බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 9

## සූත්‍රාන්ත පිටකයෙහි

03 වන ග්‍රන්ථය

# දීඝනිකාය

තෘතීය භාගය

## පාථික වර්ගය

අග්ගමහාපණ්ඩිත

**බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක**

**මහාස්ථවිරපාදයන් වහන්සේ**

විසින් කරනලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි

බු: ව: 2550

ක්‍රි: ව: 2006

Buddha Jayanti Tripitaka Series, Volume 9

The Third Book in the

**Suttanta-Pitaka**

**3**

# DĪGHA-NIKĀYA (III)

With the Sinhala translation by

**The Venerable Aggamahāpandita**
**Balangoda Ānanda Maitreya Mahā Nāyaka Thera**

නමො තස්ස භගවතො සබ්බධම්මෙ අප්පටිහතඤාණචා ස දසබලධරස්ස චතුවෙසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත් ස ධම්මිස්සරස්ස ධම්මරාජ ස ධම්ම සාමිස්ස තථාගතස්ස සබ්බ ඤුනෙ සම්මාස බුද්ධස්ස !!!

භාග්‍ය වූ සිය ධර්මය හි නොපැකි ඥානචාර සහි වූ දසබලධාරී වූ චතුර්වෛශාරද විශාර වූ සිය සත්ව න් උත්ත වූ ධර්මය ඊශ්වර වූ ධර්මරා වූ ධර්ම වාමී වූ තථාගත වූ සර්ව වූ සම්ම සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂ ක් සක්වලයන්හි සිය ආර්යයෙ ද සිය සත්පු යෙදේ මාගේ නමස්කාරය පිළිගනි !!!

**<u>බුද්ධජ ති තිපි ග්‍රන්ථමාලා</u>**
**<u>පරිගණ ගත කර නොමිළෙ බෙදාහැරීමෙ</u>**
**<u>මහා ධර්ම දානමය පුණ්‍යක</u>**

**"අපාරුත තේස අමතස්ස ද් ාරා**
**යේ සෙතවන්තෙපමු චන් සද්ධං"**

"කන් ඇත්ත හු සැදැහැ මු ත්ව
ඔවුන අමා දොර විවෘ කරන ලදී"

අප භාග්‍ය අර්හ සම්ම සම්බුදුර න් වහන්සේ ගේ පඨම අනුසාසන මෙහි ලා සි කිරීම තිපි ශ්‍රී සද්ධර්මය පරිශීල කරන්න වූ පින්වතුන්ගෙ අභිව ද්ධිය පිණිස ම වන බව අපගේ හැඟී ය.

සැම කල් ඥාන සම්ප්‍රයුක්ත ව කිය කරන්න වූ සිය සම් ා සම්බුදුරජ වහන්සේ ලාගේ පලමු අනුශාසන , බුද්ධ රත්න කෙරෙහි ගෞරව කරන්න වූ බුදුරජා වහන්සේ ගේ සම්ම සම්බුදු බෝධි අදහන්න වූ කවර නම් පු ලයෙකු නොසලකා හිදිත් ද ? චතු වෛශාරදත් සහිත වූ දශ බල සහි වූ අනාවරණ ඥාන සහිත වූ සවඥ වූ මහා කාරුණිකයන් වහන්සේ ප්‍රේවා නිව අවබෝධ කර ගැනී පිණිස ධම්මානු ම පතිපදා ආරම් කරන පුද්ගල තු 'සද්ධ ' නම් වූ ගුණ අත්‍යාව ය යන් අවධාරනය කරන සේක

මෙම තිපි ශ්‍රී සද්ධර් සැක නොකළයු ය. සැක කරමි හදාරන ලෞකි ශිල්ප ශාස්ත පවා පරිපූර්ණ ව නෙසෙහි බව සි ඇති බැලීමෙ නුව ඇත්තා ට දැක ගත හැකි ය. පු ෂයා ශ්‍රේෂ්ඨ බවට පමු වන්න වූ සද්ධා ධනය සහි ව ("සද්ධීධ චිත් පුරි ස සෙට්ඨ ") මෙම ධර් රත්න පරිශීල කරන්නාහ සද්ධා අංගයෙන් ලැබි යු සියල්ල ලැබෙනු නොඅනුමා ය. එසෙමේ සි යෙන් ලැබි යු කෙණස ද වීර්යෙ ලැබි යු කොටසද සමාධියෙ ලැබි යු කොටසද ප්‍රඥාවෙන් ලැබි යු කොටසද ලැබෙන පරි සද්ධ , සති, විරිය, සමාධි සහ පඤා යන පංච ධර්මය තමා තු ඇති කර ගෙන මහත් වූ ගෞරවයසහිත ව ධර්මා බෝධයපිණිස ම යොමු වූ දැඩි අධි ඨානයෙන් මෙම ධර් පු තක පරිශීල කළ යු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර් ශවනයෙන් මග ඵල ලැබුවෙ ම අධි ය. විමුක්තිය ලබන්න වූ කම වේදය පහක් වි 'තර කරන්න වූ අංගුත් පංචක නිපාතයෙ 'විමුත්තා ' සූ යෙහි නිව ලබන කම වේ සතරක් ම ධම් දේශණාම සහ ධම් සවනමය පුණ කර් ඇසුරින් සි වන බව පැහැදි කර ඇත. පස්වැනි කම වේද භාවනාමය පුණ කර්ම පගු කිරීෙ සාර්ථ වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතය වහන්ෙ ශේ අනුශාසන පිළිපදි වූ අප්‍රමාදී ව ධම්මානු ම පතිපදා වඩන්න වූ සිය සත්න , තෛකාලි වූ සිය දුකින් මි ලබන්න වූ අජර වූ අමර වූ අමා මහ නිව අවබෙ‍ෝධි පිණිස මෙම මහඟු පුණ කර්ම උපනිශ වේවා !

ආර්යය වහන්ෙ ශ්‍රී පහළවීමෙ සිරි බැබලේවා !

බුද්ධ ශාසනය දියු චිර 'ථිතික වේවා !

ලෙඝේත්න සෙත් වේවා !

**"අමතං දදෙම් සෙණ්හන්, යෙධෙම් මනු ාසති"**

( *යමෙක් ධර්මානුශාස කරන්නේ ද, හෙඅමෘතය දෙන්ෙ ය* )

මෙම ධර් දානමය පුණ කර්ම

මෙ‍ෝහතිමිර විධ්වංස කරන්න වූ ලොවෙළුතුම් ආලෙ‍ෝකය වූ මහා කාරුණික වූ

සම්මාස බුදුරජාණන් වහන්ෙ ශේ සවඥතා ඥානයට ද මහා කරු ා ගුණය ද

පූජෙ‍ෝපහාරය ම වේවා !!!

කෙළලක්ෂ ක් සක්වලයන්හි සිය ආර්යයෙ ද සිය සත්පු යෙ‍ද

අපගේ පුණ කර්ම අනුමෙ‍ෝද වෙත්වා !!!

ශාසනාභිව ද් කාමී,

සමින්ද රණසි හ.

2009.06.28

සුත්තන්තපිටකෙ

# දීඝනිකායො

## 3. පාථිකවග්ගො

සූත්‍රාන්තපිටකයෙහි

# දික්සඟිය

## 3. පාථික වර්ගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති, නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 15 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:15 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

# CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... ... | xxi |
| ත්‍රිපිටකසම්පාදක මණ්ඩලය ... ... ... | xxiii |
| සංඥපනය ... ... ... ... | xxv |
| සංකේත නිරූපණය ... ... ... ... | xxvii |
| පාලිහෝඩිය ... ... ... ... | xxix |
| විෂයසූචිය ... ... ... ... | xxxi |
| පෙළ හා පරිවර්තනය– ... ... ... | 2–545 |
| ගාථාදිපාදසූචි ... ... ... ... | 547–550 |
| සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... | 551–552 |
| විසෙසපදානුක්කමණිකා ... ... ... ... | 553–582 |

# සංස්කාරක නිවේදනය

ත්‍රිපිටක ප්‍රවචනයෙහි සූත්‍රාන්ත පිටකයට අයත් ආගමග්‍රන්ථයන් කෙරෙහි පළමුවැන්න වූ දීඝනිකායෙහි පාථිකවර්ග සංලක්ෂිත වූ මෙම තෘතීය භාගය බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලාවෙහි නවවැනි ග්‍රන්ථය වෙයි.

දසබල ගුණගණපරිදීපක සූත්‍රයෙන් ප්‍රතිමණ්ඩිත වූ දීඝාගමවරය සිංහල භාෂායෙන් තබන ලෙස ලඞ්කා බෞද්ධමණ්ඩලය විසින් ආරාධිත වූ අග්‍රමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ධර්මාජ්ජ විසින් ගම්භීර වූ දීඝනිකාය සිංහල පරිවර්තනය මැනැවින් සපුරා නිමහම් කළහ. එහි ශීලස්කන්ධවර්ග ලක්ෂිත ප්‍රථම භාගය 1962 දී ද, ද්විතීයභාගය වූ මහාවර්ගය 1976 නොවැම්බර් මාසයේ දී ද මුද්‍රණය වී ඇත. අවසාන පාථිකවර්ගයෙන් යුත් මෙම තෘතීයභාගය නොසිතූ පමණ ඉක්මනින් මෙසේ මුද්‍රණය කරවාලන්නට අවස්ථාව සැලැසීම භාග්‍යයක් කොට සලකම්හ.

ශ්‍රී ලංකා විද්‍යොදය විශ්වවිද්‍යාලයෙහි කලක් උපකුලපතිව සිටි ආනන්දමෛත්‍රෙය මහාස්ථවිරපාදයන් වහන්සේ සමස්ත ලඞ්කා අමරපුර මහානිකායෙහි ප්‍රථම මහානායක පදවිය හෙබවූහ. පූර්වාපර දෙශීය භාෂාන්තරයෙහි ජෙක වූ ඔබ ත්‍රිපිටක ධර්මයෙහි නිපුණත්වය හෙතු කොටගෙන බුරුමරට රජය විසින් 'අග්‍රමහාපණ්ඩිත' යන ගරු උපාධියෙන් සම්මානිත වූහ. බහුශ්‍රැත භාවයෙන් අනූන වූ උන්වහන්සේ දීඝනිකායව්‍යාඛ්‍යානය සඳහා සරල වූ සිංහල භාෂාරීතිය මෙහෙයූ සැටි සුධීන්ගේ පැසැසුමට කාරණ වෙතී සිතම්හ.

දීඝනිකාය පාඨශොධනයෙහි දී කිසි තැනෙක නිකායාන්තරිකයන්ගේ දීර්ඝාගමයෙහි– මහාවස්තු ආදි ග්‍රන්ථයන්හි එන කිසි පාඨයෙක් ද අධොලිපි වශයෙන් යොදා ඇත. එහෙත් දූෂිත පාඨ වශයෙන් ප්‍රකට ව පැනෙන බොහෝ පාඨාන්තර අධොලිපියෙනුදු බැහැර කරන ලද්දේය. තවද කිසි පොතෙක ''ඉත්ථිං වාහනං කත්වා පුරිසං වාහනං කත්වා'' යනාදි පාඨ දක්වෙතුදු 'බුද්ධානසාසනං' ආදි තැන්හි සෙයින් නිග්‍රහීත ලොපයෙහි සාධුත්වය ද සලකා ලක්දිව ඇදුරුපරපුරෙහි එන පරිදි ''ඉත්ථිවාහනං කත්වා පුරිසවාහනං කත්වා'' යනාදි විසින් නිග්‍රහීත වියුක්ත පාඨ මේ සංස්කරණයෙහි යොදා ඇත. 'ගරුං කරොන්ති' 'ගරුකරොන්ති' යනාදි තැන්හිදු එබඳු මැය. මෙසේ සංගීතිසමාරූඪ වූ බුද්ධවචනය මැ නිශ්චය කරගැනීමට බුද්ධජයන්ති ත්‍රිපිටක සංස්කරණයෙහි දී හැම පරිශ්‍රමයක් ම යොදා ඇති බව

සලකනු මැනැවි. මෙහි ඇති වෙනත් ශොධ්‍යස්ථාන අධොලිපි අනුසාරයෙන් දත හැකි වේ. මුද්‍රණකාර්‍ය්‍ය හැකිතාක් ඉක්මනින් නිමහම් කරවාලීම සඳහා ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ ශාස්ත්‍රාගමධර පූජ්‍ය පණ්ඩිත මහතෙරවරුන්ගේ සහාය ද ඇති ව ආනන්‍දමෛත්‍රෙය මහානායක ස්වාමීන්‍ද්‍රයන් වහන්සේ මැ නිරතුරු ව්‍යාපෘත වූ බව කෘතඥතා පූර්‍වක ව සඳහන් කරම්හ.

තවද සම්බුද්ධශාසනයාගේ උද්දීප්තියට අතිශයින් පිහිට වන පරිශුද්ධ වූ ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිය ව්‍යාප්ත කරවාලීම සඳහා ශ්‍රී ලඞ්කා ජනරජයේ අග්‍රාමාත්‍ය වර ගරු සිරිමාවෝ බණ්ඩාරනායක උත්තමාව දක්වන බලවත් ප්‍රසාදය හා අනුග්‍රහය ද, ගරු සංස්කෘතික අමාත්‍ය තැන්පත් ඊ. බී. තෙන්නකෝන් මැතිතුමන්ගේ උත්සාහය ද, ප්‍රශංසා මුඛයෙන් සඳහන් කරන අතර සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් කේ. එච්. ඇම්. සුමතිපාල මහතාණන්, සංස්කෘතික අධ්‍යක්ෂ පී. ඒ. අබේවික්‍රම මහතාණන් හා සාහිත්‍ය සංවර්ධන නිලධාරි කේ. ජී. අමරදස මහතාණන් ද මෙහි ලා සඳහන් කළ යුතු ය. සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ සෝමපාල ජයවර්ධන මහතාණන් ත්‍රිපිටක මුද්‍රණය නොපමාව අවසන් කිරීම සඳහා ස්වකීය විවේකය ද නොතකා හුදු ආගමභක්තිය මැ පෙරදැරි කොටගෙන ක්‍රියා කරන බව ප්‍රශංසා පූර්වක වැ සඳහන් කළ යුතු ය.

දෙහිවල තිසර මුද්‍රණාලයාධිකාරී ඇස්. ඩී. සපරමාදු මහතාණන් ප්‍රමුඛ කාර්‍ය්‍යමණ්ඩලය ත්‍රිපිටක මුද්‍රණය නොපමාව නිමහම් කිරීමට දරන උද්‍යොගය ද, ත්‍රිපිටක කාර්යාලය පිහිටි කොළඹ මහානායක වාරිකාරාමයෙහි භාරකාර ඇම්. ඒ. ආර්. සමරසිංහ මහතාගෙන් ත්‍රිපිටක සම්පාදකමණ්ඩලයට දිවරැයෙහි ලැබෙන උපස්තම්භය ද අනුස්මරණීය වේ.

සදේවක ලෝකයාහට උභයාර්ථ සංසිද්ධිය පිණිස පවත්නා අතිපරිශුද්ධ පර්යාප්තිධර්මය ව්‍යාප්ත කරවාලීමෙහි යත්න දරන හැම පින්වත් සුධීහු ධර්මදානමය කුශලයෙන් සුඛභාගී වෙත්වා'යි ආශංසනය කරම්හ.

මෙ වගට:

ශාසනෝදයකාරී,
ලබුගම ලඞ්කානන්‍ද ස්ථවිර
ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

1976. 12. 10 වැනි දින,
ත්‍රිපිටක කාර්‍ය්‍යාලය
මහානායකවාරිකාරාමය
115, විජේරාම මාවත
කොළඹ 7.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක:**

අග්‍රමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහා ස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි (භික්ෂු විශ්වවිද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදාගොඩ ශ්‍රී ඤාණාලොක දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ, ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, ත්‍රිපිටක වාගීශ්වර, රාජකීය පණ්ඩිත ලබුගම ශ්‍රී ලඞ්කානන්ද-කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක:**

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ සිරි පඤ්ඤාලොක - ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වෙඩරුවෙ සිරි අනොමදස්සී බටහිර දිශායෙහි ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ - මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන්වහන්සේ.

කොළඹ, තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරදන පඤ්ඤාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී:**

කොළඹ, බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවෙ සිරි ධම්මපාල - කොළඹ පළාතේ ප්‍රධානසඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

# සංක්ෂෙපනය

මෙහි පළමු දෙවැනි කාණ්ඩ දෙක්හි ම සංක්ෂෙපන ඇති බැවින් මෙයට විශේෂ සංක්ෂෙපනයක් අවශ්‍ය නොවේ. සූත්‍ර සාරාංශය පමණෙක් මෙහි දක්වේ.

1. පාථික සූත්‍රය. සුනක්ඛත්ත නම් පැවිද්ද බුදුරජුන් අග්ගඤ්ඤය නොපනවතැයි කළ දෙෂාරෝපණය, ඔහු කොරක්ඛත්තිය නම් බලු තවුසාට පැහැදීම, සුනක්ඛත්තයා කළාරමට්ටුක නම් අචෙලක යන් කරා යෑම, අචෙලක පාථිකපුත්‍රයා ගේ මිගබස් දෙඩීම, බුදුරජුන් අග්ගඤ්ඤය ලොකොත්පත්ති වංශ කථාව පැහැදිලි කිරීම. භග්ගව-ගොත්ත පිරිවැජියාගේ ප්‍රසාදය පහළ කිරීම යන මෙතෙක් දෑ මෙහි දක්වේ.

2. උදුම්බරික සූත්‍රය. තපොජුගුප්සාව පරිපූර්ණ වන සැටි තථාගත-වරුන් පනවන පිළිවෙත් මග තපොජුගුප්සාවට වඩා උසස් බව මෙහි ප්‍රකාශිත ය.

3. චක්‍රවර්ති සිංහනාද සූත්‍රය. මෙහි දළ්හනෙමි සක්විති රජුගේ පුවත ලොවැ දිළිඳුබව නිසා සොරකම ද, එය නිසා ප්‍රාණඝාතය ද, එය නිසා බොරු කීම ද, බොරු කීම වැඩීම නිසා කේලාම් කීම ද එයින් පසු කාමමිථ්‍යාචාරය ද එයට පසු ඵරුස වචනය හා සම්ඵප්‍රලාප ද එයට පසු අභිධ්‍යා ව්‍යාපාද ද එයට පසු දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය ද එයින් පසු අධර්මරාග විෂම ලොභ හා මිථ්‍යාධර්ම ද පහළ වී වැඩී ගිය සැටි ද මෙ හැම අකුශලයක් ම වැඩී යත් යත් ආයුෂ පිරිහුණු සැටි ද අකුසල් වැඩී යෑමෙන් දස හවුරුද්ද තෙක් ආයු පිරිහීම ද ඒසමයෙහි අවිචලින් මිනිසුන් උනුන් මරා ගැන්ම ද ඉතිරි වූ ජනයා ගේ පරපුර ක්‍රමයෙන් ප්‍රාණඝාතාදියෙන් වැළැකීම ද එයින් පරමායුෂ වැඩීම ද අන්තයේදී පරමායුෂ අසූදහස් හවුරුද්දට නැගි සමයෙහි මෙතේ බුදුරජුන් පහළ වීම ද දක්විණ. මෙයට පසු පැවිද්දහු ආත්මශරණ ව වසන සැටි ද, පැවිද්දහු ගේ ආයුෂ වර්ණ සැප බල ප්‍රඥා ද විස්තර කැරිණ.

4. අග්ගඤ්ඤ සූත්‍රය. බමුණන් ගේ කුලවාදය සදෙස් බව, කුලයෙන් නොව කුසල් දහමින් ම මිනිසා පිරිසිදු වන බව, සස්නෙහි පැවිදි වූවහු බුද්ධපුත්‍ර වන නියාව, අග්ගඤ්ඤය (ලොකොත්පත්ති වංශ කථාව), සතර වර්ණයන් පහළ වීම ධර්මයෙන් ම කෙනකු ශ්‍රෙෂ්ඨ වන නියාව යන මෙතෙක්දෑ මෙහි දක්විණ.

5. **සම්පසාදනීය සූත්‍රය.** තමන් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණු කරුණු භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැවැති අනුත්තරිය ධර්ම සැරියුත් තෙරුන් වදළ නියාව මෙහි දක්වේ.

6. **පාසාදික සූත්‍රය.** නිර්ග්‍රන්ථ ඥාත පුත්‍රයන් මළ පසු ඔවුන් සවවන් ගේ භේදය, අසම්‍යක් සම්බුද්ධ ශාස්තෘහු ගේ ශාසනයේ අපරිපූර්ණත්වය සම්‍යක් සම්බුද්ධ ශාස්තෘහුගේ ශාසනයේ පූර්ණත්වය, සත්තිස් බෝ පැකි දහම් අන්තොටුවන් නගන දෙස්, ඒවාට පිළිතුරු සුඛල්ලිකානුයෝග තථාගතයන් වහන්සේ වදරන නොවදරන දෑ, දෘෂ්ටිනිඃශ්‍රයයෝ, දෘෂ්ටිනිඃශ්‍රය ප්‍රහාණය – මෙතෙක් දෑ මෙහි සවිස්තර ව දක්වේ.

7. **ලක්ෂණ සූත්‍රය.** සක්විති රජුන්ගේ ද ලොවුතුරු බුදුරජුන්ගේ ද ගතැ පිහිටන දෙතිස් මහාපුරිස් ලකුණු ද ඒවා ඇති වීමට කාරණ වූ ගුණ ධර්ම ද ඒවායේ අනුසස් ද යන මෙතෙක් දෑ මෙහි දක්වේ.

8. **සිඟාලොවාද සූත්‍රය.** සිඟාලක ගෘහපති පුත්‍රයාට වදළ ගිහි විනය සවිස්තර ව මෙහි දක්වේ.

9. **ආටානාටිය සූත්‍රය.** ගිජුකුළු පව්වෙහි වසන බුදුරජුන් වෙතට එක් රැයෙක සිවුවරම් දෙවියන් සපිරිවරින් ආ නියාව ද වෙසවුණු රජු විපස්සී බුදුරජුන් පටන් කොට අප බුදුරජුන් තෙක් සිටි සත් බුදුරජුන් ගේ නම් ඇතුළත් කොට, සිවුපිරිසේ ආරක්ෂාව සඳහා රැසැයූ පිරිත බුදුරජුන් හමුවේ පැවැසූ නියා ව ද බුදුරජුන් එය අනුමත කොට, භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් විසින් යක්ෂභූත දෙෂ නිවාරණය පිණිස එය පුහුණු කරන සේ වදළ නියා ව ද මෙහි දක්වේ.

10. **සඞ්ගීති සූත්‍රය.** බුදුරජුන් ගේ නියෝගයෙන් සැරියුත් මහතෙරුන් වදළ දේශනාවෙකි. මෙහි ඒකක ද්වික ත්‍රික චතුෂ්කාදි වශයෙන් බුදුරජුන් වදළ දහම් පරිච්ඡේද කොට දක්විණ.

11. **දසුත්තර සූත්‍රය.** එක දෙක තුන ආදි විසින් බුදුරජුන් වදළ දහම් වර්ග වශයෙන් බෙදු සැරියුත් මහතෙරුන් විසින් මේ සූත්‍රය වදරණ ලදී.

මෙයට,

බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර

ශ්‍රී චන්ද්‍රශේඛරාරාමය,
වටයවත්ත පාර,
මහරගම.
1976–12–17.

# සංකේත නිරූපණය

සී. සිංහල පුස්කොළ පිටපත්

සීමු. සිංහල මුද්‍රිත දීඝනිකාය

මජසං. බුරුම ඡට්ඨසඞ්ගීතිසොධිත දීඝනිකාය

ස්‍යා. ස්‍යාම–තාය්අක්‍ෂර මුද්‍රිත දීඝනිකාය

කා: කාම්බෝජඅක්‍ෂර දීඝනිකාය

PTS. Pali Text Society Edition

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

අ a   ආ ā   ඉ i   ඊ ī   උ u   ඌ ū   එ e   ඔ o

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

ය ya   ර ra   ල la   ව va   ස sa   හ ha   ළ ḷa   ං ṃ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### CONJUCT - CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ ,mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ñja | ද්ව, dva | ම්භ mbha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍රා grâ | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ñkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ñga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ṇda | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

ා ā   ි i   ී ī   ු u   ූ ū   ෙ e   ො

## විෂය සූචිය

### පාථිකවග්ගො


1. පාථික සුත්තං ... ... ... ... 2

2. උදුම්බරික සීහනාද සුත්තං ... ... ... 58

3. චක්කවත්තිසීහනාද සුත්තං ... ... ... 96

4. අග්ගඤ්ඤ සුත්තං ... ... ... ... 137

5. සම්පසාදනීය සුත්තං ... ... ... ... 166

6. පාසාදික සුත්තං ... ... ... ... 194

7. ලක්ඛණ සුත්තං ... ... ... ... 236

8. සිඟාල සුත්තං ... ... ... ... 288

9. ආටානාටිය සුත්තං ... ... ... ... 312

10. සඞ්ගීති සුත්තං ... ... ... ... 352

11. දසුත්තර සුත්තං ... ... ... ... 468

සුත්තන්තපිටකෙ

# දීඝනිකායො

(තතියො භාගො)

## පාථිකවග්ගො

# සුත්තන්තපිටකෙ

# දීඝනිකායො

## තතිය භාගො

## පාථිකවග්ගො

### නමො තස්ස භගවතො අරහතො
### සම්මා සම්බුද්ධස්ස

## 1

## පාථිකසුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා මල්ලෙසු විහරති, අනුපියා නාම මල්ලානං නිගමො.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං[1] නිවාසෙත්වා පත්තචීවරමාදාය අනුපියං[2] පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි: "අතිප්පගො ඛො තාව අනුපියායං[3] පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන භග්ගවගොත්තස්ස පරිබ්බාජකස්ස ආරාමො, යෙන භග්ගවගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමෙය්‍යන්ති."

2. අථ ඛො භගවා යෙන භග්ගවගොත්තස්ස පරිබ්බාජකස්ස ආරාමො යෙන භග්ගවගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අථ ඛො භග්ගවගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: "එතු ඛො භන්තෙ භගවා. ස්වාගතං භන්තෙ භගවතො, චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භන්තෙ භගවා, ඉදමාසනං පඤ්ඤත්තන්ති." නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. භග්ගවගොත්තො'පි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි.

1. පාථෙය්‍ය වග්ගො (සීමු)
2. අනුපපියම් (ස්‍යා), අනුපියං (කාම)
3. අනුපියං (කාම)

# සූත්‍රාන්තපිටකයෙහි

# දීඝනිකාය

## තෘතීය භාගය

### ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා!

## පාථික වර්ගය

## 1

## පාථික සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ, මල්ල රටැ – මල්ලයන්ගේ අනුපියා නම් යම් නියම්ගමෙක් වී ද – එහි වැඩ වසන සේක.

එ කලැ භාග්‍යවතුන් වහන්සේ පෙර වරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන, අනුපියා නිගමයට පිඬු පිණිස වන් සේක. එ කල්හි (එසේ වඩනා) භාග්‍යවතුන් වහන්සේට 'අනුපියා නිගමයෙහි පිඬු පිණිස හැසිරෙන්නට තව ම ඉතා උදසන ය. මේ භාර්ගවගෝත්‍ර පිරිවැජ්ජා ගේ අරමට, භාර්ගවගෝත්‍ර පිරිවැජ්ජා කරා, ගියෙම් වීම නම් යෙහෙකැ' යි මෙ සිත විය.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ භාර්ගවගෝත්‍ර පිරිවැජ්ජා ගේ ආරාමය යම් තැනෙක ද, භාර්ගවගෝත්‍ර පිරිවැජ්ජා යම් තැනෙක ද, එ තැනට වැඩි සේක. එකල්හි භාර්ගවගෝත්‍ර පිරිවැජි තෙම භාග්‍යවතුන් වහන්සේට 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහි වඩිනා සේක් වා; වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහි වැඩි සේ මැනව, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අද මෙහි වැඩියේ බොහෝ කලකට පසු යැ[1]; වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳිනා සේක් වා; මේ අස්නෙක් පනවන ලද්දේ වේ' යැ යි මෙ වචන කී ය. පනවන ලද අස්නෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් සේක. භාර්ගවගෝත්‍ර පිරිවැජි ද එක්තරා මිටි අස්නෙක් ගෙන පසෙක ඉඳ ගත.

---

1. 'මෙහි වඩින්නට අද යම් වාරයක් (අවසරාවක්) සොද ගත් සේක් ද ඒ බොහෝ කලෙකිනි' යනු පදගත අර්ථයි.

3. එකමන්තං නිසින්නො බො භග්ගවගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

"පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මං එතදවොච: 'පච්චක්ඛාතො'දානි මයා භග්ගව භගවා, නදානාහං භග්ගව භගවන්තං උද්දිස්ස විහරාමී'ති. කච්චෙතං භන්තෙ තථෙව, යථා සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො අවචා?''ති.

4. "තථෙව බො එතං භග්ගව යථා සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො අවච. පුරිමානි භග්ගව දිවසානි පුරිමතරානි සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො මං එතදවොච: 'පච්චක්ඛාමි'දානාහං භන්තෙ භගවන්තං, නාහං භන්තෙ භගවන්තං උද්දිස්ස විහරිස්සාමී'ති. එවං වුත්තෙ අහං භග්ගව සුනක්ඛත්තං ලිච්ඡවිපුත්තං එතදවොචං:

"අපි නු ත්‍යාහං[1] සුනක්ඛත්ත එවං අවචං: එහි ත්වං සුනක්ඛත්ත, මමං උද්දිස්ස විහරාහී ති?''

"නො හෙතං භන්තෙ.''

"ත්වං වා පන මං එවං අවච: අහං භන්තෙ භගවන්තං උද්දිස්ස විහරිස්සාමී ති?''.

"නො හෙතං භන්තෙ.''

"ඉති කිර සුනක්ඛත්ත නෙවාහං ත්වං වදාමි:

එහි ත්වං සුනක්ඛත්ත මමං උද්දිස්ස විහරාහීති. නපි කිර මං ත්වං වදෙසි: අහං භන්තෙ භගවන්තං උද්දිස්ස විහරිස්සාමී ති. එවං සන්තෙ මොඝපුරිස කො සන්තො කං පච්චාචික්ඛසි? පස්ස මොඝපුරිස යාවඤ්ච[2] තෙ ඉදං අපරද්ධන්ති.''

5. "න හි පන මෙ භන්තෙ භගවා උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොතී''ති.

"අපි නු ත්‍යාහං සුනක්ඛත්ත එවං අවචං: එහි ත්වං සුනක්ඛත්ත, මමං උද්දිස්ස විහරාහි, අහන්තෙ උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සාමී ති?''

1. තාහං, සිමු, PTS.
2. යාව ච (මජ්ඣං)

3. එකත් පස් වැ හුන්නාවූ ම භාර්ගවගෝත්‍ර පිරිවැජි තෙමෙ භාග්‍ය-වතුන් වහන්සේට මෙ බස් පැවැසී ය:

''වහන්ස, පෙර දවසැ, බොහෝ පෙර දවසැ, ලිච්ඡවීරාජපුත්‍ර සුනක්ඛත්ත තෙමේ මා වෙත ආයේ ය. අවුත්, භාර්ගවය, දැන් මා විසින් භාග්‍යවතුන් වහන්සේ පරිත්‍යක්ත සේක. මම් භාග්‍යවතුන් වහන්සේ ගෙන් වෙන් වීමි. භාග්‍යවතුන් වහන්සේ උදෙසා නො වෙසෙමි' යි මට සැළ කෙළේය. වහන්ස, කිමෙක් ද? මෙය ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා කී සේ ම වී ද?'' (යනු යැ).

4. ''භාර්ගවය, මෙය ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා කී සේ ම විය. භාර්ගවය, පෙර දවසැ බොහෝ පෙර දවසැ, ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා මා වෙත ආයේ ය, අවුත් මා වැඳ, පසෙක ඉඳ ගත්තේ ය, එසේ හුන්නේ ම ''වහනස, මම් දැන් භාග්‍යවතුන් වහන්සේ හැරපියා යෙමි, වහන්ස, මම් භාග්‍යවතුන් වහන්සේ උදෙසා නො වසන්නෙමි'' යි කී ය. භාර්ගවය, ඔහු මෙසේ කී කලැ, මම් ඔහු අමතා,

'සුනක්ඛත්තය, තෝ මෙහි එව, මා උදෙසා වසව' යි මම තට කීම් දැ?' යි

ඔහු පුළුවුත්මි.

'වහන්ස, එසේ වූ කථාවෙක් නො වී යැ' යි හේ කී ය.

''තෝ හෝ මට 'මම භාග්‍යවතුන් වහන්සේ උදෙසා වසන්නෙමි' යි කීහි දැ?'' යි පුළුවුත්මි.

'වහන්ස, මෙසේ වූ කථාවෙක් ද නො වී' යැ යී හේ කිව.

''සුනක්ඛත්තය, මෙසේ 'මෙහි එව මා උදෙසා වසවැ' යි මම තට නො ම කීමි. 'මම භාග්‍යවතුන් වහන්සේ උදෙසා වසන්නෙමි' යි තෝ ද මට නො කී ය. හිස් මිනිස, මෙසේ ඇති කලැ, තෝ කවරෙක් වනුයෙහි, කවරක්හු හැරපියා යෙහි ද? හිස් මිනිස, මෙහි ලා තා කෙළේ කොතර ම මහත් වරදෙක් දැ? යි සලකා බලව' යි මම ඔහුට කීමි.

5. එවිටැ, 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට උතුරුමිනිස් දහමින් පෙළහර නො කරන සේකැ' යි සුනක්ඛත්තයා කී ය. එවිටැ

'සුනක්ඛත්තය, තෝ එව, මා උදෙසා වසව, මම් තට උතුරුමිනිස්-දහමින් පෙළහර කරන්නෙමි' යි තා අමතා මම කීයෙම් දැ?' යි ඔහු පුළුවුත්මි.

"නො හෙතං භන්තෙ."

"ත්වං ව පන මං එවං අවච:

අහං භන්තෙ භගවන්තං උද්දිස්ස විහරිස්සාමි, භගවා මෙ උත්තරි මනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති ති?"

"නො හෙතං භන්තෙ."

"ඉති කිර සුනක්ඛත්ත නෙවාහන්තං වදාමි: එහි ත්වං සුනක්ඛත්ත, මමං උද්දිස්ස විහරාහි, අහන්තෙ උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සාමී ති. න පි කිර මං ත්වං වදෙසි: අහං භන්තෙ භගවන්තං උද්දිස්ස විහරිස්සාමි, භගවා මෙ උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති ති. එවං සන්තෙ මොඝපුරිස කො සන්තො කං පච්චාචික්ඛසි? තං කිම්මඤ්ඤසි සුනක්ඛත්ත? කතෙ වා උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියෙ අකතෙ වා උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියෙ, යස්සත්ථාය මයා ධම්මො දෙසිතො සො නියාති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයායා?"ති.

"කතෙ වා භන්තෙ උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියෙ අකතෙ වා උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියෙ, යස්සත්ථාය භගවතා ධම්මො දෙසිතො සො නියාති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයායා"ති. "ඉති කිර සුනක්ඛත්ත කතෙ වා උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියෙ අකතෙ වා උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියෙ, යස්සත්ථාය මයා ධම්මො දෙසිතො සො නියාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායා ති, තත්‍ර සුනක්ඛත්ත කිං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කතං කරිස්සති? පස්ස මොඝපුරිස යාවඤ්ච තෙ ඉදං අපරද්ධන්ති."

6. "න හි පන මෙ භන්තෙ භගවා අග්ගඤ්ඤං පඤ්ඤපෙති" ති.

"අපි නු ත්‍යාහං සුනක්ඛත්ත එවං අවචං. එහි ත්වං සුනක්ඛත්ත මමං උද්දිස්ස විහරාහි, අහන්තෙ අග්ගඤ්ඤං පඤ්ඤපෙස්සාමී ති?"

"නො හෙතං භන්තෙ."

"ත්වං වා පන මං එවං අවච: අහං භන්තෙ භගවන්තං උද්දිස්ස විහරිස්සාමි, භගවා මෙ අග්ගඤ්ඤං පඤ්ඤපෙස්සති ති?"

"නො හෙතං භන්තෙ."

"ඉති කිර සුනක්ඛත්ත නෙවාහන්තං වදාමි:

'වහන්ස, මෙය එසේ නො ම වී' යැ යි සුනක්ඛත්තයා කී ය.

'භාග්‍යවතුන් වහන්සේ මට උතුරුමිනිස්දහමින් පෙළහර කරති' යි සිතා මම භාග්‍යවතුන් වහන්සේ උදෙසා වසන්නෙමි' යි ද තෝ මට නො කීහි. මෙසේ ඇති කලැ, හිස් මිනිස, තෝ කවරෙක් වනුයෙහි කවරක්හු හැරපියා යෙහි ද? සුනක්ඛත්තය, ඒ කිමැ යි සිතහි ද? උතුරුමිනිස්දහමින් ඉදු පෙළහර කළ ද නො කළ ද, යම් දුක්වැනැස්මක් පිණිස මා විසින් දහම් දෙසන ලද නම්, එය ඒ දහම පරිදි පිළිපදනහුට මොනොවට දුක් නසනු පිණිස පවත්නේ ද?' යි මම පුළුවුත්මි.

'වහන්ස, උතුරුමිනිස් දහමින් පෙළහර කළත් නොකළත් යම් දුක්-වැනැස්මක් පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් දෙසන ලද නම්, ඒ දහම එය වූ පරිදි පිළිපදනහුට මොනොවට දුක් නසනු පිණිස පවතී' යැ යි සුනක්ඛත්තයා කී ය.

'සුනක්ඛත්තය, මෙසේ කලැ උතුරුමිනිස් දහමින් පෙළහර කළ ද නො කළ ද, යම් දුක්වැනැස්මක් පිණිස මා විසින් දහම් දෙසන ලද නම්, එහි කී පරිදි පිළිපදනහුට එය මොනොවට දුක් නසනු පිණිස පවත්නේ නම්, උතුරුමිනිස් දහමින් ඉදුපෙළහර කරන ලදුයේ කවර නම් වැඩක් සිදු කරන්නේ ද? හිස් මිනිස, මෙහි තා කෙළේ කොතරම් මහ වරදෙක් දැ? යි බලව' යි මම කීමි.

6. 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට ලෝකෝත්පත්ති වංශකථාව නො ම වදරන සේකැ' යි සුනක්ඛත්තයා කී ය.

'සුනක්ඛත්තය,තෝ මෙහි එව, මා උදෙසා වස, මම තට ලෝකෝත්-පත්ති වංශකථාව කියන්නෙමි' යි මම තට කීම් ද?' යි

මම ඔහු පුළුවුත්මි.

'වහන්ස, එ වැනි බසක් නො වදළ සේකැ' යි හේ කී ය.

'භාග්‍යවතුන් වහන්සේ මට ලොකෝත්පත්ති වංශකථාව වදරති' යි-භාග්‍යවතුන් වහන්සේ නිසා වසන්නෙමි' යි හෝ තෝ මට කීහි ද?' යි

මම ඔහු පුළුවුත්මි.

'වහන්ස, එවැනි බසක් නොකීමි'යි හේ කිව.

“එහි ත්වං සුනක්ඛත්ත මමං උද්දිස්ස විහරාහි, අහන්තෙ අග්ගඤ්ඤං පඤ්ඤපෙස්සාමී’ති. න පි කිර මං ත්වං වදෙසි: අහං භන්තෙ භගවන්තං උද්දිස්ස විහරිස්සාමි, භගවා මෙ අග්ගඤ්ඤං පඤ්ඤපෙස්සතී ති. එවං සන්තෙ මොඝපුරිස කො සන්තො කං පච්චාචික්ඛසි? තං කිම්මඤ්ඤසි සුනක්ඛත්ත? පඤ්ඤත්තෙ වා අග්ගඤ්ඤෙ අප්පඤ්ඤත්තෙ වා අග්ගඤ්ඤෙ යස්සත්ථාය මයා ධම්මො දෙසිතො, සො නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායා?”ති.

‘පඤ්ඤත්තෙ වා භන්තෙ අග්ගඤ්ඤෙ අප්පඤ්ඤත්තෙ වා අග්ගඤ්ඤෙ, යස්සත්ථාය භගවතා ධම්මො දෙසිතො සො නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායා’ති.

‘ඉති කිර සුනක්ඛත්ත පඤ්ඤත්තෙ වා අග්ගඤ්ඤෙ අප්පඤ්ඤත්තෙ වා අග්ගඤ්ඤෙ, යස්සත්ථාය මයා ධම්මො දෙසිතො, සො නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය. තත්‍ර සුනක්ඛත්ත කිං අග්ගඤ්ඤං පඤ්ඤත්තං කරිස්සති?. පස්ස මොඝපුරිස යාවඤ්ච තෙ ඉදං අපරද්ධං. අනෙකපරියායෙන ඛො තෙ සුනක්ඛත්ත මම වණ්ණො භාසිතො වජ්ජිගාමෙ: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා ති. ඉති ඛො තෙ සුනක්ඛත්ත අනෙකපරියායෙන මම වණ්ණො භාසිතො වජ්ජිගාමෙ.

අනෙකපරියායෙන ඛො තෙ සුනක්ඛත්ත ධම්මස්ස වණ්ණො භාසිතො වජ්ජිගාමෙ; ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[1] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී”ති. ඉති ඛො තෙ සුනක්ඛත්ත අනෙකපරියායෙන ධම්මස්ස වණ්ණො භාසිතො වජ්ජිගාමෙ. අනෙකපරියායෙන ඛො තෙ සුනක්ඛත්ත සඞ්ඝස්ස වණ්ණො භාසිතො වජ්ජිගාමෙ: සුපටිපන්නො[2] භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො[3] සාවකසඞ්ඝො, ඤායපටිපන්නො[4] භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා ති. ඉති ඛො තෙ සුනක්ඛත්ත අනෙකපරියායෙන සඞ්ඝස්ස වණ්ණො භාසිතො වජ්ජිගාමෙ. ආරොචයාමි ඛො තෙ සුනක්ඛත්ත පටිවෙදයාමි ඛො තෙ සුනක්ඛත්ත, භවිස්සන්ති ඛො තෙ සුනක්ඛත්ත වත්තාරො: නො විසහි සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං චරිතුං. සො අවිසහන්තො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො ති. ඉති ඛො තෙ සුනක්ඛත්ත භවිස්සන්ති වත්තාරො’ති. එවං ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො මයා වුච්චමානො අපක්කමෙව ඉමස්මා ධම්මවිනයා යථා තං ආපායිකො නෙරයිකො.

1. ඔපනෙය්‍යිකො (මජසං)
2. සුප්පටිපන්නො. (මජසං)
3. උජුප්පටිපන්නො, (මජසං)
4. ඤායප්පටිපන්නො. (මජසං)

'සුනක්ඛත්තය, මම ද 'මෙහි එව, මා උදෙසා වසව, මම් තට ලොකෝත්පත්ති වංශකථාව කියන්නෙමි' යි මෙසේ නො කීමි. තෝ හෝ 'භාග්‍යවතුන් වහන්සේ මට ලෝකෝත්පත්ති වංශකථාව වදරති. මම් ඔබ උදෙසා වසන්නෙමි'යි නො කියෙහි. හිස් මිනිස, මෙසේ ඇති කලැ තෝ කවරෙක් වනුයෙහි කවරක්හු පියා යෙහි ද? සුනක්ඛත්තය, ඒ කිමැ යි සිතයි ද? ලෝකෝත්පත්ති වංශකථාව කිවත් නොකිවත්, යම් දුක්වැනැස්මක් පිණිස මා විසින් දහම් දෙසිණි නම්, ඒ දහම එය අනුව පිළිපදනහුට මොනොවට දුක්නැසීම පිණිස නො පවත්නේ ද?' යි මම් දුළුවුත්මි.

'වහන්ස, ලෝකෝත්පත්ති වංශකථාව වදළ ද නො වදළ ද, යමක් පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් දෙසිණි නම්, ඒ දහම එය අනුව පිළිපදනහුට දුක්වැනැස්ම පිණිස පවත්නේ යැ' යි සුනක්ඛත්තයා කී ය.

එවිට, 'සුනක්ඛත්තය, මෙසේ ලෝකෝත්පත්ති වංශකථාව කිව ද නො කිව ද, යමක් පිණිස මා විසින් දහම් දෙසන ලද නම්, එය පිළිපදනහුට ඒ දහම මොනොවට දුක් වැනැස්ම පිණිස පවත්නේ නම්, එහි ලා ලෝකෝත්පත්ති වංශකථාව කියන ලදුයේ කවර අර්ථයක් සිදු කරන්නේ ද? හිස් මිනිස, මෙහි තා විසින් කොතරම් මහ වරදෙක් කරන ලද දෑ යි සිතා බලව. සුනක්ඛත්තය, පෙර තා විසින් වැදෑගම (විසල් මහ පුර) වැද නොයෙක් කරුණින් මා ගුණ කියන ලද්දේ ය. 'ඒ භගවත්හු මේ මේ කරුණින් අර්හත් හ, සම්‍යක්සම්බුද්ධ හ, විද්‍යාචරණසම්පන්න හ, සුගත හ, ලොකවිත් හ, නිරුත්තර පුරුෂදම්‍යසාරථි හ, දෙව්මිනිස්නට ශාස්තෘ හ, බුද්ධ හ, භගවත්හ'යි මෙසේ නොයෙක් කරුණින් මා ගුණ වණන ලද්දේ ය. වැදෑගමෙහි දී නොයෙක් කරුණින් දහම්හි ගුණ කියන ලද්දේ යැ. භගවත් බුදුන් විසින් ධර්මය මොනොවට වදරන ලද්දේ යැ, එය සාන්දෘෂ්ටික යැ, අකාලික යැ, ඒහිපස්සික යැ, උපනෙයක යැ, නුවණැත්තන් විසින් තමන් සිත්හි ලා දතයුතු යැ' යි මෙසේ තා විසින් නොයෙක් කරුණින් දහමැ ගුණ කියන ලද්දේ ය. සුනක්ඛත්තය, තා විසින් 'යම් පුරුෂ යුග සතරක් වූ, පුරුෂපුද්ගල අට දෙනෙක් වූ ශ්‍රාවක කෙනෙක් වෙත් ද, භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න යැ, භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ඍජුප්‍රතිපන්න යැ, භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ න්‍යායප්‍රතිපන්න යැ, භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සාමීචිප්‍රතිපන්න යැ, භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ආහුනෙය යැ, ප්‍රාහුණේය යැ, දක්ෂිණේය යැ අඤ්ජලිකරණීය යැ, ලොවට නිරුත්තර පුණ්‍යක්ෂේත්‍රය යැ' යි මෙසේ වැදෑ ගමැදී සඞ්ඝයා ගේ ගුණ නොයෙක් කරුණින් කියන ලද්දේ ය. සුනක්ඛත්තය, මම තට කියමි, මම තට දන්වමි, තට දෙස් කියන්නන් වෙති: 'ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා මහණ ගොයුමන් වෙත බඹසර පුරන්නට නො හැකි විය. නො හැකි වූයේ ශික්ෂාව හැර පියා ගිහි බවට පෙරළී ආයේ වනැ'යි මෙසේ තව දෙස් කියන්නන් වෙති' යි මම කීමි. භාර්ගවය, මෙසේ මා විසින් කියනු ලබනුයේ ම ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙම, අපායෙහි උපදනට සුදුසු වූවක්හු සේ, නිරයෙහි උපදනට සුදුසු වූවක්හු සේ, මේ සස්නෙන බැහැර වැ ගියේ ම ය.

## කොරක්ඛත්තියවත්ථු

7. එකමිදාහං භග්ගව සමයං ථූලූසු විහරාමි, උත්තරකා නාම ථූලූනං නිගමො. අථ ඛ්වාහං භග්ගව පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සුනක්ඛත්තෙන ලිච්ඡවිපුත්තෙන පච්ඡාසමණෙන උත්තරකං පිණ්ඩාය පාවිසිං. තෙන ඛො පන සමයෙන අචෙලො කොරක්ඛත්තියො කුක්කුරවතිකො චාතුකුණ්ඩිකො ඡමා නික්කිණ්ණං භක්ඛසං මුඛෙනෙව ඛාදති මුඛෙනෙව භුඤ්ජති. අද්දසා ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො අචෙලං කොරක්ඛත්තියං කුක්කුරවතිකං චාතුකුණ්ඩිකං ඡමා නික්කිණ්ණං භක්ඛසං මුඛෙනෙව ඛාදන්තං මුඛෙනෙව භුඤ්ජන්තං. දිස්වානස්ස එතදහොසි: සාධුරූපො වත භො අරහං සමණො චාතුකුණ්ඩිකො[1] ඡමා නික්කිණ්ණං භක්ඛසං මුඛෙනෙව ඛාදති මුඛෙනෙව භුඤ්ජති ති.

8. අථ ඛ්වාහං භග්ගව සුනක්ඛත්තස්ස ලිච්ඡවිපුත්තස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සුනක්ඛත්තං ලිච්ඡවිපුත්තං එතදවොචං: 'ත්වම්පි නාම මොඝපුරිස සමණො සක්‍යපුත්තියො පටිජානිස්සසී?' ති.

'කිං පන මං භන්තෙ භගවා එවමාහ: ත්වම්පි නාම මොඝපුරිස සමණො සක්‍යපුත්තියො පටිජානිස්සසී ති?'

"නනු තෙ සුනක්ඛත්ත ඉමං අචෙලං කොරක්ඛත්තියං කුක්කුරවතිකං චාතුකුණ්ඩිකං ඡමා නික්කිණ්ණං භක්ඛසං මුඛෙනෙව ඛාදන්තං මුඛෙනෙව භුඤ්ජන්තං. දිස්වාන එතදහොසි: සාධුරූපො වත භො අරහා[2] සමණො චාතුකුණ්ඩිකො ඡමා නික්කිණ්ණං භක්ඛසං මුඛෙනෙව ඛාදති මුඛෙනෙව භුඤ්ජති ති?"

"එවං භන්තෙ. කිං පන භන්තෙ භගවා අරහත්තස්ස මච්ඡරායතී?" ති.

1. චතුකුණ්ඩිකො (සී), චතුකොණ්ඩිකො (සීමු.)
2. අරහං සීමු.

## කොරක්ඛත්තිය වස්තුව

7. භාර්ගවය, එක් සමයෙක්හි මම බුලු ජනපදයෙහි, බුලු රටට අයත් උත්තරකා නම් යම් නිගමයෙක් වේ ද, එහි වෙසෙමි. භාර්ගවය, එ කලැ මම (එක් දවසෙක) පෙර වරුයෙහි හැඳ පෙරෙවැ, පා සිවුරු ගෙන, පසුමහණනු වූ ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා හා උත්තරකා නිගමයට පිඩු පිණිස වනිමි. එ සමයෙහි කොරක්ඛත්තිය නම් නිරුවත් තවුසෙක් බලු-තපස් රක්නේ, දෙ දණ හා දෙ වැලමිටු හා යන සිවු අවයව බිමැ ඔබා හැවිදුනේ, බිමැ ලූ අහර (අතින් නො ගෙන) මුවින් ම ගෙන කයි, මුවින් ම ගෙන බුදියි. භාර්ගවය, ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා බලුතපස් කරන, දෙ දණත් දෙ වැලමිටුත් බිම ඔබා හැවිදින, බිමැ ලූ අහර මුවින් ම ගෙන කන, මුවින් ම ගෙන බුදින, කෝරක්ඛත්තිය නම් නිරුවත් තවුසා දුටුයේ ය. දැකම, 'ආශ්චර්යයෙක, භවත්නි, මේ සොඳුරු සැහැවි ඇති රහත් මහණ කෙනෙක! මොහු දෙ දණ හා දෙ වැලමිටු හා බිමැ ඔබා ඇවිදුනා කෙනෙක. බිමැ ලූ අහර මුවින් ම ගෙන කයි, මුවින් ම ගෙන බුදී' යැ යි ඔහුට මේ සිත විය.

8. භාර්ගවය, එ කලැ මම ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා ගේ චිත්ත-සංකල්පනාව මා සිතින් දැක, "හිස් මිනිස, තෝත් 'ශාක්‍යපුත්‍රීය මහණෙකිමි'යි පිළින කෙරෙයි දැ?" යි ඔහුට කීමි.

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට 'හිස් මිනිස තෝත් ශාක්‍යපුත්‍රීය මහණෙකිමි'යි පිළින කෙරෙයි දැ?' යි කවර හෙයින් මෙසේ වදරන සේක් දැ?" යි හේ මා පුළුවුත.

"සුනක්ඛත්තය, බලුතපස් කරන දෙ දණ හා දෙ වැලමිටු හා බිමැ ඔබා හැවිදුනා, බිමැ ලූ අහර මුවින් ම ගෙන කන, මුවින් ම ගෙන බුදින මේ නිරුවත් කොරක්ඛත්තිය තවුසා දැක, 'ආශ්චර්යයෙක, භවත්නි, දෙ දණ හා දෙ වැලමිටු හා බිමැ ඔබා හැවිදුනා, බිමැ ලූ අහර මුවින් ම ගෙන කන, මුවින් ම ගෙන බුදින මොහු සොඳුරු සැහැවි ඇති රහත් මහණ කෙනෙ-කැ'යි මේ සිත තට පහළ වූයේ නො වේ දැ?" යි මම කීමි.

"එසේ යැ වහන්ස. කිමෙක් ද? වහන්ස, භාග්‍යවතුන් වහන්සේ (මෙය අනෙකකුට නො වේ වා යි) රහත්බවට මසුරුකම් කරන සේක් දැ?" යි සුනක්ඛත්තයා කී ය.

"න ඛො'හං මොඝපුරිස අරහත්තස්ස මච්ඡරායාමි. අපි ච තුය්හෙ-වෙතං පාපකං දිට්ඨිගතං උප්පන්නං, තං පජහ, මා තෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛාය. යං ඛො පනෙතං සුනක්ඛත්ත මඤ්ඤසි අචෙලං කොරක්ඛත්තියං: සාධුරූපො අරහං සමණො ති, සො සත්තමං දිවසං අලසකෙන කාලං කරිස්සති, කාලකතො ච – කාලකඤ්ජකා නාම අසුරා, සබ්බනිහීනො අසුරකායො – තත්‍ර උපපජ්ජිස්සති. කාලකතඤ්ච නං බීරණත්ථම්භකෙ සුසානෙ ඡඩ්ඩෙස්සන්ති. ආකඞ්ඛමානො ච ත්වං සුනක්ඛත්ත අචෙලං කොරක්ඛත්තියං උපසඞ්කමිත්වා පුච්ඡෙය්‍යාසි: ජානාසි ආවුසො අචෙල කොරක්ඛත්තිය අත්තනො ගතින්ති? ඨානං ඛො පනෙතං සුනක්ඛත්ත විජ්ජති, යන්තෙ අචෙලො කොරක්ඛත්තියො බ්‍යාකරිස්සති: ජානාමි ආවුසො සුනක්ඛත්ත අත්තනො ගතිං – කාලකඤ්ජිකා නාම අසුරා, සබ්බනිහීනො අසුරකායො – තත්‍රම්හි උපපන්නො"ති.

9. අථ ඛො භගවා සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙන අචෙලො කොරක්ඛත්තියො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අචෙලං කොරක්ඛත්තියං එතදවොච: බ්‍යාකතො ඛො'සි ආවුසො කොරක්ඛත්තිය සමණෙන ගොතමෙන; අචෙලො කොරක්ඛත්තියො සත්තමං දිවසං අලසකෙන කාලං කරිස්සති, කාලකතො ච – කාලකඤ්ජිකා නාම අසුරා, සබ්බනිහීනො අසුරකායො – තත්‍ර උපපජ්ජිස්සති. කාලකතඤ්ච නං බීරණත්ථම්භකෙ සුසානෙ ඡඩ්ඩෙස්සන්ති"ති. යෙන ත්වං ආවුසො කොරක්ඛත්තය මත්තමත්තඤ්ච භත්තං[1] භුඤ්ජෙය්‍යාසි, මත්තමත්තඤ්ච පානීයං පිවෙය්‍යාසි, යථා සමණස්ස ගොතමස්ස මිච්ඡා අස්ස වචනන්ති". අථ ඛො භගවා සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො එකද්වීහිකාය සත්තරත්තින්දිවානි ගණෙසි යථා තං තථාගතස්ස අසද්දහමානො.

අථ ඛො භගවා අචෙලො කොරක්ඛත්තියො සත්තමං දිවසං අලස-කෙන කාලමකාසි. කාලකතො ච – කාලකඤ්ජකා නාම අසුරා, සබ්බනිහී-නො අසුරකායො – තත්‍ර උපපජ්ජි. කාලකතඤ්ච නං බීරණත්ථම්භකෙ සුසානෙ ඡඩ්ඩෙසුං. අස්සොසි ඛො භගවා සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො අචෙලො කිර කොරක්ඛත්තියො අලසකෙන කාලකතො බීරණත්ථම්භකෙ සුසානෙ ඡඩ්ඩිතො'ති.

1. මත්තමත්තංච සිමු.

"හිස් මිනිස, මම රහත්බවට තො ම මසුරුකම් කරමි. වැලි තට ම මේ ලාමක මිථ්‍යාදෘෂ්ටිය උපන. එය බැහැර කරව. එය තට බොහෝ කල් අවැඩ පිණිස, දුක් පිණිස නොවේ වා. සුනක්ඛත්තය, තෝ 'සොඳුරු සැහැවි ඇති රහත් මහණෙකැ යි මේ කෝරක්ඛත්තිය නම් යම් නිරුවත් තවුසකු හඟනෙහි ද, හේ මෙයින් සත්වන ද අලසක රෝගයෙන් මියෙන්නේ ය. මිය ගියේ, හැමට නිහීන වූ කාලකඤ්ජ නම් යම් අසුර-නිකායයෙක් ඇත් ද, එහි උපදනේ ය. (මිනිස්සු) මළා වූ ඔහු බීරණත්ථම්භක නම් සොහොනට ඇද දමන්නාහ. සුනක්ඛත්තය, ඉදින් තෝ කැමැත්තෙහි නම්, අචේලක කෝරක්ඛත්තියයා කරා ගොස්, 'ඇවැත් කෝරක්ඛත්තිය-යෙනි, තොප ගතිය දනිවු ද?'යි විචාරව. 'ඇවැත් සුනක්ඛත්තය, මම තමා ගේ ගතිය දනිමි. හැමට නිහීන වූ කාලකඤ්ජ නම් යම් අසුර නිකායෙක් ඇද්ද, මම එහි උපන්නෙම් වෙමි'යි අචේලක කෝරක්ඛත්ති-යයා තට හෙළි කරන්නේ ය යන යමෙක් ඇද්ද, මේ කාරණය විද්‍යමාන යැ'' යි මම ඔහුට කීමි.

9. භාර්ගවය, ඉක්බිති ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙමෙ අචේලක කෝරක්ඛත්තියයා කරා ගියේ ය. ගොස්, කෝරක්ඛත්තියයා බණවා, 'ඇවැත් කෝරක්ඛත්තියය, 'අචේලක කෝරක්ඛත්තියයා මෙයින් සත්වන දවසැ අලසක රෝගයෙන් මියෙති' යි, 'මිය ගියාහු ම කාලකඤ්ජ නම් හැමට නිහීන අසුර නිකායෙහි උපදිති' යි, 'මිය ගිය ඔහු බීරණත්ථම්භක නම් සොහොනට ඇද දමිතැ'යි ශ්‍රමණ ගෞතමයන් විසින් ඔබ ව්‍යාකෘතභ (ඔබේ අනාගත ගතිය හෙළි කොට කියන ලදි). ඇවැත් කෝරක්ඛත්තිය-යෙනි, එ බැවින් ශ්‍රමණ ගෞතමයන්ගේ බස යම් සේ බොරු වන්නේ ද, එසේ වනු පිණිස තෙපි මඳ මඳ කොට බොජුන් වළඳවු, මඳ මඳ කොට පැන් බොවු' යැ යි කී ය. භාර්ගවය, එ කලැ ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙමේ තථාගතයන් කී බස යම් සේ නො අදහන්නේ ද, එසේ එක් දවසෙක් ගෙවිණ, දෙ දවසෙක් ගෙවිණැ යි යන ආදි වශයෙන් සත් රෑ දවලක් ගිණුයේ ය.

භාර්ගවය, එ කලැ සත් වන දවසැ අචේලක කෝරක්ඛත්තිය තෙමේ අලසක රෝගයෙන් මිය ගියේ ය. මියැ කාලකඤ්ජ නම් සර්වනිහීන අසුර නිකායයෙහි උපන්නේ ය. (මිනිස්සු) මිය ගියා වූ ද ඔහු බීරණත්ථම්භක නම් සොහොනට ඇද දමූහ. භාර්ගවය, ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙම 'අචේලක කෝරක්ඛත්තියයා අලසක රෝගයෙන් මිය ගියේ, බීරණත්ථම්-භක නම් සොහොනට ඇද දමන ලදැ' යි යන්න ඇසීය.

අථ ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙන බීරණත්ථම්භකං සුසානං යෙන අචෙලො කොරක්ඛත්තියො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අචෙලං කොරක්ඛත්තියං තික්ඛත්තුං පාණිනා ආකොටෙසි: "ජානාසි ආවුසො කොරක්ඛත්තිය අත්තනො ගතින්ති?". අථ ඛො භග්ගව අචෙලො කොරඛත්තියො පාණිනා පිට්ඨිං පරිපුඤ්ජන්තො වුට්ඨාසි 'ජානාමි ආවුසො සුනක්ඛත්ත අත්තනො ගතිං— කාලකඤ්ජිකා නාම අසුරා— සබ්බනිහීනො අසුරකායො, තත්‍රම්හි උපපන්නො ති වත්වා තත්ථෙව උත්තානො පරිපති.

10. අථ ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අහං භග්ගව සුනක්ඛත්තං ලිච්ඡවිපුත්තං එතදවොචං: තං කිම්මඤ්ඤසි සුනක්ඛත්ත? යථෙව තෙ අහං අචෙලං කොරක්ඛත්තියං ආරබ්භ බ්‍යාකාසිං, තථෙව තං විපක්කං[1] අඤ්ඤථා වා?ති.

"යථෙව මෙ භන්තෙ භගවා අචෙලං කොරක්ඛත්තියං ආරබ්භ බ්‍යාකාසි, තථෙව තං විපක්කං නො අඤ්ඤථා"ති.

"තං කිම්මඤ්ඤසි සුනක්ඛත්ත යදි එවං සන්තෙ කතං වා හොති උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං අකතං වා?"ති. "අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ කතං හොති උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං නො අකතන්ති." එවම්පි ඛො මං ත්වං මොඝපුරිස උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොන්තං එවං වදෙසි: න හි පන මෙ භන්තෙ භගවා උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොතී'ති. පස්ස මොඝපුරිස යාවඤ්ච තෙ ඉදං අපරද්ධන්ති. එවම්පි ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො මයා වුච්චමානො අපක්කමෙව ඉමස්මා ධම්මවිනයා, යථා තං ආපායිකො නෙරයිකො.

## කළාරමට්ටුකවත්ථු

11. එකමිදහං භග්ගව සමයං වෙසාලියං විහරාමි මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන අචෙලො කළාරමට්ටුකො[2] වෙසාලියං පටිවසති ලාභග්ගප්පත්තො චෙව යසග්ගප්පත්තො ච වජ්ජිගාමෙ. තස්ස සත්ත වතපදානි සමත්තානි සමාදින්නානි හොන්ති:

යාවජීවං අචෙලකො අස්සං න වත්ථං පරිදහෙය්‍යං.

යාවජීවං බ්‍රහ්මචාරී අස්සං න මෙථුනං ධම්මං පටිසෙවෙය්‍යං.

යාවජීවං සුරාමංසෙනෙව යාපෙය්‍යං න ඔදනකුම්මාසං භුඤ්ජෙය්‍යං

1. විපාකං (සිමු)
2. කොරමට්ටකො සිමු. කණ්ඩරමසුකො PTS. කලාරමට්ටකො, මජ්සං

ඉක්බිති හේ බීරණත්ථම්භක සොහොන කරා, අචේලක කෝරක්ඛත්තියයා ගේ මළසිරුර වෙතට ගියේ ය. ගොස්, 'ඇවැත්නි, කෝරක්ඛත්තියයෙනි, ඔබ තමන් ඉපැද ඉන්නා ගතිය දනිත් ද?'යි ඔහු මළ සිරුර තෙවිටක් අත්ලෙන් පහළේ ය. භාග්‍යවය, එවිටැ අචේලක කෝරක්ඛත්තියයා අත්ලෙන් පිට පිස දමනුයේ නැඟී සිටියේ ය. නැඟී සිට, 'ඇවැත් සුනක්ඛත්තය, මම් සිය ගතිය දනිමි. කාලකංජක නම් සර්‍වනිහීන අසුර නිකායයෙහි උපනිමි'යි කියා එ තැන්හි ම උඩුකුරු වැ ඇද වැටුණේ ය.

10. භාග්‍යවය, එවිටැ ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා මා වෙත එළැඹියේ ය. එළැඹැ මා වැඳ පසෙක ඉඳගත්තේ ය. එසේ පසෙක හුන් ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා අඬතා, 'සුනක්ඛත්තය, එය කිමැ යි සිතයි ද? මම් අචේලක කෝරක්ඛත්තියයා ඇරබැ යමසේ තට කියෙම් ද, එසේ ම ඒ වචනයේ නිෂ්පත්තිය වී ද? නැත හොත් අන් සැටියකින් වී ද?' යි පුළුවුත්මි. 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අචේලක කෝරක්ඛත්තියයා ඇරබ මට යම් සේ වදළ සේක් ද, එසේ ම ඒ විපාකය විය, අන් ලෙසෙකින් නො වියැ' යි ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත කී ය. 'සුනක්ඛත්තය, ඉදින් මෙසේ ඇති කලැ, උතුරුමිනිස් දහමින් ඉද්ධිපෙළහර කරන ලද ද? නොකරන ලද ද?' යි ඇසීමි.

'වහන්ස, මෙසේ ඇති කලැ ඒකාන්තයෙන් උතුරු මිනිස් දහමින් ඉද්ධිපෙළහර කරන ලද්දේ ය, නො කරන ලද්දේ නො වෙයි' හේ කී ය. හිස් මිනිස, මෙසේ උතුරු මිනිස් දහමින් ඉද්ධිපෙළහර කරන මට 'භාග්‍යවතුන් වහන්සේ මට උතුරු මිනිස්දහමින් ඉද්ධිපෙළහර නොකරන සේකැ'යි තෝ කියෙහි, හිස් මිනිස, බලව, තා කළ මෙ වරදෙහි මහත!' යැ යි මම කීමි. භාග්‍යවය, ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා මා විසින් මෙසේ කියනු ලබනුයේ ද, අපායට සුදුසු වූවකු, නිරයට සුදුසු වූවකු සේ මෙ සස්නෙන් බැහැර වැ ගියේ ම ය.

## කළාරමට්ඨුක වස්තුව

11. භාග්‍යවය, මම් එක් සමයෙක විසල්පුර මහ වෙනෙහි කූටාගාර හල් වෙහෙර වෙසෙමි. එ සමයෙහි වූ කලී කළාරමට්ඨුක නම් අචේලකයෙක් ලාභයෙන් අග් පත් වූයේ, යසයින් අග් පත් වූයේ වැදෑගමැ වූ විසල්පුර වෙසෙයි. ඔහු විසින්,

"දිවි ඇති තාක් නිරුවත් වන්නෙමි, පිළී නො හඳින්නෙමි යි,
දිවි ඇති තාක් බඹසැරි වන්නෙමි, මෙවුන්දම් නො සෙවින්නෙමි යි,

පුරත්ථිමෙන වෙසාලිං උදෙනං නාම චෙතියං තං නාතික්කමෙය්‍යං දක්ඛිණෙන වෙසාලිං ගොතමකං නාම චෙතියං තං නාතික්කමෙය්‍යං, පච්ඡිමෙන වෙසාලිං සත්තම්බං නාම චෙතියං තං නාතික්කමෙය්‍යං උත්තරෙන වෙසාලිං බහුපුත්තං නාම චෙතියං, තං නාතික්කමෙය්‍යන්ති.''

සො ඉමෙසං සත්තන්නං වතපදනං[1] සමාදනහෙතු ලාභග්ගප්පත්තො චෙව යසග්ගප්පත්තො ච වජ්ජිගාමෙ. අථ ඛො භගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙන අචෙලො කළාරමට්ටුකො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා අචෙලං කළාරමට්ටුකං පඤ්හං පුච්ඡි. තස්ස අචෙලො කළාරමට්ටුකො පඤ්හං පුට්ඨො න සම්පායාසි. අසම්පායන්තො කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාත්වාකාසි. අථ ඛො භගව සුනක්ඛත්තස්ස ලිච්ඡවිපුත්තස්ස එතදහොසි "සාධුරූපං වත භො අරහන්තං සමණං ආසාදිම්හසෙ, මා වත නො අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායා''ති.

12. අථ ඛො භගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අහං භගව සුනක්ඛත්තං ලිච්ඡවිපුත්තං එතදවොචං: ත්වම්පි නාම මොඝපුරිස සමණො සක්‍යපුත්තියො පටිජානිස්සසී?ති.

"කිං පන මං භන්තෙ භගවා එවමාහ: ත්වම්පි නාම මොඝපුරිස සමණො සක්‍යපුත්තියො පටිජානිස්සසී?''ති.

"නනු ත්වං සුනක්ඛත්ත අචෙලං කළාරමට්ටුකං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡි? තස්ස තෙ අචෙලො කළාරමට්ටුකො පඤ්හං පුට්ඨො න සම්පායාසි. අසම්පායන්තො කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාත්වාකාසි. තස්ස තෙ එතදහොසි: සාධුරූපං වත භො අරහන්තං සමණං ආසාදිම්හසෙ, මා වත නො අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායා''ති

"එවං භන්තෙ. කිං පන භන්තෙ භගවා අරහත්තස්ස මච්ඡරායතී?''ති.

1. වත්තපදානි PTS

දිවි ඇති තාක් රා මස් දෙකින් යැපෙන්නෙමි, බත් කොමුපිඩු ඇ අහර
නො වළඳන්නෙමි යි,
විසල්පුරට පැදුම් දෙසින් උදේන නම් දෙවොල ඇත, එය ඉක්මැ
නොයන්නෙමි යි,
විසල්පුරට දකුණු දෙසින් ගෞතමක නම් දෙවොල ඇත, එය ඉක්මැ
නොයන්නෙමි යි,
විසල්පුරට පැළ දිගින් සත්තම්බ නම් දෙවොල ඇත, එය ඉක්මැ
නො යන්නෙමි යි,
විසල්පුරට උතුරු දිගින් බහුපුත්තක නම් දෙවොල ඇත, එය ඉක්මැ
නො යන්නෙමි යි''

මෙසේ වූ සප්ත ව්‍රතපද කෙනෙක් සමාදන් කොට ගන්නා ලද්දහු වෙත්. මේ ව්‍රතපද සත සමාදන් කොට ගෙන වසන හෙයින් හෙ තෙමෙ වැදෑගමැ ලාභයෙන් අග පත් වූයේ ද යසසින් අග පත් වූයේ ද වෙයි. භාර්ගවය, එ කල්හි ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙමේ නිරුවත් කළාරමට්ටුකයා කරා එළැඹියේ ය, එළැඹැ ඔහු ගෙන් ප්‍රශ්න විචාළේය. ඔහු විසින් පැණ පුළුවුස්නා ලද කළාරමට්ටුක තෙමෙ ඒ පැණ විසඳන්නට (සපයා කියන්නට) නොහැකි විය, එසේ නො හැකි වූයේ, කෝපය ද ද්වේෂය ද නොසතුට ද පහළ කෙළේ ය. භාර්ගවය, එ විටැ ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයාට 'අහෝ! සාධු ගුණ ඇති රහත් මහණක්හු කෙරේ ගැහැටුණමහ. එය අපට බොහෝ කල් අවැඩ පිණිස, දුක් පිණිස නො වේ ව' යි මෙ සිත විය.

12. භාර්ගවය, ඉක්බිත්තෙන් ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙමෙ මා කරා එළැඹියේ ය. එළැඹැ, මා වැද පසෙක හිඳගත්තේ ය. භාර්ගවය, එසේ පසෙක හුන් ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා අමතා, 'හිස් මිනිස, තෝත් ශාක්‍යපුත්‍රීය මහණෙකිමි' යි පිළිත කෙරෙයි ද?' යි කීමි.

'වහන්ස, කවර හෙයින් මට එසේ වදරන සෙයෙන් ද?' යි හේ කීය.

'සුනක්ඛත්තය, තෝ නිරුවත් කළාරමට්ටුකයා කරා එළැඹැ පැණ පුළුවුසුයෙහි නො වෙහි ද? නිරුවත් කළාරමට්ටුක තෙමෙ ඒ තා විසින් පැණ පුළුවුස්නා ලදුයේ, එය විසඳන්නට නොහැකි වූයේ නො වේ ද? නො හැකි වනුයේ කෝපයත් ද්වේෂයත් නොසතුටත් පහළ කෙළේ නොවේ ද? ඒ තට 'සාධු ගුණ ඇති රහත් මහණක්හු කෙරේ ගැහැටුණමහ, එය අපට බොහෝ කලක් අවැඩ පිණිස, දුක් පිණිස නො වේ ව' යි මෙ සිත වූයේ නො වේ ද?' යි මම කීමි.

'වහන්ස, එසේ ය, කිමෙක් ද? භාග්‍යවතුන් වහන්සේ රහත් බවට මසුරු වන සේක් ද?' යි හේ කී ය.

"න ඛො අහං මොඝපුරිස අරහත්තස්ස මච්ඡරායාමි. අපි ච තුය්හෙවෙතං පාපකං දිට්ඨිගතං උප්පන්නං, තං පජහ, මා තෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛාය. යං ඛො පනෙතං සුනක්ඛත්ත මඤ්ඤසි අචෙලං කළාරමට්ටකං 'සාධුරූපො අරහං සමණො''ති, සො න චිරස්සෙව පරිහිතො[1] සානුචරියො[2] විවරන්තො ඔදනකුම්මාසං භුඤ්ජමානො සබ්බානෙව වෙසාලියානි චෙතියානි සමතික්කමිත්වා යසා නීක්කිණ්ණො[3] කාලං කරිස්සතී''ති.

13. අථ ඛො භග්ගව අචෙලො කළාරමට්ටකො න චිරස්සෙව පරිහිතො සානුචරියො විවරන්තො ඔදනකුම්මාසං භුඤ්ජමානො සබ්බානෙව වෙසාලියානි චෙතියානි සමතික්කමිත්වා යසා නික්කිණ්ණො කාලමකාසි. අස්සොසි ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො: අචෙලො කිර කළාරමට්ටකො පරිහිතො සානුචරියො විවරන්තො ඔදනකුම්මාසං භුඤ්ජමානො සබ්බානෙව වෙසාලියානි චෙතියානි සමතික්කමිත්වා යසා නික්කිණ්ණො කාලං කතො'ති. අථ ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අහං භග්ගව සුනක්ඛත්තං ලිච්ඡවිපුත්තං එතදවොචං:

තං කිම්මඤ්ඤසි සුනක්ඛත්ත යථෙව තෙ අහං අචෙලං කළාරමට්ටකං ආරබ්භ බ්‍යාකාසිං, තථෙව තං විපක්කං අඤ්ඤථා වා?ති.

''යථෙව මෙ භන්තෙ භගවා අචෙලං කළාරමට්ටකං ආරබ්භ බ්‍යාකාසි, තථෙව තං විපක්කං නො අඤ්ඤථා''ති.

''තං කිම්මඤ්ඤසි සුනක්ඛත්ත යදි එවං සන්තෙ කතං වා හොති උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං, අකතං වා?''ති,

''අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ කතං හොති උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං, නො අකතන්ති.''

''එවම්පි ඛො මං ත්වං මොඝපුරිස උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොන්තං එවං වදෙසි න හි පන මෙ භන්තෙ භගවා උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොතී'ති. පස්ස මොඝපුරිස යාවඤ්ච තෙ ඉදං අපරද්ධන්ති.''

එවම්පි ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො මයා වුච්චමානො අපක්කමෙව ඉමස්මා ධම්මවිනයා, යථා තං ආපායිකො නෙරයිකො.

---

1. පරිදහිතො -සිමු-
2. සානුචරිකො, -මජසං-
3. නික්කිණ්ණෙ (සිමු. කම)

'හිස් මිනිස, මම රහත්බවට මසුරු නොවෙමි. වැලි, තා හට මේ ලාමක මිසදිටෙක් උපන. එය බැහැර ලව. එය තට බොහෝ කල් අවැඩ පිණිස දුක් පිණිස නො වේ වා. සුනක්ඛත්තය, නිරුවත් කළාර-මට්ටුක නම් යම් එකකු 'සාධු ගුණ ඇති රහත් මහණෙකැ'යි තෝ සිතයි ද, හේ නො බෝ දිනෙකින් ම පිළි හැන්දේ බිරියක ඇති වැ හැවිදූයේ, බත් කොමු ඇ අහර වළඳනුයේ විසල්පුර හැම දෙවොල් ම ඉක්මැ ගොස් යසසින් පිරිහුණේ කලුරිය කරන්නේ යැ' යි කීමි.

13. භාග්ගවය, එ කලැ නිරුවත් කළාරමට්ටුක තෙමෙ නොබෝ දිනෙකින් පිළි හැන්දේ, බිරියක් ඇති වැ හැවිදිනුයේ, බත් කොමු ඇ අහර වළඳනුයේ, විසල්පුර සියලු දෙවොල් ම ඉක්මැ ගොස්, යසසින් පිරිහී කළුරිය කෙළේ ලැ'යි සුනක්ඛත්තයා ඇසී ය. එ කලැ හේ මා කරා එළැඹියේ ය. එළැඹැ මා වැඳ පසෙකැ හුන්නේ ය. පසෙකැ හුන් සුනක්ඛත්තයා අමතා, 'සුනක්ඛත්තය, එය කිමැ යි සිතයි ද? නිරුවත් කළාරමට්ටුකයා ඇරබැ තට යම් සේ මම කීම් ද, එසේ ම එය නිපන්නේ ද? නැත හොත් අන් සැටියෙකින් වී ද?' යි කීමි.

'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නිරුවත් කළාරමට්ටුක තවුසා ඇරබැ යම් සේ මට වදළ සේක් ද, එසේ ම එය නිපන, අන් සැටියෙකින් නො වී යැ' යි හේ කී ය.

'සුනක්ඛත්තය, තෝ එය කෙසේ සිතහි ද? ඉදින් මෙ ලෙස ඇති කලැ මා විසින් උතුරු මිනිස් දහමින් ඉදුපෙළහර කරන ලද ද?, නො කරන ලද ද?' යි ඇසීමි.

'වහන්ස, මෙසේ ඇති කලැ. උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර කරන ලදුයේ වෙයි, නො කරන ලදුයේ නොවේ' යැ යි හේ කී ය.

'හිස් මිනිස, මෙසේත් උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර කරන මට; 'භාග්‍යවතුන් වහන්සේ මට උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර නො කරන සේකැ' යි තෝ කියෙහි. හිස් මිනිස, බලව, තා විසින් කොතරම් මහ වරදෙක් කරන ලද ද?' යි මම කීමි. භාග්ගවය, ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා මා විසින් මෙසේ කියනු ලබනුයේ ම, අපායට සුදුසු වූවක්හු. නිරයට සුදුසු වූවක්හු සේ ම හේ මෙ ධර්මවිනය කෙරෙන් (මෙ සස්නෙන් බැහැර වැ) ගියේ ම ය.

## පාථිකපුත්තවත්ථු

14. එකමිදාහං භග්ගව සමයං තත්ථෙව වෙසාලියං විහරාමි මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන අචෙලො පාථිකපුත්තො[1] වෙසාලියං පටිවසති ලාභග්ගප්පත්තො චෙව යසග්ගප්පත්තො ච වජ්ජිගාමෙ. සො ච වෙසාලියං පරිසතිං එවං වාචං භාසති: සමණො ගොතමො ඤාණවාදෙ අහම්පි ඤාණවාදෙ. ඤාණවාදෙ ඛො පන ඤාණවාදෙන අරහති උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං දස්සෙතුං. සමණො චෙ ගොතමො උපඩ්ඪපථං ආගච්ඡෙය්‍ය, අහම්පි උපඩ්ඪපථං ගච්ඡෙය්‍යං. තෙ තත්ථ උභොපි උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරෙය්‍යාම. එකං චෙ සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති, ද්වාහං කරිස්සාමි. ද්වෙ චෙ සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියානි කරිස්සති, චත්තාරාහං කරිස්සාමි. චත්තාරි චෙ සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියානි කරිස්සති, අට්ඨාහං කරිස්සාමි. ඉති යාවතකං සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති, තද්දිගුණං තද්දිගුණාහං[2] කරිස්සාමී''ති.

15. ''අථ ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො මං එතදවොච: අචෙලො භන්තෙ පාථිකපුත්තො වෙසාලියං පටිවසති ලාභග්ගප්පත්තො චෙව යසග්ගප්පත්තො ච වජ්ජිගාමෙ. සො වෙසාලියං පරිසතිං එවං වාචං භාසති: 'සමණො ගොතමො ඤාණවාදෙ, අහම්පි ඤාණවාදෙ. ඤාණවාදෙ ඛො පන ඤාණවාදෙන අරහති උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං දස්සෙතුං. සමණො ගොතමො චෙ උපඩ්ඪපථං ආගච්ඡෙය්‍ය, අහම්පි උපඩ්ඪපථං ගච්ඡෙය්‍යං. තෙ තත්ථ උභො පි උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරෙය්‍යාම. එකං චෙ සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති, ද්වාහං කරිස්සාමි –පෙ– තද්දිගුණං තද්දිගුණාහං කරිස්සාමී'ති.

1. පාථික සිමු. පාටික (ශ්‍යා PTS)
2. තද්දිගුණං –PTS–

## පාථික පුත්‍ර වස්තුව

14. භාග්‍යවය, මම එක් කලෙක විසල්පුර අසලැ මහ වෙනෙහි කූළාරහල් වෙහෙර වෙසෙමි. එ සමයෙහි පාථිකපුත්‍ර නම් නිරුවත් තවුසෙක් ලාභයෙන් ද යසසින් ද අගපත් වූයේ, වැදැරජුන් ගේ වාසභූමි වූ විසල්පුර වෙසෙයි. හේ 'මහණ ගොයුම් ඥානවාද ඇත්තෙක මම ද ඥානවාද ඇතියෙමි. ඥානවාද ඇත්තේ වූ කලි ඥානවාද ඇත්තක්හු හා උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහර දක්වන්නට සුදුස්සේ ය. ඉදින් මහණ ගොයුම් (වාද පිණිස) අඩ මඟක් එන්නේ වී නම්; මම ද අඩ මඟක් (ඔහු දෙසට) ඉදිරි වැ යන්නෙමි. එහි දී ඒ අපි දෙ දෙනා ම උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහර කරන්නමු. මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් එක් ඉද්ධි පෙළහරක් කරන්නේ නම්, මම ඉද්ධි පෙළහර දෙකක් කරන්නෙමි. මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහර දෙකක් කරන්නේ නම්, මම සතරක් කරන්නෙමි. ඉදින් මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහර සතරක් කරන්නේ නම්; මම අටක් කරන්නෙමි. මෙසේ මහණ-ගොයුම් උතුරු මිනිස් දහමින් යම් පමණ පෙළහර කරන්නේ ද, මම එ මෙන් දෙගුණයක් දෙගුණයක් ඉද්ධි පෙළහර කරන්නෙමි'යි පිරිස් මැද මෙසේ වූ බසක් කියයි.

15. භාග්‍යවය, එ කලැ ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා මා වෙත එළැඹියේ ය. එළැඹ මා වැඳ පසෙක උන්නේ ය. පසෙක හුන්නේ ම, "වහන්ස, වැදෑගම වූ විසල්පුර පාථිකපුත්‍ර නම් නිරුවත් තවුසෙක් ලාභයෙන් ද යසසින් ද අගපත් වැ වෙසෙයි. ඔහු විසල්පුර පිරිස් මැද දී "මහණගොයුම් (මම සියල්ල දනිමි යි) ඥානවාද ඇත්තෙක. මම ද ඥානවාද ඇත්තෙකිමි. ඥානවාද ඇත්තේ වූ කලි ඥානවාද ඇත්තකු හා උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහර දක්වන්නට සුදුස්සේ ය. ඉදින් මහණ ගොයුම් (වාද පිණිස) අඩ මඟක් එන්නේ වී නම්; මම ද අඩ මඟක් ඉදිරියට යන්නෙමි. එහි දී ඒ අපි දෙ දෙනා ම උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහර කරන්නමු. මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් එක් ඉද්ධි පෙළහරක් කරන්නේ නම්, මම ඉද්ධි පෙළහර දෙකක් කරන්නෙමි. මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහර දෙකක් කරන්නේ නම්, මම සතරක් කරන්නෙමි. ඉදින් මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහර සතරක් කරන්නේ නම්, මම අටක් කරන්නෙමි. මෙසේ මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් යම් පමණ ඉද්ධි පෙළහර කරන්නේ ද, මම එ මෙන් දෙගුණ දෙගුණ ඉද්ධි පෙළහර කරන්නෙමි' යි මෙසේ කියතැ" යි මට සැළ කෙළේ ය.

16. එවං වුත්තො අහං භග්ගව සුනක්ඛත්තං ලිච්ඡවිපුත්තං එතදවොචං: අභබ්බො ඛො සුනක්ඛත්ත අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙපි'ස්ස එවමස්ස 'අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති, මුද්ධා පි තස්ස විපතෙය්‍යා'ති.

"රක්ඛෙතතං භන්තෙ භගවා වාචං, රක්ඛෙතතං සුගතො වාචන්ති."

"කිම්පන මං ත්වං සුනක්ඛත්ත එවං වදෙසි: රක්ඛෙතතං භන්තෙ භගවා වාචං, රක්ඛෙතතං සුගතො වාචන්ති?".

"භගවතා වස්ස භන්තෙ එසා වාචා එකංසෙන ඔධාරිතා[1] 'අභබ්බො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි'ස්ස එවමස්ස 'අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති, මුද්ධා පි තස්ස විපතෙය්‍යා'ති. අචෙලො ච භන්තෙ පාථිකපුත්තො විරූපරූපෙන භගවතො සම්මුඛීභාවං ආගච්ඡෙය්‍ය, තදස්ස භගවතො මුසා''ති.

"අපි නු සුනක්ඛත්ත තථාගතො තං වාචං භාසෙය්‍ය යා සා වාචා ද්වයගාමිනී?'' ති

"කිං පන භන්තෙ භගවතා අචෙලො පාථිකපුත්තො චෙතසා චෙතො පරිච්ච විදිතො අභබ්බො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං, සචෙ පි'ස්ස එවමස්ස තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති, මුද්ධා පි තස්ස විපතෙය්‍යා'ති. උදාහු දෙවතා භගවතො එතමත්ථං ආරොචෙසුං අභබ්බො භන්තෙ ච අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා භගවතො සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි'ස්ස එවමස්ස; අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති මුද්ධා පි තස්ස විපතෙය්‍යා ති?''

1. ඔවාදිතා, සිමු

16. භාග්ගවය, මෙසේ කී කල්හි මම ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයාට, "සුනක්ඛත්තය, නිරුවත් පාථිකපුත්‍රයා ඒ තෙපුල් නො හැරපියා ඒ සිත නො හැරපියා ඒ දෘෂ්ටිය නොදුරලා මා හමුවට එන්නට නො හැක්ක. ඉදින් ඒ වචන නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරු ලා, 'මහණ ගොයුම් හමුවට යන්නෙමි' යි මෙසේ ඔහුට සිතෙක් වී නම් ඔහුගේ හිස ද ගිලි හෙතැ"යි මම කීමි.

''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මේ වචනය රක්නා සේක් වා, සුගතයන් වහන්සේ මේ වචනය රක්නා සේක් වා' යි සුනක්ඛත්ත කී ය.

"සුනක්ඛත්තය, කිමෙක් ද ? 'භාග්‍යවතුන් වහන්සේ මේ වචනය රක්නා සේක් වා, සුගතයන් වහන්සේ මේ වචනය රක්නා සේක් වා' යි මෙසේ මට කවර හෙයින් කියහි ද?'' යි මම පුළුවුතිමි.

'වහන්ස, නිරුවත් පාථිකපුත්‍ර තවුසා ඒ තෙපුල් නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දෘෂ්ටිය නො දුරු ලා, මා හමුවට එන්නට නො හැක්ක. ඉදින් 'මම ඒ තෙපුල් නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරු ලා, මහණ ගොයුම් හමුවට යන්නෙමි' යි ඔහුට මෙබඳු සිතෙක් වී නම්, ඔහුගේ හිස ද ගිලිහෙතැ' යි භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වචනය ඒකාන්තයෙන් අවධාරණය කොට (නියත කොට) ම වදරන ලද සේ යැ. වහන්ස, අචේලක පාථිකපුත්‍ර තෙමෙ සෘද්ධියෙන් වෙස්වළා (සිංහ ව්‍යාඝ්‍රාදීන් බඳු අන් වෙසෙකින්) භාග්‍යවතුන් වහන්සේ වෙතට ආයේ වී නම්, භාග්‍යවතුන් වහන්සේගේ ඒ තෙප්ල බොරු වන්නේ යැ'' යි හේ කී ය.

'සුනක්ඛත්තය, තථාගත තෙමේ සැටියෙන් එකක් වූ, අරුතෙන් වෙනෙකක් වූ, දැතකට යන බසක් කියන්නේ ද?'යි මම ඇසීමි.

'කිමෙක් ද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'අචේලක පාථිකපුත්‍ර තෙම ඒ තෙපුල් නො හැරපියා, ඒ සිත නොහැරපියා, ඒ දිට නො දුරු ලා මා හමුවට එන්නට නො හැක්කැ' යි ද, එසේ ඒ තෙපුල් නො හැරපියා, ඒ සිත නොහැරපියා, ඒ දිට නො දුරු ලා මහණ ගොයුම් වෙත යන්නෙමි' යි ඔහුට මෙසේ සිතෙක් වී නම්, ඔහු හිස ද ගිලිහෙතැ' යි භාග්‍යවතුන් වහන්සේ විසින් සිය සිතින් ඔහු සිත පිරිසිඳ අචේලක පාථිකපුත්‍රයා දන්නා ලද්දේ ද? නැත හොත්, 'අචේලක පාථිකපුත්‍ර ඒ තෙපුල් නො හැරපියා ... භාග්‍යවතුන් වහන්සේ හමුවට එනු නො හැක්-කැ'යි, ... ඉදින් ඒ තෙප්ල නො හැරපියා ... මහණ ගොයුම් හමුවට යන්නෙමි' යි සිතා යන්නේ නම්, ඔහු හිස ගිලි හෙතැ' යි දේවතා කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කළෝ ද?'' යි හේ පුළුවුත.

17. "චෙතසා චෙතො පරිච්ච විදිතො චෙව මෙ සුනක්ඛත්ත අචෙලො පාථිකපුත්තො අභබ්බො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි'ස්ස එවමස්ස: අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති, මුද්ධා පි තස්ස විපතෙය්‍යා'ති. දෙවතා පි මෙ එතමත්ථං ආරොචෙසුං: අභබ්බො භන්තෙ අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා භගවතො සම්මුඛීභාවං ආගන්තුං, සචෙ පි'ස්ස එවමස්ස: අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති මුද්ධා පි තස්ස විපතෙය්‍යා'ති.

අජිතො පි නාම ලිච්ඡවීනං සෙනාපති අධුනා කාලකතො තාවතිංසකායං උපපන්නො. සො පි මං උපසඞ්කමිත්වා එවමාරොචෙසි: 'අලජ්ජී භන්තෙ අචෙලො පාථිකපුත්තො මුසාවාදී භන්තෙ අචෙලො පාථිකපුත්තො මම්පි භන්තෙ අචෙලො පාථිකපුත්තො බ්‍යාකාසි වජ්ජිගාමෙ 'අජිතො ලිච්ඡවී සෙනාපති මහානිරයං උපපන්නො ති. න ඛො පනාහං භන්තෙ මහානිරයං උපපන්නො තාවතිංසකායම්හි උපපන්නො. අලජ්ජී භන්තෙ අචෙලො පාථිකපුත්තො, මුසාවාදී භන්තෙ අචෙලො පාථිකපුත්තො, අභබ්බො ච භන්තෙ අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා භගවතො සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි'ස්ස එවමස්ස: අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති, මුද්ධා පි තස්ස විපතෙය්‍යා''ති.

ඉති ඛො සුනක්ඛත්ත චෙතසා චෙතො පරිච්ච විදිතො චෙව මෙ අචෙලො පාථිකපුත්තො අභබ්බො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි'ස්ස එවමස්ස 'අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති' මුද්ධාපි තස්ස විපතෙය්‍යා ති. දෙවතා'පි මෙ එතමත්ථං ආරොචෙසුං අභබ්බො භන්තෙ අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා භගවතො සම්මුඛීභාවං ආගන්තුං. සචෙ'පි'ස්ස එවමස්ස අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති, මුද්ධා පි තස්ස විපතෙය්‍යා'ති. සො ඛො පනාහං සුනක්ඛත්ත වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන අචෙලස්ස පාථිකපුත්තස්ස ආරාමො තෙනුපසඞ්කමිස්සාමි දිවාවිහාරාය. යස්ස දානි ත්වං සුනක්ඛත්ත ඉච්ඡසි, තස්ස ආරොචෙහී''ති.

17. ''සුනක්ඛත්තය, අචේලක පාථිකපුත්‍රයා ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරැ ලා මා හමුවට එන්නට නො සුදුස්සේ ය. ඉදින් ඔහුට 'මම ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරැ ලා, මහණ ගොයුම් හමුවට යන්නෙමි' යි මෙසේ සිතක් වතොත්, ඔහුගේ හිස ද ගිලිහෙතැ යි මා සිතින් ඔහු සිත පිරිසිඳැ අචේලක පාථිකපුත්‍රයා මා විසින් දන්නා ලද්දේ ය. දේවතා කෙනෙක් ද 'වහන්ස, අචේලක පාථිකපුත්‍ර තෙමේ ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරැලා භාග්‍යවතුන් වහන්සේ හමුවට එන්නට නො සුදුස්සේ ය. ඉදින් ඔහුට 'මම ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරැලා, 'මහණ ගොයුම් හමුවට යන්නෙමි'යි මෙසේ සිතක් වතොත් ඔහු හිස ද ගිලි හෙතැ' යි මෙ පවත මට සැළ කළහ.

ලිච්ඡවීන්ගේ අජිත නම් සෙනෙවි ද නොබෝ දවස්හි කළුරිය කෙළේ, තවුතිසා දෙව් ලොවැ උපන්නේ ය. හේ ද මා කරා එළැඹ, ''වහන්ස, පාථිකපුත්‍ර අචේලක තෙමෙ මුසාබස් දොඩන්නෙක. වහන්ස, 'ලිච්ඡවීන්ගේ අජිත නම් සෙනෙවි මහ නිරයට වන්හ' යි පාථිකපුත්‍ර අචේලක තෙමෙ වැදෑගම්හි මා ඇරබැ ද දෙඩී ය. වහන්ස, මම මහ නිරයට නො වනිමි. මම තවුතිසා දෙව්ලොවැ උපනිමි. වහන්ස, පාථිකපුත්‍ර අචේලක අලජ්ජී යැ, පාථිකපුත්‍ර අචේලක මුසාවාදී යැ, වහන්ස, පාථිකපුත්‍ර අචේලක ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරැලා, භාග්‍යවතුන් වහන්සේ හමුවට එන්නට නො සුදුස්සේ ය. ඉදින්, 'මම ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරැලා, මහණ ගොයුම් හමුවට යන්නෙමි' යි ඔහුට මෙසේ සිතක් වතොත් (එසේ යතොත්), ඔහු හිස ද ගිලිහෙතැ'' යි මට සැළ කෙළේ ය,

සුනක්ඛත්තය, මෙසේ මා විසින් අචේලක පාථිකපුත්‍ර තෙමෙ 'ඒ තෙප්ල නො හැරපියා,ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරැලා මහණ ගොයුම් හමුවට යන්නෙමි' යි ඔහුට මෙසේ සිතක් වතොත් (එසේ එතොත්), ඔහු හිස ද ගිලිහෙතැ' යි පාථිකපුත්‍ර තෙමේ ඔහු සිත් මා සිතින් පිරිසිඳ මා විසින් ද දන්නා ලද්දේ වෙයි. දෙවතා කෙනෙක් ද 'වහන්ස, අචේලක පාථිකපුත්‍ර තෙමෙ ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරැලා, භාග්‍යවතුන් වහන්සේ හමුවට එන්නට නො සුදුස්සේ ය. ඉදින් ඔහුට 'මම ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට නො දුරැලා, මහණ ගොයුම් හමුවට යන්නෙමි'යි මෙසේ සිතක් වතොත්, (එසේ ම යතොත්) ඔහු හිස ගිලිහෙතැ යි' ද මට මෙ පවත් සැළ කළහ. සුනක්ඛත්තය, ඒ මම විසල්පුරැ පිඬු පිණිස හැසිරැ, පසුබත්හි පිඩුපායෙන් පෙරළා ඇක්මුණෙම්, දිවා විහාරය පිණිස, අචේලක පාථිකපුත්‍රයාගේ ආරාමය කරා යන්නෙමි. සුනක්ඛත්තය, දැන් තෝ මෙ පවත් යමකුට සැළ කරනු රිස්සෙහි නම් ඔහුට සැළ කරව' යි කීමි.

## ඉද්ධිපාටිහාරියකථා

18. අථ ඛ්වාහං[1] භග්ගව පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලිං පිණ්ඩාය පාවිසිං. වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන අචෙලස්ස පාථිකපුත්තස්ස ආරාමො තෙනුපසඞ්කමිං දිවාවිහාරාය. අථ ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො තරමානරූපො වෙසාලිං පවිසිත්වා යෙන අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අභිඤ්ඤාතෙ අභිඤ්ඤාතෙ ලිච්ඡවී එතදවොච: එසාවුසො භගවා වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන අචෙලස්ස පාථිකපුත්තස්ස ආරාමො තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අභික්කමථායස්මන්තො අභික්කමථායස්මන්තො. සාධුරූපානං සමණානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං භවිස්සතී ති.

අථ ඛො භග්ගව අභිඤ්ඤාතානං අභිඤ්ඤාතානං ලිච්ඡවීනං එතදහොසි: සාධුරූපානං කිර භො සමණානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං භවිස්ස ති. හන්ද වත භො ගච්ඡාමා ති.

අථ ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙන අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා ගහපතිනෙචයිකා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා[2] තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා අභිඤ්ඤාතෙ අභිඤ්ඤාතෙ නානාතිත්ථියෙ සමණබ්‍රාහ්මණෙ එතදවොච: එසාවුසො භගවා වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන අචෙලස්ස පාථිකපුත්තස්ස ආරාමො තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අභික්කමථායස්මන්තො අභික්කමථායස්මන්තො. සාධුරූපානං සමණානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං භවිස්සතී ති. අථ ඛො භග්ගව අභිඤ්ඤාතානං අභිඤ්ඤාතානං නානාතිත්ථියානං සමණබ්‍රාහ්මණානං එතදහොසි: සාධුරූපානං කිර භො සමණානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං භවිස්සති. හන්ද වත භො ගච්ඡාමා''ති.

19. අථ ඛො භග්ගව අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ච බ්‍රාහ්මණමහාසාලා ගහපතිනෙචයිකා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා යෙන අචෙලස්ස පාථිකපුත්තස්ස ආරාමො තෙනුපසඞ්කමිංසු. සා එසා භග්ගව පරිසා හොති[3] අනෙකසතා අනෙකසහස්සා. අස්සොසි ඛො භග්ගව අචෙලො පාථිකපුත්තො 'අභික්කන්තා කිර අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී, අභික්කන්තා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ච බ්‍රාහ්මණමහාසාලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ච බ්‍රාහ්මණමහාසාලා ගහපතිනෙචයිකා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා, සමණො පි ගොතමො මය්හං ආරාමෙ දිවාවිහාරං නිසින්නො'ති. සුත්වානස්ස භයං ඡම්භිතත්තං ලොමහංසො උදපාදි.

1. අථ ඛො සචාහං (ස්‍යා)
2. නානාතිත්ථිය සමණබ්‍රාහ්මණා (ස්‍යා)
3. මහා හොති (මජසං)

## ඍද්ධිප්‍රාතිහාර්ය කථා

18. භාර්ගවය, එ කල්හි මම පෙර වරුයෙහි හැඳ පෙරෙව, පා සිවුරු ගෙන පිඬු පිණිස විසල්පුරට පිවිසියෙමි. විසල්පුර පිඬු පිණිස හැසිර පිණ්ඩපාතයෙන් පෙරළා ඇක්මුණෙම, පසුබත්හි දිවාවිහරණය පිණිස අචෙලක පාථිකපුත්‍රයාගේ ආරාමය කරා ගියෙමි. භාර්ගවය, එ කල්හි ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙම වෙළෙවි වෙළෙවි වැ විසල්පුර වැද, ප්‍රකට ප්‍රකට ලිච්ඡවීන් කරා එළැඹියේ ය. එළැඹ, 'ඇවැත්නි, තෙල භාග්‍යවතුන් වහන්සේ විසල්පුර පිඬු පිණිස හැසිර, පිණ්ඩපාතයෙන් පෙරළා ඇක්මුණාහු පසුබත්හි දිවාවිහරණ පිණිස අචෙලක පාථිකපුත්‍රයාගේ ආරාමය කරා වැඩි සේක. ආයුෂ්මත්නි, එහි යවු. සාධු සවභාවය ඇති මහණුන් ගේ උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහරෙක් වන්නේ යැ' යි කී ය.

භාර්ගවය, එ විටැ ඒ ප්‍රකට ප්‍රකට ලිච්ඡවීනට, 'සාධුරූප වූ මහණුන් ගේ උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහරක් වන්නේ ල. භවත්නි, දැන් එහි යමහ' යි මේ සිත විය.

ඉක්බිති ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙමෙ ප්‍රකට ප්‍රකට නන් තොටු මහණ බමුණන් ද කරා එළැඹැ, 'ඇවැත්නි, තෙල භාග්‍යවතුන් වහන්සේ විසල් පුර පිඬු පිණිස හැසිර, පිණ්ඩපාතයෙන් පෙරළා ඇක්මුණාහු, පසුබත්හි- දිවාවිහරණය පිණිස අචෙලක පාථිකපුත්‍රයා ගේ ආරාමයට වැඩි සේක. ආයුෂ්මත්නි, එහි යවු, ආයුෂ්මත්නි, එහි යවු, සාධු සවභාවය ඇති මහණුන්ගේ උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහරෙක් වන්නේ යැ' යි සැළ කෙළේ ය. භාර්ගවය, එ කලැ ඒ ප්‍රකට ප්‍රකට නන්තොටුවනට, මහණ- බමුණනට 'භවත්නි, සාධුරූප වූ මහණුන්ගේ උතුරු මිනිස් දහමින් ඉද්ධි පෙළහරෙක් වන්නේ ල. භවත්නි, දැන් එහි යමහ' යි මේ සිත විය.

19. භාර්ගවය, එ කලැ ප්‍රකට ප්‍රකට ලිච්ඡවීහු ද, ප්‍රකට ප්‍රකට බමුණු මහසල්හු ද, ගැහැවි මහසල්හු ද, නන් තොටුවෝ ද, මහණබමුණෝ ද පාථිකපුත්‍ර අචෙලකයා ගේ ආරාමය කරා එළැඹියහ. භාර්ගවය, ඒ නොයෙක් සිය ගණන් නොයෙක් දහස් ගණන් ජනයා ඇති පිරිසෙක් විය. භාර්ගවය, පාථිකපුත්‍ර අචෙලක තෙමෙ 'ප්‍රකට ප්‍රකට ලිච්ඡවීන් ආහ යි, ප්‍රකට ප්‍රකට බමුණු මහසලුන් ද ගැහැවි මහසලුන් ද නන් තොටු මහණ- බමුණන් ද ආහ' යි, මහණ ගොයුම්හු ද මා අරමෙහි දිවාවිහාර පිණිස හුන්හ යි ද ඇසී ය. ඇසීමෙන් ඔහුට බිය ද තැති ගැන්ම ද ලොමුදහ ගැන්ම ද උපන.

20. අථ ඛො භගව අචෙලො පාථිකපුත්තො භීතො සංවිග්ගො ලොමහට්ඨජාතො යෙන තින්දුකඛාණුපරිබ්බාජකාරාමො[1] තෙනුපසඞ්කමි. අස්සොසි ඛො භගව සා පරිසා 'අචෙලො කිර පාථිකපුත්තො භීතො සංවිග්ගො ලොමහට්ඨජාතො යෙන තින්දුකඛාණුපරිබ්බාජකාරාමො තෙනුපසඞ්කන්තො' ති. අථ ඛො භගව සා පරිසා අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: එහි ත්වං භො පුරිස, යෙන තින්දුඛාණුපරිබ්බාජකාරාමො යෙන අචෙලො පාථික පුත්තො තෙනුපසඞ්කම්, උපසඞ්කමිත්වා අචෙලං පාථිකපුත්තං එවං වදෙහි: අභික්කමාවුසො පාථිකපුත්ත. අභික්කන්තා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී, අභික්කන්තා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ච බ්‍රාහ්මණමහාසාලා ගහපතිනෙචයිකා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා, සමණො පි ගොතමො ආයස්මතො ආරාමෙ දිවාවිහාරං නිසින්නො. භාසිතා ඛො පන තෙ එසා ආවුසො පාථිකපුත්ත වෙසාලියං පරිසතිං වාචා: සමණො පි ගොතමො ඤාණවාදෙ අහම්පි ඤාණවාදෙ. ඤාණවාදෙ ඛො පන ඤාණවාදෙන අරහති උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං දස්සෙතුං. සමණො චෙ ගොතමො උපඩ්ඪපථං ආගච්ඡෙය්‍ය, අහම්පි උපඩ්ඪපථං ගච්ඡෙය්‍යං. තෙ තත්ථ උභො පි උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරෙය්‍යාම. එකං චෙ සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති, ද්වාහං කරිස්සාමි, ද්වෙ චෙ සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියානි කරිස්සති, චත්තාරාහං කරිස්සාමි. චත්තාරි චෙ සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියානි කරිස්සති, අට්ඨාහං කරිස්සාමි. ඉති යාවතකං සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපටිහාරියං කරිස්සති, තද්දිගුණං තද්දිගුණාහං කරිස්සාමී''ති. අභික්කමස්සව[2] ඛො ආවුසො පාථිකපුත්ත උපඩ්ඪපථං. සබ්බපඨමං යෙව ආගන්ත්වා සමණො ගොතමො ආයස්මතො ආරාමෙ දිවාවිහාරං නිසින්නො'ති

1. තිණ්ඩුකඛාණු (මජසං)
2. අභික්කමස්සෙව PTS

20. භාර්ගවය, එ කලැ වනාහි අචේලක පාථිකපුත්‍ර තෙමේ බිය පත් වූයේ, බියෙන් කලකිරුණේ, උපන් ලොමුදහ ගැනුම් ඇත්තේ, තින්දුකඛාණු පරිව්‍රාජකයා ගේ (තිඹිරිකණු පිරිවැජ්ජා ගේ) ආරාමය කරා ගියේ ය. භාර්ගවය, අචෙලක පාථිකපුත්‍ර තෙමේ බිය පත්තේ, බියෙන් කලකිරුණේ, හටගත් ලොමුදහ ගැනුම් ඇත්තේ, තිඹිරිකණු පිරිවැජ්ජා ගේ ආරාමය කරා ගියේ ලැ' යි ඒ පිරිස ඇසූහු ම ය. භාර්ගවය ඉක්බිති එ පිරිස එක් පුරුෂයකු බණවා, 'භවත් පුරුෂය, මෙහි එව, තිඹිරිකනු පිරිවැජ්ජාගේ අරමට, අචෙලක පාථිකපුත්‍රයා වෙතට යා. ගොස්, අචෙලක පාථිකපුත්‍රයාට, 'ඇවැත් පාථිකපුත්‍රයෙනි, නැඟී එවු. ප්‍රකට ප්‍රකට ලිච්ඡවීහු ඔබ අරමැ රැස් වූහ. ප්‍රකට ප්‍රකට බමුණු මහසල්හු ද ගැහැවි මහසල්හු ද නන්-තොවුවෝ ද මහණබමුණෝ ද (ඔබ අරමැ) රැස් වූහ. මහණ ගොයුම්හු ද ආයුෂ්මතුන් ගේ ආරාමයෙහි දිවාවිහරණය පිණිස අවුත් උන්හ. ඇවැත් පාථිකපුත්‍රයෙනි, විසල්පුර පිරිස් මැද දී ඔබ විසින් "මහණ ගොයුම් ඥානවාද ඇත්තේ ය, මම ද ඥානවාද ඇතියෙමි. ඥානවාද ඇත්තේ ඥානවාද ඇත්තකු හා උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර දක්වන්නට සුදුස්සේ ය. මහණ ගොයුම් වාද පිණිස අඩ මඟක් එන්නේ නම්; මමත් අඩ මඟක් ඉදිරියට යන්නෙමි. එහිදී ඒ අපි දෙ දෙනා ම උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර කරන්නමු. මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් එක් ඉදු පෙළහරක් කරන්නේ නම්, මම ඉදු පෙළහර දෙකක් කරන්නෙමි. මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර දෙකක් කරන්නේ නම්, මම සතරක් කරන්නෙමි, මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර සතරක් කරන්නේ නම්, මම අටක් කරන්නෙමි. මෙසේ මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් යම් පමණ පෙළහර කරන්නේ ද, මම එමෙන් දෙගුණ දෙගුණ ඉදු පෙළහර කරන්නෙමි'' යි මෙ තෙපුල් කියන ලද්දේ ය. "ඇවැත් පාථිකපුත්‍රයිනි, අඩ මඟක් නැඟී එවු. හැමට පළමු ම මහණ ගොයුම්හු අවුත්, ආයුෂ්මතුන් ගේ ආරාමයෙහි දිවාවිහරණය පිණිස ඉන්නාහ'යි මෙසේ කියව'' යි කියා යැවූහ.

“එවං භො”ති ඛො භග්ගව සො පුරිසො තස්සා පරිසාය පටිස්සුත්වා යෙන තින්දුකඛාණුපරිබ්බාජකාරාමො යෙන අචෙලො පාථිකපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අචෙලං පාථිකපුත්තං එතදවොච: අභික්කමාවුසො පාථිකපුත්ත. අභික්කන්තා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී අභික්කන්තා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ච බ්‍රාහ්මණමහාසාලා ගහපතිනෙචයිකා නානාතිත්ථියා සමණබ්‍රාහ්මණා සමණො පි ගොතමො ආයස්මතො ආරාමෙ දිවාවිහාරං නිසින්නො. භාසිතා ඛො පන තෙ එසා ආවුසො පාථිකපුත්ත වෙසාලියං පරිසතිං වාචා: සමණො පි ගොතමො ඤාණවාදො අහම්පි ඤාණවාදො. ඤාණවාදො ඛො පන ඤාණවාදෙන අරහති උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං දස්සෙතුං -පෙ- ඉති යාවතකං සමණො ගොතමො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති තද්දිගුණං තද්දිගුණාහං කරිස්සාමී”ති. අභික්කමස්සෙව ඛො ආවුසො පාථිකපුත්ත උපඩ්ඪපථං. සබ්බපඨමං යෙව ආගන්ත්වා සමණො ගොතමො ආයස්මතො ආරාමෙ දිවාවිහාරං නිසින්නො”ති.

21. එවං වුත්තෙ භග්ගව අචෙලො පාථිකපුත්තො ‘ආයාමි ආවුසො ආයාමි ආවුසො’ති වත්වා තත්ථෙව සංසප්පති. න සක්කොති ආසනාපි වුට්ඨාතුං. අථ ඛො භග්ගව සො පුරිසො අචෙලං පාථිකපුත්තං එතදවොච: කිංසු නාම තෙ ආවුසො පාථිකපුත්ත පාවළා[1] සු නාම තෙ පීඨකස්මිං අල්ලීනා පීඨකං සු නාම තෙ පාවළාසු අල්ලීනං? ‘ආයාමි ආවුසො, ආයාමි ආවුසො’ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනා පි වුට්ඨාතුන්ති. එවම්පි ඛො භග්ගව වුච්චමානො අචෙලො පාථිකපුත්තො ‘ආයාමි ආවුසො, ආයාමි ආවුසො’ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනා පි වුට්ඨාතුං. යදා ඛො සො භග්ගව පුරිසො අඤ්ඤාසි ‘පරාභූතරූපො අයං අචෙලො පාථිකපුත්තො, ‘ආයාමි ආවුසො ආයාමි ආවුසො’ති වත්වා තත්ථෙව සංසප්පති. න සක්කොති ආසනාපි වුට්ඨාතුන්ති, අථ තං පරිසං ආගන්ත්වා එවමාරොචෙසි: පරාභූතරූපො භො අයං අචෙලො පාථිකපුත්තො, ‘ආයාමි ආවුසො, ආයාමි ආවුසො’ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනා පි වුට්ඨාතුන්ති.

එවං වුත්තෙ අහං භග්ගව තං පරිසං එතදවොචං: අභබ්බො ඛො ආවුසො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි’ස්ස එවමස්ස ‘අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති, මුද්ධා පි තස්ස විපතෙය්‍යා”ති.

පඨමභාණවාරො නිට්ඨිතො.

1. පාවුළා -සිමු-

භාර්ගවය, 'එසේ යැ භවත්නි'යි කියා ම ඒ පුරුෂ තෙම එ පිරිසට පිළිවදන් දී, තිඹිරිකණු පිරිවැජ්ජාගේ අරම කරා, අචේලක පාථිකපුත්‍රයා වෙතට ගියේ ය. ගොස් ඔහු බණවා, 'ඇවැත් පාථිකපුත්‍රයිනි, නැඟී එවු. ප්‍රකට ප්‍රකට ලිච්ඡවීහු ද අවුත් රැස් වූවාහු වෙත්, ප්‍රකට ප්‍රකට බමුණු මහසල්හු ද ගැහැවි මහසල්හු ද නන් තොටුවෝ ද මහණබමුණෝ ද අවුත් රැස් වූවාහු වෙත්. මහණ ගොයුම්හු ද ආයුෂ්මතුන් ගේ ආරාමයෙහි දිවාවිහරණය පිණිස අවුත් උන්නාහු වෙත්. ඇවැත්නි, ඔබ විසින් විසල්පුර පිරිස් මැද දී 'මහණ ගොයුම් ද ඥානවාද ඇත්තේ ය, මම ද ඥානවාද ඇත්තෙමි. ඥානවාද ඇත්තේ වූ කලි ඥානවාද ඇත්තක්හු හා උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර දක්වන්නට සුදුස්සේ ය, මෙසේ යම් පමණ මහණ ගොයුම් උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර කරන්නේ ද, එමෙන් දෙගුණ දෙගුණ මම් ඉදු පෙළහර කරන්නෙමි යි මේ තෙප්ල කියන ලද්දේ ය. ඇවැත්නි, පාථිකපුත්‍රයෙනි, අඩ මහක් නැඟී එවු. හැමට පෙරාතුව ම මහණ ගොයුම්හු අවුත් ආයුෂ්මතුන්ගේ ආරාමයෙහි දිවාවිහරණ පිණිස ඉන්නාහු වෙති''යි කී ය.

21. භාර්ගවය, ඔහු මෙසේ කී කලැ පාථිකපුත්‍ර අචේලක තෙමේ 'ඇවැත්නි එමි, ඇවැත්නි, එමි'යි කියා එතැන ම ගැලී, ඒ මේ අතට සැලෙයි. හුන් තැනින් නැඟෙන්නට ද නොහැකි වෙයි. භාර්ගවය, ඉක්බිති ඒ පුරුෂ තෙමේ අචේලක පාථිකපුත්‍රයාට, ''ඇවැත් පාථික පුත්‍රයෙනි, කිමෙක් ද? ඔබේ හිද්මඇට හුන් තැනැ ඇලුණේ ද? ඔබ හුන් තැන හෝ ඔබේ හිද්මඇටෙහි ඇලුණේ ද? 'ඇවැත්නි එමි, ඇවැත්නි එමි' යි කියා ඔහි ම ගැලී ඒ මේ අතට සැලෙති. හුනස්නෙන් නැඟෙන්නට දු නොහැකි වෙති'' යි කීය.

භාර්ගවය, අචේලක පාථිකපුත්‍ර තෙමේ මෙසේ කියනු ලබන්නේ ද, 'ඇවැත්නි එමි, ඇවැත්නි එමි' යි කියා එහි ම ගැලී ඒ මේ අතට සැලෙයි, හුනස්නෙනුදු නැංග නො හෙයි. ඒ පුරුෂ තෙම ''මේ අචේලක පාථික-පුත්‍රයා පැරැදුණු සැහැවි (හෝ නටුවාවු සැහැවි) ඇත්තේ ය: ඇවැත්නි එමි, ඇවැත්නි එමි'යි කියා එහි ම ගැලී ඒ මේ අත සැලෙයි. හුනස්නෙනුදු නො නැංග හේ' යැ යි යම් විටෙක දැනගත්තේ ද, එ විට ඒ පිරිස කරා අවුත්, 'භවත්නි, මේ අචේලක පාථිකපුත්‍ර පැරැදුණු සැහැවි ඇත්තේ ය; 'ඇවැත්නි එමි, ඇවැත්නි එමි'යි එ තැනැ මැ ගැලී ඒ මේ අත සැලෙයි. හුනස්නෙනුදු නො නැංග හේ'' යැ යි මෙසේ සැළ කෙළේ ය.

භාර්ගවය, ඔහු මෙසේ කී කල්හි, මම ඒ පිරිස බණවා, 'ඇවැත්නි, අචේලක පාථිකපුත්‍ර තෙමෙ ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට්‍ඨි බැහැර නො කොට, මා හමුවට එන්නට නො සුදුසු ය. ඉදින් ඔහුට, 'මම ඒ තෙප්ල නො පියා, ඒ සිත නො පියා, ඒ දිට්‍ඨි බැහැර නො කොට, මහණ ගොයුම්හු හමුවට යන්නෙමි'යි මෙසේ සිතෙක් වන්නේ නම්, ඔහු ගේ හිස ද ගිලිහෙන්නේ යැ' යි මෙ පවත් කීමි.

පළමු බණවර නිමියේ ය.

22. අථ ඛො භග්ගව අඤ්ඤතරො ලිච්ඡවී මහාමත්තො උට්ඨායාසනා තං පරිසං එතදවොච: තෙන හි භො මුහුත්තං තාව ආගමෙථ යාවාහං ගච්ඡාමි. අප්පෙවනාම අහම්පි සක්කුණෙය්‍යං අචෙලං පාථිකපුත්තං ඉමං පරිසං ආනෙතුන්ති. අථ ඛො සො භග්ගව ලිච්ඡවී මහාමත්තො යෙන තින්දුකඛාණුපරිබ්බාජකාරාමො යෙන අචෙලො පාථිකපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා අචෙලං පාථිකපුත්තං එතදවොච. අභික්කමාවුසො පාථිකපුත්ත, අභික්කන්තං තෙ සෙය්‍යො, අභික්කන්තා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී -පෙ- සමණො පි ගොතමො ආයස්මතො ආරාමෙ දිවාවිහාරං නිසින්නො. භාසිතා ඛො පන තෙ එසා ආවුසො පාථිකපුත්ත වෙසාලියං පරිසතිං වාචා 'සමණො පි ගොතමො ඤාණවාදො -පෙ- තංදිගුණං තංදිගුණාහං කරිස්සාමී'ති. අභික්කමස්සෙව ඛො ආවුසො පාථිකපුත්ත උපඩ්ඪපථං. සබ්බපඨමඤ්ඤෙව ආගන්ත්වා සමණො ගොතමො ආයස්මතො ආරාමෙ දිවා විහාරං නිසින්නො භාසිතා ඛො පනෙසා ආවුසො පාථිකපුත්ත, සමණෙන ගොතමෙන පරිසතිං වාචා: 'අභබ්බො ඛො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි'ස්ස එවමස්ස අහං තං වාචං අප්පහාය -පෙ- සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති, මුද්ධා පි තස්ස විපතෙය්‍යා'ති. අභික්කමාවුසො පාථිකපුත්ත, අභික්කමනෙනෙව තෙ ජයං කරිස්සාම, සමණස්ස ගොතමස්ස පරාජයන්ති.''

එවං වුත්තෙ භග්ගව අචෙලො පාථිකපුත්තො 'ආයාමි ආවුසො ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පති න සක්කොති ආසනා පි වුට්ඨාතුං. අථ ඛො භග්ගව ලිච්ඡවී මහාමත්තො අචෙලං පාථිකපුත්තං එතදවොච: කිං සු නාම තෙ ආවුසො පාථිකපුත්ත, පාවළා සු නාම තෙ පීඨකස්මිං අල්ලීනා, පීඨකං සු නාම තෙ පාවළාසු අල්ලීනං? 'ආයාමි ආවුසො, ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පසි, න සක්කොසි ආසනා පි වුට්ඨාතුන්ති.

එවම්පි ඛො භග්ගව වුච්චමානො අචෙලො පාථිකපුත්තො 'ආයාමි ආවුසො, ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනාපි වුට්ඨාතුං. යද ඛො සො භග්ගව ලිච්ඡවී මහාමත්තො අඤ්ඤාසි පරාභූතරූපො අයං අචෙලො පාථිකපුත්තො, ආයාමි ආවුසො, ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනාපි වුට්ඨාතුන්ති, අථ තං පරිසං ආගන්ත්වා එවමාරොචෙසි: පරාභූතරූපො භො අචෙලො පාථිකපුත්තො, 'ආයාමි ආවුසො ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනා පි වුට්ඨාතුන්ති.

22. භාග්ගවය, එ කලැ එක්තරා ලිච්ඡවී මහ ඇමැත්තෙක් හුනස්නෙන් නැඟ, ඒ පිරිස අමතා, ''භවත්නි, එසේ වී නම්, මා ගොස් එන තාක් තව මොහොතක් බලවු. මමත් ගොස් අචේලක පාථිකපුත්‍රයා මෙ පිරිස කරා ගෙන එන්නට හැකි වීම් නම්, ඒ ඉතා යෙහෙකැ''යි කීය. භාග්ගවය,ඉක්බිති ඒ ලිච්ඡවී මහ ඇමැත්තා තිඹිරිකණ්ඩු පිරිවැජියා අරමට, අචේලක පාථිකපුත්‍රයා වෙතට ගියේ ය. ගොස් ඔහු අමතා, 'ඇවැත් පාථිකපුත්‍රයෙනි, නැඟී එන්න. ඔබ නැඟී ආවොත් ඒ මැනැව. ප්‍රකට ප්‍රකට ලිච්ඡවීහු අවුත් රැස් වැ උන්නාහ ... මහණ ගොයුම්හු ද ආයුෂ්මතුන් ගේ ආරාමයෙහි දිවා–විහරණ පිණිස හුන්හ. ඇවැත්නි, පාථිකපුත්‍රයෙනි, 'මහණ ගොයුම් ද ඥානවාද ඇත්තේ ය, මම් ද ඥානවාද ඇත්තෙමි ... මම් එ මෙන් දෙගුණයක් දෙගුණයක් ඉද්ධි පෙළහර කරන්නෙමි'යි විසල් පුරැ පිරිසෙහි මේ තෙප්ල ඔබ විසින් කියන ලද ය. ඇවැත්නි, පාථිකපුත්‍රයෙනි, අඩමඟක් නැඟී එන්න. මහණ ගොයුම්හු හැමට පළමු ම අවුත් ආයුෂ්මතුන් ගේ ආරාමයෙහි දිවාවිහරණ පිණිස හුන්හ. ඇවැත්නි, පාථිකපුත්‍රයෙනි, 'අචේලක පාථික–පුත්‍රයා ඒ වචනය නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට්ඨි බැහැර නො කොට මා හමුවට එන්නට නො නිස්ස. ඉදින් ඔහුට, 'එ වචන නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට්ඨි බැහැර නො කොට මහණ ගොයුම් හමුවට යන්නෙමි' යි මෙසේ සිතක් වුවොත් ඔහු හිස ද ගිලිහෙතැ'යි මහණ ගොයුමන් විසින් පිරිස මැද්‍ද මේ වචනය කියන ලද ම ය. ඇවැත්නි, පාථිකපුත්‍රයෙනි, නැඟී එන්න. නැඟී ඊම් පමණින් ඔබට ජය ලබවන්නමු, මහණ ගොයුමනට පරාජය කරන්නමු'' යි මෙ තෙපුල් කීය.

භාග්ගවය, ඔහු එසේ කී කල්හි අචේලක පාථිකපුත්‍ර 'ඇවැත්නි එමි, ඇවැත්නි එමි' යි කියා එහි ම ගැලී සැලෙයි. හුනස්නෙනුදු නො නැංග හෙයි. භාග්ගවය, එ කල්හි ලිච්ඡවී මහ ඇමැති අචේලක පාථිකපුත්‍රයා බණවා ''කිමෙක් ද ඇවැත්නි පාථිකපුත්‍රයෙනි, ඔබ හිද්මඇට හුන්තැන්හි ඇලීගත්තේ ද? නැත හොත් හුන් තැන ඔබ හිද්මෙහි ඇලීගත්තේ ද? එමි ඇවැත්නි, එමි ඇවැත්නි'යි කියා එහි ම ගැලී සැලෙති, හුන් තැනිනුදු නො නැංග හෙති'' කී ය.

භාග්ගවය, මෙසේ කියනු ලබනුයේ ද අචේලක පාථිකපුත්‍ර 'ඇවැත්නි එමි, ඇවැත්නි එමි' යි එහිම ගැලී සැලෙයි. හුනස්නෙනුදු නො නැංගැ හෙයි. භාග්ගවය, ඒ ලිච්ඡවී මහමැති තෙමෙ 'මේ අචේලක පාථිකපුත්‍ර පැරැදුණු සැහැවි ඇතියේ ය. 'එමි ඇවැත්නි, එමි ඇවැත්නි'යි එහි ම ගැලී සැලෙයි, හුනස්නෙනුදු නො නැංගැ හේ' යැ යි දත් කෙණෙහි ම ඒ පිරිස කරා අවුත් භවත්නි' අචේලක පාථික පුත්‍ර පැරැදුණු සැහැවී ඇත්තේ, 'ඇවැත්නි එමි, ඇවැත්නි එමි' යි එහි ම ගැලී සැලෙයි, හුනස්නෙන් නො නැංග හේ' යැ යි සැළ කෙළේ ය.

23. එවං වුත්තෙ අහං භග්ගව තං පරිසං එතදවොචං: අභබ්බො ඛො ආවුසො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය -පෙ- මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි'ස්ස එවමස්ස: අහං තං වාචං අප්පහායං-පෙ- සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති මුද්ධා පි තස්ස විපතෙය්‍ය, සචෙ පායස්මන්තානං ලිච්ඡවීනං එවමස්ස: 'මයං අචෙලං පාථිකපුත්තං වරත්තාහි බන්ධිත්වා ගොයුගෙහි ආවිඤ්ඡෙය්‍යාමා,ති[1], තා වරත්තා ඡිජ්ජෙරං පාථිකපුත්තො වා. අභබ්බො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය -පෙ- සචෙ පි'ස්ස එවමස්ස 'අහං තං වාචං අප්පහාය -පෙ- සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති මුද්ධා පි තස්ස විපතෙය්‍යා''ති.

අථ ඛො භග්ගව ජාලියො දරුපත්තිකන්තෙවාසී උට්ඨායාසනා තං පරිසං එතදවොච: තෙන හි භො මුහුත්තං තාව ආගමෙථ යාවාහං ගච්ඡාමි, අප්පවනාම අහම්පි සක්කුණෙය්‍යං අචෙලං පාථිකපුත්තං ඉමං පරිසං ආනෙතුන්ති. අථ ඛො භග්ගව ජාලියො දරුපත්තිකන්තෙවාසී යෙන තින්දුකඛාණුපරිබ්බාජකාරාමො යෙන අචෙලො පාථිකපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අචෙලං පාථිකපුත්තං එතදවොච: අභික්කමාවුසො පාථිකපුත්ත. අභික්කන්තං තෙ සෙය්‍යො. අභික්කන්තා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී -පෙ- සමණො පි ගොතමො ආයස්මතො ආරාමෙ දිවාවිහාරං නිසින්නො. භාසිතා ඛො පන තෙ ආවුසො පාථිකපුත්ත වෙසාලියං පරිසතිං වාචා: "සමණො පි ගොතමො ඤාණවාදෙ -පෙ- තංදිගුණං තංදිගුණාහං කරිස්සාමී''ති. අභික්කමස්සෙව ආවුසො පාථිකපුත්ත උපඩ්ඪපථං. සබ්බපඨමඤ්ඤෙව ආගන්ත්වා සමණො ගොතමො ආයස්මතො ආරාමෙ දිවාවිහාරං නිසින්නො. භාසිතා ඛො පන තෙ එසාවුසො පාථිකපුත්ත සමණෙන ගොතමෙන පරිසතිං වාචා: "අභබ්බො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය -පෙ- සචෙ පි'ස්ස එවමස්ස "අහං තං වාචං අප්පහාය -පෙ- සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍ය''න්ති, මුද්ධාපි තස්ස විපතෙය්‍ය. සචෙ 'පායස්මන්තානං ලිච්ඡවීනං එවමස්ස: මයං අචෙලං පාථිකපුත්තං වරත්තාහි බන්ධිත්වා ගොයුගෙහි ආවිඤ්ඡෙය්‍යාමා ති, තා වරත්තා ඡිජ්ජෙරං පාථිකපුත්තො වා. අභබ්බො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි'ස්ස එවමස්ස "අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ආගච්ඡෙය්‍යන්ති මුද්ධා පි තස්ස විපතෙය්‍යා''ති. අභික්කමාවුසො පාථිකපුත්ත, අභික්කමනෙනෙව තෙ ජයං කරිස්සාම, සමණස්ස ගොතමස්ස පරාජයන්ති.

1. ආවිඤ්ඡෙය්‍යාමාති (සීමු)

23. භාර්ගවය, ඔහු එසේ කී කලැ මම ඒ පිරිස අමතා, "ඇවැත්නි, අචේලක පාථිකපුත්‍ර ඒ තෙප්ල නො පියා ... මා හමුවට එන්නට නො හිස්ස. ඉදින් ඔහුට 'මම ඒ තෙප්ල නො හැරපියා ... මහණ ගොයුම් හමුවට යන්නෙමි'යි මෙසේ සිතක් වතොත්, ඔහු හිස ද ගිලිහෙන්නේ ය. ඉදින් ආයුෂ්මත් ලිච්ඡවීනට 'අපි අචේලක පාථිකපුත්‍රයා වරපටින් බැඳ ගොනුන් යෙදූ වියෙන් 'ඇද ගෙන එන්නමු' යි මෙසේ සිතක් වතොත්, ඒ වරපට සිඳෙන්නේ ය. බත් තැනිත් පාථිකපුත්‍ර හෝ බිඳී වෙන් වන්නේ ය. හේ ඒ තෙප්ල නො හැරපියා... මා හමුවට එන්නට නො නිස්ස. ඉදින් 'මම ඒ තෙප්ල නො හැරපියා ... මහණ ගොයුම් හමුවට යන්නෙමි'යි ඔහුට මෙසේ සිතක් වතොත් ඔහු ගේ හිස ද ගිලිහෙන්නේ යැ' යි කීමි.

භාර්ගවය, එ කල්හි දරුපාත්‍රික පිරිවැජියක්හු අතැවැසි ජාලිය නමැත්තෙක් හුනස්නෙන් නැඟී, "භවත්නි, එසේ වී නම් මා එන තුරු මොහොත්තමක් බලවූ. අචේලක පාථිකපුත්‍රයා මෙ පිරිස කරා ගෙන එන්නට මම වත් හැකි වීම නම් යෙහෙකැ' යි කී ය. භාර්ගවය, ඉක්බිති දරුපාත්‍රික පිරිවැජ්ජහු අතැවැසි ජාලිය තෙමේ තිඹිරිකණ්ඩු පිරිවැජ්ජා අරම යම් තැනෙක ද, (එහි) අචේලක පාථිකපුත්‍රයා යම් තැනෙක ද එ තැනට ගියේ ය. ගොස් ඔහු බණවා, 'ඇවැත් පාථිකපුත්‍රයෙනි, නැඟී එවූ. ඔබ නැඟී අව උතුම. ප්‍රකට ප්‍රකට ලිච්ඡවීහු ... අවුත් රැස් වැ ඉඳිති. මහණ ගොයුම්හු ද දිවාවිහරණ පිණිස අවුත් ආයුෂ්මතුන් ගේ ආරාමයෙහි උන්නාහු වෙත්. ඇවැත්නි, ඔබ විසින් විසල්පුර මහ පිරිස් මැද දී 'මහණ ගොයුම් ද ඥානවාද ඇත්තේ ය, මම් දු ඥානවාද ඇත්තෙමි ... ඔහු එක් ඉදු පෙළහරක් කළ විට මම් එ මෙන් දෙ ගුණයක් දෙ ගුණයක් ඉදු පෙළහර කරන්නෙමි' යි මේ වචන කියන ලදුයේ ම ය. ඇවැත්නි, පාථිකපුත්‍රයෙනි, අඩ මඟක් නැඟී එවූ. මහණ ගොයුම්හු හැමට පෙරාතු වැ මැ අවුත් අයුෂ්මතුන් ගේ ආරාමයෙහි දිවාවිහරණ පිණිස උන්නාහු වෙත්. ඇවැත් පාථිකපුත්‍රයෙනි, මහණ ගොයුමන් විසින් 'අචේලක පාථිකපුත්‍ර ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා ... මා හමුවට එන්නට නො නිස්ස. ඉදින් 'මම ඒ තෙප්ල නො හැරපියා...මහණ ගොයුම් හමුවට යන්නෙමි'යී ඔහුට සිතක් වතොත්, ඔහු හිස ද ගිලිහෙන්නේ ය. ඉදින් ආයුෂ්මත් ලිච්ඡවීනටත් 'අපි අචේලක පාථිකපුත්‍රයා වරපටින් බැඳ ගවයන් යෙදූ වියෙන් ඇදූ ගෙන එන්නමු'යි මෙසේ සිතෙක් වී නම් (එසේ කරන්නට තැත් කරන්නාහු නම්), ඒ වරපට සිඳී යන්නේ ය, පාථිකපුත්‍රයා හෝ බත් තැනිත් බිඳී වෙන් වන්නේ ය. අචේලක පාථිකපුත්‍රයාට 'ඒ තෙප්ල නො පියා, ඒ සිත නො පියා, ඒ දිට බැහැර නො කොට මහණගොයුම් හමුවට යන්නෙමි'යි මේ සිත වතොත් ඔහු හිස ගිලිහෙන්නේ යැ'යි මහපිරිස් මැද මෙ බස් තෙපලන ලද්දේ ය. ඇවැත්නි, පාථිකපුත්‍රයෙනි, නැඟී එවූ, නැඟී ඊමෙන් ම ඔබට ජය ද මහණ ගොයුම්හට පරාජය ද ලබවන්නමූ'යි කී ය.

එවං වුත්තෙ භගවා අචෙලො පාථිකපුත්තො 'ආයාමි ආවුසො ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනා'පි වුට්ඨාතුං, අථ ඛො භගවා ජාලියො දාරුපත්තිකන්තෙවාසී අචෙලං පාථිකපුත්තං එතදවොච: "කිං සු නාම තෙ ආවුසො පාථිකපුත්ත පාවළා සු නාම තෙ පීඨකස්මිං අල්ලීනා, පීඨකං සු නාම තෙ පාවළාසු අල්ලීන. ආයාමි ආවුසො, ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පසි, න සක්කොසි ආසනා පි වුට්ඨාතුන්ති?"

එවම්පි ඛො භගවා වුච්චමානො අචෙලො පාථිකපුත්තො 'ආයාමි ආවුසො, ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනා පි වුට්ඨාතුන්ති. යදා ඛො භගවා ජාලියො දාරුපත්තිකන්තෙවාසී අඤ්ඤාසි පරාභූතරූපො අයං අචෙලො පාථිකපුත්තො, 'ආයාමි ආවුසො, ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනා පි වුට්ඨාතුන්ති, අථ නං එතදවොච:

24. "භූතපුබ්බං ආවුසො පාථිකපුත්ත සීහස්ස මිගරඤ්ඤො එතදහොසි: යන්නූනාහං අඤ්ඤතරං වනසණ්ඩං නිස්සාය ආසයං කප්පෙය්‍යං, තත්‍රාසයං කප්පෙත්වා සායණ්හසමයං ආසයා නික්ඛමෙය්‍යං, ආසයා නික්ඛමිත්වා විජම්භෙය්‍යං, විජම්භිත්වා සමන්තා චතුද්දිසා අනුවිලොකෙය්‍යං, සමන්තා චතුද්දිසා අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදෙය්‍යං, තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමෙය්‍යං, සො වරං වරං මිගසඞ්ඝෙ[1] වධිත්වා මුදුමංසානි මුදුමංසානි භක්ඛයිත්වා තමෙව ආසයං අජ්ඣුපෙය්‍යන්ති. අථ ඛො සො සීහො මිගරාජා අඤ්ඤතරං වනසණ්ඩං නිස්සාය ආසයං කප්පෙසි. තත්‍රාසයං කප්පෙත්වා සායණ්හසමයං ආසයා නික්ඛමි. ආසයා නික්ඛමිත්වා විජම්භි. විජම්භිත්වා සමන්තා චතුද්දිසා අනුවිලොකෙසි. සමන්තා චතුද්දිසා අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදි. තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමි. සො වරං වරං මිගසඞ්ඝෙ වධිත්වා මුදුමංසානි මුදුමංසානි භක්ඛයිත්වා තමෙව ආසයං අජ්ඣුපෙසි.

1. මිගසඞ්ඝං (සිමු. ස්‍යා. කම)

භාර්ගවය, එසේ කී කල්හි අචේලක පාථිකපුත්‍ර තෙමේ 'එම් ඇවැත්නි, එම් ඇවැත්නි' යි එහි ම ගැලී සැලෙයි. හුනස්නෙන් නැඟෙනු ද නො හැකි වෙයි. භාර්ගවය, එ කල්හි දරුපාත්‍රිකාන්තේවාසී ජාලිය තෙමේ අචේලක පාථිකපුත්‍රයා අමතා, 'ඇවැත්නි, පාථිකපුත්‍රයෙනි, කිමෙක් ද? ඔබේ හිද්මඇට හුනස්නැ ඇලිගත්තේ ද? හුනස්න හෝ ඔබ හිද්ම ඇටෙහි ඇලිගත්තේ ද? 'ඇවැත්නි එම්, ඇවැත්නි එම්' යි උන් තැන්හිම ගැලී සැලෙහු. හුනස්නෙන් නැඟෙන්නට ද නො හැක්කහු'යැ යි කී ය. භාර්ගවය, එසේ කියනු ලබනුයේ ද, අචේලක පාථිකපුත්‍ර තෙමේ 'එම් ඇවැත්නි, එම් ඇවැත්නි'යි උන් තන්හි ම ගැලී සැලෙයි, හුනස්නෙන් නැඟෙනුවටද නො හැකි වෙයි.

භාර්ගවය, දරුපාත්‍රිකාන්තේවාසී ජාලිය තෙම 'මේ අචේලක පාථිකපුත්‍ර පැරදුණු සැහැවි ඇත්තේ ය. 'ඇවැත්නි එම්, ඇවැත්නි එම්'යි කියා එහි ම ගැලී සැලෙයි, හුනස්නෙන් නැඟෙනුවටද නො හැකි වේ' යැ යි දැනගත් කෙණෙහි, ඔහුට මෙ තෙපුල් කී ය:

24. "ඇවත් පාථිකපුත්‍රයෙනි පෙර වූවක් කියමි. මෘගරාජ වූ එක්තරා සිංහයකුට කිසි වන ලැහැබක් නිසා ලැග්මක් කැරගන්නෙමි වීම නම් යෙහෙක, එහි ලැග සවස් වේලේ ඒ ලැග්මෙන් නික්මෙන්නෙමි නම්, එසේ නික්මැ වැජඹෙන්නෙමි නම්, වැජැඹැ හාත්පස සිවු දිසා බලන්නෙමි නම්, හාත්පසැ සිවු දිසා බලා, තෙවරක් සිංහනාද කරන්නෙමි නම්, තෙ වරක් සිංහනාද කොට ගොදුරු පිණිස බැහැර යන්නෙමි නම්, මුව මුළුව අතුරෙන් හොඳ හොඳ මුවකු මරා මොළොක් මොළොක් මස් කා, ඒ ලැග්මට පෙරළා යන්නෙමි නම් යෙහෙකැ'යි මෙ සිත විය. එයින් පසු මෘගරාජ වූ ඒ සිංහ තෙමෙ එක්තරා වන ලැහැබක් නිසා ලැගුම් ගත. එහි සවස් වේලෙහි ඒ ලැග්මෙන් නික්මිණ. ලැග්මෙන් නික්මැ වැජැඹිණ. වැජැඹැ හාත්පස සිවු දිසා බැලී ය. හාත්පස සිවු දිසා බලා, තුන් වරක් සිංහනාද කෙළේ ය. තුන් වරක් සිංහනාද කොට, ගොදුරු සඳහා බැහැර ගියේ ය. හේ මුවමුළුව අතුරෙන් උතුම් උතුම් මුවකු මරා, මොළොක් මොළොක් මස් කා, ඒ ලැග්මට ම පෙරළා ආයේ ය.

තස්සෙව ඛො ආවුසො පාථිකපුත්ත සීහස්ස මිගරඤ්ඤො විඝාසෙ සංවද්ධො ජරසිගාලො[1] දිත්තො චෙව බලවා ච. අථ ඛො ආවුසො තස්ස ජරසිගාලස්ස එතදහොසි “කො චාහං කො සීහො මිගරාජා? යන්නූනාහම්පි අඤ්ඤතරං වනසණ්ඩං නිස්සාය ආසයං කප්පෙය්‍යං, තත්‍රාසයං කප්පෙත්වා සායන්හසමයං ආසයා නික්ඛමෙය්‍යං, ආසයා නික්ඛමිත්වා විජම්භෙය්‍යං, විජම්භිත්වා සමන්තා චතුද්දිසා අනුවිලොකෙය්‍යං, සමන්තා චතුද්දිසා අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදෙය්‍යං, තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමෙය්‍යං, සො වරං වරං මිගසංඝෙ වධිත්වා මුදුමංසානි මුදුමංසානි භක්ඛයිත්වා තමෙවාසයං ‘අජ්ඣුපෙය්‍යන්ති” අථ ඛො සො ආවුසො ජරසිගාලො අඤ්ඤතරං වනසණ්ඩං නිස්සාය ආසයං කප්පෙසි. තත්‍රාසයං කප්පෙත්වා සායණ්හසමයං ආසයා නික්ඛමි.

ආසයා නික්ඛමිත්වා විජම්භි. විජම්භිත්වා සමන්තා චතුද්දිසා අනුවිලොකෙසි. සමන්තා චතුද්දිසා අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදිස්සාමීති සෙගාලකං යෙව අනදි, භෙරණ්ඩකං[2] යෙව අනදි. කො ච ඡවො සෙගාලකො කො පන සීහනාදෙ![3]

“එවමෙව ඛො ත්වං ආවුසො පාථිකපුත්ත සුගතාපදානෙසු ජීවමානො සුගතාතිරිත්තානි භුඤ්ජමානො තථාගතෙ අරහන්තෙ සම්මාසම්බුද්ධෙ ආසාදෙතබ්බං මඤ්ඤසි. කො ච ඡවො පාථිකපුත්තො[4] කා ච තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං ආසාදනා!”ති.

25. යතො ඛො භග්ගව ජාලියො දාරුපත්තිකන්තෙවාසී ඉමිනා ඔපම්මෙන නෙව අසක්ඛි අචෙලං පාථිකපුත්තං තම්හා ආසනා චාවෙතුං, අථ නං එතදවොච.

---

1. ජරසිඞ්ගාලො (මජසං)
2. භෙදණ්ඩකං යෙව (කම)
3. කෙ ච ඡවෙ සිංගාලෙ කෙ පන සීහනාදෙති (මජසං)
4. කෙ ච ඡවෙ පාථිකපුත්ත (මජසං)

ඇවැත් පථිකපුත්‍රයෙනි, මෘගරාජ වූ ඒ සිංහයා ගේ විඝාසයෙහි (කා ඉතිරිකළ දැයින්) වැඩුණු මහළු කැණහිලෙක් අජ්ත (දැපුණේ) ද ශක්තිමත් ද විය. එ කල්හි ඒ මහළු කැණහිලුට 'මම කවරෙම් ද! මෘගරාජ වූ සිංහ කවරේ ද ?මමත් එක්තරා වනලැහැබක් නිසා තිත්පලක් කැරැ ගන්නෙම් නම්, එහි ලැග සවස් වේලේ තිත්පොලෙන් නික්මෙන්නෙම් නම්, එසේ නික්මැ වැජඹෙන්නෙම් නම්, වැජැඹැ හාත්පසැ සිවූ දිග බලන්නෙම් නම්, හාත්පසැ සිවු දිග බලා තුන් යලක් සිංහනාද කරන්නෙම් නම්, තුන් යලක් සිංහනාද කොට ගොදුරු සඳහා පිටත් වැ යන්නෙම් නම්, ඒ මම මුවමුළුයෙන් සොඳුරු සොඳුරු මුවකු මරා මොළොක් මොළොක් මස් කා ඒ තිත්පොලට ම එළැඹෙන්නෙම් නම් යෙහෙකැ'යි මේ සිත විය. ඇවැත්නි, ඉක්බිති ඒ මහළු කැණහිල් එක්තරා වනලැහැබක් නිසා ලැගුම් ගත්තේ ය. ලැගුම් ගෙන සවස් වේලෙහි ඒ තිත්පොලෙන් නික්මියේ ය. තිත්පොලෙන් නික්මැ වැජැඹුණේ ය. වැජැඹැ හාත්පස සිවූ දිග බැලී ය. හාත්පසැ සිවූ දිග බලා 'සිංහනාද කරන්නෙමි'යි තුන් යලක් කැණහිල් හඬ ම හැඩී ය. නොමනා හඬක් ම හැඩී ය. ලාමක සිවලා කවරේ ද! සිංහනාදය කවරේ ද!! (මොවුන් දෙදෙනා ගේ කවර සමතාවෙක් ද!) ඇවැත් පාථිකපුත්‍රයෙනි, ඒ කැණහිලු සේ ම තෙපි සුගතයන් වහන්සේට නියමිත වූ පසය නිසා ජීවත් වන්නාහු, සුගතයන් වහන්සේ වළඳා ඉතිරි වූ දැ වළඳන්නාහු, 'ඒ තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් හා ගැටියැ යුතු යැ' යි සිතවු ද? ලාමක වූ පාථිකපුත්‍රයා කවර යැ! තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් හා (ඉදුපෙළහර කරමි යි) ගැටෙනු කවර යැ!'' (යනු යි)

භාග්‍යවය, යම් හෙයකින් දරුපාත්‍රිකාන්තේවාසී ජාලිය තෙමෙ මේ උපමායෙන් අචේලක පාථිකපුත්‍රයා ඒ අස්නෙනුදු ඉවත් කරන්නට නො හැකි වී ද, එ හෙයින් හේ ඔහුට මෙය (මතු දැක්වෙන පරිදි) කී ය: ''සිවලෙක් තමා දෙස බලා 'මම මෘගරාජ වූ සිංහයෙමි'යි සිතී ය. එසේ ම හේ සිවල් හඬ ම හැඩී ය, සිවල් හඬම හැඩීය. ලාමක සිවල් හඬ කවර යැ! සිංහනාදය කවර යැ!

පාථිකපුත්‍රයෙනි, එසේ ම තෙපි සුගතයනට නිසි පසයෙන් දිවි පවත්වනුවෝ, සුගතයන් ඉතිරි කළ දැ වළඳනුවෝ, ඒ තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් හා ගැටියැ යුතු කොට සිතවු ද? නීච පාථිකපුත්‍රයෝ කවුරු යැ! තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් හා ඔවුන් ගැටෙනු කවර යැ!''

25. භාග්‍යවය, දරුපාත්‍රිකාන්තේවාසී ජාලිය තෙම මේ උපමායෙනුත් අචේලක පාථිකපුත්‍රයා එ අස්නෙන් සොලොවන්නට යම් හෙයකින් නො හැකි වී ද, එ හෙයින් ඔහුට මෙ බස් ද තෙපළී ය:

සීහො'ති අත්තානං සමෙක්ඛියාන
අමඤ්ඤි කොත්ථු මිගරාජා, හමස්මි,
තථෙව සො සෙගාලකං[1] අනදි
කො ච ඡවො සෙගාලො[2] කො පන සීහනාදෙ! ති.

එවමෙව ඛො ත්වං ආවුසො පාථිකපුත්ත සුගතාපදානෙසු ජීවමානො සුගතාතිරිත්තානි භුඤ්ජමානො තථාගතෙ අරහන්තෙ සම්මාසම්බුද්ධෙ ආසාදෙතබ්බං මඤ්ඤසි. කො ච ඡවො පාටිකපුත්තො කා ච තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං ආසාදනා!ති,

26. යතො ඛො භග්ගව ජාලියො දරුපත්තිකන්තෙවාසී ඉමිනාපි ඕපම්මෙන නෙව අසක්ඛි අචෙලං පාථිකපුත්තං තම්හා ආසනා චාවෙතුං, අථ නං එතදවොච:

අමඤ්ඤි අත්තුවඩ්ඪකමනං
අත්තානං විඝාසෙ සමෙක්ඛිය
යාවත්තානං න පස්සති
කොත්ථු තාව බ්‍යග්ඝො ති මඤ්ඤති
තථෙව සො සෙගාලකං[1] අනදි
කො ච ඡවො සෙගාලො[2] කො පන සීහනාදෙ!ති.

එවමෙව ඛො ත්වං ආවුසො පාථිකපුත්ත සුගතාපදානෙසු ජීවමානො සුගතාතිරිත්තානි භුඤ්ජමානො තථාගතෙ අරහන්තෙ සම්මාසම්බුද්ධෙ ආසාදෙතබ්බං මඤ්ඤසි. කො ච ඡවො පාථිකපුත්තො කා ච තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං ආසාදනා!ති.

27. යතො ඛො භග්ගව ජාලියො දරුපත්තිකන්තෙවාසී ඉමිනාපි ඕපම්මෙන නෙව අසක්ඛි අචෙලං පාථිකපුත්තං තම්හා ආසනා චාවෙතුං, අථ නං එතදවොච:

භුත්වාන භෙකෙ[3] ඛලමූසිකායො
කටසීසු ඛිත්තානි ච කොණපානි,[4]
මහාවනෙ සුඤ්ඤවනෙ විවඩ්ඪො
අමඤ්ඤි කොත්ථු මිගරාජාහමස්මි.
තථෙව සො සෙගාලකං අනදි
කො ච ඡවො සෙගාලො කො පන සීහනාදෙ!ති.

එවමෙව ඛො ත්වං ආවුසො පාථිකපුත්ත සුගතපදානෙසු ජීවමානො සුගතාතිරිත්තානි භුඤ්ජමානො තථාගතෙ අරහන්තෙ සම්මාසම්බුද්ධෙ ආසාදෙතබ්බං මඤ්ඤසි. කො ච ඡවො පාථිකපුත්තො, කා ච තථාගතානං අරහන්තාන. සම්මාසම්බුද්ධානං ආසාදනා!ති.

---

1. සිගාලකං—මජසං
2. සෙගාලො—මජසං, සීමු
3. හිඩෙග (කම)
4. කුණපානි - සයා

'කැණහිල් තෙමෙ වෙනෙහි හැවිදුනේ, තර වූ තම සිරුර පිළිබිඹුව ඉදුල්දිය පිරි දිය වළෙකැ දක, යම් තාක් 'තමා සිංහයා ගේ ඉඳුල් කා වැඩුණෙකැ යි නො දක්නේ ද, ඒ තාක් ම තමා සිංහයකුට බඳු බල ඇත්තෙකැ යි (ව්‍යාඝ්‍ර සමාන බල ඇත්තෙකැ යි) සිතී. එසේ ම හේ කැණැහිල් හඬ ම හැඞී ය. ලාමක සිවල් හඬ කවර යැ! සිංහනාදය කවර යැ!

"ඇවැත් පාථිකපුත්‍රයෙනි, තෙපි එසේ ම සුගතයනට නියමිත පසයෙන් දිවි පවත්වනුවෝ, සුගතයන් ඉතිරි කළ දැ වළඳනුවෝ ඒ තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් හා ගැටියැ යුතු කොට සිතවූ ද? ලාමක පාථිකපුත්‍ර කවර යැ! තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් හා ගැටෙනු කවර යැ!"

26. භාර්ගවය, දරු පාත්‍රිකාන්තේවාසී ජාලිය තෙමේ මේ උපමායෙනුත් අචේලක පාථික පුත්‍රයා ඒ අස්නෙන් ඉවත් කරන්නට යම් හෙයෙකින් නො හැකි වී ද, එ හෙයින් ඔහුට මෙ තෙපුල් තෙප්ලී ය:

"මහ වෙනෙහි, සිංහව්‍යාඝ්‍රාදීන් ගෙන් හිස් වූ වෙනෙහි මැඩියන් ද කලවිටි බිල්හි වූ මීයන්ද සොහොන්හි ලූ මළ කුණු ද කා මහත් වැ වැඩුණු කැණැහිල් තෙමෙ 'මම් මෘගරාජයයමි'යි සිතී. එසේ ම (සිංහ නාද යැ යි සිතා) කැණැහිල් හඬ ම හැඞී. නිච කැණහිල්හඬ කවරයැ! සිංහනාදය කවර යැ!"

පාථිකපුත්‍රයෙනි, මෙසේ ම තෙපි සුගතයනට නියමිත පසය නිසා දිවි රක්නහු, සුගතයන් ඉතිරි කළ දැ වළඳන්නහු, තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් හා ගැටිය යුතු සේ සිතහු. ලාමක පාථිකපුත්‍ර කවර යැ! තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් හා ගැටෙනු කවර යැ!"

යතො ඛො භග්ගව ජාලියො දරුපත්තිකන්තෙවාසී ඉමිනා පි ඔපම්මෙන නෙව අසක්ඛි අචෙලං පාථිකපුත්තං තම්හා ආසනා චාවෙතුං, අථ තං පරිසං ආගන්ත්වා එවමාරොචෙසි: "පරාභූතරූපො භො අචෙලො පාථිකපුත්තො, 'ආයාමි ආවුසො, ආයාමි ආවුසො'ති වත්වා තත්ථෙව සංසප්පති, න සක්කොති ආසනාපි වුට්ඨාතුන්ති. එවං වුත්තෙ අහං භග්ගව තං පරිසං එතදවොචං:

"අභබ්බො ඛො ආවුසො අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙ පි'ස්ස එවමස්ස: අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති, මුද්ධා පි තස්ස විපතෙය්‍ය. සචෙ' පායස්මන්තානං ලිච්ඡවීනං එවමස්ස "මයං අචෙලං පාථිකපුත්තං වරත්තාහි බන්ධිත්වා ගොයුගෙහි ආවිඤ්ඡෙය්‍යාමාති, තා වරත්තා ඡිජ්ජෙරං පාථිකපුත්තො වා. අභබ්බො පන අචෙලො පාථිකපුත්තො තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා මම සම්මුඛීභාවං ආගන්තුං. සචෙ'පි'ස්ස එවමස්ස 'අහං තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා සමණස්ස ගොතමස්ස සම්මුඛීභාවං ගච්ඡෙය්‍යන්ති මුද්ධා පි තස්ස විපතෙය්‍යා''ති.

28. අථ ඛ්වාහං භග්ගව තං පරිසං ධම්මියා කථාය සන්දස්සෙසිං සමාදපෙසිං සමුත්තෙජෙසිං සම්පහංසෙසිං. තං පරිසං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා මහාබන්ධනා මොක්ඛං කරිත්වා, චතුරාසීතිපාණසහස්සානි මහාවිදුග්ගා උද්ධරිත්වා, තෙජොධාතුං සමාපජ්ජිත්වා සත්තතාලං වෙහාසං අබ්භුග්ගන්ත්වා අඤ්ඤං සත්තතාලම්පි අච්චිං[1] අභිනිම්මිනිත්වා පජ්ජලිත්වා ධූමායිත්වා[2] මහාවනෙ කූටාගාරසාලාය පච්චුට්ඨාසිං. අථ ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අහං භග්ගව සුනක්ඛත්තං ලිච්ඡවිපුත්තං එතදවොචං: තං කිම්මඤ්ඤසි සුනක්ඛත්ත, යථෙව තෙ අහං අචෙලං පාථිකපුත්තං ආරබ්භ බ්‍යාකාසිං, තථෙව තං විපක්කං අඤ්ඤථා වා?ති. "යථෙව මෙ භන්තෙ භගවා අචෙලං පාථිකපුත්තං ආරබ්භ බ්‍යාකාසි, තථෙව තං විපක්කං නො අඤ්ඤථා''ති.

1. අග්ගි. (ස්‍යා)
2. ධූමායිත්වා (මජසං)

27. භාග්ගවය, දරුපාත්‍රිකාන්තේවාසී ජාලිය තෙම මේ උපමායෙනුත් අචේලක පාථිකපුත්‍රයා ඒ හුන් තැනින් ඉවත් කරන්නට යම් විටෙක නොහැකි වී ද, එ විට ඒ පිරිස් වෙත අවුත්, 'භවත්නි, අචේලක "පාථිකපුත්‍රයා පැරදුණු සැහැවි ඇත්තේ ය. 'ඇවැත්නි එම්, ඇවැත්නි එම් යි එතන්හි ම ගැලී ඒ මේ අතැ සැලෙයි. හුනස්නෙන් නැඟෙන්-නට ද නොහැකි වේ' යැ යි සැළ කෙළේ ය. භාග්ගවය, ඔහු මෙසේ කී කලැ මම ඒ පිරිසට මේ වචන කීමි:

"ඇවැත්නි, අචේලක පාථිකපුත්‍ර ඒ තෙප්ල නො හැරපියා, ඒ සිත නො හැරපියා, ඒ දිට් බැහැර නො කොට, මා හමුවට එන්නට නො නිසි ය. ඉදින් 'මම ඒ තෙපුල් නො පියා, ඒ සිත නො පියා, ඒ දිට් බැහැර නො කොට, මහණ ගොයුම් හමුවට යන්නෙමි'යි ඔහුට මෙසේ සිතක් වනොත් (එසේ එන්නට තැත් කළ හොත්), ඔහු හිස ද ගිලිහෙන්නේ ය. ඉදින් ආයුෂ්මත් ලිච්ඡවීනට, 'අපි අචේලක පාථිකපුත්‍රයා වර පටින් බැඳ ගොනුන් බැඳි වියෙන් ඇද ගෙන එම්හ 'යි මෙසේ සිතක් වූවොත් (එයට තැත් කළ හොත්), ඒ වරපට හෝ සිඳෙන්නේ ය, පාථිකපුත්‍රයා හෝ ඒ වර පට කෙරෙන් කැඩී වෙන් වන්නේ ය. අචේලක පාථිකපුත්‍ර ඒ තෙප්ල නො පියා, ඒ සිත නො පියා, ඒ දිට් බැහැර නො කොට මා හමුවට එන්නට නො නිසි ය. ඉදින් ඔහුට 'මම ඒ තෙප්ල නො පියා, ඒ සිත නො පියා, ඒ දිට් බැහැර නො කොට මහණ ගොයුම් හමුවට යන්නෙමි'යි මේ සිත වී නම්, (එයට තැත් කෙළේ නම්), ඔහු හිස ද ගිලිහෙන්නේ ය" (යනුයි).

28. භාග්ගවය, ඉක්බිති මම ඒ පිරිසට දැහැමි කතායෙන් කරුණු දක්වා කීමි, කී දැ සමාදන් කැරැවීමි (ගැන්වීමි), එහි ඔවුන් සිත් තියුණු කෙළෙමි, එහි ඔවුන් තුටු පහටු කෙළෙමි. එ පිරිසට දැහැමි කතා-යෙන් කරුණු දක්වා, දක්වූ කරුණු ගන්වා, එහි ඔවුන් සිත් තියුණු කොට, එහි ඔවුන් තුටු පහටු කොට, මහ කෙලෙස් බැම්මෙන් ඔවුන් ගේ මිදීම සිදු කොට, සුවාසූ දහසක් ප්‍රාණීන් මහා විදුගියෙන් (කාමාදි සතර ඔඝයෙන්) ගොඩ ලා, තෙජොධාතු සමාපත්තියට සමවැද, සත් තලක් අහස් නැඟ, අන් සත් තලක් ද උසට ගිනි දල් මවා, දිලිහී දුමා, මහ වෙනෙහි කූළාර හලැ පිහිටියෙමි. භාග්ගවය, එ කලැ ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙමෙ මා කරා එළැඹියේ ය. එළැඹ මා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා, බණවා 'සුනක්ඛත්තය, එය කිමැයි සිතයි ද? මම තට අචේලක පාථිකපුත්‍රයා ඇරැබැ කී නියායෙන් ම එය නිපන්නේ ද? නැත හොත් අන් නියායෙකින් වී ද?' යි පුළුවුතිමි. 'වහන්ස, භාග්‍යවතුන් වහන්-සේ අචේලක පාථිකපුත්‍රයා ඇරැබැ මට වදළ නියායෙන් ම එය නිපන. අන් සැටියෙකින් එය නො වී යැ 'යි හේ කීය.

"තං කිම්මඤ්ඤසි සුනක්ඛත්ත, යදි එවං සන්තෙ කතං වා හොති උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං අකතං වා?"ති.

"අද්ධා ඛො පන භන්තෙ එවං සන්තෙ කතං හොති උත්තරිමනුස්සධම්මං ඉද්ධිපාටිහාරියං නො අකතන්ති."

"එවම්පි ඛො මං ත්වං මොඝපුරිස උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොන්තං එවං වදෙසි: න හි පන මෙ භන්තෙ භගවා උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොතී ති. පස්ස මොඝපුරිස තාව තෙ ඉදං අපරද්ධන්ති."

එවම්පි ඛො භග්ගව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො මයා වුච්චමානො අපක්කමෙව ඉමස්මා ධම්මවිනයා යථා තං ආපායිකො නෙරයිකො.

### අග්ගඤ්ඤපඤ්ඤත්තිකථා

29. අග්ගඤ්ඤඤ්චාහං භග්ගව පජානාමි, තඤ්ච පජානාමි තතො ච උත්තරිතරං පජානාමි, තඤ්ච පජානනං න පරාමසාමි, අපරාමසතො ච මෙ පච්චත්තඤ්ඤෙව නිබ්බුති විදිතා, යදභිජානං තථාගතො නො අනයං ආපජ්ජති.

සන්ති භග්ගව එකෙ සමණබ්‍රාහ්මණා ඉස්සරකුත්තං බ්‍රහ්මකුත්තං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙන්ති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො ඉස්සරකුත්තං බ්‍රහ්මකුත්තං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා?"ති. තෙ ච මෙ එවං පුට්ඨා 'ආමො'ති[1] පටිජානන්ති. ත්‍යාහං එවං වදාමි: කථංවිහිතකං පන[2] තුම්හෙ ආයස්මන්තො ඉස්සරකුත්තං බ්‍රහ්මකුත්තං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා"ති. තෙ මයා පුට්ඨා න සම්පායන්ති. අසම්පායන්තා මමඤ්ඤෙව පටිපුච්ඡන්ති. තෙසාහං පුට්ඨො බ්‍යාකරොමි:

1. ආමාති (ස්‍යා)
2. කථං විහිතකං නො පන (කම්)

'සුනක්ඛත්තය, එය කිමැ යි සිතයි ද? මෙසේ වන කලැ උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර කරන ලද ද? නො කරන ලද ද?' යි පුළුවුත්මි.

"වහන්ස, මෙසේ වන කලැ එකාන්තයෙන් උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර කරන ලදුයේ ය. නො කරන ලදුයේ නොවේ" යි හේ කී ය.

"හිස් පුරුෂය, මෙසේත් උතුරු මිනිස් දහමින් පෙළහර කරන මට, 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට උතුරු මිනිස් දහමින් ඉදු පෙළහර නො කරන සේකැ' යි කීයෙහි, හිස් පුරුෂය, බලව, තා විසින් මෙ කොතරම් මහ වරදෙක් කරන ලද ද?" යි ඔහුට කීමි.

භාර්ගවය, මෙසේත් මා විසින් කියනු ලබනුයේ ද ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙමේ අපායට නිස්සක්හු, නිරයට සුදුස්සක්හු සෙයින් මෙ දහම්විනයෙන් (මෙ සස්නෙන්) බැහැර වැ ගියේ මැ ය.

## අග්ගඤ්ඤ ප්‍රඥප්ති කථාව

29. භාර්ගවය, මම අග්ගඤ්ඤය ද (ලෝකෝත්පත්ති වංශ කථාව ද) දනිමි. එය ද දනිමි. එ මතු නොව එයින් මත්තෙහි දැත් දනිමි. එය දන්නෙම් ද (ඒ දූන්ම තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන්) පරාමර්ශනය නො කරමි. එසේ එය පරාමර්ශනය නොකරන්නාවූ ද මා විසින් තමා කෙරෙහි ම කෙලෙස් නිවීම දන්නා ලද්දේ ය. යම් නිවීමක් දන්නා තථාගත තෙමේ අනයව්‍යසනයකට නො පැමිණෙන්නේ ද, ඒ එබඳු වූ නිවීමෙක.

භාර්ගවය, "ලොව ඉසුරකු විසින් මැවිණැ යි, බඹකු විසින් මැවිණැයි යන ආචාර්‍ය්‍යවාද වූ ලෝකෝත්පත්තිවංශකථාව පණවන ඇතැම් මහණ කෙනෙක් බමුණු කෙනෙක් ඇත. මම ඔවුන් කරා එළැඹ, 'ආයුෂ්මත්නි, ලොව ඉසුරක්හු විසින් මැවිණ බඹහු විසින් මැවිණ යන ආචාර්‍ය්‍යවාද වූ ලෝකෝත්පත්ති වංශකථාව (අග්ගඤ්ඤය) තෙපි පණවවු දැ?යි ඔවුන් විචාරමි. මා විසින් විචාරන ලද ඔහු, 'එසේ යැ' යි පිළිණ කෙරෙත්. මම ඔවුනට 'ආයුෂ්මත්නි, ලොව කවර සැටියෙන් මවන ලද්දේ ද යි යන ඊශ්වරනිර්මාණයක්, බ්‍රහ්මනිර්මාණයක්, ආචාර්‍ය්‍යවාදයක්, ලොකොත්පත්තිවංශ කථාවක් පණවවු ද?' යි ඔවුන් පිළිවිසිමි. ඔහු මා විසින් (මෙසේ) විචාරන ලද්දහු, (පිළිතුරු දීම විසින්) සඳානගතියෙන් ඉදිරියට නො යත්. එසේ නො යන්නාහු, ඔහු මා ම පිළිවිසිත්. ඔවුන් විසින් විචාරන ලද මම මෙසේ (එය) හෙළි කෙරෙමි:

30. හොති ඛො සො ආවුසො සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන අයං ලොකො සංවට්ටති. සංවට්ටමානෙ ලොකෙ යෙභුය්‍යෙන සත්තා ආභස්සරසංවත්තනිකා හොන්ති. තෙ තත්ථ හොන්ති මනොමයා පීතිභක්ඛා සයම්පභා අන්තලික්ඛචරා සුභට්ඨායිනො, චිරං දීඝමද්ධානං තිට්ඨන්ති. හොති ඛො සො ආවුසො සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන අයං ලොකො විවට්ටති, විවට්ටමානෙ ලොකෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං පාතුභවති. අථ ඛො අඤ්ඤතරො[1] සත්තො ආයුක්ඛයා වා පුඤ්ඤක්ඛයා වා ආභස්සරකායා චවිත්වා සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජති. සො තත්ථ හොති මනොමයො පීතිභක්ඛො සයම්පභො අන්තලික්ඛචරො සුභට්ඨායී, චිරං දීඝමද්ධානං තිට්ඨති. තස්ස තත්ථ එකකස්ස දීඝරත්තං නිවුසිතත්තා අනභිරති පරිතස්සනා උප්පජ්ජති: "අහො වත අඤ්ඤෙ පි සත්තා ඉත්ථත්තං ආගච්ඡෙය්‍යුන්ති". අථ අඤ්ඤතරෙ පි සත්තා ආයුක්ඛයා වා පුඤ්ඤක්ඛයා වා ආභස්සරකායා චවිත්වා සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජන්ති තස්ස සත්තස්ස සහබ්‍යතං. තෙ පි තත්ථ හොන්ති මනොමයා පීතිභක්ඛා සයම්පභා අන්තලික්ඛචරා සුභට්ඨායිනො චිරං දීඝමද්ධානං තිට්ඨන්ති. තත්‍රාවුසො යො සො සත්තො පඨමං උපපන්නො, තස්ස එවං හොති: අහමස්මි බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඉස්සරො කත්තා නිම්මාතා සට්ඨා[2] සජිතා[3] වසී පිතා භූත-භව්‍යානං. මයා ඉමෙ සත්තා නිම්මිතා. තං කිස්ස හෙතු? මමඤ්හි පුබ්බෙ එතදහොසි: "අහො වත අඤ්ඤෙ පි සත්තා ඉත්ථත්තං ආගච්ඡෙය්‍යුන්ති. ඉති මමඤ්ච මනොපණිධි, ඉමෙ ච සත්තා ඉත්ථත්තං ආගතා"ති.

1. අථ අඤ්ඤතරො (සයා P.T.S.)
2. සෙට්ඨො (සබ්බත්ථ)
3. සඤ්ජිතා P.T.S. සජ්ජිතා (සයා, කම)

30. "ඇවැත්නි, දික් කලක් ඇවෑමෙන් කිසි සමයෙක මෙ ලොව නැසෙයි ද, එ බඳු කාලපරිච්ඡේදයෙක් වෙයි. ලොව නැසෙන සමයෙහි සත්‍වයෝ බෙහෙවින් ආභස්සර බඹ ලොව උපදනාහු වෙත්. ඔහු එහි ධ්‍යාන චිත්ත බලයෙන් උපන්නාහු, ප්‍රීතිය ම ආහාර කොටැත්තාහු, සිය සිරුරු එළියෙන් ම බබළන්නාහු, අහසැ හැසිරෙන්නාහු, සිත්කලු උයන් විමන් ඈහි සිටුනාහු (නොහොත් සිත්කලු වස්ත්‍රාභරණ හැඳ පැලැඳ සිටුනාහු) වෙත්. ඔහු එහි ඉතා බොහෝ කල් සිටුනාහ. ඇවැත්නි, දික්කලක් ඇවෑමෙන් කිසි සමයෙක මෙ ලොව හැදෙන්නේ ද, එසේ වූ කාලපරිච්ඡේදයෙක් වෙයි. ලොව හැදෙන කලැ හිස් බඹ විමනෙක් පහළ වෙයි. එ කලැ එක්තරා සත්වයෙක් ආයු ගෙවීමෙන් හෝ පින් ගෙවීමෙන් ආභස්සර බඹලොවින් සැව එකී හිස් බඹ විමනට පැමිණෙයි (හිස් බඹ විමනැ උපදී). හෙ තෙමෙ එහි ධ්‍යාන සිතින් උපන්නේ, ප්‍රීතිය ගොදුරු කොටැත්තේ, සිය සිරිරෙන් විහිදෙන එළියෙන් බබළනුයේ, අහසැ හැසිරෙනුයේ, ශොභන උද්‍යාන විමාන ආදියෙහි සිටුනේ (නොහොත් ශෝභන වස්ත්‍රාභරණ හැඳ පැලැඳ සිටුනේ) වෙයි. හේ එසේ බොහෝ කලක් සිටියි. එහි එකලා වැ දිගු කලක් වුසූ බැවින් 'අන් සත් කෙනෙකුත් මෙ අත්බවට එන්නාහු නම් යෙහෙකැ' යි එ කලා විසීමෙහි නො ඇල්මෙක්, අමුතු කෙනකු හා සහභාවයෙහි ආශාවෙක් උපදී. එයින් පසු අන් සත් කෙනෙක් ද ආයු ගෙවීමෙන් හෝ පින් ගෙවීමෙන් හෝ ආභස්සර බඹලොවින් සැව, ඒ හිස් බඹ විමනට, ඒ පළමු ඉපැද සිටියහුගේ සහභාවයට පැමිණෙයි. ඔහු ද එහි ධ්‍යාන සිතින් උපන්නාහු, ප්‍රීතිය ගොදුරු කොටැත්තාහු, ස්වයම්ප්‍රභ වූවාහු, අහසැ හැසිරෙන්නාහු, සිත්කලු උයන් ඈහි සිටිනාහු වෙත්. එසේ දිගු කලක් ඔහු එහි සිටිත්. ඇවැත්නි, එහි යම් සතෙක් පළමුව උපන්නේ ද, ඔහුට, "මම බ්‍රහ්ම වෙමි, මහා බ්‍රහ්ම වෙමි, මෙරමා මැඩ අධිපති වැ සිටුනෙම් වෙමි, අනුන් විසින් නො මඩනා ලද්දෙයෙම් වෙමි, එකාන්තයෙන් සියල්ල දක්නෙම් වෙමි, සියල්ලන් සිය වශයෙහි පවත්වනුයෙම් වෙමි, ලොවැ ඊශ්වර වෙමි, ලොවැ කාරකවෙමි, ලොවැ නිර්මාතෘ වෙමි, ලොවැ ස්‍රෂ්ටෘ වෙමි, ලොවැ සකසන්නා වෙමි. මෙරමා තමා වශයෙන් පවත්වන්නෙම් වෙමි, උපන් උපදනා හැම ගේ පියා වෙමි. මෙ සත්හු මා විසින් මවන ලදහ. ඒ (කියනුයේ) කවර හෙයින ? පෙර මට 'අන් සත් කෙනෙකුත් මෙ අත්බවට එන්නාහු නම් ඒ ඉතා යෙහෙකැ'යි මෙ සිත විය. මෙසේ මගේ ප්‍රාර්ථනාව ද විය. 'මෙ සත්හු ද මෙහි ආහ'යි මට මෙ සිත වෙයි.

යෙ පි තෙ සත්තා පච්ඡා උපපන්නා, තෙසම්පි එවං හොති; අයං ඛො භවං බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සජිතා වසී පිතා භූතභව්‍යානං. ඉමිනා මයං භොතා බ්‍රහ්මුනා නිම්මිතා. තං කිස්ස හෙතු? ඉමඤ්හි මයං අද්දසාම ඉධ පඨමං උපපන්නං, මයං පනම්හා පච්ඡා උපපන්නා'ති. තත්‍රාවුසො යො සො සත්තො පඨමං උපපන්නො, සො දීඝායුකතරො ච හොති වණ්ණවන්තතරො ච මහෙසක්ඛතරො ච. යෙ පන තෙ සත්තා පච්ඡා උපපන්නා, තෙ අප්පායුකතරා ච හොන්ති දුබ්බණ්ණතරා ච අප්පෙසක්ඛතරා ච. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති යං අඤ්ඤතරො සත්තො තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආගච්ඡති. ඉත්ථත්තං ආගතො සමානො අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති, යථා සමාහිතෙ චිත්තෙ තං පුබ්බෙනිවාසං අනුස්සරති, තතො පරං නානුස්සරති ති. සො එවමාහ: යො ඛො සො භවං බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සජිතා වසී පිතා භූතභව්‍යානං, යෙන මයං භොතා බ්‍රහ්මුනා නිම්මිතා, සො නිච්චො ධුවො සස්සතො[1] අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සති. යෙ පන මයං අහුම්හා තෙන භොතා බ්‍රහ්මුනා නිම්මිතා, තෙ මයං අනිච්චා අද්ධුවා[2] අප්පායුකා චවනධම්මා ඉත්ථත්තං ආගතා ති. එවංවිහිතකං නො තුම්හෙ ආයස්මන්තො ඉස්සරකුත්තං බ්‍රහ්මකුත්තං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා''ති. තෙ එවමාහංසු: ''එවං ඛො නො ආවුසො ගොතම සුතං යථෙවායස්මා ගොතමො ආහා''ති. අග්ගඤ්ඤඤ්චාහං භග්ගව පජානාමි -පෙ- යදභිජානං තථාගතො නො අනයං ආපජ්ජති.

1. සස්සතො දීඝායුකො (ස්‍යා. කං)
2. අද්ධුවා අසස්සතා. (ස්‍යා. කං)

යම් සත්ව කෙනෙක් පසු වැ උපන්නාහු ද, ඔවුනටත් 'මේ භවත් තෙමෙ බ්‍රහ්මයා ය, මහා බ්‍රහ්මයා ය, අනුන් මැඩ අධිපති වැ සිටුනේ ය. මෙරමා විසින් නො මැඩුණේ ය, ඒකාන්තයෙන් සියල්ල දක්නේ ය, මෙරමා සිය වශයෙහි පවත්වන්නේ ය, ඊශ්වර ය, කර්තෘ ය, නිර්මාතෘ ය, සෘෂ්ටෘ ය, ලොව සදන්නා ය, මෙරමා තමන් වශයෙහි පවත්වන්නේ ය, උපන් උපදනා හැම දෙනාගේ පියා ය, මේ භවත් බ්‍රහ්මයා විසින් අපි මවන ලදුම්හ, එසේ කියනුයේ කවර හෙයින? යත්: අපි අපට පෙර මොහු ඉපිද සිටියහු අපි දුටුමු. අපි වූ කලි පසු ව උපන්නමෝ යැ'' යි මෙසේ සිතක් වෙයි. ඇවැත්නි, එහි යම් සතෙක් පළමු ව උපන්නේ ද, හේ වඩා දීර්ඝායුෂ්ක ද වඩා පැහැපත් ද වඩා මහත් යසස් ඇත්තේ ද විය. යම් සත් කෙනෙක් පසු වැ උපන්නාහු ද, ඔහු පළ මු උපන්නා-හට වඩා අල්පායුෂ්ක ද වඩා අල්ප වර්ණ සම්පත් ඇත්තාහු ද වඩා අල්ප යශස්ක ද වූහ. එක් සත්වයෙක් එ බඹමුළුයෙන් සැව, මෙ මිනිසත් බවට එන්නේ ය හේ මේ මිනිසත්බවට පැමිණියේ ම ගිහි ගෙන් නික්මැ පැවිදි වෙයි. ගිහි ගෙන් නික්මැ පැවිදි වූයේ ම, උත්සාහ වඩා, වැර වඩා පුන පුනා වැයම් කොට, නොපමා බව නිසා, නුවණ නිසා, යම් සමාධියෙකින් සිත මනාව පිහිටි කලැ මෙයින් පළමු වූ අත්බව සිහි කළ හැකි වෙයි. එයින් ඔබ්බෙහි සිහි කළ නොහැකි වෙයි ද, එබඳු චිත්ත සමාධියක් ලබයි යන මෙ කරුණ ඇත. (එසේ චිත්ත සමාධියක් ලත්) හෙ තෙම "යම් ඒ භවත් බ්‍රහ්මයෙක් මහා බ්‍රහ්ම ද. අනුන් මැඩ අධිපති වෙ ද, ඊශ්වර ද, කාරක ද, නිර්මාපක ද, සෘෂ්ටෘ ද, ලොව සකසන්නේ ද, මෙරමා සිය වශයෙහි පවත්වන්නේ ද, උපන් උපදනා හැම ගේ පිතෘ ද, යම් ඒ භවත් මහ බඹක්හු විසින් අපි මවන ලදුමෝ ද, හෙ තෙමේ නිත්‍ය ය, ධ්‍රැව ය (නො මැරෙන්නේ ය), සදා-භාවී ය, වෙනස් නොවන සුලු ය, මහ පොළෝ ඈ ශාශ්වත වස්තූන් හා සම වැ එ සැටියෙන් ම නො වෙනස් වැ සිටුනේ ය. යමබඳු වූ අපි ඒ භවත් බඹුහු විසින් මවන ලදුමෝ ද, ඒ අපි අනිත්‍යයම් හ, අධ්‍රැවයම්හ, අල්පායුෂ්කයම්හ, සැවෙන සුල්ලම්හ, එහෙයින් එයින් සැව මෙ මිනිස් බවට ආම්හ''යි කියයි. ආයුෂ්මත්නි, තෙපි මෙසේ සකස් කැරගන්නා ලද ඊශ්වර නිර්මිතයක්, බ්‍රහ්මනිර්මිතයක්, ආචාර්‍ය්‍යවාදයක් ලෝකෝත්පත්ති වංශකථාවක් පණවවු ද? (යනුයි). "ඇවැත්නි, ගෞතමයිනි, යම් සේ ම ආයුෂ්මත් ගෞතමයෝ කීහු ද, එ සේ ම අප විසින් අසන ලදි''යි මෙසේ ඔහු කිවු ය. භාර්ගවය මම අග්ගඤ්ඤය ද (ලෝකෝත්පත්ති කථාව ද) දනිමි......තථාගත තෙමේ යමක් දන්නේ අනය ව්‍යසනයකට නො පැමි-ණෙයි ද, එසේ වූ කෙලෙස් නිවීම මා විසින් දන්නා ලද්දේ ය.

31. සන්ති භග්ගව එකෙ සමණබ්‍රාහ්මණා ඛිඩ්ඩාපදොසිකං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙන්ති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො ඛිඩ්ඩාපදොසිකං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා?ති'' තෙ ච මෙ එවං පුට්ඨා 'ආමො'ති පටිජානන්ති. ත්‍යාහං එවං වදාමි: කථංවිහිතකං නො පන තුම්හෙ ආයස්මන්තො ඛිඩ්ඩාපදොසිකං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා?ති. තෙ මයා පුට්ඨා න සම්පායන්ති. අසම්පායන්තා මමඤ්ඤෙව පටිපුච්ඡන්ති. තෙසාහං පුට්ඨො බ්‍යාකරොමි: සන්තාවුසො ඛිඩ්ඩාපදොසිකා නාම දෙවා. තෙ අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නා විහරන්ති. තෙසං අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නානං[1] විහරතං සති සම්මුස්සති. සතියා සම්මොසා[2] තෙ දෙවා තම්හා කායා චවන්ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති, යං අඤ්ඤතරො සත්තො තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආගච්ඡති. ඉත්ථත්තං ආගතො සමානො අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ තං පුබ්බෙනිවාසං අනුස්සරති තතොපරං නානුස්සරති. සො එවමාහ: යෙ ඛො තෙ භොන්තො දෙවා න, ඛිඩ්ඩාපදොසිකා තෙ න අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නා විහරන්ති. තෙසං න අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නානං විහරතං සති න සම්මුස්සති. සතියා අසම්මොසා තෙ දෙවා තම්හා කායා න චවන්ති, නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථෙව ඨස්සන්ති. යෙ පන මයං අහුම්හා ඛිඩ්ඩාපදොසිකා තෙ මයං අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නා විහරිම්හා. තෙසං නො අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නානං විහරතං සති සම්මුස්සි. සතියා සම්මොසා එවං[3] මයං තම්හා කායා චුතා අනිච්චා අද්ධුවා අප්පායුකා චවනධම්මා ඉත්ථත්තං ආගතා''ති.

1. හාසඛිඩ්ඩාරති ධම්මසමාපන්නා (කම)
2. සතියා සම්මොසාය (ස්‍යා)
3. සම්මොසා එවං P.T.S.

31. භාර්ගවය, ක්‍රීඩාප්‍රදූෂක දෙවියන් මුල් කොටැති ආචාර්‍ය්‍යවාද වූ ලොකොත්පත්ති වංශකථාවක් (අග්ගඤ්ඤයක්) යම් කෙනෙක් පණවත් ද, එසේ වූ ඇතැම් මහණ කෙනෙක් බමුණු කෙනෙක් ඇත. මම ඔවුන් කරා එළැඹ "ආයුෂ්මත්නි, තෙපි ක්‍රීඩාප්‍රදූෂක මූලක ආචාර්‍ය්‍යවාදයක් වූ ලොකොත්පත්ති වංශ කථාවක් පණවවු ද? ඒ සැබෑ ද?"යි කියමි. ඔහු මා විසින් මෙසේ විචාරන ලද්දහු, 'එසේ'යි පිළිත කෙරෙත්. "ආයුෂ්මත්නි, තෙපි කෙසේ පිළියෙල කැරගත්තා ලද ආචාර්‍ය්‍යවාදයක් වූ ක්‍රීඩාප්‍රදූෂක මූලක ලෝකෝත්පත්ති වංශ කථාවක් පණවවු ද?"යි මෙසේ මම ඔවුන් විචාරමි. ඔහු මා විසින් විචාරන ලද්දහු, පිළිතුරු දිය නො හැකි වෙත්. නො හැකි වන්නාහු, මා ම පුළුවුසිත්. එසේ විචාරන ලද මම ඔවුනට මෙසේ හෙළි කොට කියමි: "ඇවැත්නි, ක්‍රීඩාප්‍රදූෂක නම් දෙවි කෙනෙක් ඇත. ඔහු ඉතා අධික වේලාවක් (අහර වළඳනා කාලය ද ඉක්මැ) මෙවුන්දම්හි ද කායික වාචසික ක්‍රීඩාහි ද ඇලෙන සැහැවියට වැටුණාහු වෙසෙත්. ඉතා අධික වේලාවක් මෙවුන්දම්හි ද කායික වාචසික ක්‍රීඩාහි ද ඇලෙන සැහැවියට වැටී වසන ඔවුනට බොජුන් ගනුවට සිහි නැති වේ. එසේ සිහි නැති වීමෙන් (බොජුන් නොගැනුම් හේතුයෙන්) ඒ දෙවියෝ ඒ දිව්‍ය නිකායයෙන් ච්‍යුත වෙත්. මෙසේ ච්‍යුත වූ එක්තරා සත්වයෙක් ඒ දේව නිකායයෙන් ච්‍යුත ව මේ මිනිස් බවට පැමිණේ. එසේ මිනිසත් බවට පැමිණියා වූ ම හෙ තෙම ගිහි ගෙන් නික්ම පැවිදි වේ. පැවිදි වූයේ ම උත්සාහ වඩා, වැර වඩා, පුන පුනා වැර වඩා, සිහිය වඩා, නුවණ වඩා, යම් සමාධියෙකින් සිත මොනොවට පිහිටි කලැ ඒ පෙර අත් බව සිහි කළ හැකි වේ ද, එයින් යට සිහි කළ හැකි නො වේ ද, එසේ වූ චිත්තසමාධියක් ලබයි' යන මෙය විද්‍යමාන එකෙකි. හේ මෙසේ කියයි: 'යම් භවත් දෙවි කෙනෙක් ක්‍රීඩාප්‍රදූෂක නො වෙත් ද, ඔහු බොජුන් වේලාව ඉක්මැ මෙවුන්දම්හිත් කායික වාචසික ක්‍රීඩාහිත් ඇලෙන සැහැවියට පත්තෝ වැ නො වෙසෙත් ද, එසේ වේලාව ඉක්මැ මෙවුන්දම්හිත් සෙසු කායික වාචසික ක්‍රීඩාහිත් ඇලෙන සැහැවියට පැමිණ නො වසන ඔවුනට බොජුන් ගනුයෙහි සිහි නැති නො වේ. එසේ සිහි නැති නොවනුයෙන් ඒ දෙවියෝ ඒ දෙවනිකායයෙන් නො සැවෙත්. ඔහු නිත්‍ය හ, ධ්‍රැව හ, සදහාවී හ. නො පෙරළෙන සුල්ලභ. හැම කල් පවත්නා පොළෝ ආදි වස්තුනට සම වැ එසේ ම ( නො වෙනස් ව) සිටුනාහ. යම් බඳු අපි වනාහි ක්‍රීඩාප්‍රදූෂක වූමෝ ද, වේලාව ඉක්මැ හෑ ක්‍රීඩාරති සවභාවයට පැමිණියෝ වැ වුසුමෝ ද, එසේ වසන අපට බොජුන් ගැන්මෙහි සිහි නැති විය. එයින් අපි ඒ දෙවනිකායෙන් ච්‍යුත වූ මෝ එහෙයින් ම අනිත්‍ය වූමෝ අධ්‍රැව වූ මෝ අල්පායුෂ්ක වූමෝ මැරෙන සුලු වූමෝ මෙ මිනිස් බවට පැමිණියම්හ." (යනු යි.)

එවංවිහිතකං නො තුම්හෙ ආයස්මන්තො ඛිඩ්ඩාපදොසිකං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා?ති. තෙ එවමාහංසු: එවං ඛො නො ආවුසො ගොතම සුතං යථෙවායස්මා ගොතමො ආහා ති. අග්ගඤ්ඤඤ්චාහං භග්ගව පජානාමි -පෙ- යදභිජානං තථාගතො නො අනයං ආපජ්ජති.

31. සන්ති භග්ගව එකෙ සමණබ්‍රාහ්මණා මනොපදොසිකං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙන්ති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො මනොපදොසිකං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා?ති. තෙ ච මෙ එවං පුට්ඨා 'ආමො'ති පටිජානන්ති. ත්‍යාහං එවං වදමි: කථංවිහිතකං නො පන තුම්හෙ ආයස්මන්තො මනොපදොසිකං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා?ති. තෙ මයා පුට්ඨා න සම්පායන්ති. අසම්පායන්තා මමඤ්ඤෙව පටිපුච්ඡන්ති. තෙසාහං පුට්ඨො බ්‍යාකරොමි: සන්තාවුසො මනොපදොසිකා නාම දෙවා. තෙ අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්ති. තෙ අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්තා අඤ්ඤමඤ්ඤම්හි චිත්තානි පදූසෙන්ති. අඤ්ඤමඤ්ඤං පදුට්ඨචිත්තා කිලන්තකායා කිලන්තචිත්තා තෙ දෙවා තම්හා කායා චවන්ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති යං අඤ්ඤතරො සත්තො තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආගච්ඡති, ඉත්ථත්තං ආගතො සමානො අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසති, යථා සමාහිතෙ චිත්තෙ තං පුබ්බෙනිවාසං අනුස්සරති, තතො පරං නානුස්සරතීති. සො එවමාහ: "යෙ ඛො තෙ භොන්තො දෙවා න මනොපදොසිකා තෙ නාතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්ති. තෙ නාතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්තා අඤ්ඤමඤ්ඤම්හි චිත්තානි නප්පදූසෙන්ති. අඤ්ඤමඤ්ඤම්හි[1] අප්පදුට්ඨචිත්තා අකිලන්තකායා අකිලන්තචිත්තා[2] තෙ දෙවා තම්හා කායා න චවන්ති නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථෙව ඨස්සන්ති. යෙ පන මයං අහුම්හා මනොපදොසිකා තෙ මයං අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායිම්හා.

1. අඤ්ඤමඤ්ඤං - සීමු
2. අකිලන්තචිත්තා තම්හා - මජසං

ආයුෂ්මත්නි, මෙසේ සකස් කැරගන්නා ලද ක්‍රීඩාප්‍රදූෂක මූලක ආචාර්‍ය්‍ය වාදයක් වූ ලොකොත්පත්ති වංශකථාවක් තෙපි පණවවු දැ''යි මම අසමි. 'ඇවැත්නි ගෞතමයිනි, එසේ ආයුෂ්මත් ගෞතමයන් පැවැසූ පරිදි ම අප විසින් අසන ලදි'යි ඔහු කිහ. භාර්ගවය, මේ ලොකොත්පත්ති වංශකථාව ද මම දනිමි......යමක් තථාගත තෙමේ වෙසෙයි තුවණින් දන්නේ අනය ව්‍යසනයට නො පැමිණේ ද, එසේ වූ කෙලෙස් නිවීම මා විසින් තමා කෙරෙහි ම දන්නා ලද්දේ ය.

32. භාර්ගවය, මනඃප්‍රදූෂක මූලක ආචාර්‍ය්‍යවාදයක් වූ ලොකොත්පත්ති වංශකථාවක් යම් කෙනෙක් පණවත් ද, එසේ වූ සමහර මහණ කෙනෙක් බමුණු කෙනෙක් ඇත. මම ඔවුන් කරා ගොස් මෙසේ කියමි. ''ආයුෂ්මත්නි, තෙපි මනඃප්‍රදූෂකමූලක වූ ආචාර්‍ය්‍යවාද වූ සත්වොත්පත්ති වංශකථාවක් පණවවු ද? ඒ සැබෑ ද?' යි ප්‍රශ්න කරමි. මා විසින් මෙසේ විචාරනු ලැබූ ඔහු 'එසේ යැ'යි පිළිත කෙරෙත්. මම ඔවුන් බණවා, ''ආයුෂ්මත්නි, කෙසේ සැදුණු මනඃ ප්‍රදූෂකමූලක ආචාර්‍ය්‍යවාද වූ ලොකොත්පත්ති වංශකථාවක් තෙපි පණවවු දැ?'යි මෙසේ කියමි. මා විසින් ප්‍රශ්න කරන ලද ඔහු එයට පිළිතුරු දෙනු නො හැකි වෙත්. නො හැකිවන්නාහු පෙරළා මා ම විචාරත්. ඔවුන් විසින් විචාරන ලද මම ඔවුනට මෙසේ හෙළි කරමි: ''ඇවැත්නි, මනඃප්‍රදූෂක නම් දෙව් කෙනෙක් ඇත. ඔහු ඉතා බොහෝ වෙලාවක් උනුන් දෙස බලා හිඳිත්. ඉතා බොහෝ වෙලා උනුන් දෙස බලා ඉන්නා ඔහු උනුන් කෙරෙහි සිත් දූෂිත කැර ගනිත්. උනුන් කෙරෙහි ප්‍රදූෂිත වූ සිතැත්තාහු ක්ලාන්ත වූ කයැත්තාහු ක්ලාන්ත සිතැත්-තාහු ඒ දෙවියෝ ඒ දෙවලොවින් ච්‍යුත වෙත්, ඔවුන් අතුරෙන් එක්-තරා සත්ත්වයකු ඒ දෙව්ලොවින් සැව, මේ මිනිසත්බවට එතැ යි ද මෙ මිනිසත් බවට ආවහු ගිහි ගෙන් නික්ම පැවිදි බවට පැමිණෙතැ යි ද, පැවිදි බිමට පැමිණියහු ම උත්සාහ වඩා......යමසේ සිත සමාධිගත කල්හි ඒ පෙර වුසූ අත්බව සිහි කරතැ යි ද, එයින් ඔබබෙහි සිහි නො කරතැ යි ද යන මේ කාරණය විද්‍යමාන ය. හේ මෙසේ කියයි: ''යම් භවත් දෙව් කෙනෙක් මනඃප්‍රදූෂක නො වූහු ද, ඔහු අධික වෙලාවක් උනුන් නොබලන්නාහු උනුන් කෙරෙහි සිත් දූෂිත කැර නො ගනිත්. උනුන් කෙරෙහි ප්‍රදුෂ්ට නොවූ සිතැත්තාහු, ක්ලාන්ත නොවූ කයැත්තාහු, ක්ලාන්ත නොවූ සිතැත්තාහු, ඒ දෙවියෝ ඒ දෙවලොවින් නො සැවෙත් නිත්‍ය වැ ධ්‍රැව වැ ශාශ්වත වැ නො පෙරළෙන සැහැවි ඇති වැ (මහා-පෘථිවි ආදි) ශාශ්වත වස්තූන් සෙයින් ම නො වෙනස් ව සිටුනාහ. යම් බඳු වූ අපි මනඃප්‍රදූෂක වූමු ද, ඒ අපි අධික වෙලාවක් උනුන් දෙස බලා උන්නම්හ.

තෙ මයං අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්තා අඤ්ඤමඤ්ඤම්හි චිත්තානි පදූසයිම්හා. තෙ මයං අඤ්ඤමඤ්ඤම්හි පදුට්ඨචිත්තා කිලන්තකාය කිලන්තචිත්තා එවං මයං[2] තම්හා කායා චුතා අනිච්චා අද්ධුවා අසස්සතා අප්පායුකා චවනධම්මා ඉත්ථත්තං ආගතා''ති. එවංවිහිතකං නො තුම්හෙ ආයස්මන්තො මනොපදෙසිකං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා?''ති තෙ එවමාහංසු: ''එවං ඛො නො ආවුසො ගොතම සුතං යථෙවායස්මා ගොතමො ආහා''ති.

අග්ගඤ්ඤඤ්චාහං භග්ගව පජානාමි තඤ්ච පජානාමි -පෙ- යදභිජානං තථාගතො නො අනයං ආපජ්ජති.

33. සන්ති භග්ගව එකෙ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙන්ති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො අධිච්චසමුප්පන්නං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා?ති. තෙ ච මෙ එවං පුට්ඨා 'ආමො'ති පටිජානන්ති. ත්‍යාහං එවං වදාමි: කථංවිහිතකං නො පන තුම්හෙ ආයස්මන්තො අධිච්චසමු-ප්පන්නං ආචරියකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා?ති. තෙ ච මයා පුට්ඨා න සම්පායන්ති. අසම්පායන්තා මමඤ්ඤෙව පටිපුච්ඡන්ති. තෙසාහං පුට්ඨො බ්‍යාකරොමි: ''සන්තාවුසො සඤ්ඤසත්තා නාම දෙවා. සඤ්ඤුප්පාද ච පන තෙ දෙවා තම්හා කාය චවන්ති. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති, යං අඤ්ඤතරො සත්තො තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආගච්ඡති, ඉත්ථත්තං ආගතො සමානො අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො ආතප්පමන්වාය පධාන-මන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ තං සඤ්ඤුප්පාදං අනුස්සරති, තතො පරං නානුස්සරතී ති. සො එවමාහ: අධිච්චසමුප්පන්නො අත්තා ච ලොකො ච. තං කිස්ස හෙතු? අහං පුබ්බෙ නාහොසිං, සො'ම්හි එතරහි අහුත්වා සන්තතාය[3] පරිණතො''ති. එවංවිහිතකං නො පන තුම්හෙ ආයස්මන්තො අධිච්චසමුප්පන්නං ආචරි-යකං අග්ගඤ්ඤං පඤ්ඤපෙථා''ති. තෙ එවමාහංසු: ''එවං ඛො නො ආවුසො ගොතම සුතං යථෙවායස්මා ගොතමො ආහා''ති. අග්ගඤ්ඤ-ඤ්චාහං භග්ගව පජානාමි, තඤ්ච පජානාමි, තතො ච උත්තරිතරං පජානාමි, තඤ්ච පජානනං න පරාමසාමි, අපරාමසතො ච මෙ පච්චත්ත-ඤ්ඤෙව නිබ්බුති විදිතා, යදභිජානං තථාගතො නො අනයං ආපජ්ජති.

---

1. පදෙසියිම්හා (ස්‍යා)
2. කිලන්තචිත්තා එව මයං (P.T.S.) කිලන්තචිත්තා (මජසං)
3. සත්තතාය (P.T.S.)

ඒ අපි උතුන් දෙස බලා ඉන්නමෝ උතුන් කෙරෙහි සිත් දූෂිත කැරැ ගතුම්හ. ඒ අපි උතුනට ප්‍රදුෂ්ට වූ සිතැත්තමෝ එයින් ක්ලාන්ත කයැති වැ ක්ලාන්ත සිතැති වැ මෙසේ ඒ දෙව්ලොවින් චුත වූමෝ, අනිත්‍ය වූමෝ, අධ්‍රැව වූමෝ, ආශාශ්වත වූමෝ, අල්පායුෂ්ක වූමෝ, සැවෙන සුල්ලමෝ මෙ මිනිස්බවට ආම්හ'යි මෙසේ කියයි. ආයුෂ්මත්නි, තෙපි මෙසේ සැකැසුණු මනඃප්‍රදූෂක මූලක ආචාර්‍ය්‍යවාද වූ ලොකොත්පත්ති වංශකතාවක් පනවවු දැ?'යි මම ඇසිමි. 'ඇවැත්නි, ගෞතමයිනි, යම්සේ ආයුෂ්මත් ගෞතමයෝ කීහු ද, එසේ ම අප විසින් අසන ලද'යි ඔහු කීහ. භාර්ගවය, මම ලොකෝත්පත්ති වංශකථාව ද දනිමි. එය ද දනිමි... තථාගත තෙමේ යමක් වෙසෙසි නුවණින් දන්නෝ අනයව්‍යසනයට නො පැමිණේ ද එසේ වූ කෙලෙස් නිවීම තමා කෙරෙහි ම දන්නා ලද්දේ ය.

33. භාර්ගවය, යම් කෙනෙක් යදෘච්ඡාසමුත්පන්න වූ, ආචාර්‍ය්‍යවාද වූ, ලෝකෝත්පත්ති වංශ කථාවක් පනවත් ද, එසේ වූ සමහර මහණ කෙනෙක් බමුණු කෙනෙක් ඇත. මම ඔවුන් කරා එළැඹ 'ආයුෂ්මත්නි, තෙපි යදෘච්ඡාසමුත්පන්න ලොකොත්පත්ති වංශකථා සංඛ්‍යාත ආචාර්‍ය්‍යවාදයක් පණවන්නාහු ලු. ඒ සැබෑ ද?'යි මෙසේ ප්‍රශ්න කරමි. මා විසින් පුළුවුත් ඔහු එසේ යැ'යි පිළිත කෙරෙත්. 'ආයුෂ්මත්නි, කෙසේ සැදුණු, යදෘච්ඡාසමුත්පන්න වූ, ආචාර්‍ය්‍යවාද වූ ලොකොත්පත්ති වංශකථාවක් තෙපි පණවවුද?'යි මම ඔවුන් පිළිවිසිමි. මා විසින් පුළුවුස්නා ලද ඔහු එයට උත්තර දෙනු නො හැකි වෙත්. උත්තර දිය නො හැකි වන්නාහු, මා ම පුළුවුසිත්. එසේ පුළුවුස්නා ලදුයෙම් මම ඔවුනට මෙසේ හෙළි කොට කියමි "ඇවැත්නි, අසංඥසත්ව නම් දෙව් කෙනෙක් ඇත. සංඥව ඉපැත්මෙන් ම ඒ දෙවියෝ ඒ දෙව්ලොවින් ච්‍යුත වෙත්. ඇවැත්නි, එක්තරා සත්වයකු ඒ දෙව්ලොවින් සැවැ මෙ මිනිස් බවට පැමිණෙතැයි ද, එසේ මෙ මිනිසත් බවට පැමිණියාහු ගිහි ගෙන් පැවිදි බිමට යෙතැ යි ද, ගිහි ගෙන් නික්ම පැවිදි බිමට පැමිණ ම උත්සාහ වඩා......යම් සේ ම සිත සමාහිත කල්හි ඒ සංඥාව ගේ ඉපැත්ම සිහි කෙරේ නම් එයින් ඔබ්බෙහි සිහි නො කෙරේ නම් එසේ වූ චිත්තසමාධියක් ඔහු ස්පර්ශ කරතැ යි ද යන මේ කාරණය විද්‍යමාන එකෙක. හෙ තෙමේ ආත්මයත් ලොකයත් යදෘච්ඡා සමුත්පන්නහ (ඉබේ පහළ වූහ)'යි පණවයි. එසේ කියනු යේ කවර හෙයින? යත්: 'මම පෙරැ නොවීමි, ඒ මම පෙරැ නො වී දැන් සත්ව භාවයට පෙරළිණිමි යි හේ කියයි. ආයුෂ්මත්නි, තෙපි මෙසේ සැකැසුණු ආචාර්‍ය්‍යවාද වූ යදෘච්ඡාසමුත්පනන ලොකොත්පත්ති වංශකථාවක් පණවවු දැ?'යි මම ඔවුන් පිළිවිසිමි: 'ඇවැත්නි, ගෞතමයිනි, යම්සේ ආයුෂ්මත් ගෞතමයෝ කීහු ද, එසේ ම අප විසින් අසන ලද්දෙ යැ යි ඔහු කියත්.භාර්ගවය,අග්ගඤ්ඤය ද(ලෝකෝත්පත්ති වංශකථාව ද)මම දනිමි.එය ද දනිමි, එයින් වඩා උසස් වූ දැය ද දනිමි, ඒ දැනීම ද තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් පරාමර්ශනය නො කරමි.එය පරාමර්ශ නොකරන්නා වූද මාවිසින් යමක් වෙසෙසි නුවණින් දන්නා තථාගත තෙම අනයව්‍යසනයකට නො පැමිණෙයි ද, එසේ වූ කෙලෙස් නිවීම තමා කෙරෙහි ම දන්නා ලද්දේ ය.

33. එවංවාදිං ඛො මං භග්ගව එවමක්ඛායිං එකෙ සමණබ්‍රාහ්මණා අසතා තුච්ඡා මුසා අභූතෙන අබ්භාචික්ඛන්ති: "විපරීතො සමණො ගොතමො භික්ඛවො ච. සමණො ගොතමො එවමාහ: යස්මිං සමයෙ සුභං විමොක්ඛං උපසම්පජ්ජ විහරති සබ්බං තස්මිං සමයෙ අසුභන්තෙව[1] පජානාති ති. න ඛො පනාහං භග්ගව එවං වදාමි: යස්මිං සමයෙ සුභං විමොක්ඛං උපසම්පජ්ජ විහරති. සබ්බං තස්මිං සමයෙ අසුභන්තෙව පජානාතීති.[2] එවං ච ඛ්වාහං භග්ගව වදාමි: යස්මිං සමයෙ සුභං විමොක්ඛං උපසම්පජ්ජ විහරති, සුභන්තෙව තස්මිං සමයෙ පජානාතී'ති.

"තෙ'ච භන්තෙ විපරීතා යෙ භගවන්තං විපරීතතො දහන්ති භික්ඛවො ච. එවං පසන්නො අහං භන්තෙ භගවති, පහොති ච මෙ භගවා තථා ධම්මං දෙසෙතුං යථා අහං සුභං විමොක්ඛං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති."

"දුක්කරං ඛො එවං භග්ගව තයා අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්තිකෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රායොගෙන අඤ්ඤත්‍රාචරියකෙන සුභං විමොක්ඛං උපසම්පජ්ජ විහරිතුං. ඉඞ්ඝ ත්වං භග්ගව, යො ච තෙ අයං මයි පසාදො, තමෙව ත්වං සාධුකමනුරක්ඛා"ති.

"සචෙ තං භන්තෙ මයා දුක්කරං අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්තිකෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රායොගෙන අඤ්ඤත්‍ර ආචරියකෙන සුභං විමොක්ඛං උපසම්පජ්ජ විහරිතුං, යො ච මෙ අයං භන්තෙ භගවති පසාදො, තමෙවාහං සාධුකමනුරක්ඛිස්සාමී"ති.

ඉදමවොච භගවා. අත්තමනො භග්ගවගොත්තො පරිබ්බාජකො භගවතො භාසිතං අභිනන්දී ති.

පාථිකසුත්තං නිට්ඨිතං පඨමං.

---

1. අසුභන්තෙව (ස්‍යා.-PTS.)
2. සඤ්ජානාතීති (PTS.)
3. දිවාදිවස්සෙව (ස්‍යා PTS.)

33. භාර්ගවය, මෙසේ කියන, මෙසේ කරුණු පවසන මට, ඇතැම් මහණ කෙනෙක් බමුණු කෙනෙක් 'මහණ ගෞයුම් පෙරළුණු සංඥ ඇත්තේ ය, ඔහු සවු මහණහු ද පෙරළුණු සංඥා ඇත්තෝ යැ'යි ද, 'යම් විටෙක ශුභ විමොක්ෂය ලැබ වෙසේ නම් එ කලැ සියල්ල අශුභ යැ යි ම හඳුනා යැ යි ද' යි නැති දැයින්, හිස් මුසායෙන්, අභූතයෙන් දෙස් නඟත්. භාර්ගවය, ශුභවිමොක්ෂය ලැබ වසන කලැ 'සියල්ල අශුභ යැ යි හඳුනා යැ' යි මෙසේ මම නො කියමි. වැලි 'යම් සමයෙක ශුභවිමොක්ෂය ලැබ වෙසේ නම්, එ කලැ ශුභ යැ යි ම හඳුනා යැ'යි මෙසේ නම් මම කියමි.

"වහන්ස යම් කෙනෙක් වූකලි භාග්‍යවතුන් වහන්සේ ද භික්ෂූන් ද, විපරීත වශයෙන් පිහිටුවත් නම් (ඇති තතු වෙනස් කොටැ දක්වා දෙස් නගත් නම්), ඔහු ම විපරීතයෝ ය (පෙරළුණු සංඥ ඇත්තෝ ය). වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙසේ පැහැදුණෙම් වෙමි. යම් සේ මම ශුභ විමොක්ෂය ලැබ විසිය හැකි වන්නෙම් ද, භාග්‍යවතුන් වහන්සේ මට එසේ දහම් දෙසන්නට පොහොසත් සේකැ'යි මෙසේ මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණෙම් වෙමි"යි භාර්ගව කී ය.

"භාර්ගවය, අන්‍ය දෘෂ්ටික වූ අන්‍යලබ්ධික වූ අන්‍යරුචික වූ අන්‍ය ප්‍රතිපත්තියෙක යෙදුණු, අන්‍යතීර්ථායතනයෙක ඇදුරු වූ තා විසින් මෙසේ ශුභ විමොක්ෂය ලැබ වසන්නට දුෂ්කර ය. එබැවින් භාර්ගවය, මා කෙරෙහි තා ගේ මේ යම් පැහැදීමෙක් ඇද්ද, එය ම තෝ මොනොවට රකුව"යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

"වහන්ස, ඉදින් අන්‍යදෘෂ්ටික අන්‍යලබ්ධික අන්‍යරුචික අන්‍යප්‍රතිපත්ති-යෙක යෙදුණු අන් තීර්ථායතනයෙක ඇදුරු වූ මා විසින් ඒ ශුභ විමොක්ෂය ලැබ වසන්නට දුෂ්කර වේ නම්, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මගේ මේ යම් පැහැදීමෙක් ඇද්ද, එය ම මම මොනොවට රකින්නෙමි"යි භාර්ගව තෙම පැවසී ය.

භාග්‍යවතුන් වහන්සේ මේ දහම දෙසූ සේක. භාර්ගවගෝත්‍ර පරිව්‍රාජක තෙම ආරාධිත සිතැත්තේ භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය පිළි-ගත්තේ ය.

පළමු වන පාථික සූත්‍රය නිමියේ යැ. (24)

# 2

# උදුම්බරිකසුත්තං

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන නිග්‍රොධො පරිබ්බාජකො උදුම්බරිකාය පරිබ්බාජකාරාමෙ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං තිංසමත්තෙහි පරිබ්බාජකසතෙහි. අථ ඛො සන්ධානො ගහපති දිවා දිවස්ස[1] රාජගහා නික්ඛමි භගවන්තං දස්සනාය. අථ ඛො සන්ධානස්ස ගහපතිස්ස එතදහොසි: අකාලො ඛො තාව භගවන්තං දස්සනාය, පටිසල්ලීනො භගවා, මනොභාවනියානම්පි භික්ඛූනං අසමයො දස්සනාය. පටිසල්ලීනා මනොභාවනීයා භික්ඛූ. යංනූනාහං යෙන උදුම්බරිකාය පරිබ්බාජකාරාමො යෙන නිග්‍රොධො පරිබ්බාජකො තෙනුපසඞ්කමෙය්‍යන්ති.

2. අථ ඛො සන්ධානො ගහපති යෙන උදුම්බරිකාය පරිබ්බාජකාරාමො යෙන නිග්‍රොධො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන නිග්‍රොධො පරිබ්බාජකො මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නො හොති උන්නාදිනීයා උච්චාසද්දමහාසද්දාය අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා -සෙය්‍යථීදං : රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වා. අද්දසා ඛො නිග්‍රොධො පරිබ්බාජකො සන්ධානං ගහපතිං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වා සකං පරිසං සණ්ඨපෙසි: අප්පසද්දා භොන්තො හොන්තු, මා භොන්තො සද්දමකත්ථ. අයං සමණස්ස ගොතමස්ස සාවකො ආගච්ඡති සන්ධානො ගහපති. යාවතා ඛො පන සමණස්ස ගොතමස්ස සාවකා ගිහී ඔදාතවසනා රාජගහෙ පටිවසන්ති, අයං තෙසං අඤ්ඤතරො සන්ධානො ගහපති. අප්පසද්දකාමා ඛො පනෙතෙ ආයස්මන්තො අප්පසද්දවිනීතා අප්පසද්දස්ස වණ්ණවාදිනො. අප්පෙවනාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යාති. එවං වුත්තෙ තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං.

---

1. දිවා දිවස්සෙව, (සයා PTS)

# 2

# උදුම්බරික සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී:

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවරට නොදුරු නොළං තන්හි වූ ගිජුකුළු පව්වෙහි වැඩ වසන සේක. එ සමයෙහි න්‍යග්‍රෝධ නම් පිරිවැජි තෙමේ තුන් දහසක් පමණ වූ මහත් පිරිවැජි පිරිසක් හා උදුම්බරිකා දේවියගේ පිරිවැජි අරමෙහි වෙසෙයි. එ කල්හි සන්ධාන නම් ගෘහපති භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස ඉරමුදුන් වේලෙහි රජගහ නුවරින් නික්මිණ. එ කලැ ඔහුට 'තව ම භාග්‍යවතුන් වහන්සේ දක්නට නො කල් ම ය. භාග්‍යවතුන්වහන්සේ චිත්ත විවේකයෙන් වැඩ ඉන්නා සේක. සිත වඩන භික්ෂූන් ද දක්නට කාලය නො වේ. සිතවඩන භික්ෂුහු චිත්ත විවේකයෙන් උන්නාහු වෙති. උදුම්බරිකා දේවියගේ පිරිවැජි අරමට, න්‍යග්‍රෝධ පිරිවැජියා කරා ගියෙම් වීම් නම් යෙහෙකැ යි මේ සිත විය.

2. එ කල්හි සන්ධාන ගෘහපති තෙම උදුම්බරිකා දේවිය ගේ පිරිවැජි අරම කරා, න්‍යග්‍රෝධ පිරිවැජියා වෙතට ගියේ ය. එ සමයෙහි න්‍යග්‍රොධ පිරිවැජි තෙම උන්නාදී වැ ඝෝෂයෙන් යුක්ත වැ උස් හඬ මහ හඬ ඇති වැ, මහත් පිරිවැජි පිරිස හා රාජකථා චොරකථා මහාමාත්‍යකථා සෙනාකථා භයකථා යුද්ධකථා අන්නකථා පානකථා වස්ත්‍රකථා මාලාකථා ගන්ධකථා ඥතිකථා යානකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා පුරුෂකථා සූරකථා විසිඛාකථා කුම්භස්ථානකථා පූර්වප්‍රෙතකථා නානාත්වකථා ලොකාඛ්‍යායිකා සමුද්‍රාඛ්‍යායිකා ඉතිභවාභවකථා යන මේ කථා හෝ මෙ බඳු වූ තිරශ්චීන කථා කියමින් හුන්නේ වෙයි. න්‍යග්‍රෝධ පිරිවැජි තෙම එන්නාවූ සන්ධාන ගෘහපතියා දුටුයේ ය. දැක 'භවත්හු නිහඬ වෙත් වා. භවත්නි, ශබ්ද නො කරවු. මහණ ගොයුමන් ගේ සවු වූ මේ සන්ධාන ගෘහපති එයි. මහණ ගොයුමන් ගේ සවු වූ සුදු වත් හඳිනා, යම් පමණ ගිහි කෙනෙක් රජගහ නුවර වෙසෙත් ද, මේ සන්ධාන ගෘහපති ඔවුන්ගෙන් එක්තරා කෙනෙක. මේ ආයුෂ්මත්හු නිහඬ බව කැමැත්තෝ ය, නිහඬ බවිහි හික්මුණෝ ය, නිහඬ බවේ ගුණ කියන්නෝ ය. නිහඬ පිරිස දැන මෙහි එළැඹියැ යුතු යැ යි සිතුවොත් යෙහෙකැ''යි කියා සිය පිරිස නිහඬ කෙළේ ය. මෙසේ කී කල්හි ඒ පිරිවැජියෝ නිහඬ වූහ.

9. අථ ඛො සන්ධානො ගහපති යෙන නිග්‍රොධො පරිබ්බාජකො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා නිග්‍රොධෙන පරිබ්බාජකෙන සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සන්ධානො ගහපති නිග්‍රොධං පරිබ්බාජකං එතදවොච: අඤ්ඤථා ඛො ඉමෙ භොන්තො අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා සංගම්ම සමාගම්ම උන්නාදිනො උච්චාසද්දමහාසද්දා අනෙකවිහිතං තිරච්ඡානකථං ඉති වා අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං රාජකථං -පෙ- ඉතිභවාභව කථං අඤ්ඤථා ඛො[1] පන සො භගවා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානී'ති.

එවං වුත්තෙ නිග්‍රොධො පරිබ්බාජකො සන්ධානං ගහපතිං එතදවොච: යග්ඝෙ ගහපති ජානෙය්‍යාසි, කෙන සමණො ගොතමො සද්ධිං සල්ලපති? කෙන සාකච්ඡං සමාපජ්ජති? කෙන පඤ්ඤාවෙය්‍යත්තියං ආපජ්ජති. සුඤ්ඤාගාරහතා සමණස්ස ගොතමස්ස පඤ්ඤා, අපරිසාවචරො සමණො ගොතමො, නාලං සල්ලාපාය. සො අන්තමන්තානෙව[1] සෙවති. සෙය්‍යථාපි නාම ගො කාණා පරියන්තචාරිනී අන්තමන්තානෙව සෙවති. එවමෙව සුඤ්ඤාගාරහතා සමණස්ස ගොතමස්ස පඤ්ඤා, අපරිසාවචරො සමණො ගොතමො, නාලං සල්ලාපාය, සො අන්තමන්තානෙව සෙවති. ඉඞ්ඝ ගහපති, සමණො ගොතමො ඉමං පරිසං ආගච්ඡෙය්‍ය, එකපඤ්හෙනෙව නං සංසාදෙය්‍යාම,[2] තුච්ඡකුම්භිංව නං මඤ්ඤෙ ඔරොධෙය්‍යාමා'ති.

4. අස්සොසි ඛො භගවා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසකාය සන්ධානස්ස ගහපතිස්ස නිග්‍රොධෙන පරිබ්බාජකෙන සද්ධිං ඉමං කථාසල්ලාපං. අථ ඛො භගවා ගිජ්ඣකූටා පබ්බතා ඔරොහිත්වා යෙන සුමාගධාය තීරෙ මොරනිවාපො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුමාගධාය තීරෙ මොරනිවාපෙ අබ්භොකාසෙ චඞ්කමි. අද්දසා ඛො නිග්‍රොධො පරිබ්බාජකො භගවන්තං සුමාගධාය තීරෙ මොරනිවාපෙ අබ්භොකාසෙ චඞ්කමන්තං. දිස්වාන සකං පරිසං සණ්ඨපෙසි: අප්පසද්දා භොන්තො හොන්තු, මා භොන්තො සද්දමකත්ථ. අයං සමණො ගොතමො සුමාගධාය තීරෙ මොරනිවාපෙ අබ්භොකාසෙ චඞ්කමති. අප්පසද්දකාමො ඛො පන සො ආයස්මා, අප්පසද්දස්ස වණ්ණවාදී, අප්පෙවනාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍ය. සචෙ සමණො ගොතමො ඉමං පරිසං ආගච්ඡෙය්‍ය, ඉමං තං පඤ්හං පුච්ඡෙය්‍යාම 'කො නාම සො භන්තෙ භගවතො ධම්මො යෙන භගවා සාවකෙ විනෙති යෙන භගවතා සාවකා විනීතා අස්සාසප්පත්තා පටිජානන්ති අජ්ඣාසයං ආදිබ්‍රහ්මචරිය'න්ති? එවං වුත්තෙ තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං.

1. අඤ්ඤථා ච පන (PTS)
   අන්තපන්තානෙව (සයා)
2. සංහරෙය්‍යාම (කම්)

3. එ කල්හි සන්ධාන ගෘහපති න්‍යග්‍රොධ පිරිවැජියා කරා එළැඹියේ ය. එළැඹ න්‍යග්‍රොධ පිරිවැජියා හා සතුටු විය. සතුටු විය යුතු සිතැ රැඳැවිය යුතු කථාව අවසන් කොට එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන්නාවූ ම සන්ධාන ගෘහපති තෙම න්‍යග්‍රෝධ පිරිවැජියාව මෙය කී ය: "මේ භවත් අන්තොටු පිරිවැජියෝ එක්තැන් ව එක්රැස් ව ඝොෂ ඇත්තාහු, උස් හඬ මහ හඬ ඇත්තාහු, රාජකථා......ඉතිභවා භව කථා යන මේ හෝ මෙබඳු වූ අනෙකවිධ තිරශ්චීන කථාහි යෙදුණාහු අන් සැටියෙකින් වෙසෙත්. ඒ භාග්‍යවතුන් වහන්සේ ස්වල්ප හඬ ඇති, මඳ හඬ ඇති, ජනවාත රහිත වූ, හුදෙකලා වැ කරන කටයුතුවලට සුදුසු වූ, ඒකීභ වයට යොග්‍ය වූ අරණ්‍ය වනප්‍රස්ථයන්, ගොදුරු ගමට දුර සෙනසුන් සෙවනාහු අන් සැටියෙකින් ම වෙසෙත්" (යනුයි).

මෙසේ කී කල්හි න්‍යග්‍රෝධ පිරිවැජි තෙම, සන්ධාන ගෘහපතියාට මෙය කී ය: "එසේ නම් ගැහැවිය දන ගන්න. මහණ ගොයුම් කවරකු හා කතා බස් කෙරේ ද? කවරකු හා සාකච්ඡාවට බස්නේ ද? කවරකු හා උතුරු පිළිතුරු කතායෙන් ප්‍රඥාව්‍යක්තතාවට පැමිණේ ද? මහණගොයුම්හු ගේ ප්‍රඥව ශූන්‍යාගාරයන්හි ම නටුයේ ය. මහණ ගොයුම් අවිසාරද බැවින් පිරිස් මැදට බස්නට නො හැක්කේ ය. ආලාපසංලාපයට සමත් නො වෙයි. ඇහේ කිසිවක් හැපෙතැ යි මහ හැර හැර යන එකැස් කණ දෙනක සේ ප්‍රශ්න අසතැ යි බියෙන් ගමින් බොහෝ දුරවූ සෙනසුන් සෙවනේ ය. එබැවින් දනගනුව, ගැහැවිය, මහණ ගොයුම් මේ පිරිසට ආවොත් එක් ප්‍රශ්නයෙන් ම ඔහු යටපත් කරන්නමු. හිස් කළයක් (ඒ මේ අත පෙරළා බැඳ තබන්නාක්) සෙයින් වාද කථායෙන් බැඳ තබන්නෙමු" (යනු යි).

4. භාග්‍යවතුන් වහන්සේ මනුෂ්‍ය විෂය සීමා ඉක්මි පිරිසිදු දිවකන් තුවණින් සන්ධාන ගෘහපතිහු න්‍යග්‍රොධ පිරිවැජියා හා කැරෙන මේ කථා-සංලාපය අසා වදළසේක. ඉක්බිති ගිජුකුළු පව්වෙන් බැස, සුමාගධා පොකුණු තෙර වූ මයූරනිවාප නම් තැනට වැඩි සේක. වැඩ එහි සුමාගධා පොකුණු තෙර මයූර නිවාපයෙහි එළිමහනෙහි සක්මන් කළ-සේක. න්‍යග්‍රොධ පිරිවැජි තෙම සුමාගධාතීරයෙහි මයූර නිවාප-යෙහි එළිමහනැ සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේ දිටී ය. දැක සිය පිරිස බණවා, 'භවත්හු නිහඬ වෙත් වා. භවත්නි, ශබ්ද නො කරවූ. මේ ශ්‍රමණ ගෞතම තෙමේ සුමාගධාව තෙර මයූර නිවාපයෙහි පිළිමහනැ සක්මන් කෙරෙයි. ඒ ආයුෂ්මත් තෙමේ නිහැඬියාව කැමැත්තේ, නිහඬ බවැ ගුණ කියන සුලු ය. මෙ පිරිස නිහඬ වැ ඉඳි-නාහු දන එළැඹියැ යුතු කොට සිතුයේ වී නම් ඉතා යෙහෙක. ඉදින්-ශ්‍රමණ ගෞතම තෙමේ මෙ පිරිස කරා ආයේ වී නම්, 'වහන්ස' භාග්‍ය-වතුන් වහන්සේ යම් දහමෙකින් ශ්‍රාවකයන් හික්මවන සේක් ද භාග්‍යවතුන් වහන්සේ විසින් යම් දහමෙකින් හික්මවන ලද සව්වෝ සතුටට පැමිණි-යාහු උත්තම නිඃශ්‍රයයක්, ආදිම බ්‍රහ්මචර්‍ය්‍යයක් (ලොවුතුරා මඟක්) තමන් සතුටට කාරණ යැ යි) පිළින කෙරෙත් ද,භාග්‍යවතුන් වහන්සේගේ ඒ ධර්මය කවරේ වේ ද?'යි මේ පැණය විචාරන්නමු' යි කී ය. මෙසේ කී කලැ ඒ පිරිවැජියෝ නිහඬ වූහ.

## තපොජිගුච්ඡාවාද

5. අථ ඛො භගවා යෙන නිග්‍රොධො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අථ ඛො නිග්‍රොධො පරිබ්බාජකො භගවන්තං එතදවොච: එතු ඛො භන්තෙ භගවා, ස්වාගතං භන්තෙ භගවතො. චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භන්තෙ භගවා, ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිග්‍රොධොපි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නං ඛො නිග්‍රොධං පරිබ්බාජකං භගවා එතදවොච: 'කායනුත්ථ නිග්‍රොධ එතරහි කථාය සන්නිසින්නා? කා ච පන වො අන්තරා කථා විප්පකතා?ති. එවං වුත්තෙ නිග්‍රොධො පරිබ්බාජකො භගවන්තං එතදවොච: "ඉධ මයං භන්තෙ අද්දසාම භගවන්තං සුමාගධාය තීරෙ මොරනිවාපෙ අබ්භොකාසෙ චඞ්කමන්තං. දිස්වාන එවං අවොචුම්හා: සචෙ සමණො ගොතමො ඉමං පරිසං ආගච්ඡෙය්‍ය, ඉමං තං පඤ්හං පුච්ඡෙය්‍යාම: කො නාම සො භන්තෙ භගවතො ධම්මො යෙන භගවා සාවකෙ විනෙති, යෙන භගවතා සාවකා විනීතා අස්සාසප්පත්තා පටිජානන්ති අජ්ඣාසයං ආදිබ්‍රහ්මචරියන්ති?" අයං ඛො නො භන්තෙ අන්තරා කථා විප්පකතා, අථ භගවා අනුප්පත්තො"ති.

"දුජ්ජානං ඛො පනෙතං නිග්‍රොධ තයා අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්තිකෙන අඤ්ඤරුචිකෙ අඤ්ඤත්‍රායොගෙන අඤ්ඤත්‍රාචරියකෙන 'යෙනාහං සාවකෙ විනෙමි, යෙන මයා සාවකා විනීතා අස්සාසප්පත්තා පටිජානන්ති අජ්ඣාසයං ආදිබ්‍රහ්මචරියන්ති. ඉඞ්ඝ ත්වං මං නිග්‍රොධ සකෙ ආචාරියකෙ අධිජෙගුච්ඡෙ පඤ්හං පුච්ඡ "කථං සන්තා නු ඛො භන්තෙ තපොජිගුච්ඡා පරිපුණ්ණා හොති, කථං අපරිපුණ්ණා"? ති.

6. එවං වුත්තෙ තෙ පරිබ්බාජකා උන්නාදිනො උච්චාසද්දා මහාසද්දා අහෙසුං, "අච්ඡරියං වත භො අබ්භුතං වත භො සමණස්ස ගොතමස්ස මහිද්ධිකතා මහානුභාවතා, යත්‍ර හි නාම සකවාදං ඨපෙස්සති, පරවාදෙන පවාරෙස්සතී"ති. අථ ඛො නිග්‍රොධො පරිබ්බාජකො තෙ පරිබ්බාජකෙ අප්පසද්දෙ කත්වා, භගවන්තං එතදවොච: "මයං ඛො භන්තෙ තපොජිගුච්ඡාවාද තපොජිගුච්ඡාසාරා[1] තපොජිගුච්ඡං අල්ලීනා[2] විහරාම. කථං සන්තා නු ඛො භන්තෙ තපොජිගුච්ඡා පරිපුණ්ණා හොති, කථං අපරිපුණ්ණා? ති"

---

1. තපොජිගුච්ඡා සාරොද (සම)
2. තපොජිගුච්ඡා අල්ලීනා (මජසං)

5. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ න්‍යග්‍රොධ පිරිවැජි කරා වැඩි සේක. එ විට න්‍යග්‍රෝධ පිරිවැජිතෙම "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වඩිනා සේක් වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහි වැඩි සේ මැනැව. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහි වඩිනා පිණිස යම් ගමන වාරයෙක් වේ ද, බොහෝ කලෙකින් ඒ ගමනවාරය කළ සේක. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳිනා සේක් වා. මේ අස්නෙක් පැනැවිණැ" යි භාග්‍යවතුන් වහන්සේට මෙ බස් කී ය. භාග්‍යවතුන් වහන්සේ ප්‍රඥප්තාසනයෙහි වැඩ හුන් සේක. න්‍යග්‍රෝධ පිරිවැජි ද එක්තරා මිටි අස්නක් ගෙන පසෙක උන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක උන්නාවූ ම න්‍යග්‍රොධ පිරිවැජියා බණවා, "න්‍යග්‍රොධයෙනි, දුන් තෙපි කවර කථාවෙකින් හුන්නහු ද? තොප අතර කවර කථාවෙක් අඩාළ වී ද?"යි අසා වදළ සේක. මෙසේ වදළ කලැ න්‍යග්‍රොධ පිරිවැජිතෙම "වහන්ස, මෙහි සුමාගධා පොකුණු තෙර මයුර නිවාපයෙහි එළිමහනැ සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේ දුටුමු. දුක, 'ඉදින් ශ්‍රමණ ගෞතමයෝ මේ පිරිස කරා වඩනාහු නම්, 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම් දහමෙකින් ශ්‍රාවකයන් හික්මවන සේක් ද, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් දහමෙකින් හික්මවන ලද සව්වෝ සතුටට පැමිණියාහු උත්තම නිඃශ්‍රය වූ පැරණිතම බඹසරක් පිළිත කෙරෙත් ද, භාග්‍යවතුන් වහන්සේගේ ඒ ධර්මය කවරේ වේ ද?'යි මේ පැණය ඔබ විචාරන්නමු'යි කීමහ. වහන්ස, අප අතර මේ කථාව අඩාළ විය. එ කලැ භාග්‍යවතුන් වහන්සේ වැඩි සේකැ''යි පැවැසීය.

"න්‍යග්‍රොධයෙනි, 'යමෙකින් මම සව්වන් හික්මවන්නෙම් ද, මා විසින් යමෙකින් හික්මවන ලද සව්වෝ සතුටට පැමිණියාහු, උත්තමාධාරය වූ පැරණිතම බඹසරක් පිළිත කෙරෙත් ද, එය අන්‍යදෘෂ්ටික වූ අන්‍යලබ්ධික වූ අන්‍යරුචික වූ අන්‍ය ප්‍රතිපත්තියෙක යෙදුණු, අන්‍ය තීර්ථායතනයෙක ඇදුරු වූ තොප විසින් දත නො හැක්ක. එබැවින් න්‍යග්‍රොධයිනි, 'වහන්ස, කෙසේ වූ තපොජුගුප්සාව පරිපූර්ණ වෙ ද? කෙසේ වූ තපොජුගුප්සාව අපරිපූර්ණ වේ ද?'යි තෙපි ස්වකීය ආචාර්‍ය්‍ය වාදය වූ අධිජෙගුච්ඡයෙහි (රූක්ෂ පිළිවෙතින් අතිශයින් පව් බැහැර ලීමෙහි) මා විචාරවු''යැ යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

6. මෙසේ වදළ කලැ ඒ පිරිවැජියෝ 'ස්වකීය වාදය පසෙක තබා පරවාදයෙන් පවරන සේ වූ මහණ ගොයුමන්ගේ මහ ඉදුමත් බව අසිරිය, මහ තෙද බලැති බව පුදුම යැ! යි ඝොෂ පවත්වනුවෝ උස් හඬැත්තාහු මහත් හඬැත්තාහු වූහ, ඉක්බිති න්‍යග්‍රොධ පිරිවැජි ඒ පිරිවැජ්ජන් නිහඬ කොට, 'වහන්ස, අපි තපොජුගුප්සාවාදය (රළු පිළිවෙතින් පව් අරැ ලියැ යුතුය යන දෘෂ්ටිය) ඇත්තමෝ, තපොජුගුප්සාව සාරය කොටැත්තමෝ තපොජුගුප්සාවාදයෙහි ඇලුණමෝ වසම්හ. වහන්ස, කෙබඳු වූ ම තපොජුගුප්සාව පරිපූර්ණ වේ ද? කෙබඳු වූම තපොජුගුප්සාව පරිපූර්ණ නො වේ ද?''යි භාග්‍යවතුන් වහන්සේගෙන් මේ පැණය පුළුවුත.

“ඉධ නිග්‍රොධ තපස්සී අචෙලකො හොති, මුත්තාචාරො හත්ථාප-ලෙඛනො,[1] නඑහිභද්දන්තිකො, නතිට්ඨභද්දන්තිකො, නාභිහටං න උද්දිස්සකටං න නිමන්තනං සාදියති. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාති, න කළොපිමුඛා පටිග්ගණ්හාති. න එළකමන්තරං, න දණ්ඩමන්තරං, න මුසලමන්තරං, න ද්වින්නං භුඤ්ජමානානං, න ගබ්භිනියා, න පාය-මානාය, න පුරිසන්තරගතාය, න සංකිත්තීසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං, න මංසං, න සුරං, න මෙරයං, න ථුසොදකං පිවති. සො එකාගාරිකො වා හොති එකාලොපිකො, ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො, සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො. එකිස්සාපි දත්තියා යාපෙති, ද්වීහි පි දත්තීහි යාපෙති -පෙ- සත්තහි පි දත්තීහි යාපෙති. එකාහිකම්පි ආහාරං ආහාරෙති, ද්වාහිකම්පි[2] ආහාරං ආහාරෙති තීහිකම්පි...චතූහිකම්පි...පඤ්චාහි-කම්පි...ඡාහිකම්පි... සත්තාහිකම්පි ආහාරං ආහාරෙති -පෙ- ඉති එවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති.

සො සාකභක්ඛො වා හොති, සාමාකභක්ඛො වා හොති, නීවාරභක්ඛො වා හොති, දද්දුලභක්ඛො වා හොති, හටභක්ඛො වා හොති, කණභක්ඛො වා හොති, ආචාමභක්ඛො වා හොති, පිඤ්ඤාකභක්ඛො වා හොති, තිණභක්ඛො වා හොති, ගොමයභක්ඛො වා හොති, වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී.

1. හත්ථාවලෙඛනො (සමු)
2. ද්වීහිකම්පි (මජසං)

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

"න්‍යග්‍රොධයෙනි, මෙහි තපස්වී තෙම නිරුවත් වෙයි, සිට ගෙන මල මූ පහකිරීම් ආදි වශයෙන් තොරවූ ශිෂ්ටාචාර ඇත්තේ වෙයි, කෑම කා අත ලොවන්නේ ය. මෙහි වඩින්නැ වහන්සැ යි බික් පිළිගන්නට කැඳවූ විට නො එන්නේ ය. මෙහි වැඩ සිටින්නැ'යි අයැදූ විට නො සිටී, වේලායෙන් පළමු එළවූ බොජුන් නො පිළිගනී, තමා උදෙසා පිළියෙල කළ බොජුන් නො පිළිගනී, නිමන්ත්‍රණය නො ඉවසයි. හෙ තෙම සැළිමුවින් නඟා දුන් බොජුන් නො පිළිගනී. සැළිපසින් නඟා දුන් බොජුන් නො පිළිගනී. එළිපත අතර කොට (එළිපතින් එහා පැත්තේ සිට) තුබූ බොජුන් නො පිළිගනී. දංඩක් අතර කොට තුබූ බොජුන් නො පිළිගනී. මොහොලක් අතර කොට තුබූ බොජුන් නො පිළිගනී. බොජුන් වළඳන දෙදෙනෙකු ගෙන් එකකු නැඟී එළැවූ බොජුන් නො පිළිගනී. ගැබින්නක දුන් බොජුන් නො පිළිගනී. කිරි පොවන්නියක එළැවූ බොජුන් නො පිළිගනී. පුරුෂයකු හා වාසයට ගිය ස්ත්‍රියක දුන් බොජුන් නො පිළිගනී, කිහිප දෙනෙකුගේ සම්මාදමින් පිළියෙල කොට එළැවූ බොජුන් නො පිළිගනී. ළඟ හුන් සුනඛයාට නොදී තමාට දුන් අහර නො පිළිගනී. මැස්සන් කැටි කැටි ව ගැවැසෙන තැනදී දුන් අහර නො පිළිගනී. දියමස් නො වළඳයි. ගොඩමස් නො වළඳයි. සුරා නො බොයි. පුෂ්පාසවාදි ආසව නො බොයි. සොවීරකය (සියලු ශශ්‍යසම්භාරයෙන් කළ කාඩිය) නොබොයි. හේ ඒකාගාරික (එක් ගෙයෙකින් පමණක් අහර ලැබ නවත්නේ) හෝ ඒකාලොපික (එක් බත් පිඩෙකින් පමණක් යැපෙන්නේ) හෝ වෙයි. සාප්තාගාරික (සත් ගෙයෙකින් පමණක් අහර ලැබ නවත්නේ හෝ සත් අහර පිඩෙකින් පමණක් යැපෙන්නේ) වෙයි. එක් දත්තියෙක (කුඩා තලියෙක) බතින් ද යැපෙයි. දත්ති (කුඩා තලි) දෙකෙක බතින් ද යැපෙයි, ......දත්ති සතෙක බතින් ද යැපෙයි. දවසක් හැර දවසක් ද අහර ගනී. දෙ දවසක් හැර දවසක් ද අහර ගනී. තුන් දවසක්... සතර වසක්...පස් දවසක්... ස දවසක් ... සත් දවසක් හැර දවසක් ද අහර ගනී ... මෙසේ මෙ අයුරින් අඩ මසක් හැර දවසක් ද වාර බත් වැළඳීමේ ව්‍රතයේ යෙදුණේ වෙසෙයි.

හේ අමු පලා බුදින්නේ හෝ වෙයි, බොඩහමු බුදින්නේ හෝ වෙයි. සියදු වී (උංරුහැල්) බුදින්නේ හෝ වෙයි. සම් ලියාලූ කසට බුදින්නේ හෝ වෙයි. ලහටු ද දිය සෙවෙල් ද බුදින්නේ හෝ වෙයි. සහල්කුඩු බුදින්නේ හෝ වෙයි. දඹු බත් කන්නේ හෝ වෙයි. මුරුවට කන්නේ හෝ වෙයි. තණකොළ කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි. තමන් ම වැටුණු පල වළඳනුයේ, වනැ මුල් පල අහර කොටැත්තේ යැපෙයි.

7. සො සාණානි පි ධාරෙති, මසාණානි පි ධාරෙති, ඡවදුස්සානි පි ධාරෙති, පංසුකූලානි පි ධාරෙති, තිරීටානි පි ධාරෙති, අජිනානි පි ධාරෙති අජිනක්ඛිපම්පි ධාරෙති, කුසචීරම්පි ධාරෙති, වාකචීරම්පි ධාරෙති, ඵලකචීරම්පි ධාරෙති, කෙසකම්බලම්පි ධාරෙති, වාළකම්බලම්පි ධාරෙති, උලූකපක්ඛම්පි ධාරෙති.

කෙසමස්සුලොචකො පි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො, උබ්භට්ඨකො පි[1] හොති ආසනපටික්ඛිත්තො, උක්කුටිකො පි හොති උක්කුටිකප්පධානමනුයුත්තො, කණ්ටකාපස්සයිකො පි හොති කණ්ටකාපස්සෙ සෙය්‍යං කප්පෙති, ඵලකසෙය්‍යම්පි කප්පෙති, ථණ්ඩිලසෙය්‍යම්පි කප්පෙති, එකපස්සයිකො පි හොති රජොජල්ලධරො, අබ්භොකාසිකො පි හොති යථාසන්ථතිකො, වෙකටිකො පි හොති විකටභොජනානුයොගමනු යුත්තො, ආපානකො පි හොති ආපානකත්තමනුයුත්තො, සායංතතියකම්පි උදකොරොහනානුයොගමනුයුත්තො විහරති.

තං කිම්මඤ්ඤසි නිග්‍රොධ යදි එවං සන්තෙ තපොජිගුච්ඡා පරිපුණ්ණා වා හොති අපරිපුණ්ණා වා? ති.

අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තපොජිගුච්ඡා පරිපුණ්ණා හොති නො අපරිපුණ්ණා''ති.

## තපො උපක්කිලෙසා

8. ''එවං පරිපුණ්ණාය පි ඛො අහං නිග්‍රොධ තපොජිගුච්ඡාය අනෙකවිහිතෙ උපක්කිලෙසෙ වදමී''ති.

''යථාකථං පන භන්තෙ භගවා එවං පරිපුණ්ණාය තපොජිගුච්ඡාය අනෙකවිහිතෙ උපක්කිලෙසෙ වදති? ති.''

''ඉධ නිග්‍රොධ තපස්සී තපං සමාදියති. සො තෙන තපසා අත්තමනො හොති පරිපුණ්ණසංකප්පො. යම්පි ඛො නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා අත්තමනො හොති පරිපුණ්ණසංකප්පො, අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො' හොති,

1. උබ්භට්ඨකොපි (ස්‍යා) උබ්භට්ඨකො පි (කම්)

7. හේ හණ වැහැරි ද දරයි, අන් හූ හා හණ නූල් මුසු කොට වියූ වස්ත්‍ර දරයි, මිනියෙන් බැහැරකොට ලූ වස්ත්‍ර දරයි, ඉවතැ ලූ කඩමාලු රෙදි දරයි, රිටි සුඹුලුයෙන් වියූ වස්ත්‍ර දරයි, අඳුන් මුවසම් දරයි, මැදින් පළන ලද කුර සහිත අඳුන් මුව සම් දරයි, කුසතණ ගොතා කළ වැහැරි ද දරයි, තියද වැහැරි ද දරයි, මිනිස් කෙහෙයෙන් කළ කම්බිලි ද දරයි, අස් වලග ලොමින් කළ කම්බිලි ද දරයි, මහමුහුණු පියා පතින් කළ වැහැරිද දරයි,

කේසමස්සු ලෝචනානුයෝගයෙහි යෙදුණේ කෙහෙ රවුලු උදුරන්නේ වෙයි, පිළිකෙවු කළ අසුන් ඇත්තේ නැගී (සෘජුව) සිටුනේ වෙයි. උක්කුටිකප්පධානයෙහි (එළිල්ලෙන් හිඳගෙණ කරන වීයර්යයෙහි) යෙදුණේ උක්කුටුක (පැන පැන යන්නේ) ද වෙයි, කණ්ටකාපස්සයික ව්‍රත රක්නේ කටුමැස්සෙහි ශයනය කෙරෙයි. පුවරුයෙහි ශයනය ද කෙරෙයි, බිමැ ශයනය ද කෙරෙයි, එක් ඇලයකින් හෝනේ ද වෙයි, රජස් දැලි දරනුයේ එළිමහනේ වසනුයේ ද වෙයි. අතුරන ලද පරිදි වූ අස්නැ හිඳුනේ ද වෙයි, විකෘත භොජනයෙහි (ගූථානුභවයෙහි) යෙදුණේ වෛකෘතික ව්‍රතය රක්නේ වෙයි, සිහිල් දිය නො බොනුයේ අපානක ව්‍රතය (සිහිල් දිය නොබොන වත) රක්නේවෙයි, සවස තෙවැනි කොට උදේ මද්දහන සවස යන තුන් වේලෙහි (පව් සෝදන්නට) දියට බසිනුයෙහි යෙදුණේ වෙසෙයි.

න්‍යග්‍රොධයෙනි, එය කිමැයි සිතවු ද? ඉදින් මෙසේ ඇති කල්හි තපො ජුගුප්සාව පරිපූර්ණ වේ ද? පරිපූර්ණ නො වේ ද?''

''වහන්ස, මෙසේ ඇති කල්හි තපොජුගුප්සාව පරිපූර්ණ වෙයි, අපරිපූර්ණ නො වෙයි'' පිරිවැජි කී ය.

## තප උපක්ලෙශයෝ

8. ''න්‍යග්‍රොධයෙනි, මෙසේ පරිපූර්ණ වූ ද තපොජුගුප්සාවෙහි අනෙකවිධ උපක්ලේශයන් කියමි''යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. ''වහන්ස, කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ මෙසේ පරිපූර්ණ වූ ද තපොජුගුප්සාවෙහි අනෙකවිධ උපක්ලේශයන් වදරන සේක් ද?'' යි පිරිවැජි පුළුවුත.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක.: ''න්‍යග්‍රෝධයෙනි, මෙහි තවුස් තෙම තපස සමාදන් කොට ගනී. හේ ඒ තපසින් සතුටු වූ සිතැත්තේ, අවසන් කළ සංකල්ප ඇත්තේ (තෘප්ත වූයේ) වෙයි. න්‍යග්‍රොධයිනි, තවුස් තෙම යම් තපසක් සමාදන් කොට ගනී නම්, හේ ඒ තපසින් සතුටු වේ නම්, තෘප්ත වේ නම්, න්‍යග්‍රොධයෙනි, මෙය ද තවුස් හට උපක්ලේශයෙක් වෙයි.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති. සො තෙන තපසා අත්තානුක්කංසෙති පරං වම්භෙති. යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා අත්තානුක්කංසෙති· පරං වම්භෙති, අයම්පි නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති. සො තෙන තපසා මජ්ජති මුච්ඡති පමාදමාපජ්ජති.[1] යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා මජ්ජති මුච්ඡති පමාදමාපජ්ජති, අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති. සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන අත්තමානො හොති පරිපුණ්ණසංකප්පො. යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති, සො තෙන ලාභසක්කාරසිලොකෙන අත්තමනො හොති පරිපුණ්ණසංකප්පො. අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති. සො තෙන තපසා ලාභසක්කාර සිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන අත්තානුක්කංසෙති පරං වම්භෙති. යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති, සො තෙන් ලාභසක්කාරසිලොකෙන අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති. සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන මජ්ජති මුච්ඡති පමාදමාපජ්ජති. යම්පි ඛො නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති, සො තෙන ලාභසක්කාරසිලොකෙන මජ්ජති මුච්ඡති පමාදමාපජ්ජති, අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති, භොජනෙසු වොදාසං ආපජ්ජති 'ඉදං මෙ ඛමති, ඉදං මෙ නක්ඛමතී'ති. යො යඤ්ච[2] ඛ්‍වස්ස නක්ඛමති තං සාපෙක්ඛො පජහති, යං පනස්ස ඛමති තං ගධිතො[3] මුච්ඡිතො අජ්ඣොපන්නො අනාදීනවදස්සාවී අනිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති -පෙ- අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

1. මදමාපජ්ජති -ස්‍යා-
2. යංහි (PTS)
3. ගථිතො (සිමු)

තව ද න්‍යග්‍රොධයිනි, තවුස් තෙමේ තපස සමාදන් කොට ගනී. හේ ඒ තපසින් තමා හුවා තබයි, මෙරමා හෙලා දකී. න්‍යග්‍රොධයිනි, තවුසකු තපස සමාදන් කොට ගෙන එයින් තමා හුවා තබනු ද මෙරමා හෙලා දකිනු ද යන මෙය ද තවුස්හට උපක්ලේශයෙකි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙමෙ තපස සමාදන් කොට ගනී. හේ එයින් මත් වෙයි, මුසපත් වෙයි, පමාවට පැමිණෙයි. න්‍යග්‍රොධයෙනි, තවුසක්හු තපස සමාදන් කොට ගෙන එයින් මත් වනු, මුසපත් වනු පමාවට පැමිණෙනු ද තවුස්හට උපක්ලේශයෙකි.

න්‍යග්‍රොධයෙනි, තව ද තවුස් තෙමේ තපස සමාදන් කොට ගනී, ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි. හේ ඒ ලාභ සත්කාර කීර්තියෙන් සතුටු වෙයි, පරිපූර්ණ සංකල්ප ඇත්තේ වෙයි. න්‍යග්‍රොධ-යෙනි, තවුසක්හු තපස සමාදන් කොට ගෙන එයින් ලාභ සත්කාර කීර්ති උපදවනු ද ඔහු එයින් සතුටු වනු ද පරිපූර්ණ මනොරථ ඇති වනු ද තවුස් හට උපක්ලේශයෙක් වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙමේ තපස සමාදන් කොට ගනී. හේ එයින් ලාභ සත්කාර කීර්ති උපදවයි හේ ඒ ලාභ සත්කාර කීර්ති-යෙන් තමා හුවා තබයි මෙරමා හෙලා දකී න්‍යග්‍රෝධයෙනි, තවුසක්හු තපස සමාදන් කොට ගෙන එයින් ලාභ සත්කාර කීර්ති උපදවනු ද එයින් තමා හුවා තබනු ද මෙරමා හෙලා දකිනු ද යන මෙය තවුස්හට උපක්ලේශයෙක් වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙමේ තපස සමාදන් කොට ගනී හේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි. හේ එයින් මත් වෙයි. මුස පත් වෙයි. පමාවට පැමිණෙයි. න්‍යග්‍රෝධයෙනි, තවුසක්හු තපස සමාදන් කොට ගෙන එයින් ලාභ සත්කාර කීර්ති උපදවනු ද එයින් මත් වනු ද මුස පත් වනු ද පමාවනු ද යන මෙ හැම තවුස්හට උපක්ලේශ වෙයි.

තව ද න්‍යග්‍රොධයෙනි, තවුස් තෙමේ තපස සමාදන් කොට ගනී. හේ (තමා ලත්) බොජුන්හි මෙය 'මට රිසියෙයි, මෙය නො රිසියෙයි' කියා දෙකොටසකට බෙදන බවට පැමිණෙයි. හේ තමාට නො රිසියෙන බොජුන් තෘෂ්ණා සහිත ව බැහැර කෙරෙයි. තමාට රිසියෙන බොජුන් ගිජු වූයේ මුස පත් වූයේ, එහි ලැඟුණේ, ආදීනවමාත්‍රා දු නො දක්නේ ප්‍රත්‍යවෙක්ෂණ මාත්‍රා පරිභෝග මාත්‍රා ද නො දන්නේ වළඳයි . . . . මෙය ද න්‍යග්‍රෝධයෙනි, තවුස්හට උපක්ලේශ වෙයි.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති ලාභසක්කාරසිලොක-නිකන්තිහෙතු 'සක්කරිස්සන්ති මං රාජානො රාජමහාමත්තා ඛත්තියා බ්‍රාහ්මණා ගහපතිකා තිත්ථියා'ති. -පෙ- අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී අඤ්ඤතරං සමණං වා බ්‍රාහ්මණං වා අපසාදෙතා[1] හොති: කිම්පනායං සම්බහුලාජීවො[2] සබ්බං සම්භ-ක්ඛති සෙය්‍යථිදං මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං අසනිවිචක්කං දන්තකූටං සමණප්පවාදෙනාති -පෙ- අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

9. පුන ච පරං නිග්‍රොධ තපස්සී පස්සති අඤ්ඤතරං සමණං වා බ්‍රාහ්මණං වා කුලෙසු සක්කරියමානං ගරුකරියමානං මානියමානං පූජියමානං දිස්වා තස්ස එවං 'හොති ඉමඤ්හි නාම සම්බහුලාජීවං කුලෙසු සක්කරොන්ති ගරු කරොන්ති මානෙන්ති පූජෙන්ති, මං පන තපස්සිං ලූඛාජීවිං කුලෙසු න සක්කරොන්ති න ගරු කරොන්ති න මානෙන්ති න පූජෙන්ති'ති. ඉති සො ඉස්සාමච්ඡරියං කුලෙසු උප්පා-දෙතා හොති -පෙ- අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී ආපාතකනිසාදී[3] හොති. යම්පි ඛො නිග්‍රොධ තපස්සී ආපාතකනිසාදී හොති අයම්පි ඛො නිග්‍රොධ තපස්සි-නො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී අත්තානං ආදස්සයමානො කුලෙසු චරති ඉදම්පි මෙ තපස්මිං ඉදම්පි මෙ තපස්මින්ති. -පෙ- අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී කිඤ්චිදෙව පටිච්ඡන්නං සෙවති සො 'ඛමති තෙ ඉදන්ති?' පුට්ඨො සමානො අක්ඛමමානං ආහ 'ඛමතී'ති ඛමමානං ආහ 'නක්ඛමතී'ති. ඉති සො සම්පජානමුසා භාසිතා හොති -පෙ- අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තථාගතස්ස සාවකස්ස වා ධම්මං දෙසෙන්තස්ස සන්තංයෙව පරියායං අනුඤ්ඤෙය්‍යං නානුජානාති -පෙ- අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

1. අපසාදෙතා (සම)
2. බහුලාජීවො (PTS)
3. ආපාථකනිසාදී (සීමු)

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙමේ 'රජුන් ද රාජ මහාමාත්‍යයන් ද ක්ෂත්‍රියයන් ද බ්‍රාහ්මණයන් ද ගෘහපතියන් ද, තිර්ථකයන් ද මට සත්කාර කරතැ'යි ලාභ සත්කාර කීර්ති අපේක්ෂායෙන් තපස සමාදන් කොට ගනී ද . . . මෙය ද තවුස්හට උපක්ලේශ වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, 'කිමෙක් ද? මෙ තෙම පසය බහුල කොට ඇති වැ දිවි පවත්වන්නේ, මූලවීජ, ස්කන්ධවීජ' පරුවීජ, අග්‍රවීජ, පස්වනු වීජවීජ යන හැම දයක් ම කා දමයි. මොහු ගේ දත් (එයට ් හසු වන සියල්ල සුණු විසුණු කරන මහ හෙන සකක් වැන්න, එහෙත් ශ්‍රමණ නාමයෙන් මොහු හඳුනති'යි කියා තවුස් තෙමේ කිසි යම් මහණකු හෝ බමුණකු හෝ හෙළා දක්නේ වේ ද, මෙය ද තවුස්හට උපක්ලේශ වෙයි.

9. තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම කුලයන්හි සත්කාර කරනු ලබන, ගෞරව කරනු ලබන, බුහුමන් කරනු ලබන, පුදනු ලබන කිසි යම් මහණකු හෝ බමුණකු හෝ දකී ද, දැකීමෙන් 'පසය බහුල කොටැති වැ දිවි පවත්වන මොහුට කුලයන්හි සත්කාර කරත්, ගෞරව කරත්, බුහුමන් කරත්, පුදත්. රූක්ෂ වැ ජීවත් වන මට වනාහි කුලයන්හි සත්කාර නො කරත්, ගෞරව නො කරත්, බුහුමන් නො කරත්, පූජා නො කරත්' යැ යි ඔහුට මෙසේ සිතෙක් වෙයි ද, හෙ තෙමේ මෙසේ කුලයන් කෙරෙහි ඊර්ෂ්‍යාවත් මාත්සර්යයත් උපදවන්නේ වෙයි ද . . . න්‍යග්‍රෝධයෙනි, මෙය ද තවුස්හට උපක්ලේශ වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙමේ තපස් කරනුයේ මිනිසුනට පෙනෙන තන්හි හිඳුනේ වෙයි ද, න්‍යග්‍රෝධයෙනි, මේ මිනිසුනට පෙනෙන තන්හි හිඳ තපස් කරන බව තවුස්හට උපක්ලේශයෙක් වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම මේ ද මගේ තපසැ යි මෙ ද මගේ තපසැ යි තමා ගේ ගුණ දක්වනුයේ කුලයන්හි හැසිරෙයි ද . . . න්‍යග්‍රෝධයෙනි, මෙය ද තවුස්හට උපක්ලේශයෙක් වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම තමා ගේ කිසි දෙසක් සඟොවා ගෙන හැසිරෙයි ද, මෙය ඔබට කැප ද ?' යි විචාරන ලදුයේ ම නො-කැප දුය කැප යැ යි කියයි ද, කැප දුය කැප නො වෙ යැ යි කියයි ද, මෙසේ හෙ තෙමේ දැන මුසවා කියන්නේ වේ ද . . . න්‍යග්‍රොධයෙනි, මෙය ද තවුස්හට උපක්ලේශයෙක් වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, දහම් දෙසන තථාගතයන් ගේ හෝ තථා-ගත ශ්‍රාවකයකු ගේ හෝ අනුදැනියැ යුතු (මැනැවැ යි අනුමෙවියැ යුතු) ඇත්තා වූ ම දෙශනාව නො අනුදනී ද . . . න්‍යග්‍රෝධය, මෙය ද තවුස්-හට උපක්ලේශයෙක් වෙයි.

පුන ච පරං නිග්‍රොධ තපස්සී කොධනො හොති උපනාහී, යම්පි නිග්‍රොධ තපස්සී කොධනො හොති උපනාහී, අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී මක්ඛී හොති. පළාසී[1] -පෙ- උස්සුකී හොති මච්ඡරී -පෙ- සඨො හොති මායාවී -පෙ- ථද්ධො හොති අතිමානී -පෙ- පාපිච්ඡො හොති පාපිකානං ඉච්ඡානං වසං ගතො -පෙ- මිච්ඡාදිට්ඨිකො හොති අන්තග්ගාහිකාය දිට්ඨියා සමන්නාගතො -පෙ- සන්දිට්ඨිපරාමාසී හොති ආධානග්ගාහී දුප්පටිනිස්සග්ගී. යම්පි නිග්‍රොධ තපස්සී සන්දිට්ඨිපරාමාසී හොති ආධානග්ගාහී දුප්පටිනිස්සග්ගී, අයම්පි ඛො නිග්‍රොධ තපස්සිනො උපක්කිලෙසො හොති.

තං කිම්මඤ්ඤසි නිග්‍රොධ යදි මෙ තපොජිගුච්ඡා උපක්කිලෙසා වා අනුපක්කිලෙසා වා?ති.

"අද්ධා ඛො ඉමෙ භන්තෙ තපොජිගුච්ඡා උපක්කිලෙසා නො අනුපක්කිලෙසා, ඨානං ඛො පනෙතං භන්තෙ විජ්ජති, යං ඉධෙකච්චො තපස්සී සබ්බෙහෙව ඉමෙහි උපක්කිලෙසෙහි සමන්නාගතො අස්ස, කො පන වාදො අඤ්ඤතරඤ්ඤතරෙනා?"ති.

## පරිසුද්ධපපටිකප්පත්ති-කථා

10. ඉධ නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා න අත්තමනො හොති න පරිපුණ්ණසංකප්පො. යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා න අත්තමනො හොති න පරිපුණ්ණසංකප්පො, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා න අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා න අත්තානුක්කංසෙති, න පරං වම්භෙති, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

11. පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති සො තෙන තපසා න මජ්ජති න මුච්ඡති න පමාදමාපජ්ජති. යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති, සො තෙන තපසා න මජ්ජති න මුච්ඡති න පමාදමාපජ්ජති, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

1. පලාසී (සෳා, PTS) 2. උපක්කිලෙසා හොති (කම)

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුසෙක් ක්‍රෝධ කරන සුලු වෙයි. වෛර බඳින සුලු වෙයි. න්‍යග්‍රෝධයෙනි, තවුසෙක් ක්‍රෝධ කරන සුලු ය, වෛර බඳින සුලු ය යන මෙය ද තවුස්හට උපක්ලේශයෙක් වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුසෙක් ගුණමකු වෙයි. උතුමන් තමා හා සම කොට සිතන්නේ වෙයි, ඊර්ෂ්‍යා කරන්නේ වෙයි, මසුරු වෙයි, කෛරාටික වෙයි, කළ වරද සඟොවන මායා ඇත්තේ වෙයි, තෙත් ගති නැත්තේ කරුණාව නැත්තේ තද ගති ඇත්තේ වෙයි, අධිකමාන ඇත්තේ වෙයි. ලාමක ඊප්සා ඇත්තේ ලාමක ඊප්සාවනට වශග වූයේ වෙයි, උච්ඡේදදෘෂ්ටියෙන් සමන්විත මිසදිටුවෙක් වෙයි තමා ගත් දෘෂ්ටිය පරාමර්ශනය කරනුයේ, දැඩි කොට ගත්තේ, බැහැර කැරවිය නො හැකි සේ ගත් දෘෂ්ටි ඇත්තේ වෙයි. න්‍යග්‍රෝධයෙනි, ගුණමකු වෙයි... තමා ගත් දෘෂ්ටිය පරාමර්ශන කරනුයේ දැඩි කොට ගත්තේ, බැහැර කැරවිය නො හැකි දෘෂ්ටි ඇත්තේ වෙයි යන යමෙක් ඇද්ද, මෙය ද තවුස්හට උපක්ලේශයෙක් වෙයි.

න්‍යග්‍රෝධයෙනි, එය කිමැ යි සිතවු ද? මේ තපෝජුගුප්සාවෝ උපක්ලේශ ඇත්තෝ ද? නැත හොත් උපක්ලේශ නැත්තෝ ද?''

“ස්වාමීනි, මේ තපෝජුගුප්සාවෝ උපක්ලේශ ඇත්තෝ වෙත්, උපක්ලේශ නැත්තෝ නො වෙත්. ස්වාමීනි, මෙහි එක්තරා තවුසෙක් මේ සියලු උපක්ලේශයන්ගෙන් සමන්විත වන්නේ ය යන මේ කාරණය ඒකාන්තයෙන් ඇත්තේ ය. එක්තරා උපක්ලේශයෙකින් සමන්විත වන්නේ ය යනු කියනු ම කවරේ ද?'' යි තවුසා කී ය.

### පරිශුද්ධ ප්‍රපාටිකාප්‍රාප්ති කථා

10. න්‍යග්‍රෝධයෙනි, මෙහි තවුස් තෙම තපස සමාදන් කොට ගනී. හේ තපසින් ආරාධිත සිතැත්තේ නො වෙයි, පරිපූර්ණ සංකල්ප ඇත්තේ නො වෙයි. මෙසේ හෙ තෙම එ තන්හි පිරිසිදු වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම තපස සමාදන් කොට ගනී. හේ ඒ තපසින් තමා හුවා නො තබයි, මෙරමා හෙළා නො දකී. මෙසේ හේ එ තන්හි පිරිසිදු වෙයි.

11. තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම තපස සමාදන් කොට ගනී. හේ ඒ තපසින් මත් නො වෙයි, මුස පත් නො වෙයි, පමාවට නො පැමිණෙයි. න්‍යග්‍රෝධයෙනි, යම් හෙයකින් තවුසා තපස සමාදන් කොට ගනී ද හේ ඒ තපසින් මත් නො වෙයිද මුස පත් නො වෙයිද පමාවකට නො පැමිණෙයිද මෙසේ හෙ තෙම එ කරුණෙහි පිරිසිදු වෙයි.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති. සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තමනො හොති න පරිපුණ්ණසංකප්පො. යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති, සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තමනො හොති න පරිපුණ්ණසංකප්පො, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති. සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති සො තෙන තපසා ලාභසක්කාර සිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන න මජ්ජති න මුච්ඡති න පමාදමාපජ්ජති, යම්පි නිග්‍රොධ තපස්සී තපං සමාදියති සො තෙන තපසා ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති, සො තෙන ලාභසක්කාර සිලොකෙන න මජ්ජති න මුච්ඡති න පමාදමාපජ්ජති. එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තපං සමාදියති භොජනෙසු න වොදසං ආපජ්ජති 'ඉදං මෙ ඛමති, ඉදං මෙ නක්ඛමතී'ති. සො යඤ්ච ඛ්වස්ස නක්ඛමති තං අනපෙක්ඛො පජහති, යං පනස්ස ඛමති තං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී න තපං සමාදියති, ලාභසක්කාරසිලොකනිකාමහෙතු 'සක්කරිස්සන්ති මං රාජානො රාජමහාමත්තා ඛත්තියා බ්‍රාහ්මණා ගහපතිකා තිත්ථියා'ති. එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම තපස සමාදන් කොට ගනී. හේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි, හේ ඒ ලාභ සත්කාර කීර්තියෙන් ආරාධිත සිතැත්තේ නො වෙයි. පිරිපුන් සංකල්ප ඇත්තේ නො වෙයි. න්‍යග්‍රෝධයෙනි, යම් හෙයකින් ම තවුස් තෙම තපස සමාදන් කොට ගනී ද, හේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවා ද, හේ ලාභ සත්කාර කීර්තියෙන් ආරාධිත සිතැත්තේ නො වෙයි ද, පිරිපුන් මනෝරථය ඇත්තේ නො වෙයි ද, මෙසේ හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම තපස සමාදන් කොට ගනී. හේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි. හේ ලාභ සත්කාර කීර්තියෙන් තමා හුවා නො තබයි. මෙරමා හෙලා නො දකී. න්‍යග්‍රෝධයෙනි, යම් හෙයකින් තවුස් තෙම තපස සමාදන් කොට ගනී ද, ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවා ද, හේ ඒ ලාභ සත්කාර කීර්ති-යෙන් තෙම හුවා නො තබා ද, මෙරමා හෙලා නො දකී ද, මෙසේ හෙ තෙම එ කරුණෙහි පිරිසිදු වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම තපස සමාදන් කොට ගනී. හේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවයි, හේ ඒ ලාභ සත්කාර කීර්ති-යෙන් මත් නො වෙයි, මුසපත් නො වෙයි, පමාවකට නො පැමිණෙයි. න්‍යග්‍රෝධයෙනි, යම් හෙයකින් තවුස් තෙම තපස සමාදන් කොට ගනී ද, හේ ඒ තපසින් ලාභ සත්කාර කීර්ති උපදවා ද, හේ ඒ ලාභ සත්කාර කීර්තියෙන් මත් නො වේ ද, පමාවකට නො පැමිණේ ද, මෙසේ හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

න්‍යග්‍රෝධයෙනි, තව ද තවුස් තෙම තපස සමාදන් කොට ගනී ද, 'මෙය මට රිසියෙයි, මෙය මට නො රිසියෙයි' කියා බොජුන්හි දෙකොටසකට බෙදීමට නො පැමිණෙයි ද, තමාට නොරිසි දය ආශා නැති ව බැහැර කෙරේ ද, තමාට රිසි දය ගිජු නො වූයේ මුස පත් නො වූයේ, සිතින් එහි නො ගිලුණේ, ආදීනව දක්නා සුලු වූයේ, ප්‍රතිග්‍රහණ ප්‍රත්‍යවෙක්ෂණ ප්‍රමාණ දන්නේ වළඳා ද, මෙසේ හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම 'රාජ රාජමහාමාත්‍ය ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති තීර්ථක යන මොවුන් මට සත්කාර කරති'යි ලාභ සත්කාර කීර්තියෙහි ඇලුම් හෙයින් තපස සමාදන් කොට නො ගනී ද, මෙසේ හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

පුන ච පරං නිග්‍රොධ තපස්සී අඤ්ඤතරං සමණං වා බ්‍රාහ්මණං වා තාපසාරත්තා හොති: කිම්පනායං සම්බහුලාජීවො සබ්බං සම්භක්ඛති සෙය්‍යථිදං, මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං, අසනිවිචක්කං දන්තකූටං සමණප්පවාදෙනාති, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති,

පුන ච පරං නිග්‍රොධ තපස්සී පස්සති අඤ්ඤතරං සමණං වා බ්‍රාහ්මණං වා කුලෙසු සක්කරියමානං ගරුකරියමානං මානියමානං පූජියමානං. දිස්වා තස්ස න එවං හොති: ඉමඤ්හි නාම සම්බහුලාජීවිං කුලෙසු සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, මං පන තපස්සිං ළුඛාජීවිං කුලෙසු න සක්කරොන්ති න ගරුකරොන්ති න මානෙන්ති න පූජෙන්තීති, ඉති සො ඉස්සාමච්ඡරියං කුලෙසු අනුප්පාදෙතා හොති, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී න ආපාතකනිසාදී හොති එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී න අත්තානං ආදස්සයමානො කුලෙසු චරති 'ඉදම්පි මෙ තපස්මිං, ඉදම්පි මෙ තපස්මින්ති', එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී න කිඤ්චිදෙව පටිච්ඡන්නං සෙවති, සො 'ඛමති තෙ ඉදන්ති?' පුට්ඨො සමානො අක්ඛමමානං ආහ නක්ඛමතීති, ඛමමානං ආහ ඛමතී ති, ඉති සො සම්පජානමුසා න භාසිතා හොති. එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී තථාගතස්ස වා තථාගතසාවකස්ස වා ධම්මං දෙසෙන්තස්ස සන්තං යෙව පරියායං අනුඤ්ඤෙය්‍යං අනුජානාති, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

පුන ච පරං නිග්‍රොධ තපස්සී අක්කොධනො හොති අනුපනාහී. යම්පි නිග්‍රොධ තපස්සී අක්කොධනො හොති අනුපනාහී, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම 'කිමෙක් ද? පසය බහුල කොට ඇති වැ දිවි පවත්වන මේ තෙමේ මූලබීජ, ස්කන්ධබීජ, පරුබීජ, අග්‍ර-බීජ, පස් වනු බීජ බීජ ම ද යි යන සියල්ල කා දමයි, මොහු ගේ දත් (එයට හසු වන සියල්ල සුණු විසුණු කරන) මහත් හෙන සකක් වැන්න, එහෙත් ශ්‍රමණ නාමයෙන් මොහු හඳුනති' යි කිසි මහණකු හෝ බමුණකු හෙලා දක්නේ නො වේ ද, මෙසේ හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

තව ද න්‍යග්‍රොධයෙනි, තවුසෙක් කුලයන්හි සත්කාර කරනු ලබන, ගෞරව කරනු ලබන, බුහුමන් කරනු ලබන, පුදනු ලබන එක්තරා මහණකු හෝ බමුණකු හෝ දක්නේ ද, දැකීමෙන් "පසය බහුල කොවැති ව දිවි පවත්වන මොහුවත් කුලයන්හි සත්කාර කරත්, ගරු කරත්, බුහුමන් කරත්, පූජා කරත්, රූක්ෂ පැවැත්මෙන් දිවි පවත්වන තපස් වූ මට කුලයන්හි සත්කාර නො කරත්, ගරු නො කරත්, බුහුමන් නො කරත්, පූජා නො කරත් යැ'' යී ඔහුට මෙසේ සිතෙක් නො වන්නේ ද, මෙසේ හෙ තෙමේ කුලයන් කෙරෙහි ඊර්ෂ්‍යා මාත්සර්ය නො උපදවන්නේ වේ ද, මෙසේ හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම "මේත් මගේ තපෝගුණයෙක, මේත් මගේ තපෝගුණයෙකැ''යි තමා දක්වනුයේ කුලයන්හි නො හැසිරෙයි ද, මෙසේ හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

තව ද න්‍යග්‍රොධයෙනි, තවුස් තෙම කිසි ද පිළිසන් තැනක් නො සෙවී ද (කිසි දෙයක් සඟොවා ගෙන නො හැසිරෙයි ද), හෙ තෙම 'මෙය ඔබට කැප ද?' යි විචාරන ලදුයේ ම, කැප නො වන දුය 'නො කැප යැ' යි කියා ද, කැප වන දුය 'කැප යැ' යි කියා ද, මෙසේ හේ දුන දුන මුසවා නො බෙණෙන්නේ ද, මෙපරිද්දෙන් හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම දහම් දෙසන්නා වූ තථාගතයන් ගේ හෝ තථාගත ශ්‍රාවකයකු ගේ හෝ අනුදත යුතු වූ ම (අනුමෙවියැ යුතු වූ ම) ධර්ම කථාව අනුදනී ද, මෙසේ හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙම ක්‍රෝධ නො කරන්නේ වෙර නො බඳින්නේ වේ ද, න්‍යග්‍රෝධයෙනි, 'තවුසා ක්‍රෝධ නො කරන්නේ ය, වෙර නො බඳින්නේ ය' යන යමෙක් ඇද්ද, මෙසේ එ කරුණෙහි තවුස් තෙම පිරිසිදු වෙයි.

පුන ච පරං නිග්‍රොධ තපස්සී අමක්ඛී හොති අපළාසී -පෙ- අනුස්සුකී හොති අමච්ඡරී -පෙ- අසඨො හොති අමායාවී -පෙ- අත්ථද්ධො හොති අනතිමානී -පෙ- න පාපිච්ඡො හොති න පාපිකානං ඉච්ඡානං වසං ගතො, න මිච්ඡාදිට්ඨිකො හොති න අන්තග්ගාහිකාය දිට්ඨියා සමන්නාගතො -පෙ- න සන්දිට්ඨිපරාමාසී හොති න ආධානග්ගාහී සුප්පටිනිස්සග්ගී, යම්පි නිග්‍රොධ තපස්සී න සන්දිට්ඨිපරාමාසී හොති න ආධානග්ගාහී සුප්පටිනිස්සග්ගී, එවං සො තස්මිං ඨානෙ පරිසුද්ධො හොති.

"තං කිම්මඤ්ඤසි නිග්‍රොධ? යදි එවං සන්තෙ තපොජිගුච්ඡා පරිසුද්ධා වා හොති අපරිසුද්ධා වා?ති"

අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තපොජිගුච්ඡා පරිසුද්ධා හොති නො අපරිසුද්ධා, අග්ගප්පත්තා ච සාරප්පත්තා චා"ති.

"න ඛො නිග්‍රොධ එත්තාවතා තපොජිගුච්ඡා අග්ගප්පත්තා ච හොති සාරප්පත්තා ච. අපි ච ඛො පපටිකප්පත්තා ච[1] හොතී"ති.

### පරිසුද්ධතචප්පත්තකතා – කථා

12. "කිත්තාවතා පන භන්තෙ තපොජිගුච්ඡා අග්ගප්පත්තා ච හොති සාරප්පත්තා ච. සාධු මෙ භන්තෙ භගවා තපොජිගුච්ඡාය අග්ගඤ්ඤෙව පාපෙතු සාරඤ්ඤෙව පාපෙතූ"ති.

"ඉධ නිග්‍රොධ තපස්සී චාතුයාමසංවරසංවුතො හොති. කථඤ්ච නිග්‍රොධ තපස්සී චාතුයාමසංවරසංවුතො හොති?

1. පපටිකප්පත්තාච (කම)

තව ද න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙමේ ගුණමකු නො වේ ද, යුගග්‍රාහී නො වේ ද ... ඊර්ෂ්‍යා නො කරන්නේ මසුරු බව නො කරන්නේ වේ ද... ශඨ නො වන්නේ වංචා නැත්තේ වේ ද... තද ගති නැත්තේ අධික මාන නැත්තේ වේ ද... ලාමක ආශා නැත්තේ ලාමක ආශාවනට වශග නො වූයේ වේ ද,... මිසදිටු නො වනුයේ අන්තග්‍රාහික මිසදිටුයෙන් යුක්ත නො වේ ද,... තමා ගත් දෘෂ්ටිය පරාමර්ශනය නො කරනුයේ දැඩි ගැනුම් නැත්තේ පහසුයෙන් බැහැර කළ හැකි දෘෂ්ටි ඇත්තේ වේ ද, න්‍යග්‍රෝධයෙනි, මේ තවුස් තෙමේ තමා ගත් දෘෂ්ටිය පරාමර්ශනය නො කරන්නේ ය, දැඩි ගැනුම් නැත්තේ ය, පහසුවෙන් බැහැර කට හැකි දෘෂ්ටි ඇත්තේ ය යන යමෙක් ඇද්ද, මෙසේ හේ එ කරුණෙහි පිරිසිදු වෙයි.

න්‍යග්‍රෝධයෙනි, එය කිමැ යි සිතහි ද? ඉදින් මෙසේ ඇති කල්හි තපෝජුගුප්සාව පිරිසිදු හෝ වේ ද? අපිරිසිදු හෝ වේ ද?''

''වහන්ස, මෙසේ ඇති කල්හි තපෝජුගුප්සාව ඒකාන්තයෙන් පිරිසිදු වෙයි, අපිරිසිදු නො වේ, මුදුන් පැමිණියේ වේ, හරයට පැමිණියේ වේ යැ'' යි පිරිවැජියා කී ය.

''න්‍යග්‍රෝධයෙනි, මෙ තෙකින් තපෝජුගුප්සාව මුදුන් පැමිණියේ ද නො වේ, හරයට පැමිණියේ ද නො වේ. වැලිදු පිට සුඹුලට පැමිණියේ ම වේ'' යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

### පරිශුද්ධ - ත්වක්ප්‍රාප්තකතා - කථාව

12. ''වහන්ස, තපෝජුගුප්සාව කොතෙකින් මුදුන් පැමිණියේ වේ ද, හරයට පැමිණියේ වේ ද? යාච්ඤා කරමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට තපෝජුගුප්සාව ගේ මුදුන ම දක්වා දම් දෙසන සේක් වා, හරය ම දක්වා දම් දෙසන සේක් වා'' යි පිරිවැජි කී ය.

''න්‍යග්‍රෝධයෙනි, මෙහි තවුස් තෙමේ චාතුර්යාම සංවරයෙන් හැවුරුණේ වෙයි. න්‍යග්‍රෝධයෙනි, තවුස් තෙමේ කෙසේ නම් චාතුර්යාම සංවරයෙන් හැවුරුණේ වේ ද? යත්:

ඉධ නිග්‍රොධ තපස්සී න පාණමතිපාතෙති, න පාණමතිපාතාපයති, න පාණමතිපාතයතො සමනුඤ්ඤො හොති, න අදින්නං ආදියති, න අදින්නං ආදියාපෙති, න අදින්නං ආදියතො සමනුඤ්ඤො හොති, න මුසා භණති, න මුසා භණාපෙති, න මුසා භණතො සමනුඤ්ඤො හොති, න භාවිතමාසිංසති, න භාවිතමාසිංසාපෙති, න භාවිතමාසිංසතො සමනුඤ්ඤො හොති. එවං ඛො නිග්‍රොධ තපස්සී චාතුයාමසංවරසංවුතො හොති. යතො ඛො නිග්‍රොධ තපස්සී චාතුයාමසංවරසංවුතො හොති, අදුං චස්ස හොති තපස්සිතාය. සො අභිහරති නො හීනායාවත්තති.

සො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා, උජුං කායං පණිධාය, පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති, අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති, සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති, ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති, ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති, අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති, අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති. සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතා සහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති.

න්‍යග්‍රෝධයෙනි, මෙහි තවුස් තෙම පණිවා නො කෙරෙයි, පණිවා නො කරවයි, පණිවා කරන්නක්හට නො ම අනුදන්නේ වෙයි. මෙරමා අයත් නො දුන් දැ නො ගනී. නො දුන් දැ නො ද ගන්වයි, නො දුන් දෑය ගන්නහුට අනුදන්නේ ද නො වෙයි. බොරු නො කිය යි, බොරු නො ද කියව යි, බොරු කියන්නහුට අනුදන්නේ ද නො වෙයි. පස් කම් සුව සෙවුනේ නො වෙයි, පස් කම් ගුණ සෙවවන්නේ නො වෙයි, පස් කම් ගුණ සෙවුනාහට අනුදන්නේ ද නො වෙයි. න්‍යග්‍රෝධයෙනි, මෙසේ තවුස් තෙමේ චාතුර්යාම සංවරයෙන් හැවුරුණේ වෙයි. මෙය ඔහු ගේ තවුස් බව වෙයි. හේ එය මතුමත්තට ගෙන යෙයි (වඩයි), ගිහි බවට නො පෙරළෙයි.

හෙ තෙමේ අරණක් රුක්මුලක් පව්වක් කඳුරක් ගිරි ලෙනක් සොහොනක් වනපෙතක් එළි මහනක් පිදුරු ගොඩක් යන මේ කිසි විවික්ත වූ යම් සෙනස්නක් බෙජෙයි. හේ පිණ්ඩපාතයෙන් පෙරළා ආයේ පසු බත්හි පළක් බැඳ කය සෘජු කොට පිහිටුවා, සිහිය කමටහනට යොමු කොට එළවා හිඳියි. හේ ලොවැ (අත්බව කෙරෙහි) ඇල්ම හැර, (විෂ්කම්භණ ප්‍රහාණ වශයෙන්) පහ වූ අභිධ්‍යාව ඇති සිතින් වෙසෙයි. අභිධ්‍යාව කෙරෙන් සිත පිරිසිඳු කෙරෙයි. ව්‍යාපාද සංඛ්‍යාත ප්‍රද්වේෂ්ය (ක්‍රෝධය) පහ කොට, ව්‍යාපාද රහිත සිතැත්තේ, සියලු පණ ඇති සතුන් කෙරේ අනුකම්පා ඇති වැ වෙසෙයි. (විෂ්කම්භණ වශයෙන්) ක්‍රොධය කෙරෙන් සිත පිරිසිඳු කෙරෙයි. ස්ත්‍යාන මිද්ධය හැර පහ වූ ස්ත්‍යාන මිද්ධය ඇතිව, දව රෑ දෙක්හි ම දුටු එළිය හඳුනනු හැකි පිරිසිඳු සංඥා ඇත්තේ, ස්මෘතිමත් වැ, නුවණ ඇති ව, ස්ත්‍යාන මිද්ධය කෙරෙන් සිත පිරිසිඳු කෙරෙයි. උද්ධච්චය ද (සිතැ නො සංහුන් බව ද) කුක්කුච්චය ද (කළ නො කළ දෑයෙහි පසුතැවිල්ල ද) සිතින් දුරලා, සංසුන් වූයේ සංහිඳුණු සිත් සතන් ඇත්තේ, උද්ධච්ච කුක්කුච්ච දෙක කෙරෙන් සිත පිරිසිඳු කෙරෙයි. විචිකිච්ඡාව (සැකය) දුරලා, තිණු (ඉක්මි) සැක ඇත්තේ, කුසල් දහම්හි සැක නො කරනුයේ වෙසෙයි, විචි-කිච්ඡාව කෙරෙන් සිත පිරිසිඳු කෙරෙයි. හේ නුවණ දුබල කරන, සිත කෙලෙසන මේ පංච නීවරණයන් (විෂ්කම්භණ ප්‍රහාණයෙන්) පහ කොට, මෛත්‍රීසහිත සිතින් එක් දිසාවක් පැතිරගෙන වෙසෙයි. එසේ ම දෙවෙනි දිශාව ද, තෙවෙනි දිශාව ද, සිවුවැනි දිශාව ද, මෛත්‍රී සහිත සිතින් පැතිර වෙසෙයි. මෙසේ උඩ ද යට ද සරස ද යන හැම තන්හි සර්වාත්මතායෙන් (තමා හා සම කොට) සර්වසත්ත්වවත් (සියලු සතුන් ඇති) ලෝකය (හෙවත් මුළු ලොව) (ස්ඵරණ වශයෙන්) විපුල වූ, (භූමි වශයෙන්) මහද්ගත වූ (ආලම්බන වශයෙන්) අප්‍රමාණ වූ ව්‍යාපාද රහිත (දෙමනස් නැති බැවින්) නිදුක් වූ මෛත්‍රී සහගත සිතින් පැතිර ගෙන වෙසෙයි. ...කරුණා සහගත සිතින් ...මුදිතාසහගත සිතින්... උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක් පැතිර ගෙන වෙසෙයි, එසේ දෙවෙනි දිශාව ද තෙවෙනි දිශාව ද සිවුවැණි දිශාව ද පැතිරගෙන වෙසෙයි. මෙසේ උඩ ද යට ද සරස ද හැම තන්හි සර්වාත්මතායෙන් සර්වවත් ලොකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ, වෛර නැති දෙමනස් නැති උපෙක්ෂා සහගත සිතින් පැතිර ගෙන වෙසෙයි.

තං කිම්මඤ්ඤසි නිග්‍රොධ යදි එවං සන්තෙ තපොජිගුච්ඡා පරිසුද්ධා වා හොති. නො අපරිසුද්ධා,

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තපොජිගුච්ඡා පරිසුද්ධා හොති නො අපරිසුද්ධා, අග්ගප්පත්තා ච සාරප්පත්තා' චා''ති.

"න ඛො නිග්‍රොධ එත්තාවතා තපොජිගුච්ඡා අග්ගප්පත්තා ච හොති සාරප්පත්තා ච, අපි ච ඛො තචප්පත්තා හොති''ති.

## පරිසුද්ධඑග්ගපත්තකතා–කථා

13. "කිත්තාවතා ච ඛො පන භන්තෙ තපොජිගුච්ඡා අග්ගප්පත්තා ච හොති සාරප්පත්තා ච? සාධු මෙ භන්තෙ භගවා තපොජිගුච්ඡාය අග්ගඤ්ඤෙව පාපෙතු සාරඤ්ඤෙව පාපෙතූ''ති.

"ඉධ නිග්‍රොධ තපස්සී චාතුයාමසංවරසංවුතො හොති. කථඤ්ච පන නිග්‍රොධ තපස්සී චාතුයාම සංවරසංවුතො හොති. –පෙ– යතො ඛො නිග්‍රොධ තපස්සී එවං චාතුයාමසංවරසංවුතො හොති අදුං චස්ස හොති තපස්සිතාය. සො අභිහරති නො හීනායාවත්තති. සො විවිත්තං සෙනාසනං භජති –පෙ– සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ මෙත්තාසහගතෙන චෙතසා –පෙ– ඵරිත්වා විහරති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං එකම්පි ජාතිං ද්වෙ පි ජාතියො තිස්සො පි ජාතියො චතස්සො පි ජාතියො පඤ්ච පි ජාතියො දස පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාළීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකානි පි ජාතිසතානි අනෙකානි පි ජාතිසහස්සානි අනෙකානි පි ජාතිසතසහස්සානි, අනෙකෙ පි සංවට්ටකප්පෙ අනෙකෙ පි විවට්ටකප්පෙ අනෙකෙ පි සංවට්ටවිවට්ටකප්පෙ: අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටි–සංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො''ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

තං කිම්මඤ්ඤසි නිග්‍රොධ, යදි එවං සන්තෙ තපොජිගුච්ඡා පරිසුද්ධා වා හොති අපරිසුද්ධා වා?''ති.

න්‍යග්‍රොධයෙනි, ඉදින් මෙසේ ඇති කල්හි තපොජුගුප්සාව පිරිසිදු ද නොහොත් අපිරිසිදු ද?'' යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක.

"වහන්ස, මෙසේ ඇති කල්හි ඒකාන්තයෙන් තපෝජුගුප්සාව පිරිසිදු වෙයි, අපිරිසිදු නො වෙයි, අග්‍රප්‍රාප්ත ද සාරප්‍රාප්ත ද වේ'' යැ යි පිරිවැජි කී ය.

"න්‍යග්‍රෝධයෙනි, මෙ පමණෙකින් තපෝජුගුප්සාව අග්‍රප්‍රාප්ත ද සාරප්‍රාප්ත ද නො වේ ම ය. වැලි එහි පොත්ත බඳු බවට පැමිණියේ වේ'' යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## පරිශුද්ධ අග්‍රප්‍රාප්තකථා කථාව

13. "වහන්ස, කොපමණෙකින් තපෝජුගුප්සාව අග්‍රප්‍රාප්තත් සාර-ප්‍රාප්තත් වේ ද? යාචඤා කරමි, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට තපෝජුගුප්සාවේ අග ම (දේශනායෙන්) පමුණුවන සේක් වා, හරය ම (දේශනායෙන්) පමුණුවන සේක් වා'' යි පිරිවැජි කී ය.

"න්‍යග්‍රෝධයෙනි, මෙහි තවුස් තෙම චාතුර්යාම සංවරයෙන් හැවුරුණේ වෙයි. කෙසේ නම් තවුස් තෙම චාතුර්යාම සංවරයෙන් හැවුරුණේ වේ ද? යත්:... න්‍යග්‍රෝධයෙනි යම් කලෙක තවුස් තෙම මෙසේ චාතුර්යාම සංවරයෙන් හැවුරුණේ වේ ද, එය ඔහුගේ තපස්වී බව වෙයි. හෙ තෙම එය වඩයි, ගිහි බවට පෙරළා නො හැරෙයි: හේ... විවික්ත සෙනස්නක් බෙජෙයි. හේ සිත කෙලෙසන, ප්‍රඥව දුබල කරන මේ පංච නීවරණ දුරු කොට, මෛත්‍රීසහගත සිතින්... පැතිර ගෙන වෙසෙයි. හේ අනෙකවිධ පෙරවුසු කඳ පිළිවෙළ සිහි කෙරෙයි: "අසෝ තැනැ මෙනම් ඇති විමි, මෙගොත් ඇති වීමි, මෙවන් පැහැ ඇත්තෙම් වීමි, මෙවන් අහර ඇත්තෙම් වීමි, මෙ බඳු සුවදුක් විඳුනෙම් වීමි, මෙ තෙක් ආයු සිමා ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව අසෝ තැන උපනිමි. එහි ද මෙනම් ඇත්තෙම්, මෙබඳු ගොත් ඇත්තෙම්, මෙබඳු පැහැ ඇත්තෙම්, මෙබඳු අහර ඇත්තෙම්, මෙසේ සුවදුක් විඳුනෙම්, මෙසේ වූ ආයු ශිමා ඇතියෙම් වීමි. ඒ මම එයින් සැව, මෙහි උපනිමි'යි. මෙසේ එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දහයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පනසක් ද ජාති සියයක් ද ජාති දහසක් ද ජාති සිය දහසක් ද නොයෙක් සිය ගණන් ජාතීන් ද නොයෙක් දහස් ගණන් ජාතීන් ද නොයෙක් සිය දහස් ගණන් ජාතීන් ද නොයෙක් සංවර්ත කල්ප ද නොයෙක් විවර්ත කල්ප ද නොයෙක් සංවර්ත විවර්ත කල්ප ද යි ආකාර සහිත උද්දෙස සහිත නො-යෙක් වැදෑරුම් පෙරවුසු කඳ පිළිවෙළ සිහි කෙරෙයි.

න්‍යග්‍රෝධයෙනි, එය කිමැයි සිතවු ද? ඉදින් මෙසේ ඇති කල්හි තපෝජුගුප්සාව පිරිසිදු වේ ද? නැත හොත් අපිරිසිදු වේ ද?'' යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක.

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තපොජිගුච්ඡා පරිසුද්ධා හොති නො අපරිසුද්ධා, අග්ගප්පත්තා ච සාරප්පත්තා චා"ති.

"න ඛො නිග්‍රොධ එත්තාවතා තපොජිගුච්ඡා අග්ගප්පත්තා ච හොති සාරප්පත්තා ච. අපි ච ඛො පෙගගුප්පත්තා හොතී"ති.

## පරිසුද්ධ අගගපපත්තසාරපපත්තකතා – කථා

14. "කිත්තාවතා පන භන්තෙ තපොජිගුච්ඡා අග්ගප්පත්තා ච හොති සාරප්පත්තා ච? සාධු මෙ භන්තෙ භගවා තපොජිගුච්ඡාය අග්ගඤ්ඤෙව පාපෙතු සාරඤ්ඤෙව පාපෙතූ"ති.

"ඉධ නිග්‍රොධ තපස්සී චාතුයාමසංවරසංවුතො හොති. කථඤ්ච නිග්‍රොධ තපස්සී චාතුයාමසංවරසංවුතො හොති -පෙ- යතො ඛො නිග්‍රොධ තපස්සී චාතුයාමසංවරසංවුතො හොති, අදුං චස්ස හොති තපස්සිතාය. සො අභිහරති නො හීනායාවත්තති. සො විවිත්තං සෙනාසනං භජති –පෙ– සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, මෙත්තාසහගතෙන චෙතසා–පෙ–උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං එකම්පි ජාතිං ද්වෙපි ජාතියො –පෙ– ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති "ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා"ති. තං කිම්මඤ්ඤසි නිග්‍රොධ යදි එවං සන්තෙ තපොජිගුච්ඡා පරිසුද්ධා වා හොති අපරිසුද්ධා වා?"ති.

"වහන්ස, මෙසේ ඇති කල්හි තපොජුගුප්සාව එකාන්තයෙන් පිරිසිදු වෙයි, අපිරිසිදු නො වෙයි, අග්‍රප්‍රාප්ත ද සාර ප්‍රාප්ත ද වේ යැ''යි පිරිවැජි කී ය.

"න්‍යග්‍රෝධයෙනි, මෙතෙකින් තපෝජුගුප්සාව අග්‍රප්‍රාප්ත ද සාර-ප්‍රාප්ත ද නො වෙයි. වැලි දු එහි එළයට පැමිණියේ වේ'' යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

පරිශුද්ධ-අග්‍රප්‍රාප්තසාරප්‍රාප්තතා-කථාව

14. "වහන්ස, කොතෙකින් තපොජුගුප්සාව අග්‍රප්‍රාප්තත් සාර-ප්‍රාප්තත් වේ ද? යාච්ඤා කරමි, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට තපෝජුගුප්සාව ගේ කෙළවර ම සාරය ම (දේශනායෙන්) පමුණුවන සේක් වා'' යි පිරිවැජි කී ය.

"න්‍යග්‍රෝධයෙනි, මෙහි තවුස් තෙම චාතුර්යාම සංවරයෙන් හැවුරුණේ වෙයි. න්‍යග්‍රෝධයෙනි, කෙසේ නම් තවුස් තෙම චාතුර්යාම සංවරයෙන් හැවුරුණේ වේ ද?... යම් විටෙක තවුස් තෙම චාතුර්යාම සංවරයෙන් හැවුරුණේ වේ ද, එය ඔහු ගේ තවුස් බව වේ. හෙ තෙම එය මතු මත්තට ගෙන යයි, ගිහි බවට නො පෙරළෙයි. හේ... විවික්ත සෙනස්නක් බෙජෙයි... සිත කෙලෙසන, නුවණ දුබල කරන, මේ පංච නීවරණයන් ප්‍රහීණ කොට, විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ දෙම්නස් රහිත වූ මෛත්‍රී සහගත සිතින්...උපෙක්ෂා සහගත සිතින් පැතිර ගෙන වෙසෙයි. හේ එක් ජාතියක් ද ජාති දෙකක් ද... මෙසේ ආකාර සහිත ව උද්දෙස සහිත ව අනෙකවිධ වූ පෙර වුසු කඳ පිළිවෙළ සිහි කෙරෙයි.

හේ මිනිසුන් ගේ දැකුම ඉම ඉක්මැ පැවැති පිරිසිදු දිවැසින් 'අහෝ, මේ භවත් සත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු, වාග්-දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, මනෝදුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්යෝපවාද කරන්නාහු, මිසදිටු ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන ඇත්තෝ වූහ. ඒ මොහු කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ, දුකට ස්ථාන වූ, සතුන් විවශ ව පතිත වන තැන වූ නිරයට වන්නාහ. මේ සත්හු වූ කලී කායසුචරිතයෙන් යුක්ත වූවාහු, වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු, මනස්සුචරිතයෙන් යුක්ත වූවාහු, ආර්යයනට උපවාද නො කළාහු, සම්දිටු ඇත්තාහු, සම්‍යග්දෘෂ්ටි විසින් ගත් කර්ම සමාදන ඇත්තාහු ය. ඒ මොහු කාබුන් මරණින් මතු සැපයට ස්ථාන වූ සග ලොවට පැමිණියාහ' යි පහත් වූ ද උසස් වූ ද, සුරූප වූ ද, විරූප වූ ද, ධනවත් වූ ද, දිළිඳු වූ ද, තම තමන් ගේ කර්මයට අනුරූප වැ එළ බැ සිටියා වූ මරණාසන්න වූ ද, එ කෙණෙහි උපන්නා වූ ද, සත්ත්වයන් දකියි. න්‍යග්‍රොධයිනි, එය කිමැයි සිතවු ද? ඉදින් මෙසේ ඇති කල්හි තපෝජුගුප්සාව පිරිසිදු ද නොහොත් නො පිරිසිදු ද?'' යි අසා වදාළ සේක.

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තපොජිගුච්ඡා පරිසුද්ධා හොති, නො අපරිසුද්ධා, අග්ගප්පත්තා ච සාරප්පත්තා චා"ති.

"එත්තාවතා ඛො නිග්‍රොධ තපොජිගුච්ඡා අග්ගප්පත්තා ච හොති සාරප්පත්තා ච. ඉති ඛො නිග්‍රොධ[1] යං මං ත්වං අවචාසි; කො නාම සො භන්තෙ භගවතො ධම්මො යෙන භගවා සාවකෙ විනෙති, යෙන භගවතා සාවකා විනීතා අස්සාසප්පත්තා පටිජානන්ති අජ්ඣාසයං ආදිබ්‍රහ්මචරියන්ති, ඉති ඛො තං නිග්‍රොධ ඨානං උත්තරිතරඤ්ච පණීතතරඤ්ච යෙනාහං සාවකෙ විනෙමි, යෙන මයා සාවකා විනීතා අස්සාසප්පත්තා පටිජානන්ති අජ්ඣාසයං ආදිබ්‍රහ්මචරියන්ති".

එවං වුත්තෙ තෙ පරිබ්බාජකා උන්නාදිනො උච්චාසද්දමහාසද්දා අහෙසුං "එත්ථ මයං අනස්සාම සාචරියකා, එත්ථ මයං පනස්සාම සාචරියකා න මයං ඉතො භිය්‍යො උත්තරිතරං පජානාමා"ති.

## නිග්‍රොධස්ස පජ්ඣායනං

15. යද අඤ්ඤාසි සන්ධානො ගහපති 'අඤ්ඤදත්ථු ඛො' දානිමෙ අඤ්ඤ-තිත්ථියා පරිබ්බාජකා භගවතො භාසිතං සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤචිත්තං උපට්ඨපෙන්තී'ති අථ නිග්‍රොධං පරිබ්බාජකං එතදවොච: ඉති ඛො භන්තෙ නිග්‍රොධ යං මං ත්වං අවචාසි, 'යග්ඝෙ ගහපති ජානෙය්‍යාසි කෙන සමණො ගොතමො සද්ධිං සල්ලපති? කෙන සාකච්ඡං සමාපජ්ජති? කෙන පඤ්ඤාවෙය්‍යත්තියං සමාපජ්ජති? සුඤ්ඤාගාරහතා සමණස්ස ගොතමස්ස පඤ්ඤා, අපරිසාවචරො සමණො ගොතමො, නාලං සල්ලාපාය, සො අන්තමන්තානෙව සෙවති. සෙය්‍යථාපි නාම ගො කාණා පරියන්තචාරිනී අන්තමන්තානෙව සෙවති, එවමෙව සුඤ්ඤාගාරහතා සමණස්ස ගොතමස්ස පඤ්ඤා, අපරිසාවචරො සමණො ගොතමො, නාලං සල්ලාපාය, සො අන්තමන්තානෙව සෙවති. ඉංඝ ච ගහපති සමණො ගොතමො ඉමං පරිසං ආගච්ඡෙය්‍ය, එකපඤ්හෙනෙව නං සංසාදෙය්‍යාම, තුච්ඡකුම්භී'ව නං මඤ්ඤෙ ඔරොධෙය්‍යාමා"ති. අයං ඛො සො භන්තෙ භගවා අරහං සම්මාසම්බුද්ධො ඉධානුප්පත්තො. අපරිසාවචරං පන නං කරොථ, ගොකාණං පරියන්තචාරිනිං කරොථ, එකපඤ්හෙනෙව නං සංසාදෙථ, තුච්ඡකුම්භී'ව නං මඤ්ඤෙ ඔරොධෙථා"ති.

1. අථ තං නිග්‍රොධං (සම)

"වහන්ස, මෙසේ ඇති කල්හි තපොජුගුප්සා ව ඒකාන්තයෙන් පිරිසිදු වේ. අපිරිසිදු නො වේ, අග්‍රප්‍රාප්ත ද සාර ප්‍රාප්ත ද වේ" යැ යි පිරිවැජි කී ය.

"න්‍යග්‍රෝධයෙනි, තපොජුගුප්සාවාදී තීර්ථකයන් ගේ සමය පරිදි තපෝජුගුප්සාව මෙතෙකින් අග්‍රප්‍රාප්ත ද සාර ප්‍රාප්ත ද වේ. න්‍යග්‍රෝධයෙනි, 'යමෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයෝ හික්මවන ලද්දහු, සතුටට පැමිණියාහු උත්තම නිඃශ්‍රය වූ පැරණිතම බඹසරක් පිළිපන කෙරෙද් ද, භාග්‍යවතුන් වහන්සේ ගේ ඒ ධර්මය කවරේ ද?" යි යම් වචනයක් තෙපි මට කිවූ ද (යම් ප්‍රශ්නයක් තෙපි මා විචාළහු ද), එහි ලා මා විසින් හික්මවන ලද ශ්‍රාවකයෝ මෙයින් සතුටට පැමිණියම්හ යි උත්තමනිඃශ්‍රය වූ යම් ආදි බ්‍රහ්මචර්යයක් පිළිපන කෙරෙත් ද, න්‍යග්‍රොධයෙනි, මෙසේ ඒ කාරණය මේ ඉහත කී හැමට ම වඩා ශ්‍රෙෂ්ඨ ද වඩා උතුම් ද වේ" යැ යි වදාළ සේක.

මෙසේ වදාළ කල්හි ඒ පිරිවැජියෝ "මෙහි ආචාර්යයා සහිත වූ, අපි නටුවම්හ, මෙහි ආචාර්යයා සහිත වූ අපි වැනැසුණම්හ. අපි මෙයට වැඩි තරම් කිසිවක් මෙයට වඩා ශ්‍රෙෂ්ඨ දයක් නො දන්මහ"යි උද්ඝොෂවත් වූවාහු උස් හඬ මහ හඬ ඇත්තෝ වූ හ.

## න්‍යග්‍රෝධයාගේ ප්‍රධානනය

15. සන්ධාන ගෘහපති තෙම යම් විටෙක මේ අන්තොවූ පිරිවැජියෝ භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය අසනු කැමැත්තාහ යි, එයට කන් එළවත් යැ යි, දැන ගැන්ම පිණිස සිත යොමු කෙරෙත් යැ යි දැන ගත්තේ ද, එ කල්හි න්‍යග්‍රොධ පිරිවැජියා අමතා "වහන්ස, න්‍යග්‍රොධයෙනි, "එසේ නම් ගැහැවිය, දනුව. කවරකු හා මහණ ගොයුම් කතාබස් කෙරේ ද? කවරකු හා සාකච්ඡාවට බස්නේ ද? කවරකු හා උතුරු පිළිතුරු කතායෙන් ප්‍රඥව්‍යක්තතාවට පැමිණේ ද? මහණ ගොයුම්හු ගේ ප්‍රඥව ශූන්‍යාගාරයන්හි ම නටුයේ ය. මහණ ගොයුම් අවිසාර ද බැවින් පිරිස් මැදට බස්නට නො හැක්කේ ය. ආලාපසංලාපයට සමත් නො වෙයි. කිසිවක් ඇහැ හැපෙතැයි බියෙන් මහ හැර යන එකැස් කණ දෙනක මෙන් ප්‍රශ්න අසතැ යි බියෙන් ගමින් බොහෝ දුරු සෙනසුන් සෙවනේ ය. එ බැවින් දැන ගනුව ගැහැවිය, මහණ ගොයුම් මේ පිරිසට ආවොත් එක් ප්‍රශ්නයෙන් ම ඔහු යටපත් කරන්නමු. හිස් කළයක් (ඒ මේ අත පෙරළා බැඳ තබන්නාක්) සෙයින් වාද කථායෙන් බැඳ තබන්නමු" යි මෙසේ ඔබ මට යම් වචනයක් කීවෝ ද, වහන්ස, ඒ අර්හත් සම්‍යක්සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ දැන් මෙහි වැඩ ඉන්නා සේක. උන්වහන්සේ පිරිස් මැදට නො බස්නකු කරන්න, මහැ අයින් වෙච් යන දෙනක වැන්නකු කරන්න. එක් ප්‍රශ්නයෙකින් ම උන්වහන්සේ යටපත් කරන්න, හිස් කළයක් මෙන් උන්වහන්සේ පෙරළා බැඳ තබන්නැ යි කී ය.

16. "එවං වුත්තෙ නිග්‍රොධො පරිබ්බාජකො තුණ්හීභූතො මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදි.

අථ ඛො භගවා නිග්‍රොධං පරිබ්බාජකං තුණ්හීභූතං මඞ්කුභූතං පත්තක්ඛන්ධං අධොමුඛං පජ්ඣායන්තං අප්පටිභානං විදිත්වා නිග්‍රොධං පරිබ්බාජකං එතදවොච; "සච්චං කිර නිග්‍රොධ භාසිතා තෙ එසා වාචා"ති.

"සච්චං භන්තෙ භාසිතා මෙ එසා වාචා යථා බාලෙන යථා මූළ්හෙන යථා අකුසලෙනා"ති.

"තං කිම්මඤ්ඤසි නිග්‍රොධ, කින්ති තෙ සුතං පරිබ්බාජකානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං යෙ තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, එවං සු තෙ භගවන්තො සංගම්ම උන්නාදිනො උච්චාසද්දමහාසද්ද අනෙකවිහිතං තිරච්ඡානකථං අනුයුත්තා විහරිංසු, සෙය්‍යථීදං රාජ කථං චොරකථං -පෙ- ඉතිභවාභවකථං ඉති වා, සෙය්‍යථාපි ත්වං එතරහි සාචරියකො? උදහු එවං සු තෙ භගවන්තො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි සෙය්‍යථාපාහං එතරහී?"ති.

"සුතං මෙතං භන්තෙ පරිබ්බාජකානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං: 'යෙ තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, න එවං සු තෙ භගවන්තො සංගම්ම සමාගම්ම උන්නාදිනො උච්චාසද්දමහාසද්දා අනෙකවිහිතං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං රාජකථං චොරකථං -පෙ- ඉතිභවාභවකථං ඉති වා, සෙය්‍යථාපාහං එතරහි සාචරියකො, එවං සු තෙ භගවන්තො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි සෙය්‍යථාපි භගවා එතරහී"ති.

1. තාඤ්ඤු (PTS)

16. මෙසේ කී කල්හි න්‍යග්‍රෝධ පිරිවැජි තෙම නිහඬ වූයේ තෙද නැත්තේ, කර බා ගත්තේ, යටට හෙලූ මුහුණ ඇත්තේ, සිතිවිලි සිතනුයේ, කිසිත් වටහාගත නො හැකිව හුන්නේ ය. එ කලැ භාග්‍යවතුන් වහන්සේ න්‍යග්‍රෝධ පිරිවැජියා නිහඬ වැ තෙද නැති වැ කර බා ගත්තකු ව යටට හෙලූ මුහුණ ඇති වැ සිතිවිලි සිතමින් වැටහෙන නුවණක් නැති වැ හුන්නහු දැන, ඔහු බණවා, 'න්‍යග්‍රෝධයෙනි, සැබෑ ද? තොප ඒ වචන කීවා දැ?' යි අසා වදාළ සේක.

"වහන්ස, එවැනි බසක් කියන්නට තරම් ම අඥාන වූ මුළා වූ අදක්ෂ වූ මා විසින් ඒ වචන කියන ලද," යි පිරිවැජි කී ය.

"න්‍යග්‍රෝධයෙනි ඒ කිමැ යි සිතවු ද? කරුණු කියන්නා වූ, වයසින් වැඩී සිටි, මහළු වූ තොප ගේ ආචාර්ය ප්‍රාචාර්යයන් ගේ වචනය තොප විසින් කෙසේ අසන ලද ද? ඉකුත් කල්හි යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වූහු නම්, ඒ භාග්‍යවත්හු එක් රැස් ව එක් රැස් වැ ඝෝෂවත් ව උස්හඬ මහ හඬ ඇති ව, ඇඳුරා සහිත ව, අද තොප කරන නියායෙන් රාජ කථා චෞර කථා... ඉතිභවාභව කථා ය යන අනෙකවිධ තිරශ්චීන කථායෙහි යෙදී වුසූහු ද? නොහොත් දැන් මා කරන සෙයින් ඒ භගවත්හු අල්පශබ්ද ඇති, මඳ වූ හඬ ඇති, ජනවාත විරහිත, මන්ත්‍රණාදි මිනි-සුන් ගේ රහස් ක්‍රියාවනට සුදුසු ව පිහිටි, විවෙකයට නිසි වූ, වෙනෙහි දුර සෙනසුන්, වඩාත් දුරැ වූ මනුෂ්‍යොපචාර විරහිත සෙනසුන් සෙවිත් දැ?" යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක.

"වහන්ස, ඉකුත් කල්හි යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වූහු නම්, ඒ භගවත්හු එක් රැස් ව එක් රැස් වැ ඝෝෂවත් ව උස් හඬ මහ හඬ ඇති ව, ඇඳුරා සහිත වැ අද මා කරන නියායෙන් රාජ කථා චෞර කථා... ඉතිභවාභවකථා යන අනෙකවිධ තිරශ්චීන කථායෙහි යෙදී නො වුසූහ. දැන් භාග්‍යවතුන් වහන්සේ සෙයින් අල්පශබ්ද ඇති, මඳ වූ හඬ ඇති, ජනවාත විරහිත, මන්ත්‍රණාදි මිනිසුන් ගේ රහස් ක්‍රියාවනට සුදුසු ව පිහිටි, විවෙකයට නිසි වූ, වනයෙහි දුරැ පිහිටි සෙනසුන්, මනුෂ්‍යොපචාර විරහිත වඩාත් දුරැ සෙනසුන් සෙවිත්" යැ යි මෙ පිළිබඳ ව කරුණු කියනු වයොවෘද්ධ වූ මහලු වූ ආචාර්ය ප්‍රාචාර්ය වූ පිරිවැජියන් ගේ මේ වචනය මා විසින් අසන ලදැ" යි පිරිවැජි කී ය.

"තස්ස තෙ නිග්‍රොධ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි: බුද්ධො සො භගවා බොධාය ධම්මං දෙසෙති, දන්තො සො භගවා දමථාය ධම්මං දෙසෙති, සන්තො සො භගවා සමථාය ධම්මං දෙසෙති, තිණ්ණො සො භගවා තරණාය ධම්මං දෙසෙති, පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙති?"ති.

## බ්‍රහ්මචරියපරියොසාන-සච්ඡිකිරියා

17. "එවං වුත්තෙ නිග්‍රොධො පරිබ්බාජකො භගවන්තං එතදවොච: "අච්චයො මං භන්තෙ අච්චගමා යථා බාලං යථා මූළ්හං යථා අකුසලං, ස්වාහං එවං භගවන්තං අවචාසිං. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පටිග්ගණ්හාතු ආයතිං සංවරායා"ති.

"තග්ඝ ත්වං නිග්‍රොධ අච්චයො අච්චගමා යථාබාලං යථා මූළ්හං යථා අකුසලං, යො මං ත්වං එවං අවචාසි. යතො ච ඛො ත්වං නිග්‍රොධ අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි, තන්තෙ මයං පටිග්ගණ්හාම, වුද්ධි හෙසා නිග්‍රොධ අරියස්ස විනයෙ, යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති, ආයතිං සංවරං ආපජ්ජති. අහං ඛො පන නිග්‍රොධ එවං වදාමි: "එතු විඤ්ඤූ පුරිසො අසඨො අමායාවී උජුජාතිකො. අහමනුසාසාමි, අහං ධම්මං දෙසෙමි: යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති සත්ත වස්සානි.

තිට්ඨන්තු නිග්‍රොධ සත්ත වස්සානි. එතු විඤ්ඤූ පුරිසො අසඨො අමායාවී උජුජාතිකො, අහමනුසාසාමි, අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති ඡ වස්සානි -පෙ- පඤ්ච වස්සානි -පෙ- චත්තාරි වස්සානි -පෙ- තීණි වස්සානි -පෙ- ද්වෙ වස්සානි -පෙ- එකං වස්සං.

"න්‍යග්‍රෝධයෙනි, විඥ වූ ම මහළු වූ ඒ තොපට, 'ඒ භගවත් තෙමේ සත්‍යාවබෝධය කෙළේ ම මෙරමාගේ සත්‍යාවබෝධය පිණිස දහම් දෙසයි, ඒ භගවත් තෙමේ ඉන්ද්‍රියදමනයෙන් දාන්ත වූයේ ම අනුන්ගේ ඉන්ද්‍රිය දමනය පිණිස දහම් දෙසයි, ඒ භගවත් තෙමේ ශාන්ත වූයේ ම අනුන් ගේ ශාන්තිය පිණිස දහම් දෙසයි, ඒ භගවත් තෙමේ ඔසතරණය කෙළේ ම අනුන් ගේ ඔසතරණය පිණිස දහම් දෙසයි, ඒ භාග්‍යවත් තෙමේ කෙලෙස් පිරිනිවනින් පිරිනිවියේ ම අනුන් ගේ කෙලෙස් නිවනු පිණිස දහම් දෙසා' යැ යි මේ සිත නො වී ද?" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

17. මෙසේ වදාළ කල්හි, න්‍යග්‍රොධ පිරිවැජි තෙම 'වහන්ස, වරද තෙම යම්සේ බාලයකු, යම්සේ මූඪයකු, යම්සේ අදක්ෂයකු ඉක්මැයේ ද (මැඩගෙන යේ ද), එසේ ම වරද බාල වූ මූඪ වූ අදක්ෂ වූ මා ඉක්මැ (මැඩගෙන) ගියේ ය. ඒ මම්, භාග්‍යවතුන් වහන්සේට එසේ කීයෙමි. වහන්ස, මගේ මතු සංවරය පිණිස භාග්‍යවතුන් වහන්සේ මගේ වරද වරද වශයෙන් පිළිගන්නා සේක් වා (වරද වශයෙන් පිළිගන්නා මට ක්ෂමාව දෙන සේක්වා)' යි කී ය.

"එ බැවින් න්‍යග්‍රොධයෙනි, යම් බඳු තෙපි මට එසේ කීහු ද වරද තෙම යම්සේ අනුවණයකු, මුළාවූවකු, අදක්ෂයකු ඉක්ම යේ ද, එසේ ම තොප ද ඉක්මැ ගියේ ය. න්‍යග්‍රොධයෙනි, යම් හෙයෙකින් තෙපි වරද වරද වශයෙන් දැක, ධර්මය වූ පරිදි එයට පිළියම් කරවු ද, තොප කරන ඒ දැය අපි පිළිගනිමු. න්‍යග්‍රොධයෙනි, යමෙක් වරද වරද වශයෙන් දැක, එයට ධර්මය වූ පරිදි පිළියම් කෙරේ ද, මත්තෙහි සංවරයට පැමිණේ ද, මෙය ආර්ය විනයයෙහි වැඩීමෙක. න්‍යග්‍රොධයෙනි, මම් වූ කලි මෙසේ කියමි: 'ඇති වරද නො සඟොවන, නැති ගුණ නො පෙන්වන සුලු, සෘජු සවභාවය ඇති, සිහි නුවණ ඇති පුරුෂ තෙමේ පැමිණේ වා. මම් උපදෙස් දෙමි, මම් දහම් දෙසමි. මගේ අනුශාසන පරිදි පිළිපදනෝ, කුල පුත්තු යමක් පිණිස මැනැවින් ගිහි ගෙන් නික්ම පැවිදි බිම් වදිත් නම්, ඒ නිරුත්තර මාර්ග බ්‍රහ්මචර්යාවසානය (රහත් ඵලය) මේ මෙ අත්බවිහි ම සත් වසක් ඇතුළත, තෙමේ ම විශිෂ්ට ඥානයෙන් දැන සාක්ෂාත් කොට, ලැබ වසන්නේ ය.

න්‍යග්‍රෝධයෙනි, සත් වසෙක් තිබේ වා. ඇති වරද නො සඟොවන, නැති ගුණ නො පෙන්වන සුලු, සෘජු සවභාවය ඇති, සිහි නුවණැති පුරුෂ තෙමේ පැමිණේ වා. මම් උපදෙස් දෙමි, මම් දහම් දෙසමි. මගේ අනුශාසන පරිදි පිළිපදනෝ, යමක් පිණිස කුලපුත්තු මැනැවින් ගිහි ගෙන් නික්ම, පැවිදි බිම් වදිත් නම්, ඒ නිරුත්තර මාර්ග බ්‍රහ්මචර්යාවසානය (රහත් ඵලය) මේ මෙ අත්බවිහි ම ස වසක් තුළ,... පස් වසක් තුළ... සිවු වසක් තුළ... තුන් වසක් තුළ... දෙ වසක් තුළ... එක් වසක් තුළ තෙමේ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට, ලැබ වසන්නේ ය.

තිට්ඨතු නිග්‍රොධ ඒකං වස්සං එතු විඤ්ඤූ පුරිසො අසඨො අමායාවී උජුජාතිකො. අහමනුසාසාමි, අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති සත්ත මාසානි.

තිට්ඨන්තු නිග්‍රොධ සත්ත මාසානි -පෙ- ඡ මාසානි -පෙ- පඤ්ච මාසානි -පෙ- -පෙ- චත්තාරි මාසානි -පෙ- තීණි මාසානි -පෙ- ද්වෙ මාසානි -පෙ- එකමාසං -පෙ- අඩ්ඪමාසං.

තිට්ඨතු නිග්‍රොධ අඩ්ඪමාසො එතු විඤ්ඤූ පුරිසො අසඨො අමායාවී උජුජාතිකො. අහමනුසාසාමි, අහං ධම්මං දෙසෙමි, යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති සත්තාහං.

## පරිබ්බාජකානං පජ්ඣායතනං

18. සියා ඛො පන තෙ නිග්‍රොධ එවමස්ස: අන්තෙවාසිකම්‍යතා නො සමණො ගොතමො එවමාහා ති. න ඛො පනෙතං නිග්‍රොධ එවං දට්ඨබ්බං, යො එව තෙ ආචරියො සො එව තෙ ආචරියො හොතු.

සියා ඛො පන තෙ නිග්‍රොධ එවමස්ස: උද්දෙසා නො වාචෙතුකාමො සමණො ගොතමො එවමාහා ති. න ඛො පනෙතං නිග්‍රොධ එවං දට්ඨබ්බං. යො එව තෙ උද්දෙසො, සො එව තෙ උද්දෙසො හොතු.

සියා ඛො පන තෙ නිග්‍රොධ එවමස්ස: ආජීවා නො වාචෙතුකාමො සමණො ගොතමො එවමාහා ති. න ඛො පනෙතං නිග්‍රොධ එවං දට්ඨබ්බං. සො එව තෙ ආජීවො සො එව තෙ ආජීවො හොතු.

න්‍යග්‍රෝධයෙනි, එක් වසෙක් තිබේ වා. ශඨ නො වූ මායාවී නොවූ සෘජු ජාතික නුවණැති පුරුෂ තෙමේ පැමිණේ වා. මම අනුශාසන කරමි, මම දහම් දෙසමි. මගේ අනුශාසන පරිදි පිළිපදනේ, යමක් සඳහා කුලපුත්තු මැනැවින් ගිහි ගෙන් නික්මැ පැවිදි බිම වදිත් නම්, ඒ නිරුත්තර මාර්ගබ්‍රහ්මචර්යාවසානය (රහත් ඵලය) හේ මේ අත්බවහි ම සත් මසක් තුළ තෙමේ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට, ලැබ වසන්නේ ය.

න්‍යග්‍රෝධයෙනි, සත් මසෙක් තිබේ වා. අශඨ වූ අමායාවී වූ සෘජු ජාතික වූ නුවණැති පුරුෂ තෙමේ පැමිණේ වා. මම අනුශාසන කරමි, මම දහම් දෙසමි. මගේ අනුශාසන පරිදි පිළිපදනේ, යමක් සඳහා කුල-පුත්තු මැනැවින් ගිහි ගෙන් නික්මැ පැවිදි බිම වදිත් නම්, ඒ නිරුත්තර මාර්ගබ්‍රහ්මචර්යාවසානය (රහත්ඵලය) හේ මෙ අත්බවහිම ස මසක් තුළ... පස් මසක් තුළ... සිවු මසක් තුළ... තුන් මසක් තුළ... දෙ මසක් තුළ... එක් මසක් තුළ... අඩ මසක් තුළ තෙමේ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වසන්නේ ය.

න්‍යග්‍රෝධයෙනි, අඩ මසෙක් තිබේ වා. අශඨ වූ අමායාවී සෘජු ජාතික විඥ පුරුෂ තෙමේ පැමිණේ වා. මම් අනුශාසන කරමි, මම දහම් දෙසමි. මා අනුශාසන කළ පරිදි පිළිපදනේ, යමක් පිණිස කුලපුත්තු මොනොවට ම ගිහි ගෙන් නික්මැ පැවිදි බිම වදිත් ද, ඒ නිරුත්තර මාර්ගබ්‍රහ්මචර්යාවසානය (රහත් බව) හේ මෙ අත්බවහි ම සතියක් තුළ තෙමේ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වසන්නේ ය.

18. න්‍යග්‍රෝධයෙනි, තමා ගේ අතැවැස්සකු කැරගනු කැමැති වැ මහණ ගොයුම් තෙම මෙසේ කීයේ දෝ හෝ යි තොපට මෙසේ සිතක් විය හැක්ක. න්‍යග්‍රොධයෙනි, මෙය එසේ නො දත යුතු. යමෙක් තොප ගේ ආචාර්ය වී ද, හේ ම තොප ගේ ආචාර්ය වෙ වා.

න්‍යග්‍රොධයෙනි, ‘මහණ ගොයුම්හු අප ගේ ධර්මතන්ත්‍රොද්ග්‍රහණයෙන් අප බැහැර කරනු රිසි වැ මෙසේ කියතැ යි තොපට මෙසේ සිතක් වියැ හැක්ක. න්‍යග්‍රෝධයෙනි, මෙය එසේ නො ම දත යුතු. තොප ගේ යම් ධර්මතන්ත්‍ර ඉගැන්මෙක් වේ ද, එය ම තොප ගේ ඉගැන්ම වෙ වා.

න්‍යග්‍රෝධයෙනි, ‘මහණ ගොයුම්හු අප ගේ ජීවිකාවෘත්තියෙන් අප බැහැර කරනු කැමැති ව මෙසේ කියතැ යි තොපට මෙසේ සිතක් විය හැක්ක. න්‍යග්‍රොධයෙනි, මෙය එසේ නො ම දත යුතු. තොපගේ යම් ජීවිකාවෘත්තියෙක් වේ ද එයම තොප ගේ ජීවිකාවෘත්තිය වෙ වා.

සියා ඛො පන තෙ නිග්‍රොධ එවමස්ස: යෙ නො ධම්මා අකුසලා අකුසලසඞ්ඛාතා සාචරියකානං, තෙසු පතිට්ඨාපෙතුකාමො සමණො ගොතමො එවමාහා ති. න ඛො පනෙතං නිග්‍රොධ එවං දට්ඨබ්බං අකුසලා චෙව වො ධම්මා[1] හොන්තු අකුසලසඞ්ඛාතා ච සාචරියකානං.

සියා ඛො පන තෙ නිග්‍රොධ එවමස්ස; යෙ නො ධම්මා කුසලා කුසලසඞ්ඛාතා සාචරියකානං, තෙහි විවෙචෙතුකාමො සමණො ගොතමො එවමාහා ති. න ඛො පනෙතං නිග්‍රොධ එවං දට්ඨබ්බං, කුසලා චෙව වො ධම්මා හොන්තු කුසලසඞ්ඛාතා ච සාචරියකානං. ඉති ඛ්වාහං නිග්‍රොධ නෙව අන්තෙවාසිකම්‍යතා එවං වදාමි, නපි උද්දෙසා චාවෙතුකාමො එවං වදාමි. නපි ආජීවා චාවෙතුකාමො එවං වදාමි, නපි යෙ ච වො ධම්මා[2] අකුසලා අකුසලසඞ්ඛාතා සාචරියකානං තෙසු පතිට්ඨාපෙතුකාමො එවං වදාමි. නපි යෙ ච වො ධම්මා කුසලා කුසලසඞ්ඛාතා සාචරියකානං තෙහි විවෙචෙතුකාමො එවං වදාමි. සන්ති ච ඛො නිග්‍රොධ අකුසලා ධම්මා අප්පහීණා සංකිලෙසිකා පොනොභවිකා[3] සදරා[4] දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා, යෙසාහං පහානාය ධම්මං දෙසෙමි යථා පටිපන්නානං වො සංකිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා''ති.

19. ''එවං වුත්තෙ තෙ පරිබ්බාජකා තුණ්හීභූතා මඞ්කුභූතා පත්තක්ඛන්ධා අධොමුඛා පජ්ඣායන්තා අප්පටිභාණා නිසීදිංසු, යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තා. අථ ඛො භගවතො එතදහොසි: සබ්බෙ පි මෙ මොඝ-පුරිසා ඵුට්ඨා පාපිමතා, යත්‍ර හි නාම එකස්සපි න එවං භවිස්සති ''හන්ද මයං අඤ්ඤාණත්ථම්පි සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං චරාම, කිං කරිස්සති සත්තාහො''ති.

අථ ඛො භගවා උදුම්බරිකාය පරිබ්බාජකාරාමෙ සීහනාදං නදිත්වා, වෙහාසං අබ්භුග්ගන්ත්වා, ගිජ්ඣකූටෙ පබ්බතෙ පච්චුට්ඨාසි[5]. සන්ධානො පන ගහපති තාවදෙව රාජගහං පාවිසී ති.

උදුම්බරිකසුත්තං නිට්ඨිතං දුතියං (25)

1. වො තෙ ධම්මා (PTS)
2. න පි යෙ තෙ ධම්මා (ස්‍යා)
3. පොනොබ්භවිකා (මජසං)
4. සද්දරා (PTS කම්), සදරථා, (ස්‍යා)
5. පච්චුපට්ඨාසි, (මජසං)

න්‍යග්‍රෝධයෙනි, 'අකුසල් කොටසට අයත් කොට ඇදුරා සහිත අප විසින් කියන ලද අකුසල් වූ යම් ධර්ම කෙනෙක් වෙත් නම්, එහි අප පිහිටුවනු කැමැති ව, මහණ ගොයුම්හු මෙසේ කිය තැ' යි තොපට මෙසේ සිතක් වියැ හැක්ක. න්‍යග්‍රෝධයෙනි, මෙය එසේ නො ම දත යුතු. ඇදුරා සහිත තොප විසින් අකුසල් කොටසට අයත් යැ යි කියන ලද අකුසල් වූ ඒ ධර්මයෝ එසේ ම වෙත් වා.

න්‍යග්‍රෝධයෙනි, 'කුසල් කොටසට අයත් කොට ඇදුරා සහිත අප විසින් කියන ලද යම් කුසල් දහම් කෙනෙක් වෙත් නම්, එයින් අප බැහැර කරනු කැමැති වැ මහණ ගොයුම්හු මෙසේ කිය තැ' යි මෙසේ සිතක් තොපට විය හැක්ක. න්‍යග්‍රෝධයෙනි, මෙය එසේ නො ම දත යුතු. ඇදුරා සහිත තොපගේ කුසලසංඛ්‍යාත වූ ඒ කුසල් දහම්හු එසේ ම වෙත් වා. න්‍යග්‍රෝධයෙනි, අතැවැසි කැරගනු කැමැත්තෙන් මෙසේ නො ම කියමි. තොප ගේ ඉගැන්මෙන් බැහැර කරනු කැමැති ව මෙසේ නො ද කියමි. තොපගේ ජීවිකාවෘත්තියෙන් බැහැර කරනු කැමැති ව මෙසේ නො ද කියමි. ඇදුරා සහිත තොප අකුසල් යැ යි අකුසල් කොටසට ඇතුළත් යැ යි සලකන ලද දහම් හි තොප පිහිටුවනු කැමැති ව මෙසේ නො ද කියමි. ඇදුරා සහිත තොප කුසල් යැ යි කුසල් කොටසට අයත් යැයි පිළිගත් දහම් කෙරෙන් තොප බැහැර කරනු කැමැති ව මෙසේ නො ද කියමි. න්‍යග්‍රොධයෙනි, යම් කෙනෙකුන් ගේ ප්‍රහාණය පිණිස මම් දහම් දෙසම් ද, සිත් සතන් කෙලෙසන, පුනර්භවය පිණිස පවත්නා, කෙලෙස් පෙළුම් සහිත වූ, දුක් විපාක ගෙන දෙන, මතු ජාතිජරාමරණයට ප්‍රත්‍යය වූ (තොප සිත්සතන්හි) අප්‍රහීණ වූ ඒ අකුසල ධර්ම කෙනෙක් ඇත් ම ය. යම් සේ පිළිපන් තොපගේ ඒ සිත් කෙලෙසන ස්වභාවයෝ ප්‍රහීණ වන්නාහු ද, සිත් සතන් පිරිසිදු කරන ධර්මයෝ තොප සිත් සතන්හි වැඩෙන්නාහු ද, මාර්ගප්‍රඥාවගේ පරිපූර්ණත්වයත් ඵල ප්‍රඥාවගේ විපුලත්වයත් මේ අත්බවහි ම තුමූ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වසවූ ද, එසේ වනු පිණිස මම් දහම් දෙසමි.''

19. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ කල්හි, මාරයා විසින් මඩනා ලද සිතැත්තාහු යම් සේ ද, එසේ ඒ පිරිවැජියෝ නිහඬ ව, තෙද නැති ව, කර බා ගත්තෝ වැ, බිමට හෙළූ මුහුණු ඇති ව, සිතිවිලි සිතන්නාහු වැටහෙන නුවණ නැතියෝ ව හුන්හ. එ කලැ භාග්‍යවතුන් වහන්සේට, 'එසේ නම් අපි දැනගනු පිණිස තුමූ මහණ ගොයුම් කෙරෙහි බඹසර කරමු' යි 'සත් දින අපට කවර අපහසුවක් කරන්නේ දැ' යි මෙසේ සිතෙක් යම් ඒ පිරිවැජියන් අතුරෙහි එකකුට දු නො වන්නේද, එ පමණට ම මෙ සියලු ම හිස් පුරුෂයෝ පාපි වූ මරහු විසින් ස්පර්ශ කරන ලදහ' යි මේ සිත විය.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ උදුම්බරිකාවගේ පිරිවැජි අරමැ මෙසේ පරවාදච්ඡේදක ස්වවාද සමුත්ථාපක අභීත නාදය පවත්වා, අහස් නැඟ, ගිජුකුළු පව්වෙහි පිහිටි සේක. සන්ධාන ගෘහපති එ කෙණෙහි ම රජගහ පුරයට පිවිසියේ ය.

දෙවෙනි උදුම්බරික සීහනාද සූත්‍රය නිමියේ ය. (25)

# 3

# චක්කවත්තිසුත්තං

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා මගධෙසු විහරති මාතුලායං. තත්‍ර ඛො භගවා භික්ඛු ආමන්තෙසි භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

අත්තදීපා භික්ඛවෙ විහරථ අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා. කථඤ්ච පන භික්ඛවෙ භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො, ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො?

ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු වෙදනානුපස්සී -පෙ- චිත්තෙ චිත්තානුපස්සී, -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං ඛො භික්ඛවෙ භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො, ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො.

ගොචරෙ භික්ඛවෙ චරථ සකෙ පෙත්තිකෙ විසයෙ. ගොචරෙ භික්ඛවෙ චරතං සකෙ පෙත්තිකෙ විසයෙ න ලච්ඡති මාරො ඔතාරං, න ලච්ඡති මාරො ආරම්මණං. කුසලානං භික්ඛවෙ ධම්මානං සමාදානහෙතු එවමිදං පුඤ්ඤං පවඩ්ඪති.

# 3

# චක්‍රවර්ති සිංහනාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී:

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මගධ රටැ මාතුලා නුවර වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමැතූ සේක. 'පින්වතුන් වහන්සැ' යි ඒ භික්ෂූහු ඔබට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ මතු දැක්වෙන ධර්මය වදළ සේක:

මහණෙනි, ආත්මය හෙවත් ලොව්, ලොව්තුරා දහම් ද්වීප කොට ඇත්තෝ වැ, ආත්මය ශරණ කොට ඇත්තෝ වැ, අන් සරණයක් අපේක්ෂා නො කරන්නෝ වැ, ධර්මය ද්වීප කොටැත්තෝ වැ, ධර්මය ශරණ කොටැත්තෝ වැ, අන් සරණයක් නැත්තෝ වැ වසවු. මහණෙනි, මහණ තෙම කෙසේ නම් ආත්මය ද්වීප කොටැති ව, ආත්මය ශරණ කොටැති වැ, අනන්‍ය ශරණ වැ, ධර්මය ද්වීප කොටැති වැ, ධර්මය ශරණ කොටැති වැ අනන්‍ය ශරණ වැ වෙසේ ද? යත්.

මහණෙනි, මෙහි මහණ තෙමේ කයෙහි කායානුපස්සී වැ (කය අනුව බලන්නෙක් වැ), කෙලෙස් තවන වැර ඇති වැ, නුවණින් දන්නේ, එළඹැ සිටි සිහි ඇත්තේ, ලොවෙහි (කයෙහි) අභිධ්‍යාවත් දෙම්නසත් බැහැර කොට වෙසෙයි. වේදනාවන්හි වේදනානුපස්සී වැ... සිතෙහි චිත්තානුපස්සී වැ... ධර්මයන්හි (සංඥා සංස්කාරයන්හි) ධම්මානුපස්සී වැ කෙලෙස් තවන වැර ඇති වැ, නුවණින් දන්නේ, එළැඹැ සිටි සිහිඇත්තේ, ලොවෙහි (සංඥා සංස්කාර ස්කන්ධයන්හි) අභිධ්‍යාව ද දෙම්නස ද බැහැර කොට වෙසෙයි. මහණෙනි, මෙසේ ම මහණ තෙම ආත්මද්වීප වැ ආත්ම ශරණ වැ අනන්‍ය ශරණ වැ ධර්මද්වීප වැ ධර්ම ශරණ වැ අනන්‍ය ශරණ වැ වෙසෙයි.

මහණෙනි, තමන් සතු වූ, පියා ගෙන් තමනට උරුම වැ පැමිණි හැසිරීමට නිසි පෙදෙසෙහි හැසිරෙවු. පියා ගෙන් උරුම ව ආ හැසිරීමට නිසි පෙදෙසෙහි හැසිරෙන්නාවුන් ගේ සිදුරක් මාර තෙමේ නො දකින්නේ ය, අරමුණක් මාර තෙමේ නො ලබන්නේ ය. මහණෙනි, කුශල ධර්ම සමාදන් කොට ගෙන පවත්නා හෙයින් මෙසේ මේ පින් වැඩෙයි.

2. භූතපුබ්බං භික්ඛවෙ රාජා දළ්හනෙමි නාම අහොසි චක්කවත්ති ධම්මිකො රාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි අහෙසුං, සෙය්‍යථීදං: චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා අහෙසුං සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන[1] අභිවිජිය අජ්ඣාවසි. අථ ඛො භික්ඛවෙ රාජා දළ්හනෙමි බහුන්නං වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: "යදා ත්වං අම්භො පුරිස පස්සෙය්‍යාසි දිබ්බං චක්කරතනං ඔසක්කිතං, ඨානා චුතං, අථ මෙ ආරොචෙය්‍යාසී''ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ සො පුරිසො රඤ්ඤො දළ්හනෙමිස්ස පච්චස්සොසි. අද්දසා ඛො භික්ඛවෙ සො පුරිසො බහුන්නං වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන දිබ්බං චක්කරතනං ඔසක්කිතං ඨානා චුතං. දිස්වාන යෙන රාජා දළ්හනෙමි තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා රාජානං දළ්හනෙමිං එතදවොච: යග්ඝෙ දෙව ජානෙය්‍යාසි දිබ්බං තෙ චක්කරතනං ඔසක්කිතං ඨානා චුතන්ති.

3. අථ ඛො භික්ඛවෙ රාජා දළ්හනෙමි ජෙට්ඨපුත්තං කුමාරං ආමන්තෙත්වා[2] එතදවොච: දිබ්බං කිර මෙ තාත කුමාර චක්කරතනං ඔසක්කිතං ඨානා චුතං. සුතං ඛො පන මෙතං 'යස්ස රඤ්ඤො චක්කවත්තිස්ස දිබ්බං චක්කරතනං ඔසක්කති, ඨානා චවති, න'දානි තෙන රඤ්ඤා චිරං ජීවිතබ්බං හොතී'ති. භුත්තා ඛො පන මෙ මානුසිකා කාමා, සමයො'දානි මෙ දිබ්බෙ කාමෙ පරියෙසිතුං. එහි ත්වං තාත කුමාර ඉමං සමුද්දපරියන්තං පඨවිං පටිපජ්ජ. අහං පන කෙසමස්සුං ඔහාරෙත්වා, කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා, අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමී''ති. අථ ඛො භික්ඛවෙ රාජා දළ්හනෙමි ජෙට්ඨපුත්තං කුමාරං සාධුකං රජ්ජෙ සමනුසාසිත්වා, කෙසමස්සුං ඔහාරෙත්වා, කසායානි වත්ථානි අච්ඡාදෙත්වා, අගාරස්මා අනගාරියං පබ්බජි.

1. ධම්මෙන සමෙන (සයා. කම්)
2. ආමන්තාපෙත්වා (මජසං)

2. මහණෙනි, පෙර වූවක් කියමි. පෙර දැහැමි වූ දැහැමින් රජය කරවන්නා වූ, සතර මහ සයුරුහිමි කොටැති (සිවු මහ දිවයින් වූ) මුළු පොළොවට අධිපති වූ, සියලු සතුරන් දිනූ, (කිසිවකු විසිනුත් සොලොවාලියැ නො හැකි බැවින්) දනවුහි ස්ථිර බවට පැමිණි, සත් රුවනින් සමන්විත දළ්හනේමි නම් වූ සක්විති රජෙක් විය. චක්‍රරත්නය හස්තිරත්නය අශ්වරත්නය මණිරත්නය ස්ත්‍රී රත්නය ගෘහපතිරත්නය සත්වැනි පරිනායකරත්නය ම යැ යි ඔහුට මේ සත් රුවන් කෙනෙක් වූහ. බාහා සුලු නොවූ, මූර්තිමත් වීර්යය බඳු ශරීර ඇති, පර සෙන් මඩිනු සමත් වූ, දහසකට වැඩි පුත්‍ර කෙනෙක් ඔහුට වූහ. එ සක්විති තෙම සයුරහිමි මෙ මහ පොළොව දඬුවමින් තොර වැ අවියෙන් තොර වැ, දැහැමෙන් සෙමෙන් දිනා අධිපති වැ විසී ය. මහණෙනි, එ කල්හි දළ්හනේමි රජ තෙමෙ හවුරුදු බොහෝ ගණනෙක, හවුරුදු සිය ගණනෙක, හවුරුදු දහස් ගණනෙක ඇවෑමෙන් එක්තරා මිනිසකු බණවා, 'එම්බා පුරුෂය, යම් විටෙක තෝ දෙව සක්විති රුවන තුබූ තැනින් ඉවත් වැ සිටියා, තුබූ තැනින් පහ වැ සිටියා දුටුයෙහි වී නම්, එ විටැ මට දන්වව යි කී ය. මහණෙනි, එ පුරිස් තෙමෙ 'එසේ ය දේවයන් වහන්සැ' යි ම දළ්හනේමි රජු බස් මුදුනින් පිළිගත. මහණෙනි, හේ පුරිස් තෙම බොහෝ හවුරුදු ගණනෙක, බොහෝ හවුරුදු සිය ගණනෙක, බොහෝ හවුරුදු දහස් ගණනෙක ඇවෑමෙන් දෙව සක්රුවන තුබූ තැනින් ඉවත් වූවා, පහ වැ සිටියා දිටී ය. දැක, දළ්හනේමි රජු කරා එළඹියේ ය. එළඹ ඔහුට, 'දේවයන් වහන්ස, දනැ ගන්න. ඔබ ගේ දෙව සක්රුවන ඉවත් විය, තුබූ තැනින් පහ වියැ' යි සැළ කෙළේ ය.

3. මහණෙනි, එ විටැ දළ්හනේමි රජ තෙම දෙටුපුත් කුමරු කැඳවා, 'දරුව, මගේ දෙව සක්රුවන ඉවත් වී ල, තුබූ තැනින් පහ වී ල. 'යම් සක්විති රජක්හු ගේ දෙව සක්රුවන ඉවත් වේ ද, තුබූ තැනින් පහ වේ ද, දැන් එ රජු විසින් බොහෝ කල් ජීවත් විය හැකි නො වේ' යන මෙය මා විසින් අසන ලදී. මිනිසුන් විසින් වින්ද හැකි කාමයෝ මා විසින් විඳුනා ලදුහ. දැන් මට දිව්‍ය කාම සම්පත් සොයන්නට කල් පැමිණියේ වෙයි. දරුව, කුමාරය, මෙහි එව. මේ මුහුදුහිමි පොළොව තෝ අනුභව කරව. මම් වනාහි කෙහෙ රවුලු බහවා, කසා වත් හැඳ, ගිහි ගෙයින් පැවිදි බිමට වදනෙමි' යි මෙ බස් පැවැසී ය. මහණෙනි, ඉක්බිති දළ්හනේමි සක්විති තෙමෙ දෙටුපුත් කුමර හට මොනොවට රජයෙහි අනුසැසැ (මෙසේ රජය කරව යි අනුශාසන කොට), කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම පැවිදි බිම වන.

සත්තාහපබ්බජිතෙ ඛො පන භික්ඛවෙ රාජිසිම්හි දිබ්බං චක්කරතනං අන්තරධායි.

අථ ඛො භික්ඛවෙ අඤ්ඤතරො පුරිසො යෙන රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො[1] තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජානං ඛත්තියං මුද්ධාභිසිත්තං එතදවොච: යග්ඝෙ දෙව ජානෙය්‍යාසි දිබ්බං චක්කරතනං අන්තරහිතන්ති. අථ ඛො භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො දිබ්බෙ චක්කරතනෙ අන්තරහිතෙ අනත්තමනො අහොසි. අනත්තමනතඤ්ච පටිසංවෙදෙසි. සො යෙන රාජිසි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජිසිං එතදවොච: යග්ඝෙ දෙව ජානෙය්‍යාසි දිබ්බං චක්කරතනං අන්තරහිතන්ති. එවං වුත්තෙ භික්ඛවෙ රාජිසි රාජානං ඛත්තියං මුද්ධාභිසිත්තං එතදවොච: 'මා ඛො ත්වං තාත දිබ්බෙ චක්කරතනෙ අන්තරහිතෙ අනත්තමනො අහොසි, මා අනත්තමනතඤ්ච පටිසංවෙදෙසි න හි තෙ තාත දිබ්බං චක්කරතනං පෙත්තිකං දායජ්ජං, ඉඞ්ඝ ත්වං තාත අරියෙ චක්කවත්තිවත්තෙ වත්තාහි ඨානං ඛො පනෙතං විජ්ජති යං තෙ අරියෙ චක්කවත්තිවත්තෙ වත්තමානස්ස තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස[2] උපොසථිකස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතු භවිස්සති සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාරපරිපූර''න්ති.

4. ''කතමං පන තං දෙව අරියං චක්කවත්තිවත්තන්ති''?

''තෙන හි ත්වං තාත ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො[3] ධම්මං මානෙන්තො ධම්මං පූජෙන්තො ධම්මං අපචායමානො, ධම්මද්ධජො ධම්මකේතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහස්සු අන්තොජනස්මිං.

ධම්මං යෙව නිස්සාය -පෙ-

බලකායස්මිං ධම්මං යෙව නිස්සාය ඛත්තියෙසු අනුයුත්තෙසු[4].

1. මුද්ධාවසිත්තො (ස්‍යා PTS)
2. සීසං නහාතස්ස (PTS), සීසන්හාතස්ස (ස්‍යා)
3. ගරුං කරොන්තො (මජ්සං)
4. ආනුයුත්තෙසු (මජ්සං)

මහණෙනි, ඒ රාජර්ෂිහු පැවිදි වැ සත් දවස් ගියකලැ දෙව සක්රුවන අතුරුදහන් විය. මහණෙනි, එ කල්හි එක්තරා මිනිසෙක් මුදුනැ ලත් අභිෂේක ඇති එ රජු කරා එළැඹියේ ය. එළැඹ, මූර්ධාභිෂික්ත වූ එ රජහට, 'දේවයිනි, දැන ගන්න, දෙව සක්රුවන අතුරුදහන් වී යැ' යි සැළ කෙළේ ය. මහණෙනි, ඉක්බිති මූර්ධාභිෂික්ත ඒ ක්ෂත්‍රිය රාජ තෙම දෙව සක්රුවන අතුරුදහන් වූ කලැ නො සතුටු සිතැති විය. නො සතුටු සිතැති බව ද දන්වී ය. හෙ රාජර්ෂිහු කරා එළැඹියේ ය. එළැඹ ඔහුට 'දේවයිනි, දෙව සක්රුවන අතුරුදහන් වී යැ' යි සැළ කෙළේ ය. මහණෙනි, මෙසේ කී කල්හි රාජර්ෂි තෙමෙ මූර්ධාභිෂික්ත ඒ කැත් රජුහට දරුව, දෙව සක්රුවන අතුරු-දහන් වූ කල්හි නො සතුටු නො වව, නොසතුටු බව නො පළ කරව, දෙව සක්රුවන තට පියාගෙන් ලැබෙන දැවැද්දෙක් නො වෙ, 'දරුව, දැන් තෝ අරි (නිදෙස්) සක්විති වත් පුරව, අරි (නිදෙස්) සක්විති වත් පුරන, ඒ පණුරස් පොහෝ දිනැ හිස සෝද නා, පෙහෙවස් සමාදන් කොට ගෙන, පහයැ මතු මාළට පැමිණ ඉන්නා තාහට දහසක් දැවි ඇති නිම්වළලු සහිත, නැබ සහිත, හැම අයුරින් ම පිරිපුන් දෙව සක්රුවන පහළ වන්නේ ය යන යමෙක් ඇද්ද, මෙ කාරණය විද්‍යා-මාන යැ' යි කී ය.

4. "දේවයිනි, ඒ අරි (නිදෙස්) සක්විති වත කවර යැ?" යි රජ පුළුවත.

"දරුව එසේ නම්, (දශ කුශලකම් පථ) ධර්මය ම ඇසුරු කොට, (දශ කුශලකම් පථ) ධර්මයට ම සත්කාර කරමින්, (දශ කුශලකම් පථ) ධර්මයට ම ගරු කරමින්, (දශ කුශලකම් පථ) ධර්මයට ම බුහුමන් කරමින්, (දශ කුශල-කම් පථ) ධර්මය ම පුදමින්; (දශ කුශලකම් පථ) ධර්මයට ම යටත් පැවැත්ම දක්වමින්; (දශ කුශලකම් පථ) ධර්මය ම ධවජයක් සේ පෙරටු කැරගත්-තෙක් වැ, (දශ කුශලකම් පථ) ධර්මය ම කුන්තයක් සේ ඔසොවා ගත්තෙක් වැ (දශ කුශලකම් පථ) ධර්මය ම ආධිපත්‍යය කොට ඇත්තෙක් වැ, (හැම ක්‍රියාවක් දශ කුශලකම් පථ වශයෙන් ම කරන්නෙක් වැ), (පුත්‍රදාරාදි) අන්තෝජනයා කෙරෙහි ධාර්මික වූ රක්ෂාවරණගුප්තිය සංවිධාන කරව.

ධර්මය ම ඇසුරු කොට...බලසෙන් කෙරෙහි ධාර්මික වූ රක්ෂාවරණ-ගුප්තිය සංවිධානය කරව.

ධර්මය ම ඇසුරු කොට...යටත් වූ අනුයුක්ත ක්ෂත්‍රියයන් කෙරෙහි ද ධාර්මික වූ රක්ෂාවරණගුප්තිය සංවිධාන කරව.

ධම්මංයෙව නිස්සාය -පෙ- බ්‍රාහ්මණගහපතිකෙසු,

ධම්මංයෙව නිස්සාය -පෙ- නෙගමජානපදෙසු,

ධම්මංයෙව නිස්සාය සමණබ්‍රාහ්මණෙසු,

ධම්මංයෙව නිස්සාය -පෙ- මිගපක්ඛීසු.

මා ච තෙ තාත විජිතෙ අධම්මකාරො පවත්තිත්ථ.

යෙ ච තෙ තාත විජිතෙ අධනා අස්සු, තෙසඤ්ච ධනමනුප්පදෙය්‍යාසි[1].

යෙ ච තෙ තාත විජිතෙ සමණබ්‍රාහ්මණා මදප්පමාදා පටිවිරතා ඛන්තිසොරච්චෙ නිවිට්ඨා එකමත්තානං දමෙන්ති, එකමත්තානං සමෙන්ති, එකමත්තානං පරිනිබ්බාපෙන්ති. තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡෙය්‍යාසි පරිපඤ්හෙය්‍යාසි: කිං භන්තෙ කුසලං, කිං අකුසලං, කිං සාවජ්ජං කිං අනවජ්ජං, කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං, කිං මෙ කරියමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය අස්ස, කිං වා පන මෙ කරියමානං දීඝරත්තං හිතාය සුඛාය අස්සා?''ති. තෙසං සුත්වා යං අකුසලං තං අභිනිවජ්ජෙය්‍යාසි, යං කුසලං තං සමාදාය වත්තෙය්‍යාසි.

ඉදං ඛො තාත අරියං චක්කවත්තිවත්ත''න්ති.

''එවං දෙවා''ති ඛො භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො රාජිසිස්ස පටිස්සුත්වා අරියෙ චක්කවත්තිවත්තෙ[2] වත්ති. තස්ස අරියෙ චක්කවත්තිවත්තෙ වත්තමානස්ස තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස උපොසථිකස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතුරහොසි සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාරපරිපූරං, දිස්වාන රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස එතදහොසි: සුතං ඛො පන මෙතං යස්ස රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස උපොසථිකස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතු භවති.

1. ධනමනුප්පදෙජ්ජෙය්‍යාසි (සයා PTS)
2. අරියං චක්කවත්තිවත්තං (කම්)

ධර්මය ම ඇසුරු කොට ..බමුණන් කෙරෙහි ද ගැහැවියන් කෙරෙහි ද ධාර්මික වූ රක්ෂාවරණගුප්තිය සංවිධාන කරව.

ධර්මය ම ඇසුරු කොට...නියම්ගම්වැසි දනවුවැසි ජනයා කෙරෙහි ද ධාර්මික වූ රක්ෂාවරණගුප්තිය සංවිධාන කරව.

ධර්මය ම ඇසුරු කොට...මහණුන් කෙරෙහි ද (බාහිත පාපි) බමුණන් කෙරෙහි ද ධාර්මික වූ රක්ෂාවරණගුප්තිය සංවිධාන කරව.

ධර්මය ම ඇසුරු කොට...මෘගපක්ෂීන් කෙරෙහි ද ධාර්මික වූ රක්ෂා-වරණගුප්තිය සංවිධාන කරව.

දරුව, තගේ රටෙහි අධර්මක්‍රියා නොපවත්නා ලෙසට කටයුතු සලසව.

දරුව, තා රටෙහි යම් කෙනෙක් ධනය නැත්තාහු ද, ඔවුනට ධනය දෙව.

දරුව, තා රටෙහි යම් මහණ බමුණු කෙනෙක් මදයෙන් හා ප්‍රමාදයෙන් වැළැක්කාහු, ක්ෂාන්තියෙහි ද සෞරත්‍යයෙහි ද (කායික වාචසික සුචරිත-යෙහි ද) පිහිටියාහු එක ම තම සිත දමනය කෙරෙත් ද, එක ම තම සිත සංහිඳුවත් ද, එක ම තම සිත පිරිනිවත් ද, ඔවුන් කරා කලින් කලැ එළැඹ, "වහන්ස, කුසල් කවර යැ? අකුසල් කවර යැ? වරද කවර යැ? නිවරද කවර යැ? සෙවියැ යුත්ත කවර යැ? නොසෙවියැ යුත්ත කවර යැ? මා කරන කිමෙක් නම් බොහෝ කලක් අවැඩ පිණිස දුක් පිණිස පවත්නේ ද? මා කරන කිමෙක් හෝ බොහෝ කලක් වැඩ පිණිස සුව පිණිස පවත්නේ ද?''යි නැවත නැවත විචාරව පුන පුනා ප්‍රශ්න කරව. ඔවුන් කී බස් අසා යමෙක් අකුසල් වේ ද, එය බැහැර කරව. යමෙක් කුසල් වේ ද, එය සමාදන් කොට ගෙන පවතුව. දරුව, මේ අරි සක්විතිවත නම් වේ" යැ යි රාජර්ෂි කී ය.

"එසේ යැ දේවයිනි'යි කියා ම, මහණෙනි, මුදුනැ අබිසෙස් ලත් ඒ කැත් රජ රාජර්ෂිහට පිළිවදන් දී අරි සක්විති වතෙහි පැවැත්තේ ය. අරි සක්විති වත්හි පවත්නා, ඒ පසොළොස්වක් පුණු පොහෝද හිස සෝද නා, සමාදන් කොට ගත් පෙහෙවස් ඇති වැ, පහයැ මතු මහල් තලයට නැංගාවූ ඔහුට දහසක් අර ඇති, නිම්වලලු සහිත, නැබ සහිත, හැම අයුරින් පිරිපුන් දෙව සක්රුවන පහළ විය.

සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාරපරිපූරං, සො හොති රාජා චක්කවත්තීති. අස්සං නුඛො අහං රාජා චක්කවත්තී''ති.

5. අථ ඛො භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො උට්ඨායාසනා, එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වාමෙන හත්ථෙන භිඞ්කාරං ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන චක්කරතනං අබ්භුක්කිරි, 'පවත්තතු භවං චක්කරතනං, අභිවිජිනාතු භවං චක්කරතන'න්ති. අථ ඛො තං භික්ඛවෙ චක්කරතනං පුරත්ථිමං දිසං පවත්ති, අන්වදෙව රාජා චක්කවත්ති සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යස්මිං ඛො පන භික්ඛවෙ පදෙසෙ චක්කරතනං පතිට්ඨාසි, තත්ථ රාජා චක්කවත්ති වාසං උපගඤ්ඡි සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යෙ ඛො පන භික්ඛවෙ පුරත්ථිමාය දිසාය පටිරාජානො, තෙ රාජානං චක්කවත්තිං උපසඞ්කමිත්වා එවමාහංසු: එහි ඛො මහාරාජ, ස්වාගතං තෙ මහාරාජ සකන්තෙ මහාරාජ, අනුසාස මහාරාජා'ති.

රාජා චක්කවත්ති එවමාහ:

පාණො න හන්තබ්බො. අදින්නං නාදාතබ්බං. කාමෙසු මිච්ඡා න චරිතබ්බා. මුසා න භාසිතබ්බා. මජ්ජං න පාතබ්බං. යථාභුත්තඤ්ච භුඤ්ජථා'ති.

යෙ ඛො පන භික්ඛවෙ පුරත්ථිමාය දිසාය පටිරාජානො තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයුත්තා[1] අහෙසුං.

අථ ඛො තං භික්ඛවෙ චක්කරතනං පුරත්ථිමං සමුද්දං අජ්ඣොගාහිත්වා පච්චුත්තරිත්වා දක්ඛිණං දිසං පවත්ති -පෙ- අනුයුත්තා අහෙසුං.

අථ ඛො තං භික්ඛවෙ චක්කරතනං දක්ඛිණං සමුද්දං අජ්ඣොගාහිත්වා පච්චුත්තරිත්වා පච්ඡිමං දිසං පවත්ති, අන්වදෙව රාජා චක්කවත්ති සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යස්මිං ඛො පන භික්ඛවෙ පදෙසෙ දිබ්බං චක්කරතනං පතිට්ඨාසි, තත්ථ රාජා චක්කවත්ති වාසං උපගඤ්ඡි සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යෙ ඛො පන භික්ඛවෙ පච්ඡිමාය දිසාය පටිරාජානො, තෙ රාජානං චක්කවත්තිං උපසඞ්කමිත්වා එවමාහංසු: එහි ඛො මහාරාජ, ස්වාගතං තෙ මහාරාජ, සකන්තෙ මහාරාජ, අනුසාස මහාරාජා'ති.

1. අනුයන්තා (සීමු)

එය දක්මෙන් මූර්ධාභිෂික්ත වූ ඒ කැත් රජුහට මේ සිත විය: 'එ පුණු- පොහෝ දින හිස සෝද නා සමාදන් කොට ගත් පෙහෙවස් ඇති වැ පහයැ මතු මහල් තලයට නැගී හුන්, අරි සක්විති වත්හි පවත්නා මුදුනැ අබිසෙස් ලත් යම් කැත් රජක්හට දහසක් අර ඇති නිම්වළලු සහිත, නැබ සහිත, හැම අයුරින් පිරිපුන් දෙව් සක්රුවන පහළ වේ ද, හෙ තෙමේ සක්විති රජ වේ යැ''යි මෙය මා විසින් අසන ලදී. මම සක්විති රජ වන්නෙම් දෝ ?'යි යනු ය.

5. මහණෙනි, ඉක්බිති මූර්ධාභිෂික්ත වූ ඒ කැත් රජ තෙමෙ හුනස්- නෙන් නැගී, උතුරු සළුව එකස් කොට පෙරෙවැ, වම් අතින් කෙංඩිය ගෙන, 'භවත් චක්‍රරත්නය පෙරළේ වා, භවත් චක්‍රරත්නය දිශාවන් දිනා වා'යි දකුණතින් සක්රුවනට දිය ඉස්සේ ය. මහණෙනි, එ කලැ ඒ සක්රුවන පෙර දෙසට පෙරළිණ. සක්විති රජ ද සිවුරඟ සෙන් හා එය අනුව ම ගියේ ය. මහණෙනි, යම් පෙදෙසෙක සක් රුවන පිහිටියේ ද, සක්විති රජ එ තන්හි සිවුරඟ සෙන් හා දුසුළු ගත්තේ ය. මහණෙනි, පෙර දෙසැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු සක්විති රජු කරා එළැඹ, 'මහරජුනි, වඩින්න, මහරජුනි, ඔබ මෙහි වැඩි නියා යහපත. මහරජුනි, මේ සියල්ල ඔබ සතු ය. මහරජුනි, අපට අනුශාසන කරන්නැ'යි කීහ.

එ විට සක්විති රජ ඔවුන් බණවා,

"ප්‍රාණවධ නො කටයුතු. අයිනාදන් නො කට යුතු. කාමයන්හි වරදවා නො හැසිරියැ යුතු. මුසවා නො බිණියැ යුතු. මත් පැන් නො පියැ යුතු. තමන් සතු දැ පරිභෝග කළ පරිදි ම දැහැමෙන් පරිභෝග කරවූ''යැ යි මෙසේ කී ය.

මහණෙනි පෙර දෙසැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු සක්විති රජුට අනුකූල වූහ.

මහණෙනි, ඉක්බිති සක්රුවන පෙරදිගැ මුහුද වැද ගොඩ නැඟ දකුණු දිගට පෙරළිණ ..දකුණු දිග යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු සක්විති රජුට අනුකූල වූහ.

මහණෙනි, ඉක්බිති ඒ සක්රුවන දකුණු දිග මුහුද වැද ගොඩ නැඟ පැසිම් දිගට පෙරළිණ. එය අනුව ම සක්විති රජ සිවුරඟ සෙන් හා ගියේ ය. මහණෙනි, යම් පෙදෙසෙක දෙව් සක්රුවන පිහිටියේ ද, සක්විති රජ එහි සිවුරඟ සෙන් හා ලැගුම් ගත්තේ ය. මහණෙනි, පැසිම් දිගැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු සක්විති රජු කරා එළැඹ, 'මහරජුනි, වඩින්න, මහරජුනි, ඔබ වැඩි සේ යහපත. මහරජුනි, මේ සියල්ල ඔබ සතු ය. මහරජුනි, අනුශාසන කරන්නැ'යි කීහ.

රාජා චක්කවත්ති එවමාහ:

පාණො න හන්තබ්බො, අදින්නං නාදාතබ්බං, කාමෙසු මිච්ඡා න චරිතබ්බා, මුසා න භාසිතබ්බා, මජ්ජං න පාතබ්බං, යථා භුත්තඤ්ච භුඤ්ජථා'ති. යෙ ඛො පන භික්ඛවෙ පච්ඡිමාය දිසාය පටිරාජානො, තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයුත්තා[1] අහෙසුං.

අථ ඛො තං භික්ඛවෙ චක්කරතනං පච්ඡිමං සමුද්දං අජ්ඣොගාහිත්වා පච්චුත්තරිත්වා උත්තරං දිසං පවත්ති, අන්වදෙව රාජා චක්කවත්ති සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යස්මිං ඛො පන භික්ඛවෙ පදෙසෙ දිබ්බං චක්කරතනං පතිට්ඨාසි, තත්ථ රාජා චක්කවත්ති වාසං උපගඤ්ඡි සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යෙ ඛො පන භික්ඛවෙ උත්තරාය දිසාය පටිරාජානො තෙ රාජානං චක්කවත්තිං උපසඞ්කමිත්වා එවමාහංසු: එහි ඛො මහාරාජ, ස්වාගතං[2] තෙ මහාරාජ, සකන්තෙ මහාරාජ, අනුසාස මහාරාජා'ති. රාජා චක්කවත්ති එවමාහ: පාණො න හන්තබ්බො, අදින්නං නාදාතබ්බං, කාමෙසු මිච්ඡා න චරිතබ්බා, මුසා න භාසිතබ්බා, මජ්ජං නපාතබ්බං, යථාභුත්තඤ්ච භුඤ්ජථා'ති.

යෙ ඛො පන භික්ඛවෙ උත්තරාය දිසාය පටිරාජානො තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයුත්තා අහෙසුං.

6. අථ ඛො තං භික්ඛවෙ චක්කරතනං සමුද්දපරියන්තං පථවිං[3] අභිවිජිනිත්වා තමෙව රාජධානිං පච්චාගන්ත්වා රඤ්ඤො චක්කවත්තිස්ස අන්තෙපුරද්වාරෙ අත්ථකරණපමුඛෙ[4] අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසි, රඤ්ඤො චක්කවත්තිස්ස අන්තෙපුරං උපසොභයමානං. -පෙ-

දුතියො පි ඛො භික්ඛවෙ රාජා චක්කවත්ති -පෙ- තතියො පි ඛො භික්ඛවෙ රාජා චක්කවත්ති -පෙ- චතුත්ථො පි ඛො භික්ඛවෙ රාජා චක්කවත්ති -පෙ- පඤ්චමො පි ඛො භික්ඛවෙ රාජා චක්කවත්ති -පෙ- ඡට්ඨො පි ඛො භික්ඛවෙ රාජා චක්කවත්ති -පෙ- සත්තමො පි ඛො භික්ඛවෙ රාජා චක්කවත්ති බහූනං වස්සානං බහූනං වස්සසතානං බහූනං වස්සසහස්සානං අච්චයෙන අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: යදා ත්වං අම්භො පුරිස පස්සෙය්‍යාසි දිබ්බං චක්කරතනං ඔසක්කිතං ඨානා චුතං, අථ මෙ ආරොචෙය්‍යාසී ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ සො පුරිසො රඤ්ඤො චක්කවත්තිස්ස පච්චස්සොසි. අද්දසා ඛො භික්ඛවෙ සො පුරිසො බහූනං වස්සානං බහූනං වස්සසතානං බහූනං වස්සසහස්සානං අච්චයෙන දිබ්බං චක්කරතනං ඔසක්කිතං ඨානා චුතං, දිස්වාන යෙන රාජා චක්කවත්ති තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා රාජානං චක්කවත්තිං එතදවොච: යග්ඝෙ දෙව ජානෙය්‍යාසි දිබ්බන්තෙ චක්කරතනං ඔසක්කිතං ඨානා චුතන්ති.

1. අනුයන්තා (මජසං)
2. සාගතං (PTS)
3. පඨවිං (මජසං)
4. අච්චකරණපමුඛෙ (සීමු)

එ විටැ සක්විති රජ,

'ප්‍රාණවධ නො කළ යුතු, අයිනාදන් නො කළ යුතු. කාමමිථ්‍යාචාර නො කළ යුතු, මුසවා නොබිණියැ යුතු, මත් පැන් නො පියැ යුතු. තමන් පරිභෝග කළ රට එ පරිද්දෙන් ම පරිභොග කරවු' යැ යි මෙසේ කී ය. මහණෙනි, පැසිම් දිගැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු ඒ සක්විති රජු අනුව යන්නෝ වූහ.

මහණෙනි, ඉක්බිත්තෙන් ඒ සක්රුවන පැසිම් මුහුද වැද ගොඩ නැඟ, උතුරු දෙසට පෙරළිණ. සක්විති රජ ද එය අනුව ම සිවුරඟ සෙන් හා ගියේ ය. මහණෙනි, යම් පෙදෙසක දෙව සක්රුවන රඳුණේ ද, සක්විති රජ සිවුරඟ සෙන් හා එහි වාසයට එළැඹියේ ය. මහණෙනි, උතුරු දිගැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද ඔහු සක්විති රජුහු කරා එළැඹ, 'මහරජුනි, වඩින්න. මහරජුනි, ඔබ වැඩි සේ යහපත. මහරජුනි මෙ හැම ඔබ සතු ය. මහරජුනි, අනුශාසන කළ මැනවැ'යි කීහ. සක්විති රජ ඔවුන් බණවා:

'පණිවා නො කළ යුතු, අයිනාදන් නො කළ යුතු, කාමයන්හි වරදවා නො හැසිරියැ යුතු, මුසවා නො බිණියැ යුතු, මත්පැන් නො පියැ යුතු, වැළඳූ පරිදි ම සිය රට වළඳවු' යැ යි මෙසේ කී ය.

මහණෙනි, උතුරු දෙසැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු නම්, ඔහු සක්විති රජුහු අනුවැ යන්නෝ වූහ.

6. මහණෙනි, ඉක්බිත්තෙන් ඒ සක්රුවන මුහුදුහිම් පොළොව දිනා, ඒ රජදහනට ම පෙරළා අවුත්, සක්විති රජුහු ගේ ඇතොවුර බබලවනුයේ, ඇතොවුර දෙරැ යුක්ති පසිදිනා හලැ අක්දෙරියෙහි අකුර ගැසුවාක් මෙන් සිටියේ ය...

මහණෙනි, දෙවෙනි සක්විති රජ ද...තෙවෙණි සක්විති රජ ද... සතර වැනි සක්විති රජ ද... පස්වැණි සක්විති රජ ද... සවැණි සක්විති රජ ද... සත්වැනි සක්විති රජ ද බොහෝ හවුරුදු ගණනක්, බොහෝ හවුරුදු සිය ගණනක්, බොහෝ හවුරුදු දහස් ගණනක් ඇවෑමෙන් එක්තරා මිනිසකු බණවා, 'හෙම්බා පුරුෂය, තෝ යම් විටෙක දෙව සක්විති රුවන තුබු තැනින් ඉවත් වැ සිටියා, තුබු තැනින් පහ වැ සිටියා දුටුයෙහි වී නම්, එවිට මට දන්වව'යි කී ය. 'එසේ ය, දේවයිනි යි, එ රජුහු බස මුදුනින් පිළිගත. මහණෙනි, හේ පුරිස් තෙම බොහෝ හවුරුදු ගණනක්, බොහෝ හවුරුදු සිය ගණනක්, බොහෝ හවුරුදු දහස් ගණනක් ඇවෑමෙන් දෙව සක්රුවන තුබු තැනින් ඉවත් වූවා, පහ වැ සිටියා දිටී ය. දැක, සක්විති රජු කරා එළැඹ, 'දේවයිනි, දැනගන්න, ඔබ ගේ දෙව සක්රුවන ඉවත් විය, තුබු තැනින් පහ වියැ'යි සැළ කෙළේ ය.

7. අථ ඛො භික්ඛවෙ රාජා චක්කවත්ති ජෙට්ඨපුත්තං කුමාරං ආමන්තෙත්වා එතදවොච: "දිබ්බං කිර මෙ තාත කුමාර චක්කරතනං ඔසක්කිතං ඨානා චුතං. සුතං ඛො පන මෙ තං යස්ස රඤ්ඤො චක්කවත්තිස්ස දිබ්බං චක්කරතනං ඔසක්කති ඨානා චවති, න'දානි තෙන රඤ්ඤා චිරං ජීවිතබ්බං හොතී'ති. භුත්තා ඛො පන මෙ මානුසිකා කාමා, සමයො'දානි මෙ දිබ්බෙ කාමෙ පරියෙසිතුං. එහි ත්වං තාත කුමාර, ඉමං සමුද්දපරියන්තං පඨවිං පටිපජ්ජ, අහං පන කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමී"ති. අථ ඛො භික්ඛවෙ රාජා චක්කවත්ති ජෙට්ඨපුත්තං කුමාරං සාධුකං රජ්ජෙ සමනුසාසිත්වා, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි. සත්තාහපබ්බජිතෙ ඛො පන භික්ඛවෙ රාජිසිම්හි දිබ්බං චක්කරතනං අන්තරධායි. අථ ඛො භික්ඛවෙ අඤ්ඤතරො පුරිසො -පෙ- අන්තරහිතන්ති. අථ ඛො භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො දිබ්බෙ චක්කරතනෙ අන්තරහිතෙ අනත්තමනො අහොසි, අනත්තමනතඤ්ච පටිසංවෙදෙසි. නො ච ඛො රාජිසිං උපසඞ්කමිත්වා අරියං චක්කවත්තිවත්තං පුච්ඡි. සො සමතෙනෙව සුදං ජනපදං පසාසති. තස්ස සමතෙන ජනපදං පසාසතො පුබ්බෙනාපරං ජනපදා න පබ්බන්ති යථා තං පුබ්බකානං රාජූනං අරියෙ චක්කවත්තිවත්තෙ වත්තමානානං.

8. අථ ඛො භික්ඛවෙ අමච්චා පාරිසජ්ජා ගණකා මහාමත්තා අනීකට්ඨා දොවාරිකා මන්තස්සාජීවිනො සන්නිපතිත්වා රාජානං ඛත්තියං මුද්ධාභිසිත්තං උපසඞ්කමිත්වා එතදවොචුං: "න ඛො තෙ දෙව සමතෙන සුදං ජනපදං පසාසතො පුබ්බෙනාපරං ජනපදා පබ්බන්ති යථා තං පුබ්බකානං රාජූනං අරියෙ චක්කවත්තිවත්තෙ වත්තමානානං. සංවිජ්ජන්ති ඛො තෙ දෙව විජිතෙ අමච්චා පාරිසජ්ජා ගණකා මහාමත්තා අනීකට්ඨා දොවාරිකා මන්තස්සාජීවිනො, මයඤ්චෙව අඤ්ඤෙ ච, යෙ මයං අරියං චක්කවත්තිවත්තං ධාරෙම. ඉඞ්ඝ ත්වං දෙව අම්හෙ අරියං චක්කවත්තිවත්තං පුච්ඡ, තස්ස තෙ මයං අරියං චක්කවත්තිවත්තං පුට්ඨා බ්‍යාකරිස්සාමා"ති.

### ආයුවණ්ණාදිපරිහාණිකථා

අථ ඛො භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො අමච්චෙ පාරිසජ්ජෙ ගණකෙ මහාමත්තෙ අනීකට්ඨෙ දොවාරිකෙ මන්තස්සාජීවිනො සන්නිපාතාපෙත්වා අරියං චක්කවත්තිවත්තං පුච්ඡි.

7. මහණෙනි, එ කලැ සක්විති රජ තෙම දෙටුපුත් කුමරහු බණවා, 'දරුව, මගේ දෙව් සක්රුවන ඉවත් වී ල, තුබූ තැනින් පහ වී ල. යම් සක්විති රජක්හුගේ දෙව් සක්රුවන ඉවත් වේ ද, තුබූ තැනින් පහ වේ ද, දූන් එ සක්විති රජුහු විසින් බොහෝ කල් ජීවත් වියැ හැකි නො වේ' යැ යි මෙය මා විසින් අසන ලද. මිනිසුන් විසින් වින්දයුතු කාමයෝ මා විසින් විඳුනා ලදහ. දූන් දෙව් කම් සැපත් සොයන්නට කල් පැමිණියේ වෙයි. දරුව, කුමාරය, මෙහි එව. මේ මුහුදුහිම් පොළොව තෝ අනුභව කරව. මම් වනාහි කෙහෙ රවුලු බහවා, කසාවත් හැඳ, ගිහි ගෙන් පැවිදි බිමට වදනෙමි' යි කී ය. මහණෙනි, ඉක්බිති සක්විති රජ තෙම දෙටුපුත් කුමරහට රජයෙහි මොනවට අනුසැස, කෙහෙ රවුලු බහවා, කසාවත් හැඳ, ගිහි ගෙන් නික්මැ පැවිදි බිම් වනි. මහණෙනි, ඒ රාජර්ෂිහු පැවිදි වැ සතියක් ගිය කලැ දෙව් සක්රුවන අතුරුදහන් විය. මහණෙනි, එ කල්හි එක්තරා පුරුෂයෙක්...දෙව් සක්රුවන අතුරුදහන් වී යැ'යි රජහට දන්වී ය. මහණෙනි, ඉක්බිති මුදුනැ අබිසෙස් ලත් එ කැත් රජ තෙම දෙව් සක්රුවන අතුරුදහන් වූ කල්හි නො සතුටු විය. නො සතුටු බව පළ කෙළේ ය. එහෙත් රාජර්ෂිහු කරා එළැඹ අරි සක්විතිවත් නො විචාළේ ය. හේ සිය මතයෙන් ම රට පාලනය කෙරෙයි. සිය මතයෙන් ම රට පාලනය කරන ඔහු ගේ දනවුහු පසු කලැ අරි සක්විති වත්හි පවත්නා පෙරසිටි රජුන් ගේ දනවු සෙයින් නො වැඩෙත්.

8. මහණෙනි, එ කල්හි ඇමැතියෝ ද රාජපර්ෂද්හි වූවෝ ද ගණකයෝ ද මහාමාත්‍රයෝ ද බල ඇණිහි සිටුනා හස්ත්‍යාචාර්යාදිහු ද දෙරටුපල්හු ද මන්ත්‍රාජීවිහු (උපදෙස් දෙන්නෝ) ද එක් රැස් ව මූර්ධාභිෂික්ත කැත් රජුහු කරා එළැඹ "දේවයිනි, සවමතයෙන් රට පාලනය කරන ඔබගේ දනුවුහු පෙර සිටි අරි සක්විති වත්හි පැවැති රජුන් ගේ දනවු සෙයින් නො වැඩෙත්. දේවයිනි, යම් බඳු වූ අපිත් අන්‍යයෝත් අරි සක්විති වත් සිත්හිලා දරමෝ ද, එසේ වූ ඇමතියෝ ද රාජපර්ෂදට අයත්හු ද ගණකයෝ ද මහාමාත්‍රයෝ ද අනීකස්ථයෝ ද මන්ත්‍රාජීවිහු ද ඔබ රටැ ඇත්හ. එබැවින් දේවයිනි, ඔබ අරි සක්විතිවත් අප විචාරන්න. ඔබ විසින් අරි සක්විති වත් විචාරනු ලැබූ අපි ඔබට එය පවසන්නමෝ වේ ද" යි කීහ.

## ආයුෂ පිරිහීම පිළිබඳ කථා

මහණෙනි, ඉක්බිත්තෙන් ඒ මූර්ධාභිෂික්ත කැත් රජ ඇමතියන් ද රාජපර්ෂදෙහි වූවන් ද ගණකයන් ද මහාමාත්‍රයන් ද අනීකස්ථයන් ද ද්වාරපාලයන් ද මන්ත්‍රාජීවින් ද රැස් කරවා, අරි සක්විති වත් විචාළේ ය.

තස්ස තෙ අරියං චක්කවත්තිවත්තං පුට්ඨා ව්‍යාකරිංසු. තෙසං සුත්වා ධම්මිකං හි බො රක්ඛාවරණගුත්තිං සංවිදහි. නො ච බො අධනානං ධනමනුප්පාදසි[1] අධනානං ධනෙ අනනුප්පදීයමානෙ දළිද්දියං[2] වෙපුල්ලමගමාසි. දළිද්දියෙ වෙපුල්ලං ගතෙ අඤ්ඤතරො පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියි. තමෙනං අග්ගහෙසුං ගහෙත්වා රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස දස්සෙසුං අයං දෙව පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී'ති. එවං වුත්තෙ භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො තං පුරිසං එතදවොච: "සච්චං කිර ත්වං අම්භො පුරිස පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී?[3]"ති. "සච්චං දෙවා"ති. "කිං කාරණා?"ති. "න හි දෙව ජීවාමී"ති.

9. අථ බො භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො තස්ස පුරිසස්ස ධනමනුප්පාදසි "ඉමිනා ත්වං අම්භො පුරිස ධනෙන අත්තනා ච ජීවාහි, මාතාපිතරො ච පොසෙහි, පුත්තදාරඤ්ච පොසෙහි, කම්මන්තෙ ච පයොජෙහි, සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨපෙහි[4] සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකන්ති". "එවං දෙවා"ති බො භික්ඛවෙ සො පුරිසො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස පච්චස්සොසි. අඤ්ඤතරො පි බො භික්ඛවෙ පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියි. තමෙනං අග්ගහෙසුං ගහෙත්වා රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස දස්සෙසුං "අයං දෙව පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී"ති. එවං වුත්තෙ භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො තං පුරිසං එතදවොච: "සච්චං කිර ත්වං අම්භො පුරිස පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී"ති. "සච්චං දෙවා"ති. "කිං කාරණා?"ති. "නහි දෙව ජීවාමී"ති. අථ බො භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො තස්ස පුරිසස්ස ධනමනුප්පාදසි "ඉමිනා ත්වං අම්භො පුරිස ධනෙන අත්තනා ච ජීවාහි, මාතාපිතරො ච පොසෙහි, පුත්තදාරඤ්ච පොසෙහි, කම්මන්තෙ ච පයොජෙහි, සමණබ්‍රාහ්මණෙසු[5] උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨපෙහි, සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකන්ති'. "එවං දෙවා"ති බො භික්ඛවෙ සො පුරිසො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස පච්චස්සොසි.

අස්සොසුං බො භික්ඛවෙ මනුස්සා: යෙ කිර භො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියන්ති, තෙසං රාජා ධනමනුප්පදෙති[6]'ති. සුත්වාන තෙසං එතදහොසි "යන්නූන මයම්පි පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියෙය්‍යාමා"ති.

---

1. ධනමනුප්පදසි (මජසං)
2. දලිද්දියං. PTL දලිද්දියං (සයා)
3. ආදියයි (සයා)
4. පතිට්ඨාපෙසි (මජසං)
5. සමණෙසු බ්‍රාහ්මණෙසු (බහුසු)
6. ධනමනුප්පදෙයි (PTS)

එ රජ්ජුරු විසින් අපි සක්විති වත් පුළුවුස්නා ලද ඔහු ඔහුට එය පැවැසූහ. හෙ තෙමෙ ඔවුන් කී බස් අසා දැහැමි රකවළ යෙදී ය. වැලි දිළින්දනට ධනය නො දුන්නේය. දිළින්දනට ධනය නො දෙනු ලබන කල්හි දිළිඳු බව විපුලත්වයට පැමිණියේ ය. දිළිඳු බව මහත් වැ ගිය කල්හි එක්තරා මිනිසෙක් අනුන් සතු නොදුන් දයක් සොර සිතින් ගත්තේ ය. මිනිස්සු ඔහු අල්ලා ගත්හ. අල්ලා ගෙන මුදුනැ අබිසෙස් ලත් ඒ කැත් රජහට 'දේවයිනි, මෙ පුරිස් තෙම මෙර මා සතු නො දුන් දයක් සොර සිතින් ගත්තේ යැ'යි දැක්වූ හ. මහණෙනි, මෙසේ ඔවුන් කී කලැ, මූර්ධාභිෂික්ත ඒ කැත් රජ 'එම්බා පුරුෂය, සැබෑ ද? තෝ මෙරමා සතු දයක් සොර සිතින් ගත්තෙහි ද?' යි පුළුවුත. 'සැබැව, දේවයිනි'යි හේ කිව. 'කවර හෙයිනැ?'යි රජ පුළුවුත. "දෙවයිනි, දිවි රකිනු නො හැක්කෙමි'යි හේ කිව.

9. මහණෙනි, එක ලැ ඒ මූර්ධාභිෂික්ත කැත් රජ 'එම්බා පුරුෂය, තෝ මේ ධනයෙන් තෙමේ ද ජීවත්වව මා පියන් ද පෝෂිත කරව, අඹු දරුවන් ද පෝෂිත කරව, කර්මාන්ත ද යොදව, මහණුන් කෙරෙහි බමුණන් කෙරෙහි සඟසුවට හිත වූ, සැප විපාක දෙන, සුගතිය පිණිස පවත්නා, මතු මතු බිම්හි පල දෙන දක්ෂිණාව පිහිටුවව'යි කියා, ඒ පුරුෂයාට ධනය දුන්නේ ය. මහණෙනි "එසේ ය, දේවයිනි'යි කියා ම ඒ පුරුෂ තෙම ඒ මූර්ධාභිෂික්ත කැත් රජ්ජුරු බස මුදුනින් පිළිගත්තේ ය. මහණෙනි, අන් එක්තරා පුරුෂයෙක් ද මෙරමා සතු නොදුන් දැ සොර සිතින් ගත්තේ ය. මිනිස්සු ඔහු අල්ලා ගත්හ. අල්ලාගෙන මූර්ධාභිෂික්ත කැත් රජහට 'දේවයිනි, මේ පුරිස් මෙරමා සතු නොදුන් දැ සොර සිතින් ගතැ'යි දැක්වූහ. මෙසේ කී කලැ එ රජ 'එම්බා පුරිස, තෝ මෙරමා සතු දැ සොර සිතින් ගතුයෙහි සැබෑ දැ?යි විචාළේ ය. 'සැබැව දේවයිනි'යි හේ කිව. 'කවර හෙයිනැ?'යි රජ විචාළේ ය. 'දේවයිනි, දිවි පවත්වනු නො හැක්කෙමි'යි හේ කිව. මහණෙනි, එ කලැ එ රජ 'එම්බා පුරිස, මේ ධනයෙන් තෝ තෙමේත් යැපෙව, මා පියන් ද පෝෂිත කරව, අඹු දරුවන් ද පෝෂිත කරව, කර්මාන්ත ද යොදව, මහණ බමුණන් කෙරෙහි මතු මත්තෙහි පල දෙන, සුගතියට හිත වූ, සග සුව පිණිස පවත්නා දක්ෂිණාව පිහිටුවව, (දන් දෙව)' යි ඒ මිනිසාට ධනය දුන්නේ ය. 'එසේ ය, දේවයිනි'යි කියා ම හේ පුරිස් තෙම එ රජු බස මුදුනෙන් පිළිගත.

'භවත්නි, යම් කෙනෙක් මෙරමා සතු ධනය සොරා ගනිත් ද, ඔවුනට රජ තෙම ධනය දෙන්නේ යැ' යි මිනිස්සු ඇසූහ. ඇසීමෙන්, ඔවුනට අපිත් මෙරමා සතු දැ සොරා ගනුමෝ නම් යෙහෙකැ'යි මේ සිත විය.

අථ ඛො භික්ඛවෙ අඤ්ඤතරො පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියි. තමෙනං අග්ගහෙසුං ගහෙත්වා රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස දස්සෙසුං "අයං දෙව පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී"ති.

එවං වුත්තෙ භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො තං පුරිසං එතදවොච: "සච්චං කිර ත්වං අම්භො පුරිස පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී"ති. "සච්චං දෙවා"ති. "කිං කාරණා?"ති. "න හි දෙව ජීවාමී"ති. අථ ඛො භික්ඛවෙ රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස එතදහොසි: "සචෙ ඛො අහං යො යො පි පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියිස්සති, තස්ස තස්ස ධනමනුප්පදස්සාමි, එවමිදං අදින්නාදානං පවඩ්ඪිස්සති. යන්නූනාහං ඉමං පුරිසං සුනිසෙධං නිසෙධෙය්‍යං මූලඡෙජ්ජං[1] කරෙය්‍යං, සීසමස්ස ඡින්දෙය්‍ය"න්ති.

10. අථ ඛො භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො පුරිසෙ ආණාපෙසි: "තෙන හි භණෙ ඉමං පුරිසං දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා, ඛරස්සරෙන පණවෙන රථියා රථිං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සුනිසෙධං නිසෙධෙථ, මූලඡෙජ්ජං කරොථ, සීසමස්ස ඡින්දථා"ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ තෙ පුරිසා රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස පටිස්සුත්වා තං පුරිසං දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං[2] ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා, ඛරස්සරෙන පණවෙන රථියා[4] රථිං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා, දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා,[5] දක්ඛිණතො නගරස්ස සුනිසෙධං නිසෙධෙසුං මූලඡෙජ්ජං අකංසු, සීසමස්ස ඡින්දිංසු. අස්සොසුං ඛො භික්ඛවෙ මනුස්සා, "යෙ කිර භො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියන්ති, තෙ රාජා සුනිසෙධං නිසෙධෙති, මූලඡෙජ්ජං කරොති, සීසානි තෙසං ඡින්දතී"ති. සුත්වාන තෙසං එතදහොසි: යන්නූන මයම්පි තිණ්හානි සත්ථානි කාරාපෙස්සාම[6] තිණ්හානි සත්ථානි කාරාපෙත්වා යෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියිස්සාම, තෙ සුනිසෙධං නිසෙධෙස්සාම, මූලඡෙජ්ජං කරිස්සාම, සීසානි තෙසං ඡින්දිස්සාමා"ති. තෙ තිණ්හානි සත්ථානි කාරාපෙසුං, තිණ්හානි සත්ථානි කාරාපෙත්වා ගාමඝාතම්පි උපක්කමිංසු කාතුං, නිගමඝාතම්පි උපක්කමිංසු කාතුං, නගරඝාතම්පි උපක්කමිංසු කාතුං, පන්ථදුහනම්පි[3] උපක්කමිංසු කාතුං. යෙසං තෙ අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියන්ති, තෙ සුනිසෙධං නිසෙධෙන්ති, මූලඡෙජ්ජං කරොන්ති, සීසානි තෙසං ඡින්දන්ති. ඉති ඛො භික්ඛවෙ අධනානං ධනෙ අනනුප්පදියමානෙ දළිද්දියං වෙපුල්ලමගමාසි. දළිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි, අදින්නාදානෙ වෙපුල්ලං ගතෙ සත්ථං වෙපුල්ලමගමාසි. සත්ථෙ වෙපුල්ලං ගතෙ පාණාතිපාතො වෙපුල්ලමගමාසි. පාණාතිපාතෙ වෙපුල්ලං ගතෙ තෙසං සත්තානං ආයු පි පරිහායි, වණ්ණො පි පරිහායි, තෙසං ආයුනාපි පරිහායමානානං වණ්ණෙනාපි පරිහායමානානං අසීතිවස්සසහස්සායුකානං මනුස්සානං පුත්තා චත්තාරීසං වස්සසහස්සායුකා අහෙසුං.

---

1. මූලඝච්චං (මජසං)
2. පච්ඡාබාහුං (ස්‍යා)
3. පන්ථදුහනම්පි (මජසං)
4. රථියාය රථියං (ස්‍යා)
5. නික්ඛමිත්වා (සිමු. මජසං, PTS)
6. කාරාපෙය්‍යාම (ස්‍යා)

මහණෙනි, එ කල්හි එක්තරා පුරුෂයෙක් මෙරමා සතු දයක් සොරා ගත්තේ ය. මිනිස්සු ඔහු අල්ලා ගත්හ. අල්ලා ගෙන 'දේවයිනි, මෙ පුරිස් තෙම මෙරමා සතු දැ සොර සිතින් ගත්තේ යැ' යි රජුහට දක්වි ය.

'සැබෑ ද? තෝ මෙරමා දය සොරා ගත්තෙහි ද?'යි රජ පුළුවුත. 'එසේ යැ දේවයිනි'යි හේ කී ය. 'කවරහෙයින් ද?'යි රජ පුළුවත. 'දේවයිනි, දිවි පැවැත්විය නො හැක්කෙමි. එ හෙයිනැ' යි හේ කිව. එ විට 'මෙරමා සතු දය සොරා ගන්නා ගන්නා හැම එකකුට ම මම ධනය දෙන්නෙම් විම නම් මෙසේ මෙ නොදුන් දැ සොරා ගැන්ම වැඩෙන්නේ ය. මේ මිනිසා යලි අයිනාදන් නො කළ හැකි වන සේ කළෙම් නම්, මුලින් ම සිඳැලූයෙම් නම්, මොහු ගේ හිස සිඳලූයෙම් නම් යෙහෙකැ'යි එ රජහට මෙ සිත විය.

10. මහණෙනි, ඉක්බිත්තෙන් ඒ මූර්ධාභිෂික්ත ක්ෂත්‍රිය රාජ තෙම 'සගයෙනි, එසේ වී නම්, තෙපි මේ මිනිසා දඩි රැහැනින් දෙ අත් පිටට කොට තරයේ බැඳ, කරයෙන් හිස මුඩු කොට, රළු හඬ ඇති පණා බෙර හඬින් යුක්ත කොට වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට ගෙන ගොස්, දකුණු දෙරින් නික්මවා, නුවරට දකුණු දික්හි දී යලි වරද නො කළ හැකි සේ කරවු, මුලින් ම සිඳිම කරවු, මොහු හිස සිඳිවු' යැ යි ඇණැවී ය. මහණෙනි, ඒ පුරුෂයෝ 'එසේ ය, දේවයිනි'යි කියා ම එ රජු බස මුදුනින් පිළිගෙන, ඒ මිනිසා දැඩි රැහැනින් දෙහොත් පිටට කොට තරයේ බැඳ කරයෙන් හිස මුඩු කොට, රළු හඬ ඇති පණාබෙරින් යුක්ත කොට, වීථියෙන් වීථියට, මංහන්දියෙන් මංහන්දියට පමුණුවා, දකුණු දෙරින් නික්මවා, නුව රට දකුණු දිගැදී යළි වරදක් නො කළ හැකියකු කළහ, ඔහු මුලින් සිඳැලූහ, ඔහු හිස සිඳැලූහ. මහණෙනි, 'යම් කෙනෙක් මෙරමා සතු නොදුන් දැ ගනිත් නම්, රජ්ජුහු ඔවුන් යලි එ බඳු වරදක් නො කළ හැකි වන සේ කරති යි, ඔවුන් මුල් සිඳුමෙන් සිඳිති යි, ඔවුන් හිස සිඳලති'යි මිනිස්සු ඇසූහ. ඇසීමෙන් ඔවුනට අපිත් තියුණු ආයුධ කරවන්නමෝ නම්, තියුණු ආයුධ කරවා, යම් කෙනකුන් සතු නොදුන් දැ, ගනුමෝ නම්, ඔවුන් දිවි තොර කරන්නමෝ නම්, මුලින් සිඳලන්නමෝ නම්, ඔවුන් හිස් සිඳ ලන්නමෝ නම් මැනැවැ'යි මේ සිත විය. ඔහු තියුණු අවි කැරවූහ. තියුණු අවි කරවා, ගම් වොලෝ ගන්නට ද පටන් ගත්හ, නියම්ගම් වොලෝ ගන්නට ද පටන් ගත්හ. නුවරවල් වොලෝ ගන්නට ද පටන්ගත්හ. මං පැහැරීම කරන්නට ද පටන්ගත්හ. ඔහු යම් කෙනෙකුන් සතු දැ සොරා ගනිත් ද, ඔවුන් දිවි තොර කෙරෙත්, මුලින් සිඳීම කෙරෙත්, ඔවුන් හිස් සිඳිත්. මහණෙනි, මෙසේ දිළින්දනට ධනය දෙනු නො ලබන කල්හි දිළිඳු බව වැඩීමට ගියේ ය. දිළිඳු බව වැඩීමට ගිය කල්හි නොදුන් දැ සොරා ගැන්ම වැඩීමට ගියේ ය. නොදුන් දැ සොරා ගැන්ම වැඩීමට ගිය කල අවි දැරීම වැඩීමට ගියේ ය. අවි දැරීම වැඩීමට ගිය කල්හි ප්‍රාණඝාතය වැඩීමට ගියේ ය. ප්‍රාණඝාතය වැඩීමට ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂ ද පිරිහිණ, වර්ණය ද පිරිහිණ. අසූදහසක් හවුරුදු ආයුෂ ඇති, ආයුෂයෙන් ද පිරිහෙන, වර්ණයෙන් ද පිරිහෙන මිනිසුන් ගේ දරුවෝ හවුරුදු සතළිස් දහසක් ආයුෂ ඇත්තෝ වූහ.

11. චත්තාරීසංවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු අඤ්ඤතරො පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියි. තමෙනං අග්ගහෙසුං, ගහෙත්වා රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස දස්සෙසුං "අය දෙව පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී"ති. එවං වුත්තෙ භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො තං පුරිසං එතදවොච; "සච්චං කිර ත්වං අම්භො පුරිස පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියි?"ති. "න හි දෙවා"ති සම්පජානමුසා අභාසි. ඉති ඛො භික්ඛවෙ අධනානං ධනෙ අනනුප්පදීයමානෙ දළිද්දියං වෙපුල්ලමගමාසි. දළිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි. අදින්නාදානෙ වෙපුල්ලං ගතෙ සත්ථං වෙපුල්ලමගමාසි. සත්ථෙ වෙපුල්ලං ගතෙ පාණාතිපාතො වෙපුල්ලමගමාසි. පාණාතිපාතෙ වෙපුල්ලං ගතෙ මුසාවාදො වෙපුල්ලමගමායි මුසාවාදෙ වෙපුල්ලං ගතෙ තෙසං සත්තානං ආයු පි පරිහායි, වණ්ණො පි පරිහායි, තෙසං ආයුනා පි පරිහායමානානං වණ්ණෙන පි පරිහායමානානං චත්තාරීසවස්සසහස්සායුකානං මනුස්සානං වීසතිවස්සසහස්සායුකා පුත්තා අහෙසුං. වීසතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු අඤ්ඤතරො පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියි. තමෙනං අඤ්ඤතරො පුරිසො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස ආරොචෙසි: "ඉත්ථන්නාමො දෙව පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියී"ති පෙසුඤ්ඤමකාසි. ඉති ඛො භික්ඛවෙ අධනානං ධනෙ අනනුප්පදීයමානෙ දළිද්දියං වෙපුල්ලමගමාසි. දළිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි. අදින්නාදානෙ වෙපුල්ලං ගතෙ සත්ථං වෙපුල්ලමගමාසි. සත්ථෙ වෙපුල්ලං ගතෙ පාණාතිපාතො වෙපුල්ලමගමාසි. පාණාතිපාතෙ වෙපුල්ලං ගතෙ මුසාවාදො වෙපුල්ලමගමාසි. මුසාවාදෙ වෙපුල්ලං ගතෙ පිසුණා වාචා වෙපුල්ලමගමාසි. පිසුණාය වාචාය වෙපුල්ලං ගතාය තෙසං සත්තානං ආයු පි පරිහායි වණ්ණො පි පරිහායි තෙසං ආයුනා පි පරිහායමානානං වණ්ණෙන පි පරිහායමානානං වීසතිවස්සසහස්සායුකානං මනුස්සානං දසවස්සසහස්සායුකා පුත්තා අහෙසුං.

12. දසවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු එකිදං සත්තා වණ්ණවන්තො හොන්ති, එකිදං සත්තා දුබ්බණ්ණා. තත්ථ යෙ තෙ සත්තා දුබ්බණ්ණා තෙ වණ්ණවන්තෙ සත්තෙ අභිජ්ඣායන්තා පරෙසං දාරෙසු චාරිත්තං ආපජ්ජිංසු. ඉති ඛො භික්ඛවෙ අධනානං ධනෙ අනනුප්පදීයමානෙ දළිද්දියං වෙපුල්ලමගමාසි, දළිද්දියෙ වෙපුල්ලං ගතෙ -පෙ- කාමෙසු මිච්ඡාචාරො වෙපුල්ලමගමාසි, කාමෙසු මිච්ඡාචාරෙ වෙපුල්ලං ගතෙ තෙසං සත්තානං ආයු පි පරිහායි වණ්ණො පි පරිහායි. තෙසං ආයුනා පි පරිහායමානානං වණ්ණෙන පි පරිහායමානානං දසවස්සසහස්සායුකානං මනුස්සානං පඤ්චවස්සසහස්සායුකා පුත්තා අහෙසුං.

1. වණ්ණවන්තා. (ස්‍යා)

11. මහණෙනි, සතළිස් දහසක් හවුරුදු ආයු ඇති මිනිසුන් අතුරෙහි එක්තරා පුරුෂයෙක් අනුන් සතු නොදුන් දයක් සොරා ගත්තේ ය. මිනිස්සු ඔහු අල්ලා ගත්හ. අල්ලා ගෙන මූර්ධාභිෂික්ත කැත් රජහට 'දේවයිනි, මේ පුරිස් තෙම මෙරමා සතු දෑ සොරා ගත්තේ' යැ යි දැක්වූහ. මහණෙනි, ඔවුන් එසේ කී කල්හි එ රජ 'එම්බා පුරිස, තෝ මෙරමා සතු දෑ සොරා ගත්තෙහි ද? ඒ සැබෑ ද?'යි පුළුවුත. 'දේවයිනි, නැතැ'යි (සොරා නො ගතිමියි) ෂේ දූත බොරු කියේ ය. මහණෙනි, මෙසේ දිළිත්දනාට ධනය නොදෙනු ලබන කලැ අයිනාදන් වැඩීමට ගියේ ය. අයිනාදන වැඩීමට ගිය කලැ අවි දැරීම වැඩීමට ගියේ ය. අවි දැරීම වැඩීමට ගිය කලැ ප්‍රාණවධය වැඩීමට ගියේ ය. ප්‍රාණවධය වැඩීමට ගිය කලැ බොරුකීම වැඩීමට ගියේ ය. බොරුකීම වැඩීමට ගිය කලැ ඒ සත්වයන්ගේ ආයුෂ ද පිරිහිණ, වර්ණය ද පිරිහිණ. ආයුෂයෙන් ද පිරිහෙන, වර්ණයෙන් ද පිරිහෙන සතලිස්දහසක් හවුරුදු පරමායු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ විසිදහස් හවුරුදු ආයු ඇත්තෝ වූහ. මහණෙනි, විසිදහස් හවුරුදු ආයු ඇති ඒ මිනිසුන් අතුරෙහි එක්තරා මිනිසෙක් අනුන් සතු නොදුන් දයක් සොරා ගත්තේ ය. එක්තරා පුරුෂයෙක් රජුහට 'දේවයිනි, මෙ නම් පුරුෂයා මෙරමා සතු දැ සොරා ගත්තේ යැ'යි ඔහු ඇරබැ කේලාම් කී ය. මහණෙනි, මෙසේ දිළිත්දනාට ධනය නො දෙනු ලබන කල්හි දිළිඳු බව වැඩීමට ගියේ ය. දිළිඳු බව වැඩීමට ගිය කලැ අයිනාදන් වැඩීමට ගියේ ය. අයිනාදන් වැඩීමට ගිය කලැ අවි දැරීම වැඩීමට ගියේ ය. අවි දැරීම වැඩීමට ගිය කලැ ප්‍රාණවධය වැඩීමට ගියේ ය. ප්‍රාණවධය වැඩීමට ගිය කලැ මුසාවාදය වැඩීමට ගියේ ය. මුසාවාදය වැඩීමට ගිය කලැ කේලාම් කීම වැඩීමට ගියේ ය. කේලාම් කීම වැඩීමට ගිය කලැ ඒ සතුන් ගේ ආයුෂ ද පිරිහිණ, වර්ණය ද පිරිහිණ. ආයුෂයෙන් ද පිරිහෙන වර්ණයෙන් ද පිරිහෙන හවුරුදු විසිදහසක් ආයු ඇති ඒ මිනිසුන් ගේ දරුවෝ අවුරුදු දසදහසකට ආයු ඇත්තෝ වූහ.

12. මහණෙනි, අවුරුදු දස දහසක් ආයු ඇති මිනිසුන් අතුරෙහි ඇතැම් සත්හු වර්ණවත් වෙත්, ඇතැම් කෙනෙක් දුර්වර්ණ වෙත්,

ඔවුන් අතුරෙන් යම් සත්ව කෙනෙක් දුර්වර්ණ ද, ඔහු වර්ණවත් සත්වයන් දෙස සරාග සිතින් බලන්නාහු, ඒ මෙරමා අඹුවන් කෙරෙහි වරදවා හැසිරෙන බවට පැමිණියහ. මහණෙනි, මෙසේ දිළිත්දනාට ධනය නො දෙනු ලබන කල්හි දිළිඳු බව වැඩීමට පැමිණියේ ය. දිළිඳු බව වැඩීමට පැමිණි කල්හි ... කාමයන්හි වරදවා හැසිරීම වැඩීමට ගියේ ය. කාමයන්හි වරදවා හැසිරීම වැඩීමට ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂ ද පිරිහිණ, වර්ණය ද පිරිහිණ. ආයුෂයෙන් ද පිරිහෙන, වර්ණයෙන් ද පිරිහෙන හවුරුදු දස දහසක් ආයු ඇති මිනිසුන්ගේ දරුවෝ හවුරුදු පත්දහසක් ආයු ඇත්තෝ වූහ.

13. පඤ්චවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු ද්වෙ ධම්මා වෙපුල්ලමගමංසු ඵරුසා වාචා සම්ඵප්පලාපො ච. ද්වීසු ධම්මෙසු වෙපුල්ලං ගතෙසු තෙසං සත්තානං ආයු පි පරිහායි, වණ්ණො පි පරිහායි. තෙසං ආයුනාපි පරිහායමානානං වණ්ණෙන පි පරිහායමානානං පඤ්චවස්ස-සහස්සායුකානං මනුස්සානං අප්පෙකච්චෙ අඩ්ඪතෙය්‍යවස්සසහස්සායුකා අප්පෙකච්චෙ ද්වෙවස්සසහස්සායුකා පුත්තා අහෙසුං. අඩ්ඪතෙය්‍යවස්සසහ-ස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු අභිජ්ඣාව්‍යාපාද[1] වෙපුල්ලමගමංසු. අභිජ්ඣාව්‍යාපාදෙසු වෙපුල්ලං ගතෙසු තෙසං සත්තානං ආයු පි පරිහායි, වණ්ණො පි පරිහායි. තෙසං ආයුනා පි පරිහායමානානං වණ්ණෙන පි පරිහායමානානං අඩ්ඪතෙය්‍යවස්සසහස්සායුකානං මනුස්සානං වස්සසහස්සා-යුකා පුත්තා අහෙසුං. වස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු මිච්ඡාදිට්ඨි වෙපුල්ලමගමාසි. මිච්ඡාදිට්ඨියා වෙපුල්ලං ගතාය තෙසං සත්තානං ආයු පි පරිහායි, වණ්ණො පි පරිහායි. තෙසං ආයුනා පි පරිහාය මානානං වණ්ණෙ-නපි පරිහායමානානං වස්සසහස්සායුකානං මනුස්සානං පඤ්චවස්සසතායුකා පුත්තා අහෙසුං. පඤ්චවස්සසතායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු තයො ධම්මා වෙපුල්ලමගමංසු අධම්මරාගො විසමලොභො මිච්ඡාධම්මො. තීසු ධම්මෙසු වෙපුල්ලං ගතෙසු තෙසං සත්තානං ආයු පි· පරිහායි, වණ්ණොපි පරිහායි. තෙසං ආයුනා පි පරිහායමානානං වණ්ණෙන පි පරිහායමානානං පඤ්ච වස්සසතායුකානං මනුස්සානං අප්පෙකච්චෙ අඩ්ඪතෙය්‍යවස්සසතායුකා-අප්පෙකච්චෙ ද්වෙවස්සසතායුකා පුත්තා අහෙසුං. අඩ්ඪතෙය්‍යවස්සසතා-යුකෙසු භික්ඛවෙ මනුස්සෙසු ඉමෙ ධම්මා වෙපුල්ලමගමංසු අමත්තෙය්‍යතා අපෙත්තෙය්‍යතා අසාමඤ්ඤතා අබ්‍රහ්මඤ්ඤතා නකුලෙජෙට්ඨාපචායිතා.

14. ඉති ඛො භික්ඛවෙ අධනානං ධනෙ අනනුප්පදීයමානෙ දළිද්දියං වෙපුල්ලමගමාසි, දළිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි. අදින්නාදානෙ වෙපුල්ලං ගතෙ සත්ථං වෙපුල්ලමගමාසි සත්ථෙ වෙපුල්ලං ගතෙ පාණාතිපාතො වෙපුල්ලමගමාසි. පාණාතිපාතෙ වෙපුල්ලං ගතෙ මුසාවාදෙ වෙපුල්ලමගමාසි මුසාවාදෙ වෙපුල්ලං ගතෙ පිසුණා වාචා වෙපුල්ලමගමාසි පිසුණාය වාචාය වෙපුල්ලං ගතාය කාමෙසු මිච්ඡාචාරො වෙපුල්ලමගමාසි කාමෙසු මිච්ඡාචාරෙ වෙපුල්ලං ගතෙ ද්වෙ ධම්මා වෙපුල්ලමගමංසු ඵරුසා වාචා සම්ඵප්පලාපො ච. ද්වීසු ධම්මෙසු වෙපුල්ලං ගතෙසු අභිජ්ඣාව්‍යාපාද' වෙපුල්ලමගමංසු, අභිජ්ඣාව්‍යාපාදෙසු වෙපුල්ලං

1. අභිජ්ඣාවාපාදෙ (PTS)

13. මහණෙනි, පන්දහසක් හවුරුදු ආයු ඇති මිනිසුන් අතුරෙහි පරුෂ වචනය ද සම්ඵප්‍රලාපය ද යන දෙ අකුසල්හු වැඩීමට ගියහ. ඒ දෙ අකුසල් වැඩීමට ගිය කලැ ඒ සත්වයන් ගේ ආයු ද පිරිහිණ, වර්‍ණය ද පිරිහිණ. ආයුෂයෙන් ද පිරිහෙන වර්‍ණයෙන් ද පිරිහෙන, හවුරුදු පන්දහසක් ආයු ඇති මිනිසුන්ගේ ඇතැම් දරුවෝ හවුරුදු දෙදහස් පන්සියක් ද ඇතැම් දරුවෝ හවුරුදු දෙදහසක් ද ආයු ඇත්තෝ වූහ. මහණෙනි, හවුරුදු දෙදහස් පන්සියක් ආයු ඇති මිනිසුන් අතුරෙහි අභිධ්‍යාවත් ව්‍යාපාදයත් යන දෙ අකුසල් දහම්හු වැඩීමට පැමිණියහ. අභිධ්‍යා ව්‍යාපාදයන් වැඩීමට ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයු ද පිරිහිණ, පැහැය ද පිරිහිණ. ආයුෂයෙන් ද වර්‍ණයෙන් ද පිරිහෙන ඒ වර්ෂ දෙදහස් පන්සියක් ආයු ඇති මිනිසුන්ගේ දරුවෝ වර්ෂ දහසක් ආයු ඇත්තෝ වූහ. මහණෙනි, වර්ෂ දහසක් ආයු ඇති මිනිසුන් අතුරෙහි මිථ්‍යා දෘෂ්ටිය වැඩීමට ගියේ ය. මිත්‍යා දෘෂ්ටිය වැඩීමට ගිය කලැ ඒ සතුන් ගේ ආයුෂ ද පිරිහිණ, වර්‍ණය ද පිරිහිණ. ආයුෂයෙන් ද පිරිහෙන, වර්‍ණයෙන් ද පිරිහෙන, වර්ෂ දහසක් ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ හවුරුදු පන්සියක් ආයු ඇත්තෝ වූහ. මහණෙනි, හවුරුදු පන්සියක් ආයු ඇති මිනිසුන් අතුරෙහි අධර්ම රාගය ද විෂම ලෝභය ද මිථ්‍යාධර්මය ද යන තුන් අකුසල ධර්මයෝ වැඩීමට ගියහ. ඒ තුන් අකුශල ධර්මයන් වැඩීමට ගිය කල්හි, ඒ සත්වයන් ගේ ආයුෂ ද පිරිහිණ, වර්‍ණය ද පිරිහිණ. ආයුෂයෙන් ද පිරිහෙන, වර්‍ණයෙන් ද පිරිහෙන පන්සියක් හවුරුදු ආයු ඇති ඒ මිනිසුන් ගේ ඇතැම් දරුවෝ දෙසිය පනසක් හවුරුදු ආයු ඇත්තෝ වූහ. ඇතැම් දරුවෝ දෙසියයක් හවුරුදු ආයු ඇත්තෝ වූහ. මහණෙනි, හවුරුදු දෙසිය පනසක් ආයු ඇති මිනිසුන් කෙරෙහි මවට සත්කාර නො කරන බව, පියාට සත්කාර නො කරන බව, මහණුනට ගරු නො කරන බව, බමුණනට ගරු නො කරන බව, කුලෙහි වැඩි සිටියනට යටත් පැවැතුම් නැති බව යන මේ ලාමක දහම්හු වැඩීමට පැමිණියහ.

14. මහණෙනි, මෙසේ දිළින්දනට ධනය නොදෙනු ලබන කල්හි, දිළිඳු බව වැඩීමට ගියේ ය. දිළිඳු බව වැඩීමට ගිය කල්හි අදත්තාදනය වැඩීමට ගියේ ය. අදත්තාදනය වැඩීමට ගිය කල්හි ආයුධ වැඩීමට ගියේ ය. ආයුධ වැඩීමට ගිය කල්හි ප්‍රාණඝාතය වැඩීමට ගියේ ය. ප්‍රාණඝාතය වැඩීමට ගිය කල්හි මුසාවාදය වැඩීමට ගියේ ය. මුසාවාදය වැඩීමට ගිය කල්හි පිසුණාවාචාව (කේලාම් කීම) වැඩීමට ගියේ ය. පිසුණාවාචාව වැඩීමට ගිය කල්හි කාමමිථ්‍යාචාරය වැඩීමට ගියේ ය. කාමමිථ්‍යාචාරය වැඩීමට ගිය කල්හි පරුෂ වචනයත් සම්ඵප්‍රලාපයත් යන දෙ අකුසල්හු වැඩීමට ගියහ. ඒ දෙ අකුසල් වැඩීමට ගිය කල්හි, අභිධ්‍යාවත් ව්‍යාපාදයත් වැඩීමට ගියහ.

ගතෙසු මිච්ඡාදිට්ඨි වෙපුල්ලමගමාසි මිච්ඡාදිට්ඨියා වෙපුල්ලං ගතාය තයො ධම්මා වෙපුල්ලමගමංසු අධම්මරාගො විසමලොභො මිච්ඡාධම්මො තීසු ධම්මෙසු වෙපුල්ලං ගතෙසු ඉමෙ ධම්මා වෙපුල්ලමගමංසු අමත්තෙය්‍යතා අපෙත්තෙය්‍යතා අසාමඤ්ඤතා අබ්‍රහ්මඤ්ඤතා නකුලෙජෙට්ඨාපචායිතා ඉමෙසු ධම්මෙසු වෙපුල්ලං ගතෙසු තෙසං සත්තානං ආයු පි පරිහායි, වණ්ණොපි පරිහායි තෙසං ආයුනා පි පරිහායමානානං වණ්ණෙන පි පරිහායමානානං අඩ්ඪතෙය්‍යවස්සසතායුකානං මනුස්සානං වස්සසතායුකා පුත්තා අහෙසුං.

## දසවස්සායුකසමයො

15. භවිස්සති භික්ඛවෙ සො සමයො යං ඉමෙසං මනුස්සානං දසවස්සායුකා පුත්තා භවිස්සන්ති. දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු පඤ්චවස්සිකා[1] කුමාරිකා අලම්පතෙය්‍යා භවිස්සන්ති. දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු ඉමානි රසානි අන්තරධායිස්සන්ති, සෙය්‍යථීදං සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං ලොණං. දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු කුද්‍රූසකො අග්ගං භොජනානං[2] භවිස්සති. සෙය්‍යථාපි භික්ඛවෙ එතරහි සාලිමංසොදනො අග්ගං භොජනානං, එවමෙව ඛො භික්ඛවෙ දසවස්සායුකෙසු මනුස්සෙසු කුද්‍රූසකො අග්ගං භොජනානං භවිස්සති. දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු දසකුසලකම්මපථා සබ්බෙන සබ්බං අන්තරධායිස්සන්ති, දසඅකුසලකම්මපථා අතිබ්‍යා[3] දිප්පිස්සන්ති. දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු කුසලන්තිපි න භවිස්සති. කුතො පන කුසලස්ස කාරකො. දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු යෙ තෙ භවිස්සන්ති අමත්තෙය්‍යා අපෙත්තෙය්‍යා අසාමඤ්ඤා අබ්‍රහ්මඤ්ඤා න කුලෙ ජෙට්ඨාපචායිනො, තෙ පුජ්ජා ච[4] භවිස්සන්ති පාසංසා ච. සෙය්‍යථාපි භික්ඛවෙ එතරහි මත්තෙය්‍යා[5] පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො පුජ්ජා ච පාසංසා ච, එවමෙව ඛො භික්ඛවෙ දසවස්සායුකෙසු මනුස්සෙසු යෙ තෙ භවිස්සන්ති අමත්තෙය්‍යා අපෙත්තෙය්‍යා අසාමඤ්ඤා අබ්‍රහ්මඤ්ඤා න කුලෙ ජෙට්ඨාපචායිනො, තෙ පුජ්ජා ච භවිස්සන්ති පාසංසා ච. දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු න භවිස්සති මාතා ති වා මාතුච්ඡා ති වා මාතුලානී ති වා ආචරියභරියා ති වා[6] ගරූනං දාරා[7] ති වා සම්භෙදං ලොකො ගමිස්සති යථා අජෙළකා කුක්කුටසූකරා සොණසිගාලා[8].

1. පඤ්චමාසිකා (කම)
2. අග්ගභොජනං
3. අතිවිය (PTS ස්‍යා)
4. පූජා. (ස්‍යා)
5. මෙත්තෙය්‍යා (PTS)
6. 'පිතා තිවා පිතුච්ඡාති' වා ඉති අධිකො පාඨො ස්‍යාමපොත්ථකෙසු දිස්සති.
7. දරා (සිමු)
8. සොණසිඞ්ගාලා (මජසං)

අභිධ්‍යාව්‍යාපාදයන් වැඩීමට ගිය කල්හි මිථ්‍යාදෘෂ්ටිය වැඩීමට ගියේ ය. මිථ්‍යාදෘෂ්ටිය වැඩීමට ගිය කල්හි අධර්මරාග විෂමලෝභ මිථ්‍යාධර්ම යන තුන් ලාමක ධර්මයෝ වැඩීමට පැමිණියහ. ඒ තුන් දහමුන් වැඩීමට ගිය කල්හි, මවට සත්කාර නොකරන බව, පියාට සත්කාර නොකරන බව, මහණුනට ගරු නො කිරීම, බමුණනට ගරු නො කිරීම, කුලෙහි වැඩි සිටියනට යටත් පැවැතුම නැති බව යන මේ පාපධර්මයෝ වැඩීමට ගියහ. මේ පාපධර්මයන් වැඩීමට ගිය කල්හි, ඒ සත්වයන් ගේ ආයුෂ ද පිරිහිණ, වර්ණය ද පිරිහිණ. ආයුෂයෙන් ද පිරිහෙන, වර්ණයෙන් ද පිරිහෙන හවුරුදු දෙසියපනසක් ආයු ඇති මිනිසුන්ගේ දරුවෝ හවුරුදු සියයක් ආයු ඇත්තෝ වූහ.

15. මහණෙනි, මේ මිනිසුන් ගේ දරුවෝ යම් කලෙක දස හවුරුදු පරමායු ඇත්තෝ වෙත් ද, එසේ වූ කාලයෙක් වන්නේ ය. මහණෙනි, දසවස් ආයු ඇති මිනිසුන් අතුරෙහි, පස් හැවිරිදි කුමරියෝ පතිකුලයට යැමට සුදුසු වන්නාහ. මහණෙනි, දශවර්ෂායුෂ්ක මිනිසුන් අතුරෙහි ගිතෙල් වෙඬරු තලතෙල් මී සකුරු ලුණු යන මේ රසයෝ අතුරුදහන් වන්නාහ. මහණෙනි, දශවර්ෂායුෂ්ක මිනිසුන් අතුරෙහි කුද්‍රූසක ධාන්‍යය (හමු) බොජුන් අතුරෙහි අග්‍ර වන්නේ ය. මහණෙනි, දැන් මස් සහිත හැල් සාල් බත මිනිසුන් ගේ පිළිගැන්ම පරිදි බොජුන් අතුරෙහි අග්‍ර වේ ද, එසේ ම දසවස් ආයු ඇති මිනිසුන් කෙරෙහි කුද්‍රූසක ධාන්‍යය (හමු) බොජුන් අතුරෙන් අග්‍ර වන්නේ ය. මහණෙනි, දස වස් ආයු ඇති මිනිසුන් අතුරෙන් දශකුශල කර්මපථයෝ හැම ලෙසින් ම අතුරු දහන් වන්නාහ. දශ අකුශල කර්මපථයෝ ඉතා ම දීප්ත වන්නාහ. මහණෙනි, දශවර්ෂ යුෂ්ක මිනිසුන් කෙරෙහි කුශල යැ යන නම පවා නො වන්නේ ය. කුසල් කරන්නෙක් කොයින් වේ ද? මහණෙනි, දශවර්ෂායුෂ්ක මිනිසුන් අතුරෙහි යම් කෙනෙක් මවට ගරු නො කරනුවෝ, පියාට ගරු නො කරනුවෝ, මහණුනට ගරු නො කරනුවෝ, බමුණනට ගරු නො කරනුවෝ, කුලෙහි වැඩි සිටියනට යටත් පැවැතුම් නැත්තෝ වෙත් ද, ඔහු පූජ්‍ය ද ප්‍රශංසාර්හ ද වන්නාහ. මහණෙනි, මෙ කලැ මව කෙරෙහි මොනොවට පිළිපදනාහු, පියා කෙරෙහි මොනොවට පිළිපදනාහු, මහණුන් කෙරෙහි මොනොවට පිළිපදනාහු, බමුණන් කෙරෙහි මොනොවට පිළිපදනාහු, කුලයෙහි වැඩි සිටියනට යටත් පැවැතුම් ඇතියාහු යම්සේ පූජ්‍යත් ප්‍රශංසාර්හත් වෙත් ද, මහණෙනි, එ සේ ම දශවර්ෂායුෂ්ක මිනිසුන් අතුරෙහි යම් කෙනෙක් මව කෙරෙහි මොනොවට නො පිළිපදනාහු ද, පියා කෙරෙහි මොනොවට නො පිළිපදනාහු ද, මහණුන් කෙරෙහි මොනොවට නො පිළිපදනාහු ද, බමුණන් කෙරෙහි මොනොවට නො පිළිපදනාහු ද, කුලයෙහි වැඩි සිටියනට යටත් පැවැතුම් නැතියාහු ද, ඔහු පූජ්‍ය ද ප්‍රශංසාර්හ ද වන්නාහ. මහණෙනි, දශවර්ෂායුෂ්ක මිනිසුන් කෙරෙහි මෑණියෝ යැ යි හෝ සුළු මෑණියෝ යි හෝ නැන්දණියෝ යි හෝ ඇදුරු බිරින්දැ යි හෝ සුළු පිය දෙවුපිය ආදින්ගේ බිරියෝ යි කියා හෝ (හැඟීමෙක්) නො වන්නේ ය. එළුවෝ බැටළුවෝ කුකුළෝ හූරෝ බල්ලෝ කැණහිල්ලු යම්සේ ද, එසේ ම ලෝවැසි තෙමෙ (කුලසීමාව බිඳ) මිශ්‍රභාවයට යන්නේ ය. (කුල සිරිත් නොතකා ඔවුන් පාවාගන්නාහ.)

16. දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු තෙසං සත්තානං අඤ්ඤමඤ්ඤම්හි තිබ්බො ආඝාතො පච්චුපට්ඨිතො භවිස්සති, තිබ්බො බ්‍යාපාදො, තිබ්බො මනොපදොසො, තිබ්බං වධකචිත්තං මාතු පි පුත්තම්හි, පුත්තස්ස පි මාතරි, පිතු පි පුත්තම්හි පුත්තස්ස පි පිතරි, භාතු පි භාතරි භාතු පි භගිනියා, භගිනියා පි භාතරි, තිබ්බො ආඝාතො පච්චුපට්ඨිතො භවිස්සති තිබ්බො බ්‍යාපාදො තිබ්බො මනොපදොසො තිබ්බං වධකචිත්තං. සෙය්‍යථාපි භික්ඛවෙ මාගවිකස්ස මිගං දිස්වා තිබ්බො ආඝාතො පච්චුපට්ඨිතො හොති තිබ්බො බ්‍යාපාදො තිබ්බො මනොපදොසො තිබ්බං වධකචිත්තං එවමෙව ඛො භික්ඛවෙ දසවස්සායුකෙසු මනුස්සෙසු තෙසං සත්තානං අඤ්ඤමඤ්ඤම්හි තිබ්බො ආඝාතො පච්චුපට්ඨිතො භවිස්සති තිබ්බො බ්‍යාපාදො තිබ්බො මනොපදොසො තිබ්බං වධකචිත්තං මාතු පි පුත්තම්හි, පුත්තස්ස පි මාතරි, පිතු පි පුත්තම්හි, පුත්තස්ස පි පිතරි, භාතු පි භාතරි, භාතු පි භගිනියා, භගිනියා පි භාතරි, තිබ්බො ආඝාතො පච්චුපට්ඨිතො භවිස්සති, තිබ්බො බ්‍යාපාදො, තිබ්බො මනොපදොසො, තිබ්බං වධකචිත්තං. දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු සත්තාහං සත්ථන්තරකප්පො භවිස්සති. තෙ අඤ්ඤමඤ්ඤම්හි මිගසඤ්ඤං පටිලභිස්සන්ති තෙසං තිණ්හානි සත්ථානි හත්ථෙසු පාතුභවිස්සන්ති. තෙ තිණ්හෙන සත්ථෙන 'එස මිගො එස මිගො'ති අඤ්ඤමඤ්ඤං ජීවිතා වොරොපෙස්සන්ති[1].

## ආයුවණ්ණාදිවඩ්ඪනකථා

17. අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එකච්චානං එවං භවිස්සති, 'මා ච මයං කඤ්චි[2], මා ච අම්හෙ කොචි, යන්නූන මයං තිණගහණං වා වනගහණං වා රුක්ඛගහණං වා නදීවිදුග්ගං වා පබ්බතවිසමං වා පවිසිත්වා වනමූලඵලාහාරා යාපෙය්‍යාමා'ති. තෙ තිණගහණං වා වනගහණං වා රුක්ඛගහණං වා නදීවිදුග්ගං වා පබ්බතවිසමං වා පවිසිත්වා සත්තාහං වනමූලඵලාහාරා යාපෙස්සන්ති[3]. තෙ තස්ස[4] සත්තාහස්ස අච්චයෙන තිණගහණා වනගහණා රුක්ඛගහණා නදීවිදුග්ගා පබ්බතවිසමා නික්ඛමිත්වා අඤ්ඤමඤ්ඤං ආලිඞ්ගිත්වා සභාගායිස්සන්ති සමස්සාසිස්සන්ති 'දිට්ඨා භො සත්ත ජීවසි, දිට්ඨා භො සත්ත ජීවසී'ති. අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො අකුසලානං ධම්මානං සමාදානහෙතු එවරූපං ආයතං ඤාතික්ඛයං පත්තා යන්නූන මයං කුසලං කරෙය්‍යාම.

---

1. වොරොපිස්සන්ති (ස්‍යා)
2. කිඤ්චි (කම්)
3. යාපෙය්‍යන්ති. PTS.
4. තස්ස (සීමු)

16. මහණෙනි, දශවර්ෂායුෂ්ක මිනිසුන් අතුරෙහි, ඒ සත්වයන්ගේ උනුන් කෙරෙහි දැඩි වෛරයෙක්, දැඩි ව්‍යාපාදයෙක්, දැඩි මනඃප්‍රද්වේෂයෙක් දැඩි වධක චිත්තයෙක් එළැඹ සිටියේ වන්නේ ය. පුතු කෙරෙහි මවගේ ද, මව කෙරෙහි පුතුගේ ද, පුතු කෙරෙහි පියාගේ ද, පියා කෙරෙහි පුතුගේ ද, බෑයා කෙරෙහි බෑයාගේ ද, බිහිනිය කෙරෙහි බෑයාගේ ද: බෑයා කෙරෙහි බිහිනියගේ ද, දැඩි ආඝාතයෙක්, දැඩි ව්‍යාපාදයෙක්, දැඩි චිත්ත ප්‍රද්වේෂයෙක්, දැඩි වධක චිත්තයෙක් එළැඹ සිටියේ වන්නේ ය. මහණෙනි, යම්සේ මුවවැද්දකුට මුවකු දක්මෙන් දැඩි ආඝාතයෙක්, දැඩි ද්වේෂයෙක්, දැඩි චිත්ත ප්‍රද්වේෂයෙක්, දැඩි වධක චිත්තයෙක් එළැඹ සිටුනේ වේ ද, මහණෙනි, එසේ ම මිනිසුන් දශවර්ෂායුෂ්ක කල්හි ඒ සත්වයන්ගේ උනුන් කෙරෙහි දැඩි ආඝාතයෙක්, දැඩි ව්‍යාපාදයෙක්, දැඩි චිත්ත ප්‍රද්වේෂයෙක්, දැඩි වධක චිත්තයෙක්, එළැඹ සිටියේ වන්නේ ය. පුතු කෙරෙහි මවගේ ද, මව කෙරෙහි පුතුගේ ද, පුතු කෙරෙහි පියාගේ ද, පියා කෙරෙහි පුතුගේ ද, බෑයා කෙරෙහි බෑයාගේ ද, බිහිනිය කෙරෙහි බෑයාගේ ද, බෑයා කෙරෙහි බිහිනියගේ ද, දැඩි ආඝාතයෙක්, දැඩි ව්‍යාපාදයෙක්, දැඩි චිත්ත ප්‍රද්වේෂයෙක්, දැඩි වධක චිත්තයෙක් එළැඹ සිටියේ වන්නේ ය. මහණෙනි; මිනිසුන් දශවර්ෂායුෂ්ක කල්හි සත් දවසක් ශස්ත්‍රාන්තඃකල්පය වන්නේ ය. ඔහු ඔවුනොවුන් කෙරෙහි මෘගසංඥව (මේ මුවෙකැ යි හැඟීම) ලබන්නාහ. ඔවුන්ගේ අත්හි තියුණු අවි පහළ වන්නේ ය. ඔහු තියුණු අවියෙන් 'මේ මුවෙක, මේ මුවෙකැ' යි ඔවුනොවුන් දිවියෙන් තොර කරන්නාහ.

17. මහණෙනි, එ කල්හි ඒ සතුන් අතුරෙන් ඇතැම් කෙනෙකුට 'අපි කිසිවකුදු දිවියෙන් තොර නො කරමෝ වා, කිසිවෙක් අප ද දිවියෙන් තොර නො කෙරේවා අපි තණගහබුවකට හෝ වනලැහැබකට හෝ රුක්බැද්දකට හෝ අන්තර්දවීපාදි නදීන්ගේ දුර්ගමස්ථානයකට හෝ කඳුවලින් විෂම වූ තැනකට හෝ වැද, වෙනෙහි මුල් පල ආහාර කොටැති වැ යැපෙන්නමෝ නම් යෙහෙකැ'යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු තණගහබුවකට හෝ වනලැහැබකට හෝ රුක්බැද්දකට හෝ නදීවිදුර්ගයකට හෝ පර්වත විෂමයකට හෝ පිවිස සත් දවසක් වනමූලඵල ආහාර කොටැති ව යැපෙන්නාහ. ඔහු එහි සතිය ඇවෑමෙන් තණගහබුවෙන් වනලැහැබෙන් රුක්බැද්දෙන් නදීවිදුර්ගයෙන් පර්වතවිෂමයෙන් නික්ම, උනුන් වැලැඳගෙන, භවත් සත්වය, "පිනෙකි! තව ම ජීවත් වෙහි! වූ සේ යහපති! තව ම ජීවත් වෙහි' යැ යි උනුන් හා සතුටු වන්නාහ, උනුන් අස්වසන්නාහ. මහණෙනි, එ කල්හි ඒ සත්නට, "අපි වනාහි අකුසල් දහම් සමාදන් කොට ගත් හෙයින් මෙබඳු වූ මහත් ඥාතිවිනාශයකට පත්තම්හ. අපි කුසල් කරමෝ නම් යෙහෙක.

කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං පාණාතිපාතා විරමෙය්‍යාම, ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා''ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනා පි වඩ්ඪිස්සන්ති වණ්ණෙන පි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනා පි වඩ්ඪමානානං වණ්ණෙන පි වඩ්ඪමානානං දසවස්සායුකානං මනුස්සානං වීසතිවස්සායුකා පුත්තා භවිස්සන්ති. අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති, ''මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනා පි වඩ්ඪාම, වණ්ණෙන පි වඩ්ඪාම. යන්නූන මයං භිය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං අදින්නාදානා විරමෙය්‍යාම, ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති අදින්නාදානා විරමිස්සන්ති. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනා'පි වඩ්ඪිස්සන්ති, වණ්ණෙනාපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනාපි වඩ්ඪමානානං වීසතිවස්සායුකානං මනුස්සානං චත්තාලීසතිවස්සායුකා පුත්තා භවිස්සන්ති.

අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම, වණ්ණෙනාපි වඩ්ඪාම. යන්නූන මයං භිය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං කාමෙසුමිච්ඡාචාරා විරමෙය්‍යාම, ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති, කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති වණ්ණෙනාපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනාපි වඩ්ඪමානානං චත්තාලීසවස්සායුකානං මනුස්සානං අසීතිවස්සායුකා පුත්තා භවිස්සන්ති.

18. අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම වණ්ණෙනාපි වඩ්ඪාම. යන්නූන මයං භිය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං මුසාවාද විරමෙය්‍යාම, ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති, කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති, මුසාවාද විරමිස්සන්ති. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති වණ්ණෙනාපි වඩ්ඪිස්සන්ති.

කවර කුසලක් කරමෝ ද? අපි ප්‍රාණඝාතයෙන් වළකින්නමෝ නම්, මේ කුසල් දහම සමාදන් කොට ගෙන පවතින්නමෝ නම් යෙහෙකැ'යි මෙසේ සිතෙක් වන්නේ ය. කුසල් දහම් සමාදන් කොට ගත් හෙයින් ඔහු ආයුෂයෙන් ද වැඩෙන්නාහ, පැහැයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද වැඩෙන, පැහැයෙන් ද වැඩෙන දශවර්ෂායුෂ්ක වූ ඒ මිනිසුන්ගේ දරුවෝ විසි හවුරුද්දක් ආයු ඇත්තෝ වන්නාහ. එ කල්හි, මහණෙනි, ඒ සත්නට, 'අපි, කුසල් දහම් සමාදන් කොට ගත් හෙයින්, ආයුෂයෙන් ද වැඩෙමු, වර්ණයෙන් ද වැඩෙමු අපි තවත් බොහෝ සෙයින් කුසල් කරන්නමෝ නම් යෙහෙක. කවර කුසලක් කරන්නමෝ ද? අපි අදත්තාදානයෙන් වළක්නමෝ නම්, මේ කුසල් දහම සමාදන් කොට ගෙන පවත්නමෝ නම් යෙහෙකැ'යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු පණිවායෙන් වළක්නාහ, අයිනාදනින් වළක්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවතින්නාහ. ඔහු කුසල් දහම් සමාදන් කොට ගැනුම් හෙයින් ආයුෂයෙන් ද වැඩෙන්නාහ. වර්ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද වැඩෙන, වර්ණයෙන් ද වැඩෙන, විසි හවුරුදු ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ හවුරුදු සතළිසක් ආයු ඇතියෝ වන්නාහ.

මහණෙනි, එ කල්හි ඒ සත්නට, 'අපි වූ කලි කුසල් දහම් සමාදන් කොට ගැනීමේ හේතුයෙන් ආයුෂයෙන් ද වැඩෙමු, වර්ණයෙන් ද වැඩෙමු. අපි වඩාත් කුසල් කරන්නමෝ නම් යෙහෙක. කවර කුසලක් කරන්නමෝ ද? අපි කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළැක්කමෝ නම්, මේ කුසල් දහම සමාදන් කොට ගෙන පැවැත්තමෝ නම් යෙහෙකැ'යි මේ සිත වන්නේ ය. ඔහු ප්‍රාණඝාතයෙන් වළකින්නාහ, අයිනාදනින් වළකින්නාහ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වළකින්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවතින්නාහ. ඔහු කුසල් දහම් සමාදන් කොට ගැනිම හෙයින් ආයුෂයෙන් ද වැඩෙන්නාහ, වර්ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද වැඩෙන, වර්ණයෙන් ද වැඩෙන, සතළිස් වසක් ආයු කොටැති ඒ මිනිසුන්ගේ දරුවෝ අසූ හවුරුදු ආයු ඇත්තෝ වන්නාහ.

18. මහණෙනි, එ කල්හි ඒ සත්නට, 'අපි වනාහි කුසල් දහම් සමාදන් කොට ගැනුම් හෙයින් ආයුෂයෙන් ද වැඩෙමු, වර්ණයෙන් ද වැඩෙමු. අපි වඩාත් කුසල් කරමෝ නම් යෙහෙක. කවර කුසලක් කරන්නමෝ ද? අපි මුසවා බිණීමෙන් වැළැක්කමෝ නම්, මේ කුසල් දහම සමාදන් කොට ගෙන පැවැත්තමෝ නම් යෙහෙකැ'යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු පණිවායෙන් වළක්නාහ, අයිනාදනින් වළක්නාහ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වළක්නාහ, මුසවා බිණීමෙන් වළක්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවත්නාහ. ඔහු කුසල් දහම් සමාදන් කොට ගැනුම් හෙයින් ආයුෂයෙන් ද වැඩෙන්නාහ, වර්ණයෙන් ද වැඩෙන්නාහ.

තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනාපි වඩ්ඪමානානං අසීතිවස්සායුකානං මනුස්සානං සට්ඨිවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති. අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම, වණ්ණෙනාපි වඩ්ඪාම. යන්නූන මයං භිය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං පිසුණාය වාචාය විරමෙය්‍යාම ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති, කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති, මුසාවාදා විරමිස්සන්ති, පිසුණාය වාචාය විරමිස්සන්ති. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති වණ්ණෙනාපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනාපි වඩ්ඪමානානං සට්ඨිවස්සසහස්සායුකානං මනුස්සානං වීසතිවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති.

අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම වණ්ණෙනාපි වඩ්ඪාම. යන්නූන මයං භිය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං ඵරුසාය වාචාය විරමෙය්‍යාම. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති.තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති, කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති, මුසාවාදා විරමිස්සන්ති, පිසුණාය වාචාය විරමිස්සන්ති, ඵරුසාය වාචාය විරමිස්සන්ති. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති වණ්ණෙනාපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනාපි වඩ්ඪමානානං වීසතිවස්සසහස්සායුකානං මනුස්සානං චත්තාරීසංවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති.

අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම වණ්ණෙනාපි වඩ්ඪාම යන්නූන මයං භිය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං සම්ඵප්පලාපා විරමෙය්‍යාම, ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති, මුසාවාදා විරමිස්සන්ති, පිසුණාය වාචාය විරමිස්සන්ති, ඵරුසාය වාචාය විරමිස්සන්ති, සම්ඵප්පලාපා විරමිස්සන්ති. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති, වණ්ණෙනාපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනාපි වඩ්ඪමානානං චත්තාරීසංවස්සසහස්සායුකානං මනුස්සානං ද්වෙවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති.

ආයුෂයෙන් ද වැඩෙන, වර්ණයෙන් ද වැඩෙන, අසූවසකට ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ එක්සිය සැට හවුරුදු ආයු ඇත්තෝ වන්නාහ. මහණෙනි, එ කල්හි ඒ සත්නට 'අපි වනාහි කුසල් දහම් සමාදන් කොට ගැනුම් හෙයින් ආයුෂයෙන් ද වැඩෙමු, වර්ණයෙන් ද වැඩෙමු. අපි වඩාත් කුසල් කරමෝ නම් යෙහෙක. කවර කුසලක් කරමෝ ද? අපි පෙහෙසුන් තෙප්ලෙන් වළක්නමෝ නම්, මේ කුසල් දහම සමාදන් කොට ගෙන පවත්නමෝ නම් යෙහෙකැ' යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු පණිවායෙන් වළකින්නාහ, අයිනාදනින් වළකින්නාහ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වළකින්නාහ, මුසවායෙන් වළකින්නාහ, පෙහෙසුන් තෙප්ලෙන් වළකින්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවත්නාහ. ඔහු කුසල් දහම් සමාදන් කොට ගැනුම් හෙයින් ආයුෂයෙන් ද වැඩෙන්නාහ. වර්ණයෙන් ද වැඩෙන්නා. ආයුෂයෙන් ද වැඩෙන වර්ණයෙන් ද වැඩෙන, එක්සිය සැටවසක් ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ තෙසියවිසි හවුරුද්දකට ආයු ඇත්තෝ වන්නාහ.

මහණෙනි, එ කල්හි ඒ සත්නට, 'අපි වූ කලි කුශලධර්ම සමාදන හෙතුයෙන් ආයුෂයෙන් ද වැඩෙමු, වර්ණයෙන් ද වැඩෙමු. අපි වඩාත් කුසල් කරමෝ නම් යෙහෙක. කවර කුසලක් කරමෝ ද? අපි පරොස් බසින් වළක්නමෝ නම්, මේ කුසල් දහම සමාදන් කොට ගෙන පවත්නමෝ නම් යෙහෙකැ' යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු පණිවායෙන් වළකින්නාහ, අයිනාදනින් වළකින්නාහ, කාමමිථ්‍යාචාරයෙන් වළකින්නාහ, මුසවායෙන් වළකින්නාහ, පෙහෙසුන් තෙප්ලෙන් වළකින්නාහ, පරොස් බසින් වළකින්නාහ, මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවතින්නාහ. ඔහු කුසල් දහම් සමාදන් කොට ගැනුම් හෙයින් ආයුෂයෙන් ද වැඩෙන්නාහ, වර්ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද වැඩෙන, වර්ණයෙන් ද වැඩෙන, තෙසිය විසි වසක් ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ හසිය සතළිස් හවුරුද්දකට ආයු ඇත්තෝ වන්නාහ.

මහණෙනි, එ කල්හි ඒ සත්නට, 'අපි වූකලි කුශල ධර්ම සමාදන හෙතුයෙන් ආයුෂයෙන් ද වර්ණයෙන්ද වැඩෙමු. අපි වඩාත් කුසල් කරමෝ නම් යෙහෙක. කවර කුසලක් කරමෝ ද? අපි සම්ප්‍රලාපයෙන් වළක්නමෝ නම්, මේ කුසල් දහම සමාදන් කොට ගෙන පවත්නමෝ නම් යෙහෙකැ'යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු පණිවායෙන් වළක්නාහ, අයිනාදනින් කාමමිථ්‍යාචාරයෙන් මුසාවාදයෙන් පිසුණාවාචායෙන් වළක්නාහ. සම්ප්‍රලාපයෙන් වළක්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවත්නාහ. ඔහු කුශල ධර්ම සමාදන හෙතුයෙන් ආයුෂයෙන් ද, වර්ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද වැඩෙන, වර්ණයෙන් ද වැඩෙන, හසිය සතළිස් හවුරුද්දකට ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ හවුරුදු දෙදහසකට ආයු ඇතියෝ වන්නාහ.

19. අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම, වණ්ණෙනපි වඩ්ඪාම, යන්නූන මයං භිය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං අභිජ්ඣං පජහෙය්‍යාම, ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති, කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති, මුසාවාදා විරමිස්සන්ති, පිසුණාය වාචාය විරමිස්සන්ති, ඵරුසාය වාචාය විරමිස්සන්ති, සම්ඵප්පලාපා විරමිස්සන්ති, අභිජ්ඣං පජහිස්සන්ති, ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති වණ්ණෙනපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනපි වඩ්ඪමානානං ද්වෙවස්සසහස්සායුකානං මනුස්සානං චත්තාරිවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති.

අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම, වණ්ණෙනපි වඩ්ඪාම. යන්නූන මයං භිය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං ව්‍යාපාදං පජහෙය්‍යාම, ඉදං කුසලං 'ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති, කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති, මුසාවාදා විරමිස්සන්ති, පිසුණාය වාචාය විරමිස්සන්ති, ඵරුසාය වාචාය විරමිස්සන්ති, සම්ඵප්පලාපා විරමිස්සන්ති, අභිජ්ඣං පජහිස්සන්ති, ව්‍යාපාදං පජහිස්සන්ති. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති, වණ්ණෙනපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනපි වඩ්ඪමානානං චත්තාරිවස්සසහස්සායුකානං[1] මනුස්සානං අට්ඨවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති.

අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම, වණ්ණෙනපි වඩ්ඪාම, යන්නූන මයං භිය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං මිච්ඡාදිට්ඨිං පජහෙය්‍යාව ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති, කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති, මුසාවාදා විරමිස්සන්ති, පිසුණාය වාචාය විරමිස්සන්ති, ඵරුසාය වාචාය විරමිස්සන්ති, සම්ඵප්පලාපා විරමිස්සන්ති, අභිජ්ඣං පජහිස්සන්ති, ව්‍යාපාදං පජහිස්සන්ති, මිච්ඡාදිට්ඨිං පජහිස්සන්ති. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති වණ්ණෙනපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනපි වඩ්ඪමානානං අට්ඨවස්සසහස්සායුකානං මනුස්සානං වීසතිවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති,

1. චත්තාරිවස්සසහස්සායුකානං (මජසං PTS)

19. මහණෙනි, එ කල්හි ඒ සත්නට, 'අපි වූකලි කුශලධර්ම සමාදන හේතුයෙන් ආයුෂයෙන් ද, වර්ණයෙන් ද වැඩෙමු. අපි වඩාත් කුසල් කරමෝ නම් යෙහෙක. කවර කුසලක් කරමෝ ද? අපි අභිධ්‍යාව දුරු ලන්නමෝ නම්, මේ කුසල් දහම සමාදන් කොවගෙන පවත්නමෝ නම් යෙහෙකැ'යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු ප්‍රාණඝාතයෙන් අදත්තාදනයෙන් කාමමිථ්‍යාචාරයෙන් මෘෂාවාදයෙන් පෛශුන්‍යයෙන් පරුෂවචනයෙන් සම්ඵප්‍රලාපයෙන් වළකින්නාහ, අභිධ්‍යාව දුරුලන්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවතින්නාහ. ඔහු කුශලධර්ම සමාදන හේතුයෙන් ආයුෂයෙන් ද වර්ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද වර්ණයෙන් ද වැඩෙන, දෙදහසක් හවුරුද්දට ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ සාරදහස් හවුරුද්දකට ආයු ඇත්තෝ වන්නාහ.

මහණෙනි, එ කල්හි ඒ සත්නට, 'අපි වූ කලි කුශලධර්ම සමාදන හේතුයෙන් ආයුෂයෙන් ද, වර්ණයෙන් ද වැඩෙමු. අපි වඩාත් කුසල් කරමෝ නම්, යෙහෙක. කවර කුසලක් කරමෝ ද? අපි ව්‍යාපාදය බැහැර කරමෝ නම්, මේ කුසල් දහම (ව්‍යාපාද ප්‍රහාණය) සමාදන් කොට ගෙන පවත්නමෝ නම් යෙහෙකැ' යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු ප්‍රාණඝාතයෙන්, අදත්තාදනයෙන්, කාමමිථ්‍යාචාරයෙන්, මුසාවාදයෙන්, පිසුණාවාවායෙන්, ඵරුසවාවායෙන්, සම්ඵප්‍රලාපයෙන් වළකින්නාහ. අභිධ්‍යාව බැහැර කරන්නාහ. ව්‍යාපාදය බැහැර කරන්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවතින්නාහ. කුසල් දහම් සමාදන් කොට ගැනුම් හෙතුයෙන් ඔහු ආයුෂයෙන් ද වර්ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද වර්ණයෙන් ද වැඩෙන, සාරදහසක් හවුරුදු ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ අවුරුදු අටදහසක් ආයු ඇත්තෝ වන්නාහ.

මහණෙනි, එ කල්හි ඒ සත්නට, 'අපි වූ කලි කුශලධර්ම සමාදන හේතුයෙන් ආයුෂයෙන් ද වර්ණයෙන් ද වැඩෙමු. අපි වඩාත් කුසල් කරමෝ නම් යෙහෙක. කවර කුසලක් කරමෝ ද? අපි මිථ්‍යාදෘෂ්ටිය බැහැර කරමෝ නම්, මේ (මිථ්‍යාදෘෂ්ටි ප්‍රහාණමය) කුශලධර්මය සමාදන් කොටගෙන පවත්නමෝ නම් යෙහෙකැ' යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු ප්‍රාණඝාතයෙන්, අදත්තාදනයෙන්, කාමමිථ්‍යාචාරයෙන්, මුසාවාදයෙන් පිසුණවාවායෙන්, ඵරුසවාවායෙන්, සම්ඵප්‍රලාපයෙන් වළකින්නාහ. අභිධ්‍යාව, ව්‍යාපාදය බැහැර කරන්නාහ. මිථ්‍යාදෘෂ්ටිය බැහැර කරන්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවතින්නාහ. කුශලධර්ම සමාදන හේතුයෙන් ඔහු ආයුෂයෙන් ද, වර්ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද වර්ණයෙන් ද වැඩෙන අටදහසක් හවුරුද්දට ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ වර්ෂ විසිදහසකට ආයුෂ ඇත්තෝ වන්නාහ.

20. අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති: 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම, වණ්ණෙනාපි වඩ්ඪාම, යන්නූන මයං භීය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාමාති කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං තයො ධම්මෙ පජහෙය්‍යාම අධම්මරාගං විසමලොභං මිච්ඡාධම්මං, ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති, කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති, මුසාවාදා විරමිස්සන්ති, පිසුණාය වාචාය විරමිස්සන්ති, ඵරුසාය වාචාය විරමිස්සන්ති, සම්ඵප්පලාපා විරමිස්සන්ති, අභිජ්ඣං පජහිස්සන්ති, ව්‍යාපාදං පජහිස්සන්ති, මිච්ඡාදිට්ඨිං පජහිස්සන්ති, තයො ධම්මෙ පජහිස්සන්ති: අධම්මරාගං විසමලොභං මිච්ඡාධම්මං. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති, වණ්ණෙනාපි වඩ්ඪිස්සන්ති, තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනාපි වඩ්ඪමානානං වීසතිවස්සසහස්සායුකානං මනුස්සානං චත්තාරීසවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති,

21. අථ ඛො තෙසං භික්ඛවෙ සත්තානං එවං භවිස්සති 'මයං ඛො කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪාම වණ්ණෙනාපි වඩ්ඪාම. යන්නූන මයං භීය්‍යොසොමත්තාය කුසලං කරෙය්‍යාම කිං කුසලං කරෙය්‍යාම? යන්නූන මයං මත්තෙය්‍යා අස්සාම පෙත්තෙය්‍යා අස්සාම සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො, ඉදං කුසලං ධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති. තෙ පාණාතිපාතා විරමිස්සන්ති, අදින්නාදානා විරමිස්සන්ති, කාමෙසුමිච්ඡාචාරා විරමිස්සන්ති, මුසාවාදා විරමිස්සන්ති, පිසුණාය වාචාය විරමිස්සන්ති, ඵරුසාය වාචාය විරමිස්සන්ති, සම්ඵප්පලාපා විරමිස්සන්ති, අභිජ්ඣං පජහිස්සන්ති, ව්‍යාපාදං පජහිස්සන්ති, මිච්ඡාදිට්ඨිං පජහිස්සන්ති, තයො ධම්මෙ පජහිස්සන්ති අධම්මරාගං විසමලොභං මිච්ඡාධම්මං, මත්තෙය්‍යා භවිස්සන්ති පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො. ඉදං කුසලං ධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනාපි වඩ්ඪිස්සන්ති වණ්ණෙනාපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනාපි වඩ්ඪමානානං වණ්ණෙනාපි වඩ්ඪමානානං චත්තාරීසංවස්සසහස්සායුකානං මනුස්සානං අසීතිවස්සසහස්සායුකා පුත්තා භවිස්සන්ති. අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු පංචවස්සසතිකා කුමාරිකා අලම්පතෙය්‍යා භවිස්සන්ති. අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු තයො ආබාධා භවිස්සන්ති ඉච්ඡා අනසනං ජරා.

20. මහණෙනි, එ කල්හි ඒ සත්නට, අපි වූ කලි කුශලධර්ම සමාදන හේතුයෙන් ආයුෂයෙන් ද, වර්‍ණයෙන් ද වැඩෙමු. දපි වඩාත් කුසල් කරමෝ නම් යෙහෙක. කවර කුසලක් කරමෝ ද? අපි අධර්ම රාගය, විෂම ලෝභය, මිථ්‍යාධර්මය යන මේ තුන් ලාමක ධර්ම දුරලන්නමෝ නම්, මේ කුශලධර්මය සමාදන් කොට ගෙන පවත්නමෝ නම් යෙහෙකැ'යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු ප්‍රාණඝාතයෙන්, අදත්තාදනයෙන්, කාමමිථ්‍යාචාරයෙන්, මුසාවාදයෙන්, පිසුණවාචායෙන්, එරුෂවාචායෙන් සම්ඵප්‍රලාපයෙන් වළකින්නාහ. අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය දුරු ලන්නාහ. අධර්ම රාගය, විෂම ලෝභය, මිථ්‍යාධර්මය යන තුන් පාපධර්ම බැහැරු කරන්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවතින්නාහ. ඔහු කුශලධර්ම සමාදන හේතුයෙන් ආයුෂයෙන් ද, වර්‍ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද වර්‍ණයෙන් ද වැඩෙන, හවුරුදු විසිදහසක් ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ හවුරුදු සතළිස් දහසකට ආයු ඇතියෝ වන්නාහ.

21. මහණෙනි, එ කල්හි ඒ සත්නට, 'අපි වනාහි කුශලධර්ම සමාදන හේතුයෙන් ආයුෂයෙන් ද, වර්‍ණයෙන් ද වැඩෙමු. අපි වඩාත් කුසල් කරමෝ නම් යෙහෙක. කවර කුශලයක් කරමෝ ද? අපි මව කෙරෙහි මොනවට පිළිපදින්නමෝ, පියා කෙරෙහි මොනොවට පිළිපදින්නමෝ මහණුනට සත්කාර කරන්නමෝ, බමුණනට සත්කාර කරන්නමෝ කුලයෙහි වැඩි සිටියනට යටත් පැවැතුම් ඇත්තමෝ වන්නමු නම්, මේ කුශල ධර්ම සමාදන් කොට ගෙන පවතින්නමෝ නම් යෙහෙකැ'යි මෙසේ සිතෙක් වන්නේ ය. ඔහු ප්‍රාණඝාතයෙන්, අදත්තාදනයෙන්, කාමමිථ්‍යාචාරයෙන්, මුසාවාදයෙන්, පිසුණාවාචායෙන්, එරුසවාචායෙන් සම්ඵප්‍රලාපයෙන් වළකින්නාහ. අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය බැහැරු ලන්නාහ. අධර්ම රාග විෂමලොභ මිථ්‍යාධර්ම යන තුන් පාපධර්ම බැහැරු කරන්නාහ. මවුට සත්කාර කරන්නෝ, පියාට සත්කාර කරන්නෝ, මහණුනට සත්කාර කරන්නෝ, බමුණනට සත්කාර කරන්නෝ, කුලයෙහි වැඩි සිටියනට යටත් පැවැතුම් දක්වන්නෝ වන්නාහ. මේ කුසල් දහම් සමාදන් කොට ගෙන පවතින්නාහ. ඔහු කුශල ධර්ම සමාදන හේතුයෙන් ආයුෂයෙන් ද, වර්‍ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද, වර්‍ණයෙන් ද වැඩෙන හවුරුදු සතළිස් දහසකට ආයු ඇති ඒ මිනිසුන්ගේ දරුවෝ හවුරුදු අසූ දහසක් ආයුඇත්තෝ වන්නාහ. මහණෙනි, අවුරුදු අසූදහසක් ආයු ඇති මිනිසුන් අතුරෙහි පන්සියක් හවුරුදු වයස් වූ කුමරියෝ පතිකුලයට යැමට සුදුසු වන්නාහ. මහණෙනි, අසූදහසක් හවුරුදු ආයු ඇති මිනිසුන් අතුරෙහි ආහාරතෘෂ්ණාව ද ආහාරක්ලාන්තිය ද මහලු වීම ද යන තුන් ආබාධ කෙනෙක් ම වන්නාහ.

## සඞ්ඛරාජුප්පත්ති

22. අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු අයං ජම්බුදීපො ඉද්ධො චෙව භවිස්සති ඵීතො ච, කුක්කුටසම්පාතිකා[1] ගාමනිගමජනපදරාජධානියො.[2] අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු අයං ජම්බුදීපො අවීචි මඤ්ඤෙ ඵුටො භවිස්සති මනුස්සෙහි, සෙය්‍යථාපි නළවනං සරවනං[3] වා.

අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු අයං බාරාණසී කෙතුමතී නාම රාජධානී භවිස්සති ඉද්ධා චෙව ඵීතා ච බහුජනා ච ආකිණ්ණමනුස්සා ච සුභික්ඛා ච. අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු ඉමස්මිං ජම්බුදීපෙ චතුරාසීති නගරසහස්සානි භවිස්සන්ති කෙතුමතීරාජධානිපමුඛානි. අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු කෙතුමතියා රාජධානියා සංඛො නාම රාජා උප්පජ්ජිස්සති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවිස්සන්ති, සෙය්‍යථීදං, චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවිස්සන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසිස්සති.

## මෙත්තෙය්‍යබුද්ධුප්පාදො

23. අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු මෙත්තෙය්‍යො නාම භගවා ලොකෙ උප්පජ්ජිස්සති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සෙය්‍යථාපහං එතරහි ලොකෙ උප්පන්නො අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙස්සති, සෙය්‍යථාපහං එතරහි ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙමි. සො ධම්මං දෙසෙස්සති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙස්සති. සෙය්‍යථාපහං එතරහි ධම්මං දෙසෙමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙමි. සො අනෙකසතසහස්සං භික්ඛුසඞ්ඝං පරිහරිස්සති සෙය්‍යථාපහං එතරහි අනෙකසතං භික්ඛුසඞ්ඝං පරිහරාමි.

1. කුක්කුටසම්පාතිකා (ස්‍යා)
2. ගාමනිගම ජනපද රාජධානියො [කම]. ගාමනිගමරාජධානියො (මජ්සං)
3. සාරවනං (ස්‍යා)

මහණෙනි, මිනිසුන් හවුරුදු අසූදහසක් ආයු ඇතියන් වූ කල්හි මේ දඹදිව සමෘද්ධ (ධාන්‍යාදියෙන් සම්පන්න) ද, ස්ඵීත (වස්ත්‍රාදියෙන් පරිපූර්ණ) ද වන්නේ ය. ගම් නියම්ගම් දනවු රජදහන්හු වහළ මතුයෙන් ගමෙකින් ගමකට කුකුළකු විසින් යෑ හැකි වන සේ ඒකාබද්ධ වැ පිහිටි දහස්ගණන් ගෙවලින් යුක්ත වන්නාහ. මහණෙනි, අසූ දහසක් හවුරුදු ආයු ඇති මිනිසුන් ඇති වන කල්හි මේ දඹදිව උනවනයක් බටවනයක් සේ, අවීචිය මෙන් මිනිසුන්ගෙන් අතුරු සිදුරු නැති සේ ගැවැසු ගණ වන්නේ ය.

22. මහණෙනි, මිනිසුන් වස් අසූදහසක් ආයු ඇත්තන් වන කල්හි, මේ බරණැස් නුවර සමෘද්ධ වූ ද ආඪ්‍ය වූ ද බොහෝ ජනයා ඇත්තා වූ ද මිනිසුන්ගෙන් ආකීර්ණ වූ ද සුලභ ආහාර ඇත්තාවූ ද කේතුමතී නම් රජදහනෙක් වන්නේ ය. මහණෙනි, මිනිසුන් අසූදහසක් හවුරුදු ආයු ඇත්තවුන් වූ කල්හි මෙ දඹදිව්හි කේතුමතී රාජධානිය පාමොක් කොටැති සුවාසූ දහසක් නගරයෝ වන්නාහ. මහණෙනි, මිනිසුන් අසූදහසක් හවුරුදු ආයු ඇතියන් වූ කල්හි කේතුමතී රාජධානියෙහි ධාර්මික වූ ධර්මරාජ වූ සිවු සයුරු හිම් කොට සතර මහාවීපයට අධිපති වූ, සියලු සතුරන් දිනූ, දනවුහි තහවුරු බවට පැමිණි, සත්රුවනින් යුත් ශංඛ නම් සක්විති රජෙක් පහළ වන්නේ ය. ඔහුට චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, මණිරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, සත්වන පරිනායක රත්නයැ යි මේ සප්ත රත්න කෙනෙක් වන්නාහ. ඔහුට බාන සුලු නොවූ මූර්තිමත් වීර්යය බඳු ශරීර ඇති, පර සෙන් මඩිනු සමත් වූ, දහසකට වැඩි දරු කෙනෙක් වන්නාහ. හෙ තෙම සයුරුහිම් මේ මහ පොළොව දඬුවමින් තොර වැ, අවියෙන් තොර වැ, දැහැමෙන් සෙමෙන් ජය ගෙන අධිපති වැ වසන්නේ ය.

23. මහණෙනි, මිනිසුන් හවුරුදු අසූදහසකට පරමායුෂ ඇත්තවුන් වූ කල්හි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ, විද්‍යාචරණ සම්පන්න වූ, සුගත වූ, ලොව දන්නා, නිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ, දෙව්මිනිස්නට ශාස්තෘ වූ, සිවුසස් අවබෝධ කළ, සියලු භාග්‍යගුණ ඇති, මෛත්‍රෙය නම් භාග්‍යවත් තෙම ලොවැ උපදින්නේ ය. යම්සේ මම් මෙ සමයෙහි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලෝකය ද, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත සත්වප්‍රජාව ද තෙමේ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට පළ කෙරෙම් ද, එසේ ම ඒ මෛත්‍රෙය බුදුරජ ද දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, මේ ලෝකය ද, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත සත්වප්‍රජාව ද තෙමේ ම වෙසෙසි නුවණින් දැන, පසක් කොට දන්වන්නේ ය. යම්සේ මම මෙ සමයෙහි ආදි කල්‍යාණ මධ්‍ය කල්‍යාණ පර්යවසාන කල්‍යාණ වූ, අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත වූ දහම් දෙසම් ද, හැම ලෙසින් පිරිපුන් වූ, පිරිසිදු බඹසර ප්‍රකාශ කරම් ද, එසේ ම ඒ බුදුරජ තෙමේ ද ආදිකල්‍යාණ මධ්‍ය කල්‍යාණ පර්යවසාන කල්‍යාණ වූ, අර්ථ සහිත ව්‍යංජන සහිත වූ දහම් දෙසන්නේ ය. හැම ලෙසින් පිරිපුන් වූ පිරිසිදු බඹසර ප්‍රකාශ කරන්නේ ය. යම්සේ මම මෙ සමයෙහි නොයෙක් සිය ගණන් භික්ෂු සඞ්ඝයා පරිහරණය කෙරෙම් ද, එසේ ම ඒ බුදුරජ නොයෙක් සියදහස් ගණන් භික්ෂු සඞ්ඝයා පරිහරණය කරන්නේ ය.

24. අථ ඛො භික්ඛවෙ සඞ්ඛො නාම රාජා යො සො යූපො රඤ්ඤා මහාපනාදෙන කාරාපිතො, තං යූපං උස්සාපෙත්වා අජ්ඣාවසිත්වා තං දත්වා විස්සජ්ජෙත්වා[1] සමණබ්‍රාහ්මණකපණද්ධිකවණිබ්බකයාචකානං දානං දත්වා[2] මෙත්තෙය්‍යස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සති. සො එවං පබ්බජිතො සමානො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරිය-පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති.

25. අත්තදීපා භික්ඛවෙ විහරථ අත්තසරණා අනඤ්ඤසරණා ධම්ම-දීපා ධම්මසරණා අනඤ්ඤසරණා. කථඤ්ච භික්ඛවෙ භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො, ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො?.

ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු –පෙ– චිත්තෙ –පෙ– ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං ඛො භික්ඛවෙ භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො, ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො.

## භික්ඛුනො ආයුවණ්ණාදිවඩ්ඪනකථා

26. ගොචරෙ භික්ඛවෙ චරථ සකෙ පෙත්තිකෙ විසයෙ. ගොචරෙ භික්ඛවෙ චරන්තා සකෙ පෙත්තිකෙ විසයෙ ආයුනා පි වඩ්ඪිස්සථ, වණ්ණෙන පි වඩ්ඪිස්සථ, සුඛෙන පි වඩ්ඪිස්සථ, භොගෙන පි වඩ්ඪිස්සථ, බලෙන පි වඩ්ඪිස්සථ. කිඤ්ච භික්ඛවෙ භික්ඛුනො ආයුස්මිං? ඉධ භික්ඛවෙ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාර- සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි –පෙ– චිත්තසමාධි –පෙ– වීමංසා සමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො ඉමෙසං චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. ඉදං ඛො භික්ඛවෙ භික්ඛුනො ආයුස්මිං.

1. විසජ්ජිත්වා (මජසං)
2. දදිත්වා (PTS)

24. මහණෙනි, එ කල්හි ශඞ්ඛ නම් ඒ සක්විති රජ තෙම, පෙර මහාපනාද රජහු විසින් කරවන ලද යම් ප්‍රාසාදයෙක් වේ ද, (ගංගානදියෙහි ගිලී ඇති) ඒ පහය (ගඟෙන්) මත්තට නංවා. කලක් එහි වැස, මහණ බමුණු දුගී මඟී පුලනු යදි ආදීනට එය පරිත්‍යාග කොට හැර දමා කෙහෙ රවුලු බහවා කසාවත් හැඳ ගිහිගෙයින් නික්මැ භගවත් අර්හත් මෛත්‍රෙය සම්මා-සම්බුදු රජුහු වෙතැ, පැවිදි වන්නේ ය. හෙ තෙම මෙසේ පැවිදි වූයේ ම, හුදෙකලා වූයේ, කයින් සිතින් විවික්ත වූයේ, නොපමා වූයේ, කෙලෙස් තවන වැර ඇතියේ, නිවන් කරා මෙහෙයූ සිතැත්තේ, මඳ කලෙකින් ම, යමක් පිණිස කුල දරුවෝ ගිහි ගෙන් නික්ම මනා කොට ම සසුන් වදිත් නම්, ඒ නිරුත්තර වූ සසුන් බඹසර අවසන වූ රහත්-පලය වත්මනු බෙවෙහි ම තමා ම දැන පසක් කොට සපයා වසන්නේ ය.

25. මහණෙනි, (එබැවින්) ආත්මය (ලොවී ලොවුතුරා දහම්) ඞීප කොටැත්තෝ වැ ආත්මය ශරණ කොටැත්තෝ වැ අන් ශරණයක් අපෙක්ෂා නො කරන්නෝ වැ, ධර්මය ද්වීප කොටැත්තෝ වැ ධර්මය ශරණ කොටැත්තෝ වැ, අන් ශරණයක් නැත්තෝ වැ වසවු.

මහණෙනි, කෙසේ නම් මහණ තෙම ආත්මය ඞීප කොටැති වැ, ආත්මය ශරණ කොටැති වැ, අන් ශරණයක් නැත්තෙක් වැ වෙසේ ද? ධර්මය ඞීප කොටැති වැ, ධර්මය ශරණ කොටැති වැ, අන් ශරණයක් නැති වැ වෙසේ ද?

මහණෙනි, මෙහි මහණ තෙම කයෙහි කය අනුව බලනුයේ, කෙලෙස් තවන වැර ඇත්තේ, නුවණින් දන්නේ, එළැඹැවූ සිහි ඇත්තේ, ලොවෙහි (කයෙහි) අභිධ්‍යාවත් දොම්නසත් පහ කොට වෙසෙයි. වෙදනාවන්හි ... සිතෙහි ... ධර්මයන්හි ධර්ම අනුව බලනුයේ කෙලෙස් තවන වැර ඇත්තේ නුවණින් දන්නේ එළැඹැවූ සිහි ඇත්තේ, ලොවෙහි (ධර්මයන්හි) අභිධ්‍යාවත් දොම්නසත් පහ කොට වෙසෙයි. මහණෙනි, මෙසේ ම මහණ තෙම ආත්මය ඞීප කොටැති වැ, ආත්මය ශරණ කොටැති වැ අන් ශරණයක් නැති වැ, ධර්මය ඞීප කොටැති වැ ධර්මය ශරණ කොටැති වැ, අන් ශරණයක් නැති වැ වෙසෙයි. මහණෙනි, තමන් සතු වූ පියාගෙන් තමනට උරුම වැ ආ හැසිරීමට නිසි පෙදෙසෙහි හැසිරෙවු. තෙපි පියාගෙන් උරුම වැ ආ හැසිරීමට නිසි පෙදෙසෙහි හැසිරෙන්නාහු, ආයුෂයෙන් ද වැඩෙන්නාහු, වර්ණයෙන් ද වැඩෙන්නාහු, සුවයෙන් ද වැඩෙන්නාහු, භොග-යෙන් ද වැඩෙන්නාහු, බලයෙන් ද වැඩෙන්නාහු ය. මහණෙනි, මහණහුගේ ආයුෂයට කරුණු කවරේ ද? මහණෙනි, මෙහි මහණ තෙම ඡන්ද සමාධිය ප්‍රධාන කොටැති සංස්කාරයන් ගෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. වීර්ය සමාධිය ... චිත්ත සමාධිය ... වීමංසා සමාධිය ප්‍රධාන කොටැති සංස්කාර-යන්ගෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. හේ මේ සතර ඍද්ධිපාද වැඩූ බැවින් බහුල කොට කළ බැවින් කැමැති වන්නේ කල්පයක් හෝ කල්පයකට වැඩි කලක් හෝ සිටියැ හැකි වන්නේ ය. මහණෙනි, මෙය වනාහි මහණහුගේ ආයුෂයට කරුණ වෙයි.

කිඤ්ච භික්ඛවෙ භික්ඛුනො වණ්ණස්මිං? ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදය සික්ඛති සික්ඛාපදෙසු. ඉදං ඛො භික්ඛවෙ භික්ඛුනො වණ්ණස්මිං.

කිඤ්ච භික්ඛවෙ භික්ඛුනො සුඛස්මිං? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[1] උපසම්පජ්ජවිහරති, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො පන භික්ඛවෙ භික්ඛුනො සුඛස්මිං.

කිඤ්ච භික්ඛවෙ භික්ඛුනො භොගස්මිං? ඉධ භික්ඛවෙ භික්ඛු මෙත්තා-සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන[2] ඵරිත්වා විහරති. ඉධ භික්ඛවෙ භික්ඛු කරුණා-සහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛා-සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. ඉදං ඛො භික්ඛවෙ භික්ඛුනො භොගස්මිං.

කිඤ්ච භික්ඛවෙ භික්ඛුනො බලස්මිං? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයාඅනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉදං ඛො භික්ඛවෙ භික්ඛුනො බලස්මිං.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකබලම්පි සමනුපස්සාමි යං එවං දුප්පසහං යථයිදං භික්ඛවෙ මාරබලං කුසලානං භික්ඛවෙ ධම්මානං සමාදානහෙතු එවමිදං පුඤ්ඤං පවඩ්ඪතීති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති.

චක්කවත්තිසීහනාදසුත්තං නිට්ඨිතං තතියං.

---

1. පඨමජ්ඣානං සිමු. (PTS)
2. අබ්‍යාපජ්ඣෙන (සිමු. PTS)

මහණෙනි, මහණහුගේ වර්ණයට කාරණ කවරේ ද? මහණෙනි, මෙහි මහණ තෙම සිල්වත් වේ ද, පාමොක් හැවුරුමෙන් හැවුරුණේ, ආචාර ගොචර දෙකින් යුක්ත වූයේ, අනුමාත්‍ර වරදෙහි ද බිය දක්නා සුලු වූයේ වෙසේ ද, සමාදන් කොට ගෙන සිකපදන්හි හික්මේ ද, මහණෙනි, මෙය මහණහුගේ වර්ණයට කාරණ වේ.

මහණෙනි, මහණහුගේ සුවයට කාරණ කවරේ ද? මහණෙනි, මෙහි මහණ, තෙම කාමයන්ගෙන් වෙන් වැ ම, අකුසල් දහමුන්ගෙන් වෙන් ව ම, විතර්ක සහිත, විචාර සහිත, විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සුවය හා ඇති, පළමු දහන ලැබ වෙසෙයි. විතර්ක විචාරයන් සංහිඳීමෙන් ... දෙවෙනි දහන ... තෙවෙනි දහන ... සිවුවන දහන ලැබ වෙසෙයි. මහණෙනි, මේ වනාහි මහණහුගේ සුවයට කාරණ වෙයි.

මහණෙනි, මහණහුගේ භෝගයට කාරණ කවරේ ද? මහණෙනි, මෙහි මහණ තෙම මෛත්‍රී සහගත සිතින් එක් දෙසක් පැතිර ගෙන වෙසෙයි, එසේ දෙවෙනි දෙස, එසේ තෙවෙනි දෙස, එසේ සිවුවන දෙස, මෙසේ උඩ, යට, සරස, හැම තැන, සියලු ලොව මහත් වූ මහද්ගත වූ අප්‍රමාණ වූ වෛර රහිත වූ ක්‍රොධරහිත වූ මෛත්‍රී සහගත සිතින් පැතිර ගෙන වෙසෙයි. මහණෙනි, මෙහි මහණ තෙම කරුණා සහගත සිතින් ... මුදිතා සහගත සිතින්... උපෙක්ෂා සහගත සිතින් එක් දෙසක් පැතිර ගෙන වෙසෙයි. එසේ දෙවෙනි දෙස, එසේ තෙවෙනි දෙස, එසේ සිවුවන දෙස, මෙපරිද්දෙන් උඩ, යට, සරස, හැම තැන, සියලු ලොව මහත් වූ මහද්ගත වූ අප්‍රමාණ වූ වෛර රහිත වූ, ක්‍රොධ රහිත වූ උපෙක්ෂා සහගත සිතින් පැතිර ගෙන වෙසෙයි. මහණෙනි, මෙය මහණහුගේ භොගයට කාරණ වෙයි.

මහණෙනි, මහණහුගේ බලයට කාරණ කවරේ ද? මහණෙනි, මෙහි මහණ තෙම ආස්‍රවයන්ගේ විනාශයෙන් ආස්‍රව රහිත වූ ඵල සමාධිය ද ඵල ඥානය ද මෙ අත්බව්හි ම තෙමේ ම වෙසෙසි නුවණින් දැන, පසක් කොට ලැබ වෙසෙයි. මහණෙනි, මෙය වනාහි මහණහුගේ බලයට කාරණ වේ.

මහණෙනි, මාර බලය සේ දුක සේ මැඩැලියැ යුතු වූ අන් එක ද බලයක් මම (නුවණැසින්) නො දකිමි. (එය ද මේ රහත් පල තෙම මැඩ ලයි.) මහණෙනි, මෙසේ කුශල ධර්මයන්ගේ සමාදන හෙතුයෙන් මේ (ලොවුතුරා) පින ද (රහත් පලය තෙක් ම) වැඩේ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ආරාධිත සිතැති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය පිළිගත්හ.

තෙවෙනි චක්‍රවර්ති සිංහනාද සූත්‍රය නිමියේ යැ.

# 4

# අග්ගඤ්ඤසුත්තං

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. තෙන ඛො පන සමයෙන වාසෙට්ඨභාරද්වාජා භික්ඛූසු පරිවසන්ති[1] භික්ඛුභාවං ආකඞ්ඛමානා. අථ ඛො භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො පාසාද ඔරොහිත්වා පාසාදපච්ඡායායං[2] අබ්භොකාසෙ චඞ්කමති. අද්දසා ඛො වාසෙට්ඨො භගවන්තං සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතං පාසාද ඔරොහිත්වා පාසාදපච්ඡායායං අබ්භොකාසෙ චඞ්කමන්තං. දිස්වාන භාරද්වාජං ආමන්තෙසි: "අයං ආවුසො භාරද්වාජ භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො පාසාද ඔරොහිත්වා පාසාදපච්ඡායායං අබ්භොකාසෙ චඞ්කමති. ආයාමාවුසො භාරද්වාජ යෙන භගවා තෙනුපසඞ්කමිස්සාම. අප්පෙවනාම ලභෙය්‍යාම භගවතො සන්තිකා[3] ධම්මිං කථං සවණාය"ති. 'එවමාවුසො'ති ඛො භාරද්වාජො වාසෙට්ඨස්ස පච්චස්සොසි. අථ ඛො වාසෙට්ඨභාරද්වාජා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා භගවන්තං චඞ්කමන්තං අනුචඞ්කමිංසු.

2. අථ ඛො භගවා වාසෙට්ඨං ආමන්තෙසි: 'තුම්හෙ ඛ්වත්ථ වාසෙට්ඨා බ්‍රාහ්මණජච්චා බ්‍රාහ්මණකුලීනා බ්‍රාහ්මණකුලා අගාරස්මා අනගාරියං පබ්බජිතා. කච්චි වො වාසෙට්ඨා බ්‍රාහ්මණා න අක්කොසන්ති න පරිභාසන්තී?'ති.

"තග්ඝ නො භන්තෙ බ්‍රාහ්මණා අක්කොසන්ති පරිභාසන්ති අත්තරූපාය පරිභාසාය පරිපුණ්ණාය නො අපරිපුණ්ණායා"ති.

"යථා කථං පන වො වාසෙට්ඨා බ්‍රාහ්මණා අක්කොසන්ති පරිභාසන්ති අත්තරූපාය පරිභාසාය පරිපුණ්ණාය නො අපරිපුණ්ණායා?ති".

---

1. පටිවසන්ති – සිමු.
2. පාසාදච්ඡායායං – කම්.
3. සම්මුඛා – ස්‍යා කම්.

# 4

# අග්ගඤ්ඤ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී:

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර නිසා **මිගාරමාතුපාසාද** නම් වූ **පූර්වාරාමයෙහි** වැඩ වසන සේක. එ සමයෙහි **වාශිෂ්ඨ භාරද්වාජ** යන **හෙරණ** දෙනම භික්ෂුභාවය (උපසපුව) පතන්නාහු භික්ෂූන් කෙරෙහි පිරිවෙසෙත්, එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පලසමවතින් නැගී සිටිසේක්. පහයෙන් බැස, පහය ඉදිරියෙහි සෙවණෙහි එළිමහනෙහි සක්මන් කරන සේක. වාශිෂ්ඨ හෙරණ තෙම, සවස් වේලෙහිපලසමවතින් නැගී සිට පහයෙන් බැස, පහය ඉදිරියෙහි සෙවණැ එළිමහනෙහි සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේ දිටී. දැක භාරවාජ හෙරණහු බණවා, 'ඇවැත්නි,භාරවාජයෙනි, මේ භාග්‍යවතුන් වහන්සේ සවස් වේලේ පලසමවතින් නැගී සිට පහයෙන් බැස, පහය ඉදිරියෙහි සෙවණැ එළිමහනෙහි සක්මන් කරන සේක. ඇවැත්නි, භාරවාජයෙනි, එමු. භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹෙන්නමු. භාග්‍යවතුන් වහන්සේ වෙතින් ධර්ම කථාවක් අසන්නට ලබන්නමෝ නම් ඉතා යෙහෙකැ'යි කී ය. 'එසේ ය, ඇවත්නි''යි කියා ම භාරද්වාජ තෙම වාශිෂ්ඨයාට පිළිවදන් දුන. ඉක්බිති වාශිෂ්ඨ භාරද්වාජ දෙ නම භාග්‍යවතුන් වහන්සේ කරා ගියහ. ගොස් ඔබ වැඳ, සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේ අනුව සක්මන් කළහ.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වාශිෂ්ඨයා බණවා, 'වාශිෂ්ඨයෙනි, තෙපි වූ කලි බ්‍රාහ්මණජාතික වූ බ්‍රාහ්මණයන් අතුරෙහි කුලසම්පන්න වූ බ්‍රාහ්මණ කුලය හැර ගිහිගෙන් නික්ම සසුන් වන්නෝ වහු. කිමෙක් ද වාශිෂ්ඨයෙනි, තොපට බ්‍රාහ්මණයෝ ආක්‍රොශ නො කෙරෙත් ද? පරිභව නො කෙරෙත් ද?'යි අසා වදළ සේක.

'වහන්ස, එකාන්තයෙන් ම බ්‍රාහ්මණයෝ අපරිපූර්ණ නො වූ (අතර නොනැවැති) පරිපූර්ණවූ (නිරතුරු වූ) තමනට හුරු වූ පරිභව වචනයෙන් අපට ආක්‍රොශ කෙරෙත්, පරිභව කෙරෙත්' යැ යි හේ කී ය.

'වාශිෂ්ඨයෙනි, අපරිපූර්ණ නොවූ පරිපූර්ණ ම වූ තමනට හුරු වූ පරිභව වචනයෙන් කෙසේ නම් තොපට බ්‍රාහ්මණයෝ ආක්‍රොශ පරිභව කෙරෙත් ද?' යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක.

බ්‍රාහ්මණා භන්තෙ එවමාහංසු: "බ්‍රාහ්මණො'ව සෙට්ඨො වණ්ණො හීනො අඤ්ඤො වණ්ණො බ්‍රාහ්මණො'ව සුක්කො වණ්ණො, කණ්හො අඤ්ඤො වණ්ණො[1]. බ්‍රාහ්මණා'ව සුජ්ඣන්ති නො අබ්‍රාහ්මණා බ්‍රාහ්මණා ව බ්‍රහ්මුනො පුත්තා ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාද. තෙ තුම්හෙ සෙට්ඨං වණ්ණං හිත්වා හීනමත්ථ වණ්ණං අජ්ඣුපගතා, යදිදං මුණ්ඩකෙ සමණකෙ ඉබ්භෙ කණ්හෙ බන්ධුපාදපච්චෙ. තයිදං න සාධු, තයිදං නප්පතිරූපං, යං තුම්හෙ සෙට්ඨං වණ්ණං හිත්වා හීනමත්ථ වණ්ණං අජ්ඣුපගතා, යදිදං මුණ්ඩකෙ සමණකෙ ඉබ්භෙ කණ්හෙ බන්ධුපාද-පච්චෙ"ති. එවං ඛො නො භන්තෙ බ්‍රාහ්මණා අක්කොසන්ති පරිභාසන්ති අත්තරූපාය පරිභාසාය පරිපුණ්ණාය නො අපරිපුණ්ණායා"ති.

"තග්ඝ වො වාසෙට්ඨා බ්‍රාහ්මණා පොරාණං අස්සරන්තා එවමාහංසු: බ්‍රාහ්මණො'ව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො, බ්‍රාහ්මණො ව සුක්කො වණ්ණො, කණ්හො අඤ්ඤො වණ්ණො, බ්‍රාහ්මණා'ව සුජ්ඣන්ති නො අබ්‍රාහ්මණා, බ්‍රාහ්මණා'ව බ්‍රහ්මුනො පුත්තා ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාද"ති. දිස්සන්ති ඛො පන වාසෙට්ඨා බ්‍රාහ්මණානං බ්‍රාහ්මණියො උතුනියො'පි ගබ්භිනියො'පි විජායමානා'පි පායමානා'පි. තෙ ච බ්‍රාහ්මණා යොනිජා'ව සමානා එවමාහංසු: බ්‍රාහ්ම-ණො'ව සෙට්ඨො වණ්ණො –පෙ– පුත්තා ඔරසා –පෙ– බ්‍රහ්මදායාද"ති. තෙ ච බ්‍රහ්මානඤ්ඤෙව අබ්භාචික්ඛන්ති මුසා ච භාසන්ති බහුඤ්ච අපුඤ්ඤං පසවන්ති.

## චාතුවණ්ණසුද්ධි

3. චත්තාරො'මෙ වාසෙට්ඨ වණ්ණා, ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා. ඛත්තියො'පි ඛො වාසෙට්ඨා ඉධෙකච්චො පාණාතිපාතී හොති අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුණවාචො ඵරුසවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලූ බ්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨී. ඉති ඛො වාසෙට්ඨ යෙ' මෙ ධම්මා අකුසලා අකුසලසඞ්ඛාතා සාවජ්ජා සාවජ්ජසඞ්ඛාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසඞ්ඛාතා න අලමරියා න අලමරියසඞ්ඛාතා, කණ්හා කණ්හවිපාකා විඤ්ඤුගරහිතා, ඛත්තියෙ පි තෙ ඉධෙකච්චෙ සන්දිස්සන්ති. බ්‍රාහ්මණෙ පි ඛො වාසෙට්ඨ –පෙ– වෙස්සෙ පි ඛො වාසෙට්ඨ –පෙ– සුද්දෙ පි ඛො වාසෙට්ඨ ඉධෙකච්චො පාණාතිපාතී හොති අදින්නාදායී –පෙ– මිච්ඡාදිට්ඨී. ඉති ඛො වාසෙට්ඨ යෙ' මෙ ධම්මා අකුසලා අකුසල-සඞ්ඛාතා –පෙ– කණ්හා කණ්හවිපාකා විඤ්ඤුගරහිතා, සුද්දෙ පි තෙ ඉධෙකච්චෙ සන්දිස්සන්ති.

---

1. කණ්හො අඤ්ඤො වණ්ණො–PTS.

“වහන්ස, ‘බ්‍රාහ්මණ වර්ණය ම ශ්‍රේෂ්ඨ ය, අන්‍ය වර්ණයෝ පහත් හ. බ්‍රාහ්මණවංශය ම ශුක්ලවර්ණ ය, ඉතිරි තුන් වංශයෝ ම කෘෂ්ණවර්ණ හ. බ්‍රාහ්මණයෝ ම ශුඬ වෙත්. බ්‍රාහ්මණ නොවූවෝ ශුඬ නොවෙත්. බ්‍රාහ්මණයෝ ම බඹහුගේ මුවින් බිහි වූ, බඹහු ගෙන් උපන්, බඹහු විසින් මවන ලද, (වේද-වේදඬගාදි) බඹහුගේ දෑවැද්දට උරුම කරු වූ, බඹහු ගේ ඖරස පුත්‍රයෝ ය. ඒ තෙපි ශ්‍රේෂ්ඨ වර්ණය හැරදමා, ගැහැවි වූ කලු වූ මාරපාක්ෂික වූ, බඹහුගේ පයින් උපන් මුඬු මහණුන් වූ හීන වර්ණයකට බටුවෝ වහු. ශ්‍රේෂ්ඨ වර්ණය හැරලා ගැහැවි වූ කලු වූ මාරපාක්ෂික වූ බඹහුගේ පයින් උපන් මුඬුමහණුන් වූ හීන වර්ණයකට පැමිණියහු ය යන යමෙක් ඇද්ද, එය නො මැනව, එය නො සුදුසු යැ’ යි, වහන්ස, මෙසේ අපරිපූර්ණ නො වූ, පරිපූර්ණ ම වූ, තමනට හුරුවූ ගැරහුම් බසින් අපට ආක්‍රොශ කෙරෙත්, පරිභව කෙරෙත්” යැ යි වාශිෂ්ඨ තෙම කී ය.

‘වාශිෂ්ඨයෙනි, බ්‍රාහ්මණයෝ එකාන්තයෙන් ම පූරාණ කථාව (ලෝකෝත්පත්තිචර්යාවංශය) සිහි නො කරන්නාහු, ‘බ්‍රාහ්මණයෝ ම ශ්‍රේෂ්ඨ වර්ණය ය, අන් වර්ණයෝ හීනයහ, බ්‍රාහ්මණයෝ ම ශුක්ල වර්ණය ය, අන්‍ය වර්ණයෝ කෘෂ්ණයහ අබ්‍රාහ්මණයෝ නො ව බ්‍රාහ්මණයෝ ම ශුඬ වෙත්, බ්‍රාහ්මණයෝ ම බ්‍රාහ්මයාගේ මුඛයෙන් බිහි වූ, බ්‍රහ්මයාගෙන් උපන් බ්‍රාහ්මයා විසින් මවන ලද, බ්‍රහ්මයාගේ දයාද වූ, බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රයෝ’ යි කියත්. වාශිෂ්ඨයෙනි, බ්‍රාහ්මණයන් ගේ ඹසප් වූ ද, ගැබිනි වූ ද, වදන්නාවූ ද, (දරුවනට) කිරි පොවන්නාවූ ද බැමිණියෝ දක්නා ලැබෙත්. ඒ බමුණෝ යෝනියෙන් උපන්නෝ වන්නාහු බ්‍රාහ්මණවර්ණය ම ශ්‍රේෂ්ඨ ය... බ්‍රහ්මයෝ ම බ්‍රහ්මයාගේ දයාද වූ බ්‍රහ්මයාගේ ඖරසපුත්‍රයෝ යැ යි මෙසේ කියත්. එසේ කියන්නාහු බ්‍රහ්මයාට ම නිඥ කෙරෙත්, මුසවා තෙපලත්, බොහෝ අකුසල් ද රැස් කෙරෙත්.

3. වාශිෂ්ඨයෙනි, ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර යැ යි මේ වර්ණ සතරෙකි. වාශිෂ්ඨයෙනි, මෙහි එක්තරා ක්ෂත්‍රියයෙක් ද පණිවා කරන සුලු වෙයි නොදුන් දෑ ගන්නා සුලු වෙයි. කාමයන්හි වරදවා හැසිරෙන සුලු වෙයි. මුසවා බණන සුලු වෙයි. පෙහෙසුන් තෙප්ලන සුලු වෙයි. පරොස් බස් කියන සුලු වෙයි. සම්ඵප්‍රලාප දෙඩන සුලු වෙයි. අභිධ්‍යා බහුල වෙයි. ව්‍යාපාදයට පැමිණි සිතැත්තේ වෙයි. මිසදිට ගත්තෙක් වෙයි. වාශිෂ්ඨයෙනි, මෙසේ අකුසල් යැයි කියන ලද, අකුසල් ම වූ, වරද සහිත යැ යි කියන ලද, වරද සහිත ම වූ, නොසෙවියැ යුතු යැ යි කියන ලද, නොසෙ-වියැයුතු ම වූ, ආර්යභාවයට නොපොහොසත් යැ යි කියන ලද, ආර්යභාවය සිදු කිරීමෙහි නො පොහොසත් ම වූ, කෘෂ්ණවිපාක ඇති, කෘෂ්ණම වූ, නුවණැත්තන් විසින් ගරහන ලද, යම් පාප ධර්ම කෙනෙක් වෙත් ද, ඒ ඇතැම් ලාමක ධර්මයෝ මෙහි ක්ෂත්‍රියයා කෙරෙහි ද දක්නා ලැබෙත්, ... බ්‍රාහ්මණයා කෙරෙහි ද දක්නා ලැබෙත්. වෛශ්‍යයා කෙරෙහි ද දක්නා ලැබෙත්... ශුද්‍රයා කෙරෙහි ද දක්නා ලැබෙත්.

ඛත්තියො පි ඛො වාසෙට්ඨ ඉධෙකච්චො පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදානා පටිවිරතො, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො, මුසාවාදා පටිවිරතො, පිසුණාය වාචාය පටිවිරතො, ඵරුසාය වාචාය පටිවිරතො, සම්ඵප්පලාපා පටිවිරතො, අනභිජ්ඣාලු අබ්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨි. ඉති ඛො වාසෙට්ඨ යෙ' මෙ ධම්මා කුසලා කුසලසඞ්ඛාතා අනවජ්ජා අනවජ්ජසඞ්ඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසඞ්ඛාතා අලමරියා අලමරිය-සඞ්ඛාතා සුක්කා සුක්කවිපාකා විඤ්ඤුප්පසත්ථා, ඛත්තියෙ පි තෙ වාසෙට්ඨ ඉධෙකච්චෙ සන්දිස්සන්ති.

බ්‍රාහ්මණො පි ඛො වාසෙට්ඨ -පෙ- වෙස්සො පි ඛො වාසෙට්ඨ-පෙ- සුද්දො පි ඛො වාසෙට්ඨ ඉධෙකච්චො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- අනභිජ්ඣාලු අබ්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨි. ඉති ඛො වාසෙට්ඨ යෙ'මෙ ධම්මා කුසලා කුසලසඞ්ඛාතා අනවජ්ජා අනවජ්ජසඞ්ඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසඞ්ඛාතා අලමරියා අලමරියසඞ්ඛාතා සුක්කා සුක්කවිපාකා විඤ්ඤුප්පසත්ථා,[1] සුද්දෙපි තෙ ඉධෙකච්චෙ සන්දිස්සන්ති.

ඉමෙසු ඛො වාසෙට්ඨ චතූසු වණ්ණෙසු එවං උභයවොකිණ්ණෙසු වත්තමානෙසු කණ්හසුක්කෙසු ධම්මෙසු විඤ්ඤුගරහිතෙසු චෙව විඤ්ඤුප්පසත්ථෙසු ච. යදෙත්ථ බ්‍රාහ්මණා එවමාහංසු; බ්‍රාහ්මණො'ව සෙට්ඨො වණ්ණො හීනො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණො'ව සුක්කො වණ්ණො කණ්හො අඤ්ඤො වණ්ණො, බ්‍රාහ්මණා'ව සුජ්ඣන්ති නො අබ්‍රාහ්මණා, බ්‍රාහ්මණා'ව බ්‍රහ්මුනො පුත්තා ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාදා''ති, තං තෙසං විඤ්ඤූ නානුජානන්ති. තං කිස්ස හෙතු? ඉමෙසං හි වාසෙට්ඨ චතුන්නං වණ්ණානං යො හොති භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තො, සො තෙසං[2] අග්ගමක්ඛායති. ධම්මෙනෙව නො අධම්මෙන. ධම්මො හි වාසෙට්ඨ සෙට්ඨො ජනෙතස්මිං දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායෙච[3].

---

1. විඤ්ඤුප්පසත්ථා (සයා)
2. තෙසං. PTS
3. අභිසම්පරායඤ්ච. (මජසං PTS)

වාශිෂ්ඨයෙනි, මෙහි ඇතැම් ක්ෂත්‍රියයෙක් ද පණිවායෙන් වැළැක්කේ වෙයි. අයිනාදනින් වැළැක්කේ වෙයි, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළැක්කේ වෙයි, මුසවායෙන් වැළැක්කේ වෙයි, පෙහෙසුන් තෙප්ලෙන් වැළැක්කේ වෙයි, පරොස් බසින් වැළැක්කේ වෙයි, සම්ඵප්‍රලාපයෙන් වැළැක්කේ වෙයි, අභිධ්‍යා නැත්තේ වෙයි, ව්‍යාපාදසහිත සිත් නැත්තේ වෙයි, සම්දිටු ගත්තේ වෙයි. වාශිෂ්ඨයෙනි, මෙසේ කුශල යැ යි කියන ලද කුසල් ම වූ, වරද රහිත යැ යි කියන ලද, වරද රහිත ම වූ, සෙවියැ යුතු යැ යි කියන ලද සෙවියැ යුතු ම වූ, ආර්යභාවය සිද්ධ කිරීමෙහි පොහොසත් යැ යි කියන ලද, ආර්යභාවය සිද්ධ කිරීමෙහි පොහොසත් ම වූ ශුක්ලවිපාක ඇති, ශුක්ල ම වූ, නුවණැත්තන් විසින් පසස්නා ලද යම් ධර්ම කෙනෙක් වෙත් ද, ඒ ඇතැම් දහම්හු මෙහි ක්ෂත්‍රියයා කෙරෙහි ද දක්නා ලැබෙත්.

වාශිෂ්ඨයෙනි,මෙහි බ්‍රාහ්මණයා ද...වෛශ්‍යයා ද...ශුද්‍රයා ද පණිවායෙන් වැළැක්කේ වෙයි, අයිනාදනින් වැළැක්කේ වෙයි. කාමමිථ්‍යාචාරයෙන් වැළැක්කේ වෙයි, මුසවායෙන් වැළැක්කේ වෙයි, පෙහෙසුන් තෙප්ලෙන් වැළැක්කේ වෙයි, පරොස් බසින් වැළැක්කේ වෙයි, සම්ඵප්‍රලාපයෙන් වැළැක්කේ වෙයි, අභිධ්‍යා නැත්තේ වෙයි, ව්‍යාපාද, සහිත සිත් නැත්තේ වෙයි, සම්දිටු ගත්තේ වෙයි. වාශිෂ්ඨයෙනි, මෙසේ කුසල් යැ යි කියන ලද, කුසල් ම වූ, වරද රහිත යැ යි කියන ලද වරද රහිත ම වූ, සෙවියැ යුතු යැ යි කියන ලද සෙවියැ යුතු ම වූ, ආර්යභාවය සිද්ධ කිරීමෙහි පොහොසත් යැ යි කියන ලද, ආර්යභාවය සිද්ධ කිරීමෙහි පොහොසත් ම වූ, ශුක්ලවිපාක ඇති, ශුක්ල ම වූ, නුවණැත්තන් විසින් පසස්නා ලද යම් ධර්ම කෙනෙක් වෙත් ද, ඒ ඇතැම් දහම්හු මෙහි බ්‍රාහ්මණයා කෙරෙහි ද, ... වෛශ්‍යයා කෙරෙහි ද ශුද්‍රයා කෙරෙහි ද දක්නා ලැබෙත්.

වාශිෂ්ඨයෙනි, මේ සතර වර්ණයන් මෙසේ නුවණැත්තන් විසින් ගරහන ලද දහම්හි ද නුවණැත්තන් විසින් පසස්නා ලද දහම්හි ද, කෘෂ්ණ ධර්මයන්හි ද ශුක්ලධර්මයන් හි ද යි මෙසේ කුශලාකුශල යන විවිධ ධර්මයන්ගෙන් ම මිශ්‍ර ව පවත්නා කල්හි, බ්‍රාහ්මණවර්ණය ම ශ්‍රෙෂ්ඨ යැ යි ඉතර වර්ණයෝ හීනහ යි, බ්‍රාහ්මණවර්ණය ම සුද්ධ යැ යි, සෙසු වර්ණයෝ කලු හ යි, බ්‍රාහ්මණයෝ ම ශුධ වෙත් යැ යි බ්‍රාහ්මණ නොවූවෝ ශුධ නො වෙත් යැ යි, බ්‍රාහ්මණයෝ ම බ්‍රහ්මයාගෙන් උපන්, බ්‍රහ්මයා විසින් මවන ලද, බ්‍රහ්මදායාද වූ, බ්‍රහ්මයාගේ මුවින් උපන් ඖරස පුත්‍රයෝ හ යි යම් වචනයක් කියත් ද, ඔවුන්ගේ ඒ වචනය නුවණැත්තෝ නො අනුදනිත්. ඒ කවර හෙයින? යත්: වාශිෂ්ඨයෙනි, මේ සතර වර්ණ අතුරෙන් කවරකට අයත් වුව ද යම් මහණෙක් රහත් ද, ක්ෂීණාස්‍රව ද, වුසු මඟ බඹසර ඇත්තේ ද, කොට නිමි කටයුතු ඇත්තේ ද, පැමිණි ස්වාර්ථය (රහත් බව) ඇත්තේ ද, හැම ලෙසින් නැසූ භවබන්ධන ඇත්තේ ද, මොනොවට දැන මිදුණේ ද, හෙ තෙමේ ඒ හැම දෙනා අතුරෙහි අග්‍ර යැ යි කියනු ලැබේ. ඒ ද අධර්මයෙන් නොව ධර්මයෙන් ම ය. වාශිෂ්ඨයෙනි, ධර්මය ම සත්මුළුයෙහි මෙ ලොව්හි ද පරලොව්හි ද ශ්‍රෙෂ්ඨ ය. එහෙයිනි,

4. තදමිනාපෙතං වාසෙට්ඨා පරියායෙන වෙදිතබ්බං යථා ධම්මොව සෙට්ඨො ජනෙතස්මිං දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායෙ[1]ච. ජානාති ඛො පන වාසෙට්ඨා රාජා පසෙනදී කොසලො "සමණො ගොතමො අනුත්තරො සක්‍යකුලා පබ්බජිතො"ති. සක්‍යා ඛො පන වාසෙට්ඨා රඤ්ඤො පසෙනදිනො කොසලස්ස අනන්තරා අනුයුත්තා භවන්ති. කරොන්ති ඛො වාසෙට්ඨා සක්‍යා රඤ්ඤො පසෙනදිම්හි කොසලෙ නිපච්චකාරං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං. ඉති ඛො වාසෙට්ඨා යං කරොන්ති සක්‍යා රඤ්ඤො පසෙනදිම්හි කොසලෙ නිපච්චකාරං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං, කරොති තං රාජා පසෙනදී කොසලො තථාගතෙ නිපච්චකාරං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං. නත්ථු[2] 'සුජාතො සමණො ගොතමො, දුජ්ජාතො[3]'හමස්මි, බලවා සමණො ගොතමො දුබ්බලො'හමස්මි, පාසාදිකො සමණො ගොතමො දුබ්බණ්ණො' හමස්මි, මහෙසක්ඛො සමණො ගොතමො, අප්පෙසක්ඛො' හමස්මී"ති. අථ ඛො තං ධම්මං යෙව සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං මානෙන්තො ධම්මං පූජෙන්තො ධම්මං අපචායමානො එවං රාජා පසෙනදී කොසලො තථාගතෙ නිපච්චකාරං කරොති අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං. ඉමිනා'පි ඛො එතං වාසෙට්ඨා පරියායෙන වෙදිතබ්බං යථා ධම්මො'ව සෙට්ඨො ජනෙ'තස්මිං දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායෙ'ච. තුම්හෙ ඛ්වත්ථ වාසෙට්ඨා නානාජච්චා නානානාමා නානාගොත්තා නානාකුලා අගාරස්මා අනගාරියං පබ්බජිතා. 'කෙ තුම්හෙ?'ති පුට්ඨා සමානා, 'සමණා සක්‍යපුත්තියම්හා'ති පටිජානාථ. යස්ස ඛො පනස්ස වාසෙට්ඨා තථාගතෙ සද්ධා නිවිට්ඨා මූලජාතා පතිට්ඨිතා දළ්හා අසංහාරියා[4] සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං, තස්සෙතං කල්ලං වචනාය: භගවතො'ම්හි පුත්තො ඔරසො මුඛතො ජාතො ධම්මජො ධම්මනිම්මිතො ධම්මදායාදො'ති. තං කිස්ස හෙතු? තථාගතස්ස හෙතං වාසෙට්ඨා අධිවචනං ධම්මකායො ඉති පි, බ්‍රහ්මකායො ඉති පි, ධම්මභූතො ඉති පි, බ්‍රහ්මභූතො ඉති පි.

---

1. අභිසම්පරායංච (මජසං. සිමු)
2. නනං. මජසං
3. දුජ්ජාතො. සයා
4. අසංහාරිකා PTS

4. වාශිෂ්ඨයෙනි, මෙ ලොවෙහි ද, පර ලොවෙහි ද ජන මුළුයෙහි ධර්මය ම ශ්‍රෙෂ්ඨ වන නියා මේ කරුණින් ද දත යුතු. වාශිෂ්ඨයෙනි, 'මහණ ගොයුම් ශාක්‍යකුලයෙන් නික්මැ පැවිදි වූ නිරුත්තර කෙනෙකැ' යි පසේනදී කොසොල් රජ දනී. වාශිෂ්ඨයෙනි, ශාක්‍යයෝ වනාහි පසේනදී කොසොල් රජුහට අතරක් නැති (කුලවංශයෙන් සමාන වූ) ඔහු අනුව යන්නෝ වෙත්. වාශිෂ්ඨයෙනි, ශාක්‍යයෝ පසේනදී කොසොල් රජු කෙරෙහි ආදරය දක්වීම ද වැඳීම ද දක නැඟීසිටීම ද ඇඳිලිබැඳීම ද (දක මගින් ඉවත් වීම් ආදි) වත් දක්වීම ද කෙරෙත්. වාශිෂ්ඨයෙනි, මෙසේ ශාක්‍යයෝ පසේනදී කොසොල් රජු කෙරෙහි ආදරය ද වැඳීම ද දැක නැඟී සිටීම ද ඇඳිලිබැඳීමද වත් දක්වීම ද යන යමක් කෙරෙත් ද, පසේනදී කොසොල් රජ තෙම තථාගතයන් කෙරෙහි ඒ ආදර දක්වීම ද වැඳීම ද දක අස්නෙන් නැඟීසිටීම ද ඇඳිලි බැඳීම ද වත් දක්වීම ද යන සියල්ල කෙරෙයි. 'මහණ ගොයුම් සුජාත ය, මම දුර්ජාතයෙමි'යි කියා හෝ 'මහණ ගොයුම් බලවත් ය, මම දුබුලිමි' යි කියා හෝ 'මහණ ගොයුම් දකුම් කලු ය, මම් දකුම් කලු නො වෙමි' යි කියා හෝ 'මහණගොයුම් මහායශස්ක ය, මම් අල්පයශස්ක වෙමි' යි කියා හෝ හෙ තෙමෙ එසේ නො කෙරෙයි. වැලි ධර්මයට ම සත්කාර කරනුයේ, ධර්මයට ම ගෞරව කරනුයේ, ධර්මයට ම බුහුමන් කරනුයේ, ධර්මය ම පුදනුයේ, ධර්මයට ම යටත් පැවැතුම් දක්වනුයේ, මෙසේ පසේනදී කොසොල් රජ තෙම තථාගතයන් කෙරෙහි ආදර දක්වීම ද වැඳීම ද දක හුනස්නෙන් නැඟී සිටීම ද ඇඳිලිබැඳීම ද වත් දක්වීම ද යන මෙ හැම කෙරෙයි. වාශිෂ්ඨයෙනි, මෙ කරුණිනුත් 'මේ ජන මුළුයෙහි දිටුදැමියෙහි ද පරලොවෙහි ද ධර්මය ම උතුම් වන නියා දත යුතු. වාශිෂ්ඨයෙනි, තෙපි වූ කලි නානා ජාතියට අයත් වන්නාහු නානා ගොත්‍රයට අයත් වන්නාහු, නානා කුලයට අයත් වන්නාහු ගිහිගෙන් නික්මැ සස්නැ පැවිදි වූහු ය. 'තෙපි කවුරු ද?' යි විචාරනු ලද්දහු ම 'අපි ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයම්හ' යි පිළිත කරවු. වාශිෂ්ඨයෙනි, තථාගතයන් කෙරෙහි යමකු ගේ සැදැහැව නොසැලී පිහිටියේද මුල්බැස ගෙන සිටියේද දඩි වූයේද එය මහණකු හෝ බමුණකු හෝ දෙවියකු හෝ මරකු හෝ බඹකු හෝ ලොවැ කිසි ද කෙනකු විසින් සෙලැවියැ හැකි නො වේ නම්, ඒ ආර්යශ්‍රාවකයා විසින් 'මම භාග්‍යවතුන් වහන්සේ ගේ මුවින් උපන් ධර්මයෙන් උපන් ධර්මයෙන් නිර්මිත වූ ධර්මයට දයාද වූ ඖරස (ළෙහිදු) පුත් වෙමි'යි ඔහු විසින් මෙ වචනය කියනු සුදුසු ය. ඒ කවර හෙයින් ද? යත්: වාශිෂ්ඨයෙනි, ධර්මකාය යනු ද බ්‍රහ්මකාය යනු ද ධර්මභූත යනු ද බ්‍රහ්මභූත යනු දැ යි මෙ හැම තථාගතයනට නම් ය. එ හෙයිනි.

5. හොති ඛො සො වාසෙට්ඨ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන අයං ලොකො සංවට්ටති. සංවට්ටමානෙ ලොකෙ යෙභුය්‍යෙන සත්තා ආභස්සරසංවත්තනිකා හොන්ති. තෙ තත්ථ හොන්ති මනොමයා පීතිභක්ඛා සයම්පභා අන්තලික්ඛචරා සුභට්ඨායිනො චිරං දීඝමද්ධානං තිට්ඨන්ති. හොති ඛො සො වාසෙට්ඨ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන අයං ලොකො විවට්ටති. විවට්ටමානෙ ලොකෙ යෙභුය්‍යෙන සත්තා ආභස්සරකායා චවිත්වා ඉත්ථත්තං ආගච්ඡන්ති. තෙ'ධ හොන්ති මනොමයා පීතිභක්ඛා සයම්පභා අන්තලික්ඛචරා සුභට්ඨායිනො, චිරං දීඝමද්ධානං තිට්ඨන්ති.

### රසපථවිපාතුභාවො

6. එකොදකීභූතං ඛො පන වාසෙට්ඨ තෙන සමයෙන හොති අන්ධකාරො අන්ධකාරතිමිසා. න චන්දිමසූරියා පඤ්ඤායන්ති, න නක්ඛත්තානි තාරකරූපානි පඤ්ඤායන්ති, න රත්තින්දිවා පඤ්ඤායන්ති, න මාසද්ධමාසා[1] පඤ්ඤායන්ති, න උතුසංවච්ඡරා පඤ්ඤායන්ති, න ඉත්ථිපුමා[2] පඤ්ඤායන්ති. සත්තා සත්තාත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. අථ ඛො තෙසං වාසෙට්ඨ සත්තානං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන රසා පථවී උදකස්මිං සමතානි[3] සෙය්‍යථාපි නාම පයසො[4] තත්තස්ස[5] නිබ්බායමානස්ස උපරි සන්තානකං හොති, එවමෙව ඛො සා පාතුරහොසි. සා අහොසි වණ්ණසම්පන්නා ගන්ධසම්පන්නා රසසම්පන්නා. සෙය්‍යථාපි නාම සම්පන්නං වා සප්පි සම්පන්නං වා නවනීතං, එවංවණ්ණා අහොසි, සෙය්‍යථාපි නාම ඛුද්දමධු[6] අනෙළකං[7] එවමස්සාදා අහොසි.

අථ ඛො වාසෙට්ඨ අඤ්ඤතරො සත්තො ලොලජාතිකො, 'අම්භො කිමෙවිදං භවිස්සතී'ති රසං පථවිං අඞ්ගුලියා සායි. තස්ස රසං පථවිං අඞ්ගුලියා සායතො අච්ඡාදෙසි, තණ්හා චස්ස[8] ඔක්කමි. අඤ්ඤෙ'පි ඛො වාසෙට්ඨ සත්තා තස්ස සත්තස්ස දිට්ඨානුගතිං ආපජ්ජමානා රසං පථවිං අඞ්ගුලියා සායිංසු. තෙසං රසං පථවිං අඞ්ගුලියා සායතං අච්ඡාදෙසි, තණ්හා ච තෙසං ඔක්කමි.

---

1. මාසද්ධමාසා - මජසං
2. න ඉත්ථිපුරිසා. ස්‍යා
3. සමතනි—මජසං, සමන්තානි. ස්‍යා
4. පායාසො (සී.)
5. තක්කස්ස (සීමු)
6. ඛුද්දං මධු—කම. ඛුද්දමධු—මජසං.
7. අනෙලකං—PTS.
8. පස්ස. ස්‍යා.

5. වාශිෂ්ඨයෙනි, දික් කලක් ඇවෑමෙන් කිසි යම් සමයෙක මෙ ලොව වැනැසෙන්නේ ද, එසේ වූ කාලයෙක් වෙයි. එසේ ලොව නැසෙන කල්හි සත්ත්වයෝ බෙහෙවින් ආභස්සර බඹලොවැ උපන්නාහු වෙති. ඔහු එහි ධ්‍යානචිත්තබලයෙන් උපන්නෝ වෙති, ප්‍රීතිය ම ආහාර කොටැත්තාහු වෙති, තුමූ ම (සිය සිරුරු පෙබෙන් බබලන්නාහු වෙති.) අහසින් යන්නාහු වෙති. සිත්කලු වස්ත්‍රාභරණ හැඳ පැලැඳ සිටින්නාහු වෙති. එහි ඔහු ඉතා බොහෝ කලක් සිටිත්. වාශිෂ්ඨයෙනි, දික් කලක් ඇවෑමෙන් කිසි සමයෙක මෙ ලොව හටගන්නේ ද, එසේ වූ කාලයෙක් වෙයි. ඒ ලොව හට ගන්නා සමයෙහි බෙහෙවින් සත්හු ආභස්සර බ්‍රහ්මනිකායයෙන් සැව මෙ මිනිසත් බවට පැමිණෙත්. ඔහු මෙහි ධ්‍යාන සිතින් උපන්නාහු, ප්‍රීතිය ම ආහාර කොටැත්තාහු, සිය සිරුරු පෙබෙන් බබළන්නාහු, අහසින් යන්නාහු, සිත්කලු වස්ත්‍රාභරණ ඇති වැ සිටින්නාහු ඉතා බොහෝ කලක් එසේ සිටිත්.

වාශිෂ්ඨයෙනි එ සමයෙහි සියලු සක්වළ එක් මැ දිය කඳෙක් වැ සිටියි. අඳුරෙක් මහ ගනඳුරෙන් ම වෙයි. සඳු හිරුහු නො පැනෙත්, නකත්හු තරුහු නො පැනෙත්. රෑ දවල්හු නො පැනෙත්, මාස පක්ෂයෝ නො පැනෙත්. ඍතු සංවත්සරයෝ නො පැනෙත්. ස්ත්‍රී පුරුෂයෝ නො පැනෙත්. සත්ත්වයෝ සත්ත්වයෝ යැ යි ම ව්‍යවහාරයට පැමිණෙත්. වාශිෂ්ඨයෙනි, ඉක්බිති යම්සේ තිවෙන්නාවූ හුණු කිරි මත්තෙහි යොදයෙක් වේ ද, එසේ ම රස පොළොව ඒ දිය මතුයෙහි සිසාරා පැතිරගෙන පහළ විය. එය වර්ණ සම්පන්න ද ගන්ධ සම්පන්න ද රස සම්පන්න ද විය. මනාකොට නිපැයුණු ගිතෙලෙක් හෝ වෙඬුරෙක් යම්බඳු වේ ද, ඒ රස පොළොව එබඳු පැහැ ඇත්තේ ද විය. නිදෙස් වූ (පිළවුන් නැති) දඬුවැල්බැ මීවදයෙක් යම් බඳු වේ ද, ඒ රස පොළොවේ රසය ද එබඳු විය.

වාශිෂ්ඨයෙනි, එක්තරා ලෝල ස්වභාවය ඇති සත්ත්වයෙක් භවත්නි, මේ කුමක් විය යුතු ද?'යි රස පොළොව මදක් ඇඟිල්ලෙන් ගෙන දිවැ ගැයේ ය. රස පොළොව ඇඟිල්ලෙන් මදක් ගෙන දිවැ ගෑ ඔහුට එය ප්‍රිය විය. එහි තෘෂ්ණාව ද ඔහු සිතට බැස ගත.

## චන්දිමසුරියාදිපාතුභාවො

අථ ඛො තෙ වාසෙට්ඨා සත්තා රසං පඨවිං හත්ථෙහි ආලුප්පකාරකං උපක්කමිංසු පරිභුඤ්ජිතුං. යතො ඛො තෙ[1] වාසෙට්ඨා සත්තා රසං පඨවිං හත්ථෙහි ආලුප්පකාරකං උපක්කමිංසු පරිභුඤ්ජිතුං. අථ ඛො තෙසං වාසෙට්ඨා සත්තානං සයම්පභා අන්තරධායි. සයම්පභාය අන්තරහිතාය චන්දිමසුරියා පාතුරහෙසුං. චන්දිමසුරියෙසු පාතුභූතෙසු, නක්ඛත්තානි තාරකරූපානි පාතුරහෙසුං, රත්තින්දිවා පඤ්ඤායිංසු. රත්තින්දිවෙසු පඤ්ඤායමානෙසු, මාසද්ධමාසා පඤ්ඤායිංසු. මාසද්ධමාසෙසු පඤ්ඤායමානෙසු උතුසංවච්ඡරා පඤ්ඤායිංසු. එත්තාවතා ඛො වාසෙට්ඨා අයං ලොකො පුන විවට්ටො හොති.

7. අථ ඛො තෙ වාසෙට්ඨා සත්තා රසං පඨවිං පරිභුඤ්ජන්තා තම්භක්ඛා[2] තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨංසු. යථා යථා ඛො තෙ වාසෙට්ඨා සත්තා රසං පඨවිං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨංසු, තථා තථා තෙසං වාසෙට්ඨා සත්තානං රසං පඨවිං පරිභුඤ්ජන්තානං ඛරත්තඤ්චෙව කායස්මිං ඔක්කමි, වණ්ණවෙවණ්ණතා[3] ච පඤ්ඤායිත්ථ. එකිදං සත්තා වණ්ණවන්තා හොන්ති, එකිදං සත්තා දුබ්බණ්ණා. තත්ථ යෙ තෙ සත්තා වණ්ණවන්තා, තෙ දුබ්බණ්ණෙ සත්තෙ අතිමඤ්ඤන්ති. 'මයමෙතෙහි වණ්ණවන්තතරා, අම්හෙහෙතෙ දුබ්බණ්ණතරා'ති. තෙසං වණ්ණාතිමානපච්චයා මානාතිමානජාතිකානං රසා පඨවී අන්තරධායි. රසාය පඨවියා අන්තරහිතාය සන්නිපතිංසු, සන්නිපතිත්වා අනුත්ථුනිංසු අහොරසං අහොරසන්ති. තදෙතරහි පි මනුස්සා කිඤ්චිදෙව සුරසං[4] ලභිත්වා එවමාහංසු අහොරසං අහොරසන්ති. තදෙව පොරාණං අග්ගඤ්ඤං අක්ඛරං අනුසරන්ති නත්වෙවස්ස අත්ථං ආජානන්ති.

1. යතො ඛො වාසෙට්ඨ (සීමු)
2. තම්භක්ඛා—ස්‍යා.
3. වණ්ණවෙවණ්ණතා ච—කෙසුචි
4. සාධුරසං—ස්‍යා.-PTS.

වාශිෂ්ඨයෙනි, අන් සත්හු ද ඒ සත්‍වයා ගේ දෘෂ්ටානුගතියට පැමිණෙන්නාහු (ඒ සත්‍වයා කළ දෑ දක එය අනුගමනය කරන්නාහු) රසපොළොව ඇඟිල්ලෙන් ගෙන ලෙවූ කැහ. රස පොළොව ඇඟිල්ලෙන් ගෙන ලෙවූ කන ඔවුනට එය ප්‍රිය විය. එය කෙරෙහි තෘෂ්ණාව ද ඔවුන් සිතට බැස ගත. වාශිෂ්ඨයෙනි, එකල්හි ඒ සත්හු රස පොළොව පිඩු කොට කඩාගෙන වළඳන්නට පටන්ගත්හ. වාශිෂ්ඨයෙනි, එසේ කරන කල්හි ඒ සත්‍වයන්ගේ ස්‍වයම්ප්‍රභාව අතුරුදහන් විය. එය අතුරුදහන් වූ පසු සඳ හිරුහු ප්‍රකට වූහ. සඳු හිරුන් ප්‍රකට වූ පසු තාකත් තරුහු ප්‍රකට වූහ. රෑ දවල් පැනුණහ. රෑ දවල් පැනෙන කල්හි මාස පක්ෂයෝ පැනුණහ. මාසපක්ෂයන් පැනෙන කල්හි සෘතු සංවත්සරයෝ පහළ වූහ. වාශිෂ්ඨයෙනි, මෙ තෙකින් මෙ ලොව යළි දු පහළ වූයේ වෙයි.

7. වාශිෂ්ඨයෙනි, එ කල්හි, ඒ සත්‍වයෝ රසපොළොව පරිභොග කරන්නාහු, එය වළඳන්නාහු, එය ම ආහාර කොටැත්තාහු බොහෝ දික් කලක් සිටියාහ. වාශිෂ්ඨයෙනි, යම් යම් සේ ම ඒ සත්‍වයෝ රසපොළොව පරිභොග කරන්නාහු, එය වළඳන්නාහු, එය ම ආහාර කොට ඇත්තාහු ඉතා බොහෝ කලක් සිටියාහු ද, එසේ එසේ ම ඒ සතුන්ගේ සිරුරෙහි රළු බව ඇති විය, නො පැහැපත් බව පැනිණ. ඔවුන් අතුරෙහි ඇතැම් සත් කෙනෙක් පැහැපත් ද ඇතැම් සත් කෙනෙක් නො පැහැපත් ද වෙත්. ඔවුන් අතුරෙන් යම් කෙනෙක් පැහැපත් වූහු ද, ඔහු අපි මොවුනට වඩා පැහැපත්තම්හ මොහු අපට වඩා පැහැයෙන් අඩුහ'යි නොපැහැපත්තන් ඉක්මැ සිතත් (පහත් කොට සලකත්). වර්‍ණාතිමාන හෙතුයෙන් මානාති මාන ස්වභාවය ඇති ඔවුන්ගේ ඒ රස පොළොව අතුරුදහන් විය. රස පොළොව අතුරුදහන් වූ කල්හි, ඔහු එක් රැස්වූහ. එක්රැස් වැ 'අහෝ පෘථිවි රස ය, අහෝ පෘථිවි රසයැ' යි පුනපුනා කීහ. අද ද මිනිස්සු මනාප රසයක් ලැබ, 'අහෝ රස ය, අහෝ රස යැ' යි මෙසේ කියත්. ඒ පැරැණි ලොකොත්පත්ති වංශකථාව අනුව යෙත්. එහෙත් එහි අරුත් නො දනිත්.

## භූමිපප්පටකපාතුභාවො

8. අථ ඛො තෙසං වාසෙට්ඨා සත්තානං රසාය පථවියා අන්තරහිතාය භූමිපප්පටකො[1] පාතුරහොසි. සෙය්‍යථාපි නාම අහිච්ඡත්තකො එවමෙව පාතුරහොසි. සො අහොසි වණ්ණසම්පන්නො ගන්ධසම්පන්නො රසසම්පන්නො. සෙය්‍යථාපි නාම සම්පන්නං වා සප්පි සම්පන්නං වා නවනීතං එවංවණ්ණො අහොසි. සෙය්‍යථාපි නාම ඛුද්දමධු අනෙළකං එවමස්සාදො අහොසි.

අථ ඛො තෙ වාසෙට්ඨා සත්තා භූමිපප්පටකං උපක්කමිංසු පරිභුඤ්ජිතුං තෙ තං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨංසු. යථා යථා ඛො තෙ වාසෙට්ඨා සත්තා භූමිපප්පටකං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨංසු, තථා තථා තෙසං වාසෙට්ඨා සත්තානං භිය්‍යොසොමත්තාය ඛරත්තඤ්චෙව කායස්මිං ඔක්කමි, වණ්ණවෙවණ්ණතා ච පඤ්ඤායිත්ථ. එකිදං සත්තා වණ්ණවන්තො හොන්ති, එකිදං සත්තා දුබ්බණ්ණා. තත්ථ යෙ තෙ සත්තා වණ්ණවන්තො, තෙ දුබ්බණ්ණෙ සත්තෙ අතිමඤ්ඤන්ති මයමෙතෙහි වණ්ණවන්තතරා, අම්හෙහෙතෙ දුබ්බණ්ණතරා'ති, තෙසං වණ්ණාතිමානපච්චයා මානාතිමානජාතිකානං භූමිපප්පටකො අන්තරධායි.

## බදාලතාපාතුභාවො

9. භූමිපප්පටකෙ අන්තරහිතෙ බදාලතා[2] පාතුරහොසි. සෙය්‍යථාපි නාම කලම්බුකා,[3] එවමෙව පාතුරහොසි. සා අහොසි වණ්ණසම්පන්නා ගන්ධසම්පන්නා රසසම්පන්නා. සෙය්‍යථාපි නාම සම්පන්නං වා සප්පි සම්පන්නං වා නවනීතං, එවංවණ්ණා අහොසි. සෙය්‍යථාපි නාම ඛුද්දමධු අනෙළකං, එවමස්සාදා අහොසි. අථ ඛො තෙ වාසෙට්ඨා සත්තා බදාලතං උපක්කමිංසු පරිභුඤ්ජිතුං තෙ තං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨංසු. යථා යථා ඛො තෙ වාසෙට්ඨා සත්තා බදාලතං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨංසු, තථා තථා තෙසං වාසෙට්ඨා සත්තානං භිය්‍යොසොමත්තාය ඛරත්තඤ්චෙව කායස්මිං ඔක්කමි වණ්ණවෙවණ්ණතා ච[4] පඤ්ඤායිත්ථ. එකිදං සත්තා වණ්ණවන්තො හොන්ති, එකිදං සත්තා දුබ්බණ්ණා. තත්ථ යෙ තෙ සත්තා වණ්ණවන්තො, තෙ දුබ්බණ්ණෙ සත්තෙ අතිමඤ්ඤන්ති 'මයමෙතෙහි වණ්ණවන්තතරා, අම්හෙහෙතෙ දුබ්බණ්ණතරා'ති. තෙසං වණ්ණාතිමානපච්චයා මානාතිමානජාතිකානං බදාලතා අන්තරධායි. බදාලතාය අන්තරහිතාය සන්නිපතිංසු, සන්නිපතිත්වා අනුත්ථුනිංසු 'අහු වත නො, අහායි වත නො බදාලතා'ති. තදෙතරහිපි මනුස්සා කෙනචිදෙව දුක්ඛධම්මෙන ඵුට්ඨා එවමාහංසු: 'අහු වත නො, අහායි වත නො'ති. තදෙව පොරාණං අග්ගඤ්ඤං අක්ඛරං අනුසරන්ති[5], නත්වෙවස්ස අත්ථං ආජානන්ති.

1. භූමිපප්පාටිකා - සයා
2. පදලතා - මජසං
3. කලම්බකා-සයා.
4. වණ්ණවෙවජ්ජතා - මජසං
5. අනුපතන්ති PTS, අනුස්සරන්ති - සයා

වාශිෂ්ඨයෙනි, එ සමයෙහි ඒ සත්තට රස පොළොව අතුරුදන් වූ කල්හි, භූමිපප්පටකය (බිම් පප්පඩම්) පහළ වී ය. යම්සේ නාහතු පහළ වන්නේ ද, එ මෙන් ම එය පහළ විය. එය පැහැපත් ද සුවඳවත් ද රසවත් ද විය. මොනොවට නිපැයුණු ගිතෙල් යම් සේ ද, මොනොවට නිපැයුණු වෙඩරු යම් සේ ද, එය එබඳු පැහැ ඇත්තේ විය, පිළවුන් නැති දඬුවැල් බෑ මීය යම්සේ ද, එය එබඳු රස ඇත්තේ විය.

වාශිෂ්ඨයෙනි, එ කල්හි ඒ සත්හු භූමිපපීටකය වළඳන්නට පටන් ගත්හ. ඔහු එය පරිභොග කරන්නාහු එය වළඳන්නාහු එය අහර කොට ඇත්ත හු ඉතා දික් කලක් සිටියාහ. වාශිෂ්ඨයිනි, යම් යම්සේ ඒ සත්හු භූමිපපීටකය පරිභොග කරන්නාහු. එය වළඳන්නාහු, එය අහර කොටැත්තාහු, ඉතා බොහෝ කලක් සිටියාහු ද, එසේ එසේ ම බොහෝසෙයින් ඒ සතුන්ගේ කයෙහි රළු බව ද බැස ගත, පැහැය අඩු බවද පැනිණ. ඇතැම් සත් කෙනෙක් පැහැපත් වෙත්, ඇතැම් කෙනෙක් නො පැහැපත් වෙත්. ඔවුන් අතුරෙන් යම් සත් කෙනෙක් පැහැපත් වෙත් ද, ඔහු 'අපි මොවුනට වඩා පැහැපතතම්හ. මොහු අපට වඩා පැහැයෙන් අඩු හ'යි නො පැහැපත් සතුන් ඉක්මැ සිතත් (අවමන් කෙරෙත්). මානාතිමානය ස්වභාවය කොටැති ඔවුන්ගේ ඒ පැහැය නිසා ඇති වූ අතිමාන කාරණයෙන් භූමිපපීටකය අතුරුදහන් විය.

භූමිපපීටකය අතුරුදහන් වූ කල්හි බදලතාව පහළ විය. විල්පලා යම් සේ ද ඒ බදලතාව ද එසේ ම පහළ විය. එය පැහැපත් ද සුවඳවත්ද රසවත් ද විය. මොනොවට නිපැයුණු ගිතෙල් හෝ මොනොවට නිපැයුණු වෙඩරු යම් බඳු ද,එය එබඳු පැහැ ඇත්තේ විය.. පිළවුන් නැති දඬුවැල් බෑ මීයක් යම් බඳු ද එසේ ම එය මිහිරි රසැත්තේ විය. වාශිෂ්ඨයිනි, එකල්හි ඒ සත්හු බදලතාව වළඳන්නට පටන්ගත්හ. ඔහු එය පරිභොග කරන්නාහු, එය වළඳන්නාහු, එය ආහාර කොටැත්තාහු ඉතා බොහෝ කලක් සිටියාහ. වාශිෂ්ඨයිනි, යම් යම් සේ ම ඒ සත්වයෝ බදලතාව පරිභොග කරන්නාහු, එය වළඳන්නාහු, එය අහර කොටැත්තාහු, ඉතා බොහෝ කලක් සිටියාහු ද, එසේ එසේ ම බොහෝ සෙයින් ඒ සතුන්ගේ කයෙහි රළු බව ද ඇති විය. පැහැ අඩුබව ද පැනිණ. ඇතැම් සත් කෙනෙක් පැහැපත් වෙත්. ඇතැම් කෙනෙක් නොපැහැපත් වෙත්. ඔවුන් අතුරෙන් යම් සත් කෙනෙක් පැහැපත් වෙත් ද, ඔහු 'අපි මොවුනට වඩා පැහැපත් වම්හ, මොහු අපට වඩා පැහැයෙන් අඩු හ යි නොපැහැපත් සතුන් ඉක්මැ සිතත්. මානාතිමානජාතික වූ ඔවුන් ගේ වර්ණාතිම නප්‍රත්‍යය හෙයින් බදලතාව අතුරුදහන් විය. බදලතාව අතුරුදහන් වූ කලහි ඔහු එක්රැස් වූහ. එක් රැස් වැ (මිහිරි රසැති බදලතාව) අපට ඇති විය. එය දන් නැති වි යැ'යි පුනපුනා කීහ. දතුදු මිනිස්සු කිසි දුකෙකි. පැහැසුණාහු 'අපට ඇති විය, දන් නැති වී යැ'යි මෙසේ කියත්. ඒ පැරැණි වංශකථාව අනුව යෙත්. වැලිදු එහි අර්ථය නො දනිත්.

### අකට්ඨපාකසාලිපාතුභාවො

8. අථ ඛො තෙසං වාසෙට්ඨා සත්තානං බදලතාය අන්තරහිතාය අකට්ඨපාකො සාලි පාතුරහොසි අකණො අථුසො සුද්ධො සුගන්ධො තණ්ඩුලඵලො[1] යං තං සායං සායමාසාය ආහරන්ති. පාතො තං හොති පක්කං පටිවිරූළ්හං, යං තං පාතො පාතරාසාය ආහරන්ති. සායං තං හොති පක්කං පටිවිරූළ්හං, නාපදානං පඤ්ඤායති. අථ ඛො තෙ වාසෙට්ඨා සත්තා අකට්ඨපාකං සාලිං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨංසු.

### ලිඞ්ගපාතුභාවො

9. යථා යථා ඛො තෙ වාසෙට්ඨා සත්තා අකට්ඨපාකං සාලිං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨංසු, තථා තථා තෙසං වාසෙට්ඨා සත්තානං භිය්‍යොසොමත්තාය ඛරත්තඤ්චෙව කායස්මිං ඔක්කමි, වණ්ණවෙවණ්ණතා ච පඤ්ඤායිත්ථ. ඉත්ථියා ච ඉත්ථිලිඞ්ගං පාතුරහොසි, පුරිසස්ස ච පුරිසලිඞ්ගං. ඉත්ථී ච සුදං 'පුරිසං අතිවෙලං උපනිජ්ඣායති, පුරිසො ච ඉත්ථිං. තෙසං අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායතං සාරාගො උදපාදි, පරිළාහො කායස්මිං ඔක්කමි. තෙ පරිළාහපච්චයා මෙථුනං ධම්මං පටිසෙවිංසු. යෙ ඛො පන තෙ වාසෙට්ඨා තෙන සමයෙන සත්තා පස්සන්ති මෙථුනං ධම්මං පටිසෙවන්තෙ, අඤ්ඤෙ පංසුං ඛිපන්ති, අඤ්ඤෙ සෙට්ඨිං ඛිපන්ති, අඤ්ඤෙ ගොමයං ඛිපන්ති 'නස්ස වසලි නස්ස වසලි[2], කථං හි නාම සත්තො සත්තස්ස එවරූපං කරිස්සතී'ති. තදෙතරහි පි මනුස්සා එකච්චෙසු ජනපදෙසු වධුයා[3] නිබ්බුය්හමානාය[4] අඤ්ඤෙ පංසුං ඛිපන්ති, අඤ්ඤෙ සෙට්ඨිං ඛිපන්ති, අඤ්ඤෙ ගොමයං ඛිපන්ති. තදෙව පොරාණං අග්ගඤ්ඤං අක්ඛරං අනුසරන්ති, නත්වෙවස්ස අත්ථං ආජානන්ති.

### මෙථුනධම්මසමාචාරො

10. අධම්මසම්මතං ඛො[5] පන වාසෙට්ඨා යං තෙන සමයෙන හොති, තදෙතරහි ධම්මසම්මතං. යෙ ඛො පන වාසෙට්ඨා තෙන සමයෙන සත්තා මෙථුනං ධම්මං පටිසෙවන්ති, තෙමාසම්පි දෙමාසම්පි න ලභන්ති ගාමං වා නිගමං වා පවිසිතුං. යතො ඛො පන තෙ වාසෙට්ඨා සත්තා තස්මිං සමයෙ අසද්ධම්මෙ අතිවෙලං පාතබ්‍යතං ආපජ්ජිංසු, අථ ඛො අගාරානි උපක්කමිංසු කාතුං, තස්සෙව අසද්ධම්මස්ස පටිච්ඡාදනත්ථං.

---

1. තණ්ඩුලප්ඵලො—මජසං.
2. නස්ස අසුචි නස්ස අසුචි ති.—මජසං.
3. වඩ්ඪියා - සයා
4. නිවය්හමානාය, මජසං නිය්‍යමානාය—කම.
5. අධම්මසම්මතං තං ඛො—සයා.

8. වාශිෂ්ඨයෙනි, ඉක්බිත්තෙන් ඒ සත්නට බදලතාව අතුරුදහන් වූ කල්හි නොසෑ පොළොවෙහි හටගෙන පැසෙන, කුඩු නැති, දහවෙයියා නැති, සුවඳවත් සහල් ම ඵල කොට ඇති හැල් වෙසෙසෙක් පහළ විය, යම් සහලක් සවස් වේලෙහි සවස් බොජුනට ගෙනෙත් ද, පසු දින උදසනැ එය පැසුණේ යලි දු වැඩුණේ වෙයි. කපා නොගන්නා ලද තැනක් ව- (නොඅඩු ව) පැනෙයි. වාශිෂ්ඨයෙනි, එකල්හි ඒ සත්‍වයෝ නො සාන ලද බිමෙහි හටගෙන පැසුණු හැල්සහල් පරිභොග කරන්නාහු, එය ම වළඳන්- නාහු, එය ම ආහාර කොටැත්තාහු, ඉතා බොහෝ කලක් සිටියාහ.

9. වාශිෂ්ඨයෙනි, යම්සේ යම්සේ ඒ සත්හු නො සෑ බිමැ හටගෙන පැසුණු හැල්සහල් පරිභොග කරන්නාහු, එය ම වළඳන්නාහු, එය ම ආහාර කොටැත්තාහු, ඉතා බොහෝ කලක් සිටියාහු ද, එසේ එසේ ඒ සතුන්ගේ සිරුරෙහි බොහෝ සෙයින් රළුබව පහළ විය, නොපැහැපත් බවද පැනිණ. ස්ත්‍රියට ස්ත්‍රීලිංගය ද, පුරුෂයාට පුරුෂලිංගය ද පහළ විය. ස්ත්‍රී ද වූ කලී ඉතා බොහෝ වේලාවක් පුරුෂයා දෙස බලාඉඳී, පුරුෂයා ද ස්ත්‍රිය දෙස බොහෝ වේලා බලාඉඳී. මෙසේ ඉතා බොහෝ වේලා ඔවුනොවුන් දෙස බලා ඉන්නා ඔවුනට සරාගය පහළ විය. රාගපරිදාහය කයෙහි බැස ගත්තේ ය. ඔහු රාගපරිදාහ හේතුයෙන් මෙවුන්දම් සෙවූහ. වාශිෂ්ඨයෙනි, එ සමයෙහි යම් සත්‍ව කෙනෙක් මෙවුන්දම් සෙවූනාවුන් දකිත් ද ඒ අන්‍යයෝ 'වසලිය, නැසෙව, වසලිය, වැනැසෙව. කෙසේ නම් සතෙක් සතක්හට මෙබන්දක් කරන්නේ ද'' යි කියා, පස් දමාගසත්, අන් කෙනෙක් අළු දමාගසත්, තව කෙනෙක් ගොම දමාගසත්. දනුදු ඇතැම් දනවුහි මිනිස්සු එය කරත්. ස්ත්‍රියක ගෙනයතු ලබන කල්හි අන් කෙනෙක් පස් දමාගසත්, අන් කෙනෙක් අළු දමාගසත, තව කෙනෙක් ගොම දමාගසත්. ඒ පැරැණි ලොකොත්පත්තිවංශ කථාව අනුව යෙත්. එහෙත් එහි අදහස නො ම දනිත්.

10. වාශිෂ්ඨයෙනි, එ සමයෙහි පස් දමාගැසුම් ආදි විසින් අධර්මයැ යි සම්මත වූ යමෙක් වී ද, එය දැන් ධර්ම යැ යි සම්මත වැ ඇත. වාශිෂ්ඨයෙනි, එ සමයෙහි යම් සත්ත්ව කෙනෙක් වනාහි මෙවුන්දම් සෙවිත් ද, ඔහු තුන් මසකුදු නැත හොත් දෙ මසකුදු ගමකට හෝ නියම්ගමකට හෝ පිවිසෙන්නට අවසර නො ලබත්. වාශිෂ්ඨයෙනි, එ සමයෙහි සත්‍වයෝ යම් හෙයෙකින් අසද්ධර්මයෙහි (මෙවුන්දම්හි) ඉතා බොහෝ වේලාවක් යෙදිය යුතු බවට පැමිණියාහු ද, එහෙයින් ම ඒ අසද්ධර්මය වසා ලනු පිණිස ගෙවල් කරන්නට පටන්ගත්හ.

අථ ඛො වාසෙට්ඨා අඤ්ඤතරස්ස සත්තස්ස අලසජාතිකස්ස එතදහොසි: "අම්හො කිමෙවාහං විහඤ්ඤාමි සාලිං ආහරන්තො සායං සායමාසාය පාතො පාතරාසාය? යන්නූනාහං සාලිං ආහරෙය්‍යං සකිදෙව[1] සායපාතරාසායා''ති. අථ ඛො සො වාසෙට්ඨා සත්තො සාලිං ආහාසි සකිදෙව සායපාතරාසාය. අථ ඛො වාසෙට්ඨා අඤ්ඤතරො සත්තො යෙන සො සත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං සත්තං එතදවොච: "එහි භො සත්ත සාලාහාරං ගමිස්සාමා''ති. "අලං භො සත්ත, ආහතො[2] මෙ සාලි සකිදෙව සායපාතරාසායා''ති. අථ ඛො සො වාසෙට්ඨා සත්තො තස්ස සත්තස්ස දිට්ඨානුගතිං ආපජ්ජමානො සාලිං ආහාසි සකිදෙව ද්වීහාය, 'එවම්පි කිර භො සාධූ' ති. අථ ඛො වාසෙට්ඨා අඤ්ඤතරො සත්තො යෙන සො සත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං සත්තං එතදවොච: "එහි භො සාලාහාරං ගමිස්සාමා''ති. "අලං භො සත්ත ආහතො මෙ සාලි සකිදෙව ද්වීහායා''ති. අථ ඛො සො වාසෙට්ඨා සත්තො තස්ස සත්තස්ස දිට්ඨානුගතිං ආපජ්ජමානො සාලිං ආහාසි සකිදෙව චතූහාය, 'එවම්පි කිර භො සාධූ'ති. –පෙ– අථ ඛො සො වාසෙට්ඨා සත්තො තස්ස සත්තස්ස දිට්ඨානුගතිං ආපජ්ජමානො සාලිං ආහාසි සකිදෙව අට්ඨාහාය, 'එවම්පි කිර භො සාධූ'ති. යතො ඛො තෙ වාසෙට්ඨා සත්තා සන්නිධිකාරකං සාලිං උපක්කමිංසු පරිභුඤ්ජිතුං, අථ කණො පි තණ්ඩුලං පරියොනද්ධි, ථුසො පි තණ්ඩුලං පරියොනද්ධි, ලූනම්පි නප්පටිවිරූළ්හං අපදානං පඤ්ඤායිත්ථ, සණ්ඩසණ්ඩා සාලයො[3] අට්ඨංසු.

## සාලිවිභාගො

අථ ඛො තෙ වාසෙට්ඨා සත්තා සන්නිපතිංසු, සන්නිපතිත්වා අනුත්ථුනිංසු, 'පාපකා වත භො ධම්මා සත්තෙසු පාතුභූතා, මයං හි පුබ්බෙ මනොමයා අහුම්හ පීතිභක්ඛා සයම්පභා අන්තලික්ඛචරා සුභට්ඨායිනො චිරං දීඝමද්ධානං අට්ඨම්හ[4] තෙසං නො අම්හාකං කදචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන රසා පථවී උදකස්මිං සමතානි. සා අහොසි වණ්ණසම්පන්නා ගන්ධසම්පන්නා රසසම්පන්නා. තෙ මයං රසං පථවිං හත්ථෙහි ආලුම්පකාරකං උපක්කමිම්හ පරිභුඤ්ජිතුං, තෙසං නො රසපථවිං හත්ථෙහි ආලුම්පකාරකං උපක්කමතං පරිභුඤ්ජිතුං සයම්පභා අන්තරධායි.

---

1. සකිංදෙව–කම්.
2. ආහතො–මජසං.
3. සාලියො PTS
4. අට්ඨම්හා - මජසං

වාශිෂ්ඨයෙනි, එ කල්හි එක්තරා අලස ගති ඇති සත්ත්වයකුට "භවත්නි, උදේ බොජුන් පිණිස උදසන ද හවස බොජුන් පිණිස සවස් කල්හි ද හැල් ගෙන එනුයෙමි මම කුමට මෙසේ වෙහෙසෙම් ද? උදේ හවස දෙක්හි ම බොජුන් පිණිස එක් වරට ම හැල්ගෙන ආයෙම් වීම් නම් යෙහෙකැ''යි මේ සිත වීය. වාශිෂ්ඨයෙනි, ඒ සත් තෙම උදේ සවස බොජුන් පිණිස එක්වර ම හැල් ගෙනායේ ය. එ කලැ එක්තරා සත්ත්වයෙක් ඒ සත්ත්වයා කරා එළැඹි යේ ය. එළැඹ ඔහුට 'භවත් සත්ත්වය, එව, හැල් ගෙන ඊමට යම්හ'යි කී ය. 'භවත් සත්ත්වය, කම් නැත. උදේ සවස බොජුන් පිණිස මා විසින එක් වර ම හැල් ගෙනෙන ලදැ යි හේ කී ය. වාශිෂ්ඨයෙනි, එ විට ඒ සත්ත්ව තෙම ඒ (එක් වර දෙවේලට ම හැල් ගෙනා) සත්ත්වයා ගේ දෘෂ්ටානුගතියට (ඔහු කළා දුටු දූය අනුව යැමට) පැමිණෙනුයේ, 'භවත්නි, මෙසේත් යහපතැ' යි කියා දෙදවසකට එක් වරක් ම හැල් ගෙනායේ ය. වාශිෂ්ඨයෙනි, එ කල්හි එක්තරා සත්ත්වයෙක් (ඒ දෙදවසකට එක් වරක් හැල් ගෙනා) සත්ත්වයා කරා එළැඹියේ ය, එළැඹ, 'භවත් සත්ත්වය, හැල් ගෙනීමට යම්හ'යි කී ය. 'භවත් සත්ත්වය, එයින් කම් නැත. මා විසින් දෙදවසකට ම (පොහොනා පමණ) හැල් එක් වරට ම ගෙනෙනලදැ''යි ඒ සත්ත්ව තෙම කී ය, වාශිෂ්ඨයෙනි, එ විට ඒ සත්ත්ව තෙම අනෙකා කළා දුටු දැ අනුව යන්නේ, 'භවත්නි, මෙසේත් යහපතැ'යි කියා එක් වර ම සතර දිනකට පොහොනා පමණ හැල් ගෙනායේ ය... එකල්හි ඒ සත් තෙම අනෙකා කළා දුටු දැ අනුව යනුයේ, 'භවත්නි, මෙසේත් යහපතැ යි කියා, එක් වර ම අට දවසකට පොහොනා පමණ හැල් ගෙනායේ ය. වාශිෂ්ඨයෙනි, ඒ සත්ත්වයෝ යම් කලෙක හැල් රැස් කොට තබා පරිභොග කරන්නට පටන් ගත්තු ද, එකල්හි කුඩු ද සහල වසා ගත්තේ ය. දහවෙයියා ද සහල වසා ගත්තේ ය. හැල් කපා ගත් තැන ද යළි නො ව ඩුණේ ය. හැල් කපා ගත් තැන ද ඌන ව පැනුණේ ය. හැල්හු පඳුරු පඳුරු වැ සිටියාහ.

වාශිෂ්ඨයෙනි, එ කල් හි ඒ සත්ත්වයෝ එක් තැනකට රැස්වූහ. රැස් ව උනුන් හා මෙසේ කතා කැරැගත්හ: භවත්නි, බෙදයෙකි! ලාමක ස්වභාවයෝ සත්ත්වයන් කෙරෙහි පහළ වූහ. අපි පෙරැ මනොමය වූ, ප්‍රීතිය භෝජනය කොටැති ව ස්වයම්ප්‍රභ ව, ගොහන වස්ත්‍රාභරණ ඇති ව සිටින්නමෝ ඉතා බොහෝ කල් සිටුම්හ. ඒ අපට කිසි කලෙක්හි ඉතා බොහෝ කලක් ඇවෑමෙන් රස පොළොව දියෙහි පැතිරැගෙන සිටියේය.එය පැහැවත් ද සුවඳවත් ද රසවත් ද විය. ඒ අපි රස පොළොව අත්වලින් පිඩුකොට ගෙන වළඳන්නට පටන් ගතුම්හ. රස පොළොව අත්වලින් පිඩු කොට ගෙන වළඳන්නට පටන්ගත් අපගේ ස්වයම්ප්‍රභාව අතුරුදහන් විය.

තාය අන්තරහිතාය චන්දිමසුරියා[1] පාතුරහෙසුං. චන්දිමසුරියෙසු පාතුභූතෙසු නක්ඛත්තානි තාරකරූපානි පාතුරහෙසුං, නක්ඛත්තෙසු තාරකරූපෙසු පාතුභූතෙසු රත්තින්දිවා පඤ්ඤායිංසු. රත්තින්දිවෙසු පඤ්ඤායමානෙසු මාසද්ධමාසා පඤ්ඤායිංසු, මාසද්ධමාසෙසු පඤ්ඤායමානෙසු උතුසංවච්ඡරා පඤ්ඤායිංසු. තෙ මයං රසං පඨවිං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨම්හ. තෙසං නො පාපකානංයෙව අකුසලානං ධම්මානං පාතුභාවා රසා පඨවී අන්තරධායි. රසාය පඨවියා අන්තරහිතාය භූමිපප්පටකො පාතුරහොසි. සො අහොසි වණ්ණසම්පන්නො ගන්ධසම්පන්නො රසසම්පන්නො. තෙ මයං භූමිපප්පටකං උපක්කමිම්හ පරිභුඤ්ජිතුං. තෙ මයං තං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨම්හ. තෙසං නො පාපකානංයෙව අකුසලානං ධම්මානං පාතුභාවා භූමිපප්පටකො අන්තරධායි. භූමිපප්පටකෙ අන්තරහිතෙ බදාලතා පාතුරහොසි. සා අහොසි වණ්ණසම්පන්නා ගන්ධසම්පන්නා රසසම්පන්නා. තෙ මයං බදාලතං උපක්කමිම්හ පරිභුඤ්ජිතුං. තෙ මයං තං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨම්හ. තෙසං නො පාපකානංයෙව අකුසලානං ධම්මානං පාතුභාවා බදාලතා අන්තරධායි. බදාලතාය අන්තරහිතාය අකට්ඨපාකො සාලි පාතුරහොසි, අකණො අථුසො සුද්ධො සුගන්ධො තණ්ඩුලප්ඵලො. යං තං සායං සායමාසාය ආහරාම, පාතො තං හොති පක්කං පටිවිරූළ්හං. යං තං පාතො පාතරාසාය ආහරාම, සායන්තං හොති පක්කං පටිවිරූළ්හං. නාපදානං පඤ්ඤායිත්ථ. තෙ මයං අකට්ඨපාකං සාලිං පරිභුඤ්ජන්තා තම්භක්ඛා තදාහාරා චිරං දීඝමද්ධානං අට්ඨම්හ. තෙසං නො පාපකානංයෙව අකුසලානං ධම්මානං පාතුභාවා කණොපි තණ්ඩුලං පරියොනද්ධි, ථුසොපි තණ්ඩුලං පරියොනද්ධි, ලූනම්පි නප්පටිවිරූළ්හං, අපදානං පඤ්ඤායිත්ථ, සණ්ඩසණ්ඩා සාලයො ඨිතා. යන්නූන මයං සාලිං විභජෙය්‍යාම, මරියාදං ඨපෙය්‍යාමා'ති. අථ ඛො තෙ වාසෙට්ඨ සත්තා සාලිං විභජිංසු, මරියාදං ඨපෙසුං.

11. අථ ඛො වාසෙට්ඨ අඤ්ඤතරො සත්තො ලොලජාතිකො සකං භාගං පරිරක්ඛන්තො අඤ්ඤතරං භාගං අදින්නං ආදියිත්වා පරිභුඤ්ජි. තමෙනං අග්ගහෙසුං, ගහෙත්වා එතදවොචුං: 'පාපකං වත භො සත්ත කරොසි, යත්‍ර හි නාම සකං භාගං පරිරක්ඛන්තො අඤ්ඤතරං භාගං අදින්නං ආදියිත්වා පරිභුඤ්ජසි[2]. මාස්සු භො සත්ත පුනපි එවරූපමකාසී'ති.

1. චන්දිමසුරියා - මජසං
2. පරිභුඤ්ජි - සයා, පරිභුංජසි (සීමු)

එය අතුරුදහන් වූ කල්හි සඳහිරුහු ප්‍රකට වූහ. සඳුහිරුන් පහළවූ කල්හි නක්ෂත්‍රයෝ ද තාරකාරූපයෝ ද ප්‍රකට වූහ. නක්ෂත්‍රතාරකාරූප ප්‍රකට වූ පසු රෑදවල්හු පැනුණහ. රෑදවල් පැනෙන කල්හි මාස පක්ෂයෝ පැනුණහ. මාසපක්ෂයන් පැනෙන කල්හි ඍතුසංවත්සරයෝ පැනුණහ. ඒ අපි රස පොළොව පරිභොග කරන්නමෝ, එය වළඳන්නමෝ, එය ආහාර කොටැ ගත්තමෝ, ඉතා බොහෝ කලක් සිටියම්හ. ඒ අපට ලාමක අකුසල් දහම් පහළ වීමෙන් ම රසපොළොව අතුරුදහන් විය. රස පොළොව අතුරුදහන් වූ කල්හි භූමිපප්ටකය පහළ විය. ඒ අපි භූමිපප්ටකය පරිභොග කරන්නට පටන් ගතුම්හ. ඒ අපි එය පරිභොග කරන්නමෝ, එය වළඳන්නමෝ එය ම ආහාර කොට ඇත්තමෝ ඉතා බොහෝ කලක් සිටියම්හ. ඒ අපට ලාමක අකුසල් දහමුන් පහළ වීමෙන් භූමිපප්ටකය අතුරුදහන් විය. භූමිපප්ටකය අතුරුදහන් වූ කල්හි බදාලතාව පහළ විය. එය පැහැවත් සුවඳවත් රසවත් විය. ඒ අපි බදාලතාව පරිභොග කරන්නට පටන් ගතුමු. එය පරිභොග කරන්නමෝ, එය වළඳන්නමෝ, එය ම ආහාර කොටැත්තමෝ ඉතා බොහෝ කලක් සිටියම්හ. ඒ අපට ලාමක අකුශල ධර්ම පහළ වීමෙන් බදාලතාව අතුරුදහන් විය. බදාලතාව අතුරුදහන් වූ කල්හි කුඩු නැති දහවෙයියා නැති පිරිසිදු සුවඳැති සහල ම ඵල කොටැති නො සානා ලද බිමැ හටගෙන පැසෙන හැල් වෙසෙසෙක් පහළ විය. සවස් කලැ සවස් බොජුනට යම් සහලක් ගෙනෙත් ද පසුදිනැ උදසනැ එය පැසුණේ යලි දු වැඩුණේ වෙයි. කපා නොහන්නා ලද තැනෙක් ම (නොඅඩු ව) පැහුණේ ය. ඒ අපි නො සාන ලද බිමැ හටගෙන පැසුණු ඒ හැල්සහල් පරිභොග කරන්නමෝ, එය ම වළඳන්නමෝ, එය ම අහර කොටැත්තමෝ, ඉතා බොහෝ කලක් සිටියම්හ. ඒ අපට ලාමක අකුසල් දහම් පහළ වීමෙන් ම කුඩු ද සහල වසාගෙන බැඳී සිටියේ ය. දහවෙයියා ද සහල වසා බැඳී සිටියේ ය. කපා ගන්නා ලද තැන ද යලි නො නැඟුණේ ය. ඌනභාවය පැනුණේ ය. පඳුරු පඳුරු වැ හැල්හු සිටියාහ. අපි හැල් (අප අතර) වෙන වෙන ම බෙද ගන්නමෝ නම්, ඉම් තබන්නමෝ නම් මැනැවැ''යි මෙසේ කතා කැරගත්හ. වාශිෂ්ඨයෙනි, ඉක්බිති ඒ සත්වයෝ හැල් බෙදූහ. ඉම් තැබූහ.

11. වාශිෂ්ඨයෙනි, එ කල්හි ලොල්පියෙවි ඇති එක්තරා සතෙක් සිය කොටස රැකගනුයේ තමාට නො දෙන ලද එත්තරා කොටසක් ගෙන පරිභෝග කෙළේ ය. (සෙස්සෝ) ඔහු අල්ලා ගත්හ, අල්ලා ගෙන 'භවත් සත්වය, යම් බඳු තෝ සිය කොටස රකිනුයෙහි තමහට නොදුන් එක්තරා කොටසක් ගෙන පරිභොග කෙළෙහි ද, ඒ තෝ ඒකාන්තයෙන් ලාමක දෑයක් කෙළෙහි ය. භවත් සත්වය, යළිත් මෙබන්දක් නහමක් කරව''යි කී හ.

‘එවං භො’ති ඛො වාසෙට්ඨ සො සත්තො තෙසං සත්තානං පච්චස්සොසි. දුතියම්පි ඛො වාසෙට්ඨ සො සත්තො සකං භාගං පරිරක්ඛන්තො අඤ්ඤතරං භාගං අදින්නං ආදියිත්වා පරිභුඤ්ජි. තමෙනං අග්ගහෙසුං, ගහෙත්වා එතදවොචුං: ‘පාපකං වත භො සත්ත කරොසි, යත්‍ර හි නාම සකං භාගං පරිරක්ඛන්තො අඤ්ඤතරං භාගං අදින්නං ආදියිත්වා පරිභුඤ්ජිස්සසි. මාස්සු භො සත්ත පුනපි එවරූපමකාසී’ති. තතියම්පි ඛො වාසෙට්ඨ සො සත්තො සකං භාගං පරිරක්ඛන්තො අඤ්ඤතරං භාගං අදින්නං ආදියිත්වා පරිභුඤ්ජි. තමෙනං අග්ගහෙසුං, ගහෙත්වා එතදවොචුං: පාපකං වත භො සත්ත කරොසි, යත්‍ර හි නාම සකං භාගං පරිරක්ඛන්තො අඤ්ඤතරං භාගං අදින්නං ආදියිත්වා පරිභුඤ්ජිස්සසි. මාස්සු භො සත්ත පුනපි එවරූපමකාසී’ති. අඤ්ඤෙ පාණිනා පහරිංසු, අඤ්ඤෙ ලෙඩ්ඩුනා[1] පහරිංසු, අඤ්ඤෙ දණ්ඩෙන පහරිංසු තදග්ගෙ ඛො පන වාසෙට්ඨ අදින්නාදානං පඤ්ඤායති, ගරහා පඤ්ඤායති, මුසාවාදො පඤ්ඤායති, දණ්ඩාදානං පඤ්ඤායති.

### මහාසම්මතරාජා

12. අථ ඛො තෙ වාසෙට්ඨ සත්තා සන්නිපතිංසු, සන්නිපතිත්වා අනුත්ථුනිංසු “පාපකා වත භො ධම්මා සත්තෙසු පාතුභූතා, යත්‍ර හි නාම අදින්නාදානං පඤ්ඤායිස්සති, ගරහා පඤ්ඤායිස්සති, මුසාවාදො පඤ්ඤායිස්සති, දණ්ඩාදානං පඤ්ඤායිස්සති. යන්නූන මයං එකං සත්තං සම්මන්නෙය්‍යාම, යො[2] නො සම්මා ඛීයිතබ්බං ඛීයෙය්‍ය, සම්මා ගරහිතබ්බං ගරහෙය්‍ය, සම්මා පබ්බාජෙතබ්බං පබ්බාජෙය්‍ය. මයං පනස්ස සාලීනං භාගං අනුප්පදස්සාමා’’ති. අථ ඛො තෙ වාසෙට්ඨ සත්තා යො තෙසං සත්තො අභිරූපතරො ච දස්සනීයතරො ච පාසාදිකතරො ච මහෙසක්ඛතරො ච, තං සත්තං උපසඞ්කමිත්වා එතදවොචුං: එහි භො[3] සත්ත, සම්මා ඛීයිතබ්බං ඛීය, සම්මා ගරහිතබ්බං ගරහ, සම්මා පබ්බාජෙතබ්බං පබ්බාජෙහි. මයං පන තෙ සාලීනං භාගං අනුප්පදස්සාමා’’ති. ‘එවං භො’ති ඛො වාසෙට්ඨ සො සත්තො තෙසං සත්තානං පටිස්සුණිත්වා, සම්මා ඛීයිතබ්බං ඛීයි, සම්මා ගරහිතබ්බං ගරහි, සම්මා පබ්බාජෙතබ්බං පබ්බාජෙසි. තෙ පනස්ස සාලීනං භාගං අනුප්පදංසු. මහාජනසම්මතො’ති ඛො වාසෙට්ඨ ‘මහාසම්මතො මහාසම්මතො’ත්වෙව පඨමං අක්ඛරං උපනිබ්බත්තං.

1. ලෙණ්ඩුනා - සයා
2. ඛො - PTS
3. සො - PTS

වාසිෂ්ඨයෙනි, ඒ සත්ත්ව තෙම 'එසේ ය භවත්නි'යි කියා ම ඒ සත්නට පිළිවදන් දුන. වාසිෂ්ඨයෙනි, දෙවෙනි වර ද ඒ සත් තෙම සිය කොටස රකිනුයේ තමාට නොදුන් එක්තරා කොටසක් ගෙන පරිභොග කළේය. සෙස්සෝ ඔහු අල්ලා ගත්හ. අල්ලා ගෙන, 'භවත් සත්ත්වය, යම්බඳු තෝ සිය කොටස රකිනුයෙහි, තමාට නොදුන් එක්තරා කොටසක් ගෙන පරිභොග කෙරෙහි ද, ඒ තෝ ලාමක දෑයක් කෙරෙහි ය. භවත් සත්ත්වය, යළි මෙබන්දක් නො කරව'යි කීහ. වාසිෂ්ඨයෙනි, තෙවෙනි වර ද ඒ සත් තෙම සිය කොටස රකිනුයේ, තමාට නො දුන් කොටසක් ගෙන පරිභොග කළේ ය. සෙස්සෝ ඔහු අල්ලා ගත්හ. අල්ලා ගෙන, 'භවත් සත්ත්වය, යම් බඳු තෝ සිය කොටස රකිනුයෙහි, තමාහට නොදුන් එක්තරා කොටසක් ගෙන පරිභොග කෙරෙහි ද, ඒ තෝ ලාමක දෑයක් ම කෙරෙහි ය. භවත් සත්ත්වය, යළිත් මෙබන්දක් නහමක් කරව'යි කීහ. කෙනෙක් අතින් පහළහ. කෙනෙක් කැටින් පහළහ. කෙනෙක් දංඩෙන් පහළහ, වාසිෂ්ඨයෙනි, එතැන් පටන් කොට අයිනාදන පැනෙයි, ගැරැහුම පැනෙයි, මුසා බිණීම පැනෙයි, දඬු ගැනුම් පැනෙයි.

12. වාසිෂ්ඨයෙනි, ඉක්බිති ඒ සත්ත්වයෝ එක් රැස් වූ හ. එක්රැස් වැ, "භවත්නි, බෙදයෙක යම් කෙනෙකු කෙරෙහි අයිනාදන පැනෙන්නේ ද, ගැරැහුම පැනෙන්නේ ද, මුසා බිණීම පැනෙන්නේ ද, දඬු ගැන්ම පැනෙන්නේ ද, ඒ සතුන් කෙරෙහි එසේ වූ ලාමක අකුශල ධර්ම කෙනෙක් පහළ වූහ. යමෙක් අපගෙන් දෙස්නැගිය යුත්තාව මොනොවට දෙස්නගන්නේ ද ගැරැහිය යුත්තහුට මොනොවට ගරහන්නේ ද, නෙරැපිය යුත්තහු මොනොවට නෙරපන්නේ ද, අපි එසේ වූ එක් සත්ත්වයකු සම්මත කැරැගනුමෝ නම් ඉතා යෙහෙක. අපි වූ කලී ඔහුට හැල් කොටසක් දෙන්නමු"යි කතා කැරැගත්හ. වාසිෂ්ඨයෙනි, එ කල්හි ඒ සත්ත්වයෝ යම් සත්ත්වයෙක් ඔවුන් අතුරෙහි වඩා රූපසම්පන්න ද, වඩා දැකුම්කලු ද, වඩා සිත පහදවන සුලු ද, වඩා මහ තෙදැත්තේ ද, ඒ සත්ත්වයා කරා එළැඹ, 'භවත් සත්ත්වය, මෙහි එන්න, දෙස්නැගියැ යුත්තාට නිසිපරිදි දෙස් නගන්න. ගැරැහිය යුත්තාට මොනොවට ගරහන්න, නෙරැපිය යුත්තහු මොනොවට නෙරපන්න. අපි වනාහි ඔබට හැල් කොටයක් දෙන්නමු'යි මෙ බස් කීහ. 'භවත්නි, එසේ යැ'යි කියා ම ඒ සත්ත්ව තෙම ඔවුනට පිළිවදන් දී දෙස් නැගිය යුත්තහුට මොනොවට දෙස් නැගීය, ගැරැහිය යුත්තහුට ගැරැහී ය. නෙරැපිය යුත්තහු මොනොවට නෙරැපී ය. ඔව්හු ඔහුට හැල් කොටසක් දුන්හ. වාසිෂ්ඨයෙනි, මහා ජනයා විසින සම්මත හෙයින් ම ඔහුට 'මහාසම්මත ය, මහාසම්මත යැ'යි ම පළමු නම් වහර ඇති විය.

ඛෙත්තානං අධිපතී ති ඛො වාසෙට්ඨා 'ඛත්තියො ඛත්තියො'ත්වෙව දුතියං අක්ඛරං උපනිබ්බත්තං. ධම්මෙන පරෙ[1] රඤ්ජෙතීති ඛො වා සෙට්ඨා 'රාජා රාජා'ත්වෙව තතියං අක්ඛරං උපනිබ්බත්තං. ඉති ඛො වාසෙට්ඨා එවමෙතස්ස ඛත්තියමණ්ඩලස්ස පොරාණෙන අග්ගඤ්ඤෙන අක්ඛරෙන අභිනිබ්බත්ති අහොසි. තෙසඤ්ඤෙව සත්තානං අනඤ්ඤෙසං,[2] සදිසානඤ්ඤෙව නො අසදිසානං, ධම්මෙනෙව නො අධම්මෙන. ධම්මො හි වාසෙට්ඨා සෙට්ඨො ජනෙ'තස්මිං දිට්ඨෙචෙව ධම්මෙ අභිසම්පරායෙච.

## බ්‍රාහ්මණමණ්ඩලං

13. අථ ඛො තෙසං වාසෙට්ඨා සත්තානඤ්ඤෙව එකච්චානං එතදහොසි: පාපකා වත භො ධම්මා සත්තෙසු පාතුභූතා, යත්‍ර හි නාම අදින්නාදානං පඤ්ඤායිස්සති, ගරහා පඤ්ඤායිස්සති, මුසාවාදො පඤ්ඤායිස්සති, දණ්ඩාදානං පඤ්ඤායිස්සති, පබ්බාජනං පඤ්ඤායිස්සති. යන්නූන මයං පාපකෙ අකුසලෙ ධම්මෙ වාහෙය්‍යාමා''ති. තෙ පාපකෙ අකුසලෙ ධම්මෙ බාහෙසුං[3]. පාපකෙ අකුසලෙ ධම්මෙ බාහෙන්තීති ඛො වාසෙට්ඨා 'බ්‍රාහ්මණා බ්‍රාහ්මණා'ත්වෙව පඨමං අක්ඛරං උපනිබ්බත්තං. තෙ අරඤ්ඤායතනෙ පණ්ණකුටියො කරිත්වා පණ්ණකුටීසු ඣායන්ති, වීතඞ්ගාරා වීතධූමා පන්නමුසලා සායං සායමාසාය පාතො පාතරාසාය ගාමනිගමරාජධානියො ඔසරන්ති ඝාසමෙසානා[4] තෙ ඝාසං පටිලභිත්වා පුනදෙව අරඤ්ඤායතනෙ පණ්ණකුටීසු ඣායන්ති. තමෙනං මනුස්සා දිස්වා එවමාහංසු: 'ඉමෙ ඛො භො සත්තා අරඤ්ඤායතනෙ පණ්ණකුටියො කරිත්වා පණ්ණකුටීසු ඣායන්ති, වීතඞ්ගාරා වීතධූමා පන්නමුසලා සායං සායමාසාය පාතො පාතරාසාය ගාමනිගමරාජධානියො ඔසරන්ති ඝාසමෙසානා. තෙ ඝාසං පටිලභිත්වා පුනදෙව අරඤ්ඤායතනෙ පණ්ණකුටීසු ඣායන්ති ඣායන්තීති ඛො පන වාසෙට්ඨා 'ඣායකා ඣායකා'ත්වෙව දුතියං අක්ඛරං උපනිබ්බත්තං. තෙසඤ්ඤෙව ඛො වාසෙට්ඨා සත්තානං එකච්චෙ සත්තා අරඤ්ඤායතනෙ පණ්ණකුටීසු තං ඣානං අනභිසම්භුණමානා ගාමසාමන්තං නිගමසාමන්තං ඔසරිත්වා ගන්ථෙ කරොන්තා අච්ඡන්ති. තමෙනං මනුස්සා දිස්වා එවමාහංසු: ඉමෙ ඛො භො සත්තා අරඤ්ඤායතනෙ පණ්ණකුටීසු තං ඣානං අනභිසම්භුණමානා ගාමසාමන්තං නිගමසාමන්තං ඔසරිත්වා ගන්ථෙ කරොන්තා අච්ඡන්ති! න'දානි මෙ ඣායන්ති, න'දානි මෙ ඣායන්තීති ඛො වාසෙට්ඨා අජ්ඣායකා අජ්ඣායකා'ත්වෙව තතියං අක්ඛරං උපනිබ්බත්තං.

1. පරෙසං - සයා
2. අඤ්ඤෙසං - සයා
3. වාහෙසුං - මජසං
4. ඝාසමෙසමානා මජසං, ඝාසමෙසනා - සයා

වාශිෂ්ඨයෙනි, කෙත්නට අධිපති වී තු යි 'ක්ෂත්‍රිය ය, ක්ෂත්‍රිය යැ'යි ම දෙවෙනි නම් වහර ඇති විය. වාශිෂ්ඨයෙනි, දැහැමින් මෙරමා රඳවාතු යි (සුවපත් කෙරේතු යි පිණවාතු යි) 'රජ ය, රජ' යැ යි කියා ම තෙවෙනි නම් වහර ඇති විය. වාශිෂ්ඨයෙනි, මෙසේ පැරැණි වූ අග්‍ර යැ යි දන්නා ලද නමවහරින් ක්ෂත්‍රිය මණ්ඩලයාගේ ආරම්භය විය. එ ද ඒ සත්‍වයනට ම ය, අන් සත්‍වකෙනෙකුට නො වේ. සමාන සත්‍වයනට ම ය, අසමාන සත්‍ව කෙනෙකුට නො වේ. ධර්මයෙන් ම ය, අධර්මයෙන් නො වේ. වාශිෂ්ඨයෙනි, එහෙයින් මේ ජනයා කෙරෙහි මෙ ලොව්හි ද පරලොව්හි ද ධර්මය ම ශ්‍රේෂ්ඨ ය.

13. වාශිෂ්ඨයිනි, එක්බිති ඒ ඇතැම් සත්‍ව කෙනකුට "භවත්නි, බෙදයෙක! යම් කෙනකු කෙරෙහි අයිනාදන පැනෙන්නේ ද, ගැරහුම පැනෙන්නේ ද, මුසවා ච පැනෙන්නේ ද, දඬු ගැන්ම පැනෙන්නේ ද, රටින් නෙරැපීම පැනෙන්නේ ද එසේ වූ සතුන් කෙරෙහි ලාමක ධර්මයෝ පහළ වූවාහු වෙති. අපි ලාමක වූ අකුශල ධර්මයන් බාහනය (බැහැර ලීම) කරන්-නමෝ නම් යෙහෙකැ" යි මෙ සිත විය. ඔහු ලාමක වූ අකුශල ධර්ම බාහනය කළහ (බැහැර ලූහ). වාශිෂ්ඨයෙනි, ලාමක වූ අකුශල ධර්මයන් වාහනය කෙරෙත් (බැහැර ලත්) තු යි ම 'බ්‍රාහ්මණයෝ ය, බ්‍රාහ්මණයෝ ය' කියා ම පළමු නාම ව්‍යවහාරය පහළ විය. ඔහු තුමූ වන පෙදෙස්හි පන්සල් කොට ගෙන එහි ධ්‍යාන කෙරෙත්. (පිස කැව යුතු දයක් නැති බැවින්) පහවූ අඟුරු ඇත්තාහු පහ වූ දුම් ඇත්තාහු, කොටා පිසියැ යුතු දයක් නැති බැවින් බිමට වත් මෙහොල් ඇත්තාහු (අඟුරු දුම් මොහොල් යන මේ කිසිවකුත් නැත්තාහු), සවස් බොජුන පිණිස සවස ද, උදේ බොජුන් පිණිස උදසන ද අහර සොයනුවෝ ගම් නියම් ගම් රජදහන්වලට බසිත්. ඔහු අහර ලැබගෙන පෙරළා ගොස් වන පෙදෙස්හි පන්සල්හි ධ්‍යාන කෙරෙත්. වාශිෂ්ඨයෙනි, 'ධ්‍යාන කෙරෙත්, ධ්‍යාන කෙරෙත් තු'යි ම 'ධ්‍යායකයෝ ය, ධ්‍යායකයෝ යැ' යි කියා ම දෙවෙනි නම් වහරෙක් ඔවුනට ඇති විය. වාශිෂ්ඨයිනි, ඒ සත්‍වයන් ම අතුරෙන් ඇතැම් කෙනෙක් වන පෙදෙසෙහි පන්සල්හි ඒ දහන් වැඩීම නොකළ හැකි වන්නාහු ගම් අසලට නියම්ගම් අසලට බැස, ග්‍රන්ථ කෙරෙමින් ඉදිත් මිනිස්සු ඔවුන්දැක, "භවත්නි, මේ සත්හු වෙනෙහි පන්සල්හි ඒ ධ්‍යාන කළ නො හැක්කාහු, ගම් අසලට නියම්ගම් අසලට බැස, ග්‍රන්ථ කෙරෙමින් ඉදිත්. වාශිෂ්ඨයිනි, 'දැන් මොහු ධ්‍යාන නො කෙරෙත්, දැන් මොහු ධ්‍යාන නො කෙරෙත්' තු යි මොහු 'අධ්‍යායකයෝ'යැ යි ම ඔවුනට තෙවෙනි නම් වහරෙක් උපන්නේය.

හීනසම්මතං ඛො පන වාසෙට්ඨ යං තෙන සමයෙන හොති, තදෙතරහි සෙට්ඨසම්මතං. ඉති ඛො වාසෙට්ඨ එවමෙතස්ස බ්‍රාහ්මණමණ්ඩලස්ස පොරාණෙන අග්ගඤ්ඤෙන අක්ඛරෙන අභිනිබ්බත්ති අහොසි. තෙසංයෙව සත්තානං අනඤ්ඤෙසං, සදිසානංයෙව නො අසදිසානං, ධම්මෙනෙව නො අධම්මෙන. ධම්මො හි වාසෙට්ඨ සෙට්ඨො ජනෙ'තස්මිං දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායෙච.

### වෙස්සමණ්ඩලං

14. තෙසංයෙව ඛො වාසෙට්ඨ සත්තානං එකච්චෙ සත්තා මෙථුනං ධම්මං සමාදාය විස්සුතං කම්මන්තෙ[1] පයොජෙසුං. මෙථුනං ධම්මං සමාදාය විස්සුතං කම්මන්තෙ පයොජෙන්තීති ඛො වාසෙට්ඨ වෙස්සා වෙස්සාත්වෙව අක්ඛරං උපනිබ්බත්තං. ඉති ඛො වාසෙට්ඨ එවමෙතස්ස වෙස්සමණ්ඩලස්ස පොරාණෙන අග්ගඤ්ඤෙන අක්ඛරෙන අභිනිබ්බත්ති අහොසි, තෙසංයෙව සත්තානං අනඤ්ඤෙසං සදිසානංයෙව නො අසදිසානං ධම්මෙනෙව නො අධම්මෙන. ධම්මො හි වාසෙට්ඨ සෙට්ඨො ජනෙ'තස්මිං දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායෙච.

### සුද්දමණ්ඩලං

15. තෙසංයෙව ඛො වාසෙට්ඨ සත්තානං යෙ තෙ සත්තා අවසෙසා තෙ ලුද්දාචාරා[2] ඛුද්දාචාරා අහෙසුං ලුද්දාචාරා ඛුද්දාචාරා ති ඛො වාසෙට්ඨ සුද්දා සුද්දාත්වෙව අක්ඛරං උපනිබ්බත්තං. ඉති ඛො වාසෙට්ඨ එවමෙතස්ස සුද්දමණ්ඩලස්ස පොරාණෙන අග්ගඤ්ඤෙන අක්ඛරෙන අභිනිබ්බත්ති අහොසි. තෙසංයෙව සත්තානං අනඤ්ඤෙසං, සදිසානංයෙව නො අසදිසානං, ධම්මෙනෙව නො අධම්මෙන. ධම්මො හි වාසෙට්ඨ සෙට්ඨො ජනෙ'තස්මිං දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායෙච.

16. අථ ඛො සො වාසෙට්ඨ සමයො යං ඛත්තියො පි සකං ධම්මං ගරහමානො අගාරස්මා අනගාරියං පබ්බජති, 'සමණො භවිස්සාමී'ති. බ්‍රාහ්මණො පි ඛො වාසෙට්ඨ සකං ධම්මං ගරහමානො අගාරස්මා අනගාරියං පබ්බජති 'සමණො භවිස්සාමී'ති, වෙස්සො පි ඛො වාසෙට්ඨ සකං ධම්මං ගරහමානො අගාරස්මා අනගාරියං පබ්බජති, 'සමණො භවිස්සාමී'ති. සුද්දො පි ඛො වාසෙට්ඨ සකං ධම්මං ගරහමානො අගාරස්මා අනගාරියං පබ්බජති 'සමණො භවිස්සාමී'ති. ඉමෙහි ඛො වාසෙට්ඨ චතූහි මණ්ඩලෙහි සමණමණ්ඩලස්ස අභිනිබ්බත්ති අහොසි. තෙසංයෙව සත්තානං අනඤ්ඤෙසං, සදිසානංයෙව නො අසදිසානං, ධම්මෙනෙව නො අධම්මෙන. ධම්මො හි වාසෙට්ඨ සෙට්ඨො ජනෙ'තස්මිං දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායෙච.

---

1. විස්සුතකම්මන්තෙ PTS. විසුං කම්මන්තෙ-(සීමු).
2. ලුද්දාචාර. (සී.)

වාශිෂ්ඨයෙනි, එ සමයෙහි යම් ඒ අධ්‍යායකත්වය (ධ්‍යාන නො කරන බව) පහත් යැ යි සම්මත වී ද, එය දැන් උසස් යැ යි සම්මත ය. වාශිෂ්ඨයිනි, මෙසේ පැරැණි අග්‍ර යැ යි ගන්නා ලද නම්වහරින් ඒ බ්‍රාහ්මණ මණ්ඩලයාගේ නිපැත්ම විය. එ ද ඒ සත්‍වයනට ම ය. අන් සත්‍ව කෙනෙකුට නො වේ. සමාන සත්‍වයනට මය, අසමාන සත්‍වයනට නො වේ. ධර්මයෙන් ම ය, අධර්මයෙන් නො වේ. වාශිෂ්ඨයෙනි, ධර්මය ම මෙලොව්හි ද පරලොව්හි ද මේ ජනයා කෙරෙහි උසස් ය.

14. වාශිෂ්ඨයෙනි, ඒ සතුන් අතුරෙහි ම ඇතැම් කෙනෙක් මෛථුන ධර්ම සෙවනය කොට ඒ ඒ අවස්ථාහි නැඟුණු (හෝ ප්‍රකට වූ) ගව්පාලනාදි කර්මාන්තයන් කළහ. මෛථුනධර්ම ගෙන ඒ ඒ අවස්ථාහි නැඟුණු හෝ ප්‍රකට) කර්මාන්ත කෙරෙත් නු යි 'වෛශ්‍යයෝ ය, වෛශ්‍යයෝ යැ' යි ම නම් වහර උපන. වාශිෂ්ඨයිනි, මෙසේ ම පැරැණි වූ, අග්‍ර යැ යි දන්නා ලද නම් වහරින් වෛශ්‍යමණ්ඩලයාගේ ආරම්භය විය. එ ද ඒ සතුන් පිළිබඳ ව ම ය. අන් සත් කෙනකු පිළිබඳ ව නො වේ. සමානයන් පිළිබඳ ව ම ය. අසමානයන් පිළිබඳ ව නො වේ. ධර්මයෙන් ම ය, අධර්මයෙන් නො වේ. වාශිෂ්ඨයෙනි, ධර්මය ම මේ ජනයා කෙරෙහි මෙ ලොව්හි ද පර ලොව්හි ද ශ්‍රේෂ්ඨ ය.

වාශිෂ්ඨයෙනි, ඒ සත්‍වයන් අතුරෙහි ම යම් කෙනෙක් රෞද්‍රාචාර ක්ෂුද්‍රාචාර ඇත්තෝ වූහු ද, මොහු රෞද්‍රාචාර ඇත්තාහ, ක්ෂුද්‍රාචාර ඇත්තාහ යි කියා ම, ඔවුනට ශූද්‍රයෝ ය ශූද්‍රයෝ යැ යි ම නම්වහර උපන. වාශිෂ්ඨයෙනි, මෙසේ අග්‍රයැ යි දන්නා ලද පැරැණි නම් වහරින් මේ ශූද්‍රගණයාගේ ආරම්භය විය. එ ද ඒ සත්‍වයන් පිළිබඳ ව ම ය. අන් සත්‍ව කෙනෙකු පිළිබඳ ව නො වේ. සමානයන් පිළිබඳ ව ම ය, අසමානයන් පිළිබඳ ව නො වේ. ධර්මයෙන් ම ය, අධර්මයෙන් නො වේ. වාශිෂ්ඨයෙනි, එහෙයින් මෙලෝහි ද පරලෝහි ද ධර්මය ම මේ ජනයා කෙරෙහි ශ්‍රේෂ්ඨ ය.

15. වාශිෂ්ඨයෙනි, යම් හෙයෙකින් ක්ෂත්‍රියයාත් සිය දහමට ගරහනුයේ මහණ වන්නෙමි යි ගිහිගෙන් නික්ම පැවිදි බිම් වදනේ ද, බ්‍රාහ්මණයාත් සිය දහමට ගරහනුයේ මහණ වන්නෙමි යි ගිහි ගෙන් නික්මැ පැවිදිබිම් වදනේ ද, වෛශ්‍යයාත් සිය දහමට ගරහමින් ගිහි ගෙන් නික්ම පැවිදිබිම් වදනේ ද, ශූද්‍රයාත් සිය දහමට ගරහනුයේ මහණ වන්නෙමි යි පැවිදි බිම් වදනේ ද, එසේ වූ කාලයෙක් විය. (එ කල්හි) මේ සතර මණ්ඩලයන්ගෙන් ම ශ්‍රමණමණ්ඩලයාගේ ආරම්භය විය. එ ද ඒ සත්‍වයන් පිළිබඳ ම ය, අන් සත්‍ව කෙනෙකු පිළිබඳ නො වේ. සමානයන් පිළිබඳ වැ ම ය, අසමානයන් පිළිබඳ වැ නො වේ. ධර්මයෙන් ම ය. අධර්මයෙන් නො වේ. වාශිෂ්ඨයෙනි, එහෙයින් මෙ ලොව්හි ද පර ලොව් හි ද ධර්මය ම ජනයා කෙරෙහි ශ්‍රේෂ්ඨ ය.

### දුච්චරිතාදිකථා

ඛත්තියො පි ඛො වාසෙට්ඨා කායෙන දුච්චරිතං චරිත්වා, වාචාය දුච්චරිතං චරිත්වා, මනසා දුච්චරිතං චරිත්වා, මිච්ඡාදිට්ඨිකො, මිච්ඡාදිට්ඨිකම්මසමාදනො මිච්ඡාදිට්ඨිකම්මසමාදානහෙතු කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. බ්‍රාහ්මණො පි ඛො වාසෙට්ඨා –පෙ– වෙස්සො පි ඛො වාසෙට්ඨා –පෙ–සුද්දො පි ඛො වාසෙට්ඨා–පෙ–සමණො පි ඛො වාසෙට්ඨා කායෙන දුච්චරිතං චරිත්වා, වාචාය දුච්චරිතං චරිත්වා, මනසා දුච්චරිතං චරිත්වා, මිච්ඡාදිට්ඨිකො මිච්ඡාදිට්ඨිකම්මසමාදනො මිච්ඡාදිට්ඨිකම්මසමාදානහෙතු කායස්ස භෙදා පරම්මරණා අපාය දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

ඛත්තියො පි ඛො වාසෙට්ඨා කායෙන සුචරිතං චරිත්වා, වාචාය සුචරිතං චරිත්වා, මනසා සුචරිතං චරිත්වා, සම්මාදිට්ඨිකො සම්මාදිට්ඨිකම්මසමාදනො සම්මාදිට්ඨිකම්මසමාදානහෙතු කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. බ්‍රාහ්මණො පි ඛො වාසෙට්ඨා –පෙ– වෙස්සො පි ඛො වාසෙට්ඨා –පෙ– සුද්දො පි ඛො වාසෙට්ඨා –පෙ– සමණො පි ඛො වාසෙට්ඨා කායෙන සුචරිතං චරිත්වා –පෙ– සග්ගං ලොකං උපපජ්ජති. ඛත්තියො පි ඛො වාසෙට්ඨා කායෙන ද්වයකාරී, වාචාය ද්වයකාරී, මනසා ද්වයකාරී, විමිස්සදිට්ඨිකො විමිස්සදිට්ඨිකම්මසමාදනො විමිස්සදිට්ඨිකම්මසමාදානහෙතු කායස්ස භෙදා පරම්මරණා සුඛදුක්ඛපටිසංවෙදී[1] හොති. බ්‍රාහ්මණො පි ඛො වාසෙට්ඨා –පෙ– වෙස්සො පි ඛො වාසෙට්ඨා. –පෙ– සුද්දො පි ඛො වාසෙට්ඨා –පෙ– සමණො පි ඛො වාසෙට්ඨා කායෙන ද්වයකාරී, වාචාය ද්වයකාරී, මනසා ද්වයකාරී, විමිස්සදිට්ඨිකො විමිස්සදිට්ඨිකම්මසමාදනො විමිස්සදිට්ඨිකම්මසමාදානහෙතු කායස්ස භෙදා පරම්මරණා සුඛදුක්ඛපටිසංවෙදී හොති.

### බොධිපක්ඛියභාවනා

16. ඛත්තියො පි ඛො වාසෙට්ඨා කායෙන සංවුතො, වාචාය සංවුතො, මනසා සංවුතො, සත්තන්නං බොධිපක්ඛියානං ධම්මානං භාවනමන්වාය දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බාති[2].

1. සුඛදුක්ඛප්පටිසංවෙදී - මජ්ඣං.
2. පරිනිබ්බායති–මජ්ඣං.

### දුශ්චරිතාදිකථා

වාශිෂ්ඨයෙනි, ක්ෂත්‍රියයා ද කයින් දුසිරිත් කොට, වචනයෙන් දුසිරිත් කොට මනසින් දුසිරිත් කොට, මිසදිටු වැ, මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන ඇති වැ, මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන හෙතුයෙන් කාබුන් මරණින් මතු, සැප නැති දුකට ස්ථාන වූ, විවස ව පතිත වන තැන වූ නිරයට පැමිණෙයි. වාශිෂ්ඨයෙනි, බ්‍රාහ්මණයා ද... වෛශ්‍යයා ද... ශුද්‍රයා ද... ශ්‍රමණයා ද කයින් දුසිරිත් කොට, වචනයෙන් දුසිරිත් කොට, සිතින් දුසිරිත් කොට, මිථ්‍යාදෘෂ්ටික වැ මිථ්‍යාදෘෂ්ටි කර්මසමාදාන ඇති වැ මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන හෙතුයෙන් කාබුන් මරණින් මතු, සැප නැති, දුකට තැන් වූ, විවස වැ පතිත වන තැන වූ නිරයට පැමිණෙයි.

වාශිෂ්ඨයෙනි, ක්ෂත්‍රියයා ද කයින් සුසිරි පුරා, වචනයෙන් සුසිරි පුරා, සම්‍යග්දෘෂ්ටිකර්මසමාදාන ඇති වැ සිතින් සුසිරි පුරා, සම්‍යග්දෘෂ්ටික වැ සම්‍යග්දෘෂ්ටිකර්මසමාදාන හෙතුයෙන් කාබුන් මරණින් මතු, මනා ගති ඇති සග ලොවට පැමිණෙයි. වාශිෂ්ඨයෙනි, බ්‍රාහ්මණයා ද...වෛශ්‍යයා ද...ශුද්‍රයා ද... ශ්‍රමණයා ද කයින් සුසිරි පුරා...සග ලොවට යෙයි. වාශිෂ්ඨයෙනි, ක්ෂත්‍රියයා ද (විටෙක කුසල් ද විටෙක අකුසල් දැයි) කුශලාකුශල දෙක ම කරන සුලු වූයේ, වචනයෙන් කුශලාකුශල දෙක ම කරන සුලු වූයේ, සිතින් කුසලාකුශල දෙක ම කරන සුලු වූයේ, (විටෙක සම්‍යග්දෘෂ්ටික ද විටෙක මිථ්‍යාදෘෂ්ටික ද යි) මිශ්‍ර දෘෂ්ටි ඇතියේ, මිශ්‍රදෘෂ්ටික කර්මසමාදාන ඇතියේ, මිශ්‍රදෘෂ්ටික කර්මසමාදාන හෙතුයෙන් කාබුන් මරණින් මතු සුව දුක් විඳුනේ වෙයි. වාශිෂ්ඨයෙනි, බ්‍රාහ්මණයා ද... වෛශ්‍යයා ද... ශුද්‍රයා ද... ශ්‍රමණයා ද කයින් කුසල් අකුසල් දෙක ම කරන සුලු වූයේ,... වචනයෙන් කුසල් අකුසල් දෙකම කරන සුලු වූයේ,... මනසින් කුසල් අකුසල් දෙක ම කරන සුලු වූයේ, මිශ්‍ර දෘෂ්ටි ඇතියේ, මිශ්‍රදෘෂ්ටික කර්මසමාදාන ඇත්තේ, මිශ්‍රදෘෂ්ටිකකර්මසමාදාන හෙතුයෙන් කාබුන් මරණින් මතු සුව දුක් විඳුනේ වෙයි.

16. වාශිෂ්ඨයෙනි, ක්ෂත්‍රියයා ද කයින් සංවෘත වූයේ (හැවුරුණේ), වචනයෙන් හැවුරුණේ, සිතින් හැවුරුණේ, සත් කොටසකට අයත් වූ (සත්තිස්) බොධිපාක්ෂික ධර්මයන් වැඩීමට බැස, මෙ අත්බවහි ම (කෙලෙස් පිරිනිවනින්) පිරිනිවෙයි.

බ්‍රාහ්මණො පි ඛො වාසෙට්ඨා, වෙස්සො පි ඛො වාසෙට්ඨා, සුද්දොපි ඛො වාසෙට්ඨා, සමණො පි ඛො වාසෙට්ඨා කායෙන සංවුතො, වාචාය සංවුතො, මනසා සංවුතො, සත්තන්නං බොධිපක්ඛියානං ධම්මානං භාවනමන්වාය දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බාති. ඉමෙසං හි වාසෙට්ඨා චතුන්නං වණ්ණානං යො හොති භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණ-භවසඤ්ඤොජනො සම්මදඤ්ඤාවිමුත්තො, සො නෙසං අග්ගමක්ඛායති. ධම්මෙනෙව නො අධම්මෙන. ධම්මො හි වාසෙට්ඨා සෙට්ඨො ජනෙ'තස්මිං දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායෙච. බ්‍රහ්මුනා පි වාසෙට්ඨා සනඞ්කුමාරෙන ගාථා භාසිතා:

17. "ඛත්තියො සෙට්ඨො ජනෙ'තස්මිං යෙ ගොත්තපටිසාරිනො,[1]
විජ්ජාචරණසම්පන්නො සො සෙට්ඨො දෙවමානුසෙ"ති.

සා ඛො පනෙසා වාසෙට්ඨා ගාථා බ්‍රහ්මුනා සනඞ්කුමාරෙන සුගීතා නො දුග්ගීතා, සුභාසිතා නො දුබ්භාසිතා, අත්ථසංහිතා[2] නො අනත්ථසංහිතා, අනුමතා මයා, අහම්පි වාසෙට්ඨා එවං වදාමි:

"ඛත්තියො සෙට්ඨො ජනෙ'තස්මිං යෙ ගොත්තපටිසාරිනො,
විජ්ජාචරණසම්පන්නො සො සෙට්ඨො දෙවමානුසෙ"ති.

ඉදමවොච භගවා. අත්තමනා වාසෙට්ඨභාරද්වාජා භගවතො භාසිතං අභිනන්දුන්ති.

අග්ගඤ්ඤසුත්තං නිට්ඨිතං චතුත්ථං.

1. පටිසාරිණො PTS
2. අත්ථසඤ්හිතා

වාශිෂ්ඨයෙනි, මේ සතර වර්ණයන් ගෙන් (කවර වර්ණයකට අයත් වුව ද) රහත් වූ, නැසූ ආශ්‍රව ඇති, වැස අවසන් කළ මහබඹසර ඇති, සිවුමඟින් කළයුතු කෘත්‍ය කොට නිමැවූ, බහා තැබූ ස්කන්ධභාරය ඇති, මහ පිළිවෙළින් පැමිණි ස්වාර්ථය (රහත් බව) ඇති හැම ලෙසින් ම ක්ෂයයට පැමිණුවූ බවබැඳුම් ඇති මොනොවට (මනා ව නුවණින්) දත කෙලෙසුන්-ගෙන් මිදුණු මහණෙක් වේ ද, හෙ තෙමේ ඒ හැම දෙනාට ම අග්‍ර යැ යි කියනු ලැබේ. ඒ ද ධර්මයෙන් ම ය. අධර්මයෙන් නො වේ. වාශිෂ්ඨයෙනි, එහෙයින් ධර්මය මෙ ලොවිහි ද පරලොවිහි ද මේ ජනයා කෙරෙහි ශ්‍රේෂ්ඨ වෙයි. වාශිෂ්ඨයෙනි, සනත්කුමාර බ්‍රහ්මයා විසින් ද කියන ලද ගාථාවෙක් වෙයි.

17. ''යම් කෙනෙක් සිය ගෝත්‍රය සිහිකරන්නෝ ඇත් ද, ඒ ජනයා අතුරෙහි ක්ෂත්‍රියයා ශ්‍රේෂ්ඨ ය. යමෙක් විද්‍යායෙනුත් චරණධර්මයෙනුත් යුක්ත ද ඒ සම්‍යක් සම්බුද්ධ තෙමේ දෙව්මිනිසුන් අතුරෙහි ශ්‍රේෂ්ඨ ය''. වාශිෂ්ඨයෙනි, ඒ ගාථාව වූ කලි සනත්කුමාර බඹුහු විසින් මොනොවට ගයන ලදී. නොමනා කොට ගයන ලද්දේ නො වෙයි. මොනොවට කියන ලද්දේ වෙයි. නොමනා කොට කියන ලද්දෙක් නොවෙයි. අර්ථ නිඃශ්‍රිතය. අනර්ථනිඃශ්‍රිත නො වේ. මා විසින් ද අනුමත වෙයි. වාශිෂ්ඨයෙනි, මමත් මෙසේ කියමි:

''යම් කෙනෙක් සිය ගෝත්‍ර සිහිකරන්නෝ ඇත් ද, ඒ ඒ ජනයා අතුරෙහි ක්ෂත්‍රියයා ශ්‍රේෂ්ඨ ය. යමෙක් විද්‍යායෙනුත් චරණ ධර්ම-යෙනුත් යුක්ත ද ඒ සම්‍යක් සම්බුද්ධ තෙමේ දෙව්මිනිසුන් අතුරෙහි ශ්‍රේෂ්ඨ ය''.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. වාශිෂ්ඨ භාරද්වාජ දෙදෙනා සතුටු සිතැත්තාහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය ආදරයෙන් පිළිගත්හ.

සතරවන අග්ගඤ්ඤ සූත්‍රය නිමියේ යැ.

# 5

# සම්පසාදනීය සුත්තං

## සාරිපුත්ත-සීහනාදො[1]

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා නාළන්දායං[2] විහරති පාවාරිකම්බවනෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: "එවං පසන්නො අහං භන්තෙ භගවති, න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යොභිඤ්ඤතරො යදිදං සම්බොධියන්ති".

"උළාරා ඛො තෙ අයං සාරිපුත්ත ආසභී වාචා භාසිතා, එකංසො ගහිතො, සීහනාදො නදිතො: 'එවං පසන්නො අහං භන්තෙ භගවති, න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යො'භිඤ්ඤතරො යදිදං සම්බොධියන්ති', කිං තෙ[3] සාරිපුත්ත යෙ තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මා-සම්බුද්ධා, සබ්බෙ තෙ භගවන්තො චෙතසා චෙතො පරිච්ච විදිතා, එවංසීලා තෙ භගවන්තො අහෙසුං ඉති පි, එවංධම්මා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංපඤ්ඤා තෙ භගවන්තො අහෙසුං ඉති පි, එවංවිහාරී තෙ භගවන්තො අහෙසුං ඉති පි, එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපී ? ති".

"නො හෙතං භන්තෙ".

"කිං පන තෙ සාරිපුත්ත යෙ තෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, සබ්බෙ තෙ භගවන්තො චෙතසා චෙතො පරිච්ච විදිතා, එවංසීලා තෙ භගවන්තො භවිස්සන්ති ඉති පි, එවංධම්මා -පෙ- එවංපඤ්ඤා. එවංවිහාරී. එවංවිමුත්තා තෙ භගවන්තො භවිස්සන්ති ඉතිපී ?ති".

---

1. දුතියභාගෙ දීඝ II 130 පිටෙව.
2. නාලන්දායං - මජසං
3. කිංනු-PTS. කිං නු ඛො තෙ-සයා.

# 5

# සම්පසාදනීය සූත්‍රය

## ශාරිපුත්‍ර සිංහනාදය

1. මා විසින් මෙසේ අසන ලදී:

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාලන්ද නුවර සමීපයේ වූ පාවාරික සිටුහුගේ අඹ වෙනෙහි වැඩ වසන සේක. එ කල්හි සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළඹැ ඔබ වැඳ එකත්-පස් වැ උන්හ. සැරියුත් තෙරණුවෝ එසේ එකත් පස්වැ උන්නාහු ම 'වහන්ස, යම් සම්බොධිඥනයෙක් වේ ද, එහි ලා (එයින්) භාග්‍යවතුන් වහන්සේට වැඩි තරම් නුවණ ඇති අන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ පෙරත් නො විය, මතුත් නො වන්නේ ය, දැනුත් නැතැ යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ කෙරේ පැහැදුණෙම් වෙමි'යි මෙ වචන වදළහ.

''ශාරිපුත්‍රයෙනි, 'වහන්ස, යම් සම්බොධිඥනයෙක් වේද එයින් භාග්‍යවතුන් වහන්සේට වැඩි තරම් නුවණ ඇති අන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ පෙරත් නොවී ය, මතුත් නො වන්නේය, දැනුත් නැතැ'යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණෙම් වෙමි'යි තොප විසින් උදර වූ අභීත වචනයෙක් කියන ලද. ඒකාන්තයෙක් ගන්නා ලද. සිංහනාදයෙක් පවත්වන ලද. කිමෙක්ද ශාරිපුත්‍රයෙනි, ඉකුත් කල්හි යම් අර්හත් සම්මාසම්බුදු කෙනෙක් වූහු ද ඒ සියලු භගවත්හු ඔවුන් වහන්සේගේ සිත් තොප සිතින් පිරිසිඳ, 'ඒ භගවත්හු මෙබඳු සිල් ඇත්තෝ වූහයි, මෙබඳු දහම් ඇත්තෝ වූහ යි, ඒ භගවත්හු මෙසේ වූ ප්‍රඥ ඇත්තෝ වූහ යි, ඒ භගවත්හු මෙබඳු විහරණ ඇත්තෝ වූහ යි, ඒ භගවත්හු මෙබඳු විමුක්තියක් ඇත්තෝ වූහ' යි කියා තොප විසින් දැනගන්නා ලද්දාහු ද?''යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක.

''වහන්ස මෙය එසේ දැනගන්නා ලද්දේ නො වේ'' යැ යි තෙරණුවෝ වදළහ.

''කිම ශාරිපුත්‍රයෙනි, ''මතු කල්හි යම් අර්හත් සම්මාසම්බුදු කෙනෙක් වන්නාහු නම්, ඒ භගවත්හු මෙ බඳු සිල් ඇත්තෝ වන්නාහ, මෙබඳු දහම් ඇත්තෝ වන්නාහ... මෙබඳු විමුක්ති ඇත්තෝ වන්නාහ''යි ඔවුන් වහන්සේගේ සිත් තොප සිතින් පිරිසිඳ ඒ භගවත්හු තොප විසින් දත්නා ලද්දාහු ද''යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක.

"නො හෙතං භන්තෙ'.'

"කිං පන තෙ සාරිපුත්ත අහං එතරහි අරහං සම්මාසම්බුද්ධො චෙතසා චෙතො පරිච්ච විදිතො එවංසීලො භගවා ඉති පි එවංධම්මො එවංපඤ්ඤො එවංවිහාරී එවංවිමුත්තො භගවා ඉතිපී'' ?ති.

"නො හෙතං භන්තෙ''.

"එත්ථ හි[1] තෙ සාරිපුත්ත අතීතානාගතපච්චුප්පන්නෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු චෙතොපරියඤාණං නත්ථි. අථ කිඤ්චරහි තෙ අයං සාරිපුත්ත උළාරා ආසභී වාචා භාසිතා, එකංසො ගහිතො, සීහනාදො නදිතො "එවං පසන්නො අහං භන්තෙ භගවති, න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යො'භිඤ්ඤතරො යදිදං සම්බොධියන්ති ?''.

"න ඛො මෙං[2] භන්තෙ අතීතානාගතපච්චුප්පන්නෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු චෙතොපරියඤාණං අත්ථි. අපි ච ඛො මෙ භන්තෙ ධම්මන්වයො විදිතො. සෙය්‍යථාපි භන්තෙ රඤ්ඤො පච්චන්තිමං නගරං දළ්හුද්දාපං[3] දළ්හපාකාරතොරණං එකද්වාරං, තත්‍රස්ස දොවාරිකො පණ්ඩිතො බ්‍යත්තො[4] මෙධාවී අඤ්ඤාතානං නිවාරෙතා, ඤාතානං පවෙසෙතා, සො තස්ස නගරස්ස සමන්තා[5] අනුපරියායපථං අනුක්කමමානො[6] න පස්සෙය්‍ය පාකාරසන්ධිං වා පාකාරවිවරං වා අන්තමසො බිළාරනිස්සක්කනමත්තම්පි, තස්ස එවමස්ස, යෙ කෙචි ඔළාරිකා පාණා ඉමං නගරං පවිසන්ති වා නික්ඛමන්ති වා, සබ්බෙ තෙ ඉමිනා'ව ද්වාරෙන පවිසන්ති වා නික්ඛමන්ති වා'ති, එවමෙව ඛො මෙ භන්තෙ ධම්මන්වයො විදිතො. යෙ තෙ භන්තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මා සම්බුද්ධා, සබ්බෙ තෙ භගවන්තො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, චතූසු[7] සතිපට්ඨානෙසු සුප්පතිට්ඨිතචිත්තා, සත්තසම්බොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිංසු.

1. එත්ථ ච හි. මජ්ඣසං
2. න ඛො පනෙතං. සීමු. ස්‍යා.
3. දළ්හුද්ධාප. මජ්ඣ, දළ්හද්ධාලං. ස්‍යා.
4. වියත්තො. ස්‍යා, PTS.
5. සාමන්තා. සීමු. ස්‍යා.
6. අනුක්කමන්තො. PTS.
7. චතුසු PTS.

"මෙය එසේ නො දන්නා ලද"යි තෙරණුවෝ වදළහ.

"කිම ශාරිපුත්‍රයෙනි, මෙ සමයෙහි මම් අර්හත් සම්‍යක්සම්බුද්ධ වෙමි. මේ භගවත්හු මෙසේ වූ සිල් ඇත්තෝය, මෙසේ වූ දහම් ඇත්තෝ ය, මෙසේ වූ ප්‍රඥ ඇත්තෝය, මෙසේ වූ විහරණ ඇත්තෝය, මෙසේ වූ විමුක්ති ඇත්තෝ යැ යි ද මා සිත තොප සිතින් පිරිසිඳ දනාගන්නා ලද ද?"යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක.

"මෙය එසේ නො ම දනගන්නා ලද"යි තෙරණුවෝ වදළහ.

"ශාරිපුත්‍රයෙනි, මෙහි ලා ඉකුත් කලැ වූ ද, මතු කල්හි වන්නාවූ ද, දන් ඇත්තාවූ ද රහත් සම්මාසම්බුදුවරුන් විෂයයෙහි ඔවුන් සිත් පිරිසිඳ දන්මෙක් තොපට නැත. එසේ කලැ කවර නම් සැටියෙකින් තොප විසින් 'වහන්ස, යම් සම්බෝධිඥනයෙක් වේ ද එයින් භාග්‍යවතුන් වහන්සේට වැඩි තරම් නුවණ ඇති අන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ පෙරත් නො වී ය, මතුත් නොවන්නේ ය දනුත් නැතැ යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණෙම් වෙමි'යි තොප විසින් මේ උදර වූ ශ්‍රේෂ්ඨ වචනය කියන ලද ද? ඒකාංශය ගන්නා ලද ද, සිංහනාදය පවත්වන ලද ද?"යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක.

"වහන්ස, අතීත අනාගත වර්තමාන රහත් සම්මාසම්බුදුවරුන් විෂයයෙහි ඔබ සිත් පිරිසිඳ දන්නා නුවණෙක් මට නැත. වහන්ස, එහෙත් මට අනුමානඥනය ප්‍රකට ව ඇත. වහන්ස, යම්සේ රජක්හුගේ තර වූ පවුරුපා ඇති, දඩි පවුරු තොරණ ඇති, එක් දෙරක් ඇති පසල් නුවරෙක් වන්නේද, එහි නොදන්නා ලදුවන් වළක්වන, දන්නා ලදුවන් පිවිස්වන, පණ්ඩිත වූ ව්‍යක්ත වූ, නුවණ ඇති ද්වාරපාලයෙක් වන්නේද, හෙ තෙමේ එනුවර හාත්පසැ පවුරු මඟ ඔස්සේ යනුයේ ප්‍රාකාරසන්ධියක් (ගඩොළු දෙකක් ගිලිහී ගිය තැනක්) හෝ ප්‍රාකාර විවරයක් (පවුර සිඳීගිය තැනක්) හෝ යටත් පිරිසෙයින් බළලකු රිංගා පිට වන පමණ සිදුරකුදු නො දක්නේද, එවිට ඔහුට යම මහත් සත්ත්ව කෙනෙක් මෙ නුවරට වදනාහු නම්, මෙයින් නික්මෙන්නාහු නම් හෝ, උහු හැම මෙ දෙරින් ම පිවිසෙන්-තෝ ද නික්මෙන්නෝ ද වෙත්'යැ යි මෙසේ සිතෙක් වන්නේද, එ පරිද්දෙන් ම වහන්ස, ගිය කලැ යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වූහු ද, ඒ සියලු භගවත්හු ම සිත කෙලසන, නුවණ දුබල් කරන, පංච නිවරණ, යන් දුරු කොට, සිවු සිවටන්හි මොනොවට පිහිටි සිතැත්තෝ, සම්බෝ-ධ්‍යංග සත තත් වූ පරිදි වඩා, නිරුත්තර සම්‍යක් සම්බෝධිය ලදුවහ.

යෙ පි තෙ භවිස්සන්ති. අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, සබ්බෙ තෙ භගවන්තො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, චතූසු සතිපට්ඨානෙසු සුප්පතිට්ඨිතචිත්තා සත්ත සම්බොජ්ඣඞ්ගෙ[1] යථාභූතං භාවෙත්වා, අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිස්සන්ති. භගවා පි භන්තෙ එතරහි අරහං සම්මාසම්බුද්ධො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, චතූසු සතිපට්ඨානෙසු සුප්පතිට්ඨිතචිත්තො සත්ත සම්බොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා, අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො.

2. ඉදහං[2] භන්තෙ යෙන භගවා තෙනුපසඞ්කමිං ධම්මසවණාය.[3] තස්ස මෙ භන්තෙ භගවා ධම්මං දෙසෙසි.[4] උත්තරුත්තරං පණීතපණීතං කණ්හසුක්කසප්පටිභාගං. යථා යථා මෙ භන්තෙ භගවා ධම්මං දෙසෙසි උත්තරුත්තරං[5] පණීතපණීතං කණ්හසුක්කසප්පටිභාගං, තථා තථාහං තස්මිං ධම්මෙ අභිඤ්ඤාය ඉධෙකච්චං ධම්මං ධම්මෙසු නිට්ඨමගමං, සත්ථරි පසීදිං, 'සම්මාසම්බුද්ධො වත සො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො[6] භගවතො සාවකසඞ්ඝො'ති.

## කුසලධම්මදෙසනා

3. අපරං පන භන්තෙ එතදනුත්තරියං, යථා භගවා ධම්මං දෙසෙති කුසලෙසු ධම්මෙසු. තත්‍රිමෙ කුසලා ධම්මා: සෙය්‍යථීදං චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාද, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො. ඉධ භන්තෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡි කත්වා උපසම්පජ්ජ විහරති. එතදනුත්තරියං භන්තෙ කුසලෙසු ධම්මෙසු තං භගවා අසෙසමභිජානාති තං භගවතො අසෙසමභිජානතො උත්තරිං අභිඤ්ඤෙය්‍යං නත්ථි, යදභිජානං අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යො' භිඤ්ඤතරො අස්ස යදිදං කුසලෙසු ධම්මෙසු.

1. බොජ්ඣඞ්ගෙ. PTS.
2. ඉධාහං. මජසං
3. ධම්මස්සවණය. මජසං ධම්ම සවනාය. PTS.
4. දෙසෙති. මජසං
5. උත්තාරුත්තරිං සයා, PTS.
6. සුප්පටිපන්නො සාවකසංඝො මජසං

මතු කලැ යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වන්නාහු නම් ඒ භගවත්හු ද සිත කෙලෙසන නුවණ දුබල කරන පංච නීවරණයන් දුරැලා, සතර සිව්වටන්හි සුපිහිටි සිතැත්තෝ, සත් සම්බෝධ්‍යඞ්ග තත්වූ පරිදි වඩා නිරුත්තර සම්‍යක්සම්බෝධිය ලබන්නාහ. වහන්ස, මෙ සමයෙහි රහත් සම්මා සම්බුදු වූ භාග්‍යවතුන් වහන්සේ ද සිත කිලිටි කරන නුවණ දුබල කරන පංචනීවරණයන් දුරැලා සතර සිව්වටන්හි සුපිහිටි සිතැති ව, නිසි ලෙසින් සත් සම්බෝධ්‍යංග වඩා නිරුත්තර සම්‍යක්සම්බෝධිය ලද සේකි''යි අනුමාන ඥාන්ම මට ප්‍රකට විය.

2. වහන්ස, මෙහි මම දහම් අසනු පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියෙමි. වහන්ස, ඒ මට යම්සේ භාග්‍යවතුන් වහන්සේ වඩ වඩා උතුම් ලෙස, වඩ වඩා ප්‍රණීත ලෙස, ප්‍රතිබාහන සහිත කොට කුශලාකුශල ධර්මයන් (කුසලුන් ප්‍රතිබාහනය කොට අකුසල් ද අකුසලුන් ප්‍රතිබාහනය කොට කුසලුන් ද සිටුනා නියාව ඔවුනට සරි ලෙස ලැබෙන විපාක ද සහිත කොට) දෙසූ සේක් ද, ඒ ඒ සැටියෙන් ඒ දෙසූ ධර්මයෙහි එක්තරා ධර්මයක් වෙසෙසි නුවණින් දැන සිවුසස් දහම්හි නිෂ්ඨාවට පැමිණියෙමි. 'ඒකාන්තයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධ සේක, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මොනොවට වදරන ලද්දේය. ඔබගේ ශ්‍රාවක සංඝයාද සුප්‍රතිපන්න යැ යි ශාස්තෲන් වහන්සේ කෙරෙහි පැහැදුණෙමි.

## කුශල ධර්ම දේශනා

3. වහන්ස, යම්සේ භාග්‍යවතුන් වහන්සේ කුශලධර්ම විෂයයෙහි දහම් දෙසන සේක්ද, මෙය ඔබ කෙරෙහි වූ අන් අනුත්තරිය (එයට වැඩි අන් එකක්හු නැති) ගුණයෙකි. එහි ලා සතර සිව්වටන්හුය, සතර සම්‍යක්ප්‍රධානයෝ ය, සතර ඍද්ධිපාදයෝ ය, පංච ඉන්ද්‍රියයෝ ය, පංච බලයෝ ය, සප්ත බෝධ්‍යඞ්ගයෝ ය, ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය ය යන මොහු ඒ කුශලධර්මයෝ ය.වහන්ස, මෙහි භික්ෂු තෙම ආශ්‍රව නැසීමෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්තිය (ඵලසමාධිය) ද, ප්‍රඥවිමුක්තිය (ඵල ඥාණය) ද, මෙ අත්බවහි දී ම තෙමේ ම වෙසෙසි නුවණින් පසක් කොට ලැබගෙන වෙසෙයි. එය භාග්‍යවතුන් වහන්සේ සර්වප්‍රකාරයෙන් ම වෙසෙසි නුවණින් දන්නා සේක. මෙය කුශලධර්ම විෂයයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අනුත්තරිය ගුණයෙකි. යමක් දන්නා අන් මහණෙක් හෝ බමුණෙක් හෝ භාග්‍යවතුන් වහන්සේට වඩා කුශල ධර්ම විෂයයෙහි දන්නෙක් ඇතැයි නො කියැ හැක්ක. ඒ හැම නිශ්ශෙෂයෙන් වෙසෙසි නුවණින් දන්නා භාග්‍යවතුන් වහන්සේ විසින් එයින් මත්තෙහි දතයුතු දෑයෙක් නැත.

## ආයතනපණ්ණත්ති

4. අපරං පන භන්තෙ එතදනුත්තරියං, යථා භගවා ධම්මං දෙසෙති ආයතනපණ්ණත්තීසු[1]. ඡයිමානි භන්තෙ අජ්ඣත්තිකබාහිරානි ආයතනානි: චක්ඛුච[2] ච රූපානි ච සොතඤ්ච[3] සද්දා ච, ඝානඤ්ච[4] ගන්ධා ච ජිව්හා ච[5] රසා ච, කායො ච[6] ඵොට්ඨබ්බා ච[7] මනො ච[8] ධම්මා ච. එතදනුත්තරියං භන්තෙ ආයතනපණ්ණත්තීසු. තං භගවා අසෙසමභිජානාති. තං භගවතො අසෙසමභිජානතො උත්තරිං අභිඤ්ඤෙය්‍යං නත්ථි, යදභිජානං අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යො භිඤ්ඤතරො අස්ස යදිදං ආයතනපණ්ණත්තීසු.

## ගබ්භාවක්කන්තිදෙසනා

5. අපරං පන භන්තෙ එතදනුත්තරියං, යථා භගවා ධම්මං දෙසෙති ගබ්භාවක්කන්තීසු. චතස්සො ඉමා භන්තෙ ගබ්භාවක්කන්තියො: ඉධ භන්තෙ එකච්චො අසම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, අසම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, අසම්පජානො මාතුකුච්ඡිම්හා නික්ඛමති. අයං පඨමා ගබ්භාවක්කන්ති. පුන ච පරං භන්තෙ ඉධෙකච්චො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, අසම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, අසම්පජානො මාතුකුච්ඡිම්හා නික්ඛමති. අයං දුතියා ගබ්භාවක්කන්ති. පුන ච පරං භන්තෙ ඉධෙකච්චො සම්පජානො[9] මාතුකුච්ඡිං ඔක්කමති, සම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, අසම්පජානො මාතුකුච්ඡිම්හා[10] නික්ඛමති. අයං තතියා ගබ්භාවක්කන්ති. පුන ච පරං භන්තෙ ඉධෙකච්චො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, සම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, සම්පජානො මාතුකුච්ඡිම්හා නික්ඛමති. අයං චතුත්ථී[11] ගබ්භාවක්කන්ති. එතදනුත්තරියං භන්තෙ ගබ්භාවක්කන්තීසු

## ආදෙසනාවිධා දෙසනා

6. අපරං පන භන්තෙ එතදනුත්තරියං, යථා භගවා ධම්මං දෙසෙති ආදෙසනාවිධාසු. චතස්සො ඉමා භන්තෙ ආදෙසනාවිධා. ඉධ භන්තෙ එකච්චො නිමිත්තෙන ආදිසති 'එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉති පි තෙ චිත්තන්ති'. සො බහුං චෙපි ආදිසති තථෙව තං හොති, නො අඤ්ඤථා. අයං පඨමා ආදෙසනාවිධා.

1. ආයතනපඤ්ඤත්තීසු PTS
2. චක්ඛුඤ්චෙව–සීමු. මජසං
3. සොතඤ්චෙව–PTS.
4. ඝානඤ්චෙව–PTS
5. ජිව්හාචෙව–PTS
6. කායොචෙව - PTS.
7. ඵොට්ඨබ්බා චෙව. සීමු
8. මනොචෙව–PTS.
9. සම්පජානො පි–PTS.
10. මාතුකුච්ඡිස්මා PTS
11. චතුත්ථා – මජසං

## ආයතනප්‍රඥප්ති

4. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආයතන ප්‍රඥප්ති විෂයයෙහි යමසේ දහම් දෙසන සේක් ද, මෙය ද අන් අනුත්තරිය ගුණයෙකි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වදාළ මේ ආධ්‍යාත්මික බාහිර ආයතන සයෙකි. ඇස ද රූප ද, කන ද හඬ ද, නැහැය ද ගඳ ද, දිව ද රස ද, කය ද හැපෙන දැ ද, මනස ද දහම් ද යන මොහුය. වහන්ස, මෙය ආයතන ප්‍රඥප්ති විෂයයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අනුත්තරිය ගුණයෙකි. එය භාග්‍යවතුන් වහන්සේ නිශ්ශෙෂයෙන් වෙසෙසි නුවණින් දන්නා සේක. ආයතන ප්‍රඥප්ති විෂයයෙහි යමක් දන්නා අන් මහණකු හෝ බමුණකු හෝ භාග්‍යවතුන් වහන්සේට වඩා දැනුම් ඇත්තකු වේතැයි නො කියැ හැක්ක. ඒ සියල්ල නිශ්ශෙෂ කොට වෙසෙසි නුවණින් දන්නා භාග්‍යවතුන් වහන්සේ විසින් එයින් මත්තෙහි (ඒ සම්බන්ධයෙන්) දත යුතු දෑයෙක් නැත.

## ගර්භාවක්‍රාන්ති දේශනා

5. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගර්භාවක්‍රාන්ති විෂයයෙහි යමසේ දහම් දෙසන සේක් ද, මෙය ද අන් අනුත්තරිය ගුණයෙකි. වහන්ස, (භාග්‍යවතුන් වහන්සේ වදළ) මේ ගර්භාවක්‍රාන්ති සතරෙකි: මෙහි එක්තරා සත්වයෙක් දැනුම් නැත්තේ (සිහිමුළා ව) මවු කුස පිවිසෙයි. දැනුම් නැත්තේ මවු කුසෙහි වෙසෙයි, දැනුම් නැත්තේ මවු කුසින් නික්මෙයි. මේ පළමු ගර්භාවක්‍රාන්තිය යි. තව ද වහන්ස, මෙහි එක්තරා සත්ත්වයෙක් දැනුම් ඇත්තේ මවු කුස වදී. දැනුම් නැත්තේ මවු කුසැ වෙසෙයි, දැනුම් නැත්තේ මවු කුසින් බිහි වෙයි. මේ දෙවෙනි ගර්භාවක්‍රාන්තිය යි. තව ද, වහන්ස, මෙහි එක්තරා සත්ත්වයෙක් දැනුම් ඇත්තේ මවුකුස පිවිසෙයි, දැනුම් ඇත්තේ මවු කුසැ වෙසෙයි, දැනුම් නැත්තේ මවු කුසින් බිහි වෙයි. මේ තෙවෙනි ගර්භාවක්‍රාන්තිය යි. තව ද මෙහි එක්තරා සත්වයෙක් දැනුම් ඇත්තේ මවු කුස පිවිසෙයි, දැනුම් ඇත්තේ මවු කුසැ වෙසෙයි, දැනුම් ඇත්තේ මවු කුසින් බිහි වෙයි. වහන්ස, ගර්භාවක්‍රාන්ති විෂයයෙහි මේ දැනිම අනුත්තරිය ගුණයෙකි.

## ආදේශනවිධා දේශනා

6. වහන්ස, තව ද ආදේසනා කොට්ඨාස විෂයයෙහි මෙරමා සිත් පවත්නා සැටි බලා යමසේ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනා සේක් ද, මෙය ද භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වූ අනුත්තරිය ගුණයෙකි. වහන්ස, මේ ආදෙසනා කොටස්හු සතර දෙනෙකි. වහන්ස, එක්තරා එකෙක් 'තා මනස මෙසේ ය, තා මනස මෙබඳුය. තා සිත මෙසේ යැ'යි නිමිත්තෙන් කියා පායි. ඔහු බොහෝ වුව ද කියත් නමුදු ඒ එසේ ම වේ, අන් සැටියෙකින් නොවේ. මේ පළමු වැනි ආදේසනා කොට්ඨාසය යි.

පුන ච පරං භන්තෙ ඉධෙකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, අපි ච ඛො මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති'. එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්තන්ති'. සො බහුං චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා. අයං දුතියා ආදෙසනවිධා. පුන ච පරං භන්තෙ ඉධෙකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නාපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, අපි ච ඛො විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාරසද්දං සුත්වා ආදිසති 'එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්තන්ති'. සො බහුං චෙ පි ආදිසති තථෙව තං හොති නො අඤ්ඤථා. අයං තතියා ආදෙසන-විධා. පුන ච පරං භන්තෙ ඉධෙකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නාපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, නාපි විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාරසද්දං සුත්වා ආදිසති, අපි ච ඛො විතක්කවිචාරසමාධිසමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාති – යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා, තථා ඉමස්ස චිත්තස්ස අනන්තරා ඉමං නාම විතක්කං විතක්කෙස්සතීති. සො බහුං චෙපි ආදිසති, තථෙව තං හොති නො අඤ්ඤථාති. අයං චතුත්ථා ආදෙසනවිධා. එතදනුත්තරියං භන්තෙ ආදෙසනවිධාසු.

## දස්සනසමාපත්ති-දෙසනා

7. අපරං පන භන්තෙ එතදනුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති දස්සනසමාපත්තීසු. චතස්සො ඉමා භන්තෙ දස්සනසමාපත්තියො: ඉධ භන්තෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධාන-මන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු[1] අට්ඨි[2] අට්ඨිමිඤ්ජා[3] වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති. අයං පඨමා දස්සනසමාපත්ති.

1. නහාරූ. ස්‍යා PTS
2. අට්ඨී. ස්‍යා PTS
3. අට්ඨිමිඤ්ජං. මජසං

තව ද වහන්ස, මෙහි ඇතැම් එකෙක් නිමිත්තෙන් මෙරමා පැවැතුම් දැන නො ම කියයි. වැලිදු මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දේවතාවන්ගේ කථා ශබ්දය අසා 'තා මනස මෙසේ ය, තා මනස මෙබඳු ය. තා සිත මෙසේ යැ'යි කියා පායි. ඔහු බොහෝවක් ම කියතුදු ඒ එසේ ම වෙයි, අන් සැටියෙකින් නො වෙයි. මේ දෙවෙනි ආදෙසනා කොට්ඨාසය යි. වහන්ස, තව ද එක්තරා එකෙක් නිමිත්තෙන් නො ම කියයි. මිනිසුන් ගේ හෝ නොමිනිසුන්ගේ හෝ දෙවියන්ගේ කතා හඬ අසා ද නො කියයි. වැලිදු විතර්ක කරන, විචාර කරන තැනැත්තහුගේ විතර්ක විචාර ශබ්දය අසා 'තා මනස මෙසේ ය, තා මනස මෙබඳුය, තා සිත මෙසේ යැ'යි ප්‍රකාශ කෙරෙයි. ඔහු බොහෝවක් ම කියතුදු ඒ එසේ ම වෙයි. අන් පරිද්දෙකින් නො වෙයි, මේ තුන්වැනි ආදේසනා කොට්ඨාසය යි, තව ද වහන්ස, මෙහි එක්තරා පුද්ගලයෙක් නිමිත්තෙනුදු නො ම කියයි, මිනිසුන්ගේ හෝ නොමිනිසුන්ගේ හෝ දේවතාවන්ගේ හෝ ශබ්දය අසා නො ද කියයි. විතර්ක කරන විචාර කරන තැනැත්තක්හුගේ විතර්ක විචාර ශබ්දය අසා ද නො ම කියයි. වැලිදු විතර්ක විචාර සහිත සමාධියට සමවන්නක්හුගේ සිත 'මෙ භවත්හුගේ මනස් සංස්කාරයෝ යම්සේ පිහිටියාහු ද, එසේ මේ සිතට අනතුරු ව මෙ නම් කල්පනාවක් කරන්නේ යැ'යි සිය සිතින් පිරිසිඳ දනී. ඔහු බොහොවක් කියතුදු ඒ එසේ ම වෙයි, අන් සැටියෙකින් නො වෙයි. මේ සිවුවැනි ආදේසනා භාගය යි. වහන්ස, ආදේශනා භාග විෂයයෙහි (අනුන්ගේ අදහස් දැන කීම් අතුරෙහි) මේ භාග්‍යවතුන් වහන්සේගේ ආදේශන භාගය ම අනුත්තරිය වෙයි.

### දර්ශනසමාපත්තිදෙශනා

7. වහන්ස, දර්ශනසමාපත්ති විෂයයෙහි භාග්‍යවතුන් වහන්සේ යම්සේ දහම් දෙසන සේක් ද, වහන්ස, මෙය ම අනුත්තරිය වෙයි. වහන්ස මෙහි දර්ශනසමාපත්තිහු සතර දෙනෙක් වෙත්. වහන්ස, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ උත්සාහ කොට, වීර්ය කොට, පුන පුනා වැර වඩා, සම්‍යක් මනස්කාරය නිසා (නුවණ නිසා,) යම් සමාධියෙකින් සිත මනා වැ පිහිටි කල්හි පත්ලෙන් උඩ'හිසැ කෙහෙ මතුයෙන් යටැ සම හිම් කොටැති නන් අයුරු අශුචියෙන් පිරුණු මෙ ම සිරුර නුවණින් සලකා බලා ද එසේ වූ (ප්‍රථමධ්‍යාන) චිත්ත සමාධිය ස්පර්ශ කෙරෙයි. හේ එයින් 'මෙ කයෙහි කෙස් ඇත, ලොම් ඇත, නිය දත් සම නහර ඇට ඇටමිදුළු වකුගඩු හදමස අක්මාව දළබුව බඩදිව පපුමස අතුනු අතුනුබහන නොදිරූ අහර මල පිත සෙම පූයා ලේ ඩහදිය මේද තෙල කඳුළු වුරුණුතෙල කෙල සොටු සඳමිදුලු මුත්‍ර ඇතැ'යි මෙ අශුචීන් පස් විකයි. මේ පළමුවන දර්ශන සමාපත්තිය ය.

පුන ච පරං භන්තෙ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසති, යථා සමාහිතෙ චිත්තෙ ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා -පෙ- ලසිකා මුත්තන්ති, අතික්කම්ම ච පුරිසස්ස ඡවිමංස ලොහිතං අට්ඨිං පච්චවෙක්ඛති. අයං දුතියා දස්සනසමාපත්ති.

පුන ච පරං භන්තෙ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා -පෙ- ලසිකා මුත්තන්ති, අතික්කම්ම ච පුරිසස්ස ඡවිමංස ලොහිතං අට්ඨිං පච්චවෙක්ඛති, පුරිසස්ස ච විඤ්ඤාණසොතං පජානාති උභයතො අබ්බොච්ඡින්නං ඉධ ලොකෙ පතිට්ඨිතං ච පරලොකෙ පතිට්ඨිතං ච. අයං තතියා දස්සනසමාපත්ති.

පුන ච පරං භන්තෙ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය -පෙ- ලසිකා මුත්තන්ති අතික්කම්ම ච පුරිසස්ස ඡවිමංසලොහිතං අට්ඨිං පච්චවෙක්ඛති, පුරිසස්ස ච විඤ්ඤාණසොතං පජානාති උභයතො අබ්බොච්ඡින්නං ඉධ ලොකෙ අප්පතිට්ඨිතඤ්ච පරලොකෙ අප්පතිට්ඨිතඤ්ච. අයං චතුත්ථා දස්සනසමාපත්ති. එතදනුත්තරියං භන්තෙ දස්සනසමාපත්තීසු.

### පුග්ගලපණ්ණත්තිදෙසනා

8. අපරං පන භන්තෙ එතදනුත්තරියං, යථා භගවා ධම්මං දෙසෙති පුග්ගලපණ්ණත්තීසු.[1] සත්තිමෙ භන්තෙ පුග්ගලා: උභතොභාගවිමුත්තො, පඤ්ඤාවිමුත්තො, කායසක්ඛි, දිට්ඨිප්පත්තො, සද්ධාවිමුත්තො, ධම්මානුසාරී, සද්ධානුසාරී. එතදනුත්තරියං භන්තෙ පුග්ගලපඤ්ඤත්තීසු.

### පධානදෙසනා

9. අපරං පන භන්තෙ එතදනුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති පධානෙසු. සත්තිමෙ භන්තෙ සම්බොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, වීරිය[2]සම්බොජ්ඣඞ්ගො, පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. එතදනුත්තරියං භන්තෙ පධානෙසු.

---

1. පුග්ගලපඤ්ඤත්තීසු-සිමු.
2. විරිය. . .-ම ඡ සං

වහන්ස, තවද මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ උත්සාහ කොට... යම් සමාධියෙකින් සිත මනාවැ පිහිටි කල්හි 'මෙ කයෙහි කෙස් ඇත, ලොම් ඇත, නිය ඇත, දත් ඇත... සඳමිදුලු ඇත, මූත්‍ර ඇතැ'යි පත්ලෙන් උඩ හිසැකේ මත්තෙන් යට, සම ඉම් කොට නන් අයුරු අශුචියෙන් පිරුණු මේ කයත් නුවණින් බලයි ද, පුරුෂයාගේ සිවි මස් ලේ ඉක්මැ ඇට නුවණින් බලයි ද, මේ (ඇට අරමුණුකොට ඉපැදවූ දිවැස පාදක කොටැති ධ්‍යානසමාපත්තිය) දෙවෙනි දර්ශනසමාපත්තිය යි.

වහන්ස, තව ද මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ උත්සාහ කොට... යම් සමාධියෙකින් සිත මනාවැ පිහිටි කල්හි 'මෙ කයෙහි කෙස් ඇත ලොම් ඇත, නිය ඇත... සඳමිදුලු ඇත, මූත්‍ර ඇතැ'යි පත්ලෙන් උඩ හිසකේ මත්තෙන් යට සම හිම් කොට, නන් අයුරු අශුචියෙන් පිරුණු මේ කයත් නුවණින් බලයි ද, පුරුෂයාගේ සිවි මස් ලේ ඉක්මැ ඇට නුවණින් බලයි ද, පූර්වභාග අපරභාග යන දෙපසින් අතර නොසිඳී පැවැති, මෙලොවැ ද පිහිටි පරලොවහි ද පිහිටි පුරුෂයාගේ විඥාන ස්‍රොතස දනී ද මේ (ශෛක්ෂ පෘථග්ජනයන්ගේ චෙතස්පර්‍යාය-ඥානය) තෙවෙනි දර්ශනසමාපත්තිය ය.

තව ද වහන්ස, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ උත්සාහ කොට... සඳමිදුලු ඇත, මූත්‍ර ඇතැයි... නුවණින් බලයි ද, පුරුෂයාගේ සිවි මස් ලේ ඉක්මැ ඇට පස්විකයිද, (පූර්වාපර භාග වශයෙන්) දෙපසින් ම අතර නොසිඳුණු ඡන්දරාගවශයෙන් මෙලොවහි ද නොපිහිටි, පරලොවහි ද නොපිහිටි පුරුෂයාගේ විඥාන ස්‍රොතස දනී. මේ (රහත්හුගේ චෙතස්පර්යායඥානය) සතර වන දර්ශන සමාපත්තිය ය. වහන්ස, දර්ශනසමාපත්ති විෂයයෙහි භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ධර්ම දෙශනාව අනුත්තරිය ය.

### පුද්ගලප්‍රඥප්ති දෙශනා

8. වහන්ස, තවද භාග්‍යවතුන් වහන්සේ පුද්ගල ප්‍රඥප්ති විෂයයෙහි යම්සේ දහම් දෙසන සේක් ද, මෙය අනුත්තරිය ය. වහන්ස, උභතොභාගවිමුක්ත ය, ප්‍රඥාවිමුක්ත ය, කායසාක්ෂී ය, දෘෂ්ටිප්‍රාප්ත ය, ශ්‍රද්ධාවිමුක්ත ය, ධර්මානුසාරී ය, ශ්‍රද්ධානුසාරී යැ යි මේ පුද්ගලයෝ සත් දෙනෙකි.

### ප්‍රධාන දෙශනා

9. වහන්ස, තවද ප්‍රධාන (භාවනානුයොග) විෂයයෙහි භාග්‍යවතුන් වහන්සේ යම්සේ දහම් දෙසනා සේක් ද මෙය අනුත්තරිය ය. වහන්ස, සතිසම්බොජ්ඣඞ්ගය, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය, විරියසම්බොජ්ඣඞ්ගය, පීතිසම්බොජ්ඣඞ්ගය පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය, සමාධිසම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගයැ යි මේ සම්බොධ්‍යඞ්ග සතෙකි. ප්‍රධාන විෂයයෙහි භාග්‍යවතුන් වහන්සේගේ මේ ධර්ම දෙශනාව අනුත්තරිය ය.

## පටිපදාදෙසනා

10. අපරං පන භන්තෙ එතදනුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති පටිපදාසු. චතස්සො ඉමා භන්තෙ පටිපදා: දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා'ති. තත්‍ර භන්තෙ යායං පටිපදා දුක්ඛා දන්ධාභිඤ්ඤා, අයං භන්තෙ පටිපදා උභයෙනෙව හීනා අක්ඛායති දුක්ඛත්තා ච දන්ධත්තා ච. තත්‍ර භන්තෙ යායං පටිපදා දුක්ඛා ඛිප්පාභිඤ්ඤා, අයං පන භන්තෙ පටිපදා දුක්ඛත්තා හීනා අක්ඛායති. තත්‍ර භන්තෙ යායං පටිපදා සුඛා දන්ධාභිඤ්ඤා, අයං පන භන්තෙ පටිපදා දන්ධත්තා හීනා අක්ඛායති. තත්‍ර භන්තෙ යායං පටිපදා සුඛා ඛිප්පාභිඤ්ඤා, අයං පන භන්තෙ පටිපදා උභයෙනෙව පණීතා අක්ඛායති සුඛත්තා ච ඛිප්පත්තා ච. එතදනුත්තරියං භන්තෙ පටිපදාසු.

## භස්සසමාචාරාදි - දෙසනා

11. අපරං පන භන්තෙ එතදනුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති භස්සසමාචාරෙ. ඉධ භන්තෙ එකච්චො න චෙව මුසාවාදූපසංහිතං වාචං භාසති, න ච වෙභූතියං න ච පෙසුණියං[1] න ච සාරම්භජං ජයාපෙක්ඛො, මන්තා මන්තා වාචං භාසති නිධානවතිං කාලෙන, එතදනුත්තරියං භන්තෙ භස්සසමාචාරෙ.

12. අපරං පන භන්තෙ එතදනුත්තරියං, යථා භගවා ධම්මං දෙසෙති පුරිසසීලසමාචාරෙ. ඉධ භන්තෙ එකච්චො චස්ස සද්ධො ච. න ච කුහකො, න ච ලපකො, න ච නෙමිත්තිකො, න ච නිප්පෙසිකො, න ච ලාභෙන ලාභං නිජිහිංසනකො[2] ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො, භොජනෙ මත්තඤ්ඤූ, සමකාරී, ජාගරියානුයොගමනුයුත්තො, අතන්දිතො ආරද්ධවිරියො, ඣායී, සතිමා, කල්‍යාණපටිභානො, ගතිමා, ධිතිමා, මතිමා න ච කාමෙසු ගිද්ධො, සතො ච නිපකො ච.

එතදනුත්තරියං භන්තෙ පුරිසසීලසමාචාරෙ.

1. පෙසුනියං-මජසං
2. නිජිඝිංසනකො, ස්‍යා, නිජිගීසනකො-මජසං.

## ප්‍රතිපත්ති දේශනා

10. වහන්ස, තව ද ප්‍රතිපත්ති විෂයයෙහි භාග්‍යවතුන් වහන්සේ යම්සේ දහම් දෙසන සේක් ද මෙය අනුත්තරීය ය. දන්ධාභිඤ්ඤා දුක්ඛපටිපද ය, ඛිප්පාභිඤ්ඤා දුක්ඛ පටිපද ය, දන්ධාභිඤ්ඤා සුඛපටිපද ය, ඛිප්පාභිඤ්ඤා සුඛපටිපද යැ යි මේ ප්‍රතිපත්ති සතරෙකි. මොවුන්ගෙන් යම් දන්ධාභිඤ්ඤා දුක්ඛපටිපදාවෙක් ඇද්ද, මෙය දුක් බැවින් ද දන්ධ බැවින් ද යි යන දෙ කරුණින් ම හීන යැ යි කියනු ලැබේ. වහන්ස එහි යම් ඛිප්පාභිඤ්ඤා දුක්ඛ පටිපදාවෙක් ඇද්ද මෙය දුක් බැවින් හීන යැයි කියනු ලැබේ. වහන්ස, එහි යම් දන්ධාභිඤ්ඤා සුඛ පටිපදාවෙක් ඇද්ද, මෙය දන්ධ බැවින් හීන යැ යි කියනු ලැබේ. වහන්ස, එහි යම් ඛිප්පාභිඤ්ඤා සුඛපටිපදාවෙක් ඇද්ද, මෙය සුඛ බැවින් ද, ඛිප්පාභිඤ්ඤා බැවින් ද යි දෙ කරුණින් ම උතුම් යි කියනු ලැබේ. වහන්ස, ප්‍රතිපත් විෂයයෙහි භාග්‍යවතුන් වහන්සේගේ මේ ධර්මදේශනාව අනුත්තරීය ය.

## භස්සසමාචාරාදි දේශනා

11. තව ද අනෙකෙක. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වාක්සමාචාර විෂයයෙහි (කථාකිරීම පිළිබඳ ව) යම්සේ දහම් දෙසන සේක් ද මෙය අනුත්තරීය ය. වහන්ස, මෙහි එක්තරා මහණෙක් අතරතුරු මුසවා මුසු කළ බස් නො බෙණෙයි. උනුන් බිඳුවන බස් නො බෙණෙයි. කේලාම් බස් නො බෙණෙයි. (එකට දෙකක් කෙරෙමි යි) සැහැසීමෙන් උනුන් කතා නො කියයි. දිනීම අපේක්ෂා කොට ඇති ව නො කියයි. නුවණින් පිරික්සා සුදුසු කාලයෙහි සිතැ තබා ගත යුතු බස් කියයි. වහන්ස, වාක් සමාචාර විෂයයෙහි මෙය අනුත්තරීය යැ.

12. තව ද අනෙකෙක. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ පුද්ගලයන්ගේ පිරිසිදු ශීල විෂයයෙහි ද පිරිසිදු මනඃසමාචාර විෂයයෙහි ද යම්සේ දහම් දෙසනසේක් ද මෙය අනුත්තරීය යැ. වහන්ස, මෙහි එක්තරා මහණෙක් (ශීලයෙහි ද මනඃ සමාචාරයෙහි ද පිහිටියේ) සත්‍ය කථා ඇත්තේ ද සැදැහැ ඇත්තේ ද වන්නේ ය. කුහක නො වන්නේ ය. චාටු කථා නො කියන්නේ ය. ප්‍රත්‍යයාශායෙන් ඉඟි දෙඩුම් නො දොඩන්නේ ය, ලාභාශායෙන් මෙරමාට ගරහන්නෙක් ද නොවන්නේ ය. ලාභයෙන් ලාභය සොයන්නෙක් ද නොවන්නේ ය. ඉඳුරන්හි වැසූ දෙරැත්තෙක් වන්නේ ය, බොජුනෙහි පමණ දන්නෙක් වන්නේ ය. (විෂමාචාර හැර) සම ව හැසිරෙන්නෙක් වන්නේ ය. නිදි දුරැලීමෙහි යෙදුණෙක් වන්නේ ය. අලස නො වූයෙක්, රුකුළු වැර ඇතියෙක්, ධ්‍යානයෙහි ඇලුණෙක්, සිහි ඇතියෙක්, කලණ නුවණ ඇතියෙක්, සුන්දර ප්‍රතිභාන සම්පත් ඇතියෙක්, ගතිමතෙක් (නොඇසූ දහම් දැන ගැන්මෙහි සමත් නුවණැතියෙක්) ධෘතිමතෙක් (ධාරණයෙහි සමත් ප්‍රඥා ඇතියෙක්) මතිමතෙක් (අනුමාන ප්‍රඥා ඇතියෙක්) වන්නේ ය. කාමයන්හි ගිජුවූයෙක් නො වන්නේ ය. (අභික්‍රමණාදියෙහි එළඹ සිටි සිහි ඇත්තේ, අභික්‍රමණාදි සත් තන්හි පැවැති විවසුන් නුවණ ඇත්තේ වන්නේ ය.

වහන්ස, පුරුෂශීල සමාචාර විෂයයෙහි මෙය අනුත්තරීය යැ.

## අනුසාසනවිධාදෙසනා

13. අපරං පන භන්තෙ එතදනුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති අනුසාසනවිධාසු. චතස්සො ඉමා භන්තෙ අනුසාසනවිධා. ජානාති භන්තෙ භගවා පරං පුග්ගලං පච්චත්තං යොනිසො මනසිකාරා, ‘අයං පුග්ගලො යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො, තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො භවිස්සති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො’ති. ජානාති භන්තෙ භගවා පරං[1] පුග්ගලං පච්චත්තං යොනිසොමනසිකාරා,-අයං පුග්ගලො යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී භවිස්සති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සතීති.

ජානාති භන්තෙ භහවා පරං පුග්ගලං පච්චත්තං යොනිසො මනසිකාරා, අයං පුග්ගලො යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො, පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො භවිස්සති, තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකාති.

ජානාති භන්තෙ භගවා පරං පුග්ගලං පච්චත්තං යොනිසො මනසිකාරා,—අයං පුග්ගලො යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡි කත්වා උපසම්පජ්ජ විහරිස්සතීති.

එතදනුත්තරියං භන්තෙ අනුසාසනවිධාසු.

## පරපුග්ගලවිමුත්තිඤාණදෙසනා

14. අපරං පන භන්තෙ එතදනුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති පරපුග්ගලවිමුත්තිඤාණෙ. ජානාති භන්තෙ භගවා පරං පුග්ගලං පච්චත්තං යොනිසොමනසිකාරා, අයං පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො භවිස්සති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො’ති. ජානාති භන්තෙ භගවා පරං පුග්ගලං පච්චත්තං යොනිසො මනසිකාරා, අයං පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී භවිස්සති සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සතී’ති.

---

1. අපරා (මජසං) පරපුග්ගලං—[illegible].

## අනුශාසනවිධා දෙශනා

13. තව ද අනෙකෙක. වහන්ස, අනුශාසන කොටස්හි භාග්‍යවතුන් වහන්සේ යම්සේ දහම් දෙසනා සේක් ද, මෙය අනුත්තරීය යැ. වහන්ස, මේ අනුශාසන විධා සතරෙක: මේ පුහුල් තෙමේ අනුශාසන පරිදි පිළිපදිනුයේ, තුන් සංයෝජනයන් නැසීමෙන්, අපායෙහි නොවැටෙන සුලු වූ, ධර්මයෙන් නියත වූ, ඉදිරි තුන් මඟට අවශ්‍යයෙන් පැමිණියැ යුතු සෝවාන් පුහුලෙක් වන්නේ යැ' යි භාග්‍යවතුන් වහන්සේ යොනිසො- මනස්කාරයෙන් අන් පුහුලා තමන් වහන්සේ ම දන්නා සේක. මේ පුහුල් තෙම තුන් සංයෝජනයන් නැසීමෙන් රාග ද්වේෂ මෝහයන් තුනී කිරීමෙන් සකෘදගාමී වන්නේ ය, එක් වරක් ම මේ ලෝකයට අවුත් දුක් කෙළවර කරන්නේ යැ'යි භාග්‍යවතුන් වහන්සේ යෝනිසෝ- මනස්කාරයෙන් තමන් වහන්සේ ම අන් පුහුලා දන්නා සේක.

මේ පුහුල් තෙම ඔරම්භාගීය සංයෝජන නැසීමෙන් මරණින් මතු ශුද්ධාවාසයෙහි උපදින, එහිදී පිරිනිවෙන සුලු, එ ලොවින් මෙහි පෙරළා නො එන සුලු අනාගාමියෙක් වන්නේයැ' යි භාග්‍යවතුන් වහන්සේ යොනිසොමනස්කාරයෙන් තමන් වහන්සේ ම අන් පුහුල්හු දන්නා සේක

'මෙ පුහුල් තෙම ආස්‍රවයන් නැසීමෙන් අනාස්‍රව වූ චිත්ත සමාධිය ද ඵල ප්‍රඥාව ද මෙ අත්බවහි ම තෙමේ ම වෙසෙසි නුවණින් දැන, පසක් කොට, ලැබ වසන්නේ යැ' යි භාග්‍යවතුන් වහන්සේ යෝනිසෝමනස්කාර- යෙන් තමන් වහන්සේ ම අන් පුහුල්හු දන්නා සේක.

වහන්ස, අනුශාසනවිධාවන්හි මෙය අනුත්තරීය ය.

## පරපුද්ගල විමුක්තිඥාන දෙශනා

14. වහන්ස, තව ද සෝවාන් ආදී අන් පුහුලන් ඒ ඒ මඟින් කෙලෙසුන් ගෙන් මිදෙනු දන්මෙහි යම්සෙ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක් ද, මෙය අනුත්තරීය ය. වහන්ස, මේ පුහුල් තෙමෙ තුන් සංයෝජනයන් නැසීමෙන් අවාහි නොවැටෙන සුලු, රහත් බවට නියත වූ, උපරිමාර්ගත්‍රය සංඛ්‍යාත සම්බෝධිය පරායණ කොටැත්තේ සෝවාන් වූ- යෙකැ'යි තමන් වහන්සේ ම දන්නා සේක. වහන්ස, 'මේ පුහුල් තෙමේ තුන් සංයෝජනයන් නැසීමෙන්, රාග ද්වෙෂ මොහයන් තුනී වීමෙන් සකෘදගාමී වන්මෙන් යැ යි, එක් වරක් ම මේ ලොවට අවුත් දුක් කෙළවර කරන්නේ යැ' යි භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ ම උපාය මනස්කාරයෙන් අන් පුහුලා දන්නා සේක.

ජානාති භන්තෙ භගවා පරං පුග්ගලං පච්චත්තං යොනිසො මනසිකාරා, 'අයං පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො භවිස්සති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා'ති.

ජානාති භන්තෙ භගවා පරං පුග්ගලං පච්චත්තං යොනිසො මනසිකාරා 'අයං පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතී'ති. එතදානුත්තරියං භන්තෙ පරපුග්ගලවිමුත්තිඤාණෙ.

## සස්සතවාදදෙසනා

15. අපරං පන භන්තෙ එතදානුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති සස්සතවාදෙසු. තයොමෙ භන්තෙ සස්සතවාදා. ඉධ භන්තෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මා මනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති, යථාසමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙ පි ජාතියො තිස්සො පි ජාතියො චතස්සො පි ජාතියො පඤ්ච පි ජාතියො දස පි ජාතියො වීසම්පි[1] ජාතියො තිංසම්පි ජාතියො චත්තාළීසම්පි[2] ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකානි පි ජාතිසතානි අනෙකානි පි ජාතිසහස්සානි අනෙකානි පි ජාතිසතසහස්සානි, අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං[3]. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සො එවමාහ. අතීතම්පාහං[4] අද්ධානං ජානාමි 'සංවට්ටි[5] පි ලොකො විවට්ටි පි' ති, අනාගතම්පාහං අද්ධානං ජානාමි 'සංවට්ටිස්සති වා ලොකො විවට්ටිස්සති වා ති. සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඣො කූටට්ඨො[6] එසිකට්ඨායිට්ඨිතො තෙ'ච සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති, අත්ථිත්වෙව සස්සතිසමන්ති. අයං පඨමො සස්සතවාදො.

---

1. වීසතිම්පි-PTS.
2. චත්තාළීසම්පි. ස්‍යා චත්තාරීසං-PTS.
3. උපපාදි-PTS.
4. අතීතං වාහං. ස්‍යා අතීතම්පිහං.-PTS.
5. සංවට්ටි වා . . . විවට්ටි වා-සීමු.
6. කූටට්ටා.-ස්‍යා

වහන්ස, මේ පුහුල් තෙම ඔරම්භාගිය සංයොජන පස නැසීමෙන් (ශුද්ධාවාසයෙහි) ඔපපාතික වැ උපදනේය, එහිදී ම පිරිනිවෙන්නේයැ. ඒ බඹලොවින් මේ කාමලොකයට උත්පත්ති වශයෙන් පෙරළී නොඑන සුලු යැ යි භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ උපාය මනස්කාරයෙන් ඒ අන් පුහුලා දන්නා සේක.

වහන්ස, 'මේ පුහුලා ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් ආස්‍රවරහිත වූ ඵලසමාධිය ද ඵලඥානය ද මෙ අත්බවහිදී ම තෙමේ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වසන්නේ යැ' යි භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ උපාය මනස්කාරයෙන් අන් පුහුලා දැනගන්නා සේක. වහන්ස, අන්‍ය පුද්ගලයන්ගේ මිදීම දැන්මෙහි (භාග්‍යවතුන් වහන්සේගේ) මේ ගුණය අනුත්තරීය ය.

15. තව ද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ශාශ්වතවාද විෂයයෙහි යම්සේ දහම් දෙසනා සේක් ද, මෙය අනුත්තරීය ය. වහන්ස, (ඔබ වහන්සේ වදළ පරිදි) මේ ශාශ්වත වාද තුනෙකි. වහන්ස, මෙහි කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ වීර්යය ප්‍රත්‍යය කොට ගෙන (වැර වඩා), උත්සාහය ප්‍රත්‍යය කොට ගෙන (උත්සාහ වඩා) පුන පුනා වීර්යයෙහි යෙදීමට පැමිණ, නොපමා බවට පැමිණ (එළැඹැ සිටි සිහිය නිසා), නුවණ නිසා, යම් සමාධියෙකින් සිත මනා වැ පිහිටි කල්හි අනෙකවිධ වූ පෙරවුසූ කඳ පිළිවෙළ සිහි කෙරෙයි ද, එසේ වූ චිත්තසමාධියක් ලබයි. ඒ මෙසේ යි: 'අසෝ තැනැ වීමි, එහි මෙ නම් ඇතියෙම් වීමි, මෙ නම ගෝත්‍ර ඇතියෙම් වීමි. මෙබඳු පැහැ ඇතියෙම් වීමි, මෙබඳු ආහාර ඇතියෙම් වීමි, මෙබඳු සුවදුක් විඳින්නෙම් වීමි, මෙතෙක් වයස් සීමා ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව අසෝ තැනැ උපනිමි, එහිද මෙ නම් ඇතියෙම් වීමි, මෙ නම් ගෝත්‍ර ඇතියෙම් වීමි, මෙබඳු පැහැ ඇතියෙම් වීමි, මෙබඳු ආහාර ඇතියෙම් වීමි, මෙබඳු සුව දුක් විඳින්නෙම් වීමි, මෙතෙක් ආයු සීමාවක් ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව මෙහි උපනිමි'යි මෙසේ එක් ජාතියක් ද ජාති දෙකක් ද, ජාති තුනක්ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දශයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද, ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති සියදහසක් ද, නොයෙක් සියගණන් ජාතීන් ද, නොයෙක් දහස් ගණන් ජාතීන් ද, නොයෙක් සියදහස් ගණන් ජාතීන් ද, මෙසේ පැහැසටහන් ආදී ආකාර සහිත කොට නාම ගොත්‍ර වශයෙන් උද්දේශ සහිත කොට නොයෙක් වැදෑරුම් පෙර වුසූ කඳ පිළිවෙළ සිහි කෙරෙයි. හේ තෙමේ "ලොකය නැසුණේ යැ යි හෝ හටගත්තේ යැ යි හෝ අතීත කාලය ද මම දනිමි. 'ලොකය නැසෙන්නේ යැ යි ද හට ගන්නේ යැ' යි ද අනාගත කාලය ද මම දනිමි. ආත්මය ද ලොකය ද ශාශ්වත ය වඳ ය (කිසිවක් නො උපදවන්නෝය), ගිරිකුළක් සේ නිසල වැ සිටියේ ය, ගැඹුරු වළ කැන සිටුවන ලද ඉඳු කිලක් සේ තහවුරු වැ සිටියේ ය. ඒ සත්වයෝ ම මෙයින් අන් තැනට දුවත්, භවයෙන් භවයට යෙත්, ච්‍යුත වෙත්, උපදිත්. (ආත්මයත් ලෝකයත්) මහා පෘථිවි ආදී ශාශ්වතීනට (සදහාවී වස්තූනට) සම ව විද්‍යමාන ම යැ" යි මෙසේ කියයි. මේ පළමු වන ශාශ්වතවාදය යැ.

පුන ච පරං භන්තෙ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං[1] එකම්පි සංවට්ටවිවට්ටං ද්වෙ පි සංවට්ටවිවට්ටානි තීණි පි සංවට්ටවිවට්ටානි චත්තාරි පි සංවට්ටවිවට්ටානි පඤ්ච පි සංවට්ටවිවට්ටානි දස පි සංවට්ටවිවට්ටානි අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං, තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො -පෙ- එවමායුපරියන්තො, සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සො එවමාහ: අතීතම්පාහං අද්ධානං ජානාමි 'සංවට්ටි වා ලොකො විවට්ටි වා ලොකො. අනාගතඤ්ච ඛ්වාහං අද්ධානං ජානාමි සංවට්ටිස්සති වා ලොකො විවට්ටිස්සති වා'ති. සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඣො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො තෙ'ච සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති, අත්ථිත්වෙව සස්සතිසමන්ති. අයං භන්තෙ දුතියො සස්සතවාදො.

පුන ච පරං භන්තෙ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: -පෙ- දස පි සංවට්ටවිවට්ටානි වීසම්පි සංවට්ටවිවට්ටානි තිංසම්පි සංවට්ටවිවට්ටානි චත්තාළිසම්පි සංවට්ටවිවට්ටානි 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං එවංනාමො -පෙ- එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සො එවමාහ: අතීතම්පාහං අද්ධානං ජානාමි සංවට්ටි පි ලොකො විවට්ටි පි'ති. අනාගතම්පාහං අද්ධානං ජානාමි 'සංවට්ටිස්සති පි ලොකො විවට්ටිස්සති පි'ති. 'සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඣො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො, තෙ'ච සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති, අත්ථිත්වෙව සස්සතිසමන්ති'. අයං භන්තෙ තතියො සස්සතවාදො. එතදානුත්තරියං භන්තෙ සස්සතවාදෙසු.

1. සෙය්‍යථිදං—ම ජ සං

තව ද අනෙකක් කියමි. වහන්ස, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ වීර්යය ප්‍රත්‍යය කොට ගෙන (වැර වඩා) ...... යම් සමාධියෙකින් සිත සමාධි ගත වූ කල්හි 'අසෝ තැනැ මෙනම් ඇතියෙමි, මෙසේ වූ ගොත් ඇතියෙමි, මෙබඳු පැහැ සටහන් ඇතියෙමි, මෙබඳු ආහාර ඇතියෙමි, මෙබඳු සුවදුක් විඳිනා සුල්ලෙමි, මෙතෙක් ආයු සීමාවක් ඇතියෙමි වීමි, ඒ මම එයින් සැව අසෝ තැන උපනිමි. එහි ද මෙ නම් ඇත්තෙමි මෙසේ වූ ගොත් ඇතියෙමි,... මෙ තෙක් ආයු සීමාවක් ඇත්තෙමි වීමි. ඒ මම එයින් සැව මෙහි උපනිමියි මෙසේ අනේකවිධ වූ පෙර වුසූ කඳ පිළිවෙළ සිහි කෙරෙයි ද, එසේ වූ චිත්තසමාධියක් ලබයි. හෙ තෙම එයින් උක්ත පරිදි ආකාර සහිත කොට උද්දේශ සහිත කොට අනෙකවිධ පූර්වෙනිවාසය සිහි කෙරෙයි. එසේ වූ හෙ තෙමේ 'ලෝකය නැසුණේ යැ යි හෝ හැදුණේ යැ යි අතීත කාලය ද මම දනිමි. ලෝකය නැසෙන්නේ යැ යි හෝ හැදෙන්නේ යැ යි හෝ අනාගත කාලය ද මම දනිමි (ඒ මා දන්නා පරිදි) ආත්මය ද ලෝකය ද ශාශ්වත ය, වඳ ය, ගිරිකුළක් සේ සිටියේ ය, ගැඹුරු වළෑ සිටුවන ලද ඉඳු කිලක් සේ තහවුරුවැ සිටියේ ය, ඒ සත්වයෝ ම මෙයින් අන් තැනට දිවෙත්, භවයෙන් භවයට යෙත්, මැරෙත්, උපදිත්. (ආත්මයත් ලෝකයත්) මහා පෘථිවිආදි ශාශ්වතීනට සම ව විද්‍යමාන ම යැ''යි කියයි. වහන්ස, මෙ දෙවෙනි ශාශ්වත වාදය යැ.

තව ද අනෙකක් කියමි. වහන්ස, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ වැර වඩා ... යම් සමාධියෙකින් සිත සමාහිත කල්හි 'අසෝ තැනැ මෙ නම් ඇත්තෙමි, මෙසේ වූ ගොත් ඇත්තෙමි, මෙබඳු පැහැසටහන් ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙසේ වූ සුවදුක් විඳුනා සුල්ලෙමි, මෙතෙක් ආයු සීමා ඇත්තෙම වීමි. ඒ මම එයින් සැව අසෝ තැන උපනිමි. එහි ද මෙ නම් ඇත්තෙමි ... මෙතෙක් ආයු සීමාවක් ඇත්තෙම වීමි. ඒ මම එයින් සැව, මෙහි උපනිමි'යී ... සංවර්ත විවර්ත කල්ප දශයක් ද, සංවර්තවිවර්ත කල්ප විස්සක් ද, සංවර්තවිවර්ත කල්ප තිසක් ද, සංවර්තවිවර්ත කල්ප සතළිසක් ද පූර්වෙනිවාසය සිහි කෙරෙයි. හේ මෙසේ ආකාර සහිත කොට උද්දේශ සහිත කොට අනෙකවිධ පූර්වේනිවාසය සිහි කෙරෙයි. හෙ තෙමේ ලොකය (මෙසේ) නැසුණේ යැ යි ද (මෙසේ) සැදුණේ යැ යි ද අතීත කාලය ද මම දනිමි යි. ලොකය නැසෙන්නේ යැයි ද හැදෙන්නේ යැ යි ද අනාගත කාලයත් මම දනිමි යි, ආත්මය ද ලොකය ද ශාශ්වත ය, වඳ ය, ගිරිකුළක් සේ සිටුනෙ ය, තරවැ සිටුනා ඉඳුකිලක් සේ තහවුරු ය. ඒ සත්හු ම මෙයින් අන් තැනට දිවෙත්, භවයෙන් භවයට යෙත්, මැරෙත් උපදිත්. ශාශ්වත වස්තූනට සම ව ස්ථිර ව විද්‍යමාන ම යැ''යි කියයි. වහන්ස, මෙ තුන්වැනි ශාශ්වතවාදය යැ. වහන්ස, මෙසේ ශාශ්වතවාද තත්ත්ව ප්‍රකාශන විෂයයෙහි (භාග්‍යවතුන් වහන්සේගේ) මේ අනුත්තර බව වේ.

## පුබ්බෙනිවාසානුස්සතිඤාණදෙසනා

13. අපරං පන භන්තෙ එතදනුත්තරියං, යථා භගවා ධම්මං දෙසෙති පුබ්බෙනිවාසානුස්සතිඤාණෙ. ඉධ භන්තෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසති යථාසමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති- සෙය්‍යථීදං එකම්පි ජාතිං ද්වෙ පි ජාතියො තිස්සො පි ජාතියො චතස්සො පි ජාතියො පඤ්ච පි ජාතියො දස පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාළීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො සතම්පි ජාතියො සහස්සම්පි ජාතියො සතසහස්සම්පි ජාතියො අනෙකෙ පි සංවට්ටකප්පෙ අනෙකෙ පි විවට්ටකප්පෙ අනෙකෙ පි සංවට්ටවිවට්ටකප්පෙ -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සන්ති භන්තෙ දෙවා[1] යෙසං න සක්කා ගණනාය වා සංඛානෙන[2] වා ආයුං සංඛාතුං, අපි ච යස්මිං යස්මිං අත්තභාවෙ අභිනිවුත්ථපුබ්බො[3] හොති යදි වා රූපීසු යදි වා අරූපීසු යදි වා සඤ්ඤීසු යදි වා අසඤ්ඤීසු යදි වා නෙවසඤ්ඤීනාසඤ්ඤීසු. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. එතදනුත්තරියං භන්තෙ පුබ්බෙනිවාසානුස්සති ඤාණෙ.

## චුතූපපාතඤාණදෙසනා

14. අපරං පන භන්තෙ එතදනුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති සත්තානං චුතූපපාතඤාණෙ. ඉධ භන්තෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති; ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදනා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදනා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. එතදනුත්තරියං භන්තෙ සත්තානං චුතූපපාතඤාණෙ.

---

1. සත්තා-ස්‍යා.
2. සංඛාතො-PTS
3. අභිනිවුට්ඨපුබ්බා-මජසං

## පූර්වේනිවාසානුස්මෘති ඥාණ දෙසනා

13. වහන්ස, යම්සේ භාග්‍යවතුන් වහන්සේ පූර්වේනිවාසානුස්මෘති-ඥානවිෂයයෙහි දහම් දෙසා ද, මේ (ඔබ පිළිබඳ) අන් අනුත්තර බවෙකි. වහන්ස, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ වැර වඩා ... යම් බඳු සමාධියෙකින් සිත සමාහිත කල්හි, ... එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පසක්ද, ජාති දශයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද, ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති සියදහසක් ද, නොයෙක් සංවර්ත කල්ප ද, නොයෙක් විවර්ත කල්ප ද, නොයෙක් සංවර්ත විවර්ත කල්ප ද සිහි කෙරෙයි. මෙසේ ආකාර සහිත කොට උද්දේශ සහිත කොට, අනෙකවිධ වූ පූර්වේනිවාසය සිහි කරයි. වහන්ස, පිණ්ඩගණනායෙන් හෝ අච්ඡිද්‍ර මනොගණනායෙන් හෝ යම් කෙනකුන්ගේ ආයුෂය ගණින්නට නොහැක්කේ ද එසේ වූ දීර්ඝායුෂ්ක දෙවි කෙනෙක් ඇත. එතෙකුදු වුවත් රූපී වූ හෝ අරූපී වූ හෝ සංඥී වූ හෝ අසංඥී වූ හෝ නෙවසංඥ නාසංඥ වූ හෝ දෙවියන් අතුරෙහි යම් යම් අත්බැවෙක වුසූ විරූ වේ ද, (ඒ හැම එකකුගේ ම පූර්වේනිවාසය භාග්‍යවතුන් වහන්සේ දන වදරන සේක.) මෙසේ ආකාර සහිත කොට උද්දේශ සහිත කොට අනෙකවිධ වූ පූර්වේනිවාසය සිහි කරන සේක. වහන්ස, පූර්වේනිවාසානුස්මෘතිඥාන විෂයයෙහි මේ (භාග්‍යවතුන් වහන්සේගේ) අනුත්තර බව යැ.

## චුතූපපාත ඥාණ දෙසනා

14. වහන්ස, සත්වයන්ගේ ච්‍යුත්‍යුපපාද ඥාන විෂයයෙහි යම්සේ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනා සේක් ද, මේ (ඔබ ගේ) තවද අනුත්තර බවෙකි. වහන්ස, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ වැර වඩා ... යම් සමාධියෙකින් සිත සමාහිත කල්හි 'බෙදයෙක! මේ භවත් සත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්විත හ, වාග් දුශ්චරිතයෙන් සමන්විත හ, මනෝදුශ්චරිතයෙන් සමන්විත හ, ආර්යයනට උපවාද කරන්නාහ, මිසදිටු හ, මිථ්‍යාදෘෂ්ටික කර්ම සමාදන ඇත්තාහ, ඔහු කා බුන් මරණින් මතු සැපයෙන් පහ වූ විවශ ව පතිත වන ස්ථානය වූ නිරයට වන්නාහ. එතෙකුදු වුවත් මේ සත්හු වූකලි කාය සුචරිතයෙන් සමන්විත හ. වාක් සුචරිතයෙන් සමන්විත හ, මනඃ සුචරිතයෙන් සමන්විත හ, ආර්යයනට උපවාද නොකරන්නෝ ය. සම්දිටු හ. සම්‍යක් දෘෂ්ටික කර්ම සමාදන ඇත්තාහ. ඔහු කාබුන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ග ලොකයට වන්නාහ' යි මිනිසුන්ගේ දර්ශනොපචාරය ඉක්මැ දක්කැ හැකි වූ විශුද්ධ වූ දිවැසින් මරණාසන්න වූ ද එ කෙණෙහි උපන්නාවූ ද පහත් වූ ද උසස් වූ මනා පැහැපත් වූ ද, නොමනා පැහැති වූ ද, මනාගති ඇත්තා වූ ද නොමනා ගති ඇත්තාවූ ද, නම් වූ පරිදි එළැඹැ සිටි සත්වයන් දනී මෙසේ මිනිසුන්ගේ දර්ශනෝපචාරය ඉක්මැ දක්කැ හැකි වූ විශුද්ධ වූ දිවැසින් මරණාසන්න වූ ද, එ කෙණෙහි උපන්නාවූ ද පහත් වූ ද, උසස් වූ ද, මනා ගති ඇත්තාවූ ද, නොමනා ගති ඇත්තාවූ ද, කම් වූ පරිදි එළැඹ සිටි සත්වයන් කී. වහන්ස, සත්වයන්ගේ ච්‍යුති උපපත්ති දැන්මෙහි භාග්‍යවතුන් වහන්සේගේ මේ අනුත්තර බව වේ.

## ඉද්ධිවිධදෙසනා

15. අපරං පන භන්තෙ එතදානුත්තරියං යථා භගවා ධම්මං දෙසෙති ඉද්ධිවිධාසු. ද්වෙ'මා භන්තෙ ඉද්ධිවිධායො.[1] අත්ථි භන්තෙ ඉද්ධි යා සාසවා සඋපධිකා නො අරියා'ති වුච්චති. අත්ථි භන්තෙ ඉද්ධි යා අනාසවා අනුපධිකා අරියා'ති. කතමා ච භන්තෙ ඉද්ධි යා සාසවා[2] සඋපධිකා නො අරියා'ති වුච්චති? ඉධ භන්තෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො පි හුත්වා බහුධා හොති, බහුධා පි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං[3] තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො[4] ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා පි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ, උදකෙ පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසෙ පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙ පි චන්දිමසූරියෙ[5] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[6] පරිමජ්ජති, යාව බ්‍රහ්මලොකා පි කායෙන වසං වත්තෙති. අයං භන්තෙ ඉද්ධි යා සාසවා සඋපධිකා නො අරියා ති වුච්චති.

කතමා පන භන්තෙ ඉද්ධි යා අනාසවා අනුපධිකා අරියා ති වුච්චති? ඉධ භන්තෙ භික්ඛු සචෙ ආකඞ්ඛති පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති, අප්පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති, පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ ච අප්පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති, පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලඤ්ච අප්පටිකූලඤ්ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානො'ති, උපෙක්ඛකො තත්ථ විහරති සතො සම්පජානො. අයං පන භන්තෙ ඉද්ධි අනාසවා අනුපධිකා අරියා ති වුච්චති. එතදානුත්තරියං භන්තෙ ඉද්ධිවිධාසු. තං භගවා අසෙසමභිජානාති. තං භගවතො අසෙසමභිජානතො උත්තරිං අභිඤ්ඤෙය්‍යං නත්ථි, යදභිජානං අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යො'භිඤ්ඤතරො අස්ස යදිදං ඉද්ධිවිධාසු.

1. ඉද්ධියෙ-PTS.
2. ඉද්ධිසාසවා-මජසං
3. තිරොක්වටං-මජසං
4. අභිජ්ජමානො-PTS.
5. මූරියෙ-මජසං
6. පරාමසති-(සීමු)

## සෘද්ධිවිධ දේශනා

15. වහන්ස, යම්සේ භාග්‍යවතුන් වහන්සේ සෘද්ධි ක්‍රියා විෂයයෙහි දහම් දෙසන සේක් ද, මෙය ද ඔබගේ අන් අනුත්තර බවෙකි. වහන්ස, මේ සෘද්ධිවිධාවෝ දෙදෙනෙකි. වහන්ස, යමෙක් සදෙස් යැයි දෝෂාරොපණ සහිත යැ යි ආර්ය නො වේ යැ යි කියනු ලැබේ ද එසේ වූ සෘද්ධියෙක් ඇත. වහන්ස, යමෙක් නිදෙස් යැ යි දෝෂාරොපණ රහිත යැ යි ආර්ය යැ යි කියනු ලැබේ ද, එසේ වූ සෘද්ධියෙක් ද ඇත. වහන්ස, යමෙක් සදෙසැ යි දෝෂාරොපණ සහිත යැ යි ආර්ය නොවේ යැ යි කියනු ලැබේ ද ඒ සෘද්ධිය කවර ද? වහන්ස, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ වැර වඩා ... යම් සමාධියෙකින් සිත සමාහිත කල්හි නොයෙක් වැදෑරුම් සෘද්ධි කොටස් ප්‍රත්‍යක්ෂ කෙරෙයි ද එසේ වූ චිත්තසමාධියක් ස්පර්ශ කෙරෙයි. පියෙවියෙන් එකෙක් වූ හෙ තෙමේ බොහෝ දෙනෙකුන් සේ පැනෙයි. බොහෝ දෙනෙකුන් සේ වැ යලි එකෙක් ම වැ පැනෙයි. පැනෙන බවට, නො පැනෙන බවට පැමිණෙයි. බිත්තියෙන් පිටතට ද පවුරෙන් පිටතට ද, පර්වතයෙන් පිටතට ද අහසෙහි මෙන් නො ගැටෙනුයේ යෙයි. දියෙහි මෙන් පොළොවෙහි ද ගැලීම මතු වීම කෙරෙයි. පොළොවෙහි මෙන් නො බිඳෙන දියෙහි (දිය නොබිඳෙන සේ) යෙයි. පියාපත් ඇති පක්ෂියකු සේ අහසෙහි ද පළඟින් යෙයි. මෙසා මහ ඉදුමත් මෙසා මහ තෙදැති මේ සඳ හිරුන්ද අත්ලෙන් ස්පර්ශ කෙරෙයි, පිරිමදියි. බඹ ලොව තෙක් ම ද කයින් වශයෙහි පවත්වයි. වහන්ස, යමෙක් සදෙස් ද දෝෂාරෝපණ සහිත ද, ආර්ය යැ යි කියනු නො ලැබේ ද, මේ ඒ සෘද්ධිය යි.

වහන්ස, යමෙක් නිදෙස් යැ යි දෝෂාරෝපණ රහිත යැ යි ආර්ය යැ යි කියනු ලැබේ ද, ඒ සෘද්ධිය කවර ද? වහන්ස, මෙහි මහණ තෙම පිළිකුල් දැයෙහි පිළිකුල් සංඥව නැති වැ වෙසෙම් වා යි ඉදින් කැමැති වේ ද එහි පිළිකුල් සංඥ නැති වැ වෙසෙයි. ඉදින් නොපිළිකුල් දැයෙහි පිළිකුල් සංඥ නැති වැ වෙසෙම් වා යි කැමැති වේ ද, එහි පිළිකුල් සංඥ නැති වැ වෙසෙයි. ඉදින් පිළිකුල් දැයෙහිත් නොපිළිකුල් දැයෙහිත් නොපිළිකුල් සංඥ ඇති වැ වෙසෙම් වා යි කැමැති වෙ ද එහි පිළිකුල් සංඥ නැති වැ වෙසෙයි. ඉදින් පිළිකුල් දැයෙහිත් නොපිළිකුල් දැයෙහිත් පිළිකුල් සංඥව ඇති වැ වෙසෙම් වා යි කැමැති වෙ ද එහි පිළිකුල් සංඥව ඇති වැ වෙසෙයි. ඉදින් පිළිකුල් දැය ද නොපිළිකුල් දැය ද ඒ දෙක ම ද හැර සිහි ඇත්තේ නුවණින් දන්නේ එහි උපෙක්ෂක වැ වෙසෙම් වා යි කැමැති වේ ද, සිහි ඇත්තේ නුවණින් දන්නේ එහි උපේක්ෂක වැ වෙසෙයි. වහන්ස, මේ වූ කලි දෙස් නැනි දෝෂාරෝපණ නැති ආර්ය සෘද්ධියැ යි කියනු ලැබේ. වහන්ස, සෘද්ධිවිධාවන් අතුරෙහි මෙය නිරුත්තර වේ. එය භාග්‍යවතුන් වහන්සේ මුළුල්ල ම වෙසසි නුවණින් දන්නා සේක. යමක් වෙසෙසින් දන්නා අන් මහණෙක් හෝ බමුණෙක් හෝ යම් සෘද්ධි විධාවන්හි භාග්‍යවතුන් වහන්සේට වඩා බොහෝ සෙයින් දන්නේ යැ යි කියැ යුතු වේ ද, (එවැන්නෙක් නැත.) එය මුළුල්ල ම දන්නා භාග්‍යවතුන් වහන්සේ විසින් තවත් වෙසෙසින් දත යුතු දැයෙක් නැත.

16. යන්තං භන්තෙ සද්ධෙන කුලපුත්තෙන පත්තබ්බං ආරද්ධවිරියෙන ථාමවතා පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පුරිසධොරය්හෙන, අනුප්පත්තං තං භගවතා. න ච භන්තෙ භගවා කාමෙසු කාමසුඛල්ලිකානු-යොගමනුයුත්තො හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, න ච අත්තකිලමථානුයොගමනුයුත්තො දුක්ඛං අනරියං අනත්ථසංහිතං, චතුන්නං ච භගවා ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී.

## අනුයොගදානප්පකාරො

සචෙ මං භන්තෙ එවං පුච්ඡෙය්‍ය ‘කින්නු ඛො ආවුසො සාරිපුත්ත, අහෙසුං අතීතමද්ධානං අඤ්ඤෙ සමණා වා බ්‍රාහ්මණා වා භගවතා භිය්‍යො'භිඤ්ඤතරා සම්බොධියන්ති? එවං පුට්ඨො අහං භන්තෙ නො'ති වදෙය්‍යං. ‘කිං පනාවුසො සාරිපුත්ත භවිස්සන්ති අනාගතමද්ධානං අඤ්ඤෙ සමණා වා බ්‍රාහ්මණා වා භගවතා භිය්‍යො'භිඤ්ඤතරා සම්බොධියන්ති?' එවං පුට්ඨො අහං භන්තෙ ‘නො'ති වදෙය්‍යං. ‘කිං පනාවුසො සාරිපුත්ත අත්ථෙතරහි අඤ්ඤෙ සමණා වා බ්‍රාහ්මණා වා භගවතා භිය්‍යො'භිඤ්ඤ-තරො සම්බොධියන්ති?'' එවං පුට්ඨො අහං භන්තෙ ‘නො'ති වදෙය්‍යං. සචෙ පන මං භන්තෙ එවං පුච්ඡෙය්‍ය ‘‘කින්නු ඛො ආවුසො සාරිපුත්ත අහෙසුං අතීතමද්ධානං අඤ්ඤෙ සමණා වා බ්‍රාහ්මණා වා භගවතා සමසමා සම්බොධියන්ති?' එවං පුට්ඨො අහං භන්තෙ ‘එවන්ති'වදෙය්‍යං. ‘කිං පනාවුසො සාරිපුත්ත, භවිස්සන්ති අනාගතමද්ධානං අඤ්ඤෙ සමණා වා බ්‍රාහ්මණා වා භගවතා සමසමා සම්බොධියන්ති?' එවං පුට්ඨො අහං භන්තෙ ‘එවන්ති' වදෙය්‍යං. ‘කිං පනාවුසො සාරිපුත්ත අත්ථෙතරහි අඤ්ඤෙ සමණා වා බ්‍රාහ්මණා වා භගවතා සමසමා සම්බොධියන්ති?' එවං පුට්ඨො අහං භන්තෙ‘නො'ති වදෙය්‍යං. සචෙ පන මං භන්තෙ එවං පුච්ඡෙය්‍ය, ‘කිං පනායස්මා සාරිපුත්තො එකච්චං අබ්භනුජානාති එකච්චං නාබ්භනුජානාතී?'ති එවං පුට්ඨො අහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං ‘සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා මයා සමසමා සම්බොධියන්ති. සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තොසම්මා-සම්බුද්ධා මයා සමසමා සම්බොධියන්ති. සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං:

16. වහන්ස, සැදැහැවත් ආරබ්ධ වීර්ය ඇති, ස්ථිර වීර්ය ඇති පුරුෂ ස්ථාමය ඇති, පුරුෂ වීර්යය ඇති, පුරුෂ පරාක්‍රමය ඇති ධුර වහන සමර්ථ මහා පුරුෂ වූ කුල පුතක්හු විසින් යමක් ලැබියැ යුතු ද භාග්‍යවතුන් වහන්සේ විසින් එය ලබන ලද්දේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ හීන වූ ග්‍රාම්‍ය වූ පුහුදුනන් විසින් සෙවියැ හැකි, ආර්යයන් විසින් නො සෙවියැ හැකි, අනර්ථයෙන් යුක්ත වූ කාමසුඛල්ලිකානුයොගයෙහි නොයෙදුණු සේක. දුඃඛ යුක්ත වූ අනාර්ය වූ අනර්ථ නිඃශ්‍රිත වූ ආත්මක්ල-මථානු යොගයෙහි ද නොයෙදුණු සේක. භාග්‍යවතුන් වහන්සේ වූ කලී කාමාවචර සිත් ඉක්මැ සිටි, දෘෂ්ටධර්ම සුඛවිහාර වූ සතර ධ්‍යානයන් කැමැති සේ ලබන සුලු වූ සේක, නිදුකින් ඒ ලබන සුලු වූ සේක, මහත් සේ එය ලබන සුලු වූ සේක.

### අනුයොගදාන – ප්‍රකාරය

වහන්ස, ඉදින් ‘ඇවැත් ශාරිපුත්‍රයෙනි, සම්බෝධි විෂයයෙහි භාග්‍යවතුන් වහන්සේට වඩා විශිෂ්ට ඥානය ඇති අන් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඇද්දැ?’යි ඉදින් මා විචාරන්නේ නම්, වහන්ස, එසේ විචාරන ලද මම ‘නැතැ’යි කියන්නෙමි. ‘කිමෙක් ද ඇවැත් ශාරිපුත්‍රයෙනි, සම්බෝධියෙහි භාග්‍යවතුන් වහන්සේට වඩා විශිෂ්ට ඥානය ඇති අන් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ අනාගත කාලයෙහි වන්නාහු දැ?’ යි ඉදින් මා විචාරන්නේ නම් වහන්ස, එසේ විචාරනු ලැබූ මම ‘නො වන්-නාහ’යි කියන්නෙමි. ‘කිමෙක් ද ඇවැත් ශාරිපුත්‍රයෙනි, සම්බෝධියෙහි භාග්‍යවතුන් වහන්සේට වඩා විශිෂ්ට ඥානය ඇති අන් මහණෙක් හෝ බමුණෙක් හෝ දැන් ඇත් දැ?’ යි මා විචාරන්නේ නම්, වහන්ස, එසේ විචාරන ලද, මම ‘නැතැ’යි කියන්නෙමි. වහන්ස, ‘සම්බෝධියෙහි භාග්‍ය-වතුන් වහන්සේට සම සම වූ නුවණ ඇති අන් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ වූහු දැ?’යි ඉදින් මා විචාරන්නේ නම් වහන්ස, මෙසේ විචාරන ලද මම ‘එසේ යැ’යි කියන්නෙමි. ‘කිමෙක් ද ඇවැත් ශාරි-පුත්‍රයෙනි, සම්බෝධියෙහි භාග්‍යවතුන් වහන්සේට සම සම වූ අන් මහණ බමුණු කෙනෙක් අනාගත කාලයෙහි වන්නාහු දැ?’යි මා විචාරන්නේ නම්, එසේ විචාරනු ලැබූ මම ‘එසේ යැ’යි කියන්නෙමි. ‘කිමෙක්ද ශාරි-පුත්‍රයෙනි, සම්බෝධියෙහි භාග්‍යවතුන් වහන්සේට සම සම වූ අන් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ දැන් ඇත් දැ?’යි මා විචාරන්නේ නම්, වහන්ස, එසේ විචාරනු ලැබූ මම ‘නැතැ’යි කියන්නෙමි, ‘කිමෙක් ද ඇවැත් ශාරිපුත්‍රයෝ එක්තරා මහණ බමුණු කෙනකු පිළිගන්නාහු එක්-තරා මහණ බමුණු කෙනකු නො පිළිගන්නාහු දැ?’යි මා පුළුවුස්නේ නම් එසේ විචාරනු ලැබූ මම ‘ඇවැත්නි, “සම්බෝධියෙහි මා හා සම සම වූ රහත් සම්මා සම්බුද්ධවරැ අතීත කාලයෙහි වූහ” යන මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි අසන ලද්දේ ය, භාග්‍යවතුන් වහන්-සේ ගේ සම්මුඛයෙහි පිළිගන්නා ලද්දේය.. “ඇවැත්නි, සම්බෝධියෙහි මා හා සම සම වූ රහත් සම්මා සම්බුද්ධවරැ අනාගත කාලයෙහි වන්නාහ”යි යන මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහිදී අසා සම්මුඛයෙහිදී පිළිගන්නා ලද්දේය.

"අට්ඨානමෙතං අනවකාසො යං එකිස්සා ලොකධාතුයා ද්වෙ අරහන්තො සම්මාසම්බුද්ධා අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං. නෙතං ඨානං විජ්ජතී"ති. එකච්චාහං භන්තෙ එවං පුට්ඨො එවං බ්‍යාකරමානො වුත්තවාදී චෙව භගවතො හොමි, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛාමි, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරොමි, න ච කොචි සහධම්මිකො. වාදානුපාතො[1] ගාරය්හං ඨානං ආගච්ඡතී?ති".

17. "තග්ඝත්වං සාරිපුත්ත එවං පුට්ඨො එවං බ්‍යාකරමානො වුත්තවාදී චෙව මෙ හොති න ච මං අභූතෙන අබ්භාචික්ඛසි, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරොසි, න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡතී"ති.

## අච්ඡරියබ්භුතානි

18. එවං වුත්තෙ ආයස්මා උදායී භගවන්තං එතදවොච: "අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ තථාගතස්ස අප්පිච්ඡතා සන්තුට්ඨිතා සල්ලෙඛතා යත්‍ර හි නාම තථාගතො එවංමහිද්ධිකො එවංමහානුභාවො, අථ ච පන නෙවත්තානං පාතුකරිස්සති. එකමෙකං චෙපි ඉතො භන්තෙ ධම්මං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අත්තනි සමනුපස්සෙය්‍යුං, තෙ තාවතකෙනෙව පටාකං පරිහරෙය්‍යුං. අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ තථාගතස්ස අප්පිච්ඡතා සන්තුට්ඨිතා සල්ලෙඛතා, යත්‍ර හි නාම තථාගතො එවංමහිද්ධිකො එවංමහානුභාවො, අථ ච පන නෙවත්තානං පාතුකරිස්සතී"ති.

19. "පස්ස ඛො ත්වං උදායි: තථාගතස්ස අප්පිච්ඡතා සන්තුට්ඨිතා සල්ලෙඛතා, යත්‍ර හි නාම තථාගතො එවං මහිද්ධිකො එවංමහානුභාවො, අථ ච පන නෙවත්තානං පාතුකරිස්සති. එකමෙකං චෙපි ඉතො උදායි ධම්මං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අත්තනි සමනුපස්සෙය්‍යුං, තෙ තාවතකෙනෙව පටාකං පරිහරෙය්‍යුං. පස්ස ඛො ත්වං උදායි: තථාගතස්ස අප්පිච්ඡතා සන්තුට්ඨිතා සල්ලෙඛතා, යත්‍ර හි නාම තථාගතො එවංමහිද්ධිකො එවංමහානුභාවො, අථ ච පන නෙවත්තානං පාතුකරිස්සතී"ති.

20. අථ ඛො භගවා ආයස්මන්තං, සාරිපුත්තං ආමන්තෙසි: "තස්මාතිහ[2] ත්වං සාරිපුත්ත ඉමං ධම්මපරියායං අභික්ඛණං භාසෙය්‍යාසි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං. යෙසම්පි හි සාරිපුත්ත මොඝපුරිසානං භවිස්සති තථාගතෙ කඞ්ඛා වා විමතිවා තෙසම්පිමං[3] ධම්මපරියායං සුත්වා යා තථාගතෙ කඞ්ඛා වා විමති වා සා පහීයිස්සතී"ති. ඉති හිදං ආයස්මා සාරිපුත්තො භගවතො සම්මුඛා සම්පසාදං පවෙදෙසි. තස්මා ඉමස්ස වෙය්‍යාකරණස්ස සම්පසාදනීයන්තෙව අධිවචනන්ති.

**සම්පසාදනීයසුත්තං නිට්ඨිතං පඤ්චමං.**

1. වාදානුවාදො-මජසං
2. යස්මා-සයා.
3. තෙසම්පි ඉමං-PTS. තෙසම්පි මං-සයා.

ඇවැත්නි එක් ලෝකධාතුවෙක රහත් සම්මාසම්බුද්ධවරු දෙනමක් ඉදිරි පසු නො වැ එක් විටම පහළ වන්නාහ යන මෙය නො කරුණෙක, සිදු වන්නට අවකාශ නැත්තෙක. මෙ කරුණ විද්‍යමාන නො වේ' යැ යි යන මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහිදී අසා ඔබ හමුයෙහිදී පිළිගන්නා ලද්දෙකැ'යි මෙසේ පවසන්නෙමි. 'වහන්ස, මෙසේ විචාරනු ලැබූ මම මෙපරිද්දෙන් එක්තරා ශාස්තෘ කෙනකු පිළිගන්නා බව පවසනුයෙම්, භාග්‍යවතුන් වහන්සේ වදාළ වචනයක් ම කියන්නෙකිම් වෙම් ද? භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් දෙස් නො නගන්නෙකිම් වෙම් ද? නව ලොවුතුරා දහමට අනුකූල ධර්ම වූ පූර්වභාග ප්‍රතිපත්තිය පවසනුයෙම් වෙම් ද? කරුණු සහිත කිසි වාදයෙක් ගැරැහියැ යුතු තැනට පැමිණෙයි දැ?'යි (සැරියුත් තෙරණුවෝ වදළහ.)

17. "ශාරිපුත්‍රයෙනි, එසේ වී නම් අසන්න. එසේ විචාරන ලදු ව යට කී සේ විසඳන තෙපි මා කී දැයක් ම කියන්නෝ වහු, මට අභූතයෙන් දෙස් නඟන්නෝ නො වහු, ධර්මයට අනුකූල ධර්මය ද පවසන්නෝ වහු, කරුණු සහිත කිසි දු වාදයෙක් ගැරැහියැ යුතු තැනට නොපැමිණේ'යැ යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. මෙසේ වදළ කලැ උදයී තෙරණුවෝ 'වහන්ස, යම්බඳු වූ තථාගතයන් වහන්සේ මෙසේ මහත් සෘද්ධි ඇති සේක්, මෙසේ මහත් තෙද ඇති සේක් වැලි දු එසේ තමා හෙළි නො කරන සේක. එසේ වූ තථාගතයන් වහන්සේගේ අල්පේච්ඡතාව, සන්තුෂ්ටතාව සංලේඛිතාව ආශ්චර්ය ය, අද්භූත යැ' යි කීහ.

18. "උදයීනි, යම්බඳු තථාගතයෝ මෙසේ මහත් සෘද්ධි ඇත්තෝ ද, මහත් තෙදැත්තෝ ද එහෙත් තමන් නො ම හෙළි කරන්නෝය. බලවු, උදයීනි, එහි තථාගතයන්ගේ අල්පේච්ඡතාව සන්තුෂ්ටතාව, සංලේඛිතාව, කොතරම් ආශ්චර්ය ද! උදයීනි මෙයින් එක් එක් දහමක් නාමුදු අන්‍යතීර්ථ පිරිවැජ්ජෝ තමන් කෙරෙහි දක්නාහු නම් එතෙකිනාම ඔහු කොඩි ඔසොවා ගෙන, නුවර සිසාරා හැවිදුනාහ. උදයීනි, යම්බඳු වූ තථාගතයෝ මෙසේ මහත් සෘද්ධි ඇත්තෝ ද මහත් තෙද ඇත්තෝ ද එහෙත් තමන් හෙළි නො කරන්නාහ. බලවු, උදයීනි, තථාගතයන්ගේ අල්පේච්ඡතාව, සන්තුෂ්ටතාව, සංලේඛිතාව ආශ්චර්ය ය.!

19. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදරා ඉක්බිති සැරියුත් තෙරුන් බණවා, ශාරිපුත්‍රයෙනි, එසේ වී නම් තෙපි මේ ධර්මපර්යායය මහණුනට, මෙහෙණියනට, උවසුවනට, උවැසියනට එක්වන් කියවු. ශාරිපුත්‍රයෙනි, යම් හිස් පුරුෂ කෙනකුනට තථාගතයන් කෙරෙහි සැකයෙක් හෝ විමතියෙක් හෝ වන්නේ ද, ඔවුනට මේ ධර්මපර්යායය ඇසීමෙන් තථාගතයන් කෙරෙහි යම් සැකයෙක් හෝ විමතියෙක් හෝ වී නම්, එය ප්‍රහීණ වන්නේ යැ''යි වදළ සේක.

මෙසේ ම සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි සිය පැහැදීම දැන්වූහ. එහෙයින් මේ නිර්ගාථක සූත්‍රයට 'සම්පසාදනීය' සූත්‍රය යන නම විය.

පස්වනු සම්පසාදනීය සූත්‍රය නිමියේ යැ.

# 6

# පාසාදිකසුත්තං

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා සක්කෙසු විහරති, වෙධඤ්ඤා නාම සක්‍යා, තෙසං අම්බවනෙ පාසාදෙ.

## නිගණ්ඨනාතපුත්තකාලකිරියා

තෙන ඛො පන සමයෙන නිගණ්ඨො නාතපුත්තො[1] පාවායං අධුනා කාලකතො හොති. තස්ස කාලකිරියාය භින්නා නිගණ්ඨා ද්වෙධිකජාතා භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි! මිච්ඡාපටිපන්නො ත්වමසි, අහමස්මි සම්මාපටිපන්නො, සහිතම්මෙ, අසහිතන්තෙ, පුරෙ වචනීයං පච්ඡා අවච, පච්ඡා වචනීයං පුරෙ අවච, අවිචිණ්ණං තෙ විපරාවත්තං, ආරොපිතො තෙ වාදො, නිග්ගහිතො ත්වමසි චර වාදප්පමොක්ඛාය, නිබ්බෙඨෙහි වා සචෙ පහොසී"ති. වධොයෙව ඛො[2] මඤ්ඤෙ නිගණ්ඨෙසු නාතපුත්තියෙසු අනුවත්තති යෙ පි නිගණ්ඨස්ස නාතපුත්තස්ස සාවකා ගිහී ඔදාතවසනා, තෙ තෙසු නිගණ්ඨෙසු නාතපුත්තියෙසු නිබ්බින්නරූපා විරත්තරූපා පටිවානරූපා, යථා තං දුරක්ඛාතෙ ධම්මවිනයෙ දුප්පවෙදිතෙ අනිය්‍යානිකෙ අනුපසමසංවත්තනිකෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ භින්නථූපෙ අප්පටිසරණෙ.

---

1. නාටපුත්තො-මජසං
2. වධො යෙවෙකො - කම්.

# 6

# පාසාදික සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී;

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි වෙධඤ්ඤ නම් යම් ශාක්‍ය රජදරු කෙනෙක් වූහු ද, ඔවුන්ගේ අඹ වෙනෙහිවූ ප්‍රාසාදයෙහි වැඩ වසන සේක.

එ සමයෙහි වූ කලි ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථ තෙමේ පාවා නුවරෙහි දී තොබෝ දවසකට පෙර කලුරිය කෙළේ වෙයි. ඔහුගේ කාලක්‍රියායෙන් පසු නොමනා කොට කියන ලද, නොමනා කොට දන්වනලද, නෛර්යාණික නොවූ, කෙලෙස් නිවීම පිණිස නො පවත්නා වූ සම්‍යක්-සම්බුද්ධ නොවූවක්හු විසින් ප්‍රකාශිත වූ බිඳීගිය ස්තූපය ඇති (මළාවූ ශාස්තෘහු ඇති), ශාස්තෘහුගේ අභාවයෙන් පිළිසරණක් නැත්තාවූ සස්නෙක්හි යම්සේ වියැ යුතු ද, එසේ ම ඔහුගේ ශ්‍රාවක වූ නිවටුහු භෙදභින්න වූවාහු, දෙ කොටසකට බෙදී ගියාහු, උපන් අරගල ඇත්තාහු උපන් කලහ ඇත්තාහු, විවාදයට බටුවාහු, ''තෝ මේ දහම් විනය නො දනී, මම මේ දහම්විනය දනිමි, කිම තෝ මේ දහම් විනය දැනගත්තෙහි ද! තෝ වරදවා පිළිපන්නෙහි, මම මොනොවට පිළිපන්නෙමි. මා කී වචන අර්ථයුක්ත ය, තගේ වචන අර්ථරහිත ය. පළමුවෙන් කියැ යුත්ත තෝ පසු ව කීයෙහි, පසු ව කියැයුත්ත පළමුයෙන් කීයෙහි. තා බොහෝ කලක් පුහුණු කළ දෑ මගේ වාදය නිසා පෙරළී ගියේ ය. තා මත්තෙහි මා විසින් වාදය ආරොපිත ය. තෝ මා විසින් නිගන්නා ලද්දෙහි. වාදයෙන් මිදෙනු පිණිස (උත්තර සොය සොයා) හැවිදුව. ඉදින් හැක්කෙහි නම් මා නැඟූ වාදයෙන් මිදී ගනුව''යි උනුන් වචන නැමැති අඩයැටියෙන් විදිනාහු වෙසෙත්. ඥාතපුත්‍රයාගේ අතැවැස්සන් අතුරෙහි උනුන් මරාගැන්මක් මෙන් පවතී. ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයාගේ ශ්වේතවස්ත්‍රධාරී යම් ගෘහී ශ්‍රාවක කෙනෙක් වෙත් ද, උහුත් ඥාතපුත්‍රයාගේ අතැවැසි නිවටුන් කෙරෙහි කලකිරුණු ස්වභාවය ඇත්තාහු ආදර රහිත ස්වභාවය ඇත්තාහු, පළමු දක්වූ සත්කාර ගුරුකාර හැර පසුබැස ගිය ස්වභාවය ඇත්තාහු වෙත්.

2. අථ ඛො චුන්දො සමණුද්දෙසො පාවායං වස්සං වුත්ථො,[1] යෙන සාමගාමො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො චුන්දො සමණුද්දෙසො ආයස්මන්තං ආනන්දං එතදවොච: නිගණ්ඨො භන්තෙ නාතපුත්තො පාවායං අධුනා කාලකතො. තස්ස කාලකිරියාය භින්නා නිගණ්ඨා ද්වෙධිකජාතා -පෙ- භින්නථූපෙ අප්පටිසරණෙ'ති: එවං වුත්තෙ ආයස්මා ආනන්දො චුන්දං සමණුද්දෙසං එතදවොච: අත්ථි ඛො ඉදං ආවුසො චුන්ද කථාපාභතං භගවන්තං දස්සනාය. ආයාමාවුසො චුන්ද, යෙන භගවා තෙනුපසංකමිස්සාම. උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙස්සාමා'ති.[2]

'එවං භන්තෙ'ති ඛො චුන්දො සමණුද්දෙසො ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි. අථ ඛො ආයස්මා ච ආනන්දො චුන්දො ච සමණුද්දෙසො යෙන භගවා තෙනුපසංකමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: අයං භන්තෙ චුන්දො සමණුද්දෙසො එවමාහ: "නිගණ්ඨො භන්තෙ නාතපුත්තො පාවායං අධුනා කාලකතො. තස්ස කාලකිරියාය භින්නා නිගණ්ඨා ද්වෙධිකජාතා -පෙ- භින්නථූපෙ අප්පටිසරණෙ" ති.

### අසම්මා සම්බුද්ධප්පවෙදිත - ධම්මවිනයො

3. "එවං හෙතං චුන්ද අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ ධම්මවිනයෙ හොති දුරක්ඛාතෙ ධම්මවිනයෙ දුප්පවෙදිතෙ අනිය්‍යානිකෙ අනුපසමසංවත්තනිකෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ. ඉධ චුන්ද සත්ථා ච හොති අසම්මාසම්බුද්ධො, ධම්මො ච දුරක්ඛාතො දුප්පවෙදිතො අනිය්‍යානිකො අනුපසමසංවත්තනිකො අසම්මාසම්බුද්ධප්පවෙදිතො, සාවකො ච තස්මිං ධම්මෙ න ධම්මානුධම්මප්පටිපන්නො විහරති න සාමීචිපටිපන්නො න අනුධම්මචාරි, වොක්කම්ම ච තම්හා ධම්මා වත්තති.

1. වස්සං වුට්ඨො-මඡසං
2. ආරොචෙය්‍යාමා-ස්‍යා

2. එ කල්හි චුන්ද සමණුද්දෙසයෝ පාවා නුවරෙහි වස් වුසුවෝ, සාමගාමයෙහි අනඳ තෙරුන් කරා එළැඹියෝ ය. එළැඹ ආයුෂ්මත් අනඳ තෙරුන් ආදරයෙන් වැඳ, පසෙක හිඳගත්හ. පසෙක හුන්නා වූ ම චුන්ද සමනුද්දෙසයෝ ආයුෂ්මත් අනඳ තෙරුනට 'වහන්ස, ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථ තෙමේ පාවා නුවරැදී, නොබෝ කල්හි කලුරිය කෙළේ වෙයි. ඔහුගේ කාලක්‍රියායෙන්......බිඳීගිය ස්තූප ඇති, පිළිසරණක් නැති සස්නෙක්හි යම්සේ වියැ යුතු ද, එසේ ම ඔහු සවු නිවටහු භෙදභින්න වූවාහු, දෙකොටසකට බෙදී ගියාහු......වෙත් යැ' යි සැළ කළෝ ය. මෙසේ සැළ කළ කල්හි අනඳ තෙරණුවෝ චුන්ද සමනුද්දෙසයනට ඇවැත් චුන්දයෙනි, භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස මෙය කථාප්‍රාභෘතයෙක් (කතා පඩුරෙක් වැ) ඇත. ඇවැත් චුන්දයෙනි, එමු, භාග්‍යවතුන් වහන්සේ කරා යන්නමු. ගොස් මෙ කරුණ භාග්‍ය-වතුන් වහන්සේට සැළ කරන්නමෝ වෙ දැ''යි වදළහ. 'එසේ ය, වහන්සැ'යි කියා ම චුන්ද සමනුද්දෙසයෝ අනඳ තෙරුනට පිළිවදන් දුන්හ.

ඉක්බිති අනඳතෙරණුවෝ ද චුන්ද සමණුද්දෙස ද භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ, එක් පසෙක හිඳගත්හ. එක් පසෙක හුන්නාවූ ම අනඳ තෙරණුවෝ 'වහන්ස, ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථ පාවා නුවරැදී කලුරිය කෙළේ යැ යි, ඔහුගේ කාලක්‍රියායෙන් ... බිඳීගිය ස්තූප ඇති, පිළිසරණක් නැති සස්නෙකැ යම්සේ වියැ යුතු ද, එසේ ම ඔහු සවු නිවටහු භෙදභින්න වූවාහු, දෙ කොටසකට බෙදීගියාහු ... වෙත් යැ' යි මෙසේ මේ චුන්ද සමණුද්දෙසයෝ කියති'යි මෙ පවත් සැළ කළහ.

3. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක: ''චුන්දයෙනි, නොමනා කොට කියන ලද, නොමනා කොට දන්වන ලද, නෛර්යා-ණික නොවූ, කෙලෙස් නිවීම පිණිස නො පවත්නාවූ, අසම්‍යක්සම්බුද්-ධයක්හු විසින් ප්‍රකාශිත වූ සස්නෙක්හි මෙය මෙසේ ම වෙයි. චුන්දයෙනි, මෙහි ශාස්තෲ තෙමේ සම්‍යක්සම්බුද්ධත් නො වෙ ද, ධර්මයත් නො මනා කොට දෙසන ලද ද, නොමනා කොට දන්වන ලද ද, අනෛර්යාණික ද, කෙලෙස් සංසිඳීම පිණිස නො පවත්නේ ද, අසම්‍යක්-සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත ද, ශ්‍රාවක තෙමේත් ඒ දහම්හි ධර්මානු-ධර්මප්‍රතිපන්න වැ, නිසි පිළිවෙත්හි පිළිපන් වැ අනුධර්මචාරී වැ නො වෙසෙයි. හේ ඒ ධර්මයෙන් ඉවතට පැන පැන පවතී.

සො එවමස්ස වචනීයො, "තස්ස තෙ ආවුසො ලාභා, තස්ස තෙ සුලද්ධං, සත්ථා ච තෙ අසම්මාසම්බුද්ධො ධම්මො ච දුරක්ඛාතො දුප්පවෙදිතො අනිය්‍යානිකො අනුපසමසංවත්තනිකො අසම්මාසම්බුද්ධප්පවෙදිතො, ත්වඤ්ච තස්මිං ධම්මෙ න ධම්මානුධම්මපටිපන්නො විහරසි න සාමීචිපටිපන්නො න අනුධම්මචාරී, වොක්කම්ම ච තම්හා ධම්මා වත්තසී"ති. ඉති ඛො චුන්ද සත්ථා පි තත්ථ ගාරය්හො, ධම්මො පි තත්ථ ගාරය්හො, සාවකො ච තත්ථ එවං පාසංසො. යො ඛො චුන්ද එවරූපං සාවකං එවං වදෙය්‍ය "එතායස්මා තථා පටිපජ්ජතු යථා තෙ සත්ථාරා ධම්මො දෙසිතො පඤ්ඤත්තො"ති, යො ච තං සමාදපෙති යඤ්ච සමාදපෙති යො ච සමාදපිතො තථත්තාය පටිපජ්ජති, සබ්බෙ තෙ බහුං අපුඤ්ඤං පසවන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං චුන්ද හොති දුරක්ඛාතෙ ධම්මවිනයෙ දුප්පවෙදිතෙ අනිය්‍යානිකෙ අනුපසමසංවත්තනිකෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ.

4. ඉධ පන චුන්ද සත්ථා ච හොති අසම්මාසම්බුද්ධො, ධම්මො ච දුරක්ඛාතො දුප්පවෙදිතො අනිය්‍යානිකො අනුපසමසංවත්තනිකො අසම්මාසම්බුද්ධප්පවෙදිතො, සාවකො ච තස්මිං ධම්මෙ ධම්මානුධම්මප්පටිපන්නො විහරති සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සමාදය තං ධම්මං වත්තති. සො එවමස්ස වචනීයො "තස්ස තෙ ආවුසො අලාභා, තස්ස තෙ දුල්ලද්ධං, සත්ථා ච තෙ අසම්මාසම්බුද්ධො ධම්මො ච දුරක්ඛාතො දුප්පවෙදිතො අනිය්‍යානිකො අනුපසමසංවත්තනිකො අසම්මාසම්බුද්ධප්පවෙදිතො ත්වඤ්ච තස්මිං ධම්මෙ ධම්මානුධම්මප්පටිපන්නො විහරසි සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සමාදය තං ධම්මං වත්තසී"ති.

ඉති ඛො චුන්ද සත්ථාපි තත්ථ ගාරය්හො, ධම්මො පි තත්ථ ගාරය්හො, සාවකො පි තත්ථ එවං ගාරය්හො. යො ඛො චුන්ද එවරූපං සාවකං එවං වදෙය්‍ය. "අද්ධායස්මා ඤායපටිපන්නො ඤායමාරාධෙස්සතී"ති, යො ච පසංසති යඤ්ච පසංසති යො ච පසංසිතො භිය්‍යොසොමත්තාය විරියං ආරභති සබ්බෙ තෙ බහුං අපුඤ්ඤං පසවන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං චුන්ද හොති දුරක්ඛාතෙ ධම්මවිනයෙ දුප්පවෙදිතෙ අනිය්‍යානිකෙ අනුපසමසංවත්තනිකෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ.

'ඇවැත්නි, ඒ තොපට මේ ධර්මානුධර්මප්‍රතිපත්ති ආදීහු ලාභයෝ ය, ඒ තොප විසින් මිනිසත් බව ද මොනොවට ලද්දේ ය. තොප ගේ ශාස්තෘ ද අසම්‍යක්සම්බුද්ධ ය, තොපගේ ධර්මය ද දුරාඛ්‍යාත ය, දුෂ්ප්‍රවේදිත ය, අනෛර්යාණික ය, ව්‍යුපශමය පිණිස නො පවත්නේය, අසම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත ය. තෙපිත් ඒ ධර්මයෙහි ධර්මානු-ධර්මප්‍රතිපන්න වැ නො වසහු. නිසි පිළිවෙත්හි නො පිළිපන්නාහු අනු-ධර්මචාරී නො වහු. ඒ දහමින් ඉවතට පැන පවතිහු'' යැ යි හෙ තෙම මෙසේ කියැ යුතු වන්නේ ය, (ඔහුට මෙසේ කියැ යුතු ය). චුන්දයෙනි, මෙසේ එහි ශාස්තෘ ද ඒකාන්තයෙන් ගර්හා ලබනු සුදුසු ය, එහි ධර්මය ද ගර්හා ලැබියැ යුතු ය. එහි ශ්‍රාවක තෙමේ ම මෙසේ පැසැසුම් ලැබියැ යුතු ය. චුන්දයෙනි, යමෙක් වූ කලි මෙබඳු සව්වක්හට, 'ආයුෂ්මත් තෙමේ ඒ වා යම් සේ තාගේ ශාස්තෘහු විසින් දහම් දෙසන ලද ද, පනවන ලද ද, එසේ පිළිපදී ව' යි මෙසේ කියන්නේ ද, යමෙකුත් එය සමාදන් කරවා ද, යමකුත් සමාදන් කරවා ද (යමකු ලවා ගන්වා ද), යමෙකුත් සමාදන් කරවන ලද්දේ එය පුරාලනු පිණිස පිළිපදී ද, ඒ සියල්ලෝ බොහෝ අකුසල් රැස් කෙරෙත්. ඒ කවර හෙයින? යත්: චුන්දයෙනි, නො මනා කොට කියන ලද, නො මනා කොට දන්වන ලද, අනෛර්යාණික වූ, කෙලෙස් නිවීම පිණිස නො පවත්නා වූ අසම්‍යක් සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත වූ සස්නෙක්හි මෙය මෙසේ ම වෙයි. එ හෙයිනි.

4. චුන්දයෙනි, මෙහි (එක්තරා) ශාස්තෘවරයෙක් වනාහි අසම්‍යක්-සම්බුද්ධ ද වෙයි. ධර්මය ද නොමනා කොට කියන ලද්දේ ද, නොමනා කොට දන්වන ලද්දේ ද, අනෛර්යාණික ද, කෙලෙස් නිවීම පිණිස නො පවත්නේ ද, අසම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත ද වෙයි. එ දහම්හි ශ්‍රාවකයා ද ධර්මානුධර්මප්‍රතිපන්න වැ, නිසි පිළිවෙත්හි පිළිපන්-නෙක් වැ, අනුධර්මචාරී වැ වෙසෙයි, ඒ දහම සමාදන් කොට ගෙන පවතී. 'ඇවැත්නි, ඒ තොපට අලාභ ය, ඒ තොප විසින් මිනිස්බව නපුරු කොට ලබන ලද්දෙකි. තොපගේ ශාස්තෘ ද අසම්‍යක්සම්බුද්ධ ය, (තොප ගේ) ධර්මය ද නොමනා කොට කියන ලද්දේ ය, නොමනා කොට දන්වන ලද්දේ ය, අනෛර්යාණික ය, කෙලෙස් නිවීම පිණිස නො පවත්නෙක, අසම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත ය, තෙපි ද ඒ දහම්හි ධර්මානුධර්ම ප්‍රතිපන්න ව එයට නිසි පිළිවෙත්හි පිළිපන්-නෝ ව අනුධර්මචාරී වැ වසහු. ඒ ධර්මය සමාදන් කොට ගෙන වසහු' යැ යි, මෙසේ ඒ ශ්‍රාවක තෙමේ කියැ යුතු වන්නේය.

චුන්දයෙනි මෙසේ ම එහි ශාස්තෘ ද ගැරැහුම් ලැබියැ යුතු ය. එහි ධර්ම ය ද ගැරැහුම් ලැබියැ යුතු ය, එහි ශ්‍රාවකයා ද මෙසේ ගැරැහුම් ලැබියැ යුතු ය. චුන්දයෙනි, යමෙක් වනාහි එබඳු ශ්‍රාවකයකුට 'ආයුෂ්මත් තෙමේ ඒකාන්තයෙන් න්‍යායප්‍රතිපන්න ය, න්‍යායය (මුක්තිය ලබන පිළිවෙත) සම්පූර්ණ කරන්නේ යැ'යි මෙසේ කියන්නේ ද යමෙක් එසේ පසසන්නේද, යමක් හු පසස්නේද, යමෙක් පසස්නා ලද්දේ බොහෝ සේ වැර වඩා ද ඒ සියල්-ලෝ ම බොහෝ පව් රැස් කෙරෙත්, ඒ කවර හෙයින යත්: චුන්දයෙනි, නො මනා කොට කියන ලද, නොමනා කොට පවසන ලද, නෛර්යාණික නොවූ, කෙලෙස් නිවීම පිණිස නොපවත්නා වූ, අසම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත වූ සස්නෙක මෙය මෙසේ ම වෙයි, එ හෙයිනි.

## සම්මාසම්බුද්ධප්පවෙදිත — ධම්මවිනයො

5. ඉධ පන චුන්ද සත්ථා ච හොති සම්මාසම්බුද්ධො ධම්මො ච ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො, සාවකො ච තස්මිං ධම්මෙ න ධම්මානුධම්මපටිපන්නො විහරති න සාමීචිපටිපන්නො න අනුධම්මචාරී, වොක්කම්ම ච තම්හා ධම්මා වත්තති. සො එවමස්ස වචනීයො. "තස්ස තෙ ආවුසො අලාභා, තස්ස තෙ දුල්ලද්ධං, සත්ථා ච තෙ සම්මාසම්බුද්ධො, ධම්මො ච ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො, ත්වඤ්ච තස්මිං ධම්මෙ න ධම්මානුධම්මපටිපන්නො විහරසි න සාමීචිපටිපන්නො න අනුධම්මචාරී, වොක්කම්ම ච තම්හා ධම්මා වත්තසී"ති. ඉති ඛො චුන්ද සත්ථා පි තත්ථ පාසංසො, ධම්මො පි තත්ථ පාසංසො, සාවකො ච තත්ථ එවං ගාරය්හො, යො ඛො චුන්ද එවරූපං සාවකං එවං වදෙය්‍ය "එතායස්මා තථා පටිපජ්ජතු යථා තෙ සත්ථාරා ධම්මො දෙසිතො පඤ්ඤත්තො" ති. යො ච සමාදපෙති යං ච සමාදපෙති යො ච සමාදපිතො තථත්තාය පටිපජ්ජති, සබ්බෙ තෙ බහුං පුඤ්ඤං පසවන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං චුන්ද හොති ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ සුප්පවෙදිතෙ නිය්‍යානිකෙ උපසමසංවත්තනිකෙ සම්මාසම්බුද්ධප්පවෙදිතෙ.

6. ඉධ පන චුන්ද සත්ථා ච හොති සම්මාසම්බුද්ධො, ධම්මො ච ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො, සාවකො ච තස්මිං ධම්මෙ ධම්මානුධම්මපටිපන්නො විහරති, සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සමාදය තං ධම්මං වත්තති, සො එවමස්ස වචනීයො: තස්ස තෙ ආවුසො ලාභා, තස්ස තෙ සුලද්ධං, සත්ථා ච තෙ සම්මාසම්බුද්ධො ධම්මො ච ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො, ත්වඤ්ච තස්මිං ධම්මෙ ධම්මානුධම්මපටිපන්නො විහරසි, සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සමාදය තං ධම්මං වත්තසී"ති. ඉති ඛො චුන්ද සත්ථා පි තත්ථ පාසංසො, ධම්මො පි තත්ථ පාසංසො, සාවකො පි තත්ථ එවං පාසංසො.

5. චුන්දයෙනි, මෙහි ශාස්තෘ තෙමේත් සම්‍යක්සම්බුද්ධ වේ ද, ධර්මයත් මොනොවට කියන ලද්දේ, මොනවට දන්වන ලද්දේ, නෛර්යාණික වූයේ, කෙලෙස් නිවීම පිණිස පවත්නේ සම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත වූයේ වේ ද, ශ්‍රාවකයා වනාහි ඒ දහමෙහි ධර්මානුධර්මප්‍රතිපන්න නො වූයේ, නිසි පිළිවෙතට නොපිළිපන්නේ, අනුධර්මචාරී නොවූයේ වෙසේ ද, ඒ ඒ පිළිවෙතින් පිටත පැන පැන වෙසෙයි ද, හෙ තෙමේ මෙසේ කියැ යුතු වන්නේ ය: 'ඇවැත්නි, ඒ තොපට අලාභ ය, ඒ තොප විසින් මිනිස්බව නපුරු කොට ලද්දේ ය. තොපගේ ශාස්තෘ ද සම්‍යක්සම්බුද්ධ ය, ධර්මය ද මොනවට කියන ලද්දේ ය, මොනොවට දනවන ලද්දේ ය, නෛර්යාණික ය, කෙලෙස් නිවීම පිණිස පවත්නේ ය, සම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත ය. එහෙත් තෙපි ඒ ධර්මයෙහි ධර්මානුධර්මප්‍රතිපන්න නො වැ, නිසි පිළිවෙත්හි පිළිපන්නෙක් නො වැ, අනුධර්මචාරී නො වැ වෙසෙවු. ඒ ධර්මයෙන් පිටත පැන පැන පවත්හු' යැ යි (මෙසේ හෙ තෙම දෙස් නැගියැ යුතු වන්නේ ය. චුන්දයෙනි, මෙසේ එහි ශාස්තෘ ද පැසැසිය යුත්තේ ය, එහි ධර්මය ද පැසැසිය යුත්තේ ය, එහෙත් එහි ශ්‍රාවකයා මෙසේ ගැරැහියැ යුත්තේ ය. චුන්දයෙනි, යමෙක් වනාහි මෙබඳු ශ්‍රාවකයකුට 'ආයුෂ්මත් හු එත් වා, යම් සේ තොපගේ ශාස්තෘහු විසින් දහම් දෙසන ලද ද පණවන ලද ද, එසේ පිළිපදිත් ව යි මෙසේ කියැ යුතු වන්නේ ය. එහි යමෙකුත් සමාදන් කරවා ද, යමක්හුත් සමාදන් කරවා ද, යමෙකුත් සමාදන් කරවන ලදුයේ, එය පුරනු පිණිස පිළිපදී ද ඒ සියල්ලෝ ම බොහෝ පින් රැස් කෙරෙත්, ඒ කවර හෙයින්? යත්: චුන්දයෙනි, මොනොවට කියන ලද, මොනොවට දන්වන ලද, නෛර්යාණික වූ, කෙලෙස් නිවීම පිණිස පවත්නාවූ, සම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත වූ සස්නෙක්හි මෙය මෙසේ ම වෙයි. එ හෙයිනි.

6. චුන්දයෙනි, මෙහි වනාහි ශාස්තෘ තෙමේත් සම්‍යක්සම්බුද්ධ වේ ද, ධර්මයත් මොනොවට කියන ලද්දේ, මොනොවට දන්වන ලද්දේ, නෛර්යාණික වූයේ, කෙලෙස් නිවීම පිණිස පවත්නේ, සම්‍යක්සම්බුද්ධයක්හු විසින් පවසන ලද්දේ වේ ද, ශ්‍රාවක තෙමේ ද ඒ දහම්හි ධර්මානුධර්මප්‍රතිපන්න වැ නිසි පිළිවෙත්හි පිළිපන්නෙක් වැ අනුධර්මචාරී වැ වෙසේ ද, ඒ ධර්මය සමාදන් කොටගෙන පවතී ද, හෙ තෙමේ මෙසේ කියැ යුතු වන්නේ ය: 'ඇවැත්නි, ඒ තොපට ලාභ ය, ඒ තොප විසින් මිනිස් බව මොනොවට ලද්දේ ය, තොපගේ ශාස්තෘ ද සම්‍යක්සම්බුද්ධ ය, ධර්මයත් ස්වාඛ්‍යාත ද සුප්‍රවේදිත ද නෛර්යාණික ද, කෙලෙස් නිවීම පිණිස පවත්නේ ද, සම්‍යක්සම්බුද්ධප්‍රකාශිත ද වෙයි. තොපිත් ඒ ධර්මයෙහි ධර්මානුධර්මප්‍රතිපන්න වැ, නිසි පිළිවෙතට පිළිපන්නෝ වැ, අනුධර්මචාරී වැ වසහු. ඒ ධර්මය සමාදන් කොට ගෙන පවතිහු' යැ යි (මෙසේ කියැ යුතුවන්නේ ය). චුන්දයෙනි, මෙසේ ම එහි ශාස්තෘ ද පැසැසියැ යුත්තේ ය, එහි ධර්මය ද පැසැසියැ යුත්තේ ය, එහි ශ්‍රාවක තෙමේ ද පැසැසියැ යුත්තේ ය.

යො ඛො චුන්ද එවරූපං සාවකං එවං වදෙය්‍ය "අද්ධායස්මා ඤායපටිපන්නො ඤායමාරාධෙස්සතී"ති, යො ච පසංසති යං ච පසංසති, යො ච පසංසිතො භිය්‍යොසොමත්තාය විරියං ආරභති, සබ්බෙ තෙ බහුං පුඤ්ඤං පසවන්ති. තං කිස්ස හෙතු? එවං හෙතං චුන්ද හොති ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ සුප්පවෙදිතෙ නිය්‍යානිකෙ උපසමසංවත්තනිකෙ සම්මාසම්බුද්ධප්පවෙදිතෙ.

## සාවකානුතාපකරා සත්ථුකාලකිරියා

7. ඉධ පන චුන්ද සත්ථා ච ලොකෙ උදපාදි අරහං සම්මාසම්බුද්ධො, ධම්මො ච ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො, අවිඤ්ඤාපිතත්ථා චස්ස හොන්ති සාවකා සද්ධම්මෙ න ච තෙසං කෙවලපරිපූරං බ්‍රහ්මචරියං ආවිකතං හොති උත්තානීකතං සබ්බසඞ්ගාහපදකතං සප්පාටිහීරකතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං, අථ නෙසං සත්ථුනො අන්තරධානං හොති. එවරූපො ඛො චුන්ද සත්ථා සාවකානං කාලං කතො අනුතප්පො හොති. තං කිස්ස හෙතු? සත්ථා ච නො ලොකෙ උදපාදි අරහං සම්මාසම්බුද්ධො, ධම්මො ච ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො. අවිඤ්ඤාපිතත්ථා චම්හ සද්ධම්මෙ, න ච නො කෙවලපරිපූරං බ්‍රහ්මචරියං ආවිකතං හොති උත්තානීකතං සබ්බසඞ්ගාහපදකතං සප්පාටිහීරකතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං, අථ නො සත්ථුනො අන්තරධානං හොතී"ති. එවරූපො ඛො චුන්ද සත්ථා සාවකානං කාලකතො අනුතප්පො හොති.

චුන්දයෙනි, යමෙක් වනාහි මෙබඳු ශ්‍රාවකයකුට 'ඒකාන්තයෙන් ආයුෂ්මත්හු මුක්තිමාර්ගයට පිළිපන්නෝ ය, න්‍යාය ධර්මය සපුරාලන්නෝ යැ'යි මෙසේ කියන්නේ ද, යමෙකුත් මෙසේ පසස්නේ ද, යමක්හුත් පසස්නේ ද, යමෙක් පසස්නා ලද්දේත් බොහෝ සෙයින් වැර වඩන්නේ ද, ඒ සියල්ලෝ බොහෝ පින් රැස් කරන්නාහ. ඒ කවර හෙයින? යත්: චුන්දයෙනි, මොනොවට කියන ලද මොනොවට දන්වන ලද, නෛර්යාණික වූ, කෙලෙස් නිවීම පිණිස පවත්නාවූ, සම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත වූ සස්නෙහි මෙය මෙසේ ම ය. එ හෙයිනි.

7. චුන්දයෙනි, මෙහි වූ කලි අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ශාස්තෘ ද ලොවැ උපන්නේ ය. ධර්මය ද ස්වාඛ්‍යාත ය, සුප්‍රවෙදිත ය, නෛර්යාණික ය, ක්ලෙශොපශමය පිණිස පවත්නේ ය, සම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත ය, ඔහු ගේ ශ්‍රාවකයෝ සද්ධර්මයෙහි අවබොධ කරවන ලද අර්ථ ඇත්තෝ නො වෙත් ද, හැම සැටියෙන් පිරිපුන් වූ සසුන් බඹසර ඔවුනට හෙළි කරන ලද්දේ ප්‍රකට කරන ලද්දේ සියලු ශාසනාර්ථයන් එකට කැටි කොට දක්වන ලද්දේ, සසර දුක් දුරුලීමෙහි ප්‍රයෝජනවත් සේ කොට දෙසන ලද්දේ, දෙව්ලොව පටන් කොට මිහිස්ලොව තෙක් සියලු තන්හි මොනොවට ප්‍රකාශ කරන ලද්දේ නො වේ ද, එ කල්හි ඔවුන්ගේ ශාස්තෘහුගේ පිරිනිවීම වේ ද, චුන්දයෙනි, මෙබඳු වූ ශාස්තෘ තෙමේ කලුරිය කෙළේ ශ්‍රාවකයනට අනුතාපකර (පසුතැවිල්ල ඇති කරනුයේ) වෙයි. ඒ කවර හෙයින? යත්: 'අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ අපගේ ශාස්තෘ තෙමේ ලොවැ පහළ විය, ධර්මය ස්වාඛ්‍යාත ද සුප්‍රවෙදිත ද නෛර්යාණික ද ක්ලෙශොපශමය පිණිස පවත්නේ ද, සම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත ද විය. එහෙත් අපි ඒ සද්ධර්මයෙහි අවබොධ නො කරවන ලද අර්ථ ඇත්තෝ වම්හ, කෙවලපරිපූර්ණ වූ ශාසන බ්‍රහ්මචර්යය අපට නො ම හෙළි කරන ලද්දේ වෙයි, නො ම ප්‍රකට කරන ලද්දේ වෙයි, සියලු ශාසනාර්ථයන් එකට කැටි කොට නො දක්වන ලද්දේ වෙයි. දුක් දුරු ලීමෙහි ප්‍රයෝජනවත් සේ කොට නො දෙසන ලද්දේ වෙයි, සියලු දෙව්මිනිසුන් අතුරෙහි මැනවින් ප්‍රකාශ කරන ලද්දේ නො වෙයි. එතෙකුදු වුවත් අපේ ශාස්තෘහු ගේ අන්තර්ධානය වී යැ'යි ඔවුනට පසුතැවිල්ල වෙයි. චුන්දයෙනි, මෙබඳු වූ ශාස්තෘ තෙමේ කලුරිය කළේ ශ්‍රාවකයනට පසුතැවිල්ල ඇති කරන්නේ වෙයි.

## සාවකානං අනානුතප්පා සත්ථුකාලකිරියා

8. ඉධ පන චුන්ද සත්ථා ච ලොකෙ උදපාදි අරහං සම්මාසම්බුද්ධො, ධම්මො ච ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො, විඤ්ඤාපිතත්ථා චස්ස හොන්ති සාවකා සද්ධම්මෙ කෙවලඤ්ච තෙසං පරිපූරං බ්‍රහ්මචරියං ආවිකතං හොති උත්තානීකතං සබ්බසඞ්ගාහපදකතං සප්පාටිහීරකතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං අථ තෙසං සත්ථුනො අන්තරධානං හොති එවරූපො ඛො චුන්ද සත්ථා සාවකානං කාලකතො අනානුතප්පො හොති. තං කිස්ස හෙතු? සත්ථා ච නො ලොකෙ උදපාදි අරහං සම්මාසම්බුද්ධො, ධම්මො ච ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො විඤ්ඤාපිතත්ථා චම්හා සද්ධම්මෙ, කෙවලඤ්ච නො පරිපූරං බ්‍රහ්මචරියං ආවිකතං හොති උත්තානීකතං සබ්බසඞ්ගාහපදකතං සප්පාටිහීරකතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං, අථ නො සත්ථුනො අන්තරධානං හොතී''ති. එවරූපො ඛො චුන්ද සත්ථා සාවකානං කාලකතො අනානුතප්පො හොති.

## බ්‍රහ්මචරියඅපරිපූරනාදි කථා

9. එතෙහි චෙ පි චුන්ද අඞ්ගෙහි සමන්නාගතං බ්‍රහ්මචරියං හොති, නො ච ඛො සත්ථා ච හොති ථෙරො රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො, එවං තං බ්‍රහ්මචරියං අපරිපූරං හොති තෙනඞ්ගෙන. යතො ච ඛො චුන්ද එතෙහි චෙ පි අඞ්ගෙහි සමන්නාගතං බ්‍රහ්මචරියං හොති සත්ථා ච හොති ථෙරො රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො, එවං තං බ්‍රහ්මචරියං පරිපූරං හොති තෙනඞ්ගෙන.

එතෙහි චෙ පි චුන්ද අඞ්ගෙහි සමන්නාගතං බ්‍රහ්මචරියං හොති, සත්ථා ච හොති ථෙරො රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො, නො ච ඛ්වස්ස ථෙරා භික්ඛූ සාවකා හොන්ති වියත්තා විනීතා විසාරදා පත්තයොගක්ඛෙමා, අලං සමක්ඛාතුං සද්ධම්මස්ස, අලං උප්පන්නං පරප්පවාදං සහ ධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙතුං, එවං තං බ්‍රහ්මචරියං අපරිපූරං හොති තෙනඞ්ගෙන.

8. චුන්දයෙනි, මෙහි වනාහි අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ශාස්තෘ තෙමෙ ලොවැ පහළ විය. නෛර්යාණික වූ, කෙලෙස් නිවීම පිණිස පවත්නාවූ ධර්මය ද මොනොවට වදරන ලද්දේ වෙයි. සම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත ද වෙයි. ඔහුගේ ශ්‍රාවකයෝ ද සද්ධර්මයෙහි අවබොධ කරවන ලද අර්ථ ඇත්තෝ වෙත්. ඔවුනට කෙවල පරිපූර්ණ ශාසන බ්‍රහ්මචර්යය ද හෙළි කරන ලද්දේ, ප්‍රකට කරන ලද්දේ, සියලු ශාසනාර්ථයන් එකට කැටි කොට දක්වන ලද්දේ, දුක් බැහැරලීමෙහි ප්‍රයෝජනවත් කොට දෙසන ලද්දේ, දෙව්මිනිසුන් තාක් මොනොවට ප්‍රකාශ කරණ ලද්දේ වෙයි. එකල්හි ඔවුන්ගේ ශාස්තෘහුගේ අන්තර්ධානය වෙයි. චුන්දයෙනි; මෙබඳු වූ ශාස්තෘ තෙමේ කලුරිය කළේ ශ්‍රාවකයනට අනුතාප කර නො වෙයි. ඒ කවර හෙයින ? 'අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ අපගේ ශාස්තෘ තෙම ලොව පහළ විය, නෛර්යාණික වූ කෙලෙස් නිවීම පිණිස පවත්නාවූ, ධර්මය ද මොනොවට වදරන ලද්දේ ද මොනොවට දන්වන ලද්දේ ද වෙයි, සම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත ද වෙයි. අපි ද ඒ සද්ධර්මයෙහි අවබොධ කරවන ලද අර්ථ ඇත්තමෝ වම්හ. අපට කෙවල පරිපූර්ණ වූ ශාසනබ්‍රහ්මචර්යය හෙළි කරන ලද්දේ, පෙහෙළි කරන ලද්දේ, වෙයි. ඒ ධර්මයන් සියලු ශාසනාර්ථ කැටි කොට දක්වන ලද්දේ, දුක් දුරලීමට ප්‍රයෝජනවත් සේ කොට දෙසන ලද්දේ, දෙව්මිනිසුන් තාක් සියලු දෙනා අතුරෙහි මොනොවට ප්‍රකාශ කරන ලද්දේ වෙයි. එ කල්හි අපගේ ශාස්තෘහුගේ අන්තර්ධානය වූයේ යැ' යි ඔහු දනිත්. එහෙයිනි. චුන්දයෙනි, මෙබඳු වූ ශාස්තෘ තෙමේ කලුරිය කළේ ශ්‍රාවකයනට අනුතාපකර නො වෙයි.

9. චුන්දයෙනි, ඉදින් සසුන් බඹසර මෙ අඞගවලින් සමන්විත වේ ද, එහෙත් ශාස්තෘ තෙමෙ ස්ථවිර නො වේ ද, චිරරාත්‍රඥ නො වේ ද, පැවිදි වූ බොහෝ කල් ඇත්තේ නො වේ ද, දික් කලක් ඉක්මියේ නො වේ ද, පැසිම් වයසට පැමිණියේ නො වේ ද, මෙසේ ඒ ශාසනබ්‍රහ්මචර්යය ඒ අඞගයෙන් අපරිපූර්ණ වේ (අඩු වේ). චුන්දයෙනි, යම් හෙයෙකින් ශාසනබ්‍රහ්මචර්යය මේ අඞගවලිනුත් සමන්විත වේ ද, ශාස්තෘ තෙමේත් ස්ථවිරත් රාත්‍රඥත්, පැවිදි වූ බොහෝ කල් ඇතියේත් දික් කලක් ඉක්මියේත් පැසිම් වයසට පැමිණියේත් වේ ද, මෙසේ ඒ බඹසර ඒ අඞගයෙන් පරිපූර්ණ වේ.

චුන්දයෙනි, සසුන් බඹසර මෙ අඞගවලින් පරිපූර්ණ වන්නේ නමුදු, ශාස්තෘ තෙමේත් ස්ථවිරත් රාත්‍රඥත් පැවිදි වූ බොහෝ කල් ඇතියේත් දික් කලක් ඉක්මියේත් පැසිම්වයසට පැමිණියේත් වේ ද, වැලිදු ඔහුට ව්‍යක්ත වූ විනීත වූ විසාරද වූ, රහත්බවට පැමිණියාවූ, සද්ධර්මය මොනොවට කියන්නට සමර්ථ වූ, උපන්නාවූ පරවාදය කරුණු සහිත ව මොනොවට නිගහා දුක් දුරලීම පිණිස ප්‍රයෝජනවත් වන සේ කොට දහම් දෙසන්නට සමර්ථ වූ, ස්ථවිර වූ, ශ්‍රාවක භික්ෂුහු නො වෙත් ද, මෙසේ මේ අඞගයෙන් ඒ සසුන් බඹසර අපරිපූර්ණ වෙයි.

10. යතො ච ඛො චුන්ද එතෙහි චෙහි පි අඞ්ගෙහි සමන්නාගතං බ්‍රහ්මචරියං හොති, සත්ථා ච හොති ථෙරො රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො, ථෙරා චස්ස භික්ඛූ සාවකා හොන්ති වියත්තා විනීතා විසාරදා පත්තයොගක්ඛෙමා, අලං සමක්ඛාතුං සද්ධම්මස්ස අලං උප්පන්නං පරප්පවාදං සහ ධම්මෙහි සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙතුං, එවං තං බ්‍රහ්මචරියං පරිපූරං හොති තෙනඞ්ගෙන.

එතෙහි චෙපි චුන්ද අඞ්ගෙහි සමන්නාගතං බ්‍රහ්මචරියං හොති, සත්ථා ච හොති ථෙරො රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො ථෙරා චස්ස භික්ඛූ සාවකා හොන්ති වියත්තා විනීතා විසාරදා –පෙ– අලං උප්පන්නං පරප්පවාදං සහ ධම්මෙහි සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙතුං, නො ච ඛ්වස්ස මජ්ඣිමා භික්ඛූ සාවකා හොන්ති, විනීතා –පෙ– මජ්ඣිමා චස්ස භික්ඛූ සාවකා හොන්ති –පෙ– නො ච ඛ්වස්ස නවා භික්ඛූ සාවකා හොන්ති වියත්තා –පෙ– නවා චස්ස භික්ඛූ සාවකා හොන්ති –පෙ– නො ච ඛ්වස්ස ථෙරා භික්ඛුනියො සාවිකා හොන්ති වියත්තා –පෙ– ථෙරා චස්ස භික්ඛුනියො සාවිකා හොන්ති –පෙ– නො ච ඛ්වස්ස මජ්ඣිමා භික්ඛුනියො සාවිකා හොන්ති වියත්තා –පෙ– මජ්ඣිමා චස්ස භික්ඛුනියො සාවිකා හොන්ති වියත්තා –පෙ– නො ච ඛ්වස්ස නවා භික්ඛුනියො සාවිකා හොන්ති –පෙ– නවා චස්ස භික්ඛුනියො සාවිකා හොන්ති වියත්තා –පෙ– නො ච ඛ්වස්ස උපාසකා සාවකා හොන්ති ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො වියත්තා –පෙ– උපාසකා චස්ස සාවකා හොන්ති ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො වියත්තා –පෙ– නො ච ඛ්වස්ස උපාසකා සාවකා හොන්ති ගිහී ඔදාතවසනා කාමභොගිනො වියත්තා –පෙ– උපාසකා චස්ස සාවකා හොන්ති ගිහී ඔදාතවසනා කාමභොගිනො වියත්තා –පෙ– නො ච ඛ්වස්ස උපාසිකා සාවිකා හොන්ති ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිනියො වියත්තා –පෙ– උපාසිකා චස්ස සාවිකා හොන්ති ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිනියො වියත්තා –පෙ– නො ච ඛ්වස්ස උපාසිකා සාවිකා හොන්ති ගිහිනියො ඔදාතවසනා කාමභොගිනියො වියත්තා –පෙ– උපාසිකා චස්ස සාවිකා හොන්ති ගිහිනියො ඔදාතවසනා කාමභොගිනියො වියත්තා –පෙ– නො ච ඛ්වස්ස බ්‍රහ්මචරියං හොති ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං –පෙ– බ්‍රහ්මචරියං චස්ස හොති ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං, නො ච ඛො ලාභග්ගයසග්ගප්පත්තං, එවං තං බ්‍රහ්මචරියං අපරිපූරං හොති තෙනඞ්ගෙන.

10. චුන්දයෙනි, යම් හෙයෙකින් සසුන් බඹසර මේ අඞ්ගවලින් සමන්විතත් වේ ද, ශාස්තෘ තෙමේත් ස්ථවිරත් රාත්‍රඥත් පැවිදි වූ බොහෝ කල් ඇතියේත් දික් කලක් ඉක්මියේත් පැසිම් වයසට පැමිණියේත් වේ ද, ඔහුට ව්‍යක්ත වූ විනීත වූ විසාරද වූ රහත් බවට පැමිණියා වූ සද්ධර්මය මොනොවට කියන්නට සමත් වූ, උපන් පරවාදය කරුණු සහිත ව මොනොවට නිගහා, දුක් දුරුලීම පිණිස ප්‍රයෝජනවත් වන සේ කොට දහම් දෙසන්නට සමත් වූ, ස්ථවිර වූ ශ්‍රාවක භික්ෂූහු වෙත් ද, මෙසේ ඒ සසුන් බඹසර මේ අඞ්ගයෙන් පරිපූර්ණ වෙයි.

චුන්දයෙනි, සසුන් බඹසර මේ අඞ්ගවලිනුත් සමන්විත වේ ද, ශාස්තෘ තෙමේත් ස්ථවිරත් රාත්‍රඥත් චිරප්‍රව්‍රජිතත් දික් කලක් ඉක්මියේත් පැසිම් වයසට පැමිණියේත් වේ ද, ඔහුට ව්‍යක්ත වූ විනීත වූ විසාරද වූ රහත් බවට පැමිණියා වූ, සද්ධර්මය මොනොවට කියන්නට සමත් වූ, උපන් පරප්‍රවාදය කරුණු සහිත ව මොනොවට නිගහා, දුක් දුරලනුවට ප්‍රයෝජනවත් සේ කොට දහම් දෙසන්නට සමත් වූ, ස්ථවිර වූ භික්ෂුශ්‍රාවකයෝ වෙත් ද, එහෙත් ඔහුට ව්‍යක්ත වූ... මැදුම් වයසෙහි සිටි භික්ෂුශ්‍රාවකයෝ නැත් ද, ව්‍යක්ත වූ...නවක භික්ෂුශ්‍රාවකයෝ නො වෙත් ද, ව්‍යක්ත වූ... ස්ථවිර වූ ශ්‍රාවිකා භික්ෂුණීහු නො වෙත් ද, ඔහුට ව්‍යක්ත වූ... ස්ථවිර වූ ශ්‍රාවිකා භික්ෂුණීහු වෙත් ද....එහෙත් ඔහුට ව්‍යක්ත වූ... මැදිම් වයස්හි සිටි ශ්‍රාවිකා භික්ෂුණීහු නො වෙත් ද,... ඉදින් ව්‍යක්ත වූ ...මැදුම් වයස්හි සිටි ශ්‍රාවිකා භික්ෂුණීහු වෙත් ද... එහෙත් ව්‍යක්ත වූ ... නවක භික්ෂුණී ශ්‍රාවිකාවෝ නො වෙත් ද,... ඉදින් ව්‍යක්ත වූ... නවක භික්ෂුණී ශ්‍රාවිකාවෝ වෙත් ද, ... එහෙත් ඔහුට ව්‍යක්ත වූ, සුදුවත් හදනා ගෘහී බ්‍රහ්මචාරී උපාසක ශ්‍රාවකයෝ නො වෙත් ද ... ඉදින් ඔහුට ව්‍යක්ත වූ සුදුවත් හදනා ගෘහී බ්‍රහ්මචාරී උපාසක ශ්‍රාවකයෝ වෙත් ද, ... එහෙත් ගෘහී වූ සුදුවත් හදනා කාමභොගි වූ ව්‍යක්ත උපාසක ශ්‍රාවකයෝ ඔහුට නො වෙත් ද, ... ඉදින් ගෘහී වූ සුදු වත් හදනා කාමභොගී වූ ව්‍යක්ත උපාසක ශ්‍රාවකයෝ ඔහුට වෙත් නමුදු සුදු වත් හදනා ගෘහස්ථ බ්‍රහ්මචාරිණී වූ ව්‍යක්ත උපාසිකා ශ්‍රාවිකාවෝ නො වෙත් ද, ... ඉදින් ඔහුට සුදු වත් හදනා ගෘහස්ථ බ්‍රහ්මචාරිණී වූ ව්‍යක්ත උපාසිකා ශ්‍රාවිකාවෝ වෙත් නුමුත් සුදුවත් හදනා ගෘහස්ථ වූ කාමභොගී වූ ව්‍යක්ත උපාසිකා ශ්‍රාවිකාවෝ නො වෙත් ද, ඒ හෙයින්... ඔහුගේ ශාසනබ්‍රහ්මචර්යය සමෘද්ධ ද, වෘද්ධිප්‍රාප්ත ද, පැතිරගියේ ද, බොහෝ දෙනා විසින් දන්නා ලද්දේ ද, පුළුල් වූයේ ද, නුවණැති සියලු දෙව් මිනිසුන් අතර මොනොවට ප්‍රකාශිත ද නො වෙයි....ඔහුගේ ශාසනබ්‍රහ්මචර්යය සමෘර්ධ ද වෘද්ධිප්‍රාප්ත ද පැතිරගියේ ද, බොහෝ දෙනා විසින් දන්නා ලද්දේ ද, පුළුල් වූයේ ද නුවණැති සියලු දෙව් මිනිසුන් අතර මොනොවට ප්‍රකාශිත ද වන්නේ නමුදු ලාභයෙන් යශසින් අගපත් නො වෙයි නම්, මෙසේ ඒ සස්න ඒ අඞ්ගයෙන් අපරිපූර්ණ වෙයි.

11. යතො ච ඛො චුන්ද එතෙහි චෙපි අඞ්ගෙහි සමන්නාගතං බ්‍රහ්මචරියං හොති සත්ථා ච හොති ථෙරො රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො, ථෙරා චස්ස භික්ඛූ සාවකා හොන්ති වියත්තා විනීතා විසාරදා -පෙ- අලං සප්පාටිහාරියං ධම්මං දෙසෙතුං, මජ්ඣිමා චස්ස භික්ඛූ සාවකා හොන්ති, නවා චස්ස භික්ඛූ සාවකා හොන්ති, ථෙරා චස්ස භික්ඛුනියො සාවිකා හොන්ති, මජ්ඣිමා චස්ස භික්ඛුනියො සාවිකා හොන්ති, නවා චස්ස භික්ඛුනියො සාවිකා හොන්ති, උපාසකා චස්ස සාවකා හොන්ති ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො උපාසකා චස්ස සාවකා හොන්ති ගිහී ඔදාතවසනා කාමභොගිනො. උපාසිකා චස්ස සාවිකා හොන්ති ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිනියො. උපාසිකා චස්ස සාවිකා හොන්ති ගිහිනියො ඔදාතවසනා කාමභොගිනියො, බ්‍රහ්මචරියං චස්ස හොති ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිතං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං ලාභග්ගප්පත්තඤ්ච යසග්ගප්පත්තඤ්ච, එවං තං බ්‍රහ්මචරියං පරිපූරං හොති තෙනඞ්ගෙන.

12. අහං ඛො පන චුන්ද එතරහි සත්ථා ලොකෙ උප්පන්නො අරහං සම්මාසම්බුද්ධො, ධම්මො ච ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො, විඤ්ඤාපිතත්ථා ච මෙ සාවකා සද්ධම්මෙ, කෙවලඤ්ච තෙසං පරිපූරං බ්‍රහ්මචරියං ආවිකතං උත්තානීකතං සබ්බසඞ්ගාහපදකතං සප්පාටිහීරකතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං. අහං ඛො පන චුන්ද එතරහි සත්ථා ථෙරො රත්තඤ්ඤූ චිරපබ්බජිතො. අද්ධගතො වයො අනුප්පත්තො. සන්ති ඛො පන මෙ චුන්ද එතරහි ථෙරා භික්ඛූ සාවකා වියත්තා විනීතා විසාරදා පත්තයොගක්ඛෙමා, අලං සමක්ඛාතුං සද්ධම්මස්ස, අලං උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙතුං. සන්ති ඛො පන මෙ චුන්ද එතරහි මජ්ඣිමා භික්ඛූ සාවකා, -පෙ- සන්ති ඛො පන මෙ චුන්ද එතරහි මජ්ඣිමා භික්ඛූ සාවකා -පෙ- සන්ති ඛො පන මෙ චුන්ද එතරහි නවා භික්ඛූ සාවකා -පෙ- සන්ති ඛො පන මෙ චුන්ද එතරහි ථෙරා භික්ඛුනියො සාවිකා -පෙ- සන්ති ඛො පන මෙ චුන්ද එතරහි මජ්ඣිමා භික්ඛුනියො සාවිකා -පෙ- සන්ති ඛො පන මෙ චුන්ද එතරහි නවා භික්ඛුනියො සාවිකා -පෙ- සන්ති ඛො පන මෙ චුන්ද එතරහි උපාසකා සාවකා ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො -පෙ- සන්ති ඛො පන මෙ චුන්ද එතරහි උපාසකා සාවකා ගිහී ඔදාතවසනා කාමභොගිනො -පෙ- සන්ති ඛො පන මෙ චුන්ද එතරහි උපාසිකා සාවිකා ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිනියො -පෙ- සන්ති ඛො පන මෙ චුන්ද එතරහි උපාසිකා සාවිකා ගිහිනියො ඔදාතවසනා කාමභොගිනියො.

11. චුන්දයෙනි, යම් හෙයකින් ශාසනය මේ අඞ්ගවලින් සමන්විත වේ ද, ශාස්තෘ තෙමේත් ස්ථවිර ද රාත්‍රඥ ද චිරප්‍රව්‍රජිත ද දික් කලක් ඉක්මියේ ද පැසිමි වයසට පැමිණියේ ද වේ නම් කෙලෙස්නසනුවට ප්‍රයෝජනවත් සේ දහම් දෙසන්නට සමත් ව්‍යක්ත වූ විනීත වූ විසාරද වූ ස්ථවිර භික්ෂු ශ්‍රාවකයෝත් ඔහුට වෙත් නම්, මැදුම් වයස්හි වූ ... භික්ෂු ශ්‍රාවකයෝත් ඔහුට වෙත් නම්, නවක භික්ෂුශ්‍රාවකයෝත් ඔහුට වෙත් නම්, ස්ථවිර වූ භික්ෂුණී ශ්‍රාවිකාවෝත් ඔහුට වෙත් නම්, මැදුම් වයස්හි වූ භික්ෂුණී ශ්‍රාවිකාවෝත් ඔහුට වෙත් නම්, නවක භික්ෂුණී ශ්‍රාවිකාවෝත් ඔහුට වෙත් නම්, සුදුවත් හඳනා ගෘහී බ්‍රහ්මචාරී උපාසක ශ්‍රාවකයෝත් ඔහුට වෙත් නම්, සුදු වත් හඳනා ගෘහී කාමභොගී උපාසක ශ්‍රාවකයෝත් ඔහුට වෙත් නම්, සුදු වත් හඳනා ගෘහස්ථබ්‍රහ්මචාරිණී උපාසිකා ශ්‍රාවිකාවෝත් ඔහුට වෙත් නම්, සුදුවත් හඳනා ගෘහස්ථ කාමභොගිනී උපාසිකා ශ්‍රාවිකාවෝත් ඔහුට වෙත් නම්, ඔහුගේ ඒ සස්න සමෘද්ධ ද වෘද්ධිප්‍රාප්ත ද පැතිරැගියේ ද, බොහෝ දෙනා විසින් දන්නා ලද්දේ ද, පුළුල් වූයේ ද, නුවණැති සියලු දෙව්මිනිසුන් අතරැ සුප්‍රකාශිත ද ලාභයෙන් අග්‍රප්‍රාප්ත ද යශසින් අග්‍රප්‍රාප්ත ද වේ. මෙසේ ඒ සස්න ඒ අඞ්ගයෙන් පරිපූර්ණ වේ.

12. චුන්දයෙනි, මම වූ කලි මෙ සමයෙහි පහළ වූ අර්හත් සම්‍යක්සම්බුද්ධයෙමි. ඒ සම්‍යක්සම්බුද්ධ වූ මා විසින් සුප්‍රවෙදිත වූ ධර්මය ද මොනොවට කියන ලද්දේ ය, මොනොවට දන්වන ලද්දේ ය, නෛර්යාණික ය, ක්ලෙශොපශමය පිණිස පවත්තේ ය. මගේ ශ්‍රාවකයෝ ද සද්ධර්මයෙහි අවබොධකරවන ලද අර්ථ ඇත්තෝ ය. ඔවුන්ගේ සියලු සඟුන් බඹසර පරිපූර්ණ ය, හෙළි කරන ලද්දේ ය, පෙහෙළි කරන ලද්දේ ය, සියලු ධර්මය කැටි කොට දක්වන ලද්දේ ය, දුක් දුරැලනුවට ප්‍රයෝජනවත් සේ දෙසන ලද්දේ ය, නුවණැති සියලු දෙවියන් මිනිසුන් අතරැ සුප්‍රකාශිත ය. චුන්දයෙනි, මම වූ කලි මෙ සමයෙහි ස්ථවිර වූ චිරරාත්‍රඥ වූ, පැවිදි වූ බොහෝ කල් ඇති, දික් කලක් ඉක්මැ ගිය, පැසිමි වයසට පැමිණි ශාස්තෘ වෙමි. චුන්දයෙනි, දැන් ව්‍යක්ත වූ විනීත වූ විසාරද වූ, රහත් බවට පැමිණි, දහම් කියන්නට සමත් වූ, උපන් පරප්‍රවාදය කරුණු දක්වා මොනොවට නිගහා, දුක් දුරැලීමට ප්‍රයෝජනවත් වන සේ දහම් දෙසන්නට සමත් වූ ස්ථවිර භික්ෂු වූ මගේ ශ්‍රාවකයෝ වෙත්. චුන්දයෙනි, දැන් ... මධ්‍යම වයස්ක භික්ෂු වූ මගේ ශ්‍රාවකයෝ වෙත්. දැන් ... නවක භික්ෂු වූ මගේ ශ්‍රාවකයෝ වෙත්. චුන්දයෙනි, දැන්...ස්ථවිර භික්ෂුණී වූ මගේ ශ්‍රාවිකාවෝ වෙත්.... මධ්‍යමවයස්ක භික්ෂුණී වූ මගේ ශ්‍රාවිකාවෝ වෙත්. නවක භික්ෂුණී වූ මගේ ශ්‍රාවිකාවෝ වෙත්, චුන්දයෙනි, දැන් ... සුදු වත් හඳනා බ්‍රහ්මචාරී වූ ගෘහස්ථ ශ්‍රාවකයෝ මට වෙත්. දැන් ... සුදු වත් හඳනා කාමභොගී වූ ගෘහස්ථ ශ්‍රාවකයෝ මට වෙත්. චුන්දයෙනි, දැන් ... සුදු වත් හඳනා බ්‍රහ්මචාරිණී වූ ගෘහස්ථ ශ්‍රාවිකාවෝ මට වෙත්. දැන් ... සුදු වත් හඳනා කාමභොගී වූ ගෘහස්ථ ශ්‍රාවිකාවෝ මට වෙත්.

එතරහි ඛො පන මෙ චුන්ද බ්‍රහ්මචරියං ඉද්ධං චෙව ඵීතඤ්ච විත්ථාරිතං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතං.

යාවතා ඛො චුන්ද එතරහි සත්ථාරො ලොකෙ උප්පන්නා, නාහං චුන්ද අඤ්ඤං එකසත්ථාරම්පි සමනුපස්සාමි එවං ලාභග්ගයසග්ගප්පත්තං යථරිවාහං. යාවතා ඛො පන චුන්ද එතරහි සංඝො වා ගණො වා ලොකෙ උප්පන්නො, නාහං චුන්ද අඤ්ඤං එකසඞ්ඝම්පි සමනුපස්සාමි එවං ලාභග්ගයසග්ගප්පත්තං යථරිවායං චුන්ද භික්ඛුසඞ්ඝො. යං ඛො තං චුන්ද සම්මා වදමානො වදෙය්‍ය සබ්බාකාරපරිපූරං අනූනං අනධිකං ස්වාක්ඛාතං කෙවලපරිපූරං බ්‍රහ්මචරියං සුප්පකාසිතන්ති, ඉදමෙව තං සම්මා වදමානො වදෙය්‍ය සබ්බාකාරසම්පන්නං -පෙ- සුප්පකාසිතන්ති.

13. උද්දකො සුදං[1] චුන්ද රාමපුත්තො එවං වාචං භාසති: පස්සං න පස්සතීති. කිඤ්ච පස්සං න පස්සතී? ති. ඛුරස්ස සාධු නිසිතස්ස තලමස්ස පස්සති, ධාරඤ්ච ඛො තස්ස න පස්සති. ඉදං වුච්චති චුන්ද පස්සං න පස්සති. යං ඛො පනෙතං චුන්ද උද්දකෙන රාමපුත්තෙන භාසිතං හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං ඛුරමෙව සන්ධාය, යඤ්චෙතං චුන්ද සම්මා වදමානො වදෙය්‍ය 'පස්සං න පස්සතී'ති, ඉදමෙවෙතං සම්මා වදමානො වදෙය්‍ය 'පස්සං න පස්සතී'ති.

කිඤ්ච පස්සං න පස්සතී?ති: එවං සබ්බාකාරසම්පන්නං සබ්බාකාරපරිපූරං අනූනං අනධිකං ස්වාක්ඛාතං කෙවලපරිපූරං බ්‍රහ්මචරියං සුප්පකාසිතන්ති, ඉති හෙතං පස්සති. ඉදමෙත්ථ අපකඩ්ඪෙය්‍ය, එවං තං පරිසුද්ධතරං අස්සාති, ඉති හෙතං න පස්සති. ඉදමෙත්ථ උපකඩ්ඪෙය්‍ය, එවං තං පරිසුද්ධතරං අස්සාති ඉති හෙතං න පස්සති. ඉදං වුච්චති පස්සං න පස්සතීති.

1. උදකො සුදං - මජ්ඣං.

චුන්දයෙනි, දැන් වනාහි මගේ සස්න සමෘද්ධ ද වෘද්ධිප්‍රාප්ත ද, පැතිර ගියේ ද බොහෝ දෙනා විසින් දන්නා ලද්දේ ද, පුළුල් වූයේ ද, නුවණැති දෙව්මිනිසුන් අතර ප්‍රකාශිත ද වෙයි.

චුන්දයෙනි, මෙ සමයෙහි යම් පමණ දෙනෙක් ශාස්තෘහු ලොවැ පහළ වූහු ද, මා සේ ලාභයෙන් යශසින් අග පත් අන් එක ද ශාස්තෘවරයකු මම් නො දකිමි. චුන්දයෙනි, මෙ සමයෙහි යම් පමණ සඟ පිරිසෙක් හෝ ගණමුළුවෙක් ලොවැ පහළ වී ද, මෙ භික්ෂුසඞසයා සේ ලාභයෙන් යශසින් අග පත් අන් එක ද සඟ පිරිසක් මම් නො දකිමි. චුන්දයෙනි, සියලු කාරණයෙන් සැපැයුණු, සියලු කාරණයෙන් පිරිපුන්, අඩු ද වැඩි ද නො වූ, මොනොවට කියන ලද, සියල්ලෙන් පිරිපුන්, මොනොවට ප්‍රකාශිත වූ ශාසන බ්‍රහ්මචර්යයැ යි යමක් ඇරැබැ මොනොවට කියන තැනැත්තේ කියන්නේ ද, හෙ තෙමේ මෙ සස්න ඇරැබැ ම සියලු කාරණයෙන් සැපැයුණු ... මොනොවට ප්‍රකාශිත වූ බ්‍රහ්මචර්යයැ යි මොනොවට කියනුයේ කියන්නේ ය.

13. චුන්දයෙනි, රාම පුත්‍ර උද්‍රක තෙමේ 'දක්නේ නො දකි' යැ යි මෙසේ වූ වචනයක් කියයි. කුමක් දක්නේ නො දකි ද? යත්: මොනොවට මුවහත් කරන ලද ඒ කරකැත්තෙක තලය හේ දකී. එහෙත් එහි මුනාත වූ කලී හේ නො දකී. චුන්දයෙනි, දක්නේ නො දකි යි යනු මේ යැ යි කියනු ලැබෙ. චුන්දයෙනි, රාමපුත්‍ර උද්‍රකයා විසින් ම මේ හීන වූ ග්‍රාම්‍ය වූ පුහුදුනනට ම සුදුසු වූ ආර්ය නොවූ, ආශ්‍රිත නොවූ යම් වචනයෙක් කියන ලද ද, එහෙත් 'දක්නේ නො දකී' යැ යි මොනොවට කියන තැනැත්තේ යමක් සඳහා කියන්නේ නම්, 'දක්නේ නො දකී' යැ යි මෙ සස්න සඳහා ම කියන්නේ ය.

කුමක් දක්නේ නො දකි ද? යත්: මෙසේ මේ සසුන් බඹසර සියලු කරුණින් සැපැයුණේ ය, සියලු කරුණින් සපිරුණේ ය. අඩුත් නැත, වැඩිත් නැත. මොනොවට දෙසන ලද්දේ ය, සියලු අංගයෙන් පරිපූර්ණ ය. මනා කොට පවසන ලද්දේ යැ' යි මෙසේ ම හේ මෙ සස්න දකී. මෙහි මෙනම් කොටස බැහැර කරන්නේ ය (බැහැර කළ යුතුය). මෙසේ එය වඩා පිරිසිදු වෙතැ යි මෙසේ හේ නො ම දකී. මෙහි (මෙ සස්නට) මෙ නම් කොටසක් පිටතින් ඇද ගන්නේ ය (ඇද ගත යුතුය). මෙසේ එය වඩා පිරිසිදු වන්නේ යැ යි මෙසේ මෙය හේ නො ම දකී. මෙය 'දක්නේ නො දකී' යැ යි කියනු ලැබෙ.

යං ඛො තං චුන්ද සම්මා වදමානො වදෙය්‍ය "සබ්බාකාරසම්පන්නං -පෙ- බ්‍රහ්මචරියං සුප්පකාසිතන්ති" ඉදමෙව තං සම්මා වදමානො වදෙය්‍ය සබ්බාකාරසම්පන්නං සබ්බාකාරපරිපූරං අනූනං අනධිකං ස්වාක්ඛාතං කෙවලපරිපූරං බ්‍රහ්මචරියං සුප්පකාසිතන්ති.

## සඞ්ගායිතබ්බා ධම්මා

14. තස්මාතිහ චුන්ද යෙ වො මයා ධම්මා අභිඤ්ඤා දෙසිතා, තත්ථ සබ්බෙහෙව සඞ්ගම්ම සමාගම්ම අත්ථෙන අත්ථං බ්‍යඤ්ජනෙන බ්‍යඤ්ජනං සඞ්ගායිතබ්බං න විවදිතබ්බං. යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං. තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමෙ ච වො චුන්ද ධම්මා මයා අභිඤ්ඤා දෙසිතා යත්ථ සබ්බෙහෙව සඞ්ගම්ම සමාගම්ම අත්ථෙන අත්ථං බ්‍යඤ්ජනෙන බ්‍යඤ්ජනං සඞ්ගායිතබ්බං න විවදිතබ්බං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං, තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාද, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො. ඉමෙ ඛො තෙ චුන්ද ධම්මා මයා අභිඤ්ඤා දෙසිතා, යත්ථ සබ්බෙහෙව සඞ්ගම්ම සමාගම්ම අත්ථෙන අත්ථං බ්‍යඤ්ජනෙන බ්‍යඤ්ජනං සඞ්ගායිතබ්බං, න විවදිතබ්බං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං, තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

## සඤ්ඤාපෙතබ්බ විධි

15. තෙසං ච වො චුන්ද සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං සික්ඛිතබ්බං. අඤ්ඤතරො සබ්‍රහ්මචාරී සංඝෙ ධම්මං භාසෙය්‍ය, තත්‍ර චෙ තුම්හාකං එවමස්ස "අයං ඛො ආයස්මා අත්ථඤ්චෙව මිච්ඡා ගණ්හාති, බ්‍යඤ්ජනානි ච මිච්ඡා රොපෙතී"ති, තස්ස නෙව අභිනන්දිතබ්බං, නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා සො එවමස්ස වචනීයො "ඉමස්ස නු ඛො ආවුසො අත්ථස්ස ඉමානි වා බ්‍යඤ්ජනානි එතානි වා බ්‍යඤ්ජනානි කතමානි ඕපායිකතරානි ඉමෙසං වා බ්‍යඤ්ජනානං අයං වා අත්ථො එසො වා අත්ථො, කතමො ඕපායිකතරො? ති."

මොනොවට කියන තැනැත්තේ 'සියලු අයුරින් සැපැයුණු ... සසුන් බඹසර මොනොවට පැවැසිණැ'යි යමක් ඇරැබැ කියන්නේ නම්, එසේ කියන තැනැත්තේ 'සියලු අයුරින් සැපැයුණු, සියලු අයුරින් පිරිපුන්, අඩුත් නොවූ වැඩිත් නොවූ මොනොවට වදරන ලද, හැම ලෙසින් පිරිපුන්, බඹසර මොනොවට පවසන ලද යි මෙ සසුන්බඹසර ඇරැබැ ම එය කියන්නේ ය (කිය යුතු ය.)

14. චුන්දයෙනි, එ හෙයින් මෙහි මා විසින් වෙසෙසි නුවණින් දැන තොපට යම් දහම් දෙසන ලද ද, එහි තොප සියලු දෙනා විසින් ම, යම්සේ මෙ සසුන් බඹසර දික් කලක් පැවැති යැ හැකි වන්නේ ද බොහෝ කලක් සිටි යැ හැකි වන්නේ ද, එසේ එක් වැ එක්රැස් වැ අර්ථයෙන් අර්ථය ද ව්‍යංජනයෙන් ව්‍යංජනය ද සසඳනුවන් ව සැහැයිය යුතු ය. එය බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව්මිනිස්නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වන්නේ ය. ඒ දහම්හු නම්: සතර සතිපට්ඨානයෝ ය, සතර සම්‍යක්ප්‍රධානයෝ ය, සතර සෘද්ධිපාදයෝ ය, පඤ්ච ඉන්ද්‍රියයෝ ය, පඤ්ච බල ය, සප්ත බොධ්‍යඞ්ගයෝ ය, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය යන මොහු ය. චුන්දයෙනි, සියලු දෙනා විසින් ම එක් වැ එක්රැස් වැ යමෙක අරුතින් අරුතද අකුරින් අකුර ද සසඳනුවන් ව, යම්සේ මෙ බඹසර දික්කලක් පැවැති යැ හැකි වන්නේ ද, බොහෝ කලක් සිටියැ හැකි වන්නේ ද, එසේ සැහැයියැ යුතු ද, විවාද නො කළ යුතු ද ඒ මාවිසින් වෙසෙසි නුවණින් දැන දෙසන ලද මෙ දහම්හු ය. එසේ එය සංගායනා කිරීම බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව්මිනිස්නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වන්නේ ය.

15. චුන්දයෙනි, සමග වූ සතුටු වන්නා වූ විවාද නො කරන්නා වූ ඒ තොප විසින් මෙසේ හික්මි යැ යුතු (උගත යුතු): එක්තරා සබරම්සැරියෙක් සඞසයා කෙරෙහි දහම් දෙසන්නේ නම්, එහි තොපට 'මේ ආයුෂ්මත්හු වූකලි අර්ථය ද වරදවා ගනී, ව්‍යඤ්ජන ද වරදවා නංවා යැ'යි මෙසේ සිතෙක් වන්නේ නම්, ඔහුගේ වචනය නො ම පිළිගත යුතු, නො ද පිළිකෙවු කළ යුතු. නො පිළිගෙන, නො ද පිළිකෙවු කොට, "ඇවැත්නි, මේ අර්ථයට මොහු ව්‍යඤ්ජනයෝ ද නැත හොත් තුලු ව්‍යඤ්ජනයෝ ද? කවර ව්‍යඤ්ජන කෙනෙක් වඩා යෝග්‍ය ද? මේ ව්‍යඤ්ජනයන් ගේ අර්ථය මෙය ද? නැත හොත් එය ද? කවර අර්ථයෙක් වඩා යොග්‍ය වේ ද?"යි හෙ තෙමේ මෙසේ විචාළ යුතු වන්නේ ය.

සො චෙ එවං වදෙය්‍ය "ඉමස්ස ඛො ආවුසො අත්ථස්ස ඉමානෙව බ්‍යඤ්ජනානි ඔපායිකතරානි යානෙව එතානී' ඉමෙසං බ්‍යඤ්ජනානං, අයමෙව අත්ථො ඔපායිකතරො යානෙව එසො'ති, සො නෙව උස්සාදෙතබ්බො න අපසාදෙතබ්බො. අනුස්සාදෙත්වා අනපසාදෙත්වා ස්වෙව ච සාධුකං සඤ්ඤාපෙතබ්බො, තස්ස ච අත්ථස්ස තෙසං ච බ්‍යඤ්ජනානං නිසන්තියා.

අපරො පි චෙ චුන්ද සබ්‍රහ්මචාරී සඞ්ඝෙ ධම්මං භාසෙය්‍ය, තත්‍ර චෙ තුම්හාකං එවමස්ස "අයං ඛො ආයස්මා අත්ථං හි ඛො මිච්ඡා ගණ්හාති, බ්‍යඤ්ජනානි සම්මා රොපෙතී"ති, තස්ස නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා සො එවමස්ස වචනීයො "ඉමෙසං නු ඛො ආවුසො බ්‍යඤ්ජනානං අයං වා අත්ථො එසො වා අත්ථො, කතමො ඔපායිකතරො?"ති, සො චෙ එවං වදෙය්‍ය "ඉමෙසං ඛො ආවුසො බ්‍යඤ්ජනානං අයමෙව අත්ථො ඔපායිකතරො, යො චෙව එසො"ති, සො නෙව උස්සාදෙතබ්බො න අපසාදෙතබ්බො. අනුස්සාදෙත්වා අනපසාදෙත්වා ස්වෙව සාධුකං සඤ්ඤාපෙතබ්බො තස්සෙව අත්ථස්ස නිසන්තියා.

අපරො පන චුන්ද සබ්‍රහ්මචාරී සඞ්ඝෙ ධම්මං භාසෙය්‍ය, තත්‍ර චෙ තුම්හාකං එවමස්ස "අයං ඛො ආයස්මා අත්ථං හි ඛො සම්මා ගණ්හාති, බ්‍යඤ්ජනානි මිච්ඡා රොපෙතී"ති, තස්ස නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා, සො එවමස්ස වචනීයො "ඉමස්ස නු ඛො ආවුසො අත්ථස්ස ඉමානෙව බ්‍යඤ්ජනානි එතානි වා බ්‍යඤ්ජනානි, කතමානි ඔපායිකතරානී?"ති. සො චෙ එවං වදෙය්‍ය "ඉමස්ස නු ඛො ආවුසො අත්ථස්ස ඉමානෙව බ්‍යඤ්ජනානි ඔපායිකතරා ච යානි චෙව එතානීති,[1] සො නෙව උස්සාදෙතබ්බො න අපසාදෙතබ්බො. අනුස්සාදෙත්වා අනපසාදෙත්වා ස්වෙව සාධුකං සඤ්ඤාපෙතබ්බො තෙසඤ්ඤෙව බ්‍යඤ්ජනානං නිසන්තියා.

අපරො පි චෙ චුන්ද සබ්‍රහ්මචාරී සඞ්ඝෙ ධම්මං භාසෙය්‍ය, තත්‍ර චෙ තුම්හාකං එවමස්ස "අයං ඛො ආයස්මා අත්ථඤ්චෙව සම්මා ගණ්හාති, බ්‍යඤ්ජනානි ච සම්මා රොපෙතී"ති, තස්ස 'සාධූ'ති භාසිතං අභිනන්දිතබ්බං අනුමොදිතබ්බං. තස්ස 'සාධූ'ති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා සො එවමස්ස වචනීයො "ලාභා නො ආවුසො සුලද්ධං නො ආවුසො, යෙ මයං ආයස්මන්තං තාදිසං බ්‍රහ්මචාරිං පස්සාම එවං අත්ථුපෙතං බ්‍යඤ්ජනුපෙතන්ති."

1. යාචෙව එතානි – සිමු

ඉදින් හේ ඇවැත්නි, මේ අර්ථයට මේ ව්‍යඤ්ජන ම වඩා සුදුසු ය. මේ ව්‍යඤ්ජනයනට මා විසින් කියන ලද මේ යම් අර්ථ කෙනෙක් ඇද්ද, මේ අර්ථ ම වඩා සුදුසු ය. යම් තෙල අර්ථයෙක් ඇද්ද, එය නො ම හුවා දක්විය යුතු, නො ද බැහැර කළ යුතු. නො මහුවා දක්වා, නො ම බැහැර කොට, 'ඒ අර්ථය ද ඒ ව්‍යඤ්ජනයන් ද සලකා බලනු පිණිස හේ ම මොනොවට දන්වියැ යුතු.

චුන්දයෙනි, අන් සබ්‍රම්සැරියෙකුත්, සඞසයා කෙරෙහි දහම් කියන්නේ නම්, 'මේ ආයුෂ්මත් තෙම අර්ථය වරදවා ගනී, ව්‍යඤ්ජනයන් මොනොවට නංවා' යැ යි එහි තොපට මෙසේ සිතෙක් වන්නේ නම්, ඔහුගේ වචන නො ම පිළිගත යුතු නො ද පිළිකෙවු කළ යුතු. සතුටු ද නො වී, නො ද පිළිකෙවු කොට, 'ඇවැත්නි, මේ ව්‍යඤ්ජනයන් ගේ මේ අර්ථය ද? නැත හොත් තෙල අර්ථය ද? මෙයින් කවර එකෙක් වඩා යෝග්‍ය ද?'යි මෙසේ හේ කියැ යුතු ය. ඉදින් 'ඇවැත්නි, මේ ව්‍යංජනයන් ගේ (ශබ්දයන්ගේ) යම් තෙල අරුතෙක් වේ ද, ඒ මේ අරුත ම වඩා යොග්‍ය යැ' යි හෙ තෙමෙ මෙසේ කියන්නේ නම්, හේ නො ම හුවා දක්විය යුතු, නො ද හෙලා දක්ක යුතු. නො ම හුවා දක්වා, නො ද හෙලා දක, එහි අරුත් සලකා බලනු පිණිස හේ ම මොනොවට දන්වියැ යුතු.

චුන්දයෙනි, අන් සබ්‍රම්සැරියෙක් සඞසයා කෙරෙහි දහම් කියන්නේ නම්, 'මේ ආයුෂ්මත්හු අර්ථය චූකලි මොනොවට ගනිත්, ව්‍යඤ්ජනයන් වරදවා නංවති'යි තොපට මෙසේ සිතෙක් වන්නේ නම් ඔහු ගේ වචනයට නො ම සතුටු වියැ යුතු, එය නො ද පිළිකෙවු කළ යුතු. එයට නො ම සතුටු ව, නො ද පිළිකෙවු කොට, 'ඇවැත්නි, මේ අර්ථයා ගේ (මේ අර්ථය පවසන) ව්‍යඤ්ජනයෝ මොහු ම ද? නැත හොත් තුලුහු ද? කවර ව්‍යඤ්ජන කෙනෙක් වඩා යෝග්‍ය ද? යි හේ මෙසේ කියැ යුතු (ඔහුගෙන් මෙසේ ප්‍රශ්න කළ යුතු.) ඉදින් හෙ තෙමේ "ඇවැත්නි, (මා කී) යම් තෙල ව්‍යඤ්ජන කෙනෙක් වෙත් ද, මේ අර්ථයට ඒ ව්‍යඤ්ජනයෝ ම වඩා යොග්‍ය වෙත්' යැ යි මෙසේ කියන්නේ නම්, හේ නො ම හුවා කියැ යුතු නො ද හෙලා කියැ යුතු. හුවා නො කියා, හෙලා ද නො කියා, ඒ ව්‍යඤ්ජනයන් ම සලකා බලනු පිණිස හේ ම මොනොවට දන්වියැ යුතු.

චුන්දයෙනි, අන් සබ්‍රම්සැරියෙක් ද සඞසයා කෙරෙහි දහම් කියන්නේ නම්, ඉදින් එහි ලා 'මේ ආයුෂ්මත්හු වනාහි අර්ථය ද මොනොවට ගනී, ව්‍යඤ්ජනයන් ද මොනොවට නංවා යැ යි තොපට මෙසේ සිතෙක් වන්නේ නම්, 'මැනැවැ'යි ඔහුගේ වචනයට සතුටු වියැ යුතු, අනුමෙවියැ යුතු. ඔහුගේ වචනයට 'මැනැවැ යි සතුටු වැ, අනුමෙවැ 'ඇවැත්නි, යම්බඳු වූ අපි මෙසේ අරුත් දන්නා, ව්‍යංජන දන්නා ආයුෂමත් වූ ඔබ වැනි සබ්‍රම්සරක්හු දක්නමෝ ද, ඇවැත්නි ඒ අපට ලාභයෝ ය, අ වැතනි, ඒ අප විසින් (අත්බව) මොනොවට ලදුයෙ යැ'යි හේ මෙසේ කියැ යුතු වන්නේ ය.

## පච්චයානුඤ්ඤාතකාරණං

16. න වො අහං චුන්ද දිට්ඨධම්මිකානංයෙව ආසවානං සංවරාය ධම්මං දෙසෙමි, න පනාහං චුන්ද සම්පරායිකානංයෙව ආසවානං පටිඝාතාය ධම්මං දෙසෙමි. දිට්ඨධම්මිකානඤ්චෙවාහං චුන්ද ආසවානං සංවරාය ධම්මං දෙසෙමි සම්පරායිකානඤ්ච ආසවානං පටිඝාතාය. තස්මාතිහ චුන්ද යං වො මයා චීවරං අනුඤ්ඤාතං, අලං වො තං යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතපසරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව හිරිකොපීනපටිච්ඡාදනත්ථං. යො වො මයා පිණ්ඩපාතො අනුඤ්ඤාතො, අලං වො සො යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය.

ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. යං වො මයා සෙනාසනං අනුඤ්ඤාතං, අලං වො තං යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදෙව උතුපරිස්සයවිනොදනං පටිසල්ලානාරාමත්ථං.

යො වො මයා ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරො අනුඤ්ඤාතො, අලං වො සො යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣපරමතාය ති.

## සුඛල්ලිකානුයොගා

17. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති, යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං "සුඛල්ලිකානුයොගමනුයුත්තා සමණා සක්‍යපුත්තියා විහරන්තී"ති. එවං වාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා "කතමො සො ආවුසො සුඛල්ලිකානුයොගො? සුඛල්ලිකානුයොගා හි බහූ අනෙකවිහිතා නානප්පකාරකා"ති.

16. චුන්දයිනි, මෙ ලොවැ (ප්‍රත්‍යය පර්යෙෂණ ප්‍රත්‍යය පරිභොග හේතුයෙන්) උපදනා කාමාස්‍රවාදි ආස්‍රව හැවුරුම පිණිස පමණක් තොපට දහම් නො දෙසමි. චුන්දයෙනි, (කලහ හේතුයෙන් උපදනා) පරලොවැ දී දුක් විපාක දෙන ආස්‍රවයන් නැසීම පිණිස පමණක් දහම් නො දෙසමි. චුන්දයෙනි, තොපට මෙලොවැ උපදනා ආස්‍රව-යන්ගේ සංවරය පිණිස ද, පරලොවැ විපාක දෙන ආස්‍රවයන්ගේ විනාශය පිණිස ද තොපට දහම් දෙසමි. චුන්දයෙනි, එහෙයින් මෙහි මා විසින් තොපට යම් සිවුරෙක් අනුදන්නා ලද ද, එය යම්තාක් ම ශීතය නැසීම පිණිස උෂ්ණම නැසීම පිණිස, ඇටලේ මැස්සන් මදුරුවන් සර්පයන් අවු සුළං යන මොවුන්ගේ ස්පර්ශය වැළැක්වීම පිණිස, හිරි කොවන අඞ්ග වසාලනු පිණිස සමත් ම වෙයි. තොපට මා විසින් යම් පිණ්ඩපාතයෙක් අනුදන්නා ලද්දේ ද, එය යම්තාක් ම මෙ රූපකය සිටුනා පිණිස, "මෙසේ පැරැණි බඩගිනි වෙදනාව නසන්නෙමි, අළුත් බඩගිනි වෙදනාවක් නො උපදවන්නෙමි, මෙයින් මගේ ජීවිත යාත්‍රාව ද වන්නේ ය, නිවරද බව ද පහසු විහරණය ද වන්නේ යැ'' යි යැපෙනු පිණිස වෙහෙසින් වළකිනු පිණිස, බඹසරට අනුග්‍රහ පිණිස සමත් ම වෙයි.

මා විසින් තොපට යම් සෙනසෙනෙක් අනුදන්නා ලද ද, එය යම්තාක් ම ශීත නසනු පිණිස, උෂ්ණය නසනු පිණිස ඇට මැසි මදුරු අවු සුළං සර්ප යන මොවුන්ගේ ස්පර්ශය වළක්වනු පිණිස ඍතුවිපර්යාසයෙන් වන උවදුරු දුරැලීම පිණිස, චිත්තවිවෙකයෙහි ඇලෙනු පිණිස සෑහෙයි.

මා විසින් තොපට යම් බෙහෙත් පිරිකරෙක් අනුදන්නා ලද ද, එය තොපට උපදනා යම්තාක් රෝගවේදනා වැළැක්ම පිණිස, ව්‍යාබාධ නැති බව (නිදුක් බව) පරම කොට ඇති බව පිණිස සෑහෙයි.

17. චුන්දයෙනි, ශ්‍රමණශාක්‍යපුත්‍රියයෝ සුඛල්ලිකානුයොගයෙහි (සුව සෙවිනුයෙහි) ඇලී වෙසෙත් යැ' යි අන්තොටු පිරිවැජ්ජෝ මෙසේ කියන්නාහු ය' යන මේ කාරණයෙක් ඇත. චුන්දයෙනි, මෙසේ කියන අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, ඒ කවර සුඛල්ලිකානුයොගයෙක් ද? (සුව සෙවිනුයෙහි ඇලීමෙක් ද?) සුඛල්ලි-කානුයෝගයෝ (සුව සෙවිනුයෙහි ඇලීම්) වූ කලි බොහෝ හ, නොයෙක් වැදැරුම් හ, නන් අයුරු හ'' යි මෙසේ කියැ යුතු වන්නාහ. (අන්තොටු පිරිවැජ්ජනට මෙසේ කියැ යුතු)

චත්තාරො'මෙ චුන්ද සුඛල්ලිකානුයොගා හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති. කතමෙ චත්තාරො? ඉධ චුන්ද එකච්චො බාලො පාණෙ වධිත්වා වධිත්වා අත්තානං සුඛෙති පීණෙති. අයං පඨමො සුඛල්ලිකානුයොගො. පුන ච පරං චුන්ද ඉධෙකච්චො අදින්නං ආදියිත්වා ආදියිත්වා අත්තානං සුඛෙති පීණෙති. අයං දුතියො සුඛල්ලිකානුයොගො. පුන ච පරං චුන්ද ඉධෙකච්චො මුසා භණිත්වා භණිත්වා අත්තානං සුඛෙති පීණෙති. අයං තතියො සුඛල්ලිකානුයොගො. පුන ච පරං චුන්ද ඉධෙකච්චො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගිභූතො පරිචාරෙති, අයං චතුත්ථො සුඛල්ලිකානුයොගො. ඉමෙ ඛො චුන්ද චත්තාරො සුඛල්ලිකානුයොගා හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති.

18. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති, යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං 'ඉමෙ චත්තාරො සුඛල්ලිකානුයොගෙ අනුයුත්තා සමණා සක්‍යපුත්තියා''ති. තෙ වො 'මා හෙවන්තිස්සු වචනීයා. න තෙ සම්මා වදමානා වදෙය්‍යුං අබ්භාචික්ඛෙය්‍යුං අසතා අභූතෙන.

චත්තාරො'මෙ චුන්ද සුඛල්ලිකානුයොගා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. කතමෙ චත්තාරො? ඉධ චුන්ද භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. අයං පඨමො සුඛල්ලිකානුයොගො. පුන ච පරං චුන්ද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං දුතියො සුඛල්ලිකානුයොගො.

චුන්දයෙනි, හීන වූ ග්‍රාම්‍ය වූ, පෘථග්ජනයන් අයත් වූ අනාර්ය වූ අවැඩ ඇසුරු කළාවූ සුඛල්ලිකානුයෝගයෝ (සුව සෙවීනුයෙහි ඇලීම්) සතරෙකි, ඔහු සසර කලකිරෙනු පිණිස, නොඇල්ම පිණිස, කෙලෙස් නසනු පිණිස, කෙලෙස් සංසිඳෙනු පිණිස, විශිෂ්ටඥනය පිණිස, සම්බොධිය පිණිස, නිවන් පිණිස නො පවතිත්. කවර සතර දෙනෙක් ද? යත්: චුන්දයෙනි, මෙහි එක්තරා අනුවණයෙක් පණිවා කොට කොට තමා සුව පත් කෙරෙයි, තමා පිණවයි. මේ පළමු වන කාමසුඛල්ලිකානුයොගය යි. තව ද චුන්දයෙනි, මෙහි එක්තරා අනුවණයෙක් අයිනාදන් කොට කොට තමා සුව පත් කෙරෙයි, තමා පිණවයි. මේ දෙවෙනි සුඛල්ලිකානුයොගය යි. තව ද චුන්දයෙනි, මෙහි එක්තරා අනුවණයෙක් මුසවා බැණ බැණ තමා සුව පත් කෙරෙයි, තමා පිණවයි. මේ තෙවෙනි සුඛල්ලිකානුයොගය යි. තව ද චුන්දයෙනි, මෙහි එක්තරා අනුවණයෙක් පස්කම් ගුණයෙන් සමර්පිත වැ යුක්ත වැ ඉඳුරන් හසුරුවයි. මේ සිවු වන සුඛල්ලිකානුයොගය යි. චුන්දයෙනි, සතර සුඛල්ලිකානුයොගයෝ හී නහ, ග්‍රාම්‍ය හ, පුහුදුනන් අයත් හ, අනාර්ය හ, අනර්ථනිඃශ්‍රිත හ, සසර කලකිරෙනු පිණිස නො පවත්නාහ, විරාගය පිණිස නො පවත්නාහ, නිරොධය පිණිස නො පවත්නාහ, කෙලෙස් සංසිඳීම පිණිස නො පවත්නාහ, විශිෂ්ටඥනය පිණිස නො පවත්නාහ, සම්බොධිය පිණිස නො පවත්නාහ, නිවන පිණිස නො පවත්නාහ.

18. චුන්දයෙනි, 'ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ මේ සතර කාමසුඛල්ලිකානුයන්හි යෙදුණෝ ව වෙසෙත් යැ' යි මෙසේ අන් තොටු පිරිවැජ්ජෝ කියන්නාහ යන මේ කාරණය වූකලි ඇත. (එසේ කියන) ඔහු 'එසේ නො කියවු' යැ යි කියැ යුතු වන්නාහ. ඔහු තොපට මොනොවට නිවැරැදි ලෙස නො කියන්නෝ ම එසේ කියන්නාහ. නැති දූයින් නොවූ දූයින් දෙස් කියන්නාහ.

චුන්දයෙනි, මේ සුඛල්ලිකානුයොගයෝ සතර දෙනෙකි. ඔහු එකාන්ත යෙන් සසර කලකිරෙනු පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, ක්ලෙශොපශමය පිණිස, විශිෂ්ටඥනය පිණිස, සම්බොධිය පිණිස, නිර්වාණය පිණිස පවත්නාහ. කවර සතර දෙනෙක් ද? යත්: චුන්දයෙනි, මෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන් ව ම, අකුසල් දහමුන්ගෙන් වෙන් ව ම, විතර්ක සහිත, විචාර සහිත, විවේකයෙන් උපන්, ප්‍රීතිය හා සුවය හා ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ පළමු වන සුඛල්ලිකානුයෝගය යි. තව ද චුන්දයෙනි, මෙහි මහණ තෙමෙ විතර්ක විචාරයන් සංසිඳීමෙන්, තමා තුළ පැහැදීම ඇති කරන, සිත එකඟබව ඇති, විතර්කරහිත විචාරරහිත සමාධියෙන් උපන්, ප්‍රීතිය හා සැපය හා ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ දෙවෙනි සුඛල්ලිකානුයෝගය යි.

පුන ච පරං චුන්ද භික්ඛු පීතියා ච විරාගා -පෙ- තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං තතියො සුඛල්ලිකානුයොගො. පුන ච පරං චුන්ද භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථො සුඛල්ලිකානුයොගො. ඉමෙ ඛො චුන්ද චත්තාරො සුඛල්ලිකානුයොගෙ එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

18. ඨානං. ඛො පනෙතං චුන්ද විජ්ජති, යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං "ඉමෙ චත්තාරො සුඛල්ලිකානුයොගා අනුයුත්තා සමණා සක්‍යපුත්තියා විහරන්ති"ති. තෙ වො එවං ති'ස්සු වචනීයා සම්මා තෙ වො වදමානා වදෙය්‍යුං, න තෙ වො අබ්භාචික්ඛෙය්‍යුං අසතා අභූතෙන.

## සුඛල්ලිකානුයොගානිසංසා

ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති, යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං 'ඉමෙ පන ආවුසො චත්තාරො සුඛල්ලිකානුයොගෙ අනුයුත්තානං විහරතං කති ඵලානි කතානිසංසා පාටිකඞ්ඛා?''ති. එවංවාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා "ඉමෙ ඛො ආවුසො චත්තාරො සුඛල්ලිකානුයොගෙ අනුයුත්තානං විහරතං චත්තාරි ඵලානි චත්තාරො ආනිසංසා පාටිකඞ්ඛා, කතමෙ චත්තාරො? ඉධාවුසො භික්ඛු තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො. ඉදං පඨමං ඵලං පඨමො ආනිසංසො. පුන ච පරං ආවුසො භික්ඛු තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. ඉදං දුතියං ඵලං දුතියො ආනිසංසො. පුන ච පරං ආවුසො භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා'ති. ඉදං තතියං ඵලං තතියො ආනිසංසො. පුන ච පරං ආවුසො භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉදං චතුත්ථං ඵලං චතුත්ථො ආනිසංසො. ඉමෙ ඛො ආවුසො චත්තාරො සුඛල්ලිකානුයොගෙ අනුයුත්තානං විහරතං ඉමානි චත්තාරි ඵලානි චත්තාරො ආනිසංසා පාටිකඞ්ඛා''ති.

චුන්දයෙනි, තව ද මහණ තෙමෙ ප්‍රීතිය ද පහ වීමෙන් ... ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ තෙවෙනි සුඛල්ලිකානුයොගය යි. චුන්දයෙනි, තව ද මහණ තෙමෙ සුඛවෙදනාව ද පහ කිරීමෙන් ... චතුර්ථ ධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ සිවුවැනි සුඛල්ලිකානුයෝගය යි. චුන්දයෙනි, මේ සතර සුඛල්ලිකානුයොගයෝ ඒකාන්තයෙන් සසර කලකිරෙනු පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, ක්ලේශොපශමය පිණිස, විශිෂ්ටඥානය පිණිස, සම්බෝධිය පිණිස, නිර්වාණය පිණිස පවතිත්.

18. චුන්දයෙනි, 'ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ මේ සතර සුඛල්ලිකානුයන්හි යෙදී වෙසෙත්' යැ යි අන්තොවු පිරිවැජ්ජෝ කියන්නාහ යන මේ කාරණය ඇත. 'එසේ යැ' යි ඔහු කියැ යුත්තාහ (ඔවුනට පිළිතුරු දියැ යුතු.) ඔහු මොනොවට කියන්නාහු. නැති දූයින් නොවූ දූයින් තොපට දෙස් නො කියන්නාහ.

චුන්දයෙනි, 'ඇවැත්නි, මේ සතර සුඛල්ලිකානුයොගයන්හි යෙදී වසනවුන් විසින් ඵල කීයෙක්, අනුසස් කීයෙක් කැමැති වියැ යුතු ද'? යි අන්තොවු පිරිවැජ්ජෝ මෙසේ පුළුවුස්නාහ' යන මේ කාරණය වූ කලි ඇත. චුන්දයෙනි, මෙසේ පුළුවුස්නා අන්තොවු පිරිවැජියෝ මෙසේ කිය යුතු (අන් තොවුපිරිවැජියනට මෙසේ පිළිතුරු දියැ යුතු:) "ඇවැත්නි, මේ සතර කාමසුඛල්ලිකානුයොගයන්හි යෙදී වසන්නවුන් විසින් සතර ඵල කෙනෙක් සතර ආනිසංස කෙනෙක් කැමැති වියැ යුතු හ. කවර සතර දෙනෙක් ද? යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමෙ තුන් සංයෝජනයන් ක්ෂය කිරීමෙන් අපායට නොවැටෙන සුලු, ධර්මනියමයෙන් නියත වූ, උපරිමාර්ගත්‍රයය පරායණය කොටැති (අවශ්‍යයෙන් පැමිණියැ යුතු) සෝවාන් පුග්ගලෙක් වෙයි. මේ පළමු වන ඵලය යැ, පළමු වන අනුසස යැ. ඇවැත්නි, තව ද මහණ තෙමෙ තුන් සංයොජනයන්ගේ පරික්ෂයයෙන්, රාග ද්වෙෂ මොහයන් තුනී වීමෙන් සෙදගැමි වෙයි, එක් වරක් ම මේ කාම ලෝකයට අවුත් දුක් කෙළවර කෙරෙයි. මේ දෙවෙනි ඵලය යි, දෙවෙනි අනුසස යි. ඇවැත්නි, තව ද, මහණ තෙමෙ අවර භාගික සංයොජන පස ක්ෂය වීමෙන් ශුද්ධාවාස බඹලොවෙහි උපදනෝ, එහි පිරිනිවෙන සුලු වූයේ, ඒ ලොවින් මෙහි පෙරළා නොඑන සුලු වෙයි. මේ තෙවෙනි ඵලය යැ, තෙවෙනි අනුසස යැ. තවද ඇවැත්නි, මහණ තෙමෙ ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් ආස්‍රවරහිත වූ ඵලසමාධියත් ඵලඥානයත් මෙ අත්බවෙහි ම තෙමේ වෙසෙසි නුවණින් දැන පසක් කොට, එයට පැමිණ වෙසෙයි. මේ සතර වන ඵලය යැ, සතර වන අනුසස යැ. ඇවැත්නි, සතර සුඛල්ලිකානුයොගයන්හි යෙදී වසනවුන් විසින් මේ සතර ඵල, සතර අනුසස් කැමැති වියැ යුතු යැ යි, (ඒ අන්-තොවු පිරිවැජියනට) කියැ යුතු.

## ඛීණාසවානං අභබ්බට්ඨානානි

19. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති, යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං "අට්ඨිතධම්මා සමණා සක්‍යපුත්තියා විහරන්ති"ති. එවංවාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සාවකානං ධම්මා දෙසිතා පඤ්ඤත්තා යාවජීවං අනතික්කමනීයා. සෙය්‍යථාපි ආවුසො ඉන්දඛීලො වා අයොඛීලො වා ගම්භීරනෙමො සුනිඛාතො අචලො අසම්පවෙධී, එවමෙව ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සාවකානං ධම්මා දෙසිතා පඤ්ඤත්තා යාවජීවං අනතික්කමනීයා. යො සො ආවුසො භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො අභබ්බො සො නව ඨානානි අජ්ඣාචරිතුං: අභබ්බො ආවුසො ඛීණාසවො භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතුං. අභබ්බො ඛීණාසවො භික්ඛු අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සම්පජානමුසා භාසිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සන්නිධිකාරකං කාමෙ පරිභුඤ්ජිතුං, සෙය්‍යථාපි පුබ්බෙ අගාරිකභූතො. අභබ්බො ඛීණාසවො භික්ඛු ඡන්දගතිං ගන්තුං, අභබ්බො ඛීණාසවො භික්ඛු දොසාගතිං ගන්තුං, අභබ්බො ඛීණාසවො භික්ඛු මොහාගතිං ගන්තුං, අභබ්බො ඛීණසවො භික්ඛු භයාගතිං ගන්තුං. යො සො ආවුසො භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, අභබ්බො සො ඉමානි නව ඨානානි අජ්ඣාචරිතු"න්ති.

## පඤ්හබ්‍යාකරණානි

20. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං "අතීතං ඛො අද්ධානං අරබ්භ සමණො ගොතමො අතීරකං[1] ඤාණදස්සනං පඤ්ඤපෙති, නො ච ඛො අනාගතං අද්ධානං අරබ්භ අතීරකං ඤාණදස්සනං පඤ්ඤපෙති. තයිදං කිංසු, තයිදං කථංසූ?"ති.

1. අතිරෙකං - සීමු

19. චුන්දයෙනි, 'මේ ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයන් ස්ථිර ස්වභාවයක් නැති වැ වෙසෙතැ'යි අන්තොටු පිරිවැජියෝ මෙසේ කියන්නාහ යන මේ කාරණය විද්‍යමාන ය. චුන්දයෙනි, මෙසේ කියන සුලු අන්තොටු පිරිවැජියෝ මෙසේ කියැ යුත්තාහ (අන්තොටු පිරිවැජියනට මෙසේ උත්තර දියැ යුතු): ඇවැත්නි, දන්නා දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සව්වනට දෙසන ලද පනවන ලද දිවිහිම්යෙන් නො ඉක්මියැයුතු දහම්හු ඇත්හ. පොළොවැ ගැඹුරට පිවිසී, බිමැ මොනොවට සිටුවන ලද, නො සැලෙන, කම්පිත නො වන ඉන්ද්‍රකීල යෙක් හෝ අයස්කීලයෙක් යම්සේ ද, ඇවැත්නි, එසේ ම දන්නා දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භගවත්හු විසින් දිවිහිම්යෙන් නොඉක්මියැ යුතු ධර්මයෝ දෙසන ලද හ, පනවන ලද හ. ඇවැත්නි, ක්ෂීණ ආස්‍රව ඇති, වැස නිමැවූ මහබඹසර ඇති සිවුමඟින් කොට නිමැවූ කෘත්‍ය ඇති, බහා තුබූ කෙලෙස් බර ඇති, පැමිණි ස්වාර්ථය (රහත්බව) ඇති, හැම අයුරින් නැසූ භවබන්ධන ඇති, මනානුවණින් දන මිදුණු යම් රහත් මහණෙක් වේ ද, හේ නව තැනක් ඉක්මැ හැසිරෙන්නට නො හැකි වෙයි: ඇවැත්නි, රහත් මහණ තෙමෙ දන සතක්හු දිවියෙන් තොර කරන්නට නො හැකි වෙයි, රහත් මහණ තෙමෙ නොදුන් දයක් සොර සිතින් ගන්නට නො හැකි වෙයි, රහත් මහණ තෙමෙ මෙවුන්දම් සෙවිනුවට නො හැකි වෙයි. රහත් මහණ තෙමෙ දන මුසාබස් කියන්නට නො හැකි වෙයි. රහත් මහණ තෙමෙ, පෙර ගිහි වැ සිටියේ යම්සේ ද එසේ, කාමයන් රැස් කොට ගෙන පරිභොග කරන්නට නො හැකි වෙයි; රහත් මහණ තෙමෙ ඡන්දයෙන් අගතියට යන්නට නො හැකි වෙයි, රහත් මහණ තෙමෙ වෙෂයෙන් අගතියට යන්නට නො හැකි වෙයි, රහත් මහණ තෙමෙ මොහ-යෙන් අගතියට යන්නට නො හැකි වෙයි, රහත් මහණ තෙමෙ බියෙන් අගතියට යන්නට නො හැකි වෙයි, ඇවැත්නි, කළ ආසුව ඇති, වැස නිමැවූ මහබඹසර ඇති, සතර මඟින් කොටැ නිමැවූ කෘත්‍ය ඇති, බහා තුබූ කෙලෙස් බර ඇති, පැමිණි ස්වාර්ථය (රහත් බව) ඇති, සියලු අයුරින් නැසූ භවබන්ධන ඇති, මොනොවට නුවණින් දනැ මිදුණු යම් රහත් මහණෙක් වේ ද, හෙ තෙමෙ මේ නව තැන් ඉක්මැ හැසිරෙන්නට නො හැකි වේ යැ යි (ඔවුනට) කියැ යුතු.

20. චුන්දයෙනි, 'මහණ ගොයුම් තෙමෙ ඉකුත් කල ඇරැබැ අසීම වූ ඥානදර්ශනය පනවයි, එහෙත් අනා කල ඇරැබැ අසීම වූ ඥානදර්ශනය නො පනවයි, එය (ඒ අනාගතඥානදර්ශනය නොපැණ වීම) කිමෙක් ද? ඒ කවර හෙයින් දැ?'යි අන්තොටු පිරිවැජියෝ මෙසේ කියන්නාහ' යන මේ කාරණය ඇත.

තෙ ච අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අඤ්ඤවිහිතකෙන ඤාණදස්සනෙන අඤ්ඤවිහිතකං ඤාණදස්සනං පඤ්ඤපෙතබ්බං මඤ්ඤන්ති, යථරිව බාලා අබ්‍යත්තා. අතීතං ඛො චුන්ද අද්ධානං ආරබ්භ තථාගතස්ස සතානුසාරි ඤාණං හොති. සො යාවතකං ආකඞ්ඛති තාවතකං අනුස්සරති. අනාගතඤ්ච ඛො අද්ධානං ආරබ්භ තථාගතස්ස බොධිජං ඤාණං උප්පජ්ජති 'අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො'ති. අතීතඤ්චෙපි ඛො චුන්ද හොති අභූතං අතච්ඡං අනත්ථසංහිතං, න තං තථාගතො බ්‍යාකරොති. අතීතඤ්චෙපි චුන්ද හොති භූතං තච්ඡං අනත්ථසංහිතං, තම්පි තථාගතො න බ්‍යාකරොති. අතීතඤ්චෙපි චුන්ද හොති භූතං තච්ඡං අත්ථසංහිතං, තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්ස පඤ්හස්ස වෙය්‍යාකරණාය. අනාගතං චෙපි චුන්ද හොති අභූතං අතච්ඡං අනත්ථසංහිතං -පෙ- පච්චුප්පන්නං චෙපි චුන්ද හොති අභූතං අතච්ඡං අනත්ථසංහිතං න තං තථාගතො බ්‍යාකරොති. පච්චුප්පන්නඤ්චෙපි චුන්ද හොති භූතං තච්ඡං අනත්ථසංහිතං තම්පි තථාගතො න බ්‍යාකරොති. පච්චුප්පන්නඤ්චෙපි චුන්ද හොති භූතං තච්ඡං අත්ථසංහිතං, තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්ස පඤ්හස්ස වෙය්‍යාකරණාය.

21. ඉති ඛො චුන්ද අතීතානාගතපච්චුප්පන්නෙසු ධම්මෙසු තථාගතො කාලවාදී[1] භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී. තස්මා 'තථාගතො'ති වුච්චති. යඤ්ච ඛො චුන්ද සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, සබ්බං තථාගතෙන අභිසම්බුද්ධං. තස්මා 'තථාගතො'ති වුච්චති. යඤ්ච චුන්ද රත්තිං තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං අනුපාදිසෙසාය නිබ්බාන-ධාතුයා පරිනිබ්බාති, යං එතස්මිං අන්තරෙ භාසති ලපති නිද්දිසති, සබ්බං තං තථෙව හොති නො අඤ්ඤථා. තස්මා 'තථාගතො'ති වුච්චති. යථාවාදී චුන්ද තථාගතො තථාකාරී, යථාකාරී තථාවාදී ඉති යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී, තස්මා 'තථාගතො'ති වුච්චති. සදෙවකෙ ලොකෙ චුන්ද සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව-මනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී. තස්මා 'තථාගතො'ති වුච්චති.

1. කාලවාදි සච්චවාදි-ස්‍යා.

ඒ අන්‍යතොටු පිරිවැජියෝ වූකලි අව්‍යක්ත අන්ධබාලයන් සේ අනෙකක් ඇරබැ පැවැති ඥානදර්ශනයෙකින් අනෙකක් ඇරබැ පවත්නා ඥානදර්ශනයක් පැනැවියැ යුතු කොට හඟිත්. චුන්දයෙනි, තථාගතයාහට ඉකුත් කල ඇරබැ සත්‍යානුසාරි නුවණ (පෙරවුසු අත්බව සිහි කරන) නුවණ වෙයි. හෙ තෙමෙ (එයින්) යම් පමණ කැමැති වේ ද, එපමණ සිහි කෙරෙයි. අනා කල් ඇරබැ වූ කලි තථාගතයාහට 'මේ කෙළවර ඉපැත්ම ය, දන් මෙයින් මත්තෙහි භවයෙක් නැතැ'යි බොධිජ ඥානය උපදී. චුන්දයෙනි, ඉකුත් කාල පිළිබඳ වූව ද යමෙක් අභූත ද අසත්‍ය ද, අනර්ථ නිඃශ්‍රිත ද එය තථාගත තෙමෙ නො පවසයි. ඉකුත් කල පිළිබඳ වූ ද යමෙක් භූත ද සත්‍ය ද එහෙත් අනර්ථනිඃශ්‍රිත ද, එයත් තථාගත තෙමේ නො පවසයි. ඉකුත්කල පිළිබඳ වූ ද යමෙක් භූත ද, සත්‍ය ද අර්ථ නිඃශ්‍රිත ද, ඒ පැනය විසැඳීමෙහි තථාගත තෙමේ කාලඥ වෙයි. චුන්දයෙනි, අනාකල් පිළිබඳ වූ ද යමෙක් අභූත ද අසත්‍ය ද අනර්ථ නිඃශ්‍රිත ද,... වත්මන් කල පිළිබඳ වූ ද යමෙක් අභූත ද අසත්‍ය ද අනර්ථනිඃශ්‍රිත ද, එය තථාගත තෙමේ නො පවසයි. චුන්දයෙනි, වත්මන් කල පිළිබඳ වූ ද යමෙක් භූත ද සත්‍ය ද එහෙත් අනර්ථනිඃශ්‍රිත ද, එයත් තථාගත තෙමෙ නො පවසයි. වත්මන් කල පිළිබඳ වූව ද යමෙක් භූත ද සත්‍ය ද අර්ථනිඃශ්‍රිත ද, ඒ පැනය විසැඳීමෙහි තථාගත තෙමේ කියැ යුතු කල් දන්නේ වෙයි.

21. චුන්දයෙනි, මෙසේ අතීත අනාගත වර්තමාන ධර්මයන්හි තථාගත තෙමේ කල් දනා කියන සුලු ද, වූ දයක් ම කියන සුලු ද, වැඩක් ම කියන සුලු ද, දහමක් ම කියන සුලු ද, විනය ම කියන සුලු ද වෙයි. එ හෙයින් තථාගත යැ යි කියනු ලැබේ. චුන්දයෙනි, දෙවියන් සහිත මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොවැස්සා විසින්, දෙව් මිනිසුන් සහිත, මහණබමුණන් සහිත සත්වප්‍රජාව විසින් යමෙක් දක්ක යුතු ද, ඇසිය යුතු ද, යමෙක් යමෙක් ආඝ්‍රාණයත් ආස්වාදනයත් ස්පර්ශනයත් කළ යුතු ද, දන්නා ලද ද, ප්‍රාප්ත ද (ලබන ලද ද), පිරියෙස්නා ලද ද, සිතින් කල්පනා කරන ලද ද, ඒ සියල්ල තථාගතයන් විසින් වෙසෙසින් අවබෝධ කරන ලද්දේ ය. එහෙයින් තථාගත යැ යි කියනු ලැබේ. චුන්දයෙනි, යම් රැයෙක තථාගත තෙමෙ නිරුත්තර සම්‍යක්සම්බොධිය අවබොධ කෙරෙයි ද, යම් රැයෙක අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙයි ද, මේ දැතුරෙහි හෙ තෙමෙ යමක් කියා ද, පවසා ද, දක්වා ද, ඒ සියල්ල ඒ කී පරිදි ම වේ, අන් සැටියෙකින් නො වේ. එහෙයින් 'තථාගත'යැ යි කියනු ලැබේ. චුන්දයෙනි, තථාගත තෙමෙ යම් සේ කියන සුලු ද, එසේ ම කරන සුලු ය, යම්සේ කරන සුලු ද, එසේ ම කියන සුලු ය. මෙසේ තථාගත තෙමේ යථාවාදී තථාකාරී ද යථාකාරී තථාවාදී ද වේ. එහෙයින් 'තථාගත' යැ යි කියනු ලැබේ. චුන්දයෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත, ලොවෙහි, මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්වප්‍රජායෙහි තථාගත තෙමෙ මෙරමා මැඩලනුයේ ය, මෙරමා විසින් නොමැඩලන ලද්දේ ය, සියල්ල දක්නේ ය, මෙරමා සිය වශයෙහි පවත්වන්නේ ය. එ හෙයින් 'තථාගත' යැ යි කියනු ලැබේ.

## අබ්‍යාකතවත්ථූනි

22. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති, යං' අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං "කින්නු ඛො ආවුසො හොති තථාගතො පරම්මරණා? ඉදමෙව සච්චං, මොසමඤ්ඤන්ති? එවංවාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා "අබ්‍යාකතං ඛො ආවුසො භගවතා: හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොසමඤ්ඤන්ති." ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති, යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං කිං පනාවුසො න හොති තථාගතො පරම්මරණා. ඉදමෙව සච්චං, මොසමඤ්ඤන්ති?" එවං වාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා "එවම්පි ඛො ආවුසො භගවතා අබ්‍යාකතං; න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොසමඤ්ඤන්ති'. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති, යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං"කිං පනාවුසො හොති ච න හොති ච තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොසමඤ්ඤන්ති." එවංවාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: "අබ්‍යාකතං ඛො පනෙතං ආවුසො භගවතා හොති ච න හොති ච තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොසමඤ්ඤන්ති".

ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං 'කිම්පනාවුසො නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොස මඤ්ඤන්ති. එවංවාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා "එවම්පි ඛො ආවුසො භගවතා අබ්‍යාකතං: නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොසමඤ්ඤන්ති". ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති යං. අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "කස්මා පනෙතං ආවුසො සමණෙන ගොතමෙන අබ්‍යාකතන්ති?" එවං වාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: "නහෙතං ආවුසො අත්ථසංහිතං න ධම්මසංහිතං න ආදිබ්‍රහ්මචරියකං න නිබ්බිදය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. තස්මා තං භගවතා අබ්‍යාකතන්ති."

22. චුන්දයෙනි, "ඇවැත්නි, කිමෙක් ද? තථාගත තෙමේ මරනින් මත්තෙහි වන්නේ ද? මෙය ම සත්‍යත් අන් සියල්ල මොසත් (අසාරත්) වේ ද? යි අන්තොටු පිරිවැජියෝ කියන්නාහුය" යන මෙ කරුණ ඇත. චුන්දයෙනි, මෙසේ කියන අන්තොටු පිරිවැජ්ජෝ "ඇවැත්නි, තථාගත තෙමෙ මරණින් මත්තෙහි වන්නේ ද? මෙය ම සත්‍යත් අන් සියල්ලමොසත් වේ ද? යි භගවත්හු විසින් මෙය නො කියන ලදැ" යි මෙසේ කියැ යුතු හ. "ඇවැත්නි, කිමෙක් ද? තථාගත තෙමේ මරණින් මත්තෙහි නො වන්නේ ද? මෙය ම සත්‍ය ද? සෙස්ස හිස් ද?'යි අන්තොටු පිරිවැජ්ජෝ මෙසේ කියන්නාහ" යන මේ කාරණය ඇත. එසේ කියන අන්තොටු පිරිවැජ්ජෝ ඇවැත්නි, තථාගත තෙමේ මරණින් මත්තෙහි නො වන්නේ ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ' යි මෙසේත් භගවත්හු විසින් නො කියන ලදැ'යි මෙසේ කියැ යුතු වන්නාහ.

"කිමෙක් ද? ඇවැත්නි තථාගත තෙමේ මරණින් මත්තෙහි වන්නේත් නොවන්නේත් වේ ද? මෙය ම සත්‍ය ද? සෙස්ස හිස් දැ?' යි අන්තොටු පිරිවැජ්ජෝ මෙසේ අසන්නාහුය" යන මේ කාරණය ඇත. චුන්දයෙනි, මෙසේ කියන අන්තොටු පිරිවැජ්ජෝ ඇවැත්නි, තථාගත තෙමේ මරණින් මත්තෙහි වන්නේත් වේ නොවන්නේත් වේ යැ යි භගවත්හු විසින් නො කියන ලදැ" යි මෙසේ කියැ යුතු වන්නාහ. චුන්දයෙනි, "ඇවැත්නි, කිමෙක් ද? තථාගත තෙමේ මරණින් මත්තෙහි නො ම වන්නේත් නො ම නොවන්නේත් වේ ද? මෙය ම සත්‍ය ද? සෙස්ස හිස් දැ?'යි අන්තොටු පිරිවැජියෝ මෙසේ කියන්නාහ" යන මේ කාරණය වනාහි ඇත. චුන්දයෙනි, මෙසේ කියත් අන්තොටු පිරිවැජ්ජෝ, 'ඇවැත්නි තථාගත තෙමේ මරණින් මත්තෙහි නො ම වන්නේත් නො ම නොවන්නේත් වේ යැ යි මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ යි මෙසේ ද භගවත්හු විසින් නො පවසන ලදැ" යි මෙසේ කියැ යුතු වන්නාහ. චුන්දයෙනි, "ඇවැත්නි, මහණ ගොයුම්හු විසින් මෙය කවර හෙයින් අප්‍රකාශිත දැ'යි අන්තොටු පිරිවැජ්ජෝ මෙසේ කියන්නාහ" යන මේ කාරණය ඇත. චුන්දයෙනි, මෙසේ කියන අන්තොටු පිරිවැජියෝ, "ඇවැත්නි, මෙය අර්ථනිඃශ්‍රිත ද නො වේ, ධර්මනිඃශ්‍රිත ද නො වේ. මාර්ගබ්‍රහ්මචර්යාවට මුල් ද නො වේ. සසර කලකිරෙනු පිණිස, නො පවතී, විරාගය පිණිස නො පවතී, නිරොධය පිණිස නො පවතී, ක්ලෙශොපශමය පිණිස නො පවතී, විශිෂ්ට ඥානය පිණිස නො පවතී, සම්බොධිය පිණිස නො පවතී නිර්වාණය පිණිස නො පවතී. එ හෙයින් එය භගවත්හු විසින් නො පවසන ලදැ"යි මෙසේ කියැ යුතු වන්නාහ.

### බ්‍යාකතඨානානි

23. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං "කිං පනාවුසො සමණෙන ගොතමෙන බ්‍යාකතන්ති?" එවං වාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: "ඉදං දුක්ඛන්ති ඛො ආවුසො භගවතා බ්‍යාකතං. අයං දුක්ඛසමුදයො'ති ඛො අවුසො භගවතා බ්‍යාකතං, අයං දුක්ඛනිරොධො'ති ඛො ආවුසො භගවතා බ්‍යාකතං, අයං දුක්ඛනිරොධගාමිනී පටිපද'ති ඛො ආවුසො භගවතා බ්‍යාකතන්ති".

24. ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං "කස්මා පනෙතං ආවුසො සමණෙන ගොතමෙන බ්‍යාකතන්ති? එවං වාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: "එතඤ්හි ආවුසො අත්ථසංහිතං, එතං ධම්මසංහිතං, එතං ආදිබ්‍රහ්මචරියකං, එකන්තනිබ්බිදය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. තස්මා තං භගවතා බ්‍යාකතන්ති."

### පුබ්බන්තසහගතා දිට්ඨිනිස්සයා

යෙ පි තෙ චුන්ද පුබ්බන්තසහගතා දිට්ඨිනිස්සයා, තෙපි වො මයා බ්‍යාකතා යථා තෙ බ්‍යාකාතබ්බා. යථා ච තෙ න බ්‍යාකාතබ්බා කිං වො අහං තෙ තත්ථ බ්‍යාකරිස්සාමි? යෙ පි තෙ චුන්ද අපරන්තසහගතා දිට්ඨිනිස්සයා, තෙ පි වො මයා බ්‍යාකතා, යථා තෙ බ්‍යාකාතබ්බා. යථා ච තෙ න බ්‍යාකාතබ්බා කිං වො අහං තෙ තත්ථ බ්‍යාකරිස්සාමි.

25. කතමෙ ච තෙ චුන්ද පුබ්බන්තසහගතා දිට්ඨිනිස්සයා යෙ වො මයා බ්‍යාකතා යථා තෙ බ්‍යාකාතබ්බා? සන්ති ඛො චුන්ද එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'සස්සතො අත්තා ච ලොකො ච' ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. සන්ති පන චුන්ද එකෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: 'අසස්සතො අත්තා ච ලොකො ච, සස්සතො ච අසස්සතො ච අත්තා ච ලොකො ච, නෙව සස්සතො නාසස්සතො අත්තා ච ලොකො ච, සයංකතො අත්තා ච ලොකො ච, පරකතො අත්තා ච ලොකො ච, සයං කතො ච පර කතො ච අත්තා ච ලොකො ච, අසයංකාරො අපරකාරො අධිච්චසමුප්පන්නො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති. සස්සතං සුඛදුක්ඛං, අසස්සතං සුඛදුක්ඛං, සස්සතඤ්ච අසස්සතඤ්ච සුඛදුක්ඛං, නෙව සස්සතං නාසස්සතං සුඛදුක්ඛං, සයංකතං සුඛදුක්ඛං, පරංකතං සුඛදුක්ඛං, සයං කතඤ්ච පරං කතඤ්ච සුඛදුක්ඛං, අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං. ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති".

23. චුන්දයෙනි, "ඇවැත්නි, මහණ ගොයුම්හු විසින් කිමෙක් නම් පවසන ලද ද?'යි අන්තොටු පිරිවැජියෝ මෙසේ අසන්නාහ" යන මේ කාරණය වනාහි ඇත. චුන්දයෙනි, මෙසේ කියන අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, මේ දුකැ යි ම භගවත්හු විසින් පවසන ලදි, මේ දුක් උපදනා හේතුව යැ යි ම භගවත්හු විසින් පවසන ලදී. මේ දුක් වැනැස්ම යැ යි ම භගවත්හු විසින් පවසන ලදි, මේ දුක් වැනැස්මට යන පිළිවෙතැ යි ම භගවත්හු විසින් පවසන ලදැ"යි මෙසේ කියැ යුතු වන්නාහ.

24. චුන්දයෙනි, "ඇවැත්නි, කවර හෙයින් මෙය මහණ ගොයුම්හු විසින් පවසන ලද ද?'යි අන්තොටු පිරිවැජියෝ මෙසේ පුළුවුස්නාහ" යන මෙ කරුණ ඇත. චුන්දයෙනි, එසේ පුළුවුස්නා අන්තොටු පිරිවැජියෝ මෙසේ කියැ යුතු: "ඇවැත්නි, මෙය අර්ථනිඃශ්‍රිත ය, මෙය ධර්මනිඃශ්‍රිත ය, මෙය මාර්ගබ්‍රහ්මචර්යාවට මුල ය. මෙය එකාන්තයෙන් සසර කලකිරෙනු පිණිස පවතී, විරාගය පිණිස නිරෝධය පිණිස ක්ලෙශොප ශමය පිණිස විශිෂ්ට ඥානය පිණිස, සම්බෝධිය පිණිස, නිවන පිණිස පවතී. එහෙයින් එය භගවත්හු විසින් පවසන ලදැ' යි (කියැ යුතු.)

චුන්දයෙනි, පූර්වාන්තය (පෙර පැවැති ස්කන්ධ කොටස) පිළිබඳ වූ යම් දෘෂ්ටි කෙනෙක් ඇද්ද, ඔහු ද ඔවුන් පැවැසියැ යුතු පරිදි මා විසින් ප්‍රකාශිත හ. ඔහු යම්සේ නො පැවැසියැ යුතු නම් කිම? මම එහි තොපට එය පවසන්නෙම් ද? චුන්දයෙනි, අපරාන්තසහගත (මතු ස්කන්ධ කොටස පිළිබඳ වූ) යම් දෘෂ්ටි කෙනෙක් ඇද්ද ඔවුන් හෙළි කළ යුතු පරිද්දෙන් ඔහු ද මා විසින් ප්‍රකාශිත හ. යම් හැටියෙකින් ඔහු හෙළි නො කළ යුතු නම්, කිම? එහි මම ඔවුන් තොපට හෙළි කරන්නෙම් ද?

25. චුන්දයෙනි, පැවැසියැ යුතු පරිද්දෙන් මා විසින් තොපට හෙළි කරන ලද පූර්වාන්ත සහගත දෘෂ්ටිහු කවුරැ ද? යත්: චුන්දයෙනි, 'ආත්මයත් ලෝකයත් ශාශ්වත යැ' යි මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ' යි මෙසේ වාද ඇති, මෙසේ වූ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. චුන්දයෙනි, "ආත්මයත් ලෝකයත් අශාශ්වත යැ යි ද, ආත්මයත් ලෝකයත් ශාශ්වතත් අශාශ්වතත් වෙ යැ යි ද, ආත්මයත් ලෝකයත් ශාශ්වතත් නො ම වෙ අශාශ්වතත් නො ම වෙ යැ යි ද, ආත්මයත් ලොකයත් ස්වයංකෘත ය යි ද, ආත්මයත් ලොකයත් පරකෘත යැ යි ද, ආත්මයත් ලොකයත් ස්වයංකෘතත් පරකෘතත් වෙයැ යි ද, ආත්මයත් ලොකයත් ස්වයාකාර ද පරකාර ද නො වෙ, යදෘච්ඡාසමුත්පන්න යැ යි ද, මෙය ම සත්‍ය යැ යි, සෙස්ස හිස් යැ යි මෙසේ වාද ඇති, මෙසේ වූ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත.

26. තත්‍ර චුන්ද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො සස්සතො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදමි: අත්ථිනු ඛො ඉදං, ආවුසො, වුච්චති සස්සතො අත්තා ච ලොකො චා?''ති යඤ්ච ඛො තෙ එවමාහංසු 'ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති, තං තෙසං නානුජානාමි. තං කිස්ස හෙතු? අඤ්ඤථාසඤ්ඤිනො පි හෙත්ථ චුන්ද සන්තෙකෙ සත්තා. ඉමාය පි ඛො අහං චුන්ද පඤ්ඤත්තියා නෙව අත්තනා සමසමං සමනුපස්සාමි කුතො භිය්‍යො, අථ ඛො අහමෙව තත්ථ භිය්‍යො යදිදං අධිපඤ්ඤත්ති.

27. තත්‍ර චුන්ද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො "සස්සතො අත්තා ච ලොකො ච, අසස්සතො අත්තා ච ලොකො ච, සස්සතො ච අසස්සතො ච අත්තා ච ලොකො ච, නෙව සස්සතො නාසස්සතො අත්තා ච ලොකො ච, සයං කතො අත්තා ච ලොකො ච, පරංකතො අත්තා ච ලොකො ච, සයං කතො ච පරකතො ච අත්තා ච ලොකො ච, අසයංකාරො අපරකාරො අධිච්චසමුප්පන්නො අත්තා ච ලොකො ච, සස්සතං සුඛදුක්ඛං; අසස්සතං සුඛදුක්ඛං, සස්සතඤ්ච අසස්සතඤ්ච සුඛදුක්ඛං, නෙව සස්සතං නාසස්සතං සුඛදුක්ඛං, සයංකතං සුඛදුක්ඛං, පරකතං සුඛදුක්ඛං, සයං කතං ච පරකතං ච සුඛදුක්ඛං අසයංකාරං අපරකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති''. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදමි "අත්ථි ඛො ඉදං ආවුසො වුච්චති අසයංකාරං අපරකාරං අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛන්ති?'' යඤ්ච ඛො තෙ එවමාහංසු ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති', තං තෙසං නානුජානාමි, තං කිස්ස හෙතු? අඤ්ඤථාසඤ්ඤිනො පි හෙත්ථ චුන්ද සන්තෙකෙ සත්තා. ඉමාය පි ඛො අහං චුන්ද පඤ්ඤත්තියා නෙව අත්තනා සමසමං සමනුපස්සාමි කුතො භිය්‍යො. අථ ඛො අහමෙව තත්ථ භිය්‍යො යදිදං අධිපඤ්ඤත්ති. ඉමෙ ඛො තෙ චුන්ද පුබ්බන්තසහගතා දිට්ඨිනිස්සයා, යෙ මෙ මයා බ්‍යාකතා යථා තෙ බ්‍යාකාතබ්බා යථා ච තෙ න බ්‍යාකාතබ්බා, කිං වො අහං තෙ තත්ථ බ්‍යාකරිස්සාමී?''ති.

26. සුව දුක් ශාශ්වත ය, සුවදුක් අශාශ්වත ය, සුවදුක් ශාශ්වත ද අශාශ්වත ද වේ, සුවදුක් ශාශ්වත ද නො ම වේ. ආශාශ්වත ද නො ම වේ, සුවදුක් සවයංකෘත ය, සුවදුක් පරකෘත ය, සුව දුක් සවයංකෘත ද පරකෘත ද වේ. සුවදුක් සවයංකාර ද නො වේ, පරකාර ද නො වේ, යදෘච්ඡාසමුත්පන්න ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ යි මෙසේ වූ වාද ඇති, මෙසේ වූ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. චුන්දයෙනි, එහි 'ආත්මයත් ලොකයත් ශාශ්වත යැ' යි, 'මෙය ම සත්‍ය යැ සෙස්ස හිස් යැ' යි මෙසේ වාද ඇති, මෙසේ දෘෂ්ටි ඇති යම් මහණ කෙනෙක් බමුණුකෙනෙක් ඇද්ද, මම ඔවුන් කරා එළැඹ, 'ඇවැත්නි, ආත්මයත් ලොකයත් ශාශ්වත යැ යි කියනු ලැබේ යන මෙය ඇත්ත ද?' යි මෙසේ විචාරමි. ඔහු 'මෙය ම සත්‍ය ය සෙස්ස හිස් යැ'යි මෙසේ යම් වචනයක් කියත් ද, ඔවුන්ගේ ඒ වචනය නො අනුදනිමි. ඒ කවර හෙයින්ද? චුන්දයෙනි, මෙහි අන් සැටියෙකින් හඟිනා ඇතැම් සත්ව කෙනෙක් ඇත. චුන්දයෙනි, මේ දෘෂ්ටි ප්‍රඥප්තියෙන් ද තමාහට සමසමයක් හු නො ම දකිමි. තමාට වැඩි තරම් එකකු කොයින් දකිම් ද? වැලිදු අධිප්‍රඥප්ති (විශෙෂ පැනවීම) යන යමෙක් ඇද්ද, එහි මම ම වැඩිතරම් වෙමි.

27. චුන්දයෙනි, එහි 'ආත්මයත් ලෝකයත් ශාශ්වත යැ' යි 'ආත්මයත් ලොකයත් අශාශ්වත යැ' යි ආත්මයත් ලෝකයත් ශාශ්වතත් අශාශ්වතත් වෙ' යැ යි, 'ආත්මයත් ලෝකයත් ශාශ්වත ද නො ම වෙ' අශාශ්වත ද නො ම වෙ' යැ යි, 'ආත්මයත් ලෝකයත් සවයංකෘත යැ' යි 'ආත්මයත් ලෝකයත් පරකෘත යැ' යි, 'ආත්මයත් ලෝකයත් සවයංකෘත ද පරකෘත ද වෙ යැ' යි 'ආත්මයත් ලෝකයත් සවයංකාර ද නො වෙ, පරකාර ද නො වෙ යදෘච්ඡාසමුත්පන්න යැ' යි, 'සුඛදුඃඛ දෙක ශාශ්වත යැ' යි සුඛ දුඃඛ දෙක ආශාශ්වත යැ' යි, 'සුඛ දුඃඛ දෙක ශාශ්වතත් ආශාශ්වතත් වෙ යැ' යි 'සුඛ දුඃඛ දෙක ශාශ්වතත් නො ම වෙ ඈශාශ්වතත් නො ම වෙ යැ'යි, සුඛදුඃඛ දෙක සවයංකෘත යැ' යි, සුඛ දුඃඛ දෙක පරකෘත යැ'යි, සුඛ දුඃඛ දෙක සවයංකෘත ද පරකෘත ද වෙ' යැ' යි, 'සුඛ දුඃඛ දෙක සවයංකාර ද පරකාර ද නො ව යදෘච්ඡාසමුත්පන්න යැ, 'මෙය ම සත්‍ය ය සෙස්සහිස් යැ' යි, මෙසේ වූ වාද ඇති මෙ බඳු වූ දෘෂ්ටි ඇති යම් මහණ කෙනෙක් බමුණු කෙනෙක් ඇද්ද, මම ඔවුන් කරා එළැඹ, 'ඇවැත්නි, සුඛ දුඃඛ දෙක සවයංකාර ද පරකාර ද නොව යදෘච්ඡාසමුත්පන්න යැ යි කියනු ලැබේ' යන මෙය ඇත්ත ද? යි විචාරමි. ඔහු 'මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි යම් වචනයක් කියත් ද, ඔවුන් ගේ ඒ වචනය නො අනුදනිමි. ඒ කවර හෙයින? යත්: චුන්දයෙනි, මෙහි අන් සැටියෙකින් හඟිනා ඇතැම් සත්ව කෙනෙක් ඇත. චුන්දයෙනි, මේ දෘෂ්ටිප්‍රඥප්තියෙන් ද තමාහට සමසමයක්හු නො ම දකිමි. තමාහට වැඩිතරම් එකකු කොයින් දකිම් ද? වැලි දු අධිප්‍රඥප්ති යන යමෙක් ඇද්ද, එහි මම ම වැඩිතරම් වෙමි. චුන්දයෙනි, මොහු පැවැසියැ යුතු පරිදි මා විසින් පවසන ලද පූර්වාන්තය පිළිබඳ වූ දෘෂ්ටිහු ය. යම්සේ ඔහු නො පැවැසියැ යුතු නම්, කිම? එහි මම් තොපට ඒ පවසන්නෙම් ද?

## අපරන්තසහගතා දිට්ඨිනිස්සයා

28. කතමෙ ච චුන්ද අපරන්තසහගතා දිට්ඨිනිස්සයා යෙ තෙ මයා බ්‍යාකතා යථා තෙ බ්‍යාකාතබ්බා? යථා ච තෙ න බ්‍යාකාතබ්බා, කිං වො අහං තෙ තත්‍ථ බ්‍යාකරිස්සාමී?''ති, සන්ති චුන්ද එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: ''රූපී අත්තා හොති අරොගො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති.'' සන්ති පන චුන්ද එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො ''නාරූපී අත්තා හොති -පෙ- රූපී ච අරූපී ච අත්තා හොති -පෙ- නෙව රූපී නාරූපී අත්තා හොති -පෙ- සඤ්ඤී අත්තා හොති -පෙ- අසඤ්ඤී අත්තා හොති, -පෙ- නෙවසඤ්ඤීනාසඤ්ඤී අත්තා හොති, -පෙ- අත්තා උච්ඡිජ්ජති විනස්සති, න හොති පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති.'' තත්‍ර චුන්ද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො, රූපී අත්තා හොති අරොගො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: අත්‍ථි ඛො ඉදං ආවුසො, වුච්චති ''රූපී අත්තා හොති අරොගො පරම්මරණා?''ති. යං ඛො තෙ එවමාහංසු ''ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති'' තං තෙසං නානුජානාමි. තං කිස්ස හෙතු? අඤ්ඤථාසඤ්ඤිනො පි හෙත්‍ථ චුන්ද සන්තෙකෙ සත්තා. ඉමායපි ඛො අහං චුන්ද පඤ්ඤත්තියා නෙව අත්තනා සමසමං සමනුපස්සාමි කුතො භියො, අථ ඛො අහමෙව තත්‍ථ භියො යදිදං අධිපඤ්ඤත්ති.

29. තත්‍ර චුන්ද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො අරූපී අත්තා හොති -පෙ- රූපී ච අරූපී ච අත්තා හොති -පෙ- නෙව රූපී නාරූපී අත්තා හොති -පෙ- සඤ්ඤී අත්තා හොති -පෙ- අසඤ්ඤී අත්තා හොති -පෙ- නෙවසඤ්ඤීනාසඤ්ඤී අත්තා හොති -පෙ- අත්තා උච්ඡිජ්ජති විනස්සති, න හොති පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති.'' ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: අත්‍ථි ඛො ඉදං ආවුසො, වුච්චති ''අත්තා උච්ඡිජ්ජති විනස්සති, න හොති පරම්මරණා ති?'' යඤ්ච ඛො තෙ චුන්ද එවමාහංසු. ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති, තං තෙසං නානුජානාමි. තං කිස්ස හෙතු? අඤ්ඤථාසඤ්ඤිනොපි හෙත්‍ථ චුන්ද සන්තෙකෙ සත්තා. ඉමායපි ඛො අහං චුන්ද පඤ්ඤත්තියා නෙව අත්තනා සමසමං සමනුපස්සාමි කුතො භියො? අථ ඛො අහමෙව තත්‍ථ භියො යදිදං අධිපඤ්ඤත්ති. ඉමෙ ඛො තෙ චුන්ද අපරන්තසහගතා දිට්ඨිනිස්සයා, යෙ තෙ මයා බ්‍යාකතා යථා තෙ බ්‍යාකාතබ්බා. යථා ච තෙ න බ්‍යාකාතබ්බා කිං වො අහං තෙ තත්‍ථ බ්‍යාකරිස්සාමී''ති

28. චුන්දයෙනි, යම්සේ හෙළි කළ යුතු නො වෙත් නම්, 'එහි මම කුමට එය පවසන්නෙම් ද ?' යි කියැ යුතු වූ, හෙළි කළ යුතු පරිදි මා විසින් හෙළි කරන ලද්දවූ අපරාන්ත සහගත (අනාගත ස්කන්ධ කොටස පිළිබඳ වූ) දෘෂ්ටීහු කවරහ ? යත්: චුන්දයෙනි, 'ආත්මය රූපවත්ය, මරණින් මතු අරොග යැ. මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. 'ආත්මය රූපරහිත ය... ආත්මය රූපවත් ද අරූපවත් ද වෙයි... ආත්මය රූපවත් ද නොම වෙයි, අරූපවත් ද නො ම වෙයි... ආත්මය සංඥාවත් වෙයි... ආත්මය සංඥා නැත්තේ වේ... ආත්මය සංඥා ඇත්තේ ද වේ.... සංඥව නැත්තේ ද වේ... ආත්මය මරණින් පසු මුල් සුන් වෙයි, වැනැසෙයි, මරණින් මත්තෙහි නො වෙයි, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියන, මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. චුන්දයෙනි, එහි යම් මහණ බමුණු කෙනෙක් ආත්මය රූපවත්ය, මරණින් මත්තෙහි අරෝග යැ, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි කියත් ද, මම ඔවුන් කරා එළැඹ, 'ඇවැත්නි, ආත්මය රූපවත් ය. මරණින් මතු අරොග යැ'යි තොප විසින් යම් වචනයෙක් කියනු ලැබේ ද, එය ඇත්තේ දැ ? (එය හුදු වචනමාත්‍රයක් නො ව තොපගේ දෘෂ්ටිය ම දැ ?') යි විචාරමි. 'මෙය ම සත්‍ය යැ, සෙස්ස හිස් යැ'යි යමක් මෙසේ ඔහු කියත් ද, ඔවුන්ගේ ඒ වචනය නො අනුදනිමි. ඒ කවර හෙයින ? චුන්දයෙනි, මෙහි මෙයට වෙනස් සංඥා ඇති එක්තරා සත්ව කෙනෙක් ඇත්හ. චුන්දයෙනි, මේ දෘෂ්ටිප්‍රඥප්තියෙන් ද තමාට සමසම එකක්හු නො දකිමි, වැඩි තරම් එකකු කොයින් දකිම් ද ? වැලි දු යම් අධිපඥප්තියෙක් වේ ද එයින් මම ම එහි වැඩි තරම් වෙමි.

29. චුන්දයෙනි, එහි යම් මහණ බමුණු කෙනෙක් 'ආත්මය රූප රහිත වෙයි... ආත්මය රූපවත් ද රූපරහිත ද වෙයි... ආත්මය රූපවත් ද නො ම වෙයි, රූපරහිත ද නොම වෙයි... ආත්මය සංඥා ඇත්තේ වෙයි... ආත්මය සංඥ නැත්තේ වෙයි.... ආත්මය සංඥීත් (සංඥව ඇත්තේත්) නො ම වෙයි, අසංඥීත් නො ම වෙයි... ආත්මය මුල්සුන් වෙයි, වැනැසෙයි මරණින් මතු නො වෙයි. මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙසේ කියත් ද, මම ඔවුන් කරා එළැඹ, "ඇවැත්නි, ආත්මය උච්ඡින්න වේ, වැනසේ, මරණින් මතු නො වේ, මෙය ම සත්‍යය ය, සෙස්ස හිස්යැ'යි යමක් කියනු ලැබේ ද එය (ඒ දෘෂ්ටිය) ඔබට ඇත්දැයි ?''යි මෙසේ විචාරමි. 'මෙය ම සත්‍ය ය, සෙස්ස හිස්යැ'යි මෙසේ යමක් ම ඔහු කියත් ද, ඔවුන්ගේ ඒ වචනය නො අනුදනිමි. ඒ කවර හෙයින ? යත්: චුන්දයෙනි, මෙහි ඇතැම් සත්ව කෙනෙක් වෙනස් සංඥා ඇත්තාහු ද වෙත්. (එහෙයිනි.) චුන්දයෙනි, මේ දෘෂ්ටිප්‍රඥප්තියෙන් ද තමා හා සම-සමයකු මම නො ම දකිමි. තමාට වැඩිතරම් එකක්හු කොයින් දකිම් ද ? වැලි දු යම් අධිප්‍රඥප්තියෙක් වේ ද එහි මම ම වැඩිතරම් වෙමි. චුන්දයෙනි, හෙළි කළ යුතු පරිද්දෙන් මා විසින් හෙළි කරන ලද, යම්සේ නොපැවැසියයුතු නම් 'කුමට එය තොපට පවසන්නෙම් දැ' යි මා විසින් නො පවසන ලද, අපරාන්තසහගත වූ දෘෂ්ටීහු මොහු ය.

30. ඉමෙසං ච චුන්ද පුබ්බන්තසහගතානං දිට්ඨිනිස්සයානං ඉමෙසං ච අපරන්තසහගතානං දිට්ඨිනිස්සයානං පහානාය සමතික්කමාය එවං මයා චත්තාරො සතිපට්ඨානා දෙසිතා පඤ්ඤත්තා. කතමෙ චත්තාරො? ඉධ චුන්ද භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා, විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං, වෙදනාසු -පෙ- චිත්තෙසු -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා, විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ච චුන්ද පුබ්බන්තසහගතානං දිට්ඨිනිස්සයානං ඉමෙසං ච අපරන්තසහගතානං දිට්ඨිනිස්සයානං පහානාය සමතික්කමාය එවං මයා ඉමෙ චත්තාරො සතිපට්ඨානා දෙසිතා පඤ්ඤත්තා ති.

31. තෙන ඛො පන සමයෙන ආයස්මා උපවාණො භගවතො පිට්ඨිතො හොති භගවන්තං විජයමානො. අථ ඛො ආයස්මා උපවාණො භගවන්තං එතදවොච: අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ, පාසාදිකො වතායං භන්තෙ ධම්මපරියායො, සුපාසාදිකො වතායං භන්තෙ ධම්මපරියායො. කො නාමායං භන්තෙ ධම්මපරියායො?''ති. ''තස්මා තිහ ත්වං උපවාණ ඉමං ධම්මපරියායං පාසාදිකොත්වෙව නං ධාරෙහී''ති.

ඉදමවොච භගවා අත්තමනො ආයස්මා උපවාණො භගවතො භාසිතං අභිනන්දීති.

පාසාදිකසුත්තං නිට්ඨිතං ඡට්ඨං.

30. චුන්දයෙනි, මේ පූර්වාන්ත සහගත දෘෂ්ටීන්ගේ ද මේ අපරාන්ත සහගත දෘෂ්ටීන්ගේ ද ප්‍රහාණය පිණිස ඉක්මීම පිණිස, මා විසින් මෙසේ සතර සතිපට්ඨානයෝ දෙසන ලදහ, පනවන ලදහ. කවර සතරෙක් ද? යත්: චුන්දයෙනි, මෙහි මහණ තෙම කෙලෙස් තවන වැර ඇත්තේ, නුවණින් දත්තේ, සිහි ඇත්තේ, ලොවැ අභිධ්‍යාව හා දෙම්නස හා දුරු කොට, කයෙහි කායානුපස්සී වැ වෙසෙයි. වෙදනාවන්හි... චිත්තයන්හි... කෙලෙස් තවන වැර ඇත්තේ, නුවණින් දත්තේ, සිහි ඇත්තේ, ලොවැ අභිධ්‍යාව හා දෙම්නස හා දුරු කොට, ධර්මයන්හි ධම්මානුපස්සී වැ වෙසෙයි. චුන්දයෙනි, මේ පූර්වාන්තසහගත දෘෂ්ටීන්ගේ ද මේ අපරාන්ත සහගත දෘෂ්ටීන්ගේ ද ප්‍රහාණය පිණිස, ඉක්මීම පිණිස, මෙසේ මා විසින් සතර සතිපට්ඨානයෝ දෙසන ලද හ, පනවන ලදහ.''

31. එ සමයෙහි උපවාණ තෙරණුවෝ භාග්‍යවතුන්වහන්සේට පවන් සලනුවෝ ඔබ පිටුපසින් සිටියාහු වෙත්. එ කලැ උපවාණ තෙරණුවෝ 'වහන්ස, ආශ්චර්‍ය්‍ය ය, වහන්ස, අද්භූත ය. වහන්ස, මේ ධර්මපර්‍ය්‍යාය එකාන්තයෙන් ප්‍රසාද එළවන සුලු ය, වහන්ස, මේ ධර්ම පර්‍ය්‍යාය කිනම් ද? යි ඇසූහ. 'උපවාණයෙනි, එහෙයින් මෙහි මේ ධර්ම පර්යාය **'පාසාදිකයැ'** යි කියා ම සලකවු යැ' යි වදාළ සේක,

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ආයුෂ්මත් උපවාණ තෙරණුවෝ සතුටු සිතැත්තාහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්හ.

**සවැනි පාසාදික සූත්‍රය නිමියේ යැ.**

# 7

# ලක්ඛණසුත්තං

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති. 'භදන්තෙ'ති[1] තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ද්වත්තිංසිමානි භික්ඛවෙ මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණානි යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙව ගතියො භවන්ති අනඤ්ඤා: සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්ත රතනානි භවන්ති සෙය්‍යථීදං: චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිණායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා හොන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන සමෙන අභිවිජීය අජ්ඣාවසති. සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡදො[2] කතමානි තානි භික්ඛවෙ ද්වත්තිංස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණානි යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙව ගතියො භවන්ති අනඤ්ඤා? සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති –පෙ– සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡදො.

2. ඉධ භික්ඛවෙ මහාපුරිසො සුප්පතිට්ඨිතපාදො හොති. යම්පි භික්ඛවෙ මහාපුරිසො සුප්පතිට්ඨිතපාදො හොති, ඉදම්පි භික්ඛවෙ මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.

---

1. භද්දන්තෙ ති–මජසං.
2. විවටච්ඡදො–ස්‍යා, කම්.—විවට්ටච්ඡදො–මජසං

# 7

# ලක්ෂණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී:

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර නිසා දෙව්රම් නම්වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එහි දි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමැතූසේක. 'පින්වතුන් වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක:

"මහණෙනි, යමෙකින් සමන්විත මහ පුරිස්හට නිෂ්ඨා දෙකෙක් ම වේ ද, අන් නොවැන්නෙක් නැද්ද, එසේ වූ මහපුරිස්හු ගේ මහ පුරිස් ලකුණු දෙතිසෙක් වෙත්. ඔහු පිළිබඳ වූ ඒ නිෂ්ඨා දෙක නම්:

ඉදින් ගිහි ගෙහි වසන්නේ නම්, දැහැමි වූ (දස කුසල් දහම් රක්නා), දැහැමෙන් රජ්‍ය ලැබ රජ වූ, සිවුසයුර ඉම් කොටැති සිවු මහදිවයිනට නායක වූ, සතුරන් දිනූ, දනවුහි තහවුරු බවට පැමිණි, සත් රුවනින් සමන්වාගත වූ, සක්විති රජෙක් වෙයි. සක්රුවන ඇත්රුවන, අස්රුවන, මිණි රුවන, ඉතිරිරුවන, ගැහැවිරුවන, සත්වනු පුත්රුවන ම යැ යි ඔහුට මේ සත්රුවන් කෙනෙක් වෙත්. ශූර, වීර ඇඟ රුව ඇති, සතුරු සෙන් මඩිනුයෙහි බුහුටි වූ පුත්තු අයිරා දහස් දෙනෙක් ඔහුට වෙත්. ඒ සක්විති තෙමේ සයුරහිම් කොට මෙ පොළොව දඬුවමින් තොර වැ අවියෙන් තොර වැ දැහැමෙන් දිනා එයට අධිපති වැ වෙසෙයි. ඉදින් ගිහිගෙන් නික්මැ පැවිදි බිම වදනේ වී නම්. පෙරළා ලූ කෙලෙස් සෙවෙණි ඇති, රහත් සම්මාසම්බුදුවරයෙක් වෙයි. මහණෙනි, යම් දෙතිස් මහපුරිස් ලකුණින් යුත් මහ පුරිස්හට ගති දෙකෙක්ම වේ ද, අන් නොවැන්නෙක් නො වේ ද, ඉදින් ගිහි ගෙහි වසන්නේ නම්...සක්විති රජ වන්නේ ද, ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම්, ලොවැ කෙලෙස් සෙවෙණි පෙරළා ලූ රහත් සම්මාසම්බුදුවරයෙක් වන්නේ ද, මහපුරිස්හුගේ එසේ වූ දෙතිස් මහපුරිස් ලකුණු කවුරු ද? යත්;

2. මහණෙනි, මෙහි මහ පුරිස් තෙමේ සුපිහිටි පා ඇත්තේ වෙයි. මහණෙනි 'මහපුරිස්තෙමෙ සුපිහිටි පා ඇත්තේය' යන යමෙක් ඇද්ද, මෙය මහපුරිස්හු ගේ මහපුරිස් ලකුණෙක් වෙයි.

පුන ච පරං භික්ඛවෙ මහාපුරිසස්ස හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි හොන්ති සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි.[1] යම්පි භික්ඛවෙ මහාපුරිසස්ස හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි හොන්ති සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි, ඉදම්පි භික්ඛවෙ මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.

පුන ච පරං භික්ඛවෙ මහාපුරිසො ආයතපණ්හී හොති -පෙ- දීඝඞ්ගුලී හොති -පෙ- මුදුතලුනහත්ථපාදො හොති -පෙ- ජාලහත්ථපාදො හොති -පෙ- උස්සඞ්ඛපාදො හොති -පෙ- එණිජඞ්ඝො හොති -පෙ- ඨිතකො'ව අනොනමන්තො උභොහි පාණිතලෙහි ජණ්ණුකානි පරිමසති පරිමජ්ජති -පෙ- කොසොහිතවත්ථගුය්හො හොති -පෙ- සුවණ්ණවණ්ණො හොති කඤ්චනසන්නිභත්තචො -පෙ- සුඛුමච්ඡවි හොති සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උපලිම්පති -පෙ- එකෙකලොමො හොති, එකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි -පෙ- උද්ධග්ගලොමො හොති, උද්ධග්ගානි ලොමානි ජාතානි නීලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලාවත්තානි[2] පදක්ඛිණාවත්තකජාතානි -පෙ- බ්‍රහ්මුජ්ජුගත්තො හොති -පෙ- සත්තුස්සදො හොති -පෙ- සීහපුබ්බද්ධකායො හොති -පෙ- චිතන්තරංසො හොති -පෙ- නිග්‍රොධපරිමණ්ඩලො හොති, යාවතක්වස්ස කායො, තාවතක්වස්ස බ්‍යාමො, යාවතක්වස්ස බ්‍යාමො තාවතක්වස්ස කායො, -පෙ- සමවත්තක්ඛන්ධො හොති -පෙ- රසග්ගසග්ගී හොති -පෙ- සීහහනු හොති -පෙ- චත්තාළීසදන්තො හොති -පෙ- සමදන්තො හොති -පෙ- අවිරළදන්තො හොති -පෙ- සුසුක්කදාඨො හොති -පෙ- පහූතජිව්හො හොති -පෙ- බ්‍රහ්මස්සරො හොති, කරවීකභාණී -පෙ- අභිනීලනෙත්තො හොති -පෙ- ගොපඛුමො හොති -පෙ- උණ්ණා භමුකන්තරෙ ජාතා හොති ඔදාතා මුදුතූලසන්නිභා. යම්පි භික්ඛවෙ මහාපුරිසස්ස උණ්ණාභමුකන්තරෙ ජාතා හොති ඔදාතා මුදුතූලසන්නිභා ඉදම්පි භික්ඛවෙ මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති. පුන ච පරං භික්ඛවෙ මහාපුරිසො උණ්හීසසීසො හොති. යම්පි භික්ඛවෙ මහාපුරිසො උණ්හීසසීසො හොති, ඉදම්පි භික්ඛවෙ මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.

1. සබ්බාකාර පරිපූරාණි සුවිභත්තන්තරාණි-PTS.
2. කුණ්ඩලාවට්ටානි-මජසං.

තව ද අනෙකක් කියමි. මහ පුරිස්හුගේ යැටි පතුල්හි දහසක් දැවි ඇති, නිම්වළලු සහිත, නාභි සහිත හැම අයුරින් පිරිපුන් මොනොවට බෙදුණු අතර ඇති, සක් ලකුණෝ පහළ වූවාහු වෙත්. මහණෙනි, මහ පුරිස්හුගේ යැටි පතුල්හි දහසක් දැවි ඇති, නිම්වළලු සහිත, නාභිසහිත, හැම අයුරින් පිරිපුන්, මොනොවට බෙදුණු අතර ඇති, සක් ලකුණෝ පහළ වූවාහු වෙත් යන යමෙක් ඇද්ද, මෙය ද මහණෙනි, මහපුරිස්හුගේ මහපුරිස් ලකුණෙක් වෙයි.

තව ද අනෙකෙකි. මහණෙනි, මහපුරිස් තෙමේ දික් විලුම් ඇත්තේ වෙයි. ... දික් ඇඟිලි ඇත්තේ වෙයි... මොළොක් වූ තුරුණු අතුල් පතුල් ඇත්තේ වෙයි .. දැල් කවුළුවකට බඳු අත් පා ඇත්තේ වෙයි... මත්තෙහි ගොප් ඇටය පිහිටි පා ඇත්තේ වෙයි... ඕළු මුවන්ගේ බඳු කෙංඩා ඇත්තේ වෙයි.... සිටියේ ම නො නැමෙනුයේ දෙ අත්ලෙන් දෙ දණ ස්පර්ශ කෙරෙයි, පිරිමදියි.... කොපුයෙහි ගිලුණු වස්ති ගුහ්‍යය ඇත්තේ වෙයි... රන් බඳු පැහැ ඇත්තේ, කසුන් පැහැ සිවිය ඇත්තේ වෙයි... සියුම් සිවිය ඇත්තේ වෙයි; සිවිය සියුම් බැවින් කයෙහි රජස් දූලි නො ලැගෙයි... එකෙකි ලොම් ඇත්තේ වෙයි. රෝමකූපයන්හි තනි තනි ම වැ (එකෙක් එකෙක් ම) ලොම් හටගත්තේ වෙයි... උඩුකුරු අග්ඇති ලොම් ඇත්තේ වෙයි. උඩුකුරු වූ අග් ඇති, නිල් පැහැ අඳුන්වන්, කොඩොල් බඳු වක් වූ, දකුණට කරකැවුණු ලොම්හු හටගත්තාහු වෙත්....බඹහු ගේ බඳු ඍජු (නොනැමුණු) සිරුරු ඇත්තේ වෙයි.... ...කයැ දෙ අත් පිටු ඇ උස් වැ මතු වූ සත් තැනක් ඇත්තේ වෙයි... සීරදක්හු ගේ පෙරඩ කය බඳු පිරුණු කය ඇත්තේ වෙයි... පිරුණු (මොනොවට තැනුණු) පිටතුරු ඇත්තේ වෙයි... නුගරුකක් බඳු පිරිමඬුලු (සමප්‍රමාණ) කය ඇත්තේ වෙයි.... ඔහුගේ කය යම් පමණ ද ඔහුගේ බඹය ද එ පමණ ම ය. ඔහුගේ බඹය යම් පමණ ද ඔහුගේ කයත් එ පමණ ම ය (කයේ උස පමණ ම බඹය ද වෙයි)... සම වට ගෙල ඇත්තේ වෙයි... (සත් සියක්) රසනහර තුඩු දුන් ගෙල ඇත්තේ වෙයි... සීරදක්හු ගේ බඳු හනු ඇත්තේ වෙයි... සම සතලිසක් දත් ඇත්තේ වෙයි.... සම වූ දත් ඇත්තේ වෙයි... අතර විවර නැති සේ පිහිටි දත් ඇත්තේ වෙයි... ඉතා සුදු දළ ඇත්තේ වෙයි....පුළුල් දිව ඇත්තේ වෙයි...බඹහු ගේ බඳු කටහඬ ඇත්තේ, කුරවිකෙවිල්ලන ගේ බඳු මධුර නාද ඇත්තේ වෙයි... ඉතා නිල් නෙතැත්තේ වෙයි... රත්පැහැ ලමා වස්සක්හුගේ බඳු ඇස්මඬල ඇත්තේ වෙයි... සුදු මොළොක් පුලුන් රොදක් බඳු ඌර්ණා රෝමයෙක් දෙබැම අතර හටගත්තේ වෙයි. මහණෙනි, යම් සුදු වූ මොළොක් වූ පුලුන් රොදක් බඳු ඌර්ණා රෝමයෙක් දෙ බැම අතර හටගත්තේ ද, මහණෙනි, මෙය ද මහපුරිස්හුගේ මහපුරිස් ලකුණෙක් වෙයි. තව ද අනෙකෙකි. මහපුරිස් තෙමේ උෂ්ණීෂ ශීර්ෂ වෙයි. (නළල් පටින් වෙළුණක්හු බඳු පිරිපුන් නළල් තල ද පිරිපුන් හිස ද ඇත්තේ වෙයි). මහණෙනි, මහපුරිස් තෙමෙ උෂ්ණීෂ ශීර්ෂ වෙයි යන යමෙක් ඇද්ද මෙය ද මහණෙනි, මහපුරිස්හුගේ මහපුරිස් ලකුණෙක් වෙයි.

ඉමානි ඛො තානි භික්ඛවෙ ද්වත්තිංස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණානි යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙව ගතියො භවන්ති අනඤ්ඤා. සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති –පෙ– සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවට්ටච්ඡදෙ.

3. ඉමානි ඛො භික්ඛවෙ ද්වත්තිංස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණානි බාහිරකා පි ඉසයො ධාරෙන්ති. නො ච ඛො තෙ ජානන්ති 'ඉමස්ස කම්මස්ස කතත්තා ඉමං ලක්ඛණං පටිලභතී'ති.

## සුප්පතිට්ඨිතපාදලක්ඛණං (1)

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො දළ්හසමාදානො අහොසි කුසලෙසු ධම්මෙසු අවත්ථිතසමාදානො, කායසුචරිතෙ වචීසුචරිතෙ මනොසුචරිතෙ, දාන-සංවිභාගෙ සීලසමාදානෙ උපොසථුපවාසෙ මත්තෙය්‍යතාය පෙත්තෙය්‍යතාය සාමඤ්ඤතාය බ්‍රහ්මඤ්ඤතාය කුලෙජෙට්ඨාපචායිතාය අඤ්ඤතරඤ්ඤ-තරෙසු ච අධිකුසලෙසු ධම්මෙසු, සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. සො තත්ථ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති, දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි. සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති, සුප්පතිට්ඨිතපාදො හොති, සමං පාදං භූමියං නික්ඛිපති, සමං උද්ධරති, සමං සබ්බාවන්තෙහි පාදතලෙහි භූමිං ඵුසති. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථා-වරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති, සෙය්‍යථීදං චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං.

මහණෙනි, මොහු වනාහි යමෙකින් යුත් මහ පුරිස්හු ගේ ගති දෙකෙක් ම වේ ද අන් කෙවැන්නෙක් නො වේ ද, ගිහිගෙහි වුසුවොත්... සක්විති වන්නේ ද, ගිහි ගෙන් නික්ම ලොවැ කෙලෙස් සෙවෙණි පෙරළාලූ රහත් සම්මාසම්බුදුවරයෙක් වන්නේ ද, එසේ වූ මහ පුරිසක්හු පිළිබඳ වූ ඒ දෙතිස් මහ පුරිස් ලකුණුහු වෙත්.

3. මහණෙනි, ඒ මේ දෙතිස් මහ පුරිස් ලකුණුහු සස්නෙන් බැහැර වූ සාමිහු ද සිත්හි ලා දරත්. ඔහු එය සිත්හි නො දරන්නාහු නම්, මෙබඳු කර්මයක් කළ බැවින් මෙ නම් ලකුණ ලබා යැ යි නො දන්නාහු ය.

### සුප්‍රතිෂ්ඨිත පාද ලක්ෂණය (1)

මහණෙනි, තථාගත තෙමේ පෙර දැහි පෙර බෙවෙහි පෙර වුසු තන්හි දී, පෙර මිනිස් වූයේ ම (පෙර මිනිස් වැ ඉපැද සිටි කල්හි) කුසල් දහම්හි දැඩි ගැනුම් ඇත්තේ, නිසල සමාදන් ඇත්තේ වි ද, කාය සුචරිත-යෙහි ද වාක් සුචරිතයෙහි ද මනස්සුචරිතයෙහි ද, තමා ලත් කොටස බෙදා දී වැළඳීමෙහි ද, පන්සිල් ඈ සිල්සමාදන් වැ ගැන්මෙහි ද, පෙහෙවස් වුසුම්හි ද මවට කටයුතු වතාවත්හි ද පියාට කටයුතු වතාවත්හි ද මහණුනට කටයුතු සත්කාරයෙහි ද, බමුණනට කටයුතු සත්කාරයෙහි ද, කුලදෙටුවන් පුදන බව්හි ද, තවත් මෙ බඳුවූ අන් අන් වෙසෙසි කුසල් දහම්හි දැඩි ගැනුම් ඇත්තේ නිසල සමාදන් ඇත්තේ වි ය යන යමෙක් ඇද්ද, හෙ තෙම ඒ කම් කළ බැවින්, පුන පුනා කළ බැවින්, ඒ කර්මයාගේ උත්සන්න බැවින් අප්‍රමාණ බැවින කාබුත් මරණින් මතු මනා ගති ඇති සග ලොවට පැමිණෙයි. එහි ඒ මහපුරිස් තෙමෙ දෙව් ආයෙන් ද, දෙව් පැහැයෙන් ද, දෙව් සැපයෙන් ද, දෙව් යසසින් ද, දෙව් අදිපති බැවින් ද, දෙව් රුවින් ද, දෙව් හඬින් ද, දෙව් ගඳින් ද, දෙව් රසෙන් ද, දෙව් පහසින් ද යන දස කරුණෙකින් අන් දෙවියන් ඉක්මැ සිටී. හේ එයින් සැව මේ මිනිසත් බවට පැමිණියේ ම මේ මහපුරිස් ලකුණු ලබයි. හේ සුපිහිටි පා ඇත්තේ වෙයි, බිමැ සම ලෙස පා තබයි, සම ලෙස පා තබයි. සියලු අවයවයෙන් යුත් පත්ලෙන් සමලෙස බිම පහයි (පාගායි) හේ ඒ ලකුණින් සමන්විතවූයේ, ඉදින් ගිහි ගෙහි වසන්නේ වි නම්, දසකුසල් දහම් රක්නා, දැහැමෙන් රජ වූ, සිවු සයුර හිම කොටැති සිවු මහදිවයිනට නායක වූ, සතුරන් දිනූ, දනවුහි තහවුරු බවට පැමිණි, සත් රුවනින් සමන්වාගත වූ සක්විති රජෙක් වෙයි. සක්රුවන ඇත්රුවන අසරුවන මිණිරුවන ඉතිරිරුවන ගැහැවිරුවන සත් වනු පුත්රුවන ම යැයි ඔහුට මේ සත් රුවන් කෙනෙක් වෙත්.

පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අඛිලමනිමිත්තමකණ්ටකං ඉද්ධං ඵීතං ඛෙමං සිවං නිරබ්බුදං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන සමෙන අභිවිජිය අජ්ඣාවසති. රාජා සමානො කිං ලභති? අවික්ඛම්භියො හොති කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පච්චාමිත්තෙන. රාජා සමානො ඉදං ලභති. සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවට්ටච්ඡදෙ. බුද්ධො සමානො කිං ලභති? අවික්ඛම්භියො[1] හොති. අබ්භන්තරෙහි වා බාහි රහි වා පච්චත්ථිකෙහි පච්චාමිත්තෙහි රාගෙන වා දොසෙන වා මොහෙන වා සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා අවොච.

තත්ථෙතං වුච්චති:

සච්චෙ ච ධම්මෙ ච දමෙ ච සංයමෙ
සොචෙය්‍යසීලාලයුපොසථෙසු ච,
දානෙ අහිංසාය අසාහසෙ රතො
දළ්හං සමාදාය සමත්තමාචරි[2]

සො තෙන කම්මෙන දිවං අපක්කමි[3]
සුඛං ච ඛිඩ්ඩාරතියො ච අන්වභි
තතො චවිත්වා පුනරාගතො ඉධ
සමෙහි පාදෙහි ඵුසී වසුන්ධරං.

බ්‍යාකංසු වෙය්‍යඤ්ජනිකා සමාගතා
සමප්පතිට්ඨස්ස න හොති ඛම්භනා,
ගිහිස්ස වා පබ්බජිතස්ස වා පුන[4]
තං ලක්ඛණං භවති තදත්ථජොතකං.

අක්ඛම්භියො හොති අගාරමාවසං
පරාභිභූ සත්තුභී සත්තුමද්දනො,
මනුස්සභූතෙනිධ හොති කෙනචි
අක්ඛම්භියො තස්ස ඵලෙන කම්මුනො

1. අකම්පියො – මජසං
2. සමත්තමාචරි – සයා. කම්.
3. සමක්කමි.– මජසං
4. බිත – සයා.

ශූර වූ, වීර අඟ රුවැති, සතුරු සෙන් මඩිනුයෙහි බුහුටි, අයිරාදහස් පුත් කෙනෙක් ඔහුට වෙත්. හේ සයුර හිම කොටැති, සතුරන් නමැති හුල් නැති, උවදුරට කරුණු නැති, සතුරන් නමැති කටු නැති (නොහොත් සොරුන් සතුරන් නැති), සමෘද්ධ වූ සැපතින් පිරුණු, බිය රහිත, උවදුරු නැති, සොර සතුරු කැලැල් නැති මේ පොළොව දඬුයෙන් අවියෙන් තොර වැ දැහැමෙන් අත්පත් කොට ගෙන, නායක වැ වෙසෙයි. හෙ තෙමෙ රජ වන්නේ කුමක් නම් ලබා ද? හේ මිනිස් වූ කිසිදු සතුරු පසමිතුරක්හු විසින් නො මැඩැ ලියැ හැක්කේ වෙයි. රජ වනුයේ හේ මේ අනුසස් ලබයි. ඉදින් හෙ තෙමෙ ගිහි ගෙන් නික්මැ පැවිදි වන්නේ නම්, රහත් වූ ලොවැ සිඳ පෙරළා හළ කෙලෙස් සෙවෙණි ඇති සම්මා සම්බුදුවරයෙක් වෙයි. හේ බුදු වූයේ ම කුමක් නම් ලබා ද? ඇතුළතැ හෝ බැහැරතැ සිටි සතුරන් විසින්, පසමිතුරන් විසින් රාගයෙන් හෝ ද්වෙෂයෙන් හෝ මෝහයෙන් හෝ මහණක්හු විසින් හෝ බමුණක්හු විසින් හෝ දෙවියක්හු විසින් හෝ මරක්හු විසින් හෝ බඹක්හු විසින් හෝ ලොවැ කිසිදු එකක්හු විසින් මැඩැලියැ නොහැක්කේ වෙයි. බුදු වූයේ ම මේ අනුසස් ලබයි.

භගවත්හු මෙ කරුණ වදළහ. එහි මේ අර්ථය ම ගාථාබන්ධනයෙන් කියනු ලැබේ:[1]

“හෙ තෙම සබවස්හි ද දස අකුසල්දහම්හි ද ඉඳුරන් දමනුයෙහි ද සිල් හැවුරුමෙහි ද ඈන්දෙරින් පිවිතුරු බව්හි ද සිල්රැක්මෙහි ද පෙහෙවස් වුසුම්හි ද දීමෙහි ද මෙරමා නොපෙළීමෙහි ද රෞද්‍ර නොවූ ක්‍රියාහි ද ඇලුණේ එය තරයේ සමාදන් ව ගෙන, නිමාවට ම පිරී ය.

හේ ඒ කුසල් කම්න් දෙව්ලෝ පැමිණියේ ය. සැප ද කෙළිසුව ද පස්කම් ද හේ වැළැඳූයේ ය. එයින් සැව නැවැත මෙහි ආයේ, සම දෙපත්ලෙන් පොළොව පැහැයි

රජගෙට සපැමිණි ගත ලකුණු කියන බමුණෝ “සම ලෙස බිමැ පිහිටුනා පතුල් ඇතියහු ගේ සිටි තැනින් සැලීමෙක් නොවෙයි”ද, “ඒ සුපිහිටි පා ලකුණ ගිහියකු හෝ පැවිද්දකු හෝ පිළිබඳ වූ ඒ අරුත පවසනුයේ වෙ යැ”යි ද පැවැසූහ.

හේ ගිහි ගෙහි වසන්නේ නම්, සතුරන් විසින් නො මැඩැලියැ හැකි, අනුන් මැඩැ පවත්වනුයෙහි සමත්, සතුරන් මඩනා සක්විත්තෙක් වෙයි. ඒ කම්හුගේ ඵලයෙන් මිනිස් වූ කිසිවකු විසිනුත් සෙලැවියැ නො හැක්කේ වෙයි.

1. මේ ගාථාබන්ධන අනඳතෙරුන් ගේ යැ අටුවා ඇදුරෝ කීහ.

සචෙ ච පබ්බජ්ජමුපෙති තාදිසො
නෙක්ඛම්මඡන්දාභිරතො විචක්ඛණො,
අග්ගො න සො ගච්ඡති ජාතු භබ්බතං
නරුත්තමො එසහි තස්ස ධම්මතා'ති.

### පාදතලෙසු චක්කලක්ඛණං (2)

4. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො බහුජනස්ස සුඛාවහො අහොසි, උබ්බෙගං උත්තාසං භයං අපනුදිතා ධම්මිකං ච රක්ඛාවරණගුත්තිං සංවිධාතා සපරිවාරං ච දානං අදාසි, සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති, හෙට්ඨා පාදතලෙසු චක්කානි ජාතානි හොන්ති සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි සුවිභත්තන්තරානි. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? මහාපරිවාරො හොති, මහා'ස්ස හොන්ති පරිවාරා බ්‍රාහ්මණගහපතිකා නෙගමජානපද ගණකා මහාමත්තා. අනීකට්ඨා දෙවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො භොගියා කුමාරා. රාජා සමානො ඉදං ලභති.

සචෙ අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡදො. බුද්ධො සමානො කිං ලභති? මහාපරිවාරො හොති, මහා'ස්ස හොන්ති පරිවාරා භික්ඛු භික්ඛුනියො උපාසකා උපාසිකායො දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා ආවොච තත්ථෙතං වුච්චති:

පුරෙ පුරත්ථා පුරිමාසු ජාතිසු
මනුස්සභූතො බහුනං සුඛාවහො,
උබ්බෙගඋත්තාසභයාපනූදනො
ගුත්තිසු රක්ඛාවරණෙසු උස්සුකො.

සො තෙන කම්මෙන දිවං සමක්කමි
සුඛඤ්ච ඛිඩ්ඩා රතියො ච අන්වභී,
තතො චවිත්වා පුනරාගතො ඉධ
චක්කානි පාදෙසු දුවෙසු වින්දති
සමන්තනෙමීනි සහස්සරානි ච.

එ බඳුවූ ඒ කුමාරයා ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම්, ලොවට අගපත් වූයේ, හැම සත්නට උතුම් වූයේ, කිසි කලෙකත් මෙරමා ගෙන් සැලෙන බවට නොපැමිණෙයි. මෙ ඒ මහාපුරිස්හු පිළිබඳ ධර්මතා යි.

## පාදතලයන්හි චක්‍රලක්ෂණ (2)

4. මහණෙනි, තථාගත තෙම පෙර දැහි පෙර බෙවෙහි, පෙර වුසු තන්හි, පෙර මිනිස් වූයේ ම උද්වෙග (සොර ආදීන්ගෙන් වන) බිය ද, උත්‍රාස (යක් ආදීන්ගෙන් වන උවදුරු) බිය ද දුරලනුයේ දැහැමි රකවරණ සලසනුයේ බොහෝ දෙනාගේ සුව පහසුව පිණිස වූයේ ය, පිරිවර සහිත ව දන් දුන්නේ ය යන යමෙක් ඇද්ද, හෙ තෙමෙ ඒ කම් කළ බැවින්, පුනදූනා කළ බැවින්, ඒ කර්මයාගේ උත්සන්න බැවින් අප්‍රමාණ බැවින් කාබුත් මරණින් මතු මනා ගති ඇති සග ලොව උපදී...හේ එයින් සැව, මෙ මිනිස් බවට ආයේ ම, මේ මහපුරිස් ලකුණ ලබයි. ඔහුගේ යැටි පතුල්හි දහසක් දැවි ඇති, නිම් වළලු සහිත, නැබ සහිත, හැම අයුරින් පිරිපුන්, මොනොවට බෙදුණු අතර ඇති, සක්ලකුණු පහළ වූවෝ වෙත්. ඒ ලකුණෙන් සමන්විත හෙ තෙමෙ ඉදින් ගිහි ගෙහි වසන්නේ නම්... සක්විති රජ වෙයි. රජ වූයේ ම කුමක් ලබා ද? මහ පිරිවර ඇත්තේ වෙයි. ඔහුගේ ඒ පිරිවර බමුණන් හා ගැහැවියෝ ය, නිගම්වැස්සන් හා දනවු වැස්සෝය, ගණක-යන් (රජුගේ අයවැය ගණින්නන්) හා මහ ඇමැත්තෝ ය, සෙනඟ රක්නා ඇමැත්තෝ ය, දෙරටු පල්ලෝ ය, පිරිස ද (පරපුරෙන් ම රජ පිරිසැ වූ) ඇමැතියෝ ය, රජ දරුවෝ ය, ගම් මුදලියෝ ය, රජකුමරහු ය යන මහත් පිරිවර ඔහුට වෙයි. රජ වන්නේ හේ මෙකී දැ ලබයි.

ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ නම්, ලොවැ පෙරළු කෙලෙස් සෙවෙණි ඇති රහත් සම්මාසම්බුද්ධවරයෙක් වෙයි. බුදු වනුයේ කුමක් ලබා ද? මහපිරිවර ඇත්තේ වෙයි. මහණහුය, මෙහෙණියෝ ය, උවසු-වෝ ය, උවැසියෝ ය, දෙව්හු ය, මිනිස්සු ය, අසුරයෝ ය, නාගයෝ ය, ගඳෙවුහු යැ යි මහ පිරිවර ඔහුට වෙයි. බුදු වනුයේ මෙය ලබයි. භාග්‍ය-වතුන් වහන්සේ මෙ කරුණ වදාළසේක. එහි ගාථා බන්ධන වශයෙන් මෙය කියනු ලැබේ:

"පෙර බොහෝ පූර්ව කාලයෙහි පළමු ජාතීන්හි දී මිනිස් වූයේ, බොහෝ දෙනාට සුව එළැවි ය. උද්වෙග උත්‍රාස නිසා උපදනා බිය දුරු කරන්නේ විය. ගොපනයෙහි ද රක්ෂාවරණයෙහි ද උත්සුක විය.

හේ ඒ කර්මයෙන් දෙව්ලෝ ගියේ ය. දෙව්ලෝ සුව ද දිව්‍ය ක්‍රීඩා හා පංචකාම රතීන් ද වින්දේ ය, එයින් සැව, නැවැත මෙහි ආයේ, හාත්පස නිම්වළලු ඇති, දහසක් දැවි ආදිය ඇති සක් ලකුණු දෙපත්-ලෙහි ලබයි.

බ්‍යාකංසු වෙය්‍යඤ්ජනිකා සමාගතා,
දිස්වා කුමාරං සතපුඤ්ඤලක්ඛණං
පරිවාරවා හෙස්සති සත්තුමද්දනො
තථා හි චක්කානි සමන්තනෙමීනි.

සචෙ න පබ්බජ්ජමුපෙති තාදිසො,
වත්තෙති චක්කං පථවිං පසාසති
තස්සානුයුත්තා'ධ[1] භවන්ති ඛත්තියා
මහායසං සම්පරිවාරයන්ති නං.

සචෙ ච පබ්බජ්ජමුපෙති තාදිසො,
නෙක්ඛම්මඡන්දාභිරතො විචක්ඛණො
දෙවා මනුස්සා සුරයක්ඛ[2]රක්ඛසා
ගන්ධබ්බනාගා විහගා චතුප්පදා
අනුත්තරං දෙවමනුස්සපූජිතං
මහායසං සම්පරිවාරයන්ති නන්ති.

### ආයතපණ්හිතාදීනි තීණි ලක්ඛණානි (3-5)

5. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො පාණාතිපාතං පහාය පාණාති-පාතා පටිවිරතො අහොසි, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහාසි, සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි තීණි මහාපුරිසලක්ඛණානි පටිලභති, ආයතපණ්හි ච හොති දීඝඞ්ගුලි ච බ්‍රහ්මුජ්ජුගත්තො ච. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො, සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? දීඝායුකො හොති චිරට්ඨිතිකො, දීඝමායුම්පාලෙති. න සක්කා හොති අන්තරා ජීවිතා වොරොපෙතුං කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පච්චාමිත්තෙන. රාජා සමානො ඉදං ලභති -පෙ- බුද්ධො සමානො කිං ලභති? දීඝායුකො හොති චිරට්ඨිතිකො, දීඝමායුම්පාලෙති, න සක්කා හොති අන්තරා ජීවිතා වොරොපෙතුං පච්චත්ථිකෙහි පච්චාමිත්තෙහි සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා ආවොච. තත්ථෙතං වුච්චති:

---

1. තස්සානුයුත්තා ච – මජසං
2. සත්ත (කම)

(රජගෙට රැස්වූ නිමිත්තපාඨක බමුණෝ සිය පින් ලකුණු ඇති, කුමරහු දැක, මෙ තෙම මහත් පිරිවර ඇති, සතුරන් මඩින සක්විති රජෙක් වන්නේ ය. එසේ හෙයින් ම එයට පෙර නිමිති විසින් පතුල්හි හාත්පස නිමවළලු ඇති සක්ලකුණු ඇත.

ඉදින් එබඳු තැනැත්තේ පැවිද්දට නො පැමිණේ නම්, අණසක පවත්වයි, පෘථිවියට අනුශාසන කෙරේ. ඔහුට මෙහි ක්ෂත්‍රියයෝ අනු-යුක්ත වෙත්. මහත් යශස් ඇත්තාහු ඔහු හාත්පස පිරිවරත්.

ඉදින් නෛෂ්කාම්‍යඡන්දයෙහි ඇලුණු එබඳු ඒ නුවණැත්තේ පැවිදි බවට පැමිණෙන්නේ නම්,දෙවියෝ ද මිනිස්සු ද අසුරයෝද යක්ෂයෝද රකුසෝ ද, ගන්ධර්වයෝ ද, නාගයෝ ද, පක්ෂිහු ද, සිවුපාවෝ ද අනුත්තර වූ දෙව්-මිනිසුන් විසින් පුදන ලද මහත් යසස් ඇති ඔහු පිරිවරත්.

## ආයතපණ්හිතාදි තුන් ලකුණු (3,4,5)

5. මහණෙනි, තථාගත තෙමේ පළමු ජාතීන්හි, පෙර සසරෙහි, පෙර වුසූ තන්හි පෙර මිනිස් වූයේ ම ප්‍රාණඝාතය හැර, ප්‍රාණඝාතයෙන් වැළැක්කේ වී ය, බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද ශස්ත්‍ර ඇත්තේ, පණිවායෙහි ලජ්ජා ඇත්තේ, සත්‍වයන් කෙරෙහි දයායෙන් යුක්ත වූයේ, සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති වැ විසී ය යන යමෙක් ඇද්ද, හෙ තෙමෙ ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්,උත්සන්න බැවින්, අප්‍රමාණ බැවින්, කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට පැමිණෙයි. හේ එයින් සැව, මෙ මිනිස්බවට පැමිණියේ ම, මෙ මහ පුරිස් ලකුණු තුන ලබයි. හේ දික් විලුම් ඇත්තේ වෙයි, දිගැඟිලි ඇත්තේ ද වෙයි, බඹහට බඳු සෘජු ශරීරය ඇත්තේ වෙයි. ඒ ලක්ෂණ-යන්ගෙන් සමන්විත වූ හෙ තෙමෙ ඉදින් ගිහි ගෙහි වසන්නේ නම්,...... සක්විති රජෙක් වෙයි. රජ වනුයේ කුමක් ලබා ද? හේ බොහෝ කල් ජීවත් වනුයේ දීර්ඝායුෂ්ක වෙයි. දීර්ඝ ආයුෂයක් රක්ෂා කෙරෙයි. මනුෂ්‍ය වූ කිසි සතුරකු විසින් පසමිතුරකු විසින් අතර දිවියෙන් තොර කරන්නට නො හැකි වෙයි. රජ වනුයේ මෙය ලබයි... බුදු වනුයේ කුමක් ලබා ද? බොහෝ කල් ජීවත් වනුයේ දීර්ඝායුෂ්ක වෙයි, දීර්ඝ ආයුෂ පාලනය කෙරෙයි. කිසි සතුරු පසමිතුරු මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවකුදු විසින් අතර දිවියෙන් තොර කරන්නට නො හැකි වෙයි. බුදු වන්නේ මෙය ලබයි.''

මරණවධ[1]භයත්තනො විදිත්වා
පටිවිරතො පරමාරණාය හොසි[2]
තෙන සුචරිතෙන සග්ගමගමා[3]
සුකතඵලවිපාකමනුභොසි.

චවිය පුනරිධාගතො සමානො
පටිලභති ඉධ තීණි ලක්ඛණානි,
භවති විපුලදීඝපාසණ්හිකො
බ්‍රහ්මා'ව සුජු සුභො සුජාතගත්තො.

සුභුජො සුසු සුසණ්ඨිතො සුජාතො
මුදුතළුණඞ්ගුලියස්ස හොන්ති දීඝා,
තිහි පුරිසවරග්ගලක්ඛණෙහි
චිරයපනාය[4]කුමාරමාදිසන්ති.

භවති යදි ගිහී චිරං යපෙති
චිරතරං පබ්බජති යදි තතො හි
යාපයති වසිද්ධි භාවනාය
ඉති දීඝායුකතාය තන්නිමිත්තන්ති.

### සත්තුස්සදතාලක්ඛණං (6)

6. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො දාතා අහොසි පණීතානං රසිතානං ඛාදනීයානං භොජනීයානං සායනීයානං ලෙහනීයානං පානානං, සො තස්ස කම්මස්ස කතත්තා –පෙ– තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති, සත්තුස්සදො හොති. සත්තස්ස උස්සදා හොන්ති: උභොසු හත්ථෙසු උස්සදා හොන්ති, උභොසු පාදෙසු උස්සදා හොන්ති, උභොසු අංසකූටෙසු උස්සදා හොන්ති, ඛන්ධෙ උස්සදා හොන්ති සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති –පෙ– රාජා සමානො කිං ලභති? ලාභී හොති පණීතානං රසිතානං ඛාදනීයානං භොජනීයානං සායනීයානං ලෙහනීයානං පානානං. රාජා සමානො ඉදං ලභති. බුද්ධො සමානො කිං ලභති? ලාභී හොති පණීතානං රසිතානං ඛාදනීයානං භොජනීයානං සායනීයානං ලෙහනීයානං පානානං. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

---

1. මරණ (මජසං)
2. මාරණාය හොති (මජසං)
3. තෙන සො සුචරිතෙන සග්ගමගමායි (ස්‍යා)
4. චිරයාපනාය (ස්‍යා)

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදාළ සේක. එහි මෙය ගාථායෙන් මෙසේ කියනු ලැබේ:

'තමහට මරණ වධයෙන් උපන් බිය දැන, මෙරමා නැසීමෙන් වැළැක්කේ විය. ඒ කුශලකර්මයෙන් ස්වර්ගයට පැමිණියේ ය. කුශල කර්මයාගේ ඵලවිපාකය අනුභව කෙළේ ය.

දෙව්ලොවින් සැව, නැවැත මෙහි ආයේ ම, ලක්ෂණ තුනක් ලබයි. මහත් වූ දික් විලුම් ඇත්තේ වෙයි. බඹහු මෙන් මොනොවට සෘජු වූයේ ශොභන වෙයි, මොනොවට උපන් ගාත්‍ර ඇත්තේ වෙයි.

යහපත් බාහු ඇත්තේ, තරුණ වූයේ, මනා සටහන් ඇත්තේ, මොනොවට උපන්නේ වෙයි, ඔහුගේ මොළොක් තරුණ ඇඟිල්ලෝ දික් වෙත්. මෙකී ශ්‍රෙෂ්ඨ වූ තුන් මහ පුරිස් ලකුණින් කුමරහු බොහෝ කල් ජීවත් වනු පිණිස (සමතක්හු කොට) නිමිත්තපාඨකයෝ දක්වත්.

ඉදින් ගිහි වන්නේ නම්, බොහෝ කල් ජීවත් වේ. ඉදින් පැවිදි වන්නේ නම්, වශිතාප්‍රාප්ත වූයේ, ඍද්ධි භාවනායෙන් යුක්ත වූයේ, එයට වඩා බෝකල් ජීවත් වෙයි. මෙසේ දීර්ඝායුෂ්ක බවට ඒ ලකුණැ යි කීහ.

### සප්තෝත්සද ලක්ෂණ (6)

6. මහණෙනි, තථාගත තෙමේ පෙර දැහි, පෙර සසරෙහි, පළමු වුසූ තන්හි, පෙර මිනිස් වූයේ ම ප්‍රණීත වූ රසවත් වූ කෑ යුතු දෑ ද, බුදියැ යුතු දෑ ද, රස වින්ද යුතු දෑ ද. ලෙවියැ යුතු දෑ ද, අෂ්ට පානයන් ද දෙන්නේ විය යන යමෙක් ඇද්ද, හේ ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්, ඒ කර්මයා ගේ උත්සන්න බැවින්, මහත් බැවින්, කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට පැමිණෙයි.... හේ එයින් සැව මේ මිනිස් බවට පැමිණියේ ම මෙ මහ පුරිස්ලකුණ ලබයි: සත් තැනෙක උත්සන්න වෙයි: සත් තැනෙක්හි පිරිපුන් මස් ඇති වෙයි: දෙ පිටු අත්ලෙහි පිරිපුන් මස් ඇති වෙයි. දෙ පිටු පතුල්හි පිරිපුන් මස් ඇති වෙයි, දෙ උරහිස්හි පිරිපුන් මස් ඇති වෙයි, කරෙහි පිරිපුන් මස් ඇති වෙයි. හෙ තෙමේ ඒ[3] සප්ත උත්සද ලක්ෂණයෙන් සමන්විත වූයේ, ඉදින් ගිහි ගෙහි වෙසේ නම්,... සක්විති රජ වෙයි. රජ වන්නේ මෙය ලබයි. ප්‍රණීත වූ රසවත් වූ ඛාද්‍ය භොජ්‍ය ලෙහ්‍ය පෙයයන් ලබන සුලු වෙයි. රජ වනුයේ මෙය ලබයි. බුදු වනුයේ කුමක් ලබා ද? ප්‍රණීත වූ රසවත් වූ ඛාද්‍ය භොජ්‍ය ලෙහ්‍ය පෙයයන් ලබන සුලු වෙයි. බුදු වනුයේ මෙය ලබයි. භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදාළ සේක. එහි ගාථාබන්ධනයෙන් මෙය කියනු ලැබෙයි:

ඛජ්ජභොජ්ජං අථ ලෙය්‍යසායියං
උත්තමග්ගරසදායකො අහු.
තෙන සො සුචරිතෙන කම්මුනා
නන්දනෙ චිරමභිප්පමොදති.

සත්තචුස්සදෙ ඉධාධිගච්ඡති
හත්ථපාදමුදුතඤ්ච වින්දති,
ආහු බ්‍යඤ්ජනනිමිත්තකොවිද
ඛජ්ජ භොජ්ජ රසලාභිතාය නං.

තං ගිහිස්සපි තදත්ථජොතකං
පබ්බජම්පි ච තදධිගච්ඡති,
ඛජ්ජභොජනස්ස ලාභිරුත්තමං
ආහු සබ්බගිහිබන්ධනච්ඡිදන්ති.

### කරචරණමුදුතාජාලතාලක්ඛණානි (7-8)

7. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො චතූහි සඞ්ගහවත්ථූහි ජනං සඞ්ගාහකො අහොසි දානෙන පෙය්‍යවජ්ජෙන[1] අත්ථචරියාය සමානත්තතාය, සො තස්ස කම්මස්ස කතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහාපුරිසලක්ඛණානි පටිලභති, මුදුතලුණ-හත්ථපාදො ච හොති ජාලහත්ථපාදො ච. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො, සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? සුසඞ්ගහිතපරිජනො හොති, සුසඞ්ගහිතාස්ස හොන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමජානපද ගණකා මහාමත්තා අනීකට්ඨා දොවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො භොගියා කුමාරා. රාජා සමානො ඉදං ලභති. බුද්ධො සමානො කිං ලභති? සුසඞ්ගහිතපරිජනො හොති, සුසඞ්ගහිතා'ස්ස හොන්ති භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

දානම්පි චත්ථචරියතඤ්ච[2]
පියවදනංච සමානඡන්දතංච[3]
කරිය චරිය සුසඞ්ගහං බහූනං[4]
අනවමතෙන ගුණෙන යාති සග්ගං.

1. පියවාචෙන (සයා කම)
2. දානම්පි ච අත්ථචරියතම්පි ච (PTS)
3. පියවාදිතං ච සමානත්තතං ච (මජසං)
4. බහූනං (මජසං)

'ලොකොත්තම තෙමේ ඛාද්‍ය භොජ්‍ය ලෙහ්‍ය ඝවාද්‍ය යන අග්‍ර රස දෙන්නේ විය. හේ ඒ කුශල කර්මයෙන් බොහෝ කල් නන්‍දනුයනෙහි වෙසෙසින් ප්‍රමුදිත වෙයි.

මෙහි උත්සන්න වූ සත් තැනක් ලබයි. මෘදු වූ අතුල් පතුල් ද ලබයි. ඛාද්‍ය භොජ්‍ය රස ලබන බවට එය ලකුණෙකැ'යි ලක්ෂණ ශාස්ත්‍රඥයෝ කිහ.

ඒ ලක්ෂණය ගිහියාටත් ඒ අර්ථය ප්‍රකාශ කරන්නේ වෙයි. පැවිදි වන්නේ ද එය ලබයි. එය උතුම් ඛාද්‍ය භොජ්‍ය රස ලබන සුලු, සියලු ගිහිබැඳුම් සිඳිනා කෙනකු පවසයි.

## කරවරණමෘදුතාජාලතාලක්ෂණ (7 - 8)

7. මහණෙනි, තථාගත තෙමේ පළමු දැහි පළමු අත්බවහි, පළමු වාසස්ථානයන්හි පෙර මිනිස්වූයේ ම, දානයෙන් ප්‍රිය වචනයෙන් අර්ථචර්‍ය්‍යායෙන් සමානාත්මතායෙන් යන සතර සංග්‍රහ වස්තූන් ගෙන් ජනයාට සංග්‍රහ කරන්නේ විය යන යමෙක් ඇද්ද, හේ ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්, ඒ කර්මයාගේ උත්සන්න බැවින්, මහත් බැවින්, කාබුන් මරණින් මතු, මනා ගති ඇති සග ලොවට පැමිණෙයි. හේ එයින් සැව, මෙ මිනිස්බවට ආයේ ම මේ මහපුරිස් ලකුණු දෙක ලබයි: හේ මොළොක් තරුණ අතුල් පතුල් ඇත්තේ ද දැල් කවුළුවකට බඳු අත් පා ඇත්තේ ද වෙයි. හේ ඒ ලකුණුවලින් සමන්විත වූයේ, ඉදින් ගිහි ගෙයි වසන්නේ නම්... සක්විති රජ වෙයි. රජ වන්නේ කුමක් ලබයි ද? (සිවු සඟරා වතින්) මොනොවට සංග්‍රහ කරන ලද පිරිවර ජනයා ඇත්තේ වෙයි. ඔහු විසින් බමුණු ගැහැවි ජනයෝ ද, නිගම් වැසි දනවු වැසි ජනයෝ ද, අයවැය ගණන් කරන්නෝ ද, මහා මාත්‍රයෝ ද, සෙනාධිගරක්නා හස්ත්‍යාචාර්‍ය්‍යාදීහු ද ඇමැතියෝ ද පරම්පරාගත වැ රජ පිරිසෙහි වූවෝ ද, රජහු ද, රජුන්ගෙන් ලත් භොග සම්පත් ඇත්තෝ ද, රජකුමරුවෝ ද යන මොහු හැම ඔහු විසින් මොනොවට සංග්‍රහ කරන ලද්දහු වෙත්. රජ වන්නේ මෙය ලබයි. බුදු වන්නේ කුමක් ලබා ද? යත්: මොනොවට සංග්‍රහ කරන ලද පරිවාර ජනයා ඇත්තේ වෙයි. ඔහු විසින් මහණහු ද මෙහෙණෝ ද උවසුවෝ ද උවැසියෝ ද දෙව්යෝ ද මිනිස්සු ද අසුරයෝ ද නාගයෝ ද ගන්ධර්වයෝ ද මෙ නොවට සංග්‍රහ කරන ලද්දහු වෙත්. බුදු වන්නේ මෙය ලබයි. භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදළ සේක. එහි එය මෙසේ ගාථායෙන් කියනු ලැබේ:

'හෙ තෙම දානය ද අර්ථචර්‍ය්‍යාව ද ප්‍රියවාදිතාව ද සමානාත්මතාව ද කොට බොහෝ දෙනාට මැනැවින් සංග්‍රහ කොට, අනින්දිත (ප්‍රශස්ත) ගුණ හෙයින් ස්වර්ගයට යෙයි.

වචීය පුනරිධාගතො සමානො
කරචරණමුදුතලඤ්ච ජාලිනො ච,
අතිරුචිරසුවග්ගුදස්සනෙය්‍යං
පටිලභති දහරො සුසු කුමාරො.

භවති පරිජනස්සවො විධෙය්‍යො
මහිම්ම මාවසතෙ[1] සුසඞ්ගහිතො,
පියවදූ හිතසුඛතං ජිගිංසමානො[2]
අභිරුචිතානි ගුණානි ආචරන්තො.[3]

යදි ච ජහති සබ්බකාමභොගං
කථයති ධම්මකථං ජිනො ජනස්ස,
වචනපටිකරස්සභිප්පසන්නා
සුත්වා ධම්මනුධම්මමාචරන්තී[4]ති

## උස්සඞ්ඛපාදඋද්ධග්ගලොමතාලක්ඛණානි (9-10)

8. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො බහුනො ජනස්ස අත්ථූපසංහිතං ධම්මූපසංහිතං වාචම්භාසිතා අහොසි, බහුජනං නිදංසෙසි, පාණීනං හිතසුඛාවහො ධම්මයාගී, සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහාපුරිස ලක්ඛණානි පටිලභති, උස්සඞ්ඛපාදො ච හොති උද්ධග්ගලොමො ච. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? අග්ගො ච හොති සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො ච කාමභොගීනං. රාජා සමානො ඉදං ලභති -පෙ- බුද්ධො සමානො කිං ලභති? අග්ගො ච හොති සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො ච සබ්බසත්තානං. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

අත්ථධම්මසංහිතං[5] පුරෙ ගිරං
එරයං බහුජනං නිදංසයී,
පාණීනං හිතසුඛාවහො අහු
ධම්මයාගමයජී[6] අමච්ඡරී.

1. මහිමං ආවයතෙ (සිමු. මජසං)
2. ජිගීසමානො (මජසං)
3. ආචරති (සිමු. මජසං)
4. සුත්වාන ධම්මානුධම්මං මාචරන්ති (මජසං)
5. අත්ථධම්මසංහිතං (කම්. PTS)
6. ධම්මයාගං අසසජී (කම්)

එයින් සැව නැවත මෙහි ආයේ ම ළදරු වූයේ, ඉතා සිවුමැලි වූයේ, ඉතා පැහැපත්, ඉතා මනොඥ, දක්‍ුම් කටයුතු, මොළොක් වූ අතුල් පතුල් ද ජාලලක්ෂණ ද ලබයි.

පිරිවර ජන තෙමේ කීකරු වේ. කටයුත්තෙහි මෙහෙයැවියැ හැකි වේ. මොනොවට සංග්‍රහ කරන ලද්දේ මෙ පොළොවෙහි වෙසෙයි. පිය බස් කියනනේ, හිත සුව සොයනුයේ, වෙසෙසින් සිත්කලු වූ ගුණයන් වඩන්නේ වෙයි.

ඉදින් සියලු පස්කම් සුව හරනේ නම්, පව් දිනුයේ (බුදු වූයේ) දහම් දෙසයි. උන්වහන්සේ ගේ දේශනාව අසා ඉතා පහන්වූවාහු, වචනය පිළිපදනාහු ධර්මානුධර්ම ප්‍රතිපත්ති පුරත්.

## උස්සංඛපාද උර්ධවාග්‍රලොමතා ලක්ෂණ (9,10)

8. මහණෙනි, "තථාගත තෙමේ පළමු දැහි, පළමු භවයෙහි, පළමු වුසූ තන්හි, පෙර මිනිස් වූයේ ම බොහෝ දෙනාට දෙලෝවැඩ ඇසුරු කළ, දශ කුශලකර්මපථ ඇසුරු කළ වචන කියන්නේ විය. බොහෝ දෙනාට දෙලෝ වැඩ දක්වී ය. සත්නට හිතසුව එළවනුයේ, ධර්මදානය කරන්නේ විය" යන යමෙක් ඇද්ද, ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්, ඒ කර්මයාගේ උත්සන්න බැවින්, මහත් බැවින්, කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට යෙයි... හේ එයින් සැව මේ මිනිස් බවට ආයේ ම මේ මහ පුරිස් ලකුණු දෙක ලබයි. මත්තෙහි වූ ගොප් ඇට ඇති පා ඇත්තේ ද, උඩුකුරු වූ අක් ඇති ලොම් ඇත්තේ ද වෙයි. හේ ලකුණුවලින් සමන්විත වූයේ, ඉදින් ගිහි ගෙහි වසන්නේ නම්... සක්විති රජ වෙයි... රජ වනුයේ කුමක් ලබා ද? සියලු සත්නට අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වෙයි. බුදු වනුයේ කුමක් ලබා ද? සියලු සත්නට ද අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වෙයි. බුදු වනුයේ මෙය ලබයි." භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළ සේක. එහි මෙය ගාථායෙන් මෙසේ කියනු ලැබේ:

"පෙර අර්ථ හා ධර්ම හා නිඃශ්‍රිත වූ වචන කියනුයේ, බොහෝ දෙනාට දෙලෝ වැඩ දක්වීය. ප්‍රාණීනට හිත සුව එළවන්නේ විය, නො මසුරු වැ ධර්මයාගය කෙළේ ය.

තෙන සො සුචරිතෙන කම්මුනා
සුගතිං වජති තත්ථ මොදති
ලක්ඛණානි ච දුවෙ ඉධාගතො
උත්තමප්පමුඛතාය[1] වින්දති.

උබ්භමුප්පතිතලොමවාසසො
පාදගණ්ඨිරහු සාධු සණ්ඨිතා,
මංසලොහිතා චිතා තචොත්ථටා
උපරිචරණා ච සොභනා[2] අහු.

ගෙහමාවසති චෙ තථාවිධො
අග්ගතං වජති කාමභොගිනං,
තෙන උත්තරිතරො න විජ්ජති
ජම්බුදීපමභිභුය්‍ය ඉරීයති.

පබ්බජම්පි ච අනොමනික්කමො
අග්ගතං වජති සබ්බපාණිනං,
තෙන උත්තරිතරො න විජ්ජති
සබ්බලොකමභිභුය්‍ය විහරතී'ති.

## එණිජඞ්ඝලක්ඛණං (11)

9. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො සක්කච්චං වාචෙතා අහොසි සිප්පං වා විජ්ජං වා චරණං වා කම්මං වා, 'කින්ති මෙ ඛිප්පං විජානෙය්‍යුං, කින්ති'මෙ ඛිප්පං පටිපජ්ජෙය්‍යුං න චිරං කිලිසෙය්‍යු'න්ති. සො තස්ස කම්මස්ස කතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉදං මහාපුරිසලක්ඛණං පටිලභති, එණිජඞ්ඝො හොති. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො, සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? යානි තානි රාජාරහානි රාජඞ්ගානි රාජූපභොගානි රාජානුච්ඡවිකානි, තානි ඛිප්පං පටිලභති රාජා සමානො ඉදං ලභති -පෙ- බුද්ධො සමානො කිං ලභති? යානි තානි සමණාරහානි සමණඞ්ගානි සමණූපභොගානි සමණානුච්ඡවිකානි, තානි ඛිප්පං පටිලභති. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

සිප්පෙසු විජ්ජාචරණෙසු කම්මසු[3]
කථං විජානෙය්‍යු[4] ලහුන්ති ඉච්ඡති.
යදූපඝාතාය න හොති කස්සචි
වාචෙති ඛිප්පං න චිරං කිලිස්සති.

---

1. උත්තම සුඛතාය (ස්‍යා. උත්තම පමුඛතාය (කම) උත්තමපමුඛතාය සුඛානි (සීමු)
2. උපරිජානු සොභිතා (ස්‍යා). පපරි ච පන සොභනා (PTS)
3. කම්මෙසු-(මජසං)
4. විජානෙය්‍යුං-(මජසං)

හෙ තෙමේ ඒ කුශලකර්ම බලයෙන් ස්වර්ගයට යෙයි, එහි සතුටු වෙයි මෙහි ආයේ උතුම් සැප ඇති වන බවට නිමිති වූ ලකුණු දෙකක් ලබයි.

හේ තෙමේ උඩට නැමුණු ලොම් ඇත්තේ වෙයි. පාගැට (ගොප් ඇට) මොනොවට පිහිටියේ වෙයි. ඔහුගේ කෙණ්ඩා ද මසින් ලෙයින් පිරුණාහු, සිවියෙන් වැසුණාහු ශොභන වෙත්.

ඉදින් එබඳු පුද්ගල තෙමේ ගෙහි වසන්නේ නම්, කාම අතුරෙහි අග්‍ර බවට යෙයි. ඔහුට වඩා උතුම් වූවක් ඇති නො වෙයි. දඹදිව (මහපොළොව) අභිභවා වෙසෙයි.

අලාමක විහරණ ඇති හෙ තෙමේ පැවිදි වන්නේ ද සියලු සත්නට අග් බවට යෙයි. ඔහුට වැඩිතරම කිසිවෙක් නොමැති වෙයි. හේ මුළු ලොව අබිබවා වෙසෙයි.

## ඒණිජඞ්ඝා ලක්ෂණය (11)

9. මහණෙනි, "තථාගත තෙම පෙර භවයෙහි පළමු වූසූ තන්හි පෙර මිනිස් වූයේ ම, කෙසේ නම් මොහු ශිල්ප ද විද්‍යා ද වරණ ධර්ම (ශීලය) ද කර්මස්වකතාව ද වහා දනගන්නාහු ද, කෙසේ නම් මොහු වහා ඒ දෑ පිළිපදනාහු ද, බොහෝ කල් නො වෙහෙසෙන්නාහු දැ යි ඒ ශිල්පාදිය සකසා කියවන්නේ විය" යන යමෙක් ඇද්ද හේ ඒ කර්මය කළ බැවින් කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට යෙයි... එයින් සැව මේ මිනිසත්බවට ආයේ ම මේ මහ පුරිස් ලකුණ ලබයි. ඕලු මුවන්ගේ බඳු කෙණ්ඩා ඇත්තේ වෙයි. එ ලකුණින් යුත් හෙ තෙම ඉදින් ගිහි ගෙහි වසන්නේ නම්... සක්විති රජ වෙයි... රජ වන්නේ කුමක් ලබා ද? රජක්හට සුදුසු වූ ඇත් අස් ආදි යාන ද, රජුනට අවයව වූ සේනා ද, රජුනට උපභොග වූ යම් දෑ ඇද්ද, රජුනට නිසි වූ තවත් යම් දෑ ඇද්ද, ඒ සියල්ල වහා ලබයි... බුදු වනුයේ කුමක් ලබන්නේ ද? ශ්‍රමණයනට සුදුසු වූ ශ්‍රමණාවයව වූ ශ්‍රමණයන් ගේ උපභොග පරිභොග වූ ශ්‍රමණයනට නිසි වූ යම් දෑ ඇද්ද, ඒවා වහා ලබයි. බුදු වනුයේ මෙය ලබයි. භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදළ සේක. එහි මෙය ගාථා බන්ධනයෙන් කියනු ලැබේ:

"ශිල්පයන්හි ද විද්‍යා හා චරණයන්හි ද කර්මස්වකතායෙහි ද කෙසේ වහා දන ගන්නේ දැ යි හේ කැමැති වෙයි. යමෙක් කිසිවකුගේත් විනාශය පිණිස නොවේ ද, යමක් උගන්නට බොහෝ කල් නො වෙහෙසෙන්නේ ද, එපරිද්දෙන් ඒ දෑ වහා උගනවයි.

තං කම්මං කත්වා කුසලං සුඛුද්‍රයං[1]
ජඞ්ඝා මනුඤ්ඤා ලභතෙ සුසණ්ඨිතා,
වට්ටා සුජාතා අනුපුබ්බමුග්ගතා
උද්ධග්ගලොමා සුඛුමත්තචොත්ථටා.

එණෙය්‍යජඞ්ඝො'ති තමාහු පුග්ගලං
සම්පත්තියා ඛිප්පමිදාහු ලක්ඛණං,
ගෙහානුලොම නි යදිච්ඡකඞ්ඛති
අපබ්බජං ඛිප්පමිධාධිගච්ඡති.

සචෙ ච පබ්බජ්ජමුපෙති තාදිසො
නෙක්ඛම්මඡන්දාභිරතො විචක්ඛණො,
අනුච්ඡවිකස්ස යදනුලොමිකං
තං වින්දති ඛිප්පමනොමවික්කමො'ති.[2]

### සුඛුමච්ඡවිලක්ඛණං (12)

10. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පරිපුච්ඡිතා අහොසි: කිං භන්තෙ කුසලං, කිං අකුසලං, කිං සාවජ්ජං, කිං අනවජ්ජං, කිං සෙවිතබ්බං, කිං නසෙවිතබ්බං, කිම්මෙ කරීයමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය අස්ස, කිං වා පන මෙ කරීයමානං දීඝරත්තං හිතාය සුඛාය අස්සා? ති. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉදං මහාපුරිසලක්ඛණං පටිලභති. සුඛුමච්ඡවි හොති සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උපලිප්පති. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො, සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? මහාපඤ්ඤො හොති, නාස්ස හොති කොචි පඤ්ඤාය සදිසො වා, සෙට්ඨො වා කාමභොගීනං. රාජා සමානො ඉදං ලභති -පෙ- බුද්ධො සමානො කිං ලභති? මහාපඤ්ඤො හොති පුථුපඤ්ඤො හාසපඤ්ඤො ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො. නාස්ස හොති කොචි පඤ්ඤාය සදිසො වා, සෙට්ඨො වා සබ්බසත්තානං. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

පුරෙ පුරත්ථා පුරිමාසු ජාතිසු
අඤ්ඤාතුකාමො පරිපුච්ඡිතා අහු,
සුස්සූසිතා පබ්බජිතං උපාසිතා
අත්ථන්තරො අත්ථකථං නිසාමයි.

---

1. සුඛිතද්‍රියං—(සම)
2. ඛිප්පමනොමනික්කමො—(සයා. PTS)

කුසල් වූ සුව වඩන ඒ කර්‍මය කිරීමෙන් මොනොවට පිහිටි, වට වූ, මනාසේ හටගත්, පිළිවෙළින් නැංගාවූ, සියුම් සිවියෙන් වැසුණු, මන වඩන ජඩසා (කෙණ්ඩා) ද, අක් උඩුකුරු ව සිටි රොම ද ලබයි.

(එසේ වූ) ඒ පුද්ගලයා එණෙයාජඩස (ඹුළුවන්ගේ කෙණ්ඩා බඳු කෙණ්ඩා ඇත්තේ) යැ යි ලක්‍ෂණපාඨකයෝ කීහු. ඒ ලක්‍ෂණය මෙහි දී වහා සම්පත් ලබනුවට නිමිත්ත යැ යි කීහු. පැවිදි නො වන්නේ යම් කලෙක ගිහිගෙට අනුලොම් වූ (සුදුසු වූ) දැ කැමැති වේ ද, එ කල එය ද මෙහි දී වහා ලබයි.

නෛෂ්කාම්‍ය ඡන්‍දයෙහි ඇලුණු නුවණැති අලාමක විහරණ ඇති එබඳු පුද්ගල තෙමේ ඉදින් පැවිදි වන්නේ ද, ඔහුට සුදුසු වූ අනුලොම් වූ යම් දෙයෙක් ඇද්ද, එය වහා ලබයි.

## සූක්‍ෂමච්ඡවිලක්‍ෂණය (12)

10. මහණෙනි, තථාගත තෙමේ පළමු දැහි, පළමු භවයෙහි, පළමු වුසූ තන්හි, පෙර මිනිස් වූයේ ම, මහණකු හෝ බමුණකු හෝ කරා එළැඹ "වහන්ස, කුසල් නම් කිම? අකුසල් නම් කිම? කිමෙක් වරද සහිත ද? කිමෙක් වරද රහිත ද? කිමෙක් සෙවියැ යුතු ද? කිමෙක් නො සෙවියැ යුතු ද? මා විසින් කිමෙක් කරනු ලබනුයේ බොහෝ කල් අහිත පිණිස දුක් පිණිස වන්නේ ද? මා විසින් කිමෙක් හෝ කරනු ලබනුයේ බොහෝ කල් හිත පිණිස සුව පිණිස වන්නේ ද?" පුන පුනා 'විචාරන්නෝ විය' යන යමෙක් ඇද්ද, හේ ඒ කර්‍මය කළ බැවින්, රැස් කළ බැවින් කාබුත්... මරණින් මතු මනා ගති ඇති සග ලොවට යෙයි... හේ එයින් සැව, මෙ මිනිස් බවට ආයේ ම, මේ මහ පුරිස් ලකුණ ලබයි. සියුම් සිවිය ඇත්තේ වෙයි. සිවිය සියුම් බැවින් රජස් දූලි කයෙහි නො ලැගෙයි. ඒ ලක්‍ෂණයෙන් යුත් හෙ තෙමේ ඉදින් ගිහි ගෙයි වසන්නේ නම්,... සක්විති රජ වෙයි. රජ වනුයේ කුමක් ලබයි ද? මහා ප්‍රඥා ඇත්තේ වෙයි. කාමභොගීන් අතුරෙහි ප්‍රඥායෙන් ඔහුට සමානයෙක් හෝ වැඩි තරම් වූයෙක් හෝ නො වෙයි. රජ වනුයේ මෙය ලබයි... බුදු වනුයේ කුමක් ලබයි ද? මහ නුවණැත්තේ වෙයි, (ස්කන්ධාදී නානාතන්හි) පැතිර පැවැති නුවණැත්තේ වෙයි, සතුට බහුල ව මගපල පසක් කරන නුවණැත්තේ වෙයි, ස්කන්ධාදියෙහි වහා දිවෙන නුවණැත්තේ වෙයි, තියුණු නුවණැත්තේ වෙයි, විනිවිද යන නුවණ ඇත්තේ වෙයි, සියලු සතුන් අතුරෙහි මොහුට නුවණින් සමාන හෝ විශිෂ්ට වූ කිසිවෙක් නො වෙයි. බුදු වනුයේ මෙය ලබයි.

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදළ සේක. එහි මෙය (ගාථායෙන්) කියනු ලැබෙයි:

පඤ්ඤාපටිලාභගතෙන[1] කම්මුනා
මනුස්සභූතො සුඛුමච්ඡවී අහු,
බ්‍යාකංසු උප්පාදනිමිත්තකොවිදා
සුඛුමානි අත්ථානි අවෙච්ච දක්ඛති.

සචෙ න පබ්බජ්ජමුපෙති තාදිසො
වත්තෙති චක්කං පථවිං පසාසති.
අත්ථානුසිට්ඨීසු පරිග්ගහෙසු ච
න තෙන සෙය්‍යො සදිසො ච විජ්ජති.

සචෙ ච පබ්බජ්ජමුපෙති තාදිසො
නෙක්ඛම්මඡන්දාභිරතො විචක්ඛණො,
පඤ්ඤාවිසිට්ඨං ලභතෙ අනුත්තරං
පප්පොති බොධිං වරභූරිමෙධසො'ති.

## සුවණ්ණවණ්ණතාලක්ඛණං (13)

11. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො අක්කොධනො අහොසි අනුපායාසබහුලො, බහුම්පි වුත්තො සමානො නාභිසජ්ජි, න කුප්පි, න බ්‍යාපජ්ජි නප්පතිත්ථියි, න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාත්වාකාසි. දාතා ච අහොසි සුඛුමානං මුදුකානං අත්ථරණානං පාවුරණානං[2] ඛොමසුඛුමානං කප්පාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති, සුවණ්ණවණ්ණො හොති කඤ්චනසන්නිභත්තචො. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො, සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති. -පෙ රාජා සමානො කිං ලභති? ලාභී හොති සුඛුමානං මුදුකානං අත්ථරණානං පාවුරණානං ඛොමසුඛුමානං කප්පාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං. රාජා සමානො ඉදං ලභති -පෙ- බුද්ධො සමානො කිං ලභති? ලාභී හොති සුඛුමානං මුදුකානං අත්ථරණානං පාවුරණානං ඛොමසුඛුමානං. කප්පාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

1. අක්කොධඤ්ච අධිට්ඨහි අදාසි[3]
දානඤ්ච වත්ථානි සුඛුමානි සුච්ඡවීනි.
පුරිමතරභවෙ ඨිතො'භිවිස්සජි[4]
මහිමිව සුරො අභිවස්සං,

1. පඤ්ඤාපටිලාභකතෙන-(PTS)
2. පාරවුණානං-(මජ්ඣං.)
3. අදසි ච-(PTS)
4. අභිවිස්සජි (මජ්ඣං.)

'පෙර ඉතා පෙර පළමු ජාතීන්හි දී, දනගනු කැමැත්තේ, ප්‍රශ්න පුළුවුස්නේ විය. ඇසියැටී වනුයේ පැවිද්දහු ඇසුරු කරන්නේ විය. අරුත් දන ගන්නා සිතැත්තේ අර්ථකථනය ඇසී ය. මිනිස් වූයේ, ප්‍රඥාව ලබනු පිණිස පැවැති කර්මයෙන් සියුම් සිවි ඇත්තේ විය, උත්පාද ශාස්ත්‍රයෙහි ද ලක්ෂණ ශාස්ත්‍රයෙහි ද දක්ෂ පඬිහු මෙ තෙම සියුම් අරුත් අවබොධකොට දක්නේ යැ යි පැවැසූහ.

එබඳු තැනැත්තේ ඉදින් පැවිද්දට නො පැමිණෙන්නේ නම්, අණ සක පවත්වයි, පොළොව පාලනය කෙරෙයි, අර්ථානුශාසනයන්හි ද, අර්ථනර්ථ පිරිසිඳ දන්මෙහි ද, උන්වහන්සේට වැඩිතරම් හෝ සමාන වූ හෝ එකෙක් නොමැති වෙයි.

එබඳු තැනැත්තේ නෙක්ඛම්මච්ඡන්දයෙහි ඇලුණේ, ඉදින් පැවිද්දට පැමිණෙන්නේ නම්, විශිෂ්ට ප්‍රඥාව ලබයි, උතුම් වූ මහත් නුවණැත්තේ නිරුත්තර බොධියට (සම්‍යක්සම්බුද්ධත්‍වයට) පැමිණෙයි.

### සුවණ්ණවණ්ණතාලක්ෂණය (13)

11. මහණෙනි, තථාගත තෙමේ පළමු දැහි, පළමු බෙවෙහි, පළමු වුසූ තන්හි පෙර මිනිස් වූයේ නොකිපෙන සුලු වූයේ, උපායාස බහුල කොට නැත්තේ විය. බොහෝ සේ ද කියන ලදුයේ ම ක්‍රොධ වශයෙන් නො ගැටුණේ ය, නො කිපුණේ ය, සිතැ කුණු ඇති බවට (ව්‍යාපාදයට) නො පැමිණියේ ය. ක්‍රොධය සිතැ නො පිහිටුවී ය, කෝපයත් ද්වෙෂයත් නොසතුටත් පහළ නො කළේ ය. සියුම් වූ මොළොක් වූ ඇතිරිලි ද, පොරෝනා ද, සියුම් කොමු පිළි ද සියුම් කපුපිළි ද සියුම් තිහිරි පිළි ද සියුම් පලස් ද දෙන්නේත් විය, යන යමෙක් ඇද්ද, හේ ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින් කාබුත් මරණින් මතු මනාගති ඇති සග ලොවට පැමිණියේ ය. එයින් සැව මෙ මිනිස් බවට ආයේ ම මෙ මහපුරිස් ලකුණ ලබයි. හේ රන්වන් වෙයි. රන් බඳු පැහැති සිවිය ඇත්තේ වෙයි. හේ ඒ ලකුණින් සමන්විත වූයේ ගිහිගෙහි වසන්නේ නම් සක්විති රජ වෙයි... රජ වනුයේ කුමක් ලබයි ද? සියුම් වූ මොළොක් වූ ඇතිරිලි ද පිළි ද සියුම් තිහිරි පිළි ද සියුම් පලස් ද ලබන්නේ වෙයි. රජ වනුයේ මෙය ලබයි. ...බුදු වනුයේ කුමක් ලබයි ද? සියුම් වූ මොළොක් වූ ඇතිරිලි ද පොරෝනා ද සියුම් කොමු පිළි ද සියුම් සියුම් කොමු පිළි ද, සියුම් කපු පිළි ද, සියුම් තිහිරි පිළි ද සියුම් පලස් ද ලබන්නේ වෙයි. බුදු වනුයේ මෙය ලබයි.'' භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ වදළ සේක. එහි මෙය ගාථායෙන් කියනු ලැබේ.

'පළමු බෙවෙහි සිටියේ අක්‍රොධය ද ඉටී ය, පොළොව තෙමන මෙසය මෙන් දන් ද දුන්නේ ය. සියුම් වූ මනා පැහැති වස්ත්‍ර ද දුන්නේ ය.

2. තං කත්වාන ඉතො චුතො දිවං
උපපජ්ජ[1] සුකතඵලවිපාකමනුභුත්වා,
කනකතනුසන්නිභො ඉධාභිභවති
සුරවරතරොරිව ඉන්දො.

3. ගෙහමාවසති නරො අපබ්බජ්ජ
මිච්ඡාමහතිමහිං අනුසාසති
පසය්හ ස හි ච සත්තරතනං
පටිලභති විමල[2] සුඛුමච්ඡවිං සුචිඤ්ච

4. ලාභී අච්ඡාදනවත්ථමොක්ඛපාපුරණානං[3]
භවති සදි අනාගාරියතං උපෙති.
ස හි[4] පුරිමකතඵලං අනුභවති
න භවති කතස්ස පනාසො'ති.

### කොසොහිතවත්ථගුය්හතාලක්ඛණං (14)

12. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමංභවං පුරිමං නිකෙතං පුබ්බෙමනුස්සභූතො සමානො චිරප්පනට්ඨෙ සුචිරප්පවාසිනො ඤාති මිත්තෙ සුහජ්ජෙ සඛිනො සමානෙතා අහොසි, මාතරම්පි පුත්තෙන සමානෙතා අහොසි පුත්තම්පි මාතරා සමානෙතා අහොසි, පිතරම්පි පුත්තෙන සමානෙතා අහොසි, පුත්තම්පි පිතරා සමානෙතා අහොසි, භාතරම්පි භාතරා සමානෙතා අහොසි, භාතරම්පි භගිනියා සමානෙතා අහොසි, භගිනිම්පි භාතරා සමානෙතා අහොසි, සමඞ්ගීකත්වා ච අබ්භනුමොදිතා අහොසි, සො තස්ස කම්මස්ස කතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉදං මහාපුරිසලක්ඛණං පටිලභති, කොසොහිතවත්ථගුය්හො හොති සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? පහූතපුත්තො හොති, පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා රාජා සමානො ඉදං ලභති. -පෙ- බුද්ධො සමානො කිං ලභති? පහූතපුත්තො හොති අනෙකසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා අවොච තත්ථෙතං වුච්චති:

පුරෙ පුරත්ථා පුරිමාසු ජාතිසු
චිරප්පනට්ඨෙ සුචිරප්පවාසිනො,
ඤාතී සුහජ්ජෙ සඛිනො සමානයී
සමඞ්ගිකත්වා[5] අනුමොදිතා අහු

1. උපපජ්ජි-(මජසං)
2. විපුල-(ස්‍යාම) විපුලං-(PTS)
3. පාවුරණානං- (මජසං)
4. සාහිතො-(මජසං)
5. සමග්ගිං කත්වා-(ස්‍යා PTS)

ඒ කර්මය කොට මෙයින් සැව, දෙව්ලෝ පැමිණ, කුසල් පල විඳ, මෙ ලොවහි දී දෙවියනට ශ්‍රේෂ්ඨ වූ ඉන්ද්‍රයා මෙන් රන් බඳු පැහැති සිරුර ඇත්තේ වෙයි.

ඒ මිනිස් තෙම අප්‍රව්‍රජ්‍යාව (ගිහිබව) කැමැති වන්නේ, ගිහිගෙහි වසනතේ නම්, මහත් පොළොව අබිබවා අනුශාසන කෙරෙයි (පාලනය කෙරෙයි.) හේ වනාහි මහත් වූ ද සියුම් වූ ද මනා පැහැත්තාවූ ද ඉතා උතුම් වස්ත්‍ර ලබයි.

ඉදින් පැවිද්දට පැමිණෙන්නේ නම්, හඳනා වස්ත්‍ර හා සෙසු වස්ත්‍ර ද (කොඳුපලස් ඈ) පාමොක් පොරෝනා ද ලබන සුලු වෙයි. හේ වනාහි පළමු අත් බවහි කළ කුශලයන්ගේ ඵලය විඳියි. කළ කුශලයේ විපාක නොදී වැනැසී යැමෙක් ද නො වෙයි.

## කොෂාවහිත වස්ත්‍රගුහ්‍යතා ලක්ෂණය (14)

12. මහණෙනි, පළමු දැහි, පළමු බෙවෙහි, පළමු වුසූ තන්හි, පෙර මිනිස් වූයේ ම බොහෝ කල් දක්නට නැති වැ ගිය, ඉතා බොහෝ කල් පිට රටැ වුසූ නෑයන් ද මිතුරන් ද සුහෘදයන් ද යහළුවන් ද එක් තැනට පමුණුවන්නේ (ගළපන්නේ) වී ය, මව ද පුතු හා හමු කරන්නේ විය, පුතු ද මව හා හමු කරන්නේ විය, පියා ද පුතු හා හමු කරන්නේ විය, පුතා ද පියා හා හමු කරන්නේ විය, සොහොවුරා ද සොහොවුරා හා හමු කරන්නේ විය, සොහොවුරා ද සොහොවිරිය හා හමු කරන්නේ විය, සොහොවිරිය ද සොවුරා හා හමු කරන්නේ විය. සොහොවිරිය ද සොහො-විරිය හා හමු කරන්නේ විය. සමගිඵකතු කොට ද එයට සතුටු වන්නේ විය යන යමෙක් ඇද්ද, ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්, හෙ තෙමේ කා බුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට පැමිණියේ ය... එයින් සැව, මේ මිනිස් බවට ආයේ ම මේ මහ පුරිස් ලකුණ බලයි. කොෂාවහිත වස්ත්‍රගුහ්‍ය ලක්ෂණය ඇත්තේ වෙයි. හේ ඒ ලක්ෂණයෙන් සමන්විත වූයේ ඉදින් ගිහිගෙහි වසන්නේ නම්... සක්විති රජ වෙයි. රජ වනුයේ කුමක් ලබයි ද? බොහෝ පුතුන් ඇත්තේ වෙයි. ඔහුට ශූර වූ (බිය නො ගන්නා) මූර්තිමත් වීර්‍යය බඳු වූ, සතුරු සෙන් මඩනට සමත්, දහසකට වැඩි තරම් පුත්‍රයෝ වෙත්... බුදු ව යේ කුමක් ලබයි ද? බොහෝ පුතුන් ඇත්තේ වෙයි. ඔබට වනාහි ශූර වූ උතුම් වීර සාර ස්වභාවය ඇති ප්‍රති-පක්ෂ සෙනා මඩින්නට පොහොසත් ශ්‍රාවක පුත්‍රයෝ ද නොයෙක් දහස් ගණන් වෙත්. බුදු වනුයේ මේ අනුසස් ලබයි.''

භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළ සේක. එහි මෙය ගාථා බන්ධනයෙන් මෙසේ කියනු ලැබේ:

සො තෙන[1] කම්මෙන දිවං අපක්කමි[2]
සුඛඤ්ච ඛිඩ්ඩා රතියො ච අන්වභි.
තතො චවිත්වා පුනරාගතො ඉධ
කොසොහිතං වින්දති වත්ථඡාදියං.

පහූතපුත්තො භවති තථාවිධො
පරොසහස්සං ච භවන්ති අත්‍රජා,
සූරා ච වීරා ච[3] අමිත්තතාපනා
ගිහිස්ස පීතිං ජනනා පියංවදා.

බහුතරා පබ්බජිතස්ස ඉරියතො
භවන්ති පුත්තා වචනානුසාරිනො.
ගිහිස්ස වා පබ්බජිතස්ස වා පුන
තං ලක්ඛණං භවති[4] තදත්ථජොතකන්ති,

පඨමභාණවාරො නිට්ඨිතො.

## පරිමණ්ඩල-අනොනම-ජ'ණ්ණුපරිමසනලක්ඛණානි (15,16)

13. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො මහාජනසඞ්ගහං සමෙක්ඛමානො සමං ජානාති, සාමං ජානාති, පුරිසං ජානාති, පුරිසවිසෙසං ජානාති අයමිදමරහති අයමිදමරහතී'ති. තත්ථ තත්ථ පුරිසවිසෙසකරො පුරෙ අහොසි, සො තස්ස කම්මස්ස කතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහා පුරිසලක්ඛණානි පටිලභති, නිග්‍රොධපරිමණ්ඩලො ච හොති ඨිතකො'ව අනොනමන්තො උභොහි පාණිතලෙහි ජණ්ණුකානි පරිමසති පරිමජ්ජති, සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? අඩ්ඪො හොති මහද්ධනො මහාභොගො පහූතජාතරූපරජතො පහූතවිත්තූපකරණො පහූතධනධඤ්ඤො පරිපුණ්ණකොසකොට්ඨාගාරො. රාජා සමානො ඉදං ලභති. -පෙ- බුද්ධො සමානො කිං ලභති? අඩ්ඪො හොති මහද්ධනො මහාභොගො. තස්සිමානි ධනානි හොන්ති, සෙය්‍යථීදං සද්ධාධනං සීලධනං හිරිධනං ඔත්තප්පධනං සුතධනං චාගධනං පඤ්ඤාධනං. බුද්ධො සමානො ඉදං ලභති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

1. ස තෙන-(කම)
2. සමක්කමි-(මජසං)
3. වීරඞ්ගරූපා-(කම)
4. ජායති-(මජසං)
5. මහාජනසඞ්ගාහකං සමපෙක්ඛමානො (කම)

"පෙර, බොහෝ පෙර, පළමු දැහි, බොහෝ කල් නො දක්නා ලද ඉතා බොහෝ කල් වෙන් ව වුසූ නෑයන් ද මිතුරන් ද යහළුවන් ද එකතු කෙළේ ය. සමගි කොට ද එයට සතුටු විය.

හේ ඒ කර්මයෙන් දෙව්ලෝ ගියේ ය. දෙව් සුව ද ක්‍රීඩාරතීන් ද අනුභව කෙළේ ය. එයින් සැව, යළි මෙහි ආයේ කොශාවහිත වස්ත්‍රගුහ්‍යතා ලක්ෂණය ලබයි.

එබඳු තැනැත්තේ බොහෝ පුතුන් ඇත්තේ වෙයි. ගිහි වූ මොහුට ශූර වූ ද වීර වූ ද සතුරන් මඩනුයෙහි පොහොසත් වූ, ප්‍රීතිය උපදවන්නා වූ, පිය බස් තෙපලන දහසකට වැඩි දෙනෙක් පුත්‍රයෝ වෙත්.

පැවිදි වැ වසන්නහුට ඉතා බොහෝ වූ, වචනය පිළිපදනා, ශ්‍රාවක පුත්‍රයෝ වෙත්. ඒ (කොශාවහිත වස්ත්‍රගුහ්‍ය) ලක්ෂණය ගිහියාට හෝ වැලි පැවිදි වූවාහට හෝ ඒ අරුත පවසන්නේ වෙයි.

**පළමු බණවර යැ.**

### පරිමණ්ඩලතා-අනවනත-ජානුපරාමර්ශනතා ලක්ෂණ (15,16)

13. මහණෙනි, තථාගත තෙමේ පළමු දැහි, පළමු බෙවෙහි, පළමු වුසූ තන්හි, පෙර මිනිස් වූයේ ම මහජනයාට සංග්‍රහ කිරීම සම ව දකිනුයේ (ඒ ඒ තැනැත්හු හා) සම වූවහු දනී, තෙමේ දනී, පුරුෂයා දනී, පුරුෂයන් ගේ වෙසෙස දනී, මෙ තෙමේ මෙයට සුදුසු ය, මෙ තෙමේ මෙයට සුදුසු යැ යි ඒ ඒ දූයෙහි පුරුෂයන් ගේ වෙසෙස දැන කටයුතු කරනුයේ විය යන යමෙක් ඇද්ද, හේ ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්, කාබුන් මරණින් මතු මනාගති ඇති, සග ලොවට යෙයි. හේ එයින් සැව මෙ මිනිස් බවට ආයේ ම මේ මහපුරිස් ලකුණු දෙක ලබයි. නුග රුකක් සේ සම පමණ ඇත්තේ වෙයි. සිටියේ ම නො නැමෙන්නේ දෙ අත්ලෙන් දෙදන පිරිමදියි, හේ ඒ ලකුණුවලින් සමන්විත වූයේ, ඉදින් ගිහි ගෙහි වසන්නේ නම්... සක්විති රජ වෙයි. රජ වනුයේ කුමක් ලබයි ද? ආඪ්‍ය වෙයි, මහත් ධන ඇත්තේ වෙයි, මහත් භොග ඇත්තේ වෙයි. බොහෝ රන් රිදී ඇත්තේ, බොහෝ වස්තු උපකරණ ඇත්තේ, බොහෝ ධන ධාන්‍ය ඇත්තේ, පිරිපුන් වස්තු ගබඩා හා කොටුගුල් ඇත්තේ වෙයි. රජ වනුයේ මෙය ලබයි... බුදු වනුයේ කුමක් ලබයි ද? ආඪ්‍ය වෙයි, මහත් ධන ඇත්තේ වෙයි, මහත් භොග ඇත්තේ වෙයි. ඔහුට ශ්‍රද්ධාධනය, ශීලධනය, හිරිධනය, ඔත්තප්පධනය, ශ්‍රුතධනය, ත්‍යාගධනය, ප්‍රඥාධනය යන මේ ධනයෝ වෙත්. බුදු වනුයේ මෙය ලබයි.

තුලිය පටිවිචිය[1] විචයයිත්වා
මහජනසඞ්ගහනං[2] සමෙක්ඛමානො,
අයමිදමරහතීති තත්ථ තත්ථ
පුරිසවිසෙසකරො පුරෙ අහොසි.

[3]ස හි ච පන ඨිතො අනොනමන්තො
ඵුසති කරෙහි උභොහි ජණ්ණුකානි,
මහිරුහපරිමණ්ඩලො අහොසි
සුචරිතකම්මවිපාකසෙසකෙන.

බහුවිවිධ නිමිත්ත ලක්ඛණඤ්ඤූ
අභිනිපුණා මනුජාවියා කරිංසු,
බහුවිවිධානි ගිහීනමරහානි
පටිලභති දහරො සුසූ කුමාරො,

ඉධ මහීපති'ස්ස කාමභොගී
ගිහිපටිරූපකා බහූ භවන්ති,
යදි ච ජහති සබ්බකාමභොගං
ලභති අනුත්තරමුත්තමං ධනග්ගන්ති.

## සීහපුබ්බද්ධකායාදීනි තීණි ලක්ඛණානි (17–19)

14. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො බහුනො ජනස්ස අත්ථකාමො අහොසි හිතකාමො ඵාසුකාමො යොගක්ඛෙමකාමො 'කින්ති මෙ සද්ධාය වඩ්ඪෙය්‍යුං, සීලෙන වඩ්ඪෙය්‍යුං, සුතෙන වඩ්ඪෙය්‍යුං,[4] චාගෙන වඩ්ඪෙය්‍යුං, ධම්මෙන වඩ්ඪෙය්‍යුං, පඤ්ඤාය වඩ්ඪෙය්‍යුං ධනධඤ්ඤෙන වඩ්ඪෙය්‍යුං, ඛෙත්තවත්ථුනා වඩ්ඪෙය්‍යුං, ද්විපදචතුප්පදෙහි වඩ්ඪෙය්‍යුං, පුත්තදාරෙහි වඩ්ඪෙය්‍යුං, දාසකම්මකරපොරිසෙහි වඩ්ඪෙය්‍යුං, ඤාතීහි වඩ්ඪෙය්‍යුං, මිත්තෙහි වඩ්ඪෙය්‍යුං, බන්ධවෙහි වඩ්ඪෙය්‍යුන්ති.

1. පටිවිචය –(මජසං)
2. මහාජනං සඞ්ගාහකං –(කම)
3. මහිංච–(මජසං) සමා ච පන (ස්‍යා)
4. සුතෙන වඩ්ඪෙය්‍යුං–(ස්‍යා)

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදාළ සේක. එහි මෙය ගාථායෙන් කියනු ලැබෙයි.

'පෙර ජාතියෙහි නුවණින් කිරා බලා, නැවැත නැවැත පිරික්සා සිතා, මහජනයාට සංග්‍රහ කිරීම සම ව අපෙක්ෂා කරනුයේ, 'මෙ තෙමේ මෙය ලබන්නට සුදුසු වෙ යැ යි ඒ ඒ තන්හි පුරුෂයන්ගේ වෙසෙස දැන සංග්‍රහ කරනුයේ විය.

ඒ කර්‍මයා ගේ ඉතිරි වූ විපාකයෙන් හේ සිටියේ ම නො නැමෙනුයේ දෙ අත්ලෙන් දෙ දණහිස් සපර්ශ කෙරෙයි, තුග රුකෙක පිරිමඬුල්ල මෙන් පිරිමඬුලු වූ සිරුර ඇත්තේ විය.

බොහෝ විවිධ නිමිත්ත ලක්ෂණ දන්නා ඉතා සියුම් නුවණැති බමුණු පඬිහු 'ළදරු වූ ළපැටි වූ මෙ කුමර ගෘහස්ථයනට සුදුසු වූ බොහෝ වූ ද විවිධ වූ ද වස්තූන් ලබතැ යි ද,

ඉදින් මෙහි රජෙක් වී නම් මොහුට ගිහියනට සුදුසු වූ කාමසම්පත් විඳිනුවට අවශ්‍ය වූ බොහෝ උපකරණයෝ වෙත්. ඉදින් සියලු කම්සැපත් අත් හරනේ නම්, නිරුත්තර වූ උතුම් ආර්‍ය ධනය ලබන්නේ යැ යි ද හෙළි කොට කීහ.

## සිංහපූර්‍වාර්ධකායාදි ත්‍රි ලක්ෂණ (17-19)

14. මහණෙනි, තථාගත තෙමේ පළමු දැහි, පළමු බෙවෙහි, පළමු වුසූ තන්හි, පෙර මිනිස් වූයේ ම, "මෙ සත්‍වයෝ කෙසේ නම් සැදැහැයෙන් වැඩෙන්නාහු ද? ශීලයෙන් වැඩෙන්නාහු ද? සුභාෂිතශ්‍රවණයෙන් වැඩෙන්නාහු ද? ත්‍යාගගුණයෙන් වැඩෙන්නාහු ද? ලෞකික ධර්‍මයෝ වැඩෙන්නාහු ද? ප්‍රඥායෙන් වැඩෙන්නාහු ද? ධනධාන්‍යයෙන් වැඩෙන්නාහු ද? කෙත්වතින් වැඩෙන්නාහු ද? දෙපා සිවුපා සතුන්ගෙන්, අඹුදරුවන්ගෙන්, දැසි දස් කම්කරු පුරුෂයන්ගෙන් නෑයන්ගෙන් මිතුරන්ගෙන්, (පරම්පරාගත) බන්ධුන්ගෙන් වැඩෙන්නාහු ද?'යි බොහෝ දෙනාට වැඩ කැමැති වූයේ, අභ්‍යුදය කැමැති වූයේ සැප කැමැති වූයේ, නිරුපද්‍රැත බව කැමැති වූයේ විය.

සො තස්ස කම්මස්ස කතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි තීනි මහාපුරිසලක්ඛණානි පටිලභති, සීහපුබ්බද්ධකායො ච හොති චිතන්තරංසො ච සමවත්තක්ඛන්ධො ච සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති. රාජා සමානො කිං ලභති? අපරිහානධම්මො හොති, න පරිහායති ධනධඤ්ඤෙන ඛෙත්තවත්ථුනා දිපදචතුප්පදෙහි පුත්තදාරෙහි දාසකම්මකරපොරිසෙහි ඤාතීහි මිත්තෙහි බන්ධවෙහි. න පරිහායති සබ්බසම්පත්තියා. රාජා සමානො ඉදං ලභති. -පෙ- බුද්ධො සමානො කිං ලභති? අපරිහානධම්මො හොති, න පරිහායති සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය න පරිහායති සබ්බසම්පත්තියා. බුද්ධො සමානො ඉදං ලභති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

සද්ධාය සීලෙන සුතෙන බුද්ධියා
චාගෙන ධම්මෙන බහූහි සාධුහි
ධනෙන ධඤ්ඤෙන ච ඛෙත්තවත්ථුනා
පුත්තෙහි දාරෙහි චතුප්පදෙහි ච.

ඤාතීහි මිත්තෙහි ච බන්ධවෙහි ච
බලෙන වණ්ණෙන සුඛෙන චූභයං,
කථං න හායෙය්‍යුං පරෙ'ති ඉච්ඡති
ඉද්ධං සමිද්ධං ච[2] පත්ථාභිකඞ්ඛති.

ස සීහපුබ්බද්ධසුසණ්ඨිතො අහු
සමවත්තක්ඛන්ධො ච චිතන්තරංසො
පුබ්බෙ සුචිණ්ණෙන කතෙන කම්මුනා
අහානියං පුබ්බනිමිත්තමස්සතං.

ගිහී පි ධඤ්ඤෙන ධනෙන වඩ්ඪති
පුත්තෙහි දාරෙහි චතුප්පදෙහි ච,
අකිඤ්චනො පබ්බජිතො අනුත්තරං
පප්පොති සම්බොධිමහානධම්මතන්ති.[1]

1. අත්ථස්ස මිද්ධි ච-(මජසං) අද්ධං සමිද්ධං ච (සයා)
2. පප්පොංති බොධිං අසහාන ධම්මතන්ති (මජසං)

"හෙ තෙමේ ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්... කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට ගියේ ය. හේ එයින් සැව, මේ මිනිසත්-බවට ආයේ ම, මේ මහ පුරිස්ලකුණු තුන ලබයි. සිංහයාගේ පෙරධ කය මෙන් පරිපූර්ණ වූ (පූර්වාර්ධ අපරාර්ධ යන) සියලු සිරුර ඇත්තේ වෙයි. මයින් පිරුණු පිටිකර ඇත්තේ වෙයි. සම ව වට වූ කඳ ඇත්තේ වෙයි. හේ ඒ ලකුණුවලින් සමන්විත වූයේ, ඉදින් ගිහිගෙහි වසන්නේ නම්,... සක්විති රජ වෙයි. රජ වනුයේ කුමක් ලබයි ද? නො පිරිහෙන ස්වභාවය ඇත්තේ වෙයි, ධනධාන්‍යයෙන් කෙත්වතුයෙන්, දෙපාසිවුපාවන්ගෙන්, අඹුදරුවන්ගෙන්, දාසි දස් කම්කරු පුරුෂයන්ගෙන් නෑයන්ගෙන්, මිතුරන්-ගෙන්, බන්ධූන්ගෙන් නො පිරිහෙයි. සියලු සැපතින් නො පිරිහෙයි. රජ වනුයේ මෙය ලබයි. බුදු වනුයේ කුමක් ලබයි ද? නොපිරිහෙන සැහැවි ඇත්තේ වෙයි. ශ්‍රද්ධායෙන් ශීලයෙන් ශ්‍රැතයෙන් ත්‍යාගයෙන් ප්‍රඥයෙන් නො පිරිහෙයි. සියලු සැපතින් නො පිරිහෙයි. බුදු වනුයේ මෙය ලබයි."

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදළසේක.

එහි මෙය (ගාථායෙන්) මෙසේ කියනු ලැබේ:

ශ්‍රද්ධායෙන් ද ශීලයෙන් ද ශ්‍රැතයෙන් ද ප්‍රඥායෙන් ද, ත්‍යාගයෙන් ද ධර්මයෙන් ද යන බොහෝ සාධු ගුණවලින් ද, ධනයෙන් ද ධාන්‍යයෙන් ද කෙත්වතුයෙන් ද, දරුවන්ගෙන් ද, භාර්යාවන්ගෙන් ද සිවුපාවුන්ගෙන් ද, නෑයන්ගෙන් ද මිත්‍රයන්ගෙන් ද බන්ධූන්ගෙන් ද ශරීරශක්තියෙන් ද වර්ණයෙන් සැපයෙන් යන දෙකින් ද අන්‍යයෝ කෙසේ නම් නො පිරි-හෙන්නාහු ද?'යි හේ කැමැති වෙයි. මේ අනුන්ගේ සමෘද්ධිය හේ පතයි.

පෙර කරන ලද, මොනොවට රැස් කරන ලද ඒ කම් හේතුයෙන් හෙ තෙමේ සිංහයකුගේ පෙරධ කය බඳුව පිරිපුන් ව සුපිහිටි, කයැත්තේ විය. සම ව වට වූ, මයින් පිරුණු පිටිකර ඇත්තේ විය. තථාගතයන් වහන්සේ නො පිරිහෙන ඒ කර්මය ඒ ලක්ෂණත්‍රයයා ගේ ලැබීමට පෙර නිමිති වෙයි.

කුමර තෙමේ ඉදින් ගිහි ව සිටී නම්, ධනයෙන් ද ධාන්‍යයෙන් ද දූ පුතුන්ගෙන් ද භාර්යාවන්ගෙන් ද සිවුපාවන් ගෙන් ද වැඩෙයි. ඉදින් කිසි ධන රැස් කිරීමෙක් නැති පැවිද්දෙක් වී නම්, නිරුත්තර වූ නොපිරි-හෙන ධර්මතා වූ බුදුබවට පැමිණේ' යැ යි ලක්ෂණශාස්ත්‍රඥ බමුණෝ පැවැසූහ.

## රසග්ගසග්ගිතාලක්ඛණං (20)

15. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො සත්තානං අවිහෙඨකජාතිකො අහොසි පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා, සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති, රසග්ගසග්ගී හොති, උද්ධග්ගාස්ස රසහරණියො ගීවාය ජාතා හොන්ති සමාභිවාහිනියො.[1] සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්තී -පෙ- රාජා සමානො කිං ලභති? අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහනියා- සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය. රාජා සමානො ඉදං ලභති. බුද්ධො සමානො කිං ලභති? අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය. බුද්ධො සමානො ඉදං ලභති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

න පාණිදණ්ඩෙහි පනාථ ලෙඩ්ඩුනා
සත්ථෙන වා මරණවධෙන වා පුන,
උබ්බාධනාය පරිතජ්ජනාය වා
න හෙඨයී ජනතමහෙඨකො අහු.

තෙනෙව සො සුගතිසු පෙච්ච මොදති
සුඛප්ඵලං කරිය සුඛානි වින්දති,
සමොජසා[2] රසහරණී සුසණ්ඨිතා
ඉධාගතො ලභති රසග්ගසග්ගිතං.

තෙනාහු නං අතිනිපුණා විචක්ඛණා
අයං නරො සුඛබහුලො භවිස්සති
ගිහිස්ස වා පබ්බජිතස්ස වා පුන[3]
තං ලක්ඛණං භවති තදත්ථජොතකන්ති.

1. සමාභිවාහිනියො (මජසං)
2. සමුජ්ජසා (PTS) පා මුඤ්ජසා (ස්‍යා) සාචඤ්ඤවසා (කම)
3. පන (ස්‍යා)

## රසග්‍රාසාග්‍රතා ලක්ෂණය (20)

15. මහණෙනි, තථාගත තෙමේ පෙර දැහි, පෙර බෙවෙහි, පෙර වුසූ තන්හි, පෙර මිනිස් වූයේ ම අතින් හෝ කැටින් හෝ දඬුමුගුරෙන් හෝ අවියෙන් හෝ සතුන් නො පෙළන ස්වභාවය ඇත්තේ විය යන යමෙක් ඇද්ද, හේ ඒ කර්ම්ය කළ බැවින් රැස් කළ බැවින්, කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලෝ ගියේ ය. හේ එයින් සැව මේ මිනිස් බවට ආයේ ම, මේ මහපුරිස් ලකුණ ලබයි. අග්‍ර රස එළවන රස නහර ඇත්තේ වෙයි. ඔහුගේ ග්‍රීවායෙහි උඩුකුරු වැ කෙළින් නැඟී සිටි සම ව රසය එළවන රස නහරයෝ හටගත්තාහු වෙත්. හේ ඒ ලකුණින් සමන්විත වූයේ ඉදින් ගිහිගෙහි වසන්නේ නම්,... සක්විති රජ වෙයි. රජ වනුයේ කුමක් ලබයි ද? ඉතා ශීත ද නොවූ, ඉතා උෂ්ණ ද නොවූ, සමවෙපාකිනි වූ කර්මජ තෙජොධාතුයෙන් සමන්විත වූයේ, නීරොග වෙයි, නිදුක් වෙයි. රජ වනුයේ මෙය ලබයි. බුදු වනුයේ කුමක් ලබා ද? යත්: ඉතා ශීත ද නොවූ, ඉතා උෂ්ණ ද නොවූ මධ්‍යම වූ ප්‍රධන් වීර්ය වඩනුවට පොහොසත් වූ, කර්මජ තෙජොධාතුයෙන් සමන්විත වූයේ, නීරොග වෙයි, නිදුක් වෙයි. බුදු වනුයේ මෙය ලබයි''

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. එහි මෙය ගාථායෙන් මෙසේ කියනු ලැබේ:

'හේ අතින් හෝ දඬු මුගුරින් හෝ නොහොත් කැටින් හෝ අවියෙන් හෝ, තවද සිර ගෙහි ලෑමෙන් හෝ තරවටු කිරීමෙන් හෝ ජනතාව නො පෙළී ය. හේ ජනතාව නොපෙළන්නෙක් විය.

එ හෙයින් ම පර ලෝ ගොස් සුගතින්හි සතුටු වෙයි. සැප පල දෙන කර්ම කිරීමෙන් සුව විඳී. මොනොවට රස එළවන්නාවූ රසනහර යෝ තුමූ ම මොනොවට පිහිටියාහු වෙත්. මෙසේ මෙහි (මේ මිනිස්බවට) පැමිණියේ රසග්‍රාසාග්‍රිතාව (අග්‍රරසනහර ඇති බව) ලබයි.

එ හෙයින් ඉතා සියුම් නුවණැති (නිමිත්තපාඨක) පඬිහු ඔබට 'මෙ මිනිස් තෙමේ සුව බහුල කොටැති වන්නේ ය. නැවැත ද ගිහියකුට හෝ පැවිද්දකුට හෝ ඒ කරුණ හෙළි කරන ඒ ලක්ෂණය වෙයි.

### අභිනීලනෙත්ත - ගොපඛුමලක්ඛණානි (21, 22)

16. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො න ච විසටං න ච විසාචී[1] න ච පන විචෙය්‍ය පෙක්ඛිතා, උජුං තථා පසටමුජුමනො පියචක්ඛුනා බහුජනං උදික්ඛිතා අහොසි. සො තස්ස කම්මස්ස කතත්තා-පෙ-සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහාපුරිසලක්ඛණානි පටිලභති, අභිනීල-නෙත්තො ච හොති ගොපඛුමො ච. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො, සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? පියදස්සනො හොති, බහුනො ජනස්ස පියො හොති මනාපො බ්‍රාහ්මණගහපතිකානං නෙගමජානපදානං ගණකානං මහාමත්තානං අනීකට්ඨානං දොවාරිකානං අමච්චානං පාරිසජ්ජානං රාජූනං භොගියානං කුමාරානං. රාජා සමානො ඉදං ලභති. -පෙ- බුද්ධො සමානො කිං ලභති? පියදස්සනො හොති, බහුනො ජනස්ස පියො හොති මනාපො භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං දෙවානං මනුස්සානං අසුරානං නාගානං ගන්ධබ්බානං. බුද්ධො සමානො ඉදං ලභති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

න ච විසටං න ච විසාචී[2]
න ච පන විචෙය්‍ය පෙක්ඛිතා
උජුං තථා පසටමුජුමනො
පියචක්ඛුනා බහුජනං උදික්ඛිතා.

සුගතීසු සො ඵලවිපාකං
අනුභවති තත්ථ මොදති.
ඉධ ච පන භවති ගොපඛුමො
අභිනීලනෙත්තනයනො සුදස්සනො.

අභියොගිනො ච නිපුණා
බහු පන නිමිත්තකොවිදා
සුඛුමනයනකුසලා මනුජා
පියදස්සනො'ති අභිනිද්දිසන්ති නං,

1. න ච විසාචිතං (PTS), න ච විසාචි (ස්‍යා)
2. න ච විසාචිතං (PTS), න ච විසාචි (ස්‍යා)

### අභිනීලනෙත්‍ර ගොපඛුමතා ලක්ෂණ (21,22)

16. මහණෙනි, තථාගත තෙමේ පළමු දැහි, පළමු බෙවෙහි, පළමු වුසූ තන්හි පෙර මිනිස් වූයේ ම, කෝපයෙන් ඇස් ඔරවා බලන්නේ නො වී ය, (ක්‍රොධපර වැ) හිස ඇළ කොට ඇස් කොනින් බලන්නේ ද නො වී ය. ක්‍රොධපර ව අනුන් දෙස රහසින් රවා බලන්නේ ද නො වී ය. ඍජු ව ද ඇස් පුරා ද ඍජු සිත් ඇත්තේ සිය ඇසින් බොහෝ දෙනා දෙස බලන්නේ විය යන යමෙක් ඇද්ද, හේ ඒ කර්මය කළ බැවින් කා බූන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට ගියේ ය හේ එයින් සැව මේ මිනිස් බවට ආයේ ම, මේ මහපුරිස්ලකුණු දෙක ලබයි. වෙසෙසින් නිල්වන් වූ ඇස් ඇත්තේ වෙයි, එකෙණෙහි උපන් රතු වස්සකුගේ ඇස් පියුම (ඇස්ගුළිය) බඳු ඇස් පියුම් ඇත්තේ වෙයි. මේ ලක්ෂණවලින් සමන්විත වූයේ, ඉදින් ගිහිගෙහි වසන්නේ නම්, ... සක්විති රජ වෙයි. රජ වන්නේ කුමක් ලබයි ද? ප්‍රිය වූ දකුම ඇත්තේ වෙයි. බමුණනට ගැහැවියනට, නිගම්වැසියනට දනවුවැසියනට, ගණකයනට, මහාමාත්‍රයනට, සෙනාඞගරක්ෂකයනට, ද්වාරපාල යනට, පරම්පරාගත වැ රාජපර්ෂද්හි වූවනට, රජුනට, රාජදෙය භොග සම්පත් විඳුනාවුනට රජකුමරුවනට, යන බොහෝ දෙනාට ප්‍රිය මනාප වෙයි. රජ වනුයේ මෙය ලබයි ... බුදු වනුයේ කුමක් ලබයි ද? ප්‍රිය දකුම් ඇත්තේ වෙයි. බොහෝ දෙනාට ප්‍රිය වෙයි, මනවඩන්නේ වෙයි. මහණුනට මෙහෙණනට උවසුවනට උවැසියනට දෙවියනට මිනිස්නට අසුරයනට නාගයනට ගඳෙව්වනට ප්‍රිය වෙයි, මනාප වෙයි. බුදු වනුයේ මෙය ලබයි.''

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදළ සේක. එහි මෙය (ගාථායෙන්) කියනු ලැබේ:

'ක්‍රොධයෙන් ඇස් ඔරවා ද නො බලන්නේ විය. කෝපයෙන් හිස ඇළ කොට ඇස් කොනින් බලන්නේ ද නො වී ය. රහසින් අනුන් දෙස රවා බලන්නේ ද නො වී ය. ඍජු ලෙස, ඇසපුරා, ඍජු සිතැති ව, ප්‍රිය ඇසින් බොහෝ දෙනා දෙස බලන්නේ විය.

හේ එහි ඵලවිපාකය සුගතීන්හි විඳියි. එයින් එහි සතුටු වෙයි, නැවැත මෙහි උපදනේ ද එ කෙණෙහි උපන් වස්සකුගේ බඳු ඇසිපියුම් ඇත්තේ, වෙසෙසින් නිල් වූ ඇස් ඇත්තේ, ශොභන දකුම් ඇත්තේ වෙයි.

ලක්ෂණශාස්ත්‍ර හැදැරීමෙහි යෙදුණු සියුම් නුවණැති, නිමිති සතර දන්නා, සියුම නෙත්‍රවිද්‍යායෙහි දක්ෂ වූ බමුණෝ 'ප්‍රිය දර්ශන ඇත්තේ යැ'යි ඔහු වෙසෙසින් දක්වත්.

පියදස්සනො ගිහි පි සන්තො ච
භවති බහුජනපියායිතො,
යදි ච න භවති ගිහී සමණො හොති
පියො බහූනං සොකනාසනො'ති.

## උණ්හීසසීසලක්ඛණ (23)

17. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො බහුජනපුබ්බඞ්ගමො අහොසි කුසලෙසු ධම්මෙසු බහුජනානං පාමොක්ඛො කායසුචරිතෙ වචීසුචරිතෙ මනොසුචරිතෙ දානසංවිභාගෙ සීලසමාදානෙ උපොසථුපවාසෙ මත්තෙය්‍යතාය පෙත්තෙය්‍යතාය සාමඤ්ඤතාය බ්‍රහ්මඤ්ඤතාය කුලෙ ජෙට්ඨාපචායිතාය අඤ්ඤතරඤ්ඤතරෙසු ච අධිකුසලෙසු ධම්මෙසු. සො තස්ස කම්මස්ස කතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති, උණ්හීසසීසො හොති. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති -පෙ- රාජා සමානො කිං ලභති? මහා'ස්ස ජනො අන්වායිකො හොති, බ්‍රාහ්මණගහපතිකා නෙගමජානපද ගණකා මහාමත්තා අනීකට්ඨා දොවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො භොගියා කුමාරා. රාජා සමානො ඉදං ලභති. -පෙ- බුද්ධො සමානො කිං ලභති? මහාස්ස ජනො අන්වායිකො හොති භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධො සමානො ඉදං ලභති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

පුබ්බඞ්ගමො සුචරිතෙසු අහු
ධම්මෙසු ධම්මචරියාය[1] අභිරතො,
අන්වායිකො බහුජනස්ස අහු
සග්ගෙසු වෙදයිත්ථ පුඤ්ඤඵලං.

වෙදයිත්වා සො සුචරිතස්ස ඵලං
උණ්හීස සීසත්තමිධජ්ඣගමා
බ්‍යාකංසු බ්‍යඤ්ජන නිමිත්තධරා
පුබ්බඞ්ගමො බහුජනස්ස[2] හෙස්සති

පටිභොගියා මනුජෙසු ඉධ
පුබ්බෙව තස්ස අභිහරන්ති තදා
යදිඛත්තියො භවති භූමිපති
පටිහාරකබහුජනෙ[3] ලභති.

1 ධම්මචරියාභිරතො (මජසං)
2. පුබ්බඞ්ගමො බහුජනං (මජසං)
3. පටිහාරකං බහුජනො (මජසං)

ගිහි වන්නේ ද ප්‍රිය දකුම් ඇත්තේ, බොහෝ ජනයා විසින් ප්‍රිය කරන ලද්දේ වෙයි. ඉදින් ගිහි නො වන්නේ නම්, බොහෝ දෙනාට ප්‍රිය වූ, ජනයාගේ ශොක නසන ශ්‍රමණයෙක් වෙයි.

### උෂ්ණීෂශීර්ෂලක්ෂණය (23)

17. මහණෙනි, 'පළමු දැහි, පළමු බෙවෙහි, පළමු වුසූ තන්හි, පෙර මිනිස් වූයේ ම කුසල් දහම්හි බොහෝ දෙනාට ගණදෙවු විය, කායසුචරිතයෙහි ද වාක්සුචරිතයෙහි ද මනසුචරිතයෙහි ද දන් දීමෙහි ද ශීල සමාදානයෙහි ද පෙහෙවස් වුසුම්හි ද මවට උවටන්හි ද පියාට උවටන්හි ද මහණුන් පිදීමෙහි ද බමුණන් පිදීමෙහි ද කුලදෙවුවන් පිදීමෙහි ද තව තවත් අධිකුශලධර්මයන්හි ද බොහෝ දෙනාට ප්‍රමුඛ විය' යන යමෙක් ඇද් ද, හේ, ඒ කර්ම කළ හෙයින්... කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට යෙයි. හේ එයින් සැව මෙ මිනිසත් බවට ආයේ ම මෙ මහ පුරිස් ලකුණ ලබයි. හේ නලල්පට බන් සෙයින් පිරිපුන් නලල ද පිරිපුන් හිස ද ඇත්තේ වෙයි. හේ ඒ ලක්ෂණයෙන් යුක්ත වූයේ, ඉදින් ගිහිගෙයි වසන්නේ නම් ... සක්විති රජ වෙයි. රජ වනුයේ කුමක් ලබයි ද? මහා ජන තෙමේ ඔහු අනුව යන්නේ වෙයි. බමුණුගැහැවියෝ ද නියම්ගම් දනවු වැසියෝ ද ගණකයෝ ද මහාමාත්‍රයෝ ද සෙනාඩගරක්ෂකයෝ ද ද්වාරපාලයෝ ද ඇමැතියෝ ද පරම්පරාගත ව රාජපර්ෂත්හි වූවෝ ද, රජ්ජුහු ද, රාජ දත්ත භොග ලැබ පරිභොග කරන්නෝ ද, රජකුමරුවෝ ද ඔහු අනුව යන්නෝ වෙත්. රජ වනුයේ මෙය ලබයි. ... බුදු වනුයේ කුමක් ලබා ද? මහණ, මෙහෙණ උවසු උවැසි දෙව් මිනිස් අසුර නාග ගන්ධර්ව යන මහා ජනයා ඔහු අනුව යන්නේ වෙයි. බුදු වනුයේ මෙය ලබයි.''

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදළ සේක. එහි මෙය මෙසේ ගාථායෙන් කියනු ලැබෙ:

හේ සුචරිත ධර්මයන්හි පුරෝගාමී විය, ධර්මචර්යායෙහි ඇලුණේ විය එහි බොහෝ දෙනා ඔහු අනුව යන්නේ විය. එහි පින්පල සගලොවහි දී වින්දේ ය.

හේ සුචරිත යේ ඵලය විඳ, මෙහි උෂ්ණීෂශීර්ෂ බව ලැබී ය. ලක්ෂණ ශාස්ත්‍රධරයෝ 'මෙ තෙමේ බොහෝ දෙනාට පුරොගාමී වන්නේ යැ යි' පැවැසූහ,

මෙහි මිනිසුන් අතුරෙහි වතාවත් කරුවෝ එ කල්හි පළමු ළදරු වියෙහි ම ඔහුට කුදුමහත් වතාවත් එළවත්. ඉදින් පොළොවට අධිපති රජෙක් වි නම්, හේ වතාවත් කරන බොහෝ ජනයන් ලබයි.

අථ චෙ පි පබ්බජති සො මනුජො
ධම්මෙසු හොති පගුණො විසාවී.
තස්සානුසාසනිගුණාභිරතො
අන්වායිකො බහුජනො භවතී ති.

### එකෙකලොමතාඋණ්ණාලක්ඛණාදීනි. (24, 25)

18. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො අහොසි සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස, සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහාපුරිසලක්ඛණානි පටිලභති: එකෙකලොමො ච හොති, උණ්ණා ච භමුකන්තරෙ ජාතා හොති ඔදාතා මුදුතූලසන්නිභා. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්තී. රාජා සමානො කිං ලභති? මහා'ස්ස ජනො උපවත්තති බ්‍රාහ්මණගහපතිකා නෙගමජානපදා ගණකා මහාමත්තා අනීකට්ඨා දොවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො භොගියා කුමාරා. රාජා සමානො ඉදං ලභති -පෙ- බුද්ධො සමානො කිං ලභති? මහා'ස්ස ජනො උපවත්තති භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධො සමානො ඉදං ලභති,

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

සච්චප්පටිඤ්ඤො පුරිමාසු ජාතිසු
අද්වෙජ්ඣවාචො අලිකං අවජ්ජයී
න සො විසංවාදයිතා පි කස්සචි
භූතෙන තච්ඡෙන තථෙන භාසයී.[1]

සෙතා සුසුක්කා මුදුතූලසන්නිභා
උණ්ණාසුජාතා[2] භමුකන්තරෙ අහු
න ලොමකූපෙසු දුවෙ අජායිසුං
එකෙකලොමූපචිතඞ්ගවා අහු.

1. භාසයි (PTS)
2. උණ්ණසුජාතා (මඡසං)

ඉදින් ඒ මිනිස් තෙමේ පැවිදි වන්නේ නම්, ධර්මයන්හි (ධ්‍යාන සමාපත්ති ධර්මයන්හි) පුහුණු වූ, පුරුදු කළ වශිතා ඇතියෙක් වෙයි. ඔහුගේ අනුශාසන ගුණයෙහි ඇලුණු බොහෝ ජනයා ඔහු අනුව යන්නේ වේ.

## එකෙකලොමතා–ඌර්ණාලක්ෂණාදීහු (24, 25)

18. මහණෙනි, 'තථාගත තෙමේ පළමු දැහි, පළමු බෙවෙහි, පළමු වූසු තන්හි, පෙර මිනිස් වූයේ ම මුසවා හැර මුසවායින් වැළැක්කේ, ඇත්ත කියන සුලු වූයේ, ඇත්තෙන් ඇත්ත ගළපනුයේ, තහවුරු බස් ඇත්තේ, හැදැහිය යුතු බස් ඇත්තේ, ලොව, නො රවටනුයේ විය' යන යමෙක් ඇද්ද, හේ ඒ කර්මය කළ බැවින්, ඒ කර්මය රැස් කළ බැවින්...කා බුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට පැමිණෙයි. හේ එයින් සැව මේ මිනිස් බවට ආයේ ම මේ මහ පුරිස්ලකුණු දෙක ලබයි: එක් එක් ලෝම කූපයෙහි එක් එක් ලෝමයක් ඇත්තේ ද වෙයි, දෙ බැම අතුරෙහි සුදු පැහැති මොළොක් පුලුන් රොදක් බඳු වූ ඌර්ණරොමයෙක්ද හටගත්තේ වෙයි. හේ ඒ ලක්ෂණයන්ගෙන් සමන්විත වූයේ, ඉදින් ගිහි ගෙහි වසන්නේ නම් ... සක්විති රජ වෙයි. රජ වනුයේ කුමක් ලබන්නේ ද? බමුණෝ ය, ගැහැවියෝ ය, නිගම්වැස්සෝ ය දනාවුවැස්සෝ ය, ගණකයෝ ය, මහාමාත්‍රයෝ ය, සෙනාධිගරක්ෂකයෝ ය වාරපාලයෝ ය, අමාත්‍යයෝ ය, පරම්පරාගත වැ රාජපර්ෂත්හි වූවෝ ය, රජුහු ය, රාජදත්ත භොග ඇත්තෝ ය, රජකුමරුවෝ ය යන මහා ජනයෝ ඔහු අදහස අනුවැ පවත්නාහ. රජ වනුයේ මෙය ලබයි ... බුදු වනුයේ කුමක් ලබා ද? භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා දිව්‍ය මනුෂ්‍ය අසුර නාග ගන්ධර්ව යන මහා ජනයා ඔබ අදහස අනුව පවති. බුදු වනුයේ මෙය ලබයි.''

භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ වදළ සේක. එහි මෙය ගාථායෙන් කියනු ලැබේ:

''පෙර දැහි සත්‍ය ප්‍රතිඥ ඇත්තේ, දෙසැවියෙකින් නො පැවැති එකාන්ත වචන ඇත්තේ, මුසා බස් දුරැලී ය. හේ කිසිවකුත් නො රවටන්නේ විය, සත්‍ය වූ තථ්‍ය වූ තත්ත්වාකාර වූ වචනයෙන් කථා කෙළේ ය.

(එයින්) සුදු පැහැති, ඉතා සුදු වූ, මොළොක් පුලුන් බඳු වූ ඌර්ණාවෙක් දෙබැම අතුරෙහි මැනැවින් හට ගත්තේ විය. ලෝමකූපයන්හි එකෙක දෙකෙක් නො වී ය. එකි එකී ලොමකූයෙහි එක් එක් ලෝමයක් ම හට ගත් සිරුර ඇත්තේ වී ය.

තං ලක්ඛණඤ්ඤූ බහවො සමාගතා
බ්‍යාකංසු උප්පාදනිමිත්තකොවිදා.
උණ්ණා ච ලොමා ච යථා සුසණ්ඨිතා
උපවත්තති ඊදිසකං බහුජ්ජනො.

ගිහිම්පි සන්තං උපවත්තති ජනො
බහු පුරත්ථා පකතෙන කම්මුනා
අකිඤ්චනං පබ්බජිතං අනුත්තරං
බුද්ධම්පි සන්තං උපවත්තති ජනො'ති.

## චත්තාළීසදන්ත - අවිරලදන්ත - ලක්ඛණාදීනි (26,27)

19. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො අහොසි. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසම්භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසම්භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා අහොසි, සො තස්ස කම්මස්ස කතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහාපුරිසලක්ඛණානි පටිලභති: චත්තාළීසදන්තො ච හොති අවිරළදන්තො ච. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්තී -පෙ- රාජා සමානො කිං ලභති? අභෙජ්ජපරිසො හොති අභෙජ්ජා'ස්ස හොන්ති පරිසා බ්‍රාහ්මණගහපතිකා නෙගමජානපදා ගණකා මහාමත්තා අනීකට්ඨා දොවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො භොගියා කුමාරා. රාජා සමානො ඉදං ලභති? -පෙ- බුද්ධො සමානො කිං ලභති? අභෙජ්ජපරිසො හොති අභෙජ්ජා'ස්ස හොන්ති පරිසා භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධො සමානො ඉදං ලභති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

වෙභූතියං සංහිතභෙදකාරිං[1]
භෙදප්පවඩ්ඪනවිවාදකාරිං
කලහප්පවඩ්ඪනඅකිච්චකාරිං
සංහිතානං භෙදජනනිං න භණි.

1. සහිතභෙදකාරිං (මජසං)

උත්පාදශාස්ත්‍ර නිමිත්තශාස්ත්‍රයන්හි දක්ෂ වූ ශරීරලක්ෂණ දන්නා බොහෝ දෙනෙක් රැස්වූවාහු, "මොහු සිරුරැ ඌර්ණාව ද ලොමයෝ ද යමසේ මොනොවට පිහිටියාහු ද, එහෙයින් බොහෝ දෙනා මෙබන්දහු අදහස් අනුව පවතී යැ" යි එය පැවැසූහ.

පූර්ව ජාතීන්හි කරන ලද කර්ම හෙතුයෙන් බහු ජන තෙමෙ ගිහි වැ ඉන්නා වූ ද එ කුමරු අනුව යෙයි. බොහෝ දෙනා කිසි ධන රැස් කිරීමක් නැති, පැවිදි වැ බුදු වූ ම ඔබ අනුව යෙයි.

## චත්වාරිංශත්දන්ත - අවිරලදන්තතාදි-ලක්ෂණ (26, 27)

19. මහණෙනි, "තථාගත තෙමේ පළමු දැහි, පළමු බෙවෙහි, පළමු වුසූ තන්හි, පෙරැ මිනිස් වූයේ ම කේලාම් බස් හැර, කේලාම් බසින් වැළැක්මෙක් විය, මෙ තැනින් අසා මොවුන් ගේ බිඳීම පිණිස එ තැන්හි නො කියන්නේ විය, එ තැන්හි හෝ අසා, ඔවුන්ගේ බිඳීම පිණිස, මොවුනට නො කියන්නේ විය, මෙසේ බිඳුණවුන් ගළපන්නේ ද, ගැළපුණවුනට අනුබල දෙන්නේ ද විය, සමගියෙන් සිටිනවුනට කැමැත්තේ, සමගියෙන් සිටිනවුන් කෙරෙහි ඇලුණේ, සමගියෙන් සිටිනවුනට සතුටු වූයේ, සමගිය ඇති කරන බස් කියන්නේ විය" යන යමෙක් ඇද්ද, හේ ඒ කර්මය කළ බැවින් ... සග ලොවට ගියේය. හේ එයින් ච්‍යුත වූයේ මෙ මිනිස්බවට ආයේ ය, මේ මහපුරිස් ලකුණු දෙක ලබයි: දත් සාළිසක් ඇත්තේ, විරළ නොවූ දත් ඇත්තේ ද වෙයි. හේ ඒ ලක්ෂණයන්ගෙන් සමන්විත වූයේ, ඉදින් ගිහි ගෙහි වසන්නේ නම් ... සක්විති රජ වෙයි. රජ වතුයේ කුමක් ලබයි ද? නො බිඳියැ හැකි පිරිස් ඇත්තේ වෙයි, බ්‍රාහ්මණ ගෘහපති නිගමවාසී ජනපදවාසී ගණක මහාමාත්‍ර සෙනාධිගරක්ෂක ද්වාරපාල අමාත්‍ය පාරිෂද්‍ය රාජ කුමාර යන ඔහුගේ පිරිස්හු නොබිඳියැ හැක්කාහු වෙත්. රජ වතුයේ මෙය ලබයි. බුදු වතුයේ කුමක් ලබා ද? නොබිඳියැ හැකි පිරිස් ඇත්තේ වෙයි. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා දිව්‍ය මනුෂ්‍ය අසුර නාග ගන්ධර්ව යන ඔබ පිරිස්හු නොබිඳියැ හැක්කාහු වෙත්. බුදු වතුයේ මෙය ලබයි"

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. එහි මෙය (ගාථායෙන්) කියනු ලැබේ:

'හේ පෙර අත්බවහි ගැළපුණවුන් (සමගියෙන් සිටිනවුන්) බිඳුවන්නේ හෝ භෙදවැඩෙන විවාද පහළ කරන්නේ හෝ කලහ වැඩෙන නොකට-යුතු කරන්නේ හෝ නො විය. ගැළපුණුවුන් ගේ භෙද උපදවන වචන ද නො කීයේ ය.

අවිවාදවඩ්ඪනකාරිං සුගිරං
භින්නානං සන්ධිජනනිං අභණි.
කලහං ජනස්ස පනුදි සමඞ්ගි
සංහිතෙහි නන්දති පමොදති ච

සුගතිසු සො ඵලවිපාකං
අනුභවති තත්‍ථ මොදති.
දන්තා ඉධ හොන්ති අවිරළා සහිතා
චතුරො දසස්ස මුඛජා සුසණ්ඨිතා.

යදි ඛත්තියො භවති භූමිපති
අවිභෙදියා'ස්ස පරිසා භවන්ති
සමණො ච හොති විරජො විතමලො
පරිසා'ස්ස හොති අනුගතා අචලා'ති.

### පහූතජිවහා-බ්‍රහ්මස්සර ලක්ඛණානි (28,29)

20. යම්පි භික්ඛවෙ පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො අහොසි, යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා අහොසි, සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා -පෙ- සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහාපුරිසලක්ඛණානි පටිලභති, පහූතජිව්හො ච හොති බ්‍රහ්මස්සරො ච කරවීකභාණී. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති. -පෙ- රාජා සමානො කිං ලභති? ආදෙය්‍යවාචො හොති, ආදියන්ති'ස්ස වචනං බ්‍රාහ්මණගහපතිකා නෙගමජානපද ගණකා මහාමත්තා අනීකට්ඨා දොවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො භොගියා කුමාරා. රාජා සමානො ඉදං ලභති -පෙ- බුද්ධො සමානො කිං ලභති? ආදෙය්‍යවාචො හොති, ආදියන්ති'ස්ස වචනං භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධො සමානො ඉදං ලභති.

එතමත්‍ථං භගවා අවොච. තත්‍ථෙතං වුච්චති:

අක්කොසභණ්ඩනවිහෙසකාරිං
උබ්බාධකං[1] බහුජනමද්දනං
බාළ්හං ගිරං සො න භණි ඵරුසං
මධුරං භණී සුසංහිතං සඛිලං.

---

1. උබ්බාධකරං (මජසං)

විවාද වැඩීම කරන සුලු නොවූ, බිඳුණවුනට සමගිය උපදවන සුලු වචන කීයේ ය. සමඩගි ...... ජනයාගේ කලහ දුරු කෙළේ ය. සමගියෙහි පිහිටියවුන් හා සතුටු වෙයි, ප්‍රමුදිත ද වෙයි.

සුගතීන්හි ඵලවිපාක විඳියි, එහි සතුටු වෙයි. මෙහි උපන් ඔහුගේ දත් අවිරළ වේ, එකට සම්බන්ධ වෙයි. ඔහුගේ දන්තයෝ සකළිසෙක් මොනොවට පිහිටියාහ.

ඉදින් පොළොවට ස්වාමී වූ ක්ෂත්‍රියයෙක් වී නම්, ඔහුගේ පිරිස්හු නො බිඳැලියැ හැකි වෙත්. ඉදින් මහණ වන්නේ නම්, පහ වූ කෙලෙස් ධූලි ඇතියේ, පහ වූ කෙලෙස්මල ඇතියේ වෙයි. ඔබ පිරිස ඔබ අනුව ගියේ ස්ථිර වෙයි.

## ප්‍රභූතජිහ්වතා – බ්‍රහ්මස්වරතා–ලක්ෂණ (28, 29)

20. මහණෙනි, "පළමු දැහි පළමු භවයෙහි, පළමු වුසු තන්හි, පෙර මනුෂ්‍ය වනුයේ පරොස් බස් හැර, පරොස් බසින් වැළැක්කේ විය. නිදෙස් වූ, කනට සැප වූ, පෙම් කටයුතු වූ, සිතැ වැද ගන්නා, නියැරියනට සුදුසු වූ, බොහෝ දෙනාට කාන්ත වූ, බොහෝ දෙනාගේ මන වඩන්නා වූ යම් වචනයෙක් වේ ද, එබඳු වචන කියන්නේ වී ය යන යමෙක් ඇද්ද, හේ ඒ කර්මය කළ බැවින් රැස් කළ බැවින් ... සඟ ලොවට ගියේ ය. හේ එයින් සැව, මේ මිනිස්බවට ආයේ ම මේ මහපුරිස් ලකුණු දෙක ලබයි: දික් පුලුල් වූ දිව ඇත්තේ වෙයි, බඹහුගේ බඳු ගැඹුරු හඬ ඇත්තේ, කුරවි කොවුලකුගේ බඳු මිහිරි හඬ ඇත්තේ වෙයි. හේ ඒ ලක්ෂණයන්ගෙන් සමන්විත වූයේ, ඉදින් ගිහිගෙහි වසන්නේ ද, ... සක්විති රජ වෙයි. රජ වනුයේ කුමක් ලබා ද? පිළිගත යුතු වචන ඇත්තේ වෙයි, බමුණෝ ද ගැහැවියෝ ද, නිගම්වැසි දනවුවැසි ජනයෝ ද, ගණකයෝ ද මහාමාත්‍රයෝ ද සෙනාඞග රක්ෂක යෝ ද වාරපාලයෝ ද ඇමැතියෝ ද පරම්පරාගත ව රාජපර්ෂද්හි වූවෝ ද රජුහු ද රජහු දුන් භොගසම්පත් බුත්ති විඳින්නෝ ද රජකුමරුවෝ ද යන ඔහුගේ පිරිස්හු ඔහු බස් පිළිගනිත්: රජ වනුයේ මෙය ලබයි... බුදු වනුයේ කුමක් ලබා ද? පිළිගත යුතු වචන ඇත්තේ වෙයි. මහණ මෙහෙණෝ ද උවසුඋවැසියෝ ද දෙවිහු ද මිනිස්හු ද අසුරයෝ ද නාග යෝ ද ගඳෙවුහු ද ඔබ වචන පිළිගනිත්. බුදු වනුයේ මෙය ලබයි."

භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ වදළ සේක. එහි මේ (ගාථායෙන්) කියනු ලැබේ:

"හෙ තෙමේ ආක්‍රොශ කලහ හිංසා යන මේ දැ කරවන, සිත පෙළන, මහජනයාගේ සිත් රිදුවන, කැකුළු වූ පරොස් බස් නො බිණුයේ ය. ඉතා ප්‍රෙම සහිත වූ මෘදු වූ මිහිරි බස් බිණුයේ ය.

මනසො පියා හදයගාමිනියො
වාචා සො එරයති කණ්ණසුඛා
වාචා සුචිණ්ණඵලමනුභවි.
සග්ගෙසු වෙදය පුඤ්ඤඵලං.

වෙදිත්වා සො සුචරිතස්ස ඵලං
බ්‍රහ්මස්සරත්තමිධජ්ඣගමා.
ජිව්හා'ස්ස හොති විපුලා පුථුලා
ආදෙය්‍යවාක්‍යවචනො භවති.

ගිහිනො'පි ඉජ්ඣති යථා භණතො
අථ චෙ පබ්බජති සො මනුජො
ආදියන්ති'ස්ස වචනං ජනතා
බහුනො බහුං සුභණිතං[2] භණතො'ති.

## සීහහනුලක්ඛණං (30)

21. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො අහොසි, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං, සො තස්ස කම්මස්ස කතත්තා –පෙ– සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති, සීහහනු හොති. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති –පෙ– රාජා සමානො කිං ලභති? අප්පධංසියො හොති කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පච්චාමිත්තෙන. රාජා සමානො ඉදං ලභති –පෙ– බුද්ධො සමානො කිං ලභති? අප්පධංසියො හොති අබ්භන්තරෙහි වා බාහිරෙහි වා පච්චත්ථිකෙහි පච්චාමිත්තෙහි රාගෙන වා දොසෙන වා මොහෙන වා සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. බුද්ධො සමානො ඉදං ලභති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

සම්ඵප්පලාපං න අබුද්ධතන්තිං[3]
අවිකිණ්ණවචනබ්‍යප්පථො අහොසි.
අහිතමපි ච අපනුදි
හිතමපි ච බහුජනසුඛඤ්ච අභණි.

---

1. අඛාළහං (මජසං)
2. සුභාසිතං (ස්‍යා)
3. න සම්ඵප්පලාපං න මුද්ධතං (මජසං)

හේ සිතට ප්‍රිය වූ, සිතැ වැදගන්නාවූ, කනට සැප වූ, වචන කියයි වාක්සුචරිතයාගේ ඵලය හේ වින්දේ ය. ස්වර්ගයන්හි (වාක්සුචරිතමය) පිනේ පල වින්දේ ය.

හේ සුචරිතයේ විපාක ලැබීමෙන් මෙහි දී, බ්‍රහ්මස්වර බව ලැබී ය. ඔහුගේ දිව දික් ද පුලුල් ද වෙයි. හේ පිළිගත යුතු වචන ඇත්තේ වෙයි.

යම්සේ කියන ගෘහස්ථයාගේ ද වචන ය සිදු වන්නේ ද ඉදින් ඒ මිනිස් තෙමේ පැවිදි වන්නේ නම් බොහෝ ජනයාට බොහෝ වූ මනාප වචන කියන ඔබ ගේ වචන ජනතාවෝ පිළිගනිත් යැ යි නෛමිත්තක යෝ කීහ.

## සිංහහනු - ලක්ෂණය (30)

21. මහණෙනි, "තථාගත තෙමේ පළමු දැහි, පළමු භවයෙහි, පළමු වුසූ තන්හි, පෙර මිනිස් වූයේ ම සම්ඵප්‍රලාපය හැර, සම්ඵප්‍රලාපයෙන් වැළැක්කේ, කල් දුන කියනුයේ, සත්‍යය ම කියනුයේ, වැඩ සලසන බසක් ම කියනුයේ, කුසල් දහම් අසළ බසක් ම කියනුයේ, විනය අසළ බසක් ම කියනුයේ විය, සිතැ තබා ගන්නට නිසි වූ, කරුණු සහිත වූ, සයිම වූ අර්ථනිඃශ්‍රිත වූ වචන සුදුසු කල්හි කියන්නේ වී ය" යන යමෙක් ඇද්ද, හෙ තෙමෙ ඒ කර්මය කළ බැවින් ... සග ලොවට පැමිණි යේ ය. එයින් සැව මෙ මිනිස් බවට ආයේ ම මේ මහපුරිස්ලකුණ ලබයි: හේ සිංහයකුගේ යැටි හනුව සේ පිරුණු උඩු යැටි දෙහනු ඇත්තේ වෙයි. ඒ ලක්ෂණයෙන් සමන්විත වූ හෙ තෙමේ ඉදින් ගිහි ගෙහි වසන්නේ නම්, ... සක්විති රජ වෙයි. රජ වනුයේ කුමක් ලබා ද? මිනිස් වූ කිසි දු සතුරෙකු විසින්, පසමිතුරකු විසින්, නෙරපියැ නො හැක්කේ වෙයි. රජ වනුයේ මෙය ලබයි ... බුදු වනුයේ කුමක් ලබා ද? අන් සත්නට උපදනා පරිදි රාගය විසින් හෝ ද්වේෂය විසින් හෝ මෝහය විසින් හෝ මෙසේ අභ්‍යන්තරික සතුරන් පසමිතුරන් විසින් හෝ මහණක් හු විසින් හෝ බමුණක්හු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ මෙසේ බාහිරක සතුරන් පසමිතුරන් විසින් හෝ ලොවැ කිසි දු කෙනකු විසින් හෝ නෙරපියැ නොහැක්කේ වෙයි බුදු වනුයේ මෙය ලබයි.

"හේ පැණවතුන්ගේ වචන පරම්පරාවක් නොවූ සම්ඵප්‍රලාප නො දෙඩී ය. හේ නොවිසුරුණු වචනයැ යි කියන ලද වාඩමාර්ගය ඇත්තේ විය. අවැඩ හා බැඳුණු බස් ද දුරු ලී ය. අභිවෘද්ධිදායක වූ ද බොහෝ දෙනාට සුව එළවන්නාවූ ද බස් බිණී ය.

තං කත්වා ඉතො චුතො දිවමුපපජ්ජි
සුකතඵලවිපාකමනුභොසි
චවිය පුනරිධාගතො සමානො
ද්විදුග්ගමවරතරහනුත්තමලත්ථ.

රාජා හොති සුදුප්පධංසියො
මනුජින්දො මනුජාධිපති මහානුභාවො,
තිදිවපුරවරසමො භවති
සුරවරතරොරිව ඉන්දො.

ගන්ධබ්බාසුරයක්ඛරක්ඛසෙභි
සුරෙහි න හි භවති සුප්පධංසියො,
තථත්තො යදි භවති තථාවිධො
ඉධ දිසා ච පටිදිසා ච විදිසාචාති.

### සමදන්ත-සුසුක්කදාඨා-ලක්ඛණානි (31, 32)

22. යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙසි තුලාකූට-කංසකූට-මානකූට-උක්කොටන-වඤ්චන-නිකති - සාචියොග-ඡෙදන-වධබන්ධන විපරාමොස-ආලොප-සහසාකාරා පටිවිරතො අහොසි, සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. සො තත්ථ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි: සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහාපුරිසලක්ඛණානි පටිලභති, සමදන්තො ච හොති සුසුක්කදාඨො ච.

එය කොට මෙයින් සැව, දෙව්ලොවට පැමිණියේ ය. මොතොවට කළ කර්මයාගේ ඵලවිපාක විත්දේ ය. එයින් සැව, නැවැත මෙහි ආයේ ම, සිංහහනු ලක්ෂණය ලද්දේ ය.

මිනිස්නට ඉන්ද්‍ර වූ, මනුෂ්‍යාධිපති වූ, මහ තෙදැති, කිසිසේත් බැහැර නො කටහැකි රජෙක් වෙයි, සක්දෙව් බඳු වෙයි. සුරශ්‍රෙෂ්ඨ වූ ඉන්ද්‍රයා බඳු වෙයි.

ඉදින් එබඳු ස්වභාවය ඇත්තේ, එබඳු ලක්ෂණ ඇත්තේ මෙහි උපදනේ ද, සතර දිග ද සතර අනුදිග ද උඩ යට දෙදිග ද වසන ගදෙවු යක් රකුස් දෙව යන කිසි දු කෙනෙකු විසින් හෙලාලි යැ නො හැක්කේ වෙයි.''

## සමදන්ත - සුශුක්ල දංෂ්ට්‍රා ලක්ෂණ (31, 32)

22. මහණෙනි, ''තථාගත තෙමේ පළමු දැහි පළමු භවයෙහි, පළමු වුසු තන්හි, පෙර මිනිස් වූයේ ම මිථ්‍යා ආජීවය හැර, සම්‍යගාජීවයෙන් දිවි පැවැත්වී ය, තුලාකූට (තරාදියෙන් කරන වඤ්චාව) කංසකූට (රන් තලුතැටියෙන් කරන වඤ්චාව,) මානකූට (මිනීමෙන් කරන වඤ්චාව,) උත්කොටන (අල්ලස් ගෙන නොහිමියන් හිමියන් කිරීම,) වංචන (නොයෙක් උපායෙන් අනුන් රවැටීම,) නිකති (බොරු රන් බොරු මැණික් ආදිය දීමෙන් කරන වඤ්චාව,) සාචියෝග (උත්කොටනාදි ක්‍රියා) ඡේදන වධ බන්ධන විපරාමොස (සැහැවී සිට අන් සතු දැ පැහැර ගැන්ම,) ආලොප (ගම්පැහැරුම් නුවර පැහැරුම් ආදිය.) සහසාකාර (බලාත්කාරයෙන් ගැන්ම යන මෙයින් වැළක්කේ වී ය'' යන යමෙක් ඇද්ද, හේ ඒ කර්මය කළ බැවින්, රැස් කළ බැවින්, බොහෝ සේ කළ බැවින්, මහත් කොට කළ බැවින්, කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට පැමිණෙයි. හේ දිව්‍ය ආයුෂයෙන් ද දිව්‍ය වර්ණයෙන් ද දිව්‍ය සැපයෙන් ද දිව්‍ය යශයින් ද දිව්‍ය ආධිපත්‍යයෙන් ද දිව්‍ය රූපයන්ගෙන් ද දිව්‍ය ශබ්දයන් ගෙන් ද දිව්‍ය ගන්ධයන් ගෙන් ද දිව්‍ය රසයන් ගෙන් ද දිව්‍ය ස්ප්‍රෂ්ටව්‍යයන් ගෙන් ද යන කරුණු දශයෙකින් අන් දෙවියන් ඉක්මැ (මැඩලා) සිටියි. හේ එයින් සැව, මෙ මිනිස්බවට ආයේ ම, මේ මහපුරිස් ලකුණු දෙක ලබයි: සමදත් ඇත්තේ ද, ඉතා සුදු පැහැ දත් ඇත්තේ ද වෙයි.

සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්ත රතනානි භවන්ති: සෙය්‍යථීදං චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අඛිලමනිමිත්තමකණ්ටකං ඉද්ධං ඵීතං ඛෙමං සිවං නිරබ්බුදං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන සමෙන අභිවිජිය අජ්ඣාවසති. රාජා සමානො කිං ලභති? සුචිපරිවාරො හොති, සුචි'ස්ස හොන්ති පරිවාරා බ්‍රාහ්මණගහපතිකා නෙගම ජානපද ගණකා මහාමත්තා අනීකට්ඨා දොවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො භොගියා කුමාරා. රාජා සමානො ඉදං ලභති. සචෙ ඛො පන අගාරස්මා අනගාරියා පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡදො. බුද්ධො සමානො කිං ලභති? සුචිපරිවාරො හොති, සුචි'ස්ස හොන්ති පරිවාරා භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධො සමානො ඉදං ලභති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

මිච්ඡාජීවඤ්ච අවස්සජි සමෙන වුත්තිං
සුචිනා සො ජනයිත්ථ ධම්මිකෙන
අහිතමපි ච අපානුදි[1]
හිතමපි ච බහුජනසුඛඤ්ච ආචරි.[2]

සග්ගෙ වෙදයති නරො සුඛප්ඵලානි
කරිත්වා නිපුණෙහි විඤ්ඤූහි
සබ්භි වණ්ණිතානි තිදිවපුරවරස්මො
අභිරමති රතිඛිඩ්ඩාසමඞ්ගී.

ලද්ධා[3] මානුසකං භවං තතො
චවිත්වා[4] සුකතඵලවිපාකං
සෙසකෙන පටිලභති ලපනජං
සම්මපි සුචි සුසුක්කං.[5]

1. අපනුදී (මජසං)
2. අචරි (මජසං)
3. ලද්ධාන (මජසං)
4. චවිත්වාන (මජසං)
5. ලද්ධාන මනුස්සකං භවං තතො චවිය පුන, සුකත, ඵලවිපාක, සෙ සකෙන පටිලභති ලපනජං සමමපි සුචි ච සුවිසුද්ධ සුසුක්කං (ස්‍යා)

මහණෙනි, ඒ ලක්ෂණයන්ගෙන් සමන්විත වූයේ, ඉදින් ගිහිගෙහි වසන්නේ වී නම්, දැහැමි වූ ධර්මරාජ වූ, සිවුසයුර ඉම් කොටැති සිවු මහ දිවයිනට නායක වූ, සතුරන් දිනූ, දනවුහි තහවුරු බවට පැමිණි, සත් රුවනින් සමන්වාගත සක්විති රජෙක් වෙයි. ඇත්රුවන, අස්රුවන, මිණිරුවන, ඉත්ථිරුවන, ගැහැවිරුවන, සත්වනු පුත්රුවන ම යැ යි ඔහුට මේ සත් රුවන් කෙනෙක් වෙත්. ශූර, වීර, ඇඟරුව ඇති, සතුරුසෙන් මඩිනුයෙහි බුහුටි, අයිරා දහස් පුත් කෙනෙක් ඔහුට වෙත්. ඒ සක්විති තෙමේ සයුර හිම් කොට මෙ පොළොව, සතුරු ජන නැමැති හුල්නැති, සතුරු බිය නිමිති නැති, සතුරු ජන නැමැති කටු නැති, නිරුපද්‍රැත, නිවුණු සැනැහුණු, සතුරු අර්බුද නැති ක්ෂෙම භූමියක් කොට, දඬුවමින් තොර වැ අවියෙන් තොර වැ, දැහැමින් දිනා අධිපති වැ වෙසෙයි. රජ වනුයේ කුමක් ලබයි ද? මහ පිරිසිදු පිරිවර ඇත්තේ වෙයි. නියම්ගම් වැසි දනව්වැසි ජනයෝ ද, බමුණු ගැහැවියෝ ද, ගණකයෝ ද මහාමාත්‍රයෝ ද, සෙනාඬග රක්ෂකයෝ ද, ද්වාරපාලයෝ ද, පරම්පරාගත වැ රාජපර්ෂදෙහි වූ ඇමැත්තෝ ද, රජුහු දුන් භොගසම්පත් විඳුනා ප්‍රභූහු ද, රජුහු ද රජකුමරු වෝ ද යන ඔහුගේ පිරිසිදු පිරිවරජනයෝ ගණනින් මහත් වෙති. රජ වනුයේ මෙය සපුරා ලබයි. ඉදින් ගිහි ගෙන් නික්මැ, සස්නැ පැව්දි වන්නේ නම්, අර්හත් වූ ලොවැ බැහැර කොට හළ කෙලෙස් සෙවෙණි ඇති, සම්මාසම්බුදුවරයෙක් වෙයි. බුදු වනුයේ කුමක් ලබයි ද? පිරිසිදු පිරිවර ඇත්තේ වෙයි. ඔබට භික්ෂූ ද භික්ෂුණීහු ද උපාසකයෝ ද උපාසිකාවෝ ද දෙවියෝ ද මිනිස්සු ද අසුරයෝ ද නාගයෝ ද ගන්ධර්වයෝ ද යි මේ පවිත්‍ර වූ පිරිවර සවවෝ වෙත්. බුදු වනුයේ මෙය ලබයි.''

භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළ සේක. එහි මෙය (ගාථා වචන විසින්) කියනු ලැබේ:

මහ තෙමේ මිථ්‍යාආජීවය ද බැහැර ලීය. දැහැමෙන් සෙමෙන් පවිත්‍ර ආජීවයෙන් දිවිපැවැත්ම ඉපැදවී ය. අහිත දෑ ද බැහැරකෙළේ ය. බොහෝ දෙනාට හිත වැඩ ද බොහෝ දෙනාට සුවය ද සිදු කෙළේ ය.

මනුෂ්‍ය වූ මහ තෙමේ නිපුණ වූ නුවණැති සත්පුරුෂයන් විසින් වර්ණිත වූ පින් කම් කොට, ස්වර්ගයෙහි සැප විපාක විඳියි. ඒ දිව්‍ය සුවක්‍රීඩායෙන් යුක්ත වැ සක්දෙවිඳු සේ වෙසෙයින් සුව විඳ වෙසෙයි.

එයින් සැව මිනිසත් බව ලැබ, ඉතිරි කුශලවිපාකයෙන් සම වූ ද ඉතා සුදු වූ ද දත් ලබයි.

තං වෙය්‍යඤ්ජනිකා සමාගතා
බහවො බ්‍යාකංසු නිපුණසම්මතා මනුජා
සුචිජනපරිවාරගණො භවති
දිජසමසුක්කසුචිසොභනදන්තො.

රඤ්ඤො හොති බහුජනො
සුචිපරිවාරො මහතිං මහිං අනුසාසතො,
පසය්හ න ච ජනපදතුදනං
හිතම්පි ච බහුජනසුඛඤ්ච චරන්ති.

අථ චෙ පබ්බජති භවති විපාපො
සමණො සමිතරජො විවත්තච්ඡද්දො,
විගතදරථකිලමථො
ඉමම්පි ච පරම්පි ච[1] පස්සති ලොකං.

තස්සොවාදකරා බහූ ගිහී ච පබ්බජිතා ච
අසුචිගරහිතං[2] ධුනන්ති පාපං,
ස හි සුචිහි පරිවුතො භවති
මලඛිලකලිකිලෙසෙ පනුදෙති ති.[3]

ලක්ඛණසුත්තං නිට්ඨිතං සත්තමං.

1. ඉමම්පි ච පරම්පි ච (PTS), පරම්පි පරම්පි ච (ස්‍යා)
2. අසුචිං ගරහිතං (මජසං)
3. තස්සොවාදකරා බහුගිහී ච, පබ්බජිතො ච අසුචිවිගරහිත- පනුදි පාපස්ස හි සුචිහි පරිවුතො, භවති මලඛිලක කිලෙස පනුදෙති (ස්‍යා)

පණ්ඩිතසම්මත වූ බොහෝ ලක්ෂණ පාඨක බමුණෝ රැස් වූවාහු, 'මෙ තෙමේ දෙවරක් උපන් සම වූ සුදු වූ පිරිසිදු වූ ශොභන දත් ඇත්තේ පිරිසිදු ජනයන් පිරිවර මුළුව කොටැත්තේ වේ' යැ යි ද,

රජ වූ මොහුට බොහෝ දෙනා පිරිසිදු පිරිවර වෙයි. මහ පොළොව අත් කොට ගෙන පාලනය කරන්නේය. අන් කෙනෙකුගෙන් මොහුගේ රටට පීඩාවෙක් නො වෙයි. එ දනවුහි වැස්සෝ උනුනට හිතවැඩ ද බොහෝ දෙනාට සුවය ද සිදු කෙරෙත් යැ යි ද,

ඉදින් මෙ තෙමේ පැවිදි වන්නේ නම්, පහ වූ පව් ඇති, සංසිඳුවූ කෙලෙස් දූලි ඇති, බැහැර කළ කෙලෙස් සෙවෙනි ඇති, පහ වූ කායික පීඩා හා ක්ලාන්ති ඇති ශ්‍රමණයෙක් වනුයේ, මෙ ලොව ද පර ලොව ද දකී යැ යි ද,

ඔබගේ අවවාද පිළිපදනා බොහෝ ගිහියෝ ද පැවිද්දෝ ද අශුචි සෙයින් ගර්හිත වූ පාපය වනසත්. හේ වනාහි පිරිසිදු දහමින් පිරිවැරුණේ වෙයි. රාගාදි කෙලෙස් නැමැති මල ද කණු කවු ද දොෂ නැමැති පාපය ද සියලු කෙලෙසුන් ද ප්‍රහීණ කරන්නේ යැ'යි ද කියා පැවැසූහ.

සත්වනු ලක්ෂණ සූත්‍රය නිමියේ යැ.

# 8

# සිගාලසුත්තං

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන සිගාලකො[1] ගහපතිපුත්තො කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා[2] නමස්සති, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං,

2. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා සිගාලකං ගහපතිපුත්තං කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථං අල්ලකෙසං පඤ්ජලිකං පුථුද්දිසා නමස්සන්තං, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං. දිස්වාන සිගාලකං ගහපතිපුත්තං එතදවොච: කින්නු ඛො ත්වං ගහපතිපුත්ත කාලස්සෙව උට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සසි, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසන්ති?''.

''පිතා මං භන්තෙ කාලං කරොන්තො එවං අවච: 'දිසා තාත නමස්සෙය්‍යාසී'ති. සො ඛො අහං භන්තෙ පිතු වචනං සක්කරොන්තො ගරුකරොන්තො මානෙන්තො පූජෙන්තො කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සාමි, පුරත්ථිමං දිසං -පෙ- උපරිමං දිසන්ති''.

''න ඛො ගහපතිපුත්ත අරියස්ස විනයෙ එවං ඡද්දිසා නමස්සිතබ්බා''ති.

''යථාකථං පන භන්තෙ අරියස්ස විනයෙ ඡද්දිසා නමස්සිතබ්බා? සාධු මෙ භන්තෙ භගවා තථා ධම්මං දෙසෙතු යථා අරියස්ස විනයෙ ඡද්දිසා නමස්සිතබ්බා''ති.

1. සිඞ්ගාලකො (මඡසං)
2. පුථුදිසා (මඡසං)

# 8

# සිගාලක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර නිසා කලන්දක නිවාප නම් වූ වෙළුවන අරමැ වැඩ වසන සේක. එ කල්හි සිගාලක නම් ගැහැවි පුත් කලින් ම (උදසනක් සේ ම) නැඟී සිට, රජගහ නුවරින් නික්මැ ගොස්, තෙත් රෙදි ඇත්තේ, තෙත් කෙහෙ ඇත්තේ, දෙහොත් මුදුනැ තබා ගත්තේ පෙර දෙස ද, දකුණු දෙස ද, අවර දෙස ද, උතුරු දෙස ද, යට දෙස ද, උඩ දෙස ද යන බොහෝ දිශාවන් වඳී.''

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි හැඳ පෙරෙවැ, පා සිවුරු ගෙන, රජගහ නුවරට පිඩු පිණිස පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ, කලින් ම නැඟී සිට රජගහ නුවරින් නික්මැ, තෙත් වස්ත්‍ර ඇති ව, තෙත් කෙහෙ ඇතිව, දෙහොත් මුදුනැ තබා ගෙන, පෙර දෙස ද දකුණු දෙස ද අවර දෙස ද, උතුරු දෙස ද යට දෙස ද, උඩ දෙස ද වඳනා සිගාලක ගැහැවි පුතු දුටු සේක් ම ය. දැක, ඔහු බණවා, 'ගැහැවි පුත, කවර හෙයින් තෙපි කල් තබා ම නැඟී සිට රජගහ නුවරින් නික්මැ, තෙත් වස්ත්‍ර ඇත්තෙහි, තෙත් කෙහෙ ඇත්තෙහි, දෙහොත් මුදුන් තබාගෙන, පෙර දෙස දකුණු දෙස අවර දෙස උතුරු දෙස යට දෙස උඩ දෙස යන බොහෝ දිශාවන් වඳිවූ ද?''යි අසා වදළ සේක.

''වහන්ස, මා පියා කලුරිය කරනුයේ, 'දරුව, දිශාවන් වඳුව'යි මට මෙසේ කී ය. වහන්ස, ඒ මම් පියාගේ වචනයට සත්කාර කරනුයෙම්, ගරුකාර කරනුයෙම්, බුහුමන් කරනුයෙම්, පූජා කරනුයෙම්, කලින් ම නැඟී සිට රජගහ පුරයෙන් නික්මැ, තෙත් රෙදි ඇති ව, තෙත් කෙහෙ ඇති ව, දෙහොත් මුදුනැ තබාගෙන, පෙර දෙස... උඩ දෙස වඳිමි'යි (සිගාලක තෙමේ) කී ය.

'ගැහැවි පුත, ආර්‍ය විනයයෙහි ස දෙස්හු මෙසේ නො වැන්ද යුත්තා-හ'යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

'වහන්ස, කෙසේ නම් ආර්‍ය විනයයෙහි ස දෙස්හු වැන්ද යුත්තා-හු ද? වහන්ස, ආර්‍යවිනයයෙහි යම්සේ ස දෙස්හු වැන්ද යුත්තාහු නම්, එසේ භාග්‍යවතුන් වහන්සේ මට දහම් දෙසන සේක් වා'යි ගැහැවි පුත් කී ය.

ඡද්දිසා

3. තෙන හි ගහපතිපුත්ත සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමී'ති.

'එවං භන්තෙ'ති ඛො සිඟාලො ගහපතිපුත්තො භගවතො පච්චස්සොසි.

භගවා එතදවොච:

"යතො ඛො ගහපතිපුත්ත අරියසාවකස්ස චත්තාරො කම්මකිලෙසා පහීණා හොන්ති, චතූහි ඨානෙහි පාපකම්මං න කරොති, ඡ ච භොගානං අපායමුඛානි න සෙවති, සො එවං චුද්දසපාපකාපගතො, ඡද්දිසාපටිච්ඡාදී,[1] උභයලොකවිජයාය පටිපන්නො හොති, තස්ස අයං චෙව ලොකො ආරද්ධො හොති පරො ච ලොකො. සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

කම්මකිලෙසා

4. කතමස්ස චත්තාරො කම්මකිලෙසා පහීණා හොන්ති? පාණාතිපාතො ඛො ගහපතිපුත්ත කම්මකිලෙසො, අදින්නාදානං කම්මකිලෙසො, කාමෙසු මිච්ඡාචාරො කම්මකිලෙසො, මුසාවාදො කම්මකිලෙසො. ඉමස්ස චත්තාරො කම්මකිලෙසා පහීණා හොන්ති"ති. ඉදමවොච භගවා. ඉදං වත්වා[2] සුගතො, අථාපරං එතදවොච සත්ථා:

පාණාතිපාතො අදින්නාදානං මුසාවාදො ච වුච්චති
පරදාරගමනඤ්චෙව නප්පසංසන්ති පණ්ඩිතා'ති.

අගතිගමනානි

5. කතමෙහි චතූහි ඨානෙහි පාපකම්මං කරොති? ඡන්දාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති, දොසාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති, මොහාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති, භයාගතිං ගච්ඡන්තො පාපකම්මං කරොති. යතො ඛො ගහපතිපුත්ත අරියසාවකො නෙව ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, ඉමෙහි චතූහි ඨානෙහි පාපකම්මං න කරොති'ති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

ඡන්දා දොසා භයා මොහා යො ධම්මං අතිවත්තති,
නිහීයති තස්ස යසො[3] කාළපක්ඛෙ'ව චන්දිමා.

---

1. ඡද්දිසා පටිච්ඡාදි හොති (ස්‍යා)
2. වත්වාන (මජසං)
3. යසො තස්ස (මජසං)

## ස දිසා

3. 'ගැහැවි පුත, එසේ වී නම් අසව, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමි'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

එසේ ය, වහන්සැ'යි ම සිගාලක ගැහැවි පුත් භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: "ගැහැවි පුත, යම් හෙයෙකින් ආර්‍ය්‍යශ්‍රාවකයා ගේ සතර කර්මක්ලේශයෝ ප්‍රහීණ වෙත් ද, යම් හෙයෙකින් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සතර කරුණෙකින් පවකම් නො කරයි ද, යම් හෙයෙකින් භෝගයන් ගේ විනාශමුඛ සයත් නො සෙවී ද, හෙ තෙමේ මෙසේ තුදුස් ලාමක කම්වලින් පහ වූයේ ස දිසාවන් වසාලනුයේ, දෙලෝ ජය ගැන්ම පිණිස පිළිපන්නේ වෙයි. ඔහු විසින් මෙලොවද ආරාධිත වෙයි, පරලොවද ආරාධිත වෙයි. හේ කාබුන් මරණින් මතු මනාප ගති ඇති ස්වර්ග ලෝකයට පැමිණෙයි.

## කර්ම ක්ලේශ

4. ඔහු ගේ කවර සතර දෙනෙක් කර්ම ක්ලේශයෝ (අත්බව කිළිටි කරන කර්ම) ප්‍රහීණ වෙත් ද? ගැහැවිපුත, ප්‍රාණඝාතය වනාහි කර්ම ක්ලේශයෙකි, අදත්තාදනය කර්ම ක්ලේශයෙකි, කාමයන්හි වරදවා හැසිරීම කර්ම ක්ලේශයෙකි, මෘෂාවාදය කර්ම ක්ලේශයෙකි. ඔහු ගේ මේ කර්ම ක්ලේශයෝ ප්‍රහීණ වෙත්.'' භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගතයන් වහන්සේ මෙය වදරා, ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්සේ නැවැත ගාථා බන්ධන වශයෙන් අනෙකක් වූ මෙය වදාළ සේක:

පණිවා ද, අයිනාදන් ද, මුසවා යැ යි යමෙක් කියනු ලැබේ නම් එය ද, පරඹුන් කරා යෑම ද යන මේ දෑ නුවණැත්තෝ නො පසසත්.

## අගති ගමන

5. (ආර්ය ශ්‍රාවක තෙමේ) කවර සතර කරුණෙකින් පවකම් නො කෙරේ ද යත්: (පුහුදුන්තෙමේ), ඡන්දයෙන් අගතියට යනුයේ (නො කටයුත්තක් කරනුයේ) පවකම් කරයි. ද්වෙෂයෙන් අගතියට යනුයේ පවකම් කරයි, බියෙන් අගතියට යනුයේ පවකම් කරයි, මෝහයෙන් අගතියට යනුයේ පවකම් කරයි. ගැහැවිපුත, යම් හෙයෙකින් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ඡන්දයෙන් අගතියට නො ම යන්නේ ද, ද්වෙෂයෙන් අගතියට නො ම යන්නේ ද, බියෙන් අගතියට නොම යන්නේ ද, මෝහයෙන් අගතියට නො ම යන්නේ ද, හේ මේ සතර කරුණින් පවකම් නො කෙරෙයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක, ශාස්තෘ වූ සුගතයන් වහන්සේ මෙය වදරා, නැවත ගාථාබන්ධන වශයෙන් අනෙකක් වූ මේ වචන ද වදාළ සේක:

' ඡන්දයෙන් ද ද්වෙෂයෙන් ද බියෙන් ද මොහයෙන් ද යමෙක් යුක්තිධර්මය ඉක්මැ යේ ද, කළුවර පසැ සඳුහු මෙන්, ඔහුගේ යශස පිරිහෙයි.

ඡන්දා දොසා භයා මොහා යො ධම්මං නාතිවත්තති,
ආපූරති තස්ස යසො[1] සුක්කපක්ඛෙ ව[2] චන්දිමා'ති.

## ඡ අපායමුඛානි

6. කතමානි ඡ භොගානං අපායමුඛානි න සෙවති? සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගො ඛො ගහපතිපුත්ත භොගානං අපායමුඛං. විකාලවිසිඛාචරියානුයොගො භොගානං අපායමුඛං. සමජ්ජාභිචරණං භොගානං අපායමුඛං. ජූතප්පමාදට්ඨානානුයොගො භොගානං අපායමුඛං. පාපමිත්තානුයොගො භොගානං අපායමුඛං ආලස්සානුයොගො භොගානං අපායමුඛං.

## මජ්ජපානාදීනවා

ඡ ඛො' මෙ ගහපතිපුත්ත ආදීනවා සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ: සන්දිට්ඨිකා ධනජානි, කලහප්පවඩ්ඪනී, රොගානං ආයතනං, අකිත්තිසඤ්ජනනී, කොපීනනිදංසනී පඤ්ඤාය දුබ්බලීකරණීත්වෙව ඡට්ඨං පදං භවති. ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ.

## විකාලචරියාදීනවා

ඡ ඛො' මෙ ගහපතිපුත්ත ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ: අත්තා පි'ස්ස අගුත්තො අරක්ඛිතො හොති පුත්තදාරො පි'ස්ස අගුත්තො අරක්ඛිතො හොති, සාපතෙය්‍යම්පි'ස්ස අගුත්තං අරක්ඛිතං හොති, සඞ්කියො ච හොති පාපකෙසු ඨානෙසු, අභූතවචනං ච තස්මිං රූහති, බහූනඤ්ච දුක්ඛධම්මානං පුරක්ඛතො හොති. ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ.

## සමජ්ජාභිචරණාදීනවා

ඡ ඛො' මෙ ගහපතිපුත්ත ආදීනවා සමජ්ජාභිචරණෙ: ක්ව[3] නච්චං ක්ව ගීතං, ක්ව වාදිතං, ක්ව අක්ඛානං, ක්ව පාණිස්සරං, ක්ව කුම්භථූණන්ති? ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සමජ්ජාභිචරණෙ.

---

1. යසො තස්ස (මජසං)
2. ජුණ්හපක්ඛෙව (සම)
3. කුවං (PTS)

යමෙක් ඡන්දයෙන් ද ද්වේෂයෙන් ද බියෙන් ද මෝහයෙන් ද යුක්තිධර්මය ඉක්මැ නො යේ ද, ඔහුගේ යශස පුර පසැ සඳුහු මෙන් වැඩෙයි.''

## අපායමුඛ සය

6. හේ භෝගයන් ගේ කවර විනාශමුඛ සයක් නො සෙවි ද යත්: ගැහැවි පුත, මත් බවට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පිමෙහි යෙදීම භෝග-යන් ගේ විනාශ මුඛයෙකි. නොකල්හි වීථිසංචාරයෙහි යෙදීම භොගයන් ගේ විනාශ මුඛයෙකි. උත්සව දර්ශනය පිණිස යැම භෝගයන්ගේ විනාශ මුඛයෙකි, ප්‍රමාදයට කාරණයක් වූ දූකෙළියෙහි යෙදීම භෝගයන්ගේ විනාශ මුඛයෙකි. පාපමිත්‍රයන් හා පුන පුනා එක් වීම භෝගයන් ගේ විනාශ මුඛයෙකි. අලසබව්හි නැවත නැවත යෙදීම භෝගයන් ගේ විනාශ මුඛයෙකි.

## මද්‍යපානාදීනව

ගැහැවි පුත, මත්බවටත් ප්‍රමාදයටත් කාරණ වූ රහමෙර පිමෙහි පුන පුනා යෙදීමෙහි මේ දෙස් සයෙකි: මෙ ලොවැදීම වන ධන හානිය, කලහ වැඩීම, රෝගයනට කෙතක් වීම, අපකීර්ති ඉපැදවීම, කයෙහි ගුහ්‍යස්ථාන විවෘත කොට හැසිරීම, නුවණ දුර්වල කිරීම යන සවැනි කාරණය ද වෙයි. ගැහැවි පුත, මදයට ප්‍රමාදයට කාරණ වූ රහමෙර පිමෙහි මේ දෙස් සය වේ.

## විකාලචරියාදීනව

ගැහැවි පුත, නොකල්හි වීථි සඤ්චාරයෙහි පුන පුනා යෙදීමෙහි මේ දෙස් සයෙකි: තෙමේ ද සංගොපිත නො වූයේ නො රක්නාලද්දේ වෙයි. ඔහුගේ අඹුදරුවෝ ද අසංගෝපිත වූවාහු නොරක්නා ලද්දහු වෙත්, ඔහු ගේ වස්තුව ද සංගොපිත නො වූයේ නො රක්නා ලද්දේ වෙයි. පාප ක්‍රියාවන්හි සැක කටයුත්තෙක් ද වෙයි, අභූත දෝෂ කථා ද ඔහු කෙරෙහි නැඟෙයි, තවත් බොහෝ දුක් දෙම්නසුන් විසින් පෙරටු කරන ලද්දේ වෙයි, (බොහෝ දුක් ඔහු පසු පස එයි). ගැහැවි පුත, මොහු සඳෙහා නොකල්හි වීථිසඤ්චාරයෙහි පුන පුනා යෙදීමෙහි දෙෂ-යෝ ය.

## සමජ්ජාභිචරණාදීනව

ගැහැවි පුත, උත්සව දර්ශනයට යාමෙහි මේ දෙස් සයෙකි: කොහි නැටුම් ඇද්ද? කොහි ගැයුම් ඇත්ද? කොහි වැයුම් ඇද්ද? ආඛ්‍යාන (රාමායණාදි කථා කීම) කොහි ඇද්ද? අත්තාලම් ඈ ගැසීම කොහි ඇද්ද? කළ පිඹීම් ආදිය කොහි ඇද්ද?යි සොයා හැවිදිත්. උත්සව දර්ශන-යට යැමෙහි මේ ආදිනව සය ය.

### ජූතප්පමාදාදීනවා

ඡ ඛො’ මෙ ගහපතිපුත්ත ආදීනවා ජූතප්පමාදට්ඨානානුයොගෙ: ජයං වෙරං පසවති, ජිතො විත්තමනුසොචති, සන්දිට්ඨිකා ධනජානි, සභාගතස්ස[1] වචනං න රූහති, මිත්තාමච්චානං පරිභූතො හොති, ආවාහවිවාහකානං අපත්ථිතො හොති, අක්ඛධුත්තො අයං පුරිසපුග්ගලො නාලං දරභරණායා’ති. ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා ජූතප්පමාදට්ඨානානුයොගෙ.

### පාපමිත්තානුයොගාදීනවා

ඡ ඛො’ මෙ ගහපතිපුත්ත ආදීනවා පාපමිත්තානුයොගෙ: යෙ ධුත්තා, යෙ සොණ්ඩා, යෙ පිපාසා, යෙ නෙකතිකා යෙ වඤ්චනිකා යෙ සාහසිකා, ත්‍යාස්ස මිත්තා හොන්ති, තෙ සහායා. ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා පාපමිත්තානුයොගෙ.

### ආලස්සාදීනවා

ඡ ඛො’ මෙ ගහපතිපුත්ත ආදීනවා ආලස්සානුයොගෙ: අතිසීතන්ති කම්මං න කරොති, අතිඋණ්හන්ති කම්මං න කරොති, අතිසායන්ති කම්මං න කරොති, අතිපාතො’ති කම්මං න කරොති, අතිජාතො’ස්මීති කම්මං න කරොති, අතිධාතො’ස්මීති කම්මං න කරොති. තස්ස එවං කිච්චාපදෙසබහුලස්ස විහරතො අනුප්පන්නා චෙව භොගා නුප්පජ්ජන්ති, උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති. ඉමෙ ඛො ගහපති පුත්ත ඡ ආදීනවා ආලස්සානුයොගෙ’’ති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

1. සභාගෙ තස්ස (කම)

## ද්‍යූතප්‍රමාදදීනව

ගැහැවි පුත, ප්‍රමාදයට කාරණ වූ දූ කෙළියෙහි යෙදීමෙහි මේ දෙස් සයෙකි: දිනාහුයේ (පැරදුණුහු තුළ) වෛර උපදවයි, පැරදුණේ (නටුවාවූ) වස්තුව අනුව සොවී. තමා දක්කැදී ම ධනහානිය වේ. සභාවට ගිය ඔහු ගේ වචන නො නැඟේ. මිත්‍රාමාත්‍යයන් විසින් පිරිහෙලන ලද්දෙක් වෙයි. 'මේ පුරුෂපුද්ගල තෙමේ අක්ෂධූර්තයෙකැ'යි අඹුදරුවන් රක්නට නො සමත් වේ යැ'යි ආවාහක විවාහකයන් විසින් නො පතන ලදුයේ වෙයි. ගැහැවි පුත, මොහු ප්‍රමාදයට කාරණ වූ දූකෙළියෙහි පුනපුනා යෙදුම්හි දෙෂයෝ සදෙන වෙත්.

## පාපමිත්‍රානුයොගාදීනව

ගැහැවි පුත, පාපමිත්‍රානුයොගයෙහි (ලාමක මිතුරන් ඇසුරු කැරුම්හි) මේ දෝෂ සයෙකි: අක්ෂධූර්ත (දූකෙළියෙහි යෙදුණු) යම් කෙනෙක් වෙත් ද ඔහු ඔහුට මිත්‍ර වෙත්, සහාය වෙත්, යම් ඉතිරි සොඩ ආදි සොඩහු වෙත් ද, ඔහු ඔහුට මිත්‍ර වෙත්, සහාය වෙත්, බීමෙහි ලොල්වූ යම් කෙනෙක් වෙත් ද, ඔහු පාපමිත්‍රානුයුක්තයාට මිත්‍ර වෙත්, සහාය වෙත්, යම් නෛකතික (බොරුරන් ආදිය දී රවටන) කෙනෙක් වෙත් ද, ඔහු ඔහුට මිත්‍ර වෙත්, සහාය වෙත්, යම් වංචනික (සම්මුඛ වචනයෙන් රවටන ) කෙනෙක් වෙත් ද, ඔහු ඔහුට මිත්‍ර වෙත්, සහාය වෙත්, ගම් පැහැරීම් ආදි සාහසික කර්මයන්හි යෙදුණු යම් කෙනෙක් වෙත් ද, ඔහු පාපමිත්‍රානුයොගියාට මිත්‍ර වෙත්, සහාය වෙත්. ගැහැවි පුත, පාපමිත්‍රානුයොගයෙහි මේ දෙස් සය ය.

## ආලස්‍යාදීනව

ගැහැවි පුත, අලසබවහි යෙදීමෙහි මේ දෝෂයෝ ස දෙනෙක් වෙත්. ඉතා ශීත යැයි කර්මාන්ත නො කෙරෙයි, ඉතා උෂ්ණයැ යි කර්මාන්ත නො කෙරෙයි. ඉතා සවස් කාලය වී යැ යි කර්මාන්ත නො කෙරෙයි. ඉතා උදසන යැ යි කර්මාන්ත නො කෙරෙයි, ඉතා බඩ සා ඇත්තෙමි යි කර්මාන්ත නො කෙරෙයි, ඉතා වැඩියක් අහර ගතිමි යි කර්මාන්ත නො කෙරෙයි. මෙසේ කටයුතු අතපසු කිරීම බහුල කොට ඇති ඔහුට නූපන් භෝගයෝ නො උපදිත්; උපන් භෝගයෝ ද විනාශයට යෙත්. ගැහැවි පුතුනි, මේ අලසබවහි යෙදීමෙහි දෙස් සය ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ශාස්තෘ වූ සුගතයන් වහන්සේ මෙය වදරා යළි ගාථා බන්ධන වශයෙන් අනෙකක් වූ මෙය වදාළ සේක.

7. ''හොති පානසඛා නාම හොති සම්මියසම්මියො
යො ච අත්ථෙසු ජාතෙසු සහායො හොති සො සඛා. 1

උස්සූරසෙය්‍යා පරදාරසෙවනා
වෙරප්පසඞ්ගො[1] ච අනත්ථතා ච
පාපා ච මිත්තා සුකදරියතා ච
එතෙ ඡ ඨානා පුරිසං ධංසයන්ති. 2

පාපමිත්තො පාපසඛො පාපආචාරගොචරො
අස්මා ලොකා පරම්හා ච උභයා ධංසතෙ නරො. 3

අක්ඛිත්ථියො වාරුණී නච්චගීතං
දිවාසොප්පං පාරිචරියා අකාලෙ
පාපා ච මිත්තා සුකදරියතා ච
එතෙ ඡ ඨානා පුරිසං ධංසයන්ති. 4

අක්ඛෙහි දිබ්බන්ති සුරං පිවන්ති
යන්තිත්ථියො පාණසමා පරෙසං
නිහීනසෙවී න ච වුද්ධසෙවී[2]
නිහීයරෙ කාළපක්ඛෙ'ව චන්දො. 5

යො වාරුණී අධනො අකිඤ්චනො
පිපාසො පිවං පාපං ගතො[3]
උදකමිව ඉණං විගාහති
අකුලං[4] කාහිති ඛිප්පමත්තනො. 6

න දිවාසොප්පසීලෙන රත්තිමුට්ඨානදෙස්සිනා[5],
නිච්චං මත්තෙන සොණ්ඩෙන සක්කා ආවසිතුං ඝරං. 7

අතිසීතං අතිඋණ්හං අතිසායමිදං අහු,
ඉති විස්සට්ඨකම්මන්තෙ අත්ථා අච්චෙන්ති මාණවෙ. 8

යො'ධ සීතඤ්ච උණ්හඤ්ච තිණා භිය්‍යො න මඤ්ඤති
කරං පුරිසකිච්චානි සො සුඛා[6] න විහායති''ති. 9

1. වෙරප්පසවො (මජසං)
2. වුද්ධිසෙවී (සයා), බුද්ධිසෙවී (කම)
3. පිපාසොසි අත්ථපාගතො (සයා), පිපාසො පි සමපපපාගතො (කම)
පප ගතො (මජසං)
4. ආකුලං (සයා, කම)
5. රත්තිනුට්ඨානදෙස්සිනො (PTS)
6. සුඛං (මජසං)

7. පානසඛ නම් (මත් පැන් බොන තැනැදී පමණක් යහලු වූ) යහලු-වෙක, සම්මිය සම්මිය නම් (හමු වූ තැනදී පමණක් මිතුරු කම් අඟවන) යහලුවෙක, වැඩ ඇති වූ කල්හි යමෙක් යහලු වේ ද එසේ වූ යහලුවෙක් ඇත. 1

ඉරු උද වන තෙක් නිදීම ය, පරඹුවන් සෙවීම ය, වෛර බහුල බව ය, අවැඩ කරන බව ය, පාප මිත්‍රයෝ ය, තද මසුරු බව ය යන මේ කරුණු සය පුරුෂයා වනසයි. 2

ලාමක මිතුරන් ඇති, ලාමක යහලුවන් ඇති, ලාමක වූ ආචාර ගොචර ඇති මිනිස් තෙමේ මෙලොවින් ද පරලොවින් ද යන දෙප සින් ම වැනැසෙයි. 3

දූ කෙළීම ය, පරඹුවන් කරා යෑම ය, මත්පැන් පීම ය, නැටුම් ගැයුම් සොයා යෑම ය, දහවල් නිදීම ය, නොකල්හි වීථි සංචාරය ය, පාප මිත්‍රයෝ ය, දැඩි මසුරු බව ය යන මේ කරුණු සය මිනිසා වනසයි. 4

පසැටින් කෙළිත්, රා බොත්, අනුන් ප්‍රාණ සම ව රක්නා අඹුවන් කරා යෙත්. පිරිහුණවුන් සෙවනාහුයැ වැඩුණවුන් නො සෙවනාහු ය. ඔහු කළුවර පසැ සඳු සෙයින් පිරිහෙත්. 5

ධනය නැති දිළිඳු වූ යමෙක් මත්පැන් බොනුයේ පොකුණක් වෙත ගියක්හු පැන් බොන්නා සේ මත්පැන් බීමෙහි ගිජු වූයේ ද, හේ ණය ගැති බවට බැසගනී. වහා සිය කුලය අකුලයක් (පිරිහුණු කුලයක්) කරන්නේ ය. 6

දහවල් නිදන සුලු. රෑ පිබිදැ සිටීම නොරිසියෙන, නිතර මත් වූ, සොඬ වූ තැනැත්තහු විසින් ගෙහි වසන්නට නො හැක්ක. 7

ධනයෝ 'දැන් ඉතා ශීත ය, ඉතා උෂ්ණ ය, ඉතා සවස් යැ'යි හරන ලද කර්මාන්ත ඇති මිනිසුන් ඉක්මැ යෙත්. 8

මෙහි යමෙක් ශීතයත් උෂ්ණයත් තණපතකට වැඩියෙන් නො තකා ද, පුරුෂ කාර්යයන් කරන හෙ තෙමේ සැපය අත් නො හරී. 9

## මිත්තපතිරූපකා

8. චත්තාරො' මෙ ගහපතිපුත්ත අමිත්තා මිත්තපතිරූපකා[1] වෙදිතබ්බා.. අඤ්ඤදත්ථුහරො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො, වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො, අනුප්පියභාණී අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො, අපායසහායො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අඤ්ඤදත්ථුහරො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

අඤ්ඤදත්ථුහරො හොති අප්පෙන බහුමිච්ඡති,
භයස්ස කිච්චං කරොති සෙවති අත්ථකාරණා.

ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අඤ්ඤදත්ථුහරො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපති පුත්ත ඨානෙහි වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො. අතීතෙන පටිසන්ථරති[2] අනාගතෙන පටිසන්ථරතිං, නිරත්ථකෙන සඞ්ගණ්හාති, පච්චුප්පන්නෙසු කිච්චෙසු බ්‍යසනං දස්සෙති. ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අනුප්පියභාණී අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො. පාපකම්පි'ස්ස[3] අනුජානාති, කල්‍යාණම්පි'ස්ස අනුජානාති, සම්මුඛා'ස්ස වණ්ණං භාසති, පරම්මුඛා'ස්ස අවණ්ණං භාසති. ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අනුප්පියභාණී අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අපායසහායො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො: සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ සහායො හොති, විකාලවිසිඛාචරියානුයොගෙ සහායො හොති, සමජ්ජාභිචරණෙ සහායො හොති, ජූතප්පමාදට්ඨානානුයොගෙ සහායො හොති. ඉමෙහි ඛො ගහපති පුත්ත චතූහි ඨානෙහි අපායසහායො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො'ති.

1. මිත්තපටිරූපකා (සිමු)
2. පටිසන්ධරති (කම)
3. පාපකම්මම්පිස්ස (ස්‍යා)

### මිත්‍රප්‍රතිරූපකයෝ

8. ගැහැවිපුත, මිත්‍ර ප්‍රතිරූපක වූ (මිතුරු වෙසින් පැනෙන) සතර අමිත්‍රයෝ දත යුතු හ. මිත්‍රප්‍රතිරූපක අඤ්ඤදත්ථුහර අමිත්‍රයා දතයුතු, මිත්‍රප්‍රතිරූපක වචීපරම අමිත්‍රයා දත යුතු. මිත්‍රප්‍රතිරූපක අනුප්‍රියභාණී අමිත්‍රයා දත යුතු. මිත්‍රප්‍රතිරූපක අපායසහාය අමිත්‍රයා දත යුතු.

ගැහැවිපුත, සතර කරුණෙකින් මිත්‍රප්‍රතිරූපක වූ අඤ්ඤදත්ථුහර (ඒකාන්තයෙන් කිසිවක් හැරගෙන ම යන) අමිත්‍රයා දත යුතු:

ඒකාන්තයෙන් සිය මිතුරා ගෙන් කිසිවක් හැරගෙන ම යන්නේ වෙයි. අල්ප දයෙකින් (ස්වල්ප දයක් දී) බොහෝ දැ ලබන්නට පතයි. තමාට බියක් (උවදුරක්) උපන් කල්හි පමණක් මිතුරා ගේ කටයුතු කෙරෙයි. තමා ගේ වැඩ ම කරුණු කොට මිතුරා සෙවී. ගැහැවි පුත, මේ සතර කරුණින් මිත්‍රප්‍රතිරූපකවූ අඤ්ඤදත්ථුහර අමිත්‍රයා දත යුතු.

ගැහැවිපුත, මේ සතර කරුණින් මිත්‍රප්‍රතිරූපක වචීපරම (වචනය ම පරම කොටැති) අමිත්‍රයා දත යුතු: අතීතයෙන් සඞ්ග්‍රහ කෙරෙයි, අනාගත යෙන් සඞ්ග්‍රහ කෙරෙයි. නිරර්ථක කථායෙන් සඞ්ග්‍රහ කෙරෙයි. වර්තමාන කාර්‍ය්‍යයන්හි ව්‍යසන දක්වයි. ගැහැවිපුත, මේ සතර කරුණින් වචීපරම වූ මිත්‍රප්‍රතිරූපක අමිත්‍රයා දත යුතු.

ගැහැවි පුත, සතර කරුණෙකින් අනුප්‍රියභාණී (අනුකූල වූ පිය බස් කියන) මිත්‍රප්‍රතිරූපක අමිත්‍රයා දතයුතු: (පවක් කරමි යි කී කලැ ඒ) ඔහුගේ පාප ක්‍රියාව ද (මැනැවැ යි) අනුදනී, (පිනක් කරමැ යි කී කලැ ඒ) ඔහුගේ පින් කිරිය ද අනුදනී, සම්මුඛයෙහි ඔහුගේ ගුණ කියයි, අසම්මුඛයෙහි ඔහු ගේ අගුණ කියයි. ගැහැවිපුත, මේ සතර කරුණින් මිත්‍රප්‍රතිරූපක වූ අනුප්‍රියභාණී අමිත්‍රයා දත යුතු.

ගැහැවිපුත, සතර කරුණෙකින් මිත්‍රප්‍රතිරූපක වූ අපායසහාය වූ (වස්තු විනාශ කිරීමෙහි යහළු වූ) අමිත්‍රයා දතයුතු: මත් බවට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පීමේ යෙදීමෙහි යහළු වෙයි, නොකල්හි වීථි සංචාරයේ යෙදීමෙහි යහළු වෙයි. නෘත්‍යගීතාදිය දකිනු අසනු පිණිස යෑමෙහි යහළු වෙයි, ප්‍රමාදයට කාරණ වූ දූකෙළියේ යෙදීමෙහි යහළු වෙයි. ගැහැවිපුත, මේ සතර කරුණින් අපාය සහාය වූ මිත්‍ර ප්‍රතිරූපක අමිත්‍රයා දත යුතු.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

“අඤ්ඤදත්ථුහරො මිත්තො යො ච මිත්තො වචීපරො,[1]
අනුප්පියඤ්ච යො ආහ අපායෙසු ච යො සඛා.
එතෙ අමිත්තෙ චත්තාරො ඉති විඤ්ඤාය පණ්ඩිතො,
ආරකා පරිවජ්ජෙය්‍ය මග්ගං පටිභයං යථා”ති.

## සුහදමිත්තා

9. චත්තාරො' මෙ ගහපතිපුත්ත මිත්තා සුහදා වෙදිතබ්බා: උපකාරො[2] මිත්තො සුහදො වෙදිතබ්බො, සමානසුඛදුක්ඛො මිත්තො සුහදො වෙදිතබ්බො, අත්ථක්ඛායී මිත්තො සුහදො වෙදිතබ්බො, අනුකම්පකො මිත්තො සුහදො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි උපකාරො මිත්තො සුහදො වෙදිතබ්බො. පමත්තං රක්ඛති, පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛති, භීතස්ස සරණං හොති, උප්පන්නෙ කිච්චකරණීයෙ තද්දිගුණං භොගං අනුප්පදෙති. ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි උපකාරො මිත්තො සුහදො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්තඨානෙහි සමානසුඛදුක්ඛො මිත්තො සුහදො වෙදිතබ්බො: ගුය්හමස්ස ආචික්ඛති, ගුය්හමස්ස පරිගූහති, ආපදාසු න විජහති, ජීවිතම්පි'ස්ස අත්ථාය පරිච්චත්තං හොති. ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි සමානසුඛදුක්ඛො මිත්තො සුහදො වෙදිතබ්බො.

චතූහි ඛො පන ගහපතිපුත්ත ඨානෙහි අත්ථක්ඛායී මිත්තො සුහදො වෙදිතබ්බො: පාපා නිවාරෙති, කල්‍යාණෙ නිවෙසෙති, අස්සුතං සාවෙති, සග්ගස්ස මග්ගං ආචික්ඛති. ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අත්ථක්ඛායී මිත්තො සුහදො වෙදිතබ්බො.

චතූහි ඛො පන ගහපතිපුත්ත ඨානෙහි අනුකම්පකො මිත්තො සුහදො වෙදිතබ්බො: අභවෙනස්ස න නන්දති, භවෙනස්ස නන්දති, අවණ්ණං භණමානං නිවාරෙති, වණ්ණං භණමානං පසංසති. ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අනුකම්පකො මිත්තො සුහදො වෙදිතබ්බො”ති.

1. වචීපරමො (සයා)
2. උපකාරකො (සයා)

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ශාස්තෘ වූ සුගතයන් වහන්සේ මෙය වදාරා, අනතුරු ව, ගාථාබන්ධන විසින් අනෙකක් වූ මේ වචන වදාළ සේක:

"යමෙක් අඤ්ඤදත්ථුහර මිත්‍ර නම් වේ ද යමෙක් වචීපරම මිත්‍ර නම් වේ ද, යමෙක් අනුප්‍රියභාණී වේ ද, යමෙක් ධන විනාශක ක්‍රියාභි යහලු වේ ද, මෙසේ මේ සතර අමිතුරන් නුවණැත්තේ දන, උවදුරු ඇති මාර්ගයක් සේ දුරින් ම දුරු කරන්නේ ය."

## සුහෘත්මිත්‍රයෝ

9. ගැහැවි පුත, මේ සුහෘද වූ සතර මිතුරෝ දත යුතු හ: උපකාරී වූ සුහද මිතුරා දත යුතු, සමාන සුඛ දුඃඛ වූ සුහද සුමිතුරා දත යුතු. අර්ථාඛ්‍යායී (වැඩට නිසි කරුණු ම කියන) සුහද මිතුරා දත යුතු. ආනුකම්පක (අනු-කම්පා කරන) සුහද මිතුරා දත යුතු.

ගැහැවි පුත, සතර කරුණෙකින් උපකාරී වූ සුහෘද මිත්‍රයා දතයුතු: මත් වැ වැදහෙන මිතුරා රකගනී, මත් වැ වැදහෙන්නහු ගේ ධනය රක දෙයි, බියට පැමිණි මිතුරාට පිහිට වෙයි, කළයුතු කාර්‍යයක් උපන් කල්හි අවශ්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයක් ධනය දෙයි. ගැහැවි පුත, මේ සතර කරුණින් උපකාරී වූ සුහෘද මිතුරා දත යුතු.

ගැහැවි පුත, සතර කරුණෙකින් සමාන සුව දුක් ඇති (සැප දුක් දෙක්හි ම සමාන වැ හිතෛෂී ව පවත්නා) මිතුරා දත යුතු: සැඟෙවියැ යුතු රහස් සිය මිතුරාට නොසඟොවා කියයි, ඒ මිතුරාගේ සැඟෙවියැ යුතු රහස් සඟොවා රකියි, විපත්තින්හිදී නො අත්හරී, මිතුරා විසින් ඔහු පිණිස සිය දිවි වුව ද පරිත්‍යක්ත වෙයි (සිය දිවි ද නො තකා මිතුරාගේ කටයුතු කැරදෙයි). ගැහැවිපුත, මේ සතර කරුණින් සමාන සුඛ දුඃඛ සුහද මිතුරා දත යුතු.

ගැහැවිපුත, සතර කරුණෙකින් අර්ථාඛ්‍යායී (දෙලෝවැඩ පවසන) සුහද මිතුරා දත යුතු: පවින් වළක්වයි, පිනෙහි යොදලයි, පෙර නො ඇසූ දහම් අස්වයි, සුගතියට මඟ කියා දෙයි. ගැහැවිපුත, මේ සතර කරුණින් අර්ථාඛ්‍යායී සුහද මිතුරා දත යුතු.

ගැහැවි පුත, සතර කරුණෙකින් ආනුකම්පක සුහෘද මිත්‍රයා දත යුතු: ඔහුගේ පිරිහීමෙන් නො සතුටු වෙයි, ඔහුගේ අභිවෘද්ධියෙන් සතුටු වෙයි, මිතුරාගේ අගුණ කියන්නහු වළක්වයි, මිතුරාගේ ගුණ කියන්නහු පසසයි, ගැහැවි පුත, මේ සතර කරුණින් ආනුකම්පක (අනුකම්පා කරන) සුහද මිතුරා දත යුතු.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො, අථාපරං එතදවොච සත්ථා:

10. ''උපකාරො ච යො මිත්තො යො ච මිත්තො සුඛෙ දුඛෙ[1]
අත්ථක්ඛායී ච යො මිත්තො යො ච මිත්තො'නුකම්පකො.

එතෙ පි මිත්තෙ චත්තාරො ඉති විඤ්ඤාය පණ්ඩිතො
සක්කච්චං පයිරුපාසෙය්‍ය මාතා පුත්තං'ව ඔරසං.

පණ්ඩිතො සීලසම්පන්නො ජලං අග්ගි ච භාසති
භොගෙ සංහරමානස්ස භමරස්සෙව ඉරියතො
භොගා සන්නිචයං යන්ති වම්මිකො' වුපචීයති.

එවං භොගෙ සමාහත්වා[2] අලමත්තො කුලෙ ගිහී
චතුධා විභජෙ භොගෙ ස වෙ මිත්තානි ගන්ථති.

එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය ද්වීහි කම්මං පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය ආපදාසු භවිස්සතී''ති.

## ඡද්දිසාපටිච්ඡාදනං

11. කථඤ්ච ගහපතිපුත්ත අරියසාවකො ඡද්දිසාපටිච්ඡාදී හොති? ඡයිමා ගහපතිපුත්ත දිසා වෙදිතබ්බා: පුරත්ථිමා දිසා මාතාපිතරො වෙදිතබ්බා දක්ඛිණා දිසා ආචරියා වෙදිතබ්බා. පච්ඡිමා දිසා පුත්තදාරා වෙදිතබ්බා. උත්තරා දිසා මිත්තාමච්චා වෙදිතබ්බා. හෙට්ඨිමා දිසා දාසකම්මකරා වෙදිතබ්බා. උපරිමා දිසා සමණබ්‍රාහ්මණා වෙදිතබ්බා.

1. සුඛෙ දුක්ඛෙ ච යො සඛා (මජසං)
2. සමාහරිත්වා (ස්‍යා)

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ශාස්තෘ වූ සුගතයන් වහන්සේ මෙය වදරා, අනතුරු ව (ගාථාබන්ධන විසින්) අනෙකක් වූ මේ වචන වදාළ සේක:

10. "යම් උපකාරී මිතුරෙක් වේද, සුවදුක් දෙක්හි ම යමෙක් යහළු ද, යම් මිතුරෙක් දෙලෝ වැඩට මඟ කියන්නේ ද, යම් මිතුරෙක් අනුකම්පා කරන්නේ ද,

මෙසේ නුවණැත්තේ මේ සතර මිතුරන් ම දැන, මව ළෙහි ද පුතක්හු සෙයින් සත්කාර කොට ඇසුරු කරන්නේ ය,

(සැබෑමිතුරන් ඇසුරු කරන) නුවණැති සිල්වත් තැනැත්තේ දිලියෙන ගින්නක් සේ බබලයි. (මල නො පෙළා) මල් පැණි රැස් කොට මී බඳින බමරක්හු සෙයින් (මෙරමා නො පෙ ළා) භෝග රැස් කරන්නහු ගේ භොගසම්පත්හු වැඩීමට යෙත්. ක්‍රමයෙන් සුඹසක් පස්කැට රැස් කොට බඳිනු ලබන්නාක් මෙනි.

මෙසේ භෝගයන් එක්රැස් කොට ගිහිගෙහි වසන්නට සමර්ථ වූ ගෘහස්ථ තෙම භෝගයන් සතර කොටසක් කොට බෙදන්නේ ය. හේ ඒකාන්තයෙන් මිතුරන් බැඳගනී (බිඳී යනු නොදී රැකගන්නට සමත් වෙයි).

එක් කොටසෙකින් භෝගසම්පත් වළඳන්නේ ය, කොටස් දෙකෙකින් (කෘෂි වණික්කර්මාදි) කර්මාන්ත යොදන්නේ ය, විපතක් පැමිණි කල්හි ප්‍රයෝජනය පිණිස වන්නේ යැ යි සලකා සතර වන කොටස නිදහන් කොට තබන්නේ ය."

### සදිසා වැඳීම

11. ගැහැවි පුත, කෙසේ නම් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සදිසා හවුරන්නේ වේ ද? ගැහැවිපුත, මේ ස දිසා දත යුතු: මාපියෝ පෙර දිසාව යැ යි දත යුතු. ආචාර්යයෝ දකුණු දෙස යැ යි දත යුතුහ. අඹුදරුවෝ පැසිම් දෙස යැ යි දත යුතු හ. මිත්‍රාමාත්‍යයෝ උතුරු දෙස යැ යි දත යුතු හ. දාසි දස් කම්කරුවෝ යට දෙසැ යි දත යුතු හ. මහණ බමුණෝ උඩ දෙස යැයි දත යුතු හ.

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරො පච්චුපට්ඨාතබ්බා: භතො නෙ සම්භරිස්සාමි[1], කිච්චං තෙසං කරිස්සාමි, කුලවංසං ඨපෙස්සාමි, දායජ්ජං පටිපජ්ජාමි[2], අථ වා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සාමී''ති. ඉමෙහි ඛො ගහපති-පුත්ත පඤ්චහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරො පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති: පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති, සිප්පං සික්ඛාපෙන්ති, පතිරූපෙන දාරෙන සංයොජෙන්ති, සමයෙ දායජ්ජං නිය්‍යාතෙන්ති[3]. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරො පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති. එවමස්ස එසා පුරත්ථිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

12. පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණා දිසා ආචරියා පච්චුපට්ඨාතබ්බා: උට්ඨානෙන, උපට්ඨානෙන, සුස්සූසාය, පාරිචරියාය, සක්කච්චං සිප්පපටිග්ගහණෙන[4].

ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණා දිසා ආචරියා පච්චුපට්ඨිතා, පඤ්චහි ඨානෙහි අන්තෙවාසිං අනුකම්පන්ති: සුවිනීතං විනෙන්ති, සුග්ගහිතං ගාහාපෙන්ති, සබ්බසිප්පසුතං සමක්ඛායිනො භවන්ති, මිත්තාමච්චෙසු පටියාදෙන්ති[5], දිසාසු පරිත්තාණං කරොන්ති. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණා දිසා ආචරියා පච්චුපට්ඨිතා, ඉමෙහි පඤ්චහි ඨානෙහි අන්තෙවාසිං අනුකම්පන්ති. එවමස්ස එසා දක්ඛිණා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

---

1. තෙසං භරිස්සාමි (මජසං)
2. පටිපජ්ජාමි (මජසං)
3. නිය්‍යාදෙන්ති (මජසං)
4. සිප්පං පටිග්ගහණෙන (සයා) සිප්පඋග්ගහණෙන (කම)
5. පටිවෙදෙන්ති (සයා)

ගැහැවි පුත, කරුණු පසෙකින් පුතු විසින් පෙර දෙස වූ මාපියෝ උපස්ථාන කළ යුතු: ඔවුන් විසින් පෝෂිත වූ මම මහලු ව සිටින ඔවුන් පොෂිත කරන්නෙමි යි ද, ඔවුනට (මාපියනට) පැමිණි කටයුතු (ඔවුන් වෙනුවට) මම කරන්නෙමි යි ද, (මාපිය සතු වස්තුව නො නසා රක්නෙම) කුල පරපුර රැකගන්නෙමි යි ද, මා පියන්ගෙන් ලත් දුවැද්ද (ඔවුන් ඔවා පරිදි පවත්වන්නෙම) බුත්ති විදින්නෙමි යි ද, නැවැත, කලුරිය කළ පරලෝ ගිය මාපියනට (දන් දී) පින් දෙන්නෙමි යි ද යි මේ කරුණු පසින් පුතු විසින් පෙර දිසා වූ මා පියෝ උපස්ථිත වූහු (උවටැන් කරනු ලදහු) කරුණු පසෙකින් පුතුට අනුකම්පා කෙරෙත්. (මාපියෝ) පුතු පවින් වළක්වත්, පිනෙහි යොදලත්, ශිල්ප හදරවත්, සුදුසු වූ ස්ත්‍රියක හා සංයුක්ත කෙරෙත් (ස්ත්‍රියක පාවා දෙත්), සුදුසු කල්හි දෑවැද්ද (උරුම වූ වස්තුව) පවරා දෙත්. ගැහැවි පුත, මෙකී කරුණු පසින් පුත්‍රයා විසින් පූර්ව දිශාව වූ මා පියෝ උවටැන් කරනු ලැබූවාහු, මේ (දෙවැනි ව කී කරුණු පසින් පුතුට අනුග්‍රහ කරත්. මෙසේ ඔහු විසින් මේ පූර්ව දිශාව (එයින් බියක් නො එන පරිදි) උපද්‍රව රහිත කොට ප්‍රතිභය රහිත කොට හවුරන ලද්දේ වෙයි.

12. ගැහැවිපුත, දකුණු දිග වූ ආචාර්යයෝ අතවැස්සා විසින් පස් කරුණෙකින් උපස්ථාතව්‍ය වෙත් (උවටැන් කළ යුතු වෙත්): ඇදුරාහු දක හුනස්නෙන් නැගී සිටීමෙන් ද, උවටැන් කිරීමෙන් ද, උගන්වන දෑ අසනු කැමැතිවීමෙන් ද (නොහොත් හදහා ඇසීමෙන් ද), වතාවත් කිරීමෙන් ද උගන්වන ශිල්ප සකසා පිළිගැනීමෙන් ද යන මේ කරුණු පසිනි.

ගැහැවිපුත, අතවැස්සා විසින් මේ කරුණු පසින් දක්ෂිණදිශා සංඛ්‍යාත ආචාර්යයෝ උපස්ථිත වූහු, කරුණු පසෙකින් අතවැස්සාට අනුග්‍රහ කරත්: අතවැස්සා මොනොවට හික්මවත්, ඔහුට මොනොවට උගන්වත්, තමන් අසා ගත් සියලු ශිල්ප (අතවැස්සාට) මොනොවට කියන්නාහු වෙත්. මිත්‍රාමාත්‍යයන් කෙරෙහි පිහිටුවති, දිශාවන්හි ආරක්ෂාව සලස්වත්. ගැහැවිපුත, මේ කරුණු පසින් උපස්ථිත වූ (උවටැන් කරනු ලැබූ) ආචාර්යයෝ කරුණු පසෙකින් අතවැස්සාට අනුකම්පා කරත්. මෙසේ ඔහු විසින් මේ දක්ෂිණ දිශාව උපද්‍රව රහිත කොට, ප්‍රතිභය රහිත කොට හවුරන ලද්දේ වෙයි.

13. පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි සාමිකෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨාතබ්බා: සම්මානනාය, අනවමානනාය,[1] අනතිචරියාය, ඉස්සරියවොස්සග්ගෙන, අලඞ්කාරානුප්පදානෙන. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි සාමිකෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨිතා, පඤ්චහි ඨානෙහි සාමිකං අනුකම්පති: සුසංවිහිතකම්මන්තා ච හොති, සුසංගහිතපරිජනා ච[2], අනතිචාරිනී ච, සම්භතං අනුරක්ඛති, දක්ඛා ච හොති අනලසා සබ්බකිච්චෙසු. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි සාමිකෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි සාමිකං අනුකම්පති. එවමස්ස එසා පච්ඡිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

14. පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි කුලපුත්තෙන උත්තරා දිසා මිත්තාමච්චා පච්චුපට්ඨාතබ්බා: දානෙන, පෙය්‍යවජ්ජෙන[3], අත්ථචරියාය, සමානත්තතාය, අවිසංවාදනතාය. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුලපුත්තෙන උත්තරා දිසා මිත්තාමච්චා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති: පමත්තං රක්ඛන්ති, පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛන්ති, භීතස්ස සරණං හොන්ති, ආපදාසු න විජහන්ති, අපරපජා චස්ස පටිපූජෙන්ති. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුලපුත්තෙන උත්තරා දිසා මිත්තාමච්චා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති. එවමස්ස එසා උත්තරා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

1. අවිමානනාය (සයා PTS)
2. සඞ්ගහිත පරිජනා ච (මජසං)
3. පියවජ්ජෙන (සයා කම)

13. ගැහැවිපුත, කරුණු පසෙකින් සැමියා විසින් පැසිම් දෙස වූ භාර්‍ය්‍යාව උපස්ථාතව්‍ය (උවටන් කළ යුතු) වෙයි: සම්භාවන වචනයෙන් ද අවමන් බස් නොකීමෙන් ද, පරඹුවන් කරා නො යැමෙන් ද, ගෙහි කටයුතුවල අධිපති බව ඇයට බාර දීමෙන් ද, තමන් පොහොසත් පරිදි ඇඳුම් පැලැඳුම් සපයා දීමෙන්ද යන කරුණු පසිනි. ගැහැවි පුත, මේ කරුණු පසින් සැමියා විසින් පශ්චිමදිශා සංඛ්‍යාත භාර්‍ය්‍යාව උවටන් කරනු ලැබුවා, කරුණු පසෙකින් සැමියාට අනුකම්පා කෙරෙයි: (කැඳබත් පිසීම් ඈ විසින් කලට වේලාවට) මනා කොට කරන ලද කර්මාන්ත ඇත්තී ද වෙයි, මොනොවට සංග්‍රහ කරන ලද පරිවාර ජනයා ඇත්තී ද වෙයි, සැමියා හැර අන් පුරුෂයකු සිතිනුදු නො පතන්නී වෙයි, සැමියා විසින් ගෙනෙන ලද ධනය රකියි, සියලු කටයුත්තෙහි දක්ෂ ද නොමැලි ද වෙයි. ගැහැවිපුත, මේ කරුණු පසින් සැමියා විසින් පශ්චිම දිශාසංඛ්‍යාත භාර්‍ය්‍යාව උපස්ථිත වූවා (උවටන් කරන ලද්දී) මේ පසුවැ කී කරුණු පසින් සැමියාට අනුග්‍රහ කෙරෙයි. මෙසේ ඔහු විසින් මේ පැසිම්දෙස නිරුපද්‍රුත ව, ප්‍රතිභය රහිත ව හවුරන ලද්දේ වෙයි.

14. ගැහැවි පුත, කුලපුතු විසින් කරුණු පසෙකින් උත්තර දිශා නැමැති මිත්‍රාමාත්‍යයෝ (මිත්‍රයෝ ද සැප දුක දෙකෙහි එක් වැ කටයුතු කරන්නෝ ද) උවටන් කළයුතු හ: දනයෙන් ද ප්‍රිය වචනයෙන් ද අර්ථ චර්‍ය්‍යායෙන් ද සමානාත්මතායෙන් ද නොරවටන බැවින් ද යන පසිනි. ගැහැවි පුත, මේ පස් කරුණින් කුලපුතු විසින් උත්තර දිශාව වූ මිත්‍රාමාත්‍යයෝ උවටන් කරන ලද්දහු, කරුණු පසෙකින් කුලපුතුට අනුකම්පා කරත්: රහමෙරින් මත් වූවහු රකගනිත්, මත් වැ හොත්තහු ගේ වස්තුව රක දෙත්, උවදුරකට පැමිණියාහට පිහිට වෙත්, විපත්හි දී අත් නො හරිත්, ඔහු ගේ දරුමුනුබුරනට ද මමත්වයෙන් සංග්‍රහ කරත්. ගැහැවිපුත, මේ කරුණු පසින් කුලපුතු විසින් උත්තරදිශා සංඛ්‍යාත මිත්‍රාමාත්‍යයෝ උවටන් කරන ලදුවෝ, පසු වැ කී කරුණු පසින් කුලපුතුව අනුග්‍රහ කෙරෙත්. මෙසේ ඔහු විසින් මේ උතුරු දෙස නිරුපද්‍රුත කොට, ප්‍රතිභය රහිත කොට, හවුරන ලද්දේ වෙයි.

15. පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අයිරකෙන[1] හෙට්ඨිමා දිසා දසකම්මකරා පච්චුපට්ඨාතබ්බා: යථාබලං කම්මන්තසංවිධානෙන, භත්තවෙතනානුප්පදානෙන, ගිලානුපට්ඨානෙන, අච්ඡරියානං රසානං සංවිභාගෙන, සමයෙ වොස්සග්ගෙන. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දසකම්මකරා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි අයිරකං අනුකම්පන්ති. පුබ්බුට්ඨායිනො ච හොන්ති, පච්ඡානිපාතිනො ච දින්නාදායිනො ච, සුකතකම්මකරා ච, කිත්තිවණ්ණහරා ච. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දසකම්මකරා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි අයිරකං අනුකම්පන්ති. එවමස්ස එසා හෙට්ඨිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

16. පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨාතබ්බා: මෙත්තෙන කායකම්මෙන, මෙත්තෙන වචීකම්මෙන, මෙත්තෙන මනොකම්මෙන, අනාවටද්වාරතාය, ආමිසානුප්පදානෙන. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨිතා ඡහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති. පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති, කල්‍යාණෙන මනසා අනුකම්පන්ති, අස්සුතං සාවෙන්ති, සුතං පරියොදපෙන්ති, සග්ගස්ස මග්ගං ආචික්ඛන්ති. ඉමෙහි ඛො ගහපතිපුත්ත ඡහි ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨිතා ඉමෙහි ඡහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති. එවමස්ස එසා උපරිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා''ති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

17. ''මාතාපිතා දිසා පුබ්බා ආචරියා දක්ඛිණා දිසා
පුත්තදාරා දිසා පච්ඡා මිත්තාමච්චා ච උත්තරා.

දසකම්මකරා හෙට්ඨා උද්ධං සමණබ්‍රාහ්මණා
එතා දිසා නමස්සෙය්‍ය අලමත්තො කුලෙ ගිහී.

1. අය්‍යිරකෙන (මජසං)

15. ගැහැවි පුත, කරුණු පසෙකින් ස්වාමියා විසින් යට දිසාව යැ යි කියන ලද දාසි දස් කම්කරුවෝ උවටන් කළ යුතු හ: ඔවුන්ගේ ශක්තියට අනුරූප ලෙස කර්මාන්ත විධාන කිරීමෙන් ද බත් වැටුප් දීමෙන් ද, ගිලන් වූ කල ඔවුනට නිසි උපස්ථාන යොදලීමෙන් ද, මිහිරි රස බොජුන් (තමා හුදෙකලාව නො වළඳා) ඔවුනටත් දීමෙන් ද සුදුසු කාලයන්හි වැඩෙන් මුදා හැරීමෙන් ද යන පසිනි. ගැහැවි පුත, මේ කරුණු පසින් ස්වාමියා විසින් යට දෙස යැ යි කියන ලද දාසි දස් කම්හුරෝ උවටන් කරන ලද්දාහු මේ කරුණු පසෙකින් ස්වාමියාට අනුග්‍රහ කරත්; ස්වාමියාට පළමුවෙන් ම නැඟී සිටින්නාහු ද වෙත්, ස්වාමියාට පසු ව නිදන්නාහු ද වෙත්, (කිසිත් සොරා නොගන්නාහු) ස්වාමියා දුන් දෙය ම ගන්නා සුලු වෙත්, මනා කොට කරන ලද කර්මාන්ත ඇත්තාහු ද වෙත්, ස්වාමියාගේ ගුණ කථාව පතුරුවන්නාහු ද වෙත්. ගැහැවිපුත, මේ පස් කරුණින් ස්වාමියා විසින් යට දෙස නැමැති දාසි දස් කම්හුරෝ උවටන් කරනු ලැබුවාහු, පසු වැ කී කරුණු පසින් ස්වාමියාට අනුග්‍රහ කරත්. මෙසේ ඔහු විසින් මේ යට දෙස නිරුපද්‍රැත කොට ප්‍රතිභය රහිත කොට හවුරන ලද්දේ වෙයි.

16. ගැහැවි පුත, කරුණු පසෙකින් කුලපුතු විසින් උපරිම දිශාසංඛ්‍යාත මහණ බමුණෝ උවටන් කළ යුතු හ: මෛත්‍රී සහගත කායකර්මයෙන්, මෛත්‍රී සහගත වාක්කර්මයෙන්, මෛත්‍රී සහගත මනඃකර්මයෙන්, නො වැසූ දෙර ඇති බැවින්, ආහාරපාන සැපයීමෙන් යන පසිනි. ගැහැවිපුත, මේ පස් කරුණින් කුලපුතු විසින් උඩ දිසාව යැ යි කියන ලද මහණ බමුණෝ උපස්ථිත වූවාහු, කරුණු සයෙකින් කුලපුතුට අනුග්‍රහ කෙරෙත්: පවින් වළකාලත්, පිණෙහි යොදලත්, කලන සිතින් අනුග්‍රහ කෙරෙත්, නො ඇසූ විරූ දහම් අස්වත්, අසා ඇති දහම් (සැක දුරලැවීමෙන්) පිරිසිදු කරවත්, සුගතියට මඟ කියත්. ගැහැවිපුත, මේ කරුණු සයින් කුලපුතු විසින් උපරිමදිශාසංඛ්‍යාත මහණ බමුණෝ උවටන් කරන ලද්දාහු, මේ කරුණු සයින් කුලපුතුට අනුග්‍රහ කෙරෙත්. මෙසේ ඔහු විසින් මේ උඩ දෙස නිරුපද්‍රැත කොට, ප්‍රතිභය රහිත කොට, හවුරන ලද්දේ වෙයි."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ශාස්තෘ වූ සුගතයන් වහන්සේ මෙය වදරා ගාථා බන්ධන විසින් අනෙකක් වූ මේ වචන වදාළ සේක:

මා පියෝ පෙර දෙස ය. ආචාර්යයෝ දකුණු දෙස ය, අඹුදරුවෝ පැයිම් දෙස ය, මිත්‍රාමාත්‍යයෝ උතුරු දෙස ය

දාසි දස් කම්හුරෝ යට දෙස ය, මහණ බමුණෝ උඩ දෙස ය. කුලයෙහි (කුලය රැක්මෙහි) සමර්ථ ස්වභාවය ඇති ගෘහස්ථ තෙමේ මේ ස දිසා නමදනේය.

පණ්ඩිතො සීලසම්පන්නො සණ්හො ච පටිභානවා,
නිවාතවුත්ති අත්ථද්ධො තාදිසො ලභතෙ යසං.

උට්ඨානකො අනලසො ආපදාසු න වෙධති,
අච්ඡින්නවුත්ති මෙධාවී තාදිසො ලභතෙ යසං.

සඞ්ගාහකො මිත්තකරො වදඤ්ඤූ වීතමච්ඡරො,
නෙතා විනෙතා අනුනෙතා තාදිසො ලභතෙ යසං

දානඤ්ච පෙය්‍යවජ්ජඤ්ච අත්ථචරියා ච යා ඉධ,
සමානත්තතා ච ධම්මෙසු තත්ථ තත්ථ යථාරහං.

එතෙ ඛො සඞ්ගහා ලොකෙ රථස්සාණී'ව යායතො,
එතෙ ච සඞ්ගහා නාස්සු න මාතා පුත්තකාරණා,
ලභෙථ මානං පූජං වා පිතා වා පුත්තකාරණා.

යස්මා ච සඞ්ගහෙ එතෙ සමවෙක්ඛන්ති[1] පණ්ඩිතා,
තස්මා මහත්තං පප්පොන්ති පාසංසා ච භවන්ති තෙ''ති.

18. එවං වුත්තෙ සිගාලකො[2] ගහපතිපුත්තො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛන්තීති, එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

සිගාලසුත්තං නිට්ඨිතං අට්ඨමං.

1. සම්මපෙක්ඛන්ති (මජසං)
2. සිඞ්ගාලොවාදසුත්තන්තං (PTS)

පණ්ඩිත වූ, සිල්වත්, සියුම් අරුත් දන්නා, වැටැහෙන නුවණැති, යටත් පැවැතුම් ඇති, හැඩි දැඩි නොවූ, එබඳු තැනැත්තේ යශස් ලබයි.

නැඟී සිටුනා (උට්ඨානවීර්ය යුක්ත) අලස නො වූ තැනැත්තේ ආපදාවන්හිදී නො සැලෙයි. අඛණ්ඩ වෘත්ති ඇති, ඝෘානොචිත ප්‍රඥා ඇති, එ බඳු තැනැත්තේ යශස් ලබයි.

සිවු සඟරාවතින් සංග්‍රහ කරන, මිතුරන් සොයන, වදන්‍ය වූ, පහ වූ මසුරු බව ඇති, කරුණු දක්වා මඟ පෙන්වන, හික්මවන, පුන පුනා මඟ පෙන්වන, එබඳු තැනැත්තේ යශස් ලබයි.

දානය ද ප්‍රිය වචන ද මෙහි යම් අර්ථචර්‍යාවෙක් වේ නම් එය ද, ඒ ඒ පුහුලා කෙරෙහි සුදුසු පරිදි, ධර්මයන්හි සුදුසු පරිදි සමානාත්මතාව ද, යන මොහු යන්නාවූ රියකට එහි ඇණය මෙන් ලොවැ සඬග්‍රහයෝ ය. මේ සංග්‍රහයෝ නොමැත්තාහු නම්, පුතුගේ කරුණින් මව හෝ පුතුගේ කරුණින් පියා හෝ බුහුමනක් හෝ පූජාවක් හෝ නොලබන්නේ ය.

යම් හෙයෙකින් පණ්ඩිතයෝ මේ සඬග්‍රහයන් මොනොවට දක්නාහු ද, එහෙයින් මහත්ත්වයට පැමිණෙත්. ඔහු සෙසු ලෝ වැස්සා විසින් පැසැසියැ යුත්තෝ ද වෙත්.''

18. මෙසේ වදළ කල්හි ගැහැවිපුත් සිගාලක තෙමේ භාග්‍යවතුන් වහන්සේට, ''වහන්ස, අභිකාන්ත යැ, වහන්ස, අභිකාන්ත යැ. වහන්ස, යම්සේ යටිකුරු කළ දයක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුණු දයක් විවෘත කරන්නේ හෝ වේ ද, මුළා වූවක්හට මඟ කියන්නේ හෝ වේ ද, 'ඇස් ඇතියන් රූප දකිත්' යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ වේ ද, එ පරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කාරණයෙන් ධර්මය පැවැසිණ. වහන්ස, ඒ මම් භාග්‍යවතුන් වහන්සේ සරණ යෙමි, ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ යෙමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් කොට යාවජීව සරණ ගිය උවසක්හු කොට සලකන සේක් වා'යි මේ වචන කී ය.

අට වැනි සිගාලක සූත්‍රය නිමියේ යැ.

# 9

# ආටානාටියසුත්තං

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථ ඛො චත්තාරො මහාරාජා[1] මහතියා ච යක්ඛසෙනාය මහතියා ච ගන්ධබ්බසෙනාය මහතියා ච කුම්භණ්ඩසෙනාය මහතියා ච නාගසෙනාය, චතුද්දිසං රක්ඛං ඨපෙත්වා, චතුද්දිසං ගුම්බං ඨපෙත්වා, චතුද්දිසං ඔවරණං ඨපෙත්වා, අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ගිජ්ඣකූටං[2] ඔභාසෙත්වා, යෙන භගවා තෙනුපසංකමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. තෙ පි ඛො යක්ඛා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු සම්මොදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

2. එකමන්තං නිසින්නො ඛො වෙස්සවණො මහාරාජා භගවන්තං එතදවොච:

“සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො අප්පසන්නා. සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො පසන්නා. සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා. සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා. සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො අප්පසන්නා. සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො පසන්නා.

1. මහාරාජානො – මජසං
2. ගිජ්ඣකූට පබ්බතං – මජසං

# 9

# ආටානාටිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී:

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර නිසා ගිජ්ජකූළ පව්වෙහි වැඩ වසන සේක. එ කලැ වරම් දෙව් මහරජ්ජුහු සතර දෙනා මහත් යක්ෂසේනායෙන් ද මහත් ගන්ධර්ව සේනායෙන් ද මහත් කුම්භාණ්ඩ සේනායෙන් ද මහත් නාගසේනායෙන් ද (අසුරසෙන් වළක්වාලනු පිණිස සක්දෙව්දුහු ගේ) සතර දෙසැ රකවල් තබා, සතර දෙසැ බලමුළු පිහිටුවා, සතර දිගැ මුර කරුවන් රඳවා, රෑ (පෙරයම) ඉක්මි කල්හි, අභිකාන්ත වූ ශරීරප්‍රභා ඇත්තාහු, සියලු ගිජ්ජකූළ පව්ව එකලු කොට, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියාහ. එළැඹැ ඔබ ආදරයෙන් වැඳ එකත් පස් වැ හුන්හ. (ඔවුන් පිරිවර වූ) ඒ යක්කු ද ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ එක් පසෙක උන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටට කරුණු වූ, සිතැ රැඳැවියැ යුතු වූ කථාව නිමවා එක් පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දෙසට ඇඳිලි නමා එක් පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් නම් ගොත් අස්වා එක් පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් නිහඬ වැ එක් පසෙක හුන්හ.

2. එක් පසෙක හුන් ම වෙසවුණු මහරජ භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැළ කෙළේ ය:

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේට නො පැහැදුණු මහ තෙදැති යක්කු වෙත් ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට පැහැදුණු මහ තෙදැති යක්කු ද වෙත් ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට නො පහන් වූ මැදුම් තෙදැති යක්කු ද වෙත් ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට පහන් වූ මැදුම් තෙදැති යක්කු ද වෙත් ම ය, වහන්ස, භාග්‍යවතුන් වහන්සේට නො පහන් වූ හීන තෙද ඇති යක්කු ද වෙත් ම ය, වහන්ස භාග්‍යවතුන් වහන්සේට පහන් වූ හීන තෙද ඇති යක්කු ද වෙත් ම ය.

යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා අප්පසන්නා යෙව භගවතො. තං කිස්ස හෙතු: භගවා හි භන්තෙ පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති, අදින්නාදානා වෙරමණියා ධම්මං දෙසෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාද වෙරමණියා ධම්මං දෙසෙති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති, යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා අප්පටිවිරතා යෙව පාණාතිපාතා, අප්පටිවිරතා අදින්නාදානා, අප්පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා, අප්පටිවිරතා මුසාවාද, අප්පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා. තෙසන්තං හොති අප්පියං අමනාපං. සන්ති හි භන්තෙ භගවතො සාවකා, අරඤ්ඤෙ වනපත්ථානි[1] පන්තානි සෙනාසනානි පටිසෙවන්ති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි[2] පටිසල්ලානසාරුප්පානි. තත්ථ සන්ති උළාරා යක්ඛා නිවාසිනො යෙ ඉමස්මිං භගවතො පාවචනෙ අප්පසන්නා. තෙසං පසාදාය උග්ගණ්හාතු භන්තෙ භගවා ආටානාටියං රක්ඛං භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායා''ති.

3. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො වෙස්සවණො මහාරාජා භගවතො අධිවාසනං විදිත්වා තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි:

4. ''විපස්සිස්ස[3] නමත්ථු චක්ඛුමන්තස්ස සිරීමතො
සිඛිස්ස පි[4] නමත්ථු සබ්බභූතානුකම්පිනො

වෙස්සභුස්ස නමත්ථු න්හාතකස්ස[5] තපස්සිනො
නමත්ථු කකුසන්ධස්ස මාරසෙනාපමද්දිනො

කොණාගමනස්ස නමත්ථු බ්‍රාහ්මණස්ස වුසීමතො,
කස්සපස්ස නමත්ථු විප්පමුත්තස්ස සබ්බධි.

---

1. අරඤ්ඤවනපත්ථානි (මජසං)
2. රාහස්සෙය්‍යකානි (සීමු, මජසං)
3. විපස්සිස්ස ච (මජසං)
4. සිඛිස්සපි ච (මජසං)
5. වෙස්සභුස්ස ච (මජසං)

වහන්ස, බොහෝ සෙයින් යක්කු භාග්‍යවතුන් වහන්සේට නො පැහැදුණෝ ම වෙත්. ඒ කවර හෙයින් ද යත්: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වනාහි පණිවාායෙන් වැළැක්ම පිණිස දහම් දෙසන සේක, අයිනාදනින් වැළැක්ම පිණිස දහම් දෙසන සේක, කාමයන්හි වැරදි හැසිරීමෙන් වැළැක්ම පිණිස දහම් දෙසන සේක, මුසවායෙන් වළක්නා පිණිස දහම් දෙසන සේක, මත්බවට හා පමාවට කරුණු වූ රහමෙර පීමෙන් වැළැක්ම පිණිස දහම් දෙසන සේක. වහන්ස, යක්කු වනාහි බොහෝ සෙයින් පණිවාායෙන් නො වැළැක්කාහු ම ය, අයිනාදනින් නො වැළැක්කාහු ම ය, කාමයන්හි වැරදි හැසිරීමෙන් නො වැළැක්කාහු ම ය, මුසවා-යෙන් නො වැළැක්කාහු ම ය, මත් බවට ද පමාවට ද කාරණ වූ රහමෙර පීමෙන් නො වැළැක්කාහු ම ය, ඔවුනට ඒ (භාග්‍යවතුන් වහන් සේ ගේ) දහම් දෙසුම අප්‍රිය වේ, අමනාප වේ. වහන්ස, යම් කෙනෙක් අල්පශබ්ද ඇති, මඳ වූ හඬ ඇති, පහ වූ ජනවාතය ඇති, මිනිසුන්ගේ හුදෙකලා වැ කළ යුතු ක්‍රියාවනට නිසි වූ, එකලා වැ හිදීමට සුදුසු වූ, අරණ්‍ය වනප්‍රස්ථයන් (ග්‍රාමෝප‍ාචරයෙන් දුරු වූ සෙනසුන්) ද, (මනුෂෝ‍ය‍ාප‍ාචාර විරහිත) බොහෝ දුරු සෙනසුන් ද සේවනය කෙරෙත් ද භාග්‍යවතුන් වහන්සේ ගේ එසේ වූ ශ්‍රාවකයෝ වෙත් ම ය. මේ භාග්‍ය-වතුන් වහන්සේ ගේ සස්නෙහි නො පහන් වූ ඒ සෙනසුන්හි නිවැසි මහ තෙදැති යක්කු වෙත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ගේ පැහැදීම පිණිස මහණුන් ගේ මෙහෙණන් ගේ උවසුවන්ගේ උවැසියන් ගේ ගුප්තිය පිණිස, ආරක්ෂාව පිණිස, පීඩාවක් නොවනු පිණිස, පහසු වාසය පිණිස, ආටානාටිය පිරිත උගන්නා සේක් වා" යි (කීයේ ය). භාග්‍යවතුන් වහන්සේ නිහඬ වැ ඉවසූ සේක.

3. ඉක්බිති වෙසවුණු මහ රජ භාග්‍යවතුන් වහන්සේ ඉවැසූ නියා දැන, ඒ වේලෙහි මේ ආටානාටිය පිරිත කීයේ ය:

4. "පසැස් ඇති සිරිමත් වූ විපස්සී බුදුරජුනට නමස්කාර වේ වා. සියලු සත්නට අනුකම්පා ඇති සිඛී බුදුරජුනට ද නමස්කාර වේ වා..

සෝද හළ කෙලෙස් ඇති, තපස්වී වූ වෙස්සභූ බුදුරජුනට නමස්කාර වේ වා. මරසෙන් මැඩැලූ කකුසඳ බුදුරජුනට නමස්කාර වේ වා,

බාහිත පාපී වූ, වැස නිමැ වූ මහ බඹසර ඇති, කෝණාගමන බුදුරජුනට නමස්කාර වේ වා. හැම දැයෙහි මිදුණා වූ කසුප් බුදුරජුනට නමස්කාර වේ වා.

අඞ්ගිරසස්ස නමත්ථු සක්‍යපුත්තස්ස සිරීමතො
යො ඉමං ධම්මමදෙසෙසි[1] සබ්බදුක්ඛාපනූදනං.

යෙ චාපි නිබ්බුතා ලොකෙ යථාභූතං විපස්සිසුං
තෙ ජනා අපිසුණා' මහන්තා වීතසාරදා.

5. හිතං දෙවමනුස්සානං යං නමස්සන්ති ගොතමං
විජ්ජාචරණසම්පන්නං මහන්තං වීතසාරදං.

යතො උග්ගච්ඡති සූරියො[2] ආදිච්චො මණ්ඩලී මහා
යස්ස චුග්ගච්ඡමානස්ස සංවරී පි නිරුජ්ඣති.

යස්ස චුග්ගතෙ සූරියෙ[3] දිවසො'ති පවුච්චති,
රහදො පි තත්ථ ගම්භීරො සමුද්දො සරිතොදකො

එවං නං තත්ථ ජානන්ති සමුද්දො සරිතොදකො,
ඉතො සා පුරිමා දිසා ඉති නං ආචික්ඛති ජනො
යං දිසං දභිපාලෙති මහාරාජා යසස්සි සො

ගන්ධබ්බානං ආධිපති ධතරට්ඨො' ති නාම සො
රමති නච්චගීතෙහි ගන්ධබ්බෙහි පුරක්ඛතො

පුත්තා පි තස්ස බහවො එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකො ච ඉන්දනාමා මහබ්බලා

තෙ චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතො'ව නමස්සන්ති මහන්තං වීතසාරදං
නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම

කුසලෙන සමෙක්ඛසි
අමනුස්සා පි තං වන්දන්ති,
සුතං නෙතං අභිණ්හසො තස්මා එවං වදෙමසෙ

---

1. ධම්මං දෙසෙසි-මජසං
2. සූරියො -මජසං
3. සූරියෙ -මජසං

යමෙක් සියලු දුක් දුරු ලන මේ ධර්මය දෙසී ද, ශ්‍රීමත් වූ ඒ ශාක්‍යපුත්‍ර අඞ්ගීරසයන් වහන්සේට නමස්කාර වේ වා,

ලොවැ යම් කෙනෙක් තුමූ නිවුණාහු තත් වූ පරිදි (සත්‍යයන්) විවසුන් නුවණින් දුටුහු ද, මහත් වූ, පහ වූ බිය ඇති, මාත්‍රභාණි වූ (මුසවා කේලාම් ඈ නො කියන) ඒ ක්ෂීණාස්‍රවයෝ,

5. දෙව්මිනිස්නට හිත වූ (මෙත් පතුරුවන), විද්‍යා හා චරණධර්මයෙන් සම්පූර්ණ වූ, මහත්ත්වයට පැමිණි, පහ වූ බිය ඇති යම් බඳු වූ ගෞතමයන් වහන්සේට නමස්කාර කෙරෙත් ද, ඒ බුදුරජුනට ද ඔබට පළමු වැ සිටි බුදුවරුනට ද නමස්කාර වේ වා,

මහා රශ්මි මණ්ඩලයක් ඇති, ආදිත්‍යසඞ්ඛ්‍යාත සූර්ය තෙමේ යම් තැනෙකින් උද වේ ද, යම් ඒ හිරුහු නැගෙන කල්හි රාත්‍රියත් අතුරු දහන් වේ ද,

යම් දිගෙක හිරු නැගි කල්හි දහවලැ යි කියනු ලැබේ ද, එ දිගැ, පිවිසුණු නදී ජලය ඇති සමුද්‍ර නම් වූ ගැඹුරු ජලාශයය වෙයි.

මෙසේ එහි එය නදීජලය ඇති මුහුද යැ යි දනිත්. කීර්තිමත් ඒ මහ රජෙක් යම් දිශාවක් පාලනය කෙරෙයි ද, එය මෙ තැනින් පෙර දෙස යැ යි මහ ජන තෙමේ කියයි.

ගන්ධර්වයනට අධිපති වූ, නම් වශයෙන් ධෘතරාෂ්ට්‍ර යැ යි ප්‍රකට වූ හේ තෙමේ ගඳෙව්වන් විසින් පෙරටු කරන ලද්දේ, නැටුම්ගැයුම්-නෙන් එහි සිත් අලවා වෙසෙයි.

ඔහුට (ඉන්ද්‍ර යන) එක් ම නමක් ඇති පුත්තු ද බොහෝ ඇතැ යි මා විසින් අසන ලදී. මහ බලැති ඉන්ද්‍ර නම් වූ ඔහු අසූවෙක් ද දශයෙක් ද එකෙක් ද (එක් අනූ දෙනෙක්) වෙත්.

ඔහුද සූර්යබන්ධු වූ, කෙලෙස් නින්දෙන් පිබිදියා වූ, මහත්ත්වයට පැමිණි, පහ වූ භය ඇති බුදුරජුන් දක,

'පුරුෂාජානේයයෙනි, ඔබට නමස්කාර වේ වා, පුරුෂොත්තමයෙනි, ඔබට නමස්කාර වේ වා' යි දුරු සිට ම නමස්කාර කෙරෙත්.

'ඔබ නිපුණ වූ සර්වඥතාඥානයෙන් මහජනයා දෙස බලති' යි කියා අමනුෂ්‍යයෝ ද ඔබ වඳිති, මෙය අප විසින් එක්වත් අසන ලදී. එ හෙයින්,

'ජිනං වන්දථ ගොතමං'ජිනං වන්දාම ගොතමං'
''විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දාම ගොතමං''

6. යෙන පෙතා පවුච්චන්ති පිසුණා පිට්ඨිමංසිකා,
පාණාතිපාතිනො ලුද්ද චොරා නෙකතිකා ජනා

ඉතො සා දක්ඛිණා දිසා ඉති නං ආචික්ඛන්ති ජනා,
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සි සො

කුම්භණ්ඩානං ආධිපති විරූළ්හො ඉති නාමසො,
රමති නච්චගීතෙහි කුම්භණ්ඩෙහි පුරක්ඛතො.

පුත්තා පි තස්ස බහවො එකනාමා'ති මෙ සුතං
අසීතිං දස එකො ච ඉන්දනාමා මහබ්බලා

තෙ චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතො'ව නමස්සන්ති මහන්තං වීතසාරදං
'නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම'.

කුසලෙන සමෙක්ඛසි
අමනුස්සා පි තං වන්දන්ති
සුතං නෙතං අභිණ්හසො තස්මා එවං වදෙමසෙ

'ජිනං වන්දථ ගොතමං ජිනං වන්දාම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දාම ගොතමං'.

7. යත්‍ථ චොග්ගච්ඡති සුරියො ආදිච්චො මණ්ඩලී මහා
යස්ස චොග්ගච්ඡමානස්ස දිවසො පි නිරුජ්ඣති.

යස්ස චොග්ගතෙ සුරියෙ සංවරී'ති පවුච්චති,
රහදො පි තත්‍ථ ගම්භිරො සමුද්දො සරිතොදකො.

---

1. ලුද්ධා -PTS. කම
2. තෙෂාමධිපති රාජා ධෘතරාෂ්ට්‍ර ඉති නාමතඃ
ගන්ධර්වාධිපති රාජා දෙවෙභි ස ච රක්ෂිතඃ
3. තෙෂාමධිපති රාජා විරූඪකොති නාමතඃ, කුම්භාණ්ඩාධිපති රාජා යක්ෂෙභි සහ රක්ෂතු
කුම්භාණ්ඩෙභි පුරස්කෘතඃ-මහායශඃ.
පුත්‍රා පි තස්‍ය බහව - එකනාමා විචක්ෂණාඃ
අශීතිර්දශ චෛකාශ්ච - ඉන්ද්‍රනාමා මහාබලාඃ -ලලිතවිස්තර

'කෙපි ගෞතම ජිනයන් වහන්සේ වඳිහු ද ?'යි මෙසේ අපි කියම්හ (අසම්හ). 'ගෞතම ජිනයන් වහන්සේ වඳුම්හ. විද්‍යාවරණසම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳුම්හ'යි ඔහු කියත්.

6. කලුරිය කළාහු (මළ සිරුරු) යම් දෙසකට 'ගෙන යනු ලැබෙත් ව'යි කියනු ලැබෙත් ද, කේලාම් කියන, පිටු මස් කන්නවුන් සේ පිටුපා ගිය කලැ ගරහන, පණිවා කරන, රෞද්‍ර වූ, සොර වූ කපට වූ (අපරාධකාරී)ජනයෝ යම් දිගකට ගෙන ගොස් නසනු ලබත් වා'යි කියනු ලැබෙත් ද,

ඒ යම් දිශාවක් යශස්වී මහරජෙක් පාලනය කෙරෙයි ද, ඒ මෙයින් දකුණු දිග යැ යි මහ ජන තෙමේ කියයි.

එ දෙසෙහි කුම්භාණ්ඩයනට අධිපති වූ, නම් විසින් විරූඪක යැ යි ප්‍රකට රජ තෙමේ කුම්භාණ්ඩයන් විසින් පෙරටු කරන ලද්දේ නැටුමෙන් ගැයුමෙන් සිත් අලවා වෙසෙයි.

ඔහුට එක්ම නමක් ඇති බොහෝ පුත්‍රයෝ ද වෙත්. ඉන්ද්‍ර නම් වූ මහ බලැති ඔවුහු එක් අනූ දෙනෙකැ යි මා විසින් අසන ලදී.

ඔහු ද සූර්යබන්ධු වූ, මහත් බවට පැමිණි, පහ වූ බිය ඇති, කෙලෙස් නින්දෙන් පිබිදුණු බුදුරජාණන් වහන්සේ දක, 'ආජානෙය පුරුෂයාණනි, ඔබට නමස්කාර වේ වා' පුරුෂොත්තමයාණනි, ඔබට නමස්කාර වේ වා' යි දුරැ සිට ම නමස්කාර කෙරෙත්.

'ඔබ නිපුණ වූ සර්වඥතාඥානයෙන් මහජනයා දෙස බලති' යි අමනුෂ්‍යයෝ ද ඔබ වඳිති. මෙය අප විසින් එක්වන් අසන ලදී. එහෙයින්,

'කෙපි ගෞතම ජිනයන් වහන්සේ වඳිහු ද ?' යි අපි මෙසේ ප්‍රශ්න වශයෙන් කියම්හ. 'අපි ගෞතම ජිනයන් වහන්සේ වඳිම්හ. විද්‍යාවරණ-සම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳිම්හ'යි (ඔහු උත්තර දෙත්).

7. මහ රස්මඬුලු ඇති, ආදිත්‍ය නම් වූ හිරු යම් දිගෙක බස්නේ ද, යම් ඒ හිරු බස්නා කල්හි දහවලත් අතුරුදහන් වේ ද,

යම් දිනකට හිරු බැස ගිය කලැ රාත්‍රි යැ යි කියනු ලැබේ ද, එ දිගැ, පිවිතුණු නදීජලය ඇති සමුද්‍ර නම් වූ ගැඹුරු ජලාශයය වෙයි.

එවං නං තත්ථ ජානන්ති සමුද්දෙ සරිතොදකො
ඉතො සා පච්ඡිමා දිසා ඉති නං ආචික්ඛති ජනො
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සි සො.

නාගානඤ්ච[1] ආධිපති විරූපක්ඛො'ති නාමසො,
රමති නච්චගීතෙහි නාගෙහෙව පුරෙක්ඛතො[2]

පුත්තා පි තස්ස බහවො එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකො ච ඉන්දනාමා මහබ්බලා

තෙ චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතො'ව නමස්සන්ති මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම

කුසලෙන සමෙක්ඛසි
අමනුස්සා පි තං වන්දන්ති
සුතං නෙතං අභිණ්හසො තස්මා එවං වදෙමසෙ:

"ජිනං වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමං"

8. යෙන උත්තරකුරු රම්මා[3] මහානෙරු සුදස්සනො,
මනුස්සා තත්ථ ජායන්ති අමමා අපරිග්ගහා

න තෙ බීජං පවපන්ති නපි නීයන්ති නඞ්ගලා
අකට්ඨපාකිමං සාලිං පරිභුඤ්ජන්ති මානුසා

අකණං අථුසං සුද්ධං සුගන්ධං තණ්ඩුලප්ඵලං,
තුණ්ඩිකීරෙ පචිත්වාන තතො භුඤ්ජන්ති භොජනං

ගාවිං එකඛුරං කත්වා අනුයන්ති දිසොදිසං,
පසුං එකඛුරං කත්වා අනුයන්ති දිසොදිසං

1. නාගානං – PTS
2. විරූපක්ඛො ඉති – PTS
3. උත්තර කුරුවෙහා – මජසං
4. ඉත්ථිවාහනං – PTS, ඉත්ථිං වා වාහනං – මජසං
5. තෙහාමධිපති රාජා විරූපාක්ෂොති නාමතඃ
ස වො නාගාධිපො රාජා වරුණෙන සහ රක්ෂතු
සර්වනාගෙහි රක්ෂිතඃ – මහාවස්තු

මෙසේ එහි එය නදීජලය ඇති මුහුද යැ යි දනිත්. යශස් ඇති ඒ මහරජෙක් යම් දිගක් පාලනය කෙරෙයි ද, එය මෙ තැනින් පැසිම් දෙස යැ යි මහ ජනයා කියයි.

නාගයනට අධිපති වූ, නම් විසින් විරූපාක්ෂ යැ යි ප්‍රකට වූ හේ නාගයන් විසින් පෙරටු කරන ලද්දේ, නැටුම් ගැයුම්හෙන් සිත් අලවා එහි වෙසෙයි.

ඔහුට එක් ම නමක් ඇති පුතුන් ද බොහෝ ඇතැ යි මා විසින් අසන ලදි. මහ බලැති ඉන්ද්‍ර නම් වූ ඔහු එක් අනූ දෙනෙක් වෙත්.

ඔහු ද සූර්යබන්ධු වූ, කෙලෙස් නින්දෙන් පිබිදියා වූ, මහත්ත්වයට පැමිණි, පහ වූ බිය ඇති, බුදුරජුන් දැක,

'ආජානෙය පුරුෂයාණනි, ඔබට නමස්කාර වේ වා, පුරුෂොත්තමයාණනි, ඔබට නමස්කාර වේ' වා යි දුරැ සිට ම නමස්කාර කෙරෙත්.

'ඔබ නිපුණ වූ සර්වඥතාඥානයෙන් මහ ජනයා දෙස බලති' යි අමනුෂ්‍යයෝ ද ඔබ වදිත්. මෙය අප විසින් එක්වන් අසන ලදී. එ හෙයින්,

'තෙපි ගෞතම ජිනයන් වහන්සේ වදිහු ද?' යි මෙසේ අපි ප්‍රශ්න කරම්හ. 'ගෞතම ජිනයන් වහන්සේ වඳුම්හ, විද්‍යාචරණසම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳුම්හ' යි ඔහු කියත්.

8. යම් දිග් භාගයක ඉතා දකුම්කලු මහාමේරු පර්වතය වෙයි ද, එහි සිත් කලු වූ උතුරුකුරුව වෙයි. එහි (වස්ත්‍රාදීන්හි) මමත්වය නැති, ('මේ මා බිරිය යැ' යි) ස්ත්‍රීන් කෙරෙහි පරිග්‍රහයක් (තමා අයත් කැරැ ගැන්මක්) නැති මිනිස්සු උපදිත්.

ඔහු ධාන්‍ය බිජුවට නො වපුරත්. නගුල්හු ද කෙතට නො පමුණුවනු ලැබෙත්. ඒ මිනිස්සු නො සානා ලද බිමැ තමන් ම නැඟී පැසුණු හැල් පරිභොග කරත්.

කුඩු නැති, තොහො නැති, ශුද්ධ වූ, සුවඳ ඇති සහල් සැළියෙක බහා පිසැ එයින් ගෙන බොජුන් වළඳත්.

එහි (වෙසවුණු රජු ගේ පිරිවර) යක්කු එළදෙන එක් කුරැති වාහනයක් කොට ගෙන, දිශායෙන් දිශාවට යෙත්. සිවුපාවකු එක් කුරයක් ඇති වාහනයක් කොටැ ගෙන දෙසින් දෙස යෙත්.

ඉත්ථිවාහනං කත්වා අනුයන්ති දිසොදිසං,
පුරිසවාහනං කත්වා අනුයන්ති දිසොදිසං.

කුමාරිවාහනං කත්වා අනුයන්ති දිසොදිසං,
කුමාරවාහනං කත්වා අනුයන්ති දිසොදිසං.

තෙ යානෙ අභිරූහිත්වා සබ්බා දිසා අනුපරියන්ති[1]
පචාරා තස්ස රාජිනො:

හත්ථියානං අස්සයානං දිබ්බංයානං උපට්ඨිතං.

පාසාද සිවිකා චෙව මහාරාජස්ස යසස්සිනො
තස්ස ච නගරා අහු අන්තලික්ඛෙ සුමාපිතා
ආටානාටා කුසිනාටා පරකුසිනාටා
නාටපුරියා[2] පරකුසිත නාටා[3].

උත්තරෙන කපිවන්තො[4] ජනොඝමපරෙන ච,
නවනවුතියො අම්බරඅම්බරවතියො ආළකමන්දා නාම රාජධානී

කුවෙරස්සඛො පන මාරිස මහාරාජස්ස විසාණා නාම රාජධානී
තස්මා කුවෙරො මහාරාජා වෙස්සවණො'ති පවුච්චති.

පච්චෙසන්තො පකාසෙන්ති තතොලා තත්තලා තතොතලා
ඔජසි තෙජසි තතොජසී සූරො රාජා අරිට්ඨො නෙමි.

රහදො පි තත්ථ ධරණී නාම යතො මෙඝා පවස්සන්ති
වස්සා යතො පතායන්ති.
සභාපි තත්ථ භගලවතී[5] නාම යත්ථ යක්ඛා පයිරුපාසන්ති.

තත්ථ නිච්චඵලා රුක්ඛා නානාදිජගණායුතා
මයූරකොඤ්චාභිරුතා[6] කොකිලාදීහි වග්ගුහි.

1. අනුපරියායන්ති -මජසං
2. නාටසුරියා -මජසං
3. පරකුසිටනාටා -මජසං
4. කසිවන්තො -මජසං
5. සාලවතී -මජසං
6. මයූරකොඤ්චාභිරුද -මජසං

ගැබිනි ස්ත්‍රියක වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්. පුරුෂයකු වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්.

කුමරියක වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්. කුමරකු වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්.

ඒ වෙසවුණු රජු ගේ පරිවාරක යක්ෂයෝ එලැඹැ සිටි හස්තියාන ද අශ්වයාන ද (අන්‍ය බහුවිධ) දිව්‍ය යාන ද යන එකී යානයන් අරා සියලු දික් සිසාරා යෙත්.

යශස් ඇති ඒ වෙසවුණු මහ රජුට ප්‍රාසාද ද සිවිගෙවල් ද වෙත්. එ රජුට අහසැ මොනොවට මවන ලද ආටානාටා ය, කුසිනාටා ය, පරකුසිනාටා ය, නාටපුරියා ය, පරකුසිතනාටා යැ යි නගරයෝ වූහ.

එයින් (ඒ පරකුසිතනාට නුවරින්) ඉඳුරා උතුරුදිගැ කපිවන්ත නම් නුවරෙක් ද, එයින් ඔබ්බෙහි ජනොඝ නම් නුවරෙක් ද, අන්‍ය නවනවතිය නම් නුවරෙක් ද, අම්බරඅම්බරවතිය නම් නුවරෙක් ද, අන්‍ය ආලකමන්ද නම් රාජධානියෙක් ද ඇත. නිදුකාණනි, කුවෙර මහ රජුගේ රජදහන විසාණා නම, එ හෙයින් කුවෙර මහ රජ වෙස්සවණ (වෙසවුණු) යැ යි නම් කරනු ලැබෙයි. එහි තතොලා, තත්තලා, තතොතලා, ඔජසී, තෙජසී, තතොජසී, සූර, රාජ, සූරරාජ, අරිෂ්ට, නෙමි, අරිෂ්ටනෙමි යන නම් ඇති (දෙළොස්) යක් රටියෝ කරුණු විමසා පවසත්.

යම් පොකුණෙකින් දිය ඇද ගෙන මෙඝයෝ වසිත් ද, යම් පොකුණෙකින් වර්ෂාවෝ පැතිරෙත් ද, එසේ වූ ධරණී නම් ජලාශයයෙක් ද එහි වෙයි. එහි තෙර යකුන් රැස් වැ හිඳුනා භගලවතී නම් රුවන් මඩුවෙක් වෙයි.

එහි (ඒ මඩුව හාත්පසැ) විවිධ පක්ෂිසමූහයන් ගෙන් යුක්ත වූ, මොනරුන් ද කොස්ලිහිණියන් ද විසින් දුන් නාද ඇති, කෝකිලාදීන් විසින් මනොඥ නාදයෙන් උන්නාදිත වූ, නිති පල දරන වෘක්ෂයෝ වෙත්.

ජීවංජීවකසද්දෙත්ථ අථො උට්ඨවචිත්තකා[1]
කුක්කුත්ථකා[2] කුළීරකා වනෙ පොක්ඛරසාතකා.

සුකසාලිකසද්දෙත්ථ දණ්ඩමාණවකානි ච
සොභති සබ්බකාලං සා කුවෙරනළිනී සදා.

10. ඉතො සා උත්තරා දිසා ඉති නං ආචික්ඛති ජනො
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සිසො.

යක්ඛානං ආධිපති කුවෙරො ඉති නාමසො[3]
රමති නච්චගීතෙහි යක්ඛෙහි පුරක්ඛතො.

පුත්තා පි තස්ස බහවො එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකො ච ඉන්දනාමා මහබ්බලා.

තෙ චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතො'ව නමස්සන්ති මහන්තං වීතසාරදං
'නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම'

'කුසලෙන සමෙක්ඛසි'
අමනුස්සා පි තං වන්දන්ති, සුතං නෙතං අභිණ්හසො
තස්මා එවං වදෙමසෙ:
'ජිනං වන්දථ ගොතමං' 'ජිනං වන්දාම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දාම ගොතමන්ති''.

11. අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති. යස්ස කස්සචි මාරිස භික්ඛුස්ස වා භික්ඛුනියා වා උපාසකස්ස වා උපාසිකාය වා අයං ආටානාටියා රක්ඛා සුග්ගහිතා භවිස්සති සමත්තාපරියාපුතා,[4]

---

1. ඔට්ඨවච්ඡිතකා (මජසං)
2. කුක්කුළකා (මජසං)
3. නාෂාමධිපති රාජා කුවෙර ඉති නාමතඃ
   සර්වයක්ෂාධිපො රාජා රාක්ෂසෛහි සහ රක්ෂතු යක්ෂ රාක්ෂස රක්ෂිතඃ—මහාවස්තු.
4. පරියාපුටා -කම.

මෙහි පියුම් වෙනෙහි 'ජීව ජීව' යැ යි හඬ නගන (ජීවජීවක නම්) පක්ෂි කෙනෙක් ද, තව උට්ඨවචිත්තක නම් පක්ෂීහු ද, වලිකුකුළෝ ද, රත්වන් කකුළුවෝ ද, ඒ පොක්ඛරසාතක නම් පක්ෂීහු ද වෙත්.

මෙහි ගිරවුන්ගේ ද සැළළිහිණියන්ගේ ද හඬ ඇත, දණ්ඩමානවක නම් පක්ෂීහු ද මෙහි හැසිරෙත්. මෙසේ හැම කල්හි ඒ කුවේරයා ගේ පියුම් විල නිරතුරු හොබනේ ය.

10. යශස් ඇති ඒ කුවෙර මහරජ යම් දිගක් පාලනය කෙරෙයි ද, ඒ මේ තැනින් උතුරු දෙස යැ යි මහජන තෙමේ කියයි.

නම් විසින් කුවෙර යැ යි ප්‍රකට වූ, යක්ෂයනට අධිපති වූ, හෙ තෙමේ යකුන් විසින් පෙරටු කැරැ ගන්නා ලද්දේ, නෘත්‍ය ගීතයෙන් සිත් අලවා වෙසෙයි.

ඔහුට එක් නම් ඇති බොහෝ පුතුන් ද වෙති යි මා විසින් අසන ලදී. ඔහු ඉන්ද්‍ර යන නම ඇති මහා බලැති එක් අනූ දෙනෙකි.

ඔහු ද සූර්යබන්ධු වූ, ක්ලෙශනිද්‍රායෙන් පිබිදුණු මහත්ත්ව ප්‍රාප්ත, පහ වූ බියැති බුදුරජුන් දක, 'ආජානෙය පුරුෂයාණනි, ඔබට නමස්කාර වේ වා. උත්තම පුරුෂයාණනි, ඔබට නමස්කාර වේ වා' යි දුරැ සිට ම නමදිත්.

'ඔබ නිපුණ වූ සර්වඥතාඥනයෙන් මහ ජනයා දෙස බලති' යි කියා අමනුෂ්‍යයෝ ද ඔබ වඳිත්. මෙය අප විසින් එක්වත් අසන ලදී. එ හෙයින්,

'ගෞතම ජිනයන් වහන්සේ වඳිහු ද?'යි මෙසේ අපි (ප්‍රශ්න කොට) කියම්හ. 'ගෞතම ජිනයන් වහන්සේ අපි වඳිමු, විද්‍යා චරණ දෙකින් සම්පූර්ණ වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳිමු'යි ඔහු උත්තර දෙත්.

11. නිදුකාණන් වහන්ස, මහණුනට ද මෙහෙණනට ද උවසුවනට ද උවැසියනට ද ගුප්තිය පිණිස, රක්ම පිණිස, නොවෙහෙසීම පිණිස, සැප විහරණ පිණිස වූ ඒ ආටානාටිය පිරිත නම් මෙය ය. නිදුකාණන් වහන්ස, යම් කිසි මහණක්හු හෝ මෙහෙණක හෝ උවසුවකු හෝ උවැසියක විසින් මේ ආටානාටිය පිරිත මනා කොට උගන්නා ලද්දේ, අර්ථ ව්‍යංජනයෙන් පිරිපුන් කොට පුහුණු කරන ලද්දේ වී නම්,

තඤ්චෙ අමනුස්සො යක්ඛො වා යක්ඛිනී වා යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා, ගන්ධබ්බො වා ගන්ධබ්බී වා ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා, කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා, නාගො වා නාගිනී[1] වා, නාගපොතකො වා නාගපොතිකා වා නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා පදුට්ඨචිත්තො භික්ඛුං වා භික්ඛුනිං වා උපාසකං වා උපාසිකං වා ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, න මෙ සො මාරිස අමනුස්සො ලභෙය්‍ය ගාමෙසු වා නිගමෙසු වා සක්කාරං වා ගරුකාරං වා. න මෙ සො මාරිස අමනුස්සො ලභෙය්‍ය ආළකමන්දාය රාජධානියා වත්ථුං වා වාසං වා, න මෙ සො මාරිස අමනුස්සො ලභෙය්‍ය යක්ඛානං සමිතිං ගන්තුං. අපිස්සු නං මාරිස අමනුස්සා අනාවය්හම්පි නං කරෙය්‍යුං අවිවය්හං. අපිස්සු නං මාරිස අමනුස්සා අත්තාහි'පි පරිපුණ්ණාහි පරිභාසාහි පරිභාසෙය්‍යුං. අපිස්සු නං මාරිස අමනුස්සා රිත්තම්පිස්ස පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං. අපිස්සු නං මාරිස අමනුස්සා සත්තධාපි'ස්ස මුද්ධං ඵාලෙය්‍යුං.

12. සන්ති හි මාරිස අමනුස්සා චණ්ඩා රුද්ධා රභසා. තෙ නෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති' න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති. තෙ ඛො තෙ මාරිස අමනුස්සා මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

1. නාගී වා (මඡසං)

යක්ෂයෙක් හෝ යක්ෂණියක් හෝ යක්ෂපෝතකයෙක් හෝ යක්ෂපෝතිකාවක් හෝ යක්ෂ මහාමාත්‍රයෙක් හෝ යක්ෂ පාරිෂද්‍යයෙක් හෝ යක්ෂ පරිචාරකයෙක් හෝ, ගන්ධර්වයෙක් හෝ ගන්ධර්වියක් හෝ ගන්ධර්ව පෝතකයෙක් හෝ ගන්ධර්වපෝතිකාවක් හෝ ගන්ධර්ව මහාමාත්‍රයෙක් හෝ ගන්ධර්ව පාරිෂද්‍යයෙක් හෝ ගන්ධර්ව පරිචාරකයෙක් හෝ, කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියෙක් හෝ කුම්භාණ්ඩ පොතකයෙක් හෝ කුම්භාණ්ඩ පොතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍රයෙක් හෝ කුම්භාණ්ඩ පාරිෂද්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පරිචාරකයෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාගපොතකයෙක් හෝ නාගපොතිකාවක් හෝ නාග මහාමාත්‍රයෙක් හෝ නාග පාරිෂද්‍යයෙක් හෝ නාග පරිචාරකයෙක් හෝ මෙකී කිසි යම් අමනුෂ්‍යයෙක් ද්වෙෂයෙන් ප්‍රද්විෂ්ට සිතැත්තේ මහණකු හෝ මෙහෙණක හෝ උවසුවකු හෝ උවැසියක හෝ මෙ කිසිවකු යන්නහු අනුව (පසු පසැ) යන්නේ ද, සිටියහු වෙත සිටින්නේ ද, උන්නහු වෙත ඉඳුනේ ද, හොත්තහු වෙත හෝනේ ද, නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙමේ මාගේ ගම්හි හෝ නියම්ගම්හි හෝ සත්කාරයක් හෝ ගෞරවයක් හෝ නො ලබන්නේ ය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙමේ මගේ ආළකමන්ද රාජධානියෙහි වසන ගෙයක් හෝ නවාතැනක් හෝ නො ලබන්නේ ය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙමේ මගේ යක්ෂ සමාගමයට යන්නට හෝ නො ලබන්නේ ය. වැලි දු නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහු ආවාහයක් නො කටහැක්කකු ද විවාහයක් නො කටහැක්කකු ද කරන්නාහ. තව ද නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහුට අත්බව එළවා කියනු ලබන පරිපූර්ණ පරිභව වචනයෙන් බණින්නාහ. නිදුකාණන් වහන්ස, තව ද අමනුෂ්‍යයෝ හිස් වූ ලොහපාත්‍රයක් යැටිකුරු කොට ඔහු හිසැ ලන්නාහ. තව ද නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහු හිස සත් කඩක් කොට පළන්නාහු ද වෙත්.

12. නිදුකාණන් වහන්ස, නපුරු වූ, සතුරු වූ, කළ දැයට වැඩියක් කරන්නාවූ අමනුෂ්‍යයෝ ඇත. ඔහු සතර වරම් මහරජදරුවන් ගේ බස් නො ම පිළිගනිත්. වරම්රජුන් අයත් සෙනෙවියන් ගේ බස් ද නො ම පිළිගනිත්. වරම්රජුන් යටතැ සිටිනා යක් සෙනෙවියන් ගේ මෙහෙකරුවන් ගේ බස් දු නො ම පිළිගනිත්. නිදුකාණන් වහන්ස. ඒ අමනුෂ්‍යයෝ වරම් මහරජුන් ගේ සතුරෝ නමැ යි කියනු ලබත්.

සෙය්‍යථාපි මාරිස රඤ්ඤො මාගධස්ස විජිතෙ මහාචොරා තෙ නෙව රඤ්ඤො මාගධස්ස ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස මහාචොරා රඤ්ඤො මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති, එවමෙව ඛො මාරිස සන්ති හි අමනුස්සා චණ්ඩා රුද්ද රභසා, තෙ නෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති. තෙ ඛො තෙ මාරිස අමනුස්සා මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

13. යො හි කොචි මාරිස අමනුස්සො යක්ඛො වා යක්ඛිනී වා යක්ඛ-පොතකො වා යක්ඛපොතිකා වා යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා, ගන්ධබ්බො වා ගන්ධබ්බී වා ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බ-පොතිකා වා ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචා-රො වා, කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩ-පොතිකා වා කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩ-පචාරො වා, නාගො වා නාගිනී වා නාගපොතකො වා නාගපොතිකා වා නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා, පදුට්ඨචිත්තො භික්ඛුං වා භික්ඛුනිං වා උපාසකං වා උපාසිකං වා ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනි-පජ්ජෙය්‍ය, ඉමෙසං යක්ඛානං මහායක්ඛානං සෙනාපතීනං මහාසෙනාපතීනං උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං; "අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතී"ති.

14. කතමෙසං යක්ඛානං මහායක්ඛානං සෙනාපතීනං මහා-සෙනාපතීනං:

නිදුකාණන් වහන්ස, යමෙසේ මගධාධිපති රජු ගේ රටෙහි මහ සොරහු ඇත් ද, ඔහු මගධාධිපති රජු ගේ වචන නො ම පිළිගනිත් ද, මගධාධිපති රජුගේ සෙනෙවියන් ගේ වචන ද නො ම පිළිගනිත් ද, මගධාධිපති රජු ගේ සෙනෙවියන්ගේ මෙහෙකරුවන් වචනත් නො ම පිළිගනිත් ද, නිදුකාණන් වහන්ස, ඒ මහ සොරු මගධාධිපති රජුහු ගේ සතුරෝ නමැ යි කියනු ලැබෙත් ද, එසේ ම නිදුකාණන් වහන්ස, නපුරු වූ සතුරු වූ කළ එකට වැඩියක් කරන්නා වූ අමනුෂ්‍ය කෙනෙක් වෙත් ම ය. ඔහු වරම් මහ රජුන්ගේ බස් නො ම පිළිගනිත්, වරම් මහ රජුන්ගේ සෙනෙවියන් බස් ද නො ම පිළිගනිත්, වරම් මහරජුන් අයත් සෙනෙවියන්ගේ මෙහෙකරුවන් බස් ද නො පිළිගනිත්, නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ වරම් මහ රජුන්ගේ සතුරෝ යැ යි කියනු ලබත්.

13. නිදුකාණන් වහන්ස, යකෙක් හෝ යකින්නක් හෝ යක් දරුවෙක් හෝ යක් දූරියක් හෝ යක් දෙටුවෙක් හෝ යක් පිරිසදූ වූයෙක් හෝ යක් මෙහෙකරුවෙක් හෝ, ගඳෙව්වෙක් හෝ ගඳෙවියක් හෝ ගඳෙවු දරුවෙක් හෝ ගඳෙවු දූරියක් හෝ ගඳෙවු දෙටුවෙක් හෝ ගඳෙවු පිරිසදූ වූයෙක් හෝ ගඳෙවු මෙහෙකරුවෙක් හෝ, කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ දරුවෙක් හෝ කුම්භාණ්ඩ දූරියක් හෝ කුම්භාණ්ඩ දෙටුවෙක් හෝ කුම්භාණ්ඩ පර්ෂත්හි වූයෙක් හෝ කුම්භාණ්ඩ පරිවාරකයෙක් හෝ, නාගයෙක් හෝ නැයිනියක් හෝ නා දරුවෙක් හෝ නා දූරියක් හෝ නා දෙටුවෙක් හෝ නා පිරිසදූ වූයෙක් හෝ නා මෙහෙකරුවෙක් හෝ මෙ කී කිසි අමනුෂ්‍යයෙක් ද්වේෂයෙන් ප්‍රද්විෂ්ට සිතැත්තේ, මහණකු හෝ මෙහෙණක හෝ උවසුවකු හෝ උවැසියක හෝ මෙ කිසිවක්හු යන්නහු පසු පසැ යන්නේ වී නම්, සිටියහු වෙත සිටින්නේ වී නම් හෝ හුන්නහු වෙත හිඳින්නේ වී නම් හෝ හොත්තහු වෙත හෝ තේ වී නම් හෝ, මේ යකුනට, මහයකුනට, යක් සෙනෙවියනට, යක්-මහ සෙනෙවියනට, "මේ යක් තෙමේ මා අල්ලා ගනී, මෙ යක් තෙමේ මට ආවිෂ්ට වෙයි, මෙ යක් තෙමේ මා පෙළයි, මේ යක් තෙමේ වෙසෙසින් මා පෙළයි, මේ යක් තෙමෙ මට හිංසා කෙරෙයි, මේ යක් තෙමේ මා වෙහෙසයි, මේ යක් තෙමේ මා නො මුදූ (අත් නො හරී) යැ" යි දන්වියැ යුතු, හඬ නඟා කියැ යුතු, ඔවුන් හා කියැ යුතු.

14. (එසේ දන්වියැ යුත්තේ) කවර යකුනට ද? කවර මහ යකුනට ද? කවර යක් සෙනෙවියනට ද? කවර මහ යක් සෙනෙවියනට ද යත්:

ඉන්දො සොමො වරුණො ච භාරද්වාජො පජාපති,
චන්දනො කාමසෙට්ඨො ච කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච.

පනාදො ඔපමඤ්ඤො ච දෙවසූතො ච මාතලි,
චිත්තසෙනො ච ගන්ධබ්බො නළො රාජා ජනෙසභො.

සාතාගිරො හෙමවතො පුණ්ණකො කරතියො ගුළො,
සීවකො මුචලින්දො ච වෙස්සාමිත්තො යුගන්ධරො.

ගොපාලො සුප්පගෙධො ච[2] හිරි නෙත්ති ච මන්දියො.
පඤ්චාලචණ්ඩො ආළවකො පජ්ජුන්නො[3] සුමනො සුමුඛො දධිමුඛො,
මණි මාණි චරො දීඝො අථො සෙරීසකො[4] සහ.

15. ඉමෙසං යක්ඛානං මහායක්ඛානං සෙනාපතීනං මහාසෙනාපතීනං උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං: අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතී ති.

අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරායා'ති.

හන්ද ච දානි මයං මාරිස ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයා'ති.

'යස්ස' දානි තුම්හෙ මහාරාජානො කාලං මඤ්ඤථා'ති.

16. අථ ඛො චත්තාරො මහාරාජානො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු. තෙ පි ඛො යක්ඛා උට්ඨායාසනා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු, අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා තත්ථෙවන්තරධායිංසු, අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා තත්ථෙවන්තරධායිංසු, අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා තත්ථෙවන්තරධායිංසු, අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථෙවන්තරධායිංසූ'ති.

පඨමකභාණවාරො නිට්ඨිතො.

---

1. සිවකො - මජ්ඣං
2. සුප්පරොධො ච - මජ්ඣං
3. පජ්ජුනො - මජ්ඣං
4. සෙරිසකො - මජ්ඣං

ඉන්ද්‍ර ය, සෝම ය, වරුණ ය, භාරද්වාජ ය, ප්‍රජාපති ය, චන්දන ය, කාමශ්‍රේෂ්ඨ ය, කින්නිඝණ්ඩු ය, නිඝණ්ඩු ය, ප්‍රණාද ය, ඕපමඤ්ඤ ය, දෙව් සැරි මාතලි ය, චිත්‍රසේන ය, ගන්ධර්ව ය, නළ ය, රාජ ය, ජනර්ෂභ ය, සාතාගිර ය, හෙමවත ය, පූර්ණක ය, කරතිය ය (කාර්තිකෙය ය), ගුඩ ය. ගොපාල ය, සුප්පගෙධ ය, හිරිනෙත්ති ය, මන්දිය ය, පඤ්චාල චණ්ඩ ය, ආළවක ය, පර්ජන්‍ය ය, සුමන ය, සුමුඛ ය, දධිමුඛ ය, මණි ය, මානි ය, චර ය, දීර්ඝ ය, තව ද සෙරීසක ය යන මොවුනට ය.

15. මේ යක්ෂයනට ද මහා යක්ෂයනට ද යක්ෂ සෙනාපතීනට ද මහා යක්ෂ සෙනාපතීනට ද,

'මේ යක් තෙමේ මා අල්ලා ගනී යැ යි, මේ යක් තෙමේ මට ආවිෂ්ට වේ යැ යි, මේ යක් තෙමේ මා පෙළා යැ යි, මේ යක් තෙමේ වෙසෙසින් පෙළා යැ යි, මේ යක් තෙමේ මට හිංසා කෙරේ යැ යි, මේ යක් තෙමේ මා වෙහෙසා යැ යි, මේ යක් තෙමේ මා නො මුද යැ' යි දන්වියැ යුතු, හඬ නඟා කියැ යුතු.

නිදුකාණන් වහන්ස, මේ මහණුනට මෙහෙණනට උවසුවනට, උවැසියනට ගුප්තිය පිණිස, රකවරණ පිණිස, නො වෙහෙසීම පිණිස, පහසු විහරණ පිණිස වූ ඒ ආටානාටිය පිරිත ය.

නිදුකාණන් වහන්ස, දැන් අපි යම්හ. අපි බොහෝ කෘත්‍ය ඇත්තම්හ, බොහෝ කටයුතු ඇත්තම්හ'' යි වරම් රජ්ජු කීහ.

'මහ රජුනි, තෙපි යම් ගමනකට දැන් කල් වේ යැ යි සලකන්නාහු ද,

ඒ ගමන කරනු ලැබේ වා' යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

16. ඉක්බිති සතර වරම් මහරජහු හුනස්නෙන් නැඟී, සාදර වැ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට, එහි ම අතුරුදහන් වූහ. ඒ යක්කු ද හුනස්නෙන් නැඟී, ඇතැම් කෙනෙක් සාදර වැ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් වූහ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටට කරුණු වූ සිතැ රැඳැවියැ යුතු වූ කථා නිමවා එහි ම අතුරුදහන් වූහ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දිසාවට දෙහොත් නමා, එහි ම අතුරුදහන් වූහ. ඇතැම් කෙනෙක් නම් ගොත් අස්වා එහි ම අතුරුදහන් වූහ. ඇතැම් කෙනෙක් නිහඬ වූවාහු, එහි ම අතුරුදහන් වූහ.

පළමු බණවර නිමියේ ය.

16. අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි:

ඉමං භික්ඛවෙ රත්තිං චත්තාරො මහාරාජානො මහතියා ච යක්ඛසෙනාය මහතියා ච ගන්ධබ්බසෙනාය මහතියා ච කුම්භණ්ඩසෙනාය මහතියා ච නාගසෙනාය චතුද්දිසං රක්ඛං ඨපෙත්වා, චතුද්දිසං ගුම්බං ඨපෙත්වා, චතුද්දිසං ඔවරණං ඨපෙත්වා, අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ගිජ්ඣකූටං පබ්බතං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසංකමිංසු, උපසංකමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. තෙපි ඛො භික්ඛවෙ යක්ඛා අප්පෙකච්චෙ මං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු: අප්පෙකච්චෙ මම සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු: අප්පෙකච්චෙ යෙනාහං තෙනඤ්ජලිම්පණාමෙත්වා එකමන්තං නිසීදිංසු: අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු: අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

17. එකමන්තං නිසින්නො ඛො භික්ඛවෙ වෙස්සවණො මහාරාජා මං එතදවොච :

සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො පසන්නා: සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා: සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො පසන්නා: යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා අප්පසන්නා යෙව භගවතො. තං කිස්ස හෙතු? භගවා හි භන්තෙ පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති, අදින්නාදානා වෙරමණියා ධම්මං දෙසෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාදා වෙරමණියා ධම්මං දෙසෙති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති. යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා අප්පටිවිරතායෙව පාණාතිපාතා, අප්පටිවිරතා අදින්නාදානා, අප්පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා, අප්පටිවිරතා මුසාවාදා, අප්පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා. තෙසං තං හොති අප්පියං අමනාපං.

16. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ එ රැය ඇවෑමෙන් භික්ෂූන් බණවා මෙසේ වදළ සේක:

මහණෙනි, මේ ගත වූ රාත්‍රියෙහි සතර වරම් මහරජ්ජුහු මහත් යක්ෂ සේනායෙන් ද මහත් ගාන්ධර්ව සේනායෙන් ද මහත් කුම්භාණ්ඩ සේනා-යෙන් ද මහත් නාගසේනායෙන් ද සතර දිගැ රකවල් තබා, සතර දිගැ බලමුළු පිහිටුවා, සතර දිගැ මුරකරුවන් රඳවා, රැ (පෙර යම) ඉක්ම් කල්හි, විශිෂ්ට ශරීරප්‍රභා ඇත්තාහු, සියලු ගිජුකුළු පව්ව එකලු කොට, මා කරා එළැඹිය හ. එළැඹැ මා සාදර වැ වැඳ, එක් පසෙක හුන්හ. (ඔවුන්ගේ පිරිවර වූ) යක්කු ද ඇතැම් කෙනෙක් මා සාදර වැ වැඳ එක් පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් මා හා සතුටු වූහ. සතුටට කරුණු වූ සිත රැඳැවියැ යුතු වූ, කථාව නිමවා, එක් පසෙක හුන්හ, ඇතැම් කෙනෙක් මා දිසාවට දෙහොත් නමා පසෙක හුන්හ, ඇතැම් කෙනෙක් නම් ගොත් අස්වා පසෙක හුන්හ, ඇතැම් කෙනෙක් නිහඬ වැ පසෙකැ හුන්හ.

17. මහණෙනි, පසෙක උන් ම වෙසවුණු මහ රජ මට මෙ පවත් කී ය:

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේට නො පැහැදුණු මහතෙදැති යක්කු ද වෙත් ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට පැහැදුණු මහ තෙදැති යක්කු ද වෙත් ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට නො පහන් වූ මැදුම් තෙදැති යක්කු ද වෙත්මය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට පහන් වූ මැදුම් තෙදැති යක්කු ද වෙත් ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්-සේට නොපහන් වූ හීන තෙදැති යක්කු ද වෙත් ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට පහන් වූ හීන තෙදැති යක්කු ද වෙත් ම ය. වහන්ස, බොහෝ සෙයින් යක්කු භාග්‍යවතුන් වහන්සේට නොපැහැදුණ හු ම වෙත්. ඒ කවර හෙයින් ද? යත්: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වනාහි පණිවායෙන් වැළැක්ම පිණිස දහම් දෙසන සේක. අයිනාදනින් වැළැක්ම පිණිස දහම් දෙසන සේක. කාමයන්හි වැරැදූ හැසිරීමෙන් වැළැක්ම පිණිස දහම් දෙසන සේක. මුසවායෙන් වැළැක්ම පිණිස දහම් දෙසනා සේක. මත්බවට හා පමාවට හා කරුණු වූ රහමෙර පීමෙන් වැළැක්ම පිණිස දහම් දෙසන සේක. වහන්ස, යක්කු වනාහි බොහෝ සෙයින් පණිවායෙන් නො වැළක්කාහු ම ය, අයිනාදනින් නො වැළැක්නාහු ම ය, කාමයන්හි වැරැදූ හැසිරීමෙන් නො වැළැක්කාහු ම ය, මුසාවායෙන් නො වැළැක්කාහු ම ය, මත්බවට ද පමාවට ද කාරණ වූ රහමෙර පීමෙන් නො වැළැක්කාහු ම ය. ඔවුනට (භාග්‍යවතුන් වහන්සේ ගේ) ඒ දහම් දෙසුම අප්‍රිය වේ, අමනාප වේ.

සන්ති හි භන්තෙ භගවතො සාවකා, අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි.

තත්ථ සන්ති උළාරා යක්ඛා නිවාසිනො යෙ ඉමස්මිං භගවතො පාවචනෙ අප්පසන්නා තෙසං පසාදාය. උග්ගණ්හාතු භන්තෙ භගවා ආටානාටියං රක්ඛං භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති.

අධිවාසෙසිං ඛො අහං භික්ඛවෙ තුණ්හීභාවෙන.

18. අථ ඛො භික්ඛවෙ වෙස්සවණො මහාරාජා මං අධිවාසනං විදිත්වා තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි:

විපස්සිස්ස නමත්ථු චක්ඛුමන්තස්ස සිරීමතො,
සිඛිස්සපි නමත්ථු සබ්බභූතානුකම්පිනො. 1.

වෙස්සභුස්ස නමත්ථු නහාතකස්ස තපස්සිනො,
නමත්ථු කකුසන්ධස්ස මාරසෙනප්පමද්දිනො. 2.

කොණාගමනස්ස නමත්ථු බ්‍රාහ්මණස්ස වුසීමතො,
කස්සපස්ස ච නමත්ථු විප්පමුත්තස්ස සබ්බධි. 3.

අඞ්ගීරසස්ස නමත්ථු සක්‍යපුත්තස්ස සිරීමතො,
යො ඉමං ධම්මමදෙසෙසි සබ්බදුක්ඛාපනූදනං 4.

යෙ චාපි නිබ්බුතා ලොකෙ යථාභූතං විපස්සිසුං,
තෙ ජනා අපිසුනා මහන්තා වීතසාරදා. 5.

19. හිතං දෙවමනුස්සානං යං නමස්සන්ති ගොතමං,
විජ්ජාචරණසම්පන්නං මහන්තං වීතසාරදං 6.

යතො උග්ගච්ඡති සූරියො ආදිච්චො මණ්ඩලී මහා,
යස්ස චුග්ගච්ඡමානස්ස සංවරී පි නිරුජ්ඣති 7.

වහන්ස, යම් කෙනෙක් අල්ප ශබ්ද ඇති, මද වූ හඬ ඇති, පහ වූ ජනවාතය ඇති, මිනිසුන්ගේ රහස් ක්‍රියාවනට නිසි වූ, එකලා වැ හිඳීමට සුදුසු වූ, අරණ්‍ය වන ප්‍රසථයන් ද, බොහෝ දුර සෙනසුන් ද සෙවිත් නම්, භාග්‍යවතුන් වහන්සේගේ එසේ වූ ශ්‍රාවකයෝ වෙත් ම ය.

වහන්ස, මේ භාග්‍යවතුන් වහන්සේගේ සස්න කෙරෙහි නො පහන් වූ, ඒ (යට කී) සෙනසුන්හි තිවැසි මහ තෙදැති යක්කු වෙත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ගේ පැහැදීම පිණිස, මහණුන්ගේ මෙහෙණන්ගේ උවසුවන්ගේ උවැසියන්ගේ ගුප්තිය පිණිස, ආරක්ෂාව පිණිස, පීඩාවක් නොවනු පිණිස, පහසු වාසය පිණිස, ආටානාටිය පිරිත උගන්නා සේක් වා' යි (කීයේ ය.)

මහණෙනි, මම තිහඬ වැ ඉවැසීමි.

18. මහණෙනි, ඉක්බිති වෙසවුණු මහ රජ මා ඉවැසූ නියා දැන, එ වේලෙහි මේ ආටානාටිය පිරිත කීයේ ය:

"පසැස් ඇති සිරිමත් වූ, විපස්සී බුදුරජුනට නමස්කාර වේ වා. සියලු සත්නට අනුකම්පා ඇති සිඛී බුදුරජුනට ද නමස්කාර වේ වා. සෝද හළ කෙලෙස් ඇති, තපස්වී වූ වෙස්සභූ බුදුරජුනට නමස්කාර වේ වා. මරසෙන් මැඩැලූ කකුසඳ බුදුරජුනට නමස්කාර වේ වා.

බාහිත පාපී වූ, වැස නිමැ වූ මහබඹසර ඇති, කොණාගමන බුදුරජුනට නමස්කාර වේ වා. හැම දැයෙහි මිදුණා වූ කසුප් බුදුරජුනට නමස්කාර වේ වා.

යමෙක් සියලු දුක් දුරු ලන මෙ ධර්මය දෙසී ද, ශ්‍රීමත් වූ ඒ ශාක්‍යපුත්‍ර අඞ්ගිරසයන් වහන්සේට නමස්කාර වේ වා.

ලොවැ යම් කෙනෙක් තුමූ නිවුණාහු තත් වූ පරිදි (සත්‍යයන්) විමැසුම් නුවණින් දුටුහු ද, මහත් වූ, පහ වූ බිය ඇති මාත්‍රභාණී වූ ඒ ක්ෂීණාස්‍රවයෝ,

19. දෙව්මිනිස්නට හිත වූ, විද්‍යා හා චරණධර්මයෙන් සම්පූර්ණ වූ, මහත්වයට පැමිණි, පහ වූ බිය ඇති, යම් බදු වූ ගෞතමයන් වහන්සේට නමස්කාර කෙරෙත් ද, ඒ බුදුරජුනට ද ඔබට පළමු වැ සිටි බුදුවරුනට ද නමස්කාර වේ වා.

මහා රශ්මි මණ්ඩලයක් ඇති ආදිත්‍ය සංඛ්‍යාත සූර්ය තෙමේ යම් තැනෙකින් උදා වේ ද, යම් ඒ හිරුහු නැඟෙන කල්හි රාත්‍රියත් අතුරුදහන් වේ ද,

යස්ස චුග්ගතෙ සූරියෙ දිවසො ති පවුච්චති,
රහදෙ පි තත්ථ ගම්භීරො සමුද්දෙ සරිතොදකො. 8.

එවං නං තත්ථ ජානන්ති සමුද්දො සරිතොදකො
ඉතො සා පුරිමා දිසා ඉති නං ආචික්ඛති ජනො,
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සි සො. 9.

ගන්ධබ්බානං ආධිපති ධතරට්ඨො ඉති නාමසො,
රමති නච්චගීතෙහි ගන්ධබ්බෙහි පුරක්ඛතො. 10.

පුත්තා පි තස්ස බහවො එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකො ච ඉන්දනාමා මහබ්බලා 11.

තෙ චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතො'ව නමස්සන්ති මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම 12.

කුසලෙන සමෙක්ඛසි අමනුස්සාපි තං වන්දන්ති,
සුතං නෙතං අභිණ්හසො තස්මා එවං වදෙමසෙ 13.

ජිනං වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමං 14.

යෙන පෙතා පවුච්චන්ති පිසුණා පිට්ඨිමංසිකා,
පාණාතිපාතිනො ලුද්දා චොරා නෙකතිකා ජනා 15.

ඉතො සා දක්ඛිණා දිසා ඉති නං ආචික්ඛති ජනො,
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සි සො 16.

කුම්භණ්ඩානං ආධිපති විරූළ්හො ඉති නාමසො,
රමති නච්චගීතෙහි කුම්භණ්ඩෙහි පුරක්ඛතො 17.

පුත්තා පි තස්ස බහවො එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකො ච ඉන්දනාමා මහබ්බලා 18.

යම් දිගෙක හිරු නැඟී කල්හි දහවලැ යි කියනු ලැබේ ද, එ දිගැ පිවිසිණු නදී ජලය ඇති සමුද්‍ර නම් වූ ගැඹුරු ජලාසය වෙයි. 8.

මෙසේ එහි එය නදී ජලය ඇති මුහුද යැ යි දනිත්. කීර්තිමත් ඒ මහ රජෙක් යම් දිශාවක් පාලනය කෙරෙයි ද එය මෙ තැනින් පෙර දෙස යැ යි මහ ජන තෙමෙ කිය යි. 9.

ගාන්ධර්වයනට අධිපති වූ, නාම වශයෙන් ධෘතරාෂ්ට්‍ර යැ යි ප්‍රකට වූ හෙ තෙමෙ ගදෙව්වන් විසින් පෙරටු කරන ලද්දේ, නැටුම් ගැයුම්හෙන් එහි සිත් අලවා වෙසෙයි. 10.

ඔහුට එක් ම නමක් ඇති පුතුන් ද බොහෝ ඇතැයි මා විසින් අසන ලදී. මහ බලැති ඉන්ද්‍ර නම් වූ ඔහු අසූවෙක් ද දශයෙක් ද එකෙක් ද (එක් අනූ දෙනෙක්) වෙත්. 11.

ඔහු ද සූර්යබන්ධු වූ කෙලෙස් නින්දෙන් පිබිදියා වූ, මහත්ත්වයට පැමිණි, පහ වූ භය ඇති බුදුරජුන් දැක,

'පුරුෂාජානෙයයෙනි, ඔබට නමස්කාර වේ වා, පුරුෂොත්තමයෙනි, ඔබට නමස්කාර වේ වා' යි දුර සිට ම නමස්කාර කෙරෙත්.

'ඔබ නිපුණ වූ සර්වඥතාඥානයෙන් මහ ජනයා දෙස බලති'යි කියා අමනුෂ්‍යයෝ ද ඔබ වඳිති. මෙය අප විසින් එක්වත් අසන ලදී. එ හෙයින්,

'කෙපි ගෞතම ජිනයන් වහන්සේ වඳිහු ද?' යි මෙසේ අපි අසම්හ. 'ගෞතම ජිනයන් වහන්සේ වඳුම්හ. විද්‍යාචරණසම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳුම්හ,' යි ඔහු කියත්,

කලුරිය කළාහු යම් දෙසකට 'ගෙන යනු ලබත් ව' යි කියනු ලැබෙත් ද, කේලාම් කියන, පිටුමස් කන්නවුන් සේ පිටු පා ගිය කලැ ගරහන, පණිවා කරන, රෞද්‍ර වූ ඝොර වූ කපට වූ ජනයෝ යම් දිගකට ගෙන ගොස් නසනු ලබත් ව' යි කියනු ලැබෙත් ද,

ඒ යම් දිශාවක් යශස්වී මහ රජෙක් පාලනය කරයි ද, ඒ මෙයින් දකුණු දිග යැ යි මහ ජන තෙමෙ කිය යි.

එ දෙයෙහි කුම්භාණ්ඩයනට අධිපති වූ, නම් විසින් විරූඪක යැ යි ප්‍රකට රජ තෙමෙ කුම්භාණ්ඩයන් විසින් පෙරටු කරනු ලද්දේ නැටුමෙන් ගැයුමෙන් සිත් අලවා වෙසෙයි.

ඔහුට එක් ම නමක් ඇති බොහෝ පුත්‍රයෝ ද වෙත්. ඉන්ද්‍ර නම් වූ මහ බලැති ඔහු එක් අනූ දෙනෙකැ යි මා විසින් අසන ලදී.

තෙ චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතො'ව නමස්සන්ති මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම.

කුසලෙන සමෙක්ඛසි,
අමනුස්සා පි තං වන්දන්ති, සුතං නෙතං අභිණ්හසො
තස්මා එවං වදෙමසෙ.
ජිනං වන්දථ ගොතමං ජිනං වන්දාම ගොතමං.
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දාම ගොතමං.

21. යත්ථ චොග්ගච්ඡති සුරියො ආදිච්චො මණ්ඩලී මහා,
යස්ස චොග්ගච්ඡමානස්ස දිවසො පි නිරුජ්ඣති.

යස්ස චොග්ගතෙ සුරියෙ සංවරී ති පවුච්චති,
රහදො පි තත්ථ ගම්භීරො සමුද්දො සරිතොදකො.

එවං තං තත්ථ ජානන්ති සමුද්දො සාරිතොදකො,
ඉතො සා පච්ඡිමා දිසා ඉති නං ආචික්ඛති ජනො
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සි සො.

නාගානං ආධිපති විරූපක්ඛො ඉති නාමසො,
රමති නච්චගීතෙහි නාගෙහෙව පුරක්ඛතො,

පුත්තා පි තස්ස බහවො එකනාමා'ති මෙ සුතං
අසීතිං දස එකො ච ඉන්දනාමා මහබ්බලා.

තෙ චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතො'ව නමස්සන්ති මහන්තං වීතසාරදං,
'නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම'

කුසලෙන සමෙක්ඛසි
අමනුස්සා පි තං වන්දන්ති, සුතං නෙතං අභිණ්හසො
තස්මා එවං වදෙම සෙ.
ජිනං වන්දථ ගොතමං ජිනං වන්දාම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දාම ගොතමං

ඔහු ද සූර්ය බන්ධු වූ, මහත් බවට පැමිණි, පහ වූ බිය ඇති, කෙලෙස් නිනදෙන් පිබිදුණු, බුදුරජාණන් වහන්සේ දක, 'ආජානෙය පුරුෂයාණෙනි, ඔබට නමස්කාර වේ වා, පුරුෂොත්තමයාණනි, ඔබට නමස්කාර වේ ව' යි දුර සිට ම නමස්කාර කෙරෙත්.

'ඔබ නිපුණ වූ සර්වඥතාඥනයෙන් මහා ජනයා දෙස බලති'යි අමනුෂ්‍යා-යෝ ද ඔබ වඳිත්. මෙය අප විසින් එක්වන් අසන ලදී. එ හෙයින්, 'තෙපි ගෞතම ජිනයන් වහන්සේ වඳිහු ද?' යි අපි මෙසේ (ප්‍රශ්න වශයෙන්) කියම්හ. 'අපි ගෞතම ජිනයන් වහන්සේ වඳුම්හ. විද්‍යාචරණ-සම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳුම්හ' යි (ඔහු උත්තර දෙත්.)

21. මහ රස් මඬුලු ඇති ආදිත්‍ය නම් වූ හිරු යම් දිගෙක බස්නේ ද, යම් ඒ හිරු බස්නා කල්හි දහවලත් අතුරුදහන් වේ ද,

යම් දිගකට හිරු බැස ගිය කලැ රාත්‍රි යැ යි කියනු ලැබේ ද, එ දිගැ, පිවිසුණු නදීජලය ඇති සමුද්‍ර නම් වූ ගැඹුරු ජලාශය ය වෙයි.

මෙසේ එහි එය පිවිසි නදීජලය ඇති මුහුද යැ යි දනිත්. යශස් ඇති ඒ මහරජෙක් යම් දිගක් පාලනය කෙරෙයි ද, එය මෙ තැනින් පැසිම් දෙසැ යි මහජනයා කිය යි.

නාගයනට අධිපති වූ, නම් විසින් විරූපාක්ෂ යැ යි ප්‍රකට වූ හේ නාගයන් විසින් පෙරටු කරන ලද්දේ, නැටුම් ගැයුම්නෙන් තොක්සිත් අලවා එහි වෙසෙයි.

ඔහුට එක් ම නමක් ඇති පුතුන් ද බොහෝ ඇතැ යි මා විසින් අසන ලදී. මග බලැති ඉන්ද්‍ර නම් වූ ඔහු එක් අනූ දෙනෙක් වෙත්.

ඔහු ද සූර්ය බන්ධු වූ, කෙලෙස් නින්දෙන් පිබිදියා වූ, මහත්ත්වයට පැමිණි, පහ වූ බිය ඇති බුදුරජුන් දක,

'ආජානෙය පුරුෂයාණනි, ඔබට නමස්කාර වේ වා, පුරුෂොත්තම-යාණනි ඔබට නමස්කාර වේ ව' යි දුර සිට ම නමස්කාර කෙරෙත්.

'ඔබ නිපුණ වූ සර්වඥතාඥානයෙන් මහ ජනයා දෙස බලති'යි අමනුෂ්‍යයෝ ද ඔබ වඳිත්. මෙය අප විසින් එක්වන් අසනලදී..එ හෙයින්, 'තෙපි ගෞතම ජිනයන් වහන්සේ වඳිහු ද?' යි මෙසේ අපි ප්‍රශ්න කරම්හ. 'ගෞතම ජිනයන් වහන්සේ වඳුම් , විද්‍යාචරණ සම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳුම්හ' යි ඔහු කියත්.

22. යෙන උත්තරකුරූ රම්මා මහානෙරු සුදස්සනො,
මනුස්සා තත්ථ ජායන්ති අමමා අපරිග්ගහා.

න තෙ බීජං පවපන්ති නපි නීයන්ති නඞ්ගලා,
අකට්ඨපාකිමං සාලිං පරිභුඤ්ජන්ති මානුසා.

අකණං අථුසං සුද්ධං සුගන්ධං තණ්ඩුලප්ඵලං,
තුණ්ඩිකීරෙ පචිත්වාන තතො භුඤ්ජන්ති භොජනං.

ගාවිං එකඛුරං කත්වා අනුයන්ති දිසොදිසං,
පසුං එකඛුරං කත්වා අනුයන්ති දිසොදිසං.

ඉත්ථි වාහනං කත්වා අනුයන්ති දිසොදිසං,
පුරිස වාහනං කත්වා අනුයන්ති දිසොදිසං

කුමාරි වාහනං කත්වා අනුයන්ති දිසොදිසං,
කුමාර වාහනං කත්වා අනුයන්ති දිසොදිසං.

තෙ යානෙ අභිරූහිත්වා සබ්බා දිසා අනුපරියායන්ති,
පචාරා තස්ස රාජිනො.

හත්ථියානං අස්සයානං දිබ්බං යානං උපට්ඨිතං
පාසාද සිවිකා චෙව මහාරාජස්ස යසස්සිනො.

තස්ස ච නගරා අහු අන්තළික්ඛෙ සුමාපිතා,
ආටානාටා කුසිනාටා පරකුසිනාටා නාටපුරියා පරකුසිතනාටා.

උත්තරෙන කපිවන්තො ජනොඝමපරෙන ච
නවනවුතියො අම්බරඅම්බරවතියො ආළකමන්දා නාම රාජධානී,

කුවෙරස්ස ඛො පන මාරිස මහාරාජස්ස විසාණා නාම රාජධානී.
තස්මා කුවෙරො මහාරාජා වෙස්සවණො'ති පවුච්චති.

23. පච්චෙසන්තො පකාසෙන්ති තතොලා තත්තලා තතොතලා,
ඔජසි තෙජසි තතොජසි සූරො රාජා අරිට්ඨො නෙමි.

22. යම් දිග්භාගයෙක ඉතා දකුම්කලු මහාමේරු පර්වතය වෙයි ද, එහි සිත්කලු වූ උතුරුකුරුව වෙයි. එහි මමත්වය නැති, ස්ත්‍රීන් කෙරෙහි පරිග්‍රහ නැති මිනිස්සු උපදිත්.

ඔහු ධාන්‍ය බිජුවට නො වපුරත්. නඟුල්හු ද කෙතට නො පමුණුවනු ලබත්. ඒ මිනිස්සු නො සාන ලද බිමැ තමන් ම නැඟී පැසුණු හැල් පරිභොග කෙරෙත්.

කුඩු නැති, තොහො නැති, ශුද්ධ වූ, සුවඳැති සහල් සැළියෙක බහා පිසැ, එයින් ගෙන බොජුන් වළඳත්.

එහි යක්කු එළ දෙන එක් කුරැති වාහනයක් කොට ගෙන දිශායෙන් දිශාවට යෙත්. සිවුපාවකු එක් කුරයක් ඇති වාහනයක් කොට ගෙන, දෙසින් දෙසට යෙත්.

ගැබිනි ස්ත්‍රියක වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්. පුරුෂයකු වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්.

කුමරියක වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්, කුමරකු වාහන කොට ගෙන, දෙසින් දෙස යෙත්.

ඒ වෙසවුණු රජු ගේ පරිවාරක යක්ෂයෝ එළැඹැ සිටි හස්තියාන ද අශ්වයාන ද (අන්‍ය බහුවිධ) දිව්‍යයාන ද යන එකී යානයන් අරා සියලු දික් සිසාරා යෙත්. යශස් ඇති ඒ වෙසවුණු මහ රජුට ප්‍රාසාද ද සිවිගෙවල් ද වෙයි.

එ රජුට අහසැ මොනවට මවන ලද ආටානාටා ය, කුසිනාටා ය, පරකුසිනාටා ය, නාටපුරියා ය, පරකුසිතනාටා යැ යි නගරයෝ වෙත්.

එයින් (ඒ පරකුසිතනාටා නුවරින්) ඉදුරා උතුරු දිගැ කපිවන්ත නම් නුවරෙක් ද, එයින් ඔබ්බෙහි ජනොඝ නම් නුවරෙක් ද, අන්‍ය නවනවති ය නම් නුවරෙක් ද අම්බරඅම්බරවතිය නම් නුවරෙක් ද ආළකමන්‍දා නම් අන්‍ය රාජධානියෙක් ද ඇත.

23. නිදුකාණෙනි, කුවෙර මහ රජුගේ රජදහන විසාණා නම. එහෙයින් කුවෙර මහ රජ වෙස්සවණ යැ යි නම් කරනු ලැබෙයි.

එහි තතෝලා, තත්තලා, තතෝතලා, ඔජසි, තේජසි, තතෝජසි, සූර, සූරරාජ, අරිට්ඨ, නෙමි, අරිට්ඨනෙමි යන නම් ඇති යක්රැටියෝ කරුණු විමසා පවසත්.

රහදෙ'පි තත්ථ ධරණී නාම යතො මෙඝා පවස්සන්ති
වස්සා යතො පතායන්ති,
සභා පි තත්ථ භගලවතී නාම යත්ථ යක්ඛා පයිරුපාසන්ති.

තත්ථ නිච්චඵලා රුක්ඛා නානාදිජගණායුතා,
මයූරකොඤ්චාභිරුද කොකිලාදීහි වග්ගුහි.

ජීවජීවක සද්දෙත්ථ අථො උට්ඨවචිත්තකා,
කුක්කුත්ථකා කුළීරකා වනෙ පොක්ඛරසාතකා

සුකසාළිකසද්දෙත්ථ දණ්ඩමානවකානි ච,
සොභති සබ්බකාලං සා කුවෙරනළිනී සදා.

ඉතො සා උත්තරා දිසා ඉති නං ආචික්ඛතී ජනො,
යං දිසං අභිපාලෙති මහාරාජා යසස්සි සො.

යක්ඛානං ආධිපති කුවෙරො ඉති නාමසො,
රමති නච්චගීතෙහි යක්ඛෙහෙව පුරක්ඛතො.

පුත්තාපි තස්ස බහවො එකනාමා ති මෙ සුතං,
අසීතිං දස එකො ච ඉන්දනාමා මහබ්බලා.

තෙ චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතො ච නමස්සන්ති මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම

කුසලෙන සමෙක්ඛසි
අමනුස්සා පි තං වන්දන්ති, සුතං නෙතං අභිණ්හසො
තස්මා එවං වදෙමසෙ.
ජිනං වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමන්ති.

යම් පොකුණෙකින් දිය ඇද ගෙන මෙඝයෝ වසිත් ද, යම් පොකු-ණෙකින් වර්ෂාවෝ පැතිරෙත් ද, එසේ වූ ධරණී නම් ජලාසයෙක් ද, එහි වෙයි. එහි තෙර යකුන් රැස්වැ හිඳුනා භගලවතී නම් මඩුවෙක් වෙයි.

එහි හාත්පසැ විවිධ පක්ෂි සමූහයන් ගෙන් යුක්ත වූ, මොණරුන් ද කොස් ලිහිණියන් ද විසින් දුන් නාද ඇති, කෝකිලාදීන් විසින් මනොඥ නාදයෙන් උන්නාදිත වූ, නිති ඵල දරන වෘක්ෂයෝ වෙත්.

මෙහි ඒ පියුම් වෙනෙහි 'ජීව ජීව' යැ යි හඬ නඟන, (ජීව ජීවක නම්) පක්ෂි කෙනෙක් ද, තව උට්ඨවචිත්තක නම් පක්ෂීහු ද, වලිකුකුළෝ ද, රත්වන් කකුළුවෝ ද, පොක්ඛරසාතක නම් පක්ෂීහු ද වෙත්.

මෙහි ගිරවුන්ගේ ද සැළලිහිණියන්ගේ ද හඬ ඇත. දණ්ඩමානවක නම් පක්ෂීහු ද, මෙහි හැසිරෙත්, මෙසේ හැම කල්හි ඒ කුවෙරයා ගේ පියුම් විල නිරතුරු හොබනේ ය.

යශස් ඇති ඒ කුවෙර මහරජ යම් දිගක් පාලනය කෙරෙයි ද, ඒ මෙතැනින් උතුරු දෙස යැ යි මහජනයා කිය යි.

නම් විසින් කුවෙර යැ යි ප්‍රකට, යක්ෂාධිපති වූ, හේ යකුන් විසින් පෙරටු කරන ලද්දේ නෘත්‍ය ගීතයෙන් සිත් අලවා වෙසෙයි.

ඔහුට එක් නම ඇති බොහෝ පුතුන් ද වෙති යි මා විසින් අසන ලදී. ඉන්ද්‍ර යන නම ඇති, මහබලැති ඔහු එක් අනූ දෙනෙකි.

ඔහු ද සූර්යබන්ධු වූ, ක්ලෙශනිද්‍රායෙන් පිබිදුණු, මහත්ත්වප්‍රාප්ත වූ, පහ වූ බිය ඇති බුදුරජුන් දැක, 'ආජානෙය පුරුෂයාණනි, ඔබට නමස්කාර වේ වා, උත්තම පුරුෂයාණනි, ඔබට නමස්කාර වේ වා' යි දුර සිට ම නමදිත්.

'ඔබ නිපුණ වූ සර්වඥතාඥනයෙන් මහ ජනයා දෙස බලති'යි කියා අමනුෂ්‍යයෝ ද ඔබ වඳිත්. මෙය අප විසින් එක්වන් අසන ලදී. එ හෙයින්, 'ගෞතම ජිනයන් වහන්සේ වඳිහු ද ?' යි මෙසේ අපි (ප්‍රශ්න කිරීම් වශයෙන්) කියම්හ. 'අපි ගෞතම ජිනයන් වහන්සේ වඳුම්හ. විද්‍යාචරණසම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳුම්හ' යි ඔහු උත්තර දෙත්.

**24.** අයං ඛො සා මාරිස, ආටානාටියා රක්ඛා භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති. යස්ස කස්සචි මාරිස භික්ඛුස්ස වා භික්ඛුනියා වා උපාසකස්ස වා උපාසිකාය වා අයං ආටානාටියා රක්ඛා සුග්ගහිතා භවිස්සති සමත්තා පරියාපුතා. තඤ්චෙ අමනුස්සො යක්ඛො වා යක්ඛිනී වා යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා, ගන්ධබ්බො වා ගන්ධබ්බී වා ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා, කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා, කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා, නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා, පදුට්ඨචිත්තො, භික්ඛුං වා භික්ඛුනිං වා උපාසකං වා උපාසිකං වා පදුට්ඨචිත්තො ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය. නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, න මෙ සො මාරිස, අමනුස්සො ලභෙය්‍ය ගාමෙසු වා නිගමෙසු වා සක්කාරං වා ගරුකාරං වා. න මෙ සො මාරිස, අමනුස්සො ලභෙය්‍ය ආළකමන්දාය නාම රාජධානියා වත්ථුං වා වාසං වා. න මෙ සො මාරිස, අමනුස්සො ලභෙය්‍ය යක්ඛානං සමිතිං ගන්තුං. අපිස්සු නං මාරිස, අමනුස්සා අනාවය්හම්පි නං කරෙය්‍යුං අවිවය්හං. අපිස්සු නං ම රිස, අමනුස්සා අත්තාහි පරිපුණ්ණාහි පරිභාසාහි පරිභාසෙය්‍යුං. අපිස්සු නං මාරිස, අමනුස්සා රිත්තම්පි'ස්ස පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං, අපිස්සු නං මාරිස, අමනුස්සා සත්තධා පි'ස්ස මුද්ධං ඵාලෙය්‍යුං. සන්ති හි මාරිස, අමනුස්සා චණ්ඩා රුද්ධා රභසා. තෙ නෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති. තෙ ඛො තෙ මාරිස, අමනුස්සා මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

24. 'නිදුකාණන් වහන්ස, මහණුනට ද මෙහෙණනට ද උවසුවනට ද උවැසියනට ද ගුප්තිය පිණිස රක්ම පිණිස නො වෙහෙසීම පිණිස සැප විහරණ පිණිස වූ ඒ ආටානාටිය පිරිත නම් මෙය ය. නිදුකාණන් වහන්ස, යම් කිසි මහණෙක්හු හෝ මෙහෙණක හෝ උවසුවකු හෝ උවැසියක විසින් මේ ආටානාටිය පිරිත මනා කොට උගන්නා ලද්දේ, අර්ථව්‍යංජන විසින් පිරිපුන් කොට පුහුණු කරන ලද්දේ වී නම්, යක්ෂයෙක් හෝ යක්ෂිණියක් හෝ යක්ෂපෝතකයෙක් හෝ යක්ෂ පොතිකාවක් හෝ යක්ෂමහාමාත්‍රයෙක් හෝ යක්ෂපාරිෂද්‍යයෙක් හෝ යක්ෂපරිවාරකයෙක් හෝ, ගාන්ධර්වයෙක් හෝ ගාන්ධර්වියක් හෝ ගාන්ධර්ව-පෝතකයෙක් ගාන්ධර්වපෝතිකාවක් හෝ ගාන්ධර්වමහාමාත්‍රයෙක් හෝ ගාන්ධර්වපාරිෂද්‍යයෙක් හෝ ගාන්ධර්වපරිවාරකයෙක් හෝ, කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පෝතකයෙක් හෝ කුම්භාණ්ඩ පෝතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍රයෙක් හෝ කුම්භාණ්ඩ පාරිෂද්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පරිවාරකයෙක් හෝ; නාගයෙක් හෝ නාගිනියක් හෝ නාගපෝතකයෙක් හෝ නාග-පෝතිකාවක් හෝ නාග මහාමාත්‍රයෙක් හෝ නාග පාරිෂද්‍යයෙක් හෝ නාග පරිවාරකයෙක් හෝ, මෙකී කිසි යම් අමනුෂ්‍යයෙක් ද්වේෂයෙන් ප්‍රද්විෂ්ට වූ සිතැත්තේ, මහණකු හෝ මෙහෙණක හෝ උවසුවකු හෝ උවැසියක හෝ, මෙ කිසිවකු යන්නහු අනුව (පසු පසැ) යන්නේ ද, සිටියහු වෙතැ සිටින්නේ ද, උන්නහු වෙතැ ඉඳුනේ ද, හොත්තහු වෙතැ හෝනේ ද, නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයා මගේ ගම්හි හෝ නියම්ගම්හි හෝ සත්කාරයක් හෝ ගෞරවයක් හෝ නො ලබන්නේ ය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙමේ මගේ ආළකමන්ද රාජධානියෙහි වසන ගෙයක් හෝ නවාතැනක් හෝ නො ලබන්නේ ය; නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙමේ මගේ යක්ෂ සමාගමයට යන්නට හෝ නො ලබන්නේ ය. වැලි දු නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහු ආවාහයක් නො කට හැක්කකු ද විවාහයක් නො කටහැක්කකු ද කරන්නාහ. තව ද නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහුට අත්බව එළවා කියනු ලබන පරිපූර්ණ පරිභව වචනයෙන් බණින්නාහ. නිදුකාණන් වහන්ස, තව ද අමනුෂ්‍යයෝ හිස් වූ ලෝහ පාත්‍රයක් යැටිකුරු කොටැ ඔහු හිසැ ලන්නාහ. තව ද නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහු හිස සත් කඩක් කොට හෝ පළන්නාහු ද වෙත්.

25. සෙය්‍යථාපි මාරිස රඤ්ඤො මාගධස්ස විජිතෙ මහාචොරා තෙ නෙව රඤ්ඤො මාගධස්ස ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස මහාචොරා රඤ්ඤො මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති, එවමෙව ඛො මාරිස සන්ති හි අමනුස්සා චණ්ඩා රුද්ධා රභසා. තෙ නෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො මාරිස අමනුස්සා මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

26. යො හි කොචි මාරිස අමනුස්සො යක්ඛො වා යක්ඛිනී වා යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා, ගන්ධබ්බො වා ගන්ධබ්බී වා ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා, කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා, නාගො වා නාගිනී වා නාගපොතකො වා නාගපොතිකා වා නාගමහාමත්තො වා, නාගපාරිසජ්ජො වා නාගපචාරො වා. පදුට්ඨචිත්තො භික්ඛුං වා භික්ඛුනිං වා උපාසකං වා උපාසිකං වා ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, ඉමෙසං යක්ඛානං මහායක්ඛානං සෙනාපතීනං මහාසෙනාපතීනං උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං: "අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතී"ති,

25. නිදුකාණන් වහන්ස, නපුරු වූ සතුරු වූ, කළ දයට වැඩියක් කරන අමනුෂ්‍යයෝ ඇත. ඔහු සතර වරම් මහ රජ දරුවන් ගේ බස් නො ම පිළිගනිත්. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ වරම් මහ-රජුන් ගේ සතුරෝ නමැ යි කියනු ලබත්. නිදුකාණන් වහන්ස, යම්සේ මගධාධිපති රජුගේ රටෙහි මහ සොරහු ඇත් ද, ඔහු මගධාධිපති රජුහු ගේ වචන නො ම පිළිගනිත් ද, මගධාධිපති රජුගේ සෙනෙවි-යන්ගේ වචන දූ නො ම පිළිගනිත් ද, මගධාධිපති රජුගේ සෙනෙවි-යන් ගේ මෙහෙකරුවන් ගේ වචන දූ නො ම පිළිගනිත් ද, නිදුකාණන් වහන්ස, ඒ මහ සොරහු මගධාධිපති රජහු ගේ සතුරෝ නමැ යි කියනු ලබත් ද, එසේ ම නිදුකාණන් වහන්ස, නපුරු වූ සතුරු වූ, කළ එකට වැඩියක් කරන්නා වූ අමනුෂ්‍ය කෙනෙක් වෙත් ම ය. ඔහු වරම් මහ රජුන්ගේ බස් නො පිළිගනිත්. වරම් මහ රජුන්ගේ සෙනෙවියන් බස් ද නො ම පිළිගනිත්. වරම් මහ රජුන් අයත් සෙනෙවියන් ගේ මෙහෙ-කරුවන් බස් දූ නො පිළිගනිත්. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ වරම් මහ රජුන්ගේ සතුරෝ යැ යි කියනු ලබත්.

26. නිදුකාණන් වහන්ස, යකෙක් හෝ යකින්නක් හෝ යක්-දරුවෙක් හෝ යක් දූරියක් හෝ යක් දෙටුවෙක් හෝ යක් පිරිසඳ වූයෙක් හෝ යක් මෙහෙකරුවෙක් හෝ, ගඳෙව්වෙක් හෝ ගඳෙවියක් හෝ ගඳෙවු දරුවෙක් හෝ ගඳෙවු දූරියක් හෝ ගඳෙවු දෙටුවෙක් හෝ ගඳෙවු පිරිසඳ වූයෙක් හෝ ගඳෙවු මෙහෙකරුවෙක් හෝ, කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ දරුවෙක් හෝ කුම්භාණ්ඩ දූරියක් හෝ කුම්භාණ්ඩ දෙටුවෙක් හෝ කුම්භාණ්ඩ පාරිෂද්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පරිචාරකයෙක් හෝ, නාගයෙක් හෝ නාගිනියක් හෝ නා දරුවෙක් හෝ නා දූරියක් හෝ නා දෙටුවෙක් හෝ නා පිරිසඳ වූයෙක් හෝ නා මෙහෙකරුවෙක් හෝ, මෙ කී කිසි අමනුෂ්‍යයෙක් දොෂයෙන් ප්‍රද්විෂ්ට සිතැත්තේ, මහණකු හෝ මෙහෙණක හෝ උවසුවකු හෝ උවැසියක හෝ මෙ කිසිවක්හු යන්නහු පසු පසැ යන්නේ වී නම්, හෝ සිටියහු වෙත සිටින්නේ වී නම් හෝ හුන්නහු වෙත හිඳින්නේ වී නම් හෝ හොත්තහු වෙත හෝනේ වී නම් හෝ, මේ යකුනට මහ යකුනට, යක් සෙනෙවියනට, යක් මහ-සෙනෙවියනට, 'මේ යක් තෙමේ මා අල්ලා ගනී, මේ යක් තෙමේ මට ආවිෂ්ට වෙයි, මේ යක් තෙමේ මා පෙළයි, මේ යක් තෙමේ වෙසෙසින් මා පෙළයි, මේ යක් තෙමේ මට හිංසා කෙරෙයි, මේ යක් තෙමේ මා වෙහෙසයි, මෙ යක් තෙමේ මා නො මුදා (නො අත්හරී), යැ යි දැන්විය යුතු, හඬ නගා කියැ යුතු, ඔවුන් හා කියැ යුතු.

කතමෙසං යක්ඛානං මහායක්ඛානං සෙනාපතීනං මහාසෙනාපතීනං?

27 “ඉන්දො සොමො වරුණො ච භාරද්වාජො පජාපති,
චන්දනො කාමසෙට්ඨො ච කින්නිඝණ්ඩු[1] නිඝණ්ඩු ච.

පනාදො ඔපමඤ්ඤො ච දෙවසූතො ච මාතලි,
චිත්තසෙනො ච ගන්ධබ්බො නළො රාජා ජනෙසභො

සාතාගිරො හෙමවතො පුණ්ණකො කරතියො ගුළො,
සීවකො මුචලින්දො ච වෙස්සාමිත්තො යුගන්ධරො.

ගොපාලො සුප්පරොධො ච හිරිනෙත්ති ච මන්දියො
පඤ්චාලචණ්ඩො ආළවකො පජ්ජුන්නො සුමනො සුමුඛො දධිමුඛො,
මණි මානි චරො දීඝො අථො සෙරීසකො සහ.'

28. ඉමෙසං යක්ඛානං මහායක්ඛානං සෙනාපතීනං මහාසෙනාපතීනං උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං: අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතී ති. අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරාය ති. හන්ද ච දානි මයං මාරිස ගච්ඡාම බහුකිච්චා මයං බහුකරණීයා'ති. 'යස්ස' දානි තුම්හෙ මහාරාජානො කාලං මඤ්ඤථා'ති.

29. අථ ඛො භික්ඛවෙ චත්තාරො මහාරාජානො උට්ඨායාසනා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු. තෙ'පි ඛො භික්ඛවෙ යක්ඛා උට්ඨායාසනා අප්පෙකච්චෙ මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.

1. ඉන්ද්‍රඃ සොමඃ සූර්‍ය්‍යඃ වරුණඃ ප්‍රජාපතිඃ භාරද්වාජඃ
ශ්‍රී යානගච චන්ද්‍රනඃ කාමශ්‍රෙෂ්ඨඃ කුනිකණ්ඨා
........නිකණ්ඨකඃ ත්‍රිශූලී චෛව මාතලිඃ
චිත්‍රසෙනශ්ච ගන්ධර්වඃ නරරාජො ජිනර්ෂභඃ
සාතාගිරිර් හෛමවතඃ පූර්ණකඃ ඛදිර කොවිදඃ
ගොපාල යක්ෂා ආටවකො පංචාලගණ්ඩඃ සුමුඛෙං
දීඝො යක්ෂඃ සපරිජනඃ (ලලිතවිස්තර)

27. (එසේ කියැ යුත්තේ) කවර යකුනට ද? කවර මහ යකුනට ද? කවර යක් සෙනෙවියනට ද? කවර මහ යක්සෙනෙවියනට ද? යත්:

ඉන්ද්‍ර ය, සෝම ය, වරුණ ය, භාරද්වාජ ය, ප්‍රජාපති ය, චන්දන ය, කාමශ්‍රෙෂ්ඨ ය, කින්නිඝණ්ඩු ය, නිඝණ්ඩු ය, ප්‍රණාද ය, ඕපමඤ්ඤ ය, දෙවසැරි මාතලී ය, චිත්‍රසේන ය, ගන්ධර්ව ය, නළ ය, රාජ ය, ජනර්ෂභ ය, සාතාගිරි ය, හෙමවත ය, පූර්ණක ය, කරතිය ය, ගුඩ ය, සීවක ය, මුචලින්ද ය, විශ්වාමිත්‍ර ය, යුගන්ධර ය, ගොපාල ය, සුප්‍රරොධ ය, හිරි-නෙත්ති ය, මන්දිය ය, පඤ්චාලචණ්ඩ ය, ආළවක ය, පර්ජන්‍ය ය, සුමන ය, සුමුඛ ය, දධිමුඛ ය, මණි ය, මානී ය, චර ය, දීර්ඝ ය, තව ද සෙරීසක ය යන මොවුනට ය.

28. මේ යක්ෂයනට ද මහා යක්ෂයනට ද යක්ෂ සෙනාපතියනට ද මහා යක්ෂ සෙනාපතියනට ද,

'මේ යක් තෙමේ මා අල්ලා ගනී යැ යි, මේ යක් තෙමේ ආවිෂ්ට වේ යැ යි, මේ යක් තෙමේ මා පෙළා යැ යි, මේ යක් තෙමේ මා වෙසෙසින් පෙළා යැ යි, මේ යක් තෙමේ මට හිංසා කෙරේ යැයි, මේ යක් තෙමේ මා වෙහෙසා යැ යි, මේ යක් තෙමේ මා නො මුදු යැ යි දන්වියැ යුතු, හඬ නඟා කියැ යුතු.

නිදුකාණන් වහන්ස, මේ, මහණුනට මෙහෙණනට උවසුවනට උවැසියනට ගුප්තිය පිණිස, රක වරණ පිණිස, නො වෙහෙසීම පිණිස, පහසු විහරණ පිණිස වූ ආටානාටිය පිරිත ය.

නිදුකාණන් වහන්ස, දැන් අපි යම්හ. අපි බොහෝ කෘත්‍ය ඇත්තම්හ, බොහෝ කටයුතු ඇත්තම්හ'' යි වරම් රජුහු කීහ.

මහ රජුනි, යම් ගමනකට දැන් කල් වේ යැ යි සලකත්නහු ද, ඒ ගමන කරනු ලැබේ වා' යි මම් කීමි.

29. මහණෙනි, එ කල්හි සතර වරම් මහ රජදරුවෝ හුනස්නෙන් නැඟී මා සාදර වැ වැඳ, පැදකුණු කොට, එහි ම අතුරුදහන් වූහ. ඒ යක්කු ද හුනස්නෙන් නැඟී, ඇතැම් කෙනෙක් මා සාදර වැ වැඳ පැදකුණු කොට, එහි ම අතුරුදහන් වූහ. ඇතැම් කෙනෙක් මා හා සතුටු වූහ. සතුටට කරුණු වූ, සිතැ රැඳැවියැ යුතු වූ කථා නිමවා එහි ම අතුරු-දහන් වූහ. ඇතැම් කෙනෙක් මා දිසාවට දෙහොත් නමා එහි ම අතුරු දහන් වූහ. ඇතැම් කෙනෙක් නම ගොත් අස්වා එහිම අතුරුදහන් වූහ. ඇතැම් කෙනෙක් නිහඬ වැ එහි ම අතුරුදහන් වූහ.

අප්පෙකච්චෙ මයා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා, තත්ථෙවන්තරධායිංසු: අප්පෙකච්චෙ යෙනාහං තෙනඤ්ජලිම්පණාමෙත්වා තත්ථෙවන්තරධායිංසු: අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා තත්ථෙවන්තරධායිංසු: අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථෙවන්තර-ධායිංසු'ති.

30. උග්ගණ්හාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං. පරියාපුණාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං. ධාරෙථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං. අත්ථසංහිතා[1] භික්ඛවෙ ආටානාටියා රක්ඛා භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායා ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ආටානාටියසුත්තං නිට්ඨිතං නවමං.

1. අත්ථසංහිතාය (සයා)

30. මහණෙනි, ආටානාටිය පිරිත උගනිවු. මහණෙනි, ආටානාටිය පිරිත පුහුණු කරවු. මහණෙනි, ආටානාටිය පිරිත සිතෑ දරවු. මහණෙනි, ආටානාටිය පිරිත වැඩ ඇසුරු කෙළේ වේ. මහණුනට මෙහෙණනට උවසුවනට උවැසියනට ගුප්තිය පිණිස, රකවරණ පිණිස, නොවෙහෙසීම පිණිස, පහසු විහරණ පිණිස වේ."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ඒ භික්ෂූහු ආරාධිත සිතැත්තාහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගත්හ.

නව වන ආටානාටිය සූත්‍රය නිමියේ ය.

# 10

# සඞ්ගීතිසුත්තං

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා මල්ලෙසු චාරිකං චරමානො මහතා භික්ඛු සඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි යෙන පාවා නාම මල්ලානං නගරං තදවසරි. තත්‍ර සුදං භගවා පාවායං විහරති චුන්දස්ස කම්මාරපුත්තස්ස අම්බවනෙ.

2. තෙන ඛො පන සමයෙන පාවෙය්‍යකානං මල්ලානං උබ්භතකං[1] නවං සන්ථාගාරං[2] අචිරකාරිතං හොති, අනජ්ඣාවුත්ථං[3] සමණෙන වා බ්‍රාහ්මණෙන වා කෙනචි වා මනුස්සභූතෙන. අස්සොසුං ඛො පාවෙය්‍යකා මල්ලා: භගවා කිර මල්ලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි පාවං අනුප්පත්තො පාවායං විහරති චුන්දස්ස කම්මාරපුත්තස්ස අම්බවනෙ'ති. අථ ඛො පාවෙය්‍යකා මල්ලා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො පාවෙය්‍යකා මල්ලා භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ පාවෙය්‍යකානං මල්ලානං උබ්භතකං නවං සන්ථාගාරං අචිරකාරිතං හොති අනජ්ඣාවුත්ථං සමණෙන වා බ්‍රාහ්මණෙන වා කෙනචි වා මනුස්සභූතෙන. තං ච භන්තෙ භගවා පඨමං පරිභුඤ්ජතු. භගවතා පඨමං පරිභුත්තං පච්ඡා පාවෙය්‍යකා මල්ලා පරිභුඤ්ජිස්සන්ති තදස්ස පාවෙය්‍යකානං මල්ලානං දීඝරත්තං හිතාය සුඛායා''ති.

3. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො පාවෙය්‍යකා මල්ලා භගවතො අධිවාසනං විදිත්වා, උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා, පදක්ඛිණං කත්වා යෙන සන්ථාගාරං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සබ්බසන්ථරිං[4] සන්ථාගාරං සන්ථරිත්වා ආසනානි පඤ්ඤපෙත්වා, උදකමණිකං පතිට්ඨපෙත්වා, තෙලප්පදීපං ආරොපෙත්වා, යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු.

---

1. උබ්භටකං (PTS)
2. සන්ධාගාරං (මජසං), සණ්ඨාගාරං (ස්‍යා, කම)
3. අනජ්ඣාවුට්ඨං (මජසං)
4. සබ්බසන්ථරිං සන්ථතං (PTS. කම)

# 10

# සඞ්ගීති සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී:

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ පන්සියක් පමණ වූ මහත් භික්ෂු සඞ්ඝයා හා මල්ල රටෙහි සැරි සරන සේක්, පාවා නම් වූ මල්ල රජුන් ගේ නගරය යම් තැනෙක ද, එයට වැඩ වදළ සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ පාවා නුවර චුන්ද කම්මාරපුත්‍රයා ගේ අඹවෙනෙහි වාසය කරන සේක.

2. එ සමයෙහි වූ කලි පාවා නුවර වැසි මල්ල රජුන් ගේ උබ්භතක නම් අළුත් සන්ථාගාරය කරවන ලද නොබෝ කල් ඇත්තේ, මහණක්හු විසින් හෝ බමුණක්හු විසින් හෝ මිනිස් වූ කිසි දු කෙනකු විසින් වාසග්‍රහණ වශයෙන් පරිභෝග නො කරන ලදුයේ වෙයි. පාවා නුවර වැසි මල්ලයෝ 'භාග්‍යවතුන් වහන්සේ පන්සියක් පමණ වූ මහත් භික්ෂු සඞ්ඝයා කැටුව මල්ල රටැ සැරි සරන්නාහු පාවා නුවරට වැඩියාහු, එහි චුන්දකම්මාරපුත්‍රයා ගේ අඹ වෙනෙහි වසන සේක් ලැ' යි ඇසූහ. ඉක්බිත්තෙන් පාවා නුවර වැසි මල්ලයෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ ඔබ සාදර වැ වැඳ, පසෙක හිඳගත්හ. පසෙක හිඳගත්තාවූ ම පාවා නුවර වැසි මල්ලයෝ, "වහන්ස, මෙහි පාවා නුවර වැසි මල්ලයන් ගේ උබ්භතක නම් අළුත් සන්ථාගාරයෙක් කරවන ලද නොබෝ කල් ඇත්තේ, මහණක්හු විසින් හෝ බමුණක්හු විසින් හෝ කිසි දු මිනිස් වූවක්හු විසින් වාසග්‍රහණ විසින් අපරිභුක්ත වෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ එය පළමුවෙන් පරිභෝග කරන සේක් වා. භාග්‍යවතුන් වහන්සේ විසින් පළමුවෙන් පරිභෝග කරන ලද එය පසු වැ පාවා නුවර වැසි මල්ලයෝ පරිභෝග කරන්නාහ. එය පාවෙයක මල්ලයනට බොහෝ කලක් වැඩ පිණිස, සුව පිණිස වන්නේ යැ"යි භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ කීහ.

3. භාග්‍යවතුන් වහන්සේ නිහඬ බැවින් එය ඉවැසූ සේක. එ කල්හි පාවෙයක මල්ලයෝ භාග්‍යවතුන් වහන්සේ ඉවැසූ නියාව දැන, හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සාදර වැ වැඳ පැදකුණු කොට, සන්ථාගාරශාලාව කරා ගියහ. ගොස් සන්ථාගාරය සියලු තැන බුමුතුරුනු අතුට, අසුන් පණවා, දියසැළක් තබා, තෙල් පහනක් නංවා, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ ඔබ සාදර වැ වැඳ එක් පසෙක සිටියාහ.

එකමන්තං ඨිතා ඛො තෙ පාවෙය්‍යකා මල්ලා භගවන්තං එතදවොචුං, සබ්බසන්ථරිං සන්ථතං භන්තෙ සන්ථාගාරං, ආසනානි පඤ්ඤත්තානි: උදකමණිකො පතිට්ඨාපිතො, තෙලප්පදීපො ආරොපිතො. යස්ස'දානි භන්තෙ භගවා කාලං මඤ්ඤතී''ති.

4. අථ ඛො භගවා නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සන්ථාගාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පාදෙ පක්ඛාලෙත්වා සන්ථාගාරං පවිසිත්වා මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි. භික්ඛුසඞ්ඝො පි ඛො පාදෙ පක්ඛාලෙත්වා සන්ථාගාරං පවිසිත්වා පච්ඡිමං භිත්තිං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි භගවන්තංයෙව පුරක්ඛත්වා. පාවෙය්‍යකා පි ඛො මල්ලා පාදෙ පක්ඛාලෙත්වා සන්ථාගාරං පවිසිත්වා පුරත්ථිමං භිත්තිං නිස්සාය පච්ඡිමාභිමුඛා නිසීදිංසු භගවන්තංයෙව පුරක්ඛත්වා. අථ ඛො භගවා පාවෙය්‍යකෙ මල්ලෙ බහුදෙව රත්තිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උය්‍යොජෙසි; අභික්කන්තා ඛො වාසෙට්ඨා රත්ති. යස්ස'දානි තුම්හෙ කාලං මඤ්ඤථා ති. 'එවං භන්තෙ'ති ඛො පාවෙය්‍යකා මල්ලා භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

5. අථ ඛො භගවා අචිරපක්කන්තෙසු පාවෙය්‍යකෙසු මල්ලෙසු තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි, 'විගතථීනමිද්ධො ඛො සාරිපුත්ත භික්ඛුසඞ්ඝො පටිභාතු තං සාරිපුත්ත භික්ඛූනං ධම්මී කථා පිට්ඨි මෙ ආගිලායති, තමහං ආයමිස්සාමී''ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා සාරිපුත්තො භගවතො පච්චස්සොසි.

අථ ඛො භගවා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙත්වා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි, පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා,

එක් පසෙකැ සිටියා වූ ම ඒ පාවෙයක මල්ලයෝ 'වහන්ස, සන්ථාගාරශාලාව හැම තැනම බුමුතුරුණු අතුරන ලද්දේ ය, අසුන් පැනැවිණ, දියසැළෙක් තැබිණ, තෙල් පහනෙක් නැංවිණ. යම් ගමනකට භාග්‍යවතුන් වහන්සේ බලාපොරොත්තු වනු සේක් ද, දැන් එයට කල් පැමිණියේ යැ'යි භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ.

4. එ කලැ භාග්‍යවතුන් වහන්සේ හැඳ පෙරෙවැ පා සිවුරු ගෙන භික්ෂුසඞ්ඝයා කැටුවැ සන්ථාගාරය කරා එළැඹි සේක. එළැඹ පා දෙවැ සන්ථාගාරයට පිවිසැ, එහි මැද ටැඹ නිසා පෙරදිගට මුහුණ ලා වැඩහුන් සේක. භික්ෂුසඞ්ඝයා ද පා දෙවැ, සන්ථාගාරයට පිවිසැ පැසිම් බිත්තිය නිසා, පැසිම දිගට මුහුණු ලා, භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොට හිඳගත්හ. පාවා නුවර වැසි මල්ලයෝ ද පා දෙවැ සන්ථාගාරයට වැද, පෙරදිගැ බිත්තියට පිටු දී, පැසිම දිගට මුහුණු ලා, භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොට හුන්හ. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලාවක් පාවෙයක මල්ලයනට දැහැමි කතායෙන් දෙලෝ වැඩ දක්වා, දක්වූ වැඩෙහි සිත් ගන්වා, එහි ඔවුන් සිත් තියුණු කොට, එහි (යහපතැ යි) සිත් සතුටු කොට, 'වාශිෂ්ඨයෙනි, රාත්‍රිය බොහෝ ඉක්මිණ, සිය ගෙවලට යම් පෙරළා යැමක් කළ යුතු ද, දැන් එයට කල් නියාව දනිවූ' යැ යි ඔවුන් නික්මැ යන්නට උද්‍යෝගී කළ සේක. 'එසේ යැ වහන්සේ' යි කියා ම පාවා නුවර වැසි මල්ලයෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී හුනස්නෙන් නැඟී, ඔබ සාදර වැ වැඳ පැදකුණු කොට නික්මැ ගියාහ.

5. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පාවෙයක මල්ලයන් නික්මැගිය නොබෝ වේලායෙහි, නිහඬ නිහඬ වැ හුන් බික්සඟන දෙස බලා, සැරියුත් තෙරුන් බණවා, 'ශාරිපුත්‍රයෙනි, භික්ෂුසඞ්ඝ තෙමේ පහ වූ ථිනමිද්ධය ඇත්තේ වෙයි, ශාරිපුත්‍රයෙනි, ඔබට භික්ෂූන් පිණිස ධර්ම කථාවෙක් වැටැහේ වා (භික්ෂූනට දහමක් දෙසන්නැ), මා පිට රිදෙයි එ හෙයින් මම හෝනෙමි'යි වදළ සේක. 'එසේ ය වහන්සැ'යි කියා ම සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

එයින් පසු භාග්‍යවතුන් වහන්සේ සඟළ සිවුර සතර පට කොට පණවා (එළා), උත්ථානසංඥාව සිත්හි කොට (මෙතෙක් වේලායෙන් නැඟී සිටිමි යි ඉටා), දකුණු පය මතැ වම් පය මඳක් ඉක්මැ තබා දකුණැලයෙන් සිංහශය්‍යාව කළ සේක.

## භින්නනිගණ්ඨවත්ථු

6. තෙන ඛො පන සමයෙන නිගණ්ඨො නාතපුත්තො පාවායං අධුනා කාලකතො හොති. තස්ස කාලකිරියාය භින්නා නිගණ්ඨා ද්වෙධිකජාතා[1] භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි, අහමස්මි සම්මාපටිපන්නො. සංහිතම්මෙ[2] අසංහිතන්තෙ, පුරෙ වචනීයං පච්ඡා අවච, පච්ඡා වචනීයං පුරෙ අවච, ආචිණ්ණන්තෙ විපරාවත්තං, ආරොපිතො තෙ වාදො, නිග්ගහිතො ත්වමසි, චර වාදප්පමොක්ඛාය, නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති. වධොයෙව ඛො මඤ්ඤෙ නිගණ්ඨෙසු නාතපුත්තියෙසු අනුවත්තති. යෙ'පි තෙ නිගණ්ඨස්ස නාතපුත්තස්ස සාවකා ගිහී ඔදාතවසනා, තෙ'පි තෙසු නිගණ්ඨෙසු නාතපුත්තියෙසු නිබ්බින්නරූපා විරත්තරූපා පටිවානරූපා යථා තං දුරක්ඛාතෙ ධම්මවිනයෙ දුප්පවෙදිතෙ අනිය්‍යානිකෙ අනුපසමසංවත්තනිකෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ භින්නථූපෙ අප්පටිසරණෙ.

7. අථ ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි: නිගණ්ඨො ආවුසො නාතපුත්තො පාවායං අධුනා කාලකතො, තස්ස කාලකිරියාය භින්නා නිගණ්ඨා ද්වෙධිකජාතා -පෙ- භින්නථූපෙ අප්පටිසරණෙ එවං හෙතං ආවුසො හොති දුරක්ඛාතෙ ධම්මවිනයෙ දුප්පවෙදිතෙ අනිය්‍යානිකෙ අනුපසමසංවත්තනිකෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ. අයං ඛො පන ආවුසො අම්හාකං භගවතා ධම්මො ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං න විවදිතබ්බං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං. තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමො චාවුසො අම්හාකං භගවතා ධම්මො ස්වාක්ඛාතො සුප්පවෙදිතො නිය්‍යානිකො උපසමසංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො, තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං න විවදිතබ්බං යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං, තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

1. දෙවජ්ඣකජාතා (ස්‍යා. කම)
2. සහිතං මෙ (මජ්සං)

6. එ සමයෙහි වූ කලී නිර්ග්‍රන්ථඥාතපුත්‍ර පාවා නුවරදී නොබෝ කල්හි ම කලුරිය කෙළේ වෙයි. ඔහු ගේ මරණයෙන් පසු, යම්සේ නොමනා කොට කියන ලද, නොමනා කොට උගන්වන ලද නෛර්යාණික නොවූ, කෙලෙස් නිවීම පිණිස නොපවත්නා, අසම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත වූ, බිඳීගිය ස්තූපය ඇති (මළාවූ ශාස්තෘහු ඇති), ශාස්තෘහු ගේ අභාවයෙන් පිළිසරණක් නැති සස්නෙක්හි වියැ යුතු ද, එසේ ම නිවටහු ඒ ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයා ගේ මරණයෙන් බිඳීගියාහු, දෙ කොටසක් වූවාහු, "තෝ මේ දහම් විනය නො දනී, මේ දහම් විනය දනුයෙම් මම ය, තෝ කිමැ යි මේ දහම් විනය දන්නෙහි ද? තෝ වැරදි පිළිපන්නෙහි වෙහි, මම් මොනොවට පිළිපන්නෙම් වෙමි, තා බස නො සිලිටි ය, මා බස සිලිටි ය, පළමුවෙන් කියැ යුත්ත තෝ පසු වැ කීයෙහි, පසු වැ කියැ යුත්ත පළමුයෙන් කීයෙහි, තා පුරුදු පුහුණු කළ දය (මගේ වාදය නිසා) පෙරළී ගියේ ය, මා විසින් තට දෙස් නැඟිණ, තෝ නිගන්නා ලද්දෙහි, මා නැඟූ දෙසින් මිදෙනු පිණිස (මතුමත්තෙහි කරුණු සොයනුයෙහි ඒ ඒ ගුරුහු කරා) යව, ඉදින් පොහොසත් වෙහි නම් වෙළම් හරුව (විසඳව)"යි හටගත් ඩබර ඇත්තාහු, උපන් කලහ ඇත්තාහු, විවාදයට බටුවාහු, උනුන් වචන නැමැති සැතින් විදුනාහු වෙසෙත්. නිර්ග්‍රන්ථඥාතපුත්‍රයා ගේ අතැවැසි නිවටුන් අතුරෙහි උනුන් මරාගැන්මක් මෙන් පවතී. ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයා ගේ ශ්වේතවස්ත්‍රධාරී යම් ගෘහී ශ්‍රාවක කෙනෙක් වෙත් ද, උහුත් ඥාතපුත්‍රයා ගේ අතැවැසි නිවටුන් කෙරෙහි කලකිරුණු ස්වභාවය ඇත්තාහු, ආදර රහිත ස්වභාවය ඇත්තාහු, පළමු උනට දක්වූ සත්කාර ගුරුකාර හැර පසුබා ගිය ස්වභාවය ඇත්තාහු වෙත්.

7. ඉක්බිති සැරියුත් තෙරණුවෝ භික්ෂූන් අමතා, 'ඇවැත්නි, ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථ පාවා නුවැරදී නොබෝ කල්හි කලුරිය කෙළේ ය, ඔහුගේ කාලක්‍රියායෙන් ... යම්සේ නොමනා කොට කියන ලද, නොමනා කොට දන්වන ලද, නෛර්යාණික නොවූ, කෙලෙස් නිවීම පිණිස නොපවත්නා, අසම්‍යක්සම්බුද්ධයක්හු විසින් ප්‍රකාශිත වූ, බිඳීගිය ස්තූපය ඇති, ශාස්තෘහු ගේ අභාවයෙන් පිළිසරණක් නැති සස්නෙක්හි වියැ යුතු ද, එසේ ම නිවටහු ඒ ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයා ගේ මරණයෙන් බිඳී ගියාහු දෙකොටසක් වූවාහු ... වෙසෙත්. ඇවැත්නි, එතෙකුදු වුවත් අප භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මය ස්වාඛ්‍යාත ය, මොනොවට වදරන ලද්දේ ය, මොනොවට උගන්වන ලද්දේ ය, නෛර්යාණික ය, උපශමසංවර්තනික ය, සම්‍යක්සම්බුද්ධප්‍රවේදිත ය. එහි සියල්ලන් විසින් ම, යම්සේ මේ සස්න බොහෝ කල් පැවැතිය හැකි වන්නේ ද, බොහෝ කල් සිටින්නෙක් වන්නේ ද එසේ සමග්‍ර ව ගැයිය යුතු (එක් ම වචන ඇත්තවුන්, අවිරුද්ධ වචන ඇත්තවුන් වියැ යුතු), විවාද නො කළ යුතු. එය බොහෝ ජනයාට වැඩ පිණිස, බොහෝ ජනයාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිස්නට යහපත පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය.

## එකකං

8. අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකො ධම්මො සම්මදක්ඛාතො. තත්‍ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං න විවදිතබ්බං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං. තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්‍ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමො එකො ධම්මො? සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, සබ්බෙ සත්තා සඞ්ඛාරට්ඨිතිකා. අයං ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකො ධම්මො සම්මදක්ඛාතො. තත්‍ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං න විවදිතබ්බං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං, තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්‍ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

## දුකං

9. අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන ද්වෙ ධම්මා සම්මදක්ඛාතා. තත්‍ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං–පෙ– අත්‍ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

කතමෙ ද්වෙ?

නාමඤ්ච රූපඤ්ච
අවිජ්ජා ච භවතණ්හා ච
භවදිට්ඨි ච විභවදිට්ඨි ච
අහිරිකඤ්ච අනොත්තප්පඤ්ච
හිරි ච ඔත්තප්පඤ්ච
දොවචස්සතා ච පාපමිත්තතා ච,
සොවචස්සතා ච කල්‍යාණමිත්තතා ච
ආපත්තිකුසලතා ච ආපත්තිවුට්ඨානකුසලතා ච

## ඒකකය

8. ඇවැත්නි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ දන්නා දක්නා ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද එක් දහමෙක් ඇත. එහි සියල්ලන් විසින් ම, යම්සේ මෙ සස්න බොහෝ කල් පැවැතියැ හැකි වන්නේ ද, බොහෝ කල් සිටුනෙක් වන්නේ ද, එසේ සමග වැ ගැයිය යුතු. එය බොහෝ දෙනාට වැඩ පිණිස බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පාව පිණිස, දෙවිමිනිස්නට යහපත පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය. ඒ කවර එක් දහමෙක් ද යත්: සියලු සත්වයෝ ආහාරයෙන් (ප්‍රත්‍යයෙන්) සිටුනාහු වෙත්, සියලු සත්වයෝ සංස්කාරයෙන් (එලය සකසන දූයින් – ප්‍රත්‍යයෙන්) සිටුනාහු වෙත්. ඇවැත්නි, මෙය අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ දන්නා දක්නා ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද එක් දහම ය. එහි සියල්ලන් විසින් ම, යම්සේ මෙ සස්න බොහෝ කල් පැවැතියැ හැකි වන්නේ ද, බොහෝ කල් සිටුනෙක් වන්නේ ද, එසේ සමග වැ ගැයිය යුතු. එය බොහෝ දෙනාට වැඩ පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිස්නට යහපත පිණිස, වැඩ පිණිස සුව පිණිස වන්නේ ය.

## දුකය

9. ඇවැත්නි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ දන්නා දක්නා ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද දහම්හු දෙදෙනෙක් ඇත. එහි සියල්ලන් විසින් සමග වැ ගැයිය යුතු. එය... දෙවිමිනිස්නට යහපත පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය.

කවර දහම්හු දෙදෙනෙක් ද? යත්:

නාමය ද රූපය ද...

අවිද්‍යාව ද භවතෘෂ්ණාව ද...

භවදෘෂ්ටිය ද විභවදෘෂ්ටිය ද...

අහිරිකය ද අනොත්තප්පය ද...

හිරිය ද ඔත්තප්පය ද...

දුවච බව ද පාප මිත්‍රයන් ඇති බව ද...

සුවච බව ද කල්‍යාණ මිත්‍රයන් ඇති බව ද...

ආපත්තිකුශලතාව (ඇවැත් දූනීම) ද, ආපත්තිවුට්ඨානකුශලතාව ද (ඇවැතින් නැඟී සිටීම දන්නා නුවණ ද)...

සමාපත්තිකුසලතා ච සමාපත්තිවුට්ඨානකුසලතා ච

ධාතුකුසලතා ච මනසිකාරකුසලතා ච

ආයතනකුසලතා ච පටිච්චසමුප්පාදකුසලතා ච

ඨානකුසලතා ච අට්ඨානකුසලතා ච

අජ්ජවඤ්ච ලජ්ජවඤ්ච

ඛන්ති ච සොරච්චඤ්ච

සාඛල්‍යඤ්ච පටිසන්ථාරො ච

අවිහිංසා ච සොචෙය්‍යඤ්ච

මුට්ඨස්සච්චඤ්ච අසම්පජඤ්ඤඤ්ච

සති ච සම්පජඤ්ඤඤ්ච

ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා ච භොජනෙ අමත්තඤ්ඤුතා ච

ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා ච භොජනෙ මත්තඤ්ඤුතා ච

පටිසඞ්ඛානබලඤ්ච[1] භාවනාබලඤ්ච

සතිබලඤ්ච සමාධිබලඤ්ච

සමථො ච විපස්සනා ච

සමථනිමිත්තඤ්ච පග්ගාහනිමිත්තඤ්ච

පග්ගාහො ච අවික්ඛෙපො ච

සීලවිපත්ති ච දිට්ඨිවිපත්ති ච

සීලසම්පද ච දිට්ඨිසම්පද ච

සීලවිසුද්ධි ච දිට්ඨිවිසුද්ධි ච

දිට්ඨිවිසුද්ධි ඛො පන යථා දිට්ඨිස්ස ච පධානං සංවෙගො ච සංවෙජනීයෙසු ඨානෙසු සංවිග්ගස්ස ච යොනිසො පධානං

අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු අප්පටිවානිතා ච පධානස්මිං

විජ්ජා ච විමුත්ති ච

ඛයෙ ඤාණං අනුප්පාදෙ ඤාණං

1. පටිසඞ්ඛාන බලංච (ස්‍යා)

සමාපත්තිකුශලතාව (සමවතුන් දැනීම) ද, සමාපත්තිව්‍යුත්ථානකුශලතාව (සමවත්තෙන් නැඟිසිටීම දන්නා නුවණ) ද ...
ධාතුකුශලතාව (ධාතූන් දන්නා නුවණ) ද, මනස්කාරකුශලතාව (ධාතූන් මෙනෙහි කරන්නට දන්නා නුවණ) ද...
ආයතනකුශලතාව (ආයතනයන් දැන්ම) ද, ප්‍රතීත්‍යසමුත්පාදකුශලතාව (ප්‍රතීත්‍යසමුත්පාදය දන්නා නුවණ) ද...
ස්ථානකුශලතාව (ස්ථාන දන්නා නුවණ) ද, අස්ථානකුශලතාව (අස්ථාන දන්නා නුවණ) ද, ...
සෘජු බව ද, ලජ්ජාව ද...
ක්ෂාන්තිය ද සෞරත්‍යය (සිල්වත්බව) ද,...
සාඛල්‍යය (මොළොක් වචන ඇති බව) ද පටිසන්ථාරය (පිළිසඳර) ද...
අවිහිංසාව (කරුණාව) ද ශුචි බව (මෛත්‍රිය) ද...
නටුවාවූ සිහි ඇති බව ද නුවණනැති බව ද...
සිහිය ද නුවණ ද...
ඉඳුරන්හි නොවැසූ දෙර ඇති බව ද බොජුනෙහි පමණ නොදන්නා බව ද...
ඉඳුරන්හි වැසූ දෙර ඇති බවද බොජුනෙහි පමණ දන්නා බව ද...
ප්‍රතිසඞ්ඛ්‍යාන බලය (නොනුවණින් සැලිය නොහැකි නුවණ) ද, භාවනාබලය (බවුන් වැඩීමෙහි තහවුරු බව) ද...
ස්මෘතිබලය (තර වැ සිටුනා සිහිය) ද සමාධිබලය (සමාධියෙහි තහවුරු බව) ද...
ශමථය ද විදර්ශනාව ද...
ශමථනිමිත්තය ද ප්‍රග්‍රහනිමිත්තය ද ..
ප්‍රග්‍රහය (වීර්යය) ද අවික්ෂේපය (එකඟබව) ද...
ශීලවිපත්තිය (දුසිල් බව) ද දෘෂ්ටිවිපත්තිය (මිසදිට) ද...
ශීලසම්පත්තිය (ශීලසංවරය) ද දෘෂ්ටිසම්පත්තිය (ඥානය) ද...
ශීලවිශුද්ධිය ද දෘෂ්ටිවිශුද්ධිය ද...
දෘෂ්ටිවිශුද්ධිය (ඥානදර්ශනය) ද දෘෂ්ටිවිශුද්ධිය හා එක්වැ යෙදුණ වීර්යය ද...
සංවේගය (ජාතිජරාදි සංවේගවස්තූන් භය වශයෙන් භයජනක වශයෙන් දක්නා නුවණ) ද සංවෙග කටයුතු කරුණෙහි සංවේගයට පත්තහු ගේ උපාය (වීර්යය) ද...
කුසල්දහම්හි අතෘප්තිකර බවද ප්‍රධන් වීර්යයෙහි නොපසුබස්නා බව ද...
විද්‍යාව (පූර්වේනිවාසානුස්මෘතිඥානාදි තුන්විද්‍යා) ද විමුක්තිය (නීවරණ යන් ගෙන් හා සංස්කෘතධර්මයන් ගෙන් හා මිදීම) ද...
ක්ෂයයෙහි නුවණ (මාර්ගඥානය) ද අනුත්පාදයෙහි නුවණ (ඵලඥානය) ද යන මොහු ය.

ඉමෙ ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන ද්වෙ ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං න විවදිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

**තිකං**

10. අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන තයො ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

කතමෙ තයො?

**තීණි අකුසලමූලානි:** ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං, මොහො අකුසලමූලං.

**තීණි කුසලමූලානි:** අලොභො කුසලමූලං, අදොසො කුසලමූලං, අමොහො කුසලමූලං.

**තීණි දුච්චරිතානි:** කායදුච්චරිතං, වචීදුච්චරිතං, මනොදුච්චරිතං.

**තීණි සුචරිතානි:** කායසුචරිතං, වචීසුචරිතං, මනොසුචරිතං.

**තයො අකුසලවිතක්කා:** කාමවිතක්කො, බ්‍යාපාදවිතක්කො, විහිංසාවිතක්කො.

**තයො කුසලවිතක්කා:** නෙක්ඛම්මවිතක්කො, අබ්‍යාපාදවිතක්කො, අවිහිංසාවිතක්කො.

**තයො අකුසලසංකප්පා:** කාමසංකප්පො, බ්‍යාපාදසංකප්පො, විහිංසාසංකප්පො.

**තයො කුසලසංකප්පා:** නෙක්ඛම්මසංකප්පො, අබ්‍යාපාදසංකප්පො, අවිහිංසාසංකප්පො.

**තිස්සො අකුසලසඤ්ඤා:** කාමසඤ්ඤා, බ්‍යාපාදසඤ්ඤා, විහිංසාසඤ්ඤා.

**තිස්සො කුසලසඤ්ඤා:** නෙක්ඛම්මසඤ්ඤා, අබ්‍යාපාදසඤ්ඤා, අවිහිංසාසඤ්ඤා.

**තිස්සො අකුසලධාතුයො:** කාමධාතු, බ්‍යාපාදධාතු, විහිංසාධාතු,

**තිස්සො කුසලධාතුයො:** නෙක්ඛම්මධාතු, අබ්‍යාපාදධාතු, අවිහිංසාධාතු

අපරා පි **තිස්සො ධාතුයො:** කාමධාතු, රූපධාතු, අරූපධාතු.

අපරා පි **තිස්සො ධාතුයො:** රූපධාතු, අරූපධාතු, නිරොධධාතු.

අපරා පි **තිස්සො ධාතුයො:** හීනධාතු, මජ්ඣිමධාතු, පණීතධාතු.

**තිස්සො තණ්හා:** කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා.

ඇවැත්නි, මොහු දන්නා දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදාරන ලද ද්වික ධර්මයෝ ය. එහි ... දෙව්මිනිස්නට යහපත පිණිස වැඩ පිණිස සුව පිණිස සියල්ලන් විසින් ම සමග වැ ගැයිය යුතු, විවාද නො කටයුතු.

## ත්‍රිකය

10. ඇවැත්නි, දන්නා දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදාරන ලද තුන් ධර්ම කෙනෙක් ඇත. එහි ... දෙව්මිනිස්නට යහපත පිණිස වැඩ පිණිස සුව පිණිස සියල්ලන් විසින් ම සමග වැ ගැයිය යුතු විවාද නො කටයුතු.

කවර දහම්හු තිදෙනෙක් ද යත්:

අකුසල්මුල් තුනෙක: ලෝභය අකුසල් මුලෙක, ද්වේෂය අකුසල් මුලෙක, මෝහය අකුසල් මුලෙක...

කුසල්මුල් තුනෙක: අලෝභය කුසල් මුලෙක, අද්වේෂ ය කුසල් මුලෙක, අමෝහය කුසල් මුලෙක...

දුසිරිත් තුනෙක: කායදුශ්චරිත ය, වාග්දුශ්චරිත ය, මනොදුශ්චරිත ය...

සුසිරිත් තුනෙක: කායසුචරිත ය, වාක්සුචරිත ය, මනස්සුචරිත ය ...

අකුශලවිතර්ක තුනෙක: කාමවිතර්ක, ව්‍යාපාදවිතර්ක, විහිංසා-විතර්ක ...

කුශලවිතර්ක තුනෙක: නෛෂ්කාම්‍යවිතර්ක, අව්‍යාපාදවිතර්ක, අවි-හිංසාවිතර්ක ...

කුශල සංකල්ප තුනෙක: නෛෂ්කාම්‍යසංකල්පය, අව්‍යාපාද-සංකල්පය, අවිහිංසා සංකල්පය ...

අකුශල සංඥ තුනෙක: කාමසංඥ, ව්‍යාපාදසංඥ, විහිංසාසංඥ ...

කුශලසංඥ තුනෙක: නෛෂ්කාම්‍යසංඥ, අව්‍යාපාදසංඥා, අවිහිංසා සංඥ ...

අකුශලධාතු තුනෙක: කාම ධාතු, ව්‍යාපාද ධාතු, විහිංසා ධාතු ...

කුශල ධාතු තුනෙක: නෛෂ්කාම්‍ය ධාතු, අව්‍යාපාද ධාතු. අවිහිංසා ධාතු ...

අන්‍ය ද ධාතු තුනෙක: කාම ධාතු, රූප ධාතු, අරූප ධාතු ...

අන්‍ය ද ධාතු තුනෙක: රූප ධාතු, අරූප ධාතු, නිරෝධ ධාතු ...

අන්‍ය ද ධාතු තුනෙක: හීන ධාතු, මධ්‍යම ධාතු, ප්‍රණීත ධාතු ...

තෘෂ්ණා තුනෙක: කාමතෘෂ්ණා, භවතෘෂ්ණා, විභවතෘෂ්ණා ...

**අපරාපි තිස්සො තණ්හා:** කාමතණ්හා, රූපතණ්හා, අරූපතණ්හා.

**අපරා පි තිස්සො තණ්හා:** රූපතණ්හා, අරූපතණ්හා, නිරෝධතණ්හා.

**තීණි සංයොජනානි:** සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාසො.

**තයො ආසවා:** කාමාසවො, භවාසවො, අවිජ්ජාසවො.

**තයො භවා:** කාමභවො, රූපභවො, අරූපභවො.

**තිස්සො එසනා:** කාමෙසනා, භවෙසනා, බ්‍රහ්මචරියෙසනා.

**තිස්සො විධා:** සෙය්‍යො'හමස්මී ති විධා, සදිසො' හමස්මීති විධා, හීනො'හමස්මීති විධා.

**තයො අද්ධා:** අතීතො අද්ධා, අනාගතො අද්ධා, පච්චුප්පන්නො අද්ධා.

**තයො අන්තා:** සක්කායො අන්තො, සක්කායසමුදයො අන්තො, සක්කායනිරොධො අන්තො.

**තිස්සො වෙදනා:** සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා.

**තිස්සො දුක්ඛතා:** දුක්ඛදුක්ඛතා, සඞ්ඛාරදුක්ඛතා, විපරිණාමදුක්ඛතා.

**තයො රාසී:** මිච්ඡත්තනියතො රාසි, සම්මත්තනියතො රාසි, අනියතො රාසි.

**තිස්සො කඞ්ඛා:**[1] අතීතං වා අද්ධානං ආරබ්භ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, අනාගතං වා අද්ධානං ආරබ්භ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, එතරහි වා පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති.

**තීණි තථාගතස්ස අරක්ඛෙය්‍යානි:** පරිසුද්ධකායසමාචාරො ආවුසො තථාගතො, නත්ථි තථාගතස්ස කායදුච්චරිතං යං තථාගතො රක්ඛෙය්‍ය මා මෙ ඉදං පරො අඤ්ඤාසීති; පරිසුද්ධවචීසමාචාරො ආවුසො තථාගතො, නත්ථි තථාගතස්ස වචීදුච්චරිතං යං තථාගතො රක්ඛෙය්‍ය 'මා මෙ ඉදං පරො අඤ්ඤාසීති; පරිසුද්ධමනොසමාචාරො ආවුසො, තථාගතො, නත්ථි තථාගතස්ස මනොදුච්චරිතං යං තථාගතො රක්ඛෙය්‍ය මා මෙ ඉදං පරො අඤ්ඤාසීති.

---

1. තයො තමං (ලජසං)

අන්‍ය ද තෘෂ්ණා තුනෙක: කාමතෘෂ්ණා, රූපතෘෂ්ණා, අරූපතෘෂ්ණා...

අන්‍ය ද තෘෂ්ණා තුනෙක: රූපතෘෂ්ණා, අරූපතෘෂ්ණා, නිරොධ-තෘෂ්ණා ...

සංයොජන තුනෙක: සත්කායදෘෂ්ටි, විචිකිත්සා, ශීලව්‍රතපරාමර්ශ ...

ආස්‍රව තුනෙක: කාමාස්‍රව, භවාස්‍රව, අවිද්‍යාස්‍රව ...

භව තුනෙක: කාමභව, රූපභව, අරූපභව ...

එෂණා තුනෙක. කාම එෂණා, භව එෂණා, බ්‍රහ්මචර්යා එෂණා ...

විධා (මාන) තුනෙක. මම උතුම් වෙමි යි විධාවෙක, මම සමාන-යෙමි යි විධාවෙක, මම හීනයෙමි යි විධාවෙක ...

අධව (කාල) තුනෙක: අතීත කාලය, අනාගත කාලය, වර්තමාන කාලය ...

අන්ත තුනෙක: සත්කායය (පංචස්කන්ධය) එක් අන්තයෙක, සත්කායසමුදයය (පූර්ව තෘෂ්ණාවය), සත්කාය නිරොධය (නිවන හා මග) ...

වෙදනා තුනෙක. සුඛවෙදනා ය, දුඃඛවෙදනා ය, අදුඃඛඅසුඛවෙදනා ය ...

දුඃඛතා තුනෙක: දුඃඛදුඃඛතා (දුක් වෙදනා)ය, සංස්කාරදුඃඛතා ය (අදුඃඛඅසුඛවෙදනා ය), විපරිණාමදුඃඛතා ය (සුඛවෙදනා ය)...

රාශි තුනෙක: මිථ්‍යාත්වනියත රාශිය (නියත මිසදිට හා ආනන්තර්ය-කර්ම), සම්‍යක්ත්වනියත රාශිය (සතර ආර්යමාර්ගය), අනියත රාශිය (අවශෙෂ ධර්ම)...

කාඞක්ෂා (සැක) තුනෙක: අතීත කාලය ඇරබැ සැක කරයි, නිශ්චය කට නොහැකි ව වෙහෙසෙයි, ඇලෙනු නොහැකි වෙයි; නො පැහැදෙයි, අනාගත කාලය ඇරබැ හෝ සැක කරයි, නිශ්චය කට නො හැකි වැ වෙහෙසෙයි, ඇලෙනු නො හැකි වෙයි; දුන් වර්තමාන කාලය ඇරබැ හෝ සැක කෙරෙයි, නිශ්චය කට නො හැකි වැ වෙසෙයි, ඇලෙනු නොහැකි වෙයි, නො පැහැදෙයි.

තථාගතයන් වහන්සේගේ නොරක්කැ යුතු තැන් තුනෙකි: ඇවැත්නි, තථාගතයන් වහන්සේ පිරිසිදු කායසමාචාර ඇති සේක. මගේ මේ ක්‍රියාව මෙරමා නහමක් දනී වා යි තථාගතයන් වහන්සේ යමක් රක්නාසේක් ද (තථාගතයන් වහන්සේ විසින් රක්කැ යුතු ද), එසේ වූ තථාගතයන් වහන්සේගේ කායදුශ්චරිතයෙක් නැත. තථාගතයන් වහන්සේ පිරිසිදු වාක්සමාචාර ඇති සේක. මෙය මෙරමා නො දනී වා'යි යමක් තථාගතයන් වහන්සේ රක්නා සේක් ද (රක්ක යුතු ද) එසේ වූ තථාගත-යන් වහන්සේගේ වාග් දුශ්චරිතයෙක් නැත, තථාගතයන් වහන්සේ පිරිසිදු වාක්සමාචාර ඇති සේක. මෙය මෙරමා නො දනී වා'යි යමක් තථාගතයන් වහන්සේ රක්නා සේක් ද (රක්කැ යුතු ද) එසේ වූ තථාගත-යන් වහන්සේ ගේ මනොදුශ්චරිතයෙක් නැත.

තයො කිඤ්චනා: රාගො කිඤ්චනං, දොසො කිඤ්චනං, මොහො කිඤ්චනං.

තයො අග්ගී: රාගග්ගි, දොසග්ගි, මොහග්ගි.

අපරෙ පි තයො අග්ගී: ආහුනෙය්‍යග්ගි, ගහපතග්ගි, දක්ඛිණෙය්‍යග්ගි.

තිවිධෙන රූපසඞ්ගහො: සනිදස්සනසප්පටිඝං රූපං, අනිදස්සනසප්පටිඝං රූපං[1], අනිදස්සනඅප්පටිඝං රූපං.

තයො සඞ්ඛාරා: පුඤ්ඤාභිසඞ්ඛාරො, අපුඤ්ඤාභිසඞ්ඛාරො, ආනෙඤ්ජාභිසඞ්ඛාරො.

තයො පුග්ගලා: සෙක්ඛො පුග්ගලො, අසෙක්ඛො පුග්ගලො, නෙවසෙක්ඛො නාසෙක්ඛො පුග්ගලො.

තයො ථෙරා: ජාතිථෙරො, ධම්මථෙරො, සම්මතිථෙරො.[2]

තීණි පුඤ්ඤකිරියවත්ථූනි: දානමයං පුඤ්ඤකිරියවත්ථු, සීලමයං පුඤ්ඤකිරියවත්ථු, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු.

තීණි චොදනාවත්ථූනි: දිට්ඨෙන, සුතෙන, පරිසංකාය.

තිස්සො කාමූපපත්තියො[3]: සන්තාවුසො සත්තා පච්චුපට්ඨිතකාමා. තෙ පච්චුපට්ඨිතෙසු කාමෙසු වසං වත්තෙන්ති සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. අයං පඨමා කාමූපපත්ති. සන්තාවුසො සත්තා නිම්මිතකාමා. තෙ නිම්මිනිත්වා නිම්මිනිත්වා කාමෙසු වසං වත්තෙන්ති සෙය්‍යථාපි දෙවා නිම්මානරතී. අයං දුතියා කාමූපපත්ති. සන්තාවුසො සත්තා පරනිම්මිතකාමා. තෙ පරනිම්මිතෙසු කාමෙසු වසං වත්තෙන්ති, සෙය්‍යථාපි දෙවා පරනිම්මිතවසවත්තී. අයං තතියා කාමූපපත්ති.

---

1. අනිදස්සනසප්පටිඝරූපං (ස්‍යා, කම)
2. සම්මුතිථෙරො (මජසං)
3. කාමූපපත්තියො (PTS), ස්‍යා, කම)

කිඤ්චන (සත්වයන් බඳනා පරිබොධ) තුනෙකි: රාගය කිඤ්චනයෙකි (පරිබොධයෙකි). ද්වෙෂය කිඤ්චනයෙකි (පරිබොධයෙකි), මෝහය කිඤ්චනයෙකි (පරිබොධයෙකි).

අග්නි (ගිනි) තුනෙක: රාග ගින්න ය, ද්වෙෂ ගින්න ය, මෝහ ගින්න ය.

තව ද අග්නි තුනෙක: ආහුනෙයාග්නිය (මාපිය නැමැති ගින්න ය), ගෘහපත්‍යග්නිය (ගෙහිමියා නැමැති ගින්න ය), දක්ෂිණෙයාග්නිය (භික්ෂුසඞ්ඝ නැමැති ගින්න ය).

තුන් කොටසෙකින් රූපසඞ්ග්‍රහය (රූපයන් ගණන් ගැන්ම)වේ: නිදර්ශන (චක්ෂුර්විඥාන) සහිත ප්‍රතිඝ (ඇසට ගොදුරු වීම් වශයෙන් හැපීම්) සහිත රූපයෙක (රූපායතනය ය), නිදර්ශන (චක්ෂුර්විඥාන) නොමැති ප්‍රතිඝ (ශ්‍රොත්‍රාදීයේ හැපීම්) සහිත රූපයෙක (චක්ෂුරායතනාදි නව ආයතන ය), නිදර්ශන (චක්ෂුර්විඥාන) නැති, ප්‍රතිඝ (හැපීම්) නැති රූපයෙක (ශුක්ෂ්මරූප ය).

සංස්කාර තුනෙක: පුණ්‍යාභිසංස්කාරය (කාමාවචර රූපාවචර කුශල චෙතනා ය), අපුණ්‍යාභිසංස්කාරය (අකුශල චෙතනා), ආනෙඤ්ජාභි සංස්කාරය (අරූපාවචර කුශල චෙතනා ය).

පුද්ගලයෝ ති දෙනෙක: ශෛක්ෂ පුද්ගලයා ය, අශෛක්ෂ පුද්ගලයා ය, නෛවශෛක්ෂ නාශෛක්ෂ පුද්ගලයා ය.

ස්ථවිර ති දෙනෙකි: ජාතිස්ථවිරය (මහලුගිහි ය), ධර්මස්ථවිර ය (ථෙරකරණීය ධර්ම වූ සිල්වත්බව ආදී සතර ධර්මයෙන් යුක්ත පැවිද්ද ය), සම්මති ස්ථවිරය (නමින් පමණක් ස්ථවිර වූයේ ය).

පුණ්‍යක්‍රියාවස්තු (පුණ්‍යක්‍රියා වූ ද ඒ ඒ ආනිසංසයන වස්තු කාරණ වූ ද දෑ) තුනෙක: දානමය පුණ්‍යක්‍රියාවස්තුව, ශීලමය පුණ්‍යක්‍රියාවස්තුව භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුව.

චොදනාවස්තු (චොදනාවනට කරුණු වූ දෑ) තුනෙක: දැකීමෙන් චොදනා කෙරෙති, ඇසීමෙන් චොදනා කෙරෙති, සැක කිරීමෙන් චෝදනා කෙරෙති.

කාමෝපපත්ති (කම සුව විඳුම්) තුනෙක: ඇවැත්නි එළැඹැ සිටි කාම ඇති (නිබඳ වැ පැවැති කාමවස්තු ඇති) සත්ව කෙනෙක් ඇත. මිනිස්සු ද ඇතැම් දෙවියෝ ද (යාමාදි සතර දෙව්ලෝ වැස්සෝ ද) ඇතැම් විනිපාතිකයෝ ද (නිරිසතුන් හැර සෙසු ආපායිකයෝ ද) යන ඒ සත්වයෝ එළඹැ සිටි කාමවස්තූන්හි සිය වශය (කැමැති සේ පවත්නා බව) පවත්වත්. මේ පළමු කාමෝපපත්තිය ය. ඇවැත්නි, මවාගන්නා ලද කාමවස්තු ඇති සත්ව කෙනෙක් ඇත. ඔහු නිර්මාණරති දෙවියෝ යම් සේ ද එසේ ම නිර්මිත කොට කොට ගෙන කාමවස්තූන්හි වශය පවත්වත්. මේ දෙවෙනි කාමෝපපත්තිය ය. ඇවැත්නි, මෙරමා විසින් මවන ලද කාමවස්තූන් පරිභොග කරන සත්ව කෙනෙක් ඇත. ඔහු පරනිර්මිත වශවර්ත්ති දෙවියෝ යම්සේ ද එසේ අනුන් විසින් නිර්මිත කරන ලද කාමවස්තූන්හි වශය පවත්වත්. මේ තෙවෙනි කාමෝපපත්තිය ය.

තිස්සො සුඛූපපත්තියො[1] සන්තාවුසො සත්තා උප්පාදෙත්වා උප්පාදෙත්වා සුඛං විහරන්ති, සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා. අයං පඨමා සුඛූපපත්ති සන්තාවුසො සත්තා සුඛෙන අභිසන්නා පරිසන්නා පරිපූරා පරිප්ඵුටා. තෙ කදාචි කරහචි උදානං උදානෙන්ති අහො සුඛං අහො සුඛන්ති, සෙය්‍යථාපි දෙවා ආභස්සරා. අයං දුතියා සුඛූපපත්ති. සන්තාවුසො සත්තා සුඛෙන අභිසන්නා පරිසන්නා පරිපූරා පරිප්ඵුටා, තෙ සන්තං යෙව තුසිතා සුඛං පටිසංවෙදෙන්ති, සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. අයං තතියා සුඛූපපත්ති.

තිස්සො පඤ්ඤා: සෙක්ඛා පඤ්ඤා, අසෙක්ඛා පඤ්ඤා, නෙවසෙක්ඛා නාසෙක්ඛා පඤ්ඤා.

අපරා පි තිස්සො පඤ්ඤා: චින්තාමයා පඤ්ඤා, සුතමයා පඤ්ඤා භාවනාමයා පඤ්ඤා.

තීණාවුධානි: සුතාවුධං, පවිවෙකාවුධං, පඤ්ඤාවුධං.

තීණින්ද්‍රියානි: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං.

තීණි චක්ඛූනි: මංසචක්ඛු, දිබ්බචක්ඛු, පඤ්ඤාචක්ඛු.

තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා, අධිචිත්තසික්ඛා, අධිපඤ්ඤාසික්ඛා.

තිස්සො භාවනා: කායභාවනා, චිත්තභාවනා, පඤ්ඤාභාවනා.

තීණි අනුත්තරියානි: දස්සනානුත්තරියං, පටිපදානුත්තරියං, විමුත්තානුත්තරියං.

තයො සමාධි: සවිතක්කසවිචාරො සමාධි, අවිතක්කවිචාරමත්තො සමාධි, අවිතක්කඅවිචාරො සමාධි.

අපරෙ පි තයො සමාධි: සුඤ්ඤතො සමාධි, අනිමිත්තො සමාධි, අප්පණිහිතො සමාධි.

---

1. සුඛූපපත්තියො (PTS, ස්‍යා, කම්)

සුඛෝපපත්ති (සුව ලැබීම්) තුනෙක: ඇවැත්නි, බ්‍රහ්මකායික දෙවියෝ යම් සේ ද, එසේ උපදව උපදවා පළමු දහන් සුව විඳුනා සත් කෙනෙක් ඇත. මේ පළමු සුව ලැබීම ය. ඇවැත්නි, ආභාස්වර දෙවියෝ යම් සේ ද, එසේ (දෙවෙනි දහන්) සුවයෙන් තෙමුණු, හැම ලෙසින් ම තෙමුණු, පිරුණු, පැතිරගත් සත් කෙනෙක් ඇත. ඔහු කිසි විටෙක 'අහෝ සුවයෙක! අහෝ සුවයෙකැ'! යි උදන් අනත්. මේ දෙවෙනි සුඛොපපත්තිය ය. ඇවැත්නි, ශුභකෘත්ස්නක දෙවියෝ යම් සේ ද, එසේ (තෙවෙනි දහන්) සුවයෙන් තෙමුණු, හැම ලෙසින් තෙමුණු, පිරුණු, පැතිරගත් සත් කෙනෙක් ඇත. ඔහු (තමන් ලත් දහන් සුවින්) සතුටු වූවාහු, ශාන්ත (ප්‍රණීත) වූ ම සිත් සුවය විඳිත්. මේ තෙවෙනි සුවලැබීම ය.

ප්‍රඥා තුනෙක: ශෛක්ෂ ප්‍රඥා ය (සෝවාන් ආදී සත් ආර්ය ප්‍රඥා ය,) අශෛක්ෂ ප්‍රඥා ය (රහත් පල නුවණ ය), නෛවශෛක්ෂ නාශෛක්ෂ ප්‍රඥා ය (මාර්ගඵලප්‍රඥාවෙන් අන්‍ය වූ සියලු ලොවී නුවණ ය).

තව ද ප්‍රඥා තුනෙක: චින්තාමය ප්‍රඥාව, ශ්‍රැතමය ප්‍රඥාව, භාවනාමය ප්‍රඥාව.

ආයුධ තුනෙක: ශ්‍රැතායුධය, ප්‍රවිවේකායුධය, ප්‍රඥායුධය.

ඉන්ද්‍රිය: තුනෙක: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය (සෝවාන් මඟ නුවණ), අඤ්ඤින්ද්‍රිය ය (සෝවාන් පලය පටන් කොට ඉදිරි සතන්හි නුවණ) අඤ්ඤාතාවීන්ද්‍රිය ය (රහත්පල නුවණ).

ඇස් තුනෙක: මසැස, දිවැස, පැණැස.

ශික්ෂා තුනෙක: අධිශීලශික්ෂාව, අධිචිත්තශික්ෂාව, අධිප්‍රඥාශික්ෂාව.

භාවනා තුනෙක: කායභාවනාව (රහත්හුගේ පස් දොර), චිත්තභාවනාව (අට සමවත්), ප්‍රඥාභාවනාව (රහත්පල නුවණ)

අනුත්තරිය තුනෙක: දස්සනානුත්තරියය(උතුම් ම දැක් ම විදර්ශනාව) පටිපදානුත්තරිය ය (උතුම් ම පිළිපැදීම=ආර්යමාර්ග ය), විමුත්තානුත්තරිය ය (උතුම් ම මිදීම=ආර්යඵලය).

සමාධි තුනෙක: සවිතර්ක සවිචාර සමාධිය, අවිතර්ක විචාරමාත්‍ර සමාධිය, අවිතර්ක අවිචාර සමාධිය.

අන්‍ය ද සමාධි තුනෙක: ශූන්‍යතාසමාධිය, අනිමිත්ත සමාධිය, අප්‍රණිහිත සමාධිය.

**තීණි සොචෙය්‍යානි:** කායසොචෙය්‍යං වචීසොචෙය්‍යං මනොසොචෙය්‍යං.

**තීණි මොනෙය්‍යානි:** කායමොනෙය්‍යං වචීමොනෙය්‍යං මනොමොනෙය්‍යං.

**තීණි කොසල්ලානි:** ආයකොසල්ලං අපායකොසල්ලං උපායකොසල්ලං.

තයො මදා; ආරොග්‍යමදො යොබ්බනමදො ජීවිතමදො.

**තීණි ආධිපතෙය්‍යානි:** අත්තාධිපතෙය්‍යං ලොකාධිපතෙය්‍යං ධම්මාධිපතෙය්‍යං.

**තීණි කථාවත්ථූනි:** අතීතං වා අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය එවං අහොසි අතීතමද්ධානන්ති, අනාගතං වා අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය එවං භවිස්සති අනාගතමද්ධානන්ති, එතරහි වා පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය එවං හොති එතරහි පච්චුප්පන්නං අද්ධානන්ති.

**තිස්සො විජ්ජා:** පුබ්බෙනිවාසානුස්සතිඤාණං විජ්ජා, සත්තානං චුතූපපාතෙ ඤාණං විජ්ජා, ආසවානං ඛයෙ ඤාණං විජ්ජා.

**තයො විහාරා:** දිබ්බො විහාරො, බ්‍රහ්මා විහාරො, අරියො විහාරො.

**තීණි පාටිහාරියානි:** ඉද්ධිපාටිහාරියං, ආදෙසනාපාටිහාරියං, අනුසාසනිපාටිහාරියං.

ඉමෙ ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන තයො ධම්මා සම්මදක්ඛාතා. තත්‍ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

සෞචෙය (පිරිසිදු බව ඇති කරන පිළිපැදුම්) තුනෙක: කායසෞචෙයය (තුන් කායදුශ්චරිතයෙන් වැළැක්ම), වාක්සෞචෙය ය (සතර වාග් දුශ්-චරිතයෙන් වැළැක්ම), මනසෞචෙයය (තුන් මනොදුශ්චරිතයෙන් වැළැක්ම).

මෞනෙය (මුනිබව කරන පිළිපැදුම්) තුනෙක: කායමෞනේයය වාඩ මෞනේයය මනොමෞනේයය.

කෞශල්‍ය (දක්ෂතා-දැනුම්) තුනෙක: ආයකෞශල්‍යය (වැඩීම දන්නා නුවණ), අපාය කෞශල්‍යය (නො වැඩීම දන්නා නුවණ), උපාය කෞශල්‍යය (වැඩුම් පිරිහුම් දෙකට කාරණ දන්නා නුවණ).

මද තුනෙක: ආරෝග්‍යමදය (නිරෝග බව නිසා උපදනා උඩඟු බව), යෞවන මදය (තරුණ බව නිසා උපදනා උඩඟු බව), ජීවිත මදය (බොහෝ කල් ජීවත් වීම් සුවසේ ජීවත් වීම් ජීවත්වන්නෙමි යන ආදීන් ජීවත්වීම පිළිබඳ ව උපදනා උඩඟු බව).

ආධිපත්‍ය තුනෙක: ආත්මාධිපත්‍යය (ආත්මගෞරවය නිසා පව් නො කරන බව), ලෝකාධිපත්‍යය (ලෝකයා අධිපති කොට ගෙන-ලෝකයාගෙන් අපවාද ලැබෙතැ යි සලකා පව් නොකරන බව), ධර්මාධි-පත්‍යය (ලොවුතුරාදහම් අධිපති කොට ගෙන - ලොවුතුරා දහම් පසක් කළ බැවින් පව් නොකරන බව).

කථාවස්තු (කථාවට කරුණු) තුනෙක: අතීතය මෙසේ වී යැ යි අතීත කාලය ඇරබැ කථා කරන්නේ ය. අනාගතය මෙසේ වන්නේ යැ යි අනාගත කාලය ඇරබැ හෝ කථා කරන්නේ ය, දැන් පවත්නා කාලය මෙසේ වේ යැ යි වර්තමාන කාලය ඇරබැ හෝ කථා කරන්නේ ය.

විද්‍යා තුනෙක: පෙර වුසු කඳපිළිවෙළ සිහි කරන නුවණ විද්‍යා-වෙක, සතුන්ගේ ච්‍යුති උපපත්ති දන්නා නුවණ විද්‍යාවෙක, ආස්‍රවයන්ගේ ක්ෂයයෙහි නුවණ (මාර්ගඥානය) විද්‍යාවෙක.

විහාර (වුසුම්) තුනෙක: දිව්‍ය විහාරය (අට සමවත් ය.), බ්‍රහ්මවිහාරය (අප්‍රාමාණ්‍ය සතරය), ආර්යවිහාරය (පලසමවත්ය).

ප්‍රාතිහාර්ය තුනෙක ඍද්ධිප්‍රාතිහාර්යය, ආදේශනප්‍රාතිහාර්යය, අනුශාසනිප්‍රාතිහාර්යය.

ඇවැත්නි, දන්නා දක්නා අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යව-තුන් වහන්සේ විසින් මේ තුන් ධර්ම කෙනෙක් මොනොවට වදාරන ලද්දහ. එහි සියල්ලන් විසින් ම...සමග වැ ගැයිය යුතු ... එය ... දෙවි-මිනිස්නට යහපත පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය.

චතුක්කං

10. අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං න විවදිතබ්බං යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං. තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං කතමෙ චත්තාරො?

චත්තාරො සතිපට්ඨානා: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා-දෙමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී -පෙ- චිත්තෙ චිත්තානුපස්සී -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං.

චත්තාරො සම්මප්පධානා: ඉධාවුසො භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාපාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති.

චත්තාරො ඉද්ධිපාදා: ඉධාවුසො භික්ඛු ඡන්දසමාධිපධානසංඛාරසමන්නා-ගතං ඉද්ධිපාදං භාවෙති, චිත්තසමාධිපධානසංඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධිපධානසංඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, වීමංසා-සමාධිපධානසංඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති.

චතුෂ්කය.

10. ඇවැත්නි, දන්නාවූ දක්නාවූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද සතර ධර්ම කෙනෙක් ඇත. එහි මෙ සස්න බොහෝ කල් පැවැතියැ හැකි වනු පිණිස, චිරස්ථායී වනු පිණිස සියලු දෙනා විසින් ම සමග වැ ගැයියැ යුතු, විවාද නො කළ යුතු. එය බොහෝ දෙනාට වැඩ පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, දෙවිමිනිස්නට යහපත පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය. ඒ කවර සතර ධර්මයෝ ද? යත්:

සතිපට්ඨානයෝ සතර දෙනෙක: ඇවැත්නි, මෙහි මහණ තෙමේ කෙලෙස් තවන වැර ඇත්තේ, නුවණින් දන්නේ, සිහි ඇත්තේ, ලොව කෙරෙහි අභිධ්‍යාවත් දෙම්නසත් බැහැර කොට රූ කයෙහි කය අනුව බලන්නේ වෙසෙයි.... වෙදනාවන්හි වෙදනා අනුවැ බලන්නේ... වෙසෙයි. සිත්හි සිත් අනුවැ බලන්නේ... වෙසෙයි. කෙලෙස් තවනා වැර ඇත්තේ, නුවණින්දන්නේ, සිහි ඇත්තේ, ලොව කෙරෙහි අභිධ්‍යාවත් දෙම්නසත් බැහැර කොට ධර්මයන්හි ධර්ම අනුවැ බලන්නේ වෙසෙයි.

සම්‍යක්ප්‍රධානයෝ සතර දෙනෙක: ඇවැත්නි, මෙහි මහණ තෙමේ නූපන් ලාමක අකුසල් දහමුන් නො උපදනා පිණිස ඡන්දය උපදවයි, වෑයම් කරයි, වැර වඩයි, සිත ඔසොවයි, පිහිටුවයි. උපන් ලාමක අකු-සල් දහමුන් බැහැර ලනු පිණිස ඡන්දය උපදවයි, වෑයම් කරයි, වැර වඩයි, සිත ඔසොවයි, පිහිටුවයි. නූපන් කුසල් දහමුන් ඉපැත්ම පිණිස ඡන්දය උපදවයි, වෑයම් කරයි, වැර වඩයි, සිත ඔසොවයි, පිහිටුවයි. උපන් කුසල් දහමුන් සිටිනු පිණිස, නොනස්නා පිණිස, බොහෝ සෙයින් වනු පිණිස, මහත් වනු පිණිස, භාවනායෙන් පිරෙනු පිණිස ඡන්දය උපදවයි, වෑයම් කරයි, වැර වඩයි, සිත ඔසොවයි, පිහිටුවයි.

ඍද්ධිපාදයෝ සතර දෙනෙක: ඇවැත්නි, මෙහි මහණ තෙම කත්තුකම්‍යතා ඡන්දය අධිපති කොට ගෙන ලත් සමාධියෙන් ද ප්‍රධාන සංස්කාරයෙන් (හෙවත්) චතුෂ්කෘත්‍ය සාධක සම්‍යක්ප්‍රධානවීර්යයෙන් ද යුක්ත වූ ඍද්ධිපාදය වඩයි, චිත්තය අධිපති කොට ගෙන ලත් සමාධි-යෙන් ද ප්‍රධාන සංස්කාරයෙන් (ප්‍රධාන වීර්යයෙන්) ද යුක්ත වූ ඍද්ධිපාදය වඩයි, වීර්යය අධිපති කොට ගෙන ලත් සමාධියෙන් ද ප්‍රධානසංස්කාර-යෙන් ද යුක්ත වූ ඍද්ධිපාදය වඩයි. මීමාංසාව (ප්‍රඥව) අධිපති කොට ගෙන ලත් සමාධියෙන් ද ප්‍රධාන වීර්‍ය්‍යයෙන් ද යුක්ත වූ ඍද්ධිපාදය වඩයි.

**චත්තාරි ඣානානි:** ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[1] උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[2] උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති, සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යන්තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති, තං තතියං ඣානං[3] උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං. අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං[4] උපසම්පජ්ජ විහරති.

**චතස්සො සමාධිභාවනා:** අත්ථාවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති, අත්ථාවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා ඤාණදස්සනපටිලාභාය සංවත්තති, අත්ථාවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා සතිසම්පජඤ්ඤාය සංවත්තති, අත්ථාවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති.

කතමා චාවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති? ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං -පෙ- පඨමං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං ආවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති.

කතමා චාවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා ඤාණදස්සන-පටිලාභාය සංවත්තති? ඉධාවුසො භික්ඛු ආලොකසඤ්ඤං මනසි කරොති, දිවාසඤ්ඤං අධිට්ඨාති යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා. ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති. අයං ආවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා ඤාණදස්සනපටිලාභාය සංවත්තති.

1. පඨමජ්ඣානං (ස්‍යා, කම)
2. දුතියජ්ඣානං (ස්‍යා, කම)
3. තතියජ්ඣානං (ස්‍යා, කම)
4. චතුත්ථජ්ඣානං (ස්‍යා කම)

ධ්‍යාන සතරෙක: ඇවැත්නි, මෙහි මහණ තෙමේ කාමයන් ගෙන් වෙන් ව ම, අකුසල් දහමුන් ගෙන් වෙන් ව ම, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවෙකයෙන් උපන්, ප්‍රීතිය හා සුඛවෙදනාව ඇති ප්‍රථම ධ්‍යානය ලැබ වෙසෙයි; විතර්ක විචාර දෙක සංසිඳීමෙන් තමා තුළ පහන්බව ඇති කරන, සිතේ එක් අරමුණෙක ම පිහිටි බව ඇති, විතර්ක නැති, විචාරය නැති, සමාධියෙන් උපන්, ප්‍රීතිය හා සුඛවෙදනාව ඇති, ද්විතිය ධ්‍යානය ලැබ වෙසෙයි; ප්‍රීතිය ද දුරැ ලීමෙන් උපෙක්ෂක ව ද වෙසෙයි, සිහි ඇත්තේ ද නුවණින් දන්නේ, නාම කයින් සුවය විඳියි. 'උපෙක්ෂා ඇති, සිහි ඇති, සුව වුසුම් ඇති යේ යැ' යි යමක්හු ඇරැබැ ආර්යයෝ කියත් ද, ඒ තුන්වැනි ධ්‍යානයට පැමිණ වෙසෙයි; සුඛවෙදනාව ද බැහැරැ කිරීමෙන්, දුක් වේදනාව ද බැහැර කිරීමෙන් පළමුවෙන් ම සොම්නස් දොම්නසුන් පහ වැ යෑමෙන්, සුව ද දුක් ද නොවන, උපෙක්ෂායෙන් සිදධ වූ සිහියැ පිරිසිදු බව ඇති චතුර්ථ ධ්‍යානයට පැමිණ වෙසෙයි.

සමාධිභාවනා සතරෙක: ඇවැත්නි, යමෙක් භාවිත වූයේ (වඩන ලද්දේ) බහුලීකෘත වූයේ (බහුල කොට කරන ලද්දේ) මෙ අත්බවහි ම සුව වුසුම පිණිස පවත්තේ ද එසේ වූ සමාධිභාවනාවෙක් ඇත; යමෙක් භාවිත වූයේ බහුලීකෘත වූයේ දර්ශනඥානය ලබනු පිණිස පවත්නේ ද එසේ වූ සමාධිභාවනාවෙක් ඇත; යමෙක් භාවිත වූයේ බහුලීකෘත වූයේ සිහි නුවණ පිණිස පවත්තේ ද එසේ වූ සමාධිභාවනාවෙක් ඇත; යමෙක් භාවිත වූයේ බහුලීකෘත වූයේ ආස්‍රවයන්ගේ ක්ෂයය පිණිස පවත්නේ ද එසේ වූ සමාධිභාවනාවෙක් ඇත.

ඇවැත්නි, කවර සමාධිභාවනාවෙක් භාවිත වූයේ බහුලීකෘත වූයේ මෙ අත්බවහි සුව වුසුම පිණිස පවතී ද? යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමේ කාමයන් ගෙන් වෙන් ව ම, අකුසල් දහමුන් ගෙන් වෙන් ව ම විතර්කසහිත ... ප්‍රථම ධ්‍යානයට ... ද්විතිය ධ්‍යානයට... තෘතිය ධ්‍යානයට චතුර්ථ ධ්‍යානයට පැමිණ වෙසේ. ඇවැත්නි, මෙ සමාධිභාවනාව භාවිත වූයේ බහුලීකෘත වූයේ මෙ අත්බවහි සුව වුසුම පිණිස පවතී.

ඇවැත්නි, කවර සමාධිභාවනාවෙක් භාවිත වූයේ බහුලීකෘත වූයේ දර්ශනඥානය (දිවැස් නුවණ) ලබනු පිණිස පවත්තේ ද? යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමේ තමා දහවල් දුටු ආලොකය යම් සේ නම් එසේ ම එය රාත්‍රියෙහි ද, රාත්‍රියෙහි දුටු ආලොකය යම්සේ නම් එසේ ම එය දහවල් ද යි (හිරු පහන් ආදීන් ගේ ආලොකය අරමුණු කොට) ආලොක සංඥව මෙනෙහි කෙරෙයි, දහවලැ යි සංඥව සිතැ පිහිටුවයි. මෙසේ නොවැසුණු (විවෘත වූ) හාත්පසැ නොබැඳුණු සිතින් ආලොක සහිත ධ්‍යාන සිත වඩයි. ඇවැත්නි, මෙ සමාධිභාවනාව භාවිත වූයේ බහුලීකෘත වූයේ දර්ශනඥානය (දිවැස්නුවණ) ලබනු පිණිස පවතී.

කතමා චාවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා සතිසම්පජඤ්ඤාය සංවත්තති? ඉධාවුසො භික්ඛුනො විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති, විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති, විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. අයං ආවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා සතිසම්පජඤ්ඤාය සංවත්තති.

කතමා චාවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති? ඉධාවුසො භික්ඛු පඤ්චසු උපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති. ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො. ඉති වෙදනා -පෙ- ඉති සඤ්ඤා -පෙ- ඉති සංඛාරා -පෙ- ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමො. අයං ආවුසො සමාධිභාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති.

**චතස්සො අප්පමඤ්ඤා**: ඉධාවුසො භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන[1] ඵරිත්වා විහරති -පෙ- කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති.

**චත්තාරො ආරුප්පං**[2] ඉධාවුසො භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණන්ති' විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති.

---

1. අබ්‍යාපජ්ඣෙන (PTS ස්‍යා, කම)
2. අරූපා (PTS ස්‍යා, කම)

ඇවැත්නි, කවර සමාධිභාවනාවෙක් භාවිත වූයේ, බහුලීකෘත වූයේ, ස්මෘතිසම්ප්‍රජානනය පිණිස පවත්නේ ද? යත්. මහණෙනි, මෙහි මහණහු විසින් වේදනාවෝ දන්නා ලද්දහු උපදිත්, දන්නා ලද්දහු එළැඹැ සිටිත්, දන්නා ලද්දහු නැසීමට යෙත්; සංඥාවෝ දන්නා ලද්දහු උපදිත්, දන්නා ලද්දහු එළැඹැ සිටිත්, දන්නා ලද්දහු නැසීමට යෙත්: විතර්කයෝ දන්නා ලද්දහු උපදිත්, දන්නා ලද්දහු එළැඹැ සිටිත්, දන්නා ලද්දහු නැසීමට යෙත්. ඇවැත්නි, මේ සමාධිභාවනාව භාවිත වූයේ, බහුලීකෘත වූයේ, ස්මෘතිසම්ප්‍රජානනය පිණිස පවතී.

ඇවැත්නි, කවර සමාධිභාවනායෙක් භාවිත වූයේ, බහුලීකෘත වූයේ, ආශ්‍රවයන්ගේ ක්ෂයය පිණිස පවත්නේ ද? යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමේ 'රූපය මෙසේ ය, රූපයේ ඉපැද්ම මෙසේ ය, රූපයේ වැනැස්ම මෙසේ ය, වේදනාව මෙසේ ය, වේදනාවේ ඉපැද්ම මෙසේ ය, වේදනාවේ වැනැස්ම මෙසේ ය, සංඥව මෙසේ ය ... සංස්කාරයෝ මෙසේ ය... විඥනය මෙසේ ය, විඥනයේ ඉපැද්ම මෙසේ ය, විඥනයේ වැනැස්ම මෙසේ යැ' යි උපාදනස්කන්ධ පසෙහි උදය ව්‍යයය (ඉපැද්ම හා වැනැස්ම) අනුව දක්නේ වෙසෙයි. ඇවැත්නි, මේ සමාධිභාවනාව භාවිත වූයේ, බහුලීකෘත වූයේ ආශ්‍රවයන්ගේ ක්ෂයය පිණිස පවතී.

අප්‍රාමාණ්‍යයෝ සතර දෙනෙක: ඇවැත්නි, මෙහි මහණ තෙමේ මෙත් සහගිය සිතින් එක් දෙසක් පැතිරගෙන වෙසෙයි, එසේ දෙවෙනි දෙස එසේ තෙවෙනි දෙස, එසේ සතරවැනි දෙස පැතිරගෙන වෙසෙයි. මෙ පරිද්දෙන් උඩ යට සරස යන හැම තන්හි සියලු සතුන් තමාට සමතායෙන්, සියලු සතුන් ගෙන් යුත් සත්වලොකය (පැතිරීම් වශයෙන්) විපුල වූ, (භූමිවශයෙන්) මහද්ගත වූ අප්‍රමාණ සතුන් අරමුණු කොටැති, සතුරන් නැති, ව්‍යාපාද (වෛර) නැති, මෙත් සහගත සිතින් පැතිරගෙන වෙසෙයි ... කරුණා සහගත සිතින් ... මුදිතා සහගත සිතින් .. උපෙක්ෂා සහගත සිතින් එක් දෙසක් පැතිරගෙන වෙසෙයි. එසේ දෙවෙනි දෙසක්, එසේ තෙවෙනි දෙස, එසේ සතරවැනි දෙස පැතිරගෙන වෙසෙයි. මෙ පරිද්දෙන් උඩ යට සරස යන හැම තන්හි සියලු සතුන් තමාට සමතායෙන්, සියලු සතුන්ගෙන් යුත් සත්වලොකය විපුල වූ, මහද්ගත වූ, අප්‍රමාණ සතුන් අරමුණු කොටැති, සතුරන් නැති, ව්‍යාපාද නැති උපෙක්ෂාසහගත සිතින් පැතිරගෙන වෙසෙයි.

ආරූප්‍ය සතරෙක: මහණෙනි, මෙහි මහණ තෙමේ හැම ලෙසින් රූපසංඥවන් ඉක්මීමෙන්, ප්‍රතිඝසංඥාවන් දුරු වීමෙන්, නානාත්වසංඥවන් නොමෙනෙහි කිරීමෙන්, 'ආකාශය අනන්ත යැ' යි ආකාසානඤ්චායතන සමාධියට පැමිණ වෙසෙයි, හැම පරිද්දෙන් ආකාසානඤ්චායතනය ඉක්මැ 'විඥානය අනන්ත යැ' යි විඤ්ඤණඤ්චායතන සමාධියට පැමිණ වෙසෙයි, හැම පරිද්දෙන් විඤ්ඤණඤ්චායතනය ඉක්මැ 'කිසිත් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතන සමාධියට පැමිණ වෙසෙයි, හැම පරිද්දෙන් ආකිඤ්චඤ්ඤායතන සමාධිය ඉක්මැ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියට පැමිණ වෙසෙයි.

චත්තාරි අපසෙනානි: ඉධාවුසො භික්ඛු සඞ්ඛායෙකං පටිසෙවති, සඞ්ඛායෙකං අධිවාසෙති, සඞ්ඛායෙකං පරිවජ්ජෙති සඞ්ඛායෙකං විනොදෙති.

චත්තාරො අරියවංසා: ඉධාවුසො භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන, ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච, චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච චීවරං න පරිතස්සති, ලද්ධා ච චීවරං අගථිතො[1] අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තාය ච පන ඉතරීතරචීවරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති න පරං වම්භෙති යො හි තත්ථ දක්ඛො හොති අනලසො සම්පජානො පතිස්සතො. අයං වුච්චතාවුසො භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතොති.

පුන ච පරං ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච පිණ්ඩපාතහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච පිණ්ඩපාතං න පරිතස්සති, ලද්ධා ච පිණ්ඩපාතං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති න පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො හොති අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චතාවුසො භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතොති.

1. අගධිතො (මජසං)

අපස්සෙන (අපශ්‍රයණ) සතරෙක: මහණෙනි, මෙහි මහණ තෙමේ නුවණින් දැන සෙවනය කළ යුතු එක ම සෙවියි, නුවණින් දැන ඉවැසියැ යුතු එක ම ඉවසයි, නුවණින් දැන ඉවත් කළ යුතු එක ම ඉවත් කෙරෙයි, නුවණින් දැන දුරු කළ යුතු එක ම දැය දුරු කෙරෙයි.

ආර්යවංශ ධර්ම සතරෙක: මහණෙනි, මෙහි මහණ තෙමේ ඉතරෙතර චීවරයෙන් (ලැබුණු යම් කවර හෝ සිවුරෙකින්) සතුටු වෙයි. ලැබුණු කවර හෝ සිවුරෙකින් සතුටු වීමෙහි ගුණ කියන සුලු ද වෙයි, සිවුර හේතු කොට ගෙන නො සුදුසු වූ අනේෂණයකට නො පැමිණෙයි, සිවුරක් නො නොලැබීමෙන් ද නො කලකිරෙයි. සිවුරක් ලැබ ද ලොභයෙන් නො ගැටගැසුණේ (අධික තෘෂ්ණායෙන්) මුසපත් නොවූයේ, (තෘෂ්ණා යෙන්) නොබැඳුණේ (අනෙෂණයෙන් ප්‍රත්‍යයලැබීමෙහිත් තෘෂ්ණායෙන් බැඳී පරිභොග කිරීමෙහිත්) දෙස් දක්නා සුලු වූයේ, (ශුද්‍ර ශීත නැසීම පිණිසය යන ආදීන් පස්විකීම වශයෙන්) නිඃශරණප්‍රඥා ඇත්තේ පරිභොග කෙරෙයි. ඒ ඉතරෙතරචීවර සන්තොෂයෙන් තමා හුවා නො දක්වයි, මෙරමා හෙලා නො දකී. හේ වූ කලි ඒ චීවරසන්තොෂයෙහි ව්‍යක්ත වූයේ, අනලස් වූයේ, මනා නුවණින් දන්නේ, එළැඹ සිටි සිහි ඇත්තේ වෙයි. ඇවැත්නි, මේ මහණ තෙමේ පැරැණි වූ අග්‍ර යැ යි දන්නා ලද, ආර්යවංශ ධර්මයෙහි සිටියේ යැ යි කියනු ලැබේ.

ඇවැත්නි, තව ද මහණ තෙමේ ඉතරෙතර පිණ්ඩපාතයෙන් (යම් කවර හෝ ලැබුණු බොජුනෙකින්) තෘප්ත වෙයි, ඉතරෙතර පිණ්ඩපාත යෙන් තෘප්ත වීමෙහි ගුණ කියන සුලු ද වෙයි, පිණ්ඩපාතය හේතු කොට ගෙන නොසුදුසු අනෙෂණයකට නො පැමිණෙයි, පිණ්ඩපාතය නො ලැබීමෙන් ද නො කලකිරෙයි, පිණ්ඩපාතය ලැබ ද ලොභයෙන් නො ගැට ගැසුණේ, අධික තෘෂ්ණායෙන් මුස පත් නො වූයේ, (තෘෂ්ණායෙන්) නො බැඳුණේ, එහි දෙස් දක්නා සුලු වූයේ, නිඃශරණ ප්‍රඥා ඇත්තේ පරිභොග කෙරෙයි, ඒ ඉතරෙතර පිණ්ඩපාත සන්තෝෂයෙන් තමා හුවා නො දක්වයි, මෙරමා හෙලා නො දකී. හේ වූ කලි ඒ පිණ්ඩපාත සන්තොෂයෙහි ව්‍යක්ත වූයේ, අනලස් වූයේ, මනා නුවණින් දන්නේ, එළැඹ සිටි සිහි ඇත්තේ වෙයි. ඇවැත්නි, මේ මහණ තෙමෙ පැරැණි වූ, අග්‍ර යැ යි දන්නා ලද, ආර්යවංශ ධර්මයෙහි සිටියේ යැ යි කියනු ලැබේ.

පුන ච පරං ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච සෙනාසනහෙතු අනෙසනං අප්පටිරූපං ආපජ්ජති, අලද්ධා ච සෙනාසනං න පරිතස්සති ලද්ධා ච සෙනාසනං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති න පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො හොති අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චතාවුසො භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතොති.

පුන ච පරං ආවුසො භික්ඛු පහානාරාමො හොති පහානරතො භාවනාරාමො හොති භාවනාරතො, තාය ච පන පහානාරාමතාය පහානරතියා භාවනාරාමතාය භාවනාරතියා නෙව අත්තානුක්කංසෙති න පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො, පතිස්සතො, අයං වුච්චතාවුසො භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතොති.

චත්තාරි පධානානි: සංවරපධානං, පහානපධානං, භාවනපධානං[1], අනුරක්ඛනපධානං[2].

කතමඤ්චාවුසො සංවරපධානං? ඉධාවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා-පෙ-මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. ඉදං වුච්චතාවුසො සංවරපධානං.

1. භාවනාප්පධානං (ස්‍යා), භාවනාපධානං (මජසං)
2. අනුරක්ඛනාප්පධානං (ස්‍යා), අනුරක්ඛනාපධානං (මජසං)
3. ව්‍යන්තිං කරොති (මජසං)

ඇවැත්නි, තව ද මහණ තෙමෙ ඉතරෙතර ශයනාසනයෙන් (ලැබුණු යම් කවර ද සෙනස්නෙකින්) තෘප්ත වෙයි, ඉතරෙතර ශයනාසනයෙන් තෘප්ත වීමෙහි ගුණ කියන සුලු ද වෙයි, ශයනාසන හෙතු කොට ගෙන නොසුදුසු අනෙෂණයකට නො පැමිණෙයි, ශයනාසන නොලැබීමෙන් ද නො කලකිරෙයි, ශයනාසන ලැබ ද එහි (ලොභයෙන්) නො ගැට ගැසුණේ, (අධිකතෘෂ්ණායෙන්) මුසපත් නොවූයේ, (තෘෂ්ණායෙන්) නො බැඳුණේ එහි දෙස් දක්නා සුලු වූයේ, නිඃශරණප්‍රඥා ඇත්තේ පරිභොග කෙරෙයි. ඒ ඉතරෙතර ශයනාසන සන්තොෂයෙන් තමා හුවා නො දක්වයි, මෙරමා හෙලා නො දකී. හේ වූ කලී ඉතරෙතර ශයනාසන සන්තොෂයෙහි ව්‍යක්ත වූයේ, අනලස් වූයේ, මනා නුවණින් දන්නේ, එළැඹසිටි සිහි ඇත්තේ වෙයි. ඇවැත්නි, මේ මහණ පැරැණි වූ අග්‍ර යැ යි දන්නා ලද, ආර්යවංශ ධර්මයෙහි සිටියේ යැ යි කියනු ලැබේ.

ඇවැත්නි, තව ද මහණ තෙමෙ (පංචවිධ) ප්‍රහාණයෙහි ඇලුම් ඇත්තේ, ප්‍රහාණයෙහි ඇලුණේ වෙයි, භාවනායෙහි ඇලුම් ඇත්තේ, භාවනායෙහි ඇලුණේ වෙයි. ඒ ප්‍රහාණාරාමතා හේතුයෙන්, ඒ ප්‍රහාණ රති හෙතුයෙන්, ඒ භාවනාරාමතා හෙතුයෙන්, ඒ භාවනාරති හෙතුයෙන් තමා නො ම හුවා තබයි, මෙරමා නො ම හෙලා දකී. හේ එහි ව්‍යක්ත වූයේ, අනලස් වූයේ මනා නුවණින් දන්නේ, එළැඹ සිටි සිහි ඇත්තේ වෙයි. ඇවැත්නි, මේ මහණ පැරැණි වූ අග්‍රයැ යි දන්නා ලද, ආර්යවංශ ධර්මයෙහි සිටියේ යැ යි කියනු ලැබේ.

ප්‍රධානයෝ (උතුම් වීර්යයෝ) සතර දෙනෙක: සංවරප්‍රධානය ප්‍රහාණප්‍රධානය භාවනාප්‍රධානය අනුරක්ෂණප්‍රධානය යන සතර යැ.

ඇවැත්නි, සංවරප්‍රධාන නම් කවරේ යැ? මහණෙනි, මෙහි මහණ තෙමෙ ඇසින් රූපයක් දැක එහි (කෙලෙස් ඉපැද්මට වස්තු වූ) නිමිත්තක් ගන්නා සුලු නො වෙයි. අනුව්‍යඤ්ජනයක් (හස්ත පාද හෝ සිනහ ආදි ආකාරයක්) ගන්නා සුලු නො වෙයි. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රියයෙහි සංවර නැති වැ වසන තෙල පුහුලා ලාමක අකුශලධර්ම වූ අභිධ්‍යා දෞර්මනස්‍යයෝ ලුහුබඳින්නාහු ද එය හවුරනු පිණිස පිළිපදී, චක්ෂු-රින්ද්‍රිය රැකගනී, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කනින් හඬ අසා ... නාශායෙන් ගඳ ආඝ්‍රාණය කොට ... දිවෙන් රස විඳ ... කයින් ස්ප්‍රෂ්ටව්‍යයක් පැහැස ... මනසින් ධර්මාලම්බනයක් සිතා එහි නිමිති ගන්නා සුලු නො වෙයි. අනුව්‍යංජනයක් ගන්නා සුලු නො වෙයි. යම් කරුණෙකින් මනඉන්ද්‍රියයෙහි සංවර නැති වැ වසන තෙල පුහුලා ලාමක අකුශල ධර්ම වූ අභිධ්‍යාදෞර්මනස්‍යයෝ ලුහුබඳනාහු ද, එය හවුරනු පිණිස පිළිපදී, මන ඉන්ද්‍රියය රැකගනී මන ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. ඇවැත්නි, මෙය සංවරප්‍රධානයැ යි කියනු ලැබේ.

කතමඤ්චාවුසො පහානප්පධානං? ඉධාවුසො භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, උප්පන්නං බ්‍යාපාදවිතක්කං -පෙ- උප්පන්නං විහිංසාවිතක්කං -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. ඉදං වුච්චතාවුසො පහානප්පධානං.

කතමඤ්චා වුසො භාවනප්පධානං? ඉධාවුසො භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිනාමිං -පෙ- ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං: ඉදං වුච්චතාවුසො භාවනප්පධානං.

කතමඤ්චාවුසො අනුරක්ඛනප්පධානං? ඉධාවුසො භික්ඛු උප්පන්නං භද්දකං[1] සමාධිනිමිත්තං අනුරක්ඛති අට්ඨිකසඤ්ඤං පුලවකසඤ්ඤං[2] විනීලකසඤ්ඤං විච්ඡිද්දකසඤ්ඤං උද්ධුමාතකසඤ්ඤං. ඉදං වුච්චතාවුසො අනුරක්ඛනප්පධානං.

චත්තාරි ඤාණානි: ධම්මෙ ඤාණං, අන්වයෙ ඤාණං, පරියායෙ[3] ඤාණං සම්මුතියා ඤාණං.''

අපරානි පි චත්තාරි ඤාණානි: දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදය ඤාණං.

චත්තාරි සොතාපත්තියඞ්ගානි: සප්පුරිසසංසෙවො, සද්ධම්මසවනං, යොනිසො මනසිකාරො, ධම්මානුධම්මප්පටිපත්ති.

චත්තාරි සොතාපන්නස්ස අඞ්ගානි: ඉධාවුසො අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ඉති පි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති.

1. භද්‍රකං (මජසං)
2. පුළවක සඤ්ඤං (මජසං), පුළුවක සඤ්ඤං (PTS, සයා, කම)
3. පරිචෙච (කම), පරිච්ඡෙද (PTS, සයා, කම)

ඇවැත්නි, ප්‍රහාණප්‍රධානය කවරේ ද? මහණෙනි, මෙහි මහණ තෙමේ උපන් කාමවිතර්කය නො ඉවසයි. හැර පියයි බැහැර කෙරෙයි, ක්ෂීණ කෙරෙයි, යළි නො හටගන්නා බවට පමුණුවයි. උපන් ව්‍යාපාදවිතර්කය ...උපන් විහිංසාවිතර්කය ... උපන් උපන් ලාමක අකුසල් දහමුන් නො ඉවසයි, හැරපියයි, බැහැරි කෙරෙයි, ක්ෂීණ කෙරෙයි, යළි නොහටගන්නා බවට පමුණුවයි. ඇවැත්නි, මෙය ප්‍රහාණප්‍රධාන යැ යි කියනු ලැබේ.

ඇවැත්නි, භාවනාප්‍රධානය කවරේ ද? ඇවැත්නි, මෙහි මහණ තෙමේ නුවණින් සලකා විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ, වොස්සග්ගය (ක්ලෙශත්‍යාගයට හා නිවන් පසක් කිරීම) අතට නැඹුරු ව මුහුකුරා යන ස්මෘතිසම්බොධ්‍යඞ්ගය වඩයි ... ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය වඩයි...වීර්ය සම්බොධ්‍යඞ්ගය වඩයි...ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය වඩයි ... ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය වඩයි ... සමාධිසම්බොධ්‍යඞ්ගය වඩයි ... විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, වොස්සග්ගය අතට නැඹුරු වැ මුහුකුරා යන උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය වඩයි. ඇවැත්නි, මෙ භාවනාප්‍රධානයැ යි කියනු ලැබේ.

ඇවැත්නි අනුරක්ෂණප්‍රධානය කවරේ ද? ඇවැත්නි මෙහි මහණ තෙමේ අට්ඨිකසඤ්ඤ ය පුලවකසඤ්ඤ ය විනීලකසඤ්ඤ ය විච්ඡිද්දක සඤ්ඤ ය උද්ධුමාතකසඤ්ඤ ය යන මොවුන්ගේ වශයෙන් උපන් යහපත් සමාධිනිමිත්තය (චිත්තසමාධිය) රකගනී. ඇවැත්නි මෙය අනුරක්ෂණප්‍රධාන යැ යි කියනු ලැබේ.

ඥාන සතරෙක: සිවුසස් පිළිවිදුනා නුවණ, සිවුසස් නුවණ අනුව ගිය නුවණ, පර සිත් දන්නා නුවණ, සම්මතියෙහි නුවණ (උඩ කී තුන් නුවණින් ඉතිරි සියලු නුවණ.)

අන්‍ය වූ ද ඥාන සතරෙක: දුකෙහි නුවණ, දුක් උපදවන හෙතුයෙහි නුවණ, දුඃඛනිරොධයෙහි නුවණ, දුක් නැස්මට යන පිළිවෙත්හි නුවණ

ශ්‍රොත ආපත්‍යඞ්ග (සෝවන් මඟ ලබනුවට කරුණු) සතරෙක: සත්පුරුෂ සේවනය, බණ ඇසීම, උපාය මනස්කාරය, ධර්මානුධර්ම ප්‍රතිපත්තිය.

ශ්‍රොත ආපන්නාඞ්ග (සෝවාන් වූවහුගේ අංග) සතරෙක: ඇවැත්නි, මෙහි ආර්ය ශ්‍රාවකයා බුදුරජු කෙරෙහි 'ඒ භාග්‍යවතුන් වහන්සේ මෙ මෙ කරුණින් අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණ සම්පන්න ය, සුගත ය, ලොකවිත් ය, නිරුත්තර පුරුෂදම්‍යසාරථී ය, දෙව් මිනිස්නට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත් යැ' යි ගුණ දැන පැහැදීමෙන් සමන්විත වෙයි.

ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[1] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි, අට්ඨ පුරිසපුග්ගලා. එස භගවතො සාවකසඞ්ඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤූපසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි.

**චත්තාරි සාමඤ්ඤඵලානි:** සොතාපත්තිඵලං, සකදාගාමිඵලං, අනාගාමිඵලං, අරහත්තඵලං,

**චතස්සො ධාතුයො:** පඨවිධාතු. ආපොධාතු, තෙජොධාතු, වායොධාතු,

**චත්තාරො ආහාරා:** කබළීකාරො ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං.

**චතස්සො විඤ්ඤාණට්ඨිතියො:** රූපූපයං වා ආවුසො විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති, රූපාරම්මණං රූපප්පතිට්ඨං නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති. වෙදනූපයං වා ආවුසො -පෙ- සඤ්ඤූපයං වා ආවුසො -පෙ- සංඛාරූපයං වා ආවුසො විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති, සඞ්ඛාරාරම්මණං සඞ්ඛාරප්පතිට්ඨං නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති.

1. ඔපනෙයියකො (මජසං)

ධර්මය කෙරෙහි 'භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මොනොවට (ත්‍රිවිධ කල්‍යාණාදි විසින්) මොනොවට වදරන ලද්දේ ය. එය තමා විසින් දක්කැ යුතු ය, කල් නොයවා පල දෙන්නේ ය, 'එව, බලව' යි විධානයට සුදුසු ය, භාවනා වශයෙන් තම සිතැ එළැවීමට සුදුසු ය. (උද්ඝාටිතඥාදි නුවණැත්තන් විසින්) තම තමා කෙරෙහි දත යුතු යැ'යි දැන පැහැදීමෙන් සමන්විත වෙයි.

සඞ්ඝයා කෙරෙහි 'පුරුෂ යුගල සතරෙක් වූ, පුරුෂ පුද්ගල අට දෙනෙක් වූ, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ මනා පිළිවෙතට පිළිපන්නේ වෙයි, භාග්‍යවතුන් වහන සේගේ ශ්‍රාවක සංඝ තෙමේ සෘජු වූ පිළිවෙතට පිළිපන්නේ වෙයි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ නිවන් පිණිස පිළිපන්නේ වෙයි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සාමීචි කර්මයට සුදුසු වැ පිළිපන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ දුර සිටැ ද ගෙනවුත් සිල්වත්නට දියැ යුතු දන් පිළිගැන්මට සුදුසු ය, ආගන්තුක දනය පිළිගැන්මට සුදුසු ය, හැමට පළමු ව ගෙනවුත් පිදියැ යුතු දන් පිළිගන්නට සුදුසු ය, දක්ෂිණාව (පරලොව සඳහා දියැ යුතු දන්) පිළිගන්නට සුදුසු ය, දෑහොත් මුදුනැ තබා වැන්දැ යුතු ය, සියලු ලොවට නිරුත්තර පින්කෙත යැ' යි ගුණ දැන පැහැදීමෙන් සමන්විත වෙයි. මුලැ හෝ අගැ නොබුන් සිකපද ඇති, මැදැ නොබුන් සිකපද ඇති, පිළිවෙළින් දෙක තුන බැගින් නොබුන් සිකපද ඇති, අතරතුර නොබුන් සිකපද ඇති, තෘෂ්ණාදසත්වයෙන් මිදුණු බුද්ධාදි විඥයන් විසින් පසස්නා ලද තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ශනය නො කරන ලද, සමාධිය පිණිස පවත්නා, ආර්යයනට ප්‍රිය මනාප වූ ශීලයන්ගෙන් සමන්විත වෙයි.

ශ්‍රාමණ්‍යඵල (මහණකමේ ඵල) සතරෙකි. ශ්‍රොත ආපත්තිඵලය, සකෘදගාමිඵලය, අනාගාමි ඵලය, අර්හත්ත්ව ඵලය.

ධාතු සතරෙක: පෘථිවිධාතුව, ආපොධාතුව, තෙජොධාතුව, වායුධාතුව.

ආහාර සතරෙක: දළ වූ හෝ සියුම් වූ කබලීකාරාහාරය, දෙවෙනි ස්පර්ශාහාරය තෙවෙනි මනස්සඤ්චෙතනාහාරය, සතර වැනි විඥනාහාරය.

විඥනස්ථිතිහු (සිත සිටුනා තැන්) සතර දෙනෙක: ඇවැත්නි, (පඤ්චවොකාර භවයෙහි) රූපස්කන්ධය ඇසුරු කොට, රූපස්කන්ධය ගොදුරු කොටැ රූපස්කන්ධය ප්‍රතිෂ්ඨා කොට, තෘෂ්ණායෙන් තෙමන ලදු වැ අභිසංස්කාර විඥනය එළැඹ සිටිනුයේ සිටී, වැඩීමට වැවීමට මහත් බවට පැමිණේ. ඇවැත්නි, (චතුවොකාර භවයෙහි) වෙදනාස්කන්ධය ඇසුරු කොට ... හෝ සංඥස්කනධය ඇසුරු කොට ... හෝ සංස්කාරස්කන්ධය ඇසුරු කොට, සංස්කාර ස්කන්ධය ගොදුරු කොට, සංස්කාර ස්කන්ධය ප්‍රතිෂ්ඨා කොට තෘෂ්ණායෙන් තෙමන ලදු වැ අභිසංස්කාර විඥනය එළැඹ සිටිනුයේ සිටී, වැඩීමට වැවීමට මහත් බවට පැමිණෙයි.

**චත්තාරි අගතිගමනානි:** ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති.

**චත්තාරො තණ්හුප්පාදා:** චීවරහෙතු වා ආවුසො භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, පිණ්ඩපාතහෙතු වා ආවුසො භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, සෙනාසනහෙතු වා ආවුසො භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, ඉතිභවාභවහෙතු වා ආවුසො භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති.

**චතස්සො පටිපදා:** දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා.

අපරා පි **චතස්සො පටිපදා:** අක්ඛමා පටිපදා, ඛමා පටිපදා, දමා පටිපදා, සමා පටිපදා,

**චත්තාරි ධම්මපදානි:** අනභිජ්ඣා ධම්මපදං, අබ්‍යාපාදො ධම්මපදං, සම්මාසති ධම්මපදං, සම්මාසමාධි ධම්මපදං.

**චත්තාරි ධම්මසමාදානානි:** අත්ථාවුසො ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිඤ්ච දුක්ඛවිපාකං, අත්ථාවුසො ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං, අත්ථාවුසො ධම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකං, අත්ථාවුසො ධම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිං ච සුඛවිපාකං.

**චත්තාරො ධම්මක්ඛන්ධා:** සීලක්ඛන්ධො, සමාධික්ඛන්ධො, පඤ්ඤාක්ඛන්ධො, විමුත්තික්ඛන්ධො.

**චත්තාරි බලානි:** විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං.

**චත්තාරි අධිට්ඨානානි:** පඤ්ඤාධිට්ඨානං, සච්චාධිට්ඨානං, චාගාධිට්ඨානං, උපසමාධිට්ඨානං.

**චත්තාරි[1] පඤ්හබ්‍යාකරණානි:** එකංසබ්‍යාකරණීයො පඤ්හො, පටිපුච්ඡාබ්‍යාකරණීයො පඤ්හො, විභජ්ජබ්‍යාකරණීයො පඤ්හො, ඨපනීයො පඤ්හො.

---

1. චත්තාරො පඤ්හාබ්‍යාකරණා (PTS. ස්‍යා. කම්)

අගතිගමන සතරෙක: ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මෝහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යේ.

තෘෂ්ණෝත්පාද (තෘෂ්ණාව උපදනා අරමුණු) සතරෙක: ඇවැත්නි, මහණහට සිවුරු නිසා හෝ තෘෂ්ණාව උපදිනුයේ උපදී, පිණ්ඩපාතය නිසා හෝ මහණහට තෘෂ්ණාව උපදිනුයේ උපදී, සෙනසුන් නිසා හෝ මහණහට තෘෂ්ණාව උපදිනුයේ උපදී, ප්‍රත්‍යයයෙහි ප්‍රණීත බව් ප්‍රණීතතර බව් ආදි හේතුයෙන් ද මහණහට තෘෂ්ණාව උපදිනුයේ උපදී.

ප්‍රතිපත්ති සතරෙක: ලැසි වැ පැමිණෙන මාර්ගඥනය ඇති දුක සේ පිළිපදනා පිළිවෙත ය, වහා ලබන මාර්ගඥනය ඇති දුකසේ පිළිපදනා පිළිවෙත ය, ලැසි වැ ලබන මාර්ගඥනය ඇති සුව සේ පිළිපදනා පිළිවෙත ය, වහා ලබන මාර්ගඥනය ඇති සුව සේ පිළිපදනා පිළිවෙත යි.

අන්‍ය ද ප්‍රතිපත්ති සතරෙක: (ප්‍රධන් වීර්ය වැඩීමෙහි දී) ශීතාදිය නො ඉවසන බව ඇති පිළිවෙතය, ශීතාදිය ඉවසන බව ඇති පිළිවෙත ය, ඉන්ද්‍රිය දමන සංඛ්‍යාත පිළිවෙතය, අකුශල විතර්ක සංසිඳුවීම නැමැති පිළිවෙතයි.

ධර්මපද (දහම් කොටස්) සතරෙක: අනභිධ්‍යා නම් වූ දහම් කොටස ය, අව්‍යාපාද නම් වූ දහම් කොටස ය, සම්‍යක්ස්මෘති නම් වූ දහම් කොටස ය, සම්‍යක් සමාධි නම් වූ දහම් කොටස යි.

ධර්මසමාදන සතරෙක: ඇවැත්නි, වත්මන්හි දුක් සහිත වූ ද මත්තෙහි ද දුක් විපාක ගෙන දෙන ධර්මසමාදනයෙක් ඇත. වත්මන්හි දුක් ඇති මත්තෙහි සැප විපාක ගෙන දෙන ධර්මසමාදනයෙක් ඇත, වර්තමානයෙහි සුව ඇති, මත්තෙහි දුක් ගෙන දෙන ධර්මසමාදනයෙක් ඇත, වත්මන්හි සුව ඇති මත්තෙහි ද සුව ගෙන දෙන ධර්මසමාදනයෙක් ඇති.

ධර්මස්කන්ධ සතරෙක: ශීලගුණය (ඵලශීලය), සමාධිගුණය (ඵලසමාධිය), ප්‍රඥගුණය (ඵලප්‍රඥව), විමුක්තිගුණය (ඵලවිමුක්තියි).

බල සතරෙක: වීර්ය බලය, ස්මෘතිබලය, සමාධිබලය, ප්‍රඥබලයි.

අධිෂ්ඨාන (ගුණාධික පුරුෂයන් සිටුනා තැන්) සතරෙක: ප්‍රඥධිෂ්ඨානය (රහත්පල නුවණ), සත්‍යාධිෂ්ඨානය (සත්‍ය වචනය), ත්‍යාගාධිෂ්ඨානය (ආමිෂ පරිත්‍යාගය), උපශමාධිෂ්ඨානයි (කෙලෙස් සංසිඳුවීම).

ප්‍රශ්නව්‍යාකරණ සතරෙක: එකාන්තයෙන් විසැඳියැ යුතු ප්‍රශ්නය, පිළිවිසැ විසැඳියැ යුතු ප්‍රශ්නය, බෙදැ විසැඳියැ යුතු ප්‍රශ්නය, (නොවිසඳා) තබාලියැ යුතු ප්‍රශ්නයි.

චත්තාරි කම්මානි: අත්ථාවුසො කම්මං කණ්හං කණ්හවිපාකං, අත්ථාවුසො කම්මං සුක්කං සුක්කවිපාකං, අත්ථාවුසො කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං. අත්ථාවුසො කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති.

චත්තාරො සච්ඡිකරණීයා ධම්මා: පුබ්බෙනිවාසො සතියා සච්ඡිකරණීයො, සත්තානං චුතූපපාතො චක්ඛුනා සච්ඡිකරණීයො, අට්ඨ විමොක්ඛා කායෙන සච්ඡිකරණීයා, ආසවානං ඛයො පඤ්ඤාය සච්ඡිකරණීයො.

චත්තාරො ඔඝා: කාමොඝො, භවොඝො, දිට්ඨොඝො, අවිජ්ජොඝො.

චත්තාරො යොගා: කාමයොගො, භවයොගො, දිට්ඨියොගො, අවිජ්ජායොගො.

චත්තාරො විසඤ්ඤොගා: කාමයොගවිසඤ්ඤොගො, භවයොගවිසඤ්ඤොගො, දිට්ඨියොගවිසඤ්ඤොගො, අවිජ්ජායොගවිසඤ්ඤොගො.

චත්තාරො ගන්ථා: අභිජ්ඣා කායගන්ථො, බ්‍යාපාදො කායගන්ථො, සීලබ්බතපරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො.

චත්තාරි උපාදානානි: කාමුපාදානං, දිට්ඨුපාදානං, සීලබ්බතුපාදානං, අත්තවාදුපාදානං.

චතස්සො යොනියො: අණ්ඩජයොනි, ජලාබුජයොනි, සංසෙදජයොනි, ඔපපාතිකයොනි.

කර්ම සතරෙක: ඇවැත්නි, කළු වූ කළු විපාක ඇති කර්මයෙක් (දශ අකුශල කර්මපථය) ඇත. ඇවැත්නි, සුදු වූ සුදු විපාක ඇති කර්මයෙක් (කුශලකර්මපථය) ඇත. ඇවැත්නි, කළු සුදු මිශ්‍ර වූ ද කළු සුදු විපාක ඇත්තාවූ ද කර්මයෙක් (සුවදුක් දෙන මිශ්‍ර කර්මයෙක්) ද ඇත. ඇවැත්නි, කළු නොවූ ද සුදු නොවූ ද කළු සුදු විපාක නැති යමෙක් කර්මක්ෂයය පිණිස පවත්නේ ද එබඳු වූ කර්මයෙක් (සතර මාර්ගඥානය) ඇති.

සාක්ෂාත්කරණීය ධර්ම සතරෙක: පූර්වෙනිවාසය (පෙර වුසූ කඳ පිළිවෙළ) සිහියෙන් පසක් කළ යුතු, සත්වයන්ගේ ච්‍යුති උපපත්ති දෙක දිවැසින් පසක් කළ යුතු, විමොක්ෂ අට සහජාත නාම කයින් පසක් කළ යුතු. ආශ්‍රවයන් ගේ ක්ෂයය රහත්පල නුවණින් පසක් කළ යුතු.

ඔඝ (මහවතුරු) සතරෙක: කාම ඔඝය (පංචකාමගුණික රාගය), භව ඔඝය (රූපාරූපභවයන්හි ඡන්දරාගය), දෘෂ්ටි ඔඝය (දෙසැට මිස දිටු), අවිද්‍යා ඔඝය.

යොග (සතුන් සසර යොදන බඳින අකුසල්) සතරෙක: කාමයොගය, භවයොගය, දෘෂ්ටියොගය අවිද්‍යායොගයි.

විසංයොග (බැඳුම් ලිහැලුම්) සතරෙක: කාමයෝග විසංයොගය (අශුභධ්‍යානයත් එය පාදක කොට ලැබූ අනාගාමි මාර්ගයත්), භවයොගවිසංයොගය (රහත්මඟ), දෘෂ්ටියොග විසංයොගය (සෝවාන් මඟ), අවිද්‍යායොග විසංයොගයි (රහත්මඟ).

ග්‍රන්ථ (සසර නාමරූපයන් ගැට ගසන බඳින අකුසල්) සතරෙක: අභිධ්‍යාව (නාම කය හා රූප කය හා සසර ගැට ගසන) කාය ග්‍රන්ථයෙක, ව්‍යාපාදය කායග්‍රන්ථයෙක, ශීලව්‍රත දෘෂ්ටි කොට ගැන්ම කාය ග්‍රන්ථයෙක, මෙය ම සත්‍ය යැ යි සෙස්ස හිස් යැ යි පැවැති දෘෂ්ටි දෘෂ්ටිග්‍රාහය කායග්‍රන්ථයෙක.

උපාදාන (ගැනුම්) සතරෙක: කාමොපාදානය (රාග නැමැති ග්‍රහණය), දෘෂ්ට්‍යුපාදානය (මිථ්‍යාදෘෂ්ටි නැමැති ග්‍රහණය), ශීලව්‍රතොපාදානය (ශීලව්‍රතයෙන් ගැන්ම), ආත්මවාදෙපාදානය (ආත්මදෘෂ්ටිග්‍රහණය).

යොනි (කොටස්) සතරෙක: අණ්ඩජ යොනිය (බිජුවටැ උපන් සත්ව වර්ගයා), ජලාබුජ යොනිය (දලබුයෙහි උපන් සත්ව වර්ගයා), සංස්වෙදජ යොනිය (ඇතුළත උණුහුමක් ඇති තැන උපන් සත්ව වර්ගයා) ඔපපාතික යොනිය (වෙගයෙන් අවුත් පැන්නවුන් බඳු වැ සොළොස් විය පත්තවුන් සේ වහා පහළ වන අත් බැව් ඇති සත්ව වර්ගයා.)

**චතස්සො ගබ්භාවක්කන්තියො:** ඉධාවුසො එකච්චො අසම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, අසම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, අසම්පජානො මාතුකුච්ඡිම්හා නික්ඛමති. අයං පඨමා ගබ්භාවක්කන්ති.

පුන ච පරං ආවුසො ඉධෙකච්චො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, අසම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, අසම්පජානො මාතුකුච්ඡිම්හා නික්ඛමති. අයං දුතියා ගබ්භාවක්කන්ති.

පුන ච පරං ආවුසො ඉධෙකච්චො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, සම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, අසම්පජානො මාතුකුච්ඡිම්හා නික්ඛමති. අයං තතියා ගබ්භාවක්කන්ති.

පුන ච පරං ආවුසො ඉධෙකච්චො සම්පජානො චෙව මාතුකුච්ඡිං ඔක්කමති, සම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, සම්පජානො මාතුකුච්ඡිම්හා නික්ඛමති. අයං චතුත්ථා ගබ්භාවක්කන්ති.

**චත්තාරො අත්තභාවපටිලාභා:** අත්ථාවුසො අත්තභාවපටිලාභො යස්මිං අත්තභාවපටිලාභෙ අත්තසඤ්චෙතනා යෙව කමති නො පරසඤ්චෙතනා. අත්ථාවුසො අත්තභාවපටිලාභො යස්මිං අත්තභාවපටිලාභෙ පරසඤ්චෙතනා යෙව කමති නො අත්තසඤ්චෙතනා. අත්ථාවුසො අත්තභාවපටිලාභො යස්මිං අත්තභාවපටිලාභෙ අත්තසඤ්චෙතනා චෙව කමති පරසඤ්චෙතනා ච. අත්ථාවුසො අත්තභාවපටිලාභො යස්මිං අත්තභාවපටිලාභෙ නෙව අත්තසඤ්චෙතනා කමති නො පරසඤ්චෙතනා.

**චතස්සො දක්ඛිණාවිසුද්ධියො:** අත්ථාවුසො දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො, අත්ථාවුසො දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො, අත්ථාවුසො දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො, අත්ථාවුසො දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච.

**චත්තාරි සඞ්ගහවත්ථූනි:** දානං, පෙය්‍යවජ්ජං,[1] අත්ථචරියා, සමානත්තතා.

**චත්තාරො අනරියවොහාරා:** මුසාවාදො, පිසුණා වාචා, ඵරුසා වාචා, සම්ඵප්පලාපො.

1. පියවජ්ජං (ස්‍යා, කම)

ගර්භාවක්‍රාන්ති (ගැබැ පිළිසිඳුම්) සතරෙක: ඇවැත්නි, මෙහි ඇතැම් පුද්ගලයෙක් දැනුම් නැත්තේ මවු කුසට බසී, දැනුම් නැත්තේ මවු කුසැ වෙසෙයි, දැනුම් නැත්තේ මවු කුසින් බිහි වෙයි. මේ පළමු ගර්භාවක්‍රාන්තිය ය.

තව ද ඇවැත්නි, මෙහි එක්තරා පුද්ගලයෙක් දැනුම් ඇත්තේ මවු කුසට බසී, දැනුම් නැත්තේ මවු කුසැ වෙසෙයි, දැනුම් නැත්තේ මවු කුසින් බිහිවෙයි. මේ දෙවෙනි ගර්භාවක්‍රාන්තිය ය.

තව ද ඇවැත්නි, මෙහි එක්තරා පුද්ගලයෙක් දැනුම් ඇත්තේ මවු කුසට බසී, දැනුම් ඇත්තේ මවු කුසැ වෙසෙයි, දැනුම් නැත්තේ මවු කුසින් බිහිවෙයි. මේ තෙවෙනි ගර්භාවක්‍රාන්තිය ය.

තව ද ඇවැත්නි, මෙහි එක්තරා පුද්ගලයෙක් දැනුම් ඇත්තේ ම මවු කුසට බසී, දැනුම් ඇත්තේ ම මවු කුසැ වෙසෙයි, දැනුම් ඇත්තේ ම මවු කුසින් බිහි වෙයි. මේ සතර වන ගර්භාවක්‍රාන්තිය යි.

ආත්මභාව ප්‍රතිලාභ (අත්බව් ලැබීම්) සතරෙක: යම් අත්බව් ලැබීමෙක ආත්මසංචෙතනාව (තමා විසින් කරන ලද චෙතනාව ම) පවතී ද පරසඤ්චෙතනාව (මනඃප්‍රදූෂක දෙවියන් ගේ සෙයින් අනුන් ගේ චෙතනාව) නො පවතී ද එබඳු අත්බව් ලැබීමෙක් ඇත. ඇවැත්නි, යම් අත්බව් ලැබීමෙක පරසඤ්චෙතනාව ම පවතී ද (ක්‍රීඩාප්‍රදූෂක දෙවියන්ගේ සෙයින්) ආත්මසඤ්චෙතනාව නොපවතී ද එබඳු අත්බව් ලැබීමෙක් ඇත. ඇවැත්නි, යම් අත්බව් ලැබීමෙක ආත්මසංචේතනාවත් පවතී ද පරසංචේතනාවත් පවතී ද එසේ වූ අත්බව් ලැබීමෙක් ඇත. ඇවැත්නි, යම් අත්බව් ලැබීමෙක ආත්මසංචේතනාවත් නො පවතී ද පරසංචේතනාවත් නො ම පවතී ද එසේ වූ ආත්ම ප්‍රතිලාභයෙක් ඇත.

දක්ෂිණා විශුද්ධි (දනය පිරිසිදු කරන, මහත් පල කරන කරුණු) සතරෙක: ඇවැත්නි, පිළිගන්නහුගෙන් නොව දයකයාගෙන් පිරිසිදු වන දක්ෂිණාවෙක් (දනයෙක්) ඇත, දනයාගෙන් නොව පිළිගන්නහුගෙන් පිරිසිදු වන දක්ෂිණාවෙක් ඇත, දයකයාගෙනුදු පිළිගන්නහුගෙනුදු පිරිසිදු නොවන දක්ෂිණාවෙක් ඇත. දයකයාගෙනුදු පිළිගන්නාහුගෙනුදු පිරිසිදුවන දක්ෂිණාවෙක් ඇත.

සංග්‍රහවස්තු සතරෙකි: දනය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව.

අනාර්ය (ලාමකයන් ගේ) ව්‍යවහාර සතරෙකි: බොරුකීම, කේලාම් කීම, පරොස් බස් බිණීම, හිස් බස් දෙඩීම.

චත්තාරො අරියවොහාරා: මුසාවාදා වෙරමණී,[1] පිසුණාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී.

අපරෙ පි චත්තාරො අනරියවොහාරා: අදිට්ඨෙ දිට්ඨවාදිතා, අස්සුතෙ සුතවාදිතා, අමුතෙ මුතවාදිතා, අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා.

අපරෙ පි චත්තාරො අරියවොහාරා: අදිට්ඨෙ අදිට්ඨවාදිතා, අස්සුතෙ අස්සුතවාදිතා, අමුතෙ අමුතවාදිතා, අවිඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා.

අපරෙ පි චත්තාරො: අනරියවොහාරා. දිට්ඨෙ අදිට්ඨවාදිතා, සුතෙ අස්සුතවාදිතා, මුතෙ අමුතවාදිතා, විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා.

අපරෙ පි චත්තාරො අරියවොහාරා: දිට්ඨෙ දිට්ඨවාදිතා, සුතෙ සුතවාදිතා, මුතෙ මුතවාදිතා, විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා.

චත්තාරො පුග්ගලා: ඉධාවුසො එකච්චො පුග්ගලො අත්තන්තපො හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො, ඉධාවුසො එකච්චො පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගමනුයුත්තො, ඉධාවුසො එකච්චො පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො, ඉධ පනාවුසො එකච්චො පුග්ගලො නෙව අත්තන්තපො හොති න අත්තපරිතාපනානුයොගමනුයුත්තො න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො. සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති.

අපරෙ පි චත්තාරො පුග්ගලා: ඉධාවුසො එකච්චො පුග්ගලො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය, ඉධාවුසො එකච්චො පුග්ගලො පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය, ඉධාවුසො එකච්චො පුග්ගලො නෙව අත්තහිතාය පටිපන්නො හොති න පරහිතාය, ඉධාවුසො එකච්චො පුග්ගලො අත්තහිතාය චෙව පටිපන්නො හොති පරහිතාය ච.

1. වෙරමණි (කෙසුවි)

ආර්ය (සත්පුරුෂයන්ගේ) ව්‍යවහාර සතරෙකි: මුසවායෙන් වැළැක්ම, කේලාම් කීමෙන් වැළැක්ම, පරොස් බසින් වැළැක්ම, හිස් බස් දෙඩුමෙන් වැළැක්ම.

අන්‍ය ද අනාර්ය ව්‍යවහාර සතරෙක: නො දුටු දැයෙහි දක්නා ලදැ යි කියන බව, නො ඇසූ දැයෙහි අසන ලදැ යි කියන බව, අමුතයෙහි (ආඝ්‍රාණ ආස්වාදන ස්පර්ශන නො කළ දැයෙහි) මුත යැ යි (ආඝ්‍රාණ ආස්වාදන ස්පර්ශන කරන ලදැ යි) කියන බව, අවිඥතයෙහි (නො සිතූ දැයෙහි) සිතන ලදැ යි කියන බව.

අන්‍ය ද ආර්යව්‍යවහාර සතරෙක: නොදුටු දැයෙහි නො දක්නා ලදැ යි කියන බව, නො ඇසුණු දැයෙහි නො ඇසිණැ යි කියන බව, අමුතයෙහි අමුත යැ යි කියන බව, අවිඥතයෙහි අවිඥත යැ යි කියන බව.

අන්‍ය ද ආර්ය ව්‍යවහාර සතරෙක: දුටු දැයෙහි දක්නා ලදැ යි කියන බව, ඇසූ දැයෙහි අසන ල ැ යි කියන බව, මුතයෙහි මුත යැ යි කියන බව, විඥතයෙහි විඥත යැයි කියන බව.

පුද්ගලයෝ සතර දෙනෙක: ඇවැත්නි, මෙහි එක්තරා පුඟුලෙක් ආත්මපරිතාපනානුයොගයෙහි (තමා තැවීමෙහි) යෙදුණේ ආත්මන්තප වෙයි, ඇවැත්නි, මෙහි එක්තරා පුඟුලෙක් පරපරිතාපනානුයොගයෙහි (අනුන් තැවීමෙහි) යෙදුණේ පරන්තප වෙයි. ඇවැත්නි, මෙහි එක්තරා පුඟුලෙක් ආත්මපරිතාපනානුයොගයෙහි යෙදුණේ ආත්මන්තප ද පරපරිතා-පනානුයොගයෙහි යෙදුණේ පරන්තප ද වෙයි. ඇවැත්නි, මෙහි එක්-තරා පුද්ගලයෙක් ආත්මපරිතාපනානු යොගයෙහි නො යෙදුණේ ආත්මන්තප ද නො වෙ පරපරිතාපනානුයොගයෙහි නො යෙදුණේ පරන්තප ද නො වේ. හේ ආත්මන්තප නො වූයේ (තමා නො තවනුයේ), පරන්තප ද නො වූයේ (අනුන් නො තවනුයේ) මෙ අත්බවිහි ම තෘෂ්ණා නැත්තේ, කෙලෙස් නිවීමෙන් නිවුණේ, සිසිල් වූයේ (ධ්‍යාන සැප මාර්ග-සැප, ඵල සැප, නිවන් සැප යන) සුව විඳුනා සුලු වූයේ බ්‍රහ්මභූත වූ ආත්මයෙන් (ශ්‍රෙෂ්ඨ වූ සිතින්) යුක්ත ව වෙසෙයි.

අන්‍ය වූ ද පුද්ගලයෝ සතර දෙනෙක: ඇවැත්නි, මෙහි එක්තරා පුඟුලෙක් තමහට මිස පරහට වැඩ පිණිස පිළිපන්නේ නොවෙයි, ඇවැත්නි, මෙහි එක්තරා පුඟුලෙක් පරහට මිස තමහට වැඩ පිණිස පිළිපන්නේ නො වෙයි. ඇවැත්නි, මෙහි එක්තරා පුඟුලෙක් තමහට ද පරහට ද වැඩ පිණිස පිළිපන්නේ නො වෙයි. ඇවැත්නි, මෙහි එක්තරා පුඟුලෙක් තමහට ද, පරහට ද වැඩ පිණිස පිළිපන්නේ වෙයි.

අපරෙ පි චත්තාරො පුග්ගලා: තමොතමපරායනො, තමොජොතිපරායනො, ජොතිතමපරායනො, ජොතිජොතිපරායනො.

අපරෙ පි චත්තාරො පුග්ගලා: සමණමචලො, සමණපදුමො, සමණපුණ්ඩරීකො, සමණෙසු සමණසුඛුමාලො.

ඉමෙ ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

### පඤ්චකං

11. අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඤ්ච ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං න විවදිතබ්බං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං, තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

කතමෙ පඤ්ච: පඤ්චක්ඛන්ධා- රූපක්ඛන්ධො, වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සංඛාරක්ඛන්ධො, විඤ්ඤාණක්ඛන්ධො.

පඤ්චුපාදනක්ඛන්ධා: රූපුපාදනක්ඛන්ධො,[2] වෙදනුපාදනක්ඛන්ධො, සඤ්ඤුපාදනක්ඛන්ධො, සංඛාරුපාදනක්ඛන්ධො, විඤ්ඤාණුපාදනක්ඛන්ධො,

පඤ්ච කාමගුණා: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා.

---

1. ඨිතිභූතො (කෙහුචි)
2. රූපුපාදනක්ඛන්ධො (මජසං)

අන්‍ය වූ ද පුද්ගලයෝ සතරදෙනෙක: අඳුරු වූයේ අඳුර ම පර ලොවැ ගතිය කොටැති (අඳුරින් අඳුරට යන) පුහුලාය, අඳුරු වූයේ එළිය පරලොව් ගතිය කොටැති (අඳුරෙන් එළියට යන) පුහුලා ය, එළිමත් වූයේ අඳුර පරලොව ගතිය කොටැති (එළියෙන් අඳුරට යන) පුහුලා ය, එළිමත් වූයේ එළියම පරලොව් ගතිය කොටැති (එළියෙන් එළියට යන) පුහුලා ය.

අන්‍ය වූ පුද්ගලයෝ සතර දෙනෙක: අචලශ්‍රමණයා ය (සෝවාන් මහණ ය), ශ්‍රමණපද්මය හෙවත් පියුමක් බඳු මහණ ය (සකෘදගාමී මහණ ය), ශ්‍රමණපුණ්ඩරිකය හෙවත් හෙළ පියුමක් බඳු මහණ ය (අනාගාමී මහණය), ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ සුකුමාර ය හෙවත් සියුමැලි මහණ ය (රහත් මහණ තෙමේ ය.)

ඇවැත්නි, මොහු දන්නා දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට ම වදරන ලද සතර ධර්මයෝය. එය ... දෙව් මිනිස්නට යහපත පිණිස, වැඩ පිණිස, සුව පිණිස සියල්ලන් විසින් ම සමග වැ ගැයියැ යුතු.

### පඤ්චකය

11. ඇවැත්නි, දන්නා දක්නා අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද පඤ්ච ධර්ම කෙනෙක් ඇත. යම්සේ මේ සස්නා දීර්ඝ කාලයක් පැවැතිය හැකි වන්නේ ද, බොහෝ කලක් සිටිය හැකි වන්නේ ද එසේ වනු පිණිස, එහි තොප සියලු දෙනා ම විසින් සමග වැ ගැයියැ යුතු, විව ද නො කළ යුතු. එය බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පාව පිණිස, දෙව් මිනිස්නට යහපත පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය.

කවර පඤ්ච ධර්ම කෙනෙක් ද යත්: ස්කන්ධ පසෙක– රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධයි.

උපාදනස්කන්ධ පසෙක: රූපොපාදනස්කන්ධය, වෙදනොපාදනස්කන්ධය, සංඥෙපාදනස්කන්ධය, සංස්කාරොපාදනස්කන්ධය, විඥනොපාදනස්කන්ධයි.

කාමගුණ (කාම කොටස්) පසෙක: චක්ෂුර්විඥනයෙන් දත යුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මන වඩන්නා වූ ප්‍රියස්වභාවය ඇති කාම නිඃශ්‍රිත වූ ඇලුම් කටයුතු වූ රූපයෝ ය, ශ්‍රොත්‍ර විඥනයෙන් දත යුතුවූ ... ශබ්දයෝ ය, ඝ්‍රාණ විඥනයෙන් දත යුතු වූ ... ගන්ධයෝ ය, ජිහ්වාවිඥනයෙන් දතයුතු වූ ... රසයෝය, කායවිඥනයෙන් දත යුතු වූ ඉෂ්ට වූ, කාන්ත වූ මන වඩන්නා වූ ප්‍රිය ස්වභාවය ඇති කාම නිඃශ්‍රිත වූ ඇලුම් කටයුතු වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යි.

පඤ්ච ගතියො: නිරයො, තිරච්ඡානයොනි, පෙත්තිවිසයො, මනුස්සා, දෙවා.

පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං, ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං.

පඤ්ච නීවරණානි: කාමච්ඡන්දනීවරණං, බ්‍යාපාදනීවරණං, ථීනමිද්ධනීවරණං, උද්ධච්චකුක්කුච්චනීවරණං, විචිකිච්ඡානීවරණං.

පඤ්චොරම්භාගියානි සංයොජනානි: සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාසො, කාමච්ඡන්දො, බ්‍යාපාදො.

පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි: රූපරාගො, අරූපරාගො, මානො, උද්ධච්චං, අවිජ්ජා.

පඤ්ච සික්ඛාපදානි: පාණාතිපාතා වෙරමණී, අදින්න දනා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, මුසාවාද වෙරමණී, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණී.

පඤ්ච අභබ්බට්ඨානානි: අභබ්බො ආවුසො ඛීණාසවො භික්ඛු සංචිච්ච පාණං ජීවිතා වොරොපෙතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සම්පජානමුසා භාසිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සන්නිධිකාරකං කාමෙ පරිභුඤ්ජිතුං සෙය්‍යථාපි පුබ්බෙ අගාරියභූතො.

පඤ්ච බ්‍යසනානි: ඤාතිබ්‍යසනං, භොගබ්‍යසනං, රොගබ්‍යසනං, සීලබ්‍යසනං, දිට්ඨිබ්‍යසනං. නාවුසො සත්තා ඤාතිබ්‍යසනහෙතු වා භොගබ්‍යසනහෙතු වා රොගබ්‍යසනහෙතු වා කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. සීලබ්‍යසනහෙතු වා ආවුසො සත්තා දිට්ඨිබ්‍යසනහෙතු වා කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.''

ගති (කර්ම කළවුන් යෑ යුතු තැන්) පසෙක: නිරය, තිරිසන් යෝනිය, ප්‍රෙතලෝකය, මිනිස් ලොව, දෙව්ලොව.

මාත්සර්ය (මසුරුබව්) පසෙක: ආවාසමාත්සර්යය, කුලමාත්සර්යය, ලාභමාත්සර්යය, වර්ණමාත්සර්යය, ධර්මමාත්සර්යය.

නීවරණ පසෙක: කාමච්ඡන්දනීවරණය, ව්‍යාපාදනීවරණය, ථීනමිද්ධ නීවරණය, උද්ධච්චකුක්කුච්ච නීවරණය, විචිකිච්ඡානීවරණය.

ඔරම්භාගිය සංයෝජන පසෙක: සත්කායදෘෂ්ටිය, විචිකිත්සාව, ශීලව්‍රතපරාමර්ශය, කාමච්ඡන්දය, ව්‍යාපාදය.

උද්ධම්භාගිය සංයොජන පසෙක: රූපරාගය, අරූපරාගය, මානය, උද්ධච්චය, අවිද්‍යාව.

ශික්ෂාපද (ශික්ෂා කොටස්) පසෙක: ප්‍රාණඝාතයෙන් වැළැක්ම, අදත්තාදානයෙන් වැළැක්ම, කාමමිථ්‍යාචාරයෙන් වැළැක්ම, මුසාවාදයෙන් වැළැක්ම, මත්බවට ද ප්‍රමාදයට ද කාරණ වූ රහමෙර පීමෙන් වැළැක්ම.

අභව්‍ය (නොවියැ හැකි) කරුණු පසෙක: ඇවැත්නි, රහත් මහණ තෙමේ සිතා ප්‍රාණියකු දිවියෙන් තොර කරන්නට නො හැක්කේ ය, රහත් මහණ තෙමේ නො දුන් දෑයක් සොර සිතින් ගන්නට නො හැක්කේ ය, රහත් මහණ මෙවුන්දම් සෙවුනට නො හැක්කේ ය. රහත් මහණ තෙමේ-දන මුසවා තෙපලන්නට නො හැක්කේ ය, රහත් මහණ තෙමේ පෙර ගිහි කාලයෙහි මෙන් රැස් කොට තබා ගෙන කාමවස්තූන් පරිභොග කරන්නට නො හැක්කේ ය.

ව්‍යසන පසෙක: ඥාතිව්‍යසනය, භොගව්‍යසනය, රොගව්‍යසනය, ශීල-ව්‍යසනය, දෘෂ්ටිව්‍යසනය. ඇවැත්නි, සත්වයෝ ඥාතිව්‍යසන හෙයින් හෝ භොගව්‍යසන හෙයින් හෝ රෝග ව්‍යසන හෙයින් හෝ කා බුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ස්ථාන වූ විවස වැ පතිත වන තැන වූ නිරයට නො පැමිණෙත්. ඇවැත්නි, ශීලව්‍යසන හෙයින් හෝ දෘෂ්ටිව්‍යසන (මිථ්‍යාදෘෂ්ටි) හෙයින් හෝ සත්වයෝ කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ, දුකට ස්ථාන වූ විවශ ව පතිත වන තැන වූ නිර-යට පැමිණෙත්.

පඤ්ච සම්පදා: ඤාතිසම්පදා, භොගසම්පදා, ආරොග්‍යසම්පදා, සීලසම්පදා, දිට්ඨිසම්පදා. නාවුසො සත්තා ඤාතිසම්පදාහෙතු වා භොගසම්පදාහෙතු වා ආරොග්‍යසම්පදාහෙතු වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සීලසම්පදාහෙතු වා ආවුසො සත්තා දිට්ඨිසම්පදාහෙතු වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

පඤ්ච ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා: ඉධාවුසො දුස්සීලො සීලවිපන්නො පමාදාධිකරණං මහතිං භොගජානිං නිගච්ඡති. අයං පඨමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුන ච පරං ආවුසො දුස්සීලස්ස සීලවිපන්නස්ස පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුන ච පරං ආවුසො දුස්සීලො සීලවිපන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං අවිසාරදො උපසඞ්කමති මඞ්කුභූතො. අයං තතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුන ච පරං ආවුසො දුස්සීලො සීලවිපන්නො සම්මූළ්හො කාලං කරොති. අයං චතුත්ථො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුන ච පරං ආවුසො දුස්සීලො සීලවිපන්නො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. අයං පඤ්චමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පඤ්ච ආනිසංසා සීලවතො සීලසම්පදාය: ඉධාවුසො සීලවා සීලසම්පන්නො අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති. අයං පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන ච පරං ආවුසො සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

සම්පත් පසෙක: ඥාති සම්පත, භොග සම්පත, ආරොග්‍ය සම්පත, ශීල සම්පත, දෘෂ්ටි සම්පත. ඇවැත්නි, සත්වයෝ ඥාති සම්පත් හෙයින් හෝ භෝග සම්පත් හෙයින් හෝ ආරෝග්‍ය සම්පත් හෙයින් හෝ කා බුත් මරණින් මතු සුවයට ස්ථාන වූ ස්වර්ග ලෝකයට නො පැමිණෙත්. ඇවැත්නි, ශීල සම්පත් හෙයින් හෝ දෘෂ්ටිසම්පත් (සම්‍යග් දෘෂ්ටි) හෙයින් හෝ සත්වයෝ කා බුත් මරණින් මතු සැපට ස්ථාන වූ ස්වර්ග ලෝකයට පැමිණෙත්.

දුසිල්හුගේ ශීලවිපත්තියෙහි (දුසිල්බවේ) දෙස් පසෙක: ඇවැත්නි, මෙහි දුසිල් තෙම ශීලවිපත්තියට පැමිණියේ, ප්‍රමාද කාරණයෙන් මහත් භොග (වස්තු) විනාශයට පැමිණෙයි. මේ දුසිල්හුගේ ශීලවිපත්තියෙහි පළමු දෙස යි.

තව ද අනෙකෙකි. ඇවැත්නි, ශීලවිපත්තියට පැමිණි, දුසිල්හුගේ ලාමක කීර්තිශබ්දයෙක් (අපකීර්තියෙක්) උස් වැ නැඟෙයි. මේ දුසිල්හුගේ ශීලවිපත්තියෙහි දෙවෙනි දෙස ය.

තව ද අනෙකෙක් ඇත. ඇවැත්නි, ශීලවිපත්තියට පැමිණි දුසිල් තෙම කැත් පිරිසක් හෝ බමුණු පිරිසක් හෝ ගැහැවිපිරිසක් හෝ මහණ පිරිසක් හෝ යම් යම් ම පිරිසක් කරා එළැඹෙන්නේ නම් අභීත නො ව (බාන සුලු ව) තෙද නැති ව එළැඹෙයි. මේ දුසිල්හුගේ ශීලවිපත්තියෙහි තුන් වැනි දෙස ය.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, ශීලවිපන්න වූ දුසිල් තෙමේ සිහි මුළා වූයේ කලුරිය කෙරෙයි. මේ දුසිල්හුගේ ශීලවිපත්තියෙහි සතර-වන දෙස ය.

තව ද අනෙකක් කියමි. ඇවැත්නී, සීලවිපන්න වූ දුසිල් තෙම කා බුත් මරණින් මතු සැපයෙන් පහ වූ, දුකට ස්ථාන වූ, විවශ වැ පතිත වන තැන වූ නිරයට පැමිණෙයි. මේ දුසිලහු ගේ ශීලවිපත්තියෙහි පස්වන දෙස යි.

සිල්වත්හුගේ ශීලසම්පත්තියේ අනුසස් පසෙක. ඇවැත්නි, මෙහි සිල්වත් තෙමේ ශීලයෙන් යුක්තවූයේ, නොපමා කරුණින් මහත් භොගරාශියක් ලබයි. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි පළමු වන අනුසස ය.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, ශීලසම්පන්න වූ සිල්වත්හුගේ යහපත් කීර්ත්තිශබ්දයෙක් උස් වැ නැඟෙයි. මේ සිල්වත්හුගේ ශීල-සම්පත්ති දෙවෙනි අනුසස ය.

පුන ච පරං ආවුසො සීලවා සීලසම්පන්නො යඤ්ඤදෙව පරිස උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො. අයං තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන ච පරං ආවුසො සීලවා සීලසම්පන්නො අසම්මූළ්හො කාලං කරොති. අයං චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුන ච පරං ආවුසො සීලවා සීලසම්පන්නො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. අයං පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

චොදකෙන ආවුසො භික්ඛුනා පරං චොදෙතුකාමෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරො චොදෙතබ්බො: කාලෙන වක්ඛාමි නො අකාලෙන, භූතෙන වක්ඛාමි නො අභූතෙන, සණ්හෙන වක්ඛාමි නො ඵරුසෙන, අත්ථසංහිතෙන වක්ඛාමි නො අනත්ථසංහිතෙන, මෙත්තචිත්තෙන[1] වක්ඛාමි නො දොසන්තරෙනා ති. චොදකෙන ආවුසො භික්ඛුනා පරං චොදෙතුකාමෙන. ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරො චොදෙතබ්බො.

පඤ්ච පධානියඞ්ගානි: ඉධාවුසො භික්ඛු සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති, අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය, අසඨො හොති අමායාවී යථාභූතං අත්තානං ආවිකත්තා සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු, ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු, ධම්මෙසු, පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා-දුක්ඛක්ඛයගාමිනියා.

1. මෙත්තාචිත්තෙන (කෙසුචි)

තව ද අනෙකෙකි. ඇවැත්නි, ශීලයෙන් යුත් සිල්වත් තෙමේ කැත් පිරිසකට වේවයි බමුණු පිරිසකට වේවයි ගැහැවි පිරිසකට වේවයි මහණ පිරිසකට වේවයි යම් යම් ම පිරිසක් කරා එළැඹෙන්නේ නම්, අභීත වැ නොදුති වැ එළැඹෙයි. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියේ තෙවෙනි අනුසස ය.

තව ද අනෙකෙකි. ඇවැත්නි, ශීලසම්පන්න වූ සිල්වත් තැනැත්තේ සිහි මුළා නොවූයේ කලුරිය කෙරෙයි. මේ සිල්වත්හුගේ ශීල සම්පත්හි සතරවැනි අනුසස ය.

තව ද අනෙකෙකි. ඇවැත්නි, ශීලයෙන් යුක්ත වූ සිල්වත් තෙමේ කා බුන් මරණින් මතු සැපයට ස්ථාන වූ සගලොවට පැමිණෙයි. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියේ පස්වැනි අනුසස යි.

ඇවැත්නි, මෙරමාහට චෝදනා කරනු රිසි චොදක භික්ෂුහු විසින් ධර්ම පසක් තමා කෙරෙහි එළවා මෙරමාට චොදනා කළ යුතු: සුදුසු කාලයෙහි කියන්නෙමි, නොකල්හි නොකියන්නෙමි යි යන සිත, වූ දැයින් (සත්‍යයෙන්) කියමි, නොවූ දෑයෙකින් නො කියමි යි යන සිත, මොළොක් බසින් කියමි, පරොස් බසින් නො කියමි යි යන සිත, ඔහුට වැඩ කැමැති සිතින් මිස අවැඩ කැමැති සිතෙකින් නො කියන්නෙමි යි යන සිත, මෙත්සිතින් මිස ද්වේෂ සහිත සිතින් නොකියන්නෙමි යන සිත. ඇවැත්නි, මෙරමාහට චෝදනා කරනු රිසි චෝදක මහණහු විසින් මේ ධර්ම පස තමා කෙරෙහි එළවා මෙරමාට චෝදනා කළ යුතු.

ප්‍රාධානිකාඞ්ග (ප්‍රධන් වීර්ය වඩන මහණහු තුළ විය යුතු ගුණාඞ්ග) පසෙක; ඇවැත්නි, මෙහි මහණ තෙම සැදැහැ ඇත්තේ වෙයි. ඒ භගවත් තෙමේ මේ මේ කරුණින් අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණයෙන් හා චරණධර්මයන් ගෙන් සම්පූර්ණ ය, සුගත ය, ලෝකවිදූ ය, නිරුත්තර පුරුෂදම්‍යසාරථි ය, දෙව්මිනිස්නට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත්' යැ යි තථාගතයන් වහන්සේ ගේ බෝධිය (සතර මඟ නුවණ) හදහයි. රෝග නැත්තේ නිදුක් වූයේ, ඉතා ශීත ද නො වූ ඉතා උෂ්ණ ද නො වූ මධ්‍යම වූ, ප්‍රධන් වීර්යය වැඩීමට යෝග්‍ය වූ, සම ලෙස අහර පැසවන උදරාග්නියෙන් යුක්ත වෙයි.

ශාස්තෘන් වහන්සේ කෙරෙහි හෝ නුවණැති සබ්‍රම්සරුවන් කෙරෙහි හෝ තත් වූ පරිදි සිය වරද හෙළි කරන්නේ ශඨ නොවූයේ මායා නැත්තේ වෙයි.

ශක්ති ඇත්තේ, දැඩි උත්සාහ ඇත්තේ, කුසල් දහම්හි බහා නොතැබූ වැර ඇත්තේ, අකුසල් දහමුන් පහ කරනු පිණිස, කුසල් දහමුන් ලැබගැන්ම පිණිස පිරිපුන් වීර්ය ඇත්තේ වෙසෙයි.

පිරිසිදු වූ, කෙලෙසුන් විදුලීමට සමත්, මොනොවට දුක් වැනැසීමට යන නුවණින් යුක්ත වූයේ උදයාස්තගාමිනී ප්‍රඥායෙන් සමන්විතවූයේ, ප්‍රඥාවත් වෙයි.

**පඤ්ච සුද්ධාවාසා:** අවිහා අතප්පා සුදස්සා සුදස්සී අකනිට්ඨා.

**පඤ්ච අනාගාමිනො:** අන්තරාපරිනිබ්බායී, උපහච්චපරිනිබ්බායී, අසංඛාරපරිනිබ්බායී සසංඛාරපරිබ්බායී, උද්ධංසොතො අකනිට්ඨගාමී.

**පඤ්ච චෙතොඛිලා:** ඉධාවුසො භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති. යො සො ආවුසො භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඨමො චෙතොඛිලො.

පුන ච පරං ආවුසො භික්ඛු ධම්මෙ කඞ්ඛාති විචිකිච්ඡති -පෙ- සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති, -පෙ- සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති -පෙ- සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො. යො සො ආවුසො භික්ඛු සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහත-චිත්තො ඛිලජාතො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඤ්චමො චෙතොඛිලො.

**පඤ්ච චෙතසො විනිබන්ධා:** ඉධාවුසො භික්ඛු කාමෙසු අවිගතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. යො සො ආවුසො භික්ඛු කාමෙසු අවිගතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඨමො චෙතසො විනිබන්ධො.

ශුද්ධාවාස (අනාගාමී ද රහත් ද යන ශුද්ධ පුද්ගලයනට වාසස්ථාන) පසෙක: අවිහය, අතප්පය, සුදස්ස ය, සුදස්සී ය, අකනිට්ඨ ය.

අනාගාමීහු පස් දෙනෙක: අන්තරාපරිනිබ්බායී (ආයු කාලයේ මැදක් ද නො ඉක්මැ අතර දී ම රහත් බවට පැමිණියේ) ය, උපහච්චපරිනිබ්බායී (ආයු කාලයේ මැද කොටස ඉක්මැ රහත් වූයේ) ය, අසඞ්ඛාරපරිනිබ්බායී (වෙහෙස නැති ව සුවසේ රහත් වූයේ) ය, සසඞ්ඛාර පරිනිබ්බායී (උත්-සාහ ඇති ව වෙහෙසී රහත් වූයේ) ය, උද්ධංසොත අකනිට්ඨගාමී (අවිහය පටන් කොට සතර බඹලෝ ඉක්මැ අකනිටාවට ගොස් රහත් වූයේ) ය.

චේතොඛිල (සිතැ තද බව) පසෙක: ඇවැත්නි, මෙහි මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කෙරෙයි, විමති උපදවයි, නිශ්චිත නො වෙයි, නො පහදී. ඇවැත්නි, යම් මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කෙරෙයි ද විමති උපදවයි ද නිශ්චිත නො වෙයි ද නො පහදී ද, ඔහු ගේ සිත වීර්ය කරනුවට, පුන පුනා වීර්යයෙහි යෙදෙනුවට, නිරතුරු වීර්ය වඩනුවට, ප්‍රධන් වීර්ය කරනුවට නො නැමෙයි. යමකු ගේ සිත වීර්ය කරනුවට, පුන පුනා වීර්යයෙහි යෙදෙනුවට නිරතුරු වීර්ය වඩනුවට ප්‍රධන් වීර්ය කරනුවට නො නැමෙයි ද, මෙය පළමු වන චේතොඛිලය යි.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණෙක් (පර්යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධ යන ත්‍රිවිධ) ධර්මයෙහි සැක කෙරෙයි, විමති කෙරෙයි...... (අෂ්ටාර්ය පුද්ගල වූ ආර්ය සංඝයා කෙරෙහි සැක කෙරෙයි, විමති කෙරෙයි ... (අධිශීල අධිචිත්ත අධිප්‍රඥා යන ත්‍රිවිධ) ශික්ෂකයෙහි සැක කෙරෙයි. විමති කෙරෙයි ... සබ්‍රම්සරුන් කෙරෙහි කිපුණේ, නොසතුටු වූයේ, ගැටුණු සිතැත්තේ, හටගත් තද බව ඇත්තේ වෙයි. ඇවැත්නි, යම් මහණෙක් සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නොසතුටු වූයේ ගැටුණු සිතැත්තේ, හට-ගත් තද බව ඇත්තේ වේ ද, ඔහුගේ සිත වීර්ය කරනුවට, පුන පුනා වීර්යයෙහි යෙදීමට, නිරතුරු වීර්ය වඩනුවට, ප්‍රධන් වීර්ය කරනුවට නො නැමෙයි ද. මෙය පස් වනු චේතොඛිලය යි.

චේතොවිනිබන්ධ (සිතේ බැඳුම්) පසෙක: ඇවැත්නි, මෙහි මහණ තෙම කාමයන්හි නො පහ වූ ඇල්ම ඇත්තේ, නො පහ වූ ඡන්දය ඇත්-තේ, නො පහ වූ ප්‍රේමය ඇත්තේ, නො පහ වූ පවස් ඇත්තේ නො පහ වූ දැවිලි ඇත්තේ, නො පහ වූ තෘෂ්ණා ඇත්තේ වෙයි. ඇවැත්නි, යම් මහණෙක් කාමයන්හි නො පහ වූ ඇල්ම ඇත්තේ, නො පහ වූ ඡන්දය ඇත්තේ, නො පහ වූ ප්‍රේමය ඇත්තේ, නො පහ වූ පවස් ඇත්තේ, නො පහ වූ දැවිලි ඇත්තේ, නො පහ වූ තෘෂ්ණා ඇත්තේ වෙයි ද, ඔහු ගේ සිත කෙලෙස් තවන වීර්යය පිණිස, පුන පුනා වීර්ය කරණු පිණිස, නිර-තුරු ව වීර්ය කරනු පිණිස, ප්‍රධන් වඩනු පිණිස නො නැමෙයි. යමකුගේ සිත කෙලෙස් තවන වැර පිණිස, පුන පුනා වැර වඩනු පිණිස, නිරතුරු ව වැර වඩනු පිණිස, ප්‍රධන් වඩනු පිණිස නො නැමෙයි ද, මෙය සිත පිළිබඳ පළමු විනිබන්ධය (සිතේ බැඳීම) වෙයි.

පුන ච පරං ආවුසො භික්ඛු කායෙ අවිගතරාගො හොති -පෙ- රූපෙ අවිගතරාගො හොති -පෙ-

පුන ච පරං ආවුසො භික්ඛු යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරති -පෙ-

පුන ච පරං ආවුසො භික්ඛු අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති 'ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා'ති. යො සො ආවුසො භික්ඛු අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති 'ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා ති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඤ්චමො චෙතසො විනිබන්ධො.

පඤ්චින්ද්‍රියානි: චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං.

අපරානි පි පඤ්චින්ද්‍රියානි: සුඛින්ද්‍රියං, දුක්ඛින්ද්‍රියං, සොමනස්සින්ද්‍රියං, දොමනස්සින්ද්‍රියං, උපෙක්ඛින්ද්‍රියං.

අපරානි පි පඤ්චින්ද්‍රියානි: සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං.

පඤ්ච නිස්සරණියා ධාතුයො: ඉධාවුසො භික්ඛුනො කාමෙ මනසිකරොතො කාමෙසු චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති නෙක්ඛම්මං ඛො පනස්ස මනසිකරොතො නෙක්ඛම්මෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං විසංයුත්තං කාමෙහි, යෙ ච කාමපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා,[2] මුත්තො සො තෙහි, න සො තං වෙදනං වෙදෙති, ඉදමක්ඛාතං කාමානං නිස්සරණං.

1. නිස්සාරණියා (PTS, ස්‍යා, කම්)
2. විඝාත පරිළාහා (ස්‍යා, කම්)

තව ද අනෙකෙක් ඇත. ඇවැත්නි, මහණෙක් සිය කය කෙරෙහි නො පහවූ ඇල්ම ඇත්තේ වෙයි... බාහිර රූපය කෙරෙහි නො පහ වූ ඇල්ම ඇත්තේ වෙයි...

තවද අනෙකෙකි. ඇවැත්නි, මහණෙක් රිසි තාක් කුස පුරා කා යහන් සුවය (සැප පහසු දෙන ඇඳ පුටු පරිහරණය), පාර්ශ්ව සුඛය (සුව පහසු ලැබෙන ලැබෙන සේ ඇලයෙන් ඇලයට පෙරළි පෙරළී හෝනා බව), නිදි සුව යන මෙහි යෙදුණේ වෙසෙයි...

තව ද අනෙකෙකි. ඇවැත්නි, මහණෙක් මේ ශීලයෙන් හෝ ව්‍රත-යෙන් හෝ තපසින් හෝ බඹසරින් මහබලැති දෙවියෙක් හෝ වන්නෙමි, එක්තරා (ස්වල්ප බල ඇති) දෙවියෙක් හෝ වන්නෙමි'යි කියි දෙව-මුළුවෙක ඉපැදීම පතා මහණදම් පුරයි. ඇවැත්නි, මේ ශීලයෙන් හෝ මේ ව්‍රතයෙන් හෝ මේ තපසින් හෝ මේ බඹසරින් මම මහ බලැති දෙවියෙක් හෝ වන්නෙමි, එක්තරා හෝ දෙවියෙක් වන්නෙමි' යි කියි යම් දෙවමුළුවෙකැ ඉපැදීම පතා මහණදම් පුරයි ද, ඔහුගේ සිත කෙලෙස් තවන වැර වඩනු පිණිස, පුන පුනා වැර වඩනු පිණිස, ප්‍රධන් වඩනු පිණිස නො නැමෙයි. මෙය පස්වනු චේතොවිනිබන්ධය ය.

ඉන්ද්‍රිය පසෙක: චක්ෂුරින්ද්‍රියය, ශ්‍රොත්‍රෙන්ද්‍රියය, ඝ්‍රාණෙන්ද්‍රියය, ජිහ්වේන්ද්‍රියය, කායෙන්ද්‍රියය.

අන්‍ය වූ ද ඉන්ද්‍රිය පසෙක: සුඛ ඉන්ද්‍රියය, දුඃඛ ඉන්ද්‍රියය, සෞමනස්‍ය ඉන්ද්‍රියය, දෞර්මනස්‍ය ඉන්ද්‍රියය, උපෙක්ෂා ඉන්ද්‍රියය.

අන්‍ය වූ ද ඉන්ද්‍රිය පසෙක: ශ්‍රද්ධා ඉන්ද්‍රියය, වීර්ය ඉන්ද්‍රියය, ස්මෘති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රියය, ප්‍රඥා ඉන්ද්‍රියය.

නිඃසරණීය (විසංයුක්ත වූ) වෙන් වූ ස්වභාව පසෙක: ඇවැත්නි, මෙහි (අශුභධ්‍යානයෙන් නැගී සිට) කාමයන් මෙනෙහි කරන මහණහුගේ සිත කාමයන්හි නො පිවිසෙයි. (කාමයන්හි) නො පහදියි, නො රැඳෙයි, නො ඇලෙයි. වැලි දු නෙක්ඛම්මය (දශ අශුභයන් වඩා ලබන ප්‍රථම ධ්‍යානය) මෙනෙහි කරන ඔහුගේ සිත නෙක්ඛම්මයෙහි පිවිසෙයි, එහි පහදී, එහි රැඳී සිටී, එහි ඇලෙයි. ඔහුගේ ඒ සිත (අරමුණෙහි) මනා ව ගියේ, මොනොවට වැඩුණේ, කාමයන් කෙරෙන් මොනොවට නැඟී සිටියේ, මොනොවට මිදුණේ, කාමයන් කෙරෙන් වෙන් වූයේ වෙයි. කාමයන් හෙතු කොට ගෙන යම් ආශ්‍රව කෙනෙක්, යම් දුක් කෙනෙක්, යම් කාම දැවිලි කෙනෙක් උපදනාහු ද, ඔවුන් ගෙන් හේ මිදුණේ වෙයි. හේ ඒ (කාම වේදනා ද කාම පරිදාහ වේදනා ද යන ද්විවිධ) වේදනා නො විඳී. මේ (අශුභ ධ්‍යානය) කාමයන්ගේ නිඃසරණයැ (විසංයෝගයැ) යි කියන ලදී.

පුන ච පරං ආවුසො භික්ඛුනො බ්‍යාපදං මනසිකරොතො බ්‍යාපාදෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති. අබ්‍යාපාදං ඛො පනස්ස මනසිකරොතො අබ්‍යාපාදෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං විසංයුත්තං බ්‍යාපාදෙන. යෙ ච බ්‍යාපාදපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා මුත්තො සො තෙහි. න සො තං වෙදනං වෙදෙති. ඉදමක්ඛාතං බ්‍යාපාදස්ස නිස්සරණං.

පුන ච පරං ආවුසො භික්ඛුනො විහෙසං මනසිකරොතො විහෙසාය චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති. අවිහෙසං ඛො පනස්ස මනසිකරොතො අවිහෙසාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං විසංයුත්තං විහෙසාය. යෙ ච විහෙසපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා, මුත්තො සො තෙහි. න සො තං වෙදනං වෙදෙති. ඉදමක්ඛාතං විහෙසාය නිස්සරණං.

පුන ච පරං ආවුසො භික්ඛුනො රූපෙ මනසිකරොතො රූපෙසු චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති. අරූපං ඛො පනස්ස මනසිකරොතො අරූපෙ චිත්තං පක්ඛන්දති පසීදති සංතිට්ඨති විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං විසංයුත්තං රූපෙහි. යෙ ච රූපපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා, මුත්තො සො තෙහි න සො තං වෙදනං වෙදෙති. ඉදමක්ඛාතං රූපානං නිස්සරණං,

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, (මෛත්‍රීධ්‍යානයෙන් නැඟී සිට) ව්‍යාපාදය මෙනෙහි කරන භික්ෂුහු ගේ සිත ව්‍යාපාදයෙහි නො පිවිසෙයි, ව්‍යාපාදයෙහි නො පහදී, ව්‍යාපාදයෙහි නොසිටී, ව්‍යාපාදයෙහි නො ඇලෙයි. වැලි දු අව්‍යාපාදය (මෛත්‍රිය) මෙනෙහි කරන ඔහු ගේ සිත අව්‍යාපාදයෙහි (මෛත්‍රීධ්‍යානයෙහි) පිවිසෙයි, එහි සිටියි, එහි ඇලෙයි. ඔහු ගේ ඒ සිත (මෙත් අරමුණෙහි) මනා ව ගියේ, මනා ව වැඩුණේ, (ව්‍යාපාදය කෙරෙන්) මොනොවට නැඟී සිටියේ, (ව්‍යාපාදය කෙරෙන්) මොනොවට මිදුණේ, ව්‍යාපාදය කෙරෙන් වෙන් වූයේ වෙයි. ව්‍යාපාද හේතුයෙන් යම් ආශ්‍රව කෙනෙක්, යම් දුක් කෙනෙක්, යම් යම් පරිදාහ (දැවිලි) කෙනෙක් උපදනාහු නම් ඔවුන් ගෙන් හේ මිදුණේ වෙයි. හේ ඒ (ව්‍යාපාද වේදනා ද එහි විපාක වූ පරිදාහ වේදනා ද යන ද්විවිධ) වේදනා නො විඳී. මෙය ව්‍යාපාදයා ගේ නිඃසරණ යැ (විසංයොගයැ) යි කියන ලදී.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, (කරුණාධ්‍යානයෙන් නැඟී සිට) විහිංසාව මෙනෙහි කරන භික්ෂුහු ගේ සිත විහිංසායෙහි නො පිවිසෙයි, විහිංසායෙහි නො පහදී, විහිංසායෙහි නො සිටී, විහිංසායෙහි නො ඇලෙයි. වැලි අවිහිංසාව (කරුණාව) මෙනෙහි කරන ඔහුගේ සිත අවිහිංසායෙහි (කරුණා ධ්‍යානයෙහි) පිවිසෙයි, එහි සිටියි, එහි ඇලෙයි. ඔහුගේ ඒ සිත (කරුණා අරමුණෙහි) මොනොවට ගියේ, මොනොවට වැඩුණේ (විහිංසාව කෙරෙන්) මොනොවට නැඟී සිටියේ, මොනොවට මිදුණේ මොනොවට වෙන් වූයේ වෙයි. විහිංසා හෙතුයෙන් යම් ආශ්‍රව කෙනෙක්, යම් (විහිංසා වේදනා විහිංසා විපාක පරිදාහ යැ යි) විවිධ වේදනා කෙනෙක් උපදනාහු නම්, හෙ තෙමෙ ඔවුන් කෙරෙන් මිදෙයි. හේ ඒ වේදනා නො විඳී. මෙය විහිංසාව ගේ නිඃසරණයයැ (විසංයොගයයැ) යි කියන ලදී.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි (අරූපධ්‍යානයෙන් නැඟී සිට) රූපයන් මෙනෙහි කරන භික්ෂුහු ගේ සිත රූපයන්හි නො පිවිසෙයි, නො පහදියි, නො සිටියි, නො ඇලෙයි. අරූප ධ්‍යානය මෙනෙහි කරන ඔහු ගේ සිත අරූපධ්‍යානයෙහි පිවිසෙයි, පහදී, සිටියි, ඇලෙයි. ඔහු ගේ ඒ සිත (අරූප අරමුණෙහි) මොනොවට ගියේ, මොනොවට වැඩුණේ, රූපයන් කෙරෙන් මොනොවට නැඟී සිටියේ, මොනොවට මිදුණේ, මොනොවට වෙන් වූයේ වෙයි. රූප හේතුයෙන් යම් ආශ්‍රව කෙනෙක්, දුක් කෙනෙක්, පරිදාහ (දැවිලි) කෙනෙක් උපදනාහු නම්, හෙ තෙමෙ ඒ වේදනා නො විඳී. මෙය රූපයන්ගේ නිඃසරණයැ යි කියන ලදී.

පුන ච පරං ආවුසො භික්ඛුනො සක්කායං මනසිකරොතො සක්කායෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති, සක්කාය-නිරොධං ඛො පනස්ස මනසිකරොතො සක්කායනිරොධෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං, සුවුට්ඨිතං සුවිමුත්තං විසංයුත්තං සක්කායෙන. යෙ ච සක්කායපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා, මුත්තො සො තෙහි න සො තං වෙදනං වෙදෙති. ඉදමක්ඛාතං සක්කායස්ස නිස්සරණං.

පඤ්ච විමුත්තායතනානි: ඉධාවුසො භික්ඛුනො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී. යථා යථා ආවුසො භික්ඛුනො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති. ඉදං පඨමං විමුත්තායතනං.

පුන ච පරං ආවුසො භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී. අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති. යථා යථා ආවුසො භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති සුඛිනො චිත්තං සමාධියති. ඉදං දුතියං විමුත්තායතනං.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, (පලසමවතින් නැඟී සිට) සත්කාය-ය (උපාදානස්කන්ධ පස) මෙනෙහි කරන (ශුෂ්ක විදර්ශක රහත්) මහණු-හට සත්කායයෙහි (පංච උපාදානස්කන්ධයෙහි) සිත නො පිවිසෙයි, නො පහදී, නො සිටී, නො ඇලෙයි. වැලි සත්කාය නිරෝධය (නිවන) මෙනෙහි කරන ඔහු ගේ සිත සත්කාය නිරෝධයෙහි (නිවනෙහි) පිවිසෙයි, පහදී, රැඳී සිටී, ඇලෙයි. ඔහුගේ ඒ සිත (නිවන් අරමුණෙහි) මොනොවට ගියේ, මොනොවට වැඩුණේ, සත්කායය (උපාදානස්කන්ධය) කෙරෙන් මොනො-වට නැඟී සිටියේ, මොනොවට මිදුණේ, විසංයුක්ත (වෙන් වූයේ) වෙයි. සත්කායප්‍රත්‍යයෙන් (උපාදා ස්කන්ධ හේතු කොට ගෙන) යම් ආස්‍රව කෙනෙක්, යම් දුක් කෙනෙක්, යම් පරිදාහ (දැවිලි) කෙනෙක් උපදනාහු නම්, හේ ඔවුන් ගෙන් මිදුණේ වෙයි. මෙය සත්කායයා ගේ නිඃසරණය (උපාදන ස්කන්ධයන්ගේ විසංයෝගය) යැ යි කියන ලදී.

විමුක්ත්‍යායතන (මිදීමට කරුණු) පසෙක: ඇවැත්නි, මෙහි මහණෙක් හට ශාස්තෘ තෙමේ හෝ ගුරු තන්හි සිටි සබ්රම්සරුවෙක් හෝ දහම් දෙසයි. ඇවැත්නි, ශාස්තෘ තෙමේ හෝ ගුරු තන්හි සිටි සබ්රම්සරුවෙක් හෝ යම් යම් සේ එ මහණහට දහම් දෙසා ද, ඒ ඒ පරිද්දෙන් හෙ තෙම ඒ ධර්මයෙහි අරුත් දනගන්නේ ද වෙයි, පාළිය දනගන්නේ ද වෙයි. අරුත් දන්නා පෙළ දන්නා ඔහුට ප්‍රමෝදය (සතුට) උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිතැත්තහු ගේ නාම කය සංහිඳෙයි. සංහිඳුණු නාම කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහු ගේ සිත එකඟ වෙයි. මේ පළමු විමුක්ත්‍යා-යතනය යැ.

තව ද අනෙකෙකි. ඇවැත්නි, මහණකුහට ශාස්තෘ තෙමේ දහම් නො ම දෙසයි, ගුරුතන්හි වූ අන් සබ්රම්සරුවෙකුත් දහම් නො ම දෙසයි. එතෙකුදු වුවත් ඇසූ පරිදි පුහුණු කළ පරිදි ඒ ධර්මය විස්තර වශයෙන් අනුනට දෙසයි. ඇවැත්නි, මහණ යමසේ යමසේ තමා ඇසූ පරිදි පුහුණු කළ පරිදි විස්තර වශයෙන් අනුනට දහම් දෙසන්නේ ද එසේ එසේ හේ ඒ ධර්මයෙහි අරුත් දනගන්නේ ද පෙළ දනගන්නේ ද වෙයි. අරුත් දනගන්නාවූ පෙළ දනගන්නාවූ ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී, ප්‍රීතියට පැමිණි සිතැත්තහු ගේ නාම කය සංහිඳේ. සංහුන් නාම කය ඇත්තේ සුව විඳී. සුව විඳින්නහු ගේ සිත එකඟ වෙයි. මෙ දෙවෙනි විමුක්ත්‍යායතනය යැ.

පුන ච පරං ආවුසො භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති. යථා යථාවුසො භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති. ඉදං තතියං විමුත්තායතනං.

පුන ච පරං ආවුසො භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති, අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති. යථා යථා ආවුසො භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති සුඛිනො චිත්තං සමාධියති. ඉදං චතුත්ථං විමුත්තායතනං.

පුන ච පරං ආවුසො භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, නාපි යථා සුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති, අපි ච ඛ්වස්ස අඤ්ඤතරං සමාධිනිමිත්තං සුග්ගහිතං හොති සුමනසිකතං, සූපධාරිතං සුප්පටිවිද්ධං පඤ්ඤාය, යථා යථා ආවුසො භික්ඛුනො අඤ්ඤතරං සමාධිනිමිත්තං සුග්ගහිතං හොති සුමනසිකතං සූපධාරිතං සුප්පටිවිද්ධං පඤ්ඤාය, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති. ඉදං පඤ්චමං විමුත්තායතනං.

තව ද අනෙකෙකි. ඇවැත්නි, මහණහුහට ශාස්තෘ තෙමේ හෝ අන් කිසි ගුරු තන්හි වූ සබ්‍රම්සරුවෙක් හෝ නො ම දහම් දෙසයි. ඇසූ පරිදි පුහුණු කළ පරිදි අනුනට විස්තර වශයෙන් දහම් නො ද දෙසයි. එතෙ- කුදු වුවත් ඇසූ පරිදි පුහුණු කළ පරිදි ධර්මය විස්තරයයෙන් සජ්ඣායය කෙරෙයි (පුන පුනා කියයි). ඇවැත්නි, මහණ තෙමේ ඇසූ පරිදි පුහුණු කළ පරිදි මේ පරිද්දෙන් යම් සේ ධර්මය විස්තරයෙන් සජ්ඣායය කෙරෙයි ද එසේ එසේ හේ එ දහමෙහි අරුත් දැනගන්නේ ද පෙළ දැනගන්නේ ද වෙයි. අරුත් දැනගන්නා පෙළ දැනගන්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිය උපන් සිතැත්තහු ගේ නාම කය සංහිඳෙයි. සංහුන් නාම කය ඇත්තේ සුව විඳී. සුව විඳිනාහු ගේ සිත එකඟ වෙයි. මේ තෙවෙනි විමුක්ත්‍යායතනය යැ.

තව ද අනෙකෙකි. ඇවැත්නි, ශාස්තෘ තෙමේ හෝ ගුරුතන්හි වූ කිසි සබ්‍රම්සරුවෙක් හෝ නො ම දහම් දෙසයි. ඇසූ පරිදි පුහුණු කළ පරිදි ධර්මය විස්තරයෙන් අනුනට නො ද දෙසයි. ඇසූ පරිදි පුහුණු කළ පරිදි ධර්මය විස්තරයෙන් නො ද සජ්ඣායනාය කෙරෙයි. වැලි, ඇසූ පරිදි පුහුණු කළ පරිදි ධර්මය සිතින් පුන පුනා කල්පනා කෙරෙයි, පුන පුනා විමසයි, පුන පුනා සිතින් සලකා බලයි. ඇවැත්නි, ඇසූ පරිදි පුහුණු කළ පරිදි ධර්මය යම්සේ යම්සේ පුන පුනා සිතින් කල්පනා කෙරේ ද, පුන පුනා විමසා ද, පුන පුනා සිතින් බලා ද, එසේ එසේ හෙ තෙම ඒ ධර්මයෙහි අරුත් දැනගන්නේ ද පෙළ දැනගන්නේ ද වෙයි. අරුත් දැනගන්නා පෙළ දැනගන්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතියට පැමිණි සිතැත්තහු ගේ නාම කය සංසිඳෙයි. සංසුන් නාම කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහු ගේ සිත එකඟ වෙයි. මේ සතර වන විමුක්ත්‍යායතනය යැ.

තව ද අනෙකෙකි. ඇවැත්නි, ශාස්තෘ තෙමේ හෝ ගුරු තන්හි සිටි කිසි සබ්‍රම්සරුවෙක් හෝ මහණහට නො ම දහම් දෙසයි, මහණ තෙම දහම ඇසූ පරිදි පුහුණු කළ පරිදි විස්තරයෙන් නො ද දෙසයි. ඇසූ පරිදි පුහුණු කළ පරිදි දහම විස්තර විසින් නො ද සජ්ඣායනාය කෙරෙයි. ඇසූ පරිදි පුහුණු කළ පරිදි ධර්මය සිතින් පුන පුනා නො ම කල්පනා කෙරෙයි, නො ම විමසයි, පුන පුනා සිතින් නො ද බලයි. වැලිදු ඔහු විසින් එක්තරා සමාධියෙක් (ගුරුහු ගෙන් කමටහන් උගන්නා හා ම) මොනොවට උගන්නා ලද්දේ, මොනොවට මෙනෙහි කරන ලද්දේ, ප්‍රඥා- යෙන් මොනොවට සලකා බලන ලද්දේ, මොනොවට පිළිවිදිනා ලද්දේ වෙයි. ඇවැත්නි, යම් යම් පරිද්දෙන් මහණහු විසින් එක්තරා සමාධියෙක් මොනොවට උගන්නා ලද්දේ, මොනොවට මෙනෙහි කරන ලද්දේ, ප්‍රඥායෙන් මොනොවට සලකා බලන ලද්දේ, මොනොවට පිළිවිදිනා ලද්දේ වේ ද, ඒ ඒ පරිද්දෙන් හෙ තෙම ඒ ධර්මයෙහි අරුත් දන්නේ ද පෙළ දන්නේ ද වෙයි. අරුත් දන්නා, පෙළ දන්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතියට පත් සිතැත්තහු ගේ නාම කය සංහිඳේ. සංහුන් නාම කය ඇත්තේ සුව විඳී. සුව විඳිනාහු ගේ සිත එකඟ වෙයි. මේ පස්වන විමුක්ත්‍යායතනය යැ.

පඤ්ච විමුත්තිපරිපාචනියා සඤ්ඤා: අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා.

ඉමෙ ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඤ්ච ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

ඡක්කං

12. අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන ඡ ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙ හෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමෙ ඡ:

ඡ අජ්ඣත්තිකානි ආයතනානි: චක්ඛායතනං, සොතායතනං, ඝානායතනං. ජිව්හායතනං, කායායතනං, මනායතනං.

ඡ බාහිරානි ආයතනානි: රූපායතනං, සද්දයතනං, ගන්ධායතනං, රසායතනං. ඵොට්ඨබ්බායතනං, ධම්මායතනං.

ඡ විඤ්ඤාණකායා: චක්ඛුවිඤ්ඤාණං, සොතවිඤ්ඤාණං, ඝානවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං, කායවිඤ්ඤාණං, මනොවිඤ්ඤාණං.

ඡ ඵස්සකායා: චක්ඛුසම්ඵස්සො, සොතසම්ඵස්සො, ඝානසම්ඵස්සො, ජිව්හාසම්ඵස්සො, කායසම්ඵස්සො, මනොසම්ඵස්සො.

ඡ වෙදනාකායා: චක්ඛුසම්ඵස්සජා වෙදනා, සොතසම්ඵස්සජා වෙදනා, ඝානසම්ඵස්සජා වෙදනා, ජිව්හාසම්ඵස්සජා වෙදනා, කායසම්ඵස්සජා වෙදනා, මනොසම්ඵස්සජා වෙදනා.

ඡ සඤ්ඤාකායා: රූපසඤ්ඤා, සද්දසඤ්ඤා, ගන්ධසඤ්ඤා, රසසඤ්ඤා, ඵොට්ඨබ්බසඤ්ඤා, ධම්මසඤ්ඤා.

**විමුක්තිපාරිපාචනීය** (රහත් බව මුහුකුරුවන) සංඥ පසෙක: අනිත්‍ය සංඥව (අනිත්‍යානුදර්ශන ඥනයෙහි උපන් සංඥව) අනිත්‍යයෙහි දුඃඛ-සංඥව (අනිත්‍ය දුය දුක් වශයෙන් දක්නා නුවණෙහි උපන් සංඥව) දුකෙහි අනාත්මසංඥව (දුක් වූ දුය අනාත්ම වශයෙන් දක්නා නුවණෙහි උපන් සංඥව) ප්‍රහාණසංඥව (කෙලෙසුන් ප්‍රහීණ කිරීම පුන පුනා දක්නා නුවණෙහි උපන් සංඥව), විරාග සංඥව (පංචවිධ විරාගය ම අරමුණු කොට උපන් සංඥව).

ඇවැත්නි, මෙසේ ම දන්නා දක්නා අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පස් දෙනෙක් දහම්හු මොනොවට වදරන ලදුහ. එහි සියල්ලන් විසින් ම සමග වැ ගැයීය යුතු ...... එය ...... දෙව් මිනිස්නට යහපත පිණිස වැඩ පිණිස සුව පිණිස වන්නේ ය.

## ෂට්කය

12\. ඇවැත්නි, දන්නා දක්නා අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍ය-වතුන් වහන්සේ විසින් සදෙනෙක් ධර්මයෝ මොනොවට වදරන ලද්දහු ඇත. එහි සියල්ලන් විසින් සමග ව ගැයියැ යුතු ...... එය ...... දෙව් මිනිස්-නට යහපත පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය. කවර ස දෙනෙක් ධර්මයෝ ද යත්:

**ආධ්‍යාත්මික ආයතන** සයෙක: චක්ෂුරායතනය ශ්‍රොත්‍රායතනය, ඝ්‍රාණායතනය, ජිහ්වායතනය, කායායතනය, මන ආයතනය.

**බාහිර ආයතන** සයෙක: රූපායතනය, ශබ්දායතනය ගන්ධායතනය, රසායතනය, ස්ප්‍රෂ්ටව්‍යායතනය, මන ආයතනය.

**විඥනකාය** (විඥනසමූහ) සයෙක: චක්ෂුර්විඥනය, ශ්‍රොත්‍රවිඥනය, ඝ්‍රාණවිඥනය, ජිහ්වාවිඥනය, කායවිඥනය, මනොවිඥනය.

**ස්පර්ශකාය** (ස්පර්ශ සමූහ) සයෙක: චක්ෂුඃ සංස්පර්ශය (ඇස ඇසුරු කළ ස්පර්ශය) ශ්‍රොත්‍රසංස්පර්ශය, ඝ්‍රාණසංස්පර්ශය, ජිහ්වාසංස්පර්ශය, කායසංස්පර්ශය, මනඃසංස්පර්ශය.

**වේදනාකාය** (වේදනා සමූහ) සයෙක: චක්ෂුස්පර්ශයෙන් උපදනා වේදනාව, ශ්‍රොත්‍ර ස්පර්ශයෙන් උපදනා වේදනාව, ඝ්‍රාණස්පර්ශයෙන් උපදනා වේදනාව, ජිහ්වාස්පර්ශයෙන් උපදනා වේදනාව, කායස්පර්ශයෙන් උපදනා වේදනාව, මනඃස්පර්ශයෙන් උපදනා වේදනාව.

**සංඥකාය** සයෙක: රූපසංඥාව, ශබ්දසංඥාව, ගන්ධසංඥාව, රස-සංඥව, ස්ප්‍රෂ්ටව්‍යසංඥව, ධර්මසංඥව.

**ඡ සඤ්චෙතනාකායා:** රූපසඤ්චෙතනා, සද්දසඤ්චෙතනා, ගන්ධසඤ්චෙතනා, රසසඤ්චෙතනා, ඵොට්ඨබ්බසඤ්චෙතනා, ධම්මසඤ්චෙතනා.

**ඡ තණ්හාකායා:** රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා.

**ඡ අගාරවා:** ඉධාවුසො භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සවො, ධම්මෙ අගාරවො විහරති අප්පතිස්සවො, සඞ්ඝෙ අගාරවො විහරති අප්පතිස්සවො, සික්ඛාය අගාරවො විහරති අප්පතිස්සවො, අප්පමාදෙ අගාරවො විහරති අප්පතිස්සවො, පටිසන්ථාරෙ අගාරවො විහරති අප්පතිස්සවො,

**ඡ ගාරවා:** ඉධාවුසො භික්ඛු සත්ථරි සගාරවො විහරති සප්පතිස්සවො, ධම්මෙ සගාරවො විහරති සප්පතිස්සවො, සඞ්ඝෙ සගාරවො විහරති සප්පතිස්සවො, සික්ඛාය සගාරවො විහරති සප්පතිස්සවො, අප්පමාදෙ සගාරවො විහරති සප්පතිස්සවො, පටිසන්ථාරෙ සගාරවො විහරති සප්පතිස්සවො.

**ඡ සොමනස්සූපවිචාරා:** චක්ඛුනා රූපං දිස්වා සොමනස්සට්ඨානියං රූපං උපවිචරති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය සොමනස්සට්ඨානියං ධම්මං උපවිචරති.

**ඡ දොමනස්සූපවිචාරා:** චක්ඛුනා රූපං දිස්වා දොමනස්සට්ඨානියං රූපං උපවිචරති -පෙ- මනසා ධම්මං විඤ්ඤාය දොමනස්සට්ඨානියං ධම්මං උපවිචරති.

**ඡ උපෙක්ඛූපවිචාරා:** චක්ඛුනා රූපං දිස්වා උපෙක්ඛාට්ඨානියං රූපං උපවිචරති -පෙ- මනසා ධම්මං විඤ්ඤාය උපෙක්ඛාට්ඨානියං[1] ධම්මං උපවිචරති.

---

1. උපෙක්ඛාවට්ඨානියං (මජසං)

සඤ්චේතනා සයෙක: රූපසඤ්චේතනා, ශබ්දසංචේතනා, ගන්ධසඤ්චේතනා, රසසඤ්චේතනා, ස්ප්‍රෂ්ටව්‍යසංචේතනා, ධර්මසඤ්චේතනා.

තෘෂ්ණාකාය සයෙක: රූපතෘෂ්ණා, ශබ්දතෘෂ්ණා, ගන්ධතෘෂ්ණා, රසතෘෂ්ණා, ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා, ධර්මතෘෂ්ණා.

අගෞරව සයෙක: ඇවැත්නි, මෙහි මහණෙක් ශාස්තෘහු කෙරෙහි ගෞරව නැත්තේ, යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ධර්මයෙහි ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, සඞ්ඝයා කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ශික්ෂාව කෙරෙහි ගෞරව නැතතේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, අප්‍රමාද ගුණයෙහි ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි. ප්‍රතිසංස්ථාරයෙහි (පිළිසඳරෙහි) ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වෙසෙයි.

ගෞරව සයෙක: ඇවැත්නි, මෙහි මහණ තෙම ශාස්තෘහු කෙරෙහි ගෞරව ඇත්තේ යටත් පැවැතුම් ඇත්තේ වෙසෙයි, ධර්මයෙහි ගෞරව ඇත්තේ යටත් පැවැතුම් ඇත්තේ වෙසෙයි, සඞ්ඝයා කෙරෙහි ගෞරව ඇත්තේ යටත් පැවැතුම් ඇත්තේ වෙසෙයි, ශික්ෂායෙහි ගෞරව ඇත්තේ යටත් පැවැතුම් ඇත්තේ වෙසෙයි, අප්‍රමාදයෙහි ගෞරව ඇත්තේ යටත් පැවතුම් ඇත්තේ වෙසෙයි. ප්‍රතිසංස්ථාරයෙහි (පිළිසඳරෙහි) ගෞරව ඇත්තේ යටත් පැවැතුම් ඇත්තේ වෙසෙයි.

සොමනස්සූපවිචාරයෝ (සොම්නස් සහගත විචාරණයෝ) ස දෙනෙක: ඇසින් රූපයක් දැක සොම්නසට කරුණු වූ රූපයෙකැ යි (කල්පනා කොට) පිරිසිඳි යි, කනින් හඬක් අසා සොම්නසට කරුණු වූ හඬෙකැ යි පිරිසිඳියි. නැහැයෙන් ගඳක් අගා සොම්නසට කරුණු වූ ගඳෙකැ යි පිරිසිඳියි, දිවෙන් රසක් විඳ සොම්නසට කරුණු වූ රසයෙකැ යි පිරිසිඳියි, කයින් හැපෙන දැයක් පැහැසැ සොම්නසට කරුණු වූ සප්‍රෂ්ටව්‍යයෙකැ යි පිරිසිඳියි. මනසින් දහමක් සිතා සොම්නසට කරුණු වූ දහමෙකැ යි පිරිසිඳියි.

දොමනස්සූපවිචාරයෝ (දෙම්නස් සහගිය විචාරණයෝ) සදෙනෙක: ඇසින් රූපයක් දැක දෙම්නසට කරුණුවූ රූපයෙකැ යි පිරිසිඳියි, කනින් හඬක් අසා දෙම්නසට කරුණු වූ හඬෙකැයි පිරිසිඳියි. නැහැයෙන් ගඳක් අගා දෙම්නසට කරුණු වූ ගඳෙකැ යි පිරිසිඳියි, දිවෙන් රසක් විඳ දෙම්නසට කරුණු වූ රසෙකැ යි පිරිසිඳියි, කයින් හැපෙන දැයක් පැහැසැ දෙම්නසට කරුණු වූ සප්‍රෂ්ටව්‍යයෙකැ යි පිරිසිඳියි, මනසින් දහමක් සිතා දෙම්නසට කරුණු වූ දහමෙකැ යි පිරිසිඳියි.

උපෙක්ඛූපවිචාරයෝ (උපෙක්ෂා සහගත විචාරණයෝ) සදෙනෙක: ඇසින් රූපයක් දැක උපෙක්ෂාවට කරුණු වූ රූපයෙකි යි පිරිසිඳි. කනින් හඬක් අසා උපේක්ෂාවට කරුණු වූ හඬෙකැයි පිරිසිඳි, නැහැයෙන් ගඳක් අගා උපේක්ෂාවට කරුණු වූ ගඳෙකැ යි පිරිසිඳි, දිවෙන් රසක් විඳ උපේක්ෂාවට කරුණු වූ රසෙකැ යි පිරිසිඳි. කයින් හැපෙන දැයක් පැහැසැ උපෙක්ෂාවට කරුණු වූ ස්ප්‍රෂ්ටව්‍යයෙකැ යි පිරිසිඳි. මනසින් දහමක් සිතා උපෙක්ෂාවට කරුණු වූ දහමෙකැ යි පිරිසිඳියි.

**ඡ සාරාණීයා ධම්මා:** ඉධාවුසො භික්ඛුනො මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවී[1] චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො, සංගහාය අවිවාදාය අවිහෙසාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛුනො මෙත්තං වචීකම්මං -පෙ-

මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවී චෙව රහො ච, අයම්පි ධම්මො සාරාණීයො -පෙ- එකීභාවාය සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛුනො යෙ තෙ ලාභා ධම්මිකා ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි, තථාරූපෙහි ලාභෙහි අප්පටි-විභත්තභොගී හොති සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී, අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො, සඞ්ගහාය විවාදාය අවිහෙසාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛු යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධි-සංවත්තනිකානි තථාරූපෙසු සීලෙසු සීලසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච, අයම්පි ධම්මො සාරාණීයො -පෙ- එකීභාවාය සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛු යායං දිට්ඨි අරියා නිය්‍යාණිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය, තථා රූපාය දිට්ඨියා දිට්ඨිසාම-ඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය අවිහෙසාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

**ඡ විවාදමූලානි:** ඉධාවුසො භික්ඛු කොධනො හොති උපනාහී. යො සො ආවුසො භික්ඛු කොධනො හොති උපනාහී, සො සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සවො, ධම්මෙ පි අගාරවො විහරති අප්පතිස්ස-වො, සඞ්ඝෙ පි අගාරවො විහරති අප්පතිස්සවො, සික්ඛාය පි න පරිපූරකාරි[2] හොති.

1. ආවි (මජසං)
2. පරිපූරිකාරි (ස්‍යා. කම)

සාරාණීය (සංරඤ්ජනීය) ධර්ම සයෙක: ඇවැත්නි, මෙහි මහණක්-හුගේ මෛත්‍රී සහගත කායකර්මය සබ්‍රම්සරුවන් කෙරෙහි ප්‍රකට ව ද රහසේ ද එළැඹ සිටියේ වෙයි. මේ සාරාණීය ධර්මය ද... ප්‍රිය කරන (ප්‍රිය කටයුත්තකු කරන), ගරුකරන (ගරු කටයුත්තකු කරන) මේ සාරාණීය ධර්මය ද සඟැත්ම පිණිස, අවිවාදය පිණිස, සමගිය පිණිස එකීභාවය (එක්මුතු බව) පිණිස පවතී.

ඇවැත්නි, තව ද මහණක්හු ගේ මෛත්‍රීසහගත වාක්කර්මය...

මෛත්‍රීසහගත මනඃ කර්මය සබ්‍රම්සරුන් කෙරෙහි ප්‍රකට වත් අප්‍රකට වත් එළැඹ සිටියේ වෙයි ද, මේ සාරාණීය ධර්මය ද ප්‍රිය කටයුත්තකු කරන, ගරු කටයුත්තකු කරන, සංග්‍රහය පිණිස, අවිවාදය පිණිස, නොවෙහෙස පිණිස, සමගිය පිණිස, එකීභාවය (එක්මුතුබව) පිණිස පවතී.

තව ද ඇවැත්නි, මහණහට දැහැමි වූ, දැහැමින් ලද, යටත් පිරිසෙයින් පාත්‍රයට අන්තර්ගත ප්‍රමාණ වූ ද යම් ලාභ කෙනෙක් වෙත් ද, එ බඳු වූ ලාභයන්හි ආමිස විසින් ද පුද්ගල විසින් ද බෙදීමක් නැති ව පරිභොග කරනුයේ සිල්වත් සබ්‍රම් සරුවන් හා සාධාරණ පරිභොගී ව වළඳන්නේ වේ ද, මේ සාරාණීය ධර්මය ප්‍රිය කටයුතු බව ඇති කරන, ගරු කටයුතු බව ඇති කරන, සංග්‍රහය පිණිස. අවිවාදය පිණිස, නොවෙහෙස පිණිස, සමගිය පිණිස එකී භාවය (එක්මුතුබව) පිණිස පවතී.

තව ද ඇවැත්නි, අඛණ්ඩ වූ මුලින් හෝ අගින් නොසිඳුණු, අච්ඡිද්‍ර වූ (මැදින් නො සිඳුණු) අසබල වූ (පිළිවෙළින් සිකපද කිහිපයක් නො සිඳුණු) අකල්මාෂ වූ (අතරින් අතර සිකපද සිඳී නොගිය) භුජිෂ්‍ය වූ (තෘෂ්ණාදසත්‍වයෙන් මිදුණු) නුවණැත්තන් විසින් පසස්නා ලද්ද වූ, අපරාමෘෂ්ට වූ (තෘෂ්ණාදෘෂ්ට්‍යාදියෙන් ස්පර්ශ නොකරන ලද), කිසිවකු විසිනුත් දෙෂාරොපණවශයෙන් ගැහැට කළ නොහැකි සේ වූ, සමාධිය පිණිස පවත්නාවූ යම් ශීලධර්ම කෙනෙක් ඇද්ද, මහණ තෙම එසේ වූ ශීල විෂයයෙහි සබ්‍රම්සරුවන් හා ප්‍රකට ව ද අප්‍රකට ව ද ශීලසාමාන්‍යගත ව (ශීලයෙන් සමාන බවට පැමිණියේ) වෙයේ ද, මෙ සාරාණීය ධර්මය ද එකීභාවය (එක-මුතුබව) පිණිස පවතී.

තව ද ඇවැත්නි, ආර්ය වූ නෛර්යාණික වූ යම්දෘෂ්ටියෙක් එය පිළි-පදනාහට මොනොවට දුක් නැසෙනු පිණිස පවතී ද මහණ තෙම එබඳු වූ සම්‍යග්දෘෂ්ටියෙන් සබ්‍රම්සරුවන් හා ප්‍රකට ව ද අප්‍රකට ව ද දෘෂ්ටිසාමාන්‍ය ගත වැ (දෘෂ්ටියෙන් සමාන බවට පැමිණියෙක් වැ) වෙසෙයි ද, මෙ සාරාණීය ධර්මය ද ප්‍රියත්‍වය ඇති කරනුයේ, ගරු කටයුතු බව ඇතිකරනුයේ වෙයි. සංග්‍ර-හය පිණිස අවිවාදය පිණිස, නොවෙහෙස පිණිස, එකීභාවය පිණිස පවතී.

විවාදමූල සයෙක: ඇවැත්නි, මෙහි මහණෙක් කිපෙන සුලු ද වෛර බැඳගන්නා සුලු ද වෙයි. ඇවැත්නි, යම් මහණෙක් කිපෙන සුලුත් වෛර බඳින සුලුත් වේ නම්, හේ ශාස්තෘහු කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ධර්මය කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, සඞසයා කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ශික්ෂාවේ ද පරිපූරකාරී නො වෙයි.

යො සො ආවුසො භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- සික්ඛාය න පරිපූරකාරී, සො සඞ්ඝෙ විවාදං ජනෙති, යො හොති විවාදො බහුජනඅහිතාය බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපඤ්චෙ තුම්හෙ ආවුසො විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ ආවුසො තස්සෙව පාපකස්ස විවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපඤ්චෙ තුම්හෙ ආවුසො විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ ආවුසො තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ, එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස පහානං හොති. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති.

පුන ච පරං ආවුසො භික්ඛු මක්ඛී හොති පළාසී -පෙ- ඉස්සුකී හොති මච්ඡරී -පෙ- සඨො හොති මායාවී -පෙ- පාපිච්ඡො හොති මිච්ඡාදිට්ඨී සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුස්සටිනිස්සග්ගී. යො සො ආවුසො භික්ඛු සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී, සො සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙ පි අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛාය පි න පරිපූරකාරී හොති. යො සො ආවුසො භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙ අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙ අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛාය න පරිපූරකාරී, සො සඞ්ඝෙ විවාදං ජනෙති, යො හොති විවාදො බහුජනඅහිතාය බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපං චෙ තුම්හෙ ආවුසො විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ ආවුසො තස්සෙව පාපකස්ස විවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපං චෙ තුම්හෙ ආවුසො විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ ආවුසො තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස පහානං හොති, එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති.

ඇවැත්නි, යම් මහණෙක් ශාස්තෘහු කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි ද, ධර්මය කෙරෙහි ... සඞ්ඝයා කෙරෙහි යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි ද, ශික්ෂාවෙහි පරිපූරකාරී නො වෙයි ද, හේ සඟ මැද විවාද උපදවයි ද, - යම් විවාදයෙක් බොහෝ දෙනාට අවැඩ පිණිස, බොහෝ දෙනාට නොසැප පිණිස, බොහෝ දෙනාට අනර්ථ පිණිස වේ ද, දෙව්මිනිස්නට අහිත පිණිස දුක් පිණිස වේ ද එ බඳු විවාදයෙකි - ඇවැත්නි, ඉදින් මෙබඳු විවාද මූලයක් තමන් කෙරෙහි හෝ තමන් ගෙන් පිටත්හි හෝ දක්නාහු නම්, ඇවැත්නි, එහි තෙපි ලාමක වූ ඒ විවාද මූලය ම දුරුලනු පිණිස වෑයම් කරවු. ඇවැත්නි, ඉදින් තෙපි මෙබඳු විවාදමූලයක් තමන් කෙරෙහි හෝ බැහැර හෝ නො දක්නාහු නම්, ඇවැත්නි, තෙපි එහි ලාමක වූ ඒ විවාදමූලය ම මත්තෙහි නො හටගැන්ම පිණිස පිළිපදනාහු නම්, මෙසේ මේ ලාමක විවාදමූලයා ගේ ප්‍රහාණය වෙයි, මෙසේ මේ ලාමක විවාද මූලයා ගේ මත්තෙහි නො ඉපැද්ම වෙයි.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණ තෙම මෙරමා ගුණ මකන සුලු වූයේ යුගග්‍රාහී (එකට එක කරන සුලු වූයේ) වේ. ... ඊර්ෂ්‍යා කරන සුලු වූයේ මසුරු වූයේ වේ. ... කෛරාටික වූයේ කළ වරද සඟොවන සුලු වේ. ... තමා කෙරෙහි නැති ගුණයෙහි බුහුමන් කැමැත්තේ මිසදිටු වේ, ... තමා ගත් දෘෂ්ටිය ම දැඩි කොට ගත්තේ දෘඪග්‍රාහී වූයේ ගන්නා ලද්ද බැහැර කරනු නො හැක්කේ වේ. ඇවැත්නි, යම් මහණෙක් තමා ගත් දෘෂ්ටිය ම දැඩි කොට ගත්තේ දෘඪග්‍රාහී වූයේ ගන්නා ලද්ද බැහැර කරනු නො හැක්කේ වේ ද, හේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ධර්මය කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, සඞ්ඝයා කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ශික්ෂායෙහි පරිපූරකාරී නො වෙයි. ඇවැත්නි, යම් මහණෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහිත් ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි ද, ධර්මය කෙරෙහිත් ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි ද, සඞ්ඝයා කෙරෙහිත් ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි ද, ශික්ෂායෙහි පරිපූරකාරීත් නො වෙයි ද, හේ සඞ්ඝයා අතුරෙහි විවාද උපදවයි. යම් විවාදයෙක් බොහෝ දෙනාට අහිත පිණිස, බොහෝ දෙනාට නොසැප පිණිස, බොහෝ දෙනාට අවැඩ පිණිස, දෙව්මිනිස්නට අහිත පිණිස දුක් පිණිස වෙයි ද, එසේ වූ විවාදයෙකි. ඇවැත්නි, ඉදින් තෙපි මෙ බඳු විවාදමූලයක් තමන් කෙරෙහි හෝ බැහැර හෝ දක්නාහු නම්, ඇවැත්නි, එහි තෙපි ඒ ලාමක විවාද මූලය ම දුරු කරනු පිණිස වෑයම් කරවු. ඇවැත්නි, ඉදින් මෙබඳු විවාදමූලයක් තමන් කෙරෙහි හෝ බැහැර හෝ නො දක්නාහු නම්, ඇවැත්නි, තෙපි එහි ඒ විවාද මූලය ම මත්තෙහි නො හට ගන්නා පිණිස පිළිපදිවු. මෙසේ මේ ලාමක වූ විවාදමූලයා ගේ ප්‍රහාණය වේ, මෙසේ මේ ලාමක වූ විවාදමූලයා ගේ මත්තෙහි නො හටගැන්ම වේ.

ඡ ධාතුයො: පඨවිධාතු ආපොධාතු, තෙජොධාතු, වායොධාතු, ආකාසධාතු, විඤ්ඤාණධාතු.

ඡ නිස්සරණීයා ධාතුයො: ඉධාවුසො භික්ඛු එවං වදෙය්‍ය: මෙත්තා හි ඛො මෙ ආවුසො චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. අථ ච පන මෙ බ්‍යාපාදො චිත්තං පරියාදාය තිට්ඨති ති, සො 'මා හෙවන්ති'ස්ස වචනීයො, මා'යස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං මෙත්තාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය; අථ ච පනස්ස බ්‍යාපාදො චිත්තං පරියාදාය ඨස්සති ති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො බ්‍යාපාදස්ස යදිදං මෙත්තා චෙතොවිමුත්ති'ති.

ඉධ පන ආවුසො භික්ඛු එවං වදෙය්‍ය:– කරුණා හි ඛො මෙ ආවුසො චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ විහෙසා චිත්තං පරියාදාය තිට්ඨති ති, සො මා හෙවන්ති'ස්ස වචනීයො: මා'යස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං කරුණාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය අථ ච පනස්ස විහෙසා චිත්තං පරියාදාය ඨස්සතීති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො විහෙසාය යදිදං කරුණා චෙතොවිමුත්ති.

ධාතු සයෙක: පෘථිවි ධාතුව, අබ්ධාතුව, තේජො ධාතුව, වායු ධාතුව, ආකාශ ධාතුව, විඥන ධාතුව.

නිඃශරණීය ධාතු (අකුසලින් නික්මුණු සවභාව) සයෙක: 'ඇවැත්නි, ඒකාන්තයෙන් මා විසින් මෛත්‍රී චිත්තවිමුත්තිය භාවිතය, බහුලී කෘතය, යානයක් බඳු ව කරන ලද්දේ ය. වාස්තුකෘත ය (ප්‍රතිෂ්ඨාවක් කරන ලද්දේ ය). අනුස්ථිත ය (සම්පූර්ණ කරන ලද්දේ ය), පරිචිත ය (පුරුදු කරන ලද්දේ ය), සුසමාරබ්ධ ය (මොනොවට සම්පූර්ණ කරන ලද්දේ ය). එතෙකුදු වුවත් වෙෂය මා සිත මැඩ ගෙන (ක්ෂීණ කොට) සිටී' යැ යි මෙහි මහණෙක් මෙසේ කියන්නේ නම්, හෙතෙම 'මෙසේ කියැ යුතු, වන්නේය. ආයුෂ්මත් තෙමේ මෙසේ නො කියා වා, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නො කෙරේ වා (දෙස් නො නඟා වා), භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන කිරීම (දෙස් නැඟීම) නො මැනැව, භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදරන සේක, ඇවැත්නි, මෛත්‍රී චිත්ත විමුක්තිය (මෙත් වැඩීමෙන් අර්පණා වශයෙන් ලත් ත්‍රික චතුෂ්කධ්‍යාන) භාවිත කරන ලද කල්හි, බහුලීකෘත කල්හි, යානීකෘත කල්හි, වාස්තුකෘත කල්හි, අනුසථිත කල්හි, පරිචිත කල්හි, සුසමාරබ්ධ කල්හි, එසේ කරන ලද නුමුදු ව්‍යාපාදය ඔහුගේ සිත හාත්පසින් ගෙන (හෝ ඔහුගේ කුශල සිත ක්ෂීණ කොට) සිටී යන මෙය නො කරුණෙක, අවකාශ නැති එකෙක. මේ කාරණය නැත්තේ ය, ඇවැත්නි, මෛත්‍රී චිත්ත විමුක්තිය යන යමෙක් ඇද්ද, මෙය ව්‍යාපාදයාගේ නිඃශරණය (නික්මීම) වේ' යැ යි මෙසේ ඔහුට කිය යුතු වන්නේ ය.

'ඇවැත්නි, මා විසින් කරුණා චිත්තවිමුක්තිය භාවිත ය (වඩන ලද්දේ ය), බහුලීකෘත ය (නැවැත නැවැත කරන ලද්දේ ය), යානීකෘත ය (යානයක් මෙන් කරන ලද්දේ ය), වාස්තුකෘත ය (වාස්තුවක් හෙවත් ප්‍රතිෂ්ඨාවක් කරන ලද්දේ ය), අනුෂ්ඨිත ය (පරිපූර්ණ කරන ලද්දේ ය), පරිචිත ය (පුරුදු කරන ලද්දේ ය), සුසමාරබ්ධ ය (මොනොවට වඩන ලද්දේ ය), එතෙකුදු වුවත් විහිංසා චෙතනාව මා සිත හාත්පසින් ගෙන (හෝ මා කුසල් සිත ක්ෂීණ කොට ගෙන) සිටී යැ යි මහණෙක් මෙසේ කියන්නේ නම්, හෙ තෙම මෙසේ කිය යුතු (ඔහුට මෙසේ කියැ යුතු) වන්නේ ය, ආයුෂ්මත් තෙමේ මෙසේ නො කියා වා, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නො කෙරේ වා (දෙස් නො නඟා වා), භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන කිරීම (දෙස් නැඟීම) නො මැනැව, භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදරන සේක. ඇවැත්නි, කරුණා චිත්තවිමුක්තිය වඩන ලද කල්හි, බහුල වශයෙන් කරන ලද කල්හි, යානයක් මෙන් කරන ලද කල්හි, වාස්තුකෘත (ප්‍රතිෂ්ඨාවක් කරන ලද) කල්හි, අනුෂ්ඨිත (පරිපූර්ණ කරන ලද) කල්හි, පුරුදු කරන ලද කල්හි, මොනොවට සම්පූර්ණ කරන ලද කල්හි, එසේ කරන ලද නමුත් විහිංසා චෙතනාව ඔහු ගේ සිත හාත්පසින් ගෙන සිටින්නේ ය යන මෙය නො කරුණෙක, අවකාශ නැත්තෙක. ඇවැත්නි, කරුණාචිත්තවිමුක්තිය යන මෙය විහිංසාව ගේ නිඃශරණය (නික්මීම) යැ' යි (හේ මෙසේ කියැයුතු වන්නේය).

ඉධාවුසො භික්ඛු එවං වදෙය්‍ය: "මුදිතා හි ඛො මෙ ආවුසො චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ අරති චිත්තං පරියාදය තිට්ඨතී"ති සො 'මා හෙවන්ති'ස්ස වචනීයො, මායස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං මුදිතාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, අථ ච පනස්ස අරති චිත්තං පරියාදය ඨස්සතීති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො අරතියා, යදිදං මුදිතා චෙතොවිමුත්ති.

ඉධ පනාවුසො භික්ඛු එවං වදෙය්‍ය: උපෙක්ඛා හි ඛො මෙ ආවුසො චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ රාගො චිත්තං පරියාදය තිට්ඨතී ති, සො 'මා හෙවන්ති'ස්ස වචනීයො, මායස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං උපෙක්ඛාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, අථ ච පනස්ස රාගො චිත්තං පරියාදය ඨස්සතී ති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො රාගස්ස, යදිදං උපෙක්ඛා චෙතොවිමුත්ති.

'ඇවැත්නි, මුදිතා චිත්තවිමුක්තිය මා විසින් වඩන ලද්දේ ය, බොහෝ සෙයින් කරන ලද්දේ ය, යානයක් බඳු කොට කරන ලද්දේ ය, වාස්තු-කෘත ය (ප්‍රතිෂ්ඨාවක් කරන ලද්දේ ය), අනුෂ්ඨිත ය (වඩන ලද්දේ ය), පුරුදු කරන ලද්දේ ය, මොනොවට සම්පූර්ණ කරන ලද්දේ ය, එතෙකුදු වුවත් අරතිය (නො ඇල්ම) මා සිත හාත්පසින් ගෙන සිටී' යැ යි මෙහි මහණෙක් මෙසේ කියන්නේ ද, 'එසේ නො කිය යුතු යැ' යි හෙ තෙම කිය යුතු වන්නේ ය. 'ආයුෂ්මත් තෙමේ එසේ නො කියා වා, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නො කෙරේ වා (දෙස් නො නඟා වා), භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන කිරීම (දෙස් නැඟීම) නො මැනැව. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදරන සේක. ඇවැත්නි, මුදිතා චිත්තවිමුක්තිය වඩන ලද කල්හි, බහුල වශයෙන් කරන ලද කල්හි, යානයක් බඳු කොට කරන ලද කල්හි, වාස්තුකෘත (ප්‍රතිෂ්ඨාවක් කරන ලද) කල්හි, අනුෂ්ඨිත (පරිපූර්ණ) කරන ලද කල්හි, පුරුදු කරන ලද කල්හි, මොනොවට සම්පූර්ණ කරන ලද කල්හි, එසේ කරන ලද නුමුත්, අරතිය ඔහුගේ සිත හාත්පසින් ගෙන සිටින්නේ ය යන මෙය නො කරුණෙක, අවකාශ (කාරණ) නැත්තෙක. මෙ කරුණ නැත්තේ ය. ඇවැත්නි, මුදිතා චිත්තවිමුක්තිය යන යමෙක් ඇද්ද, මෙය අරතියගේ නිඃශරණය යැ' යි මෙසේ හෙ තෙම කියැ යුතු වන්නේ ය (ඔහුට කිය යුතු වන්නේ ය.).

'ඇවැත්නි, උපෙක්ෂා චිත්තවිමුක්තිය වූ කලි මා විසින් වඩන ලද්දේ ය, බහුල වශයෙන් කරන ලද්දේ ය: යානයක් සේ කරන ලද්දේ ය, වාස්තුවක් (ප්‍රතිෂ්ඨාවක්) කරන ලද්දේ ය, අනුෂ්ඨිත (පරිපූර්ණ) කරන ලද්දේ ය, පුරුදු කරන ලද්දේ ය, මොනොවට සම්පූර්ණ කරන ලද්දේ ය, එතෙකුදු වුවත් රාගය මා සිත හාත්පසින් ගෙන සිටී යැ' යි මෙහි භික්ෂු නමෙක් මෙසේ කියන්නේ වී නම්, 'එසේ නො කියැ යුතු යැ' යි හේ කිය යුතු වන්නේ ය. 'ආයුෂ්මත් තෙමේ මෙසේ නො කියා වා, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නො කෙරේ වා (දෙස් නො කියා වා) භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන කිරීම නො මැනැව, භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො ම වදරන සේක. ඇවැත්නි උපෙක්ෂා චිත්තවිමුක්තිය වඩන ලද කල්හි, බහුල කොට කරන ලද කල්හි, යානයක් මෙන් කරන ලද කල්හි, වාස්තුවක් (ප්‍රතිෂ්ඨාවක්) කරන ලද කල්හි, අනුෂ්ඨිත (පරිපූර්ණ) කරන ලද කල්හි, පුරුදු කරන ලද කල්හි, මොනොවට සම්පූර්ණ කරන ලද කල්හි, එසේ කරන ලද කල්හි පවා ඔහුගේ සිත රාග තෙමේ හාත්පසින් ගෙන සිටින්නේ ය යන මෙය නො කරුණෙක, අවකාශ නැත්තෙක. මේ කාරණය අවිද්‍යමාන ය, ඇවැත්නි, උපෙක්ෂා චිත්තවිමුක්තිය යන යමෙක් ඇද්ද, ඇවැත්නි, මෙය රාගයාගේ නිඃශරණය යැ' යි හෙ තෙම කියැ යුතු වන්නේ ය (ඔහුට කිය යුතු වන්නේ ය.).

ඉධාවුසො භික්ඛු එවං වදෙය්‍ය "අනිමිත්තා හි ඛො මෙ ආවුසො චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ තං නිමිත්තානුසාරි විඤ්ඤාණං හොතී'ති සො 'මා හෙවන්ති'ස්ස වචනීයො. මායස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං. න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං අනිමිත්තාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය, පරිචිතාය සුසමාරද්ධාය, අථ ච පනස්ස නිමිත්තානුසාරී විඤ්ඤාණං භවිස්සතී ති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො සබ්බනිමිත්තානං යදිදං අනිමිත්තා චෙතොවිමුත්ති.

ඉධ පනාවුසො භික්ඛු එවං වදෙය්‍ය අස්මීති ඛො මෙ විගතං[1] අයමහමස්මීති න සමනුපස්සාමි. අථ ච පන මෙ විචිකිච්ඡා කථංකථා-සල්ලං චිත්තං පරියාදාය තිට්ඨතීති, සො මා හෙව'න්තිස්ස වචනීයො, 'මායස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං. න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො යං අස්මීති විගතෙ[1] අයමහමස්මීති අසමනුපස්සතො, අථ ච පනස්ස විචි-කිච්ඡාකථංකථාසල්ලං චිත්තං පරියාදාය ඨස්සතී'ති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො විචිකිච්ඡාකථංකථාසල්ලස්ස, යදිදං අස්මීති මානස්ස සමුග්ඝාතො.

ඡ අනුත්තරියානි: දස්සනානුත්තරියං, සවනානුත්තරියං ලාභානුත්තරියං, සික්ඛානුත්තරියං පාරිචරියානුත්තරියං, අනුස්සතානුත්තරියං

ඡ අනුස්සතිට්ඨානානි: බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති.

1. විඝාතං (PTS,) විඝාතෙ (ස්‍යා)

'ඇවැත්නි: අනිමිත්ත චිත්තවිමුක්තිය (රහත්පල සමවත) මා විසින් වඩන ලද්දේ ය, බහුල වශයෙන් කරන ලද්දේ ය, යානයක් සේ කරන ලද්දේ ය, වාස්තු කරන ලද්දේ ය, අනුෂ්ඨාන කරන ලද්දේ ය, මොනොවට සම්පූර්ණ කරන ලද්දේ ය, එතෙකුදු වුවත් මගේ ඒ සිත (රාගනිමිත්තාදි) නිමිති අනුව යන්නේ වේ යැ' යි කියන්නේ නම්, 'එසේ නො කියා වා' යැ යි හේ කිය යුතු වන්නේ ය. 'ආයුෂ්මත් තෙමේ මෙසේ නො කියා වා. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන (දෝෂාරොපණ) නො කෙරේ වා, භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන කිරීම නො මැනැව. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො ම වදරන සේක. ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තිය වඩන ලද කල්හි, බහුල වශයෙන් කරන ලද කල්හි, යානයක් බඳු කරන ලද කල්හි, වාස්තුවක් (ප්‍රතිෂ්ඨාවක්) කරන ලද කල්හි අනුෂ්ඨිත (සම්පූර්ණ) කරන ලද කල්හි, පුරුදු කරන ලද කල්හි, මොනොවට සම්පූර්ණ කරන ලද කල්හි, එසේ කරන ලද තුමූදු ඔහුගේ සිත නිමිති අනුව යන්නෙක් වන්නේ යැ යන මෙය නොකරුණෙක: මෙය අවකාශ (කරුණු) නැති එකෙක. මේ කාරණය විද්‍යමාන නො වේ. ඇවැත්නි, යම් අනිමිත්ත චිත්තවිමුක්තියෙක් වේ ද, මෙය සියලු නිමිතින් ගේ නික්මීමෙක් වේ යැ යි මෙසේ හෙ තෙම කිය යුතු වන්නේ ය.

ඇවැත්නි, මෙහි මහණෙක් 'මම වෙමි' යි මගේ අස්මිමානය පහ විය. 'මේ මම වෙමි' යි නො දකිමි. එතෙකුදු වුවත් විචිකිච්ඡාව වූ 'කෙසේ ද? කෙසේ ද? යන' ශංකා හුල තෙම මගේ සිත හාත් පසින් ගෙන සිටී යැ'යි මෙසේ කියන්නේ නම් 'එසේ නො කියන්නැ' යි හෙ තෙම කියැ යුතු වන්නේ ය. 'ආයුෂ්මත් තෙමේ මෙසේ නො කියා වා, භාග්‍යවතුන් වහන්සේට දෙස් නො කියන්න, භාග්‍යවතුන් වහන්සේට දෙස් කීම නො මැනැව. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො ම වදරන සේක, ඇවැත්නි, 'වෙමි'යි අස්මිමානය පහ වූ කල්හි, 'මේ මම වෙමි'යි නො දක්නාහට (මෙසේ සැකයක් පහළ වීම යන) මෙය නො කරුණෙක, මෙය අවකාශ නැත්තෙක. එතෙකුදු වුවත් විචිකිච්ඡාව වූ කථංකථාසල්ලය ඔහු සිත හාත්පසින් ගෙන සිටින්නේ ය යන මේ කාරණය අවිද්‍යමාන ය. කවර හෙයින ? යම් අස්මි මානයාගේ මුලින් සිඳීමෙක් වේ ද, මෙය විචිකිච්ඡා සංඛ්‍යාත කථංකථාශල්‍යයාගේ නිඃශරණය (නික්මීම) වේ' යැ යි හේ කියැ යුතු වන්නේ ය.

අනුත්තරිය (එයට වඩා උතුම් දැ යැ යි කියැ යුතු කිසිත් නැති) ධර්ම සයෙක: අනුත්තරිය දර්‍ශනය (උසස් ම දැක්ම), අනුත්තරිය ශ්‍රවණය (උතුම් ම ඇසීම), අනුත්තරිය ලාභය (උතුම් ම ලැබීම), අනුත්තරිය ශික්ෂාව (උතුම් ම හික්මීම), අනුත්තරිය පාරිචර්යාව (උතුම් ම උවටන), අනුත්තරිය අනුස්මෘතිය (උතුම් ම සිහි කිරීම).

අනුස්මෘතිස්ථාන (සිහිකිරීම්) සයෙක: බුද්ධානුස්මෘතිය, ධර්මානුස්මෘතිය, සඞ්ඝානුස්මෘතිය, ශීලානුස්මෘතිය, ත්‍යාගානුස්මෘතිය, දෙවතානුස්මෘතිය.

ඡ සතතවිහාරා: ඉධාවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො, සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො.

ඡළාභිජාතියො: ඉධාවුසො එකච්චො කණ්හාභිජාතිකො සමානො කණ්හං ධම්මං අභිජායති. ඉධාවුසො එකච්චො කණ්හාභිජාතිකො සමානො සුක්කං ධම්මං අභිජායති. ඉධාවුසො එකච්චො කණ්හාභිජාතිකො සමානො අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති. ඉධාවුසො එකච්චො සුක්කාභිජාතිකො සමානො සුක්කං ධම්මං අභිජායති. ඉධාවුසො එකච්චො සුක්කාභිජාතිකො සමානො කණ්හං ධම්මං අභිජායති. ඉධාවුසො එකච්චො සුක්කාභිජාතිකො සමානො අකණ්හං අසුක්කං නිබ්බානං අභිජායති.

ඡ නිබ්බෙධභාගියා සඤ්ඤා. අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා.

ඉමෙ ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන ඡ ධම්මා සම්මදක්ඛාතා, තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

### සත්තකං

13. අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සත්ත ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

කතමෙ සත්ත:

සත්ත අරියධනානි: සද්ධාධනං, සීලධනං, හිරිධනං, ඔත්තප්පධනං සුතධනං චාගධනං, පඤ්ඤාධනං.

සතතවිහාර (රහත්හුගේ නිත්‍ය විහරණ) සයෙක: ඇවැත්නි, මෙහි මහණ තෙම ඇසින් රූපයක් දැක සතුටු ද නො ම වෙයි, නොසතුටු ද නො ම වෙයි. එළැඹ සිටි සිහි ඇත්තේ, නුවණින් යුක්ත වූයේ, අරමුණු මැදහත් වැ දකිනුයේ වෙසෙයි. කනින් හඬක් අසා, ... නැහැයෙන් ගඳක් අගා ... දිවින් රසක් විඳ ... කයින් හැපෙන දැ පැහැසැ ... මනසින් දහම් අරමුණක් සිතා සතුටු ද නො ම වෙයි, නොසතුටු ද නො ම වෙයි, එළැඹ සිටි සිහි ඇත්තේ නුවණින් යුක්ත වූයේ අරමුණ මැදහත් වැ දකිනුයේ වෙසෙයි.

අභිජාති (ඉපැදුම්) සයෙක: ඇවැත්නි, මෙහි එකෙක් කළු උපත ඇත්තේ (හීන කුලයෙහි උපන්නේ) ම කළු දහම් (දස අකුසල්) උපදවයි. ඇවැත්නි, මෙහි එකෙක් කළු උපත් ඇත්තේ ම (හීන කුලයෙහි උපන්නේ ම) සුදු දහම් (පින්) උපදවයි. ඇවැත්නි, මෙහි එකෙක් කළු උපත් ඇත්තේ ම කළු ද නොවූ සුදු ද නොවූ නිවන් දහම් උපදවයි. ඇවැත්නි, මෙහි එකෙක් සුදු උපත් ඇත්තේ (උසස් කුලෙහි උපන්නේ ම) සුදු දහම් (පින්) උපදවයි. ඇවැත්නි, මෙහි එකෙක් සුදු උපත් ඇත්තේ ම (උසස් කුලෙහි උපන්නේ ම), කළු දහම් (පව්) උපදවයි. ඇවැත්නි, මෙහි එකෙක් සුදු උපත් ඇත්තේ ම නොකළු නොසුදු නිවන උපදවයි.

නිර්වේධභාගික (නිවන් බජන, නිවන් කරා එළැඹෙන) ධර්ම සයෙක: අනිත්‍යසංඥව, අනිත්‍යයෙහි දුඃඛසංඥව, දුකෙහි අනාත්මසංඥව, ප්‍රහාණසංඥව, විරාගසංඥව, නිරොධසංඥව (නිරොධානුපස්සනා ඤාණයෙහි සංඥව).

ඇවැත්නි, දන්නා දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සදෙනෙක් ධර්මයෝ මොනොවට වදරන ලද්දහු වෙත්. එහි සියල්ලන් විසින් ම ... එක් වැ ගැයිය යුතු ය. එය ... දෙව් මිනිස්නට හිත පිණිස, සුව පිණිස වන්නේ ය.

### සප්තකය

13. ඇවැත්නි, දන්නා දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සත් දහම් කෙනෙක් මොනොවට වදරන ලද්දහු වෙත්. එහි සියල්ලන් විසින් ම එක් ව ගැයිය යුතු ... එය ... දෙව් මිනිස්නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි.

කවර දහම් සත් දෙනෙක් ද? යත්:

ආර්ය ධන සතෙක: ශ්‍රද්ධාධනය, ශීලධනය, හ්රීධනය, අපත්‍රපාධනය, ශ්‍රැතධනය, ත්‍යාගධනය, ප්‍රඥධනය.

සත්ත සම්බොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචයසම්බොජ්ඣ-ඞ්ගො, විරියසම්බොජ්ඣඞ්ගො, පීතිසම්බොජ්ඣඞ්ගො, පස්සද්ධිසම්බො-ජ්ඣඞ්ගො, සමාධිසම්බොජ්ඣඞ්ගො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

සත්ත සමාධිපරික්ඛාරා: සම්මාදිට්ඨි, සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො, සම්මාආජීවො, සම්මාවායාමො, සම්මාසති.

සත්ත අසද්ධම්මා: ඉධාවුසො භික්ඛු අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, අප්පස්සුතො හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, දුප්පඤ්ඤො හොති.

සත්ත සද්ධම්මා: ඉධාවුසො භික්ඛු සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, බහුස්සුතො හොති, ආරද්ධවිරියො හොති, උපට්ඨිතසති හොති, පඤ්ඤවා හොති.

සත්ත සප්පුරිසධම්මා: ඉධාවුසො භික්ඛු ධම්මඤ්ඤූ ච හොති, අත්ථඤ්ඤූ ච, අත්තඤ්ඤූ ච, මත්තඤ්ඤූ ච, කාලඤ්ඤූ ච, පරිසඤ්ඤූ ච, පුග්ගලඤ්ඤූ ච.

සත්ත නිද්දසවත්ථූනි: ඉධාවුසො භික්ඛු සික්ඛාසමාදානෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච සික්ඛාසමාදානෙ අවිගතපෙමො. ධම්මනිසන්තියා තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච ධම්මනිසන්තියා අවිගතපෙමො. ඉච්ඡා-විනයෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච ඉච්ඡාවිනයෙ අවිගතපෙමො. පටිසල්ලානෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච පටිසල්ලානෙ අවිගතපෙමො. විරියාරම්භෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච විරියාරම්භෙ අවිගතපෙමො. සතිනෙපක්කෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච සතිනෙපක්කෙ අවිගත-පෙමො. දිට්ඨිපටිවෙධෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච දිට්ඨිපටිවෙධෙ අවිගතපෙමො.

සම්බොධ්‍යඞ්ග සතෙක: ස්මෘතිසම්බෝධ්‍යඞ්ගය, ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය, වීර්‍ය්‍ය සම්බෝධ්‍යඞ්ගය, ප්‍රීති සම්බෝධ්‍යඞ්ගය, ප්‍රශ්‍රබ්ධිසම්බෝධ්‍යඞ්ගය, සමාධිසම්බෝධ්‍යඞ්ගය, උපෙක්ෂාසම්බෝධ්‍යඞ්ගය.

සමාධිපරිෂ්කාර ධර්ම (සමාධියට පිරිවර වූ දහම්) සතෙක: සම්‍යග්දෘෂ්ටිය, සම්‍යක්සඞ්කල්පය, සම්‍යග්වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය.

අසද්ධර්ම (ලාමක දෑ) සතෙක: ඇවැත්නි, මෙහි මහණෙක් සැදැහැ නැත්තේ වෙයි, පවට ලජ්ජා නැත්තේ වෙයි, පවට බිය නැත්තේ වෙයි, අල්පශ්‍රැත (දහම් නොඋගත්තේ) වෙයි, අලස වෙයි, නටුවාවූ සිහි ඇත්තේ වෙයි, ප්‍රඥා නැත්තේ වෙයි.

සද්ධර්ම සතෙක: ඇවැත්නි, මෙහි මහණ තෙම සැදැහැ ඇත්තේ, වෙයි, පවට ලජ්ජා ඇත්තේ වෙයි, පවට බිය ඇත්තේ වෙයි, බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වෙයි, සම්පූර්ණ කරන ලද වීර්‍ය්‍ය ඇත්තේ වෙයි. එළැඹ සිටි සිහි ඇත්තේ වෙයි.

සත්පුරුෂ ධර්ම සතෙක: ඇවැත්නි, මෙහි මහණ තෙමේ ධර්මඥ (සූත්‍ර ගෙය ආදි දහම් පෙළ දන්නේ) ද වෙයි, අර්ථඥ (වදළ ධර්මයේ අර්ථ දන්නේ) වෙයි, ආත්මඥ (ශීලාදියෙන් මම් මෙ පමණ ඇත්තෙම් යි තමා පමණ දන්නේ) වෙයි, මාත්‍රඥ (ප්‍රත්‍යය පිළිගැනුම් වැළැඳුම් දෙකේ පමණ දන්නේ) වෙයි, කාලඥ (පරිපුච්ඡාදියට කල් දන්නේ) වෙයි. පර්ෂජ්ඥ (අට වැදෑරුම් පිරිස දන්නේ) වෙයි, පුද්ගලඥ (සෙවියැ යුතු නොසෙවියැ යුතු පුඟුලන් දන්නේ) වෙයි.

නිර්දශ වස්තු සතෙක: ඇවැත්නි, මෙහි මහණ තෙම ශික්ෂා සමාදනයෙහි දැඩි කැමැත්තේ මත්තෙහිදු ශික්ෂා සමාදනයෙහි නො පහවූ ප්‍රේමය ඇත්තේ වෙයි, ධර්මනිශාන්තියෙහි (විදර්ශනායෙහි) දැඩි කැමැත්තේ මත්තෙහි ධර්මනිශාන්තියෙහි නො පහ වූ ප්‍රේමය ඇත්තේ වෙයි, ඉච්ඡාවිනයයෙහි (තෘෂ්ණාව දුරලීමෙහි) දැඩි කැමැත්තේ, මත්තෙහි දු ඉච්ඡාවිනයයෙහි නො පහ වූ ප්‍රේමය ඇත්තේ වෙයි, ප්‍රතිසංල්ලයනයෙහි (එකලා වැ හිඳීමෙහි) දැඩි කැමැත්තේ, මත්තෙහි දු ප්‍රතිසංල්ලයනයෙහි පහ නොවූ ප්‍රේමය ඇත්තේ වෙයි. කායික චෛතසික වීර්‍ය්‍ය පිරීමෙහි දැඩි කැමැත්තේ, මත්තෙහි දු වීර්‍ය්‍යය පිරීමෙහි පහ නොවූ ප්‍රේමය ඇත්තේ වෙයි. සිහියෙහිත් ස්ථානොචිත ප්‍රඥායෙහිත් දැඩි කැමැත්තේ මත්තෙහි දු සිහියෙහිත් ස්ථානොචිත ප්‍රඥායෙහිත් පහ නොවූ ප්‍රේමය ඇත්තේ වෙයි. දෘෂ්ටිප්‍රතිවෙධයෙහි (මාර්ගදර්ශනයෙහි) දැඩි කැමැත්තේ මත්තෙහිදු දෘෂ්ටිප්‍රතිවෙධයෙහි පහ නොවූ ප්‍රේමය ඇත්තේ වෙයි.

සත්ත සඤ්ඤා: අනිච්චසඤ්ඤා, අනත්තසඤ්ඤා, අසුභසඤ්ඤා, ආදීනවසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා.

සත්ත බලානි: සද්ධාබලං, විරියබලං, හිරිබලං, ඔත්තප්පබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං.

සත්ත විඤ්ඤාණට්ඨිතියො: සන්තාවුසො සත්තා නානත්තකායා නානත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. අයං පඨමා විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා නානත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා පඨමාභිනිබ්බත්තා. අයං දුතියා විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා එකත්තකායා නානත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි දෙවා ආභස්සරා. අයං තතියා විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා එකත්තකායා එකත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. අයං චතුත්ථී විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනූපගා. අයං පඤ්චමී විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනූපගා. අයං ඡට්ඨී විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගා. අයං සත්තමී විඤ්ඤාණට්ඨිති.

සංඥ සතෙක: අනිත්‍යසංඥව, අනාත්මසංඥව, අශුභසංඥව, ආදීනවසංඥව, ප්‍රහාණසංඥව, විරාගසංඥව, නිරොධසංඥව.

බල සතෙක: ශ්‍රද්ධාබලය, වීර්‍ය්‍යබලය, හ්රිබලය, අපත්‍රපාබලය, ස්මෘතිබලය, සමාධි බලය, ප්‍රඥබලය.

විඥනස්ථිති සතෙක: ඇවැත්නි, මිනිස්සු ද ඇතැම් දෙවියෝ ද ඇතැම් විනිපාතිකයෝ ද යි කායනානාත්වය (කයින් වෙනස් බවද) ඇති සංඥානානාත්වය (ප්‍රතිසන්ධි සංඥා වශයෙන් උනුනට වෙනස් බව) ද ඇති සත්ව කෙනෙක් ඇත. මේ පළමු වැනි විඥන ස්ථිතිය යැ.

ඇවැත්නි, ලොවැ කල්පාරම්භසමයයෙහි උපන් බ්‍රහ්මකායික දෙවියෝ යම්සේ ද එසේ වූ කායනානාත්වය ඇති ප්‍රතිසන්ධිසංඥඑකත්වය ඇති (එක ම වර්ගයේ ප්‍රතිසන්ධි සිතින් උපන්) සත්ව කෙනෙක් ඇත. මේ දෙවෙනි විඥන ස්ථිතිය යැ.

ඇවැත්නි, ආභාස්වරදෙවියන් සේ වූ කායෛකත්වය (එක් බඳු කය) ඇති, සංඥනානාත්වය (උත්පත්තිය සිදු කළ ප්‍රතිසන්ධිසංඥවගේ විවිධතාව) ඇති සත්ව කෙනෙක් ඇත. මෙ තෙවෙනි විඥනස්ථිතිය යැ.

ඇවැත්නි, ශුභකෘත්ස්නක දෙවියන් සේ වූ කායෛකත්වය (කයින් එක් බඳු බව) ඇති, ප්‍රතිසන්ධිසංඥවගේ ද එකත්වය ඇති සත්ව කෙනෙක් ඇත. මේ සතර වැනි විඥනස්ථිතිය යැ.

ඇවැත්නි, රූපසංඥවන් හැම ලෙසින් ඉක්මීමෙන්, ප්‍රතිඝසංඥවන් දුරු වැ යැමෙන්, නානාත්වසංඥවන් නොමෙනෙහි කිරීමෙන් ආකාශ-ප්‍රඥප්තිය අනන්තයැ යි දක, එහි සිත පිහිටුවා, ආකාශානන්තායතන බඹ ලොවට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ පස්වැනි විඥනස්ථිතිය යැ.

ඇවැත්නි, හැම ලෙසින් ම අනන්ත වූ කසිණුගඝාටිම ආකාසාරම්ම-ණය ඉක්මැ, (ආකාශානන්තායතන ධ්‍යාන) විඥනය අනන්තයැ යි ධ්‍යාන වඩා, විඥනන්තායතන බඹලොවට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ සවැනි විඥනස්ථිතිය යැ.

ඇවැත්නි, හැම ලෙසින් ම විඥනන්තායතනය ඉක්මැ 'කිසිත් නැතැ'යි බවා ආකිංචන්‍යායතන බඹලොවට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ සත්වැනි විඥනස්ථිතිය යැ.

**සත්ත පුග්ගලා දක්ඛිණෙය්‍යා:** උභතොභාගවිමුත්තො, පඤ්ඤාවිමුත්තො, කායසක්ඛී, දිට්ඨිප්පත්තො, සද්ධාවිමුත්තො, ධම්මානුසාරී, සද්ධානුසාරී.

**සත්ත අනුසයා:** කාමරාගානුසයො, පටිඝානුසයො, දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො, මානානුසයො, භවරාගානුසයො, අවිජ්ජානුසයො.

**සත්ත සංයොජනානි:** අනුනයසංයොජනං,[1] පටිඝසංයොජනං, දිට්ඨිසංයොජනං, විචිකිච්ඡාසංයොජනං, මානසංයොජනං, භවරාගසංයොජනං, අවිජ්ජාසංයොජනං.

**සත්ත අධිකරණසමථා:** උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛාවිනයො දාතබ්බො, සතිවිනයො දාතබ්බො, අමූළ්හවිනයො දාතබ්බො, පටිඤ්ඤාය කාරෙතබ්බං, යෙභුය්‍යසිකා, තස්සපාපියසිකා, තිණවත්ථාරකො.

ඉමෙ ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සත්ත ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං—පෙ—අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

## අට්ඨකං

14. අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන අට්ඨ ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං—පෙ—අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

කතමෙ අට්ඨ?

**අට්ඨ මිච්ඡත්තා:** මිච්ඡාදිට්ඨි, මිච්ඡාසංකප්පො, මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්තො, මිච්ඡාආජීවො, මිච්ඡාවායාමො, මිච්ඡාසති, මිච්ඡාසමාධි. (1)

**අට්ඨ සම්මත්තා:** සම්මාදිට්ඨි සම්මාසංකප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මාආජීවො, සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධි. (2)

**අට්ඨ පුග්ගලා දක්ඛිණෙය්‍යා:** සොතාපන්නො, සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො, සකදාගාමී, සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, අනාගාමී, අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, අරහා, අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නො. (3)

---

1. කාමසඤ්ඤොජනං (ස්‍යා.)

දක්ෂිණාර්හ පුද්ගලයෝ සත්දෙනෙක: උභතොභාගවිමුක්තයා, ප්‍රඥාවිමුක්තයා, කායසාක්ෂිකයා, දෘෂ්ටිප්‍රාප්තයා, ශ්‍රද්ධාවිමුක්තයා, ධර්මානුසාරියා, ශ්‍රද්ධානුසාරියා.

අනුශය සතෙක: කාමරාගානුශය, ප්‍රතිඝානුශය, දෘෂ්ට්‍යානුශය, විචිකිත්සානුශය, මානානුශය, භවරාගානුශය, අවිද්‍යානුශය.

සංයෝජන සතෙක: අනුනයසංයෝජනය, ප්‍රතිඝසංයෝජනය, දෘෂ්ටිසංයෝජනය, විචිකිත්සාසංයෝජනය මානසංයෝජනය, භවරාගසංයෝජනය, අවිද්‍යාසංයෝජනය.

අධිකරණ ශමථ සතෙක: උපනුපන් අධිකරණයන් ගේ සන්සිඳීම පිණිස, ව්‍යුපශමය පිණිස සම්මුඛාවිනය දියැ යුතු, සතිවිනය දියැ යුතු, අමූළ්හවිනය දියැ යුතු, ප්‍රතිඥයෙන් කැරැවියැ යුතු, යෙභුය්‍යසිකාව, තස්සපාපිය්‍යසිකාව, තිණවත්ථාරකය.(කැරැවිය යුතු)

ඇවැත්නි, දන්නා දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද සප්ත ධර්මයෝ මොහුය. එහි සියල්ලන් විසින් ම එක් වැ ගැයිය යුතු...එය...දෙව්මිනිස්නට ප්‍රයෝජන පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය.

## අෂ්ටකය

14. ඇවැත්නි, දන්නා දක්නා අර්හත් සම්‍යක් සම්බුඩ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද අෂ්ට ධර්ම කෙනෙක් ඇත. එහි සියල්ලන් විසින් ම එක් වැ ගැයිය යුතු... එය දෙව්මිනිස්නට ප්‍රයෝජන පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ යි.

කවර අට දෙනෙක් ද? යත්:

මිථ්‍යාත්ව (මිථ්‍යා ස්වභාවයෝ) අටෙක: මිථ්‍යාදෘෂ්ටිය, මිථ්‍යාසංකල්පය, මිථ්‍යාවචනය, මිථ්‍යා කර්මාන්තය, මිථ්‍යා ආජීවය, මිථ්‍යා ව්‍යායාමය, මිථ්‍යා ස්මෘතිය, මිථ්‍යා සමාධිය.

සම්‍යක්ත්ව (සම්‍යක් ස්වභාවයෝ) අටෙක: සම්‍යග් දෘෂ්ටිය, සම්‍යක්සඞ්කල්පය, සම්‍යග්වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධිය.

දක්ෂිණාර්හ පුද්ගලයෝ අට දෙනෙක: සෝවාන් පුඟුලාය, සෝවාන් පලය පසක් කරනුවට පිළිපන් පුඟුලා ය, සෙදගැමියා ය, සෙදගැමිපලය පිණිස පිළිපන් පුඟුලා ය, අනැගැමියා ය, අනැගැමිපලය පිණිස පිළිපන් පුඟුලා ය, රහත් තෙමෙ ය, රහත්පලය පිණිස පිළිපන් පුඟුලා ය.

අට්ඨ කුසීතවත්ථූනි: ඉධාවුසො භික්ඛුනා කම්මං කාතබ්බං හොති. තස්ස එවං හොති: කම්මං ඛො මෙ කාතබ්බං භවිස්සති, කම්මං ඛො පන මෙ කරොන්තස්ස කායො කිලමිස්සති, හන්දාහං නිපජ්ජාමී'ති සො නිපජ්ජති, න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං පඨමං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා කම්මං කතං හොති. තස්ස එවං හොති: අහං ඛො කම්මං අකාසිං, කම්මං ඛො පන මෙ කරොන්තස්ස කායො කිලන්තො, හන්දාහං නිපජ්ජාමීති. සො නිපජ්ජති, න විරියං ආරභති-පෙ-ඉදං දුතියං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා මග්ගො ගන්තබ්බො හොති. තස්ස එවං හොති: මග්ගො ඛො මෙ ගන්තබ්බො භවිස්සති. මග්ගං ඛො පන මෙ ගච්ඡන්තස්ස කායො කිලමිස්සති. හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං තතියං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා මග්ගො ගතො හොති. තස්ස එවං හොති: අහං ඛො මග්ගං අගමාසිං. මග්ගං ඛො පන මෙ ගච්ඡන්තස්ස කායො කිලන්තො. හන්දාහං නිපජ්ජාමීති. සො නිපජ්ජති න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං චතුත්ථං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: 'අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො නාලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මෙ කායො කිලන්තො අකම්මඤ්ඤො. හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති, න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං පඤ්චමං කුසීතවත්ථු.

කුසීදවස්තු (කුසීදයාගේ කරුණු, කුසීද බවට කාරණ) අටෙක: ඇවැත්නි, මෙහි මහණහු විසින් (සිවුරු විචාරණාදි) කර්මයෙක් කළ යුතු වෙයි. මා විසින් කර්මයෙක් කළ යුතු වන්නේ ය. කර්මය කරන්නාවූ මගේ කය වෙහෙසන්නේ ය. එහෙයින් දැන් වැද හෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැදහෙයි. නොපැමිණි ධ්‍යානාදියකට පැමිණීමට හෝ නොලත් ධ්‍යානාදියක් ලබනුවට හෝ පසක් නොකළ ධ්‍යානාදියක් පසක් කරනුවට හෝ වැර නො වඩයි. මේ පළමු කුසීද වස්තුව ය.

තව ද අනෙකෙකි. ඇවැත්නි, මහණහු විසින් කර්මයෙක් කරන ලද්දේ වෙයි. 'මම වනාහි කර්මයක් කෙළෙමි. කර්මය කරන්නාවූ මගේ කය වෙහෙසුණේ ය. එ බැවින් මම වැදහෙමි' යි ඔහුට මෙසේ සිතෙක්වෙයි. හේ වැද හෙයි ... වැර නො වඩයි. මේ දෙවෙනි කුසීද වස්තුව ය.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණහු විසින් මඟ යෑ යුතු වෙයි 'මා විසින් මඟ යෑ යුතු ය, මඟ යන මගේ වූ කලි කය වෙහෙසෙන්නේ ය. එහෙයින් මම වැදහෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැද හෙයි, නො පැමිණි ධ්‍යානාදියක් පැමිණෙනුවට හෝ නො ලත් ධ්‍යානාදියක් ලබනුවට හෝ පසක් නොකළ ධ්‍යානාදියක් පසක් කරනුවට හෝ හේ වැර නො වඩයි. මේ තෙවෙනි කුසීද වස්තුව යෑ.

තව ද අනෙකෙකි. ඇවැත්නි, මහණහු විසින් මඟ යන ලද්දේ වෙයි. 'මම වූ කලි මඟ ගියෙමි. මඟ යන්නා වූ මගේ කය එකාන්තයෙන් වෙහෙසුණේ ය. එ බැවින් මම වැද හෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැදූ හෙයි. නොපැමිණි ධ්‍යානාදියකට පැමිණීම පිණිස හෝ නොලත් ධ්‍යානාදියක් ලබනුවට හෝ නො පසක් කළ ධ්‍යානාදියක් පසක් කරනුවට හෝ වැර නො වඩයි. මෙ සිවුවැනි කුසීද වස්තුව යෑ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙම ගමෙක හෝ නියම් ගමෙක පිඩු පිණිස හැසිරෙන්නේ රූක්ෂ වූ ප්‍රණීත වූ බොජුන් සෑහෙන පමණ, කුස පිරෙන පමණ. නො ලබයි. 'මම වූ කලි ගමෑ හෝ නියම්ගමෑ පිඩු පිණිස සරනුයෙම් සෑහෙන පමණ, (කුස පිරෙන පමණ) රූක්ෂ හෝ ප්‍රණීත බොජුනක් නො ලද්දෙමි. ඒ මගේ කය ක්ලාන්ත ය, අකර්මණ්‍ය ය (පණ නැත). එ බැවින් මම වැද හෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැද හෙයි. හේ නොපැමිණි ධ්‍යානාදියකට පැමිණීමට හෝ නො ලත් ධ්‍යානාදියක් ලබනුවට හෝ නො පසක් කළ ධ්‍යානාදියක් පසක් කරනුවට හෝ වැර නො වඩයි. මේ පස් වැනි කුසීද වස්තුව යෑ.

පුන ච පරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: 'අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො අලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මෙ කායො ගරුකො අකම්මඤ්ඤො. මාසාචිතං මඤ්ඤෙ. හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං ඡට්ඨං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනො උප්පන්නො හොති අප්පමත්තකො ආබාධො. තස්ස එවං හොති: 'උප්පන්නො ඛො මෙ අප්පමත්තකො ආබාධො. අත්ථි කප්පො නිපජ්ජිතුං, හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං සත්තමං කුසීතවත්ථු.

පුන ච පරං, ආවුසො භික්ඛු ගිලානා වුට්ඨිතො[1] හොති, අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා. තස්ස එවං හොති: අහං ඛො ගිලානා වුට්ඨිතො අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා. තස්ස මෙ කායො දුබ්බලො අකම්මඤ්ඤො, අත්ථි කප්පො නිපජ්ජිතුං හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං අට්ඨමං කුසීතවත්ථු.

අට්ඨ ආරම්භවත්ථූනි: ඉධාවුසො භික්ඛුනා කම්මං කාතබ්බං හොති. තස්ස එවං හොති; 'කම්මං ඛො මෙ කාතබ්බං භවිස්සති, කම්මං ඛො පන මෙ කරොන්තෙන න සුකරං බුද්ධානං සාසනං මනසි කාතුං, හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං පඨමං ආරම්භවත්ථු,

1. ගිලානාවුට්ඨිතො (මජසං)

තවද අනෙකෙක: ඇවැත්නි, මහණ තෙම ගමැ හෝ නියම්ගමැ පිඩු පිණිස හැසිරෙනුයේ රුක්ෂ හෝ ප්‍රණීත ආහාර සෑහෙන පමණ, කුස පිරෙන පමණ ලබයි. 'මම ගමැ හෝ නියම්ගමැ පිඩු පිණිස සරනුයෙම් රුක්ෂ හෝ ප්‍රණීත බොජුන් සෑහෙන පමණ, කුස පිරෙන පමණ ලදිමි. ඒ මගේ කය තෙත් මැ සේ බර ය, අකර්මණ්‍ය ය. එ බැවින් මම වැද හෙමි' යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැද හෙයි. නොපැමිණි ධ්‍යානාදියකට පැමිණෙන්නට හෝ නො ලත් ධ්‍යානාදියක් ලබනුවට හෝ පසක් නොකළ ධ්‍යානාදියක් පසක් කරනුවට හෝ වැර නො වඩයි. මෙ ස වැනි කුසීද වස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණහට අල්පමාත්‍ර වූ ආබාධයෙක් උපන්නේ වෙයි. 'මට අල්පමාත්‍ර ආබාධයෙක් උපන. වැද හෝනට සුදුසු බව ඇත. එ බැවින් මම වැද හෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැද හෙයි. නොපැමිණි ධ්‍යානාදියකට පැමිණීමට, නොලත් ධ්‍යානාදියක් ලබන්නට, නො පසක් කළ ධ්‍යානාදියක් පසක් කරන්නට වැර නො වඩයි. මෙ සත්වැනි කුසීද වස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමෙ ගිලන් බැවින් නැඟී සිටියේ වෙයි, ගිලන් බැවින් නැඟී නො බෝ කල් ඇත්තේ වෙයි. ඔහුට, 'මම වනාහි ගිලන් බැවින් නැඟී සිටියෙම්, ගිලන් බැවින් නැඟී සිටි නො බෝ කල් ඇත්තෙම් වෙමි. ඒ මාගේ කය දුර්වල ය, අකර්මණ්‍ය ය, වැද හෙනුවට සුදුසු බව ඇත. එ බැවින් මම වැද හෙමි'යි මෙසේ සිතෙක් වෙයි. හේ වැද හෙයි. නොපැමිණි ධ්‍යානාදියකට පැමිණීමට හෝ නො ලත් ධ්‍යානාදියක් ලබනුවට හෝ නො පසක් කළ ධ්‍යානාදියක් පසක් කරනුවට හෝ වැර නො වඩයි. මෙ අට වැනි කුසීද වස්තුව යැ,

ආරම්භවස්තු (වීර්යයට කරුණු) අටෙක: ඇවැත්නි, මහණක්හු විසින් කර්මයෙක් කළ යුතු වෙයි. "මා විසින් වූ කලී කර්මයෙක් කළ යුතු වන්නේ ය. කර්මයක් කරන මා විසින් බුදුරජුන්ගේ සස්න මෙනෙහි කරන්නට නො හැක්ක. එ හෙයින් මම නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙනුවට, නොලත් ධ්‍යානාදිය ලබනු පිණිස, නො පසක් කළ ධ්‍යානාදිය පසක් කරනුවට වැර වඩමි" යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හෙ තෙම නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙනුවට, නොලත් ධ්‍යානාදිය ලබනුවට, නො පසක් කළ ධ්‍යානාදිය පසක් කරනුවට වැර වඩයි. මෙ පළමු වන ආරම්භවස්තුව යැ.

පුන ච පරං ආවුසො, භික්ඛුනා කම්මං කතං හොති. තස්ස එවං හොති: අහං ඛො කම්මං අකාසිං. කම්මං ඛො පනාහං කරොන්තො නාසක්ඛිං බුද්ධානං සාසනං මනසි කාතුං. හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං දුතියං ආරම්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා මග්ගො ගන්තබ්බො හොති. තස්ස එවං හොති: 'මග්ගො ඛො මෙ ගන්තබ්බො භවිස්සති. මග්ගං ඛො පන මෙ ගච්ඡන්තෙන න සුකරං බුද්ධානං සාසනං මනසිකාතුං. හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං තතියං ආරම්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා මග්ගො ගතො හොති තස්ස එවං හොති: 'අහං ඛො මග්ගං අගමාසිං. මග්ගං ඛො පනාහං ගච්ඡන්තො නාසක්ඛිං බුද්ධානං සාසනං මනසිකාතුං. හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං චතුත්ථං ආරම්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: 'අහං ඛො ගාමං වා නිගමං පිණ්ඩාය චරන්තො නාලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මෙ කායො ලහුකො කම්මඤ්ඤො. හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං පඤ්චමං ආරම්භවත්ථු.

තව ද අනෙකෙක, ඇවැත්නි, මහණක්හු විසින් කර්මයෙක් කරන ලද්දේ වෙයි. 'මම වූ කලි කර්මයක් කෙළෙමි. මම කර්මය කරනු-යෙමි, බුදුරජුන්ගේ සස්න මෙනෙහි කරන්නට නො හැකි වීමි, එ හෙයින් මම නො පැමිණි ධ්‍යානාදියට පැමිණීමට, නො ලත් ධ්‍යානාදිය ලැබීමට, නො පසක් කළ ධ්‍යානාදිය පසක් කිරීමට වැර වඩමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ නොපැමිණි ධ්‍යානාදියට පැමිණීමට, නොලත් ධ්‍යානාදිය ලැබීමට, නො පසක් කළ ධ්‍යානාදිය පසක් කිරීමට වැර වඩයි. මේ දෙවෙනි ආරම්භ වස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණක්හු විසින් මඟෙක් යෑ යුතු වෙයි. 'මා විසින් වූ කලි මඟෙක් යෑ යුතු වෙයි, මඟ යන මා විසින් බුදුරජුන්ගේ සස්න මෙනෙහි කරන්නට පහසු නො වේ. එ බැවින් මම නොපැමිණි ධ්‍යානාදියට පැමිණීමට, නොලත් ධ්‍යානාදිය ලැබීමට, නො පසක් කළ ධ්‍යානාදිය පසක් කිරීමට වැර වඩමි' යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ නොපැමිණි ධ්‍යානාදියට පැමිණීමට, නො ලත් ධ්‍යානාදිය ලැබීමට, නො පසක් කළ ධ්‍යානාදිය පසක් කිරීමට වැර වඩයි. මේ තුන්වැනි ආරම්භවස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි. මහණහු විසින් මඟ යන ලද්දේ වෙයි. 'මම වූ කලි මඟ ගියෙමි. මඟ යන මම බුදුරජුන්ගේ සස්න මෙනෙහි කරන්නට නො' හැකි වීමි. එ හෙයින් මම නො පැමිණි ධ්‍යානාදියට පැමිණීමට, නොලත් ධ්‍යානාදිය ලැබීමට, නොපසක් කළ ධ්‍යානාදිය පසක් කිරීමට වැර වඩමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ නොපැමිණි ධ්‍යානාදියට පැමිණීමට, නොලත් ධ්‍යානාදිය ලැබීමට, නො පසක් කළ ධ්‍යානාදිය පසක් කිරීමට වැර වඩයි. මේ සතර වැනි ආරම්භවස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණෙක් ගමෙක හෝ නියම් ගමෙක හෝ පිඩු පිණිස සරනුයේ, රුක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ බොජුන් සෑහෙන පමණ, කුස පිරෙන පමණ නො ලබයි. ඔහුට, 'මම ගමැ හෝ නියම් ගමැ හෝ පිඩු පිණිස සරනුයෙම්, රුක්ෂ හෝ ප්‍රණීත හෝ බොජුන් සෑහෙන පමණ, කුස පිරෙන පමණ නො ලද්මි. ඒ මගේ කය හැල්ලු යැ, කර්මණ්‍ය යැ. එ බැවින් මම නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙනුවට, නොලත් ධ්‍යානාදිය ලබනුවට, නො පසක් කළ ධ්‍යානා-දිය පසක් කරනුවට වැර වඩමි' යි මෙසේ සිතෙක් වෙයි. හේ නො පැමිණි ධ්‍යානාදියට පැමිණෙනුවට, නොලත් ධ්‍යානාදිය ලබනුවට, නො පසක් කළ ධ්‍යානාදිය පසක් කරනුවට වැර වඩයි. මේ පස් වන ආරම්භවස්තුව යැ.

පුන ච පරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: 'අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො අලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මෙ කායො බලවා කම්මඤ්ඤො. හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං ඡට්ඨං ආරබ්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනො උප්පන්නො හොති අප්පමත්තකො ආබාධො. තස්ස එවං හොති: 'උප්පන්නො ඛො මෙ අයං අප්පමත්තකො. ආබාධො. ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ ආබාධො පවඩ්ඪෙය්‍ය, හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං සත්තමං ආරබ්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛු ගිලානා වුට්ඨිතො හොති අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා. තස්ස එවං හොති: 'අහං ඛො ගිලානා වුට්ඨිතො[1] අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා. ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ ආබාධො පච්චුදාවත්තෙය්‍ය, හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං අට්ඨමං ආරබ්භ වත්ථු.

අට්ඨ දානවත්ථූනි: ආසජ්ජ දානං දෙති. භයා දානං දෙති. 'අදාසි මෙ'ති දානං දෙති. 'දස්සති මෙ'ති දානං දෙති. 'සාහු දාන'න්ති දානං දෙති, 'අහං පචාමි, ඉමෙ න පචන්ති, නාරහාමි පචන්තො අපචන්තානං න දාතු'න්ති දානං දෙති. 'ඉමං මෙ දානං දදතො කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡතී'ති දානං දෙති, චිත්තාලඞ්කාරචිත්තපරික්ඛාරත්ථං දානං දෙති.

1. ගිලානවුට්ඨිතො (මජසං)

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ ගමෙක හෝ නියම් ගමෙක හෝ පිඩු පිණිස සරනුයේ, රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ බොජුනක් සෑහෙන පමණ, කුස පිරෙන පමණ ලබයි. "මම වනාහි ගමැ හෝ නියම්ගමැ පිඩු පිණිස සරනුයෙම්, රූක්ෂ හෝ ප්‍රණීත වූ බොජුනක් සෑහෙන පමණ, කුස පිරෙන පමණ ලදිමි. ඒ මගේ කය ශක්තිමත් ය, කර්මණ්‍ය ය. එ බැවින් මම නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙන්නට, නොලත් ධ්‍යානාදිය ලබන්නට නො පසක් කළ ධ්‍යානාදිය පසක් කරන්නට වැර වඩමි' යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ නො පැමිණි ධ්‍යානාදියට පැමිණෙන්නට, නො ලත් ධ්‍යානාදිය ලබන්නට, නො පසක් කළ ධ්‍යානාදිය පසක් කරන්නට වැර වඩයි. මේ සවැනි ආරම්භවස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණක්හට අල්පමාත්‍ර ආබාධයෙක් උපන්නේ වෙයි. 'මට මේ අල්පමාත්‍ර ආබාධයෙක් උපන්නේ ම වෙයි. මගේ ආබාධය වැඩෙන්නේ ය යන යමෙක් ඇද්ද, මෙ කරුණ විද්‍යමාන ය, එ බැවින් නො පැමිණි ධ්‍යානාදියට පැමිණෙන්නට, නො ලත් ධ්‍යානාදිය ලබන්නට, පසක් නොකළ ධ්‍යානාදිය පසක් කරන්නට මම වැර වඩමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙන්නට, නොලත් ධ්‍යානාදිය ලබන්නට, පසක් නො කළ ධ්‍යානාදිය පසක් කරන්නට වැර වඩයි. මේ සත් වැනි ආරම්භවස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණෙක් ගිලන් බැවින් නැඟී සිටියේ, ගිලන් බැවින් නැඟී සිටි නොබෝ කල් ඇත්තේ වෙයි. 'මම් වූ කලි ගිලන් බැවින් නැඟී සිටියෙම්, ගිලන් බැවින් නැඟීසිටි නො බෝ කල් ඇත්තෙම් වෙමි. මගේ මේ ආබාධය වටාලා නැඟී එන්නේ ය යන යමෙක් ඇද්ද, මෙ කරුණ විද්‍යමාන ය. එ බැවින් මම නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙන්නට නොලත් ධ්‍යානාදිය ලබන්නට, පසක් නො කළ ධ්‍යානාදිය පසක් කරන්නට වැර වඩමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙන්නට, නොලත් ධ්‍යානාදිය ලබන්නට, නොපසක් කළ ධ්‍යානාදිය පසක් කරන්නට වැර වඩයි. මේ අටවැනි ආරම්භවස්තුව යැ.

දානවස්තු (දීමට කරුණු) අටෙක: පැමිණි අමුත්තාට වහා දන් දෙයි, බිය හේතු කොට ගෙන දන් දෙයි. 'මට මේ තෙම දුන්නේ යැ'යි දන් දෙයි. 'මට දෙන්නේ යැ'යි දන් දෙයි. 'දීම මැනැව'යි සලකා දන් දෙයි. 'මම පිසමි, මොහු නො පිසත්, මම පිසන්නෙම් නො පිසන්නනට දන් නොදෙන්නට නො සුදුස්සෙමි'යි දන් දෙයි. 'මේ දන් දෙනා මා පිළිබඳ යහපත් කීර්තිශබ්දයෙක් උස් වැ නැඟේ' යැයි දන් දෙයි. ශමථවිදර්ශනා සිතට සැරසිල්ලක් කොට, ශමථ විදර්ශනා සිතට පිරිවර පිණිස දන් දෙයි.

අට්ඨ දානූපපත්තියො: ඉධාවුසො එකච්චො දානං දෙති. සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො යං දෙති තං පච්චාසිංසති. සො පස්සති ඛත්තියමහාසාලං වා බ්‍රාහ්මණමහාසාලං වා ගහපතිමහාසාලං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගීභූතං පරිචාරයමානං. තස්ස එවං හොති 'අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සහබ්‍යතං උපපජ්ජෙය්‍ය'න්ති. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තං චිත්තං හීනෙ'ධිමුත්තං උත්තරිං අභාවිතං තත්‍රූපපත්තියා සංවත්තති. තඤ්ච ඛො සීලවතො වදාමි නො දුස්සීලස්ස. ඉජ්ඣතාවුසො සීලවතො චෙතොපණිධි විසුද්ධත්තා.

පුන ච පරං ආවුසො ඉධෙකච්චො දානං දෙති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං -පෙ- සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො යං දෙති තං පච්චාසිංසති.[1] තස්ස සුතං හොති 'චාතුම්මහාරාජිකා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා'ති. තස්ස එවං හොති ''අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං[2] දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍යන්ති''. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති තං චිත්තං භාවෙති. තස්ස තං චිත්තං හීනෙ'ධිමුත්තං උත්තරිං අභාවිතං තත්‍රූපපත්තියා සංවත්තති. තඤ්ච ඛො සීලවතො වදාමි නො දුස්සීලස්ස. ඉජ්ඣතාවුසො සීලවතො චෙතොපණිධි විසුද්ධත්තා.

පුන ච පරං ආවුසො ඉධෙකච්චො දානං දෙති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං -පෙ- සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො යං දෙති තං පච්චාසිංසති. තස්ස සුතං හොති තාවතිංසා දෙවා -පෙ- යාමා දෙවා -පෙ- තුසිතා දෙවා -පෙ- නිම්මාණරතී දෙවා -පෙ- පරනිම්මිතවසවත්තී දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා'ති. තස්ස එවං හොති 'අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍යන්ති'. සො තං චිත්තං දහති තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස චිත්තං හීනෙ'ධිමුත්තං උත්තරිං අභාවිතං තත්‍රූපපත්තියා සංවත්තති. තඤ්ච ඛො සීලවතො වදාමි නො දුස්සීලස්ස. ඉජ්ඣතාවුසො සීලවතො චෙතොපණිධි විසුද්ධත්තා.

1. පච්චාසීසති (මජසං)
2. චාතුමහාරාජිකානං (මජසං)

දානොපපත්ති (දාන හේතුයෙන් ඇතිවන දෙවෙනි භව) අටෙක: ඇවැත්නි, මෙහි එක්තරා පුහුලෙක් මහණකුට හෝ බමුණකුට හෝ ආහාර පාන වස්ත්‍ර යාන මාලා ගන්ධ විලෙපන ශයන ආවාස පහන් තෙල් යන දානවස්තු දෙයි. හේ යමක් දෙන්නේ ද, එය ලබන්නට පතයි. හෙ තෙම පංච කාමගුණයන්ගෙන් සමර්පිත වැ සමන්විත වැ එහි ඉඳුරන් හසුරුවන (පස්කම් සුව විඳිනා) ක්ෂත්‍රිය මහාසාරයකු හෝ බ්‍රාහ්මණ මහාසාරයකු හෝ ගෘහපති මහාසාරයකු හෝ දකී. 'මමත් කා බුන් මරණින් මතු ක්ෂත්‍රිය මහාසාරයන් ගේ හෝ බ්‍රාහ්මණ මහා-සාරයන් ගේ හෝ ගෘහපතිමහාසාරයන් ගේ හෝ එකී භාවයට පැමිණෙ-න්නෙම් නම් යෙහෙකැ යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ ඒ සිත පිහිටුවයි. ඒ සිත ඉටයි, ඒ සිත වඩයි. හීන වූ පංචකාම ගුණයන්හි ඇලුණු, මත්තෙහි නො වඩන ලද ඔහුගේ ඒ සිත එහි ඉපැත්ම පිණිස පවතී. එ ද සිල්වත්හු ගේ සිත ම ය, දුසිලක්හුගේ සිත නො වේ යැ යි කියමි. ඇවැත්නි, පිරිසිදු බැවින් සිල්වත්හු ගේ චෙතස්ප්‍රණිධිය (පැතුම) සිද්ධ වේ.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මෙහි එක්තරා පුහුලෙක් මහණකුට හෝ බමුණකුට හෝ ආහාර පාන ... පහන්තෙල් යන මේ දෑ දන් දෙයි. හේ යමක් දෙන්නේ ද එය පතයි. සිවුමහරජයෙහි වැසි දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝ යැ යි පැහැ සටහන් ඇත්තෝ යැ යි, සැප බහුල කොට ඇත්තෝ යැ යි ඔහු විසින් අසන ලද්දේ වෙයි. 'කා බුන් මරණින් මතු සිවුමහරජයෙහි දෙවියන් හා එක් වන බවට පැමිණෙන්නෙම් නම් යෙහෙකැ' යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ ඒ සිත පිහිටුවයි, ඒ සිත ඉටයි, ඒ සිත වඩයි. හීන වූ කම් සුවෙහි ඇලුණු, මත්තෙහි නො වඩන ලද ඔහුගේ ඒ සිත එහි ඉපැත්ම පිණිස පවතී. ඒ ද සිල්වත්හු ගේ සිත යැ යි, දුසිල්හුගේ සිත නො වේ යැ යි කියමි. ඇවැත්නි, පිරිසිදු බැවින් සිල්-වත්හුගේ සිතේ පැතුම සිද්ධ වේ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මෙහි එක්තරා පුහුලෙක් මහණකුට හෝ බමුණකුට හෝ ආහාර පාන ... ශයන ආවාස පහන්තෙල් යන මේ දෑ දන් දෙයි. හේ යමක් දෙන්නේ ද එය පතයි. තව්තිසාවැසි දෙවියෝ ... යාම දෙව්ලෝ වැසි දෙවියෝ ... තුසී දෙව්ලෝ වැසි දෙවියෝ ... නිර්මාණරති දෙව්ලොව වැසි දෙවියෝ ... පරනිර්මිත වශවර්ත්ති දෙව්ලොව වැසි දෙවියෝ දීර්ඝායුෂ්කභ යි වර්ණවත් භ යි, සුඛ බහුල භ යි ඔහු විසින් අසන ලද්දේ වෙයි. 'කා බුන් මරණින් මතු පරනිර්මිත වශවර්ත්ති දෙවියන්ගේ සභාවයට පැමිණියැ හෙන්-නෙම් නම් යෙහෙකැ යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ එ සිත පිහිටුවයි, ඒ සිත ඉටයි, ඒ සිත වඩයි. හීන වූ කම් සුවෙහි ඇලුණු ඔහු ගේ ඒ සිත මත්තෙහි නො වඩන ලද්දේ එහි ඉපැත්ම පිණිස පවතී. 'ඒ ද සිල්වත්හු ගේ සිත ය, දුසිල්හු ගේ සිත නො වේ' යැ යි කියමි. ඇවැත්නි, පිරිසිදු හෙයින් සිල්වත්හු ගේ සිතැ පැතුම සිදු වෙයි.

පුන ච පරං ආවුසො ඉධෙකච්චො දනං දෙති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්‍ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො යං දෙති තං පච්චාසිංසති. තස්ස සුතං හොති 'බ්‍රහ්මකායිකා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා'ති. තස්ස එවං හොති 'අහො වතාහං කායස්ස භෙද පරම්මරණා බ්‍රහ්මකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය'න්ති. සො තං චිත්තං දහති තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තං චිත්තං හීනෙ'ධිමුත්තං උත්තරිං අභාවිතං තත්‍රූපපත්තියා සංවත්තති. තඤ්ච ඛො සීලවතො වදමි නො දුස්සීලස්ස, වීතරාගස්ස නො සරාගස්ස. ඉජ්ඣතාවුසො සීලවතො චෙතොපණිධි වීතරාගත්තා.

අට්ඨ පරිසා: ඛත්තියපරිසා, බ්‍රාහ්මණපරිසා, ගහපතිපරිසා, සමණපරිසා චාතුම්මහාරාජිකපරිසා, තාවතිංසපරිසා, මාරපරිසා, බ්‍රහ්මපරිසා.

අට්ඨ ලොකධම්මා: ලාභො ච, අලාභො ච, යසො ච, අයසො ච, නින්දා ච, පසංසා ච, සුඛඤ්ච, දුක්ඛඤ්ච.

අට්ඨ අභිභායතනානි: අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං පඨමං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං දුතියං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං තතියං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං චතුත්‍ථං අභිභායතනං

තව ද අනෙකෙක. ඇවැත්නි, මෙහි එක්තරා පුඟුලෙක් මහණකුට හෝ බමුණකුට හෝ ආහාර පාන වස්ත්‍ර යාන මාලා ගන්ධ විලෙපන ශයන ආවාස පහන් තෙල් යන මේ ඈ දන් දෙයි. හේ යමක් දෙන්නේ ද, එය පතයි. ඔහු විසින් 'බ්‍රහ්මකායික දෙවියෝ දීර්ඝායුෂ්ක හ, වර්ණවත් හ, සුව බහුල කොටැත්තෝ හ' යි අසන ලද්දේ වෙයි. 'මම කා බුන් මරණින් මතු බ්‍රහ්මකායික දෙවියන් ගේ සහභාවයට පැමිණියැ හෙන්නෙම් වීම නම් යෙහෙකැ යි මෙසේ සිතෙක් ඔහුට වෙයි. ඒ සිත පිහිටුවයි, ඒ සිත ඉටයි, ඒ සිත වඩයි. ඔහුගේ ඒ සිත පහත් බඹලොවෙහි ඇලුණේ, මත්තෙහි නො වඩනා ලද්දේ එහි ඉපැත්ම පිණිස පවතී. ඒ ද සිල්වත්හු ගේ සිත යැ, දුසිල්හුගේ සිත නො වේ යැ' යි කියමි. පහවූ රාගය ඇත්තහුගේ සිත ය, රාග සහිතයාගේ සිත නො වේ යැ යි කියමි. ඇවැත්නි, සිල්වත්හුගේ චිත්තප්‍රණිධිය (පැතුම) සිදු වෙයි. පහ වූ රාගය ඇති බැවිනි.

පිරිස් අටෙක: කැත් පිරිස, බමුණු පිරිස, ගැහැවි පිරිස, මහණ පිරිස, සිවුමහරජ පිරිස, තව්තිසා දෙව් පිරිස, මර පිරිස, බඹ පිරිස.

ලොකධර්ම අටෙක: ලාභය, අලාභය, යශස, අයශස, නින්දව, ප්‍රශංසාව, සුවය, දුඃඛය.

අභිභායතන අටෙක: එකෙක් අධ්‍යාත්මරූපයෙහි පරිකර්ම වශයෙන් රූපසංඥා ඇත්තේ පිටත්හි සුවර්ණ හෝ දුර්වර්ණ හෝ පරිත්‍රාලම්බන වූ ප්‍රතිභාග නිමිති දකී. ඒ නිමිති මැඩ, 'දනිමි යි, දකිමි'යි මෙසේ සංඥ ඇත්තේ වෙයි. මේ පළමු වන අභිභායතනය යි,

එකෙක් අධ්‍යාත්මයෙහි රූප සංඥා ඇත්තේ පිටත්හි අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ නිමිත්තරූපයන් දකී. ඒ රූප මැඩ, 'දනිමි' යි 'දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ දෙවෙනි අභිභායතනය යි.

එකෙක් අධ්‍යාත්ම අරමුණෙහි පරිකර්මසංඥා නැත්තේ, පිටත්හි වූ සුවර්ණ හෝ දුර්වර්ණ වූ පරිත්‍රාලම්බන වූ පරිකර්ම නිමිති ද ප්‍රතිභාග නිමිති ද දකී. ඒ අරමුණ මැඩ, 'දනිමි' යි 'දකිමි' යි මෙබඳු සංඥා ඇත්තේ වෙයි. මේ තෙවෙනි අභිභායතනය යි.

එකෙක් අධ්‍යාත්ම අරමුණෙහි රූප සංඥා නැත්තේ, පිටත්හි වූ අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ රූපයන් දකී. ඒ රූප අභිභවා 'දනිමි' යි 'දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සතරවන අභිභායතනය යි.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි – සෙය්‍යථාපි නාම උමාපුප්ඵං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී ති එවං සඤ්ඤී හොති. ඉදං පඤ්චමං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. සෙය්‍යථාපි නාම කණිකාරපුප්ඵං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං. සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති ඉදං ඡට්ඨං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සානි ලොහිතකනිභාසානි. සෙය්‍යථාපි නාම බන්ධුජීවකපුප්ඵං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං. සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො- බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි. ලොහිතකනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී ති එවං සඤ්ඤී හොති. ඉදං සත්තමං අභිභායතන.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි. සෙය්‍යථාපි නාම ඔසධීතාරකා ඔදාතා ඔදාතවණ්ණා ඔදාතනිදස්සනා ඔදාතනිභාසා සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං ඔදාතං ඔදාතවණ්ණං ඔදාතනිදස්සනං ඔදාතනිභාසං එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී ති එවං සඤ්ඤී හොති. ඉදං අට්ඨමං අභිභායතනං.

එකෙක් අධ්‍යාත්මරූපයෙහි පරිකර්මසංඥා නැත්තේ, නිල් වූ, නිල්-වන් වූ, නිල් දකුම් ඇති, නිල්පැහැති බාහිර වූ රූප දකී. නිල් වූ, නිල්වන් වූ, නිල් දකුම් ඇති, නිල්පැහැති දියමෙරලිය මලෙක් යම් සේ වේ ද, නිල් වූ නිල්වන් වූ නිල් දකුම් ඇති, නිල් පැහැති, දෙපිට ම මට සිලිටි වූ කසීවතෙක් යම් සේ වේ ද, එසේ ම නිල් වූ, නිල්වන් වූ, නිල් දකුම් ඇති නිල්පැහැති, බාහිර කසිණාලම්බන රූපයන් අධ්‍යාත්ම-රූපයෙහි පරිකර්මසංඥා නැත්තේ දකී. ඒ රූප අභිභවා 'දනිමි දකිමි'යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ පස්වන අභිභායතනය යි.

එකෙක් අධ්‍යාත්මරූපයෙහි පරිකර්මසංඥා නැත්තේ, රන්වන් වූ, රන්වන් දකුම් ඇති, රන් පැහැති, බාහිර වූ පීත වර්ණ රූප දකී. රන්වන් වූ රන්වන් දකුම් ඇති, රන්පැහැති, පීතවර්ණ කිණිහිරි මලෙක් යම් බඳු වේ ද, දෙ පිට මට සිලිටි වූ, රන්වන් වූ, රන්වන් දකුම් ඇති, රන්පැහැති පීතවර්ණ කසී වතෙක් හෝ යම්බඳු වේ ද, එසේ ම රන්වන් වූ, රන්වන් දකුම් ඇති, රන්පැහැති, බාහිර පීතකසිණරූපයන් එකෙක් අධ්‍යාත්මයෙහි රූපසංඥා නැත්තේ දකී. ඔවුන් මැඩ, 'දනිමි'යි 'දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සවන අභිභායතනය යි.

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි රූපසංඥා නැත්තේ, රතු වූ, රත්වන් වූ, රත්වන් දකුම් ඇති, රත්පැහැති බාහිර රූපයන් දකී. රතු වූ රත්වන් වූ, රත්වන් දකුම් ඇති, රත් පැහැ වූ බඳුවද මලෙක් යම් සේ වේ ද, දෙපස මට සිලිටි වූ, රතු වූ, රත්වන් වූ, රත්වන් දකුම් ඇති, රත්පැහැ වූ, කසීවතෙක් හෝ යම් සේ වේ ද, එසේ ම රතු වූ, රත්වන් වූ, රත්-වන් දකුම් ඇති, රත්පැහැ වූ බාහිර රූපයන්, අධ්‍යාත්ම රූපයෙහි රූප සංඥා නැති එකෙක් දකී. ඔවුන් මැඩැ 'දනිමි' යි, 'දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සත්වන අභිභායතනය යි.

එකෙක් අධ්‍යාත්මරූපයෙහි රූප සංඥා නැත්තේ සුදු වූ, සුදුවන් වූ, සුදුවන් දකුම් ඇති, සුදුපැහැති වූ බාහිර රූපාලම්බනයන් දකී. සුදු වූ සුදුවන් දකුම් ඇති, සුදුපැහැ වූ, ඔෂධී තාරකාව යම් සේ ද, දෙපස මට සිලිටි වූ, සුදු වූ, සුදුවන් වූ, සුදුවන් දකුම් ඇති, සුදුපැහැති කසී වතෙක් හෝ යම් සේ වේ ද එසේ ම සුදු වූ, සුදුවන් වූ, සුදු දකුම් ඇති, සුදු පැහැ වූ, බාහිර කසිණරූපයන්, එකෙක් අධ්‍යාත්මයෙහි රූපසංඥා නැත්තේ දකී. ඔවුන් මැඩ, 'දනිමි' යි 'දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ අටවන අභිභායතනය යි.

අට්ඨ විමොක්ඛා: රූපී රූපානි පස්සති. අයං පඨමො විමොක්ඛො.
අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති. අයං දුතියො විමොක්ඛො.

සුභන්තෙව අධිමුත්තො හොති. අයං තතියො විමොක්ඛො.

සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං. චතුත්ථො විමොක්ඛො.

සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං පඤ්චමො විමොක්ඛො-

සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ඡට්ඨො විමොක්ඛො.

සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමො විමොක්ඛො.

සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිත නිරොධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමො විමොක්ඛො.

ඉමෙ ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන අට්ඨ ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

## නවකං

15. අත්ථි ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන නව ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

කතමෙ නව?

නව ආඝාත වත්ථූනි: අනත්ථං මෙ අචරීති ආඝාතං බන්ධති, අනත්ථං මෙ චරතීති ආඝාතං බන්ධති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතං බන්ධති පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති.

විමොක්ෂ අටෙක: රූපධ්‍යාන ඇත්තේ නීලකසිණරූපාදි රූපයන් ධ්‍යාන ඇසින් දකී. මේ පළමුවන විමොක්ෂය යි.

අධ්‍යාත්ම රූපයෙහි රූප සංඥා නැත්තේ බාහිර රූප දකී. මේ දෙවෙනි විමොක්ෂය යි.

දහන් ඇසින් පිරිසිදු කසිණ අරමුණු දක්නේ 'ශුභ යැ' යි ම එහි ඇලුණේ වෙයි. මේ තෙවෙනි විමොක්ෂය යි.

සර්ව ප්‍රකාරයෙන් රූප සංඥා ඉක්මීමෙන් ප්‍රතිඝසංඥාවන් පහ වැ යෑමෙන්, නානාත්වසංඥාවන් නොමෙනෙහිකිරීමෙන් 'අහස අනන්ත යැ' යි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙයි. මේ සතරවන විමොක්ෂය යි.

සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මැ 'විඥානය අනන්ත යැ' යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසෙයි. මේ පස් වන විමොක්ෂය යි.

සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ, 'කිසිත් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. මේ සවන විමොක්ෂය යි.

සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසෙයි. මේ අටවන විමොක්ෂය යි.

ඇවැත්නි, දන්නා දක්නා අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද අෂ්ට ධර්මයෝ මොහු ය. එහි සියල්ලන් විසින් ම එක් වැ ගැයිය යුතු ... එය දෙව් මිනිස්නට ප්‍රයෝජනය පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය.

## නවකය.

15. ඇවැත්නි, දන්නා දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද නව ධර්ම කෙනෙක් ඇත. එහි සියල්ලන් විසින් ම එක් වැ ගැයිය යුතු. ... එය දෙව් මිනිස්නට ප්‍රයෝජනය පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය.

කවර ධර්ම නව දෙනෙක් ද? යත්:

ආඝාත වස්තු (වෛරයට කරුණු) නවයෙක: මට අවැඩ කෙළේ යැ යි වෛර බඳී, මට දැන් අවැඩ කෙරේ යැයි වෛර බඳී, මට මතු අවැඩ කරතැ යි වෛර බඳී, මට ප්‍රිය මනාප පුද්ගලයාට අවැඩ කෙළේ යැ යි ... දැන් අවැඩ කෙරේ යැ යි ... මතු අවැඩ කරතැ යි වෛර බඳී, මට අප්‍රිය අමනාප පුද්ගලයාට වැඩ කෙළේ (අභිවෘද්ධිය සිදු කෙළේ) යැ යි ... දැන් වැඩ කෙරේ යැ යි ... මතු වැඩ කරතැ යි වෛර බඳී.

**නව ආඝාතපටිවිනයා:** අනත්ථං මෙ අචරී ති, තං කුතෙත්ථ ලබ්භා ති ආඝාතං පටිවිනෙති, අනත්ථං මෙ චරති ති තං කුතෙත්ථ ලබ්භා ති ආඝාතං පටිවිනෙති, අනත්ථං මෙ චරිස්සති ති තං කුතෙත්ථ ලබ්භා ති ආඝාතං පටිවිනෙති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සතීති තං කුතෙත්ථ ලබ්භා ති ආඝාතං පටිවිනෙති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සති ති, තං කුතෙත්ථ ලබ්භා ති ආඝාතං පටිවිනෙති.

**නව සත්තාවාසා:** සන්තාවුසො, සත්තා නානත්තකායා නානත්ත සඤ්ඤිනො සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. අයං පඨමො සත්තාවාසො.

සන්තාවුසො, සත්තා නානත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි. දෙවා බ්‍රහ්මකායිකා පඨමාභිනිබ්බත්තා. අයං දුතියො සත්තාවාසො.

සන්තාවුසො සත්තා එකත්තකායා නානත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා ආභස්සරා. අයං තතියො සත්තාවාසො.

සන්තාවුසො, සත්තා එකත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. අයං. චතුත්ථො සත්තාවාසො,

සන්තාවුසො, සත්තා අසඤ්ඤිනො අප්පටිසංවෙදිනො සෙය්‍යථාපි දෙවා අසඤ්ඤසත්තා.[1] අයං පඤ්චමො සත්තාවාසො.

සන්තාවුසො, සත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝ-සඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකා-සො ති ආකාසානඤ්චායතනූපගා. අයං ඡට්ඨො සත්තාවාසො.

සන්තාවුසො, සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනූපගා. අයං සත්තමො සත්තාවාසො.

---

1. අසඤ්ඤිසත්තා (ස්‍යා, කම)

අඝාතප්‍රතිවිනය (වෛර දුරු ලන කරුණු) නවයෙක: මේ මට අවැඩ කෙළේ යැ යි (ඒ අවැඩ කිරීම නො වේ වා යි ඒ පුඟුලා කෙරෙහි) එය කොයින් ලද හැකි ද යි සිතන්නේ වෛර දුරු ලයි. මේ මට දැන් අවැඩ කෙරේ යැ යි එය ඔහු කෙරෙහි කොයින් ලද හැකි දැයි සිතන්නේ වෛර දුරු ලයි. ඔහු මට මතු අවැඩ කරතැ යි යන එය (ඔහු කෙරෙහි) කොයින් ලද හැකි ද යි සිතනුයේ වෛර දුරු ලයි. මගේ ප්‍රිය මනාප පුඟුලාට මේ අවැඩ කෙළේ යැ යි ... මේ දැන් අවැඩ කෙරේ යැ යි ... ඔහු මතු අවැඩ කරතැයි යන එය (ඔහු කෙරෙහි) කොයින් ලද හැකි ද යි සිතනුයේ වෛර දුරු ලයි. මට අප්‍රිය වූ අමනාප වූ පුඟුලාට මේ වැඩ සිදු කෙළේ ය ... දැන් වැඩ සිදු කෙරෙයි ... මතු වැඩ සිදු කෙරෙතැ යි යන එය ඔහු කෙරේ කොයින් ලද හැකි ද යි සිතනුයේ වෛර දුරු ලයි.

සත්වාවාස (සත්වයනට වාසස්ථාන) නවයෙක: ඇවැත්නි, මිනිසුන් ද ඇතැම් දෙවියන් ද ඇතැම් විනිපාතිකයන් ද සේ කයැ වෙනස් බව ඇති, ප්‍රතිසන්ධිසංඥායෙහි ද වෙනස් බව ඇති සත්ව කෙනෙක් ඇත. මේ පළමු සත්වාවාසය යැ.

ඇවැත්නි, කල්පාරම්භ සමයෙහි උපන් බ්‍රහ්මකායික දෙවියන් සේ කයින් වෙනස් වූ ප්‍රතිසන්ධිසංඥායෙන් සමාන වූ සත්ව කෙනෙක් ඇත. මේ දෙවෙනි සත්වාවාසය යැ.

ඇවැත්නි, ආභස්සර දෙවියන් සේ වූ කයැ සමාන බව ඇති ප්‍රතිසන්ධිසංඥායෙහි වෙනස් බව ඇති සත්ව කෙනෙක් ඇත. මේ තෙවෙනි සත්වාවාසය යැ.

ඇවැත්නි, ශුභකෘත්ස්නක දෙවියන් සේ කයැ සමාන බව ඇති, ප්‍රතිසන්ධිසංඥාවේ ද සමාන බව ඇති සත්ව කෙනෙක් ඇත. මේ සිවුවැනි සත්වාවාසය යැ.

ඇවැත්නි අසංඥසත්ව දෙවියන් සේ ප්‍රතිසන්ධිසංඥාව නැති, විඳුම් නැති සත්ව කෙනෙක් ඇත. මේ පස්වැනි සත්වාවාසය යැ.

ඇවැත්නි, හැම සැටියෙන් ම රූප සංඥාවන් ඉක්මීමෙන්, ප්‍රතිඝසංඥාවන් අතුරුදහන් වීමෙන්, නානාත්වසංඥාවන් නො මෙනෙහි කිරීමෙන්, 'අහස අනන්ත යැ' යි සමාධි වඩා ආකාසානඤ්චායතනයට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ සවැනි සත්වාවාසය යැ.

ඇවැත්නි, හැම අයුරින් ආකාසානඤ්චායතනය ඉක්මැ, 'විඥානය අනන්ත යැ' යි සමාධි වඩා විඤ්ඤාණඤ්චායතනයට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ සත්වැනි සත්වාවාසය යැ.

සන්තාවුසො, සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගා. අයං අට්ඨමො සත්තාවාසො.

සන්තාවුසො, සත්තා සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම. නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගා. අයං නවමො සත්තාවාසො.

නව අක්ඛණා අසමයා බ්‍රහ්මචරියවාසාය: ඉධාවුසො, තථාගතො ච ලොකෙ උප්පන්නො හොති අරහං සම්මාසම්බුද්ධො, ධම්මො ච දෙසීයති ඔපසමිකො පරිනිබ්බානිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො, අයං ච පුග්ගලො නිරයං උපපන්නො හොති. අයං පඨමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

පුන ච පරං ආවුසො, තථාගතො ච ලොකෙ උප්පන්නො හොති අරහං සම්මාසම්බුද්ධො. ධම්මො ච දෙසීයති ඔපසමිකො පරිනිබ්බානිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො. අයං ච පුග්ගලො තිරච්ඡානයොනිං උපපන්නො හොති. අයං දුතියො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය -පෙ- පෙත්තිවිසයං උපපන්නො හොති -පෙ- අසුරකායං උපපන්නො හොති -පෙ- අඤ්ඤතරං දීඝායුකං දෙවනිකායං උපපන්නො හොති -පෙ- පච්චන්තිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති මිලක්ඛෙසු[1] අවිඤ්ඤාතාරෙසු යත්ථ නත්ථි ගති භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං. අයං ඡට්ඨො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

පුන ච පරං ආවුසො, තථාගතො ච ලොකෙ උප්පන්නො හොති අරහං සම්මාසම්බුද්ධො. ධම්මො ච දෙසීයති ඔපසමිකො පරිනිබ්බානිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො. අයං ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති, සො ච හොති මිච්ඡාදිට්ඨිකො විපරීතදස්සනො නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං[2] කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. අයං සත්තමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

---

1. මිලක්ඛෙසු (ස්‍යා, කම්) මිලක්ඛූසු (කත්ථචි)
2. සුකතදුක්කතානං (මජ්ඣං)

ඇවැත්නි, හැම අයුරින් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ 'කිසිත් නැතැ' යි සමාධි වඩා, ආකිඤ්චඤ්ඤායතනයට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ අටවැනි සත්වාවාසය යැ.

ඇවැත්නි, හැම අයුරින් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ නවවැනි සත්වාවාසය යි.

බ්‍රහ්මචර්යවාසයට නො සුදුසු කාල වූ අක්ෂණ නවයෙක: ඇවැත්නි, මෙහි අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ලොවැ පහළ වූ සේක් වෙති. කෙලෙස් සංසිඳුවන, කෙලෙස් පිරිනිවන ගෙනැදෙන, මාර්ගඥානප්‍රතිවෙධයට යන, සුගතයන් විසින් ප්‍රකාශිත ධර්මය ද දෙසනු ලැබෙයි. එහෙත් මේ පුද්ගල තෙමේ නිරයට වන්නේ වෙයි. මේ බ්‍රහ්මචර්යවාසයට නොසුදුසු කාලය වූ පළමු වැනි අක්ෂණය යැ.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ලොවැ පහළ වූ සේක් වෙති. කෙලෙස් නිවන, කෙලෙස් පිරිනිවන ගෙනැ දෙන, මාර්ගඥාන ප්‍රතිවෙධයට යන, සුගතයන් විසින් ප්‍රකාශිත දහම ද දෙසෙයි. එහෙත් මේ පුඟුල් තෙමේ තිරිසන් යොනියට පැමිණියේ වෙයි. මේ බ්‍රහ්මචර්යවාසයට නො සුදුසු කාලය වූ දෙවෙනි අක්ෂණය යැ.

... ප්‍රේත ලොකයට පැමිණියේ වෙයි ...

... අසුර නිකායයට පැමිණියේ වෙයි ...

... දීර්ඝායුෂ්ක දේවනිකායකට පැමිණියේ වෙයි ...

යම් තැනෙක මහණුන් ගේ මෙහෙණන් ගේ උවසුවන් ගේ උවැසියන් ගේ හැසිරීමෙක් නැති, පව් පින් දන්නවුන් නැති ප්‍රත්‍යන්තයෙහි වූ ම්ලේච්ඡ ජනපදයන්හි උපන්නේ වෙයි. මේ බ්‍රහ්මචර්යවාසයට නො සුදුසු කාලය වූ සවැනි අක්ෂණය වෙයි.

තව ද අනෙකෙක. ඇවැත්නි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ලොවැ පහළ වූ සේක් වෙති. කෙලෙස් නිවන, කෙලෙස් පිරිනිවන ගෙනැ දෙන, මාර්ගඥානප්‍රතිවෙධයට යන, සුගතයන් විසින් ප්‍රකාශිත ධර්මය ද දෙසනු ලැබෙයි. මේ පුද්ගල තෙමේ මධ්‍යම ජනපද අතුරෙන් එකෙක උපන්නේ ද වෙයි. එහෙත් හෙ තෙමේ 'දුන් දූයෙහි පල නැත, යාගයෙහි (මහ දන් හි) පල නැත, පූජායෙහි පල නැත, සුකෘත දුෂ්කෘත (කුශලාකුශල) කර්මයන්ගේ ඵල විපාක නැත, මෙ ලොව නැත, පර ලොව නැත, මවට කළ සත්කාරයෙහි පල නැත, පියාට කළ සත්කාරයෙහි පල නැත, උපපාදුක (කම වූ පරිදි මැරී උපදනා) සත්වයෝ නැත, සම කෙනෙක් මෙ ලොව ද පර ලොව ද තුමූ වෙසෙසි නුවණින් දැන, පසක් කොට පවසන්නාහු නම්, එසේ වූ සම්‍යග්ගත (නො වැරැදි මගින් ගිය) සම්‍යක්ප්‍රතිපන්න (නොවැරැදී මඟැ පිළිපන්) මහණ බමුණෝ ලෙව්හි නැතැ යි ගත් පෙරළුණු දෘෂ්ටි ඇති මිසදිටුවෙක් වෙයි. මේ බ්‍රහ්මචර්යවාසය පිණිස නො සුදුසු කාල වූ සත්වැනි අක්ෂණය වෙයි.

පුන ච පරං ආවුසො, තථාගතො ච ලොකෙ උප්පන්නො හොති අරහං සම්මාසම්බුද්ධො ධම්මො ච දෙසීයති ඔපසමිකො පරිනිබ්බානිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො. අයං ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති. සො ච හොති දුප්පඤ්ඤො ජළො එළමූගො න පටිබලො සුභාසිතදුබ්භාසිතානමත්ථමඤ්ඤාතුං. අයං අට්ඨමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

පුන ච පරං ආවුසො, තථාගතො ච ලොකෙ න උප්පන්නො හොති අරහං සම්මාසම්බුද්ධො, ධම්මො ච න දෙසීයති ඔපසමිකො පරිනිබ්බානිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො, අයං ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති සො ච හොති පඤ්ඤවා අජළො අනෙළමූගො පටිබලො සුභාසිතදුබ්භාසිතානමත්ථමඤ්ඤාතුං. අයං නවමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

**නව අනුපුබ්බවිහාරා:** ඉධාවුසො, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති.

විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති.

පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති.

සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති.

සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති.

සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති.

සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති.

තව ද අනෙකෙක. ඇවැත්නි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ තථාගත-යන් වහන්සේ ලොවැ පහළ වූ සේක් වෙති. කෙලෙස් නිවන, කෙලෙස් පිරිනිවන ගෙනැ දෙන, මාර්ගඥාන ප්‍රතිවෙධයට යන, සුගතයන් විසින් ප්‍රකාශිත ධර්මය ද දෙසනු ලැබෙයි. මේ පුද්ගල තෙමේ මධ්‍යම ජනපද අතුරෙන් එකෙක උපන්නේ ද වෙයි. එහෙත් හේ නුවණ නැති, ජඩ වූ, කෙළතොලු වූ මොනොවට කී ද නපුරු කොට කී ද වචනයන්ගේ අර්ථ දැනගන්නට ප්‍රතිබල නො වෙයි. මේ බ්‍රහ්මචර්යාවාසයට නො සුදුසු කාල වූ අටවැනි අක්ෂණය වේ.

තව ද අනෙකෙක. ඇවැත්නි, අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ලොවැ නො පහළ වූ සේක් වෙති. කෙලෙස් නිවන කෙලෙස් පිරිනිවන ගෙනැ දෙන, මාර්ගඥාන ප්‍රතිවෙධයට යන, සුගතයන් විසින් ප්‍රකාශිත ධර්මය වූ කලී නො දෙසනු ලැබෙයි. මේ පුද්ගල තෙමේ මධ්‍යම ජනපද අතුරෙන් එකෙක උපන්නේ ද වෙයි. හේ ප්‍රඥා ඇත්තේ, ජඩ නො වූයේ, කෙලතොලු නො වූයේ, මොනොවට කී ද නපුරු කොට කී ද වචනයන්ගේ අර්ථ දැනගන්නට සමර්ථ වෙයි. මේ බ්‍රහ්මචර්යවාසයට නො සුදුසු කාල වූ නව වැනි අක්ෂණය වෙයි.

අනුපූර්ව විහාර නවයෙක: ඇවැත්නි, මෙහි මහණ තෙමේ කාමයන් ගෙන් වෙන් වැ ම, අකුසල් දහමුන් ගෙන් වෙන් වැ මැ, විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන්, ප්‍රීතිය හා සුව හා ඇති පළමු දහන ලැබ වෙසෙයි.

විතර්කවිචාරයන් සංසිඳීමෙන්... දෙවෙනි දහන ලැබ වෙසෙයි.
ප්‍රීතිය ද පහ වීමෙන්... තෙවෙනි දහන ලැබ වෙසෙයි.
සුඛවේදනාව ද දුරැලීමෙන්... සතර වන දහන් ලැබ වෙසෙයි.

හැම ලෙසින් රූප සංඥා ඉක්මීමෙන්, ප්‍රතිඝ සංඥාවන් අතුරුදහන් වීමෙන්, නානාත්ව සංඥාවන් නො මෙනෙහි කිරීමෙන් 'අහස අනන්ත යැ' යි (සමාධි වඩා) ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වෙසෙයි.

හැම ලෙසින් අකාසානඤ්චායතනය ඉක් මැ, විඥානය අනන්ත යැ යි (සමාධි වඩා) විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වෙසෙයි.

හැම ලෙසින් විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ඉක්මැ, 'කිසිත් නැතැ' යි (සමාධි වඩා) ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වෙසෙයි.

හැම ලෙසින් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ නෙවසඤ්ඤානාසඤ්ඤා-යතන ධ්‍යානයට පැමිණ වෙසෙයි.

සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිත-නිරොධං උපසම්පජ්ජ විහරති.

නව අනුපුබ්බනිරොධා: පඨමං ඣානං සමාපන්නස්ස කාමසඤ්ඤා නිරුද්ධා හොති, දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා නිරුද්ධා හොන්ති, තතියං ඣානං සමාපන්නස්ස පීති නිරුද්ධා හොති, චතුත්ථං ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා නිරුද්ධා හොන්ති, ආකාසානඤ්චා-යතනං සමාපන්නස්ස රූපසඤ්ඤා නිරුද්ධා හොති, විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤා නිරුද්ධා හොති, ආකිඤ්චඤ්ඤා-යතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා නිරුද්ධා හොති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා නිරුද්ධා හොති, සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච නිරුද්ධා හොන්ති.

ඉමෙ ඛො ආවුසො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා-සම්බුද්ධෙන නව ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

### දසකං

16. අත්ථි ඛො ආවුසො, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන දස ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං -පෙ- අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

කතමෙ දස:

දස නාථකරණා ධම්මා: ඉධාවුසො, භික්ඛු සීලවා හොති පාතිමොක්ඛ-සංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. යං අවුසො භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, අයම්පි ධම්මො නාථකරණො.

හැම ලෙසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය ඉක්මැ සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසෙයි.

අනුපූර්ව නිරොධ (පිළිවෙළින් නිරුද්ධ වීම) නවයෙක: ප්‍රථම ධ්‍යානයට සමවන්නහුට කාම සංඥාව නිරුද්ධ වෙයි. ද්විතීය ධ්‍යානයට සමවන්නහුට විතර්ක විචාරයෝ නිරුද්ධ වෙත්. තෘතීය ධ්‍යානයට සමවන්නහුට ප්‍රීතිය නිරුද්ධ වෙයි. චතුර්ථ ධ්‍යානයට සමවන්නහුට ආශ්වාස ප්‍රශ්වාසයෝ නිරුද්ධ වෙත්. ආකාසානඤ්චායතනයට සමවන්නහුට රූප සංඥව නිරුද්ධ වෙයි. විඤ්ඤාණඤ්චායතනයට සමවන්නහුට ආකාසානඤ්චායතන සංඥව නිරුද්ධ වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහුට විඤ්ඤාණඤ්චායතන සංඥව නිරුද්ධ වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්නහුට ආකිඤ්චඤ්ඤායතන සංඥව නිරුද්ධ වෙයි. සඤ්ඤාවෙදයිත නිරෝධයට සමවනුනහුට සංඥව ද වෙදනාව ද නිරුද්ධ වේ.

ඇවැත්නි, මොහු දන්නා දක්නා අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද නව ධර්මයෝ යැ. එහි සියල්ලන් විසින් ම සමග වැ ගැයියැ යුතු. එය... දෙව්මිනිස්නට ප්‍රයෝජන පිණිස, වැඩ පිණිස, සුව පිණිස පවතී.

### දශකය

16. ඇවැත්නි, දන්නා දක්නා අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද දශ ධර්මයෝ ඇත. එහි සියල්ලන් විසින් ම සමග වැ ගැයියැ යුතු... එය... දෙව්මිනිස්නට ප්‍රයෝජන පිණිස, වැඩ පිණිස සුව පිණිස වෙයි.

කවර දශධර්ම කෙනෙක් ද යත්:

නාථකරණ (තම හට පිහිට සලසන) ධර්ම දශයෙක: ඇවැත්නි, මෙහි මහණ තෙමේ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂසංවර ශීලයෙන් හැවුරුණේ, ආචාර ගොචර සම්පන්න වැ සචල්පමාත්‍ර වරදෙහි ද බිය දක්නා සුලු වැ වෙසෙයි. සමාදන් කොට ගෙන සිකපදන්හි හික්මෙයි. ඇවැත්නි, 'මහණ තෙමේ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් හැවුරුණේ ආචාර ගොචර දෙකින් යුතු වැ, සචල්පමාත්‍ර දෙෂයන්හි ද බිය දක්නා සුලු වැ වෙසෙයි, සමාදන් කොට ගෙන සිකපදන්හි හික්මෙයි යන යමෙක් ඇද්ද, මෙය ද නාථකරණ ධර්මයෙක.

පුන ච පරං ආවුසො, භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා[1] කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපා'ස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[2] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. යම්පාවුසො, භික්ඛු බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො, භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො. යම්පාවුසො, භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො, භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං. යම්පාවුසො, භික්ඛු සුවචො හොති -පෙ- පදක්ඛිණග්ගාහී අනුසාසනිං අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො, භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං. යම්පාවුසො, භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං -පෙ- අලං සංවිධාතුං, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො, භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො. යම්පාවුසො, භික්ඛු ධම්මකාමො හොති-පෙ-අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො, අයම්පි ධම්මො නාථකරණො.

1. සාත්ථං සබ්‍යඤ්ජනං (PTS සං.)
2. ධාතා (මජසං)

ඇවැත්නි, තව ද අනෙකෙක. මහණ තෙම බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වෙයි, ඇසූ දහම් සිතෑ දරන්නේ වෙයි, ඇසූ දහම් සිතින් රැස් කොට ගන්නේ වෙයි. ආදියෙහි යහපත් වූ, මැද යහපත් වූ, අවසනැ යහපත් වූ, අර්ථ සහිත වූ, ව්‍යංජන සහිත වූ යම් ධර්ම කෙනෙක් හැම ලෙසින් පිරිපුන් වූ පිරිසිදු බඹසර ප්‍රකාශ කෙරෙත් ද, එසේ වූ ධර්මයෝ ඔහු විසින් බෙහෙවින් අසන ලද්දහු, වචනයෙන් දරන ලද්දහු, වචනයෙන් පුරුදු කරන ලද්දහු, සිතින් පුන පුනා විමසන ලද්දහු, දෘෂ්ටි-යෙන් මොනොවට පිළිවිදුනා ලද්දහු වෙත්. ඇවැත්නි, මහණ තෙමේ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වෙයි.... දෘෂ්ටියෙන් මොනොවට පිළිවිදුනා ලද්දහු වෙත් යන මෙය ද නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ කලණ මිතුරන් ඇත්තේ, කලණ යහලුවන් ඇත්තේ, කලණ මිතුරනට ම නැමුණේ වෙයි. ඇවැත්නි, මහණ තෙමෙ කලණ මිතුරන් ඇත්තේ, කලණ යහලුවන් ඇත්තේ, කලණ මිතුරනට ම නැමුණේ වේ යන යමෙක් ඇද්ද, මෙය ද නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමෙ සුවච වෙයි, සුවච බව කරන දහමුන් ගෙන් යුක්ත වූයේ, ඉවසනුයේ කරන අනුශාසනය ආදරයෙන් පිළිගන්නේ වෙයි, ඇවැත්නි, මහණ තෙමෙ සුවච වෙයි... අනුශාසනය ආදරයෙන් පිළිගන්නේ වේ යන යමෙක් වේ ද, මේ ද නාථ කරණ ධර්මයෙක.

තව ද අනෙකෙක. ඇවැත්නි, කුම් කෙරෙම් දැ යි අසා කළ යුතු වූ සබ්‍රම්සරුවන්ගේ යම් කුදු මහත් කටයුතු කෙනෙක් ඇද්ද, මහණ තෙමේ එහි දක්ෂ ද අනලස් ද එයට උපාය මාර්ග වූ නුවණින් සමන්-විත ද, එය කරනුයෙහි සමර්ථ ද එය පිළිබඳ විචාරණයෙහි සමර්ථ ද වෙයි. ඇවැත්නි,...සබ්‍රම්සරුවන් ගේ යම් කුදු මහත් කටයුතු කෙනෙක් ඇද් ද... එය පිළිබඳ විචාරණයෙහි සමර්ථ ද වේ යන යමෙක් ඇද්ද, මෙයත් නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමෙ ධර්මය කැමැත්තේ වෙයි, ප්‍රිය සමුදහාර (කියන දහම් සකසා ඇසීමත් උගත් බණ පරනට දෙසනු රිසියත්) ඇත්තේ වෙයි. අභිධර්මයෙහි අභිවිනයයෙහි බහුල ප්‍රමොදය ඇත්තේ වෙයි. ඇවැත්නි, මහණ තෙමේ ධර්මය කැමැත්තේ වෙයි... අභිධර්මයෙහි අභිවිනයයෙහි බහුල ප්‍රමොදය ඇත්තේ වෙයි යන යමෙක් ඇද්ද, මෙය ද නාථ කරණ ධර්මයෙක.

පුන ච පරං ආවුසො, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙහි චීවර-පිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරෙහි, යම්පාවුසො, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙහි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චය-භෙසජ්ජපරික්ඛාරෙහි අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො, භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හ-පරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. යම්පාවුසො, භික්ඛු ආරද්ධවිරියො විහරති -පෙ- අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො, භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. යම්පාවුසො, භික්ඛු සතිමා හොති -පෙ- සරිතා අනුස්සරිතා අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා, යම්පාවුසො, භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා, අයම්පි ධම්මො නාථකරණො.

**දස කසිණායතනානි :** පඨවීකසිණමෙකො[1] සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං. ආපොකසිනමෙකො සඤ්ජානාති -පෙ- තෙජොකසිණමෙකො සඤ්ජානාති -පෙ- වායොකසිණමෙකො සඤ්ජා-නාති -පෙ- නීලකසිණමෙකො සඤ්ජානාති -පෙ- පීතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ලොහිතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ඔදාත-කසිණමෙකො සඤ්ජානාති -පෙ- ආකාසකසිණමෙකො සඤ්ජානාති විඤ්ඤාණකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං.

---

1. පථවීකසිණමෙකො (මජසං)

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ ඉතරෙතර (ලැබුණු යම් කවර හෝ) චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලාන ප්‍රත්‍යය භෛෂජ්‍ය-පරිෂ්කාරයන් ගෙන් සතුටු වෙයි. ඇවැත්නි, මහණ තෙම ඉතරෙතර චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයන් ගෙන් සතුටු වේ යන යමෙක් ඇද්ද, මෙය ද නාථ කරණ ධර්මයෙක.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ අකුසල් දහමුන් පහ කරනුවට, කුසල් දහමුන් පිළිලබනුවට, ආරබ්ධ වීර්ය ඇත්තේ බල ඇත්තේ, දැඩි වැර ඇත්තේ, කුසල් දහම් ලබනුවට බහා නො තැබූ වීර්ය ඇත්තේ වෙසෙයි. ඇවැත්නි, මහණ තෙමේ... ආරබ්ධ වීර්ය ඇත්තේ... කුසල් දහම් ලබනුවට බහා නො තැබූ වීර්ය ඇත්තේ වෙසෙයි යන යමෙක් ඇද්ද, මෙය ද නාථ කරණ ධර්මයෙක.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ බොහෝ කලකට පෙර කළ දෑ ද බොහෝ කලකට පෙර කී දෑ ද සිහි කරනුයේ, පුන-පුනා සිහි කරනුයේ, උතුම් ම සිහියෙන් ද සථානොචිත ප්‍රඥායෙන් ද සමන්විත වූයේ ස්මෘතිමත් වෙයි. ඇවැත්නි, 'මහණ තෙමෙ... සිහි කරනුයේ පුන පුනා සිහිකරනුයේ, ස්මෘතිමත් වෙයි' යන යමෙක් ඇද්ද, මේ ද නාථ කරණ ධර්මයෙක.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමෙ (සංස්කාරයන් ගේ) ඉපැත්ම ද නැස්ම ද පිරිසිඳිනු සමත් වූ, ලොභස්කන්ධාදීන් විදලනුයෙහි සමත් වූ, මොනොවට දුක්වැනැස්මට යන පිරිසිදු ප්‍රඥයෙන් සමන්විත වූයේ, ප්‍රඥාවත් වෙයි. ඇවැත්නි, 'මහණ තෙමේ (සංස්කාරයන් ගේ) ඉපැත්මත් වැනැස්මත් පිරිසිඳිනු සමත් වූ, ලොභස්කන්ධාදීන් විදලනුයෙහි සමත් වූ, මොනොවට දුක් වැනැස්මට යන පිරිසිදු ප්‍රඥායෙන් සමන්විත වූයේ ප්‍රඥවත් වේ' යන යමෙක් ඇද්ද, මෙය ද නාථ-කරණ ධර්මයෙක.

කසිණායතන දශයෙක: එකෙක් උඩ යට සරසැ දෙකක් නොවූ (එකක් ම වූ) අප්‍රමාණ පඨවිකසිණය හඳුනයි. එකෙක් ... ආපොකසිණය හඳුනයි, එකෙක් ... තෙජොකසිණය හඳුනයි, එකෙක් ... වායොකසිණය හඳුනයි. එකෙක් ... නීලකසිණය හඳුනයි. එකෙක් ... පීතකසිණය හඳුනයි. එකෙක් ... ලොහිතකසිණය හඳුනයි. එකෙක් ... ඔදාතකසිණය හඳුනයි. එකෙක් ... ආකාසකසිණය හඳුනයි. එකෙක් උඩ යට සරස දෙකක් නොවූ (එකක් ම වූ) අප්‍රමාණ විඤ්ඤාණකසිණය (කසිණුග්ඝාටිමාකාසය අරමුණු කරන සිත) හඳුනයි.

දස අකුසලකම්මපථා : පාණාතිපාතො, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරො, මුසාවාදො, පිසුණා වාචා, ඵරුසා වාචා, සම්ඵප්පලාපො, අභිජ්ඣා, බ්‍යාපාදො, මිච්ඡාදිට්ඨි.

දස කුසලකම්මපථා : පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, මුසාවාදා වෙරමණී, පිසුණාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අනභිජ්ඣා, අබ්‍යාපාදො, සම්මාදිට්ඨි,

දස අරියවාසා : ඉධාවුසො, භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති ඡළඞ්ගසමන්නාගතො එකාරක්ඛො චතුරාපස්සෙනො පනුන්නපච්චෙක–සච්චො සමවයසට්ඨෙසනො අනාවිලසංකප්පො පස්සද්ධකායසංඛාරො සුවිමුත්තචිත්තො සුවිමුත්තපඤ්ඤො.

කථඤ්ච ආවුසො, භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති: ඉධාවුසො, භික්ඛුනො කාමච්ඡන්දො පහීනො හොති, බ්‍යාපාදො පහීනො හොති, ථීනමිද්ධං පහීනං හොති, උද්ධච්චකුක්කුච්චං පහීනං හොති, විචිකිච්ඡා පහීනා හොති. එවං ඛො ආවුසො භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති.

කථඤ්ච ආවුසො, භික්ඛු ඡළඞ්ගසමන්නාගතො හොති: ඉධාවුසො, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො. සොතෙන සද්දං සුත්වා –පෙ– ඝානෙන ගන්ධං ඝායිත්වා –පෙ– ජිව්හාය රසං සායිත්වා –පෙ– කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා –පෙ– මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො. එවං ඛො ආවුසො භික්ඛු ඡළඞ්ගසමන්නාගතො හොති.

කථඤ්ච ආවුසො, භික්ඛු එකාරක්ඛො හොති: ඉධාවුසො, භික්ඛු සතාරක්ඛෙන චෙතසා සමන්නාගතො හොති. එවං ඛො ආවුසො, භික්ඛු එකාරක්ඛො හොති.

අකුශල කර්මපථ දශයෙක: ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමයන්හි වරදවා හැසිරීම, මුසා බස් බිණීම, කේලාම් කීම, පරොස් බස් බිණීම, ප්‍රලාප දෙඩීම, අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය.

කුශල කර්මපථ දශයෙක: පණිවායෙන් වැළැක්ම, අයිනාදනින් වැළැක්ම, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළැක්ම, මුසවායෙන් වැළැක්ම, පෙහෙසුන් තෙප්ලෙන් වැළැක්ම, පරොස් බසින් වැළැක්ම, ප්‍රලාප දෙඩීමෙන් වැළැක්ම, අනභිධ්‍යාව, අව්‍යාපාදය, සම්‍යග්දෘෂ්ටිය.

ආර්යවාස (උතුමන් ගේ විසුම්) දශයෙක: ඇවැත්නි, මෙහි මහණ තෙමෙ අඞ්ග පසෙකින් විප්‍රයුක්ත වූයේ, අඞ්ග සයෙකින් සමන්විත වූයේ, එක් ම ආරක්ෂාවක් ඇත්තේ, අපශ්‍රයණ සතරක් ඇත්තේ, මොනොවට බැහැර කරන ලද ප්‍රත්‍යෙකසත්‍ය ඇත්තේ, නො අඩු කොට මොනොවට දුරු කරන ලද එෂණා ඇත්තේ, නො කැළැඹුණු කල්පනා ඇත්තේ, සංහිඳුණු කායසංස්කාර ඇත්තේ, මොනොවට මිදුණු සිත් ඇත්තේ, මොනොවට මිදුණු ප්‍රඥා ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමෙ කෙසේ නම් අඞ්ග පසෙකින් විප්‍රයුක්ත වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණහුගේ කාමච්ඡන්දය ප්‍රහීණ වෙයි. ව්‍යාපාදය ප්‍රහීණ වෙයි, ථිනමිද්ධය ප්‍රහීණ වෙයි, උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණ වෙයි, විචිකිච්ඡාව ප්‍රහීණ වෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමෙ අංග පසෙකින් විප්‍රයුක්ත වෙයි.

ඇවැත්නි, මහණ තෙමෙ කෙසේ නම් අඞ්ග සයෙකින් සමන්විත වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමෙ ඇසින් රූපයක් දැක නො ම සතුටු ද වෙයි, නො ම නොසතුටු ද වෙයි. සිහි ඇත්තේ නුවණින් දන්නේ උපෙක්ෂක වැ වෙසෙයි. කනින් හඬක් අසා, ... නැහැයන් ගඳක් අසා, ... දිවින් රසක් විඳ, ... කයින් හැපෙන දැයක් පැහැසැ, ... මනසින් දහම් අරමුණක් සිතා නො ම සතුටු ද වෙයි, නො වෙයි, සිහි ඇත්තේ, නුවණින් ම නොසතුටු ද දන්නේ, උපෙක්ෂක ද වැ වෙසෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ අඞ්ග සයෙකින් සමන්විත වෙයි.

ඇවැත්නි, කෙසේ නම් මහණ තෙමෙ එක ම ආරක්ෂාවක් ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමෙ සිහිය ම ආරක්ෂාව කොටැති සිතින් යුක්ත වෙයි. ඇවැත්නි, මහණ තෙමෙ මෙසේ ම එක් ආරක්ෂාවක් ඇත්තේ වෙයි.

කථං ඤ්ච ආවුසො, භික්ඛු චතුරාපස්සෙනො හොති, ඉධාවුසො, භික්ඛු සඞ්ඛායෙකං පටිසෙවති, සඞ්ඛායෙකං අධිවාසෙති, සඞ්ඛායෙකං විනොදෙති, සඞ්ඛායෙකං පරිවජ්ජෙති. එවං ඛො ආවුසො, භික්ඛු චතුරාපස්සෙනො හොති.

කථං ඤ්ච ආවුසො, භික්ඛු පනුණ්ණපච්චෙකසච්චො හොති, ඉධාවුසො, භික්ඛුනො යානි තානි පුථුසමණබ්‍රාහ්මණානං පුථුපච්චෙකසච්චානි සබ්බානි තානි නුන්නානි හොන්ති පනුන්නානි චත්තානි වන්තානි මුත්තානි පහීනානි පටිප්පස්සද්ධානි. එවං ඛො ආවුසො, භික්ඛු පනුණ්ණපච්චෙකසච්චො හොති.

කථං ඤ්චාවුසො, භික්ඛු සමවයසට්ඨෙසනො හොති: ඉධාවුසො භික්ඛුනො කාමෙසනා පහීනා හොති, භවෙසනා පහීනා හොති, බ්‍රහ්මචරියෙසනා පටිප්පස්සද්ධා හොති. එවං ඛො ආවුසො, භික්ඛු සමවයසට්ඨෙසනො හොති,

කථං ඤ්චාවුසො, භික්ඛු අනාවිලසඞ්කප්පො හොති: ඉධාවුසො, භික්ඛුනො කාමසඞ්කප්පො පහීනො හොති, බ්‍යාපාදසඞ්කප්පො පහීනො හොති, විහිංසාසංකප්පො පහීනො හොති. එවං ඛො ආවුසො, භික්ඛු අනාවිලසඞ්කප්පො හොති.

කථං ඤ්චාවුසො, භික්ඛු පස්සද්ධකායසංඛාරො හොති: ඉධාවුසො, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එවං ඛො ආවුසො, භික්ඛු පස්සද්ධකායසඞ්ඛාරො හොති.

කථං ඤ්චාවුසො, භික්ඛු සුවිමුත්තචිත්තො හොති: ඉධාවුසො භික්ඛුනො රාගා චිත්තං විමුත්තං හොති දොසා චිත්තං විමුත්තං හොති මොහා චිත්තං විමුත්තං හොති. එවං ඛො ආවුසො, භික්ඛු සුවිමුත්තචිත්තො හොති.

ඇවැත්නි, කෙසේ නම් මහණ තෙමේ අපශ්‍රයණ (ආධාර) සතරක් ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමෙ නුවණින් සලකා එකක් සෙවියි, නුවණින් බලා එකක් ඉවසයි, නුවණින් බලා එකක් පහ කරයි, නුවණින් බලා එකක් ඉවත් කෙරෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමේ අපශ්‍රයණ සතරක් ඇත්තේ වෙයි.

ඇවැත්නි, කෙසේ නම්, මහණ තෙමෙ මොනොවට බැහැර කරන ලද ප්‍රත්‍යෙක සත්‍ය ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, බොහෝ මහණ බමුණන් ගේ යම් බොහෝ ප්‍රත්‍යෙක සත්‍ය කෙනෙක් ( මේ දර්ශනය ම සත්‍ය යැ' යි වෙන වෙන ම ඒ ඒ මහණබමුණන් විසින් දැඩි කොට සත්‍ය වශයෙන් පිළිගන්නා ලද දෑ) වෙත් ද, මෙ සස්නැ මහණහු විසින් ඔහු හැම බැහැර කරන ලද්දහු, දුරු කරන ලද්දහු, හැර දමන ලද්දහු, පහ කරන ලද්දහු, මුදන ලද්දහු, එ හෙයින් ම ප්‍රහීණ වූවාහු සංහිඳුණාහු වෙත්, ඇවැත්නි, මහණ තෙමේ මෙසේ ම බැහැර කරන ලද ප්‍රත්‍යෙක සත්‍ය ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් නො අඩු කොට මොනොවට දුරු කරන ලද එෂණා ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණහුගේ කාම එෂණාව ප්‍රහීණ වෙයි, භව එෂණාව ප්‍රහීණ වෙයි, බ්‍රහ්මචර්යා එෂණාව සංසිඳුණේ වෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමේ මොනොවට අනූන කොට දුරු කරන ලද එෂණා ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් නො කැළැඹුණු කල්පනා ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණහු ගේ කාමසංකල්පය ප්‍රහීණ වෙයි, ව්‍යාපාදසඞකල්පය ප්‍රහීණ වෙයි, විහිංසාසංකල්පය ප්‍රහීණ වෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමේ නො කැලැඹුණු සංකල්ප ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් සංහිඳුණු සංස්කාර ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමෙ සුඛවෙදනාව ගේ ද ප්‍රහාණයෙන් දුඃඛවෙදනාව ගේ ද ප්‍රහාණයෙන්, පළමු කොට ම සොමනස් වෙදනාවන් දුරු වීමෙන්, දුක් ද නොවූ සුව ද නොවූ උපෙක්ෂාව ගේ ද ස්මෘතිය ගේ ද පිරිසිදු බව ඇති සතර වන ධ්‍යානයට පැමිණ වෙසෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමේ සංහිඳුණු කායසංස්කාරය ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමෙ කෙසේ නම් මොනොවට මිදුණු සිතැත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණහු ගේ සිත රාගය කෙරෙන් මිදුණේ වෙයි, ද්වෙෂය කෙරෙන් මිදුණේ වෙයි, මොහය කෙරෙන් මිදුණේ වෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමේ මොනොවට මිදුණු සිතැත්තේ වෙයි.

කථඤ්චාවුසො භික්ඛු සුවිමුත්තපඤ්ඤො හොති: ඉධාවුසො, භික්ඛු රාගො මෙ පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවං ගතො ආයතිං අනුප්පාදධම්මොති පජානාති, දොසො මෙ පහීනො–පෙ–මොහො මෙ පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවං ගතො ආයතිං අනුප්පාදධම්මොති පජානාති. එවං ඛො ආවුසො භික්ඛු සුවිමුත්තපඤ්ඤො හොති.

**දස අසෙක්ඛා ධම්මා :** අසෙක්ඛා සම්මාදිට්ඨි, අසෙක්ඛො සම්මාසඞ්කප්පො, අසෙක්ඛා සම්මාවාචා, අසෙක්ඛො සම්මාකම්මන්තො, අසෙක්ඛො සම්මාආජීවො, අසෙක්ඛො සම්මාවායාමො, අසෙක්ඛා සම්මාසති, අසෙක්ඛො සම්මාසමාධි, අසෙක්ඛං සම්මා ඤාණං, අසෙක්ඛා සම්මාවිමුත්ති.

ඉමෙ ඛො ආවුසො, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන දස ධම්මා සම්මදක්ඛාතා. තත්ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං න විවදිතබ්බං යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං. තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

17. අථ ඛො භගවා වුට්ඨහිත්වා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි ; "සාධු සාධු සාරිපුත්ත, සාධු ඛො ත්වං සාරිපුත්ත, භික්ඛූනං සඞ්ගීතිපරියායං අභාසී"ති.

ඉදමවොච ආයස්මා සාරිපුත්තො. සමනුඤ්ඤො සත්ථා අහොසි. අත්තමනා ච තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.

සඞ්ගීතිසුත්තං නිට්ඨිතං දසමං.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් මොනොවට මිදුණු ප්‍රඥව ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමේ 'මගේ රාගය ප්‍රහීණ ය, සිඳ දමන ලද මුල් ඇත්තේය,... උදුරා දමන ලද තල්රුකක් මෙන් කරන ලද්දේය, නැවැත නො හටගන්නා බවට පැමිණියේ ය, යළි නො-උපදනා ස්වභාවය ඇත්තේ වේ' යැ යි දනී, ඇවැත්නි, මහණ තෙමේ මෙසේ ම මොනොවට මිදුණු ප්‍රඥ ඇත්තේ වෙයි.

**අශෛක්ෂ (ඵලසම්ප්‍රයුක්ත) ධර්ම දශයෙක:** අශෛක්ෂ සම්‍යග්දෘෂ්ටිය අශෛක්ෂ සම්‍යග්වචනය, අශෛක්ෂ සම්‍යක්කර්මාන්තය, අශෛක්ෂ සම්‍යගාජීවය, අශෛක්ෂ සම්‍යග්ව්‍යායාමය, අශෛක්ෂ සම්‍යක්ස්මෘතිය, අශෛක්ෂ සම්‍යක්සමාධිය, අශෛක්ෂ සම්‍යක් ඥානය, අශෛක්ෂ සම්‍යග්විමුක්තිය.

ඇවැත්නි, දන්නා දක්නා අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට වදරන ලද දශ ධර්මයෝ මොහු ය. එහි සියල්ලන් විසින් ම, යම්සේ මේ බ්‍රහ්මචර්යාව දික්කලක් පැවැතිය හැකි වන්නේ ද, දික්කලක් සිටුණේ වන්නේ ද, එසේ වනු පිණිස එක් වැ ගැයිය යුතු, විවාද නො කළ යුතු. එය බොහෝ දෙනාට හිතපිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව්මිනිස්නට ප්‍රයොජන පිණිස, වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය.''

17. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ නැඟී සිට, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් අමතා, ''ශාරිපුත්‍රයිනි, මැනැව! මැනැව!! ශාරීපුත්‍රයිනි, තෙපි භික්ෂූනට මනා කොට ම සංගීතිපර්යායය (සමගියට කාරණ වූ ධර්මය) වදළහ'' යි වදළසේක.

ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ මෙය වදළාහ. ශාස්තෘන් වහන්සේ මොනොවට අනුදත් සේක් වූහ. ඒ භික්ෂූ ද සතුටු වූවාහු ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවන් ගේ වචනය පිළිගත්හ.

**දශ වන සඞ්ගීති සූත්‍රය නිමියේ යි.**

# 34

# දසුත්තරසුත්තං

1. එවං මෙ සුතං:

එකං සමයං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි.

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි: 'ආවුසො භික්ඛවො'ති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

දසුත්තරං පවක්ඛාමි ධම්මං නිබ්බානපත්තියා,
දුක්ඛස්සන්තකිරියාය සබ්බගණ්ඨප්පමොචනං.

එකො ධම්මො

2. එකො ආවුසො ධම්මො බහුකාරො, එකො ධම්මො භාවෙතබ්බො, එකො ධම්මො පරිඤ්ඤෙය්‍යො, එකො ධම්මො පහාතබ්බො, එකො ධම්මො හානභාගියො, එකො ධම්මො විසෙසභාගියො, එකො ධම්මො දුප්පටිවිජ්ඣො, එකො ධම්මො උප්පාදෙතබ්බො, එකො ධම්මො අභිඤ්ඤෙය්‍යො, එකො ධම්මො සච්ඡිකාතබ්බො.

කතමො එකො ධම්මො බහුකාරො? අප්පමාදො කුසලෙසු ධම්මෙසු. අයං එකො ධම්මො බහුකාරො.

කතමො එකො ධම්මො භාවෙතබ්බො? කායගතාසති සාතසහගතා. අයං එකො ධම්මො භාවෙතබ්බො.

කතමො එකො ධම්මො පරිඤ්ඤෙය්‍යො? ඵස්සො සාසවො උපාදානියො. අයං එකො ධම්මො පරිඤ්ඤෙය්‍යො?.

# 34

# දසුත්තර සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී:

භාග්‍යවතුන් වහන්සේ එක් සමයෙක්හි භික්ෂූන් පන්සියයක් පමණ වූ මහත් භික්ෂුසඞ්ඝයා සමග චම්පා නුවර සමීපයෙහි ගර්ගරා පොකුණු තෙර වැඩ වසන සේක.

එහි දී වනාහි සැරියුත් තෙරණුවෝ 'ඇවැත් මහණෙනි' යි භික්ෂූන් ඇමැතූහ. 'ඇවැත්නි'යි කියා ම ඒ භික්ෂුහු සැරියුත් තෙරුනට පිළිවදන් දුන්හ. සැරියුත් තෙරණුවෝ මෙය වදළාහ:

නිවන් පැමිණෙනු පිණිස, දුක් කෙළවර කරනු පිණිස, සියලු කෙලෙස් ගැට ලිහන දශොත්තර ධර්මය (එකකය පටන් කොට දශකය හිම් කොට සංඛ්‍යා විසින් නැඟී ගිය ධර්ම සමුදය වූ සූත්‍ර දෙශනාව) කියන්නෙමි.

### ඒකධර්ම

2. ඇවැත්නි, බහුපකාර වූ එක් ධර්මයෙක. භාවයිතව්‍ය (වැඩියැ යුතු) එක් ධර්මයෙක. පරිජ්ඡෙද්‍ය (පිරිසින්ද යුතු) එක් ධර්මයෙක. ප්‍රහාතව්‍ය (පහ කළ යුතු) එක් ධර්මයෙක. හානභාගික (පිරිහීම බජන, අපායගාමී) එක් ධර්මයෙක. විශෙෂභාගික (විශෙෂ ගුණ ලැබීම පිණිස පවත්නා) එක් ධර්මයෙක. දුෂ්ප්‍රතිවිධ්‍ය (දුකසේ පිළිවිදියැ යුතු) එක් ධර්මයෙක. උත්පාද-යිතව්‍ය (ඉපැදවියැ යුතු) එක් ධර්මයෙක. අභිජ්ඣෙය (ඥතපරිඥයෙන් වෙසෙසින් දත යුතු) එක් ධර්මයෙක. සාක්ෂාත් කර්තව්‍ය එක් ධර්මයෙක.

බහුපකාර වූ එක් ධර්මය කවර යැ? කුසල්දහම්හි අප්‍රමාදය යැ. මේ බහුපකාර වූ එක් ධර්මය යැ.

භාවයිතව්‍ය එක් ධර්මය කවර යැ? සුඛවෙදනාසම්ප්‍රයුක්ත කායගතා ස්මෘතිය ය (ආනාපාන චතුඉරියාපථ, සතිසම්පජඤ්ඤ, ද්වත්තිංසාකාර, චතුධාතුවවත්ථාන දසඅසුභ නවසිවථිකා, චුණ්ණිකමනසිකාර,[1] කෙසාදීන්හි වැඩූ සතර රූපධ්‍යාන යන මේ දෑ බැවීමෙහි උපන් සිහිය ය). මේ භාවයිතව්‍ය (වැඩියැ යුතු)ධර්මය යැ.

පරිඡෙදය (පිරිසින්ද යුතු) එක් ධර්මය කවර යැ? ආස්‍රව උපාදන දෙකට ම ප්‍රත්‍යය වූ ස්පර්ශය යැ. මේ පරිඡෙදය එක් ධර්මය යැ.



1. චුණ්ණිකමනසිකාර

**කතමො එකො ධම්මො පහාතබ්බො?** අස්මිමානො, අයං එකො ධම්මො පහාතබ්බො.

**කතමො එකො ධම්මො හානභාගියො?** අයොනිසො මනසිකාරො අයං එකො ධම්මො හානභාගියො.

**කතමො එකො ධම්මො විසෙසභාගියො?** යොනිසො මනසිකාරො අයං එකො ධම්මො විසෙසභාගියො.

**කතමො එකො ධම්මො දුප්පටිවිජ්ඣො?** ආනන්තරිකො චෙතොසමාධි. අයං එකො ධම්මො දුප්පටිවිජ්ඣො.

**කතමො එකො ධම්මො උප්පාදෙතබ්බො?** අකුප්පං ඤාණං. අයං එකො ධම්මො උප්පාදෙතබ්බො.

**කතමො එකො ධම්මො අභිඤ්ඤෙය්‍යො?** සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා. අයං එකො ධම්මො අභිඤ්ඤෙය්‍යො.

**කතමො එකො ධම්මො සච්ඡිකාතබ්බො?** අකුප්පා චෙතොවිමුත්ති. අයං එකො ධම්මො සච්ඡිකාතබ්බො.

**ඉති ඉමෙ දස ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා.**

## **ද්වෙ ධම්මා**

**3. ද්වෙ ධම්මා බහුකාරා, ද්වෙ ධම්මා භාවෙතබ්බා? ද්වෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා, ද්වෙ ධම්මා පහාතබ්බා, ද්වෙ ධම්මා හානභාගියා, ද්වෙ ධම්මා විසෙසභාගියා. ද්වෙ ධම්මා දුප්පටිවිජ්ඣා, ද්වෙ ධම්මා උප්පාදෙතබ්බා, ද්වෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා, ද්වෙ ධම්මා සච්ඡිකාතබ්බා.**

**කතමෙ ද්වෙ ධම්මා බහුකාරා? සති ච සම්පජඤ්ඤං ච. ඉමෙ ද්වෙ ධම්මා බහුකාරා.**

**කතමෙ ද්වෙ ධම්මා භාවෙතබ්බා? සමථො ච විපස්සනා ච. ඉමෙ ද්වෙ ධම්මා භාවෙතබ්බා.**

**ප්‍රහාතව්‍ය** (පහ කළ යුතු) එක් ධර්මය කවර යැ? අස්මිමානය යැ. මේ ප්‍රහාතව්‍ය එක් ධර්මය යැ.

**හානභාගික** එක් ධර්මය කවර යැ? අයොනිසොමනස්කාරය යැ. මේ හානභාගික එක් ධර්මය යැ.

**විශෙෂභාගික** එක් ධර්මය කවර යැ? යොනිසොමනස්කාරය යැ. මේ විශෙෂභාගික එක් ධර්මය යැ.

**දුෂ්ප්‍රතිවිධ්‍ය** එක් ධර්මය කවර යැ? ආනන්තරික චිත්තසමාධිය (විදර්ශනාවට අනතුරු මාර්ගය) යැ. මේ දුෂ්ප්‍රතිවිධ්‍ය එක් ධර්මය යැ.

**උත්පාදයිතව්‍ය** එක් ධර්මය කවර යැ ? අකොප්‍ය ඥානය (ප්‍රත්‍යවෙක්ෂණ ප්‍රඥව) යැ. මේ උත්පාදයිතව්‍ය එක් ධර්මය යැ.

**අභිඥෙය** එක් ධර්මය කවර යැ ? සියලු සත්හු ආහාරයෙන් (ප්‍රත්‍යයයෙන්) සිටුනාහු ය යන්න යැ. මේ අභිඥෙය එක් ධර්මය ය.

**සාක්ෂාත්කර්තව්‍ය** (ප්‍රත්‍යක්ෂ කළ යුතු) එක් ධර්මය කවර යැ? අකොප්‍ය චෙතොවිමුක්තිය (අර්හත්ඵලවිමුක්තිය) යැ. මේ සාක්ෂාත් කර්තව්‍ය එක් ධර්මය යැ.

මෙසේ භූත වූ (සැබැවින් ඇති ) තථ්‍ය වූ (ඇති සැටි ම වූ) තථ (කී පරිදි ම වූ) අවිතථ (කී පරිදි ම මිස අන් සැටියක් නැති) අනන්‍යථ (අන්සැටියෙකින් නැති) මේ දශ ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මොනොවට තමන් ම අවබෝධ කරන ලදහ.

### දෙදෙනෙක් ධර්මයෝ

3. බහුපකාර වූ ධර්මදෙකෙක. භාවයිතව්‍ය ධර්මදෙකෙක. පරිඥෙය ධර්ම දෙකෙක. ප්‍රහාතව්‍ය ධර්ම දෙකෙක. හානභාගික ධර්ම දෙකෙක. විශෙෂභාගික ධර්ම දෙකෙක. දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම දෙකෙක. උත්පාදයිතව්‍ය ධර්ම දෙකෙක. අභිඥෙය ධර්ම දෙකෙක සාක්ෂාත්කර්තව්‍ය ධර්ම දෙකෙක.

**බහුපකාරධර්ම** දෙක කවර යැ? සතියත් (සිහියත්) සම්පජඤ්ඤයත් (නුවණත්) ය. මේ බහුපකාර ධර්ම දෙක යැ.

**භාවයිතව්‍ය ධර්ම** දෙක කවර යැ ? ශමථයත් විදර්ශනාවත් යැ. මේ භාවයිතව්‍ය (වැඩියැ යුතු) ධර්ම දෙක යැ.

කතමෙ ද්වෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා? නාමඤ්ච රූපඤ්ච. ඉමෙ ද්වෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා.

කතමෙ ද්වෙ ධම්මා පහාතබ්බා? අවිජ්ජා ච භවතණ්හා ච. ඉමෙ ද්වෙ ධම්මා පහාතබ්බා.

කතමෙ ද්වෙ ධම්මා හානභාගියා? දොවචස්සතා ච. පාපමිත්තතා ච. ඉමෙ ද්වෙ ධම්මා හානභාගියා.

කතමෙ ද්වෙ ධම්මා විසෙසභාගියා? සොවචස්සතා ච කල්‍යාණ-මිත්තතා ච. ඉමෙ ද්වෙ ධම්මා විසෙසභාගියා.

කතමෙ ද්වෙ ධම්මා දුප්පටිවිජ්ඣා? යො ච හෙතු යො ච පච්චයො සත්තානං සංකිලෙසාය, යො ච හෙතු යො ච පච්චයො සත්තානං විසුද්ධියා ඉමෙ ද්වෙ ධම්මා දුප්පටිවිජ්ඣා.

කතමෙ ද්වෙ ධම්මා උප්පාදෙතබ්බා? ද්වෙ ඤාණානි ඛයෙ ඤාණං අනුප්පාදෙ ඤාණං. ඉමෙ ද්වෙ ධම්මා උප්පාදෙතබ්බා.

කතමෙ ද්වෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා? ද්වෙ ධාතුයො: සඞ්ඛතා ච ධාතු අසඞ්ඛතා ච ධාතු. ඉමෙ ද්වෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා.

කතමෙ ද්වෙ ධම්මා සච්ඡිකාතබ්බා? විජ්ජා ච විමුත්ති ච. ඉමෙ ද්වෙ ධම්මා සච්ඡිකාතබ්බා.

ඉති ඉමෙ වීසති ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා.

### තයොධම්මා

4. තයො ධම්මා බහුකාරා, තයො ධම්මා භාවෙතබ්බා -පෙ- තයො ධම්මා සච්ඡිකාතබ්බා.

පරිඥෙය ධර්ම දෙක කවර යැ? නාමයත් රූපයත් යැ. මේ පරිඥෙය (පිරිසිඳ යුතු) ධර්ම දෙක යැ.

ප්‍රහාතව්‍ය ධර්ම දෙක කවර යැ? අවිද්‍යාවත් භවතෘෂ්ණාවත් යැ. මේ ප්‍රහාතව්‍ය ධර්ම දෙක යැ.

හානභාගික ධර්ම දෙක කවර යැ? දුර්වච බවත් පාපමිත්‍රයන් ඇති බවත්යැ. මේ හානභාගික ධර්ම දෙක යැ.

විශෙෂභාගික ධර්ම දෙක කවර යැ? සුවච බවත් කලණ මිතුරන් ඇති බවත් යැ. මේ විශෙෂභාගික ධර්ම දෙක යැ.

දුෂ්ප්‍රතිවිධ්‍ය (දුක සේ පිළිවිදියැ යුතු) ධර්ම දෙක කවර යැ ? සත්‍වයන්ගේ කෙලෙසමට හෙතු වූ ප්‍රත්‍යය වූ යම් ධර්මයෙක් වේ නම් එය ද, සත්‍වයන්ගේ පිරිසිදු බවට හෙතු වූ ප්‍රත්‍යය වූ යම් ධර්මයෙක් වේ නම් එය ද යන දෙක ය. මේ දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම දෙක ය.

උත්පාදයිතව්‍ය (ඉපදවියැ යුතු) ධර්ම දෙක කවර යැ ? ක්ෂයයෙහි නුවණ (මාර්ගසිත්හි වූ කෙලෙස් නසන නුවණ) ත් අනුත්පාදයෙහි නුවණ (ඒ ඒ මඟින් කෙලෙස් නැසීමෙන් නැවැත ඔවුන් නො උපදනා බවට පත් වූ අවසනැ උපන් පලසිත්හි නුවණ) ත් ය. මේ උත්පාදයිතව්‍ය නුවණ දෙක යැ.

අභිඥෙය ධර්ම (වෙසෙසි නුවණින් දත යුතු දහම්) දෙක කවර යැ? සංස්කෘතධාතුවත් (පංචස්කන්ධයත්) අසංස්කෘතධාතුවත් (නිවනත්) ය. මේ අභිඥෙය ධර්ම දෙක යැ.

සාක්ෂාත් කර්තව්‍ය ධර්ම දෙක කවර යැ? විද්‍යාත් (පෙර ජාති දක්නා නුවණ, දිවැස, කෙලෙස් නසන නුවණ යන තුන් විද්‍යාත්) විමුක්තිත් (රහත් පලයත්) ය. මේ සාක්ෂාත් කළ යුතු ධර්ම දෙක යැ.

මෙසේ මේ භූත වූ තථ වූ අවිතථ වූ අනන්‍යථ වූ විසි ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මොනොවට තමන් ම අවබෝධ කරන ලද්දහු යැ.

### තිදෙනෙක් ධර්මයෝ

4. බහූපකාර වූ ධර්ම තුනෙක. භාවයිතව්‍ය ධර්ම තුනෙක. පරිඥෙය ධර්ම තුනෙක. ප්‍රහාතව්‍ය ධර්ම තුනෙක හානභාගික ධර්ම තුනෙක. විශේෂභාගික ධර්ම තුනෙක. දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම තුනෙක. උත්පාදයිතව්‍ය ධර්ම තුනෙක. අභිඥෙය ධර්ම තුනෙක. සාක්ෂාත් කර්තව්‍ය ධර්ම තුනෙක.

කතමෙ තයො ධම්මා බහුකාරා? සප්පුරිසසංසෙවො, සද්ධම්මසවනං ධම්මානුධම්මප්පටිපත්ති. ඉමෙ තයො ධම්මා බහුකාරා.

කතමෙ තයො ධම්මා භාවෙතබ්බා? තයො සමාධි: සවිතක්කසවිචාරො සමාධි, අවිතක්කවිචාරමත්තො සමාධි, අවිතක්ක අවිචාරො සමාධි. ඉමෙ තයො ධම්මා භාවෙතබ්බා.

කතමෙ තයො ධම්මා පරිඤ්ඤෙය්‍යා? තිස්සො වෙදනා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමෙ තයො ධම්මා පරිඤ්ඤෙය්‍යා.

කතමෙ තයො ධම්මා පහාතබ්බා? තිස්සො තණ්හා: කාමතණ්හා, භව තණ්හා, විභවතණ්හා. ඉමෙ තයො ධම්මා පහාතබ්බා.

කතමෙ තයො ධම්මා හානභාගියා? තීනි අකුසලමූලානි: ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං මොහො අකුසලමූලං. ඉමෙ තයො ධම්මා හානභාගියා.

කතමෙ තයො ධම්මා විසෙසභාගියා? තීනි කුසලමූලානි: අලොභො කුසලමූලං, අදොසො කුසලමූලං, අමොහො කුසලමූලං, ඉමෙ තයො ධම්මා විසෙසභාගියා.

කතමෙ තයො ධම්මා දුප්පටිවිජ්ඣා? තිස්සො නිස්සරණියා ධාතුයො: කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං, රූපානමෙතං නිස්සරණං යදිදං ආරුප්පං, යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං නිරොධො තස්ස නිස්සරණං. ඉමෙ තයො ධම්මා දුප්පටිවිජ්ඣා.

කතමෙ තයො ධම්මා උප්පාදෙතබ්බා? තීණි ඤාණානි. අතීතංසෙ ඤාණං, අනාගතං සෙ ඤාණං, පච්චුප්පන්නං සෙ ඤාණං. ඉමෙ තයො ධම්මා උප්පාදෙතබ්බා.

කතමෙ තයො ධම්මා අභිඤ්ඤෙය්‍යා? තිස්සො ධාතුයො: කාමධාතු රූපධාතු, අරූපධාතු. ඉමෙ තයො ධම්මා අභිඤ්ඤෙය්‍යා.

කතමෙ තයො ධම්මා සච්ඡිකාතබ්බා? තිස්සො විජ්ජා: පුබ්බෙනිවාසානුස්සතිඤාණං විජ්ජා, සත්තානං චුතූපපාතෙ ඤාණං විජ්ජා, ආසවානං ඛයෙ ඤාණං විජ්ජා: ඉමෙ තයො ධම්මා සච්ඡිකාතබ්බා.

බහූපකාර ධර්ම තුන කවුරු යැ? සත්පුරුෂාශ්‍රයයත් සද්ධර්මශ්‍රවණයත් ධර්මානුධර්මප්‍රතිපත්තියත් යැ, මේ බහූපකාර ධර්ම තුන යැ.

භාවයිතව්‍ය ධර්ම තුන කවුරු යැ? සවිතර්ක සවිචාර සමාධියත් අවිතර්ක විචාරමාත්‍ර සමාධියත් අවිතර්ක අවිචාර සමාධියත් යැ. මේ භාවයිතව්‍ය ධර්ම තුන යැ.

පරිඥෙය ධර්ම තුන කවර යැ? සුඛවෙදනා දුඃඛවෙදනා අදුඃඛාසුඛ වෙදනා යන තුන් වෙදනාවෝ යැ. මේ පරිඥෙය ධර්ම තුන යැ.

ප්‍රහාතව්‍ය ධර්ම තුන කවර යැ? කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණා යන තුන් තෘෂ්ණා යැ. මේ ප්‍රහාතව්‍ය ධර්ම තුන යැ.

හානභාගික ධර්ම තුන කවර යැ? ලොභ නම් වූ අකුසල් මුල, ද්වෙෂ නම් වූ අකුසල් මුල, මොහ නම් වූ අකුසල් මුල යන තුන් අකුසල් මුල් යැ. මේ හානභ ගික ධර්ම තුන යැ.

විශෙෂභාගික ධර්ම තුන කවර යැ? අලොභ නම් වූ කුසල් මුල, අද්වෙෂ නම් වූ කුසල් මුල, අමොහ නම් වූ කුසල් මුලැ යි යන තුන් කුසල් මුල් යැ. මේ විශෙෂභාගික ධර්ම තුන යැ.

දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම තුන කවර යැ? නිඃශරණීය ධාතු තුන යැ: නෛෂ්ක්‍රම්‍යය (අනාගාමි මාර්ගය) යන මෙය කාමයන්ගේ නිඃශරණය යැ, ආරූප්‍යය (රහත් මඟය) යන මෙය රූපයන්ගේ නිඃශරණය යැ, ප්‍රත්‍යයයන් නිසා සකස්වූ, ප්‍රත්‍යයයන් එක් වැ පහළ වූ යම් කිසි දෙයෙක් ඇද්ද නිරොධය (රහත් පලය) එහි නිඃශරණ යැ. මේ දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම තුන යැ.

උත්පාදයිතව්‍ය ධර්ම තුන කවර යැ? අතීතාංශය (අතීත ස්කන්ධ පංචකය) අරමුණුකොටැති නුවණ, අනාගතාංශය (අනාගත ස්කන්ධ) අරමුණු කොටැති නුවණ, ප්‍රත්‍යුත්පන්නාංශය (වර්තමාන ස්කන්ධ) අරමුණු කොටැති නුවණ යන තුන් ඥානයෝ යැ. මේ උත්පාදයිතව්‍ය ධර්ම තුන යැ.

අභිඥෙය ධර්ම තුන කවර යැ? කාමධාතු (කාමභවය), රූපධාතු (රූප භවය), අරූපධාතු (අරූප භවය) යන තුන යැ. මේ අභිඥෙය ධර්ම තුන යැ.

සාක්ෂාත්කර්තව්‍ය ධර්ම තුන කවර යැ? ත්‍රි විද්‍යාවෝ යැ: පෙර වුසු කඳපිළිවෙළ දක්නා නුවණ විද්‍යාවෙක, සත්වයන්ගේ ච්‍යුති උපපත්ති දක්නා නුවණ විද්‍යාවෙක, ආශ්‍රවයන්ගේ ක්ෂයයෙහි නුවණ (සතර මඟ නුවණ) විද්‍යාවෙක. මේ සාක්ෂාත්කර්තව්‍ය ධර්ම තුන යැ.

ඉති ඉමෙ තිංස ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා.

## චත්තාරො ධම්මා

5. චත්තාරො ධම්මා බහුකාරා, චත්තාරො ධම්මා භාවෙතබ්බා-පෙ- චත්තාරො ධම්මා සච්ඡිකාතබ්බා.

**කතමෙ චත්තාරො ධම්මා බහුකාරා?** චත්තාරි චක්කානි: පතිරූපදෙසවාසො, සප්පුරිසූපනිස්සයො,[1] අත්තසම්මාපණිධි, පුබ්බෙ ච කතපුඤ්ඤතා. ඉමෙ චත්තාරො ධම්මා බහුකාරා.

**කතමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බා?** චත්තාරො සතිපට්ඨානා: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං-පෙ-වෙදනාසු-පෙ-චිත්තෙ-පෙ-ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බා.

**කතමෙ චත්තාරො ධම්මා පරිඤ්ඤෙය්‍යා?** චත්තාරො ආහාරා: කබළීකාරො ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං. ඉමෙ චත්තාරො ධම්මා පරිඤ්ඤෙය්‍යා.

**කතමෙ චත්තාරො ධම්මා පහාතබ්බා?** චත්තාරො ඔඝා: කාමොඝො භවොඝො, දිට්ඨොඝො, අවිජ්ජොඝො. ඉමෙ චත්තාරො ධම්මා පහාතබ්බා.

**කතමෙ චත්තාරො ධම්මා හානභාගියා?** චත්තාරො යොගා: කාමයොගො භවයොගො, දිට්ඨියොගො, අවිජ්ජායොගො. ඉමෙ චත්තාරො ධම්මා හානභාගියා.

**කතමෙ චත්තාරො ධම්මා විසෙසභාගියා?** චත්තාරො විසංයොගා: කාමයොගවිසංයොගො, භවයොගවිසංයොගො, දිට්ඨියොගවිසංයොගො අවිජ්ජායොගවිසංයොගො. ඉමෙ චත්තාරො ධම්මා විසෙසභාගියා.

---

1. සප්පුරිසූපස්සයො (ස්‍යා. කං)

මෙසේ මේ භූත වූ තථ්‍ය වූ තථ වූ අවිතථ වූ අනන්‍යථ වූ තිස් දහම්හු තථාගතයන් වහන්සේ විසින් තමන් ම මොනොවට වෙසෙසි නුවණින් අවබොධ කරන ලද්දුහ.

චතුෂ්කය

5. බහූපකාර ධර්ම සතරෙක. භාවයිතව්‍ය ධර්ම සතරෙක... සාක්ෂාත්කර්තව්‍ය ධර්ම සතරෙක.

බහූපකාර ධර්ම සතර කවරේ යැ? සතර සම්පත්ති චක්‍රයෝ යැ: සුදුසු රටැ විසීමය, සත්පුරුෂයන් ඇසුරු කිරීමය, තමා ශ්‍රද්ධාදි ගුණධර්ම-යන්හි පිහිටුවීම යැ, පෙර කළ පින් ඇති බව යැ. මේ බහූපකාර ධර්ම සතර යැ.

භාවයිතව්‍ය ධර්ම සතර කවරේ යැ? සතර සතිපට්ඨානයෝ යැ: ඇවැත්නි, මෙහි මහණ තෙමේ කෙලෙස් තවන වැර ඇත්තේ නුවණින් දන්නේ, සිහි ඇත්තේ ලොව කෙරෙහි අභිධ්‍යා හා දොම්නස් හා බැහැර කොට කයෙහි කායානුපස්සී ව වෙසෙයි, ... වෙදනාවන්හි ... සිතෙහි චිත්තානුපස්සී වැ වෙසෙයි. කෙලෙස් තවන වැර ඇත්තේ, නුවණින් දන්නේ, සිහි ඇත්තේ, ලොව කෙරෙහි අභිධ්‍යා හා දොම්නස් හා බැහැර කොට ධර්මයන්හි ධම්මානුපස්සී වැ වෙසෙයි. මේ භාවයිතව්‍ය සතර ධර්මයෝ යැ.

පරිඥෙය ධර්ම සතර කවරේ යැ? සතර ආහාරයෝ යැ: ඖදරික වූ හෝ සියුම් වූ කබලීකාරාහාරය, දෙවෙනි ස්පර්ශාහාර ය, තෙවෙනි මනඃසංචෙතනාහාර ය, සතරවැනි විඥානාහාර යි. මේ පරිඥෙය වූ සතර ධර්මයෝ යැ.

ප්‍රහාතව්‍ය ධර්ම සතර කවරේ යැ? කාම ඔඝ, භව ඔඝ, දෘෂ්ටි ඔඝ, අවිද්‍යා ඔඝ යන ඔඝ සතර යි. මේ ප්‍රහාතව්‍ය ධර්ම සතර යැ.

හානභාගික ධර්ම සතර කවර යැ? කාමයොග, භවයොග, දෘෂ්ටි-යොග, අවිද්‍යායොග යන සතර යොගයෝ යැ. මේ හානභාගික ධර්ම සතර යැ.

විශෙෂභාගික ධර්ම සතර කවර යැ? කාමයොගවිසංයොගය (කාමයොගයෙන් මිදීම—අශුභධ්‍යානය හා එය පාදක කොට ලත් අනාගාමි මාර්ගය), භවයොග විසංයොගය (භවයොගයෙන් මිදීම, රහත්මඟ), දෘෂ්ටි-යොගවිසංයොගය (දෘෂ්ටිබන්ධනයෙන් මිදීම—සෝවාන් මඟ), අවිද්‍යා-යොගවිසංයොගය (අවිද්‍යාබන්ධනයෙන් මිදීම—රහත්බව) යන සතර විසංයොගයෝ යැ. මොහු විශෙෂභාගික ධර්ම සතර යැ.

කතමෙ චත්තාරො ධම්මා දුප්පටිවිජ්ඣා? චත්තාරො සමාධයො: හානභාගියො සමාධි, ඨිතිභාගියො සමාධි, විසෙසභාගියො සමාධි, නිබ්බෙධභාගියො සමාධි. ඉමෙ චත්තාරො ධම්මා දුප්පටිවිජ්ඣා.

කතමෙ චත්තාරො ධම්මා උප්පාදෙතබ්බා? චත්තාරි ඤාණානි, ධම්මෙ ඤාණං, අන්වයෙ ඤාණං, පරියෙ ඤාණං, සම්මුතියා ඤාණං. ඉමෙ චත්තාරො ධම්මා උප්පාදෙතබ්බා.

කතමෙ චත්තාරො ධම්මා අභිඤ්ඤෙය්‍යා? චත්තාරි අරියසච්චානි: දුක්ඛං අරියසච්චං, දුක්ඛසමුදයො අරියසච්චං, දුක්ඛනිරොධො අරියසච්චං, දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චං. ඉමෙ චත්තාරො ධම්මා අභිඤ්ඤෙය්‍යා.

කතමෙ චත්තාරො ධම්මා සච්ඡිකාතබ්බා? චත්තාරි සාමඤ්ඤඵලානි: සොතාපත්තිඵලං, සකදාගාමිඵලං, අනාගාමිඵලං, අරහත්තඵලං. ඉමෙ චත්තාරො ධම්මා සච්ඡිකාතබ්බා.

ඉති ඉමෙ චත්තාරීසං ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා.

## පඤ්ච ධම්මා

6. පඤ්ච ධම්මා බහුකාරා -පෙ- පඤ්ච ධම්මා සච්ඡිකාතබ්බා.

කතමෙ පඤ්ච ධම්මා බහුකාරා? පඤ්ච පධානියඞ්ගානි: ඉධාවුසො භික්ඛු සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං; ඉති පි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති, අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය, අසඨො හොති අමායාවී යථාභූතං අත්තානං ආවිකත්තා සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු, ආරද්ධවීරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු, පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. ඉමෙ පඤ්ච ධම්මා බහුකාරා.

දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම සතර කවර යැ? හානභාගික සමාධිය (නීවරණ ඇති බැවින් පිරිහීම භජනය කරන සමාධිය), ස්ථිතිභාගික සමාධිය (පිරිහීම වැයීම නැති ව ස්ථිතිය සෙවනා සමාධිය) විශෙෂභාගික සමාධිය (මතු විශෙෂාධිගමයට ප්‍රත්‍යය වන සමාධිය), නිර්වේදභාගික සමාධිය (නිවන් සෙවුනා සමාධිය) යන සතර සමාධිහු ය, මේ දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම සතර යැ.

උත්පාදයිතව්‍ය ධර්ම සතර කවර යැ? ධර්මයෙහි ඥානය (සතර මඟැ සතර පලැ නුවණ), අන්වයයෙහි ඥානය (සිවුසස් පසක් කොට දුන් සේ ම අතීතයෙහිත් මොහු දුඃඛාදි විසින් වූහ යි ලත් අනුමානඥනය), පර්යයයෙහි (මෙරමා සිත් පිරිසිඳ දන්මෙහි) නුවණ, සම්මුතියෙහි නුවණ (උඩ කී ඥන තුන හැර ඉතිරි සියලු දූයෙහි නුවණ) යන ඥන සතර යැ. මේ උත්පාදයිතව්‍ය ධර්ම සතර යැ.

අභිඥෙය ධර්ම සතර කවර යැ? දුඃඛාර්යසත්‍යය, දුඃඛසමුදයාර්ය-සත්‍යය, දුඃඛනිරොධාර්ය සත්‍යය, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍යසත්‍යයැ යි සතර ආර්ය සත්‍යයෝ යැ. මේ අභිඥෙය ධර්ම සතර යැ.

සාක්ෂාත්කතිව්‍ය ධර්ම සතර කවර යැ? ශ්‍රොත ආපත්තිඵලය, සකෘදගාමිඵලය, අනාගාමිඵලය, අර්හත්ත්වඵලය යන සතර ශ්‍රාමණ්‍ය-ඵලයෝ යැ. මේ සාක්ෂාත්කර්තව්‍ය ධර්ම සතර යැ.

මෙසේ තථ්‍ය වූ, තථ වූ, අවිතථ වූ, අනන්‍යථ වූ සතළිස් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මොනොවට වෙසෙසින් අවබොධ කරන ලදුහ.

## පඤ්චකය

6. බහූපකාර ධර්ම පසෙක...... සාක්ෂාත් කර්තව්‍ය ධර්ම පසෙක.

බහූපකාර ධර්ම පස කවර යැ? ප්‍රාධානිකාඞ්ග (ප්‍රධන් වීර්ය වඩන මහණහු ගේ ගුණාඞ්ග) පස යැ: ඇවැත්නි, මෙහි මහණ තෙම සැදහැ ඇත්තේ වෙයි, ඒ භගවත්හු මේ මේ කරුණින් අරහත් ය, සම්‍යක්-සම්බුද්ධ ය, විද්‍යාචරණසම්පන්න ය, සුගත ය, ලොකවිත් යැ, නිරුත්තර පුරුෂදම්‍යසාරථි ය, දෙව් මිනිස්නට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත් යැ යි තථාගතයන් වහන්සේ ගේ බොධිය හදහයි. රොග නැත්තේ නිදුක් වූයේ, ඉතා ශීත ද නොවූ, ඉතා උෂ්ණ ද නොවූ, මධ්‍යම වූ, ප්‍රධන් වීර්‍ය වැඩීමට යොග්‍ය වූ, සම ලෙස අහර පැසවන උදරාග්නියෙන් යුක්ත වෙයි. ශාස්තෘන් වහන්සේ කෙරෙහි හෝ නුවණැති සබරම්සරුවන් කෙරෙහි හෝ තතු වූ පරිදි සිය වරද හෙළි කරන්නේ, ශඨ නොවූයේ, මායා නැත්තේ වෙයි. ශක්ති ඇත්තේ, දැඩි උත්සාහ ඇත්තේ, කුසල් දහම්හි බහා නො-තැබූ වැර ඇත්තේ, අකුසල් දහමුන් පහ කරනු පිණිස, කුසල් දහමුන් ලැබැගැන්ම පිණිස පිරිපුන් වීර්‍ය ඇත්තේ වෙසෙයි. කෙලෙසුන් විදලීමට සමත් වූ, පිරිසිදු වූ, මොනොවට දුක් වැනැස්මට යන නුවණින් යුක්ත වූයේ, සංස්කාරයන් ගේ ඉපැත්මත් නැස්මත් පිරිසිඳ දක්නට සමත් ප්‍රඥයෙන් සමන්විත වූයේ, ප්‍රඥවත් වෙයි. මේ බහූපකාර ධර්ම පස යැ.

කතමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා? පඤ්චඞ්ගිකො සම්මාසමාධි; පීතිඵරණතා, සුඛඵරණතා, චෙතොඵරණතා, ආලොකඵරණතා, පච්චවෙක්ඛණනිමිත්තං. ඉමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා.

කතමෙ පඤ්ච ධම්මා පරිඤ්ඤෙය්‍යා? පඤ්චුපාදානක්ඛන්ධා: සෙය්‍යථීදං රූපූපාදානක්ඛන්ධො, වෙදනූපාදානක්ඛන්ධො, සඤ්ඤූපාදානක්ඛන්ධො, සඞ්ඛාරූපාදානක්ඛන්ධො, විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙ පඤ්ච ධම්මා පරිඤ්ඤෙය්‍යා.

කතමෙ පඤ්ච ධම්මා පහාතබ්බා? පඤ්ච නීවරණානි: කාමච්ඡන්දනීවරණං, බ්‍යාපාදනීවරණං, ථීනමිද්ධනීවරණං, උද්ධච්චකුක්කුච්චනීවරණං, විචිකිච්ඡානීවරණං. ඉමෙ පඤ්ච ධම්මා පහාතබ්බා.

කතමෙ පඤ්ච ධම්මා හානභාගියා? පඤ්ච චෙතොඛිලා: ඉධාවුසො භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති යො සො ආවුසො භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඨමො චෙතොඛිලො. පුන ච පරං ආවුසො භික්ඛු ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති -පෙ- සඞ්ඝෙ කඞ්ඛති -පෙ- සික්ඛාය කඞ්ඛති -පෙ- සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො. යො සො ආවුසො භික්ඛු සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඤ්චමො චෙතොඛිලො. ඉමෙ පඤ්ච ධම්මා හානභාගියා.

කතමෙ පඤ්ච ධම්මා විසෙසභාගියා? පඤ්චින්ද්‍රියානි: සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං. සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං. ඉමෙ පඤ්ච ධම්මා විසෙසභාගියා.

භාවයිතව්‍ය ධර්ම පස කවරයැ? ප්‍රීතිය පතුරුවමින් උපදනා (ප්‍රථම ද්විතීය ධ්‍යාන දෙක්හි) ප්‍රඥව, සුඛවේදනාව පතුරුවමින් උපදනා (ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යාන තුනෙහි) ප්‍රඥව, චේතඃස්ඵරණතා (පරචිත්ත විජානන) ප්‍රඥව, ආලෝකස්ඵරණතා (එළිය පැතිරවීමෙහි උපදනා දිව්‍යචක්ෂුස්) ප්‍රඥව, ප්‍රත්‍යවෙක්ෂණ ඥනය යන අංග පසින් යුත් සමාධිය යි. එහි මේ භාවයිතව්‍ය ධර්ම පස යැ.

පරිඥෙය ධර්ම පස කවර යැ? රූපොපාදනස්කන්ධය යැ, වෙදනොපාදනස්කන්ධය යැ, සංඥෙපාදනස්කන්ධය යැ, සංස්කාරොපාදනස්කන්ධය යැ, විඥනොපාදනස්කන්ධය යැ යන උපාදනස්කන්ධ පස යි. මේ පරිඥෙය (පිරිසිඳැ දත යුතු) ධර්ම පස යැ.

ප්‍රහාතව්‍ය ධර්ම පස කවර යැ? කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාද නීවරණය, ස්ත්‍යානමිද්ධ නීවරණය, ඖද්ධත්‍යකෞකෘත්‍ය නීවරණය, විචිකිත්සා නීවරණය යන පස යි. මේ ප්‍රහාතව්‍ය ධර්ම පස යැ.

හානභාගික ධර්ම පස කවර යැ? චෙතොඛීල (සිතේ තද බව) පස යැ: ඇවැත්නි, මෙහි මහණ තෙමේ ශාස්තෘහු කෙරෙහි සැක කෙරෙයි ද, කුකුස් කෙරෙයි ද, නිශ්චය නැත්තේ ද, නො පහදී ද, ඔහු ගේ සිත වීර්‍ය්‍ය වැඩීම පිණිස, පුන පුනා භාවනා යොගය පිණිස, සතතයෙන් භාවනානුයොගය පිණිස, ප්‍රධන් වීර්‍ය්‍ය පිණිස නො නැමෙයි. යමකු ගේ සිත වීර්ය වැඩීම පිණිස, පුන පුනා භාවනායොගය පිණිස, සතතයෙන් භාවනායෙහි යෙදෙනු පිණිස ප්‍රධන් වීර්‍ය්‍ය පිණිස නොනැමෙයි ද, මෙය පළමු වන චෙතොඛීලය යි. ඇවැත්නි, තවද මහණෙක් ධර්මය කෙරෙහි සැක කෙරෙයි ද, කුකුස් කෙරෙයි ද, නිශ්චය නැත්තේ වෙයි ද, නො පහදී ද......, සඞ්ඝයා කෙරෙහි සැක කෙරෙයි ද...... ශික්ෂායෙහි සැක කෙරෙයි ද...... සබ්‍රම්සරුවන් කෙරෙහි කිපියේ නොසතුටු සිතැත්තේ, ආහතචිත්ත (ගැටුණු සිතැත්තේ) වෙයි ද, ඛීලජාත (තද) වෙයි ද, ඔහු ගේ සිත වීර්‍ය්‍ය වැඩීම පිණිස, පුන පුනා භාවනානුයොගය පිණිස, සතතයෙන් භාවනානුයොගය පිණිස, ප්‍රධන් වීර්‍ය්‍ය පිණිස නො නැමෙයි. යමකු ගේ සිත වීර්‍ය්‍ය වැඩීම පිණිස පුන පුනා භාවනානුයොගය පිණිස, සතතයෙන් භාවනායොගය පිණිස, ප්‍රධන් වීර්‍ය්‍ය පිණිස නො නැමෙයි ද, මෙය පස් වන චෙතොඛීලය යි. මේ හානභාගික ධර්ම පස යැ.

විශෙෂභාගික ධර්ම පස කවර යැ? ශ්‍රද්ධෙන්ද්‍රියය, වීර්‍ය්‍යෙන්ද්‍රියය, ස්මෘතීන්ද්‍රියය, සමාධීන්ද්‍රියය, ප්‍රඥෙන්ද්‍රියය යන ඉන්ද්‍රිය පස යි. මේ විශෙෂභාගික ධර්ම පස යැ.

කතමෙ පඤ්ච ධම්මා දුප්පටිවිජ්ඣා? පඤ්චනිස්සාරණියා ධාතුයො: ඉධාවුසො, භික්ඛුනො කාමෙ මනසිකරොතො කාමෙසු චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති. නෙක්ඛම්මං ඛො පනස්ස මනසිකරොතො නෙක්ඛම්මෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති, තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං විසංයුත්තං කාමෙහි. යෙ ච කාමපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා මුත්තො සො තෙහි, න සො තං වෙදනං වෙදෙති. ඉදමක්ඛාතං කාමානං නිස්සරණං.

පුන ච පරං ආවුසො, භික්ඛුනො බ්‍යාපාදං මනසිකරොතො බ්‍යාපාදෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති. අබ්‍යාපාදං ඛො පනස්ස මනසිකරොතො අබ්‍යාපාදෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං විසයුත්තං බ්‍යාපාදෙන. යෙ ච බ්‍යාපාදපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා, මුත්තො සො තෙහි, න සො තං වෙදනං වෙදෙති. ඉදමක්ඛාතං බ්‍යාපාදස්ස නිස්සරණං.

පුන ච පරං ආවුසො, භික්ඛුනො විහෙසං මනසිකරොතො විහෙසාය චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති. අවිහෙසං ඛො පනස්ස මනසිකරොතො අවිහෙසාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං විසංයුත්තං විහෙසාය. යෙ ච විහෙසපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා, මුත්තො සො තෙහි, න සො තං වෙදනං වෙදෙති. ඉදමක්ඛාතං විහෙසාය නිස්සරණං.

පුන ච පරං ආවුසො භික්ඛුනො රූපෙ මනසිකරොතො රූපෙසු චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති. අරූපං ඛො පනස්ස මනසිකරොතො අරූපෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං විසංයුත්තං රූපෙහි. යෙ ච රූපපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා, මුත්තො සො තෙහි, න සො තං වෙදනං වෙදෙති. ඉදමක්ඛාතං රූපානං නිස්සරණං.

දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම පස කවර යැ? නිඃසරණීය ධාතු (විසංයුක්ත ධර්ම) පස යැ: ඇවැත්නි, මෙහි කාමයන් මෙනෙහි කරන මහණහු සිත කාමයන්හි නො පිවිසෙයි, නො පහදී, නො පිහිටයි, නො ඇලෙයි. නෙක්ඛම්මය (අශුභ කර්මස්ථානයෙන් ලත් ප්‍රථම ධ්‍යානය) මෙනෙහි කරන මහණහු සිත නෙක්ඛම්මයෙහි පිවිසෙයි, පැහැදෙයි, පිහිටයි, ඇලෙයි. ඔහු ගේ එ සිත අරමුණෙහි මොනොවට ගියේ මොනොවට වැඩුණේ, කාමයන් කෙරෙන් මොනොවට නැඟී සිටියේ, කාමයන් කෙරෙන් මොනොවට මිදුණේ, කාමයන්ගෙන් වෙන් වූයේ වෙයි. කාම හෙතුයෙන් යම් ආස්‍රව කෙනෙක්, යම් දුක් කෙනෙක්, යම් කාමපරිදහ කෙනෙක් උපදනාහු ද, හේ ඔවුන් කෙරෙන් මිදුණේ වෙයි, හේ ඒ වේදනා නො විඳී. මෙය කාමයන් ගේ නිඃසරණය නැමැයි කියන ලදි.

ඇවැත්නි, තව ද ව්‍යාපාදය මෙනෙහි කරන මහණහු ගේ සිත ව්‍යාපාදයෙහි නො පිවිසෙයි, නො පහදියි, නො රඳෙයි, නො ඇලෙයි. අව්‍යාපාදය (මෛත්‍රී ධ්‍යානය) මෙනෙහි කරන ඔහු සිත අව්‍යාපාදයෙහි පිවිසෙයි, පැහැදෙයි, සිටියි, ඇලෙයි. ඔහු ගේ එ සිත අරමුණෙහි මොනොවට ගියේ, මොනොවට වැඩුණේ, (ව්‍යාපාදය කෙරෙන්) මොනොවට නැඟී සිටියේ, මොනොවට මිදුණේ, ව්‍යාපාදය කෙරෙන් වෙන් වූයේ වෙයි. ව්‍යාපාද හෙතුයෙන් යම් ආස්‍රව දුක් පරිදහ කෙනෙක් උපදිත් ද, හේ ඔවුන් කෙරෙන් මිදුණේ වෙයි. හේ ඒ වේදනාව නො විඳී. මේ ව්‍යාපාදයේ නිඃසරණයැ යි කියන ලදි.

තව ද ඇවැත්නි, විහිංසාව මෙනෙහි කරන මහණහු සිත විහිංසායෙහි නො පිවිසෙයි, නො පහදියි, නො සිටියි, නො ඇලෙයි. වැලි අවිහිංසාව (කරුණාධ්‍යානය) මෙනෙහි කරන ඔහු සිත අවිහිංසායෙහි (කරුණාධ්‍යානයෙහි) පිවිසෙයි, පැහැදෙයි, සිටියි, ඇලෙයි. ඔහු ගේ ඒ සිත අරමුණෙහි මොනොවට ගියේ, මොනොවට වැඩුණේ, විහිංසාව කෙරෙන් මොනොවට නැඟී සිටියේ, මොනොවට මිදුණේ, මොනොවට වෙන් වූයේ වෙයි. විහිංසා හෙතුයෙන් යම් ආස්‍රව කෙනෙක්, දුක් කෙනෙක්, පරිදහ කෙනෙක් උපදනාහු ද, හේ ඔවුන් කෙරෙන් මිදුණේ වෙයි, හේ ඒ වෙදනාව නො විඳී. මේ විහිංසාව ගේ නිඃසරණයැ යි කියන ලදි.

ඇවැත්නි, තව ද මහණ තෙමේ රූපයන් මෙනෙහි කරන මහණහු ගේ සිත රූපයන්හි නො පිවිසෙයි, නො පහදියි, නො සිටියි, නො ඇලෙයි. වැලි දු අරූපධ්‍යානය මෙනෙහි කරන ඔහු සිත අරූපධ්‍යානයෙහි පිවිසෙයි, පහදියි, සිටියි, ඇලෙයි. ඔහු ගේ ඒ සිත අරමුණෙහි මොනොවට ගියේ, මොනොවට වැඩුණේ, රූපයන් කෙරෙන් මොනොවට නැඟී සිටියේ, මොනොවට මිදුණේ, වෙන් වූයේ වෙයි. රූප හෙතුයෙන් යම් ආස්‍රව කෙනෙක් දුක් කෙනෙක් පරිදහ කෙනෙක් උපදනාහු ද, හේ ඔවුන් කෙරෙන් මිදුණේ වෙයි. හේ ඒ කාම වෙදනා ද විඝාතපරිදහ වෙදනා ද නොවිඳී. මෙය රූපයන්ගේ නිඃසරණයැ යි කියන ලදි.

පුන ච පරං ආවුසො භික්ඛුනො සක්කායං මනසිකරොතො සක්කායෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති. සක්කාය-නිරොධං ඛො පනස්ස මනසිකරොතො සක්කායනිරොධෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති. තස්ස තං චිත්තං සුගතං සුභාවිතං සුවුට්ඨිතං සුවිමුත්තං විසංයුත්තං සක්කායෙන. යෙ ච සක්කායපච්චයා උප්පජ්ජන්ති ආසවා විඝාතා පරිළාහා, මුත්තො සො තෙහි. න සො තං වෙදනං වෙදෙති. ඉදමක්ඛාතං සක්කායස්ස නිස්සරණං. ඉමෙ පඤ්ච ධම්මා දුප්පටිවිජ්ඣා.

කතමෙ පඤ්ච ධම්මා උප්පාදෙතබ්බා? පඤ්ච ඤාණිකො සම්මාසමාධි. අයං සමාධි පච්චුප්පන්නසුඛො චෙව ආයතිඤ්ච සුඛවිපාකො ති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති, අයං සමාධි අරියො නිරාමිසො ති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති, අයං සමාධි අකාපුරිසසෙවිතො ති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති, අයං සමාධි සන්තො පණීතො පටිප්පස්සද්ධලද්ධො එකොදිභාවාධිගතො න සඞ්ඛාරනිග්ගය්හවාරිතාවතොති[1] පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති, සො ඛො පනාහං ඉමං සමාධිං සතො'ව සමාපජ්ජාමි, සතො වුට්ඨහාමී'ති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති. ඉමෙ පඤ්ච ධම්මා උප්පාදෙතබ්බා.

කතමෙ පඤ්ච ධම්මා අභිඤ්ඤෙය්‍යා? පඤ්ච විමුත්තායතනානි: ඉධාවුසො, භික්ඛුනො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී. යථා යථා ආවුසො භික්ඛුනො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති. ඉදං පඨමං විමුත්තායතනං.

1. සසඞ්ඛාරනිග්ගය්හවාරිතගතො (මජසං)

ඇවැත්නි, තව ද සත්කායය (සංස්කාර ධර්ම) මෙනෙහි කරන ශුෂ්ක විදර්ශක රහත්හු ගේ සිත සත්කායයෙහි නො පිවිසෙයි. නො පහදී, නො සිටියි, නො ඇලෙයි. වැලි, සත්කාය නිරොධය මෙනෙහි කරන ඔහුගේ සිත සත්කාය නිරොධයෙහි (නිවනෙහි) පිවිසෙයි, පැහැදෙයි, රැඳී සිටියි, ඇලෙයි. ඔහුගේ ඒ සිත අරමුණෙහි මොනොවට ගියේ, මොනොවට වැඩුණේ, සත්කායය කෙරෙන් නැඟී සිටියේ, මොනොවට මිදුණේ, වෙන් වූයේ වෙයි. සත්කාය හෙතුයෙන් යම් ආශ්‍රව විඝාත පරිදාහ කෙනෙක් උපදනාහු ද, ඔවුන් කෙරෙන් හේ මිදුණේ වෙයි. හේ ඒ වෙදනාව නො විඳී. මේ සත්කායයාගේ නිඃසරණයැ යි කියන ලදී. මේ දුෂ්ප්‍රතිවිධ්‍ය වූ ධර්ම පස යැ.

උත්පාදයිතව්‍ය ධර්ම පස කවර යැ? ඥාන පසක් ඇති සම්‍යක්සමාධිය යැ. මේ සමාධිය (අර්හත්ව ඵලසමාධිය සමවන් සමවන් කෙණෙහි සුව ගෙන දෙන බැවින්) වර්තමාන සැප විපාක ඇත්තේ ද (පළමු පළමු සමවන් සමාධිය මතු මතු සමාධීනට ප්‍රත්‍යය වන බැවින්) මත්තෙහි සැප විපාක ගෙනැ දෙන්නේ යැ යි තමා කෙරෙහි නුවණ උපදී. මේ සමාධිය ආර්‍ය්‍ය යැ (කෙලෙසුන්ගෙන් ඈත් ය), නිරාමිස යැ (කාමාමිස වට්ටාමිස ලොකාමිස යන තුන් ආමිසයන්ගෙන් තොර යැ) යි තමා තුළැ ම නුවණ උපදී. මේ සමාධිය අලාමක පුරුෂයන් විසින් (බුදු පසේ බුදු රහතුන් විසින්) සෙවනා ලද යි තමා තුළ ම නුවණ උපදී. මේ සමාධිය ශාන්ත යැ යි ප්‍රණීත යැ යි කෙලෙස් සංසිඳීමෙන් ලද්දේ යැ යි, එක් නිවන් අරමුණෙහි ම සිත පිහිටුවීමෙන් ලබන ලද්දේ යැ යි සසංස්කාර (ලෞකික සමාධි සෙයින් සප්‍රයොග) සිතින් කෙලෙසුන් මැඩ වළක්වා ලත් පැවැතුම් නැත්තේ යැ යි තමා කෙරෙහි ම නුවණ උපදී. ඒ මම් වූ කලි සිහි ඇත්තෙම් ම මේ සමාධියට සමවදිම්, සිහි ඇත්තෙම් ම මේ සමාධියෙන් නැඟී සිටිම් යි තමා කෙරෙහි ම නුවණ උපදී. මේ උත්පාදයිතව්‍ය ධර්ම පස යැ.

අභිඥෙය ධර්ම පස කවර යැ? විමුක්ත්‍යායතන (මිදීමට කාරණ වූ ධර්ම) පස යැ: මෙහි මහණක් හට ශාස්තෘ තෙමේ හෝ ගුරු තන්හි සිටි සබ්‍රම්සරුවෙක් හෝ දහම් දෙස යි. ඇවැත්නි, ශාස්තෘ තෙමේ හෝ ගුරු තන්හි සිටි සබ්‍රම්සරුවෙක් හෝ යම් යම් සේ ඒ මහණහට දහම් දෙසා ද, ඒ ඒ පරිද්දෙන් හෙ තෙම ඒ ධර්මයෙහි අරුත් දැනගන්නේ ද වෙයි, පෙළ දැනගන්නේ ද වෙයි, අරුත් දන්නා පෙළ දන්නා ඔහුට ප්‍රමොදය උපදී. ප්‍රමුදිතවූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිතැත්තහුගේ නාම කය සංහිඳෙයි. සංහිඳුණු නාම කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහු ගේ සිත එකඟ වෙයි. මේ පළමු විමුක්ත්‍යායතනය යැ.

පුන ච පරං ආවුසො භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති. අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී, අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති. යථා යථා ආවුසො භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති. ඉදං දුතියං විමුත්තායතනං.

පුන ච පරං ආවුසො භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී. නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති. යථා යථාවුසො භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති. ඉදං තතියං විමුත්තායතනං.

පුන ච පරං ආවුසො භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී, නාපි යථා සුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති, අපි ච ඛො යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති. යථා යථා ආවුසො භික්ඛු යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච, තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති. ඉදං චතුත්ථං විමුත්තායතනං.

තව ද ඇවැත්නි, ශාස්තෘ තෙමේ මහණකුට දහම් නො ම දෙසයි, ගුරු තන්හි වූ අන් සබ්‍රම්සරුවෙකුත් දහම් නො ම දෙසයි, එතෙකුදු වුවත් ඇසූ පරිදි පුහුණු කළ පරිදි ඒ ධර්මය විස්තර වශයෙන් අනුනට දෙසයි. ඇවැත්නි, මහණ තෙමේ යම් යම් සේ තමා ඇසූ පරිදි පුහුණු කළ පරිදි විස්තර වශයෙන් අනුනට දහම් දෙසන්නේ ද, එසේ එසේ හේ ඒ ධර්මයෙහි අරුත් දැනගන්නේ ද පෙළ දැනගන්නේ ද වෙයි. අරුත් දැනගන්නාවූ පෙළ දැනගන්නාවූ ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීත සිතැත්තහුගේ නාම කය සංහිඳේ. සංහිඳුණු නාම කය ඇත්තේ සුව විඳී. සුව විඳුනාහු ගේ සිත එකඟ වෙයි. මේ දෙවැනි විමුක්ත්‍යායතනය යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, ශාස්තෘ තෙමේ හෝ අන් කිසි ගුරු තන්හි වූ සබ්‍රම්සරුවෙක් හෝ මහණකුට දහම් නො ම දෙසයි. ඇසූ පරිදි පුහුණු කළ පරිදි අනුනට විස්තර වසයෙන් දහම් නො ද දෙසයි. එතෙකුදු වුවත් ඇසූ පරිදි, පුහුණු කළ පරිදි, ධර්මය විස්තරයෙන් සඣාධ්‍යාය කෙරෙයි (පුන පුනා කියයි). ඇවැත්නි, යම් සේ යම් සේ මහණ තෙම ඇසූ පරිදි පුහුණු කළ පරිදි ධර්මය විස්තරයෙන් සඣාධ්‍යාය කෙරෙයි ද, එසේ එසේ හේ ඒ දහමෙහි අරුත් දැනගන්නේ ද පෙළ දැනගන්නේ ද වෙයි. අරුත් දැනගන්නා පෙළ දැනගන්නා ඔහුට සතුට උපදී. සතුටු වූවාහට ප්‍රීතිය උපදී. ප්‍රීත සිතැත්තහු ගේ නාම කය සංහිඳේ. සංහුන් නාම කය ඇත්තේ සුව විඳී. සුව විඳුනාහු ගේ සිත එකඟ වෙයි. මේ තෙවෙනි වික්මුත්‍යායතනය යැ.

තව ද අනෙකෙක, ඇවැත්නි, ශාස්තෘ හෝ ගුරු තන්හි සිටි කිසි සබ්‍රම්සරුවෙක් හෝ දහම් නො ම දෙසයි. ඇසූ පරිදි, පුහුණු පරිදි විස්තරයෙන් ධර්මය සඣාධ්‍යයන ද නො ම කෙරෙයි. වැළි, ඇසූ පරිදි පුහුණු පරිදි ධර්මය සිතින් පුන පුනා කල්පනා කෙරෙයි. පුන පුනා විමසයි, සිතින් පුන පුනා සලකා බලයි. ඇවැත්නි, ඇසූ පරිදි පුහුණු පරිදි යම් යම් සේ ධර්මය සිතින් පුන පුනා කල්පනා කෙරෙයි ද, පුන පුනා විමසයි ද, පුන පුනා සිතින් සලකා බලයි ද, එසේ එසේ හෙ තෙමේ ඒ ධර්මයෙහි අරුත් දැන ගන්නේ ද පෙළ දැනගන්නේ ද වෙයි. අරුත් දැනගන්නා පෙළ දැනගන්නා ඔහුට සතුට උපදී. සතුටු වූවාහට ප්‍රීතිය උපදී, ප්‍රීත සිතැත්තහු ගේ නාම කය සංහිඳේ. සංහුන් නාම කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහු ගේ සිත එකඟ වෙයි. මෙ සතරවන විමුක්ත්‍යායතනය යැ.

පුන ච පරං ආවුසො භික්ඛුනො න හෙව ඛො සත්ථා ධම්මං දෙසෙති, අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති. නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන සජ්ඣායං කරොති, නාපි යථාසුතං යථාපරියත්තං ධම්මං චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති මනසානුපෙක්ඛති. අපි ච ඛ්වස්ස අඤ්ඤතරං සමාධිනිමිත්තං සුග්ගහිතං හොති සුමනසිකතං සූපධාරිතං සුප්පටිවිද්ධං පඤ්ඤාය. යථා යථා ආවුසො භික්ඛුනො අඤ්ඤතරං සමාධි-නිමිත්තං සුග්ගහිතං හොති සුමනසිකතං සූපධාරිතං සුප්පටිවිද්ධං පඤ්ඤාය. තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. තස්ස අත්ථපටිසංවෙදිනො ධම්මපටිසංවෙදිනො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති. ඉදං පඤ්චමං විමුත්තායතනං. ඉමෙ පඤ්ච ධම්මා අභිඤ්ඤෙය්‍යා.

කතමෙ පඤ්ච ධම්මා සච්ඡිකාතබ්බා? පඤ්ච ධම්මක්ඛන්ධා: සීලක්ඛන්ධො, සමාධික්ඛන්ධො පඤ්ඤාක්ඛන්ධො, විමුත්තික්ඛන්ධො, විමුත්ති-ඤාණදස්සනක්ඛන්ධො. ඉමෙ පඤ්ච ධම්මා සච්ඡිකාතබ්බා.

ඉති ඉමෙ පඤ්ඤාස ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා.

### ඡ ධම්මා

7. ඡ ධම්මා බහුකාරා -පෙ- ඡ ධම්මා සච්ඡිකාතබ්බා.

කතමෙ ඡ ධම්මා බහුකාරා? ඡ සාරාණීයා ධම්මා: ඉධාවුසො භික්ඛුනො මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය අවිහෙසාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

තව ද අනෙකෙක. ඇවැත්නි, ශාස්තෘ හෝ ගුරු තන්හි සිටි කිසි සබ්-රම් සරුවෙක් හෝ මහණහට නො ම දහම් දෙසයි, මහණ තෙම ඇසූ පරිදි පුගුණ කළ පරිදි විස්තරයෙන් දහම් නො ද දෙසයි, ඇසූ පුහුණු කළ පරිදි විස්තර විසින් දහම සජ්ඣායනා ද නො ම කෙරෙයි, ඇසූ පුහුණු කළ පරිදි ධර්මය සිතින් පුන පුනා නො ම කල්පනා කෙරෙයි, නො ම විමසයි, සිතින් පුන පුනා නො ද සලකා බලයි. වැළි දු ඔහු විසින් එක්තරා සමාධියෙක් (ගුරුහුගෙන් කමටහන් උගන්නා හා ම) මොනො-වට උගන්නා ලද්දේ මොනොවට මෙනෙහි කරන ලද්දේ ප්‍රඥයෙන් මොනොවට සලකා බලන ලද්දේ මොනොවට පිළිවිදුනා ලද්දේ වෙයි. ඇවැත්නි, යම් යම් පරිද්දෙන් මහණහු විසින් එක්තරා සමාධියෙක් මොනොවට උගන්නා ලද්දේ, මොනොවට මෙනෙහි කරන ලද්දේ, ප්‍රඥයෙන් මොනොවට සලකා බලන ලද්දේ, මොනොවට පිළිවිදුනා ලද්දේ වෙයි ද, ඒ ඒ පරිද්දෙන් හෙ තෙමෙ ඒ ධර්මයෙහි අරුත් දන්නේ ද පෙළ දන්නේ ද වෙයි. අරුත් දන්නා, පෙළ දන්නා ඔහුට සතුට උපදී. සතුටු වූවාහට ප්‍රීතිය උපදී. ප්‍රීති සිතැත්තහු ගේ නාම කය සංසිඳේ. සංසුන් නාමකය ඇත්තේ සුව විඳී. සුව විඳුනාහු ගේ සිත එකඟ වෙයි. මේ පස් වනු විමුක්ත්‍යායතනය යැ. මේ අභිඥෙය ධර්ම පස යැ.

සාක්ෂාත් කර්තව්‍ය ධර්ම පස කවර යැ? ශීලස්කන්ධය, සමාධිස්කන්ධය, ප්‍රඥාස්කන්ධය, විමුක්තිස්කන්ධය, විමුක්තිඥනදර්ශනස්කන්ධය යන ධර්මස්-කන්ධ පස යැ. මේ සාක්ෂාත්කර්තව්‍ය ධර්ම පස යැ.

මෙසේ මේ භූත වූ තථ්‍ය වූ තථ වූ අවිතථ වූ අනන්‍යථ වූ පනස් දහම්හු තථාගතයන් වහන්සේ විසින් තමන් ම මොනොවට වෙසෙසි නුවණින් අවබොධ කරන ලද්දහ.

### ෂට්කය

7. බහූපකාර ධර්ම සයෙක......සාක්ෂාත් කර්තව්‍ය ධර්ම සයෙකි.

බහූපකාර ධර්ම සය කවර යැ? සාරානීය (සංරඤ්ජනීය) ධර්ම සය යැ: ඇවැත්නි, මෙහි මහණක්හු ගේ මෛත්‍රී සහගත කායකර්මය සබ්රම් සරුවන් කෙරෙහි ප්‍රකට ව ද රහසේ ද එළැඹ සිටියේ වෙයි. මේ සාරානීය ධර්මය ද ප්‍රිය කරන ප්‍රිය කටයුත්තකු කරන ගරුකරන ගරුකටයුතු කරන සංග්‍රහය පිණිස අවිවාදය පිණිස, අවිහිංසාව පිණිස සමගිය පිණිස, එකමුතු බව පිණිස පවතී.

පුන ච පරං ආවුසො භික්ඛුනො මෙත්තං වචීකම්මං -පෙ- එකීභාවාය සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛුනො මෙත්තං මනොකම්මං -පෙ- එකීභාවාය සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛු යෙ තෙ ලාභා ධම්මිකාධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි තථාරූපෙහි ලාභෙහි අප්පටිවිභත්තභොගී හොති සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී. අයම්පි ධම්මො සාරාණියො -පෙ- එකීභාවාය සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛු යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි, තථාරූපෙසු සීලෙසු සීලසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණියො -පෙ- එකීභාවාය සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛු යා'යං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය, තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණියො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය අවිහෙසාය සාමග්ගියා එකීභාවාය සංවත්තති. ඉමෙ ඡ ධම්මා බහුකාරා,

කතමෙ ඡ ධම්මා භාවෙතබ්බා? ඡ අනුස්සතිට්ඨානානි: බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති. ඉමෙ ඡ ධම්මා භාවෙතබ්බා.

කතමෙ ඡ ධම්මා පරිඤ්ඤෙය්‍යා? ඡ අජ්ඣත්තිකානි ආයතනානි: චක්ඛායතනං, සොතායතනං, ඝානායතනං, ජිව්හායතනං, කායායතනං, මනායතනං. ඉමෙ ඡ ධම්මා පරිඤ්ඤෙය්‍යා.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණහු ගේ මෛත්‍රී සහගත වාක්-කර්මය......එකමුතු බව පිණිස පවතී.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණහුගේ මෛත්‍රීසහගත මනඃකර්-මය......එකමුතු බව පිණිස පවතී.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණහට දැහැමි වූ, දැහැමින් ලැබුණු, යටත් පිරිසෙයින් පාත්‍රයට ප්‍රමාණ ඇ වූ ද යම් ලාභ කෙනෙක් වෙත් ද, එ බඳු වූ ලාභයන්ගෙන් අප්‍රතිවිභක්තභොගී (අමිස වශයෙන් හෝ පුද්ගල වශයෙන් බෙදීමක් නැති ව යළදන්නෝ) වේ ද, සිල්වත් සබ්‍රම්සරුවන් හා සාධාරණ පරිභොගයෙන් එය වළඳන්නේ වේ ද, මේ සාරාණීය ධර්මය ද, ප්‍රිය කරනු පිණිස ගරුකරනු පිණිස සංග්‍රහය පිණිස, අවිවාදය පිණිස, නොවෙහෙස පිණිස, සමගිය පිණිස, එකමුතු බව පිණිස පවතී.

තව ද අනෙකෙක. ඇවැත්නි, අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අසබල වූ (අකල්මාෂ වූ) භුජිෂ්‍ය වූ නුවණැත්තන් විසින් පසස්නා ලද, අපරාමෘෂ්ට වූ සමාධිය පිණිස පවත්නා වූ, යම් ශීලධර්ම කෙනෙක් ඇද්ද, මහණ තෙමේ එ බඳු වූ ශීලවිෂයයෙහි සබ්‍රම් සරුවන් හා ප්‍රකට ව ද අප්‍රකට ව ද ශීලයෙන් සමාන බවට පැමිණියේ වෙසෙයි ද මේ සාරාණීය ධර්මය ද ... ... එකී භාවය පිණිස පවතී.

තව ද අනෙකෙක. ඇවැත්නි, ආර්ය වූ නෛර්යාණික වූ යම් දෘෂ්ටි-යෙක් එය පිළිපදනාහට මොනොවට දුක් නැසෙනු පිණිස පවතී ද, මහණ තෙමේ එබඳු දෘෂ්ටියෙන් සබ්‍රම්සරුවන් හා ප්‍රකට ව ද අප්‍රකට ව ද දෘෂ්ටි සාමාන්‍ය ගත වැ (දෘෂ්ටියෙන් සමාන බවට පැමිණියෙක් වැ) වෙසෙයි ද, මේ සාරණීය ධර්මය ද ප්‍රිය කරන ගරුකරන වෙයි, සංග්‍රහය පිණිස, අවිවාදය පිණිස, නොවෙහෙස පිණිස, එකී භාවය පිණිස, පවතී. මේ බහුපකාර ධර්ම සය යැ.

භාවයිතව්‍ය (වැඩියැ යුතු) ධර්ම සය කවර යැ? බුද්ධානුස්මෘතිය, ධර්මානුස්මෘතිය සංඝානුස්මෘතිය, ශීලනානුස්මෘතිය, ත්‍යාගානුස්මෘතිය, දෙවතානුස්මෘතිය, යන අනුස්මෘති ස්ථාන සය යැ. මේ භාවයිතව්‍ය ධර්ම සය යැ.

පරිඥෙය ධර්ම සය කවර යැ? චක්ෂුරායතනය, ශ්‍රොත්‍රායතනය, ඝ්‍රාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනආයතනය යන ආධ්‍යාත්-මික ආයතන සය යැ. මේ පරිඥෙය ධර්ම සය යැ.

කතමෙ ඡ ධම්මා පහාතබ්බා? ඡ තණ්හාකායා, රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා. ඉමෙ ඡ ධම්මා පහාතබ්බා.

කතමෙ ඡ ධම්මා හානභාගියා? ඡ අගාරවා: ඉධාවුසො භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සවො, ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- සික්ඛාය -පෙ- අප්පමාදෙ -පෙ- පටිසන්ථාරෙ අගාරවො විහරති අප්පතිස්සවො. ඉමෙ ඡ ධම්මා හානභාගියා.

කතමෙ ඡ ධම්මා විසෙසභාගියා? ඡ ගාරවා: ඉධාවුසො භික්ඛු සත්ථරි සගාරවො විහරති සප්පතිස්සවො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- සික්ඛාය-පෙ- අප්පමාදෙ -පෙ- පටිසන්ථාරෙ සගාරවො විහරති සප්පතිස්සවො. ඉමෙ ඡ ධම්මා විසෙසභාගියා.

කතමෙ ඡ ධම්මා දුප්පටිවිජ්ඣා? ඡ නිස්සරණියා ධාතුයො: ඉධාවුසො, භික්ඛු එවං වදෙය්‍ය: මෙත්තා හි ඛො මෙ ආවුසො, චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ බ්‍යාපාදෙ චිත්තං පරියාදාය තිට්ඨතීති, සො 'මාහෙවන්ති'ස්ස වචනීයො, මා'යස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො අනවකාසො යං මෙත්තාය චෙතොවිමුත්තියා භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, අථ ච පනස්ස බ්‍යාපාදෙ චිත්තං පරියාදාය ඨස්සතීති නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො බ්‍යාපාදස්ස යදිදං මෙත්තාචෙතොවිමුත්ති.

ප්‍රහාතව්‍ය ධර්ම සය කවර යැ? රූපතෘෂ්ණාව, ශබ්ද තෘෂ්ණාව, ගන්ධ තෘෂ්ණාව, රස තෘෂ්ණාව, ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණාව, ධර්ම තෘෂ්ණාව යන තෘෂ්ණකාය සය යැ. මේ ප්‍රහාතව්‍ය ධර්ම සය යි.

හානභාගික ධර්ම සය කවර යැ? අගෞරව සය යැ: ඇවැත්නි, මෙහි මහණෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ, යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි: ධර්මය කෙරෙහි... සඞ්ඝයා කෙරෙහි... ශික්ෂාව කෙරෙහි... අප්‍රමාදයෙහි... පිළිසඳර කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි. මේ හානභාගික ධර්ම සය යි.

විශෙෂභාගික ධර්ම සය කවර යැ? ගෞරව සය යැ: ඇවැත්නි, මෙහි මහණ තෙමෙ ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව ඇත්තේ යටත් පැවැතුම් ඇත්තේ වෙසෙයි. ධර්මය කෙරෙහි... සංඝයා කෙරෙහි... ශික්ෂාව කෙරෙහි... අප්‍රමාදයෙහි... පිළිසඳරෙහි ගෞරව ඇත්තේ, යටත් පැවැතුම් ඇත්තේ වෙසෙයි. මේ විශෙෂභාගික ධර්ම සය යැ.

දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම සය කවර යැ? නිඃසරනික ධාතු සය යැ 'ඇවැත්නි, මා විසින් මෛත්‍රී චිත්තවිමුක්තිය භාවිතය, බහුලීකෘත ය, යානීකෘත ය වාස්තුකෘත යැ අනුෂ්ඨිත යැ පරිචිත යැ (පුරුදු කරන ලද්දේ යැ), සුසමාරබ්ධ යැ එතෙකුදු වුවත් ව්‍යාපාදය මා සිත හාත්පසින් ගෙන සිටී යැ' යි මෙසේ මෙහි මහණෙක් කියන්නේ නම්, 'මෙසේ නො කියා වා, ආයුෂ්මත් තෙමේ මෙසේ නො කියා වා, භාග්‍යවතුන් වහන්සේට දෙස් නො නඟා වා, භාග්‍යවතුන් වහන්සේට දෙස් නැඟීම නො මැනවි, භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදරන සේක, ඇවැත්නි, මෛත්‍රීචිත්ත විමුක්තිය භාවිත කල්හි, බහුලීකෘත කල්හි, යානීකෘත කල්හි, වාස්තුකෘත කල්හි, අනුෂ්ඨිත කල්හි, පරිචිත කල්හි, සුසමාරබ්ධ කල්හි, එසේ කලැ ව්‍යාපාදය ඔහුගේ සිත හාත්පසින් ගෙන සිටී යන යමෙක් ඇද්ද, ඇවැත්නි, මෙය නො කරුණෙක, අවකාශ නැත්තෙක, මේ කාරණය අවිද්‍යමාන යැ' යි ඒ මහණ තෙමේ කියැ යුතු (ඒ මහණහට කියනු සුදුසු යැ). කවර හෙයිනැ? ඇවැත්නි, මෛත්‍රී චිත්ත විමුක්තිය යන යමෙක් ඇද්ද මෙය ව්‍යාපාදයා ගේ නිඃසරණය යැ, එහෙයිනි.

ඉධ පනාවුසො, භික්ඛු එවං වදෙය්‍ය: කරුණාහි ඛො මෙ ආවුසො චෙතොවිමුත්ති භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, අථ ච පන මෙ විහෙසා චිත්තං පරියාදය තිට්ඨතී ති, සො'මා හෙවන්ති'ස්ස වචනීයො, මා'යස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, -පෙ- නිස්සරණං හෙතං ආවුසො, විහෙසාය යදිදං කරුණා චෙතොවිමුත්ති.

ඉධාවුසො, භික්ඛු එවං වදෙය්‍ය: මුදිතා හි ඛො මෙ ආවුසො චෙතොවිමුත්ති භාවිතා -පෙ- අථ ච පන මෙ අරති චිත්තං පරියාදය තිට්ඨතී ති, සො 'මාහෙවන්ති'ස්ස වචනීයො, මායස්මා එවං අවච -පෙ- නිස්සරණං හෙතං ආවුසො අරතියා යදිදං මුදිතා චෙතොවිමුත්ති.

ඉධ පන ආවුසො, භික්ඛු එවං වදෙය්‍ය: උපෙක්ඛා හි ඛො මෙ ආවුසො, චෙතොවිමුත්ති භාවිතා -පෙ- අථ ච පන මෙ රාගො චිත්තං පරියාදය තිට්ඨතී ති. -පෙ- නිස්සරණං හෙතං ආවුසො රාගස්ස යදිදං උපෙක්ඛා චෙතොවිමුත්ති.

ඉධ පනාවුසො, භික්ඛු එවං වදෙය්‍ය: අනිමිත්තා හි ඛො මෙ ආවුසො, චෙතොවිමුත්ති භාවිතා -පෙ- අථ ච පන මෙ තං නිමිත්තානුසාරි විඤ්ඤාණං හොතී ති -පෙ- නිස්සරණං හෙතං ආවුසො, සබ්බනිමිත්තානං යදිදං අනිමිත්තා චෙතොවිමුත්ති.

ඇවැත්නි, මා විසින් කරුණා චිත්තවිමුක්තිය භාවිත යැ, බහුලීකෘත යැ, යානී කෘත යැ, වාස්තුකෘත යැ, අනුෂ්ඨිත යැ, පරිචිත යැ, සුසමාරබ්ධ යැ. එතෙකුදු වුවත් විහිංසාව මා සිත හාත්පසින් ගෙන සිටී යැ යි මෙහි මහණෙක් මෙසේ කියන්නේ නම්, 'මෙසේ නො කියා වා, ආයුෂ්මත් තෙමේ මෙසේ නො කියාවා, භාග්‍යවතුන් වහන්සේට දෙස් නො නඟා වා, භාග්‍යවතුන් වහන්සේට දෙස් නැඟීම නො මැනැවි, භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදරන සේක්‍යැ...... යි ඒ මහණ තෙමේ මෙසේ කියැ යුතු වන්නේ ය. කවර හෙයින? ඇවැත්නි, කරුණාචිත්තවිමුක්තිය යන යමෙක් ඇද්ද, මෙය විහිංසාවගේ නිඃසරණය යැ. එහෙයිනි.

ඇවැත්නි, 'මා විසින් මුදිතා චිත්තවිමුක්තිය භාවිත යැ... එ තෙකුදු වුවත් අරතිය මා සිත හාත්පසින් ගෙන සිටී යැ යි මෙහි මහණෙක් මෙසේ කියන්නේ නම් 'එසේ නො කියා වා, ආයුෂ්මත් තෙමේ එසේ නහමක් කියා වා. ... යි හෙ තෙමේ මෙසේ කියැ යුතු වන්නේ ය. කවර හෙයින? ඇවැත්නි, මුදිතා චෙතොවිමුක්ති යන යමෙක් ඇද්ද, මෙය අරතියගේ නිඃසරණය යැ. එහෙයිනි.

ඇවැත්නි, 'මා විසින් උපෙක්ෂා චෙතොවිමුක්තිය භාවිත යැ'. ... එතෙකුදු වුවත් රාගය මා සිත හාත්පසින් ගෙන සිටී යැ යි මෙහි මහණෙක් මෙසේ කියන්නේ නම්, 'එසේ නො කියා වා' ආයුෂ්මත් තෙමේ එසේ නහමක් කියා වා...'යි මෙසේ ඒ මහණ තෙමේ කිය යුතු වන්නේ ය. ඒ කවර හෙයින? ඇවැත්නි, උපෙක්ෂා චෙතොවිමුක්ති යන යමෙක් ඇද්ද, මෙය රාගයාගේ නිඃසරණය යැ. එහෙයිනි.

ඇවැත්නි, මා විසින් අනිමිත්ත චෙතොවිමුක්තිය භාවිත යැ... එතෙකුදු වුවත් මගේ ඒ නුවණ (රාගනිමිත්තාදි) නිමිති අනුව යන්නේ වේ යැ' යි කියන්නේ නම්, 'එසේ නො කියා වා, ආයුෂ්මත් තෙමේ නහමක් එසේ කියා වා...' යි මෙසේ ඒ මහණ තෙමේ කියැ යුතු වන්නේ ය. ඒ කවර හෙයින? ඇවැත්නි, අනිමිත්ත චෙතොවිමුක්ති යන යමෙක් ඇද්ද, මෙය සියලු නිමිතින් ගේ නිඃසරණය යැ එහෙයිනි.

ඉධ පන ආවුසො, භික්ඛු එවං වදෙය්‍ය: අස්මී ති ඛො මෙ විගතං, අයමහමස්මී ති න සමනුපස්සාමි. අථ ච පන මෙ විචිකිච්ඡා කථංකථාසල්ලං චිත්තං පරියාදය තිට්ඨතී ති. සො 'මා හෙවන්ති'ස්ස වචනීයො, මා'යස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං. න හි භගවා එවං වදෙය්‍ය. අට්ඨානමෙතං ආවුසො, අනවකාසො, යං අස්මීති විගතෙ අයමහමස්මීති අසමනුපස්සතො, අථ ච පනස්ස විචිකිච්ඡා කථංකථාසල්ලං චිත්තං පරියාදය ඨස්සතී ති, නෙතං ඨානං විජ්ජති. නිස්සරණං හෙතං ආවුසො විචිකිච්ඡා කථංකථාසල්ලස්ස, යදිදං අස්මිමානස්ස සමුග්ඝාතො. ඉමෙ ඡ ධම්මා දුප්පටිවිජ්ඣා.

**කතමෙ ඡ ධම්මා උප්පාදෙතබ්බා?** ඡ සතතවිහාරා: ඉධාවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො. උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො. ඉමෙ ඡ ධම්මා උප්පාදෙතබ්බා.

**කතමෙ ඡ ධම්මා අභිඤ්ඤෙය්‍යා?** ඡ අනුත්තරියානි: දස්සනානුත්තරියං, සවණානුත්තරියං, ලාභානුත්තරියං, සික්ඛානුත්තරියං, පාරිචරියානුත්තරියං, අනුස්සතානුත්තරියං. ඉමෙ ඡ ධම්මා අභිඤ්ඤෙය්‍යා.

**කතමෙ ඡ ධම්මා සච්ඡිකාතබ්බා?** ඡ අභිඤ්ඤා: ඉධාවුසො, භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති -පෙ- යාව බ්‍රහ්මලොකා පි කායෙන වසං වත්තෙති, දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ වා පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති, සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති–සෙය්‍යථීදං, එකම්පි ජාතිං ද්වෙ පි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉමෙ ඡ ධම්මා සච්ඡිකාතබ්බා.

ඇවැත්නි, 'මම වෙමි' යන මගේ අස්මි මානය පහ විය. 'මේ මම වෙමි' යි නො දකිමි. එතෙකුදු වුවත් මාගේ සැකය, කථංකථාශල්‍යය (කෙසේ ද කෙසේ ද'යි විමති කරන සැක හුල) හාත්පසින් මගේ සිත ගෙන සිටී' යැ යි මෙසේ කියන්නේ නම්, 'එසේ නො කියන්නැ, ආයුෂ්මත් තෙමේ එසේ නො කියා වා, භාග්‍යවතුන් වහන්සේට දෙස් නො කියන්න, භාග්‍යවතුන් වහන්සේට දෙස් කීම නො මැනැව. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො ම වදරන සේක. ඇවැත්නි, 'වෙමි' යි අස්මි-මානය පහ වූ කල්හි, මේ 'මම වෙමි' යි නො දක්නාහට මෙසේ සැක ඇති වීම යන මෙය නො කරුණෙක. මෙය අවකාශ නැත්තෙක. එතෙකුදු වුවත් විචිකිච්ඡාව වූ කථංකථාසල්ලය ඔහු සිත හාත්පසින් ගෙන සිටින්නේ ය යන මේ කාරණය නැත, මෙය අවිද්‍යමාන ය. කවර හෙයින? යම් අස්මිමානයක ගේ මුල් සිඳීමෙක් වේ ද, මෙය විචිකිච්ඡා සංඛ්‍යාත කථංකථාසල්ලයාගේ නිඃසරණය වේ. එ හෙයිනි. මේ දුෂ්ප්‍රතිධ්‍යධර්ම සය යැ.

උත්පාදයිතව්‍ය ධර්ම සය කවර යැ? සතතවිහාර සය යැ: ඇවැත්නි, මෙහි මහණ තෙම ඇසින් රූවක් දැක සතුටු ද නො ම වෙයි. නො සතුටු ද නො ම වෙයි, සිහි ඇත්තේ, නුවණින් දන්නේ, උපෙක්ෂක ව ම වෙසෙයි. කනින් හඬක් අසා,... නැහැයෙන් ගඳක් අසා...... දිවින් රසක් විඳ... කයින් ස්ප්‍රෂ්ටව්‍යක් පැහැස... මනසින් දහමක් සිතා සතුටු ද නො ම වෙයි, නො සතුටු ද නො ම වෙයි, සිහි ඇත්තේ නුවණින් දන්නේ උපෙක්ෂක ව ද වෙසෙයි. මේ උත්පාදයිතව්‍ය ධර්ම සය යැ.

අභිඥෙය ධර්ම සය කවර යැ? අනුත්තරිය දර්ශනය, අනුත්තරිය ශ්‍රවණය, අනුත්තරිය ලාභය, අනුත්තරිය ශික්ෂාව, අනුත්තරිය පාරිචර්යාව, අනුත්තරිය අනුස්මෘතිය යන අනුත්තරිය සය යි. මේ අභිඥෙය ධර්ම සය යැ.

සාක්ෂාත් කර්තව්‍ය ධර්ම සය කවර යැ? අභිඥා සය යැ: ඇවැත්නි, මෙහි මහණ තෙමේ නොයෙක් සෘද්ධිවිධ ලබයි... බඹ ලොව දක්වා ද කයින් වශය පවත්වයි. මිනිසුන්ගේ ශ්‍රවණොපචාරය ඉක්මි පිරිසිදු දිව කනින් දුරැ වූ ද ළඟැ වූ ද දිව්‍ය වූ ද මානුෂක වූ ද යන දෙ හඬ ම අසයි. රාග සහිත සිත රාග සහිත සිතැ යි,... නො මිදුණු සිත නොමිදුණු සිතැ යි දනී. මෙසේ අන් සතුන් ගේ අන් පුඟුලන් ගේ සිත් සිය සිතින් පිරිසිඳ දනී. එක් ජාතියක් ද ජාති දෙකක් ද ...යි අනෙකවිධ පෙරැ වුසු කඳ පිළිවෙළ සිහි කෙරෙයි. මෙසේ ආකාර සහිත උද්දෙස සහිත, අනෙක විධ පූර්වෙනිවාසය සිහි කරයි, මිනිසුන් ගේ දර්ශනොපචාරය ඉක්මැ දක්ක හැකි පිරිසිදු දිවැසින් ...කම් වූ පරිදි මිය යන නැවත උපදනා සතුන් දැනගනී. ආශ්‍රවයන් ගේ විනාශයෙන් ආස්‍රව රහිත වූ, චෙතොවිමුක්තිය ද (ඵල සමාධිය ද) ප්‍රඥා විමුක්තිය ද (ඵල ඥානය ද) මේ අත්බවහි ම තෙමේ ම වෙසෙයි නුවණින් දැන පසක් කොට ලැබ වෙසෙයි. මේ සාක්ෂාත්කර්තව්‍ය ධර්ම සය යැ.

ඉති ඉමෙ සට්ඨි ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා.

## සත්තධම්මා

8. සත්ත ධම්මා බහුකාරා, සත්ත ධම්මා භාවෙතබ්බා, සත්ත ධම්මා පරිඤ්ඤෙය්‍යා, සත්ත ධම්මා පහාතබ්බා, සත්ත ධම්මා හානභාගියා, සත්ත ධම්මා විසෙසභාගියා, සත්ත ධම්මා දුප්පටිවිජ්ඣා, සත්ත ධම්මා උප්පාදෙතබ්බා, සත්ත ධම්මා අභිඤ්ඤෙය්‍යා, සත්ත ධම්මා සච්ඡිකාතබ්බා.

කතමෙ සත්ත ධම්මා බහුකාරා? සත්ත අරියධනානි: සද්ධාධනං, සීලධනං, හිරිධනං, ඔත්තප්පධනං, සුතධනං, චාගධනං, පඤ්ඤාධනං. ඉමෙ සත්ත ධම්මා බහුකාරා.

කතමෙ සත්ත ධම්මා භාවෙතබ්බා? සත්තසම්බොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, විරියසම්බොජ්ඣඞ්ගො, පීතිසම්බොජ්ඣඞ්ගො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, සමාධිසම්බොජ්ඣඞ්ගො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ සත්ත ධම්මා භාවෙතබ්බා.

කතමෙ සත්ත ධම්මා පරිඤ්ඤෙය්‍යා? සත්ත විඤ්ඤාණට්ඨිතියො: සන්තාවුසො සත්තා නානත්තකායා නානත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. අයං පඨමා විඤ්ඤාණට්ඨිති

සන්තාවුසො සත්තා නානත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා පඨමාභිනිබ්බත්තා, අයං දුතියා විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා එකත්තකායා නානත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා ආභස්සරා. අයං තතියා විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා එකත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. අයං චතුත්ථා විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කම්ම -පෙ- අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනූපගා. අයං පඤ්චමී විඤ්ඤාණට්ඨිති.

මෙසේ මේ භූත වූ තථ්‍ය වූ තථ වූ අවිතථ වූ අනන්‍යථ වූ මේ සැටෙක් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මොනොවට අවබොධ කරන ලදහ.

## සප්තධර්මයෝ

8. බහූපකාර ධර්ම සතෙක, භාවයිතව්‍ය ධර්ම සතෙක, පරිඥෙය ධර්ම සතෙක, ප්‍රහාතව්‍ය ධර්ම සතෙක, හානභාගිය ධර්ම සතෙක, විසෙසභාගිය ධර්ම සතෙක, දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම සතෙක, උත්පාදයිතව්‍ය ධර්ම සතෙක, අභිඥෙය ධර්ම සතෙක, සාක්ෂාත්කර්තව්‍ය ධර්ම සතෙක.

බහූපකාර ධර්ම සත කවර යැ? ශ්‍රද්ධාධනය, ශීලධනය, හිරිධනය, ඔත්තප්පධනය, ශ්‍රැත ධනය, ත්‍යාග ධනය, ප්‍රඥ ධනය යන ආර්ය ධන සත යැ. මේ බහූපකාර ධර්ම සත යැ.

භාවයිතව්‍ය ධර්ම සත කවර යැ? සතිසම්බොජ්ඣඞ්ගය. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය, විරියසම්බොජ්ඣඞ්ගය, පීතිසම්බොජ්ඣඞ්ගය, පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගය, සමාධිසම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය යන සප්ත සම්බොධ්‍යඞ්ගයෝ යැ. මේ භාවයිතව්‍ය ධර්ම සත යැ.

පරිඥෙය ධර්ම සත කවර යැ? විඥනස්ථිති සත යැ: ඇවැත්නි, මිනිස්සු ද ඇතැම් දෙවියෝ ද ඇතැම් විනිපාතිකයෝ ද යි කායනානත්වය (කයින් වෙනස් බව) ඇති, සංඥනානත්වය (ප්‍රතිසන්ධිසංඥ වශයෙන් උනුනට වෙනස් බව) ද ඇති සත්ව කෙනෙක් ඇත. මෙ පළමු වන විඥනස්ථිතිය යැ.

ඇවැත්නි, ලොවැ කල්පාරම්භසමයයෙහි උපන් බ්‍රහ්මකායික දෙවියෝ යම් සේ ද එසේ වූ කායනානත්වය ඇති ප්‍රතිසන්ධි සංඥ එකත්වය ඇති (එක ම වර්ගයේ ප්‍රතිසන්ධි සිතින් උපන්) සත්ව කෙනෙක් ඇත. මේ දෙවෙනි විඥනස්ථිතිය යැ.

ඇවැත්නි, ආභාස්වර දෙවියන් සේ වූ, කායෛකත්වය (කයින් එක් බඳු බව) ඇති, සංඥනානත්වය (ප්‍රතිසන්ධි සංඥව ගේ විවිධතාව) ඇති සත්ව කෙනෙක් ඇත. මෙ තෙවෙනි විඥනස්ථිතිය යැ.

ඇවැත්නි, ශුභකෘත්ස්නක දෙවියන් සේ වූ කායෛකත්වය (කයින් එක් බඳු බව) ඇති, ප්‍රතිසන්ධිසංඥවේ ද එක්බඳු බව ඇති සත්ව කෙනෙක් ඇත. මෙ සතරවන විඥනස්ථිතිය යැ.

ඇවැත්නි, රූපසංඥ හැම ලෙයින් ඉක්මීමෙන්, ප්‍රතිඝසංඥ දුරු වැ යැමෙන්, නානත්වසංඥ නොමෙනෙහි කිරීමෙන්, ආකාශප්‍රඥප්තිය අනන්ත යැ යි දැක, එහි සිත පිහිටුවා, ආකාසානඤ්චායතනයට පැමිණි සත්ව කෙනෙක් ඇත. මෙ පස්වැනි විඥනස්ථිතිය යැ.

සන්තාවුසො සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනූපගා. අයං ඡට්ඨා විඤ්ඤාණට්ඨිති.

සන්තාවුසො සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගා. අයං සත්තමී විඤ්ඤාණට්ඨිති. ඉමෙ සත්ත ධම්මා පරිඤ්ඤෙය්‍යා.

කතමෙ සත්ත ධම්මා පහාතබ්බා? සත්තානුසයා: කාමරාගානුසයො, පටිඝානුසයො, දිට්ඨානුසයො, විචිකිච්ඡානුසයො, මානානුසයො, භවරාගානුසයො, අවිජ්ජානුසයො. ඉමෙ සත්ත ධම්මා පහාතබ්බා.

කතමෙ සත්ත ධම්මා හානභාගියා? සත්ත අසද්ධම්මා: ඉධාවුසො භික්ඛු අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, අප්පස්සුතො හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, දුප්පඤ්ඤො හොති. ඉමෙ සත්ත ධම්මා හානභාගියා.

කතමෙ සත්ත ධම්මා විසෙසභාගියා? සත්ත සද්ධම්මා: ඉධාවුසො භික්ඛු සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, බහුස්සුතො හොති, ආරද්ධවිරියො හොති, උපට්ඨිතස්සති හොති, පඤ්ඤවා හොති. ඉමෙ සත්ත ධම්මා විසෙසභාගියා.

කතමෙ සත්ත ධම්මා දුප්පටිවිජ්ඣා? සත්ත සප්පුරිසධම්මා: ඉධාවුසො භික්ඛු ධම්මඤ්ඤූ ච හොති, අත්ථඤ්ඤූ ච, අත්තඤ්ඤූ ච, මත්තඤ්ඤූ ච කාලඤ්ඤූ ච, පරිසඤ්ඤූ ච, පුග්ගලඤ්ඤූ ච. ඉමෙ සත්ත ධම්මා දුප්පටිවිජ්ඣා.

කතමෙ සත්ත ධම්මා උප්පාදෙතබ්බා? සත්ත සඤ්ඤා: අනිච්චසඤ්ඤා, අනත්තසඤ්ඤා, අසුභසඤ්ඤා, ආදීනවසඤ්ඤා, පහාණසඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා. ඉමෙ සත්ත ධම්මා උප්පාදෙතබ්බා. 8

ඇවැත්නි, හැම ලෙසින් ම අනන්ත වූ කසිණුග්ඝාටිමාකාස අරමුණ ඉක්මැ, විඥානය අනන්ත යැ යි ධ්‍යාන වඩා, විඤ්ඤාණඤ්චායතනයට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ සවැනි විඥානස්ථිතිය යැ.

ඇවැත්නි, හැම ලෙසින් ම විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ, 'කිසිත් නැතැ' යි බවා, ආකිඤ්චඤ්ඤායතනයට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ සත්වැනි විඥානස්ථිතිය යැ. මේ පරිජ්ඥෙය ධර්ම සත යැ.

ප්‍රහාතව්‍ය ධර්ම සත කවර යැ? කාමරාගානුශය ය, ප්‍රතිඝානුශය ය, දෘෂ්ටානුශය ය, විචිකිත්සානුශය ය, මානානුශය ය, භවරාගානුශය ය, අවිද්‍යානුශය ය යන අනුශය සත යැ. මේ ප්‍රහාතව්‍ය ධර්ම සත යැ.

හානභාගික ධර්ම සත කවර යැ? ඇවැත්නි, මෙහි මහණෙක් ශ්‍රද්ධා නැත්තේ වෙයි ද, පවට ලජ්ජා නැත්තේ වෙයි ද, පවට බිය නැත්තේ වෙයි ද, අල්පශ්‍රැත වෙයි ද, කුසීත වෙයි ද, නටුවා වූ සිහි ඇත්තේ වෙයි ද, ප්‍රඥා නැත්තේ වෙයි ද (ඔහු කෙරෙහි වූ ඒ අශ්‍රද්ධාදීහු) අසද්ධර්ම සත යැ. මොහු හානභාගිය ධර්ම සත යැ.

විශෙෂභාගික ධර්ම සත කවර යැ? සද්ධර්ම සත යැ: ඇවැත්නි, මෙහි මහණ තෙම ශ්‍රද්ධා ඇත්තේ වෙයි, පවට ලජ්ජා ඇත්තේ වෙයි, පවට බිය ඇත්තේ වෙයි, බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ (බහුශ්‍රැත) වෙයි, වැඩූ වීර්ය ඇත්තේ වෙයි, එළඹැ සිටි සිහි ඇත්තේ වෙයි, ප්‍රඥා ඇත්තේ වෙයි. මේ සද්ධර්ම සත යැ. මොහු විශෙෂභාගික ධර්ම සත යැ.

දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම සත කවර යැ? සත්පුරුෂ ධර්ම සත යැ: ඇවැත්නි, මෙහි මහණ ධර්මය දන්නේ ද වෙයි, අර්ථ දන්නේ ද වෙයි, තමා දන්නේ ද වෙයි, පමණ දන්නේ ද වෙයි, කල් දන්නේ ද වෙයි, පිරිස දන්නේ ද වෙයි, පුඟුලන් දන්නේ ද වෙයි. මේ දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම සත යැ.

උත්පාදයිතව්‍ය ධර්ම සත කවර යැ? අනිත්‍යසංඥා, අනාත්මසංඥා, අශුභසංඥා, ආදීනව සංඥා, ප්‍රහාණ සංඥා, විරාග සංඥා, නිරොධ සංඥා, යන සංඥා සත යැ. මොහු උත්පාදයිතව්‍ය ධර්ම සත යැ.

**කතමෙ සත්ත ධම්මා අභිඤ්ඤෙය්‍යා? සත්ත නිද්දසවත්ථූනි:** ඉධාවුසො භික්ඛු සික්ඛාසමාදානෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච සික්ඛාසමාදානෙ අවිගතපෙමො, ධම්මනිසන්තියා තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච ධම්ම-නිසන්තියා අවිගතපෙමො, ඉච්ඡාවිනයෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච ඉච්ඡාවිනයෙ අවිගතපෙමො, පටිසල්ලානෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච පටිසල්ලානෙ අවිගතපෙමො, විරියාරම්භෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච විරියාරම්භෙ අවිගතපෙමො, සතිනෙපක්කෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච සතිනෙපක්කෙ අවිගතපෙමො, දිට්ඨිපටිවෙධෙ තිබ්බච්ඡන්දො හොති ආයතිඤ්ච දිට්ඨිපටිවෙධෙ අවිගතපෙමො. ඉමෙ සත්ත ධම්මා අභිඤ්ඤෙය්‍යා.

**කතමෙ සත්ත ධම්මා සච්ඡිකාතබ්බා? සත්ත** ඛීණාසවබලානි: ඉධාවුසො ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, යම්පාවුසො ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති 'ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ආවුසො ඛීණාසවස්ස භික්ඛුනො අඞ්ගාරකාසූපමා කාමා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති. යම්පාවුසො -පෙ- 'ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ආවුසො ඛීණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං විවෙකට්ඨං නෙක්ඛම්මාභිරතං ව්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානියෙහි ධම්මෙහි. යම්පාවුසො -පෙ- 'ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ආවුසො ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා. යම්පාවුසො -පෙ- 'ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ආවුසො ඛීණාසවස්ස භික්ඛුනො පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි. යම්පාවුසො -පෙ- 'ඛීණා මෙ ආසවා'ති.

අභිඥෙය ධර්ම සත කවර යැ? නිර්දශ වස්තු සත යැ: ඇවැත්නි, මෙහි මහණ තෙම ශික්ෂා සමාදානයෙහි දැඩි කැමැත්තේ, මත්තෙහි ද ධර්ම නිශාන්තියෙහි නො පහ වූ ප්‍රේමය ඇත්තේ වෙයි, ඉච්ඡාවිනයයෙහි දැඩි කැමැත්තේ, මත්තෙහි ද ඉච්ඡාවිනයයෙහි නො පහ වූ ප්‍රේමය ඇත්තේ වෙයි, ප්‍රතිසංල්ලයනයෙහි (එකලා වැ හිඳීමෙහි) දැඩි කැමැත්තේ, මත්තෙහි ද ප්‍රතිසංල්ලයනයෙහි නො පහ වූ ප්‍රේමය ඇත්තේ වෙයි. කායික චෛතසික වීර්ය පිරීමෙහි දැඩි කැමැත්තේ, මත්තෙහි වීර්ය පිරීමෙහි පහ නොවූ ප්‍රේමය ඇත්තේ වෙයි. සිහියෙහිත් සථානොචිත ප්‍රඥයෙහිත් දැඩි කැමැත්තේ මත්තෙහි ද සිහියෙහිත් සථානොචිත ප්‍රඥයෙහිත් නොපහ වූ ප්‍රේමය ඇත්තේ වෙයි. දෘෂ්ටි ප්‍රතිවෙධයෙහි (මාර්ගදර්ශනයෙහි) දැඩි කැමැත්තේ, මත්තෙහි ද දෘෂ්ටිප්‍රතිවෙධයෙහි පහ නොවූ ප්‍රේමය ඇත්තේ වෙයි. මේ අභිඥෙය ධර්ම සත යැ.

සාක්ෂාත්කර්තව්‍ය ධර්ම සත කවර යැ? ක්ෂීණාශ්‍රව බල සත යැ: ඇවැත්නි, මෙහි ක්ෂීණාශ්‍රව (රහත්) භික්ෂුහු විසින් සියලු සංස්කාරයෝ අනිත්‍ය වශයෙන් සම්‍යක්ප්‍රඥයෙන් තතු වූ පරිදි මොනොවට දක්නා ලද්දහු වෙත්. යම් බලයක් නිසා රහත් මහණ 'මගේ ආශ්‍රවයෝ නටහ'යි ආශ්‍රවයන් ගේ විනාශය පිළිත කෙරෙයි ද මේ ද රහත් මහණහුගේ බලයෙක් වෙයි.

තව ද අනෙකෙක් ඇත. ඇවැත්නි, රහත් මහණහු විසින් කාමයෝ ගිනි අඟුරු වළක් බඳු හ යි සම්‍යක්ප්‍රඥයෙන් මොනොවට දක්නා ලද්දහු වෙත්. ඇවැත්නි, යම් බලයක් නිසා 'මගේ ආශ්‍රවයෝ නටහ' යි ... පිළිත කෙරෙයි ද, මේත් රහත් මහණහුගේ බලයෙක් වෙයි.

තව ද අනෙකෙක. ඇවැත්නි, රහත් මහණහු ගේ සිත විවෙකයට (නිවනට) නැමුණේ, විවෙකයට නතු වූයේ, විවෙකයට බර වූයේ, විවෙකයෙහි (නිවනෙහි) පිහිටියේ නෛෂ්කාම්‍යයෙහි (නිවනෙහි) ඇලුණේ, ආශ්‍රවයනට කරුණු වූ දැයින් (ත්‍රෛභූමක සංස්කාර කෙරෙන්) හැම සැටියෙන් ම ඉවත් වූයේ වෙයි. ඇවැත්නි, යම් බලයක් නිසා 'මගේ ආශ්‍රවයෝ නටහ' යි ... පිළිත කෙරෙයි ද, මේත් රහත් මහණහු ගේ බලයෙක් වෙයි.

තව ද අනෙකෙක. ඇවැත්නි, රහත් මහණහු විසින් සතර සතිපට්ඨානයෝ භාවිත වෙත්, මොනොවට වඩන ලද්දහු වෙත්. ඇවැත්නි, යම් බලයක් නිසා 'මගේ ආශ්‍රවයෝ නටහ' යි ... පිළිත කෙරෙයි ද, මේත් රහත් මහණහු ගේ බලයෙක් වෙයි.

තව ද අනෙකෙක. ඇවැත්නි, රහත් මහණහු විසින් පංච ඉන්ද්‍රියයෝ භාවිත වෙත්, මොනොවට වඩන ලද්දහු වෙත්. ඇවැත්නි, යම් බලයක් නිසා, 'මගේ ආශ්‍රවයෝ නටහ' යි ... පිළිත කෙරෙයි ද මේත් රහත් මහණහුගේ බලයෙක් වෙයි.

පුන ච පරං ආවුසො ඛීණාසවස්ස භික්ඛුනො සත්ත බොජ්ඣඞ්ගා භාවිතා හොන්ති සුභාවිතා. යම්පාවුසො -පෙ- 'ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ආවුසො ඛීණාසවස්ස භික්ඛුනො අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො. යම්පාවුසො ඛීණාසවස්ස භික්ඛුනො අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො. ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති 'ඛීණා මෙ ආසවා'ති,

ඉමෙ සත්ත ධම්මා සච්ඡිකාතබ්බා.

ඉති මෙ සත්තති ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා.

## අට්ඨ ධම්මා

9. අට්ඨ ධම්මා බහුකාරා -පෙ- අට්ඨ ධම්මා සච්ඡිකාතබ්බා.

කතමෙ අට්ඨ ධම්මා බහුකාරා? අට්ඨ හෙතූ අට්ඨ පච්චයා ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තන්ති. කතමෙ අට්ඨ:

ඉධාවුසො භික්ඛු සත්ථාරං වා උපනිස්සාය විහරති අඤ්ඤතරං වා ගරුට්ඨානියං සබ්‍රහ්මචාරිං, යත්ථස්ස තිබ්බං හිරොත්තප්පං පච්චුපට්ඨිතං හොති, පෙමඤ්ච ගාරවො ච. අයං පඨමො හෙතු, පඨමො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

තං ඛො පන සත්ථාරං උපනිස්සාය විහරති අඤ්ඤතරං වා ගරුට්ඨානියං සබ්‍රහ්මචාරිං යත්ථස්ස තිබ්බං හිරොත්තප්පං පච්චුපට්ඨිතං හොති පෙමං ච ගාරවො ච, තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති පරිපඤ්හති ඉදං භන්තෙ කථං? ඉමස්ස කො අත්ථො ති? තස්ස තෙ ආයස්මන්තො අවිවටං චෙව විවරන්ති අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති. අයං දුතියො හෙතු දුතියො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

තව ද අනෙකෙක. ඇවැත්නි, රහත් මහණහු විසින් සප්ත බොධ්‍යඞ්ග-යෝ භාවිත වෙත්, මොනොවට වඩන ලද්දහු වෙත්. ඇවැත්නි, යම් බලයක් නිසා ... 'මගේ ආස්‍රවයෝ නටහ' යි පිළිත කෙරෙයි ද, මේ ද රහත් මහණහුගේ එක් බලයෙක් වෙයි.

තව ද අනෙකෙක. ඇවැත්නි, රහත් මහණහු විසින් අරි අටැඟි මඟ භාවිත වෙයි, මොනොවට වඩන ලද්දේ වෙයි. යම් බලයක් නිසා රහත් මහණ 'මගේ ආස්‍රවයෝ නටහ' යි ආස්‍රවක්ෂයය (රහත් බව) පිළිත කෙරෙයි ද, මේ ද රහත් මහණහුගේ බලයෙක් වෙයි.

මේ සාක්ෂාත්කර්තව්‍ය ධර්ම සත යැ.

මෙසේ භූත (සත්‍ය) වූ තථ්‍ය වූ තථ වූ අවිතථ වූ අනන්‍යථ වූ සැත්තෑවෙක් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මොනොවට විශිෂ්ටඥනයෙන් දන්නා ලදහ.

## අෂ්ට ධර්මයෝ

9. බහූපකාර ධර්ම අටෙක, ... සාක්ෂාත්කර්තව්‍ය ධර්ම අටෙක.

බහූපකාර ධර්ම අට කවර යැ? අට දෙනෙක් හෙතුහු අට දෙනෙක් ප්‍රත්‍යයයෝ නොලත් ආදිබ්‍රහ්මචර්යක ප්‍රඥව ගේ (මාර්ග බ්‍රහ්මචර්යාවට හෙවත් අරි අටැඟි මඟට පූර්වභාගයෙහි වූ තරුණ ශමථ විදර්ශනා ප්‍රඥව ගේ) ලැබීම පිණිස ද, ලත් එකී ප්‍රඥවගේ වැඩීම පිණිස, මහත් බව පිණිස, භාවනායෙන් පරිපූර්ණ වනු පිණිස පවතිත්. කවර අට දෙනෙක් ද යත්:

ඇවැත්නි, මෙහි මහණ තෙම, යමක්හු කෙරෙහි ඔහුගේ දැඩි හිරිඔතප් එළැඹ සිටියේ වේ ද, ප්‍රේමයත් ගෞරවයත් එළැඹ සිටියේ වේ ද, එසේ වූ ශාස්තෲන් වහන්සේ හෝ ගුරු තන්හි වූ එක්තරා සබ්රම් සරුවක්හු හෝ ඇසුරු කොට වෙසෙයි. මේ පළමු හේතුව, මේ පළමු ප්‍රත්‍යයය නොලත් ආදි බ්‍රහ්මචර්යක ප්‍රඥවගේ ලැබීම පිණිසත් ලත් එකී ප්‍රඥවගේ වැඩීම පිණිසත් මහත් බව පිණිසත් භාවනායෙන් පරිපූර්ණ වනු පිණිසත් පවතී.

මහණ තෙමෙ, යමක්හු කෙරෙහි ඔහුගේ හිරිඔතප් එළැඹ සිටියේ වේ ද, ප්‍රේමයත් ගෞරවයත් එළැඹ සිටියාහු වෙත් ද, එසේ වූ ශාස්තෲන් වහන්සේ හෝ ගුරු තන්හි වූ එක්තරා සබ්රම් සරුවකු හෝ ඇසුරු කොට වෙසෙයි, කලින් කලැ ඔවුන් කරා එළැඹැ,'වහන්ස,මෙය කෙසේ ද? මෙහි අරුත් කිම් ද'යි පුනපුනා විචාරයි, පුනපුනා ප්‍රශ්න කෙරෙයි. ඒ ආයුෂ්මත්හු ඔහුට හෙළි නො වූ දෑ හෙළි කෙරෙත්, අප්‍රකට දෑ ප්‍රකට කෙරෙත්, නොයෙක් අයුරු සැකයට කරුණු වූ දහම්හි සැක දුරලත්. මේ හෙතුව, මේ ප්‍රත්‍යයය වනාහි නො ලත් ආදි බ්‍රහ්මචර්යක ප්‍රඥව ලබනු පිණිස ද ලත් එකී ප්‍රඥව වැඩෙනු පිණිස මහත්වනු පිණිස, භාවනායෙන් පරිපූර්ණ වනු පිණිස ද පවතී.

තං ඛො පන ධම්මං සුත්වා ද්වයෙන වූපකාසෙන සම්පාදෙති කායවූපකාසෙන ච චිත්තවූපකාසෙන ච. අයං තතියො හෙතු තතියො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදය සික්ඛති සික්ඛාපදෙසු. අයං චතුත්‍ථො පච්චයො ආදිබ්‍රහ්ම චරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙ කල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්‍ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපා'ස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. අයං පඤ්චමො හෙතු පඤ්චමො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහාණාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. අයං ඡට්ඨො හෙතු ඡට්ඨො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

පුන ච පරං ආවුසො භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. අයං සත්තමො හෙතු සත්තමො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

ඒ ධර්මය අසා කායවිවේකයෙන් ද චිත්තවිවේකයෙන් ද යන විවේක දෙකින් එය සම්පාදනය කෙරෙයි. මේ තුන්වැනි හෙතුව තුන්වැනි ප්‍රත්‍යයය නොලත් ආදිබ්‍රහ්මචර්යක ප්‍රඥව ලබනු පිණිස, ලද්දහු වැඩෙනු පිණිස, මහත් වනු පිණිස, භාවනායෙන් පරිපූර්ණ වනු පිණිස පවතී.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමෙ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් හැවුරුණේ, ආචාරගොචර සම්පන්න වූයේ, සවල්පමාත්‍ර ද වරදෙහි බිය දක්නා සුලු වූයේ, සිල්වත් වෙයි. සමාදන්කොට ගෙන ශික්ෂාපදයන්හි හික්මෙයි. මේ සතරවන හෙතුව, සතරවන ප්‍රත්‍යයය නොලත් ආදිබ්‍රහ්මචර්යක ප්‍රඥව ලබනු පිණිස, ලද්දහු වැඩෙනු පිණිස මහත් වනු පිණිස භාවනායෙන් පරිපූර්ණ වනු පිණිස පවතී.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ බහුශ්‍රැත (බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ) වෙයි, ශ්‍රැතධර (ඇසූ දෑ සිතින් දරන්නේ) වෙයි, ශ්‍රැතසන්නිචය (ඇසූ දෑ සිතැ රැස් කොට ගෙන සිටිනුයේ) වෙයි, ආදිකල්‍යාණ වූ මධ්‍ය කල්‍යාණ වූ පර්යවසාන කල්‍යාණ වූ, අර්ථ සහිත වූ ව්‍යංජන සහිත වූ යම් ධර්ම කෙනෙක් හැම ලෙසින් පරිපූර්ණ වූ පිරිසිදු බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කෙරෙත් ද, එසේ වූ ධර්මයෝ ඔහු විසින් බොහෝ සෙයින් අසන ලද්දහු ද සිතින් දරන ලද්දහු ද වචනයෙන් පුරුදු කරන ලද්දහු ද සිතින් යලි යලි බලන ලද්දහු ද දෘෂ්ටියෙන් (ප්‍රඥයෙන්) මොනොවට පිළිවිදුනා ලද්දහු ද වෙත්. මේ පස්වැනි හෙතුව, පස්වැනි ප්‍රත්‍යයය නොලත් ආදිබ්‍රහ්මචර්යක ප්‍රඥව ලබනු පිණිස ද ලද්දහු වැඩෙනු පිණිස මහත් වනු පිණිස භාවනායෙන් පරිපූර්ණ වනු පිණිස ද පවතී.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ අකුසල් දහමුන් බැහැර කරනු පිණිස, කුසල් දහම් සැපයෙනු පිණිස ශක්ති ඇත්තේ දෘඩ වීර්ය ඇත්තේ කුසල් දහම්හි නො බහා තැබූ ධුර (වීර්ය) ඇත්තේ කරන ලද වීර්ය ඇත්තේ වෙසෙයි. සවැනි හෙතුව, සවැනි ප්‍රත්‍යයය නො ලත් ආදිබ්‍රහ්මචර්යක ප්‍රඥව ලබනු පිණිස, ලද්දහු වැඩෙනු පිණිස, මහත් වනු පිණිස, භාවනායෙන් පරිපූර්ණ වනු පිණිස පවතී.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ උතුම් සිහි නුවණින් සමන්විත වූයේ, බොහෝ කලකට පෙර කළ දෑ ද බොහෝ කලකට පෙර කී දෑ ද සිහිකරන්නේ අනුස්මරණය කරන්නේ සිහි ඇත්තේ වෙයි. මේ සත්වැනි හෙතුව, සත්වැනි ප්‍රත්‍යයය නොලත් ආදිබ්‍රහ්මචර්යක ප්‍රඥව ලබනු පිණිස, ලද්දහු වැඩෙනු පිණිස, මහත් වනු පිණිස, භාවනායෙන් පරිපූර්ණ වනු පිණිස පවතී.

පුන ච පරං ආවුසො භික්ඛු පඤ්චසුපාදනක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථංගමො, ඉති වෙදනා ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථංගමො. ඉති සඤ්ඤා. ඉතිසඤ්ඤාය සමුදයො, ඉති සඤ්ඤාය අත්ථංගමො, ඉති සඞ්ඛාරා ඉති සඞ්ඛාරානං සමුදයො, ඉති සඞ්ඛාරානං අත්ථංගමො. ඉති විඤ්ඤාණං ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථංගමො ති අයං අට්ඨමො හෙතු අට්ඨමො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති. ඉමෙ අට්ඨ ධම්මා බහුකාරා.

කතමෙ අට්ඨ ධම්මා භාවෙතබ්බා? අරියො අට්ඨඞ්ගිකො මග්ගො

සෙය්‍යථීදං: සම්මාදිට්ඨි, සම්මාසංකප්පො, සම්මාවාචා, සම්මා කම්මන්තො, සම්මාආජීවො, සම්මාවායාමො, සම්මාසති සම්මාසමාධි. ඉමෙ අට්ඨධම්මා භාවෙතබ්බා.

කතමෙ අට්ඨ ධම්මා පරිඤ්ඤෙය්‍යා? අට්ඨ ලොකධම්මා: ලාභො ච, අලාභො ච, අයසො ච, යසො ච, නින්දා ච, පසංසා ච, සුඛං ච, දුක්ඛං ච. ඉමෙ අට්ඨ ධම්මා පරිඤ්ඤෙය්‍යා.

කතමෙ අට්ඨ ධම්මා පහාතබ්බා? අට්ඨමිච්ඡත්තා: මිච්ඡාදිට්ඨි, මිච්ඡාසංකප්පො, මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්තො, මිච්ඡාආජීවො, මිච්ඡාවායාමො, මිච්ඡාසති, මිච්ඡාසමාධි. ඉමෙ අට්ඨ ධම්මා පහාතබ්බා.

කතමෙ අට්ඨ ධම්මා හානභාගියා? අට්ඨ කුසීතවත්ථූනි: ඉධාවුසො භික්ඛුනා කම්මං කාතබ්බං හොති. තස්ස එවං හොති: කම්මං ඛො මෙ කාතබ්බං භවිස්සති, කම්මං ඛො පන මෙ කරොන්තස්ස කායො කිලමිස්සති, හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති, න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය, අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං පඨමං කුසීතවත්ථු.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ 'රූපය මෙසේ යැ, රූපය හටගන්නා හෙතුව මෙසේ යැ, රූපය නැසී යෑම මෙසේ යැ, වෙදනාව මෙසේ යැ, වෙදනාව හටගන්නා හෙතුව මෙසේ යැ, වෙදනාව නැසී යෑම මෙසේ යැ, සංඥව මෙසේ යැ, සංඥව උපදනා හෙතුව මෙසේ ය, සංඥව නැසී යෑම මෙසේ යැ, සංස්කාරයෝ මෙසේ ය, සංස්කාරයන් උපදනා හෙතුව මෙසේ යැ, සංස්කාරයන් නැසී යෑම මෙසේ යැ, විඥනය මෙසේ යැ, විඥනය උපදනා හෙතු මෙසේ යැ, විඥනය නැසී යෑම මෙසේ යැ යි උපාදනස්කන්ධ පසෙහි ඉපැත්මත් නැස්මත් අනුව බලනසුලු ව වෙසෙයි. මෙ අටවැනි හෙතුව අටවැනි ප්‍රත්‍යයය නොලත් ආදිබ්‍රහ්මචර්යක ප්‍රඥව ලබනු පිණිස, ලද්දහු වැඩෙනු පිණිස, මහත් වනු පිණිස, භාවනායෙන් පරිපූර්ණ වනු පිණිස පවතී. මේ බහුපකාර ධර්ම අට යැ.

**භාවයිතව්‍ය** ධර්ම අට කවර යැ? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය යැ. එය මෙසේ යැ: සම්‍යග් දෘෂ්ටිය, සම්‍යක් සඞ්කල්පය, සම්‍යග් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධිය යන අට යැ. මෙ භාවයිතව්‍ය ධර්ම අට යැ.

**පරිඥෙය** ධර්ම අට කවර යැ? ලාභය ද අලාභය ද අයශස ද යශස ද නින්‍දව ද ප්‍රශංසාව ද සුව ද දුක ද යන අටලෝදහම් යැ. මෙ පරිඥෙය (පිරිසිඳැ දත යුතු) ධර්ම අට යැ.

**ප්‍රහාතව්‍ය** ධර්ම අට කවර යැ? මිථ්‍යාදෘෂ්ටිය, මිථ්‍යාසඞ්කල්පය, මිථ්‍යාවචනය, මිථ්‍යාකර්මාන්තය, මිථ්‍යාආජීවය, මිථ්‍යාව්‍යායාමය, මිථ්‍යා-ස්මෘතිය, මිථ්‍යාසමාධිය යන මිථ්‍යාත්ව අට යැ. මෙ ප්‍රහාතව්‍ය ධර්ම අට යැ.

**හානභාගික** ධර්ම අට කවර යැ? කුසීදවස්තු අට යැ: ඇවැත්නි, මෙහි මහණක්හු විසින් (කුදුමහත්) කටයුත්තක් කළ යුතු වෙයි. 'මා විසින් කටයුත්තක් කළ යුතු වන්නේ ය. ඒ කටයුත්ත කරන මගේ කය වෙහෙසෙන්නේ ය. එ බැවින් දන් මම සැතපෙමි'යි ඔහුට මෙසේ සිත් වෙයි. හේ වැදහෙයි. නොපැමිණි (ධ්‍යානාදියකට) පැමිණීමට, නොලත් ධ්‍යානාදියක් ලබනුවට, සාක්ෂාත් නො කළ (ධර්මයක්) සාක්ෂාත් කරනුවට වීර්ය නො කෙරෙයි. මෙ පළමු වන කුසීදවස්තුව යැ.

පුන ච පරං ආවුසො භික්ඛුනා කම්මං කතං හොති. තස්ස එවං හොති: අහං ඛො කම්මං අකාසිං, කම්මං ඛො පන මෙ කරොන්තස්ස කායො කිලන්තො, හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති, න විරියං ආරභති -පෙ- ඉදං දුතියං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා මග්ගො ගන්තබ්බො හොති, තස්ස එවං හොති: මග්ගො ඛො මෙ ගන්තබ්බො භවිස්සති, මග්ගං ඛො පන මෙ ගච්ඡන්තස්ස කායො කිලමිස්සති, හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති, න විරියං ආරභති, -පෙ- ඉදං තතියං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා මග්ගො ගතො හොති. තස්ස එවං හොති: අහං ඛො මග්ගං අගමාසිං, මග්ගං ඛො පන මෙ ගච්ඡන්තස්ස කායො කිලන්තො, හන්දාහං නිපජ්ජාමීති සො නිපජ්ජති, න විරියං ආරභති -පෙ- ඉදං චතුත්ථං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: "අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො නාලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, තස්ස මෙ කායො කිලන්තො අකම්මඤ්ඤො, හන්දාහං නිපජ්ජාමී"ති. -පෙ- ඉදං පඤ්චමං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො අලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං· තස්ස ,මෙ කායො ගරුකො අකම්මඤ්ඤො මාසාචිතං මඤ්ඤෙ. හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති -පෙ- ඉදං ඡට්ඨං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනො උප්පන්නො හොති අප්පමත්තකො ආබාධො, තස්ස එවං හොති: උප්පන්නො ඛො මෙ අයං අප්පමත්තකො ආබාධො, අත්ථි කප්පො නිපජ්ජිතුං, හන්දාහං නිපජ්ජාමී'ති සො නිපජ්ජති -පෙ- ඉදං සත්තමං කුසීතවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛු ගිලානා වුට්ඨිතො හොති, අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා, තස්ස එවං හොති: 'අහං ඛො ගිලානා වුට්ඨිතො, අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා, තස්ස මෙ කායො දුබ්බලො අකම්මඤ්ඤො, අත්ථි කප්පො පනිජ්ජිතුං, හන්දාහං නිපජ්ජාමීති සො නිපජ්ජති, -පෙ- ඉදං අට්ඨමං කුසීතවත්ථු. ඉමෙ අට්ඨ ධම්මා හානභාගියා.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණක්හු විසින් (කුදු මහත්) කටයුත්තෙක් කරන ලදුයේ වෙයි. 'මම වනාහි කටයුත්තක් කෙළෙමි, කර්මය (ඒ කටයුත්ත) කරන මගේ කය වෙහෙසුණේ ය. එබැවින් මම වැදහෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැදහෙයි, ... වීර්ය නො කෙරෙයි. මේ දෙවෙනි කුසීද වස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණක්හු විසින් මඟ යෑ යුතු වෙයි. 'මා විසින් මඟ යෑ යුතු වන්නේ ය, මඟ යන මගේ කය වෙහෙසෙන්නේ ය, එබැවින් දූත් වැදූහෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැදහෙයි. ... වීර්ය නො කෙරෙයි. මේ තෙවෙනි කුසීද වස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණක්හු විසින් මඟ යන ලදුයේ වෙයි. 'මම මඟ ගියෙමි මඟ යන මගේ කය වෙහෙසිණ. එබැවින් දූත් වැදහෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැදූහෙයි. ... වීර්ය නො කෙරෙයි. මේ සතර වැනි කුසීද වස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙම ගමැ හෝ නියම්ගමැ පිඩු පිණිස හැසිරෙනුයේ කැමැති තාක් රූක්ෂ හෝ ප්‍රණීත බොජුනක් කුස පුරා නො ලබයි. 'මම ගමැ, හෝ නියම්ගමැ පිඩු පිණිස හැසිරෙනුයෙම් කුස පුරා රූක්ෂ හෝ ප්‍රණීත බොජුනක් නො ලදිමි. ඒ මගේ කය ක්ලාන්ත යැ, අකර්මණ්‍ය යැ. එබැවින් මම දූත් වැදූහෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි ... මේ පස් වන කුසීද වස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙම ගමැ හෝ නියම්ගමැ පිඩු පිණිස හැසිරෙනුයේ, කැමැති තාක් රූක්ෂ හෝ ප්‍රණීත වූ කුසපුරා අහරක් ලබයි. 'මම ගමැ හෝ නියම්ගමැ පිඩු පිණිස හැසිරෙනුයෙම්, රූක්ෂ හෝ ප්‍රණීත අහරක් කැමැති තාක් කුස පුරා ලදිමි. ඒ මගේ කය බර යැ, අකර්මණ්‍ය යැ, දියෙන් පෙඟුණු මෑ බඳු යැ. එබැවින් දූත් මම වැදහෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි ... හේ වැදහෙයි. මේ සවන කුසීද වස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණකුට ස්වල්පමාත්‍ර ආබාධයෙක් උපන්නේ වෙයි. 'මට මේ අල්පමාත්‍ර ආබාධයෙක් උපන්නේ වෙයි. වැදහෝනට සුදුසු බව ඇත. එබැවින් මම වැදහෙමි'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ වැද හෙයි... මේ සත් වැනි කුසීදවස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණ තෙමේ ගිලන් බැවින් නැඟී සිටියේ, ගිලන් බැවින් නැඟීසිටි නොබෝ කල් ඇත්තේ වෙයි. ඔහුට 'මම වනාහි ගිලන්බැවින් නැඟීසිටියෙම්, ගිලන්බැවින් නැගිසිටි නොබෝ කල් ඇතියෙම් වෙමි. ඒ මගේ කය දුබල ය, අකර්මණ්‍යය, වැද හෝනට සුදුසු බව ඇත. එබැවින් මම වැද හෙමි'යි මෙසේ සිතෙක් වෙයි. හේ වැද හෙයි... මේ අටවන කුසීද වස්තුව යැ. මේ හානභාගික ධර්ම අට යැ.

කතමෙ අට්ඨ ධම්මා විසෙසභාගියා? අට්ඨ ආරම්භවත්ථූනි: ඉධාවුසො භික්ඛුනා කම්මං කාතබ්බං හොති තස්ස එවං හොති: ‘කම්මං ඛො මෙ කාතබ්බං භවිස්සති, කම්මං ඛො පන මෙ කරොන්තෙන න සුකරං බුද්ධානං සාසනං මනසි කාතුං, හන්දාහං වීරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා’ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං පඨමං ආරම්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා කම්මං කතං හොති, තස්ස එවං හොති: ‘අහං ඛො කම්මං අකාසිං, කම්මං ඛො පනාහං කරොන්තො නාසක්ඛිං බුද්ධානං සාසනං මනසිකාතුං, හන්දාහං විරියං ආරභාමි. –පෙ– ඉදං දුතියං ආරම්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා මග්ගො ගන්තබ්බො හොති. තස්ස එවං හොති: ‘මග්ගො ඛො මෙ ගන්තබ්බො භවිස්සති, මග්ගං ඛො පන මෙ ගච්ඡන්තෙන න සුකරං බුද්ධානං සාසනං මනසිකාතුං, හන්දාහං විරියං ආරභාමි –පෙ– ඉදං තතියං ආරම්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනා මග්ගො ගතො හොති. තස්ස එවං හොති; ‘අහං ඛො මග්ගං අගමාසිං, මග්ගං ඛො පනාහං ගච්ඡන්තො නාසක්ඛිං බුද්ධානං සාසනං මනසිකාතුං හන්දාහං විරියං ආරභාමි’ -පෙ- ඉදං චතුත්ථං ආරම්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: ‘අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො නාලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, තස්ස මෙ කායො ලහුකො කම්මඤ්ඤො හන්දාහං විරියං ආරභාමි’ –පෙ– ඉදං පඤ්චමං ආරම්භවත්ථු.

විශෙෂභාගික ධර්ම අට කවර යෑ? ආරම්භ වස්තු (වීර්‍යයට කරුණු) අට යෑ. ඇවැත්නි, මහණක්හු විසින් කටයුත්තෙක් කළ යුතු වෙයි. "මා විසින් වූ කලි කටයුත්තෙක් කළ යුතු වන්නේ ය. කටයුත්තක් කරන මා විසින් බුදුරජුන්ගේ සසුන මෙනෙහි කරන්නට නො හැක්ක. එ හෙයින් මම් නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙනුවට, නොලත් ධ්‍යානාදිය ලබනුවට, පසක් නොකළ ධ්‍යානාදිය පසක් කරනුවට වැර වඩම්'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙනුවට, නොලත් ධ්‍යානාදිය ලබනුවට, පසක් නොකළ ධ්‍යානාදිය පසක් කරනුවට වැර වඩයි. මේ පළමුවන ආරම්භවස්තුව යෑ.

තව ද අනෙකෙක, ඇවැත්නි, මහණක්හු විසින් කටයුත්තෙක් කරන ලද්දේ වෙයි.'මම වූ කලි කටයුත්තක් කෙළෙම්. මම කටයුත්ත කරනුයෙම්, බුදුරජුන් ගේ සස්න මෙනෙහි කරන්නට නො හැකි වීමි. එහෙයින් මම නොපැමිණි ධ්‍යානාදියට පැමිණීමට, නොලත් ධ්‍යානාදිය ලැබීමට, පසක් නොකළ ධ්‍යානාදිය පසක් කිරීමට වැර වඩම්'යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. හේ නොපැමිණි ධ්‍යානාදියට පැමිණීමට, නොලත් ධ්‍යානාදිය ලැබීමට, පසක් නොකළ ධ්‍යානාදිය පසක් කිරීමට වැර වඩයි. මේ දෙවෙනි ආරම්භවස්තුව යෑ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණක්හු විසින් මඟෙක් යෑ යුතු වෙයි. ඔහුට මෙසේ සිතක් වෙයි: මා විසින් මඟෙක් යෑ යුතු වෙයි. මඟ යන මා විසින් බුදුරජුන් ගේ සස්න මෙනෙහි කරන්නට පහසු නො වේ. එබැවින් මම ...වැර වඩමි... මේ තෙවෙනි ආරම්භවස්තුව යෑ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණක්හු විසින් මඟෙක් යන ලදුයේ වෙයි. ඔහුට මෙසේ සිතක් වෙයි: 'මම වූ කලි මඟක් ගියෙමි. මඟ යන මම් බුදුරජුන්ගේ සස්න මෙනෙහි කරන්නට නො හැකි වීමි. එහෙයින් මම වැර වඩමි. මේ සතර වන ආරම්භවස්තුව යෑ.

තව ද අනෙකෙක, ඇවැත්නි, මහණෙක් ගමෙක හෝ නියම් ගමෙක හෝ පිඩු පිණිස සරනුයේ, රූක්ෂවූ හෝ ප්‍රණීත වූ හෝ බොජුන් සෑහෙන පමණ, කුස පිරෙන පමණ නො ලබයි. ඔහුට මෙසේ සිතක් වෙයි. 'මම් වූ කලි ගමැ හෝ නියම්ගමැ පිඩු පිණිස සරනුයෙම්, රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ බොජුන් සෑහෙන පමණ, කුස පිරෙන පමණ නො ලදිමි. ඒ මගේ කය හැල්ලු යෑ. කර්මණ්‍ය යෑ. එබැවින් මම වැර වඩම් යි වැර වඩයි. මේ පස් වන ආරම්භවස්තුව යෑ.

පුන ච පරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති 'අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො අලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, තස්ස මෙ කායො බලවා කම්මඤ්ඤො, හන්දාහං විරියං ආරභාමි' -පෙ- ඉදං ඡට්ඨං ආරම්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛුනො උප්පන්නො හොති අප්පමත්තකො ආබාධො. තස්ස එවං හොති 'උප්පන්නො ඛො මෙ අයං අප්පමත්තකො ආබාධො, ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ ආබාධො පවඩ්ඪෙය්‍ය, හන්දාහං විරියං ආරභාමි' -පෙ- ඉදං සත්තමං ආරම්භවත්ථු.

පුන ච පරං ආවුසො භික්ඛු ගිලානා වුට්ඨිතො හොති අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා, තස්ස එවං හොති 'අහං ඛො ගිලානා වුට්ඨිතො අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා, ඨානං ඛො පනෙතං විජ්ජති, යං මෙ ආබාධො පච්චුදාවත්තෙය්‍ය, හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායාති. ඉදං අට්ඨමං ආරම්භවත්ථු.

ඉමෙ අට්ඨ ධම්මා විසෙසභාගියා.

කතමෙ අට්ඨ ධම්මා දුප්පටිවිජ්ඣා? අට්ඨ අක්ඛණා අසමයා බ්‍රහ්මචරියවාසාය. ඉධාවුසො තථාගතො ච ලොකෙ උප්පන්නො හොති අරහං සම්මාසම්බුද්ධො, ධම්මො ච දෙසියති ඔපසමිකො පරිනිබ්බානිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො. අයඤ්ච පුග්ගලො නිරයං උපපන්නො හොති, අයං පඨමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

පුන ච පරං ආවුසො තථාගතො ච ලොකෙ උප්පන්නො හොති අරහං සම්මාසම්බුද්ධො, ධම්මො ච දෙසියති ඔපසමිකො පරිනිබ්බානිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො, අයඤ්ච පුග්ගලො තිරච්ඡානයොනිං උපපන්නො හොති. අයං දුතියො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණෙක් ගමෙක හෝ නියම් ගමෙක හෝ පිඩු පිණිස සරනුයේ, රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ බොජුන් සෑහෙන පමණ, කුස පිරෙන පමණ ලබයි. ඔහුට 'මම වූ කලි ගමැ හෝ නියම් ගමැ හෝ පිඩු පිණිස සරනුයෙම්, රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ බොජුන් සෑහෙන පමණ, කුස පිරෙන පමණ ලදිමි. ඒ මගේ සිරුර ශක්තිමත් යැ, කර්මණ්‍ය යැ. එබැවින් මම වැර වඩමි'යි ... වැර වඩයි. මේ සවන ආරම්භවස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණකුහට අල්පමාත්‍ර ආබාධයෙක් උපන්නේ වෙයි. ඔහුට 'මට මේ අල්පමාත්‍ර ආබාධයෙක් උපන්නේ ම වෙයි. මගේ ආබාධය වැඩෙන්නේ ය යන යමෙක් ඇද්ද, මෙ කරුණ විද්‍යමාන යැ. එබැවින් මම වැර වඩමි'යි ... වැර වඩයි. මේ සත්වන ආරම්භක වස්තුව යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, මහණෙක් ගිලන් බැවින් නැඟී සිටියේ, ගිලන් බැවින් නැඟී සිටි නොබෝ කල් ඇත්තේ වෙයි. ඔහුට 'මම වූ කලි ගිලන් බැවින් නැඟී සිටියෙමි, ගිලන් බැවින් නැඟී සිටි නොබෝකල් ඇත්තෙම් වෙමි. මගේ මේ ආබාධය වටාලා නැඟී එන්නේ ය යන යමෙක් ඇද්ද, මෙ කරුණ විද්‍යමාන යැ. එබැවින් මම නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙන්නට, නොලත් ධ්‍යානාදිය ලබන්නට, පසක් නොකළ ධ්‍යානාදිය පසක් කරන්නට වැර වඩමි'යි මෙසේ සිතෙක් වෙයි. හේ නොපැමිණි ධ්‍යානාදියට පැමිණෙන්නට, නොලත් ධ්‍යානාදිය ලබන්-නට, පසක් නොකළ ධ්‍යානාදිය පසක් කරන්නට වැර වඩයි. මේ අටවන ආරම්භවස්තුව යැ.

මොහු විශෙෂභාගික ධර්ම අට යැ.

දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම අට කවර යැ? බ්‍රහ්මචර්‍ය්‍යාවාසයට (මාර්ගබ්‍රහ්ම-චර්‍ය්‍යාව වැඩීමට) නොහැකි කාල වූ අක්ෂණ අටෙක: ඇවැත්නි, මෙහි අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ලොවැ උපන්සේක් වෙති, කෙලෙස් සංසිඳුවන, කෙලෙස් පිරිනිවන ගෙන දෙන, මාර්ගඥාන-ප්‍රතිවෙධයට යන, සුගතයන් වහන්සේ විසින් ප්‍රකාශිත ධර්මය ද දෙසනු ලැබෙයි. එහෙත් මේ පුද්ගල තෙම නිරයට පැමිණියේ වෙයි. මෙ බ්‍රහ්මචර්‍ය්‍යාවාසයට අසමය වූ පළමු වන අක්ෂණය යැ.

තව ද අනෙකෙක. ඇවැත්නි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ තථාගත-යන් වහන්සේ ලොවැ උපන්සේක් වෙති. කෙලෙස් සංසිඳුවන, කෙලෙස් පිරිනිවන ගෙන දෙන, මාර්ගඥාන ප්‍රතිවෙධයට යන, සුගතයන් වහන්සේ විසින් ප්‍රකාශිත ධර්මය ද දෙසනු ලැබෙයි. එහෙත් මේ පුද්ගල තෙමේ තිරශ්චීනයොනියට (උත්පත්ති වශයෙන්) පැමිණියේ වෙයි. මේ බ්‍රහ්මචර්‍ය්‍යාවාසයට අසමය වූ දෙවෙනි අක්ෂණය යැ.

පුන ච පරං ආවුසො -පෙ- පෙත්තිවිසයං උපපන්නො හොති අයං තතියො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

පුන ච පරං ආවුසො -පෙ- දීඝායුකං දෙවනිකායං උපපන්නො හොති. අයං චතුත්ථො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

පුන ච පරං ආවුසො -පෙ- පච්චන්තිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති මිලක්ඛෙසු අවිඤ්ඤාතාරෙසු යත්ථ නත්ථි ගති භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං. අයං පඤ්චමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

පුන ච පරං ආවුසො -පෙ- අයඤ්ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති. සො ච හොති මිච්ඡාදිට්ඨිකො විපරීතදස්සනො 'නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති'ති. අයං ඡට්ඨො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

පුන ච පරං ආවුසො -පෙ- අයඤ්ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති, සො ච හොති දුප්පඤ්ඤො ජළො එළමූගො න පටිබලො සුභාසිතදුබ්භාසිතානං අත්ථමඤ්ඤාතුං. අයං සත්තමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

පුන ච පරං ආවුසො ධම්මො ච න දෙසියති -පෙ- අයඤ්ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති, සො ච හොති පඤ්ඤවා අජළො අනෙළමූගො පටිබලො සුභාසිතදුබ්භාසිතානං අත්ථමඤ්ඤාතුං. අයං අට්ඨමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය. අයං අට්ඨමො අක්ඛමො අසමයො බ්‍රහ්මචරියවාසාය

ඉමෙ අට්ඨධම්මා දුප්පටිවිජ්ඣා.

කතමෙ අට්ඨ ධම්මා උප්පාදෙතබ්බා? අට්ඨමහාපුරිසවිතක්කා: අප්පිච්ඡස්සායං ධම්මො නායං ධම්මො මහිච්ඡස්ස.

තව ද අනෙකෙක. ඇවැත්නි ...... ප්‍රෙතලොකයට (උත්පත්ති වශයෙන්) පැමිණියේ වෙයි. මේ බ්‍රහ්මචර්‍ය්‍යාවාසයට අසමය වූ තෙවෙනි අක්ෂණ යෑ.

තව ද අනෙකෙක. ඇවැත්නි, ... දීර්ඝායුෂ්ක දේව නිකායයකට (උත්පත්ති වශයෙන්) පැමිණියේ වෙයි. මේ බ්‍රහ්මචර්යාවාසයට අසමය වූ සතර වන අක්ෂණය යෑ.

තව ද අනෙකෙක. ඇවැත්නි, ... මහණුන් ගේ මෙහෙණුන් ගේ උවසුවන් ගේ උවැසියන් ගේ හැසිරීමක් නැති, පව් පින් නොදන්නා ජනයා ඇති, ප්‍රත්‍යන්ත ම්ලෙච්ඡ ජනපද අතුරෙන් එකෙක උපන්නේ වෙයි. මේ බ්‍රහ්මචර්‍ය්‍යාවාසයට අසමය වූ පස්වන අක්ෂණය යෑ.

තව ද අනෙකෙක. ඇවැත්නි, ... මේ පුහුල් තෙමේ ද මධ්‍යම ජනපද අතුරෙන් එකෙක උපන්නේ වෙයි. හේ ද 'දුන් දූයෙහි පල නැත, යාගයෙහි මහදන්හි පල නැත. පූජායෙහි පල නැත. කුසලාකුසල කර්මයන් ගේ ඵල විපාක නැත, මෙ ලොව නැත, පරලොව නැත, මවට කළ සත්කාරයෙහි පල නැත, පියාට කළ සත්කාරයෙහි පල නැත, උපපාදුක (කම් වූ පරිදි මැරී උපදනා) සත්වයෝ නැත, මෙලොව ද පර ලොව ද වෙසෙසින් දැන, පසක් කොට පවසන, නොවැරැදි මඟින් ගිය, නොවැරැදි මඟ පිළිපන් මහණ බමුණු කෙනෙක් ලොවැ නැතැ'යි පෙරළුණු දෘෂ්ටි ඇති, මිසදිටුවෙක් වෙයි. මේ බ්‍රහ්මචර්යාවාසයට අසමය වූ සවන අක්ෂණය යෑ.

තව ද අනෙකෙක. ඇවැත්නි, ... මේ පුහුල් තෙමේ ද මැදුම් දනව්-වෙක උපන්නේ වෙයි. හේ ද නුවණ නැති, ජඩ වූ කෙළතොලු වූ, මොනොවට කී ද නපුරු කොට කී ද වචනයන්ගේ අර්ථ දැනගන්නට ප්‍රතිබල නො වෙයි. මේ බ්‍රහ්මචර්‍ය්‍යාවාසයට අසමය වූ සත්වන අක්ෂණය යෑ.

තව ද අනෙකෙක. ඇවැත්නි ... ධර්මය ද නො දෙසනු ලැබෙයි. මේ පුහුල් තෙමේ ද මැදුම් දනවුහි උපන්නේ වෙයි. හෙ තෙමෙ නුවණ ඇත්තේ, ජඩ නොවූයේ, කෙළතොලු නොවූයේ, මොනොවට කී ද නපුරු කොට කී ද වචනයන් ගේ අර්ථ දැනගන්නට සමර්ථ වෙයි. මේ බ්‍රහ්මචර්‍ය්‍යා-වාසයට අසමය වූ අට වන අක්ෂණය යෑ.

මේ දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම අට යෑ.

උත්පාදයිතව්‍ය ධර්ම අට කවර යෑ? මහාපුරුෂ විතර්ක අට යෑ මේ ධර්මය අල්පෙච්ඡයාට යෑ, මේ ධර්මය මහෙච්ඡයාට නො වේ.

සන්තුට්ඨස්සායං ධම්මො නායං ධම්මො අසන්තුට්ඨස්ස.

පවිවිත්තස්සායං ධම්මො නායං ධම්මො සඞ්ගණිකාරාමස්ස.

ආරද්ධවිරියස්සායං ධම්මො නායං ධම්මො කුසීතස්ස.

උපට්ඨිතසතිස්සායං ධම්මො නායං ධම්මො මුට්ඨස්සතිස්ස.

සමාහිතස්සායං ධම්මො නායං ධම්මො අසමාහිතස්ස.

පඤ්ඤවතො අයං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස.

නිප්පපඤ්චස්සායං ධම්මො නායං ධම්මො පපඤ්චාරාමස්ස, නිප්පපඤ්චරතිනො අයං ධම්මො නායං ධම්මො පපඤ්චරතිනො'ති.

ඉමෙ අට්ඨ ධම්මා උප්පාදෙතබ්බා

කතමෙ අට්ඨ ධම්මා අභිඤ්ඤෙය්‍යා? අට්ඨ අභිභායතනානි: අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං පඨමං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං දුතියං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං තතියං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං චතුත්ථං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි සෙය්‍යථාපි නාම උමාපුප්ඵං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං, සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං, එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං පඤ්චමං අභිභායතනං.

මේ ධර්මය සන්තුෂ්ටයාට (ලද දෑයින් සතුටු වන්නාට) යෑ, මේ ධර්මය අසන්තුෂ්ටයාට නො වේ.

මේ ධර්මය ප්‍රවිවික්තයාට යෑ, මේ ධර්මය ගණසඞ්ගණිකාහි කෙලශසඞ්ගණිකාහි ඇලුණහුට නො වේ.

මේ ධර්මය කළ වීර්‍ය්‍යාරම්භ ඇත්තාහට ය, මෙ ධර්මය කුසීදයාට නො වේ.

මේ ධර්මය එළැඹැ සිටි සිහි ඇත්තාහට ය, මේ ධර්මය නටුවා වූ සිහි ඇත්තහුට නො වේ.

මේ ධර්මය එකඟ සිතැත්තාහට යෑ, මේ ධර්මය නොඑකඟ සිතැත්තහුට නො වේ.

මේ ධර්මය කර්මස්වකතා ප්‍රඥාව ඇත්තාට ය, මේ ධර්මය කර්මස්වකතා ප්‍රඥාව නැත්තහුට නො වේ.

මේ ධර්මය මානාදි ප්‍රපඤ්ච නැත්තහුට ය, මේ ධර්මය ප්‍රපඤ්චයන් ආරාම කොට ඇත්තාහට නො වේ.

මේ ධර්මය ප්‍රපඤ්චයන්හි ඇලුම් නැත්තාහට ය, මේ ධර්මය ප්‍රපඤ්චයන්හි ඇලුම් ඇතියාහට නො වේ.

මේ උත්පාදයිතව්‍ය ධර්ම අට යෑ.

අභිඥෙය ධර්ම අට කවර යෑ? අභිභායතන අට යෑ: එකෙක් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්ම වශයෙන් රූපසංඥා ඇත්තේ, පිටත්හි සුවර්ණ හෝ දුර්වර්ණ හෝ පරිත්‍රාලම්බන වූ ප්‍රතිභාග නිමිති දකී. ඒ නිමිති මැඩ, 'දනිමි' යි 'දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ පළමු වන අභිභායතනය යෑ.

එකෙක් අධ්‍යාත්මයෙහි රූපසංඥා ඇත්තේ, පිටත්හි අප්‍රමාණ වූ සුවර්ණ හෝ දුර්වර්ණ නිමිත්ත රූපයන් දකී. ඒ රූප මැඩ, 'දනිමි'යි 'දකිමි'යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ දෙවෙනි අභිභායතනය යෑ.

එකෙක් අධ්‍යාත්ම අරමුණෙහි පරිකර්ම සංඥා නැත්තේ, පිටත්හි වූ සුවර්ණ හෝ දුවර්ණ වූ පරිත්‍රාලම්බන වූ පරිකර්ම නිමිති ද ප්‍රතිභාග නිමිති ද දකී. ඒ අරමුණ මැඩ, 'දනිමි'යි 'දකිමි'යි මෙබඳු සංඥා ඇත්තේ වෙයි. මේ තෙවෙනි අභිභායතනය යෑ.

එකෙක් අධ්‍යාත්ම අරමුණෙහි රූපසංඥා නැත්තේ, පිටත්හි වූ අප්‍රමාණ සුවර්ණ දුර්වර්ණ රූපයන් දකී. ඒ රූප අබිබවා 'දනිමි'යි 'දකිමි'යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සතරවන අභිභායතනය යෑ.

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්ම සංඥා නැත්තේ, නිල් වූ, නිල් වන් වූ, නිල් දැකුම් ඇති, නිල් පැහැති, බාහිරයෙහි වූ රූප දකී. නිල් වූ නිල්වන් වූ, නිල් දැකුම් ඇති, නිල් පැහැති දියමෙරලිය මලෙක් යම්සේ වේ ද, නිල් වූ, නිල්වන් වූ, නිල්දැකුම් ඇති, නිල්පැහැති දෙ පිට ම මට සිලිටි වූ කසීවතෙක් යම්සේ වේ ද, එසේ ම නිල් වූ, නිල්වන් වූ, නිල් දැකුම ඇති, නිල්පැහැති, බාහිර කසිණාලම්බන රූපයන් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්මසංඥා නැත්තේ දකී. ඒ රූප අබිබවා, 'දනිමි' යි 'දකිමි'යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ පස් වන අභිභායතනය යෑ.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි .සෙය්‍යථාපි නාම කණිකාරපුප්ඵං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං, සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතො භාගවිමට්ඨං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති. පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං ඡට්ඨං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි - සෙය්‍යථාපි නාම බන්ධුජීවකපුප්ඵං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිකකනිදස්සනං ලොහිතකනිභාසං, එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං සත්තමං අභිභායතනං,

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි.–සෙය්‍යථාපි නාම ඔසධී තාරකා ඔදාතා ඔදාතවණ්ණා ඔදාතනිදස්සනා ඔදාතනිභාසා, සෙය්‍යථා වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං ඔදාතං ඔදාතවණ්ණං ඔදාතනිදස්සනං ඔදාතනිභාසං එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූප නි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං අට්ඨමං අභිභායතනං.

ඉමෙ අට්ඨ ධම්මා අභිඤ්ඤෙය්‍යා.

කතමෙ අට්ඨ ධම්මා සච්ඡිකාතබ්බා? අට්ඨ විමොක්ඛා: රූපී රූපානි පස්සති. අයං පඨමො විමොක්ඛො.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති, අයං දුතියො විමොක්ඛො.

සුභන්තෙව අධිමුත්තො හොති අයං තතියො විමොක්ඛො.

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්ම සංඥ නැත්තේ, රත්වන් වූ, රත්වන් දකුම් ඇති, රත්පැහැති බාහිර වූ පීතවර්ණ රූප දකී. රත්වන් වූ රත්වන් දකුම් ඇති, රන් පැහැති, බාහිරවූ පීතවර්‍ණ වූ කිණිහිරි මලෙක් යම්බඳු වේ ද, දෙ පිට මට සිලිටි වූ, රත්වන් වූ, රත්වන් දකුම් ඇති, රන් පැහැති, පීතවර්‍ණ කසීවතෙක් හෝ යම්බඳු වේ ද, එසේ ම අධ්‍යාත්මයෙහි රූපසංඥා නැති එකෙක් රත්වන් වූ, රත්වන් දකුම ඇති, රන් පැහැති, බාහිර පීතකසිණ රූපයන් දකී. ඔවුන් මැඩ, ‘දනිමි’යි. ‘දකිමි’යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සවන අභිභායතනය යෑ.

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි රූපසංඥ නැත්තේ, රතු වූ, රත්වන් වූ, රත්වන් දකුම් ඇති, රත්පැහැති බාහිර රූපයන් දකී. රතු වූ, රත්වන් වූ, රත්වන් දකුම් ඇති රත් පැහැ වූ බඳුවද මලෙක් යම්සේ වේ ද, දෙපසැ මට සිලිටි වූ, රතු වූ, රත්වන් වූ, රත්වන් දකුම් ඇති, රත්පැහැ වූ බාහිර රූපයන්, අධ්‍යාත්ම රූපයෙහි රූපසංඥ නැති එකෙක් දකී. ඔවුන් මැඩ, ‘දනිමි’යි, ‘දකිමි’යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සත්වන අභිභායතනය යෑ.

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි රූපසංඥ නැත්තේ, සුදු වූ, සුදුවන් වූ, සුදුවන් දකුම් ඇති, සුදු පැහැති බාහිර රූපාලම්බනයන් දකී. සුදු වූ, සුදු-වන් දකුම් ඇති , සුදුප හැති, ඔෂධී තාරකාව යම්සේ වේ ද, එසේ ම සුදු වූ සුදුවන් වූ, සුදුවන් දකුම් ඇති, සුදුපැහැති කසී වතෙක් යම්සේ වේ ද, එසේ ම එකෙක් අධ්‍යාත්මයෙහි රූපසංඥ නැත්තේ සුදු වූ, සුදුවන් වූ, සුදු දකුම් ඇති, සුදු පැහැ වූ, බාහිර කසිණ රූපයන් දකී. ඔවුන් මැඩ, ‘දනිමි’යි, ‘දකිමි’යි මෙසේ සංඥ ඇත්තේ වෙයි. මේ අටවන අභිභායතනය යෑ.

මේ අභිඥෙය ධර්ම අට යෑ.

සාක්ෂාත් කර්‍තව්‍ය ධර්‍ම අට කවර යෑ? විමොක්ෂ අට යෑ: රූපධ්‍යාන ඇත්තේ, නීලකසිණරූපාදි රූපයන් ධ්‍යාන ඇසින් දකී. මේ පළමුවන විමොක්ෂය යෑ.

අධ්‍යාත්ම රූපයෙහි රූපසංඥ නැත්තේ බාහිර රූප දකී. මේ දෙවෙනි විමොක්ෂය යෑ.

දහන් ඇසින් පිරිසිදු කසිණ අරමුණු දක්නේ, ‘ශුභ යෑ’යි ම එහි ඇලුණේ වෙයි. මේ තෙවෙනි විමොක්ෂය යෑ.

සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථො විමොක්ඛො.

සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං පඤ්චමො විමොක්ඛො.

සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ඡට්ඨො විමොක්ඛො.

සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමො විමොක්ඛො.

සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමො විමොක්ඛො.

ඉමෙ අට්ඨ ධම්මා සච්ඡිකාතබ්බා'

ඉති ඉමෙ අසීති ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා.

## නව ධම්මා

10. නව ධම්මා බහුකාරා, නව ධම්මා භාවෙතබ්බා. නව ධම්මා පරිඤ්ඤෙය්‍යා. නව ධම්මා පහාතබ්බා. නව ධම්මා හානභාගියා. නව ධම්මා විසෙසභාගියා නව ධම්මා දුප්පටිවිජ්ඣා. නව ධම්මා උප්පාදෙතබ්බා. නව ධම්මා අභිඤ්ඤෙය්‍යා. නව ධම්මා සච්ඡිකාතබ්බා.

කතමෙ නව ධම්මා බහුකාරා? නව යොනිසොමනසිකාරමූලකා ධම්මා: යොනිසො මනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙ චිත්තෙ යථාභූතං ජානාති. යථාභූතං ජානං පස්සං නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. ඉමෙ නව ධම්මා බහුකාරා.

සර්ව ප්‍රකාරයෙන් රූපසංඥා ඉක්මීමෙන්, ප්‍රතිඝසංඥා පහ වැ යෑමෙන්, නානාත්වසංඥාවන් මෙනෙහි නොකිරීමෙන්, ‘අහස අනන්තයැ’යි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙයි. මේ සතර වන විමොක්ෂය යැ.

සර්ව ප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මැ, ‘විඥානය අනන්ත යැ’යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසෙයි. මේ පස්වන විමොක්ෂය යැ,

සර්ව ප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ, ‘කිසිත් නැතැ’යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. මේ සවන විමොක්ෂය යැ.

සර්ව ප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසෙයි, මේ සත්වන විමොක්ෂය යැ.

සර්ව ප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මැ සඤ්ඤාවෙදයිත නිරොධයට (නිරොධසමාපත්තියට) පැමිණ වෙසෙයි. මේ අටවන විමොක්ෂය යැ.

මේ සාක්ෂාත්කර්තව්‍ය ධර්ම අට යැ.

මෙසේ මේ භූත වූ තථ්‍ය වූ තථ වූ අවිතථ වූ අනන්‍යථ වූ අසූවෙක් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මනා කොට විශිෂ්ට නුවණින් දැනගන්නා ලදහ.

## නවකය

10. බහූපකාර ධර්ම නවයෙක, භාවයිතව්‍ය ධර්ම නවයෙක, පරිඥෙය ධර්ම නවයෙක, ප්‍රහාතව්‍ය ධර්ම නවයෙක, හානභාගික ධර්ම නවයෙක, විශෙෂභාගික ධර්ම නවයෙක, දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම නවයෙක. උත්පාදයිතව්‍ය ධර්ම නවයෙක, අභිඥෙය ධර්ම නවයෙක, සාක්ෂාත්කර්තව්‍ය ධර්ම නවයෙක.

බහූපකාර ධර්ම නවය කවර යැ? යොනිසොමනස්කාරය මුල් කොටැති ධර්ම නවය යැ; නිවැරැදි මඟින් (ධර්මයන්) මෙනෙහි කරන්නහුට ප්‍රමෝදය (සතුට) උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. සිතැ ප්‍රීතිය ඇත්තහුගේ නාම කය සංසිඳේ. සංසුන් නාම කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහුගේ සිත සමාධි ගත වේ (අරමුණෙහි එකඟ වේ.) සිත එකඟවූ කල්හි තතු වූ පරිදි දනී. තතු වූ පරිදි දන්නේ දක්නේ (සංස්කාරයන්හි) කලකිරෙයි. කලකිරෙන්නේ (සංස්කාරයන්හි) නො ඇලෙයි. නො ඇලීම හෙයින් (සංස්කාරයන් කෙරෙන්) මිදෙයි. මේ බහූපකාර ධර්ම නවය යැ.

කතමෙ නව ධම්මා භාවෙතබ්බා? නව පාරිසුද්ධිපධානියඞ්ගානි. සීලවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගං, චිත්තවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගං, දිට්ඨිවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගං, කඞ්ඛාවිතරණවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගං, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගං පටිපදාඤාණදස්සනවිසුද්ධි පාරිසු ධිපදනියඞ්ගං, ඤාණදස්සනවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගං, පඤ්ඤාවිසුද්ධි පාරිසුද්ධිපදනියඞ්ගං, විමුත්තිවිසුද්ධි පාරිසුද්ධිපධානියඞ්ගං. ඉමෙ නව ධම්ම භාවෙතබ්බා.

කතමෙ නව ධම්මා පරිඤ්ඤෙය්‍යා නව සත්තාවාසා. සන්තාවුසො සත්තා නානත්තකායා නානත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතා. අයං පඨමො සත්තාවාසො.

සන්තාවුසො සත්තා නානත්තකායා එකත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා පඨමාභිනිබ්බත්තා. අයං දුතියො සත්තාවාසො.

සන්තාවුසො සත්තා එකත්තකායා නානත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි දෙවා ආභස්සරා. අයං තතියො සත්තාවාසො.

සන්තාවුසො සත්තා එකත්තකායා එකත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. අයං චතුත්ථො සත්තාවාසො.

සන්තාවුසො සත්තා අසඤ්ඤිනො අප්පටිසංවෙදිනො, සෙය්‍යථාපි දෙවා අසඤ්ඤසත්තා. අයං පඤ්චමො සත්තාවාසො.

සන්තාවුසො සත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා, පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා, නානත්තසඤ්ඤානං අමනසිකාරා, අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනූපගා. අයං ඡට්ඨො සත්තාවාසො.

සන්තාවුසො සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනූපගා. අයං සත්තමො සත්තාවාසො.

සන්තාවුසො සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගා, අයං අට්ඨමො සත්තාවාසො.

භාවයිතව්‍ය ධර්ම නවය කවර යැ? පාරිසුද්ධි පධානියඞ්ග (පිරිසිදු බවේ ප්‍රධාන අවයව) නවය යැ: ශීල විශුද්ධිය පිරිසිදු බවේ ප්‍රධාන අවයවයෙක, චිත්තවිශුද්ධිය පිරිසිදු බවේ ප්‍රධාන අවයවයෙක, දෘෂ්ටිවිශුද්ධිය පිරිසිදු බවේ ප්‍රධාන අවයවයෙක, කාංක්ෂාවිතරණවිශුද්ධිය පිරිසිදු බවේ ප්‍රධාන අවයවයෙක, මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධිය පිරිසිදු බවේ ප්‍රධාන අවයවයෙක, ප්‍රතිපද්ඥානදර්ශනවිශුද්ධිය පිරිසිදු බවේ ප්‍රධාන අවයවයෙක, ඥානදර්ශනවිශුද්ධිය පිරිසිදු බවේ ප්‍රධාන අවයවයෙක, ප්‍රඥාවිශුද්ධිය පිරිසිදු බවේ ප්‍රධාන අවයවයෙක, විමුක්තිවිශුද්ධිය පිරිසිදු බවේ ප්‍රධාන අවයවයෙක. මේ භාවයිතව්‍ය (වැඩියැ යුතු) ධර්ම නවය යැ.

පරිඥෙය ධර්ම නවය කවර යැ? සත්ත්වාවාස නවය යැ: ඇවැත්නි, මිනිසුන් ද ඇතැම් දෙවියන් ද ඇතැම් විනිපාතිකයන් ද සේ කයැ වෙනස් බව ඇති, ප්‍රතිසන්ධිසංඥායෙහි ද වෙනස් බව ඇති, සත්ව කෙනෙක් ඇත. මේ පළමු සත්ත්වාවාසය යැ.

ඇවැත්නි, කල්පාරම්භ සමයෙහි උපන් බ්‍රහ්මකායික දෙවියන් සේ කයින් වෙනස් වූ ප්‍රතිසන්ධිසංඥායෙන් සමාන වූ සත්ත්ව කෙනෙක් ඇත. මේ දෙවෙනි සත්ත්වාවාසය යැ.

ඇවැත්නි, ආභස්සර දෙවියන් සේ වූ කයැ සමාන බව ඇති, ප්‍රතිසන්ධිසංඥායෙහි වෙනස් බව ඇති සත්ව කෙනෙක් ඇත. මේ තෙවෙනි සත්ත්වාවාසය යැ.

ඇවැත්නි ශුභකෘත්ස්නක දෙවියන් සේ කයැ සමාන බව ඇති, ප්‍රතිසන්ධිසංඥාවේ ද සමාන බව ඇති සත්ත්ව කෙනෙක් ඇත. මේ සිවුවැනි සත්ත්වාවාසය යැ.

ඇවැත්නි, අසංඥසත්ත්ව දෙවියන් සේ ප්‍රතිසන්ධි සංඥාව නැති, විඳුම් නැති සත්ව කෙනෙක් ඇත. මේ පස්වැනි සත්ත්වාවාසය යැ.

ඇවැත්නි, හැම සැටියෙන් ම රූපසංඥවන් ඉක්මීමෙන්, ප්‍රතිඝසංඥවන් අතුරුදහන් වීමෙන්, නානාත්වසංඥවන් නොමෙනෙහි කිරීමෙන්, ‘අහස අනන්ත යැ’යි සමාධි වඩා ආකාසානඤ්චායතනට පැමිණි සත්ත්ව කෙනෙක් ඇත. මේ සවැනි සත්ත්වාවාසය යැ.

ඇවැත්නි, හැම අයුරින් ආකාසානඤ්චායතනය ඉක්මැ, ‘විඥනය අනන්ත යැ’යි සමාධි වඩා, විඤ්ඤණඤ්චායතනයට පැමිණි සත්ත්ව කෙනෙක් ඇත. මේ සත්වැනි සත්ත්වාවාසය යැ.

ඇවැත්නි, හැම අයුරින් විඤ්ඤණඤ්චායතනය ඉක්මැ, ‘කිසිත් නැතැ’යි සමාධි වඩා, ආකිඤ්චඤ්ඤයතනයට පැමිණි සත්ත්ව කෙනෙක් ඇත, මේ අටවැනි සත්ත්වාවාසය යැ.

සන්තාවුසො සත්තා සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගා. අයං නවමො සත්තාවාසො.

ඉමෙ නව ධම්මා පරිඤ්ඤෙය්‍යා.

**කතමෙ නව ධම්මා පහාතබ්බා?** නව තණ්හාමූලකා ධම්මා: තණ්හං පටිච්ච පරියෙසනා, පරියෙසනං පටිච්ච ලාභො, ලාභං පටිච්ච විනිච්ඡයො, විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො, ඡන්දරාගං පටිච්ච අජ්ඣොසානං, අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො, පරිග්ගහං පටිච්ච මච්ඡරියං, මච්ඡරියං පටිච්ච ආරක්ඛො, ආරක්ඛාධිකරණං පටිච්ච[1] දණ්ඩාදානසත්ථාදානකලහ-විග්ගහවිවාදතුවංතුවංපෙසුඤ්ඤමුසාවාදා, අනෙකෙ පාපකා අකුසලා ධම්මා සංවත්තන්ති. ඉමෙ නව ධම්මා පහාතබ්බා.

**කතමෙ නව ධම්මා හානභාගියා?** නව ආඝාතවත්ථූනි: අනත්ථං මෙ අචරීති ආඝාතං බන්ධති, අනත්ථං මෙ චරතීති ආඝාතං බන්ධති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතං බන්ධති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරී'ති -පෙ- අනත්ථං චරතීති -පෙ- අනත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරී'ති -පෙ- අත්ථං චරතී'ති -පෙ- අත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති. ඉමෙ නව ධම්මා හානභාගියා.

**කතමෙ නව ධම්මා විසෙසභාගියා?** නව ආඝාතපටිවිනයා. අනත්ථං මෙ අචරීති තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති. අනත්ථං මෙ චරතීති තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති. අනත්ථං මෙ චරිස්සතීති, තං කුතෙත්ථ ලබ්භා'ති ආඝාතං පටිවිනෙති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරීති -පෙ- අනත්ථං චරතී'ති -පෙ- අනත්ථං චරිස්සතීති, තං කුතෙත්ථ ලබ්භා'ති ආඝාතං පටිවිනෙති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරී'ති -පෙ- අත්ථං චරතී'ති -පෙ- අත්ථං චරිස්සතීති, තං කුතෙත්ථ ලබ්භා'ති ආඝාතං පටිවිනෙති. ඉමෙ නව ධම්මා විසෙසභාගියා,

1. ආරක්ඛාධිකරණං දණ්ඩාදාන... (මජසං)

ඇවැත්නි, හැම අයුරින් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනයට පැමිණි සත්ව කෙනෙක් ඇත. මේ නවවැනි සත්වාවාසය යැ.

මේ පරිඥෙය (පිරිසිඳ දත යුතු) ධර්ම නවය යැ.

ප්‍රහාතව්‍ය ධර්ම නවය කවර යැ? තෘෂ්ණාමූලක (තෘෂ්ණාව මුල් කොට ඇති) ධර්ම නවය යැ: තෘෂ්ණාව ප්‍රත්‍යය කොට ගෙන පර්යේෂණය (චීවරාදි පසය සෙවීම) වේ. පර්යේෂණය ප්‍රත්‍යය කොට ගෙන (චීවරාදි පසය) ලැබීම වේ. පසය ලැබීම ප්‍රත්‍යය කොට ගෙන විනිශ්චයය (විතර්කණය) වේ. විනිශ්චයය ප්‍රත්‍යය කොට ගෙන ඡන්ද රාගය (දුර්වල වූ ද මහත් වූ ද තෘෂ්ණා) වේ. ඡන්දරාගය ප්‍රත්‍යය කොට ගෙන අධ්‍යවසානය (මම යැ යි බලවත් සනිටුහන) වේ. අධ්‍යවසානය ප්‍රත්‍යය කොට ගෙන පරිග්‍රහය (අත් කැරගැන්ම) වේ. පරිග්‍රහය ප්‍රත්‍යය කොට ගෙන මාත්සර්යය (මසුරුබව) වේ. මාත්සර්යය ප්‍රත්‍යය කොට ගෙන ආරක්ෂණය (ලත් දය රැක ගැන්ම) වේ. ආරක්ෂාධිකරණය (රකවල් කිරීම) ප්‍රත්‍යය කොට ගෙන දඬු ගැනුම් අවි ගැනුම් කලහ භෙද විවාද ගැරහුම් කේලාම් කීම් මුසවා බිණුම් ද නොයෙක් ලාමක අකුශල ධර්මයෝ ද පවතිත්. මේ ප්‍රහාතව්‍ය ධර්ම නවය යැ.

හානභාගික ධර්ම නවය කවරැ යැ? නව ආඝාත වස්තු යැ: මට පෙරැ අනර්ථ කළැ යි වෛර බඳී, මට දන් අනර්ථ කරතැයි වෛර බඳී, මට මතු අනර්ථ කරතැයි වෛර බඳී. මගේ ප්‍රිය මනාප තැනැත්තහුට අනර්ථ කළැයි... දැන් අනර්ථ කරතැ යි... මතු අනර්ථ කරතැ යි වෛර බඳී. මට අප්‍රිය වූ අමනාප වූ තැනැත්තහුට අර්ථ (වැඩ) සිදු කළැ යි......දන් වැඩ සිදු කරතැ යි......මතු වැඩ සිදු කරතැ යි වෛර බඳී. මේ හානභාගික ධර්ම නවය යැ.

විශෙෂ භාගික ධර්ම නවය කවර යැ? ආඝාත ප්‍රතිවිනය (වෛර සංසිඳුවන කරුණු) නවය යැ: මට අවැඩ කෙළේ ය යන එය කොයින් ලැබේ ද යි (සලකා) වෛර දුරැ ලයි. දන් මට අවැඩ කරතැ යි යන එය කොයින් ලැබේ ද යි වෛර දුරැ ලයි, මතු මට අවැඩ කරතැයි යන එය කොයින් ලැබේද යි වෛර දුරැලයි. මගේ ප්‍රිය මනාප තැනැත්තහුට අවැඩ කෙළේ ය යන එය කොයින් ලැබේ ද යි වෛර දුරැලයි. මගේ ප්‍රිය මනාප තැනැත්තහුට දන් අවැඩ කරතැ යි......මතු අවැඩ කරතැ යි......මට අප්‍රිය අමනාප තැනැත්තහුට වැඩ සිදු කෙළේ යැ යි......මට අප්‍රිය අමනාප තැනැත්තහුට දන් වැඩ සිදු කරතැ යි......මට අප්‍රිය අමනාප තැනැත්තහුට මතු වැඩ සිදු කරතැ යි යන එය කොයින් ලැබේ ද යි වෛර දුරැ ලයි. මේ විශෙෂභාගික ධර්ම නවය යැ.

කතමෙ නව ධම්මා දුප්පටිවිජ්ඣා? නව නානත්තා: ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං. වෙදනානානත්තං පටිච්ච උප්පජ්ජති, සඤ්ඤානානත්තං, සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති, සඞ්කප්පනානත්තං, සඞ්කප්පනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං. ඡන්දනානානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං, පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං, පරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති ලාභනානත්තං, ලාභනානත්තං පටිච්ච උප්පජ්ජති මදනානානත්තං, ඉමෙ නව ධම්මා දුප්පටිවිජ්ඣා.

කතමෙ නව ධම්මා උප්පාදෙතබ්බා? නව සඤ්ඤා: අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙ පටිකූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතිසඤ්ඤා, අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහාණසඤ්ඤා, විරාගසඤ්ඤා. ඉමෙ නව ධම්මා උප්පාදෙතබ්බා.

කතමෙ නව ධම්මා අභිඤ්ඤෙය්‍යා? නව අනුපුබ්බවිහාරා : ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. ඉමෙ නව ධම්මා අභිඤ්ඤෙය්‍යා.

දුෂ්ප්‍රතිවිධ්‍ය (දුක සේ පිළිවිද්ද යුතු) ධර්ම නවය කවර යැ? නානාත්ව නවය යැ: (චක්ෂුර්ධාත්වාදි) ධාතූන් ගේ නානාත්වය නිසා (චක්ෂු ස්පර්ශාදි) ස්පර්ශනානාත්වය උපදී. (චක්ෂුඃ ස්පර්ශාදි) ස්පර්ශ නානාත්වය නිසා (චක්ෂුඃස්පර්ශජවේදනාදි) වේදනානානාත්වය උපදී. වේදනානානාත්වය නිසා (කාමසංඥාදී) සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා (කාමසඞ්කල්පනාදි) සඞ්කල්පනානාත්වය උපදී. සඞ්කල්පනානාත්වය නිසා (රූපයෙහි ඡන්දය, ශබ්දයෙහි ඡන්දය යන ආදි විසින්) ඡන්දනානාත්වය උපදී. ඡන්දනානාත්වය නිසා (රූපපරිදාහ ශබ්දපරිදාහාදි) පරිදාහනානාත්වය උපදී. පරිදාහනානාත්වය නිසා (රූපපර්යේෂණ ශබ්දපර්යේෂණාදි) පර්යේෂණ නානාත්වය උපදී. පර්යේෂණනානාත්වය නිසා (රූපප්‍රතිලාභ ශබ්ද ප්‍රතිලාභාදි) ලාභනානාත්වය උපදී. ලාභනානාත්වය නිසා (රූප මඤ්ඤනා සද්දමඤ්ඤනාදි) මඤ්ඤනාවන්ගේ නානාත්වය උපදී. මේ දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම නවය යැ.

උත්පාදයිතව්‍ය ධර්ම නවය කවර යැ? අශුභසංඥාව, මරණසංඥාව, ආහාරය කෙරෙහි ප්‍රතිකූලසංඥාව, සියලු ලොව කෙරෙහි අනභිරත (කලකිරුණු) සංඥාව, අනිත්‍යසංඥාව, අනිත්‍යයෙහි දුඃඛසංඥාව, දුකෙහි අනාත්මසංඥාව, ප්‍රහාණ සංඥාව විරාගසංඥාව, යන නව සංඥා යැ. මේ ඉපැදවියැ යුතු සංඥා නවය යැ.

අභිඥෙය ධර්ම නවය කවර යැ? අනුපූර්වවිහාර නවය යැ: ඇවැත්නි, මෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන්ව ම, අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිත, විචාර සහිත, විවේකයෙන් උපන්, ප්‍රීතිය හා සුඛවේදනාව ඇති, ප්‍රථම ධ්‍යානය ලැබ වෙසෙයි....ද්විතීය ධ්‍යානය ලැබ වෙසෙයි,...තෘතීය ධ්‍යානයලැබ වෙසෙයි,...චතුර්ථධ්‍යානය ලැබ වෙසෙයි.......හැම ලෙසින් රූපසංඥාවන් ඉක්මීමෙන් ප්‍රතිඝසංඥාවන් පහ වීමෙන්, නානාත්වසංඥාවන් මෙනෙහි නොකිරීමෙන් 'ආකාශය අනන්තයැ'යි (සමාධි වඩා) ආකාශානඤ්චායතනය ලබා වෙසෙයි. හැම ලෙසින් ආකාසානඤ්චායතනය ඉක්මැ 'විඥානය අනන්තයැ'යි (සමාධි වඩා) විඤ්ඤාණඤ්චායතන ය ලැබ වෙසෙයි. හැම ලෙසින් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ 'කිසිත් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනය ලැබ වෙසෙයි. හැම ලෙසින් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ලැබ වෙසෙයි. හැම ලෙසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මැ සඤ්ඤාවේදයිත නිරොධ සමාපත්තිය ලැබ වෙසෙයි. මේ අභිඥෙය (වෙසෙසා දත යුතු) ධර්ම නවය යැ.

කතමෙ නව ධම්මා සච්ඡිකාතබ්බා? නව අනුපුබ්බනිරොධා: පඨමං ඣානං සමාපන්නස්ස කාමසඤ්ඤා නිරුද්ධා හොති, දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා නිරුද්ධා හොන්ති, තතියං ඣානං සමාපන්නස්ස පීති නිරුද්ධා හොති. චතුත්ථං ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා නිරුද්ධා හොන්ති, ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤා නිරුද්ධා හොති, විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤා නිරුද්ධා හොති, ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා නිරුද්ධා හොති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා නිරුද්ධා හොති, සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච නිරුද්ධා හොන්ති. ඉමෙ නව ධම්මා සච්ඡිකාතබ්බා.

ඉති ඉමෙ නවුති ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා.

## දස ධම්මා

11. දස ධම්මා බහුකාරා. දස ධම්මා භාවෙතබ්බා. දස ධම්මා පහාතබ්බා. දස ධම්මා හානභාගියා. දස ධම්මා විසෙසභාගියා. දස ධම්මා දුප්පටිවිජ්ඣා. දස ධම්මා උප්පාදෙතබ්බා. දස ධම්මා අභිඤ්ඤෙය්‍යා. දස ධම්මා සච්ඡිකාතබ්බා.

කතමෙ දස ධම්මා බහුකාරා? දස නාථකරණා ධම්මා: ඉධාවුසො භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදය සික්ඛති සික්ඛාපදෙසු. යං ආවුසො භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපා'ස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, යම්පාවුසො භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති තථා රූපා'ස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, අයම්පි ධම්මො නාථකරණො.

සාක්ෂාත්කර්තව්‍ය ධර්ම නවය කවර යැ? අනුපූර්ව නිරොධ නවය යැ: ප්‍රථම ධ්‍යානයට සමවන්නහු ගේ කාමසංඥව නිරුද්ධ වෙයි, ද්විතීය ධ්‍යානයට සමවන්නහුගේ විතර්ක විචාරයෝ නිරුද්ධ වෙත්. තෘතීය ධ්‍යානයට සමවන්නහුගේ ප්‍රීතිය නිරුද්ධ වෙයි. චතුර්ථ ධ්‍යානයට සමවන්නහු ගේ ආශ්වාසප්‍රශ්වාසයෝ නිරුද්ධ වෙත්. ආකාසානඤ්චායතනයට සමවන්නහු ගේ රූපසංඥව නිරුද්ධ වෙයි. විඤ්ඤණඤ්චායතනයට සමවන්නහු ගේ ආකාසානඤ්චායතනසඤ්ඤව නිරුද්ධ වෙ. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහු ගේ විඤ්ඤණඤ්චායතනසඤ්ඤව නිරුද්ධ වෙ. නෙවසඤ්ඤනාසඤ්ඤයතනයට සමවන්නහුගේ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤව නිරුද්ධ වෙ. සඤ්ඤවෙදයිතනිරොධයට සමවන්නහු ගේ සංඥත් වෙදනාත් නිරුද්ධ වෙත්. මේ සාක්ෂාත් කටයුතු ධර්ම නවය යැ.

මෙසේ භූත වූ තථ්‍ය වූ තථ වූ අවිතථ වූ අනන්‍යථ වූ මේ අනූවෙක් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මනා කොට විශිෂ්ට නුවණින් දැනගන්නා ලදහ.

### දශකය

11. බහූපකාර ධර්ම දසයෙක, භාවයිතව්‍ය ධර්ම දශයෙක, පරිඥෙය ධර්ම දශයෙක, ප්‍රහාතව්‍ය ධර්ම දශයෙක, හානභාගික ධර්ම දශයෙක, විශෙෂභාගික ධර්ම දශයෙක, දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම දශයෙක, උත්පාදයිතව්‍ය ධර්ම දශයෙක, අභිඥෙය ධර්ම දශයෙක, සාක්ෂාත්කර්තව්‍ය ධර්ම දශයෙක.

බහුපකාර ධර්ම දශය කවරයැ? දශ නාථකරණ ධර්මයෝ යැ: ඇවැත්නි මෙහි මහණ තෙමේ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂසංවර ශීලයෙන් හැවුරුණේ ආචාරගොචර සම්පන්න වැ ස්වල්පමාත්‍ර වරදෙහි ද බිය දක්නා සුලු වැ වෙසෙයි. සිකපද සමාදන් කොට ගෙන හික්මෙයි. ඇවැත්නි, මහණ තෙමේ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂසංවරයෙන් හැවුරුණේ ආචාර ගොචරදෙකින් යුතු වැ අල්පමාත්‍ර දෙෂයන්හි ද බිය දක්නා සුලු වැ වෙසෙයි, සික පද සමාදන් කොට ගෙන හික්මෙයි. යන යමෙක් ඇද්ද, මෙය ද නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණ තෙම බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වෙයි. ඇසූ දහම් සිතැ දරන්නේ වෙයි, ඇසූ දහම් සිතින් රැස් කොට ගන්නේ වෙයි. ආදියෙහි යහපත් වූ මැද යහපත් වූ අවසනැ යහපත් වූ, අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ යම් ධර්ම කෙනෙක් හැම ලෙසින් පිරිපුන් වූ පිරිසිදු බඹසර ප්‍රකාශ කෙරෙත් ද එසේ වූ ධර්මයෝ ඔහු විසින් බෙහෙවින් අසන ලද්දහු වචනයෙන් දරන ලද්දහු වචනයෙන් පුරුදු කරන ලද්දහු සිතින් පුනපුනා විමසන ලද්දහු දෘෂ්ටියෙන් මොනොවට පිළිවිදුනා ලද්දහු වෙත්. ඇවැත්නි මහණ තෙමේ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වෙයි ... දෘෂ්ටියෙන් පිළිවිදුනා ලද්දහු වෙත් යන මෙය ද නාථකරණ ධර්මයෙක.

පුන ච පරං ආවුසො භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණ-සහායො කල්‍යාණසම්පවඞ්කො. යම්පාවුසො භික්ඛු -පෙ- කල්‍යාණ-සම්පවඞ්කො, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං, යම්පාවුසො භික්ඛු -පෙ- අනුසාසනිං, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රුපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං. යම්පාවුසො භික්ඛු -පෙ- අලං සංවිධාතුං, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො, අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමුජ්ජො. යම්පාවුසො භික්ඛු ධම්මකාමො හොති -පෙ- පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො. අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙහි චීවර-පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. යම්පාවුසො භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙහි චීවරපිණ්ඩපාතසෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො භික්ඛු ආරද්ධවිරියො විහරති, අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්ක-මො, අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. යම්පාවුසො භික්ඛු-පෙ-අයම්පි ධම්මො නාථකරණො.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණ තෙමෙ කලණ මිතුරන් ඇත්තේ, කලණ යහළුවන් ඇත්තේ කලණමිතුරනට නැමුණේ වෙයි. ඇවැත්නි, 'මහණ තෙමෙ කලණ මිතුරන් ඇත්තේ කලණ යහළුවන් ඇත්තේ කලණමිතුරනට ම නැමුණේ වේ' යන යමෙක් ඇද්ද මේ ද නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණ තෙමෙ සුවච වෙයි, සුවච බව කරන දහමුන් ගෙන් යුක්ත වූයේ ඉවසනුයේ කරන අනුශාසනය ආදරයෙන් පිළිගන්නේ වෙයි. ඇවැත්නි, 'මහණ තෙමෙ සුවච වෙයි ... අනුශාසනය ආදරයෙන් පිළිගන්නේ වේ' යන යමෙක් ඇද්ද මේ ද නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, 'කුම කෙරෙම ද?'යි අසා කළ යුතු වූ සබ්‍රම්සරුවන් ගේ යම් කුදු මහත් කටයුතු කෙනෙක් ඇද්ද මහණ තෙමේ එහි දක්ෂ ද අනලස් ද එයට උපායමාර්ග වූ නුවණින් සමන්විත ද, එය කරනුයෙහි සමර්ථ ද එය පිළිබඳ විචාරණයෙහි සමර්ථ ද වෙයි. ඇවැත්නි, ... සබ්‍රම් සරුවන් ගේ යම් කුදු - මහත් කටයුතු කෙනෙක් ඇද්ද, ... එය පිළිබඳ විචාරණයෙහි සමර්ථ ද වේ යන යමෙක් ඇද්ද, මේත් නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණ තෙමේ ධර්මය කැමැත්තේ වෙයි. ප්‍රිය සමුදාහාර ඇත්තේ වෙයි. අභිධර්මයෙහි අභිවිනයයෙහි බහුල ප්‍රමොදය ඇත්තේ වෙයි. ඇවැත්නි, 'මහණ තෙමේ ධර්මය කැමැත්තේ වෙයි ... අභිධර්මයෙහි අභිවිනයයෙහි බහුල ප්‍රමොදය ඇත්තේ වෙයි' යන යමෙක් ඇද්ද මේ ද නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණ තෙමෙ ඉතරෙතර චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයන් ගෙන් සතුටු වෙයි. ඇවැත්නි, 'මහණ තෙමේ ඉතරෙතර චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලාන ප්‍රත්‍යය පිණ්ඩපාත ශයනාසන ග්ලාන ප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයන්ගෙන් සතුටු වේ' යන යමෙක් ඇද්ද, මෙ ද නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණ තෙමෙ අකුසල්දහමුන් පහ කරනුවට කුසල් දහමුන් පිළිලබනුවට ආරබ්ධ වීර්ය ඇත්තේ, බල ඇත්තේ, දැඩි වැර ඇත්තේ, කුසල් දහම් ලබනුවට බහා නො තැබූ වීර්ය ඇත්තේ වෙසෙයි. ඇවැත්නි, 'මහණ තෙමෙ... ආරබ්ධ වීර්ය ඇත්තේ... කුසල් දහම් ලබනුවට බහා නො තැබූ වීර්ය ඇත්තේ වෙසෙයි' යන යමෙක් ඇද්ද, මේ ද නාථකරණ ධර්මයෙක.

පුන ච පරං ආවුසො භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. යම්පාවුසො භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා, අයම්පි ධම්මො නාථකරණො.

පුන ච පරං ආවුසො භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. යම්පාවුසො භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා, අයම්පි ධම්මො නාථකරණො.

ඉමෙ දස ධම්මා බහුකාරා.

කතමෙ දස ධම්මා භාවෙතබ්බා? දස කසිණායතනානි: පඨවිකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං, ආපොකසිණමෙකො සඤ්ජානාති -පෙ- තෙජොකසිණමෙකො සඤ්ජානාති -පෙ- වායොකසිණමෙකො සඤ්ජානාති -පෙ- නීලකසිණමෙකො සඤ්ජානාති -පෙ- පීතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ලොහිතකසිණමෙකො සඤ්ජානාති පෙ- ඔදාතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ආකාසකසිණමෙකො සඤ්ජානාති -පෙ- විඤ්ඤාණකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං ඉමෙ දස ධම්මා භාවෙතබ්බා.

කතමෙ දස ධම්මා පරිඤ්ඤෙය්‍යා? දසායතනානි: චක්ඛායතනං, රූපායතනං, සොතායතනං, සද්දායතනං, ඝානායතනං, ගන්ධායතනං, ජිව්හායතනං, රසායතනං, කායායතනං, ඵොට්ඨබ්බායතනං.

ඉමෙ දස ධම්මා පරිඤ්ඤෙය්‍යා.

කතමෙ දස ධම්මා පහාතබ්බා? දස මිච්ඡත්තා: මිච්ඡාදිට්ඨි, මිච්ඡාසඞ්කප්පො, මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්තො, මිච්ඡාආජීවො, මිච්ඡාවායාමො, මිච්ඡාසති, මිච්ඡාසමාධි, මිච්ඡාඤාණං, මිච්ඡාවිමුත්ති. ඉමෙ දස ධම්මා පහාතබ්බා.

කතමෙ දස ධම්මා හානභාගියා? දස අකුසලකම්මපථා: පාණාතිපාතො, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරො, මුසාවාදො, පිසුණා වාචා, ඵරුසා වාචා, සම්ඵප්පලාපො, අභිජ්ඣා, බ්‍යාපාදො, මිච්ඡාදිට්ඨි. ඉමෙ දස ධම්මා හානභාගියා.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණ තෙමෙ බොහෝ කලකට පෙර කළ දෑ ද, බොහෝ කලකට පෙර කී දෑ ද, සිහි කරනුයේ, පුනපුනා සිහි කරනුයේ උතුම් ම සිහියෙන් ද සථානොචිත ප්‍රඥයෙන් ද සමන්විත වූයේ, ස්මෘතිමත් වෙයි. ඇවැත්නි, 'මහණ තෙමෙ සිහි කරනුයේ පුන පුනා සිහි කරනුයේ ස්මෘතිමත් වෙයි' යන යමෙක් ඇද්ද, මේ ද නාථකරණ ධර්මයෙක.

තව ද අනෙකක් කියමි. ඇවැත්නි, මහණ තෙමෙ ඉපැද්ම ද නැස්ම ද පිරිසිඳිනු සමත් වූ, ලොභ ස්කන්ධාදීන් විදලනුයෙහි සමත් වූ, මොනොවට දුක් වැනැස්මට යන, පිරිසිදු ප්‍රඥයෙන් සමන්විත වූයේ ප්‍රඥවත් වෙයි. ඇවැත්නි, 'මහණ තෙමෙ ඉපැද්මත් වැනැස්මත් පිරිසිඳිනු සමත් වූ, ලොභ ස්කන්ධාදීන් විදලනුයෙහි සමත් වූ, මොනොවට දුක් වැනැස්මට යන පිරිසිදු ප්‍රඥයෙන් සමන්විත වූයේ ප්‍රඥාවත් වේ' යන යමෙක් ඇද්ද, මේ ද නාථකරණ ධර්මයෙක.

මේ බහූපකාර ධර්ම දශය යෑ.

භාවයිතව්‍ය ධර්ම දශය කවර යෑ? කසිණායතන දශය යෑ: එකෙක් උඩ යට සරසැ දෙකක් නො වූ (එකක් ම වූ) පඨවි කසිණය හඳුනයි. එකෙක්... ආපොකසිණය හඳුනයි, එකෙක්... තෙජොකසිණය හඳුනයි, එකෙක්... වායොකසිණය හඳුනයි, එකෙක්... නීලකසිණය හඳුනයි, එකෙක්... පීතකසිණය හඳුනයි. එකෙක්... ලොහිතකසිණය හඳුනයි, එකෙක්... ඔදතකසිණය හඳුනයි, එකෙක්... ආකාසකසිණය හඳුනයි, එකෙක් උඩ යටැ සර සැ දෙකක් නොවූ (එකක් ම වූ) අප්‍රමාණ වූ විඥානකසිණය හඳුනයි. මේ භාවයිතව්‍ය ධර්ම දශය යෑ.

පරිඥෙය ධර්ම දශය කවර යෑ? චක්ෂුරායතනය රූපායතනය ශ්‍රොත්‍රායතනය ශබ්දයතනය ඝ්‍රාණායතනය ගන්ධායතනය ජිහ්වායතනය රසායතනය කායායතනය ස්ප්‍රෂ්ටව්‍යායතනය යන ආයතන දශය යෑ.

මේ පරිඥෙය ධර්ම දශය යෑ.

ප්‍රහාතව්‍ය ධර්ම දශය කවර යෑ? මිථ්‍යාදෘෂ්ටිය මිථ්‍යාසඞ්කල්පය මිථ්‍යා-වචනය මිථ්‍යාකර්මාන්තය මිථ්‍යා ආජීවය මිථ්‍යාව්‍යායාමය මිථ්‍යාස්මෘතිය මිථ්‍යාසමාධිය මිථ්‍යාඥනය මිථ්‍යාවිමුක්තිය යන මිථ්‍යාත්වයෝ යෑ. මේ ප්‍රහාතව්‍ය ධර්ම දශය යෑ.

හානභාගික ධර්ම දශය කවර යෑ? ප්‍රාණාතිපාතය අදත්තාදානය කාම-මිථ්‍යාචාරය මෘෂාවාදය පිසුණවචනය පරුෂවචනය සම්ප්‍රලාපය අභිධ්‍යාව ව්‍යාපාදය මිථ්‍යාදෘෂ්ටිය යන අකුශල කර්මපථ දශය යෑ. මේ හානභාගික ධර්ම දශය යෑ.

කතමෙ දස ධම්මා විසෙසභාගියා? දසකුසලකම්මපථා : පාණාති-පාතා වෙරමණී, අදින්නාදනා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, මුසාවාද වෙරමණී, පිසුණාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අනභිජ්ඣා, අබ්‍යාපාදෙ, සම්මාදිට්ඨි. ඉමෙ දස ධම්මා විසෙසභාගියා.

කතමෙ දස ධම්මා දුප්පටිවිජ්ඣා? දස අරියවාසා : ඉධාවුසො භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති ඡළඞ්ගසමන්නාගතො එකාරක්ඛො චතුරා-පස්සෙනො පනුන්නපච්චෙකසච්චො සමවයසට්ඨෙසනො අනාවිල-සඞ්කප්පො පස්සද්ධකායසඞ්ඛාරො සුවිමුත්තචිත්තො සුවිමුත්තපඤ්ඤො.

කථඤ්ච ආවුසො භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති: ඉධාවුසො භික්ඛුනො කාමච්ඡන්දො පහීනො හොති, බ්‍යාපාදො පහීනො හොති. ථීනමිද්ධං පහීනං හොති, උද්ධච්චකුක්කුච්චං පහීනං හොති, විචිකිච්ඡා පහීනා හොති. එවං ඛො ආවුසො භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති,

කථඤ්ච ආවුසො භික්ඛු ඡළඞ්ගසමන්නාගතො හොති: ඉධාවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො, සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො. එවං ඛො ආවුසො භික්ඛු ඡළඞ්ගසමන්නාගතො හොති.

කථඤ්ච ආවුසො භික්ඛු එකාරක්ඛො හොති: ඉධාවුසො භික්ඛු සතාරක්ඛෙන චෙතසා සමන්නාගතො හොති. එවං ඛො ආවුසො භික්ඛු එකාරක්ඛො හොති.

කථඤ්ච ආවුසො භික්ඛු චතුරාපස්සෙනො හොති: ඉධාවුසො භික්ඛු සඞ්ඛායෙකං පටිසෙවති, සඞ්ඛායෙකං අධිවාසෙති, සඞ්ඛායෙකං පරිවජ්ජෙති, සඞ්ඛායෙකං විනොදෙති. එවං ඛො ආවුසො භික්ඛු චතුරාපස්සෙනො හොති.

**විශෙෂභාගික ධර්ම දශය** කවර යැ? ප්‍රාණවධයෙන් වැළැක්ම, අදත්තාදානයෙන් වැළැක්ම, කාමමිථ්‍යාචාරයෙන් වැළැක්ම, බොරුකීමෙන් වැළැක්ම, කේලාම් කීමෙන් වැළැක්ම, පරොස් බසින් වැළැක්ම, සම්ඵප්‍රලාපයෙන් වැළැක්ම, අනභිධ්‍යාව, අව්‍යාපාදය, සම්‍යග්දෘෂ්ටිය යන කුශල කර්මපථ දශය යැ. මේ විශෙෂභාගික ධර්ම දශය යැ.

**දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම දශය** කවර යැ? ආර්යවාස දශය යැ: ඇවැත්නි, මෙහි මහණ තෙමේ අඞ්ග පසෙකින් වියුක්ත වූයේ, අඞ්ග සයෙකින් යුක්ත වූයේ, එක් ම ආරක්ෂාවක් ඇත්තේ, අපශ්‍රයණ සතරක් ඇත්තේ, මොනොවට බැහැර කරන ලද ප්‍රත්‍යෙක සත්‍ය ඇත්තේ, නො අඩු කොට මොනොවට දුරු කරන ලද එෂණා ඇත්තේ, නොකැලැඹුණු කල්පනා ඇත්තේ, සංසිඳුණු කායසංස්කාර ඇත්තේ, මොනොවට මිදුණු සිතැත්තේ, මොනොවට මිදුණු ප්‍රඥ ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමෙ කෙසේ නම් අඞ්ග පසෙකින් වියුක්ත වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණහුගේ කාමච්ඡන්දය ප්‍රහීණ වෙයි, ව්‍යාපාදය ප්‍රහීණ වෙයි, ථිනමිද්ධය ප්‍රහීණ වෙයි, උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණ වෙයි, විචිකිච්ඡාව ප්‍රහීණ වෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමෙ අඞ්ග පසෙකින් වියුක්ත වෙයි.

ඇවැත්නි, මහණ තෙමෙ කෙසේ නම් අඞ්ග සයෙකින් යුක්ත වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමෙ ඇසින් රූපයක් දැක නො ම සතුටු ද වෙයි, නො ම නොසතුටු ද වෙයි. සිහි ඇත්තේ නුවණින් දන්නේ උපෙක්ෂක වැ වෙසෙයි. කනින් හඬක් අසා ... නැහැයෙන් ගඳක් අසා ... දිවින් රසක් විඳ, ... කයින් හැපෙන දැයක් පැහැසැ ... මනයින් දහම් අරමුණක් සිතා නො ම සතුටු ද වෙයි, නො ම නොසතුටු ද වෙයි. සිහි ඇත්තේ, නුවණින් දන්නේ, උපෙක්ෂක ද වැ වෙසෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ අඞ්ග සයෙකින් යුක්ත වෙයි.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් එක ම ආරක්ෂාවක් ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමේ සිහිය ම ආරක්ෂාව කොටැති සිතින් යුක්ත වෙයි. ඇවැත්නි, මහණ තෙමේ මෙසේ ම එක් ආරක්ෂාවක් ඇත්තේ වෙයි.

ඇවැත්නි, කෙසේ නම් මහණ තෙමේ අපශ්‍රයණ සතරක් ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමෙ නුවණින් සලකා එකක් සෙවියි, නුවණින් බලා එකක් ඉවසයි, නුවණින් බලා එකක් පහ කෙරෙයි, නුවණින් බලා එකක් ඉවත් කරයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමෙ අපශ්‍රයණ සතරක් ඇත්තේ වෙයි.

කථඤ්ච ආවුසො භික්ඛු පනුණ්ණපච්චෙකසච්චො හොති: ඉධාවුසො භික්ඛුනො යානි භි පුථුසමණබ්‍රාහ්මණානං පුථුපච්චෙකසච්චානි සබ්බානි තානි නුණ්ණානි හොන්ති පනුණ්ණානි චත්තානි වන්තානි මුත්තානි පහීනානි පටිප්පස්සද්ධානි, එවං ඛො ආවුසො භික්ඛු පනුණ්ණපච්චෙකසච්චො හොති.

කථඤ්ච ආවුසො භික්ඛු සමවයසට්ඨෙසනො හොති; ඉධාවුසො භික්ඛුනො කාමෙසනා පහීනා හොති, භවෙසනා පහීනා හොති, බ්‍රහ්මචරියෙසනා පටිප්පස්සද්ධා හොති. එවං ඛො ආවුසො භික්ඛු සමවයසට්ඨෙසනො හොති.

කථඤ්චාවුසො භික්ඛු අනාවිලසඞ්කප්පො හොති: ඉධාවුසො භික්ඛුනො කාමසඞ්කප්පො පහීනො හොති, බ්‍යාපාදසඞ්කප්පො පහීනො හොති, විහිංසාසඞ්කප්පො පහීනො හොති එවං ඛො ආවුසො භික්ඛු අනාවිලසඞ්කප්පො හොති.

කථඤ්ච ආවුසො භික්ඛු පස්සද්ධකායසඞ්ඛාරො හොති: ඉධාවුසො භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එවං ඛො ආවුසො භික්ඛු පස්සද්ධකායසඞ්ඛාරො හොති.

කථඤ්චාවුසො භික්ඛු සුවිමුත්තචිත්තො හොති: ඉධාවුසො භික්ඛුනො රාගාචිත්තං විමුත්තං හොති, දොසා චිත්තං විමුත්තං හොති, මොහා චිත්තං විමුත්තං හොති. එවං ඛො ආවුසො භික්ඛු සුවිමුත්තචිත්තො හොති.

කථඤ්චාවුසො භික්ඛු සුවිමුත්තපඤ්ඤො හොති: ඉධාවුසො භික්ඛු රාගො මෙ පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවංකතො ආයතිං අනුප්පාදධම්මො'ති පජානාති, දොසො -පෙ- මොහො -පෙ- පජානාති, එවං ඛො ආවුසො භික්ඛු සුවිමුත්තපඤ්ඤො හොති.

ඉමෙ දස ධම්මා දුප්පටිවිජ්ඣා.

ඇවැත්නි, කෙසේ නම් මහණ තෙමෙ මොනොවට බැහැර කරන ලද ප්‍රත්‍යෙක සත්‍ය ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, බොහෝ මහණ බමුණන් ගේ යම් බොහෝ ප්‍රත්‍යෙක සත්‍ය කෙනෙක් වෙත් ද, මෙහි මහණහු විසින් ඔහු හැම බැහැර කරන ලද්දහු, දුරු කරන ලද්දහු, හැර දමන ලද්දහු, පහ කරන ලද්දහු, මුදන ලද්දහු, එ හෙයින් ම ප්‍රහීණ වූවාහු, සංසිඳුණාහු වෙත්. ඇවැත්නි, මහණ තෙමේ මෙසේ ම බැහැර කරන ලද ප්‍රත්‍යෙක සත්‍ය ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් නො අඩු කොට, මොනොවට දුරු කරන ලද එෂණා ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණහු ගේ කාම එෂණාව ප්‍රහීණ වෙයි, භව එෂණාව ප්‍රහීණ වෙයි, බ්‍රහ්මචර්යා එෂණාව සංසිඳුණේ වෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමෙ මොනොවට නො අඩු කොට දුරු කරන ලද එෂණා ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් නො කැලැඹුණු කල්පනා ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණහුගේ කාම සංකල්පය ප්‍රහීණ වෙයි, ව්‍යාපාද සංකල්පය ප්‍රහීණ වෙයි, විහිංසා සංකල්පය ප්‍රහීණ වෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමේ නො කැලැඹුණු සංකල්ප ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් සංසිඳුණු සංස්කාර ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමේ සුඛවෙදනාවගේ ද ප්‍රහාණයෙන් දුඃඛවෙදනාවගේ ද ප්‍රහාණයෙන් පළමු කොට ම සොමනස් දෙම්නස් වෙදනාවන් දුරු වීමෙන් දුක් ද නොවූ සුව ද නොවූ, උපෙක්ෂාවගේ ද ස්මෘතියගේ ද පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වෙසෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමේ සංසිඳුණු කායසංස්කාර ඇත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් මොනොවට මිදුණු සිතැත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණහුගේ සිත රාගය කෙරෙන් මිදුණේ වෙයි, ද්වෙෂය කෙරෙන් මිදුණේ වෙයි, මොහය කෙරෙන් මිදුණේ වෙයි. ඇවැත්නි, මෙසේ ම මහණ තෙමේ මොනොවට මිදුණු සිතැත්තේ වෙයි.

ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් මොනොවට මිදුණු ප්‍රඥව ඇත්තේ වේ ද යත්: ඇවැත්නි, මෙහි මහණ තෙමේ 'මාගේ රාගය ප්‍රහීණ ය සිඳ දමන ලද මුල් ඇත්තේ ය, උදුරන ලද තල් රුකක් මෙන් කරන ලද්දේ යැ නැවැත නොහටගන්නා බවට පැමිණියේ ය, යළි නො උපදනා සවභාවය ඇත්තේ වේ යැ' යි දනී. ඇවැත්නි, මහණ තෙමේ මෙසේ ම මොනොවට මිදුණු ප්‍රඥා ඇත්තේ වෙයි.

මේ දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම දශය යැ.

කතමෙ දස ධම්මා උප්පාදෙතබ්බා? දස සඤ්ඤා: අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙ පටිකූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා නිරොධසඤ්ඤා. ඉමෙ දස ධම්මා උප්පාදෙතබ්බා.

කතමෙ දස ධම්මා අභිඤ්ඤෙය්‍යා? දස නිජ්ජරවත්ථූනි: සම්මාදිට්ඨිස්ස මිච්ඡාදිට්ඨි නිජ්ජිණ්ණා හොති යෙ ච මිච්ඡාදිට්ඨිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාසඞ්කප්පස්ස මිච්ඡාසඞ්කප්පො නිජ්ජිණ්ණො හොති, යෙ ච මිච්ඡාසඞ්කප්පපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මාසඞ්කප්පපච්චයා ච අනෙක කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති.

සම්මාවාචස්ස මිච්ඡාවාචා නිජ්ජිණ්ණා හොති, යෙ ච මිච්ඡාවාචපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මාවාචපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාකම්මන්තස්ස මිච්ඡාකම්මන්තො නිජ්ජිණ්ණො හොති, යෙ ච මිච්ඡාකම්මන්තපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මාකම්මන්තපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාආජීවස්ස මිච්ඡාආජීවො නිජ්ජිණ්ණො හොති, යෙ ච මිච්ඡාආජීවපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මාආජීවපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

උත්පාදයිතව්‍ය ධර්ම දශය කවර යැ? අශුභසංඥව, මරණසංඥව, ආහාරයෙහි ප්‍රතිකූලසංඥව, සියලු ලොවෙහි අනභිරත සංඥව, අනිත්‍ය-සංඥව, අනිත්‍යයෙහි දුඃඛසංඥව, දුඃඛයෙහි අනාත්ම සංඥව, ප්‍රාහාණසංඥව, විරාගසංඥව, නිරොධසංඥව යන දශ සංඥවෝ යැ. මේ උත්පාදයිතව්‍ය දශ ධර්මයෝ යැ.

අභිඥෙය ධර්ම දශය කවර යැ? දශ නිර්ජර වස්තුහු (අකුසල් දිරා යෑමට කරුණු වන දෑ) ය. සම්‍යග්දෘෂ්ටිකයා ගේ (සන්තානයෙහි) මිථ්‍යා-දෘෂ්ටිය දිරාපත් වෙයි, මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයයෙන් යම් නොඑක් ලාමක අකුශල ධර්මයෝ උපදනාහු ද ඔහුගේ සන්තානයෙහි ඒ අකුසල්හු ද දිරාපත් වෙත්. සම්‍යග්දෘෂ්ටි ප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුශල ධර්මයෝ භාවනායෙන් පරිපූර්ණත්වයට යෙත්.

සම්‍යක්සඞ්කල්පනා ඇත්තහු ගේ (සන්තානයෙහි) මිථ්‍යාසඞ්කල්පය දිරා ගියේ වෙයි. මිථ්‍යාසඞ්කල්පප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ උපදනාහු ද, ඔහුගේ (සන්තානයෙහි) ඒ අකුසල්හු ද දිරාගියාහු වෙත්. සම්‍යක්සඞ්කල්පප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුශල ධර්ම-යෝ භාවනායෙන් පරිපූර්ණත්වයට යෙත්.

සම්‍යග්වචන ඇත්තහු ගේ (සන්තානයෙහි) මිථ්‍යාවචනය දිරා ගියේ වෙයි. මිථ්‍යාවචන ප්‍රත්‍යයයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙක් හටගන්නාහු ද, ඔහුගේ සතන්හි ඒ අකුසල්හු ද දිරා ගියාහු වෙත්. සම්‍යග්වචනප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුසල් දහම්හු භාවනා-යෙන් පරිපූර්ණත්වයට යෙත්.

සම්‍යක්කර්මාන්ත ඇත්තහු ගේ (සන්තානයෙහි) මිථ්‍යාකර්මාන්තය දිරා ගියේ වෙයි. මිථ්‍යාකර්මාන්තප්‍රත්‍යයයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙක් හටගන්නාහු ද, ඔහුගේ සන්තානයෙහි ඒ අකුසල්හු ද දිරා ගියාහු වෙත්. සම්‍යක්කර්මාන්තප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුසල්දහම්හු භාවනායෙන් පරිපූර්ණත්වයට යෙත්.

සම්‍යගාජීවය ඇත්තහුගේ (සන්තානයෙහි) මිථ්‍යාආජීවය දිරාගියේ වෙයි. මිථ්‍යාජීවප්‍රත්‍යයයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙක් හටගන්නාහු ද, ඔහුගේ (සන්තානයෙහි) ඒ අකුසල්හු ද දිරාගියාහු වෙත්, සම්‍යගාජීවප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුසල් දහම්හු භාවනායෙන් පරිපූර්ණත්වයට යෙත්.

සම්මාවායාමස්ස මිච්ඡාවායාමො නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡාවායාමපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මා වායාමපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාසතිස්ස මිච්ඡාසති නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡාසති-පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මාසතිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාසමාධිස්ස මිච්ඡාසමාධි නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡා-සමාධිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මාසමාධිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාඤාණස්ස මිච්ඡාඤාණං නිජ්ජිණ්ණං හොති. යෙ ච මිච්ඡා-ඤාණපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මාඤාණපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාවිමුත්තිස්ස මිච්ඡාවිමුත්ති නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡා-විමුත්තිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මා විමුත්තිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

ඉමෙ දස ධම්මා අභිඤ්ඤෙය්‍යා,

කතමෙ දස ධම්මා සච්ඡිකාතබ්බා? දස අසෙක්ඛා ධම්මා: අසෙක්ඛා සම්මාදිට්ඨි, අසෙක්ඛො සම්මාසඞ්කප්පො, අසෙක්ඛා සම්මාවාචා, අසෙක්ඛො සම්මාකම්මන්තො, අසෙක්ඛො සම්මාආජීවො, අසෙක්ඛො සම්මාවායාමො, අසෙක්ඛා සම්මාසති, අසෙක්ඛො සම්මාසමාධි, අසෙක්ඛං සම්මාඤාණං, අසෙක්ඛා සම්මාවිමුත්ති.

ඉමෙ දස ධම්මා සච්ඡිකාතබ්බා.

සම්‍යග්ව්‍යායාමය ඇත්තහු ගේ (සන්තානයෙහි) මිථ්‍යාව්‍යායාමය දිරාගියේ වෙයි, මිථ්‍යාව්‍යායාමප්‍රත්‍යයයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙකුත් හටගන්නාහු ද, ඒ අකුසල්හු ද ඔහුගේ (සන්තානයෙහි) දිරාගියාහු වෙත්. සම්‍යග්ව්‍යායාමප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුසල් දහම්හු භාවනායෙන් පිරීමට යෙත්.

සම්‍යක්ස්මෘතිය ඇත්තහු ගේ (සන්තානයෙහි) මිථ්‍යාස්මෘතිය දිරාගියේ වෙයි. මිථ්‍යාස්මෘතිප්‍රත්‍යයයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙකුත් හටගන්නාහු ද, ඔහු ගේ ඒ අකුශල්හු ද දිරාගියාහු වෙත්. සම්‍යක්ස්මෘතිප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුසල් දහම්හු භාවනායෙන් පිරීමට යෙත්.

සම්‍යක්සමාධිය ඇත්තහු ගේ (සන්තානයෙහි) මිථ්‍යාසමාධිය දිරාගියේ වෙයි. මිථ්‍යාසමාධිප්‍රත්‍යයයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙකුත් හටගන්නාහු ද, ඔහු ගේ ඒ අකුසල්හු ද දිරාගියාහු වෙත්. සම්‍යක්සමාධිප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුසල් දහම්හු භාවනායෙන් පිරීමට යෙත්.

සම්‍යග්ඥනය ඇත්තහු ගේ (සන්තානයෙහි) මිථ්‍යාඥානය දිරාගියේ වෙයි. මිථ්‍යාඥානප්‍රත්‍යයයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙකුත් හටගන්නාහු ද, ඔහුගේ ඒ අකුසල්හු ද දිරාගියාහු වෙත්. සම්‍යග්ඥානප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුසල් දහම්හු භාවනායෙන් පිරීමට යෙත්.

සම්‍යග්විමුක්තිය ඇත්තහු ගේ (සන්තානයෙහි) මිථ්‍යාවිමුක්තිය දිරාගියේ වෙයි. මිථ්‍යාවිමුක්තිප්‍රත්‍යයයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙකුත් හටගන්නාහු ද, ඒ අකුසල්හු ද දිරාගියාහු වෙත්. සම්‍යග්විමුක්තිප්‍රත්‍යයයෙන් ද නොයෙක් කුසල් දහම්හු භාවනායෙන් පිරීමට යෙත්.

මේ අභිභේද්‍ය (වෙසෙසි නුවණින් දත යුතු) ධර්ම දශය යැ.

සාක්ෂාත්කර්තව්‍ය ධර්ම දශය කවර යැ? අශෛක්ෂ සම්‍යග්දෘෂ්ටිය, අශෛක්ෂසම්‍යක්සඞ්කල්පය, අශෛක්ෂ සම්‍යග්වචනය, අශෛක්ෂ සම්‍යක්කර්මාන්තය, අශෛක්ෂ සම්‍යගාජීවය, අශෛක්ෂ සම්‍යග්ව්‍යායාමය, අශෛක්ෂ සම්‍යක්ස්මෘතිය, අශෛක්ෂ සම්‍යක්සමාධිය, අශෛක්ෂ සම්‍යග්ඥානය, අශෛක්ෂ සම්‍යග්විමුක්තිය යන අශෛක්ෂ ධර්ම දශය යැ.

මේ සාක්ෂාත්කර්තව්‍ය ධර්ම දශය යැ.

ඉති ඉමෙ සත්ත ධම්මා භූතා තච්ඡා තථා අවිතථා අනඤ්ඤථා සම්මා තථාගතෙන අභිසම්බුද්ධා'ති.

ඉදමවොචායස්මා සාරිපුත්තො. අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.

දසුත්තරසුත්තං නිට්ඨිතං එකාදසමං.

පාථිකවග්ගො[1] නිට්ඨිතො

තස්සුද්දානං:

පාටිකො ච' උදුම්බරං[2] චක්කවත්ති අග්ගඤ්ඤකං
සම්පසාදං ච පාසාදං[3] මහාපුරිසලක්ඛණං
සිගාලාටානාටියකං[4] සඞ්ගීති ච දසුත්තරං
එකාදසහි සුත්තෙහි පාථිකවග්ගො'ති වුච්චති,

නිට්ඨිතො දීඝනිකායො.

1. පාඨිකවග්ගො (සී. ස්‍යා)
2. පාඨිකඤ්ච (ස්‍යා) පාඨිකොදුම්බරී චෙව ( )
3. සම්පසාදනපාසාදං (මජසං)
4. සිඞ්ගාලාටානාටියක. (මජසං)

මෙසේ භූත වූ තථ්‍ය වූ තථ වූ අවිතථ වූ අනන්‍යථ වූ මේ සියයෙක් ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් මනා කොට විශිෂ්ට ඥානයෙන් දැනගන්නා ලදහ".

ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ මෙය වදාළහ. ආරාධිත සිත් ඇති ඒ මහණහු ආයුෂ්මත් ශාරිපුත්‍රයන් ගේ වචනය මැනැවැ යි පිළිගත්හ.

එකොළොස්වන දශෝත්තර සූත්‍රය නිමියේ යැ.

පාථිකවර්ගය යි.

මේ එහි උද්දානය යැ:

පාථික සූත්‍රය ද උදුම්බර සූත්‍රය ද චක්‍රවර්ත්ති සූත්‍රය ද අග්ගඤ්ඤ සූත්‍රය ද සම්ප්‍රසාදන සූත්‍රය ද පාසාදික සූත්‍රය ද මහාපුරුෂලක්ෂණ සූත්‍රය ද ශෘගාලසූත්‍රය ද ආටානාටියක සූත්‍රය ද සඞ්ගීති සූත්‍රය ද දශෝත්තර සූත්‍රය ද යන එකොළොස් සූත්‍රයන් කරණ කොට ගෙන පාථික වර්ගය යැ යි කියනු ලැබේ.

දික්සඟිය නිමියේ යි.

## දීඝනිකායෙ-පාථිකවග්ග

# ගාථාදිපාද-සූචි


අ

අකණ්හං අපුසං සුද්ධං 320, 340
අක්කොධඤ්ච අදිට්ඨි අද්දසි 258
අක්කොසභණ්ඩන විහෙසකාරී 278
අක්ඛම්භියො හොති
අගාරමාවසං 242
අක්ඛිත්ථියො වාරුණී නච්ච-
ගීතං 296
අක්ඛෙහි දිබ්බන්ති සුරං-
පිබන්ති 296
අඞ්ගීරසස්ස නමත්ථු 316,334
අඤ්ඤදත්ථුහරො මිත්තො 300
අඤ්ඤදත්ථුහරො හොති 298
අතිසීතං අතිඋණ්හං 296
අත්ථධම්ම සංහිතං පුරෙගිරං 252
අථ චෙ පබ්බජති භවති
විපාකො 286
අථ චෙපි පබ්බජති යො
මනුජො 274
අභියොගිනො ච නිපුණා 270
අමඤ්ඤද්දී අනුචඞ්කමනං ...
අමනුස්සාපි තං වදන්ති 316, 318
320, 324, 336, 338, 342
අවිවාදවඩ්ඪනකාරිං සුගිරං 278

ඉ

ඉතො සා උත්තරා දිසා 324, 342
ඉතො සා දක්ඛිණා දිසා 324, 342
ඉත්ථිවාහනං කත්වා 322, 340
ඉධ මහීපතිස්ස කාමභොගී 264
ඉන්දො සොමො වරුණො ච
330, 342

උ

උට්ඨානකො අනලසො 314
උත්තරෙන කපිවන්තො 322, 340
උපකාරො ච යො මිත්තො 332
උබ්භමුප්පතිතලොමවාසසො 254
උස්සූරසෙය්‍යා පරදාරසෙවනා 296

එ

එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය 302
එණෙය්‍යජඞ්ඝාති තමාහු
පුග්ගලා 256
එතෙ ඛො සඞ්ගහා ලොකෙ 310
එතෙ නිමිත්තෙ චත්තාරො 292
එවං නං තත්ථ ජානන්ති 316, 320
336, 338
එවං භොගෙ සමාගන්ත්වා 302

කු

කුමාරිවාහනං කත්වා 322, 340
කුම්භණ්ඩානං ආධිපති 318, 336

කො

කොණාගමනස්ස නමත්ථු 314,334

ඛ

ඛජ්ජභොජනං අථ ලෙය්‍ය
සායියං 250
ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං ...

ග

ගන්ධබ්බානං ආධිපති 316, 336
ගන්ධබ්බාසුරයක්ඛරක්ඛසෙහි
282

ගා

ගාවිං එකඛුරං කත්වා 320

ගි

ගිහිනොපි ඉජ්ඣන්ති යථාභණිතො
280

ගිහිම්පි සත්තං උපවත්තන්ති ජනො
276

ගිහීපි ධඤ්ඤෙන ධනෙන වඩ්ඪන්ති
266

ගෙ

ගෙහමාවසති චෙ තථා විධො 254

ගෙහමාවසති නරො අපබ්බජ්ජ 260

ගො

ගොපාලො සුප්පහෙධො ච 330, 348

ච

චවිය පුන ඉධාගතො සමානො
248, 252

ඡ

ඡන්ද දොසා භයා මොහා 290, 292

ජී

ජීවඤ්ජීවක සද්දෙත්ථ 324, 342

ඤා

ඤාතිහි මිත්තෙහි ච බන්ධවෙහි ච
266

ත

තත්ථ නිච්චඵලා රුක්ඛා 322, 342

තස්මා එවං වදෙමසෙ 316, 318 320
324, 336, 338, 342

තස්ස ච නගරා අහු 322, 340

තස්සොවාදකරා බහූ ගිහී ච
පබ්බජිතෙ ච 286

ත

තං කත්වා ඉතො චුතො
දිවමුපපජ්ජි 282

තං කත්වාන ඉතො චුතො දිවං 260

තං කම්මං කත්වා කුසලං සුඛුද්‍රයං
256

තං ගිහිස්සපි තදත්ථ ජොතකං 250

තං ලක්ඛණං නු බහවො සමාගතා
276

තං වෙය්‍යඤ්ජනිකා සමාගතා 286

තූ

තූලිය පටිවිච්චිය විත්තයිත්වා 264

තෙ

තෙන සො සුචරිතෙන කම්මුනා
254

තෙනාහු නං අතිනිපුණා
විචක්ඛණා 268

තෙනෙව සො සුගතිසු
පෙච්චමොදති 268

ද

දනඤ්ච පෙය්‍යවජ්ජඤ්ච 310

දනම්පි චත්තචරියතඤ්ච 250

න

න ච විසටං නච විසාචී 270

න තෙ බීජං පවපන්ති 320, 340

න දිවා සොප්පසීලෙන 296

න පාණිදණ්ඩෙහි පනාථ
ලෙඩ්ඩුනා 268

නා

නාගානං ආධිපති 320, 338

ප

පඤ්ඤපටිලාභගතෙන කම්මුනා 258
පටිභොගියා මනුජෙසු ඉධ 272
පණ්ඩිතො සීලසම්පන්නො 302, 310
පනාදෙ ඔපමඤ්ඤ ච 330 348
පබ්බජන්ති ච අනොමනික්කමො 254
පහූතපුඤ්ඤො භවති තථාවිධො 262

පා

පාණාතිපාතං අදින්නාදානං 290
පාපමිත්තො පාපසඛො 296

පි

පියදස්සනො ගිහීපි සන්තො ච 272

පු

පුත්තාපි තස්ස බහවො 316, 318, 320, 324, 336, 338, 342
පුබ්බඞ්ගමො සුචරිතෙසු අහු 272
පුරෙ පුරත්ථා පුරිමාසු ජාතිසු 244, 256, 260

බ

බහුතරා පබ්බජිතස්ස ඉරියතො 262
බහු විවිධ නිමිත්තලක්ඛණඤ්ඤූ 264
බ්‍යාකංසු වෙය්‍යඤ්ජනිකා සමාගතා 242, 246

භ

භවති පරිජනස්සවො විධෙය්‍යො 252
භවති යදි ගිහී චිරං යපෙති 248

භු

*භුත්වාන හෙකෙ බලමූසිකායො* 40

ම

මනසො පියා හදයගාමිනියො 280
මරණවධභයත්තනො විදිත්වා 248

මා

මාතා පිතා දිසා පුබ්බා 308

මි

මිච්ඡාජීවඤ්ච අවස්සජි සමෙන වුත්තිං 284

ය

යක්ඛානං ආධිපති 324, 342
යතො උග්ගච්ඡති සූරියො 316, 334
යත්ථ චොග්ගච්ඡති සූරියො 318, 338
යදි ඛත්තියො භවති භූමිපති 278
යදි ච ජහති සබ්බකාමභොගං 252
යස්මා ච සඞ්ගහෙ එතෙ 310
යස්ස චුග්ගතෙ සූරියෙ 316, 336
යස්ස චොග්ගතෙ සූරියෙ 318, 338

යෙ

යෙ චාපි නිබ්බුතා ලොකෙ 316, 334
යෙන උත්තරකුරූ රම්මා 320, 340
යෙන පෙතා පවුච්චන්ති 318, 336

යො

යොධ සීතඤ්ච උණ්හඤ්ච 296
යො වාරුණී අධනො අකිඤ්චනො 296

ර

රට්ඨෙ ඤ්ඤ හොති බහුජනො 286

රා

රාජා හොති සුදුප්පධංසියො 282

ල

ලද්ධා මානුසකං භවං තතො 284

ලා

ලාභී අච්ඡාදන වත්ථමොක්ඛ-
පාපුරණානං 260

වි

විපස්සිස්ස නමත්ථු 314, 334

වෙ

වෙදිත්වා සො සුචරිතස්ස බලං
272, 280
වෙභූතියං සංහිතභෙදකාරිං 276
වෙස්සභුස්ස නමත්ථු 314, 334

ස

සග්ගෙ වෙදයති නරො සුඛඵලානි
284
සඞ්ඝභනකො මිත්තකරො 310
සචෙ ච පබ්බමුපෙති තාදිසො
244, 246, 256, 258
සචෙ න පබ්බජ්ජමුපෙති තාදිසො
246, 258
සච්චපටිඤ්ඤො පුරිමාසු ජාතියා 274
සච්චෙ ච ධම්මෙ ච දමෙ ච සංයමෙ
242
සද්ධාය සීලෙන සුතෙන බුද්ධියා
266
සත්තවුස්සදෙ ඉධාභිගච්ඡති 250
සම්ඵප්පලාපං න අබුද්ධතන්ති 280
ස සීහපුබ්බද්ධ සුසණ්ඨිතො අහු 266
ස හි ච පන ඨිතො අනොනත
මන්තො 264

සා

සාතාගිරො හෙමවතො 330, 348

සි

සිප්පෙසු විජ්ජාචරණෙසු කම්මෙසු
250

සී

සීහො ති අත්තානං සමෙක්ඛියාන ...

සු

සුකසාළිකසද්දෙත්ථ 324 ,342
සුගතීසු සො ඵලවිපාකං 270, 278
සුභුජො සුසු සුසණ්ඨිතො
සුජාතො 248

සෙ

සෙතා සුසුක්කා මුදුතූල සන්නිභා 274

සො

සො තෙන කම්මෙන තිදිවං
සමක්කමි 244
සො තෙන කම්මෙන දිවං
අපක්කමි 242, 262

හ

හත්ථියානං අස්සයානං 322, 340

හි

හිතං දෙවමනුස්සානං 316, 334

හො

හොති පානසභා නාම 296

# දීඝනිකායෙ – පාථිකවග්ග

## සඤ්ඤානාමානුක්කමනිකා


| | |
|---|---|
| අම්බර අම්බරවතියො | 322 |
| ආටානාටා | 314 |
| ආටානාටියං | 313, 322, 324 |
| ආළකමන්ද | 322 |
| ආළවකො | 330 |
| උටය්වචිත්තකා | 324 |
| උත්තරකුරු | 320 |
| උදුම්බරිකාය | 58 |
| උදෙනං | 16 |
| කකුසන්ධස්ස | 314 |
| කපිවන්තො | 322 |
| කලන්දකනිවාපෙ | 288 |
| කස්සපස්ස | 314 |
| කළාරමට්ටුකො | 14, 16 |
| කාමසෙට්ඨො | 330 |
| කුවෙරො | 324 |
| කුවෙරස්ස | 322 |
| කුවෙරනලිනී | 324 |
| කුසිනාටා | 322 |
| කෙතුමතී | 130 |
| කොණාගමනො | 314 |
| කොරක්ඛත්තියං | 10 |
| ඛුලුසු | 10 |
| ඛෙමා | 304 |
| ගග්ගරාය | 468 |
| ගිජ්ඣකූටා | 60,312 |
| ගොතමකං | 16, 142 |
| චන්දනො | 330 |
| චම්පායං | 468 |
| චිත්තසෙනො | 330 |
| චුන්දස්ස | 352 |
| චුන්දෙ | 196 |
| ජම්බුදීපො | 132 |
| ජාලියො | 34, 40 |
| ජීවංජීවක | 324 |
| තතොජසී | 322 |
| තතොතලා | 322 |
| තතොලා | 322 |
| තත්තලා | 322 |
| තාවතිංසා දෙවා | 442 |
| තින්දුකාණු පරිබ්බාජකාරාමො | 28 |
| තුසිතා | 442 |
| තෙජසී | 322 |
| දළ්හනෙමි | 98 |
| දෙවසූතො | 330 |
| ධතරට්ඨො | 316 |
| ධරණී | 322 |
| නවනවුතියො | 322 |
| නාටපුරියා | 322 |
| නාතපුත්තො | 194 |
| නාළන්දයං | 166 |
| නිග්‍රොධො | 58, 62 |
| නිඝණ්ඩු | 330 |
| නිම්මානරතිනො | 442 |
| නෙමි | 320 |
| පඤ්චාලචණ්ඩො | 330 |
| පනාදෙ | 332 |
| පරකුසිතනාටා | 322 |
| පරකුසිනාටා | 322 |
| පරනිම්මිතවසවත්තිනො | 442 |
| පසෙනදී | 142 |
| පාථිකපුත්තො | 20 |
| පාවා | 352 |
| පාවායං | 194 |

| | |
|---|---|
| පාවාරිකම්බවනෙ | 166 |
| පාවෙය්‍යකානං | 352 |
| පුණ්ණකො | 330 |
| පුබ්බාරාමෙ | 136 |
| බාරාණසී | 130 |
| බාරාණසෙය්‍යකං | 446 |
| භගලවතී | 322 |
| භග්ගවගොත්තො | 2,56 |
| භාරද්වාජො | 136, 330 |
| හිරඤ්ඤවතිමහකෙ | 12 |
| මගධෙසු | 96 |
| මණී | 330 |
| මල්ලෙසු | 2,352 |
| මහානෙරූ | 320 |
| මහාපනාදෙන | 132 |
| මාණී | 330 |
| මාතලී | 330 |
| මාතුලායං | 96 |
| මෙත්තෙය්‍යො | 130 |
| මිගාරමාතුපාසාදෙ | 136 |
| මුචලින්දො | 330 |
| මොරනිවාපෙ | 60 |
| යාමා | 442 |
| රාජගහෙ | 288, 312 |
| වජ්ජිගාමෙ | 8, 14, 16 |
| වරුණො | 330 |
| වාසෙට්ඨභාරද්වාජා | 136 |
| විජිතාවී | 236 |
| විපස්සිස්ස | 314 |
| විරූළ්හො | 318 |
| විසාඛා | 322 |
| වෙධඤ්ඤා | 194 |
| වෙසාලියං | 14 |
| වෙසාලිං | 16 |
| වෙස්සභුස්ස | 314 |
| වෙස්සවණො | 312, 314, 322 |
| වෙස්සාමිත්තො | 330 |
| වෙළුවනෙ | 288 |
| සක්කෙසු | 194 |
| සක්‍යපුත්තස්ස | 316 |
| සක්‍යා | 142 |
| සඞ්ඛො | 130 |
| සත්තම්බං | 16 |
| සන්ධානො | 56, 58 |
| සාතාගිරො | 330 |
| සාමගාමො | 196 |
| සාරිපුත්තො | 166 |
| සාවත්ථියං | 136 |
| සිඛිස්ස | 311, 314 |
| සිගාලකො | 288 |
| සීවකො | 330 |
| සුදස්සනො | 320 |
| සුනක්ඛත්තො | 4 |
| සුප්පගෙධො | 330 |
| සුමාගධාය | 60 |
| සුමුඛො | 330 |
| සෙරිස්සකො | 330 |
| සොමො | 330 |

# දීඝනිකායෙ පාථිකවග්ගෙ

## පදානුක්කමනිකා


අ

| | |
|---|---|
| අකට්ඨපාකිමං | 320 |
| අකට්ඨපාකො | 150, 254 |
| අකණ්හං | 320 |
| අකණ්හඅසුක්කවිපාකං | 388 |
| අකණ්හො | 150 |
| අකම්මාසෙහි | 384 |
| අකසිරලාභී | 190 |
| අකිච්ඡලාභී | 190 |
| අකිත්තිස ඤ්ඤත්තානි | 292 |
| අකිඤ්චනො | 296 |
| අකුප්පං ඤාණං | 470 |
| අකුප්පා චෙතොවිමුත්ති | 470 |
| අකුලං | 296 |
| අකුසලකම්මපථා | 462 |
| අකුසලධාතුයො | 362 |
| අකුසලමූලානි | 362, 474 |
| අකුසලවිතක්කා | 362 |
| අකුසලසඞ්කප්පා | 362 |
| අකුසලසඤ්ඤා | 362 |
| අක්කොසන්ති | 136 |
| අක්ඛණා | 452, 514 |
| අක්ඛමමානො | 70 |
| අක්ඛමා | 386 |
| අක්ඛාතං | 292 |
| අක්ඛිප්පියො | 296 |
| අක්ඛෙහි | 296 |
| අටණ්ඩෙහි | 384 |
| අගතිගමනානි | 306 |
| අගමං | 170 |
| අගාරවා | 414, 492 |

අ

| | |
|---|---|
| අගාරිකභූතො | 222 |
| අගුත්තො | 292 |
| අග්ගඤ්ඤෙ | 380 |
| අග්ගඤ්ඤං | 16, 40 |
| අග්ගප්පත්තා | 78, 84 |
| අග්ගී | 366 |
| අඞ්ගාරකාසූපමා | 502 |
| අඞ්ගීරසස්ස | 316 |
| අචිරකාරිතං | 352 |
| අචෙලකො | 64 |
| අචෙලො | 10 |
| අච්චිං | 42 |
| අච්ඡන්ති | 158 |
| අච්ඡරියාතං | 308 |
| අච්ඡාදෙසි | 144 |
| අච්ඡිදෙහි | 384 |
| අච්ඡින්නවුත්ති | 310 |
| අජායිසුං | 274 |
| අජිතො | 24 |
| අජිතකප්පං | 66 |
| අජිනානි | 66 |
| අජෙළකං | 118 |
| අජ්ජවං | 360 |
| අජ්ඣත්තිකබාහිරානි | 172 |
| අජ්ඣත්තිකානි | 412 |
| අජ්ඣාචරිතුං | 222 |
| අජ්ඣායකං | 158 |
| අජ්ඣාවසති | 236 |
| අජ්ඣ සසං | 60 |
| අජ්ඣාපන්නො | 68 |

අ

අජ්ඣුපගතා 136
අජ්ඣුපෙය්‍යං 36
අජ්ඣුපෙසි 36
අඤ්ජනවණ්ණාති 238
අඤ්ජලිකම්මං 142
අඤ්ඤතිත්ථිකෙන 56, 62
අඤ්ඤතිත්ථියා 222
අඤ්ඤත්‍රාචරියකෙන 62
අඤ්ඤත්‍රායොගෙන 56, 62
අඤ්ඤථාසඤ්ඤීනො 230
අඤ්ඤදත්ථු 86
අඤ්ඤදත්ථුදසො 46, 224
අඤ්ඤදත්ථුහරො 298
අඤ්ඤදිට්ඨිකෙන 56, 62
අඤ්ඤමඤ්ඤම්හි 120
අඤ්ඤරුචිකෙන 56, 62
අඤ්ඤවිහිතකෙන 224
අඤ්ඤාණත්ථං 94
අඤ්ඤාතානං 168
අඤ්ඤාවිත්තං 86
අට්ඨමහ 152
අට්ඨඞ්ගිකො මග්ගො 170, 508
අඩ්ඪතෙය්‍යවස්සසහස්සායුකා 116
අතච්ඡං 224
අතන්දිතො 178
අතික්කන්තමානුසකාය 60, 84
අතිධාතො 294
අතිපාතො 294
අතිබ්‍යා 118
අතිමඤ්ඤන්ති 196
අතිවෙලං 150
අතිසායං 294
අතිසීතං 294
අතීතං අද්ධානං 14, 222
අතීරකං 222

අ

අත්තඤ්ඤූ 428
අත්තනාපි 224, 326
අත්තදීපා 96
අත්තන්තපො 392
අත්තපරිතාපන 392
අත්තභාවෙ 186
අත්තභාවපටිලාභා 390, 392
අත්තරූපාය 136
අත්තසරණා 96
අත්තසංචෙතනා 3
අත්තහිතාය 392
අත්තා 292
අත්තානුක්කංසෙති 68
අත්ථකාරණා 298
අත්ථක්ඛායී 300
අත්ථචරියා 310
අත්ථචරියාය 250, 306
අත්ථඤ්ඤූ 428
අත්ථෙධා 310
අත්ථපටිසංවෙදී 408
අත්ථසංහිතං 224, 226
අත්ථා 296
අත්ථූපෙතං 214
අද්ධුසො 150
අඩ්ඪං 80
අද්ධගතො 204
අඩ්ඪමාසිකං 64
අද්ධා 168, 200, 202, 364
අද්ධුතො 144
අද්වෙජ්ඣවාචො 274
අධම්මරාගො 116
අධම්මසම්මතං 150
අධිකරණසමථා 432
අධිගණ්හාති 240
අධිච්චසමුප්පන්නං 54, 228

අ

අධිජෙගුච්ඡෙ 62
අධිට්ඨානානි 386
අධිපඤ්ඤත්ති 230
අධිමුත්තං 442
අධිමුත්තො 448
අධොකෙසමත්ථකා 174
අනගාරියං 48
අනජ්ඣාවුත්ථං 352
අනඤ්ඤථා 470
අන ඤ්ඤු 236
අනඤ්ඤසරණා 96
අනතික්කමනීයං 222
අනතිචරියාය 306
අනත්තමනතං 10, 108
අනත්ථතා 296
අනත්ථසංහිතං 224
අනන්තරා 142
අනභාවං ගමෙති 382
අනභිනන්දිත්වා 214
අනභිභූතො 46, 224
අනභිරති 46
අනභිසම්භුනමානා 158
අනයං 44
අනරියවොහාරා 390, 392
අනවජ්ජතා 216
අනවමතෙන 200
අනවමානනාය 306
අනවයභං 326
අනසනං 128
අනස්සාම 86
අනාගාමිනො 402
අනාදීනවදස්සාවී 68
අනාවටද්වාරතාය 308
අනාවත්තිධම්මො 180
අනාවිලසඞ්කප්පා 462

අ

අනාසවා ඉද්ධි 188
අනික්ඛිත්තධුරො 400, 460
අනිමිත්තා 424
අනිස්සරණපඤ්ඤෙ 68
අනිය්‍යානිකො 114, 196, 198
අනීකට්ඨා 108
අනුකම්පති 306
අනුක්කමමානා 168
අනුගවෙසෙය්‍ය 326
අනුවච්චමනං 40
අනුවච්චාමිංසු 136
අනුජානන්ති 298
අනුඤ්ඤෙය්‍යං 70
අනුත්තරියානි 368, 424, 496
අනුත්ථුනිංසු 146
අනුද්ධතො 80
අනුධම්මචාරී 196, 198
අනුනෙතා 310
අනුපධිකා ඉද්ධි 188
අනුපනාහී 76
අනුපරියායපථං 168
අනුපසමසංවත්තනිකො 194, 196, 198
අනුපියා 2
අනුපුබ්බවිහාරා 454
අනුපුබ්බනිරොධා 530, 456
අනුප්පත්තසදත්ථො 140, 164, 222
අනුප්පදස්සාමි 156, 304
අනුප්පදෙති 300
අනුප්පදයී 110
අනුප්පාදෙ ඤාණං 360
අනුප්පියභාණී 298
අනුයන්ති 320
අනුයුත්තා 142, 220
අනුයුත්තෙසු 100

අ


| | |
|---|---|
| අනුයොගමන්වාය | 48, 174 |
| අනුයොගාය | 402 |
| අනුරක්ඛනප්පධානං | 382 |
| අනුවත්තති | 194 |
| අනුවිචරිතං | 224 |
| අනුවිචාරෙති | 410 |
| අනුවිතක්කෙති | 410 |
| අනුවිලොකෙති | 36 |
| අනුසයා | 432 |
| අනුසාසනවිධා | 180 |
| අනුසොචති | 294 |
| අනුස්සතිට්ඨානානි | 424, 490 |
| අනුස්සරති | 224 |
| අනෙළකං | 144 |
| අනොත්තප්පං | 358 |
| අනොනමන්තා | 238 |
| අන්තරධානං | 202 |
| අන්තලික්ඛචරා | 46, 144 |
| අන්තලික්ඛෙ | 322 |
| අන්තමත්තානි | 86 |
| අන්තමත්තානෙව | 60 |
| අන්තරාපරිනිබ්බායී | 402 |
| අන්තා | 364 |
| අන්තෙවාසිකමන්තා | 94 |
| අන්ධකාරතිමිසා | 144 |
| අන්ධකාරා | 144 |
| අන්වෙති | 242 |
| අන්වයෙ | 382 |
| අන්වායිකො | 272 |
| අන්වාස්සවෙය්‍යුං | 380 |
| අපක්කමි | 14 |
| අපචායමානො | 100 |
| අපජ්ඣිතො | 294 |
| අපදානං | 152 |
| අපනුදිතා | 244 |


අ


| | |
|---|---|
| අපරංකාරො | 228 |
| අපරජ්ජා | 30 |
| අපරිග්ගහා | 320 |
| අපරිසාවචරො | 60 |
| අපසාදෙතබ්බො | 214 |
| අපසාදෙතා | 70 |
| අපායමුඛානි | 292 |
| අපායසහායො | 298 |
| අපිසුණා | 316 |
| අපෙත්තෙය්‍යතා | 116 |
| අප්පච්චයං | 16, 258 |
| අප්පටිකූලසඤ්ඤී | 188 |
| අප්පටික්කොසිත්වා | 214 |
| අප්පටිනිස්සජ්ජිත්වා | 22 |
| අප්පටිභාණා | 94 |
| අප්පටිවාණිතා | 360 |
| අප්පටිවිරතා | 314 |
| අප්පටිසරණෙ | 194 |
| අප්පතිට්ඨිතං | 176 |
| අප්පධංසියො | 280 |
| අප්පතිඝොසානි | 60, 314 |
| අප්පමඤ්ඤා | 376 |
| අප්පමාදමන්වාය | 48 |
| අප්පමාදාධිකරණං | 398 |
| අප්පමාදෙ | 468 |
| අප්පසද්දකාමා | 58 |
| අප්පසද්දවිනීතා | 58 |
| අප්පසද්දං | 58 |
| අප්පසද්දානි | 314 |
| අප්පසන්නා | 312 |
| අප්පාතංකො | 268 |
| අප්පාබාධො | 268 |
| අප්පායුකතරා | 48 |
| අප්පිච්ඡස්ස | 516 |
| අප්පිච්ඡතා | 192 |

# පදානුක්කමණිකා


අ

අප්පෙකච්චෙ 312
අප්පෙවනාම 58
අබ්බොච්ඡින්නං 176
අබ්භනුජානාති 190
අබ්භනුමොදිතා 260
අබ්භන්තරෙහි 242
අබ්භාචික්ඛාමි 192
අබ්භුක්කිරි 104
අබ්භොකාසං 80, 136
අබ්භොකාසිකො 66
අබ්‍යත්තා 224
අබ්‍යාකතං 226
අබ්‍යාපන්නචිත්තා 80
අබ්‍රහ්මඤ්ඤතා 116
අභබ්බට්ඨානානි 396
අභබ්බො 22, 222
අභවෙන 300
අභිකඞ්ඛී 26
අභික්ඛණං 192
අභිජාතියො 426
අභිජායති 426
අභිජ්ඣාව්‍යාපාද 116
අභිඤ්ඤා 496
අභිඤ්ඤෙය්‍යො 58, 172, 468,502
අභිණ්හසො 318
අභිධම්මෙ 458
අභිනිවජ්ජෙත්වා 188
අභිනිවජ්ජෙය්‍යාසි 102
අභිනිවුත්ථපුබ්බො 186
අභිනීලනෙත්තො 238, 270
අභිපාලෙති 316
අභිභායතනානි 414, 518
අභිභූ 46, 224
අභියොගිනො 270
අභිරුතා 322

අ

අභිවදන්ති 530
දභිවාදනං 142
අභිවිජිය 236
අභිවිනයෙ 458
අභිවිස්සජී 258
අභිසම්පරායෙ 142
අභිසම්බුද්ධා 470
අභිහටං 64
අභිහරති 84
අභූතවචනං 292
අභූතෙන 192
අමත්තෙය්‍යතා 116
අමනුස්සා 324
අමමා 320
අමූළ්හවිනයො 432
අම්බවනෙ 352
අයිරකෙන 308
අයොඛීලො 222
අයොනිසොමනසිකාරො 470
අරක්ඛෙය්‍යානි (තථාගතස්ස) 364
අරඤ්ඤෙ 314
අරඤ්ඤායතනෙ 158
අරහති 20
අරිට්ඨො 322
අරියකන්තෙහි 384
අරියධනානි 426, 498
අරියවංසෙ 380
අරියවාසා 462
අරියවොහාරා 392
අරියසච්චානි 478
අරියස්ස විනයෙ 288
අරියා ඉද්ධි 188
අරූපීසු 186
අලඞ්කාරානුප්පදානෙන 306
අලජ්ජී 24

අ

අලමෙත්තා 308
අලමරියසඞ්ඛාතං 135, 136
අලම්පතෙය්‍යා 118
අලසකෙන 12
අලං 458
අලිකං 274
අල්ලකෙසො 288
අල්ලවත්ථො 288
අල්ලීනං 30
අල්ලීනා 62
අවවාසිං 86, 90
අවජ්ජිතසමාදනො 240
අවරුද්ධා 326, 328
අවික්ඛම්භියො 242
අවික්ඛෙපො 360
අවිචිණ්ණං 194
අවිජ්ජා 358
අවිතථා 470
අවිනිපාතධම්මා 180
අවිරළ දන්තා 233
අවිවයහං 326
අවිසංවාදකො 274
අවිසංවාදනතාය 306
අවිහිංසා 314, 360
අසංඛාරපරිනිබ්බායී 402
අසජ්ජමානො 188
අසඤ්ඤසත්තා 54
අසඤ්ඤීසු 184
අසද්ධම්මා 428
අසද්ධම්මෙ 150
අසනිවක්කං 70
අසන්තුට්ඨිතා 360
අසමයා 452
අසමයො 58

අ

අසම්පජඤ්ඤං 360
අසම්පවෙධී 222
අසම්පායමන්තා 16
අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ 194, 196, 198
අසයංකාරො 228
අසස්සතො 228
අසහිතං 194
අසංහාරියා 142
අසාමඤ්ඤතා 116
අසාහසෙ 242
අසුරකායො 12
අසෙක්ඛා 466
අසෙවිතබ්බා 135
අසෙසමභිජාති 170
අස්මිමානො 470
අස්මිතිමානස්ස 424
අස්සවො 252
අස්සාම 120
අස්සාසප්පත්තා 60, 62
අහානධම්මතං 266
අහිරිකං 358
අහො වත 46

ආ

ආකඞ්ඛති 224
ආකඞ්ඛමානා 136
ආකොටෙයි 14
ආඝාතපටිවිනයා 450, 526
ආඝාතවත්ථූනි 448, 526
ආඝාතො 120
ආචරියකං 44
ආචරියපාචරියානං 88
ආචරියභරියා 118
ආවාමහකෙබා 64

**ආ**

ආචික්ඛති 300
ආතප 216
ආතප්පමන්වාය 48
ආතප්පාය 402
ආදස්සයමානො 70
ආදිබ්‍රහ්මචරියකං 60, 206
ආදියති 80, 172
ආදියන්ති 326, 328
ආදියාපෙති ɛ0
ආදීනවදස්සාවී 380
ආදෙසනවිධා 172
ආධිපතෙය්‍යානි 370
ආනන්තරිකො සමාධි 470
ආනුකම්පකො 300
ආනුතප්පො 202
ආපත්තිකුසලතා 358
ආපදාසු 300, 306
ආපාතකනිසාදී 70, 76
ආපානකත්තමනුයුත්තො 66
ආපානකො 66
ආපායිකො 8
ආපූරති 292
ආභස්සරකායා 144
ආභස්සරසංවත්තනිකා 46
ආභිචෙතසිකාන 190
ආමිසානුප්පදානෙන 308
ආමො 44
ආයතනකුසලතා 360
ආයතනං 120, 292
ආයතනානි 412, 534
ආයතනපඤ්ඤත්ති 172
ආයතපණ්හී 238
ආරකා 300
ආරක්ඛප්පධානං 332
ආරම්භවත්ථු 436, 512

**ආ**

ආරම්මණං 96
ආරුප්පං 376
ආරොපිතො 194
ආලස්සානුයොගො 292
ආලිඞ්ගිත්වා 120
ආලොකකරණතා 480
ආලොකසඤ්ඤී 80
ආවාහවිවාහකානං 294
ආවිඤ්ජෙය්‍ය 34
ආවිසති 328
ආවීකත්තා 478
ආවීභාවං 188
ආවුධානි 368
ආසණී 166, 168
ආසවට්ඨානියෙහි 502
ආසාදිම්හසෙ 16
ආසජ්ජ 440
ආසනපටික්ඛිත්තො 66
ආසයා 36
ආසවා 364
ආසවානං 216
ආසාදනා 38
ආසාදෙතබ්බං 40
ආහතචිත්තො 402, 480
ආහාරට්ඨිතිකා 358, 470
ආහාරා 384, 476
ආහාසි 152
ආහාරෙති 64

**ඉ**

ඉබ්භ 86
ඉච්ඡා 128
ඉච්ඡාවිනයෙ 428
ඉට්ඨා 394
ඉතරීතරෙන 380

ඉ

ඉට්ඨං 46
ඉත්ථිලිඞ්ගං 150
ඉද්ධං 206
ඉද්ධිපාදං 132, 170, 372
ඉද්ධිවිධං 188
ඉද්ධිවිධායො 188
ඉද්ධො 130
ඉන්දඛීලො 222
ඉන්දනාමො 316
ඉන්දු 330
ඉන්ද්‍රියානි 368
ඉබ්භා 136
ඉස්සරකුත්තා 44
ඉස්සරියවොස්සග්ගෙන 306
ඉස්සාමච්ඡරියං 70

උ

උක්කුටිකප්පධානං 66
උක්කුටිකො 66
උක්කොටන 282
උච්චාසද්දමහාසද්දය 58
උජුජාතිකො 90
උජ්ඣාපෙතබ්බං 330
උට්ඨානකො 310
උට්ඨානදෙසිතා 296
උට්ඨානෙන 304
උණ්ණා 238, 274
උතුනියො 136
උතුපරිස්සයවිනොදනං 216
උත්තරකා 10
උත්තරිං 172
උත්තරිංඅභිඤ්ඤායං 188
උදකොරොහණානුයොගං 66
උත්තර තරං 170
උත්තානීකතං 204
උත්තාසං 244
උදයත්ථගාමිනියා 400, 460
උදරාවදෙහකං 404
උදික්ඛිතා 270
උද්දිස්සකටං 64
උද්ධග්ගලොමො 238
උද්ධග්ගිකං 110
උද්ධච්චකුක්කුච්චං 80, 82
උද්ධම්භාගියානි 396
උද්ධරති 240
උද්ධං පාදතලා 174
උපක්කිලෙසෙ 66, 80
උත්තාදිනියා 58
උපකාරො 300
උපක්කමිංසු 110, 146
උපට්ඨපෙත්වා 400
උපට්ඨානෙන 304
උපචිතත්තා 240
උපඩ්ඪපථං 20
උපතිට්ඨෙය්‍යා 326
උපනිපජ්ඣායති 52, 150
උපනිපජ්ජෙය්‍යා 322
උපනිබ්බත්තං 156
උපනිසීදෙය්‍යා 322
උපපජ්ජමානො 186
උපලිප්පති 238
උපවත්තති 274
උපවාදකා 84
උපවිචරති 414
උපසමසංවත්තනිකෙ 202
උපහච්චපරිනිබ්බායී 402
උපාදානක්ඛන්ධා 480
උපාදානානි 388
උපාදානියො 468
උපෙක්ඛා 422

## උ


| | |
|---|---|
| උපෙක්ඛාසහගතෙන | 80 |
| උපෙක්ඛූපවිචාරා | 414 |
| උපොසථුපවාසෙ | 240 |
| උප්පාදෙතබ්බා | 468 |
| උබ්බෙගං | 244 |
| උබ්භට්ඨකො | 66 |
| උබ්භතකං | 352 |
| උබ්භමුප්පතිතලොමවා | 254 |
| උභතොභාගවිමුත්තො | 176 |
| උභයවොකිණ්ණෙසු | 140 |
| උභොහි | 238 |
| උම්මුජ්ජනිමුජ්ජං | 188 |
| උලූකපක්ඛං | 66 |
| උස්සද | 248 |
| උස්සඞ්ඛපාදෙ | 238 |
| උස්සන්නත්තා | 240 |
| උස්සාදෙතබ්බා | 214 |
| උස්සූරසෙය්‍යා | 296 |
| උළාරපාමොජ්ජා | 458 |
| උළාරා | 312 |


## එ


| | |
|---|---|
| එකබුරං | 320 |
| එකච්චං | 190 |
| එකච්චානං | 120 |
| එකද්වාරං | 168 |
| එකදීඝිකාය | 12 |
| එකනාමා | 316 |
| එකන්තනිබ්බිදාය | 220 |
| එකපස්සයිතො | 66 |
| එකංසො | 166 |
| එකාගාරිකො | 64 |
| එකාරක්ඛො | 462 |
| එකාලොපිකො | 64 |
| එකාහිකං | 64 |
| එකෙකලොමො | 238 |
| එකොදකීභූතං | 144 |
| එණිජඞ්ඝං | 238 |
| එතදනුත්තරියං | 170 |
| එරයං | 252 |
| එසනා | 364 |
| එසිකට්ඨායී | 182 |
| එළකමන්තරං | 64 |


## ඔ


| | |
|---|---|
| ඔක්කමති | 390 |
| ඔක්කමී | 144 |
| ඔඝා | 388, 476 |
| ඔජසි | 322 |
| ඔතාරං | 96 |
| ඔත්තප්පං | 358 |
| ඔදනකුම්මාසං | 14 |
| ඔදහන්ති | 86 |
| ඔදාතවසනා | 194 |
| ඔධාරිතා | 22 |
| ඔපපාතිකො | 180 |
| ඔපසමිකො | 452, 514 |
| ඔපායිකරානි | 214 |
| ඔරම්භාගියානි | 182, 396 |
| ඔරොධෙය්‍යාම | 60 |
| ඔරසො | 142 |
| ඔවරණං | 312 |
| ඔසක්කන්ති | 98 |
| ඔසධීතාරකා | 520 |
| ඔසරන්ති | 156 |
| ඔසක්කිතං | 98 |
| ඔහිතභාරො | 140, 164, 222 |

ක

කඞ්ඛා 192, 364
කඞ්ඛවිතස නත්ථිහතතවො 238
කටසීසු 40
කණ්හපක්ඛා 64
කණ්ණො 136
කණිකාරපුප්ඵං 520
කණ්ටකාපස්සෙ 66
කණ්ටකාපස්සයිකො 66
කණ්හවිපාකා 135, 388
කණ්හසුක්කසප්පටිභාගො 170
කණ්හාභිජාතිකො 426
කතකරණීයෙ 140, 164
කත්තා 46
කථංකථාසල්ලං 424
කථං විහිතකං 44
කථාපාහතං 196
කථාවත්ථූනි 370
කඳරං 80
කප්පං 132
කප්පාවසෙසං 132
කප්පාසිකසුඛුමානං 258
කප්පො 436
කමති 390
කම්මකිලෙසා 290
කම්මන්තසංවිධානෙන 308
කම්මෙන 110, 160
කම්මානි 388
කම්මාරපුත්තස්ස 352
කරතියො 330
කරවීකභාණී 238
කරහචි 46
කරුණා 420

ක

කරුණාසහගතෙන 80
කරෙහි 264
කලම්බුකා 148
කලහජාතා 194
කලහප්පවඩ්ඪනී 292
කලොපිමුඛා 64
කල්‍යාණ පටිභාණො 178
කල්‍යාණෙ 300
කල්‍යාණමිත්තතා 358
කල්‍යාණසහායො 498
කල්ලංවචනාය 142
කසිණායතනානි 460, 534
කාණා 86
කාමගුණා 394
කාමූපපත්තියො 366
කාමූපසංහිතා 394
කායගතාසති 468
කායවූපකාසෙන 506
කායසක්ඛී 176
කායානුපස්සී 96
කාලකංජිකා 12
කාලඤ්ඤූ 428
කාලෙසව 288
කාළපක්ඛ 296
කාහිති 296
කිච්චකරණීයෙ 300
කිච්චාපදෙස බහුලස්ස 294
කිඤ්චන 366
කිඤ්චරහි 168
කිත්තිවණ්ණහරා 308
කිත්තිසද්දු 330
කිලිස්සෙයුං 254

කු

කුකුත්ථකා 324
කුක්කුටසම්පාතිකා 130
කුක්කුටසූකරා 118
කුක්කුරවතියො 10
කුටට්ඨො 182
කුණ්ඩලාවට්ටානි 238
කුද්‍රූසකො 118
කුම්භණ්ඩපවාරො 326
කුම්භණ්ඩපොතකො 326
කුම්භණ්ඩපොතිකා 326
කුම්භණ්ඩසෙනාය 312
කුම්භණ්ඩපාරිසජ්ජා 326
කුම්භණ්ඩමහාමත්තා 326
කුම්භණ්ඩානං 318
කුම්භණ්ඩී 326
කුම්භථූනං 292
කුමස්මුඛා 64
කුලවංසං 304
කුලෙජෙට්ඨාපචායිනො 116, 240
කුසචීරං 66
කුසලකම්මපථා 462
කුසලතා 360
කුසලධාතුයො 362
කුසලමූලානි 362, 474
කුසලවිතක්කා 362
කුසලසඞ්කප්පා 362
කුසලසඤ්ඤා 362
කුසීතවත්ථූනි 434, 508
කුහකො 178
කුළීරකා 324
කූටාගාරසාලායං 14

කෙ

කෙවලකප්පං 311
කෙසකම්බලං 66
කෙසමස්සුලොචකො 66

කෙ

කෙසමස්සුලොචනානුයොග-
මනුයුත්තො 66
කොකිලාදිහි 322
කොඤ්චා 322
කොණපාති 40
කොත්ථු 40
කොපීනනිදංසනී 292
කොසල්ලානි 370
කොසොහිතවත්ථගුය්හ 238
ක්ව 292

ඛ

ඛත්තියො 158
ඛන්ති 360
ඛන්තිසොරච්ච 102
ඛමා 386
ඛමනතං 242
ඛයෙ ඤාණං 360
ඛරත්තං 148, 150
ඛරස්සරෙන 110
ඛළුමූසිකායො 40
ඛිඩ්ඩාපදොසිකා 50
ඛිඩ්ඩාරතියො 242
ඛිප්පාභිඤ්ඤා 178
ඛීණාසවබලානි 502
ඛීණාසවා 140
ඛීණාසවො 222
ඛීයිතත්තං 156
ඛීයෙය්‍ය 156
ඛීලජාතො 402, 480
ඛුද්දකමධු 144
ඛොමසුඛුමානං 258

ග

ගණ්ඨිකා 108
ගණ්ඨිතාය 186
ගතිමා 178
ගතියො 396
ගධිතො 68
ගන්ථා 386
ගන්ථෙ 158
ගන්ධබ්බපචාරො 326
ගන්ධබ්බපාරිසජ්ජා 326
ගන්ධබ්බපොතකො 326
ගන්ධබ්බපොතිකා 326
ගන්ධබ්බමහාමත්තා 326
ගන්ධබ්බසෙනාය 312
ගන්ධබ්බි 326
ගන්ධබ්බො 330
ගබ්භාවක්කන්ති 172, 390
ගබ්භිනී 64, 136
ගම්භීරනෙමො 222
ගරහා 156
ගරහිතබ්බං 156
ගරහභයා 156
ගරුට්ඨානියො 484, 408
ගහණියා 268, 478
ගහපතිනෙචයිකා 20
ගාමසාමන්තං 158
ගාමඝාතකං 110
ගාරවා 414
ගාරවි 492
ගාරය්හං 192
ගාවිං 320
ගාළ්හබන්ධනං 110
ගිරිගුහං 80

ගි

ගිලානුපට්ඨානෙන 308
ගිහිනියො 206

ගු

ගුත්තද්වාරතා 360
ගුත්තියා 314
ගුම්බං 312
ගුය්හං 300

ගො

ගොචරෙ 96
ගොත්තපටිසාරිනො 164
ගොපාලො 330
ගොපඛුමො 238, 270
ගොමයං 150
ගොමයභක්ඛා 64

ඝ

ඝාසමෙසානා 158

ච

චක්කවත්තිවත්තං 100
චක්කවත්ති 130, 236
චක්කානි 238
චක්ඛුමන්තස්ස 314
චක්ඛුවිඤ්ඤෙය්යා 394
චක්ඛූනි 368
චණ්ඩ 326
චතුරාපස්සෙනො 404, 462, 536
චතුහිකං 64
චත්තාලීස දන්තා 238
චන්දිමසූරියා 146
චවමානෙ 186
චාතුකුණ්ඩිකො 10
චාතුම්මහාරාජිකා 442

චා

චාතුයාමසංවරසංවුතො 78
චාතුරන්තො 98, 236
චාරිකං 352
චාවෙතුං 40

චි

චිතන්තරංසො 238, 266
චිත්තවූපකාසෙන 506
චිත්තසමාධි 132
චිත්තානුපස්සී 96
චිරට්ඨිතිකං 358
චිරපබ්බජිතො 204
චිරප්පනට්ඨෙ 260

චු

චුතූපපාතඤාණෙ 186

චෙ

චෙතසො උපක්කිලෙසෙ 168
චෙතසො විනිබන්ධා 402
චෙතොඛිලා 402, 480
චෙතොපණිධි 442
චෙතොපරියඤාණං 168
චෙතොඵරණතා 480
චෙතොවිමුත්ති 420
චෙතොසමාධිං 48, 176
චොදකෙන 400
චොදනාවත්ථූනි 366

ඡ

ඡන්දසමාධිපධාන-
සංඛාර සමන්නාගතං 132
ඡන්දගති 222
ඡමා 10
ඡවදුස්සානි 66
ඡවො 38
ඡවිමංසං 176
ඡළඞ්ගසමන්නාගතො 462
ඡාහිකං 64

ජ

ජණ්ණුකානි 238, 264
ජනපදත්ථාවරියප්පත්තො 98, 236
ජනෙසභො 330
ජනොඝං 322
ජයාපෙක්ඛො 178
ජරසිගාලො 38
ජරා 128
ජාගරියානුයොගා 178
ජාතිජරාමරණියා 94
ජාලහත්ථපාදෙ 238
ජානං 318
ජූතප්පමාදට්ඨානානුයොගො 292

ඣ

ඣානානි 574
ඣායකා 158

ඤා

ඤාණදස්සනං 222
ඤාණවාදෙ 20
ඤාතික්ඛයං 120
ඤාණානි 474, 478, 382

ඨ

ඨිති 170
ඨානකුසලතා 360
ඨිතකො 238

ඩ

ඩංස 216

ත

තගර 136
තච්ඡං 224
තච්ඡා 174
තණ්ඩුලප්ඵලං 320
තණ්ඩුලප්ඵලො 150
තණ්හා 362, 364, 474
තණ්හාකායා 444, 492
තණ්හාමූලකා 526
තණ්හුප්පාද 386
තත්ථපරිනිබ්බායී 10
තථා 470
තථාකාරී 204
තථාගතො 224, 226
තථාවාදී 224
තථෙන 274
තදඞ්ගො 156
තදත්ථජොතකං 242
තදදිගුණං 300
තපං 66
තපස්සිතාය 80
තපස්සී 76
තපො උපක්කිලෙසා 66
තපොජිගුච්ඡා 62
තමොතමපරායනො 394
තස්සපාපියස්සිකා 432
තාවතකං 224
තාවදෙව 94
තිණගහණං 120
තිණභක්ඛා 64
තිණා (තීයෙය්‍යා) 296
තිණවත්ථාරකො 432
තිණානි 110
තිබ්බච්ඡන්දො 428, 502
තිට්ඨො 120

ති

තිරච්ඡානකථා 58
තිරීටානි 66
තිරොභාවං 188
තිහිකං 64
තුච්ඡකුම්භි 60, 86
තුණ්ඩිකීරෙ 320
තුලාකූට 282
තුලියං 264
තෙලං 118

ථ

ථණ්ඩිලසෙය්‍යා 66
ථාමවතා 190
ථීනමිද්ධං 80
ථුසො 152
ථුසොදකං 64
ථෙතො 274
ථෙය්‍යසඞ්ඛාතං 110
ථෙරා 366

ද

දක්ඛිණා 110
දක්ඛිණාවිසුද්ධියො 390
දක්ඛිණෙය්‍යා 432
දණ්ඩමන්තරං 64
දණ්ඩමාණවකානි 324
දත්තියා 64
දද්දුලභක්ඛා 64
දන්තකූටං 70
දන්ධාභිඤ්ඤා 178
දමා 386
දමෙ 242
දයාපන්නො 246
දසකුසලකම්මපථා 118
දසසඤ්ඤා 540

ද

දස්සනසමාපත්ති 174
දහති 442
දහන්ති 56
දළ්හපාකාරතොරණං 168
දළ්හසමාදානො 240
දළ්හුද්දාපං 681

දා

දානවත්ථූනි 440
දානසංවිභාගෙ 240
දානූපපත්තියො 442
දායකතො 390
දායජ්ජං 304
දාරභරණාය 294
දාරුපත්තිකන්තෙවාසී 34
දාරො 118
දාසකම්මකරා 308
දාලිද්දියං 110

දි

දිට්ඨං 224
දිට්ඨධම්මිකානං 216
දිට්ඨවාදිකා 392
දිට්ඨා 120
දිට්ඨානුගති 144
දිට්ඨිගතං 12
දිට්ඨිනිස්සයා 230, 234
දිට්ඨිපටිවෙධ 428
දිට්ඨිප්පත්තො 176
දිට්ඨිවිපත්ති 360
දට්ඨිවිසුද්ධි 360
දිට්ඨිසම්පදා 360
දිට්ඨෙ චෙව ධම්මෙ 142
දිත්තො. 38
දින්නාදායිනො 308

දි

දිප්පිස්සන්ති 118
දිබ්බන්ති 296
දිබ්බාය සොතධාතුයා 60
දිබ්බෙන චක්ඛුනා 84
දිවසො 316
දිවාසොප්පං 296
දිසා 288
දිසොදිසං 320
දීඝඞ්ගුලි 238
දීඝායුකතරො 48
දීඝො 330

දු

දුක්ඛිතා 364
දුක්ඛධම්මෙන 148
දුක්ඛා පටිපදා 178
දුච්චරිතානි 362
දුප්පටිවිජ්ඣා 468,482,492
දුප්පවෙදිතො 196,198
දුබ්බණ්ණතරා 146
දුබ්බණ්ණා 114
දුබ්බලීකරණී 292
දුබ්බලීකරණෙ 80
දුරක්ඛාතෙ 194
දුස්සීලො 398
දෙමනස්සුපවිචාරා 414
දෙවචස්සතා 356
දෙවාරිකො 108,168
දෙසන්තරෙන 400
දෙසාගතිං 222
ද්වාගාරිකො 64
ද්වාලොපිකො 64
ද්වාහිකං 64
ද්වෙහිකජාතා 194

### ධ


ධනජානි 292,294
ධම්මකායො 142
ධම්මකෙතු 100
ධම්මක්ඛන්ධා 386,488
ධම්මජො 142
ධම්මඤ්ඤූ 428
ධම්මදීපා 96
ධම්මද්ධජො 100
ධම්මනිම්මිතො 142
ධම්මනිසන්තීයා 428
ධම්මන්වයො 168
ධම්මපදානි 386
ධම්මපටිසංවෙදී 408
ධම්මභූතො 142
ධම්මයාගී 252
ධම්මසමන්නාගතං 50
ධම්මසමාදානානි 386
ධම්මසම්මතං 150
ධම්මසරණා 96
ධම්මසංහිතං 226
ධම්මා (අටය්) 504
ධම්මා (ඉද්ධිපාටිහාරියා) 6
ධම්මානුධම්මපටිපත්ති 382, 474
ධම්මානුධම්මපටිපන්නා 106,196
ධම්මානුපස්සී 96
ධම්මානුසාරී 176
ධංසතෙ 296
ධංසයන්ති 296
ධාතුකුසලතා 360
ධාතුයො 312,384,420,474
ධිතිමා 178
ධුත්තා 292,294
ධූමවා 48
ධූමායිත්වා 42


### න


නඑහිභද්දන්තිකො 64
නක්ඛත්තානි 144
නතිට්ඨභද්දන්තිකො 64
නදීවිදුග්ගා 120
නනූපසෙවනං 384
නමන්තු 314
නවට්ඨානානි 222
නවනීතං 118
නළවනං 100
නළො 330
නාගපවාරො 326
නාගපාරිසජ්ජා 326
නාගපොතකො 326
නාගපොතිකා 326
නාගමහාමත්තා 326
නාගසෙනාය 312
නාගිනී 326
නාගො 326
නාතපුත්තියෙසු 194
නාථකරණා 456,530
නානාගොත්තා 142
නානාජච්චා 142
නානත්තා 528
නානාකුලා 142
නානාතිත්ථියා 28
නානාදිජගණා 322
නානානාමා 102
නානුබ්‍යංජනග්ගාහී 380
නාභිසජ්ජී 258
නාමං 358
නාලං 60,294
නිකති 282
නිකිණ්ණං 10
නිකෙතං 240
නික්ඛිපති 240

න

නික්කුජ්ජෙය්‍යුං 326
නිග්ගහිතං 194
නිගණ්ඨා 194
නිගමඝාතං 110
නිගමසාමන්තං 158
නිග්‍රොධපරිමණ්ඩලො 238
නිච්චඵලා 322
නිච්ඡාතො 392
නිජිගිංසනකො 178
නිජ්ජරවත්ථූනි 504
නිජ්ජිණ්ණා 540
නිට්ඨං 170
නිදංසෙති 252
නිද්දසවත්ථූනි 428, 502
නිද්දිසති 224
නිධානවතිං 178
නිපච්චකාරං 142
නිපෙසිකා 178
නිඛිත්තරූපා 194
නිබ්බුතා 316
නිබ්බෙයෙහි 126, 194
නිබ්බෙධිකාය 400
නිමන්තනං 64
නිමිත්තග්ගාහී 380
නිමිත්තානුසාරී 424
නිමිත්තෙන 172
නිම්මාතා 46
නියතො 180
නියන්ති 326
නිය්‍යාතෙන්ති 304
නිරපෙක්ඛෙන 298
නිවාපවුත්ති 310
නිවාරෙතා 168

න

නිවිට්ඨො 142
නිවුසිතත්තා 46
නිවෙසෙති 300
නිසන්තියා 214
නිසෙධෙති 110
නිසෙධෙය්‍ය 110
නිස්සරණපඤ්ඤෙ 380
නිස්සරණියා 474, 492, 482
නිස්සරණියා ධාතුයො 420, 404
නිහීනසෙවී 296
නිහීයති 290
නිහීයරෙ 296
නීයන්ති 320
නීවරණානි 396, 408
නීවාරභක්ඛා 64
නුන්නානි 464
නෙකතිකා 294, 318
නෙක්ඛම්මඡන්දාභිරතො 44
නෙන්ති 330
නෙවසඤ්ඤානාසඤ්ඤී 186
නහාතකස්ස 314

ප

පක්කං 150
පක්ඛන්දති 404
පග්ගහනිමිත්තං 360
පග්ගාහො 360
පච්චත්තං 180
පච්චත්ථිකෙහි 242
පච්චනුභොති 188
පච්චන්තිමං 168
පච්චයා (අට්ඨ) 504
පච්චයිකො 274
පච්චවෙක්ඛණනිමිත්තං 480

**ප**

පච්චවෙක්ඛති 174
පච්චාසිංසති 442
පච්චුට්ඨානං 142
පච්චුට්ඨාසි 94
පච්චුපට්ඨාතබ්බා 304, 306
පච්චුපට්ඨිතා 304, 306
පච්චුපට්ඨිතො 120
පච්චුප්පන්නසුඛො 484
පෙච්චසන්තො 322
පච්ඡා 194
පච්ඡානිපාතිනො 308
පච්ඡාබාහං 110
පජාපති 330
පජ්ජන්තො 330
පජ්ජලිත්වා 42
පඤ්චක්ඛන්ධා 394
පඤ්චඞ්ගවිප්පහීනො 462
පඤ්චඤාණිකො 484
පඤ්චබලානි 170
පඤ්චාහිකං 64
පඤ්චින්ද්‍රියානි 120, 404, 480
පඤ්චුපාදානක්ඛන්ධා 394
පඤ්ජලිකො 288
පඤ්ඤාවිමුත්තො 176
පඤ්ඤාය දුබ්බලීකරණී 166
පඤ්ඤාවෙය්‍යත්තියං 60
පඤ්හබ්‍යාකරණානි 386
පටාකං 192
පටිකූලෙ 188
පටිග්ගාහකතා 390
පටිඝාතාය 216
පටිච්චසමුප්පාදකුසලතා 60
පටිච්ඡන්නා 70,304
පටිජානිස්සති 10
පටිඤ්ඤාය 432

**ප**

පටිපජ්ජාමි 304
පටිපදු 178,386
පටිභයං 300
පටිවානරූපා 194
පටිවිරතො 140
පටිවිරුළ්හං 150
පටිසඞ්ඛානබලං 360
පටිසන්ථරති 298
පටිසන්ථාරො 360
පටිසල්ලානසාරුප්පානි 60,314
පටිසල්ලානා 136
පටිසල්ලීනො 58
පටිසෙවන්ති 314
පටිසඞ්ඛාමි 216
පඨමො සස්සතවාදෙ 184
පණවෙන 110
පණීතපණීතං 170
පණ්ණකුටීසු 158
පතායති 322
පතිජීයි 258
පත්තක්ඛන්ධා 94
පත්තපරියාපන්නමත්තං 410
පත්තයොගක්ඛෙමා 201,206
පත්තං 224
පදක්ඛිණග්ගාහී 458
පදක්ඛිණාවත්තකජාතානි 238
පදුට්ඨචිත්තො 326
පධානක්ඛමාය 268,478
පධානමන්වාය 48
පධානස්මිං 360
පධානියඞ්ගානි 400,478
පධානෙසු 176
පනුන්නපච්චෙකසච්චො 462
පත්තානි 60,314

ප

පත්ථද්ධනං 110
පන්නමුසලා 156
පපං 296
පපටිකප්පත්තා 78
පබ්බතවිසමං 120
පබ්බන්ති 108
පබ්බාජනං 158
පබ්බාජෙතබ්බා 156
පබ්බාජෙය්‍ය 156
පමත්තං 300, 306
පයොජෙතුං 160
පයොජෙති 110
පරකතං 228
පරදාරසෙවනා 296
පරන්තපො 392
පරපුග්ගලවිමුත්තිඤාණ 8
පරප්පවාදං 204
පරම්මුඛා 298
පරසඤ්චෙතනා 390
පරසෙනප්පමද්දනා 98, 236
පරහිතාය 392
පරාභිභූ 242
පරාභූතරූපො 30
පරික්ඛීණභවසංයොජනො 140, 164, 222
පරිගූහති 300
පරිඤ්ඤෙය්‍යා 480, 498, 508, 468, 490
පරිණතො 54
පරිතස්සනා 46
පරිනිබ්බායිස්සති 102
පරනෙත්වා 110
පරිනිබ්බානිකො 452, 514
පරිපඤ්හෙය්‍යාසි 102
පරිපති 14

ප

පරිපුච්ඡෙය්‍යාති 102
පරිපුණ්ණසංකප්පො 66
පරිපුණ්ණාය 136
පරිපූරං 204
පරිබ්බාජකා 222
පරිබ්බාජකාරාමෙ 58
පරිභාසන්ති 136
පරිභාසාය 136
පරිභුඤ්ජති 320
පරිභූතො 294
පරිමුඛං 80
පරිමජ්ජති 188, 238
පරිමසති 188, 238
පරියන්තචාරිනී 86
පරියායභත්තභොජනානුයොගං 64
පරියායං 262
පරියායෙ 382
පරියුට්ඨිතචිත්තා 94
පරියෙසිතං 224
පරියොදපෙන්ති 308
පරියොනද්ධි 152
පරිරක්ඛන්තො 154
පරිවජ්ජෙය්‍ය 300
පරවිතක්කං 10
පරිසඤ්ඤූ 428
පරිසා 444
පරිහරෙය්‍යුං 192
පරිහිතො 18
පරිළාහො 150
පරොසහස්සං 236
පලාලපුඤ්ජං 80
පවත්තඵලභොජී 64
පවපන්ති 320
පවරො 252
පවස්සන්ති 322

ප

පවෙසෙතා 168
පසටමුජුමනො 270
පසංසති 202
පසාසතෙ 108
පසුං 320
පස්සද්ධකායසංඛාරො 462
පහාතබ්බා 468,480,492 508,526
පංසුකූලානි 66
පංසුං 150
පහානප්පධානං 382
පහානරතො 380
පහානාරාමො 380
පහූතජිව්හතා 238
පහොසි 194
පාකාරවිවරං 168
පාකාරසන්ධිං 168
පාටිහාරියානි 370
පාණමතිපාතෙති 80
පාණසමා 296
පාණිනා 156
පාණිස්සරං 292
ප.තබ්‍යතං 150
පාතරාසාය 150
පාදගණ්ඨී 254
පානසඛා 296
පාප ආචාරගොචරො 296
පාපමිත්තා 296
පාපමිත්තතා 358
පාපමිත්තානුයොගො 290, 292, 294
පාපසඛා 296
පාමුජ්ජං 408
පායමානාය 64
පාරිචරියාය 304
පාරිසජ්ජා 108
පාරිසුද්ධිපධානියංගානි 524
පාවළා 20

ප

පාසණ්ඩිකො 248
පාසංසා 118
පාසාදපච්ඡායායං 136
පිඤ්ඤාකභක්ඛා 64
පිට්ඨිමංසිකා 318
පිපාසා 294
පිපාසො 296
පියසමුදාචාරො 458
පිසුණා 318
පීඨකං 30
පීතිඵරණතා 480
පීතිභක්ඛා 46, 144
පුග්ගලඤ්ඤු 428
පුග්ගලපණ්ණත්ති 176
පුග්ගලා 366, 392
පුඤ්ඤකිරිය වත්ථූනි 306
පුත්තදාරා 292
පුථුදිසා 288
පුථුපච්චෙකසච්චානි 464
පුරිසථාමෙන 190
පුරිසලිඞ්ගං 150
පුරිසවිසෙසං 262
පුරෙවචනීයං 194
පොක්ඛරසාතකා 324

ඵ

ඵරුසා වාචා 116
ඵලකචීරං 66
ඵලකසෙය්‍යං 66
ඵස්සකායා 412
ඵස්සො 468
ඵාණිතං 118
ඵාලෙසුං 326
ඵාසුවිහාරාය 314
ඵීතං 206
ඵීතො 130
ඵෙග්ගුප්පත්තා 84

බ

බදලතා 148
බන්ධුජීවකපුප්ඵං 446, 520
බන්ධුපාදපච්ච 136
බලකායස්මිං 100
බලානි 386, 430
බහුකරණීයා 330
බහුකාරා 468, 490, 498, 504
බහුකිච්චා 330
බහුජනපියායිතො 272
බහුපුත්තං 16
බාහිරානි 412
බාහිරෙහි 242
බාහුජඤ්ඤං 206
බාහෙත්ති 158
බීජං 320
බුද්ධතන්තිං 280
බොජ්ඣඞ්ගා 170, 382, 498
බොධිජං ඤාණං 224
බ්‍යග්ගෙසා 40
බ්‍යඤ්ජනානි 214, 396
බ්‍යඤ්ජනූපෙතං 214
බ්‍යන්තිකරොති 382
බ්‍යාකතං 228
බ්‍යාකතො 12
බ්‍යාපජ්ජි 258
බ්‍යාපාදපදෙසං 80
බ්‍යාමො 238
බ්‍රහ්මකායො 142
බ්‍රහ්මකුත්තං 44
බ්‍රහ්මචරියවාසාය 452, 514
බ්‍රහ්මජා 136
බ්‍රහ්මදායාද 136
බ්‍රහ්මඤ්ඤතාය 240
බ්‍රහ්මනිම්මිතා 136
බ්‍රහ්මභූතො 142, 392
බ්‍රහ්මවිමානං 46
බ්‍රහ්මස්සරො 238
බ්‍රහ්මුජ්ජුගත්තො 238
බ්‍රහ්මුනා 164
බ්‍රාහ්මණා 158
බ්‍රාහ්මණකුලීනා 136
බ්‍රාහ්මණජච්චා 136

භ

භක්ඛයිත්වා 36
භක්ඛසං 10
භණ්ඩනජාතා 194
භතො 304
භත්තවෙතනානුප්පදානෙන 308
භමුකන්තරෙ 274
භයාගතිං 222
භරියා 306
භවතණ්හා 358
භවදිට්ඨි 358
භවං 240
භවා 364
භවෙන 300
භස්සසමාචාරෙ 178
භාවනප්පධානං 382
භාවනා 368
භාවනාබලං 360
භාවනාරතො 380
භාවනාරාමො 380
භාවිතමාසිංසති 80
භාවෙතබ්බා 468, 490, 498 508
භික්ඛුභාවං 136
භිඞ්කාරං 104
භින්නථූපෙ 194
භිය්‍යොභිඤ්ඤතරො 166
භුජිස්ස 384

භ

භූතභව්‍යානං 46
භූතං 224
භූමිපප්පටකො 148 154
භෙකෙ 40
භොගියා 244

ම

මකස 216
මක්ඛිකා 64
මඞ්කුභූතො 94, 398
මච්ඡරායති 10
මච්ඡරියානි 396
මච්ඡං 64
මජ්ජති 68
මණ්ඩලී 318
මතිමා 175
මත්තඤ්ඤුතා 360
මත්තඤ්ඤූ 178, 428
මත්තමත්තඤ්ඤූ 12
මත්තෙය්‍යතාය 240
මත්තෙය්‍යා 120
මදප්පමාද 102
මද 370
මධු 118
මනසිකාරකුසලතා 360
මනුස්සභූතෙන 352
මනුස්සරාහසෙය්‍යකානි 60, 314
මනොපණිධි 46
මනොපදොසිකං 52
මනොපදොසො 120
මනොභාවනීයා 58
මනොමයා 144
මත්තස්සාජීවිනො 108
මත්තා 178
මන්දියො 330

ම

මයූර... 322
මරියාදං 154
මසාණානි 66
මහත්තං 310
මහාචොරා 328
මහාජනසංගහං 262
මහාජනසම්මතො 156
මහාපුරිසලක්ඛණානි 236
මහාපුරිස විතක්කා 516
මහාබන්ධනා 42
මහායක්ඛානං 328
මහාරාජා 312
මහාවනෙ 14
මහාවිදුග්ගා 42
මහාසම්මතො 156
මහාසෙනාපතීනං 328
මහිච්ඡස්ස 516
මංසං 64
මාගධස්ස 328
මාගවිකස්ස 120
මාතුච්ඡා 118
මාතුලානී 118
මානුසා 320
මාරසෙනප්පමද්දනො 314
මාරො 96
මිගසඤ්ඤං 120
මිච්ඡත්තා 432, 508, 534
මිච්ඡාදිට්ඨි 116
මිච්ඡාධම්මා 116
මිච්ඡාපටිපන්නා 194
මිත්තකරො 310
මිත්තපතිරූපකා 298
මිත්තා 300
මිත්තාමච්චා 306
මිද්ධසුඛං 404

මු

මුඛසත්තීහි 194
මුච්ඡති 68
මුඤ්චති 328
මුට්ඨස්සච්චං 360
මුණ්ඩකෙ 136
මුතවාදිතා 392
මුතං 224
මුත්තාචාරො 64
මුදිතා 422
මුදිතාසහගතෙන 80
මුදුතළුනහත්ථපාදෙ 238
මුදුතූලසන්නිභා 238, 274
මුද්ධං 326
මුද්ධා 24
මුසලමන්තරං 64
මුසාවාදූපසංහිතං 178
මූලච්ඡෙජ්ජං 110
මූලජාතා 142
මෙසා 322
මෙත්තා 420
මෙත්තාසහගතෙන 80
මෙත්තෙන 308
මෙථුනං 150
මෙරයං 64
මොඝමඤ්ඤං 228
මොනෙය්‍යානි 370
මොහාගතිං 222

ය

යක්ඛපචාරො 326
යක්ඛපාරිසජ්ජා 326
යක්ඛපොතකො 326
යක්ඛපොතිකා 326
යක්ඛමහාමත්තා 326
යක්ඛසෙනාය 312
යග්ඝෙ 60, 86, 98
යත්‍රට්ඨිතාම 62, 94, 192
යත්වාධිකරණමෙනං 380
යථරිව 224
යථාකථං 66, 136
යථාකාරී 224
යථාකම්මූපගෙ 84, 186
යථාදිට්ඨිස්ස 360
යථානුසිට්ඨං 90, 180
යථාබලං 308
යථාවාදී 224
යථාසන්ථතික 66
යදිවා 186
යාවතකං 422
යාවතකවස්ස 238
යාවදත්ථං 404
යාවදෙව 216
යුගන්ධරො 330
යූපො 131
යෙභුය්‍යසිකා 432
යොගා 388, 476
යොනිසො 388
යොනිසොපධානං 360
යොනිසොමනසිකාරො 180, 470
යොනිසොමනසිකාරමූලකා 522

ර

රක්ඛං 312
රක්ඛාය 314
රක්ඛාවරණගුත්තිං 100
රජනීයා 394
රජොජල්ලං 238
රජොජල්ලධරො 66
රජ්ජුයා 110
රත්තඤ්ඤූ 204

ර

රත්තින්දිවා 146
රථස්සානීව 310
රථියා 110
රහසා 326
රම්මා 320
රසග්ගසග්ගි 238, 268
රසහරණියො 268
රසං පථවිං 146
රසානි 118
රසිතානං 248
රහදෙ 316
රාජභයානි 254
රාජානුවජ්ජිකානි 254
රාජාරහානි 254
රාජූපභොගානි 254
රාසි 364
රිත්තං 326
රුක්ඛගහනං 120
රුද්ධා 326
රූපප්පතිට්ඨං 384
රූපං 358
රූපසඞ්ගහො 366
රූපීසු 186
රූපූපයං 384
රූහති 292, 294
රොපෙති 214

ල

ලච්ඡති 96
ලජ්ජවං 360
ලජ්ජී 246
ලපකො 178
ලපති 224
ලාභසක්කාරසිලොකං 68
ලූනං 152
ලෙඩ්ඩුනා 156
ලෙහනීයානං 248
ලොකධම්මා 508
ලොණං 118
ලොලජාතිකො 144

ව

වග්ගුහි 322
වචනීයං 194
වචනීයො 198
වචීපරමො 298
වඤ්චන...... 282
වඤ්චනිකා 294
වණ්ණවන්තතරා 146
වණ්ණවන්තො 114
වණ්ණවෙවණ්ණතා 148
වණ්ණාතිමානපච්චයා 148
වත්තපදානි 14
වත්තසි 198
වත්ථුං 326
වදඤ්ඤූ 310
වදෙමසෙ 316
වධකචිත්තං 120
වධො 194
වනගහණං 120
වනපත්ථං 80
වනපත්ථානි 314, 60
වනමූලඵලාහාරො 64
වමෙහති 68, 380
වරත්තාහි 34, 42
වරො 330
වසවත්ති 224
වසුන්ධරං 242
වාකචීරං 66
වාචෙතා 254
වාදප්පමොක්ඛාය 194

ව

වාදනුපාතො 192
වාමෙන 104
වාරුණී 296
වාසං 326
වාහෙය්‍යාම 158
වාළකම්බලං 66
විකටභොජනානුයොගමනු-
යුත්තො. 66
විගතාභිජ්ඣෙන 80
විකාලවිසිඛාචරියානුයොගො 292
විකන්දිතබ්බං 330
විගාහති 296
විසාලෙ 38
විචක්ඛණො 244
විචිකිච්ඡං 80
විචෙය්‍යපෙක්ඛිතා 270
විජනවාතානි 60, 314
විජමෙඝය්‍යං 36
විජහති 300
විජිතාවී 98
විජ්ජා 360, 370, 474
විජ්ජාචරණසම්පන්නං 316
විඤ්ඤාණකායා 412
විඤ්ඤාණට්ඨිතියො 384, 430 498
විඤ්ඤාණසොතං 176
විඤ්ඤුතං 224
විඤ්ඤුතවාදිතා 392
විඤ්ඤූපසත්ථා 204
විතක්කවිචාරසමාධි 174
විතුදන්තා 194
විත්තං 294
විධා 364
විධෙය්‍යා 252
විනිබන්ධා 402
විනෙත්වා 310

ව

විනෙන්ති 304
විපතෙය්‍ය 22
විපරාමොස... 282
විපරාවත්තං 194
විපරීතා 56
විපස්සනා 360, 470
විපස්සිස්සං 316
විප්පමුත්තස්ස 314
විප්පාරිතං 206
විභවදිට්ඨි 358
විමුත්තායතනං 486
විමුත්තායතනානි 408, 484
විමුත්ති 360
විමුත්තිපරිපාචනියා 412
විමොක්ඛා 448, 520
විරත්තරූපා 194
විරචිතබ්බං 330
විරියසමාධිපධාන... 132
විවට්ටති 46, 144
විවට්ටි 182
විවෙධා 40
විවත්තච්ඡදෙ 236
විවදිතබ්බං 358
විවාදමූලානි 416
විවාදපන්නා 194
විවිත්තං 80
විවෙචෙතුකාමො 94
විසෙඤ්ඤුගා 388
විසටං 270
විසමලොභො 116
විසංයොගා 476
විසංවාදයිතා 274
විසාචි 270
විසුද්ධියො (නව) 524
විසුං 160

## ව

විසෙසභාගියා 468, 480, 500, 12
විස්සට්ඨකම්මන්තෙ 296
විහඤ්ඤමි 152
විහායති 296
විහාරා 370
විහිංසති 328
විහෙඨෙති 328
විහෙසං 404
විහෙසාය 482
වීතඞ්ගාරා 158
වීතධූමො 158
වීතමච්ඡරො 310
වීතසාරද්ද 316
වීමංසාසමාධි 132
වීරඞ්ගරූපා 98, 236
වුත්තවාදී 192
වුද්ධසෙවී 296
වුසිතවා 140
වූපකාසෙන 506
වෙකටිකො 66
වෙදනා 364, 474
වෙදනාකායා 412
වෙදනානුපස්සී 96
වෙදනූපයං 384
වෙදයිත්ව 272
වෙධති 310
වෙපුල්ලතං 94
වෙභූතියං 178
වෙය්‍යඤ්ජනිකා 242
වෙරප්පසවො 296
වෙස්සා 133
වෙහාසං 42
වොක්කම්ම 196
වොදසං 68
වොස්සග්ගපරිනාමිං 382
වොස්සග්ගෙන 308

## ස

සළපදිකා 188
සකදාගාමී 180
සකිදෙව 152
සක්කායං 408, 484
සක්‍යපුත්තියා 10, 142
සඨා 296
සඞ්කිත්තිසු 64
සඞ්ඛියො 292
සඞ්ඛාතෙන 186
සඞ්ඛාය 464
සඞ්ඛාරට්ඨිතිකා 358
සඞ්ඛාරා 366
සඞ්ඛාරූපයං 384
සඞ්ගණ්හාති 298
සඞ්ගහවත්ථූනි 259, 390
සඞ්ගායිතබ්බං 358
සඞ්ගාහකො 310
සඞ්ගීතා 164
සච්චපටිඤ්ඤ 274
සච්චවාදී 274
සච්චසන්ධො 274
සච්චෙ 242
සච්ඡිකරණීයා 388
සච්ඡිකාතබ්බා 468, 496 542
සජිතා 46
සඤ්චෙතනාකායා 414
සඤ්ඤා 412, 430, 500
සඤ්ඤූපෙතබ්බා 214
සඤ්ඤුප්පාද 54
සඤ්ඤූපයං 384
සඤ්ඤෙජනානං 180
සණ්ඨපෙසි 60
සණ්ඩසණ්ඩචාරිනී 64
සණ්ඩ සණ්ඩා 152
සණ්හෙන 400

ස

සඞ්ගණිකා 308
සතතවිහාරා 426, 496
සතානුසාරිවිඤ්ඤාණං 224
සතාරක්ඛෙන 462
සති 360, 470
සතිනෙපක්කෙන 428, 460
සතිපට්ඨානා 170, 372, 476
සතිබලං 360
සතිමා 178
සතිවිනයො 432
සත්තකාලං 42
සත්තරතනසමන්නාගතො 236
සත්තරතනානි 98
සත්තාගාරිකො 64
සත්තාලොපිකො 64
සත්තාවාසා 450, 524
සත්තාහිකං 64
සත්තුහි 242
සත්තුමද්දනො 242
සත්තුස්සදෙ 238
සත්ථන්තරකප්පා 120
සත්ථා 202
සත්ථානි 110
සද්ධම්මසවනං 382, 474
සද්ධම්මා 428
සද්ධම්මෙ 208
සද්ධානුසාරී 176
සද්ධාවිමුත්තො 176
සනාභිකානි 238
සනෙමිකානි 238
සන්තකාය 54
සන්තුට්ඨිතා 192
සන්ථාගාරං 352
සන්දස්සෙසිං 42
සන්දිට්ඨිකා 292

ස

සන්නිධිකාරකං 152
සප්පි 118
සප්පාටිහිරකතං 202
සප්පුරිසධම්මා 428
සප්පුරිසසංසෙවො 382
සබ්බත්තතාය 80
සබ්බදුක්ඛාපනූදං 316
සබ්බධි 80
සබ්බපාණභූතහිතානුකම්පී 80
සබ්බභූතානුකම්පිනො 314
සබ්බසඞ්ගාහපදකතං 202
සබ්බසන්ථරිං 352
සබ්බාකාරපරිපූරානි 238, 240
සබ්බාවන්තෙහි 240
සබ්බෙන සබ්බං 118
සභාගායිස්සන්ති 120
සමකාරී 178
සමක්ඛාතුං 206
සමක්ඛායිනො 304
සමඞ්ගීකතා 260
සමජ්ජාභිචරණං 292
සමණඞ්ගානි 254
සමණමචලො 394
සමණානුච්ඡවිකානි 254
සමණාරහානි 254
සමණුද්දෙසො 196
සමණූපභොගානි 254
සමතානි 144
සමතෙන 108
සමත්තානි 14
සමථනිමිත්තං 360
සමථො 360, 470
සමදන්තෙන 238
සමනුඤ්ඤෙ 80, 466
සමනුසාසිත්වා 98

ස

සමවත්තක්ඛන්ධො 238, 266
සමවයසට්ඨෙසනො 462
සමවෙපාකිනියා 268, 478
සමවෙක්ඛන්ති 310
සමසමා 190
සමස්සාසිස්සන්ති 120
සමං 240
සමා 386
සමාදපෙසි 42
සමාදපෙති 198
සමාදින්නානි 14
සමාදියති 66
සමාධි 368, 478, 474
සමධිපරික්ඛාරා 428
සමාධිබලං 360
සමානසුඛදුක්ඛො 300
සමානත්තතා 260
සමානත්තතාය 250, 306
සමාපත්තිකුසලතා 360
සමාපත්තිවුට්ඨානකුසලතා 360
සමාවාහිනියො 268
සමිතිං 326
සමුත්තෙජෙසි 42
සමුද්දෙ 316
සමෙක්ඛමානො 262
සමෙක්ඛසි 316
සමෙක්ඛියාන 40
සමෙත 236
සම්මදක්ඛාතා 358, 426
සම්පජඤ්ඤං 360, 470
සම්පසාදං 192
සම්පද 398
සම්පායාසි 19
සම්පහංසෙසි 42

ස

සම්පායන්ති 44
සම්පායාසි 161
සම්ඵප්පලාපා 116
සම්ඵස්සො 216
සබ්බහුලාජීවො 70
සම්බොජ්ඣඞ්ගා 176, 428
සම්බොධගාමී 452
සම්බොධිපරායණො 180
සම්බොධියං 166
සම්භක්ඛෙති 70
සම්හරිස්සාමි 304
සම්මෙහදං 118
සම්මත්තා 432
සම්මදඤ්ඤා විමුත්තො 140, 164
සම්මනෙය්‍යාම 156
සම්මප්පධානා 170, 372
සම්මාතකාය 306
සම්මාපටිපන්නො 194
සම්මාමනසිකාරමන්වාය 48
සම්මාසමාධි 484
සම්මියසම්මියො 296
සම්මුඛා 298
සම්මුඛා විනයො 432
සම්මුතියා 382
සම්මුස්සති 50
සයං කතං 228
සයම්පභා 46
සරවනං 130
සරිතොදකො 316
සරිංසපා 216
සල්ලෙබතා 192
සසඞ්ඛාරපරිනිබ්බායී 402
සස්සතවාද 182
සස්සතිසමං 182
සස්සතො 48, 288

ස

සහධම්මිකො 192
සහිතො 194
සංයමෙ 242
සංයොජනානි 432
සංවට්ටති 46, 144
සංවට්ටී 182
සංවඩ්ඪා 38
සංවරප්පධානං 380
සංවරාය 216
සංවරී 316
සංවිග්ගස්ස 630
සංවිග්ගො 28
සංවිධාතා 244
සංවිභාගරත 308
සංවෙගො 360
සංවෙජනීයෙසු 360
සංසප්පති 30
සංසාදෙය්‍යාම 60, 86
සංහිතානං 276
සා 64
සාකච්ඡං 60
සාකභක්ඛො 64
සාබල්‍යං 360
සාගරපරියන්තං 98, 236
සාචියොගා 282
සාණානි 66
සාතච්චාය 402
සාත සහගතා 468
සාධුරූපො 10
සානුචරියො 18
සාපතෙය්‍යං 292, 300
සාපෙක්ඛො 68
සාමීචිපටිපන්නො 196
සාමඤ්ඤතාය 240
සාමඤ්ඤඵලානි 384,478

ස

සාමාකභක්ඛො 64
සාමිකං 306
සාමීචිකම්මං 142
සායමාසාය 150
සායංතතියකං 66
සායියං 250
සාරප්පත්තා 78, 84
සාරාගො 150
සාරම්භජං 178
සාරානීයං 416, 486
සාලාහාරං 152
සාලිං 150, 320
සාලිමංසොදනො 118
සාවජ්ජා 135
සාවෙති 300
සාසවා ඉද්ධි 188
සාසවො 468
සාහසිකා 294
සාළික 324
සික්ඛා 368
සික්ඛාපදානි 396
සිඞ්ඝාටකෙන 110
සිප්පපටිග්ගහණෙන 304
සිරීමතො 314
සීලවිපත්ති 360, 398
සීලවිපන්නො 398
සීලවිසුද්ධි 360
සීලසමාදානෙ 240
සීලසම්පදා 360, 398
සීලසම්පන්නො 398
සීහනාදෙ 166
සීහපුබ්බද්ධකායො 238, 266
සීහහනු 238, 280
සූක 324
සුකතකම්මකරා 308

ස

සුකදරියතා 296
සුක්කවිපාකං 388
සුක්කාභිජාතිකො 426
සුඛඵරණතා 480
සුඛල්ලිකානුයොගමනුයුත්තා 216
සුඛල්ලිකානුයොගා 218
සුඛා පටිපදා 178
සුඛුමච්ඡවී 238
සුඛුමාන 258
සුඛූපපත්තියො 368
සුගතං 404
සුගතාතිරිත්තානි 38
සුගතාපදනෙසු 33
සුග්ගහිතං 304
සුචරිතානි 362
සුඤ්ඤවනෙ 40
සුඤ්ඤාගාරගතා 60
සුතවාදිතා 302
සුතං 224
සුද්ද 135
සුද්ධාවාසා 402
සුනිඛාතො 222
සුනිසෙධො 110
සුප්පකාසිතං 204
සුප්පටිනිස්සග්ගි 78
සුප්පතිට්ඨිතපාදලක්ඛණං 240
සුප්පතිට්ඨිතපාදෙ 236
සුභට්ඨායිනො 46
සුභං විමොක්ඛං 56
සුමනො 330
සුමාපිතා 322
සුරසං 146
සුරා 64, 98
සුරාමෙරයමජ්ජපමාදට්ඨානා-
නුයොගො 292
සුවිනීතං 304
සුසඞ්ගහිතපරිජනො 250
සුසානෙ 12

ස

සුසුක්ක 274
සුසුක්කදාඨො 238, 283
සුස්සූසන්ති 86
සුස්සූසාය 304
සුභද්ද 300
සූරො 322
සෙගාලකං 38
සෙගාලො 40
සෙට්ඨිං 150
සෙනාපතීනං 328
සෙය්‍යසුඛං 404
සෙය්‍යාවසථපදීපෙය්‍යං 442
සොකනාසනො 272
සොචෙය්‍යං 242, 360, 370
සොණසිගාලා 118
සොණ්ඩා 294
සොතාපත්තියඞ්ගානි 382
සොතාපන්නඞ්ගානි 382
සොතාපන්නො 180
සොමනස්සූපවිචාරා 414
සොවග්ගිකං 110
සොවචස්සතා 358

හ

හටහෙක්ඛා 64
හත්ථාපලෙඛනො 64
හදයඞ්ගමා 278
හන්ද 330
හානභාගියා 468, 480, 592, 500
526
හිරි 330, 358
හිංසති 328
හීනායාවත්තන්ති 84
හෙඨෙති 328
හොමි 192

ළ

ළද්ද 318